පමා වූ සරසවි වරම

(ස්වයං ලිඛිත චරිතාපදානය)

පමා වූ සරසවි වරම

(ස්වයං ලිඛිත චරිතාපදානය)

ආචාර්ය ආරියපාල ඒකනායක

B.A. (Vidyodaya); M.P.A. (Vidyodaya); M.D.S. (ISS-The Hague)
D.Sc. Honoris Causa, USJ ; D. Lett – Honoris Causa - SUSL
(විශ්‍රාමික සභාය මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

ප්‍රකාශක - චාන්දිනී ඒකනායක
බෙදාහැරීම - 077 3820573

අධ්‍යාපන අමාත්‍යාංශය
බලපත්‍රය

පොතේ නම - පමා වූ සරසවි වරම
කර්තෘ - ආරියපාල ඒකනායක

බලපත්‍ර අංකය - අග්‍රප්‍රදම/2/9722

1952 පෙබරවාරි මස 29 දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ උපකෘත ස්වභාෂා ද්විභාෂා සහ ඉංග්‍රිසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19/ඒ ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

විජිත වෙලදෙර
ලේකම්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

2013.09 මස 30 වැනි දින
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල.
බලපත්‍රය අවලංගු වන දිනය 2018.09.29

ප්‍රකාශකගේ ලිඛිත අවසරය කලින් නිසි පරිදි නොලබා මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින් ඉලෙක්ට්‍රොනිකව, යාන්ත්‍රිකව, ඡායාපිටපත් මගින් සම්ප්‍රේෂණය හා භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම හා ගබඩා කර තැබීම සපුරා තහනම් ය.

පමා වූ සරසවි වරම

පළමු මුද්‍රණය - 2013
සංශෝධිත දෙවන මුද්‍රණය - 2017

© Copyright ආචාර්ය ආරියපාල ඒකනායක

ISBN 978-955-671-823-2

පිටකවර නිර්මාණය - සමන් ඉන්දික ලොකුකළුගේ

මුද්‍රණය - තරංජී ප්‍රින්ට්ස්
506, හයිලෙවල් පාර, නාවින්න,
මහරගම.

පිළිගැන්වීම

මගේ ආදරණීය දෙමව්පියන්ට, ගුරුවරුන්ට සහ
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ මා
හදුවඩාගත් මහාචාර්ය ලීනස් සිල්වා සහ
ආචාර්ය වී. කනේෂලින්ගම් මැතිතුමන්ලාට
හද බැතියෙන් පිළිගන්වමි.

DEDICATION

Dedicated to my dear Parents, Teachers
and more Particularly to Professor Linus Silva
and Dr. V. Kaneshalingam who brought me up
in the Study of Public Administration.

සංඥපනය

යම් කෙනෙක් පිටිසරයෙක්ය, යන්නෙන් අදහස් කරන්නේ ඒ තැනැත්තා අගනුවරින් හෝ නාගරික මධ්‍යස්ථානයකින් ඈත තැනක ඉපදුන හෝ ජීවත්වන බවයි. මා එවැන්නෙකි. අපේ ගම ඈත පිටිසර ගමකි. මා කුඩා කල මහනුවර සිට අපේ ගමට බස් රථයකින් ගමන් කළත් පැය තුන හතරක් ගතවිය. මහා මාර්ග යක් කඩපොලක් තිබුණත් එය ගම් ප්‍රදේශයක් ම විය. එහි ගැමියන් ගොවිතැන් බත් කරගෙන ජීවත් වූහ. පාසල් අධ්‍යාපනයක් ලබා ගත්තේ මව්බස යම් තරමින් කියවීමට හා ලිවීමට පමණය. මෙම දුරස්ථභාවය නිසා යහපත් ගුණාංග සමහරක් නොනැසී පැවතිණි. ගමන් පහසුකම් ආදිය වැඩිවත් ම මේ ගුණාංග යටපත් විය. එනමුත්, දැන් මේ ගම් ප්‍රදේශයේ නවීකරණයක් දක්නට ලැබේ.

එවැනි ගමක ඉපදී ප්‍රාථමික අධ්‍යාපනය ලබන විට නිදහස් අධ්‍යාපනයේ අරුණාලෝකය වැටිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද්විතීය අධ්‍යාපනය ලැබීමට මඟ පෑදිණි. රජයේ රැකියාවකට පිවිසීමට එය උපකාර විය. නිදහස් අධ්‍යාපනයේ පහන වඩාත් දීප්තිමත් ව බැබලීමට පටන් ගත් විට, උසස් අධ්‍යාපනයක් ද ලබා ගත හැකි විය. එම පහන අඛණ්ඩ ව දල්වා තැබීමට සහභාගී වූ පිටිසරයෙකුගේ කථාව මේ කෘතියේ ඇතුළත් වේ.

මා උපන් ගමේ පිහිටීම, දේශගුණය, ගස් කොළන්, සතා සිව්පාවා, ජීවනෝපාය, ආහාරපාන, සමාජ සම්බන්ධතා, සිරිත් විරිත් යනාදිය ගැන තොරතුරු ඉතා ම කෙටියෙන් පළමුවන පරිච්ඡේදයේ ඇතුළත් කර තිබේ. ගස් කොළන්, සතා සිව්පාවා වැනි දේ ගැන දීර්ඝ විස්තරයක් කළා නම්, මෙය පරිච්ඡේද දෙක තුනකට විහිදේ. එපමණක් නොව, මා උද්භිද විද්‍යාඥයෙක් හෝ සත්ව විද්‍යාඥයෙක් නොවන නිසා, ඒ ගැන ගැඹුරු අධ්‍යයනයකට පිවිසීමට නොදනිමි.

මගේ ළමා විය ගැන අවුරුදු දොළහක තොරතුරු දෙවෙනි පරිච්ඡේදයේ ඇතුළත් වේ. එයින් මුල භාගය නිදැල්ලේ ගමේ ගත කළ අවදියයි. ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසියේ වයස අවුරුදු හය හමාරේදීය. මගේ පවුලේ තොරතුරු, බාල කාලයේ කෙළි සෙල්ලම්, ගමන් බිමන්, ලෙඩ දුක් ආදිය ගැන ද කෙටි විස්තරයක් ඇතුළත් වේ. පහේ ශිෂ්‍යත්ව විභාගය සමත් වීමත් සමඟ ගැටවර වියට පා තබයි. ද්විතීය අධ්‍යාපනය අවසන් වන තුරු අවුරුදු හයක තොරතුරු තුන්වෙනි පරිච්ඡේදයේ දක්නට ලැබේ.

පාසල් අධ්‍යාපනය අවසන් කර රැකියාවල නිරත වන්නේ වයස අවුරුදු දහ අටේ දී ය. එම අත්දැකීම් හතරවෙනි පරිච්ඡේදයේ 'තරුණ විය' යනුවෙන් විස්තර කර ඇත. සම්ප්‍රදායානුකූල ව තරුණ විය අවුරුදු දහයක් පහළොවක් සිසාරා පවතින නමුත්, මගේ ජීවිතයේ එය වසර පහකින් අවසන් වේ. වයස අවුරුදු විසි තුනේ දී විවාහ වීමත් සමඟ යුගදිවි සමයට පස්වෙනි පරිච්ඡේදය

අවධානය යොමු කරයි. වැඩිමහල් දරු දෙදෙනාගේ උත්පත්ති සහ නොයෙක් තැන්වලට ස්ථාන මාරුවීම් ආදිය ගැන තොරතුරු මෙම පරිච්ඡේදයේ ඇතුළත් කර තිබේ. අවුරුදු පනස් එකක යුග දිවියක් ගත කළ නමුත්, මෙම පරිච්ඡේදය වසර දහ හතරක තොරතුරුවලට සීමා කර තිබේ. එසේ වුවත්, ඊළඟ පරිච්ඡේද තුළ ද යුග දිවියේ සමහර තොරතුරු අන්තර්ගත කර තිබේ.

හයවෙනි පරිච්ඡේදය මගේ උසස් අධ්‍යාපනය ගැන විස්තර කරන වැඩිහිටි සමය ලෙස හඳුන්වා තිබේ. උසස් අධ්‍යාපනය ලබා ගත්තේ රැකියාවක නිරත වී සිටිය දී ම නිසා, එයට අදාළ තොරතුරු මෙන් ම පවුලේ තොරතුරු ද මෙම පරිච්ඡේදයේ විස්තර කෙරේ. රැකියාවේ ඇති වූ වෙනස්කම් ගැන ද සඳහන් වේ. උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වයස අවුරුදු තිස් හත වන විට විශ්ව විද්‍යාල ගුරු පදවියක් ලැබිණි.

හත්වෙනි, අටවෙනි හා නවවෙනි පරිච්ඡේද වෙන්වන්නේ විශ්ව විද්‍යාල සේවය සඳහා කැපවුණු වසර විසිඅටක තොරතුරු ඇතුළත් කිරීමටයි. මගේ වෘත්තීය ජීවිතයෙන් වැඩි ම කාලයක් ගත කළේ ද මේ සඳහාය. විදේශ ගතවීම් කීපයක් ද වෙනත් අත්දැකීම් රාශියක් ද මේ යුගයට අයත් වේ. මුල් යුගයේ දී නොයෙක් ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දුන් නමුත්, අවසාන වසර දහයේ දී ඒ අමාරුකම් විශාල වශයෙන් ඉවත් වී ගියේය. ඒ නිසා, විශේෂයෙන් ම, බාල දරු දෙදෙනාට යහපත් ජීවන මාර්ගවලට පිවිසීමට ඉඩ ප්‍රස්ථාව ලැබිණි.

විශ්‍රාමික සමය ආරම්භ වන්නේ මගේ වයස අවුරුදු හැටපහ ගත වූ විටයි. දහවෙනි පරිච්ඡේදයේ 2012 දක්වා එම තොරතුරු ඇතුළත් වේ. මගේ බිරිඳ රෝගාතුර වීම හා වියෝවීම එම පරිච්ඡේදයේ විස්තර කෙරේ. වයස් ගතවීම නිසා කෙනෙක් මුහුණපාන රෝග පීඩාවලට වැඩි වැඩියෙන් මුහුණ දීමට පසුගිය වසර කීපය තුළ දී සිදු වී තිබේ. ඒවා ගැන යම් තොරතුරු මෙහි ඇතුළත් කර ඇතත්, ඒ ගැන එතරම් දුක්වන්නේ නැත. මා මේ කෘතියේ ආගමික ජීවිතයේ තොරතුරු ඇතුළත් කර නැත. ඒවා මගේ අභ්‍යන්තර දිවියට සම්බන්ධ නිසාය. දේශපාලන වශයෙන් කරන ලද යම් යම් දේ ගැන ද තොරතුරු දක්වා නැත. ඒවා මගේ මෝඩකම් යයි සලකන නිසාය.

මෙම අභ්‍යාසයෙන් මා ඉගෙන ගත් කරුණු දෙක තුනක් වේ. මා විශිෂ්ටයෙක් නොවේය, යන්න පළමුවැන්නයි. අශිෂ්ටත්වයෙන් මිදීමට වෙර දරා ඇති බව දෙවැන්නයි. ඒ නිසා මා ශිෂ්ටයෙක්ය, යන හැඟීම තුන්වැන්නයි. එය මට ප්‍රමාණවත්ය. ඒ සඳහා මට උදව් උපකාර කළ සියලු දෙනාට ම මගේ ප්‍රණාමය හිමි වේ.

- ආරියපාල ඒකනායක

පෙරවදන

මෙම රචනාව ලිවීමේ අරමුණු කීපයක් වේ. මා ගැන මම දන්නවා ද යන්න පැහැදිලි කරගැනීම පළමුවැන්නයි. මගේ දරු මුණුපුරන්, නෑදෑයන් මා ගැන දන්නවා ද? නැත්නම් ඒ නොදන්නා දේ පැහැදිලි කිරීම දෙවැන්නයි. මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ හිතමිතුරන් මා ගැන නොදන්නා දේ එළිදරව් කිරීම තුන්වෙනි අරමුණයි. මෙය කියවීමෙන් පසු සමහර විට ඒ අය මා තබා සිටි අසුනෙන් පොළොවට පතිත කරන්නට ඉඩ තිබේ. මහ පොළොව මත පා තබා සිටින විට බිමට වැටීමට නො හැකිය.

ඈත පිටිසර ගමක ඉපදී සරසවි ඇදුරෙකු වීම දක්වා වූ මගේ ගමන් මඟ, මා වැනි ගැමි දරුවන්ට යම්කිසි මඟ සලකුණක් වේ නම් එය පෙන්වා දීම තවත් අරමුණකි. මේ සියල්ල මගේ මනසේ පැන නැඟුණ සිතිවිලිය. අන් අයට ඒවායින් පලක් වේ ද නොවේ ද යන්න පැහැදිලි නැත. එනමුත්, මා ගැන මා දන්නා ටික වැඩි කර ගැනීමට ලැබුණත් ඒ ප්‍රමාණවත්ය.

මගේ මිතුරෙක් මෑතක දී **වී.ඩී. ද ලැනරෝල් පඬිවරයා "හපන්කම් මෝඩකම් හා පුරසාරම්"** නමින් ලියන ලද පොතක් මට දුන්නේය. මගේ හපන්කම් හා පුරසාරම් ගැන යම් යම් දේ මගේ මෙම කෘතියෙහි ඇතුළු කර ඇති නමුත්, මෝඩකම් ගැන සඳහන් කර තිබෙන්නේ අල්ප වශයෙනි. මගේ මෝඩකම් රාශියක් ඇති නමුත්, ඒවායින් මට යහපතක් නොවූ නිසා, අන් අය ඉදිරියේ ඒවා හුවා දැක්වීමට මැළිවූයෙමි. හපන්කම් හා පුරසාරම් ගැන ද සඳහන් කරුණු "ඇල්මරා" ඇත. ඒ උඩඟුකමෙන් බේරීමටය.

මෙම චරිතාපදානය ලිවීමට මා පෙළඹුණේ 2011 සැප්තැම්බර් **අරුණලු** සඟරාවේ පළ වූ WHAT IF නම් ලිපිය කියවීමෙන් පසුවයි. එය ලියා තිබුණේ ලංකා පරිපාලන සේවයෙන් විශ්‍රාම ලත් සම්මානනීය ලේඛක ආරියවංශ රණවීර මහතා විසිනි. එතුමාට මගේ ප්‍රණාමය හිමි වේ. මා මිත්‍ර සවිමන් උරුගොඩවත්ත මහතා මෙම කෘතියේ සංස්කාරක ලෙස අගනා කාර්යභාරයක් ඉටු කළේය. එතුමාට මගේ හද පත්ලෙන් නැඟී එන කෘතඥතාව හිමි වේ.

මෙවැනි පොතකට වෙළඳපොලක් තිබේ දැ'යි නොසලකා එය මුද්‍රණය කිරීමට හාරගෙන කළට වේලාවට එම කාර්ය ඉටුකිරීම පිළිබඳව සීමාසහිත සරසවි සමාගමේ අධිපති එච්. ඩී. ප්‍රේමසිරි මහතාට මගේ ස්තුතිය හිමි වේ. මෙය එළිදැක්වීමට මට උපකාර කළ මගේ දීප්තිමත් සිසුන් වූ මහාචාර්ය රමණී සමරතුංග, ආචාර්ය එච්. එම්. ඒ හේරත් සහ සුප්‍රසිද්ධ දේශක ජගත් විජේනායක යන තිදෙනාට පිය සෙනෙහසින් තුති පුදමි.

මා කුඩා කල සිට මේ දක්වා නන් අයුරින් මට උපකාර කළ ලොකු කුඩා නොයෙක් දෙනාට මෙය උපහාරයක් වේව'යි පතමි.

- **ආරියපාල ඒකනායක**

65, එදිරිසිංහ පාර,
මිරිහාන, නුගේගොඩ.
2012 ජූනි 04
(0773820573)

නිදහස් අධ්‍යාපනය නොතිබුණා නම්, අද මම විශ්‍රාමික ගොවියෙක්



ආචාර්ය ආරියපාල ඒකනායක ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අංශයේ දිගු කලක් සේවය කළ කීර්තිමත් ගුරුවරයෙකි. පර්යේෂකයෙකි. විද්වතෙකි. ලේඛකයෙකි. නිදහස් අධ්‍යාපනය ඔස්සේ එහි මහරු ඵල ප්‍රයෝජන නෙලා ගනිමින් ප්‍රාමාණික උගතෙකු වූ ඔහු මෙරට ආර්ථික විද්‍යා ක්ෂේත්‍රය බබළවන වත්මන් විද්වතුන් සිය ගණනකගේ කීර්තිමත් ගුරුවරයකු ලෙස ප්‍රකට ය. ඔහු සිය ජීවිත ගමන අළලා ලියූ චරිතාපදානය ඇසුරින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවකි මේ.

ප්‍රශ්නය : ජීවිතයේ විවිධ අත්දැකීම්වලට මුහුණ දෙමින් විවිධ තනතුරු උසුලමින් ජීවිතයේ සැඳෑ භාගයේ පසුවන ඔබට මෙසේ ඔබේ අතීත ජීවිත ගමන දෙස ආපසු බලන්නට හිතුණේ ඇයි?

පිළිතුර : හුදකලාවේ, තනි පංගලමේ මේ ගේ සාගරයේ ජීවත්වන මට, මගේ හිතට ගලාඑන සිතිවිලි ධාරාවන්වල කෙළවරක් නැහැ. මේවායේ අවසානයක් තිබෙන්න ඕනෙ. මේවා ක්‍රමවත්ව, පිළිවෙළකට ලියා තැබිය යුතු යැයි මං අදහස් කළා. මම ගැන මං හරියාකාරව දන්නවා යැයි මට කියන්න බැහැ. මගේ ගෝල්බාලයින්, නැදෑ හිතමිතුරන් කෙසේ වෙතත් මගේ දූ දරු මුනුපුරු, මිනිපිරියන්වත් මං ගැන දන්නේ නැහැ. මං මෙහි තැබූ සටහන් නිසයි ඉහත සඳහන් සියලු දෙනාම මං කවුද යනු හරියටම දැන ගත්තේ. මුළු ලෝකයම පිහිටා ඇත්තේ බඹයක් පමණ වූ මේ ශරීරය තුළයි. ඒ අනුව බලන විටත් තමා ගැන දන්නා ටික වැඩි කර ගැනීමට මෙවැනි අභ්‍යාසයක් උපකාර වෙනවා. තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. කොළඹ සිට සැතපුම් 100ක් පමණ මධ්‍යම කඳුකරය දෙසට ඈතින් ඇති, කඳු බෑවුමක පිහිටා ඇති අපේ ගම් ප්‍රදේශය ගැන කිසිවෙක්, කොතැනකවත් ලියා ඇති බවක් මං දන්නේ නැහැ. ලංකාව යටත් විජිතයක්ව පැවති දෙවන ලෝක යුද්ධ සමය ගැන පොත් පත් බොහොමයක් ලියවී ඇතත් අපේ ගම් ප්‍රදේශය ගැන කිසිවක් ලියවී නැහැ. යුද්ධය නිසා ගම් ප්‍රදේශයට වූ හානිය, ඇති වූ වෙනස ගැන දන්නේ දුප්පත් ගම්වැසියන් පමණයි.

නිරන්තරයෙන්ම මගේ හිතට ඇතුළුවෙන සිතුවිලි ධාරා නිසා අතීතය මං වෙළා ගන්නා බව මට දැනෙනවා. මේ හැමටම පිළිතුරු ලෙස මං හිතුවේ හිත තුළ තෙරපෙන සියලුම දේ ක්‍රමවත්ව සටහන් කර තැබීමයි.

ප්‍රශ්නය : ඔබ ගමෙන් පැමිණ නගරය ජයගත් කෙනෙක්. ගම කොතෙක් දුරට ඔබගේ ජීවිතය හැඩගස්වා ගැනීමට උපකාර වුණාද?

පිළිතුර : ඔබ කියන දේ හරියට ඇත්ත. මං ගමෙන් ඈත් වී බොහෝ කල් ගතවී ඇතත් මං ගමෙන් ලද අභාසය දැනටමත් මා කෙරෙහි දැඩි බලපෑම් ඇති කරනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් මාගේ දෙමාපියන්ගේ, වැඩිහියන්ගේ ආගමික ජීවිතය මා කෙරෙහි ඇති කරන ලද බලපෑම් තවමත් මා හසුරුවන බව දැනෙනවා. නූතන පරම්පරාව කේන්දර, නක්ෂත්‍ර රාහු කාලය වැනි දේ එතරම් ගණන් නොගන්නා බව මට තේරෙනවා. එහෙත් මට ඒවා කෙරෙහි ඇත්තේ විශ්වාසයක්. ගමට රෝග බිය උපද්‍රවයක් ඇති වන විට ගමේ පිරිස් පන්සලට ගොස් ලොකු හාමුදුරුවෝ හමු වී සති පිරිත් පටන් ගන්නවා. තරුණ පිරිස් ගම දෙකට බෙදා ගම්මඩු පොරපොල් තරග හා අං ඇදීම් වැනි පාරම්පරික ක්‍රීඩාවල යෙදෙනවා. රාත්‍රී කාලයේ ගම හරහා පන්දම් පත්තු කරගෙන දෙවියන්ට කන්නලව් කරමින් පේළි යනවා. මුලු ගමේම පිරිත් පැන් ඉහිනවා. මේ හැමදෙයක්ම කුඩා කල මගේ සිත තුළ තැන්පත් වුණා. ඒ හැමදෙයක්ම මගේ ජීවිතය හැඩගස්වා ගැනීමට උපකාර වුණා. ගමේ මුලාදෑනියා හැමදේකටම ප්‍රමුඛත්වය දුන්නා.

ප්‍රශ්නය : ගම පිළිබඳව දීර්ඝ විස්තරයක් ඔබගේ පොතේ සඳහන් වෙනවා. බැලූ බැල්මට එම විස්තරය පොතෙහි අනෙකුත් පරිච්ඡේද සමග නොගැළපේ යැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන්. මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?

පිළිතුර : ඔය කියන කතාවට මම එකඟ වන්නේ නැහැ. මං ගම ගැන නොලියන්නේ නම් මගේ මතය හැටියට මම අහසින් වැටුණ කෙනෙක් ලෙසට ඔබ සිතන්නට පුළුවන්. ගම ගැන ලියන්නට මට තවත් බොහෝ දේ තිබුණා. අවශ්‍යම ප්‍රධානම දේ තමයි ලියා තිබෙන්නේ. මගේ උරුමය එතනයි.

ප්‍රශ්නය : මාර්ටින් වික්‍රමසිංහ "අපේ ගම" වැනි කෘතීන් ලියන විට එය ගමටම පමණක් සීමා නොවී දකුණු පළාතම ආවරණය වන අන්දමට ලිවීම කළා. මධ්‍යම පළාත සම්බන්ධව එවැනි කෘතීන් එළිදැක්වී නැති නිසා අනාගතයේදීවත් එවැනි කෘතියක් එළි දැක්වීමට අදහසක් නැද්ද?

පිළිතුර : ඔය සම්බන්ධව මම දැනගෙන හිටියේ මීට වර්ෂ ගණනාවකට ඉස්සෙල්ලයි. ඇත්තෙන්ම මෙවැනි කෘතීන් බිහි කිරීමට හැකියාවක් තිබූ එකම පුද්ගලයා නැසී ගිය ටී. බී. ඉලංගරත්න මැතිතුමායි. නමුත් එතුමා ඔහුගේ මුළු කාලයම වැය කළේ නව කතා සහ කෙටිකතා ලිවීම සඳහායි. මෙය මං කියන

කතාවක් නොවෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා ජීවතුන් අතර සිටියදී කියපු කතාවක්. අනික එවැනි ගාම්භීර සාහිත්‍ය කෘතීන් ලියන්න තරම් ලේඛකයෙක් නෙවෙයි මං.

ප්‍රශ්නය : ඔබගේ ග්‍රන්ථයේ රචනා ශෛලිය සහ "ඔබ" යොදු ගැනීමේදී "උත්තර පුවත්" භාෂාවක් යොදුගෙන නැහැ. සිද්ධි සහ කරුණු ඇති සැටියෙන් වාර්තා කිරීම ඔබගේ අභිලාෂය බව පෙනෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස් දැන ගැනීමට කැමතියි.

පිළිතුර : ඔබ අහන දේ ඇත්ත. මට අවශ්‍යව තිබුණේ සාහිත්‍යධරයන් හෝ පඬිවරුන් සඳහා පොතක් ලිවීම නොවෙයි. කුමන තරාතිරමේ අයෙකුට වුවත් කියවා තේරුම් ගැනීමට පුළුවන් කෘතියක් බිහිකිරීමයි. මම භාෂා විශාරදයෙක් නොවන නිසා මට පහසු ශෛලියක් යොදු ගත්තා. එය නිවැරදි යයි මම හිතනවා.

ප්‍රශ්නය : ඔබගේ රාජකාරි ජීවිතය, රජයේ සේවය සහ විශ්වවිද්‍යාල සේවය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. මම අංග දෙකෙහි අතීතය සහ වර්තමානය ගැන යමක් කිව හැකිද?

පිළිතුර : මම මගේ රජයේ වෘත්තිය ආරම්භ කළේ 1915 නොවැම්බර් මස මැද භාගයේ දීයි. එතැන් සිට වසර 14 කට ආසන්න කාලයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විවිධ ප්‍රදේශවල සේවය කළා. එකල රජයේ සේවයේ නියුතු අයෙකුට ලොකු ගරුත්වයක් මෙන්ම පිළිගැනීමක් තිබුණා. ඒ කාලය තුළ සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන් ආශ්‍රය කිරීමට අවස්ථාව ලැබුණා. මින්නේරිය වගේ දුර බැහැර ප්‍රදේශවල රජයේ සේවයේ නියුතු අයට රජයේ නේවාසික බංගලා පවා ලැබෙනවා. එමෙන්ම විශාල වශයෙන් කම්කරු ශ්‍රේණිවල පුද්ගලයින් සමග ගනුදෙනු කිරීමට අවස්ථාව ලැබුණා. තමන්ට ඉහළ නිලධාරීන්ට ගරු කිරීමට තම වෘත්තියට නිගරු වන සේ කටයුතු නොකිරීමට ඔවුන් පුරුදු පුහුණු වී සිටියා.

විශ්වවිද්‍යාලයේ දී මට මුණ ගැසුණේ ඊට හාත්පසින්ම වෙනස් පිරිසක්. දිවයිනේ නා නා දෙසින් පැමිණි උගත් බුද්ධිමතුන් පිරිසක්. ඒ අය තුළ විවිධ මත තිබුණත් කලක් යන විට ඒවා සියල්ලම සම වෙනවා. ඒ අයට මං නිතරම සැලකුවේ මගේ දරු පිරිසක් ලෙසටයි. මේ අය විවිධ බාහිර බලපෑම් නිසා දඩබ්බර වුවත් ඒ අයට නිසි මග පෙන්වා දීම ආචාර්යවරයෙකුගේ යුතුකමක්. වසර 28 ක දිගු සේවා කාලයක් තුළ දහස් ගණන් සිසු සිසුවියන්ට සිප් සතර උගන්වා ඇත. ඒ අය අතරෙන් අද සමාජයේ විවිධ තරාතිරම්වල වැජඹෙන පුද්ගලයන් සිටිනවා. මා ඔවුන් ගැන ආඩම්බර වෙනවා. ඔවුන් අතරෙන් ආරාධනා ලැබ හෝ නොලැබ අතළොස්සක් දෙනා මගේ කෘතිය දෙරට වැඩීමේ දිනයට පැමිණීම ගැන මං ආඩම්බර වෙනවා.

ප්‍රශ්නය : ස්වයං ලිඛිත චරිතාපදනයකදී මම ඉදිරියටම ඒම වළක්වන්න බැහැ. එහෙත් ඒ කාර්යයේදී ඔබ ඇල්මරා ඒ කාරණා ඉදිරිපත් කරන බව මෙහි පෙරවදනින් කියවෙනවා. ඔබ එයින් අදහස් කළ දේ කිව හැකිද?

පිළිතුර : ස්වං ලිඛිත චරිතාපදනයක් කියන්නේ මම ගැන කියන කථාවක් තමයි. ඒ වුවත් දැඩි මමත්වයක් නැතිව එය ලිවීමට ප්‍රයත්න දැරීම ලේඛකයෙකුගේ වගකීමයි. මා විසින් "ඇල්මරා" ඇත්තේ ලැනරෝල් පඬිවරයාගේ වචනවලින් කියවෙන හපන්කම් සහ "පුරසාරම්ය".

ප්‍රශ්නය : ඔබගේ ආදරණීය භාර්යාව "හැර නොයන සෙවණැල්ලක්" ලෙස ඔබගේ ජීවිතයට බලපා ඇති බව පෙනෙනවා. ඒ පිළිබඳව මතක සටහනක් කිව හැකිද?

පිළිතුර : මට මේ සම්බන්ධව කථා කිරීම ඉතාම අපහසු දෙයක්. දැනට මා සමග නැති නිසා එය තවත් අපහසුයි. එහෙත් ඔබ අසන නිසා මේ සම්බන්ධව යමක් පැවසිය යුතුයි. අප දෙදෙනා එක්ව ගතකළ අවුරුදු 51 ක ජීවිතය, කෙසේවත් අමතක කළ නොහැකියි. බොහෝ විට අප සිරිත යම් කෙනෙක් ජීවත්ව සිටියදී ඇය හෝ ඔහු කරන කියන දේ අගය කිරීම වේ. නමුත් මම මගේ ජීවිතයේ යම් දුරකට ගියා නම් ඒ මගේ භාර්යාවගේ නිහඬ දායකත්වය නිසා බව පැවසිය යුතුයි. අපට දූවරුන් දෙදෙනෙක් සහ පුතුන් දෙදෙනෙක් ඉන්නවා. මේ අය උස්, මහත් කර යහමගට යොමුකර උසස් අධ්‍යාපනය ලබාදීමට ඇය ගත් උත්සාහය සම්පූර්ණයෙන්ම සාර්ථක වුණා. එහි ප්‍රතිඵල දැන් අපි භුක්ති විඳිනවා.

ප්‍රශ්නය : කන්නන්ගර ශ්‍රීමතානන්ගේ නිදහස් අධ්‍යාපන සංකල්පය නිසා ඔබ ජීවිතය ජයගත් කෙනෙක්. ඔබගේ ග්‍රන්ථයේ අවසන් පරිච්ඡේදවලද ඒ බව සඳහන් වෙනවා. ඒ ගැන යමක් කිව හැකිද?

පිළිතුර : ඉතාමත් කෙටියෙන් කියනව නම් සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපන වැඩපිළිවෙල නොතිබෙන්නට අද මම අපේ ගමේ විශ්‍රාමික ගොවියෙක් වෙන්නට බොහෝ සෙයින් ඉඩකඩ තිබුණා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබා රජයේ රැකියාවල නිරත වී, උසස් අධ්‍යාපනය ලබා, විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ලෙස කටයුතු කර විශ්‍රාම ගැනීමට ලැබුණේ එතුමාගේ ඒ වැඩපිළිවෙළ නිසයි. එය මම පමණක් නොවෙයි මුළු ලංකාව පුරාම විසිරී සිටින දුගී දුප්පත් දූ පුතුන් ලැබූ ජයග්‍රහණයක් ලෙස සලකනවා.

(2013 මැයි මස 12 වැනි දින, දිවයින ඉරිදා සංග්‍රහයේ 'රූපණ IV' කොටසේ පළ වූ ලිපියකි.)

සාකච්ඡා කළේ, **ලයනල් ගන්ගේ**

ආචාර්ය ආරියපාල ඒකනායක මහතාණන්ගේ අභාවය 2014 මැයි මස 12 වන දින සිදු විය.

පාත්‍ර වර්ගයා

මම	-	ආරියපාල ඒකනායක (ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ආරියපාල)
අපේ අප්පච්චී	-	ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා
අපේ අම්මා	-	අබේසිංහ මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකා
අපේ අයියා	-	ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ මුතු බණ්ඩා (ඊ.ආර්.එම්.බණ්ඩා)
නන්දා අක්කා	-	අබේසිංහ රාජපක්ෂ මුදියන්සේලාගේ නන්දාවති කුමාරිහාමි (අයියාගේ බිරිඳ)
ප්‍රේමා	-	ප්‍රඥාවතී විජේසිරිවර්ධන (ඒකනායක) (මගේ බිරිඳ)
ලොකු දුව	-	චාන්දිනී ටිකිරි කුමාරිහාමි ඒකනායක
වසන්ත	-	වසන්ත සුමනසේකර ලියනගම (ලොකු දුවගේ සැමියා) (මගේ බෑණා)
දිනීත්	-	දිනීත් තරුෂ ලියනගම (මගේ මුණුබුරා)
සවිනි	-	සවිනි දුලංගා ලියනගම (මගේ මිණිබිරිය)
ලොකු පුතා	-	හේමකාන්ත ඒකනායක
නිර්මලා	-	නිර්මලා ජයසූරිය (ඒකනායක) (ලොකු පුතාගේ බිරිඳ) (මගේ ලේලි)
පොඩි දුව	-	දයානි භද්‍රා නිල්මිණි ඒකනායක
ප්‍රියන්ත	-	ප්‍රියන්ත ප්‍රේම කුමාර (පොඩිදුවගේ සැමියා) (මගේ බෑණා)
පොඩි පුතා	-	වරුණ කෝසල ඒකනායක
මෙලානි	-	මෙලානි හලංගොඩ (ඒකනායක) (පොඩි පුතාගේ බිරිඳ) (මගේ ලේලි)
මියුර	-	මියුර කවීන් ඒකනායක (මගේ අලුත් ම මුණුබුරා)

පටුන

01 මා ළමා වියේ අපේ ගම **01**
- පිහිටීම 02
- දේශගුණය 03
- ගහකොළ 05
- සතා සිව්පාවා 06
- ගෙවල් දොරවල් 10
- ජීවනෝපාය 13
- ආහාරපාන 23
- ඇඳුම් පැලඳුම් 26
- සමාජ සම්බන්ධතා 28
- පුද පූජා, ඇඳහිලි විශ්වාස 31
- අධ්‍යාපන පහසුකම් 37
- පරිපාලනය 39
- දෙවන ලෝක මහා සංග්‍රාමය 40

02 මගේ ළමා කාලය (1933-1945) **43**
- පවුලේ තොරතුරු 45
- කෙළි සෙල්ලම් 49
- ලෙඩදුක් 53
- ගමන් බිමන් 57
- මුදල් පරිහරණය 64
- ප්‍රාථමික අධ්‍යාපනය 66

03 ගැටවර විය (1945-1950) **75**
- ද්විතීය අධ්‍යාපනය 76
- 1947 ගං වතුර 90
- 1947 මහා මැතිවරණය 93
- 1948 නිදහස් උත්සවය 95
- හැරවුම් ලක්ෂයක් 109
- අපේ අයියා 112

04 තරුණ විය (1951-1956) **116**
- රක්ෂා: ගොවිතැන 117
- ගුරුසේවය 118
- ලිපිකාර සේවය 121
- කොළඹ, මිණිපේ 130

- පිරිත් පින්කම 136
- ශ්‍රී පාද වන්දනාව 138
- රෝගාතුර වීම 143
- ප්‍රේම සම්බන්ධතාව 145

05 යුග දිවි සමය (1956-1960) 152
- විවාහ ප්‍රාප්තිය, දරු සම්පත 159-163
- බදුල්ලට ස්ථාන මාරුවීම 164
- හිගුරක්ගොඩ 179
- අප්පච්චිගේ අභාවය 190
- දෙවැනි දරු උපත 191
- උසස් අධ්‍යාපන ප්‍රවේශය 196

06 වැඩිහිටි සමය (1961-1970) 198
- ස්ථාන මාරුවීම 201
- උසස් අධ්‍යාපනය 208
- බාහිර කථිකාචාර්ය තනතුර 210
- ධීවර සංස්ථා සේවය 216
- පොඩි දුවගේ උපත 220
- ස්ථාන මාරුවීම 221-223
- පශ්චාත් උපාධිය 228

07 විශ්ව විද්‍යාල සේවය: පළමුවෙනි වසර අට (1970-1978) 231
- කථිකාචාර්ය තනතුර 234
- අප්‍රේල් කැරැල්ල 241
- ජනරජ ව්‍යවස්ථාව 245
- සිව්වන දරු උපත 246
- අපේ අම්මා 253
- සප්ත වාර්ෂික නිවාඩුව (නෙදර්ලන්තය) 256

08 විශ්ව විද්‍යාල සේවය: දෙවෙනි දොළොස් වසර (1979-1990) 279
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සේවය ආරම්භ කිරීම 279
- නිවසක් ඉදිකර ගැනීම 280
- 1983 ජූලි කලබලය 284
- පවුලේ ප්‍රගතිය 286
- ලොකු දුවගේ විවාහ මංගල්‍යය 287
- විදේශ චාරිකා 289
- බෙල්ජියම 289

- හයිද්‍රාබාද් 293
- භූතානය 295
- නේපාලය 298
- පීඨාධිපති තනතුර 300
- සහාය මහාචාර්ය තනතුර 308
- දෙවැනි සප්ත වාර්ෂික නිවාඩුව (බෘහනායි විශ්ව විද්‍යාලය) 311
- ලොකු පුතාගේ විවාහ මංගල්‍යය 334

09 විශ්ව විද්‍යාල සේවයඃ - තුන්වන වසර අට (1991-1998) **342**
- ලංකාවේ දී ඉදිරි කටයුතු 342
- අනුබද්ධ විශ්ව විද්‍යාල 346
- අධ්‍යයන සමායෝජක 347
- උතුරු මැද පළාත් අනුබද්ධ විශ්ව විද්‍යාලය 348
- බාල දරුවන්ට රැකියා සෙවීම 351
- සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව 356
- හදවත් සැත්කම 358
- තුන්වෙනි සප්ත වාර්ෂික නිවාඩුව 364
- උඟව මණ්ඩපාධිපති තනතුර 364
- පොඩි දුවගේ විවාහ මංගල්‍යය 371
- විශ්‍රාම පූර්ව සේවය හා විශ්‍රාම ගැනීම 372

10 විශ්‍රාමික යුගය (1998ට පසුව) **383**
- විදේශ ගමන් 384
- උඩදුම්බර පදිංචිය 416
- පොඩි පුතාගේ විවාහ මංගල්‍යය 419
- ප්‍රේමා රෝගාතුර වීම 424
- අභාවය 435
- දඹදිව චාරිකාව 439
- සම්මාන උපාධි 451
- රෝගාතුර වීම 469
- අනාගතය 473
- වලල මධ්‍ය විද්‍යාලය 477
- සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදී ශිෂ්‍ය සංගමය 480

◆ පසු වදන 489
◆ සිතියම් සහ ඡායාරූප 492

01 මා ළමා වියේ අපේ ගම

වියපත් කෙනෙක් හුදකලාව සිටින විට නොයෙක් සිතිවිලි දහරාවෝ ගලා එති. එකලස් සිතක් ඇති කෙනෙකුට වුව ද, එයින් මිදුණු විට "දූරං ගමන් ඒක චරං" වෙයි. මෙවැනි අවස්ථාවල දී මගේ සිත නිතර ම ඇදී ගියේ මා උපන් ගම් ප්‍රදේශයටයි. මගේ ළමා කාලය වයස අවුරුදු දොළහක් වන තුරු ගත කළේ උපන් ගමේය. පහේ ශිෂ්‍යත්ව විභාගය සමත් වී මධ්‍යම පාසලකට ඇතුළත් වීමට ගමෙන් පිට වූ පසු ගමට ගියේ පාසල් නිවාඩු කාලවල දී පමණය. පසු කාලයක දී මගේ දෙමව්පියන් ඇතුළු මුළු පවුල ම මිනිපේ ගොවි ජනපදයේ පදිංචියට ගිය නිසා, උපන් ගමට යෑම අවශ්‍ය වූයේ කලාතුරකිනි.

නිතර නිතර නැඟී එන සිතිවිලි අතර සටහන් කර තැබිය යුතු යමක් වේදැ'යි යන්න කෙරෙහි අවධානය යොමු කළෙමි. අදාල කාල පරිච්ඡේදය විසිවන සියවසේ ඇවිලී ගිය දෙවන ලෝක මහා යුද සමයට ඇතුළත් වන නිසාත්, බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වූ අපේ රටේ කොළඹින් සැතපුම් සීයක් (කිලෝමීටර් එකසිය හැටක්) ඈත පිටිසර ගමක ජීවත් වූ වැසියන්ගේ හා ගමේ තොරතුරු කෙනෙකුට දැනගන්නට සැලසීම උචිත යැ'යි කල්පනා වූ නිසාත්, මෙම සිතුවිලි සටහන් කර තැබීමට යොමු වුණෙමි.

අපේ ගමේ පිහිටීම, දේශගුණය, තුරුලිය, සතා සිව්පාවෝ, ගම්වැසියන්ගේ ජීවනෝපාය, ඔවුන් භාවිතා කළ උපකරණ, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, පරිහරණය කළ මුදල් හදල්, ඇදහිලි විශ්වාස, සමාජ සම්බන්ධතා, සෞඛ්‍යය, අධ්‍යාපනය ආදි කරුණු කිහිපයක් ගැන මතකයට නැඟෙන තොරතුරු සමහරක් මෙසේ සටහන් කර තබමි. මේ විස්තරයේ දී, එවකට ගමේ භාවිතා වූ වචන සමහරක් යොදා ගෙන ඇත. ඒවායේ තේරුම් පැහැදිලි වන සේ වර්තමාන භාවිතයේ ඇති වචන අවශ්‍ය යැ'යි හැඟෙන තැන්වල එසේ දක්වා තිබේ. මෙම විස්තරය කියවන ප්‍රබුද්ධ බහුශ්‍රැත මහතුන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, මෙහි යම් දෝෂයක් ඇත්නම් මට පෙන්වා දීමට කාරුණික වන ලෙසත්, සුභාෂිතයේ

එන අලගියවන්න මුකවැටිතුමාගේ මේ කවිය කියවන ලෙසත්‍යඃ

එබැවින් සෙබෙහි වියතුනි ගුණයුත් පව ර
කිරියෙන් දියර වෙන් කළ හස මෙන් පත ර
මවිසින් කියන මෙහි වරදක් දුටත් හැ ර
සතොසින් අසව් පද'රුත් විමසා ගැඹ ර

(පණ්ඩිත වේරගොඩ අමරමොලි හිමියන්ගේ සංස්කරණය - 1960)

පිහිටීම

අපේ ගම පිහිටියේ කඳු බෑවුමකය. කොතැනකවත් තැනිතලා භූමියක් නොවීය. මහනුවර සිට කටුගස්තොට, මඩවල, මැනික්හින්න, තෙල්දෙණිය හරහා වේරගන්තොට (මහවැලි ගඟේ දකුණු ඉවුරේ මහියංගණය) දක්වා වැටී තිබුණු මහා මාර්ගයේ සැතපුම් 28ක් (කි.මී. 45) ගිය විට *හාල්යාල* නම් වූ අපේ ගම හමුවේ. මහනුවර කුණ්ඩසාලේ දිගන තෙල්දෙණිය හරහා ඇති මාර්ගය සැතපුම් 25ක් (කි.මී 40) විය. ගමට බස්නාහිරින් වූ කන්ද හරහා ගමට ඉහළින් වැටී තිබෙන මේ පාර, ගමේ උතුරු දෙසින් පිහිටි උඩපතන කඳුගැටය හරහා වැටී, අමුතුකොළහින්න පසුකර ගොස් මාඩුගොඩ කඩපොලට වැටිණි. එය ඉදිරියට ගොස් දහඅට වංගුවලින් පසුව ගුරුළුපොත පල්ලේවත්ත හරහා වේරගංතොටට පැමිණේ. මාඩුගොඩ සිට වේරගංතොටට සැතපුම් විස්සකි.

මාඩුගොඩ සිට ගමේ නැගෙනහිර දෙසින් පිහිටි කන්ද හරහා මැදිවක දෙසට කරත්ත පාරකි. මේ පාර ගංගොඩ, බෝපාන, කලුන්තැන්න යනාදි ගම් හරහා ගොස් තැම්මිටියානේ දී වේරගංතොට පාරට වැටේ. තවත් පාරක් හුන්නස්ගිරියේ කන්ද කැපූ තැනින් ආරම්භ වී කිරිපට්ටිය පසු කොට, ගමේ පහළ කොණින් ඉදිරියට ගොස් කණගම්පිටියේ දී මාඩුගොඩ සිට එන කරත්ත පාරට වැටේ. මේ පාරේ ඉදිරියට ගොස්, කලුන්තැන්නෙන් හැරී උඩුවාහින්න, මහවල, ගැටලාගොල්ල, ගල්පඩිහෙල හරහා මහියංගණයට ළඟාවිය හැකිය. ගමේ සිට දුර සැතපුම් පහළොවක් පමණ වේ.

නකල්ස් කඳුවැටියේ දකුණු කොණේ පිහිටි දෝතලුකන්දේ නැගෙනහිර බෑවුමේ පිහිටි නාවනගල වත්තෙන් ගලා බසින දියකඳුරු කීපයක් එකතු වී හැදෙන කහටගොල්ලේ ඔය ගමේ දකුණු මායිම ලෙස සැලකිය හැකිය. ගමේ වෙල්යායට ජලය ලබා ගන්නේ මේ ඔය හරහා බැඳි අමුණු කීපයකිනි. තවත් තැන් කීපයකින් ගම හරහා පහළට ගලාබසින කඳුරු කීපයක් තිබේ. ඒවායින් ද ගමේ තැනින් තැන පිහිටි කුඹුරුවලට ජලය ලබාගනී. වෙල් යායේ

තැන් කීපයක දිය උල්පත් ඇත. ඒවා රැක ගැනීමට උල්පත් වටා ගස්වැල් වැවී ගොම්මන් වීමට ඉඩහැර තිබේ. පානීය ජලය ලබා ගැනීමට උල්පත් ජලය හරවා පිහිලි සාදා ඇත. ගම තුළ මෙවැනි පිහිලි හතරක් තිබිණි. මේවායේ දිය නෑමට ද පුළුවන.

මෙසේ කඳුගැට කීපයකින් වටවී ඒවායේ බෑවුම්වල පිහිටි අපේ ගම ගෙවල් මණ්ඩි හතරකින් යුක්ත වේ. ඉහළ ගම්මැද්දේ ගෙවල් විස්සක් පමණ විය. පහළ ගම්මැද්දේ, එගොඩහ ගම්මැද්දේ සහ මැදිරියේ ගෙවල් දහය බැගින් පමණ විය. තැනින් තැන ඉදිකර තිබූ තනි ගෙවල් කිහිපයක් ද විය. ගමේ පන්සල එගොඩහ ගම් මැද්දට ඉහළින් පිහිටියේය. එහි තේවාව කරන පවුල් දෙකක් පන්සල අසල ගෙවල් දෙකක පදිංචි ව සිටියෝය. ගම හරහා එහා මෙහා දිවෙන අඩිපාර හා ගම්සභා පාර කිහිපයක් විය. මහපාරේ සිට ගම හරහා පහළට දිවෙන ගම්සභා පාරක් ද විය. එය මාඩුගොඩ සිට ගම හරහා ඇති කිරිපට්ටිය පාරට සම්බන්ධ වේ.

දේශගුණය

අපේ ගමේ සීතල දේශගුණයක් පැවතිණි. රාත්‍රී කාලයේ දී පවතින සීතල නිසා නිදාගැනීමට රෙද්දක් පොරවා ගැනීම අවශ්‍යය. දවල් කාලයේ තද ඉර එළිය වැටෙන විට වුව ද හැට්ටයක්, කමිසයක් ඇඳීමට බැරි තරම් දැඩි උෂ්ණත්වයක් නොවීය. මෙම ප්‍රදේශයට වැසි ලැබීම වප් මාසයේ දී (සැප්තැම්බර්) පමණ ආරම්භ වේ. මුල දී පොද වැස්ස ද ක්‍රම ක්‍රමයෙන් මහ වැසි ද ලැබේ. උඳුවප් (දෙසැම්බර්) මාසයේ දී තද වැසි ලැබේ. සමහර විට දින ගණන් එක දිගට මහ වැසි වැටිණි. දුරුතු (ජනවාරි) මාසයෙන් පසුව ක්‍රමයෙන් අඩු වී ගොස් බක් (අප්‍රේල්) මාසය වන විට මුළුමනින් ම පායයි. වෙසක් (මැයි) මාසයෙන් පසුව වියළි කාලගුණය ආරම්භ වී වප් මාසය දක්වා පවතී. එනමුත්, මේ කාලයේ ද අතරින් පතර යල් වැසි (පොද වැස්ස) ලැබේ. වෙසක් මාසයේ දී හය මාසයක් පමණ පවතින හුළං සමය ඇරඹේ. මේ නිසා, ප්‍රදේශයේ ගස් කොළන් වැඩීම මුළුමනින් ම පාහේ නවතී. නැවත වැසි සමය එළඹෙන තුරු දළු ලියලීමක් පවා සිදු නොවේ. යල් වැසි පැවතුන ද, හුළඟනිසා එය වියළී යයි. මෙසේ මාස හයක් තුළ පවතින වියළි හුළං සමය සහ හය මාසයක් පවතින වැසිබර තෙත් සමය ගම්වැසියන්ගේ ක්‍රියාශීලීභාවය හා ජීවනෝපාය කෙරෙහි දැඩි බලපෑම් ඇති කරයි. වැසි සමය පැමිණි විට ගහකොළට නවජීවනයක් ලැබේ. කඳු පහළට දිය පාරවල් ගලා බසිති. අමුතු සිරියක් නිර්මාණය වේ.



උඩදුම්බර කොඨාශය

මහනුවර - මහියංගණ දඟඅට වංගු පාර —— දක්වා ඇත. ඒ පාරෙන් ආරම්භවන —— පාර හාල්යාලට පහළින් වැටී කණහම්පිටිය කළුන්නැන්න හරහා තැම්මිටි යානට සම්බන්ධව ඇත. කළුන්නැන්නෙන් —— පාරට සම්බන්ධ —— පාර ගල්පඩි හෙල හරහා ඉදිරියට ගොස් වේරගංනොටට යයි.

- M - මාඩුගොඩ
- A - අමුනුකොළහින්න
- D - දේවාලේවත්ත
- T - පංසල
- S - මැදිවක පාසල
- K - කණහම්පිටිය

ගහකොළ

ගමට ඉහළින් බටහිර දෙස ඇති කන්ද මුදුනේ සිට පහළට මහපාර දක්වා වූ පතනේ මානා වැවී තිබේ. මෝරා වියළී තිබෙන මෙම මානාවට වියළි කාලයේ දී කවුරු හෝ ගිනි තබයි. දින කීපයක් තුළ ඇවිලී යන ගින්න ක්‍රමයෙන් නිවී යයි. වැසි සමය එළඹෙන විට මේ මානාව ලියලන්නට පටන් ගනී. කුඹුරු වැඩ නැති සමයේ පතනට දමන මීහරකුන්ට ලියලන මේ මානාව හොඳ ආහාරයකි. පතනේ තැනින් තැන ඇති දිය උල්පත් ආශ්‍රිත මඩිති තිබේ. අව්ව සැර වේලාවට මී හරක් මෙම මඩිතිවල ලගිති. කඳුරු හා දියපාර ආශ්‍රිත ව ද ගමේ වතුපිටිවල ද ළඳු කැලෑවල ද වැවෙන ගස් කොළන් රාශියක් තිබේ. නෙල්ලි, කහට, කීන, කොටදිඹුලා, දිඹුල්, මොර, එරමුදු (වර්ග දෙකකි) ගංසූරිය, බෝ, ඉත්ත, කොස්දන්, හොඬපොල්ලන්, කරෝලකැම්බෙල්ලන් (කරුවල කැබෙල්ල), කැන්ද, වෙලන්, දඹ, උගුරැස්ස, කුඩුදවුලා (දවුල් කුරුඳු), මී, කැකුණ, කුරු අඹ, රබර්, කිරිකෝන්, ගොරොක්, දලුක් වැනි ලොකුවට වැඩෙන ගස් තැනින් තැන ස්වාභාවික ව වැවී තිබේ. සියඹලා, ගොරක, කොස්, දෙල්, පොල්, පුවක් ආදිය ගෙවතුවල වවාගෙන ඇත. ඔය දිගේ ඉබේ වැවුණ කොස්ගස් කීපයක් වේ. සමහර ගෙවතුවල දේවදාර, සබුක්, ගිරිසීරියා, (වැටහිර) වැනි ගස් තිබේ. වැට මායිම්වල නොයෙක් වර්ගයේ උණ පඳුරු වවා ගෙන ඇත.

ළඳු කැලෑවල වැවෙන පඳුරු වර්ග බොහෝය. අත්තන, කැප්පෙට්ටිය, නත්තසූරිය, කුරුඳු, කරපිංචා, කරකොළ, මැල්ල, පාවට්ටා, නික, නහදුණු, පේර, කටුපොල්, නෙලූ, එඩරු (වර්ග දෙකකි), ඇඹිල්ල, ගැටපූජා (මල්බෙරි), කරඹ, යබර යනාදියයි. හිඟුරු, එරමිණියා, කුඩුමිරිස් යනාදිය කටු සහිත වැල්ය. කලවැල්, පඹ, හොඬ, දැල්හොඬ, කිරිමුන්දන්, අඟුණ, කිරි අඟුණ ආදී වැල් වර්ග කැලෑවල හා ගෙවතුවල ද වැවී තිබේ. දිග කටු සහිත පතොක් සමහර වැට අයින්වල වැවී හෝ වවා තිබේ.

ගෙවතුවල වවාගන්නා ගස් හා පැළෑටි අතර, මුරුංගා, කෝපි, දෙහි, නාරං, නත්තරං, සුදු අලකොළ, කිරි අල, හුලංකීරිය, බුස්සරණ, අරත්ත (එනසාල් වැනි ගසකි) කහ, ඉඟුරු ආදිය වේ. කුඩා පැළෑටි අතරට නිදිකුම්බා, හුලංතලා, මදුරුතලා, තුත්තිරි, ඉත්තෑබේරිය, කුප්පමේනිය, අමුක්කරා, තිප්පිලි, කළාඳුරු, හෙන්දිරික්කා, සැවැන්දරා ආදිය අයත් වේ.

මෙම ගස් වැල් බොහොමයකින් නොයෙක් ප්‍රයෝජන ලැබේ. කටු එරමුදු හා දිඹුල් දළුකොළ, කරකොළ, අඟුණ, කිරි අඟුණ, මුරුංගා කොළ, කෝපි දළු කොළ, සුදු අලකොළ යනාදියේ කොළ මැල්ලුමට ගනිති. ගමේ ළමෝ දඹ, උගුරැස්ස, මොර, පේර, කටුපොල්, ඇඹිල්ල, ගැටපූජා, කරඹ, යබර, දැල් හොඬ, කරෝල කැබැල්ල යනාදියේ ගෙඩි ඉදුණු විට කඩා ගෙන කති. නෙල්ලි පළගන්නා කාලයට ගෙඩි කඩා ගෙන වියළා තබා ගැනීමට

හෝ වෙළඳුන්ට විකිණීමට කටයුතු කරති. කහට ගෙඩි මෝරන්නට පෙර මැල්ලුමට ගත හැකිය. ඒවා පෙති ගසා වේලාගත් කොඳ, බොහෝ කාලයක් තබා ගෙන මැල්ලුමට ගත හැකිය. ගම්වැසියන් කරපිංචා කඩා ගන්නේ කැලෑවේ ඇති ගස්වලිනි. කුරුඳු කෝටු කපා ගෙන පොතු ගලවා වේලා ගනිත්. කුඩුදුවුලා කොළ කොටා මිරිකා ගන්නා යුෂ ආස්මී සෑදීමේ දී හාල් පිටි සමඟ දියකර ගනී. හුලංකීරිය සහ බුස්සරණ අල තම්බා කෑමට ගනිත්.

උසට හැදෙන වෙලන්, ගොබිල් (ලොකු දිග කෝටු), බැත පෝරු, කැට පෝරු, මිටවලට හා කෙකි සඳහා කපා ගනිති. මී ගස් හොඳින් වැඩුණු පසු ශක්තිමත් ලෑලි, පරාල ආදිය ඉරා ගැනීමට පුළුවන. ගංසූරිය ගස් ද එවැන්නකි. මී ගෙඩි ඉදීමෙන් පසු වවුලන් වැනි සතුන් කා බිම දමා තිබෙන ඇටියල් (මී ඇට) එකතු කර වේලා මදය ගෙන තෙල් හිඳ ගැනීමට යොදා ගනිති. තෙල් හිඳීමෙන් පසු ඉතිරි වන මුරුවට ගිනි ඇවිලීමට ද ආලෝකය ලබා ගැනීමට ද දැල්වීමට ද පුළුවන. කුඩැල්ලන් ඇති තැන්වල ගමන් කරන විට, මුරුවට ටිකක් ඇකුල්වල ගාගෙන ගියොත් ඔවුන් මතුවන්නේ නැත. කැකුණ ගෙඩි ඉදී ඇට වැටුණ විට එකතු කර තලා ඒවායේ මදය ගෙන ඉරටුවක අමුණා ගන්නා මලකැට, ඉටිපන්දම් සේ දැල්වීමට පුළුවන. කරඳ කොළ, නත්තසූරිය කොළ, කැප්පෙටියා කොළ, ගිනිසිරියා කොළ, කුඹුරුවල පොහොරට යොදා ගනිති. කාබනික පොහොර සෑදීමට ද යොදා ගත හැකිය. දත් මැදීමට දැහැටි කුරු සාදා ගන්නේ කරඳ මුල්වලිනි. කරඳ කෝටු ද ඒ සඳහා ගත හැකිය.

කහට, නහදුණු, කළවැල් යනාදියේ පට්ටා ලණු ඇඹරීමට ගත්හ. කොහු ලණු හෝ කඹ භාවිතයක් නොවීය. එළහරක්, මී හරක්, දිගවිලි කිරීමට පට්ටාවලින් අඹරා ගත් ලණු පාවිච්චි කළහ. ගෙමිදුල්, කමත් ආදිය අගුගෑමට බෝලතු බැඳ ගත්තේ *වරළු අතු* වේලාගෙනයි. කරල් කපාගත් පසු ඉතිරි වූ කුරහන් පඳුරුවලින් ගෙවල් ඇමදීමට ඉළපත් බැඳගත්හ. කොහු ඉදල් භාවිතාවක් වූයේ පන්සලේ පමණයි. නගුල් සඳහා උචිත ලී කැලෑවලින් කපා ගත්හ. කැලෑ විනාශ කිරීම තහනම් වුවත්, මෙවැනි දේ සඳහා ලී කපා ගැනීම සහ ආහාර පිසීමට අවශ්‍ය දර කඩා ගැනීම තහනම් නොවීය.

සතා සිව්පාවා

ගමේ ගෙවල් දොරවල්, වතුපිටි, අවට ලඳු කැළෑ හා පතන් ආශ්‍රයෙන් විවිධ සිව්පාවුන්, පක්ෂීන්, උරගයන්, මැසි මදුරුවන් දක්නට ලැබිණි. *ගෙමැස්සන්, රාමැස්සන්, කෝඳුරුවන්* හා *මීයන්* ද ගෙවල් දොරවල්වල දක්නට ලැබිණි. ගස්කොලන් යට තරමක් අඳුරු තැන්වල *හෝහපුටෝ* වූහ. බල්ලන් බළලුන් දක්නට ලැබුණ නමුත් ඔවුන් ගෙවල්වල ඇති කළ සතුන් නොවූහ. *ලේනුන්, දඬුලේනුන්* ගෙවතු ආශ්‍රයේ උන්හ. *ඉත්තෑවුන්, මීමින්නන්,*

වැලිමුවන්, උෆරන් හා රිළවුන් කැලෑවල දක්නට ලැබුණි. මොවුන්ගෙන් වඩාත් ම ගම්මුන්ට හානිකර වූයේ *වල්උෆරන්* හා *රිළවුන්ය.* කන්දේ ඉහළ අඩවියේ වවන හේන්වලට *රිළවු* කඩා පනිති. ගමට එන්නේ නැත. එනමුත්, *වල් උෆරෝ* හේන්වලට, ගෙවතුවලට හා කුඹුරුවලට හානි කළෝය. උන් *මයියොක්කා, අල බතල* වර්ග හාරා ගෙන කති. කෑම සොයා නියර පෙරළා දමති. *උෆරන්ගෙන්* තරම් නොවූවත් *ඉන්තෑවන්ගෙන්* ද එවැනි හානි සිදුවේ. *වැලිමුවන්* පතන් හා ලඳුකැළෑ ඇසුරෙන් ජීවත්වන නිසා ගම්මුන්ට සිදුවන හානිය අල්පය.

මී මැස්සෝ වද බඳින්නේ ගල්කුහරවල හෝ ගස්බෙනවලය. *කණ මී මැස්සෝ* ද ගල් කුහර තුළ වද බැඳ ගනිති. *බඹරු* වද බඳින්නේ උස ගස්වල අතුවල යටි පැත්තේය. බඹර වදයක් පහසුවෙන් බලා ගැනීමට පුළුවන. නොයෙක් උස ගස්වල *දෙබර කුඩු* බඳින නමුත් ඒවායේ *බඹරු* හෝ *මී* වද වැනි දෙයක් නැත. එනමුත්, මේ අතරින් විෂ වැඩිම කෘමියා *දෙබරාය. මී මැස්සෝ* හා *බඹර මැස්සෝ* දෂ්ට කරති. මේ කෘමීන් විශාල සංඛ්‍යාවක් දෂ්ට කළොත්, ඒ විෂෙන් කෙනෙක් මරණයට පත්වීමට ද ඉඩ තිබේ. *කණ මී* හා *දඬුවැල්බෑ* මැස්සන්ගෙන් එවැනි හානියක් සිදු නොවේ. දඬුවැල්බෑ ද බඳින්නේ කුඩා අත්තකය. කණ මී හෝ දඬුවැල්බෑ පැණි එකතු කිරීමට කෙනෙක් උනන්දු වන්නේ නැත.



ඉහළින් කන්ද හරහා මහියංගණ පාර වේ. මැතින් ඇති ගොම්මණේ ඉහළින්ම දේවාලේවත්ත පිහිටා තිබේ. ළඟ පෙනෙන කුඹුර පද්දලන්දය



ඇති පාර මහනුවර - මහියංගණ දහඅට වංගු පාරය. පාර හුන්නස්ගිරිය-කණහම්පිටිය පාරය. පාර හාල්යාල හරහා වූ කිරිපට්ටිය - මාඩුගොඩ පාරය. පාර මාඩුගොඩ-කණහම්පිටිය පාරය.

A - අමුනුකොළහින්න
D - දේවාලේවත්ත
P - පහළ ගෙදර

- මහනුවර-වේරගංතොට පාර (මහ පාර)
- හුන්නස්ගිරිය - කනහම්පිටිය පාර
- කිරිපට්ටිය - මාඩුගොඩ පාර (ගම්සභා පාර)
- මාඩුගොඩ - කනහම්පිටිය පාර (කරත්ත පාර)

නයි, පොළොන්ගු, පොළොන් තොලවිස්සන් (තෙලිස්සන්), අහුරු කුක්කන්, ගැරඬි, දිය නයි, ඇහැටුල්ලන්, පළා පොළඟුන් යනාදී උරගයින් මෙහි ගෙවතු කැලෑ ආදියේ දී හමුවිය හැකිය. ගැරඬි, දියනයි, විෂකුරු සර්පයින් නොවේ. අනෙක් සෑම උරගයෙක් ම විෂ සහිතය. සමහරු දෂ්ට කළ විට ක්ෂණික මරණ පවා ළඟාවීමට පුළුවන. උරගයින් නොවූවත් දියමකුළුවා, පත්තෑයා හා ගෝනුස්සා ද විෂකුරුය. මේ සතුන් දෂ්ට කළ විට වෙදකම් කළ වෙදමහතෙක් ගමේ සිටියේය. එතුමාගේ පළමු වෙදකම මැතිරීමයි. මතුරා විෂ බැස්සූ පසු අවශ්‍ය නම් කසායක් දීම හෝ තුවාලයට බෙහෙත් බැඳීමක් සිදුකළේය.

ගමේ හෝ අසල කැලෑවල දක්නට ලැබුණ පක්ෂීන් රාශියකි. කුකුළා, ඇටිකුකුළා, ගේ කුරුල්ලා, පාන් කිරිත්තා (පොල්කිච්චා), මයිනා, කොණ්ඩයා, කොට්ටෝරුවා, කපුටා, පැන්ටා (බට්ටිච්චා), පැණි කුරුල්ලා, වඩු කුරුල්ලා, බකමූණා, පියාකුස්සා, වැහිලේනා (වැහිලිහිණියා), වළිකුකුළා, කිරිවවුලා යනාදීන්ය. ගෙවල් දෙක තුනක කුකුල්ලු ඇති කළේ පාන්දරට හැඬලීමටයි. ගම්වැසියන් පාන්දර වේලාව සනිටුහන් කර ගත්තේ කුකුළාගේ හැඬලීමෙනි. පළමුව පාන්දර තුනටත්, දෙවනුව හතර හමාරට පමණත් තුන්වෙනුව උදේ හයට පමණත් කුකුළා හඬලන බවට මතයක් තිබේ. පාන්දර ගමනක් බිමනක්, වැඩක් පළක් සඳහා පිටත් ව යෑමට කුකුළා හැඬලීම උපකාර වේ. බිත්තර සඳහා කුකුළන් ඇති කළේ එක ම එක ගෙදරක පමණය. වෙල්යායේ මැද තිබුණ ගසක අතුවල වඩුකුරුළු කූඩු එල්ලී තිබෙනු දැකගත හැකි විය. මේ කුරුල්ලන් කූඩුවට ඇතුළු වන කුහරය තබා ඇත්තේ කූඩුවේ යට පැත්තෙනි. සර්පයින් වැනි හතුරෙකුට කූඩුවට ඇතුළු වීම දුෂ්කරය.

කැලෑව තුළ ජීවත්වන වලිකුකුළා දැක ගැනීමට ලැබෙන්නේ කලාතුරකිනි. ඔවුන් සිටින බව දැනගත හැක්කේ ඔවුන්ගේ හැඬලීම නිසාය. සෑම ගෙයක් ඇසුරේ ම පාහේ ගේකුරුළු කූඩුවක් ඇත. මේ සඳහා ඔවුන් බොහෝ විට තෝරා ගන්නේ පිදුරු සෙවිලි කළ වහලේ ඇතුළු පැත්තය. පැන්ටා දක්නට ලැබෙන්නේ කුඹුරු යායේ වැටවල්වලය. හොඳට ඉර පායන දවස්වල ඉහළ අහසේ පියාකුස්සෝ පියාඹති. ඇත්ත වශයෙන් ම කෙනෙකුට පෙනෙන්නේ ඔවුන් අහසේ ඉතා හෙමින් පාවෙන ආකාරයකි. එනමුත්, බිම ගොදුරක් දුටුවිට විදුලි වේගයෙන් ඒ කරා පාත් වී පාදවලින් ගොදුර ඩැහැගෙන පියාසර කරති. පියාකුස්සෝ ද ඇටිකුකුළන් මෙන් ම ගොවියාගේ මිතුරන්ය.

ගෙවතුවල කහකුරුල්ලන්, කොබෙයියන්, දක්නට ලැබිණි. පිහාටු දුඹුරු පැහැති වෙසක් කඩදාසි මෙන් දිග වල්ග සහිත කුරුළු වර්ගයක් සමහර කාලවල දී දක්නට ලැබිණි. කුඹුරුවල මඩ කක්කුට්ටන් (කකුළුවෝ) දක්නට ලැබිණි. දිය සීරාව ඇති කාලවල සාමාන්‍ය ගෙවත්තේ ද ගෙවතු ආදියේ අඳුරේ ගස් ගෙම්බන් ද දක්නට ලැබිණි. උරගයින් ඇදී එන්නේ මීයන්,

ගෙම්බන් ඇති තැන්වලටයි. බොහෝ මුළුතැන්ගෙවල "දුම්මැස්සේ" තිබූ හැළිවලං තුළ දැලියෝ (කැරපොත්තන් වැනි ඊට කුඩා සතුන් වගයක්) රංචු පිටින් සිටියහ. ගෙයින් පිටත හැකරැල්ලෝ සහ කංකුණ්ඩෝ වූහ. ගෙවල්වල පිටතින් බිත්ති අයිනේ "තානකුරුං" නමින් හැදින්වුණු කුඩා සතුන් වගයක් සැඟවී උන්හ. මොවුන් *නන්දා මාලිනී* ශිල්පිනියගේ ගීයක සඳහන් *'බිංකුණ්ඩෝ'* විය හැකිය. *තෙල්කුඹි, කළුකුඹි, කුරෝ* සහ *කඩි* නිතර දක්නට ලැබිණි. ගෙවල් තුළට කඩියන් රංචු පැමිණීම වැළැක්වීමට ලිපේ අළු ටිකක් ඉසීමට පුළුවන.



ඇතින් තිබෙන වංගුව මහියංගණ පාරේ අමුතුකොළහින්නය. ඊට පහළින් ගොම්මණ තුළ පංසලය, ඇත කන්ද හරහා මැදිවක පාරය, කුඹුරුවල මැද ඉහළින් ම තිත්තවැල්දල්ල කුඹුර වේ

ගෙවල් දොරවල්

ගමේ ගෙවල් ප්‍රධාන කොටස් තුනකට බෙදීමට පුළුවන. උළු ගෙවල්, බෙලෙක් (ටකරන්) ගෙවල් හා පිදුරු ගෙවල් වශයෙනි. ගමේ පැරණි ම ගෙවල් (දහනවවන සියවසේ පමණ ඉදිකළා විය හැකිය.) සණ මැටි බිත්ති බැඳ සිංහල උළු සෙවිලි කොට ඉදිකර තිබිණි. ඒවා බොහොමයක් මැද මිදුල් සහිත විය. මැද මිදුල වටා එහා මෙහා යෑමට පිලක් ඉදිකර තිබිණි. හතර පැත්තේ මැද මිදුලට මුහුණ ලා දොරවල් තබා ඇති කාමර විය. පිටතින් ගෙදරට

ඇතුළු වූ විට විවෘත ශාලාවක් විය. අමුත්තන් පැමිණි විට වාඩිවීමට තිබුණේ මෙම ශාලාවයි. අවශ්‍ය විටක මේ ශාලාවේ වී කෙටීම පිණිස ශාලාව මැද ගිල්වන ලද ගල් පොත්තක් තිබිණි. මෙවැනි ගෙයක පවුල් දෙක තුනක් වුවත් පදිංචි ව සිටීමට ඉඩ තිබේ. එසේ සිටින විට, සමහර විට පිටංගනෙන් (පිට අංගනයෙන්) කාමරයක් දෙකක් ඉදි කර ගැනීමට ඉඩ තිබේ.

සහෝදරයින් කීප දෙනෙක් සිටින විට ඉන් කෙනෙක් දෙන්නෙක් වෙන ඉඩමක නිවසක් ඉදිකර ගැනීමට ඉඩ තිබේ. මෙසේ මුල් ගෙදරින් බැහැර ව ඉදිකර ගත් දෙවෙනි පරම්පරාවේ ගෙවල් බොහොමයක් ම මැටි බදාමෙන්, කළුගලෙන් බිත්ති බැඳ බෙලෙක් තහඩු සෙවිලි කළ ඒවාය. විසිවන සියවසේ ඉදිකරන ලද මේ ගෙවල්, වතුකරයේ බංගලාවල සහ ලයින් ගෙවල්වල රටාව අනුගමනය කිරීම නිසා, බෙලෙක් තහඩු භාවිතා කළා විය හැකිය. මේ ගෙවල්වල මැද මිදුල් නැත. වහලේ තහඩු සවිකර තිබෙන්නේ "ගෙඩි ලී" වලටයි. උළුවලට මෙන් පරාල අවශ්‍ය නොවීය. වහලයේ බාල්ක හැඩට කපා ගත්තේ වෑයෙන්ය. කියතෙන් ඉරාගැනීම අනවශ්‍යය. මෙම ගෙවල් කාමර දෙකකින් හා ඉස්තෝප්පුවකින් යුක්ත විය. ගේ ඉදිරිපස දොරටුවෙන් ඉස්තෝප්පුවට ඇතුළු වී කාමරවලට පිවිසිය හැකිය. එක කාමරයක් මුළුතැන්ගෙය හැටියට පාවිච්චි කළහ. එවිට ඒ කාමරයෙන් ඉස්තෝප්පුවට විරුද්ධ පැත්තෙන් තවත් දොරක් තබා ගත්හ. වෙන ම මුළුතැන්ගෙයක් ඉදිකර ගත් විට ඒ දොර ප්‍රයෝජනවත් වේ. මේ දෙවෙනි වර්ගයේ ගෙවල්ය. පළමු වර්ගය උළු ගෙවල්ය (මහගෙවල්). බිත්ති කටුමැටි ගසා, ඉලුක් හෝ පිදුරු සෙවිලි කළ වහල සහිත ගෙවල් තුන්වෙනි වර්ගයයි. මේවායේ කාමර එකකි. මුළුතැන්ගෙය ද නිදන කාමරය ද එයමයි. ඉදිරිපසින් කුඩා ඉස්තෝප්පුවක් තිබේ. පිරිමි දරුවන් වැඩිමහල් වන විට රෑ නිදා ගැනීමට ගමේ ඉඩ තිබෙන (ලොකු ඉස්තෝප්පුවක් තිබෙන) ගෙයකට ගියහ. නැත්නම් තවත් කුඩා නිවසක් ඉදිකර ගත්හ.

ගොවි හා වෙනත් උපකරණ

කුඹුරු වැඩ කිරීමට භාවිතා කළ උපකරණ කිහිපයක් විය. *සිංහල උදැල්ල, නඟුල, වීය ගහ, මඩ පෝරුව, කැට පෝරුව, බැත පෝරුව, උකුණු ගහ, බෝලත්ත, කැත්ත, දෑ කැත්ත, කුරහන් කැත්ත* යනාදියයි. ගමේ කම්මල්කරු ලවා උදැල්ල සාදවා ගත්හ. ඒ සඳහා යකඩ කැල්ලක් දිය යුතු විය. නියම ක්‍රමයට උදැල්ල තලා ගැනීමට දිනක්, දෙකක් ගත විය. *කැනි, පිහිය* ආදිය ද කම්හල්කරු විසින් සාදා දෙන ලදී. *නඟුලක* බිම හාන පැත්තට සවිකරන හීවල ද යකඩෙන් නිමකර තිබේ.

නඟුල සඳහා නැමුණු කොටයක්, *නිමුණට* අවශ්‍ය නැමුණු ලීයක්, (නඟුල් ලීය,) විය ගහට අවශ්‍ය කොටයක් යනාදිය කැලයෙන් කපා ගත්හ. පළපුරුදු කෙනෙකු ලවා මේවා නියම ප්‍රමාණයට නිමවා ගත්හ. හාන විට නඟුල අල්ලා ගෙන යෑමට සවිකරන නැමුණු ලීය *නිමුණයි*. නිමුණේ මුදුනට නිමුන් කුරුල්ලෙකු සවිකළ යුතු වේ. ඒ සඳහා සුදුසු ලී කෑල්ලක් හෝ මී අං කෑල්ලක් ගත්හ. මී හරක් ඈඳා ගැනීමට සහ වියගහ බැඳ ගැනීමට "බාන්" අඹරා ගත යුතුය. ගම අවට ඇති ගස්වැල්වලින් ලබා ගන්නා පට්ටාවලින් බාන් අඹරා ගත්හ. (කොහු ලණු පාවිච්චි කළේ නැත) නඟුල් ලීය වියගහට අමුණා ගැනීමට හයිය ඇති වැල් ජාතියකින් "අමුතු බාන්" සාදා ගනිති.

කුඹුර පෝරු ගෑමට යොදා ගන්නා පෝරුව අඟල් දෙකක් පමණ ඝනකම, අඟල් පහළොවක් පමණ පළල අඩි තුනක් පමණ දිග ලෑල්ලකින් නිමකර ගත්හ. අල්ලා ගෙන යෑමට ලී දෙකක් හා මිටක් සවිකර තිබේ. වියගහට සම්බන්ධ කිරීමට නඟුල් ලීයක් අවශ්‍ය වේ. කැට පෝරුව හා බැත පෝරුව එක සමානය. සුදුසු ප්‍රමාණයේ ලෑලි කෑල්ලක් මැදින් විද දිග මිටක් සවිකර ගත්විට පෝරුවක් නිමවේ. කමතේ පාගන ගොයම් කොළ වැඩට "උකුණු ගහක්" අවශ්‍යය. අඩි හතරක් පමණ දිග, එක කොනක නැම්මක් ඇති ලීයක් මේ සඳහා කපා ගත්හ. වරව් අතු කපා වියලා කොළ ඉවත් කර බැඳගත් වරව් අතු මිටිය *"බෝල්ලන්තයි"* කමත අතුගෑමට මෙය උවමනාය. ගෙවල්, මිදුල් අතුගාන්නේ ද බෝලත්තෙනි. හේන් කෙටීමට කැත්තක් අවශ්‍ය වේ. ගමේ කම්මලෙන් කැතිතලය සාදවා ගෙන හයිය ඇති දිග මිටක් සවිකර ගත යුතු වේ. පෙරොවක් අවශ්‍ය වන්නේ කලාතුරකිනි. හේනක කුඹුරක (පස පෙරළීම) ඉලිප්පීමට රට උදැල්ලක් අවශ්‍යය. මේ සඳහා බෙහෙවින් ම ගන්නේ 7X10 උදළුය. මේ උදළු හා පෙරෝතල කඩයකින් මිල දී ගත යුතු විය.

හේනක කුරහන් කපා ඉතිරි වන කුරහන් ගස් අහුරක් පමණ එකට බැඳ ඉලපත් සාදා ගත්හ. ගෙවල් අතුගෑවේ මේ ඉලපත්වලිනි. කොහු ඉදල් භාවිතාවක් නොවීය. බැත පෙළීම, හුළං ඇල්ලීම, කුරහන් පොළා ගැනීම, වී හාල් පොළා ගැනීම ආදියට කුල්ලක් අවශ්‍ය විය. මේවා බට පතුරුවලින් වියා තිබිණි. බොහෝ ගෙවල්වල ඉණිමගක්, කෙක්කක් තිබිණි. හේනේ කුඹුරේ වැඩට යන විට මෙන් ම ගෙවල්වල භාවිතාවට ද සෙම්බුව, සෙම්බු මුට්ටිය, භාවිතා කළහ. ලබු ගෙඩියක් ද වතුර ගෙන යාමට ප්‍රයෝජනවත් විය. මුළුතැන්ගේ සඳහා මුට්ටි, හැලි, අප්පල්ලා (හට්ටි), මඩක්කු, නැඹිලි, කොරහ, ඇතිලි යනාදිය යම් යම් ප්‍රමාණවලින් හැම ගෙයක ම තිබිණි. ගෘහ භාණ්ඩ (ඇඳ, පුටු, මේස) තිබුණේ අල්ප වශයෙනි. ගෙදර පත්තුකරන ලාම්පු බෙලෙක්වලින් සාදා තිබුණි. ඒවා බිත්තියක ඇණයක් ගසා එල්ලීමට පුළුවන් විය. සමහර ගෙවල්වල චිමිනි ලාම්පු තිබිණි. රාත්‍රියේ ගමන් බිමන් යෑමට හා කමත්වල වැඩට ලන්තෑරුමක් තිබිණි.

නිදා ගැනීමට පැදුරු කොට්ටා තිබිණි. පැදුරු වියා ගැනීමට *ගල්ලැහ, හැවන්, වැටකේ* වැනි දේ භාවිතා කළහ. මේවා කුඹුරුවල වැට අයින්වල වවාගත්හ. පමණට වැඩුණු පසු කපා වේලා පැදුරු විවීමට ගත්හ. වඩා සුවදායක *ගල්ලැහ (පන්)* පැදුරුය. වී වේලා ගැනීමට *හැවැන්* හා *වැටකේ* පැදුරු භාවිතා කළහ. ගෙවතුවල කොට්ට ගස් වැවුණ නිසා, *කොට්ට ගෙඩිවල පුළුන්* කොට්ටවලට භාවිතා කළහ. කෙසෙල් කොළ එලා ආහාර ගැනීමට තට්ටු පාවිච්චි කළහ. මෙම තට්ටු, වට්ටි, පෙට්ටි ආදිය වියා ගත්තේ ද *වැටකේ, හැවැන්* හා *ගල්ලැහැවලිනි*. ධාන්‍ය වර්ග දමා ගැනීමට පෙට්ටි අවශ්‍යය. යමක් වේලා ගැනීමට වට්ටි භාවිතා කළහ. මෙම තට්ටු වියා තිබුණේ *හැවැන්* හෝ *ගල්ලැහැවලිනි*. කුඹුරු වැඩ සමයේ දී වැඩට එන අයට කෑම දීමට භාවිතා කළේ තට්ටුය. එවැනි අවස්ථාවල වතුර බීමට දෙන ලද්දේ හොඳින් හූරා ශුද්ධ කළ *පොල්කටුවලය*. ගෙදර දී පාවිච්චියට *බෙලෙක් කෝප්ප* හා *බෙලෙක් පිඟන්* කීපයක් හැම නිවසක ම තිබිණි. සමහර ගෙවල ගෘහ මූලිකයන් ආහාර ගත්තේ *පිත්තල තැටිවලය*. තැටිය තබා ගැනීමට ගෙඩි ලී එකතු කොට වේවැල්වලින් වියන ලද *"පුටු"* භාවිතා කළහ. ගෙවල් තුළ දී වාඩිවීමට ගත්තේ කොළොම්බුය. ලී කොටවලින් කපා සාදා ගන්නා කොළොම්බු මිටි බංකුවක් වැනිය. කෑම කෑමෙන් පසු වතුර *"බුන්නේ"* (බීවේ) *සෙම්බුවකින්* හෝ *සෙම්බු මුට්ටියකිනි*. වැඩිහිටි සමහර දෙනෙක් සෙම්බුව උස්සා කටට වතුර වත්කර ගත්හ. කටේ තියා බොන්නේ නැත. කුඩා අයට බෙලෙක් කෝප්පයකට හෝ පොල් කට්ටකට වතුර වත්කර දුන්හ. බුලත් කෑමට උවමනා කළමනා තැබීමට *පිත්තල බුලත් තට්ටුවක් (ඉලන් තට්ටුවක්)* තිබිණි. පිත්තල බුලත් තට්ටුවක් නොවී නම්, පන් ආදියකින් වියූ තට්ටුවක් භාවිතා කළහ.

ගම්වැසියන්ගේ ජීවනෝපාය

ගම්වැසියන්ගේ රැකියාව වූයේ හේන්, කුඹුරු ගොවිතැනයි. ඉඩකඩම් නොතිබූවන් කුලී වැඩක නිරත වූහ. ගොවිතැන් කටයුතු නැති අවස්ථාවල ඉඩකඩම් ඇති අය ද සමහරෙක් කුලී වැඩෙහි යෙදුණෝය. ගම් මුලාදැනිවරයා සහ වෙල් මුලාදැනිවරයා හැර වෙන කිසිවෙක් රජයේ රැකියාවල නිරත ව සිටියේ නැත. එවකට **"ප්‍රාරම්භය"** (අටවෙනි පන්තිය) සමත් වී සිටි එක ම තරුණයා මහියංගනේ (බිංතැන්නේ) රටේ මහත්තයාගේ ලිපිකරු ලෙස සේවයට ගොස් සිටියේය.

(අ) කුඹුරු ගොවිතැන

කුඹුරු ගොවිතැන කන්න දෙකක් විය. වැස්ස වැඩි කාලය මාස් කන්නයයි. වැස්ස අඩු වියළි කාලය යල් කන්නයයි. ගමේ හැම කුඹුරක් ම මාස් කන්නයට වැඩ කළ නමුත් යල් කන්නයට වැඩ කළේ "මඩ කුඹුරු" පමණයි. යල් කන්නයේ දී වැඩ නොකරන කුඹුරු සමහරක එළවළු වගා කළහ.

අවුරුදු පතා වෙල්යාය ගොවිතැනට සූදානම් කිරීම ගොවීන්ගේ වගකීමකි. ඒ කාර්යය නිසියාකාර ව ඉටුවනවා දැ'යි සොයා බැලීමට වෙල්මුලාදෑනි කෙනෙක් රජය විසින් පත්කර සිටියේය. අමුණු නිසියාකාර ව බැඳගැනීම, කුඹුරුවල ඇල මාර්ග ශුද්ධ පවිත්‍ර කරවා ගැනීම වැනි ජල සැපයීමට අදාළ කරුණු මෙහෙයවීම "වෙල්මුලාදෑනි මහත්තයාගේ" වගකීමකි. මේ සඳහා ඔහුට රජයෙන් වැටුපක් ලැබුණේ නැත. ඒ වෙනුවට අස්වැන්න එකතු කර ගැනීමෙන් පසු අදාළ ගොවීන්ගෙන් වී ටිකක් එකතු කර ගත්තේය.

ගොවිතැන් වැඩ ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය කැති, උදළු, පිහියා ආදිය ගමේ කම්මල්කරු ලවා සාදවා ගත්හ. මේ සඳහා අවශ්‍ය යකඩ තිබෙන අය කම්මකල්කරුට දෙති. නැති අයට කම්මල්කරුගෙන් යකඩ කැලි ලබා ගැනීමට සිදුවේ. වෙනත් ගොවි උපකරණ ද සූදානම් කර තබා ගැනීම අවශ්‍ය වේ. *නඟුල්, වියගස්, බාන්, අමුතු බාන්, කෙව්ටි, මඩ පෝරු, කැටපෝරු* යනාදිය මේවාට ඇතුළත් වේ. *උකුණු ගස්, බැත පෝරු, බෝලතු* අවශ්‍ය වන්නේ *කොළදින්* (ගොයම් කපන) කාලයටයි.

ඉන්පසුව කුඹුර සීසෑමට සූදානම් කළ යුතුය. වනාත කපා ශුද්ධ කළ යුතුය. එසේ එකතුවන කොළ පොහොර වීමට ලියදිවලට දැමූහ. ගත වූ කන්නයේ දී නියරවල කපා තිබූ වක්කඩ ඇහිරිය යුතුය. එසේ සූදානම් කළ කුඹුරට ඇල මාර්ගවලින් වතුර හරවති. ලියදි හොඳින් පෙඟෙන්නට වතුර අවශ්‍ය වේ. දින කීපයකට පසුව *බිං නැංගුම* (සීසෑම) සිදු කෙරේ. හීයට මීහරක් බාන් (ජෝඩු) කීයක් අවශ්‍ය දැ'යි තීරණය වන්නේ කුඹුරේ වපසරිය අනුවයි.

වී පැලක (බුසලක/අක්කර භාගයක) කුඹුරක් හෑමට මීහරක් බානක් අවශ්‍යය. මේ ගමේ සීසෑමට යොදා ගත්තේ මී හරක් පමණයි. (එළහරක් නොවේ) කුඹුරේ පහළ ලියැද්දේ සිට ක්‍රමයෙන් ඉහළට සීසානු ලැබේ. මුලින් හාන ලියද්දේ නියර බැඳ ඉහළ ලියැද්දේ වතුර පහළට හරවන නිසා ජල නාස්තිය අල්ප වේ.

සීසෑමෙන් පසුව කුඹුරක් වපුරන්නේ සති දෙක තුනකට පසුවය. කුඹුරේ තිබුණ වල් තණකොළ සහ යොදන කොළ වේ නම්, ඒවා දිරාපත් වී මඩ සමඟ නිසියාකාර ව මුසු වීමට කල් ගතවන නිසාය. මේ යුගයේ

වී වැපිරීම මිස තවාන් කර පැල සිටවීමක් සිදු නොවීය. වැපිරීමට දින කීපයකට පෙර බිත්තර වී දියළා ගත්හ. ලොකු හැළිවලං මේ සඳහා භාවිතා කළහ. සමහරෙක් බෙලෙක් කොරොස් (දරුවන් නෑවීමට ගත් භාජන) භාවිතා කළහ. දින දෙකකට පසු වතුර පෙරා දමා, ගෙදර මුල්ලක අතුරන හබරල, කෙසෙල් ආදී කොළ වර්ගයක් මත පොඟවා ගත් බිත්තර වී *යාන් කළහ.* උඩින් තවත් කොළ ජාතියකින් වසා ඊට උඩින් පරණ ගෝනියක් හෝ පැදුරක් එළා බර පටවති. එසේ දින තුනක් පමණ ගතවූ විට මුල් ඇදී එකට බැඳී පවතී. මෙම පැළමුල් එකිනෙකින් වෙන් වන තෙක් *යාන් කර,* වැපිරීමට ගත්හ.

වපුරන දවසේ ලියදි හොඳින් මඩකර ගත යුතු වේ. මෙය කරන්නේ *පෝරුගෑමෙනි.* මී හරක් බානක් යොදා ගෙන මඩ පෝරුවකින් හෝ නඟුලකින් පෝරුගෑමට පුළුවන. ලියදිවල මඩ ගතිය අඩු නම්, පළමුවෙන් නඟුලෙන් හාන්නට සිදු වේ. පෝරු ගාන්නට පුළුවන් ඉන් පසුවයි. පෝරු ගා අවසන් වන ලියද්ද, කැටගොඩවල් හා වලවල් නැති වන ලෙස, "උදැල්ලන්" කළහ. ලියද්දේ වතුර මුළුමනින් ම බැස යන ලෙස වක්කඩ කපා *කැට පෝරුවකින්* ද සමතලා කරනු ලැබේ. මින් පසුව පළපුරුදු ගොවියකු විසින් *වප් පෙට්ටියකට* දමා ගත් පැළමුල් ඉසිනු ලැබේ. කුඹුරක් වපුරන්නේ ඉහළ ම ලියද්දේ සිට පහළටයි.

වපුරන ලද පැළමුල් බේරා ගැනීම සඳහා දින කීපයක් කුරුල්ලන් එළවීමට සිදුවේ. කුරුල්ලන්ගෙන් හානි වන්නේ උදේ සහ සවස නියමිත වේලාවටයි. තද අව්ව වේලාවට කුරුල්ලන්ගෙන් හානියක් නැත. ගොයම් පැළය අඟලක් හමාරක් වැවුණු විට *වක්කඩ* අහුරා *'ඉස්නන්'* බැඳ වතුර හරවති. ඉන්පසු කුරුල්ලන්ගෙන් හානියක් නැත.

කුඹුරක් වපුරා සති තුනක් පමණ වූ විට (මාසයකට පෙර), *ගොයම් නෙළති.* ගෙවිලියෝ ලියදිවල පැළ වැඩි තැන්වලින් සමහරක් ගලවා පාළු තැන්වල සිටවති. ඒ අතර ම, වල් පැළෑටි ගලවා දමති. නෙළුම හමාර වූ පසු, ලියදිවලට හොඳට වතුර හරවා තබනු ලැබේ. ගොයම් නෙළන ලන්දු නොයෙක් සී පද කියමින් ඒ කාර්යයේ නිරත වූහ.

නිතිපතා නියර දිගේ ඇවිද, කක්කුටු ගුල් ආදිය නිසා වතුර වැදීම වළකී නම්, ඒ හිල් වසා දැමිය යුතු වේ. වපුරන ලද වී බාල ද නැද්ද යන්න අනුව, කරල් කිරි වැදීමට මාස දෙක තුනක් ගත වේ. කරල් පැහෙන කාලයේ දී නැවතත් කුරුල්ලන් එළවීමට සිදුවේ. මේ සඳහා සමහර කුඹුරුවල *දඬුහොල්මන්* සවි කරති. පුරුක් දෙකක උණ බටයක කොනක් ඇදේට කපා බටේ තුළට වතුර පිරීමට වක්කඩයකට මානා තබයි. ඒ පැත්තට වතුර පිරි බටය පහළ ගොස් වතුර හිස් වී නැවත උඩ යන විට, අනික් පැත්ත ගලක වැදීමට සලස්වා තිබේ. එමගින් නඟන ශබ්දය නිසා කුරුල්ලෝ බිය වී ඉගිලී

යති. බාල වී කුඹුරු සිංහල අවුරුද්දට පෙර *කොළදින්* (ගොයම් කපා පාගා ගැනීම) කළහ. අනික් කුඹුරු අවුරුද්දෙන් පසුව වෙසක් මහ තෙක් කොළදින් කළෝය.

කුඹුරක ගොයම් කැපීමට (කොළදීමට) පෙර *කමනක්* කොටා ගත යුතු වේ. සමහර කුඹුරුවල ස්ථිර *කමන්* තිබේ. ඒවා උදළු ගාගෙන, මැටි ගොම ගා සකස් කර ගත්හ. එසේ නැති කුඹුරුවල, ලොකු ලියද්දක *කමනකට* ප්‍රමාණවත් වටයක ගොයම් කපා පසෙක තබා *කමන* හදාගත්හ. *කමනට* පිටින් එයට මූණ ලා කුඩා පැල් කොටයක් අටවා ගැනීම සිරිතය. එහි මුදුන පිරිමීඩයක් වැන්න. එක පැත්තකින් පැළට ඇතුළු වීමට විවරයක් තිබේ. අනික් පැත්තට බෑවුම් වන සේ සිටවූ කෝටු මතට කොළදීමෙන් පසුව ලැබෙන පිදුරු සෙවිල්ලති.

ගොයම් කපන්නේ පිරිමින්ය. මේ සඳහා *දෑකැනි* අවශ්‍යය. ඒවා ද කම්මල්කරු ලවා සාදවා ගත්හ. කපා දමා යන *උස්පිඩි* ගෙවිලියන් විසින් එකතු කර, උසුලා ගෙන යාහැකි තරම් මිටි කොළ ලණුවලින් බැඳ ගෙන ගොස් කමතට ලති. මෙය *කොළ බැඳීමයි.* කොළ මුදුන් කිරීමට පෙර කමතේ මැද අළුවලින් රටාවකට කවයක් *(කෝලමක්)* ඇඳ ගත්හ. *නොලබෝ* කොළයකින් සාදා ගත් *හුම්මණ්ඩියක්* (දරණුවක්) මත *අරක්ගලක්* (බෝලගලක්), හක්ගෙඩියක් වැනි දේ තැන්පත් කළහ. කොළ මුදුන් කරන්නේ මේවා මතය. කොළ වැඩ කිරීමට *උකුණුගස්* යොදා ගත්හ.

කොළ මඩවන්නේ (පාගන්නේ) වැඩියෙන් ම රෑ කාලයේ දී ය. පැගීමට තිබෙන කොළයේ (ගොයම් කොළේ) ප්‍රමාණය අනුව, මී හරක් කීපදෙනෙක් බාන් කර (එකට ඇඳා) කොළ පැගීමට දැමූහ. මී හරක් කමතේ වටේ යමින් මුදුන් කළ කොළය පාගති. පිරමීඩයක් සේ මුදුන් කර තිබූ කොළය මත මී හරක් ඇවිදීම නිසා, එය කමතේ සමතලා වීමට පටන් ගනී. එවිට කොළ වැඩ කරන පිරිමි *උකුණු ගස්වලින්* නැවත නැවතත් කොළ මුදුන් කරති. යම් කිසි පමණකට කොළය පැගුණ විට, කොළය කඩා කමත වටේ වැටියක් සේ දමා කමතේ මැද පාදා ගත්හ. වී කරල් එළවී වෙන්වුණු බැත (වී) එහි දක්නට ලැබේ. මී හරක් පසකට කර නැවත වටට දමා තිබෙන කොළය කමත මැදට මුදුන් කරති. යම් පමණකට කමත මැද කොළයෙන් පිරෙන විට, නැවතත් මී හරක් ඒ මතට දක්කා කොළ පැගීමට සලස්වති. මේ ආකාරයට වී කරල්වල වී ඇට හොඳින් *එළවෙන* තුරු තුන්වතාවක් පමණ කොළය කැඩීම හා මුදුන් කිරීම කළහ. වී කරල් හොඳින් පැගුණ විට පිදුරු කමතෙන් පිටට *උකුණු ගස්වලින්* විසිකළහ. නැවතත් ක්‍රමයෙන් බැත පැදී කමත පිදුරුවලින් හිස් වේ. මේ ක්‍රියාවලිය අවසන් වන විට රෑ පහන් වී හමාරය. සමහරවිට, ඉර නඟින තුරු ද කොළ පැගීම අවසන් නොවන අවස්ථා ද තිබේ. කොළ වැඩට මිනිසුන් කීදෙනෙක් කැඳවා ගන්නවා ද,

යන්න පැහීමට ඇති කොළයේ ප්‍රමාණය අනුව තීරණය වේ. කොළ වැඩ කරන ගොවීන්ට ආහාරපාන සැපයීම කොළපැහීම හිමි ගොවියාගේ යුතුකම වේ. ප්‍රධාන ආහාර වේලට අතිරේක ව මැදියම් රෑයේ දී *ප්‍රස්නාඹු* වැනි රස කැවිල්ලක් සමඟ *කොත්තමල්ලි එතුර* වැනි යමක් පානයට දුන්හ.

කමතේ තිබෙන *බැත* (වී) හොඳින් වේලා ගත යුතු වේ. ඒවා කමත පුරා වනා ගැනීමට *බැත පෝරුවක්* යොදා ගත්හ. නැවත එකතු කර ගොඩ ගසා ගැනීමට *බැත පෝරුව* මෙන් ම *බෝල්ලන්න* ද අවශ්‍ය ය. වටේට විසිරී තිබෙන බැත කමත මැදට වන සේ හොඳින් අතුගා ගන්නේ *බෝල්ලන්නෙනි.* බැතේ තිබෙන *කාටු* (කොළේ පාගන විට මී හරක් කුරවලට පැහී කැඩී තිබෙන ගොයම් රොඩු), බොල් ආදිය ඉවත් කර ගත යුතු වේ.

කුල්ලෙන් පොලා හෝ සුළඟට අල්ලා මේ අපද්‍රව්‍ය ඉවත් කරති. හොඳින් වේලා පොලා ගත් බැත මැන, පෙට්ටිවලට හෝ ගෝනිවලට පුරවා නිවෙස් කරා ගෙන යති. බැත මැනීමට *කාර්තු* හා *ලාස්* යොදා ගනිති. වෙල් මුලාදෑනියාගේ පංගුව වෙන් කර දෙන්නේ කමතේ දී බැත මණින විටය. නිසියාකාර ව පැසුණු ගොයම්වලින් පාගා ගන්නා වී ප්‍රමාණයක් ඊළඟ කන්නයේ බිත්තර වී වශයෙන් ගැනීමට හොඳින් වේලා වෙන්කර තබා ගත්හ. ඉතිරි වී ආහාරයට ගැනීමට, අටුවක් තිබේ නම්, එයට දමා තබා ගත්හ. කමතෙන් ඉවත් කළ පිදුරු, වහළ සෙවිලි කිරීමට හෝ හරකුන්ට කෑමට හෝ අවශ්‍ය කෙනෙක් විසින්, හොඳින් වේලා *කැරළි* (මිටි) බැඳ ගෙදරවලට ගෙනැවිත් ගොඩ ගසා තබා ගත්හ. එවැනි අවශ්‍යතාවක් නැත්නම්, ඒ පිදුරු කුඹුරේ ම දිරා යෑමට හරිති. ඉන් පසුව ඒවා කුඹුරට පොහොර වශයෙන් යොදා ගත්හ.

වැස්ස අඩු යල් කන්නයේ දී වෙල්යායේ මඩ කුඹුරු පමණක් වී වගාව සඳහා යොදා ගත්හ. එසේ වැඩ නොකරන කුඹුරු සමහරක තක්කාලි (ගොරක වර්ගය), *බෝංචි* (පතුරු), *නෝකෝල්, රාබු* වැනි එළවළු වගා කළහ. මේවා බෙහෙවින් ම විකිණීම පිණිසය. මේ කන්නයේ ද *"යල් වැහි"* (පොද වැස්ස) විටින් විට වැටෙන නිසා, එළවළු වගාවට වතුර දැමීම අවශ්‍ය වන්නේ මුල් අල්ලා ගන්නා තුරු දින දෙක තුනක් පමණයි. එළවළු අස්වැන්න නෙළා ගන්නා කාලයේ ඒවා මිල දී ගැනීමට මහපාරේ හෝ කඩපලේ නියමිත තැන්වලට වෙළෙන්දෝ පැමිණියහ. තක්කාලි *පකිස්* පෙට්ටිවල අසුරා ලොරිවලට බාර දුන් පසු, මහනුවර වැනි වෙළඳපලවලට ගෙන ගියහ. බෝංචි, නෝකෝල් වැනි එළවළු ගෝනිවල අසුරා යැවූහ. මෙසේ එළවළු වැවීමෙන් යම්කිසි මුදල් ආදායමක් ලැබුණ අතර, එළවළු කොටසක් තම තමන්ගේ ආහාරයට ද ගත්හ. කඩවල්වලින් එළවළු මිලට ගන්නේ ඉතා ම කලාතුරකිනි.

(අ) හේන් ගොවිතැන

ගම අවට ලඳු කැලෑවල හේන් කෙටූහ. සමහර විට ඈත මූකලාන් කැලෑවල හේන් කෙටීමට ද කීප දෙනෙක් ගියහ. හේන් කෙටීමට කැත්තක් අවශ්‍යය. ගමේ කම්මලෙන් කැත්තක් සාදවා ගෙන ප්‍රමාණවත් දිගට මිටක් සවිකර ගත්හ. ශුභ නැකතක් බලා හේන කෙටීම ආරම්භ කළහ. ජූලි මාසයේ අග දී පමණ හේන කෙටීම ආරම්භ කර, කපා දැමූ ගස්කොළන් හොඳින් වේළුණු පසු ගිනිතැබීම සිදුකළහ. හේනක් ගිනිතියන්නට පෙර කැලෑව තුළ සිටිය හැකි සතා සිව්පාවා එළවා දැමූහ. හේන ගිනිතිබ්බේ නැකත් වෙලාවකටයි. ගින්නෙන් පසුව ඉතිරිවන කොටන් හා අතු, හේනේ වැට කඩුලු බැඳීමට යොදා ගත්හ. සෑම හේනක ම පැලක් සාදා ගත්හ. ඈත මූකලාන් හේන්වල පැල තාවකාලික නිවසක් වේ. ගම අවට හේන්වල මුල් වාරයේ මිරිස් වැවීම සාමාන්‍ය සිරිතය. වැටකොළු, ලබු, පුහුල්, වට්ටක්කා, තියඹරා, කැකිරි වැනි ඇට ජාති සිටවූහ (වැපුරූහ). ඒවායේ වැල් ඇදෙන විට, කණුමුදු දිගේ ඉහළට යාන් වීමට සැලැස්වූහ. දඹල ජාති (දලුක් දඹල, හාල් මැස්සන් දඹල) බටු, බණ්ඩක්කා, තක්කාලි, රාබු වැනි එළවළු වර්ග තැනින් තැන සිටවූහ. එමෙන් ම, ඉරිඟු ඇට ද සිටවූහ. ඉරිඟු ගස් ලොකු වන විට, ඒවායේ ද වැල් ජාති යාන් කළහ. මුලින් පලගන්නා අමු මිරිස් විකුණන නමුත්, හේන් වාරය අවසානය කිට්ටුව පලගන්නා මිරිස් ඉදෙන්නට හැර, තම ගෙදරවල අවශ්‍යතාවට වියලා ගත්හ. හේනේ වවන වෙනත් බෝග ජාති බෙහෙවින් ම තම තමන්ගේ ආහාරය සඳහා විය. වැඩිපුර තිබුණ විට විකුණා ගත්හ. හේනක වවාගන්නා දුංකොළ වියළා තබා ගෙන බුලත් විටට හෝ දුම්බීමට ගත්හ. තම ගෙදර අවශ්‍යතාව සඳහා රතුඑැණු පාත්ති කිහිපයක් වගා කර ගත්හ. මේ සඳහා දිනපතා ජලය අවශ්‍ය නිසා, මේවා වගා කළේ කුඹුරුවල (කමතේ) හෝ දියපාරක් අසල වූ හේනකය. ලූණුකොළ ආහාරයට ගන්නා නමුත් අල එරීමට (බැසීමට) ඇරීම සාමාන්‍ය සිරිත විය.

මාස් කන්නයේ දී එළවළු වගා කළ හේන එළඹෙන යල්කන්නයේ දී කුරහන් ඉසීමට යොදා ගත්හ. කුරහන් සමඟ උඳු, මුං හා අබ ටිකක් ද මිශ්‍ර කර ඉහිති. තැනින් තැන ඉරිඟු ඇට ද සිටවූහ. ඉරිඟු ගස් වැඩෙන විට ඒවා දිගේ ඉහළට යාන් වීමට මෑකරල් සිටවූහ. මූකළාන්වල කෙටූ හේන්වල කුරහන්, ඉරිඟු, කැකිරි, වට්ටක්කා, පුහුල්, තියඹරා, ලබු, වැටකොළු, උඳු, මුං, ආදිය වගා කළහ. කුරහන් හේන්වල පැළ ජාති වැඩී ගෙන එන විට, ආහාරයට ගත හැකි නොයෙක් පළා ජාති ඉඹේට ම වැඩේ. ඒ නිසා, මුල් මාසය හමාර ගත වූ පසු කෑමට දේ හිඟ නොවේ. විශේෂයෙන් ම, ඉරිඟු පළගත් පසු, කිරි ඉරිඟු කාලයේ සිට කරල් මෝරා පැහෙන තුරු, ඒවා හේනේ පැල රකින ගොවීන්ගේ ප්‍රධාන ආහාරයක් කර ගත්හ. ඉරිඟු කරල් පැහී වේලුනාට පසුව ඒවා ගස්වලින් කඩා ගෙන, හණසු තිබිය දී ම එකට

ගැටගසා එල්ලා තබති. අවශ්‍ය වූ විට කරල් එළකර ඉරිඟු ඇට, කුමන හෝ ආකාරයකට ආහාරයට ගැනීමට සකස් කර ගත්හ. ඉරිඟු කොටා ගත් විට පිටිවලින් රොටි හා තලප ද නොකෙටී ඉතිරි වන කැලිවලින් ඉරිඟු බත් ද උයා ගනිති. ඉරිඟු බත් උයද්දී මෑකරල් ඇට ටිකක් කලවම් කළ විට, ඉතා රසවත් ආහාරයක් ලැබේ.

කුරහන් පැසුණු විට (කුඹුරක කමතක් මෙන්) මැඩිල්ලක් කොටා ගත යුතු වේ. ඒවායේ ඇති මැටි, වැලි තද කර ගන්නේ තාප්ප මෝලකින් තැලීමෙනි. අඟල් අටක් දිග හතරක් පළල, තුනක්/හතරක් ඝනකම ඇති ලී කොටයක පැතලි පැත්තක මැද අඟල් 1 × 1/2 පමණ කුහරයක් සාදා, එයට අඩි හතරක් පහක් උස ලීයකින් මිටක් සවිකර ගත්හ. මෙය *තාප්ප මෝල* යි. එසේ තළා තදවුණු මැඩිල්ල තුළ කුරහන් තලා ගනිති. පැසුණු කුරහන් කරල් කපන්නේ ගෙවිලියන් විසිනි. මේ සඳහා *"කුරහන් කැනි"* (කුඩා ප්‍රමාණයේ දෑකැති වැනි) භාවිතා කළහ. කුරහන් කපන ගෙවිලියන්ට දිවා ආහාරය සඳහා බෙහෝ විට *'"දොහොයි"* (තෝසේ) උයා ගත්හ. කුරහන් කැපිල්ල තිබෙන හේන අයිතිකරු පාන්දරින් අවදි ව *"දොහොයි"* උයාගනී. බොහෝ ගෙවල්වල මැටියෙන් නිම කළ දොහොයි ගල් තිබිණි.

කපාගත් කුරහන් කරල් *මැඩිල්ලට* දමා හොඳින් අව්වේ වේලාගත්හ. ඉන්පසු ඒවා මැඩිල්ලේ මැදට එක්කාසු කර, පිරිමි කීපදෙනෙක් වට වී ඒවා තැළූහ. කුරහන් තැළීමට මහත පොලු සාදා ගත්හ. පොල්ලේ එක පැත්තක් සීරුවෙන් අත් දෙකින් ම අල්ලා ගැනීමට හැකි වන සේ හැඩකර ගත්හ. මේ පොල්ල, දෑත බදා ඉහවට කරකවා කුරහන් කරල් මත පතිත කිරීමෙන් කරල්වල ඇති කුරහන් ඇට එළවී වැටේ. ඉන් පසුව රොඩ්ඩ බේරා ඉවත් කළහ. එවිට මැඩිල්ලේ ඉතුරු වන්නේ කුරහන් ඇට පමණයි. මේ කුරහන් හෙළින් වේලා ගත යුතු වේ. තෙතමනය තිබුණොත් කල් තබා ගැනීමට බැරි නිසාය. වේලා ගත් කුරහන් පොලා, ගල්වැලි ඉවත් කර, ගෝනිවල හෝ පෙට්ටිවල දමා තබා ගත්හ. ඈත මූකලානක හේනක් කෙටූ කෙනෙකුට සෑහෙන අස්වැන්නක් (කුරහන්, ඉරිඟු, උඳු, මුං, වට්ටක්කා, කැකිරි ආදිය) ලැබුණොත්, ඒවා ගම්වලට ගෙන ඒමට මිනිසුන් කීපදෙනෙක් නැත්නම් තවලමක් සොයා ගත යුතු වේ. දෙපැත්තට සමබර වන සේ ගෝනි දෙකක බැඳි මලු, ගොනාගෙ පිටමත එලන ලද ගෝනි *හැනක්*(සෑදෑලය වැනි දෙයක්) මත තබා, ඒවා බිමට නොවැටෙන සේ සකසා ඇති පටිවලින් හා බාන්වලින් ගොනුගේ පිටට තදවන සේ බැඳගත්හ. ගොනුන් කීප දෙනෙකුගේ තවලමක් පාරේ යන විට උන්ගේ කර බැඳි සොකඩ හා මිණිගෙඩි නාදය සෑහෙන දුරකට ඇසේ. කඳුකර ගම් ප්‍රදේශවල අඩිපාරවල් ආදියේ ප්‍රවාහනය කළේ මෙවැනි තවලම්වලිනි.

(ඇ) කුලී වැඩ

හේන් කුඹුරු වැඩ නැති කාලයට ගම්වැසියන් සමහර දෙනෙක් මහ පාරේ හෝ තේ වත්තේ වැඩට ගියහ. හේන් කුඹුරු නැති අයගේ ආදායම් මාර්ගය වූයේ ද කුලී වැඩය. මහපාරේ වැඩ සුපරීක්ෂණය කළේ ද, වැඩ කරවන ලද්දේ ද, කඩපල අසල බංගලාවක පදිංචි ව සිටි *"ඕවර්සියල්"* (ඕවර්සියර්) මහතා විසිනි. වාර්ෂික ව අබණ්ඩ ව මහපාරේ පරණ වූ තැන් හා කැඩුණු බිඳුණු තැන් අලුත්වැඩියා කළහ. මේ සඳහා පළමුවෙන් ගල්කඩා රැස් කර තැබිය යුතුය. පාර අයිනේ කන්ද පැත්තේ තිබෙන ගල් මේ සඳහා කඩා ගත්හ.

මේ ගල්පරවල පළපුරුදු අය බෝර ගසති. මහත යකඩ (වානේ) කම්බියක් අඩි එකහමාරක් පමණ දිගට ගෙන, එක කොණක් (කම්මලේ දී) උල්කර ගත්හ. මේ ගල්කටුව ගල මත තබා හරව හරවා රාත්තල් හතරක පමණ මිටියකින් ගසමින් අඩියක් පමණ වන වලක් ගලේ හාරා ගත්හ. එසේ හාරා ගත් සිදුරට වෙඩි බෙහෙත් පුරවා, උඩින් පාන්කඩ වැනි යමක් දමා රාම රෝට්ටුවෙන් (රෑම්රොඩ්) වෙඩිල්ල හිර කර ගත්හ. සිදුරෙන් පිටත අඩියක් හමාරක් තබා වෙඩි නූල කපා දැමූ විට, ගල්වෙඩිල්ල පත්තු කිරීමට සුදානම්ය. ළඟ පහත සිටින මිනිසුන් ඇතට ගොස් "ගල්වෙඩි" "ගල්වෙඩි" කියා කීපවරක් කෑගසති. වෙඩිල්ල මහත් ශබ්දයක් නැඟුවහොත් එය පුස් වෙඩිල්ලක් වේ. ගල කැඩෙන වෙඩිල්ල එතරම් ශබ්ද නඟන්නේ නැත්තේ එය සිදුර තුළ ම පුපුරා ගල කැඩී යන නිසාය.

මෙසේ පුපුරා කැඩී වැටෙන ලොකු ගල් පතුරු කුළු ගෙඩියකින් කඩා ගත යුතුවේ. පාර අයින්වල වාඩි වී කැටගල් කඩන්නේ මෙසේ කඩාගත් ගල් කෑලිවලිනි. රාත්තල් බාගයක් පමණ බර ඒවා මිටිවලින් නැවතත් කැඩූහ. පාරට දමා තැලීමට ගන්නා මේ ගල්කැට, පාර අයිනේ කියුබ් වශයෙන් ගොඩ ගසා තිබෙනු දක්නට ලැබේ. පාර අලුත්වැඩියා කරන විට, මෙම කැටගල් අවශ්‍ය තැන්වලට දමා, ගල් රෝලකින් තලා තදකර තාර වක්කරති. ඒ මත වැලි හෝ ග්‍රැවල් පස් විසුරුවා හරිති. ඉන්පසු වාහන ගියත් තාර ගැලවෙන්නේ නැත.

වසරකට වරක් පැරණි දුම්රිය ඇන්ජිමක් බදු වාෂ්ප ඇන්ජිමකින් ක්‍රියා කරන ගල්රෝල්ක් මේ ප්‍රදේශයට පැමිණේ. යකඩ තහඩුවලින් නිමකළ කරත්තයක් (කුඩා නිවසක්) සහ පාර හැරීමට පුළුවන් යකඩ නඟුලක් රෝලයට අමුණා ඇදගෙන විත් පාරේ ඉඩ ඇති තැනක නවතා තැබුහ. ගල්රෝල පදවන්නා සහ සහායකයා යන දෙදෙනාගේ නිවස මෙම කරත්තයයි. යට තට්ටුව මුළුතැන්ගෙයයි. උඩතට්ටුවේ පදවන්නාගේ නිදන කාමරයයි. වැඩ ඇති දිනවල පාන්දරින් ම ගල්රෝලේ ඇන්ජිම රත් කළ යුතුය. ඇන්ජිමට වතුර දමා, යටින් ඇති උදුනට දර කොට දමා ගිනි දමයි. දර ඇවිලෙන

විට නැඟෙන දුම පිටකිරීමට අඩි හතරක් පමණ උස දුම්බටයක් (චිමිනියක්) ඇත. වතුර රත්වීමෙන් පසුව වාෂ්පීකරණය සිදුවිය. ඒ සඳහා ඇති කුඩා යකඩ බට තුළින් වාෂ්පය පිටවන විට ඇන්ජම රත්වී ඇති තරම දැනගත්හ. ගල්රෝල ඔබ මොබ යෑමට සලසන ලීවරයක් හා නවතා ගැනීමට තිරිංග තිබේ. වාෂ්පයෙන් පිඹින නලාවක් ද විය. අවශ්‍ය විටක මෙය නාදකරවයි. අවට ගම්වල ළමෝ මේ "හාස්කම" බැලීමට රොක්වෙති. පාරේ වැඩ කරන කම්කරුවන්ට සතියකට වරක් "ඕවර්සියර්" මහත්තයා විසින් පඩි ගෙවන ලදී.

මහ පාරේ වැඩට අමතර ව සමහර ගම්මු *නාවනගල* තේ වත්තේ වැඩට ගියහ. කරඬිගෑම (වල් කෙටීම), මුල්ලු ගැසීම, පෙහොර දැමීම, ඔවුන්ට ලැබෙන වැඩය. ළමා වියේ අය යොදවන්නේ කරඬි ගෑමට පමණයි. ගමට ඉහළින් තිබෙන *මැටිහක්ක කන්ද* නැඟ තේ වත්තට ළඟා විය හැකිය. දිනපතා උදේ හත හමාරට පමණ වැඩ ආරම්භ වී, සවස හතරයි තිහට වැඩ නිමවේ. දිවා ආහාරයට පැයක පමණ විවේකයක් ලැබේ. මේ වේලාවල් දැන ගන්නේ වත්තේ බංගලාවේ සිට කෙනෙකු පිඹින *සංඛ්‍යේ* (විශේෂ නළාවක්) ශබ්දයෙනි. වැඩට යන අය දිවා ආහාරය පිණිස *"බත් ගෙඩියක්"* බැඳගෙන ගියහ. බත් ගෙඩිය (මුළ) බඳින්නේ කොළපතකයි. පුවක් අත්තක් වේලි වැටුණ පසු එහි ඇති ලොකු "කොළය" කපා ගෙන පොතු ගලවා දමා සකස් කර ගන්නා කොළය බත් මුල් බැඳීම සඳහා භාවිතා කළහ. බත් නැති අය රොටි ගෙන ගියහ. රොටි හදා ගත්තේ කුරහන් පිටිවලිනි. එනමුත්, යුධ සමය එළඹීමත් සමඟ තිරිඟු පිටි භාවිතය වැඩි විය. පිරිසිදු ජලය ගලා බසින කඳුරක් අසලට වී ආහාරය ගත්හ. තම තමන්ගේ බත් මුල්වල තිබෙන මාළු ජාති (වෑංජන) එකිනෙකා අතර හුවමාරු කර ගත්හ. ඒ නිසා, වෑංජන කීපයක් සහිත බත් වේලක් ලැබිණි. සවස ගෙදර එන විට, අතරමඟ ඇති පිහිල්ලකින් ස්නානය කළහ. ගෙදර එනවිට අඳුරු වැටී ඇත. සතිපතා ඉරිදා දිනවල උදේ කංකානමගේ නිවසට ගිය විට වැඩ කුළිය ලැබේ. දිනක වේතනය ශත කිහිපයක් වූ නිසා, සතියේ දින හය ම වැඩ කළත්, ලැබුණේ රුපියල් තුනක් පමණය. ඒ මුදල පවුලේ වියදමට පිරිමසා ගත්හ. මුදල් ආදායමක් ලබා ගන්නේ මේ අකාරයට කුළී වැඩක් කිරීමෙනි. එසේ නොමැති ගැමියන්, මුදල් අවශ්‍යතා සඳහා, වී හාල් වැනි යමක් විකිණිය යුතුය.

මුදල් භාවිතය

ගම්වැසියන් මුදල් භාවිතා කළේ ඉතා ම අඩුවෙනි. කඩයකින් යමක් මිල දී ගැනීමට අවශ්‍ය වූ විට හාල් ටිකක් විකුණා ලැබෙන මුදල් ඒ සඳහා යොදවන ලදී. වැඩක් පොලක් කර දුන් කෙනෙකුට කුලිය ගෙව්වේ ද වී, හාල්වලිනි. මහපාරේ හෝ තේ වත්තේ කුලී වැඩ කළ අයට මුදල් ලැබිණි. අන්

අයට මුදල් අවශ්‍ය වූ විට හාල් ටිකක් විකුණා ගත්හ. ඒ කාලයේ වැඩියෙන් හුවමාරු වූයේ කාසිය. මුදල් ඉතුරු කරන කෙනෙක් වැඩි මුදලක් ඇති විට රුපියල් පහ, දහය වැනි නෝට්ටු තබා ගත්හ. ඉතුරු කළ මුදල් ගෙවල්වල ම සඟවා තබා ගැනීම ප්‍රචලිත සිරිත විය.

මෙරට මුදල් භාවිතය පිළිබඳ ඉතිහාසය අනුරාධපුර යුගය දක්වා විහිදෙන බව පෙනේ. එනමුත්, ඒ යුගවල භාවිතා වී ඇත්තේ කාසිය. මුදල් නෝට්ටු හඳුන්වා දී තිබෙන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී ය. මුල් යුගයේ එංගලන්තයේ භාවිතා වූ පවුම්, ෂිලින්, පැන්ස ක්‍රමය හඳුන්වා දී තිබේ. ලන්දේසි පාලන සමයේ භාවිතා වූ කාසි ද ඉදිරියටත් භාවිතා විය. එසේ වුව ද, *1872 ජනවාරි 01 දින සිට රුපියල් ශත ක්‍රමය ආරම්භ කිරීමෙන් පසුව, ඉන් පෙර භාවිතා වූ කාසි හා නෝට්ටු භාවිතයෙන් ඉවත් වී තිබේ.*

විසිවන සියවසේ තුන්වෙනි දශකයේ දෙවෙනි භාගයේ දී භාවිතයේ තිබුණේ *තඹ සතය, රිදී සත පහ, දහය, විසිපහ, පණහ හා රුපියලයි. සල්ලියේ කාසි* ද (ශත භාගය) භාවිතා විය. එනමුත්, සත කාලේ කාසිය භාවිතයෙන් ඉවත් වී තිබිණි. සල්ලිය හා සත කාල ද තඹ කාසි විය. තඹ සත පහේ රවුම් කාසියක් ද තිබී ඇති නමුත්, පසුව ඒ වෙනුවට රිදීයෙන් හතරැස් කාසිය නිකුත් කර ඇත.

මේ යුගයේ සමහර වැඩිහිටියන් බොහෝ දෙනෙක් පැරණි වචන කිහිපයක් ද භාවිතා කළහ. *තුට්ටුව* ඕලන්ද යුගයේ භාවිතා වූ කාසියකි. පසුව *සත එකහමාර තුට්ටුව* ලෙස හැඳින්විණි. කෝට්ටේ හා මහනුවර යුගවල භාවිතයේ වූ *පණම* යන වචනය ද විසිවන සියවසේ දී භාවිතයේ තිබිණි. පණම සත හයයි කාලට (6 1/4) සමකර තිබිණි. ඒ නිසා, *සත විසිපහ පණම් හතරක්* විය. *සත පනහ පනම් අටකි. සත හැත්තෑ පහ පනම් දොළහක්* ලෙස ද, *රුපියල් එකයි සත විසිපහ පණම් විස්සක්* ලෙස ද භාවිතයේ තිබිණි. රුපියලේ කාසිය ගෙඩි රුපියල විය. රුපියල් දහය පවුමකි. ඒ නිසා, සත පණහ සිලිම ලෙස ද රුපියලයි සත පණහ *සිලින් හූනක්* ලෙස ද රුපියල් දෙකයි සත පණහ *සිලින් පහ* ලෙස ද හැඳින්විණි.

දෙවන ලෝක මහා යුද්ධය ඇරඹීමත් සමඟ, මේ මුදල්වල වෙනසක් සිදුවිය. වර්තමාන සත පණහක පමණ ඝනත්වයක් සහ රවුමක් තිබුණු තඹ ශතයේ ඝනකම ඉන් අඩක් පමණ විය. *සත පහ, දහය, විසිපහ, පනහ* සඳහා *නෝට්ටු* භාවිතය ආරම්භ විය. සත පහේ නෝට්ටුව, සත දෙක හා සත තුන වශයෙන් දෙකට කැඩිය හැකි විය. එනමුත්, වැඩිකල් නොගොස් එය භාවිතයෙන් ඉවත් විය. ගෙඩි රුපියල ද භාවිතයෙන් ඉවත් වී, ඒ වෙනුවට නෝට්ටු නිකුත් කරන ලදී. එතෙක් තිබූ රුපියල්, පහ, දහය ආදී නෝට්ටු-වල දිග, පළල ප්‍රමාණය අඩුවිය. රුපියල් සියයේ, පන්සීයේ සහ දාහේ

නෝට්ටු තිබුණත්, නිරන්තර භාවිතයේ නොවීය. යුද සමයේ දී නැවතත් රිදී කාසි වෙනුවට පිත්තල මිශ්‍ර ලෝහ කාසි සත දෙක, පහ, දහය, විසිපහ හා පණහ නිකුත් කරන ලදී. *1947 දී රුපියල් දහදාහේ නෝට්ටුවක්* ද නිකුත් කර ඇතත් එය භාවිතා කර තිබෙන්නේ අන්තර් බැංකු ගනුදෙනු සඳහා පමණි. යුධ සමයේ දී මිනිසුන් අතර මුදල් පරිහරණය වැඩිවිය. කුලියක් කළ විට ලැබෙන වේතනය ඉහළ ගියේය. වී, හාල් වැනි යමක් විකුණූ විට ලැබෙන මුදල ද වැඩි විය. පෙර රුපියල් පහකටවත් විකුණා ගත නොහැකි වූ වී බුසල, සහතික මිලට රුපියල් හය බැගින් රජය විසින් මිල දී ගත් අතර, වතු කම්කරුවන් වැනි අය රුපියල් පහළොවක්, විස්සක් තරම් මුදලක් ගෙවීමට සුදානම් වූහ. යුද්ධ කාලයේ පැවති ආහාර හිඟය නිසා එළවළු වැනි දේ සඳහා පෙරට වඩා වැඩි මිලක් ලැබිණි. මේ නිසා වී, හාල්වලින් කළ ගනුදෙනු වෙනුවට ගැමියන් අතර මුදල් හුවමාරුව ද ක්‍රමයෙන් වැඩි විය.

මේ යුගයේ රටවැසියන් කෙරෙහි පනවා තිබූ *"පාර බද්ද" (ඇඟ බද්ද)* 1947 දී අහෝසි විය. සෑම වැඩිහිටි පිරිමියෙකු ම අවුරුද්දකට රුපියලක් බදු වශයෙන් ගෙවිය යුතුවිය. එය ගෙවීමට බැරි අය, ඒ වෙනුවට පාරේ වැඩ කළ යුතු විය. *ඇඟ බද්ද, පාර බද්ද* නමින් හැඳින් වූයේ ඒ නිසාය. මේ නිසා, ග්‍රාමීය ප්‍රදේශවල පාරවල් අඩු වියදමකින් ඉදිකිරීමට හැකි වූ බව පෙනේ.

ආහාර පාන

ගම්වැසියන්ගේ ප්‍රධාන ආහාරය වූයේ බත්ය. උදේට *හීල් බත්, හූංසල් (සුංසහල්) බත්, දියබත්, උණු බත්* වැනි යමක් හෝ *කුරහන් රොටියක්* ආහාරයට ගත්හ. වැංජනයට පොළොස් මැල්ලුමක්, තක්කාලි හොද්දක් හෝ තක්කාලි සම්බලයක් සාදා ගත්හ. වී හාල් හිඟයක් නොමැති වූ ගෙවල්වල දවල් හා රාත්‍රී ආහාරය වූයේ ද බත්ය. වැංජනයට කොස්, පොළොස්, දෙල් වැනි යමක් සහ කොළ (පලා) මැල්ලුමක් උයාගත්හ. හේන් කුඹුරු ආදියේ වගා කළ එළවළු තිබෙන විට *(බණ්ඩක්කා, මෑකරල්, වැටකොළු, කැකිරි, තියඹරා, ලබු, පුහුල්, වට්ටක්කා)* මේවායින් වැංජනයක්/හොද්දක් උයා ගත්හ. වැහි කාලය ආරම්භ වන විට දිරා ගිය පිදුරු ගොඩවල *බිම්මල්* ජාති හටගනී. *යාල බිම්මල්* ඉතා රසවත් වැංජනයකි. මඟුලක්, දානයක් වැනි අවස්ථාවකට උවමනා ගෝවා ගෙඩියක් වැනි දෙයක් මිස කඩවල්වලින් එළවළු මිලට ගත්තේ ම නැති තරම්ය. එළවළු වවා ඇති කෙනකුගෙන් ඉල්ලා ගැනීම ද දක්නට ලැබිණි. එසේ ඉල්ලා ගත් තැනැත්තා තමන්ට තිබෙන විට අන් අයට (නොමිලේ) දීමට මැළි නොවීය. දාන හා මඟුල් ගෙවල්වල වැංජන සඳහා *කට්ට ඇඹුල්* (විශේෂ ක්‍රමයකට උයන අළුපුහුල්), *පොළොස් ඇඹුල, ගෝවා, අර්තාපල්, මයිසූර් පරිප්පු, මුං ඇට* වැංජන සහ *කරවල* බැදුමක්, *මැල්ලුමක්*

උයා ගත්ත. මස්, මාළු තිබුණේ ම නැත. ඉතා කලාතුරකින් *දඩමස්* (වේලන ලද මුව මස්/ගෝන මස් වැනි දෙයක්) ලැබේ. අර්තාපල්, බොම්බයි ලූණු, මයිසූර් පරිප්පු, කරවල සහ දුරු ජාති කඩෙන් මිල දී ගත්ත. මිරිස්, රතුළුණු තම තමන් විසින් ම වවා ගත්ත. සිංහල අවුරුද්දට සහ දාන, මඟුල් ගෙවල් ආදිය සඳහා දින කිහිපයකට කලින් *අච්චාරු* දමාගත්ත.

කුඹුරු වැඩ දවස්වලට ආහාර ගන්නා වේලාවල් වෙනස් විය. උදේ "හීල්කෑමෙන්" පසු තම තමන්ගේ කුඹුරුවල තිබෙන වැඩ කර ගන්නා ගොවීහු පෙරවරු දහයට පමණ තවත් ආහාර වේලක් ගෙන තමන්ගේ ම හෝ වෙන කෙනෙකුගේ කුඹුරක හීයට හෝ වැපිරීමට ගියහ. හීයක් ඇති දිනවල "මද්දහන" (දිවා ආහාරය) දවල් දෙකට පමණ ගනු ලැබූහ. කොස්, දෙල්, වට්ටක්කා වැනි දෙයකින් උයන ලද වැංජනයක්, කරවල මැල්ලුමක් හා කැකිරි, තියඹරා, බණ්ඩක්කා, මාළු මිරිස්, තක්කාලි වැනි දේකින් උයන ලද ඇඹුලක් (හොද්දක්) සමඟ බත් මද්දහනට ලැබේ. මද්දහන කන්නේ කුඹුරේ දී ම ය. කුඹුරක් වපුරන දවසේ දිවා ආහාරයක් නැත. උදේ දහයට ගන්නා ආහාරයට පසුව කෑම වේල ලැබෙන්නේ වැඩ නිම කළ පසු රෑ කෑම ලෙසිනි. මේ කෑම වේල ද "මද්දහන" මෙන් ම සකස් කර ගත්ත. වැපිරීම නිමා වී දිය නා පිරිසිදු වී වැපිරීම කළ කුඹුර හිමියාගේ නිවසට ගොස් රාත්‍රී භෝජනය අනුභව කළහ.

හීයක් වැපිරීමක් නැති දිනවල සමහර ගෙවල්වල දවල් හා රෑ කෑම සඳහා කුරහන් තලප හැදිගා ගත්ත. තලප ගිලීමට *"ආනමක්"* (හොද්දක්) අවශ්‍ය වේ. මුං ඇට, මෑ ඇට, කොල්ලු වැනි දෙයකින් ආනම උයා ගත්ත. වේල් තුනට ම හෝ උදේට, රෑට, කුරහන් රොටී ආහාරයට ගැනීම සමහර ගෙවල්වල දක්නට ලැබිණි. රොටියට පිටි අනන විට, අමු මැකරල්, තක්කාලි වැනි යමක් මුසුකර ගෙන උයා ගත් විට රසවත්ය. මේ යමක් නැත්නම්, රොටියේ එක පැත්තක පොල්තෙල් තවරා රත් කර ගත් විට වැංජන ආදියක් නොමැති ව ද කෑමට පුළුවන.

වී තම්බා වේලා කොටා ගත් තම්බපු හාල් මෙන් ම කැකුළු හාල් ද බත් පිසීමට ගත්ත. වී, හාල් නොතිබූ ගෙවල්වල උදව්ය කඩවලින් රටහාල් මිලයට ගත්ත. මේවා සියමෙන් (තායිලන්තය) හා බුරුමයෙන් ගෙන් වූ සුදුහාල් හෝ "මිල්වාඩ්" (තම්බපු) හාල්ය. සමහර විට, නොයෙක් හේතු නිසා, ලූණු කැඳ හෝ පොල් කිරි කැඳ පානය කළ අවස්ථා තිබිණි.

දෙවෙනි ලෝක මහා යුද්ධ සමයේ දී, තිරිඟු පිටි භාවිතය ව්‍යාප්ත විය. එතෙක් තිරිඟු පිටි යොදා ගත්තේ පාන් සෑදීමට පමණක් වුව ද, ඉන් පසුව රොටී සෑදීමට බෙහෙවින් ම යොදා ගත්ත. කුරහන් පිටි නැති ගෙවල්වල තිරිඟු පිටි (පාන් පිටි) රොටී ආහාරයට ගැනීම බෙහෙවින් ම වැඩි වී ගියේය. යුද්ධ කාලයේ දී තිරිඟු ඇට ද සලාකයට ලැබුණු නිසා, ඒවා වංගෙඩියේ

දමා කොටා පොතු ඉවත් කර බතක් උයා ගත්ත. *ජපන් ආක්‍රමණය* නිසා සියමෙන් හා බුරුමයෙන් හාල් ගෙන්වීම නතර වූ පසු, ඊජිප්තුවෙන් "ඉටි" හාල් වගයක් ගෙන්වා සලාකයට බෙදා දුන්නේය.

හේන්වල කුරහන් කැපීම වැනි වැඩ දවස්වල දිවා ආහාරය සඳහා හාල්පිටි හා උඳුපිටි මිශ්‍රණයකින් *"දොහොයි"* (තෝසේ) උයා ගත්ත. ලුණු මිරිසක් හෝ පොල් සම්බලයක් සමඟ *දොහොයි* කෑමට ගත්ත. හාල් පිටි, උඳුපිටි හා සීනි/පැණි මිශ්‍ර කර අනාගන්නා පිටිවලින් *"පුස්නාඹු" (වණ්ඩු ආප්ප)* තැම්බූහ. මේවා තම්බා ගන්නේ කඩපිම්මේ ය. චතුර දැමූ මුට්ටියක, කට වසා රෙදි කඩක් බැඳ, ඒ මත හිල්බෙලෙක් පිඟානකට බෙදූ පිටි මිශ්‍රණයට උඩින් පියනක් වසා වාෂ්පයෙන් *පුස්නාඹු* තම්බා ගත්ත. මෙය රසවත් අතුරුපසක් විය.

මඟුල් ගෙවල්වලට සහ දානවලට මෙන් ම සිංහල අවුරුද්දට ද නොයෙක් කැවිලි වර්ග සාදා ගත්ත. ඒ, *කැවුම්, කොකිස්, උඳුවැල්, ආස්මී, අළුවා, වැලි තලප* වැනි කැවිලිය. *හැඳිකැවුම්*, කැවුම් *(අතිරහ), නාරං කැවුම්, මුං ඇට කැවුම්* යනුවෙන් කැවුම් වර්ග කිහිපයක් විය. *කොණ්ඩ කැවුම්* වෙනුවට ගත්තේ හැඳි කැවුම්ය. නෑදෑ ගමනක් යන විට ද මේ කැවිලි සමහරක් උයාගත්ත.

තේ පානය අල්ප විය. අමුත්තෙක් ගෙදරට පැමිණි විට තේ දීමට, තේ කොළ, සීනි ටිකක් හැම ගෙදරක ම පාහේ තිබිණි. *රණවරා, පොල්පලා, ඉරමුසු* වැනි යමක් තම්බා පානය කිරීම කලාතුරකින් සිදු විය. හෙම්බිරිස්සාවක් හැදුණුවිට, ඉඟුරු, කොත්තමල්ලි, සුදුලූණු, තම්බා පානය කළහ. ඒවායේ (වාෂ්ප) දුම් ඇල්ලීම ද පිළියමක් විය.

එළහරක් ඇති ගෙවල්වල උදෙන් ම කිරිදොවා ගත්ත. නැවුම් කිරි උණුකර පානය කිරීමෙන් පසුව ඉතිරිවන කිරි, අප්පල්ලයකට (හට්ටියකට) වක්කර වසා මිදෙන්නට තැබූහ. කිරි මිදීමට *"මුහුන්"* අවශ්‍ය වේ. පළමුවරට කිරි මිදීමට තබන විට මුහුන් වශයෙන් සීනි ටිකක් දැමුහ. ඉන්පසුව, මුදවපු කිරි ටිකක් මුහුන් වශයෙන් කලවම් කිරීමට පුළුවන. මුදවපු කිරි බත් සමඟ කෑමට ගත්ත. අතුරු පසක් වශයෙන් ගත්තේ කළාතුරකිනි.

ගම්වැසියන් සමහරෙක් මස්, මාළු ආහාරයට ගත්තත්, ඒවා නිතිපතා ලැබුණේ නැත. කෙනෙක් හේනක තුවක්කුවක් බැඳ කලාතුරකින් වල් ඌරකු වැනි සතෙක් මරා ගතහොත් සමහර කෙනෙකුට මස් ටිකක් ලැබේ. මුවන්, ගෝනන්, වැනි සතුන් මේ අවට සිටියේ නැත. *බිංතැන්න* (මහියංගණය ප්‍රදේශය) වැනි ප්‍රදේශයකට ගිය කෙනෙකුට දඩමස් (වියලන ලද මස්) සොයා ගැනීමට ලැබිණි. මාළු උවමනා නම් මහනුවර මාරකට් එකට යා යුතුය.

මත්පැන් පානය කිරීමක් නොවූ තරම්ය. කිතුල් ගහක් දෙකක් මැදගත් කෙනෙක් දෙන්නෙක් ගමේ සිටි නමුත්, *කිතුල් 'නෙලිජ්ජ'* ගත්තේ

වැඩියෙන් ම පැණි හකුරු සෑදීමටය. *රා* පෙරීමට ගත්තේ කලාතුරකිනි. එය ද හොර රහසේය. රා බී වැටී වැටී යන කෙනෙක් සිංහල අවුරුදු දවසක දැක ඇත්තෙමි.

සිංහල අවුරුදු දිනයේ *"කෝණ"* කෑම සිදුවිය. එදිනට ගන්නා කැවිලි කල්තියා සකසා තැබූහ. කඩපලෙන් කරවල කුරියෙක් හෝ අඩක් (මිල මුදල් ඇති තරමට) ගෙනැවිත් තැබූහ. පොළොස් ඇඹුල, කටු ඇඹුල පෙර දින රෑයේ උයා තැබුහ. කල් ඇති ව *අච්චාරු* සකසා තිබිණි. කෙසෙල් ගෙඩි කඩයකින් මිල දී ගත යුතු විය.

නැකතට ගිනි මෙලවීම ආදී චාරිත්‍ර අනුගමනය කිරීම සිරිතක් විය. නැකැත් වේලාවට වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර ගැනීම සිදුකළහ. කිරිබත් හා ලුණු මිරිස් නැකතට කෑමට ගත්හ. ප්‍රධාන ආහාර වේල සඳහා පරිප්පු, මුං ඇට, අර්තාපල් වැනි දේවලින් වෑංජන සාදා ගත්හ. කරවල බැඳුමක්/මැල්ලුමක් විය. *"හත් මාළුව"* අත්‍යවශ්‍ය අංගයක් විය. ඒ සඳහා දෙහි අල, දඹල ඇට යනාදි එළවළු හතක් මුසුකර ගත්හ.

ඇතැම් පළාත්වල හත් මාලුව සඳහා මෙම හත් වර්ගය ගත් බව පෙනේ :-

1. මද වර්ග (කජු ආදිය), 2. බඩ වර්ග (කෙසෙල් බඩ ආදිය), 3. ගෙඩි වර්ග (ලබු, වට්ටක්කා ආදිය), 4. දලු වර්ග (කොහිල, කැකිල්ල, නිවිති ආදිය), 5. කොළ වර්ග (කිරි අඟුණ, ගෝවා ආදිය), 6. ඇට වර්ග (උඳු, මුං, පරිප්පු ආදිය), 7. අල වර්ග (අර්තාපල්, හිඟුරල, දෙහි අල ආදිය)

අවුරුද්ද කෑමට උයාගන්නා බත්, වෑංජන අසල්වැසි ගෙවල්වලට බෙදීම අනාදිමත් කාලයක සිට පැවැති සිරිතකි. මෙම හුවමාරුව නිසා, අමනාපකම් ආදිය ඇති ව සිටි අසල්වාසීහු මිතුරු වූහ. අවුරුද්දට පෙර දිනයේ ගමේ පන්සලට අවශ්‍ය වන වියලි ආහාර හා කැවිලි ගෙන ගොස් දුන්හ. අවුරුදු දවස ගත වී තුන්වෙනි දිනයේ පමණ, ගමේ සියලු දෙනා ම පාහේ පන්සලට යති. එදින පන්සලේ පිංකම් පැවැත්විණි. භික්ෂූන් වහන්සේලාට දවල් දානය පුජා කළහ. අවුරුද්දට පසුව ගම්වැසියන් වෙනත් කටයුතුවල නිරත වන්නේ පන්සල් යෑමෙන් පසුවයි.

ඇඳුම්, පැළඳුම්

මේ ගම්වැසියන්ගේ ඇඳුම් පැළඳුම් ඉතා සරලය. පිරිමි ළමයි කුඩා කාලයේ දී ඇන්දේ දනහිස දක්වා දිගට මැසූ කමිසයක් වැනි ඇඳුමකි. ඒ ඇඳුම කරෙන් පහළට ලිස්සා වැටීම වැළැක්වීමට බෙල්ලට පිටුපසින් කමිස කරට මසන ලද පටි දෙකකින් ගැස ගසන ලදී. පාසල් යන වයසේ දී කුඩා සරම් සහ අත්කොට කමිස ඇඳගෙන ගියහ. ජංගි, කොට කලිසම්

ආදිය ඇන්දේ නැත. සපත්තු, සෙරෙප්පු කිසිවක් ද පාවිච්චි කළේ නැත. ගැහැණු ළමුන් කුඩා ම අවදියේ දී ගවුම් ඇන්ද නමුත් වයස අවුරුදු හත අට පමණ වන විට චීත්ත රෙදි කැබැල්ලක් සහ හැට්ටයක් ඇන්දාහ. පාසල් ගිය ගැහැණු ළමෝ ද හැට්ට, රෙදි ඇඳගෙන ගියහ.

වැඩිහිටි කාන්තාවන් ඇන්දේ රෙද්ද හා හැට්ටයයි. චීත්ත රෙදි යාර තුනක් කපා කෑලි දෙකට මසාගත් රෙද්දක් සුදුරෙදි හැට්ටයක් ද නිතර ඇඳහිටි ඇඳුම විය. ගම තුළ යමක් කමක් තිබෙන අය ගමනක් යන විට ඔසරිය (උඩරට සාරිය) ඇඳීමට කෑලි හතරේ චීත්ත මසා ගත්හ. හැට්ටය සුදු රෙද්දෙන් මැසූ එකක් විය. ගමෙන් පිට ගමනක් යන විට හැකියාවක් තිබුණු කාන්තාවන් ටිකක් වටිනා රෙද්දක් හා හැට්ටයක් (ලේස් රෙදි ආදියෙන්) ඇඳගෙන ගියහ. කම්බා (කොටු සහිත රෙද්දක්) ඇඳීම ද රටාවක් විය. *ඉන්දියානු (පහත රට) සාරිය* ඇන්දේ ම නැත. සිරිතක් වශයෙන් කාන්තාවන් ගෙදරින් බැහැර යන විට, සාළුවක් (තුවායක්) කරේ දමා ගෙන ගියහ. කාන්තාවන් පැළඳූ කණකර ආයිත්තම් රිදියෙන් සාදා තිබිණි. ඒවාට රන් ආලේප කළ ස්වරූපයක් දීමට "ගිනි වතුරේ" දමා ගත්හ. මේ සඳහා මහනුවරට යායුතු විය. එහි තැනක දෙකක රිදී ආභරණ වතුරේ දමා දෙන අය සිටියෝය. වයෝවෘධ කාන්තාවන් කීපදෙනෙක් දමිළ කතුන්ගේ මෙන් කන්වල *"බෙර"* පැළඳූහ. බොහෝ කාන්තාවන් කන්වල පැළඳියේ අරුංගල්ය. ගමනක් බිමනක් යන විට කලාතුරකින් *කරාබු* පැළඳ ගියෝය. වළලු හා මාල ද රිදියෙන් නිමකර තිබිණි. මඟුල් ගෙදරක් වැනි අවස්ථාවකට අවශ්‍ය වූ විට, තිබෙන කෙනෙකුගෙන් ඉල්ලා ගෙන ආභරණ පැළඳ යන අවස්ථා ද දක්නට තිබිණි.

පිරිමින්ගේ ඇඳුම සරම හා (බුරුම කබායක් වැනි) බැනියමයි. මේ බැනියම රවුම් කරක් (ටියුනික් කොළරය) සහිත අත් දිගට මසන ලද්දකි. බැනියම මසා ගත්තේ *"ලන්ක්‍රීන්"* නම් වූ ගොරෝසු දළ රෙද්දකිනි. සමහර දෙනෙක් එම බැනියම සුදු රෙදිවලින් ද *(පොප්ලින්)* මසා ගත්හ. සරම් ඉන්දියාවෙන් ගෙන්වන ලද *"පලයකාට"* සරම්ය. ඒවා බොහොමයක් නොයෙක් වර්ණවල කොටු සහිත විය. කොටු සහිත සුදු සරම් ද විය. කෙනෙක් ගමන් බිමන් යන විට කබාය (කෝට්) ඇන්දාහ. සමහර දෙනෙක් සරමක් ඇඳ, ඊට උඩින් ටිවීඩ් රෙද්දක් හෝ සුදු රෙද්දක් ඇන්දාහ. කෙනෙක් දෙන්නෙක් *"පට"* (සේද) සරම් ද ඇන්දේය. රෙදි හෝ සරම් ඇඳි අය ඉණට පළල් කළු පටියක් හෝ රිදී හවඩියක් බැන්දාහ. බොහෝ අය ඉණ බැඳි දිය ලණුවෙන් සරම තද කරගත්හ. පිරිමින්ගේ කරේ නිතර ම ලේන්සුවක් තිබිණි. ගමනක් බිමනක් යන විට, සාලුවක් කරේ දමා ගෙන ගියහ. ගමේ ප්‍රභූවරු සමහරෙක් මඟුල් ගෙදරකට හෝ මහනුවර වැනි ඈතකට යන විට, සෙරෙප්පු සපත්තු පැළඳ ගිය නමුත්, අන් අය පාවහන් පැළඳියේ නැත. කිසිවෙක් කලිසම් ඇන්දේ නැත. මේ කාලයේ ප්‍රචලිත ව පැවති මතය වූයේ, කලිසම් ඇඳීමට නම් ඉංග්‍රීසි (කථා කිරීමටවත්) දැන ගෙන සිටිය යුතු බවයි.

වැඩිහිටි පිරිමින් බොහෝ දෙනෙක් හේනේ කුඹුරේ සහ කුලී වැඩ කරන විට සරම වෙනුවට *සරුවාලය* (කලිසම වැනි දණහිස දක්වා වූ ඇඳුමක්) ඇන්දාහ. එය සරම ලෙස ඇඳගෙන, දියලනුව, හවඩිය වැනි යමකින් ඉණට තද කර ගත්හ.

ගැහැණු පිරිමි දෙපාර්ශවයේ ම අය සිල් ගන්නා විට වෙන ම "සිල් රෙදි" ඇන්දාහ. කාන්තාවෝ ඇඳ ගැනීමට සුදු රෙද්දක් සහ සාටකයට සුදු රෙද්දක් සපයා ගත්හ. ඔව්හු, සුදු හැට්ටයක් ඇඳ සුදු පත්කඩයක් අතේ රැගෙන පන්සලට ගියහ. සුදු සරමක් ඇඳ සුදු බැනියමකින් සැරසුණු පිරිමි සුදු රෙදි සාටකයක් හා පත්කඩයක් සපයා ගත්හ.

සමාජ සම්බන්ධතා

මේ ගම්වැසියන් කුල කීපයකට අයත් වූහ. *ගොයිගම* පිරිස් ''ගොඩේ" හෝ "රටේ" ඇත්තන් ලෙස හැඳින්වූහ. රටේ ඇත්තන් අතර, ප්‍රභූ හා ප්‍රභූ නොවන ජනයා වූහ. මොවුන් අතර වෙනස පැහැදිලි වූයේ, අන් කුලවල අය රටේ ඇත්තන්ට ආමන්ත්‍රණය කරන විටයි. ප්‍රභූවරු "වලංනාන්සේ" (වලව්වේ උන්නාන්සේ), *බණ්ඩාර මහත්තයා* වූහ. අන් අය *නිලමේ, මැණිකේ* වූහ. ප්‍රභූ නොවන අය ප්‍රභූ පවුල්වල කාන්තාවන් ඇමතුවේ "කුමාරිහාමි" නමිනි. වැඩිහිටියෝ එකිනෙකා ඇමතීමට *නිලමේ, මැණිකේ, කුමාරිහාමි, බණ්ඩා, උපාසක උන්නැහේ, වෙද මහත්තයා, බාස් උන්නැහේ* යනාදි වචන උචිත පරිදි භාවිතා කළහ.

බාල වයස්වල අය වැඩිහිටි කාන්තාවන් *"අම්මා"* යයි ඇමතූහ. පිරිමියා *"අම්මණ්ඩි"* විය. නැදෑකම් සඳහා යොදා ගත් වචන මෙසේ විය. කෙනෙකුගේ මව "අම්මා", "අපෙ අම්මා" ය. මවගේ වැඩිමහල් සොහොයුරිය ''ලොකු අම්මා'' ය. මවගේ එක කුස උපන් බාල සොහොයුරිය ''හීං අම්මා ''ය. අම්මාගේ බාල ඥාති සෙහොයුරිය ''කුඩම්මා ''ය. "පර අම්මා" (අප්පච්චිගේ බිරිඳ) *කුඩම්මාය.* කෙනෙකුගේ පියා *"අප්පච්චිය" නාත්තා* යන වචනය භාවිතා නොවීය. අප්පච්චිගේ වැඩිමහල් සහෝදරයා *"ලොකු අප්පච්චිය"* අප්පච්චිගේ එකකුස උපන් බාල සහෝදරයා *"හීං අප්පච්චිය"* වෙනත් බාල සහෝදරයෝ *"කුඩප්පච්චිලාය"* බිරිඳගේ අම්මා සහ පියාගේ සහෝදරිය, මාමාගේ බිරිඳ යනාදීන් *"නැන්දම්මාය"* (නැන්දා නොවේ) බිරිඳගේ පියා *"මාමණ්ඩිය"* අම්මාගේ සහෝදරයෝ *"මාමලාය"* නැන්දම්මලාගේ සැමියන් ද *"මාමලා"* ය. අම්මාගේ හා අප්පච්චිගේ පියා *''ලොකු අත්තා''* ය. ලොකු අත්තාගේ බිරිඳ *''හීං අත්තා''* ය. වියපත් වෙන ඕනෑම කෙනෙක් (සමකුල ගැහැණු/පිරිමි) *''අත්තා''* කෙනෙකු විය.

දුරා පවුල් කිහිපයක් තිබිණි. ඔවුන් *"හේවායන්"* ලෙස හැඳින්වූහ. ඒ කාන්තාවෝ *"කොල්ලැම්මු"* (කොල්ලන්ගේ අම්මා) යනුවෙන් ද පිරිමි "දුරයා" යනුවෙන් ද අමතනු ලැබූහ. *''හේවායන්''* ලෙස මේ අයගේ සේවය ලබා ගත්තේ මඟුල් ගෙවලටයි. බුලත් මල්ල මඟුල් ගමනේ ගෙන ගියේ කොල්ලැම්මු කෙනෙකි. ඔවුන් හිස මතින් කැවිලි පෙට්ටි ගෙන ගියහ. කැවිලි පෙට්ටියක් හා කෙසෙල් කැනක් දෙකොණේ බැඳි කද ගෙන ගියේ දූරයාය. ගමේ පන්සලේ *"හොරණෑකාරයා"* ද මේ කුලයේ කෙනෙකු විය. මෙම "රාජකාරියට" අමතර ව වෙනත් කුලීවැඩ සඳහා ද මේ අයගේ සේවය ලබා ගත්හ.

පිරිත් ගෙයක හෝ මඟුල් ගෙයක වියන් බැන්දේ හා ඒවාට අවශ්‍ය සුදු රෙදි සැපයුවේ *"හේනයා" (හේන මාමා)* හෝ *"රිදී" (රෙදි නැන්දා)* ය. *කොටහළු* ගෙයකට හෝ *වැදූ ගෙයකට* පිරුවට සැපයුවේ ද මේ අය විසිනි. මේ අය සිංහල අවුරුදු සමයේ දී තමන් සේවය සැපයූ ගෙවල්වලට ගොස්, වී හාල් ආදිය එකතු කර ගත්හ. මුදලින් ගෙවීමක් කළේ කලාතුරකිනි.

පන්සලේ තේවාව කිරීමට අදාල කුලයේ පවුල් දෙකක් පන්සල අසල ගෙවල් දෙකක පදිංචි ව උන්හ. බෙර, දවුල්, තම්මැට්ටම් වැයීම ඔවුන්ගේ "රාජකාරිය" විය. පාන්දර *"අළුයම් දුරේ"* වාදනය, හවසට *"හැන්දෑ දුරේ"* වාදනය, බුදුරදුන්ට ගිලන් පස, ආහාර ආදිය පුජා කරන විට *හේවිසි වාදනය*, දාන දිනවල හේවිසි වාදනය යනාදිය මේ රාජකාරිවලට අයත් විය. මේ සඳහා ඔවුන්ට පන්සලේ කුඹුරු වැඩ කර ගැනීමට දී තිබිණි. දාන ගෙවල්වලින් ද ආහාර පාන, කැවිලි පෙවිලි ආදියෙන් සැලකිලි ලැබේ. මේ කුලයට අයත් පවුල් කීපයක් ගමේ එක කොටසක පදිංචි ව උන්හ. ඒ අය අතර *නැට්ටුවන්, බලි තියන්නන්, නැකැත්තන්* (කේන්දර බලන අය), *වෙදදුරන්* වැනි විවිධ හැකියාවන්හි නිරත අය වූහ. මේ පිරිස පොදුවේ *"බෙර කාරයන්"* ලෙස ද ගැහැණුන් *"නැන්දා"* ලෙස ද අමතනු ලැබූහ. එකිනෙකාගෙන් වෙන් ව හඳුනා ගැනීමට ඒ ඒ අයගේ නම මෙම වචනවලට මුලින් යොදා ගත්හ. උදා: *රංකිරි නැන්දා.*

යකඩ වැඩ කළ කම්මලක් මහපාර අසල තිබිණි. කම්මල්කරුවා *"ගල්ලද්දා"* විය. ගුරුන්නාන්සේ යනුවෙන් ද අමතන ලදී. ඔහුගේ බිරිඳ *"නාච්චිරේ"* ය. ස්වර්ණාභරණ හදන ගුරුන්නාන්සේලා සිටියේ අල්ලපු ගමකය. *කුඹල් (වලං) කර්මාන්තකරුවන් (බඩහැල)* මේ ගමේ සිටියේ නැත. වෙනත් ගමක උන් ඔවුහු, සිංහල අවුරුදු සමයේ වළං කදක් රැගෙන ගමට පැමිණියහ. කලාතුරකින් ගමට *"රොඩී"* මිනිසෙක් පැමිණියේය. ඔහු කත්ලීයක එක පැත්තක පමණක් පෙට්ටියක් බැඳ ගෙන ආවේය. ඒ අය ගෙවත්තටවත් වැද්දගත්තේ නැත. ඉදිකඩ ළඟ දී ම වී ටිකක් දී පිටත් කර හරින ලදී. ඔහුට ඇමතුවේ *"හුලවාලියා"* කියාය. හුලවාලින්ට වැඩියෙන් ම

බියවුණේ කාන්තාවන්ය. ඒ *හුලවාලි වශී ගුරුකම්* කරන බවට තිබූ විශ්වාසය නිසාය. හුලවාලි සිංහල රජකාලේ ගමින් ගමට ගිය රජුගේ ඔත්තුකරුවන් වී යැ'යි මතයක් පැවතිණි. ගම්මුන්ගෙන් ලැබුණු වී මේ ඔත්තුකරුවන්ගේ ආදායම් මාර්ගය විය. *හුලවාලියාට* වී ටිකක් දියයුතු බවට රාජ නියමයක් තිබුණා විය හැකිය.

ගමේ තරුණ තරුණියන් අතර ආවාහ විවාහ සිදුවූයේ දෙමාපියන්ගේ මැදිහත්වීමෙනි. අසල ගමේ (මැදිවක) පදිංචි ව සිටි ලේකම් මහත්තයාගේ (රෙජිස්ට්‍රාර් තැන) නිවසට ගොස් විවාහය ලියාපදිංචි කළහ. මෙම විවාහ *''උඩරට නීතිය''* අනුව සිදු කළහ. *"පහත රට නීතිය"* අනුව විවාහය ලියාපදිංචි කළ විට විවාහය "කටුගෑම" (දික්කසාද වීම) උසාවි මගින් සිදුවිය යුතු වුවත්, උඩරට නීතිය අනුව යුවලට ලේකම් මහත්තයාට දන්වා විවාහය කටුගෑමට හැකි විය. දික්කසාද වීම එතරම් පහසු වුවත්, එසේ වෙන් වූයේ කලාතුරකිනි. උප්පැන්න, මරණ, ලියාපදිංචි කළේ ද මේ ලේකම් මහත්මයා ම ය. කුලයෙන් පිට විවාහයක් ගැන එකල අසන්නට ලැබුණේ නැත. තරුණ යුවලක් සිය කැමැත්තෙන් ජෝඩු වූයේ කළාතුරකිනි. එවැනි සම්බන්ධයක් ඇති වූ විට, දෙමාපිය අනුමැතිය නැති කල්හි, දෙදෙනා ගමෙන් පැන ගියහ. එසේ කලාවැවට පැනගිය යුවලක් පසු කාලයේ ගමට පැමිණ පදිංචි වූහ.

වැඩිහිටියන්ට ගරු කිරීමට තරුණ, බාල හැම දෙනා ම වගබලා ගත්හ. ඒ කාරණයේ දී කුල ගෝත්‍ර වැදගත් වුවත්, කිසිවකුගේ සිත් රිදවීමක් ඇති වන ලෙස හැසිරීමක් හෝ කථාබහ කිරීමක් සිදුවූයේ කලාතුරකිනි. මුරණ්ඩු- කමටවත් කිසිවෙක් වැඩිහිටියෙකුට නොමනා අයුරින් කතාබහ කළොත් දෙමව්පියන් පමණක් නොව කුමන හෝ වැඩිහිටි කෙනෙක් ඒ වරද පෙන්වා දීමට කටයුතු කළේය. අසල්වැසියන් අතර අඬදබර වූ අවස්ථා තිබුණත් ගහ මරා ගැනීමක් සිදු නොවීය. යම් අමනාපයක් පැවතුණත් සිංහල අවුරුද්දට ඒවා නැති කර ගත්හ.

ගම්වැසියන් අතර අන්‍යෝන්‍ය සහයෝගය දක්නට තිබිණි. හේනේ, කුඹුරේ වැඩවල දී මිල මුදල් (හෝ වී හාල් ආදියෙන්) ගෙවා කෙනෙක් වැඩට ගන්නේ කලාතුරකිනි. *"අත්තන්"* ක්‍රමය ප්‍රචලිත ව පැවතිණි. කෙනෙකුගේ වැඩට වෙන කෙනෙක් සහභාගී වූ විට, ඒ වෙනුවට පළමුවැන්නා දෙවැන්නාගේ වැඩට සහභාගී විය. *'අත්තමක්'* එක කන්නයක දී *"ගෙවීමට"* බැරි වුණොත් ඊළඟ කන්නයේ දී ගෙවිය හැකි විය. කුඹුරක් හේනක් නොතිබූ කෙනෙක් වැඩට ආවේ, හාල් වැනි දෙයක් දෛනික ව ලබා ගැනීමටයි.

යම් කෙනෙක් අසනීප ආදිය නිසා කුඹුර හෝ හේන වැඩ කිරීම අතපසු වන විට, ගම්මුන්ට *"බුලත් දී"* නියමිත දිනක් කුඹුරේ, හේනේ වැඩ කරවා ගැනීමට ආරාධනා කළහ. ඒ සඳහා කුලී ගෙවීමක් හෝ අත්තමක්

අවශ්‍ය නොවීය. වැඩට යන අයට කැවිලි ජාතියකින් හෝ උචිත පරිදි ආහාර වේලකින් සංග්‍රහ කිරීම ප්‍රමාණවත් විය. ගෙපලක් කපා ගැනීමාදියට ද බුලත් දීමට පුළුවන. වහලක් සෙවිලි කිරීමට කීප දෙනෙකුට කී විට, ඒ කාර්යය නොමිලේ ඉටු කරගත හැකිය.

පුද පූජා ඇදහිලි විශ්වාස

කුමන කුලයකට අයත් වුවත් වැසියන් සියලු දෙනා ම සිංහල බෞද්ධයෝ වූහ. ගමේ පන්සල ආගමික කටයුතු රාශියක මධ්‍යස්ථානය විය. සිංහල අවුරුද්ද ගත වූ වහා ම, වෙන ගමන් බිමන් කිසිවකට පෙර පන්සලට ගොස් පුද පූජා පැවැත්වූහ. *වෙසක් පොහෝ දිනය* විශේෂයෙන් වැදගත් විය. එදින ගමේ සියලු දෙනා ම පන්සලට ගොස් බුදුන් වහන්සේට කිරිපිඬු දානයක් පූජා කළහ. නැට්ටුක්කාරයන් හා හේවිසිකාරයන් *"පෝය හේවිසියක්"* පැවැත්වූහ. පෝය හේවිසිය වශයෙන් හැඳින්වූයේ, අදාල ඇඳුම්වලින් සැරසී බෙර දවුල් ගසමින් නැටීමයි. තරග වාද ද දක්නට ලැබිණි. කිරිපිඬු දානයෙන් පසු ඉතිරිවෙන ආහාරය පන්සල් වත්තේ වළලා දැමූහ. බලු කටුපු ආදීන්ටවත් කෑමට දුන්නේ නැත.

කෝන කෑමෙන් (සිංහල අවුරුද්දට) දින දෙක තුනකට පසුව, සමහර දෙනෙක් *මහියංගණය, ශ්‍රී පාදය* වැනි ආගමික ස්ථානවලට වන්දනා ගමන් ගියහ. ශ්‍රී පාද ගමනට දින දෙක තුනක් ගතවිය. මහනුවරට බසයෙන් ගොස් එතැන් සිට *හැටන්* දක්වා දුම්රියෙන් ද නැවත *නල්ලතන්නිය* දක්වා බසයෙන් ද ගමන් කළහ. පළමු දිනයේ දිවා ආහාරය සඳහා "බත් ගෙඩියක්" (මුලක්) බැඳ ගෙන ගියහ. බත් ගෙඩියේ තිබුණේ කැකුළු බත් සහ පොල් මැල්ලුම්ය. අග්ගලා මල්ලක් ද (පොට්ටනියක්) ගෙන ගියහ. බොහෝ දෙනා සුදු ඇඳුමින් සැරසී ගියහ. සීතලට පෙරවා ගැනීමට රෙද්දක් හා *සුම්බරයක් (ජටාවක්)* බැඳ ගැනීමට සාළුවක් (තුවායක්) ගෙන ගියහ. ශ්‍රී පාදේ වන්දනාවේ ගොස් ගමට පැමිණි විට, සමහර දෙනෙක් ඒ අයගේ කකුල්වල තෙල් ගා සාත්තු කර පිං සිද්ද කරගත්හ. වන්දනාවේ ගිය අය නොගිය අයට පිං අනුමෝදන් කිරීම ද සිරිතක් විය.

මහියංගණ වන්දනාවේ ගියේ පයින්ය. එවකට තිබුණේ දිනකට එක බස් රථයක් පමණි. *සිල්වර් ලයින්* බස් සමාගමට අයත් වූ මේ බසය, වම් පැත්තේ දොරටු තුනකින් ද පිටුපස දොරටුවකින් ද යුක්ත වූ විවෘත වූ *(ඕපන් බොඩි)* බස් රථයකි. රියදුරාට බසයට ගොඩවීමට ඉදිරියෙන් ම දකුණු පසින් වෙන ම දොරටුවක් තිබිණි. ඒ කාලයේ ලංකාවේ හැම තැන ම දක්නට ලැබුණේ මේ ජාතියේ බස් රථය. මහනුවර සිට ගමන් අරඹන මේ බසය, *තෙල්දෙණියේ* පොලීසිය පසු කළාට පසුව, වහලේ උඩ පවා මගීන් පටවා

ගත්හ. වහලේ උඩට නගින මගීන් සමහර විට බඩු මලු උඩ වාඩි ගත්හ. දහඅට වංගු පසු කරන විට පාරට නැමී තිබුණ අතු මඟ හැරීමට සෑහෙන්ට පහත් විය යුතු විය.

බොහෝ දෙනා මහියංගණයේ ගියේ *ගල්පඩිහෙළ* හරහා පා ගමනින්ය. සැතපුම් පහළොවක් පමණ වූ මේ ගමනේ දී ද දිවා ආහාරයට බත් ගෙඩියක් බැඳගෙන ගියහ. *ගැටලාගොල්ල ඔය* අසල දී දිවා ආහාරය ගත්හ. ඉන්පසුව ගමනට පිටත් වී *ගල්පඩි හෙළ මුදුනේ දී* කොළ අත්තක් කඩා එල්ලා සමන් දෙවියන්ට බාරවූහ. *ගල්පඩිහෙලේ* මැද හරියේ දී ගල් අම්බලමක් හමුවිය. එතැනින් පහළට ගමන් කරමින් ඉදිරියට යන විට, දකුණු පසින් ලොකු දියපාරක් ගලා යන *මනන්නා ඔය* හමුවේ. තවත් සැතපුම් දෙකක් පමණ ගියතැන *චේරගංනොටට* ළඟාවිය. මහවැලි ගඟ හරහා මහියංගණයට එගොඩ වන්නේ මෙහි වූ ඔරුතොටෙන්ය. ගඟේ වතුර වැඩියෙන් තිබේ නම්, ඔරුවක් එනතුරු ගං ඉවුරේ බලා සිටිය යුතුයි. දණහිසට වැඩිය වතුර නැති වූ කල, ගඟ හරහා පා ගමනින් (පා දියෙන්) යා හැකි විය. වතුර අඩු විට ඔරු පැදීමට බැරිය. තදින් වතුර තිබෙන විට ඔරුව පැදීමට ඔරුකාරයින් දෙන්නෙක් වත් උවමනාය. දෙදෙනෙකුටත් ඔරුව පාලනය කිරීමට නොහැකි නම්, වතුර අඩුවන තුරු ගං ඉවුරේ නතර වී සිටීමට සිදුවේ.

එගොඩ ඉවුරට ගිය විට බොහෝ දෙනා මළුවට යාමට පෙර ජලස්නානය කළහ. එසේ පිරිසිදු වූ වන්දනාකරුවෝ, පිරුවට (පිරිසිදු ඇඳුම්) තිබේ නම් ඇඳගෙන පේවී, සිද්ධස්ථානය වෙත ගොස් වැඳපුදා ගත්හ. මෙහි බෝධියක්, විහාර ගෙයක් සහ ගරා වැටුණ චෛත්‍යයක් තිබිණි. ගරා වැටී තිබුණේ *මියුගුණු චෛත්‍යයයි.* මෙහි බුදුරජාණන් වහන්සේගේ කේශ ධාතු නිදන් කර, සුමන සමන් දෙවියන් විසින් හත් රියන් චෛත්‍යයක් ඉදිකර ඇත. ඉන්පසුව, රහතන් වහන්සේ නමක් *ග්‍රීවාධාතුව* තැන්පත් කර, එම මුල් චෛත්‍යය ද ඇතුළු වන සේ, රියන් දොළහක ලොකු චෛත්‍යයක් ද, ඉන්පසු ව දුටුගැමුණු රජතුමා විසින් විශාල චෛත්‍යයක් ද ගොඩනඟා ඇත. ගරා වැටී තිබුණේ මේ විශාල චෛත්‍යයයි.

මහියංගණය ගැන ධාතු විස්තරය නමැති කවි පොතේ මෙසේ සඳහන් වේ:

"මයියන් කළේ දෙවියෝ වැඩ ඉන්ට ම තු
දෙයියන් බුදුන් එක තැන පවතින්ට ම තු
කොයියන් ලෙසින් වත් වැඳ වැඳ ඉන්ට යු තු
මහියංගණේ පිහිටියේ ග්‍රීවා ධා තු

අහස පලක් බැඳ මුණි රජ වැඩ සිටි යේ
දේස දේසවල බුදුරැස් පැතිර ගි යේ
වෙහෙස නැතිව ලොවුතුරු මුනි වැඩ සිටි යේ
කේස ධාතු මහියංගණ මුල් අඩි යේ

කේස ධාතු පිහිටා දාගැබ බැන් දා
ඉඳුනිල් මිණියෙන් සත් රියනක් බැන් දා
බැඳි දාගැබ මේ තුන් ලොව පරසිද් දා
වඳිති එතන සැම දෙවියෝ නොවරද් දා"

සිද්ධස්ථානය වැඳපුදා ගෙන අවසන් වන විට රෑ බෝවේ. එකල විදුලි ආලෝකය නොමැති වූයෙන්, තද අඳුරට පෙර *පිංශාලාවට (අම්බලමට)* ගියහ. තම තමන් රැගෙන ගිය "කළමනාවලින් '' රෑ කෑම සකසා ගත්හ. ඉටිපන්දම් හෝ ලිපේ ගින්දර එළියෙන් ආහාර නිමකර, 'පිං ශාලවේ' සුදුසු තැනක නිදාගත්හ. පසුදා *උදැහැනැක්කෙන් ම* (උදෑසනින් ම) අවදි වී ආපසු ගමනට පිටත් වූහ. ආප්ප, හුළං විස්කෝත්තු, විස්කිරිඤ්ඤ වැනි යමක් කඩයකින් මිල දී ගැනීමට තිබුණොත් ආහාරයට ගෙන ගං ඉවුරට පැමිණියහ. නැවතත් ඔරුවෙන් ගඟ හරහා විත් ආපසු ගමනට පිවිසුණහ. මේ ගමනේ දී *ගල්පඩි හෙළේ* ඉහළට නැඟීමට සිදුවේ. බොහෝ විට හිස් බඩ එන සමහරකට ගල් පඩි පෙළ නැඟීම මහත් වෙහෙසකර විය. *ගැටලාගොල්ල* ඔයට පැමිණි විට, බඩ පිරෙන තෙක් වතුර බී දිය සා පිපාසය හොඳින් නිවා ගෙන ගමන අරඹා, මහවල, උඩුවාහින්න, පිටවල, බෝපාන, ගංගොඩ, මැදිවක ආදී ගම් පසුකර අපේ ගමට එන විට හවස දෙක තුන වී හමාරය. දිවා ආහාරයක් උයාගත්තේ ඉන්පසුවය.

කෝන කැමෙන් පසුව ඉතිරි ව තිබෙන කොළදින් හමාර වූ පසු, යල්කන්නට කුඹුරු වැඩ එළඹෙන තුරු ඇති විවේක සමයේ දී ප්‍රදේශයේ පන්සල්වල බණ කීම ආරම්භ කළේය. බණ කියන්නේ කොයි ගමේ පන්සලේ ද යන්න වසරින් වසර වෙනස් විය. බණ වාරය යෙදුන පන්සලේ රෑයක් හැර රෑයක් සුමාන දෙකක් පමණ කාලයක් තුළ බණ දේශනා කළහ. බණදාට අවට ගම්වාසීන් හේවිසි හොරණෑ සහිත ව පෙරහැරින් පැමිණියහ. බණ දේශනයට ධර්ම ශාලාවේ ලීයෙන් නිමකළ ආසන තිබිණි. දේශකයන් වහන්සේ සංඝාවාසයේ සිට ධර්මාසනයට වැඩම කරවූයේ අත්පුටුවේ තබා

ගෙන හේවිසියෙනි. ශක්තිමත් පිරිමි දෙන්නෙක් එකිනෙකාට මුහුණ ලා වැලමිටෙන් ද අතෙන් ද අල්ලා ගත් විට, අත්පුටුව හැදේ. දේශකයන් වහන්සේ ධර්මාශාසනයේ වාඩි කරවූ පසු වටින් තිර ඇද ආවරණය කළහ.

බණ ශාලාව ආලෝකවත් කළේ "පැට්‍රෝල්" ලාම්පුවලිනි. මේවා ලාම්පු තෙල් පුරවා හුළං ගැසූ කළ, රත් වී නලයක් දිගේ ඉහළට එන තෙල් වාෂ්ප මැන්ටලයක් තුළ දැල්වීම සඳහා නිපදවා තිබූ ලාම්පු වර්ගයකි.

දේශකයන් වහන්සේ රෑ පහන් වනතුරු "තිස්පැයේ" ම බණ දේශනා කළහ. නොයෙක් ජාතක කථා මෙම ධර්ම දේශනාවලට අඩංගු විය. ධර්මාසයනය පාමුළ වාඩිගත් උපාසක කෙනෙක් විටින් විට "එහෙයි, හාමුදුන්නේ" යයි කියමින් ප්‍රති උත්තර දුන්නේය. සිංහල පැය තුන හතරකට වරක් හේවිසි වාදනයක් කළේය. නිදිකිරා වැටෙන උපාසක උපාසිකාවන් අවදි කිරීමට මෙය උපකාර විය. මේ මගින් දේශකයාණන් වහන්සේට ද කෙටි විවේකයක් ලැබිණි. එවිට ගිලන්පස හා දැහැත් විටක් වැළඳීමට අවකාශයක් ලැබිණි. බණ හමාර වූ පසු දේශකයාණන් වහන්සේ හේවිසියෙන් සංඝාවාසයට වැඩම කරවූහ. ටික වේලාවකින් හීල් දානය පිළිගැන්වූහ. ශ්‍රාවකයන් තම තමන්ගේ නිවෙස්වලට ගියේ බණ හමාර වූ පසුවයි. එදින විවේක ගෙන පසුදා රාත්‍රියේ ද බණ ඇසීමට ගියහ. සමහර දිනවල ආසන දෙකේ බණ දේශනා පැවැත්වූහ. ඒ සඳහා දේශකයන් වහන්සේලා දෙනමක් සහභාගී වූහ. රෑ තිස්සේ ම බණකීම සිරිත විය. පැයේ බණ දේශනා කළේ දානෙකට පසුව පමණි.

මරණයක් සිදු වී දින තුනකට හෝ හතකට පසුව පන්සලේ වැඩ සිටින හාමුදුරුවන්ට සීමා වන දානයක් පූජා කළහ. හැකියාවක් ඇති ගැමියන් දවස් විසි එකකට පසුව ලොකු දානයක් පූජා කළහ. මෙවැනි දානයකට දින කිහිපයක් සූදානම් වේ. අවුල්පත් (කැවිලි) සූදානම් කර ගත යුතුය. කටු ඇඹුල්, පොළොස් ඇඹුල් වැනි වැංජන පෙර දින රාත්‍රියේ උයාගත්හ. අනෙක් වැංජන දානය දවසේ පාන්දරින් ම උයාගත්හ. මේවා උයන විට ලුණු බැලීම් ආදියකින්වත් ඉඳුල් නොකරති. දානය පන්සලට ගෙන යෑමට කුරුණි (වේවැල්) පෙට්ටි හෝ වැටකේ, ගල්ලැහැ ආදියෙන් වියන ලද පෙට්ටි භාවිතා කළහ. ඒවාට බත් වැංජන බෙදා පියන්වලින් වසා සුදු රෙදිවලින් බැඳගෙන, තවත් සුදු රෙද්දක් (පිරුවටයක්) උඩින් එළා උවැසියන්ගේ හිස මතින් හේවිසියකින් පන්සලට ගෙන ගියහ. දානයට පෙර දින සවස "මල් පූජාව" සඳහා ද දානේ ගෙදර සිට පන්සලට තෙල්, මල්, ගිලන්පස ආදිය රැගෙන හේවිසියකින් පිරිස ගමන් ගත්හ.

දානයට අවශ්‍ය භික්ෂූන් වහන්සේලා අවට ගම්වල පන්සල්වලින් වඩමවා ගත්තේ ගමේ පන්සලේ හාමුදුරුවන්ගේ ආරාධනාවෙනි. පෙරවරු එකොළහ පමණ වන විට බුද්ධ පූජාව පිළිගැන්වූහ. *මඟුල් බෙර* (ගැටබෙර)

දැවුල්, තම්මැට්ටම් වයා මේ වෙලාව සනිටුහන් කළේය. බුද්ධ පූජාවෙන් පසුව භික්ෂූන් වහන්සේලාට දන් පිළිගැන්වූහ. දානය වළඳා හමාර වී පිං පැමිණවීමෙන් පසුව, "පූජා පදය" ගැසූ විට පිංකමේ වැඩ අවසන් විය.

වස් කාලයේ දී ගමේ භික්ෂූන් වහන්සේ දිනපතා පිණ්ඩපාතයෙ වැඩිසේක. ගමේ ගෙයක් පාසා වැඩම කළ උන්වහන්සේ, ගෙදරකට පැමිණෙන විට උයා ඇති බත්, මාළු (වැංජන) ටික ටික ගෙනැවිත් පාත්තරයට බෙදූහ. *"බාස්කට්"* එකක තිබුණ භාජනවලට වැංජන වෙන වෙන ම බෙදූහ. ඇබිත්තයෙක් සිටින විට ඇබිත්තයා හාමුදුරුවත් සමඟ "බාස්කට්" එක රැගෙන ගියේය. ගෙදරකට ගිය විට "පිණ්ඩපාතේ වැඩියා" යයි ශබ්ද නඟා කීවේය. යම් ගෙයක ඒ වන විට පිසූ ආහාරයක් නොමැති වූ විට, *"අහර බෝයි"* කියා ඒ බව හැඟවූ විට, ඊළඟ ගෙදරට වැඩම කළේය. වස් කාලය අවසන් වූ විට කඨින පිංකම සිදුකරන ලදී. දවසේ උදෙන් ම පළපුරුදු භික්ෂූන් වහන්සේ නමක් විසින් සිවුර සඳහා සුදු රෙද්දක් කපා සිවුර මසා ගත්හ. ඇති තැනකින් එදිනට මහණ මැසිමක් ගෙන්නා ගත්තේය. සිවුර මසා ගත් පසු හේවිසියකින් පන්සලේ ළිඳට ගොස් සිවුර සෝදා, පඬුගසා ගත්හ. සිවුර අව්වේ වනා තෙතමනය යම් පමණකට වියළුණු පසු පන්සලට පැමිණ, දානය පිළිගැනීමෙන් පසුව කඨින සිවුර පූජා කළහ. ගමේ සියලු දෙනා ම පාහේ කඨින පිංකමට සහභාගී වූහ.

පොසොන් සමයේ පා ගමනින් මහියංගණේ යන වන්දනා කරුවනට ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීමට දංසලක් *හාල්යාලේ* ගමට පහළින් පිහිටි *පිංශාලාවේ* දී පිට ප්‍රදේශයකින් එන පිරිසක් විසින් පවත්වන ලදී.



මියුගුණ වෙහෙර

අපල උපද්‍රව මඟහරවා ගැනීමට හා ලෙඩදුක් සුව කර ගැනීමට පිරිත් කියවා ගැනීම සිදුවිය. *ගිහි පිරිත්* කියවා ගැනීම බහුල විය. භික්ෂූන් වහන්සේලාගේ පිරිත කලාතුරකින් සිදුවූවකි. පිරිත සඳහා අදාළ නිවසේ *පිරිත් මණ්ඩපයක්* සෑදිය යුතු විය. උඩුවියන් බැඳ, අවටින් ද උචිත පරිදි වෙන් කොට නූල් ඇද, *සිවිය* දළු (බුලත් දළුවලට සමාන කොළ

ජාතියක්) සහ පුවක් මල් කිනිති එල්ලා ගත්හ. *ලන්තෑරුම්* හෝ පැට්‍රෝල් ලාම්පු දල්වා ආලෝකමත් කළහ. මණ්ඩපය තුළ ඉටි පන්දම් හා පොල්තෙල් පහන් දල්වා එළිය කළහ. *පිරිත් පැන් කලය* සඳහා සෙම්බු මුට්ටියක් යොදා ගත්හ. රාත්‍රී අටට පමණ ආරම්භ කරන පිරිත පසුදා පහන් වන තුරු සජ්ජායනා කළහ. පිරිත හමාර වූ පසු, *පිරිත් පැන්* හා *පිරිත් නූල්* බෙදා දී, ඉතිරි වන නූල් සහ පැන් දින කීපයක් තබා ගත්හ. හීල් දානයෙන් හෝ උදේ ආහාරයෙන් පිරිතේ වැඩ කටයුතු හමාර විය.

ගම්වැසි සමහරෙක් අපල උපද්‍රව ආදිය සඳහා *බලියාග, යකුන් නැටීම, අඩුක්කු පිදීම* වැනි කටයුතු කළහ. බලි වර්ග කීපයක් විය. හුඹස් මැටියෙන් දේවරූපයක් අඹා වර්ණ ආලේප කර බලි සඳහා යොදා ගත්හ. උණ ලීවලින් සාදා ගත් තට්ටුවක අඹන මේ බලිරූපය බිත්තියකට හේත්තු කර නිමවා ගත්හ. නැට්ටුවන් කිහිපදෙනෙක් මේ බලිරූපය ඉදිරියේ බුදුගුණාදිය ගායනා කරමින් බෙර වාදනයට නැටූහ. බලිරූප ඉදිරියෙන් *ආතුරයා* වාඩි කරවූහ. ආතුරයාගේ දෙපස ආවඩන්නන් දෙදෙනෙක් පුවක් මල් අතැති ව වාඩි වී සිටියහ. *බලිනියන්නන්ගේ* ගායනා විටින් විට අවසන් වූ විට, මේ දෙදෙනා *"ආයිබෝ ඒවා"* කියා ආවැඩුහ. යකුන් නැටුවේ *යක්දෙස්සන්* විසිනි. ඒ සඳහා උචිත ඇඳුමකින් සැරසී, බෙර වාදනය අනුව නටන *යක්දෙස්සා,* විටින් විට ආවේශ වූයේය. යකුන් නටන විට සාදා ගන්නා යහන මත "ආයුධ" කිහිපයක් තැන්පත් කර තිබුණේය. අඩුක්කු පිදීම කිරි අම්මලාගේ දානය වැනි දෙයකි. එනමුත්, ඒ සඳහා පිටි කෙටීම හා උයමන් කළේ පිරුවට ඇඳගත් පිරිමින් විසිනි. ගමේ වෙනත් නැටුම් ගැයුම් වශයෙන් දක්නට ලැබුණේ *සොකරි නැටුමය.* ඒ ගැන දැනුමක් ඇති කිප දෙනෙක් වූහ. *සොකරි නැටීම* ද රැයක් තිස්සේ ම සිදුවිය. *සොකරි* වැනි ගැහැණු චරිතවලට ඇන්දේ පිරිමින්ය. වරක් ගමේ පන්සලේ විහාර කර්මාන්තයට ආධාර එකතු කිරීමේ මාර්ගයක් වශයෙන් *"සුවිසි නැටුමක්"* පවත්වන ලදී. මෙය දින ගණනක් ගතවන නැටුමක්ය. මේ සඳහා පුහුණුවක් තිබූ පිට ගමක කණ්ඩායමක් විසින් සුවිසි නැටුම ඉදිරිපත් කළහ.

ගමේ වැඩිහිටි සමහර දෙනෙක් සතර පෝයට ම අටසිල් සමාදන් වූහ. පෙහොය දිනයේ පාන්දර සිල්සමාදන් වූ මෙම උපාසක උපාසිකාවෝ සිල් පවාරණය කළේ පසුදින පාන්දරය. සිංහල පැයෙන් හැට පැයක් සිල් සමාදන් වී උන්හ. මුළු දවස ම ගත කළේ පන්සලේය. තම තමන්ගේ නිවෙස්වලට පැමිණියේ දිවා ආහාරයට පමණි. සිල් සමාදන් කරවීම, බුද්ධ පූජාව, ගිලන් පස පූජාව හා රාත්‍රී බණ දේශනාව වැනි අවස්ථාවල දී පන්සලේ භික්ෂූන් වහන්සේ මෙම සිල් ඇත්තන්ට මඟ පෙන්වූ නමුත්, දිවා කාලය ගත කළේ බණ පොත් කියවීමට පුළුවන් කෙනෙක් ලවා *ජාතක පොත* වැනි බණ පොතක් කියවා ගැනීමෙනි. බොහෝ උවැසියන් අකුරු කියවීම නොඳත්

නිසා, අකුරු දන්නා කෙනෙකු කියවන දේ ශ්‍රවණය කිරීමට ඔවුනට සිදුවිය. අකුරු කියවීමට දන්නා අය සිටියේ ස්වල්ප දෙනෙක් පමණයි. ඒ අතරින් ද බණ පොත් කියවීමේ විශේෂ නිපුණතාවක් තිබුණේ ටික දෙනෙකුට පමණි.

අධ්‍යාපන පහසුකම්

මේ ගමේ ළමුන් ඉගෙනීමට ගියේ සැතපුම් දෙකක් පමණ ඈතින් වූ පාසලටයි. එම පාසල *කේ/මැදිවක ස්වභාෂා මිශ්‍ර පාසල* නමින් හැඳින්විණි. මෙම පාසල එය පිහිටි ස්ථානයේ ආරම්භ කර තිබෙන්නේ 1913 වසරේ යැයි දැනගන්නට ලැබිණි. ඊට පෙර මැදිවක ගමේ ම *කබට්ටිය* නම් වූ තැනක පැරණි පාසලක් තිබුණ බව කියති. මෙම පාසලේ ගොඩනැඟිලි 04ක් විය. ස්ථිර ගොඩනැඟිල්ලක් වූ ප්‍රධාන ශාලාව හා ගුරු නිවාසය මුලින් ම ඉදිකළ බව පෙනේ. ඉන් පසුව රෙදි වියන යන්ත්‍ර ආදිය සඳහා තාවකාලික ගොඩනැඟිල්ලක් ඉදිකර තිබේ. ඒ අසලින් ම එක පන්ති කාමරයකට ප්‍රමාණවත් ස්ථිර ගොඩනැඟිල්ලක් අලුතෙන් ඉදිකර තිබිණි. තාවකාලික ගොඩනැඟිල්ලේ වහලය සෙවිලි කර තිබුණේ *ඉලුක්* සහ *පිදුරුවලිනි.* අනික් ගොඩනැඟිලි උළු සෙවිලි කර තිබිණි. *පහළ බාලාංශයේ* (හෝඩියේ) සිට *ප්‍රාරම්භය* (අටවැනි පන්තිය) දක්වා පන්ති සියල්ල ම තිබුණේ ප්‍රධාන ගොඩනැඟිල්ලේය. පසුව එක පන්තියක් ස්ථිර කුඩා ගොඩනැඟිල්ලට ගෙන ගොස් තිබේ. එහි පැවැත්වූයේ පහේ පන්තිය බව මතකය. රෙදි වියන යන්ත්‍රවලට අමතර ව ඉංග්‍රීසි පන්තිය සඳහා වෙන ම ඉඩක් තාවකාලික ව ගොඩනැඟිල්ල තුළ වෙන්කර තිබිණි.

පාසල් භූමියට ඇතුළු වූයේ එක පැත්තක විශාල ගලක් පිහිටි ගේට්ටුවකිනි. ඇතුළු වී පඩිපෙලක් බැස ඉදිරියට ගිය තැන ප්‍රධාන ගොඩනැඟිල්ල හමුවිය. මේ මඟ දෙපස ක්‍රීඩා පිට්ටනියක් තිබුණේය. විශාල ගල රජ කාලයේ රජතුමා සංචාරයේ යන විට විවේක ගැනීමට පිහිටුවා තිබූ *"වැඩිහිටිගල"* යයි කියති. දෙවෙනි ලෝක මහා යුධ සමයේ දී සෙල්ලම් පිට්ටනියේ බිම උළුප්පා බතල සිටුවන ලදී. එවකට වැඩි වැඩියෙන් ආහාර නිෂ්පාදනයට හැම දෙනා ම දායක විය යුතු විය. පිට්ටනි භූමියේ එක තැනක බෝම්බවලින් බේරීමට අගලක් හාරා තිබිණි.

දෙවන ලෝක මහා යුද්ධයට පෙර මෙම පාසලේ සිටියේ ගුරුවරු පස් දෙනෙකි. ප්‍රධානාචාර්යතුමා, ඉංග්‍රීසි ගුරුතුමා, තවත් පිරිමි ගුරුවරයෙකු සහ ගුරුවරියන් දෙදෙනෙකි. එක ගුරුවරියක් රෙදි විවීම හා අත්වැඩ ඉගැන්වූ උපදේශිකාවකි. මුල් ගුරුතුමා හැර අන් ගුරුවර ගුරුවරියන් හැම දෙනා ම මේ ප්‍රදේශයේ ම අය වූහ. ඒ නිසා මෙහි බොහෝ කල් සේවය කළහ.

එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රදේශයේ හැම දෙනා ම පාහේ මේ ගුරුවරුන් දැන හැඳින සිටි අතර, ඔවුන්ට මහත් පිළිගැනීමක් ද තිබිණි. යුධ සමයේ දී අලුතෙන් ගුරුවරු තිදෙනෙක් මාරු වී පැමිණියහ. නොයෙක් හේතු නිසා මෙම ගුරුවරු සිසුන් අතර ජනප්‍රිය වූහ. නාට්‍ය හා සංගීතය ගැන උනන්දුවක් දැක්වූ එක ගුරුවරයෙක්, සිසුන් එම අංශය කෙරෙහි යොමු කළේය. වාර අවසානයේ විවිධ ප්‍රසංග ආදියට ද සිසුන් පුහුණු කළේය. 1939 සිට 1945 දක්වා වූ වසර හයක කාල පරිච්ඡේදය තුළ, මෙම පාසලේ ප්‍රධානාචාර්ය-තුමන්ලා තිදෙනෙක් සේවය කළහ.

මේ යුගයේ පාසලේ පළමු වසර *පහළ බාලාංශය* (හෝඩිය) ලෙස ද, දෙවෙනි වසර *ඉහළ බාලාංශය* (පළවෙනිය) ලෙස ද හැඳින්විණි. තුන්වෙනි වසරේ සිට දෙක, තුන, හතර ආදී පන්ති ද නවවෙනි වසර *ප්‍රාරම්භය* ලෙස ද හඳුන්වන ලදී. මෙම පාසලේ තුනේ පන්තියේ සිට ඉංග්‍රීසි විෂයක් ලෙස උගන්වන ලදී. ඒ නිසා, දක්ෂ සිසුවෙකුට පහේ පන්තියට පමණ උසස් වූ විට යම් තරමක ඉංග්‍රීසි දැනුමක් ද තිබිණි. එක පන්තියක සිට ඉහළ පන්තියට උසස් කරනු ලැබුයේ වසර අවසානයේ පවත්වන වාර විභාගයෙන් සමත් වුවහොත් පමණකි. අසමත් වූ කෙනෙක් අවුරුදු කීපයක් වුවත් එක පන්තියක සිටීමට ඉඩ තිබේ. ක්‍රමයෙන් ඉහළ පන්තිවලට යන විට ඒවායේ ශිෂ්‍ය සංඛ්‍යාව ද අඩු විය. ප්‍රාරම්භ පන්තියේ සිටියේ සිසුන් දෙතුන් දෙනෙකි. අන් අය ගමේ ගොවියන් ගෙවිලියන් වූහ. මේ යුගයේ ගැහැණු ළමුන් පාසල් ගියේ ඉතා ම ස්වල්ප දෙනෙකි. මේ නිසා වැඩිහිටි පරම්පරාවල කාන්තාවන් *"මළපොනේ"* අකුරක් දැන සිටියේ නැත.

බ්‍රිතාන්‍ය යටත් විජිත සමය වූ මේ යුගයේ රාජ්‍ය භාෂාව වුයේ ඉංග්‍රීසි භාෂාවයි. ඒ නිසා, රජයේ රැකියා සහ උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි උගත යුතු විය. ඒ සඳහා *ඉංග්‍රීසි මාධ්‍ය පාසල්වලට* යායුතු විය. ඒවා තිබුණේ මහනුවරයි. සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගත් කෙනෙකුට රැකියාව වශයෙන් තිබුණේ සිංහල පාසල් ගුරු තනතුර හෝ *නොතාරිස්ලා* ලෙස ඔප්පු ලිවීම පමණි. ඉංග්‍රීසි දැනුමක් ඇතියවුන් ලෙස සැලකිය හැකි කීප දෙනෙක් *මාඹුගොඩ* සිටි නමුත්, ගමේ එවැනි කිසිවෙක් නොවීය. රජයේ බෙහෙත් ශාලාවේ වෛද්‍යවරයා, තැපැල් ස්ථානාධිපතිවරයා, තානායම් භාරකරු හා මහ පාරේ ඕවර්සියර් ඉංග්‍රීසි දැනුමක් තිබූ අයවූහ. මේ නිසා, ගම්වැසි යම් කෙනෙකුට රාජකාරි ලිපියක් හෝ *ටැලිග්‍රෑම්* එකක් (විදුලි පණිවිඩයක්) ලැබුණහොත් මෙවැනි කෙනෙකුගේ පිහිට පැතිය යුතු විය. බෙහෝ විට එසේ පිහිට වූයේ තැපැල් මහත්තයාය.

ගමේ පරිපාලනය

යටත් විජිත ආණ්ඩුව වෙනුවෙන් ගමේ පරිපාලනය භාර ව සිටියේ *ආරච්චි මහත්තයාය* (ගම්මුලාදැනි). ගම්මුන්ගේ ආරවුල් නිරාකරණයට ආරච්චි මහත්තයා මැදිහත් විය. ආරවුල් එතරම් නොවූ නිසා ඔහුගේ රාජකාරිය පහසු විය. දෙවෙනි ලෝක මහා යුද්ධ කාලයේ දී ඔහුගේ රාජකාරි බෙහෙවින් ම වැඩි විය. සලාක පොත් බෙදීම, අතිරේක වී අස්වැන්න තක්සේරු කිරීම (නියමිත ප්‍රමාණයට වැඩි වී අස්වැන්න රජය විසින් මිල දී ගත්තේය) වැනි බරපතල රාජකාරි මේ අතර විය. ගමේ වෙල්යායේ ජලසම්පාදනය ආදිය මෙහෙය වූ මුලැදැනි මහත්තයෙක් *(වෙල් මුලැදැනි)* සිටියේය.

ගම්මුලාදැනිවරයාට ඉහළින් ගම් කීපයක පරිපාලනය සුපරීක්ෂණයට *කෝරළේ මහත්තයෙක්* සිටියේය. අපේ ගම අයත් වූයේ ගම්පහ බස්නාහිර කෝරළයටයි. එහි කෝරළේ මහත්තයා පදිංචි ව සිටියේ *මැදිවකය.* එවැනි කෝරළ කිහිපයක් අයත් වූ කොට්ඨාශයක් විය. මේ ප්‍රදේශය ආවරණය වූ *උඩුම්බර* කොට්ඨාශයේ පරිපාලන නිලධාරියා වූයේ රටේ මහත්තයාය. රටේ මහත්තුරු දිස්ත්‍රික්කයේ (මහනුවර) සහකාර ආණ්ඩුවේ ඒජන්තවරයා මගින් පළාතේ (මධ්‍යම) ආණ්ඩුවේ ඒජන්තවරයාට *(ඒජන්තුන්නාන්සේට)* වගකිව යුතු විය. 1938 වසරේ සිට රටේ මහත්තුරු වෙනුවට *ඩියාරෝ* (ප්‍රාදේශීය ආදායම් නිලධාරි) මහත්තුරු පත් කළහ. උඩුම්බර කොට්ඨාශයේ පළමුවන ඩියාරෝ මහතාගේ කාර්යාලය *හුන්නස්ගිරියේ නුගේතැන්න* නම් ගමේ ස්ථාපිත කර තිබිණි. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී උඩුම්බර කොට්ඨාශය දුම්බර ආසනයේ කොටසක් විය.

තම නිලධාරීන් මසකට වරක් රාජකාරි සඳහා රැස්වන කොට්ඨාශ දිනයක් වේ. එදිනට මේ අය නිල ඇඳුම් ඇඳගෙන එති. වෙල් මුලාදැනියා සහ ගම්මුලාදැනියා සුදු රෙද්දක් ඇඳගෙන, හතරැස් සුදු තොප්පියක් පැලඳ උඩු කය නිරාවරණය කර ගෙන පට ලේන්සුවක් කරේ දමා ගෙන සිටිති. කෝරළේ මහත්තයා *තුප්පොට්ටියක්* ඇඳ උඩුකයට හැට්ටයක් සහ හිසට තොප්පියක් පැළඳ සිටී. රටේ මහත්තයාගේ ඇඳුම මේ සියල්ලට ම වඩා විසිතුරුය. දළදා පෙරහැරේ නිලමේ ඇඳුමට සමාන ය. *ඩියාරෝ ක්‍රමය* ඇතිවීමෙන් පසුව මෙම නිල ඇඳුම් වෙනස් වීය. ගමේ අය රැස්වූයේ ගම්සභා උසාවි ගොඩනැඟිල්ලේ දීය.

දෙවන ලෝක මහා යුද්ධය

අපේ ගම හද්ද පිටිසර ගමක් වුවත්, දෙවන ලෝක මහා යුද්ධය ඒ ප්‍රදේශයට ද නොයෙක් ආකාරයේ බලපෑම් ඇති කළේය. මෙම බලපෑම වඩාත් ම තීව්‍ර වුයේ, 1942 වසරේ අප්‍රේල් මස 5වෙනි දින ජපන්නු කොළඹට බෝම්බ දැමීමෙන් පසුවයි. අපේ ගම පසුකර මහියංගණ පාරේ සැතපුම් හයක් පමණ ගිය තැන හමුවන *තවලන්තැන්න* නම් වූ ස්ථානයේ හමුදා කඳවුරක් පිහිටුවන ලදී. කඳු ගැටයක් මත පිහිටි මේ කඳවුරේ සිට නැගෙනහිර දෙස බලන කෙනෙකුට *බිංනැන්න* තැනිතලාවේ ඈත කෙළවර දක්වා දැක ගත හැකි විය.

මහනුවර දෙස සිට මෙම කඳවුරටත් ආපසු යන එන හමුදා සොල්දාදුවන් රැගත් රථවාහන නිතර එහා මෙහා ගමන් කරන්නට විය. මෙම සොල්දාදුවන් අතර, යුරෝපීයන්, ඕස්ට්‍රේලියානුවන්, අප්‍රිකානුවන් *(කාබේරි)* හා ඉන්දියානුවන් *(මැරැට්)* වූහ. විටින් විට යුධ ටැංකි ද මේ පාරේ ගමන් ගත්තේය. යුද්ධයට පෙර, දිනකට බස් රථ දෙකක් හා කලාතුරකින් ලොරියක් ගමන් කළ මහපාරේ, දැන් වාහන රාශියක් එහා මෙහා ගමන් කරයි. කඩපොළ කලබලකාරී තත්ත්වයක් ඉසිලීය. යම් අතවරයක් වේය, යන බිය නිසා දර කැඩීමට හෝ ඉරිදා පොළට *(සන්ද පොළ)* ගිය කාන්තාවෝ මහපාරේ ගමන නැවැත්වූහ. මින් පසු වෙනත් ගම්වලින් ද *සන්ද පොළට* ගියේ පිරිමි පමණයි. මින් පෙර කිසිවිටෙක හමුදා ඇඳුම් ලාගත් සොල්දාදුවෙක් දැක නැති මේ ප්‍රදේශයේ වැසියන්ට දැන් එය සාමාන්‍ය දෙයක් විය. මෙම සෙබලු සමහරෙක් කඩපලේ වාහන නවත්වා තේ කඩයකින් පාන්, කෙසෙල් ගෙඩි ආහාරයට ගත්හ. ඒ සඳහා ඔවුන් මුදලක් දුන්නොත් මිස කඩහිමියා විසින් මුදල් ඉල්ලීමට පවා බිය වූ බවක් දක්නට තිබිණි.

ඉහළ අහසේ ගුවන් යානා පියාසර කරනවා මීට පෙර දැක නැත. එනමුත්, දැන් දැන් ගේ කුරුල්ලන් පමණ පෙනෙන ගුවන් යානා ඉහළ අහසේ නිතර දක්නට ලැබේ. දිනක් උදේ පාන්දරින් ඉතා පහළින් ගුවන් යානා රාශියක් පියාසර කරනවා දක්නට ලැබිණි. මෙම යානා කොළඹට බෝම්බ දැමූ ජපන් ගුවන් යානා වන්නට ඇත. යුද්ධය ආරම්භ වී වසරක් දෙකක් ගත වූ විට, මිණිපේ ගොවි ජනපදයේ තැනක ඉතාලි සිරකඳවුරක් පිහිටුවන ලදී. එම කඳවුරට වතුර ගෙන යෑමට දිනපතා වතුර බවුසරයක් කීප වරක් ම ගමට ඉහළින් වූ කහටගොල්ල මහ ඇළට පැමිණියේය.

මේ ප්‍රදේශයේ තරුණයන් කීප දෙනෙක් හමුදා සේවයට බැඳුණාහ. ඒ අය පිටරට ගිය බවක් ද දැනගන්නට ලැබිණි. හමුදා නිල ඇඳුම් ඇඳගෙන නිවාඩුවට ගමට එන මේ තරුණයින් බසයෙන් බැස මහත් ආඩම්බරයෙන් ගමන්ගත් බවක් පෙනිණි.

යුද්ධ සමයේ දී ජනතාවට හිඟයකින් තොර ව ආහාර ලබා ගැනීමට සලාක ක්‍රමයක් ඇති කරන ලදී. මේ සඳහා *කූපන් පොත්* (හාල් පොත්) නිකුත් කළේය. හාල් පමණක් නොව තිරිඟු ඇට ද සලාකයට දුන් අවස්ථා තිබිණි. හාල් පොත් කම්කරු, සාමාන්‍ය, ළමා, ළදරු යනුවෙන් වර්ග කර තිබිණි. කම්කරුවෙකුට සතියකට හාල් සේරු දෙකක් ද, සාමාන්‍ය පොතකට සේරු එක හමාරක් ද ළමා පොතකට සේරුවක් ද, ළදරු පොතකට සේරු භාගයක් ද බෙදා දෙන ලදී. මේ යුගයේ ධාන්‍ය වර්ග මැනීමට භාවිතා කළේ *හුණ්ඩුව, නැලිය, සේරුව, ලාහ, කාර්තුව, බුසල* යන මිනුම්ය. හුණ්ඩු දෙකක් නැලියයි. නැලි දෙකක් සේරුවයි. සේරු අටක් කාර්තුවයි. කාර්තු හතරක් බුසලයි. *ලාස්* අටක් බුසලයි. සලාකයට බෙදා දුන්නේ ආනයන කළ හාල්ය. *සුදුහාල්, මිල්චාට්* යයි හාල් වර්ග දෙකක් විය. මේවා සියමෙන් හා බුරුමයෙන් ආනයන කළහ. මේ රටවල් ජපනුන්ගේ පාලනයට යටත් වූ පසු *ඊජිප්තු හාල්* (ඉටිහාල් වර්ගයන්) සහ *තිරිඟු ඇට* සලාකයට දෙන ලදී. තිරඟු ඇට වංගෙඩියක ලා කොටා පොතු ඉවත් කර බත් උයාගත්හ. පාන් පිටි භාවිතය ව්‍යාප්ත වූයේ ද මේ යුගයේ දී ය.

ඊට පෙර බේකරියක පිළිස්සු පාන්, විස්කිරිඤ්ඤා, හුලං විස්කෝතු, බනිස්, රෝස් පාන් ආදිය තිබුණත් පාන් පිටි බහුල නොවීය. මේ ප්‍රදේශයේ කෙනෙක් පාන් ගෙඩියක් (රාත්තලක්) මිලයට ගත්තේ නෑදෑ ගමනක් යන විට පමණි. පාන් රාත්තල සමඟ සීනි භාගයක් ද (රාත්තල් භාගයක්) ගෙන යෑම සිරිතක් විය. කූපන් පොත්වලට නිකුත් කරන හාල් ප්‍රමාණය සීමා වන විට, *රොටි* කෑම සඳහා පාන් පිටි මිල දී ගැනීමට පෙළඹිණි. වී, හාල් තිබුණත් ගැමියන් පාන් පිටි රොටියක් කෑවා නම් එසේ කළේ ඒවායේ රසය බැලීමට තිබූ කැමැත්ත නිසයි. පාන් පරිභෝජනය ද වැඩි වීමට පටන් ගත්තේය. මේ නිසා, ගමේ පාසලේ ගුරුවරයෙක් ප්‍රසිද්ධ රැස්වීමක දී දිනක් කියා සිටියේ:-

දැන් අපේ ළමයි බඩගින්නට අඬන්නේ අම්මා "බත් දියන්" කියාය

නමුත් ඉදිරියේ දී ඔවුන් "අම්මා පාන් දියන්" කියා අඬනවා ඇත. යනුවෙනි. එතුමා පාන් වසංගතය දැක්කේ ඒ අයුරිනි.

කුඹුරු හිමියන්ගේ වී අස්වැන්නෙන් කොටසක් ආණ්ඩුවට විකිණීමට නියම කරන ලදී. නිවසේ පරිභෝජනයට සිටි පුද්ගල සංඛ්‍යාව අනුව කෙනෙකුට ඉතිරි කර ගත හැකි වී ප්‍රමාණය තීරණය විය. අතිරික්තය ආණ්ඩුවට විකිණිය යුතු විය. ඒ සඳහා වී බුසලකට රුපියල් හයක් ගෙවන ලදී. සමහර ගොවීන් නියම ගණන් නිළධාරීන්ට නොපෙන්වා වැඩිපුර වී ප්‍රමාණයක් ඉතිර කර ගෙන තේ වත්තේ කම්කරුවන්ට වී බුසල රුපියල් දහය හෝ ඊට වැඩි මුදලකට විකුණන ලදී. තිරිඟු පිටි, සීනි, තේ කොළ, අර්තාපල්, අල, ලුණු, ආදිය විකුණන ලද්දේ බර අනුවය. මේ සඳහා භාවිතයට ගත් මිනුම වූයේ *වීසුම* (අවුන්ස භාගය) *අවුන්සය, රාත්තල් කාල* (අවුන්ස හතර), රාත්තල්

භාගය, රාත්තල (අවුන්ස දහසය), *හොන්ඩරය* (රාත්තල් එකසිය දොළහ) සහ *ටොන් එක* (හොන්ඩර විස්ස) යනාදියයි. මේ යුගයේ මැට්‍රික් කිරුම් මිනුම් ක්‍රමය භාවිතා වූයේ නැත.

යුද්ධය උග්‍ර වන විට පිටරටින් රෙදි ගෙන්වීම ද අඩුවිය. ඒ නිසා, රෙදි බෙදා දීම ද සලාක ක්‍රමයට සිදු කිරීමට රෙදි කූපන් කාඩ් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. පසු කාලයේ දී මෙම කූපන් හාල් පොතට ම ඇතුළත් කොට නිකුත් කරන ලදී. සරමක්, චිත්ත යාර දෙකක්, සුදු රෙදි යාර දෙකක් වැනි ප්‍රමාණයක් මෙසේ බෙදා දුන් නමුත් පවුලේ හැම දෙනාට ම එය ප්‍රමාණවත් නොවීය. මේ නිසා, සමහර දෙනෙක් පාන් පිටි ආනයන කළ උරවලින් ද කමිස මසා ගත්හ. සමහර දෙනෙකුට සරමක් හෝ චිත්ත රෙදි කැබැල්ලක් ලැබුණේ වසර දෙකකට වරක් වූ අවස්ථා තිබිණි. රෙදි මැනීමට භාවිතා කළේ *යාරයේ* (අඩි තුනේ) කෝදුවයි. යාර භාගයක් *රියනකි.* දුර මැනීමේ දී අඟල, *අඩිය, යාරය, බඹය* (අඩිහය), *දම්වැල* (අඩි හැට හය), *පර්ලොම්* හා *හැතැප්ම* භාවිතා විය. යාර 1760 මෙන් ම අඩි 5280 හැතැප්මයි.

නිගමනය

මෙම විස්තරයේ ගමේ පිහිටීම, දේශගුණය, ගහ කොළ, සතා සිව්පාවා, සිරිත් විරිත්, ඇදහිලි, විශ්වාස ආදිය මෙන් ම ජීවනෝපාය යනාදියට නොයෙක් කරුණු ඇතුළත් කරන ලද්දේ මීට දශක හත අටකට පෙර පැවැති තත්ත්වයන් ගෙන හැර දැක්වීමටයි. මෙහි භාවිතා කර තිබෙන සමහර වචන පවා දැනට භාවිතයේ නැති වීමට ඉඩ තිබේ. ගමේ භූගෝලීය පිහිටීම එසේ ම වුවත්, ඒ තුළ නොයෙක් වෙනස්කම් සිදු වී තිබිය හැකිය. ගෙවල් දොරවල් වැඩි වී ඇත. ඒ නිසා, ලඳු කැලෑ දක්නට නැත. අඩිපාරවල් වැඩි වී ඇත. සිරිත් විරිත් වෙනස් වී ඇත. ගමේ වර්තමාන වැසියන්ට පවා මෙහි දක්වා ඇති විස්තරය "අලුත් ප්‍රවෘතියක්" වීමට ඉඩ තිබේ. එසේ නම්, මෙය ලිවීමේ අරමුණ ඉටුවී යයි සැහීමකට පත්වීමට පුළුවන.

02 මගේ ළමා කාලය

අප ජීවිත කාලය තුළ සිදු වූ නොයෙක් දේ සිත තුළ පැන නඟින්නේ හුදෙකලා සිද්ධි වශයෙනි. ඒ සියල්ල එක ම එක දහරාවක් මෙන් අඛණ්ඩ ව ගලා යන්නේ නැත. එනමුත්, මනසේ අතිශය වේගවත් ක්‍රියාකාරීත්වය නිසා, මෙම සිතිවිලි නොනැසී ගලා යන දහරාවක් මෙන් පෙනේ. වේගයෙන් වෙනස්වන සිතිවිලි දහරා සටහන් කර තැබීමට මහත් ආයාසයක් දැරිය යුතු වේ. පැන නැඟුන එක සිතිවිල්ලක් නැවත නැවත මෙනෙහි කිරීමට සිදුවේ.

කෙනෙකුගේ මතකයට නැඟෙන්නේ ඒ ඒ වකවානුවල දී සිතට තදින් බලපාන ලද කරුණුය. මෙයින් සමහරක් අතිශය සුන්දර හැඟීම් දනවන සුළු ඒවා විය හැකිය. එනමුත්, සමහරක් දැඩි කම්පනයක් ඇති කිරීමට හේතු වන්නට ඇත. ජීවිතයේ අඛණ්ඩ ව ගලා යන සාමාන්‍ය සිදුවීම්, පසු කාලයේ දී මතකයට නැඟෙන්නේ නැත. කෙනෙකුගේ සාමාන්‍ය ජීවිතය කෙසේ වන්නට ඇත් දැ'යි නිගමනය කළ හැකි වන්නේ, මතකයට නැඟෙන විශේෂ සිද්ධි ඇසුරෙනි. මතකයට එන සිද්ධි එකිනෙකට සම්බන්ධ වන රේඛාවක් ඇන්දහොත්, සාමාන්‍ය පැවැත්ම කෙසේ වී දැ'යි නිගමනය කිරීමට පුළුවන.

මගේ මතකයට එන පැරණිතම සිද්ධිය, ගමේ සිට සැතපුම් පහළොවක් පමණ ඈතින් පිහිටි *ඇල්දම්පෝරුව* නම් වූ මූකලානක කොටා තිබූ හේනකට සම්බන්ධ වේ. ඒ වන විට මගේ වයස අවුරුදු තුනක් පමණ වන්නට ඇත. හේනේ එක පැත්තකින් ලොකු ගස් සහිත මූකලාන් කැලෑවකි. අනෙක් පසින් පැහැදිලි දිය දහරාවක් ගලා බසින ලොකු ඔයකි. හේනේ එක් තැනක පැලක් විය. අපෙ අම්මා දිනක් මා වඩාගෙන ඔය තරණය කළාය. මේ *රත්නැල්ලේ ඔය* බව පසුව දැනගතිමි. මේ ඔය *හසලක* පසුකර ගලා ගොස් *මහියංගණයට* පහළින් මහවැලි ගඟට වැටේ. මහනුවර සිට මහියංගණයට යන මහ පාරේ එක් තැනකට රත්නැල්ලේ දිය ඇල්ල මනා ව දිස්වේ.

අම්මාත්, මාත් තවත් කීප දෙනෙකුත් ඔයෙන් මෙගොඩ වී මෙසේ පැමිණියේ අපේ ගමට එන්නටයි. ඒ ගමනේ දී ඊළඟට මතකයට නැඟෙන්නේ

දහ අට වංගු පෙදෙසේ මහ පාරේ ගමන් කිරීමයි. අපේ ගමේ වැඩිහිටියෙකු කර පිටින් මා එන අතරතුර (තුන්වෙනි වංගුවට ඉහළින් පමණ), මහපාරේ එක් තැනක කාර් එකක් නවතා තිබිණි. ඒ අසල "සුද්දන්" ජෝඩුවක් උන්හ. අපේ වැඩිහිටියා ඒ යුරෝපීයයන්ගෙන් හිස් බෝතලයක් ඉල්ලා ගත්තේය. එය තද කොළ පාට බෝලතයක් බව දැනුදු මට "පෙනේ". ඉන්පසුව සැතපුම් දහයක් පමණ මඟ ගෙවා ගමට පැමිණි නමුත් ඒ අතරතුර කිසිවක් මතක නැත. මේ සිද්ධිය මෙසේ සඳහන් කළේ මගේ මතකයේ ස්වභාවය පෙන්වීමට උදාහරණයක් වශයෙනි. එනමුත්, මේ කථාව මුල සිට පටත් ගත යුතුය. ඒ නිසා මුලට යමු.

අපේ නිවසේ පිහිටීම

මහනුවර-වේරගංතොට (මහියංගණය) මහපාරේ විසිපහේ සැතපුම් කණුව ළඟින් වැටී ඇති ගම්සභා පරේ අපේ ගමට එන කෙනෙකුට ඉහළ ගම්මැද්දේ ඉහළින් ම පිහිටි ගෙවල් දෙකතුනක් හමුවේ. අපේ නිවස ඉන් එකකි. එය ඉදිකර තිබුණේ *"දේවාලේ වත්තේ"* ය. මෙම ගෙවත්තේ බටහිර, උතුර, නැඟෙනහිර දෙසින් වූ ගම්සභා පාර ගමේ අනික් ගෙවල් තිබූ දකුණු දෙසට වැටී තිබිණි. දේවාලේ වත්තේ අග්නි දිග කෙළවර දිය උල්පතක් විය. එම දියපාර වත්තට පිටින් වූ ශෛලමය පිහිල්ලකට හරවා තිබිණි. ඉහළ ගම්මැද්දේ වැසියන් පානීය ජලය ලබා ගත්තේ මේ පිහිල්ලෙනි.

අපේ ගෙවත්ත අක්කර කාලක් - භාගයක් අතර ප්‍රමාණයක් වන්නට ඇත. ගෙවත්ත වටේ ගල්වැටක් බැඳ ගම්සභා පාරෙන් වෙන් කර ගෙන තිබිණි. දකුණු පසින් ගස් කොළන්වලින් යුත් වැටක් විය. වැටේ තැනින් තැන උණ පඳුරු කීපයක් විය. ගෙවත්ත තුළ *කොස්, දෙල්, කිතුල්, දේශීය කෝපි* වැනි ගස් කීපයක් තිබිණි. *සුදු අලකොළ, හුලංකීරිය, බුස්සරණ, අරත්තා* වැනි පැළෑටි වර්ග ද ගෙවත්තේ වවා තිබිණි. *නීං නාරන්* ගසක්, *නත්තරං* ගසක් හා *දෙහි ගසක්* ද තිබිණි. ඉඩමේ ඉහළ ම කෙළවරේ හරක් ගාලක් විය. ගම්සභා පාරෙන් එයට ඇතුළු වීමට ඉදිකඩක් තිබිණි. (65, 68 පිටුවල පිංතූර බලන්න)

අපේ නිවස කාමර දෙකකින් හා ඒ දෙක දිගට වූ ඉස්තෝප්පුවකින් (ශාලාවකින්) සමන්විත විය. කළුගල් බිත්තියෙන් යුක්ත වූ නිවසේ වහළ සෙවිලි කර තිබුණේ *ටකරන්* තහඩුවලිනි. ඉදිරිපස මිදුලේ සිට ශාලාවට ඇතුළු වීමට දොරක් විය. ශාලාවෙන් කාමරවලට පිවිසීමට දොරටු දෙකක් විය. එක කාමරයකින් ගෙදර පිටුපස මිදුලට යෑමට දොරක් තිබිණි. ගෙයින් පිටට වෙන ම තිබූ මුළුතැන්ගෙය ඉදිකර තිබුණේ පිටුපස මිදුලේය. කටු මැටි බිත්තිවලින් යුක්ත වූ මුළුතැන්ගෙයි වහල සෙවිලි කර තිබුණේ *ඉලුක්* හා *පිදුරුවලිනි.* මුළුතැන්ගේ පැත්තේ හා පිටුපස මිදුල පැත්තේ නිවසට පිටින්

අඟල් දහ අටක් පමණ පළලට පිලක් ඉදිකර තිබිණි. ශාලාවට ඇතුළු වීමට තිබුණ දොරකඩට ඉදිරියෙන් ලොකු ගලක් යට කර තිබිණි. ඒ මතට පිවිසි විට පය සෝදා ගැනීමට හැකි විය.

නිවසේ ඉදිරිපස දොරෙන් පිටවී, වමට හැරී මිදුල දිගේ ගොස්, උතුර පසින් වූ *ඉදිකඩුල්ල* පසුකර ගම්සභා පාරට පිවිසීමට හැකි විය. මහපාරට යන විට හරක් ගාල අසල තිබූ ඉදිකඩුල්ලෙන් පිට වී ගම්සභා පාරේ ඉහළට යා යුතුය. ගමේ නැගෙනහිර දෙසින් වූ *'අමුතුකොළ හින්න'* නම් වූ වංගුවෙන් නුවර දෙසට යන රියක් ශබ්ද නඟා ගමන් කරනවා අපේ නිවසට ඇසිණි. අප ළමා කාලයේ දී ඒ ශබ්දය අසෙන විට ගෙදර සිට ඉහළට දුවගොස් බස්රියට ගොඩ වූ අවස්ථා තිබිණි.

පවුලේ තොරතුරු

අපේ අප්පච්චී උපන්නේ 1889 වසරේ බව දැනගන්නට ලැබිණි. දිනය හා මාසය නොදනිමි. එතුමාට වයස අවුරුදු දහ හතර වන විට තම පියා (අපේ ලොකු අත්තා) අභාවප්‍රාප්ත වී තිබේ. පවුලේ වැඩිමලා වූ නිසා, එතැන් සිට තම මෑණියන් හා බාල සහෝදරයන් දෙදෙනෙක් ජීවත් කරවීමට තම පාසල් ගමන අතහැර, ගොවිතැනෙහි නිරත වීමට දහහතර හැවිරිදි මේ "ළමයාට" සිදු වී ඇත. ගමේ සිටි දක්ෂ ගොවියෙක් බවට පසු කාලයේ දී ගම් වැසියන් අතර පිළිගැනීමක් එතුමාට තිබිණි. ගමේ වෙල් යායේ තැනින් තැන තිබූ වී හත්පෑලක් පමණ මහට ද, හතර පෑලක් පමණ යලට ද වැඩ කර, පෑලකින් වී බුසල් විස්සක පමණ අස්වැන්නක් ලබා ගත්තේය. ඒ නිසා අපේ ගෙදර ආහාරපානවලින් අඩුපාඩුවක් නොවීය. මිණිපේ ගොවි ජනපදය ආරම්භ කළ මුල් කාලයේ දී ම එහි ගොස් මඩ ඉඩම් අක්කර පහක් ද (වී දහපෑළක්) ගොඩ ඉඩම් අක්කර තුනක් ද ලබා ගෙන එහි ස්ථීර පදිංචියට ගිය නිසා, ඒවා වගා කර ලොකු ආදායමක් උපයා ගත්තේය. ගමේ කුඹුරු අඳේට දීමට සිදුවිය. කර්කෂ දේශගුණය නිසා මිණිපේ ජීවිතය බෙහෙවින් ම දුෂ්කර විය. වයස අවුරුදු හැත්තෑවක් පමණ ජීවත් වූ අප්පච්චී, 1959 ජනවාරි මාසයේ දී අභාවප්‍රාප්ත විය.

අපේ අම්මා උපත ලබා තිබෙන්නේ 1894 වසරේ දී ය. වයස අවුරුදු අසූ තුනක් ජීවත් ව සිට 1977 ජූනි මාසයේ දී අභාවප්‍රාප්ත වූවාය. අම්මා ක්‍රියාශූර ගෙවිලියක් වූවාය. ඉතා සකසුරුවම්න් කටයුතු කළ එතුමිය, ගොවි ගෙදරක ගෘහණියකගෙන් ඉටු විය යුතු සියලු කාර්යයන් ඉතා හොඳින් සිදුකළාය. දෙවන ලෝක මහා යුද්ධ සමයේ දී ආහාර හිඟයකට මුහුණ දුන් වතුකම්කරුවන් වී මිලයට ගැනීමට අපේ ගමට පැමිණි නිසා, අපේ අම්මා ද ඔවුන්ට වී විකුණුවාය. ඒ මඟින් මුදල් ඉතිරි කිරීමට හැකි විය. එසේ

රැස්වූ මුදල් *පින්තල හෙප්පුවක* (පෙට්ටියක) දමා සඟවා තැබීය. මේස ලාච්චුව එළියට ඇද්දවිට පිටිපසින් තිබුණ හිඩැස තුළ හෙප්පුව සඟවා තැබුවාය. අම්මා මුදල් සැඟවූ තැන මා දැක ඇති නමුත්, වෙන කවුරුවත් ඒ ගැන දැන සිටියා දැ'යි නොදනිමි. මම අවශ්‍ය වූ විට එයින් රුපියලක් පමණ ගැනීමට පුරුදු වී සිටියෙමි. අම්මාට නොදන්වා ගත් නිසා එය "හොරකමක්" වන්නට ඇත.

මගේ ළමා කාලය අම්මාගේ ඇසුරේ ගත කළේ අප්පච්චී ටිකක් "සැර" නිසාත් මගේ වයස අවුරුදු හතරක් පමණ වූ විට එතුමා මිණිපේ ගිය නිසාත්ය. අම්මා මිණිපේ පදිංචි වන්නට ගියේ 1949 වසරේ දී පමණය. මගේ වයස අවුරුදු තුනක් පමණ වන තෙක් මව් කිරි බී ඇත. ඒ වයසේ දී දිනක් අම්මා මස් කෑ නිසා, මට කිරි බීමට උවමනා වූ විට, අම්මාගේ කට හෝදා ගෙන එන්ට කී බවක් සඳහන් කරමින් පසු කාලයේ දී මට අහිංසක විහිළුවක් කළාය. මා වැඩිහිටියෙකු වූ පසුව ද මස් කන්නේ නැත.

'ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා' සහ **'අබේසිංහ මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකා'** නම් වූ මගේ මව්පිය දෙදෙනාට පිරිමි දරුවන් දෙදෙනෙක් සහ ගැහැණු දරුවන් හතර දෙනෙක් වූහ. පවුලේ වැඩිමලා, අපේ අයියා, ඉපදී තිබෙන්නේ 1914 වසරේ දී ය. ඉන්පසු අවුරුදු තුන හතරකට වරක් බැගින් පවුලේ ඉතිරි අය ඉපදී ඇත. දෙවෙනියා ලොකු අක්කාය. තුන්වෙනියා හීං අක්කා (පසුව අපි ඇයට *'කලාවැවේ අක්කා'* යැයි කීවෙමු) හතරවෙනියා පිරිමි ළමයෙක් වුවත්, මා දන්නා විට ඔහු ජීවතුන් අතර නොවීය. ඒ නිසා අපි පවුලේ හතරවෙනියා ලෙස සැලකුවේ ද මට වැඩිමහල් අක්කාය. කලාවැවේ අක්කාට පසුව *'හීං අක්කා'* යයි මා ඇමතුවේ ඇයටයි. මට බාල නංගී පවුලේ *"බඩ පිස්සී"* වූවාය.

මගේ දෙමව්පියන් ආගම දහම අනුව ජීවත් වූ බවට ගම්වැසියන් අතර පිළිගැනීමක් තිබුණු බව පෙනේ. ගමේ වැඩිහිටි සමහර කෙනෙක් අපේ අප්පච්චී ඇමතුවේ *"උපාසක උන්නැහේ"* කියාය. ගමේ සිටිය දී අප්පච්චී හතර පෝයට අටසිල් සමාදන් වූ බව මතකය. ඒ කාලයේ ලොකු අක්කා ද අටසිල් සමාදන් වූවාය. අම්මාගේ දෙමව්පිය දෙදෙනා ද (ලොකු අත්තා සහ හීං අත්තා) අටසිල් සමාදන් වූ දිනවල දිවා ආහාරය සඳහා අපේ ගෙදරට පැමිණියහ. මෙම සිල්කාරයින් හතර දෙනාට ම ආහාරය සකස් කළේ අපේ අම්මාය. ඒ අයට උපස්ථාන කිරීම අටසිල් සමාදන් වනවාට වඩා අම්මාට සතුටක් ගෙන දුන් බව දක්නට තිබිණි.

මා උපන් 1933 අවුරුද්දේ දී, එවකට වයස අවුරුදු දහනවයක් වූ අපේ අයියා බිංතැන්නේ රටේ මහත්තයාගේ ලිපිකරු වශයෙන් සේවය කිරීමට මහියංගණයට ගොස් සිටියේය. ඉන්පසුව (අයියා) විවාහ වනතුරු අපේ ගෙදර

හැම දෙනාට ම සිංහල අවුරුද්දට අලුත් ඇඳුම් ගෙනත් දුන්නේ අයියාය. අවුරුද්දට *රතිඤ්ඤා* ගෙනාවේ ද අයියාය. හීං අක්කා කලාවැව (කාගම) ගොවි ජනපදයේ ගොවියකු සමඟ විවාහ වී එහි ගියාය. ඈ *'කලාවැවේ අක්කා'* වූයේ එසේය.

ඒ අක්කා පළමුවන දරු ප්‍රසූතිය සඳහා ගමට පැමිණ රජයේ රෝහලේ දී බිහි කළ දරුවා අභාවප්‍රාප්ත විය. ඊළඟ වසරේ බිහිකළ දරුවාට දින විස්සක් පමණ වන විට අක්කා අභාවප්‍රාප්ත විය. දරු ප්‍රසූතියෙන් පසුව බලවත් ලෙස රෝගාතුර වූ අක්කාට ගෙදර දී ගමේ වෙද මහතාගෙන් ප්‍රතිකාර ලබා දුන් නමුත්, සුව කර ගැනීමට බැරිවිය. අක්කා විඳි දුක හා ඇගේ මරණය කුඩා මට ද දකින්නට ලැබිණි. එය මට මහත් වේදනාවක් හා කම්පනයක් ඇති කළ සිද්ධියක් විය. කලාවැවේ අක්කාගේ දරුවා හදාවඩා ගත්තේ අපේ අම්මාය. ඒ නිසා ඒ දරුවා ද "අපේ අම්මා" යයි ඇමතුවේ ඇගේ *හීං අත්තා* වූ අපේ අම්මාටය. කලාවැවේ අක්කාගේ අභාවය සිදුවූයේ මගේ වයස අවුරුදු දොළහේ දී ය.

මා පාසල් යෑමටත් පෙර අපේ පවුලේ වයසක ඥාතිවරියක් මරණයට පත්වූවාය. ඒ අපේ අප්පච්චිගේ අම්මා (හීං අත්තා) ය. එතුමිය කෙරෙහි මා තුළ යම්කිසි ගෞරවයක් තිබුණි. එසේ වුවත්, එතරම් ලෙන්ගතුකමක් තිබුණා යයි කිව නොහැකිය. වයස්ගත ව සිටි හීං අත්තාට අසනීපාදියක් තිබුණේ නැත. දිනක් රාත්‍රියේ වතුර උණු කර අත පය සෝදා ගෙන නින්දට ගිය එතුමිය පසුදා අවදිවූයේ නැත. *හීං අත්තා* ජීවත්වූයේ පහළ ගම්මැද්දේ පිහිටි අපේ මහ ගෙදර (පහළ ගෙදර) යි. අපේ *හීං අප්පච්චිලා* දෙන්නෙක් ම විවාහ වී, තම පවුල් සමඟ පදිංචි ව සිටියේ ඒ ගෙදර ම කොටස් දෙකකය. පසුදා උදේ ම හීං අත්තාගේ මරණය ගැන දැනගන්නට ලැබුණේ ඒ නිසාය. අප පදිංචි ව සිටියේ ඉහළ ගැම්මැද්දේ පිහිටි අපේ ගෙදරය.

හීං අත්තාගේ භූමදානය සිදුකළේ දින දෙක තුනකට පසුවයි. මරණය සුසාන භූමියට ගෙන යෑමට සූදානම් වූ අවස්ථාවේ, මරණ ගෙදර සිටි නෑදෑයෝ අඬා වැළපෙන්නට පටන් ගත්හ. මේ සම්බන්ධයෙන් කුඩා මට කණගාටුවක් දුකක් වශයෙන් කිසිම හැඟීමක් නොතිබුණ නමුත්, බාල මහලු බොහෝ දෙනා ඇඬූ නිසා මා නොහඬා සිටීම වරදක් යැ'යි සිතා මම ද අඬන්නට පටන් ගත්තෙමි. එසේ ටික වේලාවක් අඬන විට කඳුළු ගලන්නට ද පටන් ගත්තේය. බොරු ඇඬීම ඇත්ත වූවා වැන්න.

මේ මරණ ගෙදරට බඹරදෙණියේ පදිංචි ව සිටි අපේ *"උඩුනුවර නැන්දම්මා"* ද පැමිණියාය. එතුමිය හීං අත්තාගේ එක ම දියණියයි. නැන්දම්මාට මගේ වයසේ පුතෙක් සිටි නිසාත්, එතුමිය අපට බොහෝ ලෙන්ගතු වූ නිසාත්, ඇගේ පැමිණීම ගැන මම බෙහෙවින් ම සතුටු වීමි. මරණයෙන් ටික දිනකට

පසුව නැන්දම්මා ආපසු ගොස් විසි එක් දවසේ (අපේ ගමේ තුන්මාසේ දානයක් නොවීය) දානයට ටික දිනකට පෙර නැවත පැමිණියාය. දානයට අවශ්‍ය කැවිලි, *ආසම්, උඳුවැල්, කැවුම්* යනාදිය සකස් කළේ නැන්දම්මාය. මේ නැන්දම්මා අපේ අප්පච්චීගේ එක ම සොහොයුරිය වූවාය. එතුමිය අපේ අයියාගේ වයසේ වී යයි කියනු ලැබේ. එවකට පොලීසියේ සේවය කළ බඹරදෙණියේ කෙනෙක් සමඟ විවාහ වී එහි පදිංචියට ගොස් ඇත.

අප්පච්චීගේ බාල සහෝදරයින් දෙදෙනා ම විවාහ වීමෙන් පසුව ද පදිංචි වී සිටියේ මහගෙදරය. මැද මිදුලක් සමඟ වූ ඒ නිවස ඒ ප්‍රදේශයේ පැවැති තත්ත්වය අනුව පවුල් දෙක තුනකට ජීවත්වීමට ඉඩකඩ තිබිණි. වැඩිමහල් හීං අප්පච්චි එක් පසක කාමර දෙකක් හා මුළුතැන්ගෙයක් සහිත කොටසක් ද බාල හීං අප්පච්චි පිටංගනයට වන්නට අලුතෙන් ඉදිකර ගත් කොටසක් ඇතුළු ව මුළුතැන්ගෙය සහිත කාමර තුනක් ද පරිහරණය කළහ. අප්පච්චි දේවාලේවත්තේ නිවස ඉදිකර ගෙන එහි පදිංචියට ගියේ මහගෙදර ඉඩකඩ අල්ප වූ නිසා වන්නට ඇත. අපේ පවුල අලුතෙන් ඉදිකර ගත් නිවසේ පදිංචියට පැමිණීම, මගේ උපත හා අයියා රැකියාවකට යාම එක ම වකවානුවේ සිදු වූ බව පෙනේ. ඒ 1933 වසරේ දී ය.

බාල හීං අප්පච්චි විවාහ කර ගෙන සිටියේ අපේ අම්මාගේ බාල සොහොයුරියකි (හීංඅම්මා). ඒ නිසා එම පවුලේ සහෝදර සහෝදරයින් හා අප අතර තිබුණ බැඳීම ලොකු හීං අප්පච්චීගේ දරුවන් සමඟ තිබූ බැඳීමට වඩා දැඩි වීයයි සිතේ. මා කුඩා කාලයේ අපේ ගෙදර (ඉහළ ගෙදර) සිට මහගෙදරට (පහළ ගෙදරට) ගිය විට දී වැඩි වශයෙන් ඇදුණේ හීං අම්මාගේ ගෙට මිස කුඩම්මාගේ (වැඩිමහල් හීං අප්පච්චීගේ බිරිඳ) ගෙට නොවේ.

අපේ අම්මාගේ බාල ම සොහොයුරා (හීං මාමා) අපේ ගමේ ම පදිංචි ව සිටියේය. ලොකු මාමා දෙවහන්දියේ පදිංචියට ගොස් සිටියේය. බාල ම හීං අම්මා ද දෙවහන්දියේ කෙනෙකු සමඟ විවාහ වී සිටියාය. ලොකු හීං අම්මා පිටවල ගමේ කෙනෙක් සමඟ විවාහ වී එහි පදිංචියට ගොස් සිටියාය. අම්මාගේ එක සහෝදරයෙක් සසුන් ගත වී, පසු කාලයේ දී අස්ගිරි මහා විහාරයේ අනුනායක පදවියට පත් ව වැඩහුන් සේක. උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනේ අධ්‍යාපනය ලබා පණ්ඩිත උපාධිය සහ ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යා විශාරද උපාධිය ලබා සිටි සංඝ පීතෘවරයෙකු විය.

බාල ළමා කාලයේ කෙළි සෙල්ලම්

කුඩා වයසේ දී මා හැදී වැඩුණේ අම්මා සහ අක්කලා ඇසුරේය. සම වයසේ වෙනත් පිරිමි ළමයෙකු නොවූ නිසා, නිවසේ දී කෙලි සෙල්ලම් කළේ මට අවුරුදු දෙක තුනක් වැඩිමහල් වූ අක්කා සමඟය. මිදුලේ කොනක ලිපක් බැඳ, පොල් කටු වලංවල වැලි බත් හා ගෙවත්තෙන් කඩාගත් (ප්‍රයෝජනයට ගත නොහැකි වූ) කොළ ජාතියකින් වෑංජනයක් උයා ගැනීම දිනපතා ම වාගේ කළ සෙල්ලමකි.

ලඟපාත ගෙවල්වල සම වයසේ ගැහැණු පිරිමි ළමුන් අසල ගෙදරකට රැස්වී "පෙරහැර පවත්වා බුද්ධ පූජාකිරීම" සිරිතක් විය. අසල වේල්ලකින් කිරිමැටිවලට සමාන "මකුළු" ටිකක් කඩා ගෙන, වතුරෙන් අනා, කුඩා බුදු පිළිම අඹාගතිමු. හොඳට ඉදී කළු පැහැ ගැන්වුණු හිඟුරු ගෙඩිවලින් නේත්‍රා තබා ගත්තෙමු. වේල්ලක් හාරා පිළිම ගෙයක් නිර්මාණය කර බුදුපිළිම එහි තැන්පත් කර මල් පූජා කළෙමු. ඉටිපන්දම් කැල්ලක් සොයා ගැනීමට ලැබුණොත් පහනක් ද දැල්වීය. උණ පුරුක්වලින් නිම කළ දඬුබෙර වැල්පටකින් කරේ එල්ලා ගෙන, කෝටු කැලි දෙකකින් ගසමින් බෙර වාදනය කළෙමු. ගන්සූරිය කොළවලින් හොරණෑ සාදා ගතිමු. උණ අතු පුරුකකින් කපා නිම කරගත් "තුවක්කු"වලින් වෙඩි ශබ්දය නිකුත් විය. අච්චු බටය, අච්චු කුර සවිකළ මිට යනාදියෙන් "තුවක්කුව" සමන්විත විය. වෙඩි පත්තුවීමට යොදා ගත්තේ ඉත්ත ගෙඩි හෝ කොස්දන් ගෙඩිය. එක ගෙඩියක් අච්චු බටය තුළට බහා, අච්චුකුරක් එම බටය තුළ එක් කොනකට තල්ලු කර, තව ගෙඩියක් බහා තල්ලු කළ විට, මුලින් ඇතුළු කළ ගෙඩිය වායු පීඩනය නිසා ශබ්ද නඟා පිටවේ. මේ ආකාරයට හේවිසි හොරණෑ වෙඩිහඬ නඟමින් ද සාධුකාර දෙමින් ද පෙරහැර ගේ වටා ගොස් "විහාරය" ළඟට පැමිණේ. කොළුකෙළි රැළ වැඩි වූ විට මහත් කෝලාහල (ගාලගෝට්ටියක්) ඇති පෙරහැරක් වේ. වැඩිහිටි බොහෝ දෙනා හේන් කුඹුරු වැඩවලට ගොස් සිටි නිසා මේ කෝළාහලය නැවැත්වීමට කිසිවෙක් නොවීය.

කුඹුරු කොළදින් කළාට පසුව, හැන්දෑවට ගමේ කොල්ලන් බෝල ගැහීමට රැස්වූහ. ඒ සඳහා සුදුසු ලියදි තිබෙන කුඹුරු දෙක තුනක් විය. ලොකු ලියද්දක, වටේට අඩි කිහිපයකට ඇතින් වන සේ, වටරවුම් කීපයක් උදලු ගා ගත්හ. එක පැත්තක මැද හරියේ තවත් වටයක් සකස් කළහ. මේ බෝල ගහන පිට්ටනියයි. පාන්කඩ කීපයක් ඔතා බෝලයක් හදා ගෙන, ගැලවීම වැළැක්වීමට රබර් කිරි දවටා ගත්හ. (මේ දේශීය රබර් වර්ගයක් විය) රියනක් පමණ ලී කෑල්ලකින් "බෝලපත්ත" සැකසූහ. එයින් බෝලයට ගසා ඇතට ගිය විට පෙත වටා දුව ගියේය. වටේට ම එකවර දිවීමට බැරි නම්, අතරමඟ ඇති කොටුවක නතර වේ. කොටුවකට පැමිණීමට පෙර බෝලයෙන් ගැසූ විට දැවී යයි. ඊළඟ ක්‍රීඩකයා දුවන විට, අතරමඟ නතර වී සිටි ක්‍රීඩකයා ද

ඉදිරියට දිව ගොස් මුලස්ථානයට ළඟාවිය යුතුය. බෝලය ගසා උඩින් එන විට ඇල්ලීම නිසා හෝ දුවයන විට බෝලයෙන් ගැසීම නිසා දැවී යන ක්‍රීඩකයන්, ඒ පිලේ වෙනත් ක්‍රීඩකයෙකු විසින් බෝලය ගසා මුළු රවුම ම හෝ දිවගොස් "උපද්දවා" ගැනීමට පුළුවන. (මෙය එල්ලේ ක්‍රීඩාවට සමාන යයි සිතේ). දෙපිල මාරුවෙන් මාරුවට ඇදිරි වැටෙන තුරු ම බෝල ගැසූහ. කුඩා ළමුන් පසෙකට වී බලා සිටියහ. ඔවුන්ට බෝල ගැසීමට ලැබෙන්නේ ලොකු ළමයි අඩු වූ විටකයි.

කුඹුරුවල මෙන් ම මිදුලක ද *ගුඩු සෙල්ලම්* කිරීමට පුළුවන. මේ සඳහා අඩි එක හමාරක් පමණ දිග ගුඩු ලීයක් සහ *''ගුඩු කුට්ටියක්''* අවශ්‍යය. මිදුලේ හෝ ලියද්දක යම් තැනක දිගැටි වලක් හාරා, ඒ මත කුට්ටිය තබා ලීයෙන් ඈතට විදිය යුතුය. ඈතට විදින ලද කුට්ටිය නැවත වල ළඟට වීසි කරන විට, ගුඩු ලීයෙන් එයට ගැසිය යුතුය. මේ ආකාරයට තුන්වරක් කුට්ටියට ගසා ඈතට ගිය විට ගුඩු ඇදීම සිදුකරති. ක්‍රීඩකයන් දෙන්නෙක් කුට්ටිය දෙකොනෙන් අල්ලා ගෙන වල ළඟට දිව එති. අන් අය ද ඒ පිටුපස දුවගෙන එති.

''අඹ කොට්ටන් පැනීම'' තවත් ක්‍රීඩාවකි. කෙනෙක් දෙන්නෙක් සිටියත් නිරත වීමට පුළුවන් ක්‍රීඩාවකි. මිදුලේ කොටු ඇඳගෙන, කොටුවෙන් කොටුවට අඹ ඇටයක් හෝ වලං කැබැල්ලක් වීසි කරමින්, එක කකුලකින් පැන ගොස් *"කොට්ටමට"* පයින් ගසා එළියට යැවීම හා ආපසු පැන ඒම මේ ක්‍රීඩාවේ ස්වරූපයයි. කොටු පැනීමේ ක්‍රම දෙකක් වේ. ඒ සඳහා ඇඳගන්නා කොටුවල හැඩය ද වෙනස්ය. තනි කෙනෙකුට වුවත් මේ ක්‍රීඩාවේ නිරත වීමට පුළුවන. පිල් බෙදීමක් සිදු නොවේ.

පුවක් ගැසීම, මිදුලක කළහැකි ක්‍රීඩාවකි. අඟල් හයක් පමණ ගැඹුරට රවුම් වළක් හාරා ගෙන, අඩි පහක් පමණ ඈතින් සිට, පුවක් ගෙඩියක් වළට වැටෙන සේ "කිරීමෙන්" ක්‍රීඩාව ආරම්භ වේ. මේ සඳහා කීප දෙනෙකුට සහභාගි වීමට පුළුවන. පුවක් ගෙඩියෙන් කිරන විට, එය වැටුණ තැන අනුව ක්‍රීඩා කිරීමේ ප්‍රමුඛත්වය හිමි වේ. මුල් ක්‍රීඩකයා හැම දෙනාගේ ම පුවක් එක අතකින් ගෙන වළට වීසි කරයි. වළෙන් පිට වැටී තිබෙන පුවක් ගෙඩියක් පෙන්වූවාට පසු, ලැලි රවුමකින් *("සිල්ලා")* ඒ ගෙඩියට ගැසිය යුතුය. වෙන පුවක් ගෙඩියකට නොවැදිය යුතුය. වළේ වැටී තිබෙන පුවක් ඔහුට හිමි වේ. ඊළඟ ක්‍රීඩකයා ද මේ ආකාරයට ක්‍රීඩාවේ යෙදේ. පුවක් ගෙඩි සියල්ල ම වළට වැටුණොත් නැවතත් මුල සිට ක්‍රීඩාව ආරම්භ කරනු ලැබේ. පරදින කෙනෙකුට ජයග්‍රහකයාගෙන් පුවක් ණයට ගැනීමට පුළුවන.

සිංහල අවුරුදු කාලයට වැඩිහිටියෝ *'වල සල්ලි'* ගසති. ඒ සඳහා භාවිතා කළේ තඹ සතේ කාසිය. මූලධර්මය පුවක් සෙල්ලම හා සාමානය. පැරණි රවුම් සත පහේ කාසියක් *"සිල්ලා"* ලෙස යොදා ගත්හ. මෙය යම් ආකාරයක "සූදුවක්" නිසා කුඩා අපට තහනම් වූ ක්‍රීඩාවකි.

කුඩා ළමුන් නිරත වූ තවත් සෙල්ලමක් නම් *''අන්තම් කෙළිය''* යි. එක් කෙනෙකුගේ අල්ලට ගසා අනික් අය දුව ගියහ. අත දිගු කර සිටි ළමයා දුව යන ළමුන් පසුපස එළවා කවුරු හෝ අල්ලා ගත යුතුය. අහුවන කෙනා ඊළඟ වාරයේ දී අන් අය පසුපස එළවා ගොස් කෙනෙකු අල්ලා ගත යුතුය. අසු නොවී සිටීම මේ ක්‍රීඩාවේ ස්වභාවයයි. මට බඩගිනි වූ විට හෝ ගෙදර යන්නට හිතුණ විට, අතට ගසා දුවගොස් නතර වූයේ අපේ ගෙදරට ම ගියාට පසුවයි. මෙය ළමා වයසේ දී දුව පැන යන්නට පුරුදු වීමට හොඳ ව්‍යායාමයකි. මේ ක්‍රීඩාවට සහභාගි වන සමාජිකයන්ගේ සීමාවක් නැත.

පිල් බෙදීමට අවශ්‍ය විට ක්‍රීඩකයින් ජෝඩු වී *'උච්චි උච්චි'* කියමින් නායකයන් දෙදෙනා ළඟට යති. නායකයන් *"තෝන්"* කියති. එවිට කලින් කථාකර ගත් යම්කිසි දෙයක් සඳහන් කර නායකයන් ඉල්ලන්නේ කුමක් දැ'යි විමසති. උදාහරණයක් ලෙස, "ගල ද? මල ද?" කියා ඇසුවොත්, ඉල්ලීමට වාරය තිබෙන නායකයා "මල" ඉල්ලුවොත්, මල ලෙස නියම කර ගත් ක්‍රීඩකයා ඒ පිලට එක්වේ. මෙසේ හැම දෙනා ම දෙපිළට බෙදෙති. ජෝඩු වීමට කෙනෙක් නැති ළමයෙක් ඉතිරි වුවහොත්, නායකයන් දෙදෙනාගේ කැමැත්තෙන් ඒ ළමයා කුමන හෝ පිලකට එක් කර ගත්හ. බෝල ගැසීම හැර අන් හැම සෙල්ලමක් ම දවසේ කුමන වේලාවක වුව ද කළ හැකිය. බෝල ගහන්නේ හවස් වරුවේ පමණි. නොයෙක් සෙල්ලම්වල දී ළමුන් අතර අඬදබර ඇති වුණත් ඒ ගැන වැඩිහිටියන්ට පැමිණිලි කළේ නැත.



25 කණුවේ සිට දේවාලේවත්තට යන පාර

ආහාර පාන

අපේ ගෙදර සිරිතක් වශයෙන් දවසේ තුන්වේලට ම ආහාරය වූයේ බත්ය. පොළොස් මැල්ලුමක්, තක්කාලි හොද්දක් හෝ සම්බෝලයක් වැනි යමක් සමග උදේට බත් කෑවෙමු. හැමදා ම පාහේ එළකිරි තිබුණ නිසා, උදේ ආහාරයට පසුව උණු කළ කිරි කෝප්පයක් ද බීවෙමි. දිවා රාත්‍රී ආහාරයට බතට (වැංජන වශයෙන්) කොස්, පොළොස්, දෙල් වැනි දෙයකින් වැංජනයක්, කොළ (පලා) මැල්ලුමක් සහ තක්කාලි වැනි දෙයකින් හොද්දක් ද තිබිණි. දවල් බත සමඟ මුදවපු කිරි ද කෑවෙමු.

අතරින් පතර උදේට *කුරහන් රොටී* උයන ලදී. සමහර විට රෑ කෑමට *කුරහන් තලප* හැදිගාන ලදී. මුං ඇට, කොල්ලු හෝ මෑ ඇට වැනි දෙයකින් තලප ගිලීමට *ආනමක්* උයා ගත්තේය. තලප ගිලින විට "කට ගැස්මට" කුම්බලා හෝ කීලන් කරවල කැල්ලක් පුච්චා ගත්හ. මාසයකට දෙකකට වරක් රෑ කෑම වේලට *පොල්කිරි කැඳ* පානය කළ අවස්ථා තිබිණි. රෑට උයන ලද බත් ඉතිරි වුවහොත්, බත් මුට්ටියේ ම තිබිය දී වතුර ටිකක් වත්කර වසා තබා, පසුදා පාන්දර රතු එැණු, අමුමිරිස් යනාදිය ටිකක් කපා දමා පදමට දැමූ ලුණු සමඟ හොඳින් අනා, *'දියබතක්'* සාදා ගත්හ. එය උදේට හොඳ ගුණදායී ආහාරයකි.

කුඹුරු වැඩ කාලයට ආහාර ගන්නා වේලාවල වෙනසක් සිදුවිය. උදේ ම "හීල් කෑමෙන්" පසුව අප්පච්චී කුඹුරේ වැඩට ගියේය. පෙරවරු දහයට පමණ (උදේ ආහාරයට සමාන) තවත් ආහාර වේලක් ගෙන නැවත කුඹුරු වැඩට ගියේය. කුඹුරු හාන කොටන දිනවල, දවල් *"මද්දහන"* නම් වූ ආහාරය ගත්තේ සවස දෙකට පමණය. මද්දහනට බතත්, වැංජනයක්, කරවල මැල්ලුමක් හා ඇඹුලක් (හොද්දක්) අයත් වේ. කුඹුරු වපුරන දවස්වල මද්දහනක් නැත. රෑ කෑම පමණයි. කුඹුරු වැඩ නැති දවස්වල තම තමන්ගේ ගෙවල්වල දී සාමාන්‍ය ආහාර වේලක් ගත්හ.

කුඩා අපට දිවා ආහාර වේලට අමතර ව සවස තුනට හතරට පමණ *"හීල් බත්"* ටිකක් කෑමට තිබිණි. සමහර දවස්වල ගෙවත්තෙන් ගලවා ගත් *බුස්සරණ, හුලංකීරිය* වැනි අල වර්ගයක් තම්බා දෙන ලදී. වැසි සමයේ ගෙදරට වී, පැදුරු, තට්ටු, වට්ටි, පෙට්ටි ආදිය වියන අම්මලා ඉරිඟු බැදගෙන කෑහ. හේන්වලින් කඩාගත් වියලි ඉරිඟු හැම ගෙදරක ම පාහේ තිබිණි. උදේ කෑමට අපේ ගෙදර විටින් විට ආප්ප පිච්චුවේය. මේ ක්‍රියාවලිය ටිකක් වෙහෙසකර වුවත් අම්මා එය කැමැත්තෙන් කළ බව පෙනිණි. ඒ කාලයේ ආප්ප පිච්චුවේ මැටි හට්ටිවලය. ඒවාට උඩින් තබන *"ගිනි කබලක්"* ද අවශ්‍ය විය. ගිනි කබලට යොදා ගත්තේ ද තවත් මැටි හට්ටියකි. අම්මා සාදන ආප්ප දෙකකින් හොඳට ම බඩ පිරුණ බව මතකය.

කලාතුරකින් හාල් පිටිවලින් *"කිරි රොටී"* උයන ලදී. මේ සඳහා විශේෂයෙන් සාදන ලද *"කිරි රොටී කබලක්"* අවශ්‍ය වේ. කබලේ මැද තිබෙන බොකු ගැසුණු කොටසට දියකළ පිටි වත්කර, වාටිය නැති ආප්පයක් වැනි රොටියක් හදා ගෙන, පොල්කිරි හෝ ''කිරිපැණිවල'' බහා කෑමට ගත්හ. අඩුක්කුවට (අම්මාවරුන්ගේ දානයට) කිරි රොටී අත්‍යවශ්‍ය අංගයකි.

කුඹුරුවල ගොයම් නෙළන විටත් හේන්වල කුරහන් කපන විටත්, ඒවායේ නිරතවන ගෙවිලියන්ගේ දිවා ආහාරයට *"දොහොයි"* (තෝසේ) උයා ගත්හ. මේ සඳහා මැටියෙන් සාදන ලද *"දොහොයි ගලක්"* බොහෝ ගෙවල්වල තිබිණි.

පොළොස්, කොස්, දෙල් වැනි වෑංජන සහ මුදවපු කිරි සමඟ බත් කෑමෙන් ද, උදේට එළකිරි බීමෙන් ද, කුඩා කාලයේ මට හොඳ පෝෂ්‍යදායක ආහාරයක් ලැබුණ බව කිව හැකිය. යුද්ධ කාලයේ රටේ ආහාර හිඟයක් පැවතිය ද වෙනසක් නොවීය. මට වයස අවුරුදු දෙළහෙන් පසුව ද්විතීය අධ්‍යාපනය සඳහා ගෙදරින් බැහැර ගිය පසු, මේ තත්ත්වය බෙහෙවින් ම වෙනස් විය. ඒ ගැන පසුව විස්තර කරමි.

බාල කාලයේ ලෙඩදුක්

මා කුඩා කාලයේ (ශරීරාභ්‍යන්තරයේ) රෝගාබාධ කිසිවක් වැළඳුණු බවක් මතක නැත. විටින් විට බඩරිදීමක් වුවහොත් එය පණු අමාරුවක් ලෙස සලකා, අමු ඉඟුරු කැබැල්ලක් හපා කෑමට දුන්නේය. බඩ රිදීම එයින් නතර වූයේ නැත්නම්, *"හාල් බැඹියා"* කොළ ටිකක් කොටා මිරිකා ලුණු ටිකක් මුසුකර බීමට දෙන ලදී. මෙය අතිශයින් ම තිත්ත බෙහෙතක් විය. එනමුත්, බඩේ රිදුම සුව වේ. අවුරුද්දකට වරක් පමණ රජයේ බෙහෙත් ශාලාවෙන් (එඬරුතෙල්) පණු බෙහෙත් ලබා දෙන ලදී. එදිනට දිවා ආහාරය නොලැබේ. කීපවරක් බඩ සැහැල්ලු විය. සමහර විට දිග පණුවෝ ද වැටෙත්. හවසට *''නැම්බුම් හොද්දක්''* (දුරු, මිරිස්, සුදුළුණු සමඟ) බෙරිකර උයන තම්බපු හාලේ බතක් කෑමට ලැබිණි. මෙයින් පසුව දවල්ට නිදිකිරා වැටෙන ගතිය නැති ව යයි.

පාසල් යෑමට පෙර වයසේ දී දෙවරක් බරපතල තුවාල සිදුවිය. වරක් අම්මා සමඟ හේනකට ගොස් ගෙදර යන අතරමඟ, හේනේ තිබුණ උල් කණු කැබැල්ලක් මත ලිස්සා වැටී, ඉල ඇට පේළියේ ලොකු තුවාලයක් විය. වහා ම රජයේ රෝහලට ගොස් බෙහෙත් දමා ගෙන දින ගණනක් පිළියම් කිරීමෙන් පසු සුව විය. එම තුවාලයේ කැළල බොහෝ කාලයක් යන තුරු දක්නට තිබිණි. ටික කලකට පසු ඊට වඩා දරුණු තුවාලයක් හිසේ පිටුපස ඇති විය. දිනක් හවස් වරුවේ දර කැඩීමට ගිය වැඩිහිටි කාන්තාවක් හා ඇගේ දරුවන් සමඟ *කහටගොල්ලේ ඔයට* ගියෙමු. වැඩිහිටි කාන්තාව දර

හොයන තුරු කොලු ගැටව් ඔය අයිනේ පිහිටි ගලින් ගලට පනිමින් සිටින අතර, එහි ගලක් මත තිබුණ වියළි කොළ ලිස්සා ගොස් ගලමත උඩුබැලි අතට වැටීම නිසා, සුළු මොළේට පහළින් ලොකු පැලීමක් සිදුවිය. තදබල ලෙස ලේ ගලද්දී තුවාලය තිබුණු පෙදෙස අතගාන විට, පැළුණ හම තුළට මගේ ඇඟිල්ලක් ඇතුළුවනු දැනිණි.

මා සමග සිටි හැම දෙනා ම වහා ම පාර දිගේ සැතපුමක් පමණ දුරින් පිහිටි රජයේ රෝහලට මා රැගෙන ගියහ. ඒ අතරතුර, ගෙදර සිටි අපේ අම්මාට ද පණිවිඩයක් යවා තිබූ නිසා, අම්මා ද වහා ම රෝහලට දුවගෙන පැමිණියාය. තුවාලයට මැහුම් කීපයක් දමා පිළියම් කිරීමෙන් පසුව අම්මා සමග ගෙදර යන විට ද උණගතියක් දැනිණි. තුවාලය සුව වීමට සති දෙකක් පමණ ගත වන්නට ඇතැ'යි සිතමි. මේ තුවාලයේ කැළල මත දැනට වුවත් හිසකෙස් වැවෙන්නේ නැත.

අපේ ගෙදර අය දිය නෑමට ගියේ වෙල්යායට වතුර ගෙනෙන මහ ඇලේ එකතැනක පිහිටි *මහනාවන* නම් වූ පිහිල්ලටය. ඒ පිහිල්ලේ වතුර වැටෙන ගල ගල්සෙවෙල් නිසා ලිස්සන සුළුය. එහි දියනෑමට ගිය කීප වතාවක් ම ලිස්සා වැටී ඔළුව පැලී තිබේ. එයට පිළියම වූයේ "දුම්මල කුඩු" ටිකක් දැමීමය. තුවාලය වේලෙන තුරු නෑම සුදුසු නැත. දින දෙක තුනකින් තුවාලය වේලී යයි.



අද දේවාලේවත්ත (අලුතෙන් නිවසක් ඉදිවෙමින් පවතී)

ගමේ තිබෙන ගම්සභා පාරේ මෙන් ම අඩිපාරවල ද ගල්පඩි බහුල නිසා පයවැදී ඇඟිලි තුවාල වීමට ඉඩ තිබේ. මගේ කකුල් දෙකේ ම විටින් විට ඇඟිලි දෙකක් පය වැදී තුවාල සිදුවිය. මෙවැනි තුවාලයක් සිදු වූ විට, බෙහෙත් දමන විට ඇතිවන දැවිල්ල නිසා, ඒ ගැන වැඩිහිටියන්ට කියන්නේ නැත. එනමුත්, තුවාල නොසලකා හැරීම නිසා පැසවා ලේ සැරව ගැලීමට පවා පටන් ගත් විට, බෙහෙත් කර ගැනීමට සිදුවේ. ගමේ සිටි දක්ෂ වෙදමහතෙකුට පෙන්වා මගේ තුවාලවලට බෙහෙත් කර ගතිමි. තුවාල පිරිසිදු කර බෙහෙත් කුඩක් දැමූ විට ඉවසිය නොහැකි තදබල කැක්කුමක් දැනුණ නමුත්, ටික වේලාවකින් මහත් සැනසිල්ලක් දැනිණි. දින දෙක තුනකින් තුවාලය වේලී ගියේය. මෙසේ තුවාල වූ ඇඟිලිවල දැනුදු නියපොතු එන්නේ අමුතු විධියකටයි.

වරක් වත්තේ වේලී තිබූ කොළ ගොඩක ඇවිදින විට දියමකුළුවෙකු දෂ්ඨ කර ඒ විෂෙන් දින තුනක් පීඩා වින්දෙමි. ගමේ විෂ වෙද මාමා පැමිණ මතුරා පිළියම් කළේය.

මා කුඩා කාලයේ දී විටින් විට *සරම්පප, පැපොල, කම්මුල් ගෙඩි, ඇස් රුදා* ආදී රෝග වැළඳී තිබේ. ඒවායින් වැඩියෙන් ම පීඩා වින්දේ ඇස් රුදාවෙන් සහ කම්මුල් ගෙඩිවලිනි. ඇස් රුදාව හැදුණු සමහර විට, ඇස් දෙක ම රතු වී කබ කඳුළු ගැලීමෙන් තදබල ලෙස වේදනාවක් දැනෙන්නට පටන් ගනී. ඇස් ඇර අව්ව දිහා බැලීමට නොහැකියි. ගමේ සිටි ඇස්වෙද මහතා මේ සඳහා පිළියම් කළේය. යම්කිසි බෙහෙත් කොළ ජාතියක් කොටා මිරිකා ඒ යුෂ ඇස්වලට වත්කරන ලදී. බෙහෙත් වත්කළ වහා ම තදබල ලෙස දැවිල්ල හටගනී. මේ ආකාරයට දින දෙක තුනක් පිළියම් කරන විට, ඇස් අමාරුව සුව වේ. එක කම්මුලක ඉදිමීමක් සහිත ව ඇදුන්දෙන කැක්කුම කම්මුල් ගෙඩිවල ලක්ෂණයයි. සුදු හඳුන් උරච්චි කර නිතර නිතර ආලේප කිරීමෙන් මේ රෝගය ක්‍රමයෙන් සුවවේ.

අපේ පවුලේ වැඩිමලා වූ අයියා සේවය කළේ මහියංගණයේය. එය එවකට මැලේරියා ප්‍රදේශයක් විය. ඒ නිසා අයියාට මැලේරියා වැළඳුණු විට ගෙදර ආවේය. මැලේරියාව හැදුණ කෙනෙකුට උණ ගැනෙන්නේ සවස් වරුවටය. තද සීතලක් දැනී වෙව්ලන්නට පටන් ගනී. ඉන්පසුව ඇඟ රත් වී උණ සෑදේ. මේ සඳහා අයියා ප්‍රතිකාර කර ගත්තේ *නෙල්දෙණියේ* සිටි සිද්ධායුර්වේද වෙදමහතෙකුගෙනි.

අප්පච්චී *මිණිපේ* ගියාට පසුව එක අතක පිටිඅල්ලේ ගෙඩියක් සෑදී මහත් වේදනාවක් වින්ද බව මතකය. ඒ හැර වෙන අසනීපයක් හැදුණු බවක් මතක නැත. අම්මාට නිතර නිතර බඩ දැවිල්ලක් සෑදිණි. ඒ සඳහා කුමන පිළියමක් කළේ දැ'යි නොදනිමි. වැඩිහිටියන් මෙවැනි වේදනාවලින් දුක්විඳින විට වෙනදාට වඩා කෝපවන ගතියක් ඇති වන බවක් මට හැඟී ගියේය. ඒ නිසා, කුඩා කාලයේ එවැනි අවස්ථාවල පැත්තකට වී මගේ පාඩුවේ සිටීමට පුරුදු වූවෙමි.

අපේ පවුලේ "බඩ පිස්සී" (නංගී) බාල ම කාලයේ තදබල ලෙස රෝගාතුර වී සිටි බව මතකය. ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත්තේ ගමේ වෙදරාළ "අම්මණ්ඩී"ගෙනි. කොපමණ වෙදකම් කළත් රෝගය අසාධ්‍ය විය. දිනක් ගමේ පන්සලේ හාමුදුරුවන්ට ආරාධනය කර පිරිත් කියවා ගත්තේය. ඉන්පසුව නංගීගේ අසනීපය ක්‍රමයෙන් සුව අතට හැරී, සති දෙක තුනකින් සම්පූර්ණ සුවය ලැබුවාය. එසේ සුව වනතුරු වෙදකම් කිරීම නැවැත්වූයේ නැත. නංගිගේ අසනීපය සුවවීම ගෙදර හැම දෙනාගේ ම මහත් සතුටට හේතු විය.

වරක් අපේ ගෙදර ගිහි පිරිතක් කියවන ලදී. කාමරයක පසෙක පිරිත් කොටුව (මණ්ඩපය) ඉදිකොට, උඩුවියනක් බැඳ ගොක් කොළ, බුලත් දළු, සිවිය කොළ, පුවක් මල් කිනිති අදිය එල්ලා පිරිත් මණ්ඩපය සරසා තිබිණි. පිරිත් පැන් සඳහා සෙම්බු මුට්ටියක් ගෙන තිබිණි. පිරිත් කීමට දකුණ ගමේ කිහිප දෙනෙක් රෑ පහන් වනතුරු පිරිත් සජ්ජායනා කළහ. පිරිත හමාර වූ පසු පිරිත් පැන් පානය කර, පිරිත් නූල් බන්දවා ගත්හ. පිරිත් කියන අතරතුර පැමිණ සිටි අයට කැවිලි ආදියෙන් සංග්‍රහ කරන ලදී. උපාසකවරුන්ට උදේ ආහාරය පිළිගැන්වීමෙන් පසු පිරිතේ වැඩ කටයුතු අවසන් විය.

ගමේ සමහර ගෙවල්වල තිබූ යකුන් නැටිලි, අඩුක්කු පිදීම (අම්මාවරුන්ගේ දානය) වැනි ශාන්ති කර්ම අපේ ගෙදර නොවීය. වරක් අපේ ලොකු අත්තාට (අම්මාගේ අප්පච්චිට) සෙත් පැතීමට එම නිවසේ බලි නැටීමක් පවත්වන ලදී. හුඹස් මැටියෙන් ඉතා ලස්සන බලි රූපයක් අඹා පාට කර තිබිණි. මුළු රෑය පුරා ම බුදුගුණ ගායනා කරමින් බලි ඇදුරන් විසින් බලි නටන ලදී.

එක අවුරුද්දක අපේ ගමේ හැම දෙනාට ම වැළඳුණු උණ රෝගයක් පැතිර ගියේය. මෙය දෙවැනි ලෝක මහා යුධ සමයේ දී වී යැ'යි සිතමි. පළමුවෙන් ම අපේ ගෙදර උණ හැදුණේ මටයි. දින කිහිපයකට පසුව මට උණ සුවවන විට, අම්මා උණ රෝගයෙන් පෙළෙන්නට වූවාය. උණ සුව වී සිටි මට, කෑමට යමක් උයා දීමටවත් අම්මාට හැකියාවක් නොවීය. ඒ නිසා, කුමක් හෝ උයාගන්නා ලෙස අම්මා මට කීවාය. කිසිදිනක මුළුතැන්ගේ කිසිම දෙයක් කර නොතිබුණු මට මෙය ලොකු අභියෝගයක් විය. අම්මා හාල් ගරනවා බලා සිටි වාර බොහෝය. ඒ නිසා ඒ ආකාරයට හාල් ටිකක් නෑඹිලියකට දමා ගෙන ගැරීමෙන් පසුව මුට්ටියකට දමා ලිපේ තැබීමි. කැඳ "ගිලෙන විට" හාල් තැම්බී දැ'යි බලා බත උයා ගතිමි. පසුව බත්කෑමට ගත් නමුත් හැම බත් කටේ ම ගල් හැපෙන්නට විය. එනමුත් බඩගින්න නිසා ගල් ඉවත් කරමින් එදින බත් කෑවෙමි. පසුදින දෙවරක් ම ගරා බත උයා ගතිමි. එදින ගල් හැපුණේ නැත. දවසින් දවස ක්‍රමයෙන් බත මෙන් ම වැංජන ද උයා ගැනීමට පුරුදු වූයෙමි. දිනක් කලාවැවේ සිට පැමිණි මස්සිනාට ද (හීං අක්කාගේ සැමියා) දෙල් වැංජනයක් සමඟ බත්වේලක් උයා දුන් බව මතකය.

එදින අම්මා ගෙදර සිටියේ නැත. ඒ කෑම වේල ගැන මස්සිනා "පාරට්ටු" කළ බව පසුව අම්මා මට කියා ඇත. මෙම නිපුණතාව මා වැඩිහිටියෙකු වීමෙන් පසුව නොයෙක් අවස්ථාවල මට ප්‍රයෝජනවත් වී තිබේ.

ගමන් බිමන්

උපන් ගමේ සීමාව තුළ ජීවත් වූ කෙනෙකුට අසල ගමකට යන්ට ලැබුණත් එය අලුත් අත්දැකීමක් වන්නේය. ගමන වඩා දුර බැහැර වන විට අත්දැකීම් වඩාත් විවිධ වේ. ද්විතීය අධ්‍යාපනය සඳහා ගමෙන් පිට වී යෑමට පෙර ගිය ගමන් කිහිපයක් ගැන මතකයේ සටහන් වී තිබේ. *මහියංගණයේ* වන්දනා ගමන සහ *වේඬරුවේ* ගමන මේ අතර ප්‍රධාන වේ.

අපේ ගමේ කීහිප දෙනෙක් "කෝන කෑමෙන්" (සිංහල අවුරුද්දට) පසුව මහියංගණයේ ගිය වන්දනා ගමනකට අපේ අම්මා මා සමඟ සහභාගී වූවාය. මෙය මා පාසල් යෑමටත් පෙර ගිය ගමනකි. අපේ ගමේ සිට ගල්පඩිහෙළ හරහා වැටී ඇති මාර්ගයේ වේරගංතොට දක්වා ඇති දුර ප්‍රමාණය සැතපුම් පහළොවක් පමණ වේ යයි සිතමි.

එදින හිමිදිරි පාන්දරින් ම ගමෙන් පිටත් වූ මේ වන්දනා නඩය, *මැදිවක, ගංගොඩ, බෝපාන, පිටවල, උඩුවාහින්න, මහවල* යන ගම් පසුකර, ඉර මුදුන්වන වේලාවට පමණ *ගැටලාගොල්ල ඔය* අසලට පැමිණියහ. ඉතා පැහැදිලි සීතල දිය දහරක් ගලා ගිය මේ ඔය ළඟ දී, අතපය මුහුණ කට සෝදා ගිමන් නිවා ගෙන, දිවා ආහාරය ගැනීමට සුදානම් වූහ. දිවා ආහාරය සඳහා "බත් ගෙඩියක්" (මුලක්) බැඳ ගෙනැවිත් තිබිණි. ආහාර ගෙන පැයක පමණ විවේකයෙන් පසුව නැවතත් ගමන ඇරඹිණි. ටික දුරක් ගොස් කන්ද මුදුනේ සිට බලන විට, ඈත ක්ෂිතිජය දක්වා විහිදී තිබෙන තැනිතලා භූමියක් දිස්වේ. මහියංගණය පිහිටියේ ඒ දෙසිනි. කඳු මුදුනේ තැනක දී කොළ අත්තක් කඩා එල්ලා සමන් දෙවියන්ට බාර වී, ගල්පඩිහෙළ බැසීමට පටන් ගත්හ. *මහියංගණ* ප්‍රදේශය සමන් දෙවි අඩවියයි. මෙහි ගල්පඩි බඳින ලද්දේ බිංතැන්නේ සොරබොර වැව ඉදි කළ *"බුලතා"* නම් යෝධයා විසින් යයි ජනප්‍රවාදයක් වේ. ගල්පඩිහෙල අතර මැද හරියේ අම්බලමක් වේ.

අම්බලම අසල කුඩා දිය පාරක් විය. එතැන පිංතාලියක් (චතුර පිරවූ මැටි බඳුනක්) තිබිණි. පඩිපෙළ බැස තැනිතලා භූමියට පැමිණ සැතපුම් තුනක් පමණ ඉදිරියට ගමන් කළ විට, මහවැලි ගං ඉවුරේ වේරගංතොට හමුවේ. මහියංගණය පිහිටියේ අනෙක් ඉවුරේය. ගඟ හරහා ගියේ ඔරුවලිනි. වන්දනාකරුවන් වැඩි දවස්වල ඔරුවකට ගොඩ වීමට ටික වේලාවක් ඔරුතොටේ නතර වී සිටීමට සිදුවේ.

ගඟෙන් එගොඩ වී මහියංගණයට එළඹෙන වන්දනාකරුවන් දිය නාගෙන පිරිසිදු වූහ. (මේ ගමනේ දී මගේ හිස බූගා තිබුණා මට මතකය) වන්දනාවට පැමිණි අය "පිරුවට" (පිරිසිදු ඇඳුම්) ඇඳගෙන සිද්ධස්ථානය වෙත පිය නැඟූහ. එහි විහාරගේ, බෝධිය හා ගරා වැටුණු චෛත්‍යය දක්නට ලැබිණි. මේ ස්ථාන වැඳපුදා, අසල පිහිටි සමන් දේවාලයට ගොස් පඬුරු දමා බාරහාර ඔප්පු කළහ. මේ වන විට ඇදිරි වැටී ගෙන එන නිසා, රාත්‍රිය ගත කිරීමට අසල පිහිටි *"පිං ශාලාවට"* (විශ්‍රාම ශාලාව) ගියෝය. රාත්‍රී ආහාරය උයා ගත්තේ පිං ශාලාවේ දී ය. බොහෝ වන්දනාකරුවන් මෙවැනි ගමන් යන විට, තම තමන්ගේ ගමන් මළුවල කුඩා මුට්ටියක්, හට්ටියක්, අත් හිරමනයක්, නෑඹිලියක් රැගෙන ගියහ. හාල්, තුනපහ සමඟ (කොට්ට) පොල් බෑයක් ගෙන ගිය විට, වේලක් දෙවේලක් පිරිමහ ගැනීමට පුළුවන. ඒ කාලයේ වන්දනාකරුවෝ කඩවල්වලින් කෑවේ ඉතා කලාතුරකිනි. පසුදින පාන්දරින් ම අවදි වී "හිස්බඩ ම" ගමනට පිටත් වූහ. ආපසු එන ගමනේ දී ගල්පඩිහෙළ නැඟීමට සිදුවන නිසා, *ගැටලාගොල්ල* ඔය ළඟට එනතුරු මහත් වෙහෙසකර වේ. *මහවල* හෝ *උඩුවාහින්න* තිබූ කුඩා කඩයකින් අම්මා මට හුලං විස්කෝතු කීපයක් ගෙන දුන්නාය. සවස තුනට පමණ ගෙදර ආවේ මහත් අහේනියකිනි.

ඊට අවුරුදු කීපයකට පසුව මේ පාරේ ම තවත් වරක් අප්පච්චී සමඟ මිණිපේ ගියා මතකය. ඒ වර ගියේ ගමේ සිටි මීහරක් බානක් දක්කා ගෙනය. හිමිදිරි පාන්දර ගමෙන් පිටත් වී, *ගැටලාගොල්ල* ඔය දක්වා ගොස් දිවා ආහාරය ගෙන, නැවත ගමන පිටත් විය. මී හරක් සමඟ ගල්පඩිහෙළ බැහීමට නොහැකි නිසා, වංගු සහිත ගුරු පාරේ දිගේ පහළ තැනිතලාව වෙත ගියෙමු. *මොරයායට* ගොස් දකුණට හැරී *හඳඟනාවේ* හවරිනුගේ ළඟට යන විට වැස්සක් වැටිණි. ඒ නිසා, හවරි නුගේ සෙවනේ වැහි පායන තුරු ගත කොට, පැයකට පමණ පසුව විසි එකේ ඇලේ පිහිටි අපේ කුඹුරේ පැලට (තාවකාලික නිවස) ළඟාවීමු. ආපසු ගමට ආවේ කෙසේ දැ'යි මතක නැති නමුත්, ඒ බසයෙන් විය හැකිය.

වයස අවුරුදු දහහතර පමණ වූ කාලයේ දී "කලාවැවේ මස්සිනා" සමඟ වේඩරුවේ ගිය ගමන බොහෝ වෙහෙසකර විය. ගමේ සිට නුවර යන බස් එකේ සැතපුම් අටක් ගෙවා *මොරගහමුල* දක්වා ගියෙමු. මොරගහමුල සිට සැතපුම් හයක් හතක් පමණ දුරක් *වේඩරුව* දක්වා යා යුතු වන්නේ පයින් ම ය. ගමන අරඹා සැතපුමක් පමණ යන විට, *අම්බාලේ* නම් වූ ගම හමුවේ. ඒ ගම පිහිටා තිබුණ කඳු ගැටයේ පහළට ගොස් තවත් කඳුගැටයක් නැඟීමෙන් පසු, *දුනුවිල* නම් ගම හමුවේ. කන්ද මත ටික දුරක් ගිය පසු පල්ලම බැස පහළ ගම්මානයකට ළඟා වේ. කඳුබෑවුමේ පහළින් ම තිබුණ ඔයක් හරහා ගිය විට වෙල් යායක් හමුවිය. ඒ වේඩරුවේ ඉහළ ගම්මැද්දේ වෙලය. වෙල

ඉස්මත්තේ ටික දුරක් ගොස් අපි නෑදෑයින්ගේ නිවසට ළඟාවීමු. මට වැඩිමල් අක්කා දීග ගොස් සිටියේ ඒ ගෙදර තරුණයෙකු සමඟය. මේ ගමේ පහළ කෙළවරට ගිය විට මහවැලි ගඟ හමුවන බව දැනගතිමි. *ඒ වික්ටෝරියා දිය ඇල්ල* පසුකළ විටය. *වේඬරුවේ* වැසියන් කුඹුරු වැඩවල සහ හේන් ගොවිතැනෙහි ද නිරත වූහ. හේන්වල වැඩි වශයෙන් වගා කළේ දුන්කලය. දුන්කල විකිණීමෙන් යම්කිසි ආදායමක් ලැබූහ. එනමුත්, දුන්කල වගා කළ ඉඩම් ඉක්මනින් නිසරු වූ නිසා, ඊළඟ කන්නයට වෙනත් කැලෑවක් එළිකළ යුතුවිය. වේඬරුවේ ගියදාට පසුදා උදැසන ආපසු ගමන පිටත් වී, හවස් වන විට අපේ ගමට පැමිණියේ යයි සිතමි. ආපසු ගමන ගැන එතරම් මතකයක් නැත.

අතරින් පතර ගමේ සිට සැතපුම් හතරක් ඈතින් පිහිටි *හුන්නස්ගිරියට* වාර කීපයක් ගියෙමි. වරක් එහි ගියේ කොණ්ඩේ කපා ගැනීමටයි. අපේ ගමට ළඟ ම බාබර් සාප්පුව තිබුණේ හුන්නස්ගිරියේය. එහි සේවය කළේ දමිළ ජාතික කරණවැමියෙකි. ඉරිදා දිනක *සංදෙට* (පොලට) යන ගමේ මිනිස්සු සමඟ හුන්නස්ගිරියට ගිය හැකි විය. වරක් අම්මා සමඟ ද සංදෙට ගිය බව මතකය.

අපේ ගම්වැසි කාන්තාවන් *සංදේ* ගියේ හාල් රැගෙනය. වී බුසලක හාල් (සේරු දොළහක්) වැටකේ පෙට්ටියක පුරවා ගෙන ගොස්, හුන්නස්ගිරියේ කඩයක් අයිති *"හවඩියා"* මුදලාලිට විකුණා රුපියලක් පමණ ලබා ගත්හ. ඉන්පසු 'සංදෙට' ගොස් බුලත්, පුවක්, හුණු, දුන්කල (යාපනේ කළු දුන්කල) පොල්, කරවල ආදිය පොලෙන් මිලයට ගත්හ. මේ හැම දෙයක් ම මිල වූයේ ශත ගණන්ය. පොල් ගෙඩියක් සත තුනක් විය. මේ නිසා රුපියලකට අවශ්‍ය දේ බරක් ම මිලයට ගත හැකි විය. අම්මා සමඟ සංදේ ගිය දවසේ *බොම්බායි මුටයි* වෙළෙන්දෙකුගෙන් මටත් බොම්බායිමුටයි ගොටුවක් ගෙන දුන් බව මතකය. මේ වෙළෙන්දා සීනි කුරු නමැති පැණි රස දෙයක් ද විකුණුවේය. අපෙ අම්මා සංදේ ගිය දිනවල අපට මෙවැනි රසකැවිල්ලක් ගෙනවිත් දුන්නාය. ඒ නිසා අම්මා සංදේ යන දවස කුඩා අපට ප්‍රීතිදායක දිනයක් විය.

දිනක් ගමේ කොල්ලන් කීප දෙනෙක් සමඟ *බෝපාන පන්සලේ* බණ ඇසීමට ගියෙමි. අපේ "මාමා" කෙනෙක් වූ ***පණ්ඩින හාල්යාලේ සුමනතිස්ස ස්වාමීන් වහන්සේ*** එදින ධර්ම දේශනාවක් පැවැත්වූහ. *මාඩුගොඩ* සිට *බෝපාන* පන්සල දක්වා සැතපුම් හතරක් පමණ දුරක් උන්වහන්සේ පා ගමනින් පෙරහැරේ වැඩම කරවා ගෙන ගියහ. කුඩා අපිත් මේ පෙරහැර සමඟ *බෝපාන* පන්සලට ගියෙමු. බණ දේශනාවෙන් පසුව "වංකගිරිය" හා නැටුම් ගැයුම් ආදිය නරඹා, පසුදා පාන්දරින් ම ආපසු ගමට එන්නට ආවෙමු. ටික දුරක් එන විට ගංගොඩ ගමට පෙර තිබෙන බෝක්කුවක් අසල

කඳුරේ ජලය මත සුදු රෙද්දක් පා වෙනවා දැක විපරමෙන් බලන විට දක්නට ලැබුණේ, අසල ගමක ඇස් අන්ධ වැඩිහිටියෙක් බෝක්කුවෙන් පහළට වැටී සිටින බවය. කිසිම හැලහොල්මනක් නොවූ නිසා මහත් බියට පත් අපි, සෑහෙන දුරක් දුව ගියෙමු. ටික දුරක් යන විට තේ කඩයක් හා බේකරියක් හමු වූ නමුත්, මේ ගැන කිසිවෙකුට කීමට බිය වූ නිසා, ඒ ගැන සඳහනක් නොකර ම ගමට පැමිණියෙමු.

විටින් විට අසල ගම්වල පන්සල්වල බණ ඇසීමට අම්මා සමඟ ගිය අවස්ථා කීපයක් විය. එනමුත්, බණ දේශනාව ආරම්භ වී ටික වේලාවකින් නිදාගත් මා අවදිවන්නේ පසුදා උදෑසන බණ හමාර වූවාට පසුවයි. එසේ වුවත්, ඉඩ ලැබුණු හැම අවස්ථාවක ම බණ ඇසීමට ගියෙමි.

ළමා කාලයේ වෙනත් විවිධ තොරතුරු

පාසල් ගමන ආරම්භ කිරීමට පෙර මගේ ඇඳුම වූයේ, දනහිසෙන් ටිකක් පහළට වැටෙන සේ මසා තිබූ කමිසයකි. රවුම් කරකින් යුක්ත වූ එහි පිටුපසින් අඟල් හයක් පමණ කපා විවර කර තිබිණි. ඒ කමිසය ගැලවී වැටීම වැළැක්වීමට පිටුපස කර කපා තිබූ තැන පටි දෙකක් මසා තිබිණි. ඒ පටි දෙක ගැට ගැසූ විට කමිසය ගැලවුණේ නැත. වයස අවුරුදු පහක් පමණ වූ කාලයේ දිනක්, අයියාගේ සරමක් මැදින් දෙකට නමා ඇඳගෙන පාරේ ඇවිදගෙන යන විට මඟ දී අයියා හමුවිය. සරම් ඇඳීමට කැමති දැ'යි ඇසූ අයියා, ඊළඟ සිංහල අවුරුද්දට ගමට එන විට කොටු වැටුණ කුඩා සරමක් හා එයට ගැළපෙන කුඩා කමිසයක් ගෙනැවිත් දුන්නේය. ඒ යුගයේ දී අයියා සිංහල අවුරුද්දට ගෙදර එන විට, පවුලේ හැම දෙනාට ම අලුත් ඇඳුම් රැගෙන ආවේය. මා මුලින් ම පාසල් යන විට ඇඳ ගෙන ගියේ අයියා පළමුවෙන් ම ගෙනැවිත් දුන් සරම හා කමිසයයි.

අලුත් අවුරුද්දට අපේ ගෙදරට *රතිඤ්ඤා* ගෙනාවේ ද අයියාය. එවකට මෙරට නිෂ්පාදනය කළ රතිඤ්ඤා තිබුණේ නැත. අයියා ගෙනා රතිඤ්ඤා නිපදවා තිබුණේ චීනයේය. ඒවා මනරම් ලෙස පාට පාට කඩදාසිවලින් ඔතා තිබිණි. ඒවා විවිධ ප්‍රමාණයේ විය. ඉතා ම කුඩා "හීං මිරිස්" රතිඤ්ඤා කරල් වැලක් එකට පත්තු කළ යුතුය. පෙට්ටියකට කරල් විස්සක් බැගින් වූ අඟල් දෙකක් පමණ දිග රතිඤ්ඤා කරල්, එක කොනකින් අල්ලා ගෙන මට ද පත්තු කළ හැකි විය. එතරම් ආරක්ෂා සහිත ව (මැටි කට්ටයක් ඇති ව) නිපදවා තිබිණි. ලොකු කරල් ගුංඩු වශයෙන් හදුන්වන ලදී. ඒ කාලයේ ගුංඩුවක් සත විස්සක් පමණ විය. කොතරම් ආරක්ෂා සහිත වුව ද, අප කුඩා කාලයේ රතිඤ්ඤා පත්තු කළේ බිම තබා ගිනි පෙනෙල්ලකිනි. ඒ නිසා රතිඤ්ඤා අනතුරු සිදුවූයේ ඉතා කලාතුරකිනි.

රතිඤ්ඤා මිලයට ගැනීමට නොහැකි ගමේ ළමයෙකුට කරල් කීපයක් දුන් විට මහත් සේ සතුටු වූ බව පෙනිණි.

දෙවෙනි ලෝක මහා යුද්ධය අවසන් වූ පසුව, එක් අවුරුද්දක් දවසක ගමේ "කොල්ලන්" කීප දෙනෙක් සමඟ *තවලංතැන්නේ* තිබුණ "මිල්ටේරි" කඳවුර බැලීමට ගියෙමි. එතැනට අපේ ගමේ සිට සැතපුම් පහක් පමණ ඇත. එහි ගියේ ආවේ පයින් ම ය. මේ වන විට හමුදා කඳවුර ඉවත් කර තිබිණි. ඒ නිසා, ගොඩනැගිලි කිසිවක් නොවීය. සිමෙන්ති දමා තිබූ ගෙබිම පමණක් දක්නට ලැබිණි. මෙම කඳවුර පිහිටා තිබුණේ මනරම් කඳුගැටයක් මතය. මහපාරේ නැගෙනහිර දෙසින් පිහිටි කඳුගැටය මහපාර පැත්තට බෑවුම් ව තිබේ. අතරින් පතර ගස් කොළන් තිබුණත් භූමියේ වැඩි ප්‍රදේශයක් පිට්ටනියක් වැන්න. කන්ද මුදුනට ගිය විට ඉතා ඈත ක්ෂිතිජය දක්වා දැකුම්කළු දසුනක් දිස්වේ. ඈතින් තිබුණේ මහියංගණ ප්‍රදේශයයි. දහ අට වංගු ආරම්භ වන *"තිස් පහ"* නමැති ස්ථානය ද කන්ද පාමුල *පෝප්පිටිය, පණවැල්උල්ල* නමැති ගම් ද දක්නට ලැබිණි. *තවලන්තැන්න* අසල වනයේ වැඩී තිබුණ ගස් කොළන් *හෝර්ටන් තැන්න* ආශ්‍රිත ව වැවුණ ගස් කොලන්වලට සමානය. ආපසු එන ගමනේ දී, කෝවිල්මඩ, මාඋස්සාව ආදී තැන් පසුකර *මාඩුගොඩට* ළඟාවන විට මහන්සියත්, බඩගින්නත්, පිපාසයත් නිසා හොඳට ම හෙම්බත් වී සිටියෙමු. තවත් විනාඩි දහයකින් පමණ ගෙදර පැමිණියෙමි.

තවලන්තැන්න අසල මහා මාර්ගයේ සිට බටහිර දෙස බලන කෙනෙකුට ඈතින් පිහිටි *නකල්ස් කඳුවැටිය* දැකගත හැකිය. ඒ කාලයේ නකල්ස් කඳුවැටිය ගැන අප දැනගෙන සිටියේ නැත. කිසිවෙක් ඒ ගැන කියා දුන්නේ ද නැත. අප දැනගෙන සිටියේ නකල්ස් කඳුවැටියේ එක කොනක පිහිටි *"දෝනළකන්ද"* ගැන පමණයි. *මීමුරේ* නම් වූ ගම පිහිටියේ නකල්ස් කඳුවැටියේ අනික් කෙළවර කඳුපාමුලය. ඒ අපේ ගමේ සිට සැතපුම් අටක් පමණ ඈතිනි. *නාවනාගල, ඩින්ස්ටන්, කොබෝනිල්ල, දෙහිගොල්ල, ලුල්වත්ත* යනාදි තේ වතු නකල්ස් කඳුවැටියේ නැගෙනහිර බෑවුමේ විය. මේ තේ වතු බොහෝමයක් දැනට පාළු වී ගොස්ය.

දෙවැනි ලෝක මහා යුද්ධ කාලයේ දී, *කහටගොල්ලේ* ඔයට සමීප *ඇල්ල* නම් වූ තැනක, මහපාරට ඉහළින් හේනක් කොටා තිබිණි. හේන අවට තිබුණ කැලෑවෙන් දවල් කාලයේ රිලව් රංචුවක් පැමිණ හේන, පාළු කිරීමට ඉඩ තිබුණ නිසා, පාසල් නිවාඩු දිනවල ඒ හෙන්ේ පැල් රැකීමට ගියෙමි. කුඩා කාලයේ රිළවු රංචුව ගැන මා තුළ බියක් තිබුණ නමුත්, හේනේ වවා තිබුණ ඉරිඟු, තියඹරා, වැටකොළු, බණ්ඩක්කා, මෑකරල් වැනි බෝග රැක ගැනීමට කෙනෙකු හේනේ සිටිය යුතු නිසාත්, හමුදා රථ වාහන එහා මෙහා යෑම දැක බලා ගැනීමට තිබූ කැමැත්ත නිසාත්, දවල් කාලයේ හේනේ පැළට ගියෙමි.



දෝතළුගල - මැටිහක්ක කන්ද ඉදිරිපසින් ඇත. නාවනගල වන්න ඒ කඳු දෙක අතර පිහිටා තිබේ. හාල්යාල මැටිහක්ක පා මුලය. ලඟින් ම තිබෙන්නේ තවලන්නැන්න අසළ කැළෑවය



නිදිගත යෝධයා (SLEEPING-DUTCHMAN) දකුණු කොනේ ම නකල්ස් කඳු සහ මීමුරේ ගම

හේනේ පැලේ සිට පහළ බැලූ විට ගමේ වෙල්යාය ද ඊට ඈතින් ගමට නැගෙනහිර දෙසින් පිහිටි කන්ද දිගේ වැටී තිබුණ මැදිවක පාර ද මනා ව දක්නට ලැබිණි. හේනට පහළින් තිබුණ මහපාර ද සැතපුමක් හමාරක් ඉදිරියට දක්නට ලැබේ. ඒ නිසා, පාරේ එහා මෙහා යන රථවාහන හැම දෙයක් ම දක්නට හැකි විය. අපේ ගෙදර සිට වෙල්යාය හරහා වැටී තිබුණ ඇලවේල්ල දිගේ ඉහළට පැමිණ මහපාරේ අයිනේ වූ බෝක්කුවක් ළඟට පැමිණිය හැකිය. මට දිවා ආහාරය රැගෙන ආවේ *"හීං අක්කාය."* බෝක්කුව අසලට පැමිණ විපරම් කර, මගේ සළකුණකින් පාර හරහා දුවවිත් ඈ හේනට ගොඩවූවාය. එක් වන ම මහපාර හරහා එන්නට බිය වූයේ "මිල්ටේරි" ලොරි නිතර එහා මෙහා ගිය නිසාය. ගම්වැසියන්ගේ එළවළු මිලයට ගැනීමට පැමිණි *"වීරකෝන්"* ලොරි සේදීම් ආදිය කළේ ද අපේ හේනට පහළින් පිහිටි මහ ඇලේ වතුරෙනි. මිණිපේ පිහිටි *"ඉතාලි කැම්ප්"* එකට වතුර ගෙන ගියේ ද මේ ස්ථානයෙනි..

අපේ ගෙදරට අල්ලපු වත්ත (මඤ්ඤොක්කා වත්ත) ට එහායින් පිහිටි වත්තේ කටු මැටියෙන් සෑදූ කුඩා ගෙයක් විය. එහි ජීවත් වූ පවුලේ, මට වඩා අවුරුද්දක් හමාරක් වැඩිමහල් **"සුන්දරා"** මගේ ගජ මිතුරා විය. සුන්දරාගේ අම්මා අපේ ගෙදර වී කොටා දුන්නාය. ඇයට උදේ සහ දවල් ආහාරය අපේ ගෙදරින් ලැබුණේය. වී බුසලක් කෙටීමට ඇයට ලැබුණු කුළිය හාල් සේරුවක් පමණ විය. ඇගේ සැමියා ද නොයෙක් කුලී වැඩ කර යමක් උපයා ගත්තේය. සුන්දරාට වැඩිමහල් සොයුරන් දෙදෙනෙක් ද බාල සොහොයුරන් දෙදෙනෙක් ද වූහ. ගම අසල ලඳු කැලෑවල හා වෙලේ ඇවිදීමට මා ගියේ සුන්දරා සමඟය. එසේ ඇවිදින අපට හමු වූ ඉදුණු හිඟුරු, දැල්හොඬ, කරෝල කැම්බෙල්ලන්, පේර යනාදි ගෙඩි කඩා ගෙන කෑවෙමු. මෙසේ ඇවිදින විට, වැල නොකැඩී ඉගිල යන *"වන්දනාවෝ"* (සමනල) රංචු සමහර කාලවල දී දක්නට ලැබිණි. මේ සමනළයින් අපේ ගමේ "වන්දනාවෝ" යයි හැඳින් වූයේ, මොවුන් ශ්‍රී පාද (සමනල කන්දේ) වන්දනාවේ යන විශ්වාසය නිසාය. සුදු හා කහ පාට පිහාටු ඇති මේ සමනළයින් ලක්ෂ ගණනක් වැල නොකැඩී මේ කාලයේ දී ගමේ උතුරු දෙසින් පැමිණ ගම හරහා දකුණු දෙසට පියාඹා ගියහ. මේ යන්නේ සමනළ කන්ද දෙසට යයි ගම්මු කීහ.

වරක් වෙලේ ගොයම් කපා පාගා කමතකින් ඉවත්කර තිබූ පිදුරු ගොඩකට ගිනිතැබීම නිසා අප්පච්චිගෙන් දඬුවම් ලැබුවෙමි. වෙල්යායේ ඉහළින් පිහිටි කුඩා වැවකට වතුර රැස්කරන (යල්) කාලයේ දී ගමේ කොල්ලන් පිහිනීමට එහි ගියහ. දිනක් දිවා ආහාරයෙන් පසුව ඒ පැත්තට යමින් සිටි මා අතේ තිබූ ගිනි පෙනෙල්ලකින් පිදුරු ගොඩකට ගිනි තැබුවෙමි. බුර බුරා ඇවිලීමට පටන් ගත් ගින්නට බිය වී දුවගොස් නතර වූයේ ගෙදරට ගිය පසුවයි. අප්පච්චී හා ගමේ තවත් වැඩිහිටියෙක් අපේ හේනක වැඩට යන්ට ගියේ මේ ගිනිගෙන දැවෙන පිදුරුගොඩ අසලිනි.

වැව අසල සිටි ළමුන්ගෙන් විමසූ විට අප්පච්චිට දැනගන්නට ලැබුණේ මා එම ගින්න ඇවිලූ බවයි. වහා ම ආපසු ගෙදර පැමිණි අප්පච්චි, මා අල්ලා ගෙන ගොස් ඉදිකඩ ළඟ තිබූ සියඹලා ගහක බැඳ සියඹලා කෝටුවක් කඩා ගෙන තදබල ලෙස මට ගැසුවේය. හවස් වනතුරු ගහේ බැඳ සිටි මා ලිහා දැම්මේ කලින් සදහන් කළ වැඩිහිටියා විසිනි. ඒ ඔවුන් වැඩ හමාර වී ගෙදර පැමිණි පසුවයි. අපේ අම්මාවත් මගේ බැමි නොලිහුවේ අප්පච්චිගේ තරවටුව නිසාය. අප්පච්චි විරුද්ධ වූයේ පිදුරුවලට ගිනි තැබීම නිසා ඒ ගින්නට පිළිස්සී කුරා කුහුඹුවන් වැනි සතුන් මැරෙන නිසා බව පසුව දැනගතිමි. දඬුවම නොව අවවාදය මා සිත තුළ තදින් කා වැදී තිබේ.

වයසින් ටිකක් මුහුකුරා ගිය විට, කුඹුරු වැඩට සහභාගී වූයෙමි. බිංනැඟුමට පසුව *නින්නවැල්ඨල්ල* කුඹුරේ කෙටුමක් දවසක උදළු කෙටියක් ගෙන ගොස් වැඩිහිටියන් සමඟ කුඹුර කොටන්නට වූයෙමි. එකල අපේ ගමේ ගොවීන් කුඹුරු කෙටීමට භාවිතා කළේ සිංහල උදලුය. ඒවා ගමේ කම්මලෙන් සාදවා ගත්හ. ලියැදිවල ස්වභාවය හා ප්‍රමාණය අනුව සිංහල උදැල්ල ඉතා ම උචිතය. ලොකු උදැල්ලක් ගෙවී ගිය පසු කුඩා අපට භාවිතා කළ හැකිය. මේ වැඩවලට සහභාගී විය යුතු යැ'යි කිසිවිටක අප්පච්චි මට කියා නැතත්, මගේ කැමැත්තෙන් වැඩට ගිය විට බාධා කළේ ද නැත. ඒ කුඹුරේ ම කොළ මඩවන දවසක කමතේ හරක් එළවීමට ගියෙමි. කොළ මඩවන්නේ රාත්‍රී කාලයේය. රෑ කෑමෙන් පසුව නිදි කිරා වැටෙන විට කමතෙන් වීසි කර දැමූ පිදුරු ගොඩකට වී නින්දට වැටේ. එනමුත්, විටින් විට අවදිවන විට දිස්වන්නේ පැහැදිලි නිල් අහසයි. පාන්දර යාමයේ අහස දෙස බලා සිටින විට *"රාම සැර"* (උල්කාපාත) යනවා දැක ඇත. මේවා ආලෝක ධාරාවක් ලෙස අහස හරහා ඉතා වේගයෙන් ඇදී යන විට පෙනෙන්නේ දිග සර්පයෙක් ඇදී යන ලෙසිනි.

මුදල් පරිහරණය

මම මුදල් පරිහරණයට පටන් ගත්තේ පාසල් යෑමටත් පෙර යයි සිතමි. අපේ අම්මාගෙන් ඉල්ලාගත් තඹ සතේ කාසි එකතු කළෙමි. සතයකට වැඩි මුදලක් මට ලැබුණේ නැත. අවශ්‍යතාවක් ද නොවීය. ගෙදර ළඟපාත කඩවල් නොතිබුණ නිසා, සීනි බෝල වැනි දෙයක් මිලයට ගත්තේත් *මාඋගොඩ* කඩයකට කා සමඟ හෝ ගිය විටය. සතයකට ඉතා කුඩා සීනි බෝල *(හූණු බින්නර)* අහුරක් ලැබිණි. අම්මාට කියා සීනි බෝල ගතහැකි වූ නිසා, මගේ කැමැත්ත වූයේ මට ලැබෙන මුදලක් එකතු කිරීමටයි. දෙවන ලෝක මහා යුද්ධයට පෙර භාවිතයේ පැවති සතයේ කාසිය ඉන් පසුව සංසරණයට දැමූ කාසියට වඩා බරය. (එය වර්තමාන සත පනහ තරම් වටකුරුය. ඝනකම ද එතරම් පමණ විය). මා එකතු කිරීමට කැමති වූයේ ඝනකම සතේ කාසියයි.

යුද්ධයට පෙර *සල්ලියේ* (ශත භාගයේ) කාසිය ද භාවිතාවේ තිබිණි. *සත කාලේ* එක කාසියක් කොහෙන්දෝ ලැබී තිබිණි. කාලේ කාසි සංසරණයේ නොවීය. යුද්ධයට පෙර සත පහේ (හතරැස් කාසිය), දහයේ, විසිපහේ, පනහේ සහ රුපියලේ කාසි, රිදී කාසි විය. එනමුත් ඒ කිසිවක් මට ලැබුණේ නැත. සත පහක් වුවත් එවකට ලොකු මුදලක් විය. යුද්ධ කාලයේ මුල් යුගයේ දී ම රිදී කාසි වෙනුවට මුදල් නෝට්ටු සංසරණයට පැමිණියේය. සත පහට පවා නෝට්ටුවක් විය. **එය සත දෙක සහ සත තුන වශයෙන් දෙකට ඉරන්නට හැකි විය.** එනමුත්, සත පහේ කොළය වැඩිකල් භාවිතයේ පැවතුණේ නැත. පසුව රිදී කාසි වෙනුවට පිත්තල මිශ්‍ර ලෝහයකින් නිමකළ කාසි භාවිතයට පැමිණියේය. සත දෙකේ දාර සහිත කාසියක් ද ඒ සමාන ප්‍රමාණයෙන් ලොකු සත දහයේ කාසියක් ද හතරැස් සත පහේ කාසියක් ද භාවිතයට පැමිණියේය.

මගේ වයස අවුරුදු නවය, දහය පමණ වන විට මුදල් ඉපයීමේ මාර්ග දෙකකට පිවිසියෙමි. වැඩිහිටියන් කුඹුරුවල තක්කාලි වවන විට මමත් කුඩා ලියදි කෑල්ලක තක්කාලි වගා කළෙමි. තක්කාලි ගෙඩි සෑදී ඉදීගෙන එන විට කඩාගෙන ගොස් සතියකට වරක් කඩපොළට පැමිණි අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලොරියට විකුණා ශත කිහිපයක් උපයා ගතිමි. මේ ආකාරයට යම්කිසි මුදලක් එකතු වූ විට, මාඩුගොඩ තැපැල් කන්තෝරුවට ගොස් ඉතිරි කිරීමේ බැංකු පොතක් ලබා ගතිමි. ඒ කාලයේ සත විසිපහක් වුවත් බැංකුවේ තැන්පත් කිරීමට පුළුවන් විය.

මුදල් උපයා ගත් අනික් ක්‍රමය *නාවලගල නේ වත්තේ* වැඩ කිරීමයි. කුඹුරු වැඩ නැති කාලයට ගමේ වැඩිහිටි සමහරු තේ වත්තේ වැඩට ගොස් යම් මුදලක් උපයා ගත්හ. ගමේ පිරිමි ළමයින් ද මේ වැඩිහිටියන් සමඟ එහි වැඩට ගියහ. ඒ කාලයට දවල් වරුවේ පිරිමි ළමයි කිසිවෙක් ගමේ ඉතිරි වුයේ නැත. සෙල්ලම් කිරීමට කිසිවෙක් නැති නිසාත් මුදල් ඉපයීමට ඇති වූ ආශාව නිසාත් වරක් ඔවුන් සමඟ වත්තේ වැඩට ගියෙමි. එසේ යෑමට කැමැත්ත දැක්වූ විට අම්මා උදෙන් ම *"බත් ගෙඩියක්"* බැඳ දුන්නාය. ඒ දිවා ආහාරය සඳහාය. මුල් දින කීපයේ *"කරඬිගෑම"* විඩා ගෙන දෙන්නක් විය. *කරඬිය* යනු බෙලෙක් පට්ටමක් නමා අඩි දෙකමාරක පමණ ලී මිටක් සවි කර සකස් කර තිබූ උපකරණයකි. තේ වත්තේ වැවෙන වල් පැළෑටි කරඬියෙන් "උදලු" ගෑමට ගත්හ. තේ ගස් පේළි අතරේ නෙරයක් දිගේ එකිනෙකා කරඬිගෑමෙහි යෙදුණේය. දින කිහිපයක් ගත වූ විට, මෙය එතරම් අමාරු වැඩක් නොවීය. වැඩෙහි යෙදෙන වෙනත් අය සමඟ විහිළු තහළු කරමින් දවස ගෙවූ නිසා, විඩාව සැහැල්ලු විය. වත්තේ බංගලාවේ *"සංගුව"* පිම්බාට පසුව දිවා ආහාරයට පැයක පමණ විවේකයක් ලැබිණි. සවස හතර හමාරට පමණ සංගුව පීබීමෙන් පසු වැඩ හමාර විය. වැඩ ඉවර වී ගමට ආවේ *මැටිහක්ක කන්දේ* පහළට වැටී තිබුණ අඩි පාර දිගේය. උදේ වැඩට එන විට මැටිහක්ක කන්ද නැඟීමට පැය භාගයක් පමණ ගත විය.

උදේට හෙමින් ගමන නිසා කුඩැල්ලන් කෑමට තිබූ ඉඩකඩ බොහෝය. ඒ නිසා, කෙනෙක් සබන් හෝ මීමුරුවට කකුල්වල ගාගෙන මේ ගමනේ නිරත විය. හවස ආපසු එන විට පිල්ලකින් වතුර නාගෙන (සීතලට) වෙච්ල වෙච්ලා ගෙදර එන්නේ අඳුර වැටුණ විටයි.

සතියේ දවස් හයක් වැඩ කළ විට රුපියල් දෙක හමාරක් පමණ ලැබිණි. එය ලබා ගැනීමට ඉරිදා උදේ අපේ ගමේ සිටි කංකානම් මාමාගේ ගෙදරට යා යුතු විය. මෙසේ උපයාගත් මුදල් ගෙදර වියදමට යෙදිය යුතු වුවත් මගේ මුදල් කිසිකෙනෙක් (අම්මාවත්) ඉල්ලුවේ නැත. ඒ නිසා එසේ ඉපයූ මුළු මුදල ම තැපැල් කන්තෝරු පොතේ දැමීමට හැකිවිය. ද්විතීය අධ්‍යාපනය සඳහා ගමෙන් පිටවී ගිය පසු මෙසේ මුදල් රැස් කිරීමට බැරි විය. එනමුත්, අප්පච්චී මිණිපේ පදිංචියට ගියාට පසුව මගේ "පාස් පොත" රැගෙන ගොස් විටින් විට රුපියල් දහය පහළොව වශයෙන් තැන්පත් කර තිබිණි. වරක් මා බලන විට රුපියල් තුන්සීයක් එකතු වී තිබෙනු දැක්කෙමි. ඒ මුදලට සිදුවූයේ කුමක් දැ'යි පසුව විස්තර කරමි.

ප්‍රාථමික අධ්‍යාපනය

මට අකුරු කියවන ලද්දේ අපේ අප්පච්චී විසිනි. ඒ සඳහා හෝඩි පොතක්, ගල් ලෑල්ලක් සහ ගල්කුරක් ගෙනැවිත් තිබිණි. එක් උදෑසනක නැකතකට අකුරු කියවූ බව මතකය. "**ස්වස්ති සිද්ධම්**" කියා ඉන්පසු අකුරු කියවන ලදී. මුළු හෝඩිය ම කියවා "**සිද්ධි රස්තු**" කියා අවසන් කළේය. ගල්කුරෙන් ගල්ලෑල්ලේ 'අ' යන්න ලියා අකුරු ලිවීම අරඹන ලදී. ඉලක්කම් ලිවීම ඒ වේලාවේ ම පටන් ගත්තා දැ'යි මතක නැත.

මෙසේ කලක් ගත වූ පසු, දිනක් උදෑසනින් අප්පච්චී සමඟ සැතපුම් දෙකක් පමණ ඈතින් අල්ලපු ගමේ පිහිටි පාසලට ගියෙමි. ඒ පාසල එවකට හැඳින්වූයේ ***කේ/මැදිවක ග්‍රාමීය ස්වභාෂා මිශ්‍ර පාසල*** යනුවෙනි. මෙම පාසල ප්‍රදේශයේ පිහිටි පැරණිතම පාසලක් විය. එය මා දන්නා ස්ථානයේ ඉදිකර තිබෙන්නේ 1913 වසරේ දී යයි පසුව දැන ගතිමි. ඊට පෙර එතැන සිට යාර පන්සීයක් පමණ දුරින් තිබෙන *"කබට්ටිය"* නම් ස්ථානයේ කුඩා පාසලක් තිබුණු බව කියති. අපේ අප්පච්චී මෙන් ම අයියා ද ඉගෙන ගෙන ඇත්තේ මැදිවක පාසලේ ම ය.

මැදිවක පාසලට මා බාරදී තිබෙන්නේ 1939 සැප්තැම්බර් 1 වෙනි දාය. එම පාසලේ මගේ ප්‍රවේශ අංකය 1229 විය. ඒ වන විට මගේ වයස අවුරුදු හයයි මාස හයක් වී තිබිණි. එවකට පාසලේ මුල් ගුරුවරයා වූයේ *විමලසේන මහතාය.* ජාතික ඇඳුමක් ඇඳ සාටකයක් කරේ දමාගෙන හිටි

එතුමා, ප්‍රියමනාප දේහධාරී කෙනෙකු විය. එතුමාගේ ගම් පළාත කොහේ දැ'යි නොදනිමි. එනමුත්, පාසල් සමයේ දී පදිංචි ව සිටියේ පාසලේ ගුරුනිවාසයේය.

පාසලට ඇතුළු කළ විට මා ඉගෙන ගත්තේ පහළ බාලංශ පන්තියේය. එම පන්තිය භාර ගුරුතුමිය *"ගොඩකුඹුරේ නෝනා මහත්තයාය."* මව් කෙනෙක් වූ එතුමිය ගැන මගේ ළමා මනසේ ලොකු පැහැදීමක් විය. එතුමියගේ ලොකු පුතා ඉගෙන ගත්තේ ද මගේ පන්තියේ ම ය. මගේ මතකයේ හැටියට ඔහු මා සමඟ පහේ පන්තිය දක්වා ම එකට ඉගෙන ගෙන තිබේ. මාස හතරකට පසුව ඊළඟ අවුරුද්ද මුල දී ඉහළ බාලාංශ පන්තියට උසස් වීමි. ඒ පන්ති භාර ව සිටි ගුරුවරයා ගැන මතකයක් නැත.

මම දෙකේ පන්තියට උසස් වූ විට පන්තිභාර ගුරුවරයා වුයේ ද මුල් ගුරුතුමාය. ඒ වන විට *විමලසේන මහතා* මාරු වී ගොස් *පිටවල* නමැති උසින් අඩු මහතෙක් පැමිණ සිටියේය. "ටිවීඩ්" රෙද්ද, කමිසය හා කබාය එතුමාගේ පාසල් ඇඳුම විය. එතුමා කණ්ණාඩි දමාගෙන සිටි කෙනෙකි. ලිපි ලේඛනවල වැඩ කරමින් විටින් විට කණ්ණාඩියට උඩින් ඇස් යොමා පන්තිය දෙස බලනවා පෙනිණි. මුල්ගුරු මේසය මත වේවැලක් ද තබා තිබිණි. නොයෙක් විට එම වේවැල ක්‍රියාත්මක වනවා දැක ඇත්තෙමි. ඒ නිසා අප ඒ වසර ගත කළේ ඉමහත් බියකිනි. එතුමාගේ මුණුපුරෙක් ද අපේ පන්තියේ ඉගෙන ගත්තේය. එනමුත් ඔහුටවත් විශේෂ සැලකිල්ලක් දැක්වූයේ නැත. එතුමාගේ පුතෙක් දෙවෙනි ලෝක මහා යුද්ධ සමයේ දී හමුදාවට බැඳී පිටරට ගිය බව මහත් ආඩම්බරයෙන් සඳහන් කරන අවස්ථා තිබිණි. එතුමා විශ්‍රාම ගියේ ද මේ පාසලේ සේවයෙන් පසුවයි.

තුනේ පන්තියේ දී අපේ ගුරුවරයා වූයේ *රඹුක්වැල්ලේ* මහතාය. එතුමා ක්‍රීම් පාට රෙද්දක්, කමිසයක් හා කබායක් ඇඳ සිටියේය. දිනපතා උදෑසන මුළු පාසලට ම පන්සිල් දුන්නේ රඹුක්වැල්ල මහතාය. එතුමාගේ මේසය මත ද කුඩා වේවැලක් තිබුණ නමුත්, එය ප්‍රයෝජනයට ගන්නවා දැක නැත. යම් සිසුවෙකුට දඬුවම් කිරීමට අවශ්‍ය වූ විට එතුමා කළේ, තමාගේ අල්ල බොකු කොට පිටට පහරක් ගැසීමයි. පාර වැදුණත් රිදෙන්නේ නැත. එනමුත් දඬුවමක් ලැබුණ බව මතක තිබේ. පාසැලේ දී පමණක් නොව ප්‍රදේශයේ නොයෙක් රැස්වීම්, උත්සව ආදියේ දී සාරවත් දේශනා පැවැත්වීම ගැන *රඹුක්වැල්ලේ* මහතා ප්‍රසිද්ධියක් ඉසුළුවේය. වරක් යුද්ධ සමයේ දී මාඩුගොඩ රැස්වීමක දී එතුමා පාන් කෑමට ළමුන් ඇබ්බැහි වීමේ අවදානම ගැන සඳහන් කළ දේ ඉහත දක්වා ඇත.

අපේ පාසලට අලුතෙන් ගුරුවරු තිදෙනෙක් මාරු වී පැමිණියේ මේ කාලයේ දී ය. *ගලගොඩ, මාටින්, වීරසිංහ* නම් වූ ඒ ගුරුවරු අතරින් දෙදෙනෙකු හමුවූයේ හතරේ හා පහේ පන්තිවල දී ය. වීරසිංහ මහතා හතරේ පන්තිය භාර ගුරුවරයා විය. එතුමා අපට කියාදුන් පාඩමක් නම්, ගල්ලෑලිවල, පොත්වල හැර දුටු දුටු තැන නොයෙක් දේ ලිවීමෙන් වළකින ලෙසයි. මේ සඳහා කවියක් වූ නමුත් එය දැන් මතක නැත. එතුමා ඉතා ප්‍රියමනාප ගුරුවරයෙකි. සංගීතය හා නාට්‍ය ගැන ද දැඩි ඇල්මක් දැක්වූ කෙනෙකි. ධාතුසේන රජතුමාගේ කාලයේ රජ කථාවක් රඟ දැක්වීමට අප කීප දෙනෙක් පුහුණු කර වාර අවසානයේ දිනයක වේදිකාගත කළා මතකය. *"සෞඛ්‍ය සතිය"* සඳහා දෙබස්/කෙටි නාට්‍ය දෙකක් දෙවසරක් අප දෙදෙනෙකුට පුහුණු කර ඉදිරිපත් කළේය. සෞඛ්‍ය සතිය "විවිධ ප්‍රසංගය" පැවැත්වූයේ *උඟරුගල* (මැද මහනුවර) පාසැලේ දී ය. වරක් ඒ සඳහා තෑගි වශයෙන් ලොකු තුවායක් බැගින් අප දෙදෙනාට ලැබිණි. අපේ පාසලේ සිට සැතපුම් අටක් පමණ ඈතින් වූ *උඟරුගල පාසලට* අප කැඳවා ගෙන ගියේ "ඉංග්‍රීසි මහත්තයා ය". හුන්නස්ගිරියේ සිට උඟරුගලට සැතපුම් තුනක් ගියේ බස් එකකිනි. වීරසිංහ ගුරුතුමා අපට ඉගැන්වූ ශ්ලෝකයක් මෙසේය:

අක්‍රොධමාරොග්‍ය ජිතෙන්ද්‍රියත්වං

දයාක්ෂමා සර්ව ජනප්‍රියත්වං

නිර්ලෝභී දාතා භය ශෝක මුක්තීර්

ඥානප්‍රභෙදා දස ලක්ෂණානි "

මෙය *ප්‍රඥා ශතකයේ* ආරම්භක ශ්ලෝකය බව දැන ගත්තේ පසු කාලයේ දී ය.

පහේ පන්තියේ දී අපේ ගුරුවරයා වූයේ **ගලගොඩ මහතාය.** සුදු රෙද්දක්, කමිසයක් හා කබායක් ඇදි එතුමා ටිකක් උස කෙනෙකි. ඉතා දක්ෂ ගුරුවරයෙකු වූ එතුමා දැඩි විනයාරක්ෂකයෙකි. එතුමා කිසිවකු සමග හිනාවෙනවා දැක නැත. අපේ පන්තියේ ගැහැණු පිරිමි ළමුන් දහ දොළොස් දෙනෙක් පමණ වූහ. අපට භාවිතා කිරීමට තිබුණේ ජෝඩු මේස බංකුය. පොත් දැමීමට පෙට්ටියක් වැනි කොටසක් විය. එයට උඩින් වැසීමට පියනක් විය. පියන වැසූ විට ලියන මේසය විය. මේසය එකට සම්බන්ධ කර වාඩි වන බංකු සාදා තිබිණි. මා ළඟ මේසය හා බංකුව පාවිච්චි කළ අනෙක් ශිෂ්‍යයා ද ඉගෙනීමට දක්ෂ කෙනෙකු විය. පන්තියේ පළමු දෙවෙනි තැන් ලැබුවේ අප දෙදෙනාය. එම වසර (1944) අවසානයේ පැවති ශිෂ්‍යත්ව විභාගයෙන් ද අප දෙදෙනා ම සමත් ව සැතපුම් විස්සක් පමණ දුරින් පිහිටි ප්‍රදේශයේ මධ්‍යම පාසලට ද්විතීය අධ්‍යාපනය සඳහා ගියෙමු.

මේ වන විට පාසලේ මුල් ගුරුවරයා වූයේ "දඹුල්ලේ" මහතාය. පිටවල මහතා විශ්‍රාම ගැනීමෙන් පසුව මුල් ගුරු පදවියට පත්ව ආවේ *ජේ.කේ.පී. බණ්ඩා* නම් වූ මේ දඹුල්ලේ මහතාය. එතුමා බෙහෙවින් ම ගුණයහපත් කෙනෙකු වූ බව මතකය. මැදිවක පාසලේ හැම පන්තියක දී ම ඒ පන්තියේ හැම විෂයයක් ම අපට ඉගැන්වූයේ පන්තිභාර ගුරුතුමාය. එනමුත්, ඉංග්‍රීසි ඉගැන්වීමට වෙන ම ගුරුවරයෙක් සිටියේය. රෙදි විවීම ඇතුළු හස්ත කර්මාන්තය ඉගැන්වීමට වෙන ම ගුරුවරියක වූවාය. විවීම ඉගැන්වූයේ ගැහැණු ළමයින්ට පමණය.

එනමුත් පිරිමි ළමයින්ට අත්වැඩ තිබිණි. කිරි මැටිවලින් යම් යම් රූප සෑදීම, ලණු ඇඹරීම (කොහු ලණු නොවේ. පට්ටාවලිනි) යනාදිය කරවන ලදී.

අපේ පාසලේ ඉංග්‍රීසි (විෂයක් ලෙස) ඉගැන්වීම ආරම්භ කළේ තුනේ පන්තියේ දී ය. ඉංග්‍රීසි ඉගැන්වීම කළේ පාසල අසල ම නිවසක පදිංචි ව සිටි ඒ ගමේ ම කෙනෙකු වූ ***කේ.බී. මැදිවක මහතාය.***

"ඉංග්‍රීසි මහත්තයා" යනුවෙන් ප්‍රදේශයේ ප්‍රසිද්ධ ව සිටි එතුමා, පාසලට එන විට ඇඳ සිටියේ සරමක්, කමිසයක් හා කබායක්ය. එනමුත්, ඇත ගමනක් යන විට කළිසම් කබා ඇඳීම එතුමාගේ සිරිත විය. පෝලෝ තොප්පියක් හිස පැළැන්දේය. එතුමා ද දක්ෂ ප්‍රායෝගික ගුරුවරයෙකු වූයේ යයි සිතමි. පහේ පන්තියේ ඉගෙන ගන්නා විට, කොළඹ පොත් සාප්පුවකට ඉංග්‍රීසියෙන් ලිපියක් යවා ශිෂ්‍යත්ව විභාගය සඳහා වූ බුද්ධි පරීක්ෂණය/සාමාන්‍ය දැනීම පොතක් ගෙන්වා ගැනීමට මට හැකියාව ලැබුණේ ඉංග්‍රීසි මහත්තයාගේ ඉගැන්වීම් ක්‍රමය නිසාය. එතුමාගේ ලොකු පුතා මා සමඟ පහේ පන්තියේ දී ඉගෙන ගත් බව මතකය.

අප ප්‍රාථමික පාසලේ නොයෙක් පන්තිවල දී භාවිතා කළ පොත් කිහිපයක් ගැන මතකයට නැඟේ. පහළ බාලාංශයේ දී පාවිච්චි කළේ *හෝඩි පොතය.* මිශ්‍ර සිංහල හෝඩිය මුලින් ම තිබිණි. පාවිච්චි කළ අනෙක් පොත් කවරේ දැ'යි මතක නැත. ඉහළ බාලාංශයට හා දෙවෙනි පන්තියට "ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ" අච්චු ගසන ලද පොත් දෙකක් තිබිණි. ඒ පොත් රජයෙන් දුප්පත් සිසුනට නොමිලේ දුන් අතර, වසර අවසානයේ ආපසු භාර දිය යුතු විය. ඒ පොත්වල තිබුණ පාඩම් දෙකක් වූයේ, *'කපුටා හා කේජු කැල්ල'* යන්නත්, රිළවි දෙදෙනෙකුගේ කතාවත් ය. රණ්ඩු කිරීමට කැමති රිළවෙක් ලී කෝටු කැල්ලක් ගෙනැවිත් 'එය තමාගේ' යයි අනිකාට කීවිට, 'ලී කැල්ල උඹේ නම් උඹ ඒක ගණින්' යයි කියා රංඩුව මඟහැරීමයි. තුනේ පන්තියේ දී භූගෝල ශාස්ත්‍රය ඉගැන්වීමට *ඇල්.මැක්.බී රොබිසන්* මහතාගේ පොතක් භාවිතා කරන ලදී. රොබිසන් මහතා එකල අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වූ බව සඳහන් වේ.

"මහවැලි නදිය" නමින් කවි පොතක් ද තුනේ පන්තියේ දී භාවිතා කළේ යැ'යි සිතමි. ඒ පොතේ කර්තෘවරුන් වූයේ, *එන්.බී.ඩබ්ලිව් මැදිවක* හා *කේ.බී. මැදිවක* මහතුන්ය. එන්.බී.ඩබ්ලිව් මැදිවක මහතා කේ.බී. මැදිවක මහතාගේ වැඩිමහල් සෙහොයුරාය. එතුමා පසු කාලයේ මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයේ විදුහල්පති ලෙස සේවය කොට, 1956 වසරේ දී මිණිපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස තේරී පත්විය. කේ.බී. මැදිවක මහතා අපේ පාසලේ ඉංග්‍රීසි මහත්තයා විය. එතුමා ද 1947 පාර්ලිමේන්තු මැතිවරණයට ලංකා සමසමාජ පක්ෂ අපේක්ෂකයා ලෙස තරග කළ නමුත් පරාජයට පත්විය. දිනුවේ රඹුක්වැල්ල දිසා මහතාය. මහවැලි නදිය කවි පොතේ තිබුණේ මහවැලි ගඟේ ගමන් මඟ පිළිබඳ සිත් ඇඳ බැඳ ගන්නා විස්තරයකි. *වික්ටෝරියා දියඇල්ල, රංටැඹේ ඇල්ල* යනාදිය පිළිබඳ විස්තර මනරම් ලෙස කවියට නඟා තිබිණි. අවාසනාවට ඒ කවි කිසිවක් දැනට මතකයේ නැත.

මහිංශාස කුමාරයා ගැන විස්තරයක් හතරේ පොතක තිබුණේ යයි සිතමි. පහේ පන්තියට නියමිත ව තිබුණ කවි පොත **සුභාෂිතය** යි. ගලගොඩ මහතා විසින් මෙහි කවිවල තේරුම් පැහැදිලි කර දී "ක්‍රියා කාරක පද සම්බන්ධය" ආදිය කියා දුන් නමුත්, අපට ඒ කාලයේ මේවායේ අරුත හෝ ගැඹුර සිත්වලට කා වැදුණේ නැත. එනමුත්, සුභාෂිතයේ වූ කවි කීපයක් තවමත් මතක තිබේ. පසු කාලයේ දී අපේ ගායකයන් කීප දෙනෙකුගේ සින්දුවලට ද සුභාෂිතයේ කවි සමහරක් පාදක වී තිබේ :

උදාහරණ :-

නැගෙතත් අවර ගිරගින් දිනකර — මඬල
සැලෙතත් සුනෙර පවනින් සෙදෙතත් — අනල
පිපෙතත් ගිරි මුදුන් හෙල්මැලි — පියුමුපුල
බොරු නැත්තෙමය මහතුන් පැවසූ — තෙපුල

එහි මුල් ම කවියත් අවසන් කවියත් පහතින් දැක්වේ :

1 සත වෙන පත මෙත සඟහස සෙවි — පසිඳූ
අවනත සුර මත මිණිතර සර — පුබඳූ
දිගුරතැ'ඟිලි දළ පෙළ මොක් සුවඳ — රැඳූ
සියපත සිය සියපත සිය පත — නමඳූ

101 නිති සුපසන්න සරසවි රැඳි මුව තඹර
කවි ගජබින්න කළ එකසර කෙසර යුර
අලගියවන්න මුකවෙටි නමැති කිවියර
යුතු පද සන්න මේ කවි කෙළෙය අමයුර

අලගියවන්න පඬිතුමා "සීතාවක රාජ්‍ය කාලයෙන් පසු උදා වූ ශ්‍රේෂ්ඨ පඬිරුවනක් " යයි **පණ්ඩිත වේරගොඩ අමරමෝලි නාහිමියෝ** පවසති. මේ කවියා යම් කාලයක දී ක්‍රිස්තියානි ආගම වැළඳ සිටි බව කියන නමුත්, සුභාෂිතය රචනා කරන විට හේ බෞද්ධයකු ව සිටි බව පෙනේ.

නිර්දේශිත පාඨ ග්‍රන්ථයක් නොවූව ද, පහේ ශිෂ්‍යත්ව විභාගය සඳහා මා ඉහතින් සඳහන් කරන ලද, කොළඹ පොත් සාප්පුවකින් ගෙන්වා ගත් "**බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම**" යන පොත එම විභාගය සඳහා මහත් උපකාරයක් විය. ඒ පොත කාගේ කෘතියක් දැ'යි මතක නැත. තැපැල් කන්තෝරුවට ගෙන්වා ගත් එම පොත, එහි ගොස් මුදල් ගෙවා ලබා ගෙන ගෙදර පැමිණි වහා ම, දැඩි පිපාසයකින් සිටි කෙනෙක් නොනවත්වා දිය බීගෙන යන්නා සේ, පොත කියවීමට පටන් ගතිමි. එහි තිබුණ රූප සටහන් ආදිය මට නවමඟක් විවර කළහ. ඊට පෙර එවැනි අභ්‍යාස දැක නොතිබුණි. ඒ පොත කියවා හමාර වීමෙන් පසු, මගේ පන්තියේ අනිත් සගයාට ද කියවීමට දුන්නේ යයි සිතමි. ශිෂ්‍යත්ව විභාගය සමත්වීමට පන්තිභාර ගුරුතුමාගේ මඟපෙන්වීම මෙන් ම මේ පොත ද උපකාර වූ බව මගේ විශ්වාසයයි. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල ලැබුණ දවසේ පාසලේ ගුරුවරු කීප දෙනෙක් එතුමන්ලාගේ සතුට පළකළහ. අපේ පාසලෙන් ඊට පෙර වසරේ ද කෙනෙක් ශිෂ්‍යත්ව විභාගය සමත් වී මධ්‍යම පාසලට ඇතුළත් වී සිටියේය.

මැදිවක පාසලේ මා ඉගෙන ගෙන ඇත්තේ 1939 සැප්තැම්බර් 1 සිට 1945 පෙබරවාරි 5 දක්වා අවුරුදු පහකුත් මාස පහක් පමණය. පාසලට ඇතුළු කළ දිනයේ අප්පච්චී සමඟ එහි ගිය නමුත්, එදින ආපසු ගෙදර ආවේ ගමේ අනෙක් ළමයින් සමඟය. සැතපුම් දෙකක් පමණ වූ පාසල් ගමන මාර්ග තුනක් ඔස්සේ යා හැකි විය. අපේ ගෙදර සිට ගමේ අඩිපාරක් දිගේ ගොස් "පාලම ළඟදී" *මාඩුගොඩ - මැදිවක* පාරට (උඩහ පාර) ගොඩ වී ගිය මාර්ගය පළමුවැන්නයි. ගමේ අඩිපාරක් දිගේ ඔයට වම් පසින් පහළට ගොස් කිරිපට්ටිය-මැදිවක පාර (පල්ලෙහා පාර) දෙවැන්නයි. ඔයට දකුණු පසින් වෙලේ පහළට ගොස් කිරිපට්ටිය පාරට සේන්දු වී ගිය මාර්ගය තුන්වැන්නයි. බාලාංශ පන්ති දෙකේ දී පාසල් ඇරුණේ දවල් දොළහටයි. එනමුත්, දෙවෙනි පන්තියෙන් පසුව සවස දෙක දක්වා පාසල පැවැත්විණි.

මුලින් ම පාසල් යන දවසේ ගොරෝසු රෙද්දකින් මසා කරේ එල්ලා ගෙන යෑමට පටියක් අල්ලා තිබුණ පොත් මල්ලක් ගෙන ගියෙමි. මුලින් ම එහි දමා ගෙන ගියේ හෝඩි පොත, ගල්ලෑල්ල, ගල්කුර හා (බෙලෙක්) පිඟානයක් ය. පිඟාන ගෙන ගියේ දිවා ආහාරය සඳහාය. දිවා ආහාරයට රට හාල් බත් සහ පරිප්පු හොද්දක් ලැබිණි. යුද්ධය ආරම්භ වී ටික කලක් ගතවන විට, දිවා ආහාරය නතර විය. එසේ වුව ද, වැඩි කල් නොගොස් තිරිඟු පිටි (පාන් පිටි) රොටී කෑල්ලක් ලැබිණි. පසුව ඒ සඳහා පාන් කෑල්ලක් දෙන ලදී. පාසල් දිවා ආහාරය නතර වූ කාලයේ දී ගෙදරින් කුරහන් රොටියක් ගෙන ගියෙමි.

පාසල ඇරී ගෙදර එන අතරමඟ හමුවන ගස් කොළන්වල තිබුණ ගෙඩි ජාති කඩා ගෙන කෑම සාමාන්‍ය සිරිත විය. මොර, පේර, කරඹ, යබර ආදී ගෙඩි වසරේ සමහර කාලවල දී මේ ගස්වල ඵලගනී. වැසි සමය ආරම්භ වුවායින් පසුව (උඩහ පාර ඉදිකිරීමේ දී කපා තිබුණු) වේලිවල ඉරමුසු වැල් ඇදී තිබේ. එවිට ඒවා හාරා ඉරමුසු මුල් කෑමට ගැනීම අපේ සිරිතක් විය. සතයක් දෙකක් අතේ තිබුණහොත් *කණහම්පිටියේ* මරක්කල "ආච්චිලාගේ" කඩේකින් සීනිබෝල ගෙන බෙදා ගෙන කෑවෙමු. පාසල අසල කඩවල් දෙකක් තිබිණි. පසු කාලයේ දී *විජේසේකර පවුල කරණහම්පිටියේ* කඩයක් විවෘත කළහ. හුලං විස්කෝත්තු, සීනිබෝල වැනි දේ ඒ කඩවලින් ද මිල දී ගතිමු. එනමුත්, ඒ සඳහා නිතර අතේ මුදලක් නොවීය. තිබුණත් සත තුන හතරක් පමණි.

පාසල ඇරී ගෙදර පැමිණ, පොත් මල්ල පසෙක දමා ඇඳුම් මාරු කර ගෙන, දිවා ආහාරය ගතිමි. පාසලේ දිවා ආහාරය දවල් දොළහට පමණ විය. ගෙදර පැමිණ ආහාර ගත්තේ සවස තුනට පමණය. ඒ කාලයේ එළහරක් කීප දෙනෙක් ඇති කළ නිසා, උදේට බිමට එළකිරි තිබිණි. ඉතිරි වන කිරි මිදෙන්නට තබා පසුදා කෑමට ගත්තේය. ඒ නිසා දවල් බත් වේල සමඟ මුදවපු කිරි දිනපතා ම ලැබිණි. කෑමට පසු ගමේ කොල්ලන් සමඟ සෙල්ලම් කිරීමට ගියෙමි. රෑ බෝ වනතුරු ගමේ ගෙදරක මිදුලක හෝ වෙලේ ලියද්දක සෙල්ලම් කර ආපසු ගෙදර එන විට, පිහිල්ලෙන් අතපය සෝදා ගතිමි. රෑ කෑමෙන් පසු නිදාගෙන පසුදා පාසල් ගියෙමි. පාසලේ දී ගුරුවරුන්ගෙන් ඉගෙන ගත් දේ මතක තබා ගත්තා මිස, ගෙදර දී පාඩම් කිරීමක් නොවීය. ගෙදර දී කියවන ලද එක ම පොත ශිෂ්‍යත්ව විභාගයට කොළඹ පොත් සාප්පුවකින් ගෙන්නා ගත් *'බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම'* නමැති පොත පමණයි. සති අන්තයේ දී ගම අවට ළඳු කැලෑවල ඇවිදීමට ගියෙමු. ඒ යන විට හමුවන ගෙඩි කඩා ගෙන කෑවෙමු.

අපේ ගෙදර රෑ කෑමෙන් පසු අම්මා සහ අක්කලා නිදා ගැනීමට සූදානම් ව **"යසෝධරාවත"** **"ධාතුවිස්තරය"** වැනි පොත්වල කවි කීමේ නිරත වූහ. අකුරු දන්නා කවුරු හෝ ලවා ඒවා කියවා ගෙන, කවි කටපාඩම් කරගෙන උන්හ. මට අකුරු කියවීමට නිපුණත්වයක් ලැබුණ පසු, දිනපතා නින්දට පෙර මේ පොතකින් කවි කීපයක් කියවා ගත්හ. මුල දී "ඕසෙකට" කවි කියන්ට බැරි වුණත්, අම්මලාගේ ගායනය නිසා මට ද එය පුරුදු විය. ධාතු විස්තරය පටන් ගන්නේ :

සාරා සන්ක කප් ලක්සය පෙරුම් පු රා
ගෝරා මරු දිනා බුදු බව ලත් පව රා
දීරා බල ගුණැති අප මුනිඳු ලොවුතු රා
නැරා අත් මුදුන් දී වඳිමි පද ස රා

යන කවියෙනි. බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා *ද්‍රෝණ* නම් බමුණා විසින් රජවරු අට දෙනකුට බෙදා දුන් බව සඳහන් වේ. එම ධාතු පිහිටෙව් නුවර අට කුමක් දැ'යි විචාරා මෙසේ පිළිතුරු දෙයි :

"රජගහ නුවර සහ වේසාලි නුවර ය
කපිල වස්තුපුර සහ අල්ල කප්ප ය
රාමගම වේටදීපය පාවෙයි ය
කුසිනාරාපුරය යන මෙනුවර අට ය"

කවි හැටතුනක් වූ ධාතු විස්තරය පොතේ ධාතූන් වහන්සේලා තැන්පත් කර දාගැබ් ආදිය ඉදිකරන ලද වෙනත් නොයෙක් තැන් ගැන විස්තර කෙරේ. මක්කම වැල්ලේ ද සිරිපතුළක් තැන්පත් කර ඇති බව සඳහන් වේ.

යසෝදරාවතේ කවි එකසිය තිහකි. එහි පළමුවන කවිය මෙසේය :

"සාරාසංක කප් ලක්සය පෙරුම් පු රා
සොළසා සංක කප් ලක්සය පෙරුම් පු රා
සූවිසි සංක කප් ලක්සය පෙරුම් පු රා
මෝරා පුබුදු මල ලෙස බුදු වූ ලොව් තු රා"

අපෙ අම්මලා නිතර අහන්නට කැමැත්තක් දැක්වූ කවි කීපයක් විය. ඒවා අතර පහත දැක්වෙන කවිය වඩාත් සංවේදී වූවක් වී යයි සිතමි :

කැලේ තිබෙන කොයි දේ වත් රස වේ වා
මලේ බඹරු ලෙස පිරිවර ඇති වේ වා
අව්වේ තිබෙන රැස්මාලා අඩු වේ වා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේ වා"

වැඩිහිටියනට මේ කවි කොපමණ සංවේදී වුවත්, කුඩා මා නිදිකිරා වැටෙන විට කවි පොත ඉඛේ ම ගිළිහී ගොස් කවි කීම නතර වූ අවස්ථා එමටය. ද්විතීයික අධ්‍යාපනය සඳහා ගමෙන් පිට වී ගිය පසු, කවි පොත් කියවීමට අවකාශ ලැබුණේ කලාතුරකිනි. ඒ වන විට අපේ අක්කලා ද ගෙදරින් පිට වී ගොස්ය. නිවාඩුවට ගෙදර එන විට සිටියේ අම්මාත් නංගීත් අම්මාගේ ළඳරු මිනිබිරියත් පමණි.

අකුරු කියවීමට ඉගෙනීමෙන් පසුව, අපේ ගෙදර තිබුණ පොත් දෙකක් කියවීමට ප්‍රයත්න දැරුවෙමි. එයින් එකක් "වදන් කවි පොත" යි. බුද්ධ, ධර්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය වැඳ ආරම්භ කරන මේ කවි පොත කියවූ කෙනෙකුට, සිංහල හෝඩියේ ස්වරාක්ෂර (ප්‍රාණාක්ෂර) දහසය සහ ගාත්‍රාක්ෂර තිස්හතර ගැන දැනීමක් ලබා ගත හැකි වේ. වදන් කවි පොතට මුලින් *ගණදෙවි හැල්ල* නම් කොටසක් ද සම්බන්ධ කර තිබිණි. එහි තිබුණ කවි නුවණට අධිපති ගණ දෙවිඳුන්ට කරන යාදින්නක් විය. ගෙදර තිබුණ අනිත් පොත *පිරුවානා පොත් වහන්සේය.* එහි ලොකු අකුරින් පිරිත් සූත්‍ර මුද්‍රණය කර තිබුණ නිසා කියවීමට ප්‍රයත්න දැරුවෙමි. මුල දී බැඳි අකුරු කියවීම අපහසු වුවත්, ක්‍රමයෙන් එය ද පහසු විය. මංගල සූත්‍රයේ "**ඒවං මේ සුතං**" යන කොටස පමණක් කට පාඩමෙන් කියවීමට හැකියාව ලැබිණි. කුඩා අවධියේ දී මෙවැනි පොත් කියවීමට ලැබුණ නිසා, විවිධ පොත්පත් කියවීමේ ආශාවක් මා තුළ ජනිත කළේ යයි සිතමි.

03 ගැටවර විය

මගේ ගැටවර විය ද්විතීය අධ්‍යාපනය සඳහා ගත කළ නමුත්, උපන් ගමෙන් පිට වී දෙමව්පිය ඇසුර අවසන් වූයේ ද එයට පිවිසීමක් සමඟය. එහි ප්‍රතිඵලය වූයේ, මගේ සිතැඟි අනුව යම් මේ දේ කිරීමට ඉඩ සලසා ගැනීමයි. ස්වභාවයෙන් ම හොඳ නම ඇසීමට කැමැත්තක් මා තුළ තිබුණ නිසා, හිතුවක්කාරයෙකු වීමට තිබුණ යම් ප්‍රවණතා පාලනය කර ගැනීමට පෙළඹීමක් ද ඇති විය. ඒ නිසා, හිතුමතයේ කළ බොහෝ දේ හැකි තරම් හුදකලාව හා රහසිගත ව තබා ගැනීමට ප්‍රයත්න දැරුවෙමි. ශිෂ්‍ය නේවාසිකාගාරයේ නැවතී සිටින විට අනවසරයෙන් එයින් පිටවී යෑම විනය විරෝධී විය. සති අන්තයේ පිටවී යෑමට අවශ්‍ය වූ විට, නේවාසිකාගාර භාර ගුරුතුමාගේ අවසරය ලබා ගෙන, අපේ ගෙදර යන බව දන්වා, සමහර විට බඹරදෙණියේ නැන්දම්මලාගේ ගෙදර ගියෙමි.

මුලින් ම නේවාසිකාගාරයට ගිය දිනවල එහි ගත කිරීමට පාළුව දැනුණු විට, අනවසරයෙන් කීප දිනක් ගණදෙවි කෝවිල පන්සලට යෑමට හැකි වීම නිසා, අවශ්‍ය නම් එසේ පිටවී යෑමට එතරම් බාධාවක් නොවූ බව ද පෙනී ගියේය. එහෙත්, ක්‍රමයෙන් නේවාසිකාගාර දිවියට හුරු වූ පසුව, පන්සලට යෑම නතර කළෙමි. එනමුත්, අවශ්‍ය වූ විට දවල් කාලයේ දී පැය කීපයකට හුදකලාව ම පන්සලට ගොස් ආපසු පැමිණීමට පුරුදු වූයෙමි. පසු කාලයේ දී විටින් විට **වත්තේගම ධර්මදීප පිරිවෙනට** යෑමට ද පුරුදු වූයෙමි. කල්ගත වන විට චිත්‍රපට බැලීමට හිතුණු විට හුදකලාව මහනුවර ගිය වාර ද බොහෝය. මහනුවර ඇසල පෙරහැර, වෙසක් උත්සව හා කැරොල් ආදිය බැලීමට ගියේ තවත් කීප දෙනෙක් සමඟය. මේ ගමන් බිමන් මගේ දිවියේ නව මං විවර කිරීමට උපකාර වූ බව පෙනේ. එකිනෙක සිද්ධි විස්තර වන විට ඒවායේ වැදගත්කම හා බලපෑම යනාදිය පැහැදිලි වනවා ඇත. ඒ නිසා, විධිමත් අධ්‍යාපනයට අමතර ව මගේ ගැටවර වියේ වෙනත් අත්දැකීම් රාශියක් ද විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි.

ද්විතීය අධ්‍යාපනය

කෙනෙක් අධ්‍යාපනය ලබන්නේ පාසල් ගුරුවරුන්ගෙන් හා පොත්පත් කියවීමෙන් පමණක් නොවේ. පාසල් යන වයසේ සිටින කෙනෙක් විධිමත් අධ්‍යාපනය තුළින් යම් යම් විෂයයන් ගැන දැනුමක් ඒ ඒ පන්තිවල දී ලබා ගන්නා නමුත්, ජීවිතය, සමාජය, පරිසරය යනාදිය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නේ බාහිර ලෝකයෙනි. ප්‍රාථමික අධ්‍යාපන අවදියේ දී පරිසරයෙන් ලබා ගන්නා දැනුම, ද්විතීය අධ්‍යාපන යුගයේ දී වඩා පුළුල් ව උකහා ගනී. මෙහි සටහන් කරන විස්තරයට, පාසල තුළ දී මෙන් ම ඉන් බැහැර ව ද අදාල වයස් සීමාවන් තුළ දී ලබා ගත් විවිධ අත්දැකීම් අන්තර්ගත වේ. ඒ සියල්ල මගේ ජීවිතය හැඩගැස්වීමට හේතු විය.

එම වකවානුවේ දී මගේ සිතුම් පැතුම් කෙරෙහි විශාල බලපෑම් ඇති කළ ලොකු කුඩා පුද්ගලයින් රාශියක් වූහ. ඒ අයගේ දයාව, කරුණාව මගේ විධිමත් අධ්‍යාපනය අඛණ්ඩ ව කර ගෙන යෑමට හේතු විය. අව්‍යාජ අහිංසක මිනිසුන්ගේ උපකාරය නිසා, ද්විතීය අධ්‍යාපනය ආරම්භයේ මුහුණ දුන් දැඩි පීඩනය තරණය කිරීමට මට ශක්තියක් ලැබිණි. ඒ බවක් මෙහි සඳහන් කිසිවෙක් නොදැන සිටියා වන්නට ඇත. මෙම විස්තරය අදාළ දේ සිදුවන අවස්ථාවල දී ලියා තැබුවා නම්, එය හුදු වාර්තාවක් මිස මගේ ජීවිතය ඒ අයට කොපමණ ණයගැති ද යන්න මෙතරම් පැහැදිලි නොවීමට ඉඩ තිබිණි. ද්විතීය අධ්‍යාපන යුගයේ දී මගේ විවිධ අත්දැකීම් මේ විස්තරයට අන්තර්ගත කරන්නේ, ඒ සියල්ල මට පන්නරයක් ලබා දීමට උපකාර වූ නිසාය.

නිර්ව්‍යාජ පිටිසර ගැමි පරිසරයේ රැකවරණය ලබමින් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ මම, වයස අවුරුදු දොළහ සම්පූර්ණ වීමට දින කීපයක් තිබිය දී, යම් පමණක නාගරික බලපෑමක් තිබූ නව පරිසරයකට ප්‍රවේශ වූයෙමි. ඒ සමඟ ඇති වූ වෙනස්කම් කීපයක් විය. පාසල් ඇඳුම, සරම වෙනුවට කලිසමට මාරු විය. සිංහල මාධ්‍යයෙන් ඉගෙනීම ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය විය. මේවා තුළින් ආනුශංගික ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් වෙනසකට ආරම්භය වැටිණි. දෙමව්පිය ඇසුරේ තම නිවසේ ජීවත්වීම වෙනුවට සම වයසේ පිරිසක් සමඟ නේවාසිකාගාරයක කාලය ගතකිරීමට සිදුවිය. මේ අය සමඟ සුහදතාවක් ගොඩ නැඟීමට කාලයක් ගත විය. ද්විතීය අධ්‍යාපනයේ පදනම වූයේ විධිමත් පාසල් අධ්‍යාපනයයි. එයට ප්‍රවේශ වූ අවධියෙන් මේ කථාව ඇරඹිය යුතුවේ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරමු.

මගේ ද්විතීය අධ්‍යාපනය ආරම්භ වූයේ, පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී *වලල මධ්‍යම පාසලට* ඇතුළුවීමත් සමඟය. අපේ ගමේ සිට එම පාසලට සැතපුම් විස්සක් (කිලෝමීටර් තිස් දෙකක්) පමණ විය. මහනුවර

සිට කටුගස්තොට, නවයාලතැන්න, පොල්ගොල්ල, මඩවල හරහා සැතපුම් අටහමාරක් පමණ විය. වලල මධ්‍යම පාසල ඉදිකර තිබුණේ කොකෝවා, පොල් ආදිය වවා තිබූ ලොකු වත්තකය. මේ ඉඩම *ගල්කන්දේ වලව්වේ රත්වත්තේ නිලමෙවරයෙකුට* අයත් වූ බව කියනු ලැබේ. ගල්කන්දේ වලව්ව පිහිටියේ වලල - නාපාන පාරේය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දුම්බර ආසනය නියෝජනය කළ **අබේරත්න රත්නායක** මැතිතුමාගේ අනුග්‍රහයෙන් වලල මධ්‍යම පාසල ආරම්භ කර තිබේ. රත්නායක මහතා **ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර** ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් වූ විධායක සභාවේ සාමාජිකයෙකු විය.

මා ළඟ තිබෙන වාර්තා හා මතකය අනුව, වලල මධ්‍යම පාසලට මා ඇතුළු වූයේ, *ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ආරියපාල* (ඊ.ආර්.ඇම්. ආරියපාල) නමින් 1945 මාර්තු මස 01වෙනි දා ය. පාසලේ ප්‍රවේශ අංකය 222 ය. දිනක් හිමිදිරි පාන්දර ලස්සන කොටු සරමක් හා නිල් පැහැති කොටු කමිසයක් ඇඳගෙන, කමිස සාක්කුවේ ලේන්සුවක් රුවා ගෙන, හොඳට පොල්තෙල් ගා බොකුටු කොණ්ඩය පීරාගෙන සූදානම් ව සිටි මට, අප්පච්චී එනතුරු මඟට බැස මහපාරට යන ලෙස කී නිසා, අම්මාට වැඳ සමුගෙන, තනිව ම අඳුරේ ම ගෙදරින් පිටත් වූයෙමි. මහ පාරට පිවිස ටික දුරක් යන විට අප්පච්චී ගමනට එකතු විය. අපේ ගෙදර තිබූ එවකට වටිනා භාණ්ඩයක් වූ යකඩ පෙට්ටිය (ට්‍රන්ක පෙට්ටිය) අප්පච්චී අතේ තිබිණි. එහි මට අවශ්‍ය ඇඳුම් පැළඳුම් කළමනා තිබුණේ යැ'යි සිතමි. බස්රියකට නැඟීමට හුන්නස්ගිරියට යා යුතු වූ නිසා, සැතපුම් හතරක් පයින් ආවෙමු. සීතල හිමිදිරියේ හිස ගැල්වූ පොල්තෙල් මිදී කොණ්ඩේ "පොල්කට්ටක්" වී තිබූ බව වරක් හිස අතගාන විට දැනිණි. හිසකෙස් නැවත යථා තත්ත්වයට පත්වූයේ බස් රථය හුන්නස්ගිරියෙන් පිටත් වී සෑහෙන දුරක් ගමන් කළාට පසුවයි.

හුන්නස්ගිරියෙන් බස්රිය පිටත්වන විට හොඳට ම එළිය වැටී තිබිණි. එහි ඉරිදා පොලෙන් එපිට *උඟරුගල* දක්වා පමණක් ගොස් තිබුණ මට, මේ විවෘත වන්නේ නව ලෝකයක් බව නොදැනුණත්, මඟ දෙපස ගැන මහත් ආශාවෙන් විපරම් කරමින් ගමන් කළෙමි. දැන් හමුවන ස්ථාන සමහරක් කලින් අසා තිබුණ තැන්ය. ගලේකැලේ තේ වත්ත පසුකර ටික දුරක් ගිය විට උඟරුගලට ළඟාවිය. එහි පාසල අවට වූ වෙල්යායට පහළින් විශාල සියඹලා ගසක් වේ. *ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා සහ බිසව සැඟවී සිටි මැදමහනුවර උඩුපිටියේ රාළලාගේ වලව්ව* පිහිටා තිබුණේ මේ ඉසව්වේ යයි කියනු ලැබේ. මහනුවරට ගමන් කරන අපේ බස් රථය තවත් සැතපුමකින් පසු *මොරගහමුල* කඩපලට ළඟාවිය. ටික දුරක් යන විට ගුරුඹය පාලම පසුවේ. එතැන් සිට සියඹලාගස්තැන්න දක්වා මහ පාරේ වම් පසින් ගුරුඹය ගලා බැස වික්ටෝරියා දිය ඇල්ලට ඉහළින් හුළුගඟට එකතු වේ. රඹුක්වැල්ල පසු

කරන බස් රථය, යකාමුල්ලට පසුව තෙල්දෙණියට ළඟාවේ. එහි දී, හුළුගඟ හරහා ඇති පාලම පසු කරන විට දකුණු පසින් තෙල්දෙණියේ ද්විභාෂා පාසල හා වම්පසින් රෝහල ද දක්නට ලැබේ.

ඒ තැන් පසු කරන විට *තෙල්දෙණියේ පොලීසිය* ද එතැනින් පසුව බස් නැවතුම්පළ ද හමුවේ. *තෙල්දෙණියේ පොලීසිය* හැර වෙන පොලිස් ස්ථානයක් *මැද දුම්බර, උඩුදුම්බර* ප්‍රදේශවල එවකට තිබුණේ නැත. *මීණිපේ, බැඹිය* වැනි ඈත ප්‍රදේශ ආවරණය කළේ ද මේ පොලීසිය විසිනි. තෙල්දෙණියෙන් පිටත් වූ බස්රථය, *වැවේගම, අංචිකඩේ, මහබේරිය තැන්න, ගල්අම්බලම* පසුකර *දිගනට* ළඟාවිය. එතැනින් මහනුවරට යෑමට පාරවල් දෙකක් වේ. අප ගමන් කළ යුතු වූයේ උඩ පාරේය. එය මල්පාන, දහයේ කණුව පසුකර මැණික්හින්නට ළඟාවේ. සිරිතක් වශයෙන් බස් රියැදුරු කොන්දොස්තර දෙදෙනා මෙහි දී තේ පානය කරති. එතැනින් හුරීකඩුව පසුකර වලලට බස් රථය ළඟාවන විට, පෙරවරු අටයි තිහ පමණ වන්නට ඇතැ'යි සිතමි.

වලල මධ්‍යම පාසල

එහිදී බස්රථයෙන් බැස මහ පාරේ වම්පසින් පිහිටි කඳුගැටයක ඉහළට වැටී තිබුණ පාර දිගේ ගොස් *වලල මධ්‍යම පාසලේ* ප්‍රධාන ශාලාවට ළඟාවීමු. මහපාරේ සිට පාසලට එන පාරේ වම්පසින් පන්සල ද දකුණුපස ඉහළින් ගම්සභා උසාවි ගොඩනැඟිල්ල ද තිබිණි. ප්‍රධාන ශාලාවේ එක් පසෙක ගැහැණු පිරිමි ළමුන් කීපදෙනෙක් හා දෙමව්පියන් සේ පෙනුණ කීප දෙනෙක් ද වූහ. අපි දෙදෙනා ද ඒ අතරට එක්වීමු.

අපට නුහුරු ඇඳුමක් ඇඳගත් ප්‍රසන්න පෙනුමකින් යුත් මහතෙක් එහි සිටියේය. එතුමා උඩුකයට ජාතික ඇඳුම් කමිසයක් ඇඳ සිටියේය. පහළ කොටසට චේට්ටියක් ඇඳ, එහි කොනක් කලිසමක හැඩයක් වන ලෙස කකුල් දෙක වටා කරකවා, දිගට ඉතිරි ව තිබුණ කොන ජාතික කමිසයේ පැත්තේ සාක්කුවට රුවා ගෙන සිටියේය. මෙම *බංගලි ඇඳුම* ඇඳ සිටියේ වලල මධ්‍යම පාසලේ ප්‍රථම ප්‍රධානාචාර්යවරයා වූ **තෙන්නකෝන් විමලානන්ද** මහතාය. මෙතුමා ළමා කාලයේ සිට ඉන්දියාවේ කල්කටා ප්‍රදේශයේ ජීවත් වූ නිසා, බංගලි ඇඳුමට හුරු වී ඇත. එතුමාගේ උපන්ගම වලල සිට සැතපුම් දෙකක් පමණ දුරින් පිහිටි *නාපානය.* එහි ගම්පතිගේ පුතෙකි. *අනගාරික ධර්මපාල තුමා* ලංකාවේ නොයෙක් පෙදෙස්වලින් ඉන්දියාවට කැඳවා ගෙන ගොස් අධ්‍යාපනය ලබා දුන් ළමුන් කීප දෙනා අතරට විමලානන්ද මහතා ද අයත් වී ඇත. කල්කටා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ විමලානන්ද මහතා වලල මධ්‍යම පාසලේ ප්‍රධානාචාර්ය තනතුරට පත්කරන ලද්දේ,

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දුම්බර මන්ත්‍රීවරයා ව සිටි *අබේරත්න රත්නායක* මහතාගේ නිර්දේශය මත, **ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර** අධ්‍යාපන ඇමතිතුමා විසින් යයි සිතමි.

පැමිණ සිටි සිසුන් පෙළගසා යම් උපදේශ මාලාවක් දුන් විමලානන්ද මහතා, දෙමව්පියන් ද ඇමතුවේය. නේවාසිකාගාරයේ ඇඳන් අවශ්‍ය සිසුන් සඳහා රුපියල් විස්සක් අය කළ බව පසුව දැනගතිමි. මේ පාසලේ පිරිමි ළමුන් කළිසම් අඳින බව පෙනිණි. සරමක් ඇඳ සිටියේ මා පමණක් දැ'යි සැකයකි. එනමුත් අපේ ගම් ප්‍රදේශයෙන් පැමිණ සිටි තවත් තුන් හතර දෙනෙක්වත් සරම් ඇඳගෙන ඉන්නට ඇත.

අපේ නව පාසලේ ප්‍රධාන ශාලාව පන්ති තුනක් සඳහා ඉඩ තිබුණ ද බෙදා වෙන් කර තිබුණේ නැත. ශාලාව අවසානයේ කාර්යාල කාමරයක් විය. ඒ ගොඩනැඟිල්ලට ම සම්බන්ධ කර තිබූ ගුරු නිවාසයේ ඉස්තෝප්පුවක්, සාලයක්, නිදන කාමර දෙකක් හා මුළුතැන්ගෙයක් විය. ප්‍රධාන පාසල් ගොඩනැඟිල්ල පසුකර පාසල් වත්තේ ඉදිරියට ගිය විට, කඳු බෑවුමේ දකුණු පසින් තවත් ස්ථිර ගොඩනැඟිල්ලක් විය. මෙය පිරිමි නේවාසිකාගාරයයි. (එවකට එහි ගෙබිමට සිමෙන්ති දමා තිබුණේ නැත) එයට වම් පසින් පහළට වන්නට පොල්අතු සෙවිලි කළ තාවකාලික ගොඩනැඟිල්ලක් විය. ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරය, මුළුතැන්ගෙය සහ භෝජන ශාලාව වූයේ එම ගොඩනැඟිල්ල තුළය. ප්‍රධාන ශාලාවට පහළින් ප්‍රාථමික පාඨශාලාව පිහිටා තිබුණි. මහපාරෙන් එයට පිවිසුණේ වෙන ම පාරකිනි. පාසල් වත්තේ සිට බලන විට මහපාරේ අනික් පැත්තේ දඹගල්ල, හේරත්, වීරබාහු, කහවත්ත යන පවුල්වල ගෙවල් තිබිණි. පාසල් වත්ත පැත්තෙන් ම මහපාර අයිනේ වූ ගෙවල් දෙකක බස් රියදුරන් දෙදෙනෙකු වූ ප්‍රැන්සිස් සහ හරමානිස් යන දෙදෙනාගේ පවුල් පදිංචි ව උන්හ. එයට එපිටින් පාසලට පිවිසීමට තිබුණු අඩිපාර අසල කඩ කාමරයක මැහුම් ගෙතුම් ඉගැන්වූ ගුරුවරයා පදිංචි ව සිටියේය. එතැනින් මැණික්හින්න පැත්තට වන්නට පල්ලෙගම්පහ ගම්සභා කාර්යාලය පිහිටා තිබුණේය. පාසල අසල වලං වැඩ කරන පවුල් කීපයක් ද පදිංචි ව උන්හ. පාසල් සිසුන්ගේ ජල අවශ්‍යතාවන් සලසා ගත්තේ පාසල අසල කුඹුරක් මැද කුඹුක්ගහක් මුල තිබූ ළිඳකිනි. පාසල් වත්තේ ද ළිඳක් තිබුණ නමුත් එහි ජලය බීමාදියට සුදුසු නොවීය. මහපාරට මායිම් ව තිබුණ පාසල් වත්ත කොකෝවා වත්තකි. පසු කාලයේ දී මෙය ක්‍රීඩා පිටිය ඉදිකිරීමට එළිකරන ලදී. (දැනට එය පාසලේ ගොවිපලය).

ප්‍රධානාචාර්යතුමා මුණගැසුණු මෙම ආරම්භක රැස්වීම පැවැත්වූයේ, 1945 පෙබරවාරි මාසයේ අග දී වන්නට ඇත. අධ්‍යාපන කටයුතු ආරම්භ වූයේ 1945 මාර්තු මාසයේ යයි සිතමි. මා අයත් වූයේ 6-බී පන්තියටයි. 6-ඒ පන්තියේ සිටියේ 1944 ඇතුළු කර ගත් සිසුන්ය. 6-බී පන්තියේ සිටි සිසුන්

අතරට මැදිවක පාසලෙන් මා සමඟ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ පුසරත්න, දාගැවිල්ලේ මැණික්හාමි සහ තවත් අයෙක්, හංවැල්ල/තලගුණේ පාසලේ විජේබණ්ඩා, වීරසේකර ශිෂ්‍යාව, පොල්ගොල්ලේ සුගතපාල, යටිරාවණ ප්‍රේමදාස, දම්ඹරාවේ කරුණාතිලක යන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සිටියහ. දෙනික ව පාසලට පැමිණි සිසුන් වූ හුරීකඩුවේ වයි.එම්.ඩබ්ලිව්. බණ්ඩාර, වයි.එම්. තිලකරත්න, වලල ඒකනායක, උඩගම රණතුංග, වලල අටේ කණුවේ රණතුංග යන සිසුහු ද 6-බී පන්තියට අයත් වූහ. තවත් ගැහැණු පිරිමි බොහෝ දෙනෙක් අපේ පන්තියේ සිටි නමුත්, ඒ හැම දෙනාගේ ම නම් ගම්, වසර හැට හතකට පසුව දැනට මතකයට එන්නේ නැත.

වලල මධ්‍යම පාසලේ පිරිමි සිසුන් කලිසම් ඇන්ද නිසා, එහි ගිය පළමු දිනයේ ම අප්පච්චී මා සමඟ මැණික්හින්න කඩපලේ ගුණදාස මහතාගේ ටේලර් සාප්පුවට ගොස් කොට කලිසමක් සඳහා ඇණවුමක් දුන්නේය. එවකට නියමිත නිල ඇඳුමක් නොවූයෙන් කැමති රෙද්දකින් කළිසමක් මස්සවා ගත්තෙමි. දින කීපයකට පසුව කලිසම මසා තිබිණි. එනමුත් එයට තිබුණේ එක සාක්කුවක් පමණි. එය ද දකුණු පසින් විය. මම වමත්කාරයෙකු වූ නිසා යම් අපහසුතාවක් ඇති විය. එනමුදු දැන් සරම වෙනුවට කළිසමක් ඇත. කළිසමට මාරු වීමට අපහසුවක් නැති වුවත්, එයට ආනුශංගික ඉංග්‍රීසි කථාකිරීමාදිය පුහුණු වීමට වසර කීපයක් ගතවිය. ක්‍රමයෙන් සාක්කු දෙකේ කළිසම් හා නිල ඇඳුම් ද ගුණදාස මහතා ලවා ම මස්සවා ගතිමි. සපත්තු, මේස් පැළඳීමට තවත් කාලයක් ගත විය. ඒ ගැන ද පසුව දැන ගැනීමට පුළුවන. මිශ්‍ර පාසලක් වූ මෙහි වැඩිහිටි බාලිකාවන් ඇන්දේ ළමා සාරියයි. ළමා සාරිය ඇඳි ගැහැණු ළමයි කරවටා මන්තයක් ද පැළඳ උන්හ. බියට්‍රිස් සිල්වා නම් ගවුම් ඇන්ද කෙනෙක් ද සිටියාය.

කලිසම මැහීමට බාරදීමෙන් පසුව අප්පච්චීත්, මාත් අසල පිහිටි ගණදෙවි කෝවිල පන්සලට ගියෙමු. ඒ පන්සලේ ලොකු හාමුදුරුවෝ *තලගුණේ ධම්මපාල* නම් වූ සේක. උන් වහන්සේගේ ගෝලයන් දෙදෙනෙක් වූහ. ඒ *වටපාන සෝමානන්ද* සහ *තලගුණේ සුමනාතිස්ස* යන හිමිවරුන් දෙදෙනාය. වටපාන සෝමානන්ද ස්වාමීන් වහන්සේ අප්පච්චීගේ ඥාති සොහොයුරෙකි. ඒ නිසා මගේ බාප්පා කෙනෙකි. ඒ ඥාති ස්වාමීන් වහන්සේ පළමු වරට දැක්කේ මේ ගමනේ දී ය. ඉතා ම ගුණ යහපත් කෙනෙකු වූ මේ හාමුදුරුවෝ, අප්පච්චීටත් මටත් කැවිලි හා තේ පැනින් සංග්‍රහ කළහ. අප්පච්චී පන්සල්වලින් කන බොන කෙනෙක් නොවූවත් මට මේ සංග්‍රහය මහත් ආස්වාදජනක දෙයක් විය. පාසැලේ දී/නේවාසිකාගාරයේ දී යම් අවශ්‍යතාවක් වුවහොත් පන්සලට විත් උන්වහන්සේට දන්වන ලෙස සෝමානන්ද ස්වාමීන් වහන්සේ අප්පච්චී ඉදිරියේ මට කීවේය. මෙය *"ඉබ්බා දියේ දැමීමක්"* වැනි විය.

නේවාසිකාගාරයේ නතර වූ දිනයේ මාගේ ඇඳුම් ආදිය බහා තිබූ ට්‍රන්ක පෙට්ටිය ද රැගෙන එහි ගියෙමි. අප්පච්චී මුදල් ගෙවා තිබුණ නිසා මට ඇඳක් වෙන්කර තිබිණි. ගිනි සපු ලීවලින් නිමකර තිබූ එම ඇඳේ තට්ටුවට ගිනිසපු ලෑලි ගසා තිබිණි. ඇඳේ අතුරා ගැනීමට පැදුරක් ගෙන ගොස් තිබිණි. කොට්ටයක් ගෙදරින් ගෙනාවා වන්නට ඇත. දියනෑමට හා මුහුණ සෝදා ගැනීමට බාල්දියක් ගැනීමට සිදුවිය. යුද්ධය අවසන් වී නොතිබුණ නිසා බාල්දි සෑදීමට යකඩ තහඩු නොවූයෙන්, එහෙන් මෙහෙන් එකතු කර ගත් විස්කෝතු පෙට්ටි වැනි බෙලෙක් තහඩුවලින් බාල්දි සාදා තිබිණි. මේ බාල්දිවල අඩිය බර නැති නිසා, ළිඳට දැමූ විට වතුර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතු විය. කොහුලනු කෑල්ලක් ගැට ගසා ළිඳෙන් වතුර ඇද ගැනීමට පුරුදු වූයේ අමාරුවෙනි. ගමේ දී දිය නෑමාදිය කළේ පිහිලිවලින් නිසා ළිං භාවිතාවක් නොවීය.

නේවාසිකයන්ට නොමිලේ ආහාරපාන සපයන ලදී. උදේට තිරිඟු පිටි රොටියක්, දවල්ට බත් වේලක් හා රාත්‍රී ආහාරයට රොටී හෝ පාන් ලැබිණි. නේවාසික බාලක බාලිකාවන් ආහාර වේල ගැනීමට කාන්තා නේවාසිකාගාරයේ සාලයට රැස්වූහ. එහි බිත්ති අයිනේ එළා තිබූ පැදුරු මත එරමිණිය ගොතා ගෙන වාඩි වී, පිඟාන ඉදිරියෙන් තබා ගෙන උන්හ. ටිකක් වැඩිහිටි ගැහැණු ළමුන් දෙදෙනෙක් *(බියට්‍රිස් සිල්වා හා සුමනා වීජේසිංහ)* කෑම බෙදූහ. ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරය භාර ව සිටි *කන්‍රිආරච්චි ගුරුතුමිය* මේ කටයුතු සුපරීක්ෂා කළාය. ප්‍රධානාචාර්යතුමා ද විටින් විට මේ ගැන සොයා බැලුවේය.

අප මධ්‍යම පාසලට ඇතුළත් වූ අවුරුද්දේ (1945) දෙවෙනි ලෝක මහා යුද්ධය අවසන් වී තිබුණේ නැති නිසා, ආහාරපාන හිඟයක් පැවතිණි. ඒ නිසා, සලාකයට දෙන ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම පිණිස අපගේ සලාක පොත් පාසලට භාර දී තිබිණි. හාල්, තිරිඟු පිටි, සීනි ආදිය පාලන මිලකට සලාක පොත් හිමියන්ට ලැබිණි. නැත්නම් වැඩි මිලකට ගත යුතු විය. ඒ සඳහා එතරම් මුදලක් රජයෙන් වෙන්කර තිබුණේ නැත. එවකට ශිෂ්‍යාචලාභියෙකුට මාසයකට රජයෙන් වෙන්කර තිබුණේ රුපියල් දොළහකි. බඩගින්නේ අරුමය මට දැනුණේ නේවාසිකයෙකු වීමෙන් පසුවයි. මේ නිසා, ටික දිනක් නේවාසිකාගාරයේ නැවතී සිට පසුව පස්වරු තුනට පාසල නිමවීමත් සමඟ *ගණදෙවි කෝවිලේ,* පන්සලට "පැන ගියෙමි". රාත්‍රියට නේවාසිකාගාරයට පැමිණියේ නැත. පසුදා උදේ පාසල පටන් ගන්න වේලාවට පන්තියට පැමිණියෙමි. නේවාසිකාගාරයෙන් "පැන යාම" විනය විරෝධී වූවත් එහි පැවති පීඩනයෙන් මිදීමට මා දුටු එක ම විකල්පය සවසට පන්සලට යෑමයි.

ගණදෙවි කෝවිල පන්සල අවට පරිසරය

පන්සලට ගිය විට අවට ගෙවල් කීපයකට යෑමට නිදහස ලැබිණි. **ගමගෙදර වෙද මහත්තයාගේ** නිවසෙහි අපේ ම ගෙදර බඳු පරිසරයක් විය. වෙද මහතාගේ බිරිඳ අපේ ම අම්මා හා සමාන වූවාය. අක්කලා දෙදෙනෙක් ද එහි වූහ. සුදු අක්කා මා කෙරෙහි මහත් දයාවක් පෙන්වූවාය. මගේ ම පන්තියේ ඉගෙනගත් සහෝදරියන් දෙදෙනෙක් වූහ. කෙනෙක් වෙද මහතාගේ දියණිය *හීං මැනිකාය*. අපේ ගමට කිට්ටුව *තලගුණේ වීරසේකර* නම් වූ ගැහැණු ළමයෙකු වූවාය. ඇය ගණදෙවි කෝවිලේ පන්සලේ සුමනතිස්ස හාමුදුරුවන්ගේ ඥාතිවරියෙකි. ගණදෙවි කෝවිලේ දේවාලේ කපු මහත්තයාගේ නිවස ද ඒ අසල විය. එහි මගේ වයසේ පිරිමි ළමයෙක් සිටියේය. ඔහුගේ නම ද *වීරසේකරයි*. අක්කලා දෙදෙනෙක් ද වූහ. ඒ හැම දෙනා ම මට ආදරයෙන් සැලකුහ. එයට හේතුව, මා *වටපාන සෝමානන්ද හාමුදුරුවන්ගේ* නෑයෙක් වූ නිසාත් එවකට මා හුරුබුහුටි කොලුවෙක් වීම ද එයට හේතු වූවා විය හැකිය. අසල ගෙදරක සනීපාරක්ෂක පරීක්ෂකවරයෙක් පදිංචි ව සිටි අතර, ඔහුගේ තරුණ බිරිඳ දිවා කාලය ගත කළේ හුදකලාවයි. ඒ නිවසේ ග්‍රැමෆෝන් යන්ත්‍රයක් තිබුණ නිසා සිංදු ඇසීමට එහි යෑමට පුරුදු වූයෙමි. ඒ සිංදු දමිළ භාෂාවෙන් විය. ඒ අක්කා මට තමන්ගේ බාල සොහොයුරෙකු සේ සැලකුවාය. අප දෙදෙනා අතර භාෂා ප්‍රශ්නයක් තිබූ නිසා, කථාබහ ඉතා ම අල්ප විය. මගේ අම්මාගෙන් හා අක්කලාගෙන් වෙන් වී සිටි මට, මේ නොයෙක් දෙනාගේ ඇසුර, දයාව, කරුණාව මහත් අස්වැසිල්ලක් විය. මේ දිනවල දී ම මට උගුරේ "සෙම්ගෙඩි" රෝගය සෑදුණ නිසා, දින ගණනක් ම ගත කළේ වෙදමහතාගේ නිවසේය. එම රෝගයට ප්‍රතිකාර කළේ ද වෙදමහතාය. සාත්තු සප්පායම් කළේ එම අම්මා හා අක්කලාය. සෙම්ගෙඩි සුව වූවාට පසුව මා නාවන ලද්දේ ද සුදු අක්කා විසිනි.

නේවාසිකාගාරයේ නතර නොවී දිනපතා බැහැර යෑම ගැන සොයා බැලූ නේවාසිකාගාර භාර ගුරුතුමා, වරක් මා නේවාසිකාගාරයේ නතර කර ගත්තේය. ක්‍රමයෙන් නේවාසිකාගාරයට පුරුදු වීමෙන් පසුව දිනපතා පන්සලට යෑම නතර කළෙමි. අතරින් පතර සති අන්තයේ පැය කීපයකට පමණක් මැණික්හින්න කඩපලට යන්නට අවසර ලබා ගෙන පන්සලට ද ගියෙමි. එවැනි දවස්වලට දවාලට හොඳ ආහාර (දානේ) වේලක් ලැබිණි. දිනපතා පන්සලට ගිය දිනවල රෑට කෑමට ලැබුණේ පාන් වැනි දෙයකි. ඒ නිසා, නේවාසිකාගාරයේ නැවතුණාට වෙනසක් නොවීය. පන්සල් ගමන නතර වූ පසු ඒ අසල ගෙවල්වලට යෑම ද ඒ අයගේ ඇසුර ද නතර විය. ආහාර අහේනියට යොදා ගත් අනික් පිළියම වූයේ බඩගිනි වන විට පාසල අසල ඇති කඩයකින් පාන්, බනිස් වැනි යමක් සමඟ තේ බීමට පුරුදු වීමයි. මේ සඳහා දිනපතා ම අතේ මුදල් ඉතිරි නොවන නිසා, සති අන්තයට ගෙදර

ගොස් එන විට ගෙන එන මුදලක් පළමුවෙන් කඩේ මුදලාලිට දී ඒ මුදල ගෙවී යන සේ ආහාරපාන ගත්තෙමි. මුදල් අවසන් වී යන විට මුදලාලිගේ හොඳහිත ගොඩනැඟේ. ඉන්පසුව ණයට තේ බීමට අපහසු නොවේ. මසකට වරක් පමණ සති අන්තයට ගෙදර ගොස් පැමිණි වහා ම ණය මුදල් ගෙවීම නිසා, හොඳ ගනුදෙනුකාරයෙකු වශයෙන් තවදුරටත් අවශ්‍ය ණය ලබා ගැනීමට කිසිම අපහසුවක් නොවීය. දැන් නේවාසිකාගාරයේ *"සාගතය"* නිවා ගැනීමට ක්‍රමයක් ඇති නිසා, පන්සලට යෑම ද අවශ්‍ය නොවීය. මා පන්සලට ගිය දිනවල හෝ ඉන් පසුව ද, වටපාන සෝමානන්ද හාමුදුරුවන්ගෙන් කිසි විටක මුදලක් ඉල්ලුවේ නැත. එයට හේතුව උන්වහන්සේ ළඟ මුදල් නැතැ'යි යන අදහසක් මා තුළ හටගැනී තිබුණ නිසාය. මුදල් අවශ්‍යතාවක් ඇති වූ විට මා ගියේ *වත්තේගම ධර්මදීප පිරිවෙනටය.*

ද්විතීය අධ්‍යාපන සමයේ අපගේ ගුරුවරු

වලල මධ්‍යම පාසලට මා ප්‍රවේශය ලත් 1945 වසරේ එහි ප්‍රථම ප්‍රධානාචාර්යවරයා වූයේ **තෙන්නකෝන් විමලානන්ද** මහතා බව මෙහි මුලින් සඳහන් කළෙමි. විවාහකයෙකු වූ එතුමා පදිංචි ව සිටියේ නාපාන පිහිටි තම නිවසේය. පාසලට සැතපුම් දෙකක් පමණ වූ දුර ප්‍රමාණය ආවේ ගියේ පයින් ම ය. සමහර දවස්වල රාත්‍රීය ගත කළේ පාසල් ගුරු නිවාසයේය. එවැනි දිනවල පාන්දර හතරට පමණ අවදිවන එතුමා, පිරිමි නේවාසිකාගාරයේ සිසුන් අවදි කර සැතපුම් දෙකක් පමණ මහපාරේ දිවීමට සැලැස්සුවේය. නේවාසිකාගාරයෙන් දිවීම ආරම්භ කොට, මහපාරට පිවිස අටේ කණුව දක්වා ගොස්, ආපසු දිව ආ යුතු විය. එවකට පාසල් වත්තේ කොකෝවා වවා තිබුණ නිසා, පාන්දර කළුවරේ එහි සැඟවී සිට අනෙක් සිසුන් ආපසු දිව එන විට ඒ අයට එකතු වී, නේවාසිකාගාරයට දිව ඒමට මම "උපක්‍රමශීලී" වීමි.

මගේ මාමා කෙනෙකු වූ *වත්තේගම ධර්මදීප පරිවේනාධිපති හාල්යාලේ සුමනනිස්ස ස්වාමීන් වහන්සේ, වටපාන සෝමානන්ද හිමියන්* සමඟ දිනක් පාසලට වැඩම කර *විමලානන්ද මහතාට* මා ගැන සඳහන් කර තිබිණි. ඉන්පසුව විටින් විට එතුමා සවස පාසල අවසන් වී ගෙදර යන විට මා ද එතුමාගේ නිවසට කැඳවා ගෙන ගියේය. "ලොකු සර්" ගේ නෑදෑ ගැහැණු පිරිමි සිසුන් කීප දෙනෙකු ම එතුමාගේ නිවසේ නතර කර ගෙන උන්නේය. මෙම සිසුන් හැම දෙනා ම රාත්‍රී ආහාරයට පෙර ලොකු මේසයක් වටා වාඩි වී පාඩම් කළහ. මට ද ඔවුන් අනුගමනය කිරීමට සිදුවිය. පසුදා හිමිදිරි පාන්දර මා ද අවදි කරගෙන, අසල වෙලේ පිහිටි ළිඳකට ගොස් දියනෑමෙන් පසුව මට ද ළිඳෙන් වතුර ඇදගෙන නාන්නට නියම කළේය. සීතල හිමිදිරියේ

දිය නැමට කැමැත්තක් නොතිබුණත්, "ලොකු සර්ට" තිබූ භය නිසා එසේ කළෙමි. අපේ පාසල අසල ලිංවල වතුර හිඟයක් පැවැති නිසා, මෙසේ බලකිරීම නිසාවත් නාන්නට ලැබීම වෙස්වලා ගත් ආශීර්වාදයක් විය.

විමලානන්ද මහතාගේ සමයේ දී පාසලේ පෙරවරු රැස්වීම ආරම්භයේ දී ගායනා කළ ගීතයක් විය. එහි පදමාලාව ආරම්භ වූයේ "ජන සැම මන.... යනාදී වශයෙනි. එය **රවීන්ද්‍රනාත් තාගෝර්** පඬිවරයා රචනා කර තිබූ "ජන ගන මන අධිනායක ජයහේ භාරත භාග්‍ය විදාතා... යන ගීයේ තාලය අනුව රචනා කර තිබිණි. තාගෝර් පඬිවරයාගේ ගීය පසු කාලයේ දී භාරතයේ ජාතික ගීය විය. අප "පාසල්" ගීතයෙන් කුඩා අපගේ සිත් තුළ ධාරණය කිරීමට ප්‍රයත්න දැරුවේ බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, මහම්මත් ආගම්වලට අයත් අප සැම සමගියෙන් ජීවත් විය යුතු බවය. ලංකාව මේ යුගයේ තවමත් යටත් විජිතයක් ව පැවති නිසා ජාතික ගීයක් සම්මත කර ගෙන තිබුණේ නැත.

මා වලල මධ්‍යම පාසලට ඇතුළු වූ 1945 වසරේ ගුරු මණ්ඩලයේ සාමාජිකයන් අට දෙනෙක් වූහ. *ප්‍රධානාචාර්ය තෙන්නකෝන් විමලානන්ද, ජී.අයි පෙරේරා, එම්.සී කබ්‍රාල්, එච්.බී. පෙතියාගොඩ, එස්. මාලගම්මන, ප්‍රනාන්දු* යන මහත්වරු සහ *ජී.එම් තෙන්නකෝන්, කත්‍රිරිආරච්චි* යන මහත්මාවන්ය. ප්‍රාථමික පාසලේ අප ගුරුවරු ඇමතුවේ "මහත්තයා," "නෝන මහත්තයා" යනුවෙන් වුවත් දැන් ඒ අය "සර්" හා ''මැඩම්" වූහ. පෙතියාගොඩ සර් අපට රෙදි විවීම ද මාලගම්මන සර් නැටුම් ද ඉගැන්වූහ. කබ්‍රාල්, පෙරේරා, තෙන්නකෝන්, කත්‍රිආරච්චි යන ගුරුවරු පුහුණුව ලත් අය වී යයි සිතමි. සිංහල භාෂාව හා සාහිත්‍යය යන විෂයයන් අපට ඉගැන්වූයේ තෙන්නකෝන් මැඩම්ය. මා අයත් වූ 6-බී පන්තිය භාර ව සිටියේ ද එතුමියයි. දැන් අපට විවිධ විෂයයන් ඉගැන්වීමට වෙන වෙන ම ගුරුවරු වූහ. ලොකු සර් ඉතිහාසය ඉගැන්නුවේය. සිංහල භාෂාවට **උම්මග්ග ජාතකය** සහ **දහම් සොඬ කව** පාඨ ග්‍රන්ථ විය. ඉතිහාස පාඨ ග්‍රන්ථය වූයේ ජී.සී. මැන්දිස් මහතාගේ ඉතිහාසය පොතක්ය. සිංහල හැර අන් හැම විෂයයක් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන ලදී. මේ නිසා, හයේ පන්තියේ දී අප කරකවා ගැසූ පරවියන් මෙන් වූහ. ඉගෙන ගත් යමක් ගැඹුරට කිදා බැස්සේ නැත. ඒ නිසා, ඒ ඒ විෂයයන් ඉගැන්වූයේ කුමන ගුරුවරුන් ද, ඒ මොනවා ද, යන්න මතකයට එන්නේ නැත. මාලගම්මන සර් නැටුම් *උගන්වද්දී නයියඩි වන්නම, ගජගා වන්නම, තුරඟා වන්නම, හනුමා වන්නම* යනාදී දහඅට වන්නම් තාලයට ගයමින්, අදාළ නැටුම් පුහුණු කළේය. අපගේ සෞන්දර්යාත්මක කුසලතා අවදි කිරීමට මේ අභ්‍යාසය උපකාර වී යයි සිතමි. ප්‍රනාන්දු සර් මැහුම් ගෙතුම් ගුරුවරයා විය. එතුමා "තැටින් සර්" යනුවෙන් ද හැඳින්වූයෙමු. මෙම විෂය ඉගැන්වූයේ ශිෂ්‍යාවන්ට පමණය.

විමලානන්ද මහතා ලංකා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරක් භාර ගැනීම සඳහා 1946 දී පමණ අස්වී ගියේය. පසු කාලයේ දී එතුමා කොළඹ දී නොයෙක් අවස්ථාවල මට මුණ ගැසුණේය. ඒ බොහෝ අවස්ථාවල උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමේ වැදගත්කම මට කියා දුන්නේය. ඒ උපදෙස් මගේ විද්‍යාදීපය දල්වා තැබීමට උපකාර වී යයි සිතමි.

විමලානන්ද මහතාට පසුව **ඊ.සෙන්ට්.සී. රෝදේ** නමැති ලංසි මහතා අපගේ ප්‍රධානාචාර්ය තනතුරට පත්ව පැමිණියේය. එතුමා ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති (එම්.ඒ) උපාධිධාරියෙකු විය. එතුමාගේ විෂය වූයේ ඉංග්‍රීසි භාෂාවයි. මේ වකවානුවේ දී, පී. අයි. පෙරේරා සහ කබ්‍රාල් යන ගුරුවරු මාරු වී ගියහ. පෙරේරා නැමති මැඩම් කෙනෙක් මාරු වී පැමිණියාය. එතුමිය සැරපරුෂ ගුරුවරියක් වූ බව මතකය. පී.ඒ පෙරේරා නැමති ගුරුවරයෙක් අලුතෙන් පත් වී ආවේය. එතුමාගේ ගම තලංගමය. එතුමාගේ පියා දේශීය වෛද්‍යවරයෙකි. තලංගම නිවස "සිරිවෙදපාය" නම් වී යයි පසුව දැනගතිමි. පෙරේරා සර් අප නෝවාසිකාගාරය භාර ව සිටියේය. එක පන්තියක දී එතුමා විසින් අපට 'ග්‍රාමීය විද්‍යාව' නම් විෂයය උගන්වන ලදී. එතුමා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ උපාධි සුදුසුකම් ලබා ගැනීමට ඉගෙනීම කරගෙන ගියේය. පසුකාලයේ දී ඉංග්‍රීසි ගුරු පුහුණුව සඳහා මහරගම ගුරු විද්‍යාලයට ඇතුළු වී තිබේ. රැකියාව සඳහා මා කොළඹ ගිය විට නේවාසිකාගාරයේ සිටි *ගිඩිඩව අබේරත්න* සොහොයුරා සමග (ඔහු ඒ වන විට බන්ධනාගාර නියාමකවරයෙකු ලෙස වැලිකඩ සේවය කළේය) පෙරේරා සර්ගේ ගෙදර ගිය නමුත්, දැන් ඒ ඉසව්ව කොතනක දැ'යි මතක නැත.

රෝදේ සර් අප පාසලේ ප්‍රධානාචාර්ය තනතුරට පත් ව ආවේ මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයේ සිට යැ'යි දැනගන්නට ලැබුණි. එතුමා පෙනුමෙන් ද ක්‍රියාවෙන් ද උපශාන්ත පියෙකු සේ පෙනිණි. තම පවුල සමඟ ගල්කන්දේ වලව්වේ පදිංචි ව සිට පාසලට දිනපතා ආවේ ගියේ පයින් ම ය. ගල්කන්දේ වලව්ව විශාල ගොඩනැඟිල්ලක් වූයෙන්, මේ අවධියේ දී ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරය තිබුණේ ද එම ගොඩනැඟිල්ලේය. පී.ඒ පෙරේරා සර්ගේ පණිවිඩ රැගෙන වරක් දෙකක් ගල්කන්දේ වලව්වට ගිය බව මතකය. වලල පන්සලේ හාමුදුරුවන් ලවා සඳුදා දිනවලට පාසලේ සියලු දෙනාට ම පන්සිල් දීම ආරම්භ කළේ රෝදේ මහතා විසිනි. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රීඩාවන්ට පුහුණු කිරීමට ද උනන්දු කරවන ලදී. මේ අවධියේ දී *බෝලින්* නැමැති ගුරුතුමිය අප නිවාසාන්තර ක්‍රීඩා උත්සවවලට සහභාගී කරවීමට පුහුණු කර, වාර්ෂික ව මහනුවර බෝගම්බර පිට්ටනියේ පැවැත්වුණු ක්‍රීඩා තරගවලට හා ශාරීරික අභ්‍යාස සංදර්ශනවලට එක්කර ගෙන ගියාය. පාසලේ වොලිබෝල් කණ්ඩායමට දිනපතා උදේ දහයට ලූණු සම්බලයක් සමග පාන් ආහාරයට

දීම ආරම්භ කළේ ඒ සඳහා අතිරේක ශරීර ශක්තියක් ලබා ගැනීමටය. දිවා ආහාරය ප්‍රමාණවත් නොවූ සිසුන්ට බත් වේල සමඟ පාන් කාලක් ලබා දීමට ද නියම කළේය. මලල ක්‍රීඩාවලට ශිෂ්‍ය ශිෂ්‍යාවන් උනන්දු කරවන ලදී. ශිෂ්‍යාවන්ට නෙට් බෝල් ක්‍රීඩාව පුහුණු කරවන ලදී. ක්‍රීඩා පිට්ටනිය ඉදිකර අවසන් වූවාට පසුව පාපන්දු ක්‍රීඩාව අරඹන ලදී. ක්‍රිකට් ක්‍රීඩාවට අවශ්‍ය උපකරණ ගෙනැවිත් තිබුණ නමුත්, පුහුණු කරුවෙකු නොසිටි නිසා, එයට ප්‍රවේශ වීමට ඉඩක් නොලැබුණි.

පාසලේ නිවාසන්තර ක්‍රීඩා උත්සවයක් පළමුවරට පැවැත්වූයේ ද රෝදේ සර්ගේ යුගයේ දී යයි සිතමි. *රත්නායක, කන්නන්ගර හා සැන්ඩිමන්* නමින් නිවාස තුනක් අතර පාසලේ සියලු ම සිසුන් බෙදන ලදී. කන්නන්ගර නිවාසයේ පාට වූයේ තද රතුය (මෙරුන්). රත්නායක නිවාසය නිල්පාට හා සැන්ඩිමන් නිවාසය කොළ පාට භාවිතා කළේය. පසු කාලයේ දී සැන්ඩිමන් නිවාසය *නුගවෙල නිවාසය* බවට පරිවර්තනය කරන ලදී. මා අයත් වූයේ සැන්ඩිමන් නිවාසයටයි. මලල ක්‍රීඩා තරගවල දී වයස දහසයෙන් පහළ දුරදිවීමේ පළමුවන ස්ථානය මට ලැබුණි. ඒ යුගයේ දුර දිවීමට තිබුණ ඉසව් යාර සීය හා දෙසිය විස්සය. මේ ඉසව් දෙකේ වයස දහනවයෙන් පහළ පළමුවැනියා වූයේ අටේ කණුවේ අප්පුහාමියි. ඔහු ලංකා යුධ හමුදාව ආරම්භ වූ 1949 වසරේ දී එහි පළමුවන බල ඇණියට බැඳී සේවය කළේය. දිනක් ඔහු නිල ඇඳුමෙන් සැරසී පාසලට පැමිණ, එවකට අපේ පන්ති භාර ව සිටි මේජර් හෙන්රි ද සිල්වා ගුරුතුමාට ආචාර කොට ගෞරවය දක්වා ගිය බව මතකය.

කොළඹ අධ්‍යාපන ගමන

අප සිසුන් පළමුවරට අධ්‍යාපන චාරිකාවක් ගියේ ද රෝදේ සර්ගේ කාලයේ දී ය. ඒ කොළඹ ගමනයි. මේ සඳහා සූදානම් වූ මම, අප්පුහාමිට කියා මහනුවරින් සපත්තු කුට්ටමක් ගෙන්වා ගතිමි. එය මහනුවර *ෆැන්සි හවුස්* නම් සාප්පුවෙන් රුපියල් දහයකට මිල දී ගෙන තිබුණ දුඹුරු පාට සපත්තු ජෝඩුවකි. සුදු මේස් ජෝඩුවක් ද ගෙනත් තිබිණි. කොළඹ යන දවසේ හිමිදිරි පාන්දර අවදිව, සපත්තු ජෝඩුව ද දමාගෙන, පාසල් මිදුලේ එහා මෙහා ඇවිදිමින් සපත්තුවලට හුරුවීමි. පී.එස්. බස් සමාගමේ බස් රථයකින් කොළඹ ගියෙමු. මහනුවරින් එහා ගමනක් ගිය පළමු වතාව මෙය නිසා, මේ ගමන තවත් නව ලොවකට ප්‍රවේශවීමක් විය. *කඳුගන්නාවේ දී ඩෝසන් කුළුණ* බලා පල්ලම පසුකර යන බස්රථය වේගයෙන් ගමන් කරන බවක් අපට දැනිණි. දවල් වනවිට අප ගියේ *දෙහිවල සත්තුවත්තටයි.* එයින් පසුව වැල්ලවත්තේ වත්තකට ගොස් දිවා ආහාරය ගෙන අවසන් වී, ලේක්හවුස්

පත්තර කන්තෝරුවට ගියෙමු. ලයිනෝ ටයිප් යන්ත්‍රය ක්‍රියාකිරීම ආදී පත්තර මුද්‍රණය පිළිබඳ ශිල්පීය තොරතුරු රැසක් දැක බලා ගෙන, ඉන්පසුව ගියේ රාජ්‍ය මන්ත්‍රණ සභා ගොඩනැඟිල්ලටයි. එහි ඉදිරිපස පඩි පෙළේ දී අධ්‍යාපන ඇමති *කන්නන්ගර මැතිතුමා සමඟ ජායාරූපයකට පෙනී සිට* ආපසු ගමනට පිටත් වූයෙමු. අපේ ගමනේ බොහෝ දේ සංවිධානය කළේ බෝලිං මැඩම් යයි සිතමි. බොහෝ දවසක් යනතුරු එම අත්දැකීම් මගේ මනසේ සිනමා චිත්‍රයක් ලෙස හොල්මන් කරමින් තිබිණි.

ගුරු මාරුවීම් ආදිය

පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව හා පන්ති සංඛ්‍යාව වැඩි වන විට, අලුතෙන් තාවකාලික ගොඩනැඟිලි ඉදිකර අපගේ පන්ති ඒවාට ගෙන ගියහ. 1946 දී 7 - බී පන්තිය ද, 1947 දී 8වෙනි පන්තිය ද, එසේ ගොඩනැඟිලි දෙකකට ගෙන යන ලදී. 7- බී පන්තියේ දී අපේ පන්තිය භාර ගුරුවරයා වූයේ *ඩී.සී. මායාදුන්නේ* ගුරුතුමාය. එතුමා ගුරු නිවාසයේ කාමරයක නවාතැන් ගෙන සිටි අතර, සමහර සති අන්තවල දී අලවතුගොඩ එතුමාගේ නිවහනට ගියේය. අපට අංක ගණිතය ඉගැන්වූයේ මායාදුන්නේ සර්ය. මේ වන විට වඩු කර්මාන්තය සඳහා ද වෙන ම ගොඩනැඟිල්ලක් ඉදිකර තිබිණි. ලියනගේ සර් වඩුකර්මාන්ත ගුරුවරයා විය. රෙදි විවිම ඉගැන්වීමට රූපසිංහ නමින් තවත් තරුණ ගුරුවරියක් පැමිණ සිටියාය. නැටුම් ගුරු *මාලගම්මන සර්* මාරු වී ගොස් ඒ වෙනුවට *සුනන්දරසේන සර්* පැමිණ සිටියේය. එතුමා පුහුණු කළ ශිෂ්‍යාවන් කණ්ඩායමක් කොළඹ ගොස් ලංකා ගුවන් විදුලි සේවයේ ළමා පිටියට ගායනාවක් ඉදිරිපත් කළ බව මතකය.

ක්‍රමයෙන් ගුරු මාරුවීම් හා එකතුවීම් නිසා, ජයසේකර, ගුණවර්ධන, රංහොටී, කුමාරසිංහ, මන්තිලක, සෙනෙවිරත්න, හේරත්, හෙන්රි ද සිල්වා, කුලසේකර යන පුහුණු ගුරුවරුන් ද, එච්.ආර්.පී රූපසිංහ නම් උපාධිධාරී ගුරුතුමා ද, විජේරත්න නැමැති නුපුහුණු ගුරුවරයා ද ආචාර්ය මණ්ඩලයට එක්වූහ. ඩී. බෝලින් නම් ගුරුතුමිය රෝදේ මහතාගේ කාලයේ දී අප පාසලේ ගුරුවරියක වූවාය. මඩකලපුවේ කෙනෙකු වූ එම්.සී. අහමඩ් ගුරුතුමා, පී.ඒ පෙරේරා මහතාට පසුව අප නෝවාසිකාගරය භාර ව සිටියේය. එතුමාට පසුව බණ්ඩාරනායක නම් කුරුණෑගල ප්‍රදේශයේ ගුරුවරයෙකු නෝවාසිකාගරය භාර ව සිටි අතර, එතුමා ශිෂ්‍ය භට කණ්ඩායම ආරම්භ කර එහි අණදෙන නිලධාරියා ව සිටියේය.

ජයසේකර ගුරුතුමා අපට ඉතිහාසය පාඩමක් කියා දුන්නේ අටවැනි පන්තියේ දී ය. එතුමා ඉතා දක්ෂ ගුරුවරයෙකු වී යයි සිතමි. දිනක් කළුලෑල්ලේ මුගලන් කුමාරයාගේ හමුදාව ලෙස ගිනිකුරු මිනිසුන් ඇඳ,

සීගිරිය වටකරනවා පැහැදිලි කර කියා දුන් පාඩම අදටත් මතකයේ සටහන් වී තිබේ. එතුමා මින් පසුව ගුරු විද්‍යාලයක කථිකාචාර්ය තනතුරක් ලබා මාරු වී ගියේය. *ගුණවර්ධන ගුරුතුමා යටිරාවණ පාසලේ* සිට මාරු වී පැමිණියේය. එතුමා අපට සිංහල විෂය ඉගැන්වීය. ඒ වකවානුවේ *කථා තරංගනී* නම් පොතක "වේතාලයා" නමැති චරිතයක් තිබිණි. ඒ පොත සිංහල විෂය සඳහා අටවෙනි පන්තියේ දී අපේ පාඨ ග්‍රන්ථයක් විය. අපේ පන්තියේ සමහර ළමුන්, ගුණවර්ධන සර් පන්තියට එන විට, "වේතාලයා" එන බව කීවේය. ගුණවර්ධන සර් ඒ ගැන දැන සිටියේ නැතැ'යි සිතමි. ගුරුවරුන් මෙවැනි විහිළුතහළුවලට භාජනය කිරීම ගැන මා කැමැත්තක් දැක්වූයේ නැත. ගුරුවරු හැමදෙනාට ම ගරු කළ යුතු බවට තදින් කා වැදුණු අදහසක් මා තුළ තිබුණ නිසාය.

පසුකාලයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය දක්වා ම සිංහල විෂය අපට ඉගැන්වූයේ *ජී.ජී.මන්තිලක* මහතාය. ඒ සඳහා *බැද්දේගම* නමැති පොත භාවිතා කරන ලදී. එතුමාගේ ගම කෙන්ගල්ලයි. අපේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක ජයසිංහ සොහොයුරාගේ ඥාතියෙකු වූ *මන්තිලක මහතා,* 1966 දී පමණ වලල මධ්‍ය විද්‍යාලයේ විදුහල්පතිවරයා ද විය. මුල දී එතුමා පාසල් ආවේ පාපැදියකිනි. පි.ඒ පෙරේරා ගුරුතුමා සමඟ මා දිනක් සති අන්තයේ කෙන්ගල්ලේ මංතිලක මහතාගේ නිවසට ගිය බව මතකය. පාසලේ නේවාසිකාගාරයේ සිට අප එහි ගියේ ආවේ පයින්මය. මුළුගමන සැතපුම් අටක් පමණ වන්නට ඇත. මධ්‍යම පළාත් සභා මන්ත්‍රිනී *චිත්‍රා මන්තිලක මහන්මිය* එතුමාගේ දියණියයි.

රංහොටී සර් මහනුවර ත්‍රිකුණාමළ වීදියේ (වර්තමාන ඩී.එස් සේනානායක වීදිය) පල්ලිය අසල නිවසක පදිංචි ව සිට දිනපතා බස් රථයෙන් පාසලට පැමිණියේය. පසුකාලයේ දී එතුමා පාසල ඉදිරිපිට හේරත් මහතාගේ නිවසක් කුළියට ගෙන එහි පදිංචියට පැමිණියේය. එතුමා ප්‍රධානාචාර්ය තනතුරේ වැඩ බැලුවේ ද එසේ පාසල අසල පදිංචියට පැමිණි පසුවයි. රංහොටී ගුරුතුමා පන්ති කිහිපයක දී ම අපට ඉංග්‍රීසි විෂය උගන්වා ඇත. වරක් වාර අවසානයේ විවිධ ප්‍රසංගයකට අප කිප දෙනෙකුට කෙටි නාට්‍යයක් පුහුණු කළ බව මතකය. කලිසම් කබා ඇඳ ටයි පටියක් ද ඇඳි එතුමා, හම් හිස්වැසුමක් ද පැළඳ පාසලට පැමිණියේය. යුරෝපීය ඇඳුම ඒ යුගයේ බොහෝ ගුරුවරුන්ගේ පාසල් ඇඳුම විය.

මායාදුන්නේ සර්ට පසුව කුමාරසිංහ සර් අපගේ ගණිත ගුරුවරයා විය. ගණිතය සඳහා පාඨ ග්‍රන්ථ වූයේ **හෝල් සහ ස්ටීවන්සන්** ගේ පොත්ය. වීජගණිතය හා රේඛා ගණිතය සඳහා ද ඒ අයගේ පොත් පාඨ ග්‍රන්ථ විය. කුමාරසිංහ සර් පාසලට ඇන්දේ එවකට භාවිතාවට පැමිණෙමින් තිබුණු *"බුෂ් කෝට්"* නම් කබායක් හා කලිසමකි. මේ ඇඳුම ඇන්ද එක ම ගුරුවරයා

කුමාරසිංහ සර් යයි සිතමි. එතුමා වලල අටේ කණුවේ ජයසේකර මුදලාලිගේ විශාල බංගලාවේ නේවාසික ව සිටියේය. හේරත් සර් ද එහි නේවාසිකයෙකු විය. හේරත් සර් අපට ප්‍රජාචාරය ඉගැන්වීය යයි සිතමි. *එස්.එෆ්. ද සිල්වා මහතාගේ* පොතක් ඒ සඳහා භාවිතා කළෙමු. හේරත් සර් සමහර විට පාසලේ දී යම් යම් පෙරළිකාර හැසිරීම් ප්‍රදර්ශනය කළේය. ඒවා සමනය කළේ කුමාරසිංහ සර් විසිනි. හේරත් සර් යම් ආවේග ප්‍රදර්ශනය කළේ අයුක්තියට එරෙහි වන්නෙක් ලෙසය. එනමුත්, සමහර දෙනෙකුගේ මතය වූයේ, එතුමාට මානසික ආබාධයක් ද තිබුණු බවය. කෙසේ වුව ද, එතුමා ද දක්ෂ ගුරුවරයෙකු වූ බව මගේ අවබෝධයයි.

කුලසේකර සර් ක්‍රීඩා අංශය භාර ව සිටි උසින් අඩු කෙනෙකු විය. එතුමා අපට වෙනත් කිසි විෂයක් ඉගැන්වූයේ නැත. එතුමා පාසලට පැමිණියේ කටුගස්තොට සිට පාපැදියෙනි. සෙනෙවිරත්න සර් හුරීකඩුවේ කෙනෙකි. තරුණ ගුරුවරයෙකු වූ එතුමා ද පාසලට පැමිණියේ පාපැදියකිනි. එතුමා සහ විජේරත්න යන ගුරුවරුන් අපට කිසිම විෂයයක් ඉගැන්වූයේ නැත. එනමුත් ඔවිහු අපට හිතවත් ආදර්ශමත් ගුරුවරුන් වූහ. එවකට ප්‍රධානාචාර්යතුමා හැර පාසලේ සිටි එක ම උපාධිධාරී ගුරුවරයා වූයේ *එච්.ආර්.ජී රූපසිංහ සර්* ය. එතුමා විද්‍යා උපාධිධාරියෙකු විය. එතුමාගේ පැමිණීමෙන් පසුව, ටිකෙන් ටික විද්‍යාගාරයට අවශ්‍ය උපකරණ ලැබෙන්නට පටන්ගත් නමුත්, අපට වැඩි ප්‍රයෝජනයක් නොවීය. විද්‍යාගාරය සඳහා ගෙන්වන ලද *ෆොස්පරස්* නම් රසායනික ද්‍රව්‍ය පාර්සලයක් විසිරී ගොස් රාත්‍රියේ දී පාසල් වත්තේ අමුතු ආලෝකයක් විහිදෙන්නට පටන් ගත්තේය. රසායනික ලෝකයට සමීප වූ එක ම අවස්ථාව එය විය.

මගේ පාසල් ජීවිතයේ අවසාන වසර දෙක තුනක් තුළ මහත් බලපෑමක් ඇති කළ ගුරුවරයා වූයේ **මේජර් හෙන්රි ද සිල්වා** සර් ය. එතුමා දෙවන ලෝක මහා යුද්ධයට පසුව අපගේ පාසලට මාරු වී පැමිණි ආදර්ශමත් ගුරුවරයෙකු විය. අඩි හයක් පමණ උස ප්‍රියමනාප පෞරුෂයක් තිබූ එතුමා, ඉතා පිරිසිදු සුදු බටහිර ඇඳුමකින් සැරසී පාසලට පැමිණියේය. ටයි පටියක් බැඳ සිටියේ නැත. එතුමා නේවාසික ව සිටියේ වලල-නාවින්න පාරේ පිහිටි හලංගොඩ කෝරළේ මහතාගේ වළව්වේය. බොහෝ දිනවල එතුමා පයින් ම පාසලට ආගිය නමුත්, වැහි දවසක් වැනි අවස්ථාවල දී තමාගේ කාර් එකෙන් පාසලට ආවේය. මුල දී එතුමාට තිබුණේ තරමක් පරණ ස්ටෑන්ඩර්ඩ් එයිට් කාර් එකක් වුවත් යුද්ධය අවසන් වී අලුතෙන් කාර් රටට ගෙන්වීම ඇරඹූ පසු, අලුත් ම ෆෝර්ඩ් ප්‍රිෆෙක්ට් රථයක් මිලයට ගත්තේය. ඒ යුගයේ දී මේ අලුත් කාර් එකක් රුපියල් හය දහසක් පමණ වන්නට ඇත.

වැදගත් සිදුවීම් රාශියක්

1947 වසර ලංකාවට වැදගත් සිදුවීම් රාශියක් වූ වර්ෂයක් විය. ඒවා සමහරක් ක්ෂණික ව ද සමහරක් ක්‍රම ක්‍රමයෙන් ද අපගේ ජීවිතවලට බලපෑම් ඇති කළහ. මේ වර්ෂයේ ඇති වූ මහා වැඩ වර්ජනය, ගංවතුර හා මහ මැතිවරණය යම් යම් සමීප බලපෑම් ඇති කරන ලදී. එනමුත් මේ වසරේ දී සම්මත වූ අධ්‍යාපන ආඥාපනත අපට ගැඹුරින් නමුත් හෙමින් හෙමින් බලපෑම් ඇති කළ කාරණයක් විය.

1947 ගං වතුර

1947 අගෝස්තු මාසයේ දී පමණ වූ මහා ගංවතුර මහනුවර ප්‍රදේශවල තදබල හානියක් සිදු කළේය. නොකඩවා එක දිගට ඇද හැළුණ වර්ෂාව නිසා මහවැලි ගඟ පිටාර ගැලීමෙන්, පේරාදෙණිය, ගැටඹේ, කටුගස්තොට ආදී ප්‍රදේශවලට බලවත් හානි සිදුවිය. පේරාදෙණියේ දුම්රිය පාලම හා කටුගස්තොට දුම්රිය පාලම එසේ හානි වූ බව අපට ආරංචි විය. *ගැටඹේ පන්සලේ හාමුදුරුවන් වහන්සේ දිවිගලවා ගත්තේ එහි බෝධීන් වහන්සේ උඩට නැඟීමෙන් බව ද එවකට පැතිර ගිය කථාවකි.* පාසලේ ඉගෙනීමේ කටයුතුවලට බාධාවක් වූ නිසා අප ගත කළේ අපේ සිතැඟි පරිදිය. ඒ නිසා, අප කීප දෙනෙක් එකතු වී ගංවතුර බැලීමට පොල්ගොල්ලට ගියෙමු. එහි සමූපකාර විද්‍යාලය අසල වූ මහපාරේ වංගුවෙන් එහා නවයාලතැන්න පැත්ත ගංවතුරෙන් යට වී තිබිණි. මහවැලි ගඟ දෙගොඩතලා ගිය දසුන බියකරු විය. රථවාහන ගමනාගමනය කිසිවක් නොවූයෙන් ආපසු පාසල වෙත පැමිණියේ ද පයින් ම ය.

අපගේ ඊළඟ ගැටලුව වූයේ, පාසල් නිවාඩුව ද ඇරඹුණ නිසා, නිවෙස් කරා යෑමය. දීප ව්‍යාප්ත මහා වැඩ වර්ජනය ද මේ දිනවල දැ'යි යන්න මතක නැත. කෙසේ වෙනත්, ගංවතුර නිසා රථවාහන ගමනාගමනයක් නොවූයෙන්, ගම්වලට යෑමට බස් රථ කිසිවක් නොවීය. ඒනිසා, නේවාසිකාගාරයේ සිටි අපි හතර පස් දෙනෙක් නිවාඩු දුන් දවසේ සවස් වරුවේ පයින් ම ගම්වල යෑමට තීරණය කළෙමු. අපේ ගමට සැතපුම් විස්සක් පයින් යා යුතු විය. ධාරාණිපාත වැස්ස අඩු වී තිබුණි. එනමුත්, විටින් විට තෙමෙන්නට ද සිදුවිය හැකි ව තිබිණි. කොට කලිසම් හා කමිස ඇඳ සිටි අප අතේ කුඩා පාර්සලය බැගින් විය. එහි සරමක් හා කමිසයක් වන්නට ඇත. මගේ මතකයේ හැටියට මේ ගමනට එක් වූයේ මාත්, හාල්යාලේ කරුණාධිපති, මැදිවක පුසරත්න හා එන්.බී.ඒ. මැදිවක සහ ගොඩකුඹුරේ ජයතිලක යන පස් දෙනාය.

සැතපුම් විස්සක් ගමට පයින් ගමන

වලල අප පාසලේ නේවාසිකාගාරයෙන් පස්වරුවේ පිටත් වූ අපි, මහනුවර තෙල්දෙණිය මහපාරේ ගමන් ගතිමු. *මැණික්හින්න, දහයේ කණුව, මල්පාන, රජවැල්ල, දිගන, ගල්අම්බලම, අංචිකඩේ* පසුකර *තෙල්දෙණියට* ළඟා වීමු. අතරින් පතර වැහිපොද වැටුණ නමුත්, ඒවායින් බේරීමට හෙවනකට යෑමට අවශ්‍යතාවක් අප කිසිවෙකුට නොවීය. ගමන ගැන තිබුණ අපගේ උද්යෝගය ඉමහත් විය. තෙල්දෙණියෙන් පිටත් වී පොලීසිය, රෝහල, පාසල ආදියට පසුව, හුළුගහ හරහා වූ පාලම පසුකර ටික දුරක් ඉදිරියට ගොස් දකුණට හැරී වේරගංතොට (මහියංගණ) පාරට එළඹුණෙමු. මෙතැනින් සැතපුම් භාගයක් හමාරක් ගිය විට, *යකාමුල්ලේ සුසාන භූමිය* හමුවේ. ඉන් පසුව ටික දුරකින් රඹුක්වැල්ලේ පන්සල හා ගම පසුකර *සියඹලාගස්තැන්නේ* දී සැතපුමක් පමණ දුරක් මහපාර වංගු රහිතය. මේ හරියට පැමිණෙන විට ඇඳිරි වැටී තිබිණි. තව ටිකක් ඉදිරියට ගිය විට මහපාරේ දකුණු පසින් ගුරු ඔය හුළුගගට වැටෙන ස්ථානය දක්නට ලැබේ. මේ අසල ම ගුරුඔය හරහා බැඳි අමුණක් තිබේ. මේ වන විට හොඳට ම කළුවර වී අවසන්ය. දැන් අප යන්නේ *මොරගහමුල* දක්වා වැටී ඇති මහ පාරේය. තනියම යන කෙනෙකුට මෙහි ඉදිරියෙන් තිබෙන එක බෝක්කුවක් අසල දී *"පොකුටී"* නමැති *යක්ෂණියක්* හමුවන බවට කටකථාවක් පැතිර තිබිණි. අප පස්දෙනා මේ ගැන දැන සිටි නිසා, මේ බෝක්කුව ලංවන විට ඒ ගැන වැඩි වැඩියෙන් ශබ්ද නඟා කථා කිරීමට පටන් ගත්තෙමු.

මේ බෝක්කුව හා එයට ඉදිරියෙන් තිබුණ වංගුව පසු කරත් ම, *පොකුටී* ගැන තිබුණ බිය පහව ගොස් ලොකු සහනයක් ලැබුණ බවක් පෙනිණි. නොයෙක් විහිළු තහළු කරමින් ද තම තමන් දන්නා කතන්දර කියමින් ද ඉදිරියට ගිය අපි, වෑගලට යන පාර පසුකර ගුරුඔය පාලම කිට්ටුව තිබුණ හින්දු කෝවිල පසු කළෙමු. මෙපමණ දුරක් මහපාරේ එතරම් කඳු පල්ලම් නොවීය. එනමුත්, ගුරුඔය පාලම පසුකළ තැන සිට කන්ද නැඟීමට පටන් ගනී. සැතපුම් භාගයක් පමණ ඉහළට ගිය විට, මොරගහමුල කඩපොල හමුවේ. තවත් සැතපුමක් පමණ ඉහළට යන විට උඩතැන්න ද, ඉන්පසුව උෑරුගල කඩපොල ද හමුවේ. දැන් තෙල්දෙනියේ සිට සැතපුම් හයක් ගමන් කර ඇත. ගමන් මහන්සිය හා බඩගින්න ද ටිකෙන් ටික දැනෙන්නට වුණි. එනමුත්, මෙහි නතර වීමට පුළුවන්කමක් නැත. දන්නා හඳුනන කෙනෙක් නැති නිසාය.

උෑරුගල පසුකර මහපාරේ ඉහළට යන විට *දොඩන්ගොල්ල* වත්තට හැරෙන පාර පසුවේ. තවත් සැතපුමක් පමණ යන විට, එක ළඟ ඇති වංගු දෙක හමුවේ. එතැනින් පසුව ටික දුරක් යන විට *මාන්ගොඩට* හා එතැනින් එහා ඇති *නේවන්තකට* හැරෙන පාරක් පසුවේ. ඉන් පසුව ඉදිරියට යන අපට

ගලේකැලේ නේ වන්න හමුවිය. මහපාරේ දකුණු පසින් ගලේකැලේ වත්ත අයිතිකරු වූ ජොන්ස්ටන් මහතාගේ බංගලාවට යන අතුරු පාරකි. වම්පසින් වත්ත ඇතුළේ පහළට යන අතුරු පාරක් වේ. එයින් තේ ෆැක්ටරියට යා හැකිය. ඊට ස්වල්පයක් ඉහළින් ටී මේකර් බංගලාව පිහිටා තිබේ. ඒ යුගයේ එහි සේවය කළේ අප සමඟ පාසල් ගිය නවරත්න අයියාගේ පියාය. එසේ ද වුවත්, අප කිසිවෙක් ඔහු හැඳින නොසිටි නිසා, පිළිසරණක් සොයා යෑමට සිතිවිල්ලක් අප කිසිවෙකුටත් ඇතිවුණේ නැත. තවත් සැතපුම් භාගයක් පමණ ඉදිරියට ගිය විට හුන්නස්ගිරියේ සන්ද පොළ හා ඒ අසල වූ කඩපල හමුවිය. එතැනින් ටික දුරක් ඉදිරියට යන විට *මුතලිබ් මුදලාලිගේ 'මහ කඩේ'* හමුවේ. මුතලිබ් මුදලාලි සිල්වර් ලයින් බස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාය. ඔහුගේ සහෝදරයකු වූ අලියාර් මුදලාලි මොරගහමුල වෙළඳ ව්‍යාපාරයන් හා ප්‍රවාහන සේවයක් පවත්වා ගෙන ගියේය. මුතලිබ් මුදලාලිට ද ලොරි රථ කීපයක් තිබිණි. අප පස් දෙනා මේ කඩවල් තිබෙන තැනට එන විට ඒවා වසා දමා තිබිණි. සැතපුම් කාලක් පමණ තවත් ඉදිරියට ගොස් හුන්නස්ගිරියේ කන්ද කපාපු තැනට ළඟා වීමු. එහි යනවිට තේ පැන් ශාලාවක් (හෝටලයක් වූ) දුම්බර ආපන ශාලාව තවමත් විවෘත කර තිබිණි. එහි අයිතිකරුවෙකු වූ දෙනාපිටියේ හීංබණ්ඩා මුදලාලිට අපේ කතාව කීමෙන් පසුව, කඩේ සොල්දරේ තිබුණ බූරු ඇඳන් මත එදින රාත්‍රිය ගත කිරීමට අවසර ලැබිණි. විඩාපත් ව සිටි අප සමහර විට කඩෙන් යමක් ආහාරයට ගන්නට ඇත. අපි ඉතා ඉක්මනින් නින්දට වැටුණෙමු.

පසුදා උදෙන් ම අවදි ව සැතපුම් හතරක් පහක් පමණ ඉතිරි ව තිබුණ ගමන අවසන් කිරීමට පිටත්වූයෙමු. මහපාරේ විසිපස්වෙනි සැතපුම් කණුව අසලින් පහළට තිබුණ ගම්සභා පාර දිගේ ගමන් ගත් අපි පස් දෙනා, පළමුවෙන් ම අපේ ගෙදර ළඟට පැමිණියෙමු. අනික් අයගෙන් සමුගත් මම අප නිවසට ගියෙමි. අනිත් අය තම තමන්ගේ නිවෙස් කරා යෑමට පිටත් ව නොපෙනී යන තෙක් බලා සිටියෙමි. අපේ ගමේ ම පහළින් මැදිරියේ කරුණාධිපතිලාගේ නිවස විය. අනිත් තිදෙනා තවත් සැතපුම් දෙකක් පමණ යා යුතු විය.



වලල - මාඩුගොඩ පා ගමන් මඟ ද, වලල - වත්තේගම මාර්ගය ද
වලල - දවුලගල බඹරදෙනිය මාර්ගය ද දක්වා ඇත

1947 මහා මැතිවරණය

1947 වර්ෂයේ දී අප රටේ ඇති වූ අනික් වැදගත් සිද්ධිය වූයේ මහා මැතිවරණයක් පැවැත්වීමය. සෝල්බරි කොමිෂන් සභාව මඟින් නිර්දේශ කළ පරිදි, යටත් විජිතයක් වූ ලංකාවට දේශපාලන නිදහස ලබා දීමේ තවත් පියවරක් වශයෙන් බ්‍රිතාන්‍ය රාජසභා ආඥාවක් මඟින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රදානය කරන ලදී. එය **සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** නමින් හැඳින්විණි. ඒ අනුව, පාර්ලිමේන්තුව මන්ත්‍රී මණ්ඩල දෙකකින් යුක්ත විය. ඉහළ මන්ත්‍රී මණ්ඩලය **සෙනෙට් සභාව** නමින්ද පහළ මන්ත්‍රී මණ්ඩලය **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය** නමින් ද හැඳින්විණි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරු එකසිය එක් දෙනෙක් වූහ. එයින් අනූපස් දෙනෙක් භූගෝලීය මැතිවරණ කොට්ඨාසවලින් තෝරා පත්කර ගැනීමට නියමිත ව තිබූ නිසා, 1947 සැප්තැම්බර්, ඔක්තෝම්බර් යන මාසවල දී දිවයිනේ විවිධ ප්‍රදේශවල මහා මැතිවරණ පවත්වන ලදී. මුළු දිවයින මැතිවරණ කොට්ඨාස අසූ නවයකට බෙදා තිබිණි. සමහර කොට්ඨාස බහු ආසන කොට්ඨාස වූහ. මැද කොළඹ, දකුණු කොළඹ, බේරුවල, අම්බලන්ගොඩ-බලපිටිය, බලන්ගොඩ යනාදිය

බහුමන්ත්‍රී ආසන වූහ. අපගේ පාසල අයත් වූයේ වත්තේගම කොට්ඨාසයටයි. ආසන්න කොට්ඨාස කීපයක් වූයේ මහනුවර, කඩුගන්නාව, අකුරණ, ගම්පොල යන කොට්ඨාසය.

වත්තේගම කොට්ඨාශයට තරග කළේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දුම්බර මන්ත්‍රීවරයා ව සිටි *අබේරත්න රත්නායක මහතාය.* වලල මධ්‍යම පාසල ආරම්භ කරන ලද්දේ එතුමාගේ අනුග්‍රහය යටතේය. එතුමා අයත් වූයේ එක්සත් ජාතික පක්ෂයටයි. එහි නායකයා වූයේ **ඩී.එස් සේනානායක** මහතාය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඇමති මණ්ඩලයේ හැම දෙනා ම එක්සත් ජාතික පක්ෂය යටතේ ආසන තරග කළහ. මිණිපේ ආසනය එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළේ උඩදුම්බර රටේ මහත්තයා ලෙස සේවය කළ *එච්.බී.රඹුක්වැල්ල දිසාවේය.* එතුමා මිණිපේ ගොවි ජනපදය පිහිටුවීමට වෙහෙස මහන්සි වූ කෙනෙකි. වත්තේගම ආසනයට *ලංකා සමසමාජ පක්ෂයෙන් නානායක්කාර* නම් කෙනෙක් ද, *මිණිපේ* ආසනයට එම පක්ෂයෙන් *කේ.බී. මැදිවක මහතා* ද තරග කළහ. ප්‍රාථමික පාසලේ දී අපගේ ඉංග්‍රීසි ගුරුවරයා වූ මැදිවක මහතා ඡන්ද ව්‍යාපාරයේ දී එතුමාට උපකාර කරන ලෙස වරක් මගෙන් ද ඉල්ලා සිටියේය. අටවැනි පන්තියේ සිටි අපි කීප දෙනෙක් සමසමාජ පක්ෂයට හිතවත්කමක් දැක්වූහ. රතු කොඩි කීපයක් පන්ති කාමරය අවට එල්ලා තැබුවෙමු. අපේ සමහර ගුරුවරුන්ගේ උපදේශය වූයේ, පාසල් සිසුන් වූ අප දේශපාලනයේ නිරත නොවිය යුතු බවය. රජයේ සේවකයන් වන ගුරුවරු ද අපක්ෂපාතී ව සිටින බවය. කෙසේ වෙතත්, අපගේ අවනතභාවය රහසිගත ව ඉදිරියටත් පවත්වා ගෙන ගියෙමු. මැතිවරණයෙන් ඉහත සඳහන් ආසන දෙක ම ජයගත්තේ එක්සත් ජාතික පක්ෂයේ *අබේරත්න රත්නායක* මහතා සහ රඹුක්වැල්ලේ දිසාවය. ඒ ගැන මගේ කිසිම අසතුටක් නොවූයේ පක්ෂ දේශපාලනයක් ගැන කිදා බැස තිබූ අවබෝධයක් නොතිබුණ නිසාය.

1947 මැතිවරණයේ දී *මතුගම* ආසනය තරග කළ **'නිදහස් අධ්‍යාපනයේ පියා'** වශයෙන් එවකට ද ප්‍රසිද්ධියක් ඉසුළු අමාත්‍ය **සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර** මැතිතුමා පරාජය විය. එතුමා නිදහස් අධ්‍යාපනය ඉදිරියට ගෙන ගිය නිසා, එතුමා අයත් වූ එක්සත් ජාතික පක්ෂයේ බොහෝ දෙනා එතුමාට විරුද්ධ ව වැඩ කළ බවත්, එතුමා එක්සත් ජාතික පාක්ෂිකයෙකු වූ නිසා වාමාංශිකයෙක් (විල්මට් ඒ. පෙරේරා මහතා) එතුමා පැරැද්දවීමට ක්‍රියා කළ බවත් කියති. මේ නිසා ඇත්ත වශයෙන් ම හානියක් වූයේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ අනාගත දරු පරපුරටයි. එතුමා පුරෝගාමී ව සකස් කර තිබූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙලට මහත් බාධා, අවහිරතා ඇති විය. ඇති කරන ලදී. 1947න් පසුව අධ්‍යාපනය භාර දුන්නේ *ජිබ්‍රොල්ටාවේ* සිට ගෙන්වන ලද, අතිශයින් ප්‍රතිගාමී අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකුටයි *(ආචාර්ය එච්.ඩබ්. හව්ස්).* එය නරියාට බොක්ක භාර දීමක් වැනි විය. රත්නායක මහතා අධ්‍යාපන ඇමති තනතුර ඉල්ලා ඇතත්, එතුමා ආහාර

හා සමූපකාර ඇමතිවරයා ලෙස පත්කර, ඒ ඉල්ලීම යටපත් කර ඇත. කන්නන්ගර මහතා මැතිවරණයෙන් පරාජය වී කලක් ගත වූවාට පසුව, ඉන්දුනීසියාවේ තානාපතිවරයා ලෙස යවන ලදී. 1952 මැතිවරණයට ආපසු පැමිණ ජයග්‍රහණය කළත් එතුමාට ලැබුණේ පළාත් පාලන අමාත්‍යාංශයයි. 1956න් පසුව එතුමා මැතිවරණවලට ඉදිරිපත් වූයේ නැත. පසුව එතුමා සඳහන් කර ඇති අන්දමට, බෙහෙත් මිල දී ගැනීමට තරම්වත් මුදලක් නොමැති ව ඒ සඳහා උපකාර කරන ලෙස කථානායකවරයාට ඉල්ලීමක් කිරීමට සිදු ව ඇත. දේවත්වයෙන් සැලකිය යුතු වූ කන්නන්ගර මැතිතුමාට අත්වූ ඉරණම අන්ත දරිද්‍රතාවයි. මේ රටේ අප කොතරම් ගුණමකු ද?

කන්නන්ගර මහතා අධ්‍යාපන ඇමති වශයෙන් සේවය කළ අවසාන වසරේ දී, රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන් අනුමත කරගත් ප්‍රතිපාදන යටතේ, දිවයින පුරා විසිර සිටි ශිෂ්‍යත්වධාරීන්ට නොමිලේ ඇඳුම් සැපයීම ආරම්භ කරන ලදී. ඒ අනුව, මුල් වාරයේ දී පිරිමි ළමයින්ට කලිසම් දෙකක් සඳහා කාකි රෙදි ද කමිස සඳහා සුදු (එයාර්ටෙක්ස්) රෙදි ද සරම් දෙකක් හා සබන් කැල්ලක් ද ලැබිණි. ගැහැණු ළමුන්ට ළමා සාරි හා හැට්ට රෙදි දෙන ලදී. පසු කාලයේ දී පිරිමි ළමයින්ට කලිසම් සඳහා නිල්පාට රෙද්දක් දී ඇත. ඒ වන විට මා පාසලෙන් අස් වී ගොස්ය. ආරම්භයේ දී මසකට රුපියල් දොළහ බැගින් වූ (ආහාර පාන සඳහා) දීමනාව පසුව රුපියල් විස්ස දක්වා වැඩි කරන ලදී. මා පාසල හැරගිය පසු තවත් වැඩි කළා වන්නට ඇත.

1948 නිදහස් උත්සවය

1948 වසර තුළ දී වැදගත් සිදුවීම් කීපයක් විය. යටත් විජිතයක් ව පැවැති ලංකාව නිදහස ලැබුවේ **1948 පෙබරවාරි මස 04වැනි දා ය.** ඒ සම්බන්ධයෙන් රටේ හතර දිග්භාගයෙන් ගිනි සිළු රැගෙන ආ *මැරතන් ධාවන හතරක්* විය. මඩකලපුවේ සිට ගෙනා ගිනිසිළුව කොළඹට ගියේ මහනුවර හරහාය. එම ධාවනයේ මඩවල-පොල්ගොල්ල පෙදෙසේ සැතපුම් භාගයක් දුර ගිනි සිළුව රැගෙන දිවීමට අප පාසලෙන් සහභාගී වූයේ මාත්, අප්පුහාමිත්ය. අප දෙදෙනා වයස 16න් පහළ හා 19න් පහළ ධාවන ශූරයන් වූ අයයි. මේ හැර නිදහස් උත්සව සඳහා මහනුවර නගරය හැම තැන ම සරසා තිබිණි. **සෝල්බරි සාමිවරයා** ඇතුළු පිරිසක් මහනුවර මිලර්ස් ගොඩනැගිල්ලේ සිට පෙරහැර නරඹනවා දැක්කෙමි. *ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ රූව සහිත ව තැපැල් මුද්දරයක් නිකුත් කරන ලදී.* නගරය සැරසීමට යොදා ගෙන තිබුණ සිංහ කොඩි විවිධාකාර විය. පැරණි 'ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා භාවිතා කළ කොඩියක්' යයි හැඳින්වුණු සිංහ රූපය සහිත කොඩියක් හැම තැන ම දක්නට ලැබිණි. මේ වන විට ජාතික කොඩියක් හෝ ජාතික ගීයක් සම්මත වී තිබුණේ නැත.

නිදහස් උත්සවය ආදිය අවසන් වීමෙන් පසුව, මට කක්කල් කැස්ස සෑදී, එවර වාර විභාගයට ද පෙනී සිටීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලය වූයේ, පූර්ව ජ්‍යෙෂ්ඨ පන්තිය වෙනුවට මා ඇතුළු සිසුන් හතර දෙනෙක්, පළමු වාර විභාගයේ ලකුණු අඩු නිසා හෝ ලකුණු නොලැබූ නිසා, ප්‍රායෝගික ජ්‍යෙෂ්ඨ පන්තියට ඇතුළු කිරීමයි. සාමාන්‍යයෙන් පූර්ව ජ්‍යෙෂ්ඨ පන්තියේ ඉගැන්වූ සමහර විෂයයන් වෙනුවට අප හතර දෙනාට වඩු කර්මාන්තය, ලාකඩ කර්මාන්තය වැනි විෂයයන් කීපයක් උගන්වන ලදී. මේ නිසා අපට වඩු වැඩ ගැන මූලික දැනීමක් ලබා ගැනීමට හැකිවිය. එනමුත්, ඊළඟ වසරේ සාමාන්‍ය ජ්‍යෙෂ්ඨ පන්තියට ඇතුළු කළ නිසා, ඉංග්‍රීසි සාහිත්‍යය වැනි දැනුමක් නොලැබුණු විෂයෙන් සම්බන්ධයෙන් අපගේ දැනුම දුර්වල වූයෙන්, ජ්‍යෙෂ්ඨ විභාගය කෙරෙහි ද එය බලපෑමක් ඇති කළේය. ඉංග්‍රීසි භාෂාව විෂයෙන් සමත්වීමට මට ලැබුණේ අප පන්තිය භාර ගුරුතුමාගේ යහපත් මඟපෙන්වීමත් වැඩි මහන්සියකින් ඒ විෂයට අවධානය යොමු කිරීමත් නිසාය. ඉංග්‍රීසි භාෂාවට අමතර ව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග යෙන් මා සමත් වූ අනික් විෂයන් වූයේ භූගෝල විද්‍යාව, ප්‍රජාචාරය, සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය සහ බුද්ධාගමයි. එවකට විෂයයන් හයකින් එකවර සමත් වූ විට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලැබේ.

අනුරාධපුර අධ්‍යාපන චාරිකාව

පාසල් සමයේ සහභාගී වූ අවසාන අධ්‍යාපන චාරිකාව වූයේ, 1948 වසරේ දී සිදු වූ අනුරාධපුර ගමනයි. මෙම චාරිකාව, අප අටේ කණුවේ නේවාසිකාගාරයේ සිටිය දී මට කක්කල් කැස්ස සුවවේගෙන එන අවධියේ ගිය බවට සාධක තිබේ. ඒ ගමන සඳහා ගමන් වියදම් ආදියට රුපියල් දහයක් ගෙවිය යුතු විය. ඒ මුදල මා ළඟ තිබුණේ නැත. ඒ නිසා, නේවාසිකාගාරයේ සිටි "පොලීකාර" සිසුවකුගෙන් ඒ මුදල ණයට ඉල්ලා ගෙන, අධ්‍යාපන චාරිකාවේ යෙදී, පසුව ගෙදරින් ගෙනැවිත් ණය බේරුවෙමි. මම ණය මුදල් ගත් තැනැත්තා අධ්‍යාපන චාරිකාවේ ගියේ නැත.

හිමිදිරි පාන්දර ගමන අරඹා එළිය වැටී ගෙන එන විට වත්තේගම උකුවෙල පසු කරන අතරතුර, ගැහැණු ළමුන් කීප දෙනෙක් *'වීරමලේ රොන් ගෙනයන්නා'* යන *සරණගුප්ත අමරසිංහ මහතාගේ ගීතය* ගායනා කළහ. දඹුල්ලට ගොස් විහාරය වැඳ පුදා සීගිරියට ගියෙමු. එහි වූ "ස්පයිරල්" පඩි පෙළ නැඟ, අප්සරාවන්ගේ සිතුවම් නරඹා, සිංහ මුඛය වෙත ගියෙමු. දෙබරුන්ගෙන් ප්‍රවේශම් වීමට උපදෙස් ලැබිණි. ඉතා අමාරුවෙන් අත්පා හතරේ ම වාරුවෙන් සීගිරි ගල මුදුනට නැංගෙමු. කන්ද මත වූ නටබුන් සියල්ල නරඹා, මනස්කාන්ත අවට පරිසරය ද සිරි නැරඹුවෙමු. තදබල සුළං පහරක් නොවූයෙන්, පහළට ගමන එතරම් බියජනක නොවීය.

එතැනින් බැස දිවා ආහාරය සඳහා කැකිරාව මධ්‍යම පාසලට ගියෙමු. නව අත්දැකීම් හේතුවෙන් ගමනේ යෙදී සිටිය දී වෙහෙසක් නොදැනුණත්, කුසගින්න තදින් දැනිණි. කැකිරාව මධ්‍යම පාසලේ ද එවකට තිබුණේ තාවකාලික ගොඩනැඟිලි කීපයක් බව මතකය. දිවා ආහාරයෙන් පසුව කලාවැව නරඹා *අවුකන පිළිම වහන්සේ* වෙත ගියේ දුම්රිය පාර හරහා පා ගමනින්ය. බස් රථය ඉන් එහා ගෙන යෑමට එවකට නොහැකිවුණ නිසාය. පාවහන් නොමැති ව පයින් ගිය අපට, නෙරිංචි කටුවලින් බේරීමට ද සිදුවිය. අවුකන බුදු පිලිමය නැරඹීමෙන් පසුව, කලාවැව හා යෝධ ඇල බලා, එහි ඓතිහාසික පසුබිම ගැන ද සිතමින් අනුරාධපුරයට පැමිණියෙමු.

එදින රාත්‍රිය අනුරාධපුරයේ විශ්‍රාම ශාලාවක ගත කළෙමු. එහි පැමිණෙන විට කොපමණ මහන්සියෙන් සිටියා ද යත්, රාත්‍රී ආහාරයට දෙන ලද පාන් සහ පරිප්පු ගිල දැම්මේ නිදිමරගාතේය. පසුදා අනුරාධපුරයේ අටමස්ථානය නැරඹීමෙන් හා වැදපුදා ගැනීමෙන් පසුව, මිහින්තලාවට ගියෙමු. මිහින්තලේ කඳු මුදුනට නැඟ බලා ගත් බව ද මතකය. එදින ආපසු අපගේ පාසලට පැමිණෙන විට බොහෝ රෑ බෝවී තිබිණි. මේ ගමනේ දී අප භාර ව ගියේ *ජී.ඒ. පෙරේරා ගුරුතුමා* සහ කාන්තා නේවාසිකාගාර *පාලිකා ගුණවර්ධන මෙනවියයි. එච්.ආර්.ජී. රූපසිංහ* සර් සිය පවුල සමග එතුමාගේ අලුත් *මොරිස් එයිට්* රථයෙන් මේ ගමනට සම්බන්ධ වූයේය.

අටේ කනුවේ නේවාසිකාගාරය තිබුණේ ලොකු පොද්ගලික නිවාසයකය. පාසල් භූමිය තුළ වූ පිරිමි නේවාසිකාගාරය මෙහි ගෙන එනවිට, මට කක්කල් කැස්ස සෑදී ගෙදර ගොස් සිටි නිසා, මගේ ඇඳුම් ආදිය එහි ගෙන ගියේ කවුරුන් දැ'යි නොදනිමි. කෙසේ වෙතත්, අසනීපයෙන් පසුව පාසලට ගිය පසු නේවාසිකාගාරය වෙනස් වී තිබිණි. මේ නේවාසිකාගාරයේ දී, *පෙතියාගොඩ සර්* සහ *ජී.ඒ. පෙරේරා* සර් අප භාර ව සිටි බව මතකය. අපගේ කෝකියා වූයේ *කළු බණ්ඩාය.* මේ නේවාසිකාගාරයේ සිටි විස්සක් තිහක් පමණ වූ සිසුන් අතර, *දෙවහන්දියේ එදිරිසිංහ, රඹුක්වැල්ලේ ජයවර්ධන, තෙල්දෙණියේ වැවේගම මුදියන්සේ, ගිඩ්ඩව අබේරත්න, හාල්යාලේ කරුණාධිපති, මැදිවක පුසරත්න, අමුපිටියේ ධර්මදාස, ගිඩ්ඩව ගුණසේන හා ගල්පිහිල්ලේ සිරිසේන, පොල්ගොල්ලේ සුගතපාල, යටිරාවණ ප්‍රේමදස* යන අය වූහ. ඒ අය බොහෝ දෙනෙක් මුලින් ම මේ පාසලට ඇතුළුවූවන්ය. මෙම නිවසේ පිටුපසින් එක් කොටසක නිවස හිමි පවුලක් ද පදිංචි ව උන්හ. නිවස පිටුපස වූ පොල් ගස් කිහිපයක් කොච්චි මිනිසෙක් රා මැදීමට යොදා ගෙන තිබිණි. පොල්ගස් එකින් එක සම්බන්ධ කර කඹවලින් බැඳ තිබූ අතුරේ, රා මදින්නා ගමන් කරනවා බලා සිටීම ද අපට යම් පමණ ත්‍රාසජනක දෙයක් විය. මෙය වඩාත් භයානක බවක් දැනුණේ මැදිවියේ සිටි මොහු උපැස් යුවලක් ද පැළඳ සිටි නිසාය.

අටේ කණුවේ නිවසින් පසුව, ජේෂ්ඨ බාලක නෝවාසිකාගාරය පාසල කිට්ටුවෙන් වූ බංගලාවත්තට ගෙන යන ලදී. පාසල් වත්තට පහළින් වූ කුඹුර හරහා ගොස් බංගලාවත්තට පිවිසීමට හැකි වුවත්, කුඹුර වැඩ කළවිට හා වැසි දිනවල ඒ පාර දිගේ ගමන් කිරීම ගැටලුවක් වූයේ, ලිස්සනසුළු වීම නිසාය. වත්ත තුළ වූ තවත් පාරකින් මහපාරට ගොස් පාසලට යාහැකි වුවත්, එය ද වැසි දිනවල ලිස්සනසුළු විය. ඒත් අඩිමාරුවෙන් පැත්තකට වී, බිම වැටී තිබුණ කෙකෝවා කොළ උඩින් ගමන් කළ හැකි විය. බංගලාවත්තේ වූ අපගේ නේවාසිකාගාරය අවට කහඹිලියා පැල වැවී තිබිණි. ඒ නිසා ඒවායේ ගැටීමෙන් මඟහැර සිටීම අවශ්‍ය විය. එසේ වුව ද, මේ කහඹිලියා පැල වරක් අපට බෙහෙවින් ම ප්‍රයෝජනවත් විය. ඒ ගැන ද මෙතැන දී ම විස්තර කිරීම උචිත යැ'යි සිතමි.

කහඹිලියා ශාන්තිය

මහනුවර පිහිටි ධර්මරාජ, විද්‍යාර්ථ, රාහුල, ශාන්ත අන්තෝනි, ශාන්ත සිල්වෙස්ටර් ආදි පිරිමි පාසල් සහ පුෂ්පදාන, මහාමායා, උසස් බාලිකා, කොන්වන්ට් යනාදි බාලිකා පාසල්වලට ගිය සිසුන් සඳහා පාසල් බස්රථයක් තෙල්දෙනියේ සිට මහනුවරට ගියේ අප පාසල ද පසුකරමිනි. අපේ පාසලට පැමිණෙන සිසුන් සමහර දෙනෙක් ද මේ බසයේ ගමන් කළහ. මහනුවර පාසල්වලට යන සිසුන් අප පාසල ඉදිරියෙන් ගමන් කරන් ම, අප දුටුවිට "පිංබත්' කියමින් අපහාස කළහ. මේ අයගේ මතය වූයේ, ඔවුන් මුදල් ගෙවා ලොකු විද්‍යාලවල ඉගෙන ගන්නා බව සහ මධ්‍යම පාසලේ ඉගෙන ගන්නා අය නොමිලේ "පිනට බත් කමින්' ඉගෙනගන්නා නිකමුන් රැලක් බව වන්නට ඇත. මේ බස් රථයේ එන අප පාසලේ සිසුන්ට මෙය වදයක් වන්නට ඇත. එපමණක් නොවේ. අප විදුහල්පති **එම්.බී.එස්. පලීපාන** මැතිතුමා නිවසේ සිට පාසලට මේ යුගයේ ගමන් කළේ ද බෙහෙවින් ම පරණ කාර් එකකයි. මේ ගැන ද මෙම බස්රථයේ ගමන් ගත් සිසුන් විහිළු කරමින් කෑ කෝ ගැසූ බවත් දැනගන්නට ලැබිණි.

ජ්‍යෙෂ්ඨ බාලක නෝවාසිකාගාරයේ සිටි අප මේ ගැන යමක් කළ යුතු බවට තීරණය කොට, දිනක් පාසල් බසය එන වේලාවට කහඹිලියා පැල ද අතැති ව සිසුන් බැස්සවීමට හා නංවා ගැනීමට බසය නැවත්වුණ තැන්වල නතර වී සිටියෙමු. මුලින් ම සිටියේ *ජයසුන්දර* නැමති අපේ සගයාය. ඔහු දුටුවිට, *'පිංබත්'* පදය ගැයීමට පටන් ගත් කල්හි, බසයේ පසුපස ගරාදියේ එල්ලී ඇතුළේ සිටි කිහිප දෙනෙකුගේ කහඹිලියා ඇතිල්ලීය. මේ ආකාරයට කීප තැනක දී ම තවත් අප සගයන් කීප දෙනෙක් විසින් ඇතුළේ සිටි අයට *"කහඹිලියා ශාන්තිය"* ලබා දුන්හ. ටික දුරක් යන විට, පාර හරහා කොටයක්

ද හරස් කර, බසයේ මඟ අහුරන ලදී. රියදුරාට කාරණය අවබෝධ වී, බසයේ උන් සිසුන්ට බැණ වැදී, අපගෙන් අවසර ගෙන ගමනේ නිරත විය. ඉන්පසු ව මේ "පොඩි මහත්වරු" අපගේ මිතුරන් බවට පත්වූහ.

හුන්නස්ගිරි කන්ද නැඟීම

ජ්‍යෙෂ්ඨ බාලක නේවාසිකාගාරයේ සිටි අප සිසුන් කණ්ඩායමක් අපගේ පාලක ගුරුතුමා සමග වරක් හුන්නස්ගිරි කන්ද තරණය කළෙමු. උදේ ආහාරයෙන් පසු පයින් ගමන් ආරම්භ කළ අප කණ්ඩායම, *වාවින්න* හරහා *පන්විල* පාරේ *ගල්පිහිල්ල* තෙක් ගොස්, ඒ අසල පිහිටි තේ වත්තේ පාරක් දිගේ මහ හෙලක් ඉහළට ගියෙමු. අතරමඟ තේ කර්මාන්ත ශාලාවක් විය. වත්තේ පහළ සිට තේ කම්හලට තේ දළු ප්‍රවාහනය කරන යෝධ කම්බි දෙකක් කන්දේ ඉහළට ඇද තිබිණි. ගෝනිවලට තේ දළු පුරවා රෝද සහිත පුලියක අමුණා ඒවා කම්බියට පුරුද්දා ඉහළට යැමට සලසා තිබිණි. මේ ආකාරයට ශ්‍රමිකයින්ගේ හිස මතින් තේදළු ඉහළට ගෙන යැමට වඩා පහසුවෙන් කාර්යය ඉටුකර ගැනීමට හැකි විය. තේ කම්හලේ නිපද වූ තේ කොළ මහනුවර වැනි ඈත ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීමට ලොරි ගමනාගමනය සඳහා පාරක් සාදා තිබිණි. තේ කම්හල පසුකර සෑහෙන දුරක් කන්දේ ඉහළට ගිය විට, තේ වත්ත අවසන් වී කැලෑව හමුවේ. මෙහි ඇති අඩිපාරක් දිගේ කන්ද මුදුනට ළඟා වීමට පුළුවන. බඩගින්න හා මහන්සිය තදින් දැනෙන්නට විය. දිවා ආහාරයට අප ගෙන ගිය පාන් හා සීනි සම්බල්ය. ඒවා ආහාරයට ගනිමින් ම කන්ද මුදුනට ගියෙමු. ටික වේලාවකින් අතිශයින් මනස්කාන්ත දර්ශනයක් දිස් විය. කන්දේ බටහිර දෙසින් හා උතුරු දෙසින් *වත්තේගම* හා *උකුවෙල* තැනිතලාව දිස්වේ. මහනුවර-මාතලේ දුම්රිය මාර්ගය වත්තේගම පසු කළ තැන් පටන් ඈතින් දිස්වෙයි. පෙට්ටි දෙක තුනක් සහිත දුම්රියක් ද ගමන් කරනවා දක්නට ලැබිණි. එය මෙහි දුර්ලභ දසුනක් වන්නේ, මේ මාර්ගයේ දුම්රිය ධාවනය වන්නේ පැය දෙක තුනකට වරක් නිසාය. බොහෝ වේලාවක් කඳු මුදුනේ අති සුන්දර පරිසරය නරඹමින් සිට, විඩා නිවුණු පසු ආපසු ගමනට පිටත් වූයෙමු. එය සිරිපාදේ නැඟ ආපසු එන ගමනට සමාන විය. *ගල්පිහිල්ල* මහ පාරට එනතුරු තද පල්ලමේ ආ ගමන, පල්ලම නිසා ම පරිස්සමෙන් බැසිය යුතු විය. *වාවින්න* හන්දියෙන් *වලල* පාරට හැරී නේවාසිකාගාරයට එන විට හවස් වී තිබිණි. විඩාපත් ව සිටි නමුත් සිත පිරුණු ගතියක් දැනිණි.



වලල - වාවින්න - ගල්පිහිල්ල - හුන්නස්ගිරි කඳු මුදුන මාර්ගය ——— පාටින් දක්වා ඇත

වෙනත් ගමන් බිමන්

වත්තේගම ධර්මද්වීප පිරිවෙනට යෑමට ගිය කීපවාරයක් ම මා ගියේ මේ පාරේය. *වලල* හන්දියේ සිට *වාවින්න* දක්වා ගොස් වමට හැරී මහපාර දිගේ ම හෝ රබර් වත්තේ වූ අඩිපාර දිගේ *වත්තේගම* නගරයට ළඟා විය හැකිය. මහපාර දිගේ යන විට, *රාස්සැල්ල* නම් කුඩා දිය ඇල්ලක් හමුවේ. එය පසුකර යන විට පාරට ඉහළින් රබර් කම්හලක් තිබිණි. *වාවින්න* හන්දියෙන් රබර් වත්ත හරහා යන විට, තද පල්ලමක් බැස වෙල් යායකට පිවිස, ඇලවේල්ලක් දිගේ *විද්‍යාදර්ශන පිරිවෙන* අසලින් *වත්තේගම* නගරයට පිවිසිය හැකි විය. මේ කුමන මාර්ගයේ ආවත්, නගරය මැද දුම්රිය පාරට උඩින් පිහිටි පාලම පසුකර *මඩවල - මාතලේ* පාරට වැටේ. එතැනින් දකුණට හැරී දුම්රිය පාර හරහා ඇති ගේට්ටුව අසලින් *ධර්මද්වීප පිරිවෙනේ* වත්තට ඇතුළු වන්නේය. එහි ඇති පඩි පෙළේ ඉහළට ගියවිට පිරිවෙනට පැමිණිය හැකි විය.

අපේ අම්මාගේ බාල සෙහොයුරෙකු වූ *පණ්ඩිත හාල්යාලේ සුමනතිස්ස හාමුදුරුවෝ* මේ පිරිවෙනේ අධිපති හිමියෝ වූහ. උන්වහන්සේ *මාලිගා කන්දේ විද්‍යොදය පිරිවෙනේ* ඉගෙනුම ලබා පණ්ඩිත උපාධිය සමත් වීමෙන් පසුව, පළමුවෙන් ම පැමිණියේ වත්තේගම විද්‍යාදර්ශන පිරිවෙනටයි. මා *වලල*

මධ්‍යම පාසලට ගිය වසරේ උන්වහන්සේ *වත්තේගමට* පැමිණ තමන් වහන්සේගේ ගුරුවරුන් සඳහා විශාල පින්කමක් පවත්වන ලදී, අපේ අම්මා, අප්පච්චී සහ ගමේ නෑදෑයින් රාශියක් ද මේ උත්සවයට සහභාගි වීමට පැමිණ සිටියහ. මට ද එයට වාසනාව ලැබුණේ ඒ අවුරුද්දේ මා *වලල මධ්‍යම පාසලට* ඇතුළු වී සිටි නිසාය. *සුමනතිස්ස හිමියන්* මෙහි ටික කලක් පිරිවෙන පවත්වා ගෙන ගොස්, පසුව *ප්‍රනාන්දු* නම් වූ දානපතියෙකුගේ ඉඩමක *ධර්මද්වීප* නම් පිරිවෙනට ගොඩනැඟිල්ලක් ඉදිකර ගෙන එහි පදිංචියට වැඩියේය.

මට මුදල් අහේනි ඇති වූ විටින් විට, *සුමනතිස්ස හිමිපාණෝ* හමුවීමට ගියෙමි. ඒ වාරවල රුපියල් පහක් දහයක් ඉල්ලා ගතිමි. එක් වරක් ආණ්ඩුවෙන් ලැබුණු රෙදිවලින් කලිසම් කමිස මසා ගැනීමට වියදම් වශයෙන් රුපියල් විස්සක් ඉල්ලා ගතිමි. පිරිවෙනේ නැවතී සිටි *ජයසේකර* නැමැති මට වඩා ටිකක් වයසැති ළමයා අතේ රුපියල් සියයේ නෝට්ටුවක් වත්තේගම දුම්රිය ස්ථානය වෙත එවා මාරු කරගෙන, මට රුපියල් විස්සක් දීම දැනුදු පැහැදිලි ව "පෙනේ." ඉමහත් සතුටකින් එම මුදල රැගෙන ආපසු නේවාසිකාගාරයට පැමිණියේ, *මඩවල* දක්වා *මහනුවර* යන බසයකින් ගොස් එතැනින් *තෙල්දෙනියේ* බසයක ගොස් පාසල අසලට ළඟාවීමෙනි. මුදල් ලැබුණු හැම වාරවල දී මගේ ආපසු ගමන මේ මාර්ගයේ විය.

වරක් මෙසේ *වත්තේගම* යන ගමනක දී, *හලංගොඩ වලව්ව* පසුකරන විට, *වාවින්න* පාරේ පිටියේ ගෙදර හන්දියට කිට්ටුව පාරට දැමීමට ගෙනැවිත් තිබූ කැටගල් කියුබ් එකක් ළඟ වයස්ගත අසරණ කෙනෙක් වැටී සිටිනවා දුටුවෙමි. ඔහු ළඟට ගොස් කථා කළ විට යමක් කීමට ප්‍රයත්න දැරුවත් ශබ්දයක් පිට නොවීය. ඔහු වැටී සිටි අයුරින් මට දැනුණේ බඩගින්නේ ඉන්න බවකි. ඒ නිසා, අසල තිබූ තේ කඩයකට ගොස් ටී බනිස් එකක් සහ තේ වීදුරුවක් ගෙනැවිත් බනිස් ගෙඩිය තේවල ඔබා ඔහුට කැවීමි. ඒ ආහාරයෙන් පසුව, මේ අසරණයාට යම් සහනයක් ලැබුණ බවක් පෙනිණි. මා අතේ තිබුණ එක ම ශත විසි පහෙන් ශත පහළොවක් මේ සඳහා වියදම් වී යයි සිතමි. මට ගමනට ඉතිරි වූයේ ශත දහයක් පමණි. මා මේ ගමන පයින් ගියේ ද තිබුණ මුදල් බස් වියදමට යෙදීමට අකමැති වූ නිසාය. එසේ ද වුවත්, මට දැනුණේ මෙය මහා සාංඝික දානයක් දුන්නාට වඩා හැඟීමකි. එයින් පසුව මගේ ජීවිතයේ දී යම් යම් දන්දීම් කර ඇතත්, මෙය මා දෙන ලද ලොකු ම දානය ලෙස තවමත් සලකමි. මා නොයෙක් දෙනා සමග මේ ගැන කියා උදම් අනා ඇත. එය සාධාරණ දැ'යි මා දන්නේ නැත. එනමුත් මා හිතන්නේ, මා ද අහේනියකින් සිටි අවස්ථාවක දනක් දීමට අවස්ථාවක් ලබා දුන් දේවදූතයෙකු මට හමුවූ බවයි.

චිත්‍රපටි බැලීම

එක් වතාවක *වත්තේගම පිරුවනට* ගොස් රාත්‍රිය එහි ගත කළෙමි. ඒ වකවානුවේ *නාරම්පනාවෙන්* එහි පැමිණ සිටි කුඩා ළමයෙක් ද විය. ඔහු පසු කාලයේ *මැදිවක වජිරඤාණ* නමින් සසුන්ගත ව උපසම්පදාව ද ලබා සිටියේය. බොහෝ කාලයකට පසුව, අපේ අයියාගේ අභාවයෙන් පසුව, මා පල්ලේවෙලට ගොස් සිටි දවසක, ජාතික ඇඳුම් ඇඳගත් කෙනෙක් මා අසලට පැමිණ, තමා උපැවිදි වූ බව කී විට, එක්වර ම මගේ සිතට පැන නැගුණේ පින අවසන් වී ඇතැ'යි යන සිතිවිල්ලය. *නාරම්පනාවේ* මේ කුඩා ළමයා පමණක් නොව අපේ හීං අම්මාගේ/හීං අප්පච්චීගේ පුතෙකු වූ *ධර්මසේන අයියා* ද, *හාල්යාලේ ධම්මරතන* නමින් එම පිරුවනේ ඉගෙන ගනිමින් සිටියේය. ඒ හාමුදුරුවන්ගේ මල්ලී වූ *ගුණතිලක මල්ලී* ද එහි උන්නේය. පිරුවනේ රැයක් ගත කිරීමට මේ දෙදෙනා එහි සිටීම ද හේතු වන්නට ඇත.

මේ දිනවල පිරුවන පිහිටි කඳුගැටය ඉදිරිපසින් තිබෙන වෙනත් කඳුගැටයක් මුදුනේ කුඩාරමක් ඉදිකොට තාවකාලික චිත්‍රපටි ශාලාවක් පවත්වා ගෙන ගියේය. සවස පහ හමාර පමණ වන විට, ඉදිරියේ කඳුගැටයෙන් ශබ්ද විකාශන යන්ත්‍රවල සංගීත රාවය විහිදෙන්නට පටන් ගත්තේය. ඊට පෙර කිසිදාක චිත්‍රපටි ශාලාවක චිත්‍රපටි දැක තිබුණේ නැත. පාසල් භූමියට ජංගම සිනෙමා රථ පැමිණ කෙටි චිත්‍රපට පෙන්වා තිබිණි. ඉන් එකක තිබුණේ *"දිස් ඉස් ද හවුස් දැට් ජැක් බිල්ට්"* යන කථාවයි. දැන් මා තුළ චිත්‍රපටි බැලීමට කුතුහලයක් ඇති විය. පසු දින ආපසු නේවාසිකාගාරයට යන අටියෙන් පිරිවෙනෙන් පිටත් වී ගොස් *වත්තේගම* නගරයේ කඩයක නතර වී සිටි අප පාසලේ සිසුවකු වූ *සමරපාල* හමුවීමි. සමරපාලගේ අයියා මේ කඩයේ අයිතිකරු විය. එදින දවල් කාලය සමරපාල සමග ගත කොට සවස සිනෙමා ශාලාවට ගොස් චිත්‍රපටිය බැලුවෙමි. එය දෙමළ චිත්‍රපටියක් වූ අතර, එහි බොහෝ අද්භූත ජවනිකා දක්නට ලැබිණි. ඒ චිත්‍රපටිය *ඇලඩින් හා පුදුම පහන* ගැන වන්නට ඇත. එක් නළුවෙක් ගොඩනැගිල්ලක පහළ මාලයේ සිට හිටිවන ම ඉහළ මාලයට කරනම් ගැසුවේය.

මින් පසුව චිත්‍රපටි බැලීමේ කුතුහලය තව තවත් මතුවන්නට විය. තවත් දිනක, දිවාකාලයේ *පොල්ගොල්ලේ සුගතපාල* සමග *මහනුවර* ගොස්, එහි තිබූ *එම්පයර්* නම් (ටකරන්) සිනමාහලේ දී ඉංග්‍රීසි චිත්‍රපටියක් බැලුවෙමි. එහි වූ සෝෂාව මිස අගක් මුලක් තෝරා ගැනීමට නොහැකි විය. මහනුවර *මුල්ගම්පල* අලුතෙන් ඉදිකළ නිව් *එම්පයර්* සිනෙමා ශාලාවේ *චන්ද්‍රලේඛා* නම් චිත්‍රපටියක් ප්‍රදර්ශනය කළේය. එම චිත්‍රපටිය බැලීමට තුන්වරක් ගියෙමි. මෙහි එවකට ප්‍රසිද්ධියක් ඉසුළු දකුණු ඉන්දීය දෙමළ නළුනිළියන් කීප දෙනෙක් රඟපෑහ. සර්කස් කණ්ඩායමක දර්ශන ද එහි විය.

මෙසේ චිත්‍රපට බැලීමට අවශ්‍ය වූ විට මා අනුගමනය කළ ක්‍රියාමාර්ගය නම්, සවස හයයි තිහේ දර්ශනය බැලීමට කල්තියා නේවාසිකාගාරයෙන් හුදකලා ව පිටත් ව බසයකින් මහනුවරට යෑමයි. *වලල්ල* සිට *මහනුවරට* බස් ගාස්තුව සත විසිපහක් විය. සිනෙමා ශාලාවට පයින් ම ගොස් රුපියල් එකයි ශත විස්සක් ගෙවා දෙවෙනි පන්තියේ ටිකට්පතක් ගෙන, හයයි තිහේ දර්ශනය නරඹා එය අවසන් වූ වහා ම, නවයයි තිහේ දර්ශනයට ද ටිකට් ලබා ගෙන එය ද නැරඹුවෙමි. පාන්දර 12.30 ට පමණ මේ දර්ශනය අවසන් වූ විට, මහනුවර දුම්රිය ස්ථානයට පැමිණියෙමි. අතරමඟ ඇති තේ පැන් ශාලාවකින් ආහාරපාන ගෙන තේ පානය කොට, දුම්රිය ස්ථානයට පැමිණ පෙරවරු 4.30ට මාතලේ දක්වා යන දුම්රියෙන් *වත්තේගමට* යෑමට ශත හැත්තෑවක් ගෙවා පළමු පන්තියේ ටිකට්පතක් ගනිමි. මේ දුම්රිය පාන්දර දෙකට පමණ අදාල වේදිකාවේ නවතා තිබේ. ඒ නිසා දුම්රිය පිටත්වන තුරු පැය දෙක හමාරක් පමණ සැප පහසුවට පළමුවන පන්තියේ දුම්රිය මැදිරියේ නිදා ගැනීමට පුළුවන. මේ වේලාවට පළමුවන පන්තියේ වෙනත් මඟීන් එන්නේ ම නැති තරම්ය. ඒ නිසා නින්දට බාධාවක් ද නොවේ. දුම්රිය පිටත් වී *කටුගස්තොට* පාලම ආදිය පසු කරන විට නින්දෙන් අවදි වේ. *වත්තේගමට* ගිය පසු දුම්රියෙන් බැස *වත්තේගම* හන්දියේ තිබෙන කඩයකට පැමිණ එහි ඇති තෝසේ, වඩේ වැනි යමක් ආහාරයට ගෙන තේ එකක් පානය කොට අවසන් වන විට, *මාතලේ* සිට *මහනුවර* දක්වා යන බස් රථයක් පැමිණේ. ශත දහයක් ගෙවා ඒ බසයෙන් *මඩවලට* ගොස් එතැනින් *මහනුවර* සිට *තෙල්දෙණියට* යන බසයකට ශත දහයක් ගෙවා *වලලට* ගියෙමි. නේවාසිකාගාරයේ අන් සිසුන් අවදි වන විට මා එහි ගොස් හමාරය. එක් දිනක් මට අවදි වූයේ දුම්රිය *මාතලේට* ද ගොස් නතර කළාට පසුවයි. සිදු වූ වරදින් ගැලවීමට ටිකට් පත් එකතු කරන ගේට්ටුවේ මුරකරුට අල්ලසක් දිය යුතු විය. ඒ නිසා, අනික් මඟීන් හැම දෙනා ම පිට වී යනතුරු සිට මුරකරු වෙත ගොස් කාරණය පැහැදිලි කර, අතේ තිබුණු රුපියල් පහෙන් දෙකක් ඔහුට දී ගැලවී පැමිණ, බස් රියේ *මඩවලට* ද එතැනින් *වලලට* ද පැමිණෙන විට පෙරවරු අට පමණ වී තිබුණත්, සති අන්තයේ දිනයක් නිසා හැල හොල්මනක් නැති ව නේවාසිකාගාරයට පිවිසීමට අපහසුවක් නොවීය.

බඹරදෙණියේ ගමන්

නේවාසිකාගාරයෙන් අවසර ලබා ගෙන සති අන්තයට ගෙදර ගොස් පැමිණීමට හැකි විය. එවැනි සමහර අවස්ථාවල මා අපේ ගෙදර යාම වෙනුවට බඹරදෙණියේ නැන්දම්මලාගේ ගෙදර ගියෙමි. එකී ගමනට මුල පිරුවේ මා *වලලට* පැමිණි පළමු වසරේමයි. අපේ නැන්දම්මා වරක්

එතුමියගේ ලොකු දුව ද සමඟ අපේ ගෙදර පැමිණියාය. මේ අපේ නිවාඩු කාලය වන්නට ඇත. නේවාසිකාගාරයේ ඇඳක් සඳහා කලින් ගෙවා තිබූ මුදල් ආපසු ගෙවන බව දන්වා තිබුණ නිසා, නැන්දම්මා ආපසු යන විට මා සමඟ අපේ පාසලට ගොස් ඒ මුදල ලබා ගන්නා ලෙස අප්පච්චි එතුමියට කී නිසා, අප තුන්දෙනා එහි ගියෙමු. *විමලානන්ද සර්ගෙන්* මුදල ලබා ගෙන, මා ද කැටුව නැන්දම්මා *බඹරදෙණියේ* ගියාය. *මහනුවරට* ගොස් එතැනින් *දුවුලගල* බසයකින් ගොස් *වෙලම්බඩ* පාරේ සැතපුම් දෙකක් පමණ පයින් ගමන් කොට, *බඹරදෙණියේ* නැන්දම්මලාගේ ගෙදරට පැමිණියෙමු. ආපසු එන ගමනේ දී, වෙල්යායක් මැදින් වැටී තිබුණ පාරේ වම් පසින් *ඇම්බැක්කේ දේවාලේ* පිහිටා ඇති බව දැන ගතිමි. ඒ ගමනේ දී, *බඹරදෙණියේ* මාමා සමඟ *මහනුවර සිතුමිණ* පොත්හලට පැමිණ ඊළඟ වසරේ පාසල් පොත් මිලට ගෙන ආපසු ගියෙමි. ඒ නිසා තනියම වුවත් දැන් *බඹරදෙණියේ* යන අන්දම දැන ගතිමි.

පසුව විටින් විට එහි යෑමට පුරුදු වූයෙමි. වරක් එහි ගිය විට ලිඳ ළඟට එක්කර ගෙන ගොස් නැන්දම්මා මගේ කුණු අතුල්ලා හොඳින් නෑවූ බව තාම මතකයට නැගේ. නැන්දම්මා මා කෙරෙහි මහත් දයාවකින් කරුණාවෙන් සැලකූ බව පෙනුණ නිසා ඉඩ ලැබුණ හැම අවස්ථාවක ම එහි ගියෙමි. මගේ වයසේ පිරිමි ළමෝ දෙදෙනෙක් වූහ. එයින් වැඩිමලා *කරුණාරත්න* අයියා *පේරාදෙණියේ* ද්විභාෂා පාසලේ ඉගෙන ගත් නිසා, වරක් ඔහු සමඟ උදෙන් ම පිටත් වී වෙල්යායක් මැදින් නියරවල් දිගේ සැතපුම් හතරක් පහක් පමණ වූ ගමන පයින් ම පැමිණ, *පේරාදෙණියේ* දුම්රිය ස්ථානය අසල තිබූ ඔහුගේ පාසලට ළඟා වූයෙමි. මා එතැනින් එන *(පැණිදෙනියේ)* බස් රථයකින් මහනුවරට පැමිණ, *නෙල්දෙණියේ* බසයකින් *වලලට* පැමිණියෙමි.

බඹරදෙණියේ ගමන්වල දී ඒ ප්‍රදේශයේ ජනතාව තේ වගාව මත රැඳී සිටින බව පෙනී ගියේය. නැන්දම්මලාගේ ගෙවත්තේ ද තේ වගා කර තිබිණි. කුඹුරුවලට වඩා තේ වගාවෙන් ආදායම් උපයා ගත්හ. තේ දළු මිලයට ගන්නා වෙළඳුන්ගෙන් අවශ්‍ය විටක කල්තියා මුදලක් ලබා ගැනීමට ඉඩ තිබිණි. සතියකට වරක් දළු කැඩීමට පුළුවන. තේ වගාවක් ඇති විට සරල ජීවිකාවකට අපහසු නොවේ. මම *බඹරදෙණියේ* යන එන අවධියේ නැන්දම්මාගේ පවුලේ අට දෙනෙක් වූහ. නැන්දම්මා, මාමා සහ දරුවන් හය දෙනෙකු වශයෙනි. දරුවන්ගේ වැඩිමලා වූයේ අක්කාය. ඇය *නන්දා* නම් වූවාය. ඊළඟට අයියලා දෙන්නෙක් ද නංගිලා දෙන්නෙක් සහ මල්ලී කෙනෙක් ද සිටියහ. මෙවැනි පවුලකට සලාකයට ලැබුණු හාල් ප්‍රමාණවත් නොවීය. ඒ නිසා, කුඹුරුවලින් හෝ කඩවලින් වැඩි මුදලකට මිලයට ගැනීමට සිදු වේ. නැන්දම්මලාට යම්යම් දුෂ්කරතාවන් තිබුණ බව ඒ වකවානුවේ නොදැනුණත්, එසේ තිබෙන්නට ඇති බව දැන් අවබෝධ වේ.

යුද්ධයෙන් පසු රථවාහන

පාසල් භූමියේ වූ නේවාසිකාගාරයේ ගත කළ මුල් වසර දෙක තුන තුළ දී, සවස තුනට පාසල අවසන් වූ පසුව කාලය ගත කළේ ක්‍රීඩා පිටියේ හෝ ඊට ඉහළින් පිහිටි ප්‍රාථමික පාසලට මහ පාරෙන් පිවිසෙන මාර්ගය දෙපසය. ක්‍රීඩා භූමිය ඉදිකළේ ද මුල් වසර දෙක තුළ දී ය. පාසලට පිවිසෙන මාර්ගය දෙපස වාඩි වී මහපාරේ ගමන් කරන විවිධ වර්ගයේ හා තරාතිරමේ රථ වාහන හඳුනා ගැනීම ටික කලකට අපගේ විනෝදාංශයක් විය. දෙවන ලෝක මහා යුද්ධය අවසන් වසරේ දී මහ පාරේ බහුල වශයෙන් ගමනාගමනය කළේ හමුදා රථ වාහනයි. පොල්ගොල්ලේ හමුදා කඳවුරක් පිහිටා තිබිණි. අනික් පැත්තෙන් *කුණ්ඩසාලේ* තවත් කඳවුරක් පිහිටා තිබීම ද නිසා අවට ගම්වලින් කඳවුරුවල සේවය සඳහා කම්කරුවන් ප්‍රවාහණය කිරීමට මෙන් ම හමුදා භටයන් එහා මෙහා ගෙන යෑමට ද හමුදා රථවාහන මෙසේ පාසල ඉදිරිපස මහපාරේ ගමන් ගත්හ. ඒ රථවාහන නිෂ්පාදනය කර තිබුණේ කුමන රටවල ද යන්න හඳුනා ගැනීම දුෂ්කර විය. එනමුත්, ඒ යුගයේ ලංකාව යටත් විජිතයක් වූ නිසා, රථවාහන සියල්ල පාහේ එංගලන්තයේ නිපදවා තිබුණා විය හැකිය. රටවැසියාගේ ගමනාගමනයට හා ප්‍රවාහනයට තිබූ බස් රථ හා ලොරි රථ මෙන් ම කාර් රථ ද යුද්ධයට පෙර නිපදවන ලද පරණ වූ රථවාහන විය.

බස්රථ විවෘත බඳ සහිත වූ (ඕපන් බොඩි) පැරණි මාදිලියේ ඒවා විය. අප පාසල ඉදිරියේ මහා මාර්ගයේ ඉහළ පහළ ගමන් කළේ *"සිල්වර් ලයින්"* බස් සමාගමේ බස් රථය. මේවා *මහනුවර* සිට *තෙල්දෙණිය, හූන්නස්ගිරිය, ලූල්වත්ත, මාඩුගොඩ, වේරගන්නොට* ආදී තැන්වලට ආ ගිය ඒවාය. මහනුවර සිට *කුණ්ඩසාලේ* පාරේ *තෙල්දෙණියට* හා *රංගලට* ගිය බස් රථ ද මෙම සමාගමට අයත් විය. බස් රථ සමාගම් ක්‍රමය ලංකාවේ ආරම්භ කළේ 1938 වසරේ දී පමණය. ඉන් පෙර තනි තනි හිමිකරුවන්ගේ බස් රථ ඒ අයට කැමැති පරිදි මේ මාර්ගවල ධාවනය කළ නමුත්, බස් රථ සමාගම් පිහිටුවීමෙන් පසුව, ඒ ඒ මාර්ගවල ඒකාධිකාරය ඒ ඒ සමාගම්වලට පවරා නියමිත කාල සටහන් අනුව බස් ධාවනය කළ යුතු විය. රටේ වෙනත් ප්‍රදේශවල ද මේ ආකාරයට වෙනත් බස්රථ සමාගම් පිහිටුවා තිබිණි. මහනුවර හා අවට තිබුණ වෙනත් බස් රථ සමාගම් වූයේ, *ටවුන් බස් සමාගම, යුනයිටඩ් බස් සමාගම, සිංහ බස් සමාගම, ජී.එස්. බස් සමාගම* හා *මධ්‍යම ලංකා බස් සමාගමයි.* මහනුවර හා කොළඹ අතර ධාවනය කළ බස් රථ අයත් වූයේ *ශ්‍රී ලංකා බස් රථ සමාගමටයි.* එහි මූලස්ථානය කොළඹ පිහිටි අතර, මෙහි සඳහන් අනික් සමාගම්වල මූලස්ථාන *මහනුවර* පිහිටා තිබිණි.

යුද්ධය අවසන් වූ පසුව බස් රථවල ස්වභාවය වෙනස් කරන ලදී. අලුත් බස් රථ *"නෙල්සන් බොඩි"* ක්‍රමයට සාදා තිබිණි. ඒ අනුව, බසයට පිවිසීමට හා පිටවීමට වම් පස ඉදිරියෙන් එක් දොරක් පමණක් තිබිණි. ඒවායේ මගීන් වැස්සෙන්, පින්නෙන් වඩා හොඳින් ආරක්ෂා වන අයුරු වීදුරු ජනේල යොදා ඉදිකර තිබිණි. විවෘත බඳ සහිත පැරණි බස් රථවල, වැස්සෙන් ආරක්ෂා වූයේ දොරවලට එල්ලා තිබූ කැන්වස් රෙදිවලිනි. ඒවා වැසි නැති විට අකුලා තබා වහින විට දිගහැරීමට හැකි විය. නෙල්සන් බස් රථ වීදුරු යෙදූ ජනෙල් සහිත වූයෙන්, ඒවා ආසන්නයේ වාඩි වූ මගීන්ට ඒවා ඉහළ පහළ දමා වැස්සෙන් බේරීමට හැකි විය. ජනෙල්වලට වීදුරු යොදා තිබුණ නිසා මඟ දෙපස බැලීමට ද බාධාවක් නොවීය. යුද්ධය අවසන් වූ වහා ම අලුතෙන් මාර්ගවලට යොදන ලද *නෙල්සන් බස්* රථ ද බොහොමයක් ඉදිකර තිබුණේ හමුදාවෙන් ඉවත් කළ වාහන යොදා ගෙනය. යුද්ධය අවසන් වූ පසු හමුදාවේ රථ වාහන වෙන්දේසි කළ විට, බස් සමාගම් විසින් ඒවා මිලයට ගෙන, බස් බොඩි ගසා මගී ප්‍රවාහණයට යොදවන ලදී. ඒ අනුව, *පොර්ඩ්, බෙඩ්ෆෝර්ඩ්, චවලට්, මුක්කන් පොර්ඩ්* ආදී නොයෙක් වර්ගවලට අයත් එන්ජින්වලින් බස් රථ නිම කර තිබිණි. පාසල් වත්තේ වේලිවලට වී සිටි අපට, මෙසේ අලුතෙන් එන බස් රථවලට නම් යෙදීම ද විනෝදයක් විය. මේ අතර, 1946 වසර අවසාන වන විට පමණ වෙනත් මෝටර් රථ ද පිටරටවලින් ගෙන්වීමට පටන් ගත් බව පෙනිණි. මේවා බෙහෙවින් ම *එංගලන්තයේ* නිෂ්පාදනය කළ *ඔස්ටින්, පොර්ඩ්, මොරිස්, වොක්ෂෝල්* යනාදී කාර් රථ විය. අපේ ගුරුවරුන් වූ *පලිපාන සර්, රූපසිංහ සර්* හා *මේජර් සර්* ද 1947 දී පමණ අලුත් කාර් තුනක් ගත්හ. ඒවා පිළිවෙලින් *වොක්ෂෝල්, මොරිස්* හා *ෆෝර්ඩ්* වර්ගයේ කාර් විය.

කලා කුසලතා

මධ්‍යම පාසල් සමයේ දී සෞන්දර්ය කුසලතා වර්ධනයට වැඩි පිටුවහලක් නොවීය. ප්‍රාථමික පාසලේ දී *වීරසිංහ මහතා* විසින් පුහුණු කරන ලද *ධාතුසේන නාට්‍යයේ* රඟපෑමට මා තෝරා ගත් නිසා, ගීත ගයන්නට පිවිසුණෙමි. එසේ නොවුණා නම්, මගේ දස්කම් කවි ගායනයට සීමාවීමට ඉඩ තිබිණි. මධ්‍යම පාසලට ඇතුළු වූ මුල් දිනවල, අසල කඩයක එවකට පළ කරන ලද කවි පොත් කීපයක් තිබිණි. ඒවා ඇත්ත වශයෙන් ම මාසික ප්‍රකාශන විය. *දේදුන්න, මී වදය, අඹවනය* යන නම්වලින් මේ ප්‍රකාශන නිකුත් වී තිබිණි. මම ඒවා මිල දී ගෙන කියවීමට පුරුදු විමි. මධ්‍යම පාසලේ මුල් වසරේ දී නැටුම් පුහුණුවීම් නිසා මෙම නිපුණතාවන් වර්ධනයට ආරම්භයක් වැටුණ නමුත්, ඉන්පසු වසරවල දී අපට නැටුම් ඉගැන්වීමක් නොවීය. එනමුත්, දැන් නොයෙක් මාර්ගවලින් ගීත ගායනයට ද ප්‍රවේශයක්

ලැබිණි. නේවාසිකාගාරයේ දී වාර අවසාන විවිධ ප්‍රසංග සඳහා ගීත ගායනා කිරීමට ඉඩ ප්‍රස්ථා ලැබුණේ ගී ගායනයට දක්ෂතාවක් මට තිබෙන බව අන් සිසුන් හා ගුරුවරු දැනගත් නිසාය. එක් වසරක *විජය-කුවේණි නාට්‍යයේ* කොටසක් රඟපෑමට ද ලැබිණි. තවත් වරක් ඉංග්‍රීසි කෙටි නාට්‍යයක් රඟපෑවෙමි. මේ යුගයේ දී සිංහල චිත්‍රපට ගීත ද ඇසෙන්නට ලැබුණ නිසා, ඒවා අනුකරණය කිරීමේ හැකියාවක් ලබා ගතිමි. එම ගීත සමාජගත වීමට පෙර සිංහල සිංදු හැටියට **ආනන්ද සමරකෝන්** හා ඊට පෙර යම් යම් ගායකයන්ගේ ගීත කලාතුරකින් අසන්නට ලැබිණි. මා පළමුවෙන් ම ගායනයට පිවිසුණේ *"කාකයෝ පියාඹති එහා මෙහා උදේ"* සහ *"සිරි සරු සාර කෙතේ ගොයම් පැසීලා මහිමේ"* යන ගීත ගායනයට පුරුදුවීමෙනි. *ඩබ්ලිව්.ඩී. ඇල්බට් පෙරේරා* ගායකයාගේ *"හවේ හීන හැර දේ සිත තිලෝනා.....* ආදී ගීත ද ක්‍රම ක්‍රමයෙන් ගායනයට වෙර දැරුවෙමි. *සුනිල් ශාන්තයන්ගේ "ඕලු පිපීලා"* වැනි ගීත ලාංකීය ගීත ලොවට පිවිසියේ ද මේ යුගයේ දී ය. ඔහුගේ ගීත අප අතර බෙහෙවින් ම ජනප්‍රිය වූයේ ඒවා සරල සුගම වීම කියාය. පසුකාලයේ දී *අශෝකමාලා, කඩවුණු පොරොන්දුව, කපටි ආරක්ෂකයා* යනාදී චිත්‍රපට සිංදු සමහරක් නේවාසිකාගාරයේ සමහර දෙනා අතර ජනප්‍රිය විය. මේ අතරතුර ගුවන් විදුලියේ අධ්‍යාපන සේවය ආරම්භ කිරීමත් සමඟ පාසල්වලට ගුවන් විදුලි යන්ත්‍ර සපයන ලදී.

අපේ පාසලට සපයන ලද ගුවන් විදුලි යන්ත්‍රය ප්‍රධාන ශාලාවේ කාර්යාල කාමරයේ සවිකරන ලදී. දිනපතා දවල් දොළහේ සිට එක දක්වා වූ විවේක කාලය තුළ *හින්දුස්තානී ගීත* ප්‍රචාරය විය. දිවා ආහාරය සඳහා දිවයන මම, විනාඩි දහයක් ගතවීමටත් පෙර ආපසු පැමිණ ගුවන් විදුලි යන්ත්‍රය ළඟට වී හින්දුස්තානී සින්දුවලට කන් දුන්නෙමි. දවල් 12.45ට දිවා ප්‍රවෘත්ති ප්‍රචාරය විය. විවේක කාලය ආරම්භ වනවාත් සමඟ ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළේ අපේ පන්තිය භාර ගුරුතුමාය. හින්දි සිංදුවල තේරුමක් දැන ගන්නට නොහැකි වුවත්, ඒවායේ මිහිරි තාල අප තුළට කිඳා බැස තිබිණි. පාසලේ ගුවන් විදුලි යන්ත්‍රය හැර මේ වකවානුවේ නිවෙස් ආදියේ ගුවන් විදුලි යන්ත්‍ර නොවීය. සමහර නගරවල හෝ කඩවල ගුවන්විදුලි යන්ත්‍ර තිබුණි. ඒවායේ බෙහෙවින් ම ඇසුණේ කර්ණාටක සංගීතයයි. එසේ වුවත්, කලින් කිසිදා සවන් දීමට නොලැබුණු ඒ සංගීතය ද ක්‍රමයෙන් අගය කිරීමට පුරුදු වූයෙමි. දමිළ චිත්‍රපට බැලීම නිසා ද මේ ප්‍රවණතාව දියුණු විය.

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය

මේජර් හෙන්රි ද සිල්වා සර් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පන්තියේ අපගේ පන්තිය භාර ගුරුවරයා විය. ඉංග්‍රීසි විෂයය ඉගැන්වූයේ ද එතුමා ය. දිනපතා ම ගෙදර වැඩ සඳහා *ඩබ්ලිව්.එච්.සමරනායක* මහතාගේ

"ප්‍රැක්ටිකල් ඉංග්ලිෂ්" පොතේ එක පරිච්ඡේදයක් නියම කරන ලදී. එහි අඩංගු වූ වචනවලට පැහැදිලි අරුත් ලැබෙන සේ වාක්‍ය ලිවීම මේ අභ්‍යාසයේ එක් වැදගත් අංගයක් විය. උඩින් පල්ලෙන් යමක් ලියා ගෙන ආ සිසුන්ට, ගැහැණු පිරිමි භේදයකින් තොර ව, "මීහරකුන්ට" මෙන් බැණ වදී. මේජර් සර්ගේ බැණවැදීමට *"බෆලෝ"* යන වචනය යොදා ගත්තේය. දිනපතා සවස තුනට පාසල ඇරුණු ගමන් ම නේවාසිකාගාරයෙට යන මම, තේ පානය කළ වහා ම ඒ ඒ වචනවල තේරුම් සොයා ගෙන, වාක්‍ය ගොඩනඟා ගෙදර වැඩ අවසන් කළ පසුව, සෙල්ලම් කිරීමට ගියෙමි. කෙසේ හෝ, බැණුම් අහන්නේ නැතිව *"ජාම් බේරා ගැනීමට"* කටයුතු කළ මට, විභාගය කිට්ටු වන විට දිනක් එතුමා පන්තියේ දී සමාලෝචනයක් කරමින් කියා සිටියේ, " උඹ කොහොම හරි ගොඩ ඒවි" වැනි දෙයකි. මෙය මට මහත් අස්වැසිල්ලක් මෙන් ම ධෛර්යක් ද වූයේය. ඒ වසරේ අපේ පන්තියේ සිටි සිසුන් වූයේ, ජයවර්ධන, බංඩාර, ගුණසේන, සිරිසේන, සූසරත්න, රංබණ්ඩා, ආරියපාල, රත්නසේකර, රාජපක්ෂ, ඒකනායක, කරුණාධිපති යන පිරිමි සිසුන් සහ සුමනා විජේසිංහ, එච්.ඒ.සී.ඩී. පෙරේරා, ප්‍රඥාවතී, සීලවතී, අමරා රත්නායක යන ගැහැණු ළමුන්ය. මේ අය අතරින්, 1949 වසරේ දෙසැම්බර් එස්.එස්.සී. විභාගය සමත් වූයේ බංඩාර, ජයවර්ධන, ආරියපාල, සුමනා විජේසිංහ හා එච්.ඒ.සී.ඩී. පෙරේරා යන පස් දෙනා පමණයි. මේ ප්‍රතිඵල, 1950 මාර්තු මාසයේ දී *"ඩේලිනිව්ස්"* පුවත්පතේ පළවී තිබිණි. එක් විෂයකින් පමණක් අසමත් වූ කීප දෙනෙක් වූහ. බංඩාර විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියට ඉගෙනීම සඳහා *මහනුවර ධර්මරාජ විද්‍යාලයට* ගියේය. *එච්.ඒ.සී.ඩී. පෙරේරා මෙනෙවිය* ගුරු පත්වීමක් ලබා ගෙන *උලපනේ* පාසලක ඉගැන්වීමට ගියාය. *සුමනා විජේසිංහ, ජයවර්ධන* හා *ආරියපාල* යන අප තිදෙනෙක් විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ ඉගෙනීමට රැඳී සිටි නමුත් එය ඵලදායක නොවීය. ටික කලකට පසුව ජයවර්ධන මහනුවර සිල්වෙස්ටර් විද්‍යාලයට ඇතුළු වී වැඩිදුර ඉගෙනීම කරගෙන ගියේය. මම 1950 සැප්තැම්බර් 12 දින රැකියාවක් සොයා ගැනීම සඳහා අස් වී ගියෙමි. මේ කාල පරිච්ඡේදය තුළ මගේ ජීවිතයේ වෙනත් නොයෙක් ක්‍රියාකාරකම් රාශියක් තව දුරටත් විස්තර කිරීමට ඉතිරි ව තිබේ.

වලල මධ්‍යම පාසලේ ම සයවැනි පන්තියේ සිට ඉගෙන ගෙන, 1949 වසරේ ජ්‍යෙෂ්ඨ විභාගයට ඉදිරිපත් වූයේ අප පන්තියේ කණ්ඩායමයි. වෙනත් පාසල්වලින් පැමිණ ඉහළ පන්තිවලට සම්බන්ධ වී සිටි වැඩිහිටිභාවයෙන් යුත් සිසුන් කණ්ඩායමක්, 1948 වසරේ දී ජ්‍යෙෂ්ඨ විභාගයට ඉදිරිපත් වූහ. ඒ අය අතර, *ආර්.එම්. රත්නායක, සී. රත්නායක, ගුණතිලක, ජිනසේන, සිල්වා, රණසිංහ, නෙල්සන් පෙරේරා, යසපාල, සමරජීව* යන පිරිමි අය ද *මංතිලක* නම් ශිෂ්‍යාවක් ද වූහ. ඒ සියලු දෙනා විභාගයට පෙනී සිටීමෙන් පසුව පාසල හැර ගියහ.

හැරවුම් ලක්ෂයක්

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට අප පෙනී සිටියේ 1949 දෙසැම්බර් මාසයේ දී ය. එහි ප්‍රතිඵල නිකුත් වූයේ 1950 මාර්තු මාසයේ දී ය. ඒ විභාගයෙන් සමත් වූයේ පස් දෙනෙක් පමණි. ඒ අතරින් *එයි.එම්.ඩබ්ලිව්. බණ්ඩාර* විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට ඉගෙනීමට මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළු විය. *එච්.ඒ.සී.ඩී. (චිත්‍රා) පෙරේරා* ගුරු පත්වීමක් ලබා ගැනීමට පාසලෙන් අස්වූවාය. පාසලේ ඉතිරි වූයේ *ඒ.ඩබ්ලිව්.ජයවර්ධන, සුමනා විජේසිංහ, ඒ.ආර්.එම්. ආරියපාල* යන අප තිදෙනාය. අප *විදුහල්පති පලීපාන* මහතා අපට කීවේ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාග / විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියක් ආරම්භ කිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා තුරු පාසලේ රැඳී සිට, ඒ සඳහා ඉගෙනීම් කරගෙන යන්නටය. ඒ අනුව අප තිදෙනා ම කලක් ඒ සඳහා ගත කළෙමු. එනමුත්, අපට ඒ දිනවල ඉගැන්වීමට පැමිණියේ සිංහල විෂයය භාර *මන්තිලක ගුරුතුමා* පමණි. අතරින් පතර විදුහල්පතිතුමා භූගෝල විද්‍යාව ඉගැන්වීමට පැමිණියේය. එනමුත්, එතරම් ඵලදායක යමක් සිදු නොවූයෙන්, *ජයවර්ධන* පාසලෙන් අස්වී *මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයට* ඇතුළු විය.

1950 අගෝස්තු පාසල් නිවාඩු කාලයේ දී මම ගෙදර ගියෙමි. මේ වකවානුවේ අප පදිංචි ව සිටියේ මිණිපේ ගොවි ජනපදයේ හඳගනාව අසල විසි එකේ ඇලේ ගොඩ ඉඩමේය. නිවාඩු කාලයේ එක් දිනක් උදෑසනින් ම, කුමන හෝ හේතුවක් නිසා, අප්පච්චී මට දොස් කියා කුඹුරට ගියේය. මේ ගැන මහත් සේ හිත් තැවුලට පත් වූ මම, ගෙදරින් පිට වී යෑමට *තීරණය කළෙමි.* අප්පච්චීගේ ට්‍රන්ක පෙට්ටිය විවෘත කර (යතුර නොවූයෙන් ඇණයකින් ගසා එය විවෘත කළෙමි), එහි තුළ තිබූ ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් සඳහා වූ මගේ පාස්පොත සහ රුපියල් දහයක් ගෙන ගෙදරින් පිටවීමි. අම්මා සහ අක්කා මා වැළකීමට වෙර දැරූ නමුත්, තදින් ම හිතුවක්කාර වූ මා, ඒ කිසිවෙකුට කන්දුන්නේ නැත. අතුරු පාරක් දිගේ සැතපුම් පහක් පමණ දුර පයින් ම *වේරගන්නොටට* පැමිණ, *මහනුවර* යන බස්රියකින් *වලලට* ගියෙමි.

එහි ගිය මා, අපගේ නේවාසිකාගාරයේ සේවක *හීංබණ්ඩා* මුණ ගැසීමට ගියෙමි. ඊළඟට *ගුරුකුඩුවේ* තැපැල් කාර්යාලයට ගොස් මගේ පාස් පොතෙන් රුපියල් පනහක් ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍රයක් පුරවා තැපැල් මහතාගේ නිර්දේශය සහිත ව වත්තේගම ලොකු තැපැල් කන්තෝරුවට ගොස් මුදල් ලබා ගතිමි. මේ ආකාරයට සතියකට රුපියල් පනහ බැගින් වාර කීපයක් ම මුදල් ලබා ගෙන, ආහාරපානාදියට අවශ්‍ය වියදම් පියවා ගතිමි. රාත්‍රිය ගත කළේ නේවාසිකාගාරයේය. දිනක් රෑ බෝවී එහි පැමිණි විට, *හීංබණ්ඩා* එහි නොසිටි නිසා, අසල තිබුණු වියන ලද පොල් අත්තක්

ඉස්තෝප්පුවේ එලා එදා රෑ ඒ මත නිදාගතිමි. වරක් හීංබණ්ඩා මා ඔහුගේ නිවසට එක්කර ගෙන ගොස් ආහාර වේලක් මට දුන්නේය. මේ කාල පරිච්ඡේදය මහනුවර ඇසල පෙරහැර පැවති නිසා දිනකීපයක් ම පෙරහැර බැලීමට ද ගියෙමි. මේ අතරතුර, රැකියාවක් සොයා ගැනීමට ගම්පොල හා නුවරඑළිය නගරවලට ද ගියෙමි. ඒ ප්‍රයත්න සාර්ථක නොවීය. පළමුවරට නුවරඑළියට ගිය මා, එහි ඇති සීතලෙන් වෙව්ලන්නට වූයෙන්, තේ කඩයකට ගොස් උණුසුම් යමක් පානයට ඉල්ලූ විට, අරක්කු වීදුරු භාගයක් මට දුන්නේය. එය පානය කළ මට ඇඟට හා හිසට නුහුරු යමක් දැනුනෙන්, නැවත මහනුවර යන බසයකට නැඟී ආපසු ගියෙමි. එදින පෙරහැර පටන් ගැනීමට පෙර මහනුවරට පැමිණියෙමි. පෙරහැර බලා නේවාසිකාගාරයට ගියෙමි. මේ ආකාරයට දින දහයක් පහළොවක් පමණ ගත විය.

එක් දිනක *වලල* හන්දියට යන විට, අපේ නෑ කෙනෙකු වූ *පල්ලේවෙල අබේරත්න අයියා* මුණ ගැසිණි. ඔහු මා හමුවන බලාපොරොත්තුවෙන් පැමිණි බව කීවේය. අපේ අම්මා මා ගැන නිතර මතක් කරමින් ඉතා කණගාටුවෙන් ඉන්නා බව කියා, මට ගෙදර යන්නට බැරි නම් අයියලාගේ ගෙදරටවත් යන ලෙස මගෙන් ඉල්ලා සිටියේය. මීට දවසකට දෙකකට පසුව වේරගංතොට බසයකින් ගොස් මහියංගණයට යෑම සඳහා මහවැලි ගඟ හරහා යන ඔරුවකින් ගඟ මැදට යන විට, එගොඩ ගං ඉවුරේ අප්පච්චී ඉන්නවා දුටුවෙමි. පැන නඟින කුමන තත්ත්වයකට වුවත් මුහුණ දීමට හිත හදා ගෙන, ඔරුව එගොඩ ඉවුරට ළඟා වූ විට එයින් බැස අප්පච්චී සිටි තැනට ගියෙමි. මම යන්නේ කොහේ දැ'යි විමසූ විට, අයියලාගේ ගෙදර යන බව කීවෙමි. අයියා ඉන්නේ කොහේ දැ'යි නැවත මගෙන් ඇසීය. *'පෝටාවේ'* යැයි මගේ පිළිතුරට අප්පච්චී කියා සිටියේ, අයියලා මහියංගණයට ඇවිත් සිටින බවය. මා ද කැටුව අප්පච්චී මහියංගණ තානායම වෙත ගියේය. අයියා රාජකාරී කටයුත්තක් සඳහා, පෝටාවේ සිට සිය පවුල ද සමඟ මහියංගණයට පැමිණ, එහි තානායමේ නවාතැන් ගෙන සිටියේය. අප්පච්චී හමු නොවුණා නම් මා එදින පෝටාවට ගොස් අතරමං වීමට තිබිණි.

අප දෙදෙනා තානායමට යන විට දවල් කෑම වේලාව පසුවෙමින් තිබිණි. මා දුටු අයියා, මා ආගිය තොරතුරු කිසිවක් නොවිමසා දිවා ආහාරයට ආරාධනා කළේය. තානායම් භාරකරු එය සූදානම් කළ පසුව, ආහාර ගන්නා අතරතුර, *උඩත්තව පාසලේ* ඉංග්‍රීසි ගුරු පුරප්පාඩුවක් තිබෙන බව එම පාසලේ මුල් ගුරුතුමාගෙන් දැන ගත් බවත්, කැමති නම් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් යවන ලෙසත් අයියා කියා සිටියේය. මේ කතාබහ නිසා, මගේ හිතේ තිබුණ සැක සංකා නැති විය. දිවා ආහාරයෙන් පසුව අප්පච්චී සමඟ *හඳගනාවේ* අපේ ගෙදර ගියෙමි. අම්මා ඇතුළු අපේ පවුලේ අයට මගේ ආපසු පැමිණීම ඉමහත් සතුටට හේතු වූ බව පෙනිණි. ගෙදරින් "පැනගොස්"

මා ආගිය තැන් හෝ කළ කී දේ ගැන කිසිවක් විමසුවේ නැත. මෙය මට මහත් අස්වැසිල්ලක් විය. එනමුත් මේ කාරණය හා එයට අදාළ සිද්ධි මාලාව මගේ ජීවිතේ එක් වැදගත් හැරවුම් ලක්ෂයක් වූ බවට සැකයත් නැත.

පාසල් නිවාඩුව අවසන් වූවාට පසුව, නේවාසිකාගාරයට ගොස් නැවත සුපුරුදු පාසල් ගමන ආරම්භ කළ නමුත්, දැන් අපේ පන්තියේ සිටියේ මාත් *සුමනා විජේසිංහ* අක්කාත් පමණය. ඒ වන විට ජයවර්ධනයන් ද සිල්වෙස්ටර් විදුහලට ගොසිනි. ටික දිනක් ගත වන විට මට අවබෝධ වුණේ මෙසේ කාලය ගත කිරීම නිෂ්ඵල දෙයක් බවය. ඒ නිසා, 1950 සැප්තැම්බර් මස 12 දින *විදුහල්පති පලීපාන මැනිතුමා* හමු වී මට අස්වීමට අවශ්‍ය බව කීවෙමි. අස්වන්නේ මක්නිසා දැ'යි විමසූ විට මාගේ පිළිතුර වූයේ, රැකියාවක් සොයා ගැනීමට බවයි. වැඩිපුර කතාබහ කිසිවක් නොමැති ව පාසල් හැර යාමේ සහතිකය ටයිප් කර අත්සන් තබා පාසලේ තිබුණ මගේ වෙනත් ලිපිලේඛන සමඟ මට දුන්නේය. විදුහල්පතිතුමාගෙන් සමුගත් මා, පාසලේ අනෙක් ගුරුවරුන්ගෙන් ද සමුගෙන එදින නේවාසිකාගාරයට පැමිණ, පසුදා උදෑසන මගේ ට්‍රන්ක පෙට්ටිය ද රැගෙන *මිණිපේ* ගියෙමි.

පසු කාලයේ දී මට දැනගන්නට ලැබුණ තොරතුරු අනුව, ශිෂ්‍යත්වලාභියෙකු විශ්ව විද්‍යාලයට ගියත් එහි ප්‍රතිලාභ දිගට ම ලබා ගැනීමට හැකියාව තිබිණි. අපේ පාසලේ විශ්ව විද්‍යාල ප්‍රවේශයට අනුමත වූ පන්තියන් නොතිබුණත් සැතපුම් හතක් එහා *නුගවෙල* පාසලේ ඒ සඳහා පහසුකම් තිබිණි. *වැලිමඩ* වැනි මධ්‍ය විද්‍යාලවලින් ද නුගවෙලට පැමිණ විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ගත් අය වූහ. අප විදුහල්පති *පලීපාන මැනිතුමා* අප පාසලට මාරු වී ආවේ නුගවෙල සිටය. ඒ නිසා එතුමා ඒ ගැන හොඳින් දැන සිටින්නට ඇත. එහෙත්, ඒ ගැන මට එතුමාගෙන් උපදෙසක් නොලැබුණේ, මා රැකියාවක් සඳහා අස්වී යන බව සඳහන් කළ නිසා දැ'යි නොදනිමි. නිසි මඟ පෙන්නීමට කෙනෙකු නොවූයෙන්, මගේ උසස් අධ්‍යාපනය වසර දහයකින් කල් ගියේය. ඒ ගැන *පලීපාන මැනිතුමා* කෙරෙහි මගේ කිසිම වෛරයක්, කෝන්තරයක් නැත. මක්නිසාදයත්, ඒ අවුරුදු දහය තුළ ජීවිතයේ තවත් අත්දැකීම් රාශියක් ලබා ගැනීමට අවස්ථාව ලැබීම නිසාය. ස්වභාවයෙන් ම උඩඟු ආඩම්බරකාර මට කිසිම බාධාවක් නැති ව උසස් අධ්‍යාපනය ලබා උසස් තනතුරකට යන්නට ලැබුණා නම්, අතිශයින් අහංකාර මිනිසෙකු වන්නට ඉඩ තිබිණි. එයින් මට හෝ සමාජයට යහපතක් නොවීමට ද ඉඩ තිබිණි. ඒ නිසා, *පලීපාන මැනිතුමනි,* ඔබතුමා මට කළේ මහත් ලාභයකි.

අපේ අයියා



අපේ අයියා

මගේ ගැටවර වියේ දී මා සම්බන්ධයෙන් වූ තවත් කරුණක් ගැන විස්තර කළ යුතු ව ඇත. මා උපන් 1933 වර්ෂයේ බිංතැන්නේ රටේ මහත්තයාගේ ලිපිකරු වශයෙන් මගේ එක කුස උපන් වැඩිමහල් සොහොයුරා (අයියා) සේවයට ගියේය. මගේ ළමා කාලයේ දී *ප්‍රාදේශීය ආදායම් නිළධාරී (ඩියාරෝ)* ක්‍රමය ආරම්භ වීමත් සමඟ අයියා බිංතැන්නේ ඩියාරෝ කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු (සී.සී.) ලෙස සේවය කළ අතර, එම කාර්යාලය *ඇකිරියන්කුඹුරට* ගෙන ගොස් තිබිණි. ටික කලකට පසුව එය *පෝටාව* නම් ස්ථානයට ගෙන ගොස් තිබේ. බිබිලේ සිට මහියංගණය යන පාරේ සැතපුම් හයක් පමණ දුරින් පෝටාව පිහිටියේය. පෝටාවේ සිට මහියංගණය දෙසට සැතපුම් දෙකක් ගිය තැන *උෆරණිය* පිහිටා ඇත. එහි රෝහලක් සහ තැපැල් කාර්යාලයක්, පාසලක් විය. බදුල්ලේ සිට යන බසය, සවස් වරුවේ *පෝටාව, උෆරණිය, ආදා උල්පත* යන තැන් පසු කොට ගොස් *හද්දන්නා ඔයේ* නවතා තබා, පසුදින උදැසන ආපසු ගියේය එතැන සිට මහියංගණයට පාරක් කපමින් තිබිණි. එනමුත් බස් රථ ගමන් කළේ නැත.

වරක් අයියා ගමේ සිට මහියංගණයට පැමිණ පෝටාවට යන ගමනට මා ද එකතු විය. එදින අයියාගේ බිරිඳ (නන්දා අක්කා) සහ ළදරු දියණියක් ද සිටි නිසා, මහියංගණයේ සිට *හද්දන්නා ඔය* දක්වා ගමනට බර කරත්තයක් සූදානම් කර ගෙන අක්කාත් දුවත් එහි වාඩි කරවා ගෙන, හද්දන්නා ඔයේ සිටි *ජී.ඩබ්ලිව්.ඊ. ඕවර්සියර්* මහතාගේ නිවසට ගියෙමු. එහි ළඟාවන විට සවස ඇදිරි වැටී තිබිණි. ඕවර්සීයර් මහතා සහ ඔහුගේ බිරිඳ අපට ආහාරපාන සපයා ඉතා හොඳින් සංග්‍රහ කළහ. එදින රාත්‍රියේ එම නිවසේ ගත කොට පසුදා උදැසනින් ම බදුල්ල බලා යන බස් රථයෙන් පෝටාවේ පිහිටි අයියා එවකට පදිංචි ව සිටි ගෙදරට ගියෙමු. ඉලුක් සෙවිලි කර තිබුණ මෙම නිවසේ සාලයක්, කාමරයක්, කුස්සියක් ආදිය විය. ඉස්සරහා ඉස්තෝප්පුව කෙළවර කුඩා කාමරයක් තිබිණි.

පෝටාව කඩපල හා ගම, ගෙවල් හා කඩ දෙක තුනකින් යුක්ත විය. කොරළේ මහත්තයාගේ නිවස මහ පාරට ස්වල්පයක් ඈතින් පිහිටි ඒ ප්‍රදේශයේ හැටියට ලොකු ගෙයක් විය. මහපාරේ අනිත් පැත්තේ ඒ අසලින් ම (ගම්මුලාදෑනි) ආරච්චි මහත්තයාගේ නිවස විය. ඒ වත්තේ ම ටිකක් ඇතුළට වන්නට *ඩියාරෝ කාර්යාලය* හා නිල නිවස තිබිණි. ආරච්චි මහත්තයාගේ ගෙදරට ඉස්සරහින් මහපාරේ අනිත් පැත්තේ සමූපකාර කඩය පිහිටියේය. තවත් කඩ දෙකක් විය. ඉන් එකක් ආරච්චි මහතාගේය. අනික කන්දයියා නම් වූ බිබිල ප්‍රදේශයේ පදිංචි කෙනෙකුගේ කඩයයි. මේවා එකිනෙකින් ටිකක් ඈතින් මහපාර අයිනේ පිහිටා තිබිණි. කන්දයියාගේ කඩේ ළඟින් වත්තක් ඇතුළට යාර පන්සීයක් පමණ ගිය තැන ගම්සභා කාර්යාලය පිහිටා තිබිණි. එම නිවසේ ම රජයේ නිලධාරීන් කීප දෙනෙක් නවාතැන් ගෙන උන්හ. ගම්සභා කාර්යාලයේ ලිපිකරු ගුණසේකර මහතා, සමූපකාර පරීක්ෂක අප්පුහාමි මහතා, ඩියාරෝ කන්තෝරුවේ ලිපිකාර හේරත් මහතා සහ කොඩිකාර මහතා යන අය එම නේවාසිකයෝ වූහ. ඔවුන්ට ආහාරපාන සකසා දීමට තරුණයෙක් සිටියේය. ඔහු මහතුවර *නවයාලනැන්න* ප්‍රදේශයේ කෙනෙකි. මා සමඟ ඉතා කුළුපග වූ මේ තැනැත්තාගේ වාග් මාලාවේ බෙහෙවින් ම තිබුණේ "මෙතැන නැත්නම් වෙන තැනක් " යන්නය. මෙය ඔහුගේ දර්ශනය වූ බව පෙනේ.

පාසල් නිවාඩු කාලවල දී වරින් වර *පෝටාවට* ගියෙමි. වරක් එහි ගියේ *මහියංගණයේ* සිට පයින් ම ය. උදේ මිණිපේ ගෙදරින් පිටත් වී මහියංගණයට පැමිණ, *බිබිල* දෙසට යන කෙනෙක් සිටී දැ'යි *"සෙයියදු"* කඩෙන් විමසා බලා කිසිවෙක් නොවූයෙන්, පඟරගම්මන වෙල හරහා හද්දත්තා ඔය දක්වා වැටී තිබුණ පාරේ හුදකලාව සැතපුම් පහක් පමණ ගියෙමි. මේ කැලෑ පාරේ සමහර විට වල් අලි මුණගැසීමට වුවත් ඉඩ තිබිණි. එනමුත්, වියලි කාලගුණයක් පැවති මේ සමයේ ඒ අවදානම අල්ප විය. හද්දත්තා ඔය දක්වා ගිය පසු, ඔයේ සිසිල් ජලයෙන් මුහුණ හා අතපය සෝදා ගෙන බඩ පිරෙන තරම් දිය බී නැවතත් ගමන ඇරඹුවෙමි. සැතපුම් එකහමාරක් පමණ ගිය විට, *ආදාඋල්පත* තේ කඩයක් හමුවේ. හූලං විස්කෝතු හා වේළුණු රෝස් පාන් ගෙඩියක් කා තේ පානයෙන් පසු නැවතත් ගමන ඇරඹුවෙමි. ඊළඟට සැතපුම් හතරක් පමණ ගිය විට, *උගරණිය* හමුවේ. ගුරු පාරක් වූ එය ද කැලෑව මැදින් වැටී තිබිණි. උගරණියට පසුව තවත් සැතපුම් දෙකක් ගෙවා පෝටාවට ළඟා වූයෙමි. දිවා ආහාරයක් ලැබුණේ ඉන් පසුවයි.

තවත් අවස්ථාවක මිණිපේ සිට බයිසිකලයකින් මේ ගමන ගියෙමි. දවස් කීපයකට පසු ආපසු එන ගමනේ දී උදේ පාන්දරින් ම උගරණිය තැපැල් කාර්යාලය වෙත පැමිණ, මහියංගණය තැපැල් කාර්යාලය දක්වා ලියුම් මලු රැගෙන බයිසිකලයෙන් එන තැපැල්කරු සමඟ මහියංගණයට ආවෙමි. එවර

මහියංගණයේ සිට ගිය ගමනේ දී ද උෆරණිය දක්වා ඔහු සමඟ ගමන් කළ බව මතකය. තවත් වරක් තනියම බයිසිකලයෙන් ද පෝටාවට ගියෙමි.

එස්.එස්.සී. විභාගයේ ප්‍රතිඵල ලැබුණ දවසේ ඒ බව දන්වා අයියාට විදුලි පණිවිඩයක් යැවීමි. මට රුපියල් පහළොවක් එවන ලෙස ද ඒ පණිවිඩයේ සඳහන් කළෙමි. ඉතා ඉක්මනින් ඒ මුදල එවා තිබිණි. මගේ සාමාර්ථය ගැන අයියා සතුටුවීම ගැන කිසිම සැකයක් නැත.

එක් වරක් මෙසේ නිවාඩු කාලයක දී පෝටාවට ගොස් සිටිය දී අයියා මහියංගණයට ගොස් සිටියේය. මහියංගණයේ පොසොන් උත්සවය, ඇසල පෙරහැර ආදී කාලවල දී ඒ ගැන රජය වෙනුවෙන් කටයුතු කිරීම ඩියාරෝ මහතාට පැවරී තිබුණ රාජකාරියකි. ඒ නිසා, ඒ අවස්ථාවල අයියා ද දින කීපයක් එහි ගතකිරීම සිදුවේ. අයියාගේ කුඩා දියණිය (කළ්‍යාණී) ට ඇස්රුදාව සෑදීම නිසා මහත් අසීරුතාවකට පත් ව සිටි නන්දා අක්කා, මහියංගණයට එන ලොරියකින් දියණියත් මාත් සමඟ මහියංගණයට පැමිණියාය. අතිශය වියළි කාලගුණයක් පැවති ඒ දිනවල ඇස් රුදාවෙන් පෙළෙන දරුවා අස්වැසිල්ලක් නැති ව අඬමින් සිටි නිසා, මේ ගමන ගැන නිතර මතක් වේ. තවත් වරක පෝටාවේ ගොස් සිටින විට අයියාගේ මාස දහයක් පමණ වයස් වූ (ජී.බී) පුතාට නිව්මෝනියාව වැළඳී සිටියේය. ඒ සඳහා උෆරණියේ දොස්තර මහතා ප්‍රතිකාර කළේය. පැලැස්තරයක් දැමීමට අවශ්‍ය බෙහෙතක් සැතපුම් දෙකක් පමණ ඈතින් වූ හෑපොල නම් ස්ථානයේ කඩයකින් ගෙනැවිත් දුන්නෙමි. රැකියාවක් සොයමින් සිටි මා, වරක් අයියාගේ බයිසිකලයෙන් බිබිල බදුල්ල පාරේ යල්වෙල නම් තැනකට ගොස් එහි සමූපකාරයේ රැකියාවක් ගැන සොයා බැලුවෙමි. එය සාර්ථක වූයේ නැත. එදින ආපසු අයියලාගේ ගෙදර යන විට රෑ අටට පමණ වී තිබිණි.

බිංතැන්න කොඨාශයේ සේවය කළ කාලය තුළ අයියාට සිටි ප්‍රධානීන් අතර *මඩුගල්ලේ රටේ මහත්තයා* සහ *ඩියාරෝ මහතුන්* වන *අලවත්තේගම, එම්.බී. රත්නායක, විමලරත්න කුමාරගම* යන මහතුන් වූ බව දැන ගතිමි.

අපේ අයියා ගැන මේ තොරතුරු සඳහන් කළේ අයියා හා මා අතර තිබුණ බැඳීම සුළු වශයෙන් හෝ පැහැදිලි කිරීමටයි. මගේ එක කුස උපන් එක ම සහෝදරයා මගේ දියුණුව ගැන සතුටින් බලා සිටි කෙනෙකි. නොමඟ ගිය අවස්ථාවල කරුණාවෙන් දයාවෙන් නිසි මඟ පෙන්නා දීමට මට සිටි එක ම මාර්ග දේශකයා අයියාය. මේ අතින් අප්පච්චීටත් වඩා අයියා මට උපකාර විය. ගෙදරින් "පැනගොස් " සිට අයියලාගේ ගෙදර යෑමට මහියංගණයට පැමිණියේ ද මේ බැඳීම නිසාය. පෝටාවෙන් පසුව බිංතැන්නේ ඩියාරෝ කන්තෝරුව මහියංගණයට ගෙන ගියාට පසුව අයියා එහි යෑම නිසා ගමන් බිමන් වඩා පහසු විය. 1953 වසරේ දී පමණ අයියා අපේ උපන්ගම් පළාතේ

උඩුදුම්බර සියාරෝ කාර්යාලයට මාරුවීමක් ලබා ගත්තේය. තවත් කලකට පසුව මහනුවර කච්චේරියට මාරු වී ගොස් විශ්‍රාම යන තෙක් එහි සේවය කළේය. ඉන්පසුව අයියා කලින් දැන හැඳින සිටි *නිශ්ශංක විජේරත්න* මහතා දළදා මාලිගාවේ දියවඩන නිලමේ තනතුර දරණ යුගයේ, දළදා මාලිගාවේ යම් තනතුරක් දැරූ බව දනිමි. 1985 වසරේ දී අභාවයට පත්වන තුරු අයියා දළදා මාලිගාවේ තනතුර දැරුවේ යයි සිතමි.

04 තරුණ විය

වලල මධ්‍යම පාසලට ඇතුළු වී, 1945 මාර්තු මාසයේ දී ද්විතීය අධ්‍යාපනය අරඹා, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්වීමෙන් පසුව, විශ්ව විද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් මාස කිහිපයක් ඒ පන්තියේ ද ගත කොට, 1950 සැප්තැම්බර් 12 දින වලල මධ්‍ය විද්‍යාලයෙන් අස්වුයෙමි. පාසල විද්‍යාලය වූයේ කෙසේ ද? එවකට තිබුණ පිළිගැනීම අනුව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට සිසුන් ඉදිරිපත් කොට සාර්ථක ප්‍රතිඵල ලබා ගත් පාසලක් විද්‍යාලයක් සේ හැඳින්වීමට පුළුවන. ඇත්ත වශයෙන් ම වඩාත් ම උචිත වූයේ විශ්ව විද්‍යාල ප්‍රවේශයට ද සිසුන් සාර්ථක ප්‍රතිඵල ලබාගත් විටයි. වර්තමානයේ නම් ප්‍රාථමික පාසල හඳුන්වන්නේ ද විද්‍යාලය ලෙසය. දැනුම ලබා දෙන තැනක් විද්‍යාලයක් නම්, කුමන පාසලක් වුව ද විද්‍යාලයක් ලෙස හැඳින්වීම වරදක් නොවේ.

පාසලෙන් අස්වී මා ගියේ එයට ඇතුළු වීමට පිටත් වී ගිය අපේ ගමේ ගෙදරට නොවේ. එය පිහිටා තිබුණේ මගේ උපන් ගම වූ හාල්යාලේය. එනමුත් මා පාසලෙන් අස්වන අවස්ථාවට වසර කීපයකට කලින් අපේ පවුලේ සියලු දෙනා ම *මිණිපේ* ගොවි ජනපදයේ අප්පච්චිට ලැබී තිබුණු *විසි එකේ ඇලේ* තිස්තුනේ ඉඩමේ වෙන්කර තිබූ ගොඩ ඉඩමේ ඉදිකර තිබූ නිවසේ පදිංචියට ගොස් සිටියහ. අපේ ගෙදර යනවාය, කියා මා ගියේ මිණිපේ ගෙදරටයි. එය පිහිටි ඉඩම අක්කර තුනක් විය. මිණිපේ මහ ඇලට මායිම් ව ඊට ඉහළින් පිහිටා තිබිණි. එහි වතුර නැවැත්වූ විට අසල ළිඳක් තිබිණි. පානීය ජලය ලබා ගත්තේ ඒ ළිඳෙනි. වැසි සමයේ දී නිවස අසල ම ළිඳක් හාරා ගෙන තිබිණි. අපේ කුඹුරු ඉඩම පිහිටා තිබුණේ සැතපුමක් හමාරක් ඈතින් මහඇලෙන් බෙදී යන විසිඑකේ ඇලේ ටික දුරක් යන විටය. කුඹුර අක්කර පහක් හෙවත් වී දහ පැලක් විය. කුඹුරේ ඉස්මත්තේ හොඳින් ඉදි කළ පැලක් තිබුණේය. කුඹුරු වැඩ දිනවල ආහාර සැකසීමාදිය සඳහා ද, රාත්‍රියේ දී නැවතීමට අවශ්‍ය නම් ඒ සඳහා ද, මේ පැල යොදා ගත්තේය. කුඹුරේ සිටින විට අතුරු ඇලෙන් දිය නෑමට හැකි විය. එහි තිබුණ දිය

බස්නාවක් (ෆෝල් එකක්) අසල වූ උල්පතකින් පානීය ජලය ලබා ගත්තේය. අපේ ගමෙන් ගිය පවුල් දෙකකට අයත් කුඹුරු අපේ කුඹුරට මායිම් ව තිබිණි. එකක් අපේ බාල හීං අප්පච්චීගේ කුඹුරයි. එයට අයත් ගොඩ ඉඩම සහ නිවස අපේ ගොඩ ඉඩමට මායිම් ව තිබිණි. මේ නිසා අප ගමෙන් පිට වී ඈත පෙදෙසකට ගිය නමුත් හුදකලා වූයේ නැත.

මිණිපේ ගියාට පසුව, නේවාසිකාගාරයේ දී තිබූ ආහාර අහේනිය අවසන් විය. කළයුතු යමක් නොමැති ව ටික කලක් ගත කිරීමට සිදුවිය. උදේට අවදි වී ආහාරයෙන් පසුව, කඩපලට ගොස් පුවත්පතක් බැලීම හෝ කඩපලේ මිනිසුන්ගේ කතාබහ අසා ගෙන සිටීම වැඩි වශයෙන් ම සිදුවූවකි. සමහර දිනවල කුඹුරට ද ගියෙමි. එනමුත් එහි ද කළයුතු යමක් නොවීය. මේ දිනවල ගුරු පත්වීමක් ලබා ගැනීමට කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට හා මහනුවර අධ්‍යාපන නිලධාරි කාර්යාලයට ඉල්ලුම් පත් යැවිමි. වරක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ *වැල්ලව* පාසලකට ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස පත්වීමක් දීමට තෝරා ගෙන ඇති බව දන්වා ලිපියක් ලැබුණ නමුත්, ටික දිනකට පසුව ඒ පත්වීම අවලංගු කළ ලිපියක් ලැබිණි. මහනුවර ගිය අවස්ථාවක ස්විස් හෝටල් ගොඩනැඟිල්ලේ පිහිටා තිබූ අධ්‍යාපන කාර්යාලයට ගොස් එහි ප්‍රධාන අධ්‍යාපන නිලධාරිතුමා (ඊ.ඕ) හමු වී ගුරුපත්වීමක් සඳහා ඉල්ලුම්පතක් භාර දුනිමි. එයට සාර්ථක පිළිතුරක් ලැබිණි. 1951 ජනවාරි 15වෙනි දා සිට *උඟරුගල* (වර්තමාන මැද මහනුවර) කනිෂ්ඨ පාසලේ වැඩ බලන ඉංග්‍රීසි සහායක තනතුරකට පත් කළ බව දන්වා තිබිණි. මේ ලිපිය මට ලැබුණේ 1951 ජනවාරි මාසයේ දී යයි සිතමි. එසේ වුව ද, එතෙක් මා නිරත වූ වැඩ කටයුතු ගැන ද මෙහි සඳහන් කළ යුතු ව තිබේ.

ගොවිතැන් කිරීම

දෙසැම්බර් මාසයේ දී මාස් කන්නයට කුඹුරු වැඩ ආරම්භ කරන ලදී. මේ දිනවල තද වැසි ද පැවතිණි. අප්පච්චී කුඹුරේ වැඩට යන විට මම ගෙදරට වී සිටීම සුදුසු නොවන බව සිතා මමත් කුඹුරේ වැඩට යා යුතු යැ'යි තීරණය කළෙමි. අපේ අප්පච්චී කුඹුරු වැඩට පිවිසියේ වයස අවුරුදු දහහතරේ ගැටවර වියේ දී යයි අසා තිබිණි. මේ වන විට වයස අවුරුදු දහඅටකට කිට්ටු වී සිටි තරුණයෙකු වූ මට කුඹුරු වැඩ බැරි වීමට හේතුවක් නොවීය. ළමා කාලයේ දී උපන් ගමේ සිටියදීත් උදළු කෙටියක් ගෙන කුඹුරේ වැඩට ගිය මට කුඹුරට බැසීමට බාධාවක් නොවීය. ඒ නිසා, මෙම මාස්කන්නයේ දී අප්පච්චී සමග වැඩට බැසීමි. පළමු දවසේ තද වර්ෂාව පැවති නිසා, වැඩ අවසන් වී දිය නා ගෙදර යන විට දැඩිසේ විඩාවට පත් වී සිටියෙමි. ඒ යන විට අම්මා මගේ තත්ත්වය තේරුම් ගෙන, ගිනි ගොඩක් අවුලා ඇඟපත වේලා ගැනීමට සලසා දුන්නාය. මෙසේ මෙම මාස් කන්නයේ

වැඩි හරියක් කුඹුරු වැඩෙහි නිරත වී සිටි මට, වැඩට සහභාගි වූ අන් වැඩිහිටියන්ගේ කතාබහ අතරින් "ඉගෙන ගත්තේ කුඹුරු කොටන්න දැ'යි" වැනි ප්‍රශ්නවලට මුහුණ දීමට ද සිදුවිය. ඒ අයගේ මතයේ හැටියට, පාසල් ගොස් යමක් ඉගෙන ගත් කෙනෙක් කුඹුරු වැඩ කළ යුතු නොවේ. එනමුත්, මට එය ගැටලුවක් නොවීය. දැඩි මතධාරියෙක් නොවුණා නම්, මේ අයගේ කතා නිසා මා කුඹුරෙන් ගොඩට තල්ලුවීමට ඉඩතිබිණි.

ගුරුසේවය

කෙසේ වෙතත්, කුඹුරෙන් මා එළියට දැම්මේ ඉහත සඳහන් කළ ගුරුපත්වීමයි. *උඟුරුගල* පාසලට ලැබුණ ගුරුපත්වීම නිසා, 1951 ජනවාරි මස 14වැනි දින උඟුරුගලට ගියෙමි. ගෙවත්තෙන් කඩා ගත් එළවලු ටිකක් ද කොට්ට උරයකට දමා ගෙන, අප්පච්චි ද මා සමග ගමනට පැමිණියේය. මහනුවර යන බසයකින් උඟුරුගලට ගිය අප දෙදෙනා, කනිෂ්ඨ පාසලේ *ප්‍රධානාචාර්ය සමරසේන* මහතාගේ නිවස සොයා ගියෙමු. සමරසේන මහතා අප පිළිගෙන, පාසල අසල තිබෙන ගුරුවරුන් කිහිප දෙනෙකු නිවැසි නවාතැනට යන අයුරු විස්තර කළේය. ඒ අනුව, උඟුරුගල කඩපලට හා මහපාරෙන් පහළට බැස වෙල මැද පිහිටි පාසල් භූමිය අසල තිබුණ නිවසක් වෙත ගියෙමු. එම නිවාසයේ ගුරුවරු තිදෙනෙක් නේවාසික ව උන්හ. *ප්‍රනාන්දු මහතා* ප්‍රාථමික පාසලේ ගුරුවරයෙකි. *පොන්නයියා මාස්ටර්* ප්‍රාථමික පාසල යටතේ පාලනය වූ දෙමළ අංශයේ ගුරුවරයෙකු විය. *මිත්‍රසේන* මහතා කණිෂ්ඨ පාසලේ වඩු කර්මාන්ත ගුරුවරයා විය. මගේ නවාතැන මේ නිවසේ විය. එහි තිබූ බූරු ඇඳක් මට වෙන් කර දෙන ලදී. උදේ ආහාරය හැර දිවා රෑ ආහාරය සඳහා, කඩපල පසුකර ගොස් ළඟාවිය යුතු නිවසකට යා යුතු විය. ඒ නිවසේ ප්‍රාථමික පාසලේ ගුරුවරුන් දෙදෙනෙකු වූ *අත්තනායක* හා *වික්‍රමසිංහ* මහතුන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ලිපිකරු *උඩුවාවල* මහතා ද නේවාසික ව සිටියහ. ආහාර පාන සකසා දීමට තරුණයෙක් එහි සිටියේය. මම නවාතැනේ නවත්වා අප්පච්චි ආපසු ගියේය. තරුණයෙකු ව සිටි මා සමඟ අප්පච්චි උඟුරුගලට පැමිණීමෙන් පෙනී ගියේ මගේ ප්‍රගතිය ගැන එතුමා කොපමණ සතුටින් සිටියා ද යන්නයි. මීට පෙර අප්පච්චි මා එක්කර ගෙන ගියේ ප්‍රාථමික පාසලට බාර දීමට සහ ද්විතීය පාසලට ඇතුළු කිරීමටත් පමණි. රැකියාවකට යන පළමුවන දවසේ ද මා සමඟ ගොස් අප්පච්චිගේ දයාව කරුණාව පෙන්වූ බව හිතාගත හැකිය. මේ හැර මින් පෙර කිසිම අවස්ථාවක අප්පච්චිගේ ආදරයත් කරුණාවත් අපට පෙන්වා නැත.

පසුදින, එනම් 1951 ජනවාරි 15වැනි දින, මගේ පළමුවන රාජකාරි දිනය විය. උඟුරුගල කණිෂ්ඨ පාසලේ පන්ති තුනක් තිබිණි. හයවෙනි පන්තිය භාර ව අදාල විෂයයන් ඉගැන්වූයේ *සමරසේන මහත්මයයි. සමරසේන* මහතා අටවෙනි පන්තිය භාර ව ඒ ඒ විෂයයන් ඉගැන්වූයේය. මට භාර දුන්නේ හත්වෙනි පන්තියයි. ඒ පන්තියට සියලු ම විෂයන් ඉගැන්වීමට සිදු විය. ඉගැන්වීම ගැන කිසිම පුහුණුවක් හෝ පළපුරුද්දක් නොතිබුණු මට, ගුරුවරයෙකුගේ කටයුතු කරන්නට සිදුවූයේ, මගේ ගුරුවරුන් කටයුතු කළේ කෙසේ දැ'යි විටින් විට මතක් කරමිනි. පාඨග්‍රන්ථ ආදිය තිබුණ නිසා, ක්‍රමයෙන් ඉගැන්වීම පුරුදු වූයෙමි. බොහෝ විෂයයන් ඉගැන්විය යුතු වූයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. මට අමාරු ම විෂය වුයේ චිත්‍ර කර්මය ඉගැන්වීමයි.

මෙම පන්තියේ ගැහැණු පිරිමි සිසුන් විසිපහක් පමණ සිටින්නට ඇත. ඒ අතරින් මගේ මතකයට එන කිහිප දෙනෙක් නම්, ප්‍රාථමික පාසලේ ප්‍රධානාචාර්යතුමාගේ දියණියක වූ හේරත්, ප්‍රාථමික පාසලේ ගුරුවරයෙකු වූ අබේසිංහ මහතාගේ මල්ලී සහ නංගී කෙනෙක්, වෑගල පාසලේ ප්‍රධානාචාර්යතුමාගේ පුත් අබේවර්ධන, ඔහුගේ ඥාති සොහොයුරියක හා කඩයක් අයිති ඒකනායක මහතාගේ මල්ලී, තේවත්තක දමිළ ශිෂ්‍යයෙක් යනාදීන්ය. අබේවර්ධන සිසුවා පසු කාලයේ දී තමන්කඩුව වාරිමාර්ග ලිපිකරුවෙකු ලෙස මට මුණගැසුණි.

පාසල් භූමියේ ගොඩනැඟිලි සංකීර්ණයට කනිෂ්ඨ පාඨශාලා ගොඩනැඟිල්ල, ප්‍රාථමික පාසලේ ප්‍රධානාචාර්යතුමාගේ නිල නිවාසය, වඩු කර්මාන්ත ගොඩනැඟිල්ල, දෙමළ පාසල් ගොඩනැඟිල්ල හා ප්‍රාථමික පාසල් ගොඩනැඟිල්ල ද අයත් විය. ප්‍රාථමික පාසල් ගොඩනැඟිල්ල සහ නිල නිවාසය අප කුඩා කාලයේ සෞඛ්‍ය සතිය උත්සවයට එනවිටත් තිබුණ ගොඩනැඟිලියි.

කනිෂ්ඨ පාඨශාලා ගුරු මණ්ඩලය හතර දෙනෙකි. ප්‍රධානාචාර්ය *සමරසේන මහතා,* එම මහත්මිය, වඩු කර්මාන්ත උපදේශක *මිත්‍රසේන මහතා* සහ *මාය.* මාස කිහිපයකට පසුව *'වීරකන්නි'* නම් දෙමළ මහතෙක් ප්‍රායෝගික විෂයයන් ඉගැන්වීමට පත්කර එවන ලදී. පුහුණු ගුරුවරයෙකු වූ එතුමා සමරසේන මහතාට වඩා ප්‍රධානාචාර්ය තනතුරට සුදුස්සෙකු යැ'යි සිතන බව පෙනී ගියේය. දෙමළ අංශයේ *පොන්නයියා මාස්ටර්* සහ *එහාම්බරම්* නම් ගුරුවරියක වූහ. ප්‍රාථමික අංශයේ ප්‍රධානාචාර්ය හේරත් මහතා, එම මහත්මිය, ඉංග්‍රීසි ගුරුවරයා වූ අත්තනායක මහතා, ප්‍රනාන්දු මහතා, වික්‍රමසිංහ මහතා ගුරු මණ්ඩලයේ සාමාජිකයන් වූහ. ටික කලකට පසුව *මැනඳිස්* නම් තරුණ ගුරුවරියක් පැමිණියාය. කනිෂ්ඨ පාසලට තවත් ගුරුවරියක් පැමිණියාය. එතුමිය *තෙල්දෙණියේ කෙනෙකි.*

පෙරවරු අටට පමණ පාසල ආරම්භ වී පස්වරු එකට අවසන් විය. අප දිවා ආහාරය සඳහා ගියේ ඉන්පසුවය. ඒ සඳහා උෆරුගල කඩපලෙන් එහා තිබුණ ගුරු නවාතැනට යන්නට සදුවිය. රෑ කෑම සඳහා ද එහි යෑමට සිදුවිය. අප නැවතී සිටි නිවසේ දී ම උදේ ආහාරයට කිරි වීදුරුවක් හා ආප්ප කිහිපයක් ගත්තෙමු. දවල් දහයට පමණ තේ කෝප්පයක් පානය කළෙමු.

ඉංග්‍රීසි සහායක ගුරු තනතුරට මගේ මාසික වැටුප රුපියල් හැටකි. මා වැඩබලන ගුරුවරයෙකු වූ නිසා, වැටුප ලැබුණේ ඊළඟ මාසයේ දහවෙනිදාට පමණි. මා වැඩ කළ දින ගණන සඳහන් ලේඛනයක් ප්‍රධානාචාර්යතුමා විසින් මහනුවර අධ්‍යාපන කාර්යාලයට යැවූ පසු මගේ වැටුප උෆරුගල තැපැල් කන්තෝරුවට එවන ලදී. ඒ වකවානුවේ මූලික වැටුපට අමතර ව ජීවන වියදම් දීමනාවක් සහ විශේෂ දීමනාවක් ගෙවූ නිසා මාසයකට ලැබුණ සම්පූර්ණ මුදල රුපියල් එකසිය විස්සක් පමණ විය. 1951 ජනවාරි මාසේ දින පහළොවකට මට ලැබුණ මුදල රුපියල් හැත්තෑවක් පමණ විය. මාර්තු මාසයේ වැටුප අප්‍රේල් මස දහවෙනිදාට පමණ ලැබෙන්නට ඇතැ'යි සිතමි. අප්‍රේල් මාසය පාසල් නිවාඩු නිසා වැටුපක් නොලැබිණි. මේ අකාරයට 1951 නොවැම්බර් මස 13වැනි දා දක්වා උප ගුරුවරයෙකු වශයෙන් සේවය කළෙමි.

මේ කාල පරිච්ඡේදය තුළ අනික් ගුරුවරු සමග පාසලෙන් බාහිර ක්‍රියාකාරකම් කීපයක ද නිරත වූයෙමි. පෙබරවාරි මස නිදහස් දින උත්සවය සඳහා අපි කීප දෙනෙක් හුන්නස්ගිරියට ගියෙමු. ගීත කිපයක් ගායනා කළෙමු. උෆරුගල සිට හුන්නස්ගිරියට ගියේ ආවේ කුලී රථයකය. තවත් දිනක් චිත්‍රපටියක් බැලීම සඳහා කුලී රථයකින් මහනුවර නිව් එම්පයර් සිනමා ශාලාවට ගියෙමු. උෆරුගල කඩපලේ තේ පැන් ශාලාවක් පවත්වා ගෙන ගිය, කලින් ටීමේකර් මහත්තයෙකු වූ, ඒකනායක මහතාගේ මංගල උත්සවය සඳහා මැටිදෙනියේ පිහිටි ඔහුගේ නිවසට ගියෙමු. රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා එහි ගිය අපට සංග්‍රහ කළේ වෙන ම කාමරයක දී ය. එම සංග්‍රහ භුක්ති වීඳීමෙන් පසුව වෙලක් ඉහළට වැටී තිබුණ අඩිපාර දිගේ ආපසු පැමිණියේ ඉතා අමාරුවෙනි. පස්වෙනි සිල්පදය කැඩූ දෙවෙනි අවස්ථාව මෙය විය.

මේ වකවානුවේ දී අයියා සිය පවුල සමග උපන් ගමේ පිහිටි අපේ නිවසේ පදිංචියට පැමිණියේය. එම නිවසේ පිරිත් දවසේ මම එහි ගියෙමි. පසුව සති අන්තවල දී ද විටින් විට එහි ගියෙමි. ඒ අවදියේ අයියාට දුවක හා පුතෙකු වශයෙන් දරුවන් දෙදෙනෙක් වූහ. මේ දරුවන් කෙරෙහිත් මගේ දැඩි ඇල්මක් තිබිණි. මාස කීපයකට පසුව අයියා නැවත මහියංගණයේ පදිංචියට ගිය නිසා, ඒ ගමන් නතර විය. වරක් ගමේ ගොස් ආපසු එන විට මාඩුගොඩ කඩයකින් ලොකු ට්‍රන්කා පෙට්ටියක් මිලයට ගෙන උෆරුගලට

ගෙනාවෙමි. කොළඹ යන විට මගේ ඇඳුම් දමාගෙන ගියේ මේ ට්‍රන්කා පෙට්ටියේය.

මා උෆරුගල පාසලේ සේවය කරන කාලයේ දී, රජයේ ලිපිකරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගයක් පැවැත්වුණ නිසා, ඒ සඳහා අයදුම්පත් යැවීමි. 1951 ජූනි 15 දින මහනුවරට පාසලක දී තිබුණ විභාග මධ්‍යස්ථානයක දී ඒ සඳහා පෙනී සිටියෙමි. වැඩි කල් නොගොස් එම විභාග ප්‍රතිඵල නිකුත් විය. මේ විභාග ප්‍රතිඵල රජයේ ගැසට් පත්‍රයේ පළ වී තිබිණි. එයින් මා සමත් වූ බව දැනගන්නට ලැබුණේය. සාමාන්‍ය ලිපිකාර සේවයේ තනතුරට මා පත්කොට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන බව දන්වන ලිපියක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් 1951 නොවැම්බර් 5වැනි දින මා වෙත එවා තිබිණි. 1951 නොවැම්බර් 13 දින ගුරු සේවයෙන් සමුගතිමි. එදින සවස මහනුවර බසයකින් ට්‍රන්කා පෙට්ටිය ද රැගෙන දුම්රිය ස්ථානයට ගියෙමි. කොළඹ දුම්රිය පිටත්වූයේ පසුදා පාන්දර දෙකහමාරට පමණය. එදින රැය නිදිවරමින් ගතකළෙමි.

ලිපිකාර සේවය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ

බදුල්ලේ සිට කොළඹ යන රාත්‍රී තැපැල් දුම්රිය පේරාදෙණිය හන්දියට පැමිණි විට, මහනුවරින් පිටත් ව පේරාදෙණියට යන දුම්රිය පෙට්ටි දෙක තුනක් තැපැල් දුම්රියට අමුණයි. මහනුවරින් පිටත් ව කොළඹට යන්නේ ඒ අන්දමටයි. 1951 නොවැම්බර් 13 දින රාත්‍රියේ මා කොළඹ ගියේ එසේය. පෙරවරු හයයි හතළිස් පහට පමණ මේ දුම්රිය කොළඹ කොටුවට පැමිණේ. 14වැනි දා පෙරවරුවේ දුම්රියෙන් කොළඹ එන බව දන්වමින්, කොළඹ මහලේකම් කාර්යාලයේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සේවය කළ මගේ ඥාතියෙකු වූ *සිරිනාම අයියාට* ලිපියක් එවා තිබිණි. එනමුත්, ඔහු දුම්රිය ස්ථානයට පැමිණ සිටියේ නැත. පාසල් සමයේ අධ්‍යාපන ගමනක දී කොළඹ පැමිණ තිබුණ නමුත් මා කොළඹ ගැන කිසිවක් දැන සිටියේ නැත. සිරිනාම අයියා මගේ අයියා විවාහ කරගෙන සිටි නන්දා අක්කාගේ අයියාය. පෙරවරු නවය පමණ වනතුරු කොටුව දුම්රිය ස්ථානයේ ඉදිරිපිට ඉස්තෝප්පුවේ රැඳී සිටියෙමි. ඒ අතරතුර, විටින් විට කුලීරථකරුවන් හෝ තැරැව්කරුවන් මට යන්ට උවමනා කොහේට දැ'යි කීපවරක් ම මගෙන් විමසූ නමුත් ඔවුනට මා කීවේ, මගේ නෑයෙක් එනතුරු ඉන්නා බවයි. සිරිනාම අයියා එන හැඩක් නොවූ විට මට මතක් වූයේ බොරැල්ලේ *සුමංගලාරාමයයි.* එහි අපේ බාල හීං අප්පච්චිගේ පුතෙක්

හාල්යාලේ ධම්මරතන නමින් මහණ වී සිටියේය. කොළඹ ගැන කිසි දෙයක් නොදත් මට වෙන විකල්පයක් නොවීය. ඒ නිසා, රුපියල් පහක් ගෙවීමට කතිකා කර ගෙන මා *සුමංගලාරාමයට* ඇරලන ලෙස කුලී රථ රියැදුරෙකුට කීවෙමි. කාර් එකට නැඟි මම ඒ අය කොහේ යනවා දැ'යි නොදත් නමුත් පැය භාගයකට පමණ පසුව *සුමංගලාරාමයට* පැමිණියෙමි. මගේ සහෝදර ධම්මරතන හාමුදුරුවෝ එහි සිටියේය.

මෙම පන්සලේ අධිපති ධූරය දැරුවේ අපේ උපන්ගමට අල්ලපු ගමක් වූ *තලගුනේ ස්වාමීන් වහන්සේ* නමකි. මගේ සොහොයුරා උන්වහන්සේගේ ගෝලයෙකු ලෙස පැවිදි වී සිටියේය. ධම්මරතන හාමුදුරුවන්ට මගේ ගැටලුව සඳහන් කළ විට, දවල් දානයට පසුව සිරිනාම අයියා හමුවීමට යාහැකි බව සඳහන් කළේය. මෙය මහත් සැනසිල්ලක් විය. සිරිනාම අයියා හමුවුවත් නොවූවත් තාවකාලික ව මට දැන් නවාතැනක් තිබේය, යන අදහස නිසාය. හාමුදුරුවන් දවල් දානය වැළඳුවාට පසුව මට ද දිවා ආහාරය ලැබිණි. ඉන්පසුව අපේ පොඩිහාමුදුරුවෝ මා *ජයවර්ධනාරාමය* වෙත කැඳවා ගෙන ගියේය. බොරැල්ල හන්දියට ට්‍රෑම් කාර් එකකින් ගොස් කෝට්ටේ පාරේ ජයවර්ධනාරාමය දක්වා බස්රථයකින් ගියෙමු. අපි ජයවර්ධනාරාමයට ගියේ එහි වැඩ විසූ හාල්යාලේ ඉන්දජෝති හිමියන් සමග සිරිනාම අයියා හමුවීමට කොළඹ මහලේකම් කාර්යාලයට යෑමටයි. ධම්මරතන පොඩිහාමුදුරුවෝ එහි යන ආකාරය දැන සිටියේ නැත. *ඉන්දජෝති හාමුදුරුවන්* සමග බසයකින් කෝට්ටේ පාර සිට ලේක්හවුස් දක්වා ගොස් එතැන සිට මහ ලේකම් කාර්යාලයට පයින් ගියෙමු. *වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය* පිහිටා තිබුණේ මහලේකම් කාර්‍යාලයේ බිම් මහලේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ල පසට වන්නටය. සිරිනාම අයියා හමු වූ පසු කාර්යාල වේලාවෙන් පසුව සුමංගලාරාමයට පැමිණෙන බව කීයෙන්, අපි තිදෙනා කොටුවේ යෝක්වීදියේ මිලර්ස් ගොඩනැඟිල්ල අසලට පැමිණ ට්‍රෑම් කාර් එකකින් සුමංගලාරාමයට පැමිණියෙමු.

ඒ කාලයේ කොළඹ පාරවල් කීපයකට මගී ප්‍රවාහනයට ට්‍රෑම් කාර් යොදවා තිබිණි. මගේ පළමු ට්‍රෑම් කාර් ගමන ද එදින සිදුවිය. සිරිනාම අයියා සවස පහට පමණ සුමංගලාරාමයට ආවේය. ඔහු සමග කුලීරථයකින් නාරාහේන්පිට තිඹිරිගස්‍යාය පාරේ අභයාරාම පටුමගේ අංක විස්ස දරණ තැනට ගියෙමි. සිරිනාම අයියා කිතුලගොඩ පවුලට අයත් නිවහනේ "බෝඩිං කාරයෙකු" විය. සෑහෙන විශාල ගෙයක් වූ මෙහි ඉදිරිපස කාමර දෙකක "බෝඩිංකාරයන්" කීප දෙනෙක් නැවතී සිටියහ. ඉදිරිපස ඉස්තෝප්පුවෙන් ඇතුළුවන ඉදිරි කාමරයේ තිදෙනෙක් ද, ඒ කාමරයෙන් ඇතුළුවීමට තිබුණ පසුපස කාමරයේ තිදෙනෙක් ද, වශයෙන් මා සමඟ බෝඩිංකාරයන් හය දෙනෙක් වූහ.

ඉදිරිපස කාමරයේ ඇඳන් තුනක් තබා තිබිණි. *කොළඹ ඩී.සී ප්‍රනාන්දු සමාගමේ ගණකාධිකාරි චන්ද්‍රදාස මහතා*, තැපැල් දෙපාර්තමේන්තුවේ මුදල් ඇණවුම් අංශයේ සේවය කල සමරසේකර මහතා සහ පාසල් ශිෂ්‍යයෙකු වූ සමරසේකර මහතාගේ මල්ලී ගුණදාස සමරසේකර ඉදිරිපස කාමරයේ ඇඳන් භාවිතා කළහ. අනික් කාමරයේ ද ඇඳන් තුනක් විය. සිරිනාම අයියා, තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කළ වනිගසේකර මහතා සහ මම ඒ කාමරයේ සිටියෙමු. කිතුලගොඩ නිවහනට ඉදිරිපසින් පාරේ අනික් පැත්තේ *වොට්මෝර්* සහ *ඩිව්ට්‍රම්* (Dewtrem) නම් ලංසි පවුල් දෙකක් පදිංචි ව උන්හ. අප "බෝඩිමේ" කටයුතු පාලනය කළේ කිතුලගොඩ මහත්මියයි. *කිතුලගොඩ මහතා* තැපැල් දෙපාර්තමේන්තුවේ මුදල් ඇණවුම් අංශයේ සේවය කළේය. එතුමා උදෙන් ම බසිසිකලයෙන් කාර්යාලයට ගොස් ආපසු ගෙදර ආවේ රෝ බෝවීමෙන් පසුවය. අතිකාල වැඩ නිසාය. කිතුලගොඩ යුවලට දරු තිදෙනෙක් වුහ. තුඩා දියණියන් දෙදෙනෙක් හා පුතෙකි. දියණියන් දෙදෙනා විශාඛා විද්‍යාලයේ ඉගෙන ගත්හ. පුතා රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යයෙකු විය. කිතුලගොඩ මහත්මියගේ අම්මා ද එම නිවසේ විසුවාය. ගෙදර වැඩට පිරිමි ළමයෙක් විය. කුස්සියේ වැඩට කාන්තාවන් කෙනෙක් දෙන්නෙක් වී යයි සිතමි. තුන්වේලට ම ආහාර පාන හා කාමර කුලිය සඳහා මාසයකට අය කළේ රුපියල් හැටකි. දිවා ආහාර වේල බයිසිකල්කරුවෙකු මගින් කාර්යාලයට එවන ලදී. ඔහුට මසකට රුපියල් තුනක් ගෙවිය යුතු විය.

1951 නොවැම්බර් 15 දින උදේ *සිරිනාම අයියා* සමග "කාසල්" බස් සමාගමේ බසයකින් බම්බලපිටියට ගොස්, එතැන සිට සවුත් වෙස්ටර්න් බස් සමාගමේ බසයකින් කොටුවේ මහලේකම් කාර්යාලය වෙත ගියෙමු. මේ මුළු ගමනට ම බස් ගාස්තුව කෙනෙකුට සත විසිපහකි. මහලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේ තුන්වෙනි මහලේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත මා එක්කර ගෙන ගිය සිරිනාම අයියා, හවස ආපසු නවාතැනට ඔහු සමග යා හැකි බව පවසා යන්ට ගියේය.

මේ වකවානුවේ වාරිමාර්ග අධ්‍යක්ෂවරයා වූයේ *ඩබ්ලිව්.ඒ ගන්‍රි* නම් සුදු මහතෙකි. නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වූයේ *ඩබ්ලිව්.ටී.අයි. අලහරන්නම්* නමැති දෙමළ මහතෙකි. සහකාර අධ්‍යක්ෂකවරයා *ඒ.ඒසී.ද.එස්. ගුණසේකර* මහතාය. මේ තිදෙනා ම ඉංජිනේරුවරු වූහ. පරිපාලන කටයුතු භාරව සිවිල් සේවාවට අයත් *කුලසේකරම් මහතා* සහකාර අධ්‍යක්ෂ තනතුර දැරීය. *ඒ. වීරසිංහ* මහතා ප්‍රධාන ගණකාධිකාරිවරයා විය. *ෆොන්සේකා, පරරාජසිංගම් හා විග්නරාජා* නම් සහකාර ගණකාධිකාරිවරු තිදෙනෙක් වූහ. *කේ. කනගරත්නම්* මහතා කාර්යාල සහකාර (ඕ.ඒ) වූ අතර, *ජී. එම් ඩිරේක්ස්* නම ලංසි මහතෙක් ප්‍රධාන ලිපිකරු වූයේය. මේ දෙදෙනා ලිපිකාර සේවයට අයත් වූහ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආයතන අංශයේ *ගුණසේන බණ්ඩා* නම් ලිපිකරු මහතෙක් අපගේ විෂය භාර ව කටයුතු කළේය. මා ඇස්තමේන්තු ශාඛාවට අනුයුක්ත කරන බව කී හෙයින් පියුන් මහත්තයෙකු කැටුව ඒ අංශය පිහිටි කාර්යාල කාමරයට ගියෙමි. නිලධාරීන් (ලිපිකරුවන්) විස්සක් විසිපහක් පමණ මෙම කාමරයෙහි උන්හ. ඒ අය ගෙවීම් ශාඛාව, ගිණුම් ශාඛාව හා ඇස්තමේන්තු ශාඛාව යන අංශවලට අයත් වූහ. එකිනෙක අංශයට ප්‍රධාන ලිපිකරුවෙක් විය. ඇස්තමේන්තු ශාඛාවේ ප්‍රධානියා වූයේ ඒ.වී. රත්නරාජ මහතාය. දුරේසිංගම්, පිලිප් අයියා, පීරිස්, තම්බයියා යන අය ඒ ශාඛාවේ අනෙක් ලිපිකරුවෝ වූහ. මේ හැම දෙනා ම වයස තිහ හතළිහ ඉක්ම වූ අය බව පෙනිණි. මේ අංශයේ මේස පේළියේ මැද හරියේ මේසයක් පුටුවක් මට වෙන්කර තිබිණි. එහි වාඩිගෙන සිටින්නට උපදෙස් දුන් රත්නරාජා මහතා, මට අයිති රාජකාරි කවරේ ද ඒවා ඉටුකරන්නේ කෙසේ ද, යන්න ගැන කිසිවක් කියා දුන්නේ නැත. නවකයකු හෙමින් හෙමින් වැඩ ඉගෙන ගත යුතුය, යන ආකල්පය ඒ මහතා තුළ තිබුණ බව පෙනී ගියේය. මේ අංශයේ යතුරු ලේඛක වූයේ *පොඩි මහත්තයා* නම් වැඩිහිටියෙකි. මෙහි කාර්යාල සේවකයා වූයේ *කරුණාදාස* නමැත්තෙකි. තුන්වෙනි මහලේ එක පැත්තක භෝජනාගාරයක් විය. අපේ දිවා ආහාරය අඩංගු පිඟන් ජෝඩුව ද මෙහි තබා යන බව දැන ගතිමි.

පළමු දිනයේ මා සමග කතාබහ කිරීමටවත් අන් අයගේ උනන්දුවක් නොවීය. මගේ මේසයට සමාන්තර ව ගිණුම් අංශයේ කෙනෙක් මා සමග කථාවට වැටිණි. ඔහු මුස්ලිම් කෙනෙකු බව නමින් දැනගතිමි. (දැනට නම මතක නැත) ක්‍රමයෙන් අප ශාඛාවේ අන් අය ද කතාබහ කිරීමට පටන් ගත්තෝය. වඩාත් ම කුළුපග වූයේ *පොඩි මහත්තයාය.* කලක් ගතවන විට ඔහු රත්නපුරයේ ප්‍රදේශයේ කෙනෙකු බවත්, පදිංචි ව සිටියේ ගංගොඩවිල දෙල්කඳ හන්දිය අසල බවත් දැනගතිමි. මා සේවයට පැමිණි දිනයේ ම ගිණුම් අංශයට රාජකරුණා හා සිවගුරුනාදන් යන දෙදෙනා ද සේවයට වාර්තා කළහ. සිවසුබ්‍රමනියම් නමැත්තෙක් ගෙවීම් අංශයන්ට අනුයුක්ත කර සිටියේය. ඒ අංශවල අනික් අය ද පළපුරුදු ලිපිකරුවන් බව පෙනිණි. පසු කාලයේ දී ඒ සමහරක් දෙනා සමග ද "ඇයි හොඳයිකම්" ඇති කර ගතිමි.

පළමු දවසේ රාජකාරී වේලාව අවසන් වී සිරිනාම අයියා සමග නවාතැනට ගියෙමි. එනමුත් පසුදින සිට මා කාර්යාලයට ආවේ ගියේ තනිව ම ය. දෙසැම්බර් මස හත්වෙනි දා වැටුප් අත්තිකාරම් ලබා ගන්නේ දැ'යි මා අසල සේවය කළ මුස්ලිම් නිලධාරිවරයා මගෙන් ඇසීය. නැතැ'යි කී විට, එය අරගෙන ඔහුට ණයට දෙන ලෙස ඉල්ලීය. ඒ නිසා, මාසික ව හත්වෙනිදාට වැටුප් අත්තිකාරම් ගැනීම ඇරඹිණි.

දෙසැම්බර් මස අවසානයේ දී සිරිනාම අයියා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මාරු වී ගියේය. මේ වනවිට කොළඹ සමහර ප්‍රදේශවල ගමන්බිමන් යෑමට දැනුමක් ලබා සිටියෙමි. ඒ කාලයේ නත්තල් සමයට සතියක් පමණ රජයේ නිවාඩු නිසා, කොළඹ ගියාට පසු පළමුවරට මා ගමේ (මිණිපේ) ගියේ 1951 දෙසැම්බර් මස අග දී යයි සිතමි. එවකට ජනවාරි පළමුවැනි දා නිවාඩු දිනයක් විය.

සිරිනාම අයියා නවාතැනෙන් ගියාට පසුව *ජයසේන* නමැති විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් අපේ කාමරයට ආවේය. ඔහු ඉංජිනේරු ශිෂ්‍යයෙකු විය. හේ කිරිඳිවැල ප්‍රදේශයේ කෙනෙකි. බොහෝ කාලයකට පසුව අපේ ගම් ප්‍රදේශයේ දී ඔහු මට හමුවිය. ඒ වනවිට එහි කෝරළේ මහත්තයාගේ දියණියක් විවාහ කර ගෙන සිටින බව ඔහු මට කීවේය. මම කිතුලගොඩ නිවාසයේ වසරක් පමණ නවාතැන් ගෙන සිටියෙමි. ඒ අතරතුර සමරසේකර මහතා විවාහ වී තුගේගොඩ ප්‍රදේශයේ පදිංචියට ගියේය. ඔහු සමග සමරසේකර මල්ලී ද අස්වී ගියේය. ඉන්පසුව කොළඹ මහ නගර සභාවේ සේවය කළ *මහලියන* මහතා සහ තැපැල් කන්තෝරු ඉතිරිකිරීම් බැංකුවේ සේවය කළ *සිරිවර්ධන* මහතාත් ඉස්සරහ කාමරයට පැමිණියහ.

නවාතැනේ නිකරුණේ කාලය ගත කළ අප කීපදෙනා එකතු වී කාඩ් සෙල්ලම් කළෙමු. ඉතා සුළු මුදලක් ඔට්ටුවට තබා සෙල්ලම් කිරීම නිසා, කල් ගතවන විට සෑහෙන මුදලක් එකතු වී තිබිණි. මා කොළඹින් මාරු වී යෑම නිමිත්තෙන් මේ මුදල යොදා මරදානේ *ඩොනල්ඩ්සන්* ජායාරූප ශාලාවට ගොස් සමූහ ජායාරූපයක් ගෙන, අසල හෝජනාගාරයකින් තේපැන් සංග්‍රහයක් ද පැවැත්වීමු. සමහර දිනවල රාත්‍රී ආහාරයෙන් පසුව තිඹිරිගස්යාය පාර දිගේ ඇවිදීමට ගියෙමු. තවත් සමහර දවස්වල කිරුළ පාරේ පිහිටි පරාක්‍රම සිනෙමා ශාලාවේ නවයයි තිහේ චිත්‍රපටි දර්ශනය නැරඹීමට ද ගියෙමු. දෙවෙනි පන්තියට වියදම් වූයේ කෙනෙකුට රුපියලයි සත විස්සකි. මේ යුගයේ සෙනසුරාදා දිනවලත් පස්වරු එක වනතුරු රාජකාරියේ නිරත විය යුතු විය. ඒ නිසා, සති අන්ත විවේකය වූයේ සෙනසුරාදා සවස සහ ඉරිදා දිනයයි.

කිතුලගොඩ නිවාසය පිටුපසින් වත්තේ තිබූ ගෙවල් කිපයක *රෙඩිෆ්‍යුෂන්* කොම්පැනියේ ගුවන් විදුලි යන්ත්‍ර සවිකර තිබිණි. උදේ හයට පමණ ආරම්භ කරන *රෙඩිෆ්‍යුෂන්* යන්ත්‍රවල සංගීත වැඩ සටහන් අවසන් වන්නේ රාත්‍රි දහයට පමණය. පසුපස කාමරයේ පදිංචි අපට මෙය කන්දොස්කිරියාවක් වුවත් සමහර විට හොඳ සීන්දුවක් අහන්නට ද අවස්ථාව ලැබිණි. කිතුලගොඩ නිවසේ ගුවන් විදුලි යන්ත්‍රය නිතර දෙවේලේ ක්‍රියාත්මක නොකළ නිසා, ඒ මගින් ඇසිය හැකි වූයේ "රේඩියෝ සිලෝන්" ප්‍රවෘත්ති පමණයි.

රජයේ සේවකයන්ට පාපැදියක් මිල දී ගැනීමට රුපියල් එකසිය පනහක ණය මුදල් ලැබේ. සුළු පොළියක් සමඟ මසකට රුපියල් හතක් පමණ වන වාරිකවලින් ඒ මුදල අයකරනු ලැබීය. ඒ නිසා, 1952 පෙබරවාරි මාසය තුළ දී ණය මුදල ලබා ගෙන, හන්ටර් සමාගමෙන් රැලේ බයිසිකලයක් මිල දී ගතිමි. මේ නිසා ක්‍රමයෙන් කොළඹ නගරයේ නොයෙක් තැන් සොයා යෑමට ද කාර්යාලයට යෑමට ද බයිසිකලය භාවිතා කළෙමි. ඉන්පසු පයින් ගමන අවශ්‍ය නොවීය. වැසි දිනවල වැඩට යෑමට දුම්රිය ටිකට් පතක් ලබා ගතිමි. නාරාහේන්පිට දුම්රිය පොළේ සිට කොටුවට තුන්මාසයක දෙවෙනි පන්තියේ සීසන් පතකට අය කළේ රුපියල් හයකි. නාරාහේන්පිට දුම්රිය ස්ථානය තිබුණේ කොළඹ සිට ඕපනායක දක්වා වූ පුංචි කෝච්චි මාර්ගයේය.

මම කොළඹට පැමිණ වැඩි කලක් ගතවීමට පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී දිනක් *ආචාර්ය තෙන්නකෝන් විමලානන්ද මහතා* මුණ ගැසිණි. එතුමා වලල මධ්‍යම පාසලේ පළමුවන ප්‍රධානාචාර්යවරයා විය. මා එම පාසලට ඇතුළු වූයේ ඒ යුගයේ දී ය. විමලානන්ද මහතා මේ වන විට ලංකා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු විය. ඒ මගින් එංගලන්තයට ගොස් දර්ශනශූරි (පී.එච්.ඩී.) උපාධි ලබා සිටියේය. එතුමා එවකට පදිංචි ව සිටියේ කොළඹ කොල්ලුපිටියේ ස්කොෆීල්ඩ් ප්ලේස්හි බවත්, ඉඩ තිබෙන වෙලාවක එහි එන ලෙසත් මට කීවේය. වරක් සති අන්තයක දී එහි ගියෙමි. එම නිවස දුම්රිය පාර අසල විය. *මහාචාර්ය රායි මහතා* පදිංචි ව සිටියේ ද එම නිවසේය. මම එහි ගිය හැම විට ම පාහේ විමලානන්ද මහතා කියා සිටියේ උසස් අධ්‍යාපනයක් ලබා ගන්නා ලෙසයි. ඒ සඳහා එතුමා ද උදව් කිරීමට සුදානම් ව සිටියේය. පොත්පත් ලබා දුන්නේය. මඟ පෙන්වීමට කිහිප දෙනෙක් හඳුන්වා දුන්නේය. විශ්ව විද්‍යාල කාර්යාලයේ ලිපිකාර තනතුර සඳහා පුරප්පාඩු ඇති විට ඒ සඳහා ඉල්ලුම් කරන ලෙස ද කීවේය. ඒ අනුව ඉල්ලුම්පතක් යැවූ නමුත් පත්වීමක් ලැබුණේ නැත. වරක් එතුමාගේ නිවසට ගිය විට, විද්‍යාලංකාර පිරිවෙනේ *බඹරැන්දේ සිරි සීවලී ස්වාමීන් වහන්සේ* මුණ ගැසීමට එතුමා යන විට මා ද එක්කර ගෙන ගියේය. මා *හාල්යාලේ සුමනතිස්ස හිමියන්ගේ බෑණා කෙනෙකු* බව කියා මා හඳුන්වා දුන්නේය. ඒ අවධියේ ඓතිහාසික කරුණු ගැන *විමලානන්ද මහතා* සහ *සෙනරත් පරණවිතාන මහතා* අතර සිළුමිණ පත්‍රය මගින් විවාදයක් පවත්වා ගෙන ගියේය. ඒ ගැනත් *සීවලී හිමියන්* සමඟ එතුමා කතාබහ කළේය. 1952 වර්ෂයේ *ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියට* ගෙන ගිය අවස්ථාවේ, විමලානන්ද මහතා ගලහ පාරේ නිල නිවසක පදිංචියට ගියේය. එහි යන විට එතුමාගේ පොත්පත් ආදිය ක්‍රමවත් ව අසුරා ගැනීම සඳහා උපකාර කිරීමට මා ද එක්කර ගෙන ගියේය. සති අන්තය ඇතුළු ව දින දෙකතුනක් එහි ගත කොට, පේරාදෙණියේ සිට දුම්රියෙන් කොළඹට ආවෙමි. ඉගෙනීම පිළිබඳ

යටපත් වී තිබුණ ආශාව විමලානන්ද මහතා විසින් අවදි කරන ලදී. එනමුත්, ඒ බලාපොරොත්තු ඉෂ්ට කර ගැනීමට තවත් කල්ගත විය.

ඩී.එස්. සේනානායක අගමැතිතුමාගේ අභාවය

1952 වර්ෂය ලංකාවේ වැදගත් සිද්ධි කිහිපයක් සිදු වූ වසරකි. මාර්තු මාසයේ දී ගාලු මුවදොර පිටියේ දී අසුපිටින් වැටී *අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ අභාවය සිදුවිය.* පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ තබා තිබූ එතුමාගේ දේහයට ගරු කිරීමට නත් දෙසින් ජනයා පැමිණියහ. මා ද කීපවරක් ම දේහය බැලීමට හා ගරු කිරීමට ගියේ අපගේ කාර්යාලය පිහිටා තිබුණේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල අසල ම නිසාය. ඒ දිනවල මා ගෙදර ගියවිට අප්පච්චි මගෙන් ඇසුවේ, අගමැතිතුමාගේ දේහය බැලීමට ගියා ද යන්නය. ගොවිජනපද ව්‍යාපාර ඇති කිරීමට පුරොගාමී වූ නිසා, මිණිපේ ජනපද වැසියෙකු වූ අප්පච්චි, සේනානායක මැතිතුමාට අසීමිත ගෞරවයක් දැක්වූයේය. *ඩී.එස්. සේනානායක මහතාගේ* අභාවය නිසා අගමැති තනතුරේ ඇති වූ පුරප්පාඩුවට එතුමාගේ පුත් *ඩඩ්ලි සේනානායක මහතා* පත් කරන ලදී. මේ ගැන *ශ්‍රීමත් ජෝන් කොතලාවල ඇමතිතුමා* අකැමැති වූ බවක් ඒ වකවානුවේ ප්‍රචාරය විය.

ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ආණ්ඩුව යටතේ 1952 ජූලි මාසයේ දී කොළඹ වික්ටෝරියා උද්‍යානයේ දී (වර්තමාන විහාරමහාදේවි උද්‍යානය) *කෘෂිකාර්මික ප්‍රදර්ශනයක්* පවත්වන ලදී. මෙය නැරඹීමට රටේ නොයෙක් ප්‍රදේශවල ජනතාව පැමිණියහ. අපේ ගම් ප්‍රදේශයේ පිරිසක් සමග අයියා සහ සිය පවුල ද පැමිණෙන බව ආරංචි වූ නිසා, ඒ අය හමුවන අටියෙන් මා ද එහි ගිය නමුත් හමු නොවීය. පසු දින මා ගමේ යනවිට යක්කල දී ඒ අය මුණගැසුණාහ.

කොළඹ ගත කළ කාලය තුළ වෙසක් සමයේ දී අප මිත්‍ර *පොඩිමහත්තයා* සමඟ විශාල වෙසක් කූඩුවක් හදනවා බැලීමට *ගංගොඩවිලට* ගියෙමි. එදින රාත්‍රී ආහාරය පොඩිමහත්තයලාගේ නිවසේ දී ලැබිණි. මා එහි ගියේ නාරාහේන්පිට නාවල හරහා නුගේගොඩ පසුකර බයිසිකලයෙනි. ආපසු කොළඹ එනවිට රෑ බෝ වී තිබිණි.

1952 මහ මැතිවරණය හා ඉන් පසුව

ඩඩ්ලි සේනානායක අගමැතිතුමා එම තනතුර භාර ගෙන ටික කලකට පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැර මහමැතිවරණයක් පැවැත්වීය. එම මැතිවරණ රාජකාරි සඳහා කොළඹ සිට පිටත්කර යැවූ රජයේ නිලධාරීන්

සමග මම ද මාතරට ගියෙමි. ඒ මරදාන දුම්රිය ස්ථානයෙන් රාත්‍රී එකොළහට පමණ පිටත් වූ විශේෂ දුම්රියකිනි. දුම්රිය මැදිරි හත අටක ම පිරිස ගමන් කළහ. ටික දුරක් යන විට, දෙතුන්වරක් ම දුම්රියේ ආපදා දම්වැල ඇදීම නිසා, කීහිප පලක ම දුම්රිය නතර විය. නියාමකවරයා තමාගේ සංඥා ලාම්පුව ද රැගෙන අදාළ මැදිරි වෙත පැමිණ, තිරිංග තද වන උපකරණ මුදාහරින ලදී. අදාල මැදිරියේ ගමන් කළ අයට මේ "විහිළුව" නොකරන ලෙස ආයාචනය කිරීමෙන් පසුව නැවත එය සිදුනොවීය. පසුදින පහන් වන විට අපි මාතරට ළඟා වීමු.

කච්චේරි භූමියට ගිය පසු, මෙසේ ගිය පිරිස විවිධ ඡන්ද පොලවල රාජකාරි සඳහා යායුතු තැන් නියම කරන ලදී. අප තිදෙනෙකු රාජකාරියට නියම වූයේ නුපේ රෝමානු කතෝලික පාසලේය. ඒ නිසා, වැඩි ඇතක යෑමක් සිදු නොවීය. මැතිවරණ රාජකාරී සඳහා පැමිණෙන නිලධාරීන් සඳහා පහසුකම් සැපයීම අදාල ගම්මුලාදෑනියාට පැවරී තිබිණි. අප තිදෙනාට නැවතීමට හා ආහාරපාන ගැනීමට මාතර බ්‍රෝඩ්වේ පාරේ තැනක් ලැබිණි. එතැන සිට ඡන්දපොළට පයින් යා හැකි වූ නිසා, ඡන්ද දිනට පෙරදින එහි ගොස්, පෙරහුරුවට ද සහභාගි වී නවාතැනට පැමිණ විවේක ගනිමු. අප සමග සිටි *රණසිංහ මහතා* විවිධ අත්දැකීම් ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලිපිකරුවෙකු විය. ඒ නිසා එදින කාලය ගතකිරීම නොදැනීම සිදුවිය.

පසුදා ඡන්දපොළ රාජකාරියට ගියෙමු. මෙහි ප්‍රධාන නිලධාරියා වූයේ සහකාර ආගමන විගමන පාලකවරයෙකි. දිවා ආහාරය ඡන්ද පොළට ලැබිණි. හවස හතරට ඡන්දය දීම අවසන් විය. පසුව ඡන්ද පෙට්ටිය සීල් තබා, ඡන්ද පොල භාර නිලධාරියා, පොලිසියේ ද ආරක්ෂාව සමග එය කච්චේරියට ගෙන ගියේය. අප තිදෙනා නවාතැන්පොළට ගොස් අපේ ගමන් මලු ආදිය රැගෙන මාතර දුම්රියපොළට ගියෙමු. එදින රාත්‍රියේ කොළඹ-මරදාන විශේෂ දුම්රියක් යොදා තිබිණි, පසුදින උදේ මරදානට පැමිණ, කැළණිවැලි මාර්ගයේ දුම්රියකින් නාරාහේන්පිටට යායුතු විය. එම දුම්රියේ දී මට නින්ද ගිය නිසා, නාරාහේන්පිට පසුකර පොල්හේන්ගෙඩ පාලම පසු කරන තුරු අවදි වූයේ නැත. අනතුරු ව, කිරුළපන දුම්රිය ස්ථානයෙන් බැස දුම්රිය පාර දිගේ නාරාහේන්පිටට පැමිණ නවාතැනට ගියෙමි. මා පළමුවරට මාතරට ගියේ මේ ගමනේ දී ය.

1952 වර්ෂයේ දී ආහාර පාලන රෙගුලාසි යටතේ සංගණනයක් පවත්වන ලදී. ඒ සංගණනයේ දී තිඹිරිගස්යාය පාරේ කොටසක ගණන් ගැනීමේ නිලධාරි ලෙස සේවයේ නිරතවීමි. අදාළ ආකෘති පත්‍ර නිවාස-වලට කල්තියා බෙදා හැර, ගණන් ගන්නා දිනයේ රාත්‍රියේ දී ඒ නිවාසවලට ගොස් නිවැසියන් සංඛ්‍යාව, ඒ අයට සලාක පොත් ඇති නැති බව යනාදිය පරීක්ෂා කිරීම මේ රාජකාරියට අයත් විය. නිවාස දෙකක දී අකරතැබ්බ

දෙකකට මුහුණ දීමට සිදුවිය. එක නිවසක සිටියේ අම්මා සහ දුවකි. දුව අසනීප නිසා නිදා සිටින බව මෙම අම්මා කීවාය. එනමුත් ඒ නිවැසියා ද බැලිය යුතු බව මම කීවෙමි. නිවැසියන් හැම කෙනෙක් ම නොදැක ආකෘති පත්‍රය සහතික කිරීම මගේ රාජකාරී පැහැර හැරීමක් වන බව කීමෙන් පසුව, රෝගාතුර ව සිටි තරුණ කතක් ශාලාවට පැමිණියහ. ඒ අයට ස්තුති කොට, අසල පිහිටි තවත් ගෙයකට ගොස් මේසයක් අසල වාඩි වී, මගේ ලිපි ලේඛන ඒ මත තබා, සලාක පොත් දෙනතුරු බලා සිටියෙමි. එම නිවසේ ගෘහණිය හත් අටදෙනෙකුට කෑම සපයන කෙනෙකි. ඒ අය ද පැමිණ සිටියහ. ටික වේලාවක් යනතුරු මා නිශ්ශබ්ද ව සිටි නිසා, එයින් කෙනෙක් මගේ රාජකාරිය ඉටුකරන ලෙස කී විට, සලාක පොත් දෙනතුරු බලා ඉන්න බව කීවෙමි. එම පොත් මාගේ ලිපි ලේඛනවලට යට වී ඇති බව කී විට ලැජ්ජාවට පත් මා, මඳ සිනහවක් පා රාජකාරී හමාර කර, නවාතැනට ගියෙමි. එහි තිබූ මගේ බයිසිකලයෙන් හැව්ලොක් ටවුමේ නිවසකට ගොස් එහි පදිංචි ව සිටි අපගේ සුපරීක්ෂක *ජී.ඩී. ලෝස්* මහතාට අදාළ ආකෘති පත්‍ර භාර දී ආපසු පැමිණියෙමි.

මා පළමුවරට කලිසම් කෝට් ඇඳුම් කට්ටලයක් මස්සවා ගත්තේ ද කොළඹ සිටිය දී ය. බම්බලපිටිය හන්දිය අසල *ටොලාරාම්ස්* සාප්පුවට යාබද ව සිටි ඇඳුම් මහත්නෙකු වෙත ගොස් ඉන්දියානු ටසෝර් රෙද්දකින් කලිසමක් සහ "ඩබල් බ්‍රෙස්ට්" කබායක් සඳහා ඇණවුමක් දී සතියකින් පමණ එය ලබා ගතිමි. මේ සඳහා වියදම් වූයේ රුපියල් පනහක් පමණ යයි සිතමි. ඉංග්‍රීසි ටසෝර් රෙද්දකින් කලිසමක් මස්සවා ගතිමි. ඒ වකවානුවේ මසා නිම කළ කමිස කලිසම් නොවීය. ටේලර් සාප්පුවකට ගොස් අවශ්‍ය පරිදි රෙදි පෙන්වා ඇඳුම් මස්සවා ගත යුතු විය. මසා නිමකළ කමිස වෙළඳපලට පැමිණියේ නවසිය හැටගණන්වල ආරම්භයේ දී පමණය. ඒ කාලයේ ඒවා ගෙන්වා තිබුණේ සිංගප්පුරුවෙනි. මසා නිමකළ සුදු කමිසයක් රුපියල් හතයි සත පනහක් පමණ විය. සපත්තු සියල්ල ම පාහේ එංගලන්තයේ නිපදවන ලද ඒවාය. හොඳ ම සපත්තු ලෙස පිළිගැනුණේ *"ජෝන් වයිට්"* සපත්තුය. ජෝන් වයිට් සපත්තු ජෝඩුවක් රුපියල් විසිහයක් විය. දේශීය වශයෙන් නිපදවූ බාල වර්ගයේ සපත්තු ද තිබිණි. ඒවා රුපියල් දහයට පහළොවවටත් මිල දී ගත හැකි විය. මා මිණිපේට මාරු වී යන විට ඡායාරූපය ගැනීමට ඇඳගෙන ගියේ ඉහතින් සඳහන් අයුරු බම්බලපිටියෙන් මසා ගත් "සූට්" එකයි. එම ඡායාරූපය තවමත් අපේ නංගිලාගේ ගෙදර ඇතැ'යි සිතමි.

කොළඹ සේවය කරන අතරතුර කීපවතාවක් ම අසනීප වීමි. 1952 පෙබරවාරි මාසයේ දී උණ රෝගය සඳහා කිරුළ පාර හන්දියේ බෙහෙත් ශාලාවක් තිබූ දොස්තර රත්නපාල මහතාගෙන් ප්‍රතිකාර ලබා ගෙන, දින පහක වෛද්‍ය නිවාඩු නිර්දේශ කර ගෙන තිබේ. මාර්තු මාසයේ දී අසනීප

වී මහියංගණ රෝහලේ නේවාසික ව ප්‍රතිකාර ලබා ගතිමි. දින දහසයක වෛද්‍ය නිවාඩු නිර්දේශ කර තිබුණි. ජූලි මාසයේ දී අසනීප වී කොළඹ මහ රෝහලේ නේවාසික ව ප්‍රතිකාර ලබා ගෙන ඇත. ඒ කාලය සඳහා දින එකොළහක වෛද්‍ය නිවාඩු ලබා තිබේ. මේ ආදී හේතු නිසා කොළඹ ජීවිතය ගැන කළකිරීමක් ඇති විය.

පළමුවන වසරේ සේවා කාලය අවසන් වී ගෙන එන විට සමත්විය යුතු යතුරු ලියන පරීක්ෂණය අවසන් කළ වහා ම, මිණිපේ වාරිමාර්ග කාර්යාලයට ස්ථාන මාරුවක් ඉල්ලා සිටියෙමි. කොළඹ සිට මිණිපේ වැනි ප්‍රදේශයකට මාරුවීමට ඉල්ලන්නේ උමතුවෙන් දැ'යි සමහර දෙනෙකුට ප්‍රශ්නයක් මතු විය. මිණිපේ මගේ ගම් ප්‍රදේශය බව ඒ අය දැන සිටියේ නැත. ස්ථාන මාරුව ලැබුණු පසු මට කථා කළ කාර්යාල සහකාර (ඕ.ඒ.මහත්තයා) කනගරත්නම් මහතා මට වටිනා උපදේශයක් දුන්නේය. එනම්, ගම්පළාත්වල සේවය අමාරු බවත් දන්නා හඳුනන අය තරහ වීමට ඉඩ ඇති බවත්, ඒවායින් ප්‍රවේශම් වී රාජකාරි හොඳින් ඉටුකරන ලෙසත්ය. මගේ ස්ථාන මාරුව 1952 දෙසැම්බර් මස 22වෙනි දා සිට ක්‍රියාත්මක විය. නවාතැන්පලේ සිටි මිතුරන් මා සමග සමූහ ඡායාරූපයක් ගෙන තේ පැන් සංග්‍රහයන් ද පැවැත්වූහ. මාස දහතුනක් පමණ මට පහසුකම් සලසා දුන් කිතුලගෙ ාඩ පවුලෙන් සමුගෙන, "ක්වික්ෂෝ" රියකින් කොළඹ කොටුවට පැමිණ, දුම්රියන් මහනුවරට පැමිණියෙමි. මගේ බයිසිකලය ද නුවරට ගෙන ඒමට කොටුව දුම්රිය ස්ථානයට භාර දී තිබිණි. මහනුවරට පැමිණ රාත්‍රියේ මුස්ලිම් හෝටලයේ නවාතැන් ගෙන පසුදින උදෙන් ම බස්රථයකින් මිණිපේ බලා ගියෙමි.

මිණිපේට මාරුවීම

මිණිපේ ගිය පසු හඳගනාවේ අපේ ගෙදර සිට රාජකාරි සඳහා මොරයායේ පිහිටි වාරිමාර්ග කාර්යාලයට දිනපතා බයිසිකලයෙන් ගමන් කිරීමට තීරණය කළෙමි. 1952 දෙසැම්බර් 22වැනි දින වාරිමාර්ග කාර්යාලයට ගොස් රාජකාරි සඳහා වාර්තා කළෙමි. මිණිපේ උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරිවරයා (එස්.ඩී.ඕ) පළමුවන ශ්‍රේණියේ ටී.ඒ (කාර්මික සහකාර) කෙනෙකු වූ *අප්පුකුට්ටි වෙල්ලප්පා* මහතාය. ප්‍රධාන ලිපිකරු වුයේ *ඒ. රාජපක්ෂ* මහතාය. *සිරිවර්ධන* නමැති පියුන් කෙනෙක් (පසුව කාර්යාල කාර්ය සහායක යන නිලනාමය දුන්නේ පියුන්වරුන්ටයි) සිටියේය. *ජිනදාස* සහ *බාසන්බක්* නම් දෙදෙනෙක් ගබඩා නිලධාරීන් වූහ. *බන්දුලහාමි* සහ *පොඩි අප්පුහාමි* නමැති කම්කරුවන් දෙදෙනෙක් ද *රිච්ර්ඩ්* නමැති ලොරි රියදුරෙක් ද *රොබෝ සිඤ්ඤෝ* නමැති මුරකරුවෙක් ද කාර්යාලයට සම්බන්ධ ව සේවය කළහ. විවිධ ස්ථානවල සේවය කළ කාර්මික සහකාර (ටී.ඒ), ඕවර්සියර් කම්කරු

යනාදී නිලධාරීන් හා සේවකයන් රාශියක් ද මෙම උප කොට්ඨාශය යටතේ සේවය කළහ.

දෙවන ලිපිකරු වශයෙන් මට පැවරුණු රාජකාරි අතරින් ප්‍රධාන වූයේ, ආයතන කටයුතු, යතුරු ලියන කටයුතු, වාරිමාර්ග දුෂ්කරතා යනාදියයි. මේ ශීර්ෂ යටතේ ටෙන්ඩර් හා කොන්ත්‍රාත් ලේඛන ටයිප් කිරීම, ඇස්තමේන්තු ටයිප් කිරීම, කම්කරුවන්ගේ නිවාඩු, හදිසි අනතුරු යනාදියට අදාල ලිපිලේඛනවල කටයුතු කළෙමි. ලිපිලේඛන ටයිප් කිරීමට සහාය වීමට පියසේන නැමැති බණ්ඩාරවෙල සිට පැමිණි තරුණයෙකු සිටි නමුත්, ඔහු තව ම ටයිපින් ඉගෙන ගන්නා අවදියේ සිටි නිසා, එතරම් උපකාරයක් ලැබුණේ නැත. එසේ වුවත්, කාර්යාල වේලාවෙන් බැහැර ගමන් බිමන්වලදී මා සමඟ මිතුරු විය. ටික කලකට පසුව ඔහු ද *සොරබොරවැව* ව්‍යාපාරය යටතේ ක්ෂේත්‍ර සේවයට යවන ලදී. මේ වනවිට, *ටී. ලීලාසෝම* නමින් මුරුතලාවේ කෙනෙක් සහකාර ලිපිකාරවරයෙකු වශයෙන් පත්කර එවා සිටියේය. ඔහුගේ පැමිණීමෙන් පසුව මගේ රාජකාරි යම් පමණකට ලිහිල් විය.

ක්‍රමයෙන් කාර්යාලයේ සැලසුම් අංශයට ද නිලධාරීන් පත් වී ආහ. පළමුවෙන් ම පැමිණියේ *එම්.කේ. පියදාස* නමින් අත්තනගල්ලේ අලවල කෙනෙකි. ඔහුගේ තනතුර *"ට්‍රේසර්"* නමින් හැඳින්විණි. සිතියම් ආදිය පිටපත් කිරීම හා ඇඳීම ඔහුගේ රාජකාරිවලට අයත් විය. පසු කාලයේ දී තවත් *පියදාස* කෙනෙක් සැලසුම්කරු ලෙස ද *නවසිවායම්* නමැත්තෙක් ආධුනික සැලසුම්කරුවෙකු ලෙස ද පත් වී පැමිණියහ. මා හැර මේ සියලු දෙනා ම නිල නිවාසවල පදිංචි වී සිටියෝය. *එම්.කේ පියදාස* මහතා මගේ කුළුපග හිතමිත්‍රයෙකු විය. ඔහු ගැන පසුව තවත් තොරතුරු දැන ගැනීමට ලැබෙනවා ඇත. *නාගරාජා* නමැති කාර්මික නිලධාරි මහතෙක් සිය මෑණියන් හා සහෝදරිය සමඟ එක නිල නිවාසයක පදිංචි වී උන්හ. ප්‍රධාන ලිපිකරු *රාජපක්ෂ* මහතා සහ *නමසිවායම්* මහතා තවත් නිවසක උන්හ. ඒ නිවසේ ම එක කාමරයක *රුහිරාපති* නම් කාර්මික සහායකවරයෙක් පදිංචි ව සිටියේය. ගබඩා නිලධාරීන් තාවකාලික නිවසක උන්හ. *ලීලාසෝම* මහතා ද එහි කාමරයක නැවතී සිටියේය. සැලසුම්කරු *පියදාස* මහතා ද ඒ නිවහනේ පදිංචි ව සිටියේය. *එම්.කේ. පියදාස* මහතා වෙනත් තාවකාලික නිවසක කාමරයක පදිංචිව සිටියේ ය. එම නිවස *මානික්කවාසගර්* නම් කාර්මික නිලධාරි මහතෙකුට වෙන්කර දී තිබිණි.

මිණිපේ වාරිමාර්ග කාර්යාලය මගින් බදුල්ල දිස්ත්‍රික්කයට අයත් බිංතැන්න ප්‍රදේශයේ වාරිමාර්ග ව්‍යාපාර කීපයක ඉදිකිරීම් කටයුතු භාරව කටයුතු සිදුවිය. *මාපාකඩ ව්‍යාපාරයේ* ඉදිකිරීම් කටයුතු භාරව *වයිරමුත්තු* සහ *කේ.කේ.වී සිල්වා* නම් කාර්මික නිලධාරීන් දෙදෙනා සේවය කළහ. *සොරබොර වැව ව්‍යාපාරය* භාරව කටයුතු කළේ *ලියෝ ප්‍රනාන්දු* නම්

කාර්මික නිලධාරියාය. *රුතිරාපති* මහතා හෙඹරව ව්‍යාපාරය භාරව සිටියේය. ආධුනික කාර්මික නිලධාරීන් වශයෙන් *ඒ.එම්.ඩී.ඩබ්ලිව් විජේනායක* (පසුව ඩබ්ලිව්. බී. ඒකනායන), *කේ.කේ.බී. කොඩිතුවක්කු, එල්.ඒ.බී.ඒ. ජයතිස්ස, ජී. සමරසිංහ* යන අය මෙහි පුහුණුව ලැබූහ. *සිවලිංගම් හා ජයකොඩි* නම් නඩත්තු ඕවර්සියර්වරු දෙදෙනෙක් මිණිපේ ගොවිජනපද ව්‍යාපාරයේ නඩත්තු කටයුතු භාරව සිටියහ. මේ නිලධාරීන් යටතේ විශාල කම්කරුවන් සංඛ්‍යාවක් සේවය කළහ. *මාපාකඩ* හා *සොරබොර* ව්‍යාපාරවල සේවය කළ ඉදිකිරීම් ඕවසියර්වරු කීප දෙනෙක් ද වූහ.

ගෙදර සිට කාර්යාලයට පැමිණි සමහර දිනවල නිල නිවාසවල සිටි මිතුරන් සමග නැවතීමට පුරුදු වීමි. කාර්මික නිලධාරි රුචිරාපති මහතා හොඹරව ගොස් සිටින දිනවල ඔහුගේ ඇඳේ නිදා ගතිමි. පසුව, *එම්.කේ පියදාස* මහතාගේ කාමරයේ මගේ ඇඳක් සවිකර ගෙන එහි නැවතුනෙමි. කාර්යාල වේලාවෙන් පසුව තේ පානය සඳහා *පියදාස* සමග මගේ බයිසිකලයෙන් වේරගංතොට දුම්බර හෝටලයට ගොස් ආපසු එන ගමනේ අසල තිබූ *අබේරත්න* මුදලාලිගේ කඩේට ද ගොඩවීමට පුරුදු වූයෙමු. ඒ නිසා, ඒ ප්‍රදේශයේ බොහෝ දෙනෙක් දැන හැඳින ගැනීමට හැකි විය.

පියදාස මිතුරාත් මාත් හවස් කාලයේ *මොරයායේ* පාසලට ද ගියෙමු. එහි ප්‍රධානාචාර්ය *සුබසිංහ* මහතා අපේ පියෙකු වැනි වැඩිහිටියෙකු විය. පාසලේ ගුවන් විදුලි යන්ත්‍රයක් තිබුණ නිසා, ඉරිදා දිනවල පෙරවරු ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට පාසලට යෑම නිසා, එම ගුරු යුවල සමග දැන ඇඳුනුම්කම් ඇති කරගන්නට හැකිවිය. මෙම පාසලේ වැඩිහිටි අධ්‍යාපන පන්තියක් පැවැත් වූ නිසා, එහි ඉගැන්වීමට ද අප දෙදෙනාට ආරාධනා ලැබිණි. ඒ නිසා, සතියේ දින තුනක් පමණ සවස් වරුවේ පැය දෙක තුනක් ඒ සඳහා වැය කළෙමු. මේ සම්බන්ධය නිසා, අප දෙදෙනාගේ ආහාර පානාදිය ගැටලුව විසඳා ගැනීමට මඟක් පෑදුණේය. ඉස්කෝලේ හාමිනේ හදුනන කාන්තාවකගේ ඥාතියෙක් මොරයාය හන්දියේ වඩුමඩුවක් පවත්වා ගෙන ගියේය. ඒ බාස් උන්නැහේ අප දෙදෙනාට දිවා රාත්‍රී ආහාර සැපයීමට එකඟ විය. වඩුමඩුවේ "කොලුවා" රසවත් ආහාර වේලක් පිස දුන්නේය.

මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ සේවය කළ කාලය තුළ දී සිදුවූ බොහෝ දේ තවත් ඇත. ඒවා මෙහි සඳහන් කරන්නේ මතකයට නැඟෙන ආකාරයට මිස, දින වකවානු අනුපිළිවෙලකට නොවේ.

පෝටාවේ පිහිටි බිං නැන්නේ ප්‍රාදේශීය ආදායම් නිළධාරී (ඩී. ආර්.ඕ) කාර්යාලය මේ වන විට මහියංගණයට ගෙනැවිත් තිබිණි. එහි සේවය කළ අපේ අයියා, 1953 වසරේ දී උඩදුම්බර ඩියාරෝ කන්තෝරුවට මාරු වී ගිය නිසා, අප උපන් ගමේ අපේ නිවසේ පදිංචියට ගියෙමු. ඒ නිසා, නැවතත්

විවේකයක් ලැබුණ විට ගමට යෑමට අවස්ථාව ලැබිණි. මේ වන විට අයියාට දරුවන් සිව් දෙනෙක් උන්හ. එනමුත් ඔවුන් තවමත් පාසල් යන වයසට එළඹ සිටියේ නැත.

අයියා බිංතැන්නේ ඩියාරෝ කාර්යාලයේ සේවය කළ අවධියේ එහි සේවය කළ *හේරත්, මැන්දිස්, කොඩිකාර* වැනි මහතුන් දැනහැඳින ගෙන සිටියෙමි. අයියා මාරු වී ගිය පසු ද, විටින් විට මහියංගණයට ගිය අවස්ථාවල, මේ මිතුරන් නවාතැන් ගෙන සිටි *බලගල්ල ආරච්චි* මහතාගේ නිවසට ගොස් ඒ අය සමඟ සම්බන්ධතාවක් පවත්වා ගෙන ගියෙමි. *පියසේන* මහතා ද මා සමඟ මේ ගමන්වලට හවුල් විය.

මහියංගණයේ ගිය අවස්ථාවල එහි සිඬස්ථානය වැඳපුදා ගැනීමට ලැබිණි. මේ වන විට මහියංගණ චෛත්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු අරඹා තිබිණි. වාර්ෂික ව ඇසල පෙරහැර සමයට විශේෂ උත්සව පවත්වන විට, වන්දනාකරුවන්ට මහවැලි ගඟ හරහා ගමන් කිරීමට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව තාවකාලික පාලමක් ඉදිකළේය. එක ඉවුරක සිට අනිත් ඉවුරට විශාල යකඩ කම්බියක් ඇද, ගඟ හරහා හිස් බැරල් පේලියට තබා, එකට බැඳ, ඒවා මත ලෑලි දමා, මෙම පාලම ඉදිකරන ලදී. ඉහළින් ඇද තිබූ යකඩ කම්බියට බැරල් පේලිය තැනින් තැන අමුණා තිබිණි. උත්සව සමයේ දී වන්දනාකරුවන්ට මෙය මහත් සහනයක් විය. නැත්නම්, ඔරුවලින් ගඟ හරහා යෑමට සිදුවූවා නම්, බෝහෝ වේලාවක් ගතවන අතර, විශාල වන්දනාකරුවන් සංඛ්‍යාවක් නොපැමිණීමට ද ඉඩ තිබිණි. මහියංගණ චෛත්‍ය වර්ධන සමිතියේ සභාපතිවරයා වූයේ *අගමැති ඩඞ්ලි සේනානායක* මහතාය. භාණ්ඩාගාරික වූයේ මහනුවර පදිංචි ව සිටි *ශ්‍රීමත් බෙනට් සොයිසා* මහතාය. පොසොන් උත්සව සමයේ දී ද වන්දනාකරුවන් විශාල සංඛ්‍යාවක් මහියංගණයට එන නමුත්, තාවකාලික පාලමක් ඉදිකළේ නැත. ඒ කාලයේ දී ගඟ හරහා යායුතු වන්නේ ඔරුවලිනි. ගඟේ වතුර බෙහෙවින් ම අඩු වූ විට පාගමනින් ද ගඟ හරහා යන අවස්ථා තිබිණි.

හෙඹරව හා කිඳිගොඩ ගමන්

වරක් කාර්මික නිලධාරී *නාගරාජා* මහතා *හෙඹරව* යන විට මම ද ඔහු සමඟ එහි ගියෙමි. හෙඹරව කුඩා වැවක් ප්‍රතිසංස්කරණය කරමින් තිබිණි. එය සුපරීක්ෂණය කළ කාර්මික නිලධාරී *රුහිරාපති* මහතා රෝගාතුර වී, ගමේ (වැල්වටිතුරේ) ගොස් සිටි නිසා, නාගරාජා මහතාට ඒ ඉදිකිරීම් වැඩ ගැන සොයා බැලීමට පවරණ ලදී. *හෙඹරවට* මහියංගණයේ සිට සැතපුම් දහඅටක් යා යුතු විය. *සොරබොර,* අළුත්තරම, *ගින්නෝරුව* යන තැන් පසුකර පා ගමනින් යා යුතු විය. පාරේ සමහර තැන් මඩවගුරු විය.

උදේ පාන්දරින් මොරයායෙන් පිටත් වූ අප දෙදෙනා හෙඹරවට ළඟාවන විට සවස දෙක පමණ වන්නට ඇත. *රුහිරාපති* මහතා නැවතී සිටි ගෙදරින් අපට දිවා ආහාරය ලැබිණි. එය සූදානම් වනතුරු අසල පිහිටි මහවැලි ගඟෙන් නා ගත්තෙමු. ආහාරයට පසුව ගමන් මහන්සිය නිසා රාත්‍රී ආහාර වේලාව වනතුරු ම මම නිදාගත්තෙමි.

පසුදින වැවේ වැඩ ගැන බලා එදින රාත්‍රියේ ආපසු ගමනට පිටත්වීමු. ඒ ගැන මගේ කැමැත්තක් නොතිබූ නමුත්, *නාගරාජා* මහතාට සතෙක් දඬයම් කර ගැනීමට අවශ්‍ය ව තිබිණි. ගමේ මිනිසුන් දෙදෙනෙක් සමඟ ආපසු ගමන එන විට විල්ලුවක් අසල වල් අලියෙක් සිටියේය. ඒ සතා මඟහැරීමට කැලේ වෙනත් පාරකින් පැමිණ *ගින්නෝරුව* දක්වා පැමිණියෙමු. ඒ අතරමඟ මුවකුට වෙඩි තැබූ නමුත් ඒ සතා සොයා ගැනීමට බැරි විය. *හෙඹරව* ගමෙන් අප සමඟ පැමිණි දෙදෙනා *ගින්නෝරුවෙන්* එහා යාමට අකමැති වූ නිසා, එහි හේනක සිටි කෙනෙකුට කථා කොට එදා රෑ එහි ගතකළෙමු. ගිනිගොඩක් අසල ඇඳන්වලට සමාන මැසි ගසා තිබුණ නිසා, ඒවා මත නිදා ගැනීමට හැකි විය. පසුදා හිමිදිරි පාන්දරින් ම ගමන් අරඹා, එවකට එළිකර තිබූ ජීප් රථ මාර්ගය දිගේ පැය කීපයකට පසුව සොරබොර කාර්මික නිළධාරී *ලියෝ ප්‍රනාන්දු* මහතාගේ නිවහනට පැමිණියෙමු. *"හන්ට්ලි ඇන්ඩ් පාර්මර්ස්"* විස්කෝතු කා තේ බීමට සැලසීමට එහි සිටි සේවකයා කාරුණික විය. පැය එකහමාරකට පමණ පසු මහියංගණය හරහා පැමිණ, ගඟෙන් මෙගොඩ වී *මොරයායට* පැමිණියෙමු. ඉතා වෙහෙසකර ගමනක් වුවත්, අලුත් අත්දැකීම් රාශියක් ලබා ගත් නිසා, "සිත පිරුණ" බවක් දැනිණි.

තවත් වරක *නාගරාජා* මහතා සමඟ *කිඳිගොඩ* නමැති ගමේ අමුණක් ඉදිකිරීමට නියමිත යෝජනා ක්‍රමයක් සොයා බැලීමට ගියෙමි. අප සමඟ මහියංගණ රෝහලේ සහකාර වෛද්‍යවරයෙක් ද *උඩත්තව* බෙහෙත් ශාලාවට යෑමට පැමිණියේය. *කිඳිගොඩ* ගම්වැසියන් මුස්ලිම් ආගමිකයෝ වූහ. එහි යන අතරමඟ කැලෑ ප්‍රදේශයේ මිනින්දෝරු මහතෙක් කුඩාරම් ගහගෙන සිටි තැනක් ද පසුකර ගියෙමු. සහකාර වෛද්‍යවරයා සමඟ අප දෙදෙනා ද උඩත්තවට ගොස්, එහි සිටි සේවකයෙක් සූදානම් කර දුන් දිවා ආහාරයෙන් පසුව ආපසු ගමනට පිටත්වීමු. *කිඳිගොඩ* කිට්ටුවට එනවිට තද වැස්සක් ආරම්භ විය. යන ගමනේ දී හසලක ඔය හරහා ගිය තැනින් ඔය තරණය කිරීමට දැන් නොහැකි විය. ඔයේ විශාල ජලකඳක් ගලාගිය නිසාය. ඔයේ එගොඩින් ඉහළට ගිය අපට කුඹුරක් හා එහි වූ පැලක්/නිවසක් හමුවිය. ඒ ඉසව්වේ හසලක ඔය හරහා ඉදිකර තිබූ හෙල්ලෙන පාලමක් වූයෙන්, ඒ දෙසට යන අදහස පළකළ විට, ඒ ගෙදර විසූ කෙනා කියා සිටියේ, වැස්ස සහිත ඇඳිරි වැටීගෙන එන මේ වේලාවේ එතැන සොයා ගැනීමට අපහසු

නිසා, ඒ ගෙදර නැවතී උදේ ආපසු යන ලෙසයි. තමාගේ අම්මා හා නංගී තනියම තම නිල නිවසේ ඉන්න නිසා, කෙසේ හෝ එහි යා යුතු බව කී *නාගරාජා* මහතා, හෙල්ලෙන පාලම වූ දිසාවට යෑමට පිටත් වී ගිය නමුත්, බොහෝ වේලාවක් ගත වුවත් අවශ්‍ය මඟ සොයා ගැනීමට බැරි විය. දැන් අප සිටියේ හස්සලක ඔය අයිනේ කැලෑව තුළය. වෙලේ තිබුණ ගෙදරට ආපසු එන මාර්ගය සොයා ගැනීම ද දුෂ්කරය. ඔය දිගේ පහළට එමින්, විටක ඔයට බසිමින් ද විටෙක ගොඩවෙමින් ද පහළට එන විට, ඔය හරහා වැටී තිබුණ සපත්තු පාලමක් හමුවිය. ඒ උඩින් ද විශාල ජල කඳක් ගලා ගිය නිසා, පාලම හරහා යෑමට ද බැරි විය. අවසානයේ අපට සිදුවූයේ පැය දෙක තුනක් මහ වැස්සේ වල් වැදී එහා මෙහා යමින් සිට, කුඹුර මැද තිබුණ නිවසට යෑමටයි.

අප දෙදෙනා හොඳට ම තෙම්බාය. නිවැසියන් අපට ඇඳ ගැනීමට සරම් දෙකක් දී, ගිනි ගොඩක් ගසා ගිනි තැපීමට සලස්වන ලදී. ඒ අතරතුර එම ගෘහණිය බතක් වැංජනයක් උයා අපට රාත්‍රී ආහාරය සැපයූවාය. මගේ ජීවිතයේ රසවත් ම ආහාර වේල එය වී යයි මට සිතේ. පසුදා උදෑසනින් ඒ නිවසින් පිටත් වූ අප දෙදෙනා, සපත්තු බෝක්කුව හරහා ඔය තරණය කොට *පල්ලේවත්තේ කෝරළේ මහත්තයාගේ* ගෙදර දමා ගිය මගේ බයිසිකලයෙන් *මොරයායේ* වාරිමාර්ග කාර්යාලයට ගියෙමු. මේ ගමන තවත් අලුත් අත්දැකීමක් විය.

මගේ මිත්‍ර *පියසේන* සමඟ වරක් වෙසක් සමයේ දී **බණ්ඩාරවෙල** ගියෙමි. පියසේන මහතාගේ ගම බණ්ඩාරවෙලය. උදෙන් යන බසයකින් *කැන්දකැටියෙන්* පිටත්වීම පිණිස, පෙරදින හවස් වරුවේ *මොරයායෙන්* පිටත් වී, මගේ බයිසිකලයෙන් *අඹගහපැලැස්සට* ගොස් එතැනින් මහවැලි ගඟෙන් එගොඩ වී *බත් මැඩිල්ල* ජනපද ව්‍යාපාරය හරහා *කැන්දකැටියට* පැමිණීම අපේ අරමුණ විය. මහවැලි ගඟ හරහා ඔරුවෙන් යා යුතු විය. ඒ සඳහා ටික වේලාවක් ගතවීමෙන් පසු එගොඩට යන විට ඇඳිරි වැටෙමින් තිබිණි. මහ පාරට යන අඩිපාර වල් වැදී තිබුණ නිසා, පැය එකහමාරක් පමණ තණකොළ ගොල්ලේ බයිසිකලය ද තල්ලු කරගෙන එහා මෙහා ගොස්, ඉතා අමාරුවෙන් මහපාරට පිවිසුණෙමු. එතැන් සිට සැතපුම් දෙකක් පමණ ගිය විට, *කැන්දකැටියේ* ජනපද නිළධාරී බංගලාවට පැමිණියෙමු. *පියසේන* මහතා එම නිලධාරී මහතා අඳුනන නිසා, එදින රාත්‍රියේ එහි නතරවීමු.

පසුදා උදෑසනින් බදුල්ලට යන බස් රථයෙන් එහි ගියෙමු. මේ මාර්ගයේ මා යන පළමුවන වතාව විය. ගමනේ අඩක් පමණ යන විට *මීගහකිවුල* කඩපොල හමුවේ. එහි දී බස් මගීන් තේ පානය කරත්. තවත් සැතපුම් තුනක් පමණ යන විට, පාසල, පාලම, බාලාපරාධකරුවන්ගේ රැඳවුම් ස්ථානය

යනාදිය තිබෙන *තල්දෙන* ග්‍රාමය හමුවේ. තවත් සැතපුම් දෙකක් පමණ යන විට බදුළු ඔය හරහා ඇති පාලම පසුකරත් ම කන්ද නැඟීමට පටන් ගනී. ටික දුරක් එසේ කන්ද නඟින විට, වංගුවක් අසලින් දුන්හිඳ දිය ඇල්ල වෙත යන අඩිපාර හමුවේ. *මැඩිතලේ* හා *රිදීපාන* දක්වා ගිය විට කන්ද නැඟීම අවසන් වී, බදුල්ල නගර සීමාවට පිවිසේ. බදුල්ලේ බස්නැවතුම්පලේ දී *බණ්ඩාරවෙල* යන බසයකට නැඟ, *හාලිඇල* පසු කොට *බණ්ඩාරවෙල* බිදුණුවැවට පැමිණියෙමු. පියසේන මිතුරාගේ ගෙදර තිබුණේ බිදුණුවැව මහපාර අයිනේ ම ය. බණ්ඩාරවෙල නගරයට තවත් සැතපුම් බාගයක් පමණ යා යුතු විය.

දින දෙකක් පමණ *බණ්ඩාරවෙල* ගත කළ පසු, *බදුල්ල-කොළඹ* රාත්‍රි තැපැල් දුම්රියෙන් *පේරාදෙණිය* හරහා *මහනුවරට* ගියෙමු. *මහනුවරින්* පාන්දර පහයි තිහට *වේරගන්නොට* දක්වා යන බසයකින් ගොස් පෙරවරු නවය පමණ වන විට *මොරයායට* ළඟාවීමු. *බන්මැඩිල්ල, කැන්දකැටිය, බදුල්ල,* බණ්ඩාරවෙල යන තැන්වලට මා ගියේ පළමු වතාවටයි. බණ්ඩාරවෙල, *පේරාදෙණිය* දුම්රිය ගමන ද නවතම අත්දැකීමක් විය. ඒ ගමන රාත්‍රියේ දී ගිය නිසා, අතරමඟ සිරි නැරඹීමට ඉඩ ලැබුණේ නැත. ඒ සඳහා තවත් කාලයක් ගත කිරීමට සිදු විය.

මොරයායේ පිරිත් පිංකම

මිණිපේ වාරිමාර්ග කාර්යාලයට මාරු වී ගොස් එහි නිලධාරීන් හා සේවක පිරිස් හොඳින් දැන හැඳින ගැනීමෙන් පසුව, වාරිමාර්ග කාර්යාලයක කිසිවෙක් නොකරන යමක් කිරීමට අදහසක් මතුවිය. එනම්, *මොරයාය* නිල නිවාස සංකීර්ණය තුළ පිරිත් පින්කමක් පැවැත්වීමයි. ප්‍රධාන ලිපිකරු *ඒ. රාජපක්ෂ*, සැලසුම්කරු *පියදාස*, කාර්යාල සහකාර *සිරිවර්ධන* යනාදි අප කීප දෙනෙක් සමඟ සාකච්ඡා කර, නිල නිවාසයක පිරිතක් කියවා පසු දින දවල් දානයක් දුනහොත් මැනවැ'යි තීරණය කළෙමි. මෙයට පුරෝගාමී ව කටයුතු කළේ මමයි. අවශ්‍ය වියදම් සඳහා හැකි තරම් පුළුල් සහභාගිත්වයක් ලබා ගැනීම පිණිස සම්මාදම් පත්‍රිකා *මාපාකඩ, සොරබොර* ආදී ව්‍යාපාරවලටත් *මොරයාය* ප්‍රදේශයේ සේවය කරන අයටත් යවන ලදී. *මාපාකඩ, සොරබොර* ව්‍යාපාරවලවල මේ කටුයුතු ඉතා උද්යෝගයෙන් කරගෙන ගියේ ඒ ප්‍රදේශවලට කාර්යාලයේ සිට ලියුම් රැගෙන ගිය *ආනර්* මහතා විසිනි. කම්කරුවන් සත පනහ, රුපියල වශයෙන් ද නිලධාරීන් රුපියල් පහ, දහය වශයෙන් ද දායක වූහ.

ප්‍රමාණවත් මුදලක් එකතු වූ පසු, පිරිතට දිනයක් නියම කරගෙන, භික්ෂූන් වහන්සේලාට ආරාධනා කිරීම හා හේවිසිකාරයන් සොයා ගැනීම

මා විසින් කරන ලදී. පිරිත් මණ්ඩපය ඉදිකිරීමට තවත් අය භාරගෙන තිබිණි. දානයට හා පිරිතට අවශ්‍ය උපකරණ, පිරිකර එළවළු ආදිය මොරයාය, වේරගන්තොට ආදී කඩවලින් ද මහනුවරින් ද සපයා ගතිමු. *බන්දුලහාමී, පොඩි අප්පුහාමී* ආදී සේවකයන් ද තවත් කම්කරු පිරිසක් ද මේ වැඩවලට සහාය වූහ. දානය සූදානම් කළේ ද ඒ අයයි. බෞද්ධ නොවන නිළධාරීන් ද මෙයට නොයෙක් ආකාරයෙන් උපකාර කළහ. දානය දවසේ අපේ අප්පච්චී පැමිණ සිටියේය. එතුමා ඇතුළු මෙයට උපකාර කළ සේවකයන් කීප දෙනෙකුගේ ඡායාරූපයක් තවමත් මා ළඟ තිබේ. සංවිධායකයන් හැම දෙනාගේ ම මතය වූයේ, මෙම පින්කම බෙහෙවින් ම සාර්ථක වූ බවයි.

අප කීප දෙනෙක් මේ අවස්ථාව සඳහා ම සුදු ජාතික ඇඳුම් මසා ගත්තෙමු. එය ද අලුත් අත්දැකීමක් විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැන බොහෝ දෙනා අතර පැතිර තිබූ වැරදි ප්‍රතිරූපය ද මෙයින් වෙනස් විය. කඩපලේ, මහා මාර්ගයේ අපට පිළිගැනීමක් ඇති විය. එය අපගේ රාජකාරීවලට ද හිතකර ලෙස බලපෑවේය. *මොරයාය* පාසලේ ප්‍රධානාචාර්යතුමා සමඟ සම්බන්ධතාවක් ඇති වූයේ ද මෙයින් පසුව යයි සිතමි. පාසලේ තිබුණ ගුවන් විදුලියට සවන් දීමට යෑම ගැන ඉහතින් සඳහන් කර ඇත. එයට ද මඟ පෑදුණේ අපේ පින්කමෙන් පසුව වන්නට ඇත.



දකුණු කොනේ ම ඉන්නේ අපේ අප්පච්චිය. ඩෙව්ඩ්, පොඩි අප්පුහාමි සහ බන්දුලහාමී යන අය ද සිටිත්.

ශ්‍රීපාද වන්දනාව

මොරයායේ දානමය පිංකමට පසුව සිරිපාද වන්දනා සමය එළඹී තිබුණ නිසා, අප කීප දෙනෙක්, පිටස්තර දෙතුන් දෙනෙක් ද එකතුව, ශ්‍රී පාද වන්දනාවේ ගියෙමු. *වේරගන්තොට* හා *මොරයායේ* වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය *අබේරත්න* මුදලාලි අලුත් වෑන් රථයක් මිලයට ගෙන තිබිණි. අපි ශ්‍රීපාදේ ගියේ ඔහු සමඟය. *පියසේන* මිතුරා මේ ගමනට එකතු වූ බව හොඳින් ම මතකය. යම් දිනක පෙරවරුවේ මොරයායෙන් පිටත් වූ අපි *මහනුවර, ගම්පොල, උලපනේ, ගිනිගත්හේන, ලක්ෂපාන, මස්කෙළිය* හරහා *නල්ලතන්නියට* ගොස් රෑ බෝ වන විට සමනල කන්ද නැඟීමට පටන් ගතිමු. මෙය මගේ පළමුවන ශ්‍රී පාද ගමනය.

මකර තොරණ පසුකර *සීත ගඟුලට* ගොස් අතපය සෝදා ගෙන පිරිසිදු වූයෙමු. ටිකක් ඉහළට යන විට හමුවන අම්බලමේ දී අප මිත්‍ර *පියදාස* (සැලසුම් ශිල්පී) මහතාට කලාන්තයක් සැදිණි. එනමුත් ඉක්මනින් ම එය සුව වූයේ වෙනත් වන්දනා නඩයක අය ඉගුරු, ගම්මිරිස්, සුදුළුණු වැනි යමක් ප්‍රතිකාරයක් ලෙස දුන් නිසාය. අතරමඟ තිබුණ තේ පැන් ශාලාවලින් ආහාරපාන ගතිමු. අප වන්දනා නඩයේ සිටි හැමදෙනා ම පාහේ කෝඩුකාරයෝ වූහ. අනිත් අය කියන දේ කියමින් අපි ද සිරිපා කරුණා කළෙමු. *ඉදිකටුපාන, හැරම්ටිපාන, මහගිරිදඹේ* යනාදි තැන් පසුකර සිරිපා මළුවට පැමිණි අපට, එතරම් තදබදයක් නැති ව වන්දනා කර ගැනීමට හැකි වූයේ, වසර හැටකට පෙර ඒ යුගයේ දැන් තරම් වන්දනාකරුවන් නොමැති වූ නිසා විය හැකිය. වන්දනා කර අවසන් වූ පසු ආපසු ගමනට පිටත් වූයෙමු. *ඉරසේවය* බැලීමට නතර වීම ගැන අදහසක් නොවුණු නිසාය. එළිය වැටීගෙන එන විට *නල්ලතන්නියට* පැමිණියෙමු. ආපසු එන ගමනේ දී අප මිත්‍ර *පියසේන* මහතාට වෑන් රථය එළවීමට වුවමනා වී, එය පදවාගෙන ටික දුරක් එන විට හමු වූ තද පල්ලමක් සහිත වංගුවක දී, වාහනය නිසියාකාර ව පාලනය කර ගැනීමට බැරි ව මහපාර අයිනට ම ඇදෙන විට, ඉදිරි අසුනේ සිටි *අබේරත්න මුදලාලි* "හෑන්ඩ් බ්‍රේක්" එක ඇද වාහනය නවත්වා ගත්තේය. මේ වංගුවේ දී රිය අනතුරු කීපයක් ම සිදු වී ඇත. අප බේරුණේ සමන් දෙවි පිහිටෙන් බව හැම දෙනාගේ ම සිතිවිල්ල වන්නට ඇත. එසේ පැමිණ දහ අට වංගුව පසුකර *පල්ලෙවත්තට* පැමිණි පසු නැවතත් පියසේනට වාහනය පැදවීමට අවශ්‍ය විය. එවර වේරගන්තොට අබේරත්න මුදලාලිගේ කඩේ ළඟට පැමිණ වාහනය නවත්වන විට, රෝදවලින් දුම් පිටවීමට පටන් ගත්තේය. පියසේන මහතා වාහනය පැදවීමට පටන් ගන්නා විට "හෑන්ඩ් බ්‍රේක්" බුරුල් නොකර පදවා ගෙන ආ නිසා යයි අබේරත්න මුදලාලි කීවේය. නොදන්නා දේට ගොස් වන්දනා නඩයම නොනැසී බේරුණේ පූරුවේ පිනකට ද?

1954 සූර්ය ග්‍රහණය

1954 වසරේ සූර්යග්‍රහණයක් ඇති වූ දිනක මෙරට මහත් ව්‍යසනයක් ඇති විය. යම්කිසි පුවත්පතක සූර්ය ග්‍රහණය වේලාවට වදකහ අඹරා පානය කළහොත් මහත් වාසි රැසක් ලැබෙන බව සඳහන් වී තිබිණි. නුවණ වර්ධනය, වර්ණවත් ශරීරයක් ඇතිවීම මෙයින් සමහරකි. මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ බොහෝ දෙනෙක් ද මේ වදකහ මිශ්‍රණය සකසා ගෙන පානය කළහ. ටික වේලාවක් ගතවන විට හැම දෙනා ම වමනේ කරන්නට වූහ. වැඩියෙන් වදකහ බීපු අය වැඩියෙන් වමනය කළහ. ඉතා අමාරු වූ කෙනෙක් අසල රෝහලෙන් ප්‍රතිකාර ගත්තේය. මට රෝහලට යන තරම් අමාරුවක් නොවීය. එනමුත් වදකහ බිව් හැම දෙනාට නැවත මෙවැනි මෝඩකම් නොකිරීමට මොළේ පැදුණු බව කිව යුතුය. *"බිව්ව නේද වදකහ සූදිය"* නමින් ගීතයක් ද ප්‍රබන්ධ විය.

අනුරාධපුර ගමන

මෙම කාලපරිච්ඡේදය තුළ දී වරක් මම අනුරාධපුරේ ගියෙමි. දුම්රිය ගමන් බලපත්‍රයක් ගෙන මහනුවර සිට පොල්ගහවෙල දක්වා ගොස් තවත් දුම්රියකින් අනුරාධපුරයට ගියෙමි. මේ වන විටත් අනුරාධපුයේ රජයේ කාර්යාල මෙන් ම කඩපොල ද තිබුණේ ශුද්ධ නගරය තුළමයි. නවනගරය ඉදිවෙමින් තිබිණි. අනුරාධපුරයේ කෘෂිකර්ම කාර්යාලයේ *සිරිනාම අයියා* සේවය කළ නිසා, ඔහු සොයා ගෙන ගොස් දින දෙකතුනක් නවාතැන් ගෙන සිටි නිල නිවසේ නතර වූයෙමි. තවත් රජයේ නිලධාරීන් කීප දෙනෙක් එම නිල නිවසේ නැවතී උන්හ. ආහාරපාන පිළියෙල කිරීමට සේවකයෙක් සිටියේය. දිනක් *සිරිනාම* අයියා මැදවච්චියේ රාජකාරියකට යන විට මමත් එහි ගියෙමි.

සිද්ධස්ථාන කීපයක් තනියම ගොස් වැඳ පුදා ගතිමි.

දින කීපයකට පසුව සිරිනාම අයියා සමඟ බසයකින් මාතලේට පැමිණියෙමි. මාතලේ නගරයේ සිට සැතපුම් දෙක තුනක් ඈතින් තිබුණ ගමක ඔහුගේ ලොකු අම්මා පදිංචි ව සිටියේය. අප ගොස් නැවතුනේ ලොකු අම්මාගේ දුවකගේ නිවසේය. ඒ අක්කා ටිකක් වයස්ගත වී විවාහ වී සිටියාය. පසුදින මම වත්තේගම, මඩවල හරහා මිණිපේට පැමිණියෙමි. අනුරාධපුරේ ගිය මේ ගමන පාසලේ දී අධ්‍යාපන චාරිකාවට පසුව තනියම ගිය ගමනක් වූයෙන්, නැවත වරක් අටමස්ථානය දැක වැඳපුදා ගැනීමට ලැබීමත්, පළමුවරට දුම්රියෙන් අනුරාධපුරේ ගමනත් අලුත් අත්දැකීම් එකතු කළහ.

මේ දිනවල සිරිනාම අයියාට විවාහ යෝජනාවක් තිබිණි. මනමාලිය මාතලේ කඩුවෙල ගුරු මහතෙකුගේ නැඟණියක වූවාය. ඒ විවාහ මංගල්‍යයට මමත් කඩුවෙල ගියෙමි. ඒ සඳහා කලිසම් කෝට් ඇඳුම් කට්ටලයක් මහනුවර දස්වානි සාප්පුවෙන් මස්සවා ගතිමි. මෙය මගේ දෙවෙනි ඇඳුම් කට්ටලය විය. එය මසා තිබුණේ "ගැබර්ඩින්" නම් වූ ලා දුඹුරු පාට රෙද්දකිනි.

උඩුදුම්බර පල්ලේවෙල සිරිනාම අයියලාගේ ගෙදර (කණහම්පිටිය හන්දියේ සිට) කුලී කාර්වලින් මාතලේ කඩුවෙල මනාලියගේ ගෙදර ගියෙමු. මංගල චාරිත්‍රවලින් පසුව දිවා භෝජන සංග්‍රහයක් විය. ආපසු ගමනේ දී මහනුවරට ගොස් ඡායාරූපයකට පෙනී සිට, කුණ්ඩසාලේ තෙල්දෙණිය හරහා නැවත කණගම්පිටිය හන්දියට ගියෙමු. හන්දියේ සිට මනමාලයාගේ ගෙදරට ගම් සභා පාරක් දිගේ සැතපුම් භාගයක් පමණ පයින් යා යුතු විය. ගල්පඩි පෙලක් හා පල්ලමක් තිබුණ එම මඟ ගමන, තුප්පොට්ටි ඇඳුම් ඇද සිටි මනමාල යුවලට යම් තරමක දුෂ්කර කාර්යයක් වන්නට ඇත. මනාලයාගේ නිවසේ පැවති තේ පැන් සංග්‍රහයකින් පසුව මනාලියගේ ඥාතීහු ආපසු ගියහ. මා සහභාගී වූ පළමුවන මංගල උත්සවය නිසා මෙය සටහන් කර තැබීමට සිතුවෙමි. මීට පෙර අපේ අක්කලා හා නංගී විවාහ කර දෙන විට අපේ ගෙදර පැවතියේ ඉතා චාම් චාරිත්‍ර අනුගමනය කිරීම පමණයි. ඒ සඳහා ඈත ගමන්වල නිරත වූයේ ද නැත.

නාට්‍යයක රඟපෑම

මිණිපේ සේවය කරන යුගයේ දී මාසයකට වරක්වත්, වැටුප් ලැබුණ පසු මහනුවර ගියෙමි. මගේ කොණ්ඩෙ කපා ගත්තේ ද මහනුවර බාබර් සාප්පුවකිනි. චිත්‍රපටියක් බැලීමට වුව ද මහනුවරට යායුතු විය. ඒ අතරතුර, සෞන්දර්යාත්මක හැඟීම් ද මතුවන්නට පටන් ගත්තේය. මා ඉගෙනගත් පාසල අසල වලල හන්දියේ බේකරියේ *ජයතිලක* අයියා අප නේවාසිකාගාරයේ සිටිය දී අපට කෙටි නාට්‍ය පුහුණු කළ කෙනෙකි. නාට්‍ය කරණය ගැන ඔහුට දැනුමක් තිබිණි. මගේ උනන්දුව ගැන ජයතිලක අයියාට කී විට ඔහු පුහුණු කිරීමට බලාපොරොත්තු වන නාට්‍යයකට සම්බන්ධ වන ලෙස ආරාධනා කළේය. ඉන්පසු මාස කිහිපයක් සෙනසුරාදා සවස මෙහි පුහුණුවීම් සඳහා වලලට පැමිණියෙමි. *"හිතුවක්කාරයා"* නමැති මෙම නාට්‍යයේ ප්‍රධාන නළුවා මා විය.

නාට්‍යයේ "දුෂ්ටයා" මා සමඟ නෝවාසිකාගාරයේ සිටි පොල්ගොල්ලේ සුගතපාලය. ප්‍රධාන නළුවාට අම්මාත්, බිරිඳත් වශයෙන් තරුණියන් දෙදෙනෙක් පුහුණු වූහ. ඒ අය මහනුවර නගරයේ කටුකැලේ හා දෙයියන්නේවෙල ප්‍රදේශවලින් සොයා ගෙන තිබිණි. මේ නාට්‍ය පුහුණු වන අතරතුර මහනුවර

වෙම්බ්ලි සිනමා ශාලාවේ පෙන්නු *"නිරිම්බිපාර්"* නමැති චිත්‍රපටිය බැලීමට අප එක්කර ගෙන ගියේය. ඒ චිත්‍රපටියේ ප්‍රධාන නළුවා වූයේ *සිවාජි ගනේෂන්* ය. චිත්‍රපටිය බලනවිට අම්මාගේ චරිතයට පුහුණු වන තරුණිය මා ළඟින් වාඩිවී සිටියාය. ඇයට අවශ්‍ය වූයේ චිත්‍රපටිය බැලීමට වඩා මා පැත්තට බරවීමට බව පෙනිණි. එනමුත් එයට අනුබලයක් දීමට මට අවශ්‍ය නොවුණේ ඇය එතරම් ආකර්ශනීය තරුණියක් නොවූ නිසාය. ඉන්පසුව පුහුණුවන රැයක ඈ මට හොරෙන් ලිපියක් දුන්නාය. මගේ "අම්මාගෙන්" එවැනි සම්බන්ධයක් බලාපොරොත්තු නොවන බව කියා ඒ වදයෙන් බේරුණෙමි.

ඉන්පසුව මැනික්හින්න පාසලේ දී සහ පොල්ගොල්ල සමුපකාර විද්‍යාල ශාලාවේ දි මෙම නාට්‍යය වේදිකාගත කෙරිණි. විශාල සෙනඟක් නාට්‍ය බැලීමට පැමිණ සිටි නමුත් ජයතිලක අයියා මට කීවේ වියදම් පියවා ගැනීමටවත් ආදායමක් නොලැබුණ බවයි. සෑම සෙනසුරාදා දිනක ම පාහේ වියදම් සඳහා රුපියල් පනහක්වත් දුන්නෙමි. එය ඒ කාලයේ ලොකු මුදලකි.

නාට්‍ය පුහුණු වන සමයේ සෙනසුරාදා දිනවල පෙරවරු රාජකාරියෙන් පසුව පස්වරු එක හමාරට පමණ මොරයායෙන් පිටත්වන මහනුවර බසයකින් වලලට පැමිණියෙමි. අවසාන කාලයේ පුහුණුවීම් කළේ වලල පාසලේ තාවකාලික ශාලාවකයි. මුළු රෑ නිදිවරා ඉරිදා පාන්දර පහයි තිහට මහනුවරින් එන වේරගන්තොට බස් එකෙන් ආපසු පැමිණියෙමි.

ඉරිදා දවසේ මේ බසයේ හුන්නස්ගිරියේ "සන්ද පොළට" එන සුළු වෙළෙන්දන් බොහෝ දෙනෙක් අතර මඟ දී මෙයට ගොඩ වී පැමිණෙති. "ඕපන් බොඩි" බස් රථයක් වූ මෙහි මා වාඩි ගෙන එන්නේ දෙවෙනි ආසන පේළියේය. මුළු රෑම නිදිවරා එන මා විටින් විට නින්දට වැටේ. සිරිතක් වශයෙන් උදේට යම් ආහාරයක් ගෙන තේ එකක් බොන්නේ හුන්නස්ගිරියේ කන්ද කැපූ තැන පිහිටි දුම්බර හෝටලයෙනි. දිනක් එතැනින් තේ බී මුදල් ගෙවීමට බලන විට මගේ මුදල් පසුම්බිය තිබුණේ නැත. මා එය දමා ගත්තේ කලිසමේ පිටුපස සාක්කුවේය. එදා මා නිදාවැටෙන අතරතුර පසුම්බිය පිටුපසින් බිමට වැටෙන්නට ඇත. අසල සිටි සුළු වෙළෙන්දෙක් අහුලා ගන්නට ඇත. හෝටලයට මුදල් ගෙවීමට නොමැති ව වටපිට බලන විට, මා ප්‍රාථමික පාසල් යන අවදියේ සිට දන්නා හඳුනන කනහම්පිටියේ ලේකම් මහත්තයා එහි සිටියේය. එතුමාට කාරණය පැහැදිලි කර රුපියල් පහක් ණයට ඉල්ලා ගෙන හෝටලේ වියදම් ගෙව්වෙමි. මින්පසුව වසර ගණනක් ගතවන තුරු මා මුදල් පසුම්බියක් පාවිච්චි කළේ නැත. නොදැනුවත් ව නොවැටෙන අයුරු මුදල් තබා ගතිමි.

මුදල් හදල් පරිහරණය

මෙම ගමන් බිමන් ආදිය නිසා මාසික ව ලැබෙන වැටුපෙන් කිසිම මුදලක් ඉතිරි නොවීය. ගෙදර වියදමකට කියා මුදලක් දුන්නේ ද නැත. මාසික ව වැටුප් අත්තිකාරම් දිනයට වච්චරයක් අත්සන් කොට දී රුපියල් පනහක් පමණ ලබා ගනිමි. වැටුප් දිනයේ දී මුළු වැටුප ම අතට ගත් පසු, අත්තිකාරම් මුදලක් ගෙන ඇති බව ප්‍රධානතුමාට කියා, ඔහුගේ කාමරයෙන් පිටවෙමි. අත්තිකාරම් මුදල ආපසු එතුමාට දෙන්නේ නැත. මුදල් වර්ෂය අවසානයේ දී දෙතුන් වරක් එතුමා මට රුපියල් සියයක් හමාරක් දී තිබේ. වරක් එසේ දුන් මුදලින් රුපියල් පනස් පහක් දී ඇලඩින් මේස ලාම්පුවක් මිල දී ගනිමි. පසුකාලයේ දී ඒ ලාම්පුවල මැන්ටල් හා චිමිනි ආනයන නොකරන නිසා, එය භාවිතයෙන් ඉවත් විය. එනමුත්, ලාම්පුවේ තෙල් පුරවන ප්‍රධාන කොටස අපේ ගෙදර තිබේ.

රජයේ සමහර දෙපාර්තමේන්තුවල දුෂණ හා වංචා පවතින බවට කටකතා ඒ කාලයේ දී ව්‍යාප්ත ව තිබිණි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව (පී.ඩබ්ලිව්.ඩී), වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි සංවර්ධන ව්‍යාපාර ඉදිකරන ආයතනවල නිලධාරීන් සමහර දෙනෙක් අල්ලස් ගන්නා බව ද විවෘත රහසක් විය. 1955 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මේ ගැන සෙවීමට රජය විසින් කොමිෂන් සභාවක් ද පත් කරන ලදී. මේ වන විට වාරිමාර්ග අධ්‍යක්ෂ ව සිටි *අලගරත්නම්* මහතා විශ්‍රාම ගොස්, *සිල්වා ගුණසේකර* මහතා අධ්‍යක්ෂ තනතුරට පත් කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සමහර ඉංජිනේරුවන් හා කාර්මික සහකාර නිලධාරීන් මෙන් ම ඕවර්සියර්වරුන් ද තම තමන්ගේ තරාතිරම්වල පමණට අල්ලස් ගත් බව මිණිපේ උපකොට්ඨාශයේ සේවය කරන කාලයේ දී මට පැහැදිලි විය. කාර්යාලයේ සේවය කළ මා වැනි සමහර උදවියට ඒ ගැන උනන්දුවක් නොතිබුණි. අත්තිකාරමක් ලබා ගෙන එය වැටුප් ගන්නා විට අයකර නොගැනීම වැනි "සුළු වාසි" ලැබිණි. මට මුදල් අවශ්‍ය වූ විට කුමක් හෝ කාරණයක් සඳහන් කර අත්තිකාරම් මුදලක් ඉල්ලා ගනිමි. වරක් රුපියල් එකසිය පනහක අත්තිකාරම් මුදලක් ඉල්ලාගෙන මහනුවර *'දස්වානී'* සාප්පුවෙන් "සූට් එකක්" මස්සවා ගත්තෙමි. සිරිනාම අයියාගේ මඟුලට ඇඳගෙන ගියේ ඒ ඇඳුම් කට්ටලයයි.

වලල පාසල් යුගයේ මගේ මිතුරෙකු වූ තෙල්දෙණියේ හෙනගැහුවෙල (දැන් සෙනරත්වෙල) *ව්ජේසිංහ* අයියා මම මිණිපේ සිටිය දී රැකියා විරහිත ව සිටියේය. ඒ නිසා ඔහුට මාපාකඩ වැව ව්‍යාපාරය යටතේ ඇල මාර්ග කැපීම සඳහා සුළු කොන්ත්‍රාත් කිරීමට එන ලෙස දැන්වීමි. රුපියල් පන්දහකට අඩු වැඩ සුළු කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටුකරවා ගැනිණි. ඒ සඳහා අදාල වැඩභූමිය අසල වාඩියක් ඉදිකර ගෙන කම්කරු කණ්ඩායමක් සේවයේ යෙදවිය යුතුවිය. උදළු, අලවංගු, කුඩා වැනි උපකරණ සපයා ගත යුතු වේ. ආහාරපාන වාඩියේ දී සකසා ගත යුතු වේ. විජේසිංහ අයියාට මේ සඳහා

මුදලින් ආධාර කොට අවශ්‍ය හාල්, තුනපහ වැනි දේ අබේරත්න මුදලාලිගේ කඩෙන් මිල දී ගැනීමට (ණයට) උපකාර කළෙමි. මෙම දුෂ්කරතාව නිසා, විජේසිංහ අයියා මාසයකට දෙකකට පසුව වැඩ අවසන් කර ගමට ගියේය. එනමුත්, ඔහු සමඟ මගේ තිබුණ මිතුරුදමට එය බාධාවක් නොවීය. මීට පෙර හා පසුවත් විටින් විට විජේසිංහ අයියලාගේ ගෙදර ගොස් සමහර විට දින දෙක තුනක් එහි ගත කළෙමි. වරක් එහි ගිය අවස්ථාවක විශාල සියඹලා ගසක් මුල ඉදිකළ මඩුවක දේවදානයක් පැවැත් වූ නිසා, දින දෙකතුනක් ම නැවතී සිටියෙමි. ඒ වකවානුවේ විජේසිංහ අයියලාගේ ගෙදර ඒ දෙමව්පියන් හා ගම්සභා සභාපති කෙනෙකු වූ මාමා කෙනෙක් ද බාල වයසේ නංගී කෙනෙක් ද සිටියහ. විජේසිංහ අයියාගේ වැඩිමහල් සහෝදරයෙක් පිට ප්‍රදේශයක රැකියාවක නිරත වී සිටියේය.

මාපාකඩ ව්‍යාපාරය විවෘත කිරීම

1955 වසරේ මැදහරියේ දී පමණ (1954 දී වන්නටත් පුළුවන) අලුත්නුවර ආසනය සඳහා අතුරු මැතිවරණයක් පැවැත් වූ නිසා, මාපාකඩ ව්‍යාපාරයේ ඉදිකිරීම් කටයුතු වේගවත් කර උත්සවශ්‍රීයෙන් "විවෘත" කිරීමට කටයුතු යෙදුවේය. මේ සඳහා එවකට *අග්‍රාමාත්‍ය ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා, ඉඩම් සංවර්ධන ඇමති බුලන්කුලම මැතිතුමා, වාරිමාර්ග අධ්‍යක්ෂ සිල්වා ගුණසේකර මැතිතුමා* යනාදින් සහභාගි වීමට නියමිත ව තිබිණි. එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළේ *කපිතාන් සෙනෙවිරත්න* මහතා යයි සිතමි. මේ උත්සවය මාපාකඩ වැව වේල්ල මත පවත්වන ලදී. සම්භාවනීය අමුත්තන් පිළිගැනීම පිණිස ගීතයක් ගායනා කළයුතු බව අපේ ප්‍රධාන වෙල්ලප්පා මහතාගේ අදහස විය. ඒ සඳහා මා උචිත තාලයකට ගීතයක් රචනා කර, වෙල්ලප්පා මහතාගේ දියණියන් දෙදෙනා සමඟ දින කිහිපයක් පුහුණු වී, උත්සවයේ දී ගායනා කළෙමු. සැලසුම්කරු පියදාස මහතා වයලීනය වාදනය කළේය. "විවෘත කිරීමේ" උත්සවය ඉහළින් ම පැවැත්වුණ නමුත් මැතිවරණයෙන් ජයග්‍රහණය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ *ගුණරත්න* නම් මහතෙකි. එතුමා බදුල්ලේ සේවයේ නිරත ව සිටි ගුරුවරයෙකි.

රෝගාතුර වීම

1955 වසරේ දී මාර්තු මාසයේ පමණ ම තදබල ලෙස රෝගාතුර වීමි. උණ සෑදී ඉතා දරුණු හිසරුදාවක් දින ගණනක් එක දිගට පැවතිණි. ඒ නිසා, තෙල්දෙණියේ රෝහලට ගොස් එහි ඩී.එම්.ඕ. ජයකොඩි දොස්තර මහතාගෙන් බෙහෙත් ලබා ගෙන, හාල්යාලේ අයියලාගේ ගෙදර ගියෙමි. හිසරුදාව හා උණරෝගය සුව වූයේ නැත. අයියා හුන්නස්ගිරියට ගොස්



මහනුවර ඇසළ පෙරහැර සමයේ
බෝගම්බර සැනකෙලි භූමියේ
සේයා හළකින් ගත් රූවක්, 1954

කුලීරථයක් ගෙනැවිත් මා තෙල්දෙණියේ රෝහලට කැඳවා ගෙන ගොස් ඇතුළු කළේය. දින හත අටක් වාට්ටුවේ නැවතී ප්‍රතිකාර ලබා ගතිමි. ලේ පරීක්ෂා කිරීමට මහනුවර රෝහලට යවන ලදී. දින තුනකට පමණ පසුව ලැබුණු වාර්තාවේ සඳහන් වූයේ, මට සන්නිපාත උණ (ටයිෆොයිඩ්) වැළඳී ඇති බවයි. මේ රෝගය වැළඳුන විට, බඩවැලේ ගෙඩි හැදී ඒවා පුපුරණ විට, ලේ බඩයෑමට ද පටන්ගනී. මෙය සුවවීමට ගතවන කාලය එහි බැරෑරුම්කම අනුව වෙනස් වේ. සමහර විට සතියකින් පමණ සුවවීමට පුළුවන් නමුත්, සති හයක් පමණ ගත වූ අවස්ථා ගැන ද අසන්නනට ලැබිණි. මට රෝගය සුවවීමට සති දෙකක් පමණ ගතවිය. ආහාර කිසිවක් ගැනීමට නොහැකි විය. දෙහි යුෂ පානයට දෙනු ලැබේ. එයින් බඩවැලේ තුවාල වේලීයන නිසාය. වාට්ටුවේ ප්‍රතිකාර ගන්නා කාලය තුළ දී වේඩරුවේ සිට සේවයට පැමිණෙන රෝහල් සේවකයෙක් රෑ වැඩ කළේය. උදේ පාන්දරින් ම ඔහු උණුවතුර බේසමක් ගෙනවිත් මුළු ඇඟ ම ධෝවනය කර පිරිසිදු කරයි. මේ වකවානුවේ වතුර උණුකළේ දර ලිප්වලය. විදුලි බලය තිබුණේ නැත. රාත්‍රියට ලාම්පු දල්වා තිබිණි. විදුලි ආලෝකය නොවීය.

වාට්ටුවේ නැවතී සිටි අවදියේ අසනීපය ටිකක් සුවවී ගෙන එන විට, අසල කඩයක ගුවන් විදුලි යන්ත්‍රයකින් විටින් විට මිහිරි හින්දුස්ථානි ගීත ඇසෙන්නට විය. ඒ යුගයේ අපගේ ගුවන් විදුලි සේවයේ බෙහෙවින් ම වාදනය කළේ හින්දි සංගීතයයි. *බයිජු බව්රා* චිත්‍රපටියේ *"තූ ගංගාකි මෝජුවේ ජමුනාකි ධාරා"* ගීතය ද *"භගවාන්, භගවාන්...."* යන ගීතය ද නිතර ඇසෙන්නට වන. *රූක්මණී දේවී* සහ *මොහිදීන් බෙග්* යන කලාකරුවන් දෙදෙනා මෙම සින්දුවල තාලයට සිංහල සින්දු දෙකක් ගායනා කළහ. ඒවා ද මේ යුගයේ අතිශයින් ම ජනප්‍රිය විය.

මගේ අසනීපය සුව වී ටිකට් කැපුවාට පසුව, නවරත්න මල්ලී (එනම් අයියා විවාහ කරගෙන සිටි නන්දා අක්කාගේ මල්ලී) සමඟ කරල්ලියද්දේ

නැදෑ ගෙදරකට ගියෙමි. ඒ ගෙදර කුඩප්පච්චී, කුඩම්මා සහ අක්කා මට ආදරයෙන් සංග්‍රහ කළහ. පසුදින කුලී රථයකින් *තෙල්දෙණියට* පැමිණ, මිණිපේ බස්රියකින් *හාල්යාලට* ගියෙමි. එහි අයියලාගේ ගෙදර සතියක් පමණ විවේකයෙන් ගත කළෙමි. අසනීප වීමෙන් ඉතා දුර්වල ව සිටි නිසා බිත්තර ආහාරයට ගන්නා ලෙස වෛද්‍ය උපදෙස් ලැබිණි. එනමුත් මීට පෙර මස් මාළු බිත්තර කෑවේ නැත. දිනක් නවරත්න මල්ලී තම්බා දෙන ලද බිත්තරයක් "උගුරට හොරා" ගිල දැමීමි. ඉන්පසුව ටික දවසක් ගතවන තුරු දිනකට වරක්වත් බිත්තරයක් ලැබිණි.

නැවත රාජකාරී සඳහා මොරයායට ගිය පසු නිල නිවාසයක නතර වූයෙමි. එ මගේ මිත්‍ර පියදාස මහතාගේ කාමරයේය. ආහාරය අසල කඩයකින් ලබා ගත්තෙමි. ශරීරයේ දුර්වලකමට සැනටෝජන් පානය කළෙමි. නැවත පෝෂ්‍යදායක ආහාර ශරීරයට ලැබුණ විට දුර්වලකම් දුරුවිය. කාර්යාල කටයුතු පමණක් නොව බාහිර කටයුතු සුපුරුදු පරිදි නැවත ඇරඹුවෙමි. මොරයාය පාසලේ වැඩිහිටි පන්තියේ ඉගැන්වීමට සවස හයෙන් පසුව සතියකට දින තුනක් සහභාගී වූයෙමි.

පෙම් සබඳතාව

තරුණ වියට පත් කෙනෙක් තම ජීවිතයට බෙහෙවින් ම වැදගත් කරුණක් ලෙස සලකන්නේ සුදුසු සහකාරියක් සොයා ගැනීමයි. සමහර විට ගැටවර වියේ දී පවා මේ ගැන අවධානය යොමු කරනවා විය හැකිය. පාසල් යන වියේ දී පවා ප්‍රේම සම්බන්ධතා ඇති කරගන්නේ මේ නිසා යයි සිතමි. ගැටවර විය අවසාන වේගන එනවිට මේ අදහස් මෝදු වී එන්නට පුළුවන. මගේ ජීවිතයේ මේ අවධිවල දී මා මුහුණ දුන් ගැටලු කීපයක් විය. කුඩා කල ගෙදර දී කාන්තාවන් ඇසුරේ හැදුණු වැඩුණු නිසා ගෙදරින් බැහැර දී හමුවන තරුණ කාන්තාවන් අක්කා නංගිලා ලෙස සැලකීමේ ප්‍රවණතාවක් විය. ගැටවර වියේ දී මිශ්‍ර පාඨශාලාවක අධ්‍යාපනය ලැබූ මා, එහි දී මුණ ගැසුණ ගැහැණු ළමුන් කීප දෙනෙක් ගැන පැහැදීමක් ඇති වුණ නමුත්, ඉහත කී ප්‍රවණතාව නිසා ඒ කිසිවෙකු යෙහෙළියක් කර ගැනීමට ප්‍රයත්නයක් දැරුවේ නැත. එකල පැවැති සදාචාරාත්මක බලපෑම් නිසා ද පාසල් වියේ දී ප්‍රේම සම්බන්ධතාවක් ඇති කර ගැනීම "තහනම්" දෙයක් සේ සැලකුවෙමි. දෙමව්පියන්ගෙන් යැපෙන අවදියේ දී එවැනි "තහනම්" සම්බන්ධතාවලට පැටලීම වඩාත් බරපතල බව විශ්වාස කළෙමි.

තරුණ වියට පත් වී ස්වාධීන ආදායම් මාර්ගයක් ඇති වූ පසුව මේ ගැන උනන්දු වූ නමුත්, සම්මත සීමාවන් ඉක්මවීමට ධෛර්යමත් නොවීමි. මා උඩරට සිංහල බෞද්ධ ගොයිගම පවුලකට අයත් වූ නිසා, ඒ රාමුවට ගැලපෙන තරුණියක් සොයා ගත යුතු විය. වැඩිහිටියන් මැදිහත් වී සුදුසු

කෙනෙක් යෝජනා කිරීමට පමා වූයේ මා තවමත් එතරම් වයස්ගත වූ කෙනෙක් නොවූ නිසා විය හැකිය. එනමුත් මගේ අදහස වූයේ, සුදුසු කෙනෙක් මා විසින් ම සොයා ගත යුතු බවයි. පාසල් යන වියේ දී දැන සිටි අය ඉහත සඳහන් රාමුවට මුළුමනින් ම නොවැටුණු නිසා යම් සම්බන්ධයක් ඇති කරගැනීමට පසුබට වීමි. සමහර තරුණයන් විනෝදය පිණිස "ප්‍රේම සම්බන්ධතා" ඇති කරගන්නා නමුත් මට එවැනි දෙයක් අවශ්‍ය නොවීය. යම් කෙනෙක් සමඟ එවැනි සම්බන්ධතාවක් ඇතිකර ගත යුතු විවාහ වීමේ අරමුණින් මිස "විනෝදයට" නොවිය යුතු බව මගේ තදබල විශ්වාසය විය. මේ නිසා මේ කාරණයේ දී බෙහෙවින් ම ප්‍රවේශම් වීමට සිදුවිය.

හිතුවක්කාරයා නාට්‍යය පුහුණු වන සමයේ දී එයට සහභාගී වූ තරුණියක් මා "ආක්‍රමණය" කිරීමට ප්‍රයත්න දැරූ නමුත් නොයෙක් හේතු නිසා ඇගේ ප්‍රේමවන්තයා වීමට අකමැති වූයෙමි. මෙම පුහුණුව සඳහා කලක් සෑම සති අන්තයේ ම මොරයායේ සිට වලල දක්වා බසයෙන් ගමන් කළෙමි. ඒ ගමනක දී වරක් *අඹගහපැලැස්ස* පාසලේ ඉංග්‍රීසි ගුරුවරිය මුණ ගැසිණි. *තෙල්දෙණියේ අංචිකඩේ* පදිංචි පවුලක කෙනෙකි. අප දෙදෙනා නොයෙක් දේ කතා බහ කරමින් ගිය නමුත්, මින් පසුව අප හමු නොවුන නිසා, ඒ හැඳුනුම්කම වැඩිදියුණු කර ගැනීමට නොහැකි විය. සමහර විට උනන්දු වූවා නම් ඈ සොයා යන්නට තිබුණු නමුත් එය අතපසු විය.

සන්නිපාත උණ සුව වී සුපුරුදු පරිදි *මොරයායේ* පාසලට ගිය විට, එහි ගුරු නිවසේ දී තරුණ කතක් දුටුවේය. ඈ ප්‍රධානාචාර්යතුමාගේ නෑදෑ කෙනෙක් බව දැනගතිමි. වැඩිහිටි අධ්‍යාපන පන්තියට එන විට ඇය පාසලේ දී හමුවූවාය. මේ තරුණිය ගැන පැහැදීමක් ඇති වුණ නමුත්, වැඩිහිටියන් හා වෙනත් අය ඉදිරියේ කතා බහ කිරීමට ධෛර්යමත් නොවීමි. ක්‍රමයෙන් මා ගැන ඇය තුළ ද උනන්දුවක් ඇති බව දැනිණි. අප දෙදෙනා අතර වූ "අදෘශ්‍යමාන තාප්පය" බිඳ දැමීමට ධෛර්යමත් වූයේ ඒ තරුණියයි. ප්‍රධානාචාර්යතුමාගේ නිවසේ *ගුණදාස* නමින් පාසල් ශිෂ්‍යයෙක් නැවතී සිටියේය. ඔහු සන්ධ්‍යා කාලයේ වැඩිහිටි පන්තියේ දී ඉංග්‍රීසි ඉගෙන ගැනීමට පැමිණියේය. ඒ පන්තියට ඉගැන්වූයේ මමයි. පන්තිය අවසන් වන විට රැ හතහමාර පමණ වේ. එක හැන්දෑවක *ගුණදාස* විසින් හොර රහසේ ම මගේ අතේ ලිපියක් තැබීය. එය දුන් කෙනා කවුදැ'යි කියා සිටියේය. සිතේ යම්කිසි චකිතයක් ඇති වුව ද ලිපිය සාක්කුවේ දමාගෙන නවාතැනට පැමිණි පසු කියවීමි. එය ලියා තිබුණේ "ප්‍රේමා" නමැති කෙනෙකු විසිනි. ලියුම්කාරිය මා ගැන පැහැදීමක් ඇති බව දක්වා තම පවුල පිළිබඳ තොරතුරු ද සඳහන් කර තිබිණි.

තමාගේ නම *ප්‍රඥාවතී විජේසිරිවර්ධන* බවත් "ප්‍රේමා" යන්න ආරූඪ නාමය බවත් සඳහන් කර තිබිණි. ඇගේ උපන්ගම මාතර තල්පාවිල *අලහේන්පිටය.* පියා *දොන් කෝර්නේලිස් විජේසිරිවර්ධන* ය. මව *දෝන ඇසැනසියා සමරකෝන්ය.* ප්‍රේමාගේ පවුලේ සහෝදර සහෝදරියන් ගැන ද

තොරතුරු අඩංගු විය. මොරයාය පාසලේ ප්‍රධානාචාර්ය *සුබසිංහ* මහතා ඇගේ මුත්තා කෙනෙකි. *'මාවරලේ මුත්තා'* නමින් ඇමතුවාය. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී සිටි ප්‍රේමා, මාවරලේ මුත්තා කොළඹ මැනිං ටවුමට ගිය විටක ඔහු සමඟ මොරයායට පැමිණියාය. මාවරලේ මුත්තාගේ පුත් ඉන්ද්‍රා සහ දියණිය චන්ද්‍රා පාසල් යෑම සඳහා මැනිං ටවුමේ නෑදෑ ගෙදරක නවාතැන් ගෙන උන්හ. ඒ ගෙදර ප්‍රේමාගේ ලොකු කුඩම්මා විවාහ වී සිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ *රාසපුත්‍ර* මහතාගේ (බාප්පාගේ) නිල නිවාසය විය. ප්‍රේමා මට හමුවන විට පාසල්වල සිංහල අවුරුදු නිවාඩු කාලය විය. මේ තරුණිය ගැන සඳහන් වී තිබුණ තොරතුරු අනුව ඈ මගේ "රාමුවෙන්" පිට පැන්නේ එක කාරණයක දී පමණය. එනම් උඩරට නොවීමයි. මේ වකවානුවේ දී මගේ දෙමව්පියන්ට මෙය ද ගැටලුවක් වීමට ඉඩ තිබිණි. කෙසේ වෙතත්, මෙම තරුණිය ගැන පැහැදීමක් ඇති වූ නිසා, *ගුණදාස* මගින් තොරතුරු හුවමාරුව ආරම්භ කළෙමි.

මේ කාරණය ඇගේ වැඩිහිටියන්ට රහසක් ව තබාගත යුතු නොවන බව මගේ මිත්‍ර පියදාස සමඟ සාකච්ඡා කර තීරණය කළෙමි. ඒ අනුව, පියදාස මිතුරා මගින් ඒ ගැන මාවරලේ මුත්තාටත්, ආත්තාටත්, දැන්වූයෙමි. ඒ අය ද මෙවැනි සම්බන්ධයක් ගැන නොසතුටක් දැක්වූයේ නැත. කෙසේ වෙතත්, පාසල් නිවාඩුව අවසන් වී ඉන්ද්‍රා හා චන්ද්‍රා කොළඹ *එක්කර* ගෙන යන විට ප්‍රේමා ද කොළඹ ගියාය. එහි ගොස් මැනිං ටවුමේ ඇගේ ලොකු කුඩම්මාගේ නිවසේ නවාතැන් ගෙන සිටියාය. දැන් තොරතුරු හුවමාරු වූයේ තැපෑලෙනි.

ප්‍රේමාට පෙම් බැඳීම





ප්‍රේමා සහ කපුගේවත්තේ කළු අක්කා
1950 දී පමණ

ප්‍රේමාගේ මැණියන් අයත් වූ *සමරකෝන්* පවුලේ පිරිමි පස් දෙනෙක් හා ගැහැණු හතර දෙනෙක් ද වූහ. ප්‍රේමාගේ ලොකු මාමා, වෙද මාමා, ඩිංගි මාමා, බැංකුවේ මාමා, හින්නි මාමා පිරිමි පස් දෙනය. අම්මා, හිංගි කුඩම්මා, ලොකු කුඩම්මා හා පුංචි කුඩම්මා ගැහැණු හතර දෙනාය. මේ වන විට අම්මා සහ හිංගි කුඩම්මා හැර අන් සියලු දෙනා ම කොළඹ ප්‍රදේශයේ පදිංචි ව උන්හ. බැංකුවේ මාමා සහ ඩිංගි මාමා පානදුරේ ද වෙද මාමා පාගොඩ ද, හින්නි මාමා උඩහමුල්ලේ ද පදිංචි ව සිටියහ. ලොකු මාමා මාතර නගරයේ ඔහුගේ ලොකුපුතාගේ ගෙදර පදිංචි ව සිටි නමුත් නිරන්තරයෙන් කොළඹ පැමිණියේය. එවිට නවාතැන් ගත්තේ මැනිං ටවුමේ ලොකු කුඩම්මාගේ ගෙදරය. එතුමා මට හමුවූයේ ද එහිදීය. ඒ විවාහයට පෙරය. ලොකු කුඩම්මාට *කීර්නි, ලක්ෂ්මන්* නම් පුතුන් දෙදෙනෙක් හා *රම්‍යා* නම් දියණියක් ද වූහ. මේ තිදෙනා ම එවකට පාසල් සිසුන් වූහ.

ප්‍රේම සම්බන්ධතාව ගැන මගේ දෙමව්පියන්ට ද දැන්වූයෙමි. අම්මාට සියලු විස්තර දැන්වූවත් අප්පච්චිට මා කතා කළේ නැත. ඒ වගකීම සිරිත් පරිදි අම්මාට පැවරිණි. අම්මා මගේ කැමැත්තට අකමැති නූනත් අප්පච්චිගෙන් කිසිම ප්‍රතිචාරයක් ලැබුණේ නැත. විරුද්ධත්වයක් පළ කළේ ද නැත. ඒ මම "හිතුවක්කාර" වන බව දන්නා නිසා වන්නට ඇත. ඒ නිසා මගේ සිතැඟි පරිදි කටයුතු කිරීමට තීරණය කළෙමි.

ඉඩප්‍රස්ථා ලැබුණ විට කොළඹ ගොස් ඇය බැලීමට ගියෙමි. ඇගේ නෑදෑයින් මේ සම්බන්ධය අනුමත කළ බව පෙනිණි. ඇගේ ලොකු මාමා මා ගැන බෙහෙවින් ම පැහැදී සිටි බව පෙනිණි. කොළඹ ගමනට ඉඩ ලැබුණ හැම අවස්ථාවක දී ම මැනින් ටවුමට ගියෙමි. එවකට මිණිපේ සේවය කළ *ජයතිස්ස* නමැති කාර්මික නිලධාරී මහතාට තදබල උණ රෝගයක් වැළඳී ඔහු සමඟ කොළඹ ඒමට කෙනෙක් සොයන විට, මම කැමැත්තෙන් ඉදිරිපත් වූයෙමි. ජයතිස්ස මහතා ගම්පහ ප්‍රදේශයේ කෙනෙකි. මොරයායේ

තිබුණ වැන් රථයකින් මිත්‍රයා සමඟ මිරිස්වත්ත හන්දියට එන විට, ජයතිස්ස මහතාගේ ඥාතීන් දෙතුන් දෙනෙක් අපට එක්වී බොරැල්ලේ දොස්තර විජේගුණවර්ධන මහතාගේ බංගලාවට ගිය පසු, ඇල්ප්‍රඩ් හවුස් ගාර්ඩන්ස්හි පිහිටි ඩර්ඩන්ස් රෝහලට ඇතුළු කරන ලෙස උපදෙස් ලැබිණි. ඒ වැඩ කටයුතු අවසන් කර වැන් රථය ආපසු පිටත් කිරීමෙන් පසුව, මැනිං ටවුමට ගොස් එදින රෑ එහි නැවතී සිට ආපසු මිණිපේ ගියේ දිනකට දෙකකට පසුවයි.

මෙම සම්බන්ධතාව ඇතිවීමෙන් පසුව මගේ අරමුණ වූයේ විවාහ ජීවිතයට ඇතුළුවීමයි. එම අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය නොයෙක් පියවර ගැනීම ආරම්භ කළෙමි. ගෘහ භාණ්ඩ ස්වල්පයක් සාදවා ගැනීමට අපේ ගෙදර තිබූ ලෑලි වගයක් මොරයාය හන්දියේ පුංචි සීයාගේ වඩුමඩුවට ගෙනවිත් දුනිමි. කෑම මේසයක්, කණ්නාඩි මේසයක්, ඇඳන් දෙකක් සහ පොත් රාක්කයක් මේ දැවවලින් නිමකර ගත හැකි විය. මොරයාය වැනි ස්ථානයක සේවය කරමින් කොළඹ හෝ මාතර ජීවත්වන තරුණියක් සමඟ විවාහ ජීවිතයට එළඹීම ගැටලු සහිත වූ නිසා, සුදුසු ස්ථාන මාරුවීමක් ලබා ගැනීම අත්‍යවශ්‍ය විය. ඒ සඳහා ලිපියක් වාරිමාර්ග අධ්‍යක්ෂතුමාට 1955 ජූලි 27 දින මිණිපේ වාරිමාර්ග ඉංජිනේරුවරයා සහ බණ්ඩාරවෙල මධ්‍යම කොට්ඨාශ භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා මගින් ඉදිරිපත් කළෙමි. ස්ථාන මාරුවීම ඉල්ලීමට හේතු වශයෙන් සඳහන් කළේ, වසර දෙකකට වැඩි කාලයක් මිණිපේ සේවය කළ මා උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමත්, ලිපිකාර සේවයේ විධායක ශ්‍රේණියේ දෙවෙනි පන්තියට උසස් කිරීමේ විභාගයට පෙනී සිටීමත් අපේක්ෂා කරන නිසා, එයට පහසුකම් ඇති ස්ථානයකට මාරුවීමක් ලබා දෙන ලෙසය.

මේ අනුව 1956 ජනවාරි 3වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයට මාරුවීමක් ලැබිණි.

ප්‍රීති සම්භාෂණ

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මිණිපේ උප කොට්ඨාශ කාර්යාලයේ වසර තුනක කාලයක් තුළ, මෙහි සඳහන් නොවූ නමුත් අපගේ ජීවිතවලට බලපාන වැදගත් තවත් කරුණු කීපයක් විය. මෙම දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන බොහොමයක් දුෂ්කර ප්‍රදේශවල පිහිටා තිබිණි. ඒ නිසා, ඒවායේ සේවය කරන නිලධාරීන් හා සේවකයන් අතර ගොඩනැගෙන සමාජ සම්බන්ධතාවන් ඉතා වැදගත් වේ. එකිනෙකා අතර ගැටුම් ඇති වුවහොත් රාජකාරි කටයුතු පවා අවුල් වියවුල් වීමට ඉඩ තිබේ. විවිධ ජනවර්ගවලට හා

ආගම්වලට අයත් උදවිය මේ ස්ථානවල සේවය කළහ. එක උපකොට්ඨාශයක වුව ද වැඩබිම් එකිනෙකින් දුර බැහැර ව පවතී. මේ නිසා මේ අය ඒකරාශී වීමට නොයෙක් අවස්ථා උපයෝගි කර ගත්හ. යම්කිසි කෙනෙකුට ස්ථාන මාරුවක් ලැබුණ විට, ඒ නිමිති කර ගෙන සාදයක් පැවැත්වීම සිරිතක් විය. සති අන්තයේ රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා මාරු වී යන තැනැත්තාට තෑගිබෝග දී සුභපැතීම සිදුවිය. ආහාරයට පෙර මදුපානය වැදගත් අංගයක් විය. ගී ගායනා නිතැතින් ම සිදුවේ. ඒ ඒ යුගයේ ජනප්‍රිය සිංහල, දෙමළ, හින්දි සින්දු ගායනා කිරීමට දස්කම් තිබූ අය වූහ. මේ අවදියේ සිංහල *සුජාතා චිත්‍රපටිය*, හින්දි *බයිජු බවුරා චිත්‍රපටිය*, හා දෙමළ *"ලයිෆ්"*, *"තිරිම්බිපාර්"* වැනි චිත්‍රපටිවල ගීත සමහරක් බෙහෙවින් ම ජනප්‍රිය වී තිබිණි. *කඩවුණු පෙරොන්දුව*, *කපටි ආරක්ෂකයා*, *හදිසි විනිශ්චය*, *පෙරළෙන ඉරණම* යනාදී චිත්‍රපටිවල ගීත මේ අවදියට පෙර සිටම ජනප්‍රිය වී තිබිණි. *කෑලෑහඳ* චිත්‍රපටිය එළිදැක්කේ ද මේ අවධියේ යයි සිතමි. නිතර ගායනා කළ ගීතය *මොහිදීන් බෙග්* මාස්ටර්ගේ *"මායා මායා"* නමැති ගීතයයි. ගායනය පටන් ගන්න බොහෝ දෙනාට වරදින්නේ උච්ඡස්වරයට ගැයිය යුතු අවස්ථාව වන විටයි. ඒ යුගයේ *මොහොමඩ් රාෆි* ගායනා කළ මෙහි හින්දි ගීයද ගායනා කිරීමට දැන සිටියෙමි. ඒ ගීතයේ මුල් වචන *"භගවාන්, භගවාන්..... ඕ දුනියාකේ රඛවාලේ ....."* යනාදි වශයෙන් විය. හින්දි ගීතයක් වූ *"දෝ නයනා තුම්හාරේ පියරෙ පියාරේ"* යන ගීතයේ තාලයට සුජාතා චිත්‍රපටියේ *"ජීවන මේ ගමන සංසාරේ"* යන ගීතය බෙහෙවින් ජනප්‍රිය වී තිබිණි.

මේ ගීත ගායනාවන්හි දී එවකට අපගේ ප්‍රධාන ලිපිකරු ලෙස සේවය කළ *ටී.එයි. මුණවීර* මහතා ක්ලැරිනට් වාදනය කළේය. ඔහු සඳහන් කළ අන්දමට, ක්ලැරිනට් වාදනය ඔහු ඉගෙනගත්තේ ගුවන් විදුලි ශිල්පී *ඒ.ජේ. කරීම්* නම් ක්ලැරිනට් වාදකයාගෙනි. සැලසුම් ශිල්පී (ලොකු) *පියදාස* මහතා වයලින් වාදනය කළේය. *මුණවීර* මහතා මාරු වී පැමිණි යුගය මම *"හිතුවක්කාරයා"* නාට්‍යයේ රඟපෑම්වලට ගිය යුගයයි. සමහර දිනවල නිල නිවාසයේ දී ඔහු ක්ලැරිනට් වාදනය කරන විට මම ගීත ගායනා කළෙමි. අප දෙදෙනා අතර එවකට වඩාත් ම ආකර්ශණීය ගීතය වූයේ *රැක්මණී දේවි* හා *ඇස්.ඇස්.වේදා* ගැයූ *"ගියේ ඇයි ද මාව තනිකර හෘදේ දුකක් මවා වැළපෙන්නෙ ඔබගේ සොඳුරිය සෝකෙන් සුසුම් හෙළා"* යන ගීතයයි.

අපගේ තවත් ජනප්‍රිය ගීතයක් වූයේ බයිජු බව්රා චිත්‍රපටියේ *මොහොමඩ් රාෆි* ගැයූ *"තූ ගංගා කී මෝජූ මේ ජමුනා කිධාරා"* යන ගීතයයි. මෙවැනි "ලොකු" සාදවලට අමතර ව කාර්මික නිලධාරියෙක් "මරා" ගැනීමට ලැබුණ විටක, *මොරයාය* කැම්ප් එකේ සිටි අප කීප දෙනෙක් විනෝද වූ අවස්ථාවල් අනන්තය. මහනුවර සිට මිණිපේ එන බස් රථ අරක්කු බෝතල් ප්‍රවාහකයෙක් විය. සවස් වරුවේ නුවරින් පිටත්වන බස් රථවල රියදුරන්

හා කොන්දොස්තරවරුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ මිණිපේ කොළණියට අරක්කු ගෙනවිත් විකිණීමයි. එවකට අරක්කු බෝතලයක් රුපියල් දහයකට බසයෙන් ලබා ගත හැකි විය. මහනුවර තැබෑරුමේ රුපියල් අටකි. කෙනෙකුට අරක්කු බෝතල් දෙකක් ගෙනගිය හැකි විය. මහනුවර තැරැව්කරුවන් බෝතල් දෙකේ පාර්සල් බසයට ගෙනවිත් දුන්හ. බස්සේවකයන් ඒවා මඟීන් අතට දී ප්‍රවාහනය කරවා ගනී. දිනක් තෙල්දෙණියේ දී පොලිසියෙන් පරීක්ෂා කරද්දී ඉදිරිපස අසුනේ බෝතල් දෙකක් තිබී ප්‍රශ්න කළ විට රියදුරා කියා ඇත්තේ, ඒවා එම අසුනේ වාඩිවී සිටි හාමුරුදුරුවන්ගේ බවයි. හාමුදුරුවන්ගේ නම් අපි ගෙන යනවා කියා පොලිසිය ඒවා අත්පත් කර ගෙන ඇත. එම රියදුරා මඩවල මරක්කලයෙකි. එකල ගොවිජනපද ව්‍යාපාරවල මත්පැන් ව්‍යාප්ත කළේ බස් සේවකයන්ය. බස්රථ සමාගම් ගමනාගමන මණ්ඩලයට පවරා ගැනීමෙන් පසුව මේ කටයුතු නතර වූයේ /අඩු වූයේ බස් සේවකයන්ගේ වැටුප් ආදිය ද වැඩි වූ නිසාය.

වේරගන්තොට මහපාරේ සිට තානායමට යන පාරට මායිම් වූ හිස් ඉඩමක තාවකාලික චිත්‍රපටි ශාලාවක් ඉදිකර තිබිණි. මේ ස්ථානයට මොරයායේ වාරිමාර්ග කාර්යාලයේ සිට දුරප්‍රමාණය සැතපුම් එක හමාරක් පමණ විය. මේ නිසා විටින් විට චිත්‍රපටි බැලීමට ද ගියෙමු. වරක් එහි *සීක්‍රට්ස් ඕෆ් ලයිෆ්* නමැති ඉංග්‍රීසි චිත්‍රපටිය පෙන්වන ලදී. එහි ශෛල්‍යකර්මයන් ද ඇතළත් ව තිබිණි. ශෛල්‍ය කර්මය අරඹන විට ම මම ක්ලාන්ත වීමි. සිහිය එන විට ඒ දර්ශනය අවසන් වී තිබිණි. *සුජාතා* වැනි චිත්‍රපටි ද මෙහි පෙන්වීය. මිණිපේ ගොවිජනපදයේ ඇත සිට බයිසිකල්වලින් චිත්‍රපටි නැරඹීමට සෙනඟ ආවෝය. මොරයායේ පදිංචි ව සිටි මැදිවියේ යුවලක් දිනපතා ම චිත්‍රපටි නැරඹීමට ගිය බව කියනු ලැබේ.

05 යුග දිවි සමය

කැළණියේ නවාතැන

1956 ජනවාරි 3වැනි දින සිට ක්‍රියාත්මක වීමට නියමිත ස්ථාන මාරුව පිළිබඳ ලිපිය මට ලැබුණේ 1955 දෙසැම්බර් 1වෙනි දා ය. පළමුවෙන් ම කළ යුතු වූයේ කොළඹ ගිය විට නැවතීමට නවාතැනක් සොයා ගැනීමයි. *මැදිවක* හා *වලල* පාසල් දෙකේ දී ම මා සමග ඉගෙනගත් ගංගොඩ *ජී.බී.වයි රඹුක්වැල්ල* මහතා මේ වන විට කොළඹ කොටුවේ පිහිටි පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ සේවයේ නිරත ව සිටියේය. ඔහුගේ කාර්යාලයේ සේවය කරන *පෙරේරා* නැමැති කෙනෙක් කැළණිය දුම්රියපල අසල නිවසක "බෝඩිමක්" පවත්වා ගෙන ගියේය. ඒ නිසා මට එහි කාමරයක් වෙන් කර ගතිමි. එම නිවසට කැළණිය දුම්රියපලේ සිට විනාඩි පහකින් පමණ දුම්රිය පාර දිගේ පයින් යා හැකි විය. එය පිහිටා තිබුණේ දුම්රිය පාර අසල ම ය. කැළණියේ සිට කොටුව දුම්රිය ස්ථානයට ගමන් කිරීම පිණිස දුම්රිය වාර ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉල්ලුම්පතක් යැවිමි.

මා වෙනුවට මිණිපේ වාරිමාර්ග කාර්යාලයට මාරු කර තිබුණේ එවකට නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ සේවය කළ *එම්. වීරසේකර* නමැති අපේ ගමට අල්ලපු ගමේ *කිරිපට්ටියේ* පාසලේ ප්‍රධානාචාර්‍යතුමාගේ පුත්‍රයාය. මා ඉටු කළ රාජකාරි හා ඉටුකිරීමට තිබුණ කටයුතු අඩංගු වැඩ බාර දීමේ පිටු දෙකක ලිපියක් 1955 දෙසැම්බර් 31 දින සකස් කොට, ප්‍රධාන ලිපිකරු *ටී. වයි. මුණසීර* මහතාට බාර දී තිබේ. මගේ හිතමිත්‍රයින්ගෙන් සමුගෙන එදින කොළඹට ඒමට පිටත්වීමි. සවස බස්රථයකින් මහනුවරට පැමිණ රාත්‍රී දුම්රියෙන් කොළඹ එන්නට ඇතැ'යි සිතමි. කොළඹ කොටුව දුම්රියපලේ දී රඹුක්වැල්ල මිතුරා මුණගැසී කැළණිය නවාතැනට යන්නට ඇත. මේ කරුණු එතරම් පැහැදිලි ව දැනට මතකයේ නැත.

"බෝඩිම" කැළණිය දුම්රිය ස්ථානයට පෙනෙන තෙක් මානයේ පිහිටා තිබිණි. මට තනි කාමරයක් වෙන් කර තිබිණි. *නෙන්නකෝන්, විජේරත්න, ප්‍රේමසිරි* යන තිදෙනා ද ප්‍රේමසිරි මහතාගේ මිතුරන් දෙදෙනෙක් ද නවාතැන් ගෙන උන්හ. පෙරේරා මහතා රාජකාරි අවසන් වී පැමිණ මේ නිවසේ කළ යුතු දේ මෙහෙයවීය. ආහාර පිළියෙල කිරීමට කාන්තාවක් ද වෙනත් නන්විධ කටයුතු සඳහා තරුණයෙක් ද එහි සේවය කළහ. ආහාර පානවල ගැටලුවක් නොතිබුණ නමුත්, කෑම වේලාවට සිටියේ නැත්නම් අඩුපාඩු වීමට ඉඩ තිබිණි. එහි සිටි සෑම දෙනා ම බඩගිනිකාරයින් වූ නිසාය. සතියකට හමාරකට පසුව මහනුවර දුම්රියපලට භාර දුන් මගේ ගෘහභාණ්ඩ ටික කැළණිය දුම්රිය ස්ථානයට ලැබිණි. කම්කරුවන් කීපදෙනෙකුගේ හිසමතින් ඒවා "බෝඩිමට" ගෙන්වා ගෙන මගේ කාමරයේ තබා ගතිමි.

ප්‍රධාන කාර්යාලයේ ගිණුම් ශාඛාව

1956 ජනවාරි 3 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් ශාඛාවේ සේවය සඳහා වාර්තා කළෙමි. ගිණුම් ශාඛාවේ ප්‍රධානියා පානදුරේ සිට එන *ජී.සී.එම්. ඩයස්* නමැති ජ්‍යෙෂ්ඨ ලිපිකාර මහතෙකි. ඩයස් මහතා හොඳ බෞද්ධයෙකු බව පෙනී ගියේය. පානදුරේ සමහර දෙනා එසේ වූහ. *නෙන්ඩාවුදපානී* නමැති දමිළ ලිපිකරු මහතෙක් ගිණුම් අංශයේ දෙවෙනියා තරම් විය. මා හැර ඒ අංශයේ ලිපිකරුවන් හතර පස් දෙනෙක් වූහ. පළමුවන පත්වීම ලැබීමෙන් පසු මා සේවය කළ ඇස්තමේන්තු ශාඛාවේ දැනට ප්‍රධානියා වූයේ *දොරේසිංගම්* මහතාය. යතුරු ලේඛක *පොඩි මහත්තයා* ද තවමත් එහි සේවය කළේය. ගෙවීම් අංශයේ *එයි.ඒ.ද සිල්වා* සහ *ඩබ්ලිව්. මතුගම* යන මහතුන් ගෙවීම් අංශයේ සේවයට පැමිණ උන්හ. මේ දෙදෙනා මට පසු කාලයේ දී මහත් සේ උපකාර කළ අය වූහ. ගිණුම් අංශය භාරව *පරරාජසිංගම්* නම් ගණකාධිකාරිවරයෙක් විය. *ෆොන්සේකා* මහතා ප්‍රධාන ගණකාධිකාරි විය. *විග්නරාජා* හා *නාගමනි* යන තවත් දෙදෙනෙක් ගණකාධිකාරිවරු වූහ.

අපගේ විෂය භාර ආයතන අංශයේ ලිපිකරු වූයේ 1951 දී මෙන් ම *ගුණසේන බණ්ඩා* මහතාය. මේ වන විට වාරිමාර්ග අධ්‍යක්ෂකවරයා වූයේ *ඒ.ඊ.සී.ද සිල්වා ගුණසේකර* මහතාය. නියෝජ්‍ය අධ්‍යක්ෂ වූයේ *එස්. ආරුමුගම්* මහතාය. *ඩබ්ලිව්.ඒ.ද සිල්වා* නම් මහතෙක් සහකාර අධ්‍යක්ෂකවරයා විය. පරිපාලනය භාර සහකාර අධ්‍යක්ෂකවරයා වූයේ *ඒ.සෙන්ට් වී. විජේමාන්න* නමැති සිවිල් සේවයේ නිලධාරි මහතාය. ඕ.ඒ (කාර්යාල සහකාර) තනතුරු දැරුවේ *ඩී.එස්. ජයවර්ධන* නම් ලිපිකාර සේවයේ ජ්‍යෙෂ්ඨයෙකි. ප්‍රධාන ලිපිකරු වුයේ කලින් ඇස්තමේන්තු ශාඛාවේ ප්‍රධානියා ව සිටි *ඒ.වී.රත්නරාජා* මහතාය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ වකවානුවේ අයත් වූයේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයටයි. *"ප්‍රේමා"* ගේ ලොකු අයියා *(සිරිල්) විජේසිරිවර්ධන* එම අමාත්‍යාංශයේ ලිපිකරුවෙකු විය. ප්‍රධාන කාර්යාලයට ගොස් නොබෝ දිනකින් ඔහු දැන හැඳින ගතිමි. ඔහු පදිංචි ව සිටියේ පිලියන්දල කැස්බෑව අසල *ගෝණමඩින්න* අතුරු පාරේ නිවසේය. දිනපතා කැස්බෑව බස්රියෙන් සේවයට පැමිණියේය. එම බස් ගාමිණි බස්රථ සමාගමට අයත් විය. මා කොළඹට මාරු වී ගියාට පසුව *"ප්‍රේමා"* මැනිං ටවුමේ සිට තම සහෝදරයාගේ නිවසට ගොස් එහි නතරවූවාය. ඒ නිසා සති අන්තය සෙනසුරාදා සවස් වරුවේ මා එහි ගොස් සඳුදා උදෑසනින් ම කොළඹට පැමිණියෙමි. අපගේ විවාහ මංගල්‍යය සිදුවන තුරු මගේ සති අන්තය බොහෝ විට ගෙවී ගියේ මේ ආකාරයටයි. ප්‍රේමාගේ නෑනා *මර්ලින්* අක්කාය. ඇගේ දෙමව්පියන් ද අසල ගෙයක පදිංචි ව උන්හ. ඒ අම්මා ඉතා ගුණයහපත් කෙනෙකු විය. ඉරිදා දිනවල දිවා ආහාරය බොහෝ විට ලැබුණේ ඒ නිවසෙන්ය. *ගාමිණි* හා *ඉන්ද්‍රානි* නම් වූ දරු දෙදෙනෙක් *සිරිල් - මර්ලින්* යුවලට උන්හ. (දැනට ජීවත් ව ඉන්නේ ඉන්ද්‍රානී පමණි.)

මාතර අලහේන්පිට ගමන

මේ අතරතුර වරක් මාතර ගියෙමි. එක් අතකින් එය කළ යුත්තක් ද විය. "ප්‍රේමාගේ" මෑණියන් හා සහෝදර සහෝදරියන් ජීවත් වූයේ මාතර අලහේන්පිට ඔවුන්ගේ මහගෙදරය. මේ වන විට ප්‍රේමාගේ පියා අභාවප්‍රාප්ත වී සිටියේය. මේ දරුපවුල හදාවඩා ගෙන ඇත්තේ අම්මා විසිනි. ඇයට තම සහෝදර සහෝදරියන්ගේ උපකාරය ද ලැබුණා විය හැකිය. මුල් ගෙදර ඒ අයටත් හිමිකම් තිබුණ නමුත්, එහි වත්තේ පිටියේ හා කුඹුරුවල ආදායම් ඒ අය ගෙන ගියේ නැති බව පෙනී ගියේය.

1952 මහ මැතිවරණ රාජකාරි සඳහා මාතර ගොස් තිබුණ නිසා, එම නගරයට යෑම අලුත් දෙයක් නොවුණත් එතැන් සිට සැතපුම් තුනක් පමණ වූ ගමන ගියේ පළමුවන වරටයි. මරදානෙන් උදේ පිටත්වන දුම්රියෙන් මාතරට පැමිණෙන විට පෙරවරු 11.30 පමණ වන්නට ඇත. එතැන සිට බක්කි කරත්තයකින් මාතර බස් නැවතුම්පොලට ගියෙමි. තල්පාවිලට යායුතු වූයේ *කැකණදුර* පාරේ යන *අපරක්ක* හෝ *යටියන, කැකණදුර* බස්රථයකිනි. තවත් පැයකින් පමණ එහි ගොස් බසයෙන් බහින විට, ප්‍රේමාගේ මල්ලී කෙනෙක් එහි සිට සැතපුම් කාලක් පමණ දුරින් පිහිටි "පහළ ගෙදරට" මා එක්කර ගෙන ගියේය. ඔහුගේ නම *හරිස්චන්ද්‍රය*. ඔහුට බාලයා *රාමචන්ද්‍රය*. වැඩිමලා *ජයසේනයි*. *චන්ද්‍රා* සහ *නෙලි* නමින් නංගිලා දෙදෙනෙක් ද වූහ. පවුලේ වැඩිමහල් ම සහෝදරයා පිළියන්දල පදිංචි ව සිටි බව සඳහන්

කළෙමි. දෙවෙනියා *එඩ්මන්ඩ් විජේසිරිවර්ධන* මාතර කොළඹ මගීධාවනය කළ වැන්රියක් පැදවූවෙකි. "බේබි මහත්තයා" නමින් හැඳින්වුණු *ගුණදාස විජේසිරිවර්ධන* කහටගස්දිගිලියේ වෙළඳ ව්‍යාපාරයක් කර ගෙන ගියේය. ප්‍රේමාගේ අක්කා කොළඹ උඩහමුල්ලේ පදිංචි ව සිටි ඒ අයගේ මාමා කෙනෙකු ළඟ සිටියාය.

පහළ ගෙදර පිහිටියේ පොල්වත්තක් මැද උස්බිම් තීරුවකයි. එය ඒ යුගයේ ටිකක් ලොකු ගෙයකි. ඉදිරිපස ඉස්තෝප්පුවෙන් පිවිසිය හැකි කාමරයක මට නවාතැන් ලැබිණි. ප්‍රේමා පිළියන්දල සිට මාතර ගෙදර ගොස් සිටියාය. දින දෙක තුනක් ගත කිරීමෙන් පසුව පෙරවරු මාතරින් පිටත් වන දුම්රියෙන් කොළඹ එන්නට පිටත්වූයෙමි. මා ගමන් කළේ දුම්රියේ දෙවෙනි පන්තියේ අසුනකය. අපට *"රේල්වේ වොරන්ට්"* තිබුණේ දෙවෙනි පන්තිය සඳහාය. වැලිගම, අහංගම යන ස්ථානවල දී තවත් සෙනඟ එකතු වූහ.

ගාල්ලේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ *ඩබ්ලිව්. දහනායක මැතිතුමා* අප දුම්රිය මැදිරියට පැමිණියේය. ඒ වකවානුවේ පිටපළාත්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කොළඹ ගියේ දුම්රියෙන් හෝ බස්රියෙනි. දුම්රියේ පළමුවන පන්තියේ ගමන් කළ හැකි වුවත් *දහනායක මහතා* දෙවෙනි පන්තියේ ගමන් කළේ අතරමඟ දී හමුවන රජයේ සේවකයන් සමග කතාබහ කිරීමට බව පෙනිණි. 1956 මහමැතිවරණය පැවැත්වීමට නියමිත ව තිබුණේ මේ අවධියේය. අම්බලන්ගොඩ දී දුම්රියට පිවිසි රජයේ සේවකයන් පිරිසක් දහනායක මහතා තදබල ලෙස විවේචනය කළහ. ඒ අය වාමාංශික අදහස් දැරූ අය බව පෙනිණි. දහනායක මහතා කලින් සමසමාජ පාක්ෂිකයෙකු ව සිට වෙනස්වූවෙකි. භාෂා පෙරමුණුකාරයින් සමග එකතු වීම ගැන දහනායක මහතාට දොස් පැවරූහ. එනමුත් දහනායක මහතා ඉතා සුහද ව, ඒ ඒ අයගේ නම්වලින් ආමන්ත්‍රණය කරමින්, කරුණු පැහැදිලි කර දුන්නේය. කොළඹට එනතුරු ඉතා උණුසුම් තර්ක විතර්කවලට සවන් දෙමින් ආ නිසා, ඉක්මනින් ගමන අවසන් වූ බවක් දැනිණි. 1956 මහ මැතිවරණයෙන් පසුව ගාල්ල ආසනය ජය ගත් දහනායක මහතා, *බණ්ඩාරනායක අගමැතිතුමාගේ* රජයේ අධ්‍යාපන ඇමතිවරයා විය. හෙතෙම පාසල් දිවා ආහාරය නැවත ආරම්භ කළේය. *විද්‍යෝදය, විද්‍යාලංකාර* විශ්ව විද්‍යාල දෙක පිහිට වූයේ එතුමා අධ්‍යාපන ඇමති ව සිටි කාලයේ දී ය.

බණ්ඩාරනායක මහතා ඝාතනය වීමෙන් පසුව අගමැති තනතුරට පත් වූ *දහනායක මහතා, ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ* නමින් දේශපාලන පක්ෂයක් ආරම්භ කොට, 1960 මාර්තු මැතිවරණයට අපේක්ෂකයින් 97 දෙනෙකු ඉදිරිපත් කළ නමුත්, දිනුවේ කෙනෙක් දෙන්නෙක් පමණි. ඊට පෙර කිසිදා නොපැරදුණු දහනායක මහතා ද පැරදුණේය. නැවත එතුමා ජයග්‍රහණය කළේ 1960 ජූලි මැතිවරණයේ දී ය. තමා අගමැති වූ වහා ම

එවකට සිටි මුළු ඇමති මණ්ඩලය ම එක රැයකින් ඉවත් කොට නව ඇමතිවරුන් පත්කිරීම ගැනත් 1960 මාර්තු මැතිවරණයෙන් පසුව අගමැතිකම නැති වූ විට, අරලියගහ මන්දිරයෙන් ගාලු පාරට බැස බස්රියකින් ගාල්ලට ගිය බවත් සඳහන් වේ. එතුමා ගැන තව බොහෝ රසවත් කරුණු ඇතත් ඒ සියල්ල මෙහි සඳහන් කිරීමට නොහැකිය.

මාතර ගමනෙන් පසුව නැවතත් කැළණියේ නවාතැනට පැමිණ දිනපතා රාජකාරි සඳහා ගියෙමි. දුම්රියේ ගමනාගමනයට වාර ප්‍රවේශ පත්‍රයක් ලබා ගෙන තිබුණේ ජනවාරි මාසයේ මුල දී ය. මාස තුනක දෙවන පන්තියේ වාර ප්‍රවේශ පත්‍රයට රුපියල් හයක් වී යයි සිතමි. සති අන්තයට පිළියන්දල ගියෙමි. සිංහල අවුරුද්දට මිණිපේ අපේ ගෙදර යෑමට නොහැකි විය. එයට හේතුව වූයේ මේ දිනවල පිළියන්දලට ගිය නිසාය. එනමුත්, එහි දී උදරාබාධයක් සෑදී දින දෙක තුනක් බලවත් සේ රෝගාතුර වී සිටියෙමි. ඒ දිනවල *ප්‍රේමා* මට සාත්තු කළාය. අවුරුද්දට පසුව ගමේ ගියෙමි. මගේ විවාහ යෝජනාවට සතුටුදායක ප්‍රතිචාරයක් නොවූ බව පැහැදිලිය. ඒ නිසා වැඩිපුර විස්තර නොකියා ම ආපසු කොළඹ පැමිණියෙමි.

විවාහ වීමට දින නියම කර ගැනීම

ප්‍රේමාගේ පවුලේ උදවිය මෙන් ම නෑදෑයින් ද දැන හැඳින ගැනීමෙන් පසුව, විවාහ මංගල්‍යය සඳහා දින වකවානු නියම කළයුතු විය. 1956 ජුනි මස 4වෙනි දා මේ සඳහා නියම කර ගතිමු. එනමුත්, එයට අවශ්‍ය මුදල් කිසිවක් මා සතු ව තිබුණේ නැත. වසර කීපයක් රජයේ සේවයේ රැකියාවක නිරත වී මාසික ව වැටුපක් ලැබුණ නමුත්, මෙවැනි අවස්ථාවක් සඳහා අවශ්‍ය මුදලක් ඉතිරි කර ගෙන තිබුණේ නැත. සාමාන්‍ය ලිපිකාර සේවයේ ලිපිකරුවකු වශයෙන් මට ලැබුණු වැටුපෙන්, අඩුකර ගැනීම්වලින් පසුව, 1952 හා 1955 අතරතුර කාලය තුළ දී මාසික ව මා අතට ලැබුණේ රු. 130 - 169ක් අතර මුදලකි. 1956 මැයි මාසයේ දී මට ලැබුණු මුදල රුපියල් එකසිය හැත්තෑහතකි. මේ කාල පරිච්ඡේදය තුළ 1954 දී නාට්‍යය පුහුණුව සඳහා වියදම් කළ මුදල් නාස්තියක් සේ සැලකිය හැකි නමුත්, බෝඩිං ගාස්තු හා සාමාන්‍ය ගමන් බිමන් ආදියට හැර වෙන මුදල් නාස්ති කිරීමක් සිදුකළේ නැත. මා කුඩා කාලයේ දී මුදල් ඉතිරි කිරීමට පෙළඹී සිටි අන්දමට මාසයකට රුපියල් දහය බැගින්වත් ඉතිරි කළා නම්, 1956 වනවිට රුපියල් හත් අට සීයක් ඉතිරි කර ගැනීමට තිබිණි. එනමුත් ස්ථිර වැටුපක් ලැබෙන විට අනාගත අවශ්‍යතාවන් ගැන එතරම් උනන්දු නොවන බවක් පෙනේ. මට සිදුවූයේ එය වන්නට ඇත.

මුදල් සපයා ගැනීම

විවාහ මංගල්‍යයට අවශ්‍ය වියපැහැදම් පියවා ගැනීමට මුදලක් සොයා ගැනීම බැරෑරුම් ප්‍රශ්නයක් විය. සිංහල අවුරුදු පසු වී ගමේ ගිය විට අප්පච්චීගෙන් මුදලක් ඉල්ලා ගැනීමට හැකි වුවත්, මගේ විවාහය ගැන එතරම් පැහැදීමක් නොවූයෙන්, මුදල් ඉල්ලා "බැණුම්" ඇසීමට සුදානම් නොවීමි. ඒ නිසා, මගේ ගැටලුව ගැන අම්මාටවත් නොකියා ම කොළඹ පැමිණ මුදල් සොයා ගැනීමට වෙනත් මාර්ග සෙවීමි. මේ වන විට අප කාර්යාලයේ සේවය කළ කිහිප දෙනෙක් සමග යම් හිතවත්කමක් ගොඩ නඟා ගෙන සිටි නිසා, මා මුහුණ පා සිටින තත්වය ගැන ඒ අය සමඟ සාකච්ඡා කළෙමි. ගෙවීම් ශාඛාවේ සේවය කළ *මතුගම* මහතා සහ *වයි.ඒ.ද සිල්වා* මහතා අනුකම්පාවෙන් මට සවන් දුන් අයයි. "ඉහ මොළ රත්වී" සිටි මට සිසිල් ජලයක් වත් කළේ *වයි.ඒ.ද සිල්වා මහතාය.* අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගබඩා අංශයේ සේවය කළ ඔහුගේ මිතුරෙකු මුදල් පොලියට දෙන බවත්, මට අවශ්‍ය මුදල් ඔහුගෙන් ලබා ගැනීමට ඉඩ තිබෙන බවත් දිනක් මට දැන්වීය. මගේ මිතුරා සමඟ තර්ස්ටන් පාරේ පිහිටි කාර්යාලයට ගොස් මුදල් පොලියට දෙන තැනැත්තා මුණ ගැසී සාකච්ඡා කිරීමෙන් පසුව මට අවශ්‍ය මුදල් ලැබිණි. ඒ සඳහා මාසික ව සියයට දහයක පොලී මුදලක් ගෙවිය යුතු විය.

පොලීකරුවන්ගේ සාමාන්‍ය සිරිත ණය මුදල පළමුවෙන් දෙන විට ම පළමුවන පොලී වාරිකය කපා ගැනීමයි. එනමුත්, මගේ මිතුරාගේ ඉල්ලීම නිසා (ඇපය නිසා), මට මුළු ණය මුදල ම ලැබිණි. මින් පසුව මාස් පතා පොලී මුදල ගෙවමින් සිට, මුල් මුදල ආපසු ගෙවා හමාර කළේ 1960 වසරේ දී පමණය. සමහර මාසවල පොලී වාරික ගෙවීම අතපසු වූ අවස්ථා තිබිණි. කෙසේ වුවත්, මේ දෙදෙනා මට කරන ලද්දේ **මගේ ජීවිතය බේරා ගැනීම** තරමේ මහත් උපකාරයකි. මුදල් නොමැතිකම නිසා මගේ විවාහය අතපසු කිරීමට සිදුවූවා නම් එය මට දරාගත නොහැකි වේදනාවක් ගෙන දෙන්නක් වීමට ඉඩ තිබිණි. ප්‍රේමාට හා ඇගේ පවුලේ උදවියට මා කෙසේ මුහුණ දෙන්න ද? ඒ නිසා මා කුමක් කළ යුතු ද? යනාදි සිතුවිලි මගේ මනසේ නිතර නිතර දෝංකාර දුන්නේය. වයි.ඒ.ද සිල්වා නම් වූ මගේ මිතුරා මගේ ගැලවුම්කරුවෙකු ලෙස මා සලකන්නේ මේ නිසාය. මේ කිසිවක් මා ඔහුට කියා නැත. එය මා සිත තුළ තැන්පත් කර ගෙන තිබෙන පහනක් වැනි සිතිවිල්ලකි.

විවාහ මංගල්‍යට අවශ්‍ය වියපැහැදම් සපයා ගත් විගස ම මා කළේ ඇඳුම් කට්ටලයක් මැසීමට ඇණවුම් කිරීමයි. බම්බලපිටියේ *ටොලාරාම්ස්* සාප්පුවට ගොස් "ඉංග්ලිෂ් ක්‍රීම් ෆ්ලැනල්" රෙද්දකින් කලිසමක් හා කබායක්

මස්සවා ගත්තෙමි. පාවහන් කඩයකින් *"බක් ඇන්ඩ් ටැන්"* සපත්තු කුට්ටමක් මිලයට ගතිමි. දැනට මනමාලයාට අවශ්‍ය ඇඳුම් තිබේ. මනාලියගේ ඇඟිල්ලට දැමීමට මුදුවක් ඒ අයගේ කැමැත්තට මිල දී ගැනීමට සැලැස්සුවෙමි.

නිවසක් සොයා ගැනීම

මගේ මිත්‍ර මතුගම මහතා සමග කතිකා කර ගෙන, කුලියට ගැනීමට ගෙයක් සෙවීම සඳහා දින කීපයක් ම සන්ධ්‍යා කාලවල දී නුගේගොඩ, මිරිහාන, උඩහමුල්ල, නාවින්න ආදි ප්‍රදේශවල ඇවිද්දෙමි. අවසානයේ නාවින්නේ දේවානන්ද පාරට හැරෙන හන්දිය පසු කළ විට මහරගම පැත්තට වූ දෙවෙනි ගේ කුලියට ගැනීමට හැකි විය. මාසයක කුලිය රුපියල් හතළිහකි. ඒ ගේ අයිතිකාරිය අල්ලපුගෙදර පදිංචිකාරියයි. 1956 ජුනි 1වෙනි දා සිට මම එම ගෙයි පදිංචියට ගියෙමි. මගේ මිත්‍ර පියදාස මහතා ද මගේ තනියට එහි පැමිණියේය. ඔහු ඒ වන විට කොළඹ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ සේවය කරමින් කැටවලමුල්ලේ ගෙදරක නවාතැන් ගෙන සිටියේය. කැළණියේ නවාතැන්පලේ තිබුණ මගේ ගෘහභාණ්ඩ ස්වල්පය ගොන් කරත්තයකින් නාවින්නට ගෙන්වා ගතිමි. මඟුල් දිනයට පෙර දින රාත්‍රියේ උඩහමුල්ලේ දුම්රියපොළ අසල නිවසක පදිංචි ව සිටි ප්‍රේමාගේ මාමා කෙනෙකුගේ ගෙදරින් විසිත්ත කාමර පුටු කට්ටලයක් ගෙන ගියෙමු. ප්‍රේමාගේ මස්සිනා කෙනෙකු වූ *කරුණා සමරකෝන්* සහ *බේබි මහත්තයා* ඒ සඳහා උපකාර කළහ.

නුගේගොඩ නගරයේ තිබුණ කුලී රථ දෙකක් මංගල ගමන යෑමට සුදානම් කර ගතිමි. නුගේගොඩ සිට පිළියන්දලට ගොස්, දිවා ආහාරයෙන් පසුව ආපසු නාවින්න දක්වා පැමිණීමට එක කාරයකට කුළිය රුපියල් දහයක් විය. මගේ නෑදෑයින් කිසිවෙක් මේ මඟුලට සහභාගි නොවන නිසා, කාර්යාලයේ මිතුරන් කීප දෙනෙකුට ආරාධනා කළෙමි. ඒ අනුව ගුණසේන බණ්ඩා (පසුව *ජී.බී. ඒකනායක*) මහතා සහ බිරිඳ, *මතුගම මහතා* සහ බිරිඳ, පොඩිමහත්තයා යන මිතුරෝ පැමිණියෝය. දෙවන මනමාලයා වූයේ මා මිත්‍ර *එම්.කේ. පියදාස* මහතාය.

මංගල ගමන

1956 ජූනි මස 4වෙනි දා, සඳුදා, පෙරවරුවේ නුගේගොඩට රැස්වූ අප ආරාධිතයින් පිරිස, කුලීරථ දෙකෙන් පිළියන්දල ගෝණාමඩිත්ත පාරේ *සිරිල් විජේසිරිවර්ධන* නිවස කරා ගියෙමු. ප්‍රේමාගේ මාමලා, නැන්දලා, කුඩම්මලා හා වෙනත් නෑදෑයින් රාශියක් එම නිවසට පැමිණ සිටියෝය. කැස්බෑව මහපාර අසල නිවසක පදිංචි ව සිටි විවාහ රෙජිස්ට්‍රාර්වරයා නිවසට පැමිණ එම නිල කටයුතු කළේය. විවාහයට සාක්ෂියට අත්සන් කළේ ප්‍රේමාගේ ලොකු මාමා, *තිලෝරිස් ජෝන් සමරකෝන්* මහතා සහ මගේ මිත්‍ර *එම්.කේ. පියදාස* මහතාය. දිවා ආහාරයෙන් පසුව නුගේගොඩ හන්දියේ සමරකෝන් ස්ටුඩියෝ වෙත පැමිණ මංගල ඡායාරූපය ගත්තෙමු. ඉන්පසු ව නාවින්න නිවසට පැමිණෙන විට ජයමංගල ගාථා කීමට සිටියේ චන්ද්‍රා සහ නෙලා නංගිලා දෙන්නාය. සරල සංග්‍රහයකින් පසුව අමුත්තෝ විසිර ගියහ. ආරාධනා ලැබූ කාර්යාලයේ මිතුරන් කීප දෙනෙක් මඟුල් දින සවස අප නිවසට පැමිණියහ. ඒ අයට ද සිසිල් බීම යනාදියෙන් සංග්‍රහ කළෙමු. පළතුරු බීමක් සුදානම් කිරීමට බේබි මහත්තයා පෙරදින රාත්‍රියේ උදව් කළේය. ප්‍රේමාගේ අම්මා දින කිහිපයකට අප නිවසේ නැවතී සිටියාය. මෙම නිවසේ නිදන කාමර දෙකක්, ලොකු සාලයක්, මුළු තැන්ගෙයක් හා කෑම කාමරයක් පිටුපසින් බරාඳයක් ආදියෙන් යුක්ත විය.

විවාහයට පත්වූ දිනවල රටේ සිදුවූ ඓතිහාසික සිදුවීම් කිහිපයක් ගැන සඳහන් කළ යුතු වේ. 1956 මහමැතිවරණයෙන් පසුව බලයට පැමිණි මහජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක *බණ්ඩාරනායක* මහතාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවා ගත්තේය. එම රජය **සිංහල භාෂාව රාජ්‍ය භාෂාව** කිරීමට පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ මේ දිනවලය. දෙමළ දේශපාලන පක්ෂ මෙන් ම කතෝලිකයන් ද මෙයට විරෝධය පළ කළහ. දෙමළ භාෂාව ගැනත් පනත් කෙටුම්පතේ සඳහන් වීම නිසා *එෆ්.ආර්.ජයසුරිය* මහතා පාර්ලිමේන්තු පරිශ්‍රයේ දී උපවාසයක් ඇරඹුවේය. ඒ නිසා පනත් කෙටුම්පත සංශෝධනය කිරීමට සිදුවිය. *කේ.එම්.ජී රාජරත්න* මහතා ද මෙම උපවාසයට සහයෝගය දැක්වීය.



1956 ජූනි 04

ජීවන ගමන

සතියක් පමණ නිවාඩු ලබා ගෙන සිටි නිසා, ඒ කාලය තුළ නෑදෑ ගෙවල් කීපයකට යන ලදී. වරක් පානදුරේ "බැංකුවේ මාමලාගේ" ගෙදර ගියෙමු. බසයකින් පානදුරේ නගරයට ගොස් නල්ලූරුව පසට තිබුණ සමුද්‍රාසන්න පටුමගේ එම නිවස වෙත ගියෙමු. ප්‍රේමාගේ "ඩිංගි මාමාගේ" පවුල ද එම නිවසේ කොටසක පදිංචි ව උන්හ. බැංකුවේ මාමාගේ බිරිඳ *"එමරා ඇන්ටි"* අපට ඉතා ආදරයෙන් සංග්‍රහ කොට දිවා ආහාරය ද සකසා දුන්නාය. අප දෙදෙනා ආපසු නාවින්නට එන

විට තරමක් හවස් වී තිබුණ නමුත්, ප්‍රේමාගේ අම්මා ගෙදර සිටි නිසා, රාත්‍රී ආහාරය ද සුදානම් කර තිබුණාය.

විවාහයෙන් පසුව ටික දිනක් ගතවන විට, මගේ මිත්‍ර මතුගම මහතා අප කාර්යාලයේ මිතුරන්ගෙන් එකතු වී තිබුණ මුදලක් මට ගෙනැවිත් දුන්නේය. එය ලැබුණේ අත්‍යවශ්‍ය ම අවස්ථාවකය. මඟුලට පෙර ලබා ගෙන තිබු ණය මුදල ඒ වන විට අවසන් වී තිබුණ නිසාය. විවාහයෙන් පසු විශේෂ ජීවන වියදම් දීමනාව හා ගෙවල් කුලී දීමනාව වැඩි වන නිසා, 1957 ජූලි මාසයේ දී රුපියල් 208 ක් පමණ මුදලක් අතට ලැබිණි. බුද්ධ ජයන්ති උත්සවය වෙනුවෙන් රුපියල් සියයක අත්තිකාරම් මුදලක් ලැබිණි. ඉතා ම අරපරෙස්සමින් මාසේ වියදම් පියවා ගත යුතු විය. ඉරිදා දිනවල දෙල්කඳ හන්දියේ පොලට ගොස් එළවළු, මාළු ආදිය මෙන් ම හාල්, පොල් ද රැගෙන ආවෙමු. නිවස අසල කඩයකින් සලාක පොතට ලැබෙන දේ මිලයට ගතිමි. අසනීප ආදියක් වුවහොත් එය අතිරේක බරක් වන්නේය.

රාජකාරියට කොළඹ කොටුවට නාවින්නේ සිට දුම්රියෙන් ගමන් කිරීමට වාර ප්‍රවේශ පත්‍ර ලබා ගතිමි. තුන්මාසයකට දෙවෙනි පන්තියේ වාර ප්‍රවේශ පත්‍රයකට අය කළේ රුපියල් හයකි. මේ මාර්ගයේ නාරාහේන්පිට සිට කොටුවට අය කළේ ද ඒ මුදල ම ය. දිවා ආහාරය ප්‍රේමා විසින් සකසා දෙන ලදී. ඒ නිසා කැන්ටිමෙන් කෑමට වියදමක් ගියේ නැත. තේ හා දුම්පානයට මුදලක් වියදම් විය. දුම්පානය නාස්තියක් වුවත්, දැන් එයට ඇබ්බැහි වී සිටි නිසා, දිනකට සිගරට් දහයක් පමණ අවශ්‍ය විය. බොහෝ කාලයක් යනතුරු මා පානය කළේ *"ත්‍රී රෝසස්"* සිගරට්ය. නුගේගොඩ ගුණවර්ධන වෙළඳසැලෙන් සිගරට් දහයේ පැකට් එකක් ශත විසිපහකට මිල දී ගත හැකි විය. කොටුවේ සිට නුගේගොඩ දක්වා එන දුම්රියෙන් පැමිණ සිගරට් පැකට් එකක් මිලදී ගෙන උඩහමුල්ල හෝ නාවින්න දුම්රිය පළේ නවත්වන දුම්රියට නැඟීගොස් ගෙදරට යන විට සවස හයට ආසන්න වේ.

සිගරට් මිල දී ගැනීමට නුගේගොඩ දී දුම්රියෙන් බැස යන එන වේලාවේ දී අසල කඩවලින් ගුවන්විදුලි සේවයෙන් දිනපතා ම අසන්නට ලැබුණේ "ආයුබෝවන්", "වාසනාවන් " ..... යනාදි වශයෙන් ළමා කැලක් ගායනා කළ ගීතයයි. ඒ ළමා පිටිය අරඹන වේලාව විය. බොහෝ විට *කරුණාරත්න අබේසේකර* නිවේදක මහතා "නංගී, මල්ලී" කියා අමතන මිහිරි කටහඬ ඇසිණි. ඒ ගීත නාදය ළමාපිටිය ඇරඹුම සටහන් කළා පමණක් නොව, වේලාව පස්වරු පහයි කාල බව ද අපට දැන්වීය.

අම්මා මාතර ගියාට පසුව ප්‍රේමා තනියම මා එනතුරු බලා සිටියාය. ටික දිනක් ප්‍රේමාගේ ආත්තා (අම්මාගේ අම්මා) මැනිං ටවුමේ සිට අප ගෙදරට විත් නැවතුණාය. ඒ දවස්වල දිනක් මා ගෙදර එන විට, රබර්

ලීවලින් සෑදූ පිඟන් මේසයක් තිබෙනු දැක විමසූ විට, එය ආත්තා විසින් රුපියල් පහකට ගෙන දුන් බව ප්‍රේමා කීවාය. ඒ පිඟන් මේසය බොහෝ කාලයක් අප නිවසේ තිබිණි. අවශ්‍ය වූයේ විටින් විට පාට කිරීම පමණකි. ආත්තා ආපසු මැනිං ටවුමට ගිය පසු ප්‍රේමාට දිවා කාලයේ හුදකලා ව ගත කිරීමට සිදුවිය. ඒ යුගයේ ගුවන් විදුලි යන්ත්‍රයක්වත් අපට තිබුණේ නැත.

එනමුත්, අල්ලපු ගෙදර (මහරගම පැත්තට වූ) තිබූ ගුවන් විදුලි යන්ත්‍රය අපේ අඩුපාඩුව ද පිරිමැසීය. උදේ පාන්දර සිට රෑ දහය පමණ වනතුරු එය ක්‍රියාත්මක ව පැවතිණි. *සිංගිරි මැණිකා චිත්‍රපටිය* එළිදැක්වූයේ මේ වකවානුවේ දී ය. ඒ නිසා ධර්මදාස වල්පොල හා ලතා ගායනා කළ එහි ගීත නිතර ම අසන්නට ලැබිණි.

එම නිවසේ තාත්තා දුම්රිය දෙපාර්තමේන්තුව වැනි ආයතනයක සේවය කළ කෙනෙකු විය. දිනපතා සවස වැඩ නිම වී ගෙදර පැමිණි විගස ඉදලක් ගෙන, ගෙදර අනික් අයට බැනවදිමින් ගේ අවට මිදුල අතුගෑමට පටන් ගනී. පවුල් ජීවිතය මේදැ'යි මට සිතුණ වාර අනන්තය. මේ අසල්වැසි කිසිවෙක් අපට කථාබහ කළේ නැත. ඒ නාගරික ප්‍රදේශවල සිරිතක් බව කල්ගත වන විට තේරුම් ගතිමි. අප නිවසේ අයිතිකාරිය තරුණ කාන්තාවකි. ඇගේ මව දිනපතා කොහේ හෝ වැඩට ගොස් නිවසට ආපසු පැමිණියාය. පාසල් යන වයසේ පිරිමි ළමයෙක් එහි සිටියේය. තරුණ ලඳ සමඟ සම්බන්ධයක් තිබුණ හැඩිදැඩි තරුණයෙක් විටින් විට ඒ ගෙදරට පැමිණියේය. ගෙවල් කුලී දීමට මිස මේ අය සමග ද අපගේ වැඩි පයිරුපාසානයක් නොවීය.

මේ අවධියේ පොදු ජලපහසුකම් හෝ විදුලි එළිය තිබුණේ නැත. මගේ ඇලඩින් ලාම්පුව සහ *කරුණා සමරකෝන්* ඥාතියා අපට මඟුල් තෑග්ගක් ලෙස දෙන ලද පිත්තල චිමිණි ලාම්පුව අඳුර නිවා ගැනීමට උපකාර විය. ආහාර පාන උයා ගැනීමට භූමිතෙල් උදුනක් තිබිණි. පානීය ජලය ලබා ගැනීමට ගෙදර පිටුපස ගෙවත්තේ ළිඳක් තිබිණි. එහි වතුර තිබුණේ අඩි දහයක් පමණ ගැඹුරින් වුවත් ඉතා ම සිසිල් විය. දිය නෑම සඳහා උඩහමුල්ල දුම්රිය ස්ථානයට ඉදිරිපසින් සන්තානම්පිටිය ගුරුපාරට සමීප ව පදිංචි ව සිටි හින්නිමාමලාගේ ළිඳට ගියෙමු. එය පහත් බිමක් වූ නිසා පහසුවෙන් අතින් දිය ඇදගෙන නෑමට පුළුවන් විය. දිවා කාලයේ දී බොහෝ විට ගෙදර තනි වූ ප්‍රේමා, හින්නිමාමලාගේ ගෙදරට ගියාය. ඇඳුම් සෝදා ගෙන ජලස්නානය කළේ ඒ ආකාරයටයි. අපගේ නිවසේ සිට මේ ගෙදරට සැතපුමක් පමණ දුරක් වන්නට ඇතැ'යි සිතමි.

අප දුම්රියේ ගමන් බිමන් යනවිට උඩහමුල්ල දුම්රිය ස්ථානයට පැමිණි නිසා, දියනෑමට හින්නිමාමලාගේ ගෙදරට එන ගමන අමුතු දුරක්

ලෙස සැලකුවේ නැත. සමහර දිනවල මා කාර්යාලයට යන විට මා සමඟ මැනිං ටවුමට යන ප්‍රේමා, ලොකු කුඩම්මලාගේ ගෙදර දවස ගත කර සවස මා සමඟ ආපසු ගෙදර ගියාය. මැනිං ටවුමේ දුම්රිය නැවතුම්පල තිබුණේ කුඩම්මලාගේ ගෙදර සමීපයේය. කාර්යාල දුම්රිය කිපයක් ම මේ නැවතුමේ නවත්වා එහි අවට පදිංචි ව සිටි රජයේ සේවකයන් කොළඹට ගෙන ගියහ. එසේ නැතත් ටික දුරක් දුම්රිය පාර දිගේ විනාඩි පහක් පමණ පයින් ගියවිට නාරාහේන්පිට දුම්රිය ස්ථානයට ළඟා වීමට පුළුවන.

ලිපිකාර සේවයේ විධායක ශ්‍රේණියේ දෙවෙනි පන්තියට උසස් කිරීමේ විභාගයක් ද මේ අවධියේ පැවැත්වුණි. එනමුත් එම විභාගයට සුදානම් වීමට නොහැකි වූ නිසා, විභාගයට පෙනී සිටි නමුත් සමත් වූයේ නැත.

දරු සම්පතක්

විවාහයෙන් මාස දෙක තුනක් ගත වන විට දරු සම්පතක ලකුණු පහළ විය. ගැබ්ගෙන සිටින අම්මා කෙනෙකුට වෙනදාට වඩා *පෝෂණයක්* අවශ්‍ය බව සාමාන්‍ය දැනීමයි. එනමුත්, ලැබුණ වැටුපෙන් ඉතා අමාරුවෙන් කටයුතු කළ අපට අතරින් පතර අගහිඟකම් වැඩි විය. මේ අතරතුර අපගේ කුලී ගෙය අයිතිකාරියට අවශ්‍ය බව කී නිසා, හින්නිමාමා දන්නා හඳුනන දෙල්කඳ ඉරිදා පොළ අසල ආවිස් සිඤ්ඤෝ මුදලාලිගේ කුඩා නිවාසයක් කුලියට ගත හැකි විය. එයට මාසික කුලිය රුපියල් තිහක් විය. තුන්මාසයක අත්තිකාරම් ගෙවිය යුතුවිය. එකිනෙකට සම්බන්ධ කර සාලයක්, කාමර දෙකක් හා මුළුතැන්ගෙයක් යනාදියෙන් සමන්විත වූ එම නිවස, දුම්රිය මැදිරියකට සමාන විය. එනමුත් අප දෙදෙනාට ප්‍රමාණවත් විය. මේ කටයුතු-වලට අවශ්‍ය වූ අතිරේක මුදල් ලබා ගැනීමට තිබුණ පහසුම මඟ පිටකොටුවේ හෙට්ටිවීදියේ උගස්බඩු කඩයි. පළමු වතාවේ කිසිවෙකුට නොදැනෙන සේ මගේ අතේ තිබුණ මංගල මුදුව උගසට තබා රුපියල් හතළිහක් ලබා ගතිමි. ගෙදර ගියවිට මුද්ද ගැන විපරම් කළ ප්‍රේමාට කාරණය පැහැදිලි කළෙමි. මාසයේ වැටුප ලැබුණ වහා ම උගස අරවා ගතිමි. මේ ආකාරයට මුදල් අහේනි ඇති වූ විට හෙට්ටිවීදියේ පිහිට පැතීමි.

මෙම නිවසේ සිටිය දී එවකට විරැකියාවෙන් සිටි ප්‍රේමාගේ මල්ලිලා දෙදෙනෙක් ද අප සමග විසීමට පැමිණියහ. කොළඹ-මාතර අතර මගී ප්‍රවාහන වෑන් රථයක් ධාවනය කළ "පුංචි අයියා" කොළඹ පැමිණි විට, ආපසු මාතරට යෑමට "ටර්න්" එක එනතුරු, අප ගෙදරට පැමිණ විවේක ගත්තේය. ඒ එන බොහෝ අවස්ථාවල මාතරින් හාල් පොල් ආදි යම්කිසි දෙයක් ගෙනැවිත් දුන්නේය. එය ද අපට ලොකු සහනයක් විය.

මෙම වත්තේ සීතල වතුර සහිත ළිඳකින් පානීය ජලය ලබා ගත්තෙමු. දිය නෑමට දුම්රිය මාර්ගය අසලින් වත්තේ අයිනේ ලොකු ළිඳක් තිබිණි. අවට බොහෝ දෙනෙක් ස්නානය කළේ ද එම ළිඳෙන්ය. අප නිවසට සමාන තවත් කුඩා නිවසක් අසලින් තිබිණි, එම නිවසේ අලුතෙන් විවාහ වූ යුවලක් පදිංචි ව උන්හ. මනමාලයා වෙළඳ ව්‍යාපාරිකයෙකු සේ පෙනිණි. ආවේ ගියේ කාරයකිනි. අපේ නිවසට ඉදිරිපසින් බස් පාර අයිනේ ගෙවල් දෙකක් විය. එක ගෙයක රෝහල් උපස්ථානයක ජෝඩුවක් පදිංචි ව උන්හ. තවත් ගෙයක දම්ළ/ලංසි පවුලක් වූහ. ගෙවල් හිමියාගේ ගෙය වත්තේ එක පසෙක විය. ඔහු දරමඩුවක් ද පවත්වා ගෙන ගියේය. දෙල්කඳ හන්දියේ ඉරිදා පොළ ගෙවල් දෙකක තුනකට එහායින් පිහිටා තිබුණ නිසා, දැන් ඉරු දිනයන්හි හාල්, පොල්, එළවළු, මාළු ආදිය මිලයට ගැනීම ඉතා පහසු විය.

ප්‍රේමාගේ දරුගැබ මෝරණ විට වෛද්‍යවරයෙකුට පෙන්වීම සුදුසු යැ'යි වැඩිහිටියන්ගෙන් ලැබුණු උපදෙස් අනුව, වරක් දෙවරක් බොරැල්ලේ නිවසක පදිංචි ව සිටි *කල්දේරා* නමැති දොස්තර මහතෙකු හමුවූයෙමු. ඒ අතරතුර, වෛද්‍ය පහසුකම් ඇති පිට පළාතකට ස්ථාන මාරුවක් ලබා ගැනීමට ඇති පහසුකම් සොයා බැලුවෙමි. ඒ වන විට මා කලින් දැන හැඳින සිටි කාර්මික නිලධාරීන් දෙතුන් දෙනෙක් බදුල්ල වාරිමාර්ග කොට්ඨාසයේ සේවයේ කරමින් සිටියහ. ඒ අයගෙන් ලැබුණ තොරතුරු මත, බදුල්ල වාරිමාර්ග කාර්යාලයට ස්ථාන මාරුවීමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළෙමි. මේ අනුව, 1957 මාර්තු මස පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවක් ලැබිණි.

බදුල්ලට ස්ථාන මාරුව

බදුල්ල වාරිමාර්ග කාර්යාලයට ස්ථාන මාරුව ලැබීමෙන් පසු එම කොට්ඨාශ භාර සහකාර වාරිමාර්ග ඉංජිනේරුතුමාට ලිපියක් යවා, නිල නිවසක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියෙමි. එනමුත් එවැනි පහසුකම් නැති බව දන්වා පිළිතුරක් ලැබිණි. කෙසේ නමුත්, බදුල්ලේ සිටි මගේ මිතුරන්ගෙන් දැනගන්නට ලැබුණේ එහි ගිය පසු අවශ්‍ය පහසුකම් සලසා ගැනීමට ඉඩකඩ තිබුණ බවයි. මේ වනවිට එම කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු හා දෙවෙනි ලිපිකරු යන දෙදෙනා ම නිතර දෙවේලේ නිවාඩු ගනිමින් රාජකාරි පැහැර හරින නිසා, ප්‍රධානියා සමඟ විරසක වී උන්හ. ඒ අය හිතුවක්කාරයට වැඩ කළහ. දෙවැනි ලිපිකරු වශයෙන් මට හිමි නිල නිවාසයක ප්‍රනාන්දු නමැති ලිපිකරු මහතෙක් තනි ව ම පදිංචි ව සිටියේය. ඔහු විටින් විට රාජකාරියට පැමිණෙන නමුත් ස්ථාන මාරුවක් බලාපොරොත්තුවෙන් සිටියේය.

මට ස්ථාන මාරුව ලැබුණ පසු, මගේ ගෘහ භාණ්ඩ ආදිය බදුල්ලට ප්‍රවාහනය කිරීම පිණිස මරදාන දුම්රිය අංගණයෙන් භාණ්ඩ මැදිරියක් වෙන්කරවා ගෙන ඒ අයට භාර දුනිමි. කොළඹ සිටි ඥාතිමිත්‍රාදීන්ගෙන් සමුගෙන, 1957 පෙබරවාරි මස 27 දින රාත්‍රී තැපැල් දුම්රියෙන් බදුල්ලට ගියෙමි. මේ ගමන සඳහා දෙවෙනි පන්තියේ නිදන මැදිරියක් වෙන් කරගෙන තිබිණි. කොළඹින් දුම්රිය පිටත් වී ටික දුරක් යනවිට ප්‍රේමා කඳුළු සලන බව පෙනිණි. මා යන ඕනෑම තැනකට යන්ට සුදානම් වුවත් තම නෑදෑ කැළගෙන් වෙන්වීම මෙයට හේතුව බව පෙනිණි. මේ ගමන යන්නේ අප දෙදෙනාගේත් අපට ලැබෙන්නට ඉන්න දරුවාගේත් යහපතට බව පැහැදිලි කළ විට, ඇයට අස්වැසිල්ලක් ලැබුණු බව පෙනිණි. මේ අප ජීවිතයේ තැනින් තැන ගමන ආරම්භ වූවා පමණි. තවත් වසර ගණනාවක් ම ප්‍රේමා මා සමඟ රටේ නොයෙක් පෙදෙස්වලට ගිය නමුත්, ඒ කුමන අවස්ථාවකවත් කඳුළු සැලූ බවක් දැක නැත.

රාත්‍රී තැපැල් දුම්රිය 1957 පෙබරවාරි 28 දින පෙරවරු අටයි තිහට පමණ බදුල්ලට ළඟා විය. මගේ මිත්‍ර කාර්මික නිලධාරි *ඒ.එම්.ඩී.ඩබ්ලිව් විජේනායක* (ඩබ්ලිව්. බී. ඒකනායන) මහතා දුම්රියපොලට පැමිණ සිටියේය. බදුල්ල නගර මධ්‍යයේ පිහිටි සල්ගාදු හෝටලයේ අපට නවාතැන් පහසුකම් සුදානම් කර තිබුණ නිසා, කුලීරථයකින් එහි ගියෙමු. දුම්රියපොලේ සිට සැතපුමක්වත් නැති තරම්ය. සල්ගාදු හෝටලයේ කළමනාකරු විජේනායක මිතුරා හොඳින් දන්නා හඳුනන කෙනෙකි. හෝටලයේ ඉහළ මාලයේ කාමරයක් අපට වෙන්කර තිබිණි. මුහුණ කට සෝදා ගෙන උදෑසන ආහාරපාන අවසන් කළෙමු. ප්‍රේමා අපට වෙන්වූ කාමරයේ විවේක ගැනීමට සලස්වා, පෙරවරු නවයට පමණ මගේ මිතුරා සමඟ වාරිමාර්ග කාර්යාලයට ගියෙමි. එයට ද සැතපුමක්වත් නොවූ තරම්ය.

බදුල්ල නගර ශාලාව හා රෝහල පසුකර, බණ්ඩාරවෙල පාරේ ටික දුරක් ගොස්, දකුණට තිබුණ හරස් පාරකින් වාරිමාර්ග කාර්යාලයට ළඟා වීමු. බදුල්ල උප කොට්ඨාසය භාර සහකාර වාරිමාර්ග ඉංජිනේරු *ජී.එම්. සිනම්පරපිල්ලේ* මහතා ඉතා සුහදශීලි ව මා පිළිගත්තේය. දිනක් දෙකක් ගතවන විට, නිල නිවාසය ලබා ගැනීමට හැකි වේ යයි එතුමා කීවේය. මාස කීපයක ගිණුම් සම්බන්ධයෙන් ඉහළ කාර්යාලවලින් මතුකර තිබෙන ප්‍රශ්න අඩංගු ලිපි රාශියක් ගොඩගැසී තිබිණි. ඒවාට පිළිතුරු සපයා අවසන් වනතුරු, වෙනත් එදිනෙදා රාජකාරි ඉටුකිරීම අවශ්‍ය නොවීය. ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ සේවය කර තිබුණ නිසා පැවරුණු මේ රාජකාරි දුෂ්කර නොවන බව තේරුම් ගියේය.

මෙම උපදෙස්වලින් පසුව කාර්යාලයේ සේවය කළ වෙනත් අය හැඳින ගතිමි. ප්‍රධාන ලිපිකරු *ඩබ්ලිව්.ආර්.මුණසිංහ* හා අනිත් ලිපිකරු

ජේ.ඒ.සී ප්‍රනාන්දු මහතා සේවයට පැමිණ සිටියේ නැත. ගබඩා නිලධාරි *සිරිවර්ධන, ජයතිලක* හා *ගමගේ* යන තිදෙනා, කාර්යාල සේවක *තිසේරා,* කම්කරු *ඇල්බට්,* සැලසුම්කරු *ඒ.බී.ද සිල්වා* හා *ඩයස්* අතිරේක කාර්යාල සහායක වූ *නාදන්* හා *පොන්නම්බලම්* යන මහතුන් මෙදින හමු වූ අය අතර වූහ. මීට පසුව දිනෙන් දින කාර්යාල මුරකරු *පුංචි බණ්ඩා,* කාර්මික නිලධාරීන් වූ *ෆ්‍රෙඩ් රත්නසිංගම්, බර්ට් ජයසේකර, අයර්ටන් ඩී. ලීමා,* ඕවර් සියර්වරුන් වූ *සයිනුල් අබ්දීන්, රත්නජ්පුලි, සෙනෙවිරත්න, පුංචි බණ්ඩා, නානායක්කාර* යන අය කාර්යාලයට පැමිණෙන අයුරින් මුණ ගැසිණි. පළමුවන දිනයේ ම නොවේ. කාර්යාලයට ගිය පළමුවන දිනයේ වෙනත් රාජකාරියක් නොවූයෙන්, දිවා ආහාරය සඳහා සල්ගාදු හෝටලයට පැමිණ සවස් වරුවේ විවේකයන් ගත කළෙමු.

බදුල්ලේ නිල නිවාසය

1957 මාර්තු 1වෙනි දා රාජකාරි ආරම්භ කළෙමි. දෙවෙනි දා වන විට නිල නිවාසය ද ලැබිණි. එය පිහිටා තිබුණේ බදුල්ලේ කැප්පෙටිපොළ පාරේ කඳුබෑවුමකය. කැප්පෙටිපොළ පාර බදුල්ල නගර ශාලාව අසළින් ආරම්භ වී, වෙලක් හරහා කඳුගැටයක් වටා ගොස්, බණ්ඩාරවෙල පාරට සම්බන්ධ වන රවුම් පාරකි. එම පාරේ සිට පඩි හතළිහක් පමණ ඇති පියගැට පෙලක් නැඟ දෙවෙනි ලිපිකරු නිල නිවාසයට පිවිසිය යුතු වේ. පඩිපෙළ නැංග විට දකුණු පසින් නඩත්තු ඔවර්සිපර් මහතාගේ නිල නිවාසය විය. මට ලැබුණු නිවාසයට පඩිපෙළේ ඉස්මත්තෙන් වම්පසට හැරී යා යුතුය. ඒ ස්ථානයට පහළින් මහපාර අයිනේ *එල්.එම්. පෙරේරා* නම් වූ කොන්ත්‍රාත්කරුවකුගේ පෞද්ගලික නිවාසය විය. අපේ ගෙවල්වලට නඟින පියගැට පෙළට පහළින් මහපාරේ අනික් පසින් ගබඩා නිලධාරි සිරිවර්ධන මහතාගේ නිවසත්, කාර්යාල සේවක *තිසේරා* සහ නඩත්තු සේවක *යෝනන්ගේ* නිවාස දෙකත් පිහිටා තිබිණි. යාර තුන්හාර සියකට එපිටින් *රත්නසිංගම්* කාර්මික නිලධාරි මහතාගේ නිල නිවාසය පිහිටා තිබුණේය. අප නිවෙස්වල සිට කාර්යාලයට යෑමට කෙටි පාරක් තිබිණි. එය ටික දුරක් මහපාරේ ද ඉන්පසුව ඇලවේල්ලක ද නැවතත් තාර දැමූ පාරක ද පහළට ගොස්, කාර්යාලය වෙත වැටී තිබුණේය. විනාඩි දහයකින් පමණ කාර්යාලයේ සිට නිවසට පැමිණිය හැකිය.

දුම්රියෙන් එවා තිබුණ ගෘහභාණ්ඩ දින කිහිපයක් තුළ ලැබුණ නිසා, නිලනිවසේ පදිංචියට යා හැකි විය. මේ නිවස කඳුබෑවුමක පිහිටි නිසා මුළුතැන්ගෙය, ගබඩා කාමරය, කෑම කාමරය හා සේවක කාමරය පිහිටා තිබුණේ අඩි හයක් හතක් ඉහළ තලයකයි. ප්‍රධාන නිවාසය පහළ තලයේ

ඉදිරියෙන් පිහිටා තිබිණි. ප්‍රධාන නිවසේ ඉදිරිපස ඉස්තෝප්පුව, විසිත්ත කාමරය, කෑම කාමරය, නිඳන කාමර දෙකක්, නාන කාමරය හා වැසිකිළිය පිහිටා තිබිණි. එම නිවසේ පදිංචි ව සිටි *ප්‍රනාන්දු* ලිපිකරු මහතා, අපට ඉඩ සැලසීම සඳහා පිටුපස තිබුණු කාමරයකට ගියේය. ඒ නිසා ප්‍රධාන නිවාසය හිස් විය. පිටුපස කාමරයට ප්‍රධාන නිවස පිටුපසින් වෙනම ම මඟක් වැටී තිබුණ නිසා, ප්‍රධාන නිවස හරහා යෑමට අවශ්‍යතාවක් නොවීය. මේ නිසා අපට කිසි කරදරයක් ඇති නොවීය. මාසයකින් පමණ *ප්‍රනාන්දු* මහතාට ස්ථාන මාරුවක් ලැබී ගියේය. ඒ නිසා, ගෙදර පිටුපස කොටස ද අපට නිදහස් විය. මෙම නිවසට විදුලි බලය හා ජල පහසුකම් තිබිණි. සවස හයේ සිට නවය පමණ වනතුරු විදුලි ආලෝකය දුර්වල විය.

වැඩිකල් නොගොස් ප්‍රේමාගේ තනියටත් ගෙදර වැඩවල උදව්වටත් වයසක ආච්චී කෙනෙක් බදුල්ලෙන් සොයා ගතිමු. උන්දෑ අපට ආහාරපාන සකසා දුන්නාය. බදුල්ලේ මුළුතැන්ගේ පාවිච්චියට දර සපයා ගැනීම ගැටලුවකි. ඒ නිසා, තල්දෙන ප්‍රදේශයේ සිට බරකරත්තවලින් නගරයට දරමිටි රැගෙන විත් විකුණති. දිනපතා කරත්ත කිහිපයක් එසේ පැමිණේ. එකල ලී කෝටු හතරක පහක දරමිටියක් ශත දහයක් පමණ විය. ගෙදර උන් ආච්චී ද කරත්ත එන අවස්ථාවල මහපාරට ගොස් දරමිටි කීපයක් මිල දී ගත්තාය. වරක් එසේ ගන්නා දරමිටි සතියකට පමණ පිරිමසා ගත හැකි විය.

බදුල්ලට ගිය දිනවල සිල්ලර බඩු කඩයකින් අවශ්‍ය බඩුබාහිරාදිය ණයට ගැනීමට කටුතු යොදා ගතිමි. *ජී.කේ. ජීදික් අප්පුහාමි* නම් වූ අහංගමින් පැමිණි මුදලාලි කෙනෙක් මට ණයට දීමට කැමති වූයේ මා විවාහ වී සිටින්නේ මාතර කෙනෙකු සමග බව කී නිසා යයි සිතිණි. කෙසේ වෙතත්, අවශ්‍ය දේ අත්පිට මුදලට ගන්නවාට වඩා මේ ක්‍රමය පහසු විය.

මාසයේ පඩිය ලැබුණු විට ණය ගෙවයි නම් ගනුදෙනු කිරීමට මුදලාලි මැළිවන්නේ නැත. 1957 මාර්තු මාසයේ අතට ලැබුණු මුදල රු. 197/- ක් විය. ඉරිදා දිනවලට දුම්රියපල අසල පිහිටි පොළකට ගොස් එළවළු ආදිය මිලයට ගතිමි. මාර්කට් එකෙන් ගත නොහැකි සමහර ගොඩේ එළවළු ජාති පොලෙන් ගත හැකි විය. එවායේ මිල ගණන් ද අඩුය. ඒ නිසා ගමන ටිකක් දුෂ්කර වුවත්, ඉරුදිනවලට පොළට යෑම සිරිතක් විය. මුතියංගනේ පන්සල ද බදුල්ල නගරයේ දුම්රියපල පසට වූ පස්සර පාරේ පිහිටා තිබේ. පෝය දිනවල විශේෂයෙන් ම ප්‍රේමා සමඟ එහි ගොස් මල් පහන් පුදා එන්නට ක්‍රියා කළෙමි. මිණිපේ සේවය කරන කාලයේ නිතර නිතර මහියංගණයට ගියෙමි. දැන් අවශ්‍ය විටක මුතියංගන රජ මහා විහාරයට යෑමට අවස්ථාව සැලසිණි. එය ද ලොකු ලාභයක් සේ සැලකුවෙමු.

දරු ප්‍රසූතිය - බදුල්ල මහ රෝහල

බදුල්ල මහ රෝහල පිහිටා තිබුණේ වාරිමාර්ග කාර්යාලයට ඉදිරිපසිනි. එම රෝහල උඩව පළාතේ ප්‍රධානතම ආරෝග්‍ය ශාලාව විය. විශේෂඥ වෛද්‍යවරු කීප දෙනෙක් සේවයේ නිරත ව උන්හ. පෞද්ගලික අංශයේ ද පිළිගත් සාත්තු නිවාසයක් තිබිණි. රජයේ රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥයා වූයේ *ඇන්ඩෘ පෙරේරා* දොස්තර මහතාය. එතුමාගේ නිවස පිහිටියේ කාර්යාලය අසල අතුරු මාර්ගයේ ස්ථානයකය. රාජකාරි වේලාවෙන් බැහැර අවස්ථාවල එම දොස්තර මහතා බාහිර රෝගීන් පරීක්ෂා කර ප්‍රතිකාර කළේය. 1957 මාර්තු මාසයේ පටන් ප්‍රේමා *ඇන්ඩෘ පෙරේරා* දොස්තර මහතා ලවා පරීක්ෂාවට භාජනය කළෙමි. මාසික ව එතුමා හමු වී උපදෙස් ලබා ගතිමි. ජුනි මස මුල දී දරු ප්‍රසූතිය සිදුවිය හැකි බව දොස්තර මහතාගේ නිගමනය විය.

මැයි මාසයේ අග දී පමණ, මාතර සිට පුංචි අයියාගේ වෑන් රථයෙන් ප්‍රේමාගේ අම්මා අපේ ගෙදර පැමිණියාය. අම්මාට අවශ්‍ය වූයේ තම දියණියගේ ප්‍රථම දරු උපත සිදුවන විට බදුල්ලේ නැවතී සිටීමය. අම්මාගේ පැමිණීම ප්‍රේමාට මහත් අස්වැසිල්ලක් වූ බව පෙනිණි. දරු ප්‍රසූතිය සමීප වන විට වාරිමාර්ග කාර්යාලයට අනුයුක්ත කර තිබූ ජීප් රථය රාත්‍රී කාලයේ දී මගේ නිල නිවස අසලින් පිහිටි රත්නසිංගම් මහතාගේ නිවාස පරිශ්‍රයේ නවතා තබන ලෙස ඉංජිනේරු මහතා විසින් උපදෙස් දෙන ලදී. ඒ නිසා, 1957 ජුනි මාසයේ 6වැනි දින රෑ එකොළහට පමණ ප්‍රේමාට ප්‍රසව වේදනාව දැනුණු විට රෝහල වෙත ගෙන යෑම පහසු විය. එදින රාත්‍රියේ රෝහලට ඇතුළු කළ නමුත් දරු ප්‍රසූතිය සිදුවූයේ පසුදින දවල් 12.34 ටය. ඒ සිකුරාදා දිනයකි.

රෝහල තුළ රැඳී සිටි මට කොයි වේලේ මව හා බිළිදා දැක ගැනීමට ලැබේ දැ'යි සිතමින් නොඉවසිල්ලෙන් වේලාව ගත කළෙමි. දරුප්‍රසූතිය සිදු වූ පසු ඒ බවත්, ඉපදී සිටින්නේ දියණියක් බවත්, දැන ගන්නට ලැබිණි. මව සහ දරුවා නිරුපද්‍රිත ව ඉන්නා බව දැනගත් මට ඇති වූයේ නිමිහිම් නැති සතුටකි. එසේ වුවත්, ඒ දෙදෙනා දැක ගැනීමට තවත් පැය දෙක තුනක් ගතවිය. බොහෝ වේලාවක් නොඉවසිල්ලෙන් බලා සිට, ටික වේලාවකින් ආපසු එන අදහසින් රෝහලෙන් පිටවීමට සුදානම් වන විට, ඒ දුටු දොස්තර මහතා දරුවා බැලීමට උවමනා නැද්දැ'යි ඇසුවේය. ඒ වනවිට බිම් මහලේ තිබූ සූතිකාගාරයේ සිට ඉහළ මාලයේ වාට්ටුවට මව සහ දරුවා ගෙන ගොස් සිටියහ. එහි ගොස් ඒ දෙදෙනා බලන ලෙස දොස්තර මහතා කී විට, කොපමණ වේගයකින් ප්‍රේමා සිටි ඇඳ වෙත ගියා දැ'යි විස්තර කළ නොහැකිය. ප්‍රේමා රෝහලට යන විට ඇඳගෙන ගිය ලෝම ජර්සියකින්

ඔතා සිටි සිඟිති දරුවා අම්මාට තුරුළු වී සිටියාය. රෝහල් කාර්ය මණ්ඩලය මට ඉවත් ව යන ලෙස කියන තුරු එහි රැඳී සිට, ගෙදර ගොස් ප්‍රේමාගේ අම්මාට ආරංචිය කියා දරුවාට අවශ්‍ය ඇඳුම් පැළඳුම් රැගෙන නැවතත් රෝහලට පැමිණියෙමි. දින දෙක තුනක් රෝහලේ ගත කිරීමට සිදුවිය.

ඒ අතරතුර දියණියගේ උපන් වේලාව *සිරිනායක* නම් වූ *දෛවඥයෙකුට* දී වේලාපත්කඩයක් සකස් කර ගතිමි. නම් තැබීමට සුදුසු අකුරු ඔහු විසින් සඳහන් කර තිබිණි. රෝහලෙන් පිටවීමට පෙර උප්පැන්න ලියා පදිංචි කිරීම සඳහා නමක් වාට්ටුවට දැන්විය යුතු විය. *"චාන්දිනී"* යනුවෙන් නම් කිරීමට අදහස් කරන බව මගේ මිත්‍ර විජේනායක මහතාට කී විට, *"ටිකිරි කුමාරිහාමි"* යන්න ද එකතු කරන ලෙස ඔහු යෝජනා කළේය. මගේ ලොකු දුවගේ උප්පැන්න සහතිකයේ **"චාන්දිනී ටිකිරි කුමාරිහාමි"** යනුවෙන් සඳහන් වී තිබෙන්නේ මේ නිසාය. ප්‍රේමාට ගමන් බිමන් යෑමට හැකියාව ලැබුණු පසු, අම්මාත් සමඟ බිළිඳු දියණිය රැගෙන මුතියංගන පන්සලට ගියෙමු. බුදු පිළිමය දෙසට හිස හරවා විහාරයේ බිම තබා ටික වේලාවක් අතපය ගසමින් සිටීමට ඉඩ හැරියෙමු. අපේ නිල නිවාසයේ සිට මුතියංගන රජමහා විහාරයට සැතපුම් එකහමාරක් දෙකක් පමණ දුරය. ඒ ගමන ආවේ ගියේ කුලී රථයකින් යයි සිතමි. බදුල්ල නගරයේ රන්කරුවකු ලවා පවුම් කාලක පංචායුධයක් සාදවා ගෙන බිළිඳු දරුවාට පැළඳුවෙමු. මෙයින් මාසයකට හමාරකට පසුව පුංචි අයියා පැමිණි විට, අම්මා ආපසු මාතරට ගියාය. ඉතා ශක්තිමත් තොටිල්ලක් පුංචි අයියා එන විට ගෙනැවිත් දුන්නේය. මගේ දරුවන් හැම දෙනාට ම ඒ කුඩා ඇඳ ප්‍රයෝජනයට ගත්හ. ඉන්පසුව බෑණා කෙනෙකුගේ පුංචි අම්මාට දුන්නේය. එය තවමත් භාවිතාවේ ඇතැ'යි සිතමි. අම්මා ගියාට පසුව ද බදුල්ලෙන් හොයා ගත් ආච්චි ප්‍රේමාට උපකාරයට සිටියාය. රාජකාරි හමාර වූ සැනින් මම ගෙදර ආවෙමි. ඉන්පසුව අප දෙදෙනාගේ කාලය ගත වූයේ දරුවා සමඟය. බිළිඳාගේ සෑම ඉරියව්වක් ම ඇගේ අවධානයට යොමු විය. අප දෙදෙනාට ම මෙය අලුත් අත්දැකීමක් විය.

නෑයන්ගේ පැමිණීම

පාසල් නිවාඩු කාලයක දී කොළඹ සිට ප්‍රේමාගේ ඥාති පිරිසක් අප නිවසට පැමිණියහ. *ලොකු කුඩම්මා, හින්නි මාමා, සීලා ඇන්ටි* යන වැඩිහිටියන් ද ඒ අයගේ දරුවන් කීප දෙනෙක් ද එසේ පැමිණි අය අතර වූහ. කොළඹ සිට දුම්රියෙන් පැමිණ දින දෙක තුනකට පසුව ඔව්හු දුම්රියෙන් ආපසු ගියහ. රජයේ සේවකයන් වූ ඒ වැඩිහිටියන්ට නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර හිමි ව තිබිණි. තවත් වරක ප්‍රේමාගේ මාමා කෙනෙකු

වූ වෙදමහතෙක් මාතර සිට අපේ ගෙදර විත් දින දෙක තුනක් ගත කර ගියේය. මේ අයගේ පැමිණීම අපගේ ඒකාකාර ජීවිතයේ යම් වෙනසක් ඇති කිරීමට හේතු විය.

රැකියා විරහිත ව සිටි ප්‍රේමාගේ මල්ලී කෙනෙකු වූ *හරිස්චන්ද්‍ර* (හරිස්) බදුල්ලට ගෙන්වා ගෙන සුළු රැකියාවකට සම්බන්ධ කළෙමි. අපගේ වාරිමාර්ග ඉංජිනේරු මහතාට කියා බදුලුඔය ව්‍යාපාරය යටතේ සුළු පරිපාලක තනතුරකට පිටත් කර යැවිමි. ඔහු තමන්ගේ උසස් නිලධාරින්ගේ හිත් දිනා ගෙන කටයුතු කර, *හක්වට්ටනා* ඔය ව්‍යාපාරයටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයටත් මාරුවෙමින් විශ්‍රාම යනතුරු එහි යම් යම් තනතුරු දැරීය. දරු දෙදෙනෙකුගේ පියෙකු වූ *හරිස්*, විශ්‍රාම ගිය පසු හදිසි අනතුරකින් අභාවප්‍රාප්ත විය. දරු දෙදෙනා හොඳින් ජීවත් වෙති. හරිස්ගේ බිරිඳ ගුරුවරියක වුවාය. ඇය ද වසර දෙක තුනකට පෙර අභාවප්‍රාප්ත වූවාය.

විවාහ දිවියට පිවිසෙන අවදියේ සිට දරු ප්‍රසූතිය වනතුරු ගමන් බිමන් යන විට ප්‍රේමා ඇඳගෙන ගියේ ඉන්දීයන් (පහත රට) සාරියයි. එනමුත්, බදුල්ලට ගොස් පළමුවන දරුවා ඉපදීමෙන් පසුව, උඩරට සාරිය (ඔසරිය) අඳින්නට පටන් ගත්තාය. මේ ගැන මා වඩා සතුටුවනවා ඇතැ'යි සිතුවා විය හැකිය. එනමුත් ඇය කැමති කුමන සාරිය ඇන්දත් මගේ කිසිම වෙනසක් නොවීය. අවශ්‍ය වන්නේ කාන්තාවක් ප්‍රියමනාප ලෙස ප්‍රමාණවත් වන අයුරින් සිරුර ආවරණය වන ඇඳුමක් ඇඳීම පමණයි. ප්‍රේමාගේ අම්මා හා කුඩම්මලා ද උඩරට සාරිය ඇන්ද නිසා එම ඇඳුමට මාරු වූවා දැ'යි නොදනිමි. උඩරට සාරිය ඇඳ ගැනීමට ඉන්දියන් සාරිය අඳිනවාට වඩා වේලාවක් ගත වූ බව පෙනී ගියේය.

මිණිපේ ගමන

විවාහ වීමට පසුව මා මිණිපේ නොගිය නමුත් බදුල්ලට මාරු වී ගිය බව අපේ අම්මලා දැන ගෙන සිටි බව පෙනේ. මට වැඩිමල් අක්කාගේ වැඩිමහල් දියණිය (යසවතී?) ඉඳුල් කටගෑමේ උත්සවය නිමිත්තෙන් හඳගනාවේ එම නිවසේ පැවැත්වීමට නියමිත "ඇටිහෝම්" එකට මට ද ආරාධනාවක් ලැබිණි. බදුල්ලේ සිට කැන්දකැටිය හරහා මිණිපේ ගමනට ගතවන්නේ පැය තුන හතරකි. රැයක් මිණිපේ ගත කිරීමට සිදුවූවත් ප්‍රේමාට හා දරුවාට එතරම් ගැටලුවක් නොවේ. කෙසේ වෙතත් කැන්දකැටියේ රැකියාව කළ ප්‍රේමාගේ මල්ලී හරිස් ගෙන්වා ගෙන ගෙදර නවත්වා, මම මිණිපේ ගියෙමි. මෙය මගේ විවාහයට පසුව මගේ නෑදෑයන් මුණගැසීමට ලැබුණු අවස්ථාවක් ද විය. දිවා ආහාර වේලාවට පමණ හඳගනාවේ අක්කලාගේ

ගෙදරට පැමිණියෙමි. අම්මා. අප්පච්චී, නංගී, අක්කා, මස්සිනාලා, වෙනත් වැඩිහිටි හා ළමා නෑදෑයින් බොහෝ දෙනෙක් එහි උන්හ. මා දුටු අප්පච්චී ගමන් විස්තර හා වෙනත් තොරතුරු විමසීය. විවාහය ගැන වචනයක්වත් කථා කළේ නැත. බොහෝ කාලයකින් නොදුටු තම බාලපුතාගේ පැමිණීම ගැන මහත් සේ සතුටු වූ බවක් පමණක් දක්නට ලැබිණි.

මේ ගමනට පසුව නැවත වරක් බදුල්ලේ සිට මිණිපේ යන්නට සිදුවිය. ඒ අපේ නංගීගේ බිළිඳු පුතාගේ අවමංගල්‍යයටයි. ඒ ගැන දන්වා මට විදුලි පණිවිඩයක් එවා තිබුණේ ද අප්පච්චී විසිනි. එවර ද කැන්දකැටිය හරහා මිණිපේ ගොස් පසුදින ආපසු පැමිණියෙමි. මරණයට පත් වී සිටි නංගීගේ පුතා ඇගේ දෙවෙනි දරුවාය. මීට පෙර වාරයේ මිණිපේ ගිය විට ඉතා පුෂ්ටිමත් ව සිටි ඒ දරුවා දුටු මම, ඒ දරුවා ප්‍රවේශම් කර ගන්නා ලෙස නංගීට කීවෙමි. මට එසේ කියන්නට හිතුණේ ඒ දරුවා හොඳින් වැඩී සිටි නිසාය. නමුත් මට දැන් හිතෙන්නේ එසේ නොකියා සිටියා නම් වඩා හොඳ බවය. මේ ගමන් දෙක නිසා මගේ දෙමව්පියන් සමඟ යම් අනවබෝධයක් තිබුණා නම් එය අහෝසි වන්නට ඇත. අප්පච්චී ජීවතුන් අතර සිටිය දී දැක ගැනීමට ලැබුණේ ඒ ගමන් නිසාය. මේ ගමන් දෙක ගියේ 1957 හා 1958 යන වසර දෙකේ මැද භාගයේ දී යයි සිතමි.

මෙම වර්ෂ දෙක තවත් වැදගත් සිද්ධි කීපයක් නිසා මගේ ජීවිතයට බලපෑමක් ඇති කළ කාල පරිච්ඡේදයක් විය. 1957 අප්‍රේල් මාසයේ දී *හල්ජෝති ටෙන්ටියුලස් ද සිල්වා විමලසිරි* මහතා බදුල්ලට මාරු වී පැමිණ ප්‍රධාන ලිපිකරු තනතුරේ සේවය ආරම්භ කළේය. 1952 වසරේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ සමයේ දී අප දෙදෙනා දැනහැඳින ගෙන සිටියහ. විවාහකයකු වූ ඔහුට පුතෙක් සිටියේය. බදුල්ලට එන විට බිරිඳ සහ ඇගේ නංගී කෙනෙක් ද සමඟ පැමිණ ප්‍රධාන ලිපිකරු නිවසේ පදිංචි විය. එතෙක් මාර්තු මාසයේ දී ප්‍රධාන ලිපිකරු ලෙස වැඩ බැලීමට ද මට සිදුවිය. කලින් සේවය කළ අය අතපසු කර ගොඩගැසී තිබුණ ගිණුම් සම්බන්ධ ලිපිකටයුතු මාර්තු මාසය තුළ අවසන් කර, විමලසිරි මහතා පැමිණීමෙන් පසුව දෙවෙනි ලිපිකරු වශයෙන් ගිණුම් කටයුතු භාර ව රාජකාරී ඉටු කිරීමට පටන් ගතිමි.

නම් වෙනස් කිරීම

රජයේ සේවයේ නිරතවූවන්ට නම් වෙනස් කිරීමට පහසුවන අයුරු භාණ්ඩාගාරය විසින් 1957 අගෝස්තු 18වැනි දා දාතමින් අංක 394 දරණ චක්‍ර ලේඛය නිකුත් කරන ලදී. ඒ අනුව, 1957 ඔක්තෝම්බර් 04වන දින සිට නම වෙනස් කර ගැනීමට ප්‍රකාශනයක් අදාළ බළධාරීන්ට ඉදිරිපත් කළෙමි. එතෙක් මා හඳුන්වනු ලැබුවේ, 'ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ආරියපාල' නමිනි. මගේ විවාහයෙන් පසුව ප්‍රේමාට "මිසිස්" ආරියපාල

යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලැබීම ගැන මට එතරම් පැහැදීමක් නොවීය. දරු උපතින් පසුව මගේ දියණිය "මිස් ආරියපාල" යනුවෙන් හඳුන්වනවාට ඊටත් වඩා අකැමැති විය. මට උත්පත්තියේ දී දෙන ලද 'ආරියපාල' යන නම මගේ පෙළපත් නාමය සමඟ භාවිතා කළ යුතුයයි නිගමනය කළ නිසා, ඉහත සඳහන් ප්‍රකාශනය ඉදිරිපත් කළෙමි. එතැන් සිට මා භාවිතා කළේ *'ආරියපාල ඒකනායක'* යන නමයි. ඉන්පසු මගේ බිරිඳ *"මිසිස් ඒකනායක"* වූවාය. මගේ දියණිය *'චාන්දනී ඒකනායක'* වූවාය. කලින් දැනුන මදිකම පහ වී ගියේය.

1957 ගංවතුර හා නායයාම

1957 දෙසැම්බර් ඊසාන දිග මෝසම් කාලයේ දී රටේ බොහෝ ප්‍රදේශවල තදවැසි පැවතිණි. ඒ වැස්ස වෙනත් අවුරුදුවලට වඩා වැඩි විය. සමහර විට දින ගණන් නොකඩවා වැස්ස පැවතිණි. මේ නිසා ගල්ඔය, අනුරාධපුර, පොළොන්නරුව වැනි ප්‍රදේශවල ගංවතුර ගැළුවේය. කඳුකරයේ නොයෙක් තැන්වල නායයෑම් බහුල විය. තදබල ලෙස වැස්ස පැවතුණි.

1957 දෙසැම්බර් 19 දා රාත්‍රියේ මා පදිංචි ව සිටි නිල නිවාසය ඉදිරිපස නිඳන කාමරයේ ජනේලය දෙදරුම් කනවා දැනිණි. ජනේල පඩියේ සිට පහළට බිත්තියේ අඟල් කාලක පමණ විවරයක් සෑදී තිබිණි. තද වැසි හා අඳුර පැවතිණි. අසල නිවසේ පදිංචි ව සිටි ඕවර්සියර් පුංචි අප්පුහාමි මහතාට කථා කොට විදුලි පන්දමක් අල්ලා බලන විට, නිදන කාමරයෙන් පිටත මිදුල කඩාගෙන ගොස් ඇති බව පෙනිණි. ඒ පැත්තෙන් අඩි පනහක හැටක පල්ලමක් විය. ඉන් පහළ තිබුණේ *ඇල්.ඇම්. පෙරේරා* පවුලේ නිවසයි.

නිවසේ අනිත් පසින් තිබුණ විසිත්ත කාමරයට ප්‍රේමා හා දරුවා කැඳවා ගෙන ගොස් නවතා, අවශ්‍ය වන ඇඳුම් පැළඳුම් ටිකක් පෙට්ටියක දමා ගතිමි. පඩිපෙළට පහළින් මහපාර අයිනේ තිබුණ සිරිවර්ධන මහතාගේ නිවසට ගිය අප තිදෙනා එදින රාත්‍රිය එහි ගත කළෙමු. දෙදරුම් කන අප නිවස කොයි මොහොතක කඩා වැටේ දැ'යි නිශ්චිත නොවීය. පසුදා පහන් වූ පසු නායයෑම් සිදු වී තිබුණ අයුරු දැක ගත හැකි විය. අපගේ නිදන කාමරයට පිටින් මිදුල අත්තිවාරම අයිනෙන් ම කඩාගෙන ගොස් තිබිණි. කාර්යාලයට ගොස් ඉංජිනේරු මහතාට දැන්වූ පසු එතුමා ද පැමිණ හානිය ගැන සොයා බලා, බංඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාට හා වාරිමාර්ග අධ්‍යක්ෂතුමාට වාර්තා කළේ යයි සිතමි. විසිවෙනි දින ද සිරිවර්ධන නිවසේ ලැඟුම් ගත් අප තිදෙනා, පසුදින පෙරවරු "උඩරට මැණිකේ" දුම්රියෙන් කොළඹට ගොස් "රුහුණු කුමාරි" දුම්රියෙන් මාතරට ගියෙමු. ප්‍රේමා සහ දියණිය මහ ගෙදර නතර කොට, දින දෙක තුනකින්

මාතර, හම්බන්තොට, වැල්ලවාය, බණ්ඩාරවෙල මාර්ගයේ බස් රථවලින් බදුල්ලට පැමිණියෙමි. මේ වන විට දුම්රිය මාර්ගයේ දෙමෝදර අසල නාය ගොස් තිබිණි. ඉන්පසුව බොහෝ කාලයක් ගතවන තුරු කොළඹ දුම්රිය පැමිණියේ බණ්ඩාරවෙල දක්වා පමණි.

කාර්යාල පරිශ්‍රයේ ලැගුම් ගැනීම

බදුල්ලට ගිය මට නිල නිවාසයේ නතර වීම අනතුරුදායක විය. කාර්යාල ගොඩනැඟිල්ලේ ප්‍රයෝජනයට නොගත් දිග ශාලාවක් තිබිණි. මට එහි ලැගුම් ගැනීමට සලසා ගන්නා ලෙස ඉංජිනේරු මහතා දැන්වීය. ඒ අනුව එම ශාලාවට මගේ ගෘහ භාණ්ඩ ස්වල්පය ද ගෙනැවිත් දමා ඇඳක් සවිකර ගෙන නිදාගැනීමාදි පහසුකම් සලසා ගතිමි. ආහාරපාන අසල කඩවලින් ලබා ගතිමි. මසකට වරක් පමණ දුම්රියෙන් මාතර ගොස් බිරිඳ හා දරුවා දැක බලාගෙන ආපසු පැමිණියෙමි.

මේ සිද්ධිය වන විට මගේ දියණියට වයස මාස හයක් ගතවූවා පමණකි. මාසයකින් පමණ බදුල්ලේ සිට මාතර ගිය විට මේ කුඩා දැරියට මා නාඳුනන කෙනෙක් විය. මේ ආදී කරුණු නිසා, හැකි පමණ ඉක්මනින් අප තිදෙනාට ම එකට සිටීමට පුළුවන් පිළිවෙලක් ගැන සෙවීමට සිදුවිය. මේ නිසා, 1958 පෙබරවාරි 15වැනි දින ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළෙමි. ඒ ගැන ඉංජිනේරු මහතා වැඩි කැමැත්තක් දැක්වූයේ නැත. එතුමා වෙන ම පිළියමක් යෙදුවේය. මගේ නිල නිවසේ එක පැත්තක පදිංචි වීමට සකස් කර දුන්නේය. විසිත්ත කාමරය නිදන කාමරය ලෙස භාවිතා කිරීමට හාඩ්බෝඩ් ගසා වෙන් කරන ලදී. කෑම කාමරය පස ඉස්තෝප්පුවෙන් දොරක් තිබුණ නිසා නිවසට පිවිසීමට ගැටලුවක් නොවීය. පිටුපස නිඳන කාමරය මුළුතැන්ගෙය මෙන් යොදා ගත හැකි විය. කලින් අප භාවිතා කළ ඉදිරිපස නිදන කාමරය පමණක් වසා තැබුවෙමු. නිවසේ තිබුණ නාන කාමරය හා වැසිකිලිය ද පෙර පරිදි ම භාවිතා කළ හැකි විය. මේ නිසා, මාර්තු මාසයේ දී පමණ ප්‍රේමා හා දියණිය බදුල්ලට කැඳවා ගෙන ඒමට හැකි විය.

රත්නායක මහතාගේ අර්බුදය

මා කාර්යාලයේ ලැගුම් ගෙන සිටි අවධියේ දී අප කාර්යාලයට පත්වීමක් ලැබ පැමිණ සිටි *රත්නායක* නම් ලිපිකරු මහතා හැන්දෑ කාලය ගත කිරීමට සමහර දිනවල මගේ කාමරයට පැමිණියේය. ඔහු බදුල්ල අසල ගමක ඉපදී හැදී වැඩුණු කෙනෙකි. වාරිමාර්ග කාර්යාලයේ රැකියාව ලැබුණායින් පසුව

ඔහු එයට සමීප නිවසක නවාතැන් ගත්තේය. එම ගෙහිමියාට හැඩරුව ඇති දියණියක වූවාය. ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගත් මේ දෙදෙනා, රත්නායක මහතාගේ වැඩිහිටියන්ගේ අවසරයකින් තොර ව, විවාහ වූහ. මේ බව දැනගත් ඒ උදවිය, මේ සම්බන්ධය නවත්වන ලෙස රත්නායක මහතාට බල කළහ. මේ ගැන බෙහෙවින් ම විරෝධය පෑවේ රත්නායකගේ මෑණියන් බව දැන ගන්නට තිබිණි.

රත්නායක මා හමුවන්නට ආවේ මේ අවුල ගැන සාධාරණ උපදෙසක් ලබා ගැනීමටයි. තම මෑණියන් මෙයට විරුද්ධ වන්නේ ඇයි දැ'යි විමසූ විට රත්නායක කියා සිටියේ, කුල භේදය නිසා බවය. රත්නායක ගොයිගමය. තරුණිය අඩු කුලයකය. එනමුත් රත්නායකගේ එම සම්බන්ධය ගැන මම පුදුම නොවූයේ ඈ එතරම් හැඩකාරියක් වූ නිසාය. නොයෙක් කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් පසුව, රත්නායකට මා දුන් උපදේශය වූයේ, දැන් කුමන ගැටලු පැන නැඟුණත් තරුණියක් අතරමං නොකරන ලෙසයි. විවාහත් තරුණියකට නැවත කිසිදා අවිවාහක තරුණියකට ලැබෙන පිළිගැනීම ලබා ගත නොහැකිය. ඒ නිසා ඇය අතරමං වේ. පිරිමියකුට මෙය එතරම් බරපතල දෙයක් නොවීමට පුළුවන. වෙන තරුණියක් හා විවාහ වීමට බාධා නොමැති තරම්ය. මම බඳුල්ලෙන් මාරු වී ගියාට පසුව කුමක් සිදුවී දැ'යි නොදනිමි. එනමුත් එතෙක් එම විවාහය කඩාකප්පල් වූයේ නැති බව දනිමි.

ප්‍රේමා හා දරුවා මාතර සිට බදුල්ලට එක්කර ගෙන එන විට ප්‍රේමාගේ නැඟණියක වූ *නෙලා* නංගී ද අප සමඟ බදුල්ලට පැමිණියාය. ඒ නිසා ප්‍රේමාට දරුවා සමඟ හුදකලා වීමට සිදු නොවීය. නංගී බෙහෙවින් ම අක්කාට උපකාර වූ නිසාය. බිළිඳු දරුවා ද ගමේ සිටිය දී පුංචි අම්මා සමඟ කුළුපග වී සිටියාය. එය ද පහසුවක් විය. මගේ නිල නිවසට නල ජලය හා විදුලිය පහසුකම් තිබුණ නිසා ද විශාල පහසුවක් විය.

ශ්‍රී පාද වන්දනා ගමන

1958 ශ්‍රී පාද වන්දනා සමයේ දී සිරිපා වැඳ පුදා ගැනීමට තීරණය කළෙමු. අප කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු විමලසිරි මහතා ඒ සඳහා බදුල්ල නගරයේ ව්‍යාපාරිකයෙකුගේ කාර් එකක් ලබා ගත්තේය. විමලසිරි මහතා, එම මහත්මිය හා නැඟණිය ද බිළිඳු පුතා ද එම පවුලට අයත් වූහ. අප පවුලට ද හතර දෙනෙක් වූහ. ප්‍රේමා, නෙලා නංගී, දියණිය හා මාය. රියදුරා සමඟ නව දෙනෙක් මේ ගමනට සම්බන්ධ වූහ. නියමිත දින පාන්දර මගේ දියණියට උණගැනී සිටියාය. මේ ගමන යනවා ද නැද්ද ගැටලුව මතුවිය. වයස මාස අටක් පමණ වූ දරුවාට අවශ්‍ය වුවහොත් අතරමඟ දී

ප්‍රතිකාර ලබා දීමේ බලාපොරොත්තුවෙන් උදෑසනින් ම බදුල්ලෙන් පිටත් වුණෙමු. හැටන් නගරයට එනවිටත් දරුවාට උණගතිය තිබුණ නිසා, එහි වෛද්‍යවරයෙකුගෙන් බෙහෙත් ලබා ගතිමු. වාහනයෙන් බැස පා ගමනින් යා යුතු මුළු දුර ප්‍රමාණයේ දී ම දරුවා වඩා ගෙන යෑමට ප්‍රේමාට සිදුවිය. වෙන කෙනෙකුගේ අතට මාරු වීමට අකැමැති වූ නිසාය. රාත්‍රියේ ශ්‍රීපාදය කරුණා කරන අතරතුර විවේක ගැනීමට තිබුණ තැනක, පැය කීපයක් නිදාගෙන සිට නැවත ගමනට පිටත් වී ඉර සේවයට පෙර ශ්‍රීපාද පද්මය වෙත පැමිණියෙමු. සිරිපතුළ වැඳපුදා ගැනීමෙන් පසුව ඉර සේවය දැක ගැනීම පිණිස නැඟෙනහිර දෙසින් වූ ගල්තලාවේ වාඩිගෙන සෑහෙන වේලාවක් ගත කළ පසු ඉර උදාව දක්නට ලැබිණි. ඉන්පසුව ආපසු එන විට, මළුවේ දී ම මහත් තදබදයක් ඇති විය. සෙනඟ අඩුවන තුරු පසෙකට වී සිට, සීරුවෙන් පහළට එන ගමන ඇරඹුවෙමු. මේ වන විට අප කුඩා දියණියට උණ බැස තිබිණි. එනමුත් අම්මාගේ අතින් බැසීමට කැමති වුණේ නැත.

මෙය මගේ දෙවැනි ශ්‍රී පාද වන්දනා ගමනයි. 1983 වන්දනා සමයේ දී දරුවන් සමඟ මා ගිය නමුත්, ඒ අය ශ්‍රීපාදේ වැඳපුදා ආපසු එනතුරු නල්ලතන්නියේ නැවතී සිටියෙමි. ඒ වන විට කඳු නැඟීමට නොහැකි වූ නිසාය. පළමුවරට මාස අටේ දී ශ්‍රී පාදේ ගිය මගේ ලොකු දුව, මේ වන විට වයස අවුරුදු විසිහයක් වූ වෛද්‍යවරියක් ව වන්දනාවේ ගියාය. එවර මස්කෙළියට පැමිණ උදේ ආහාරය ගැනීමෙන් පසු, නුවරඑළිය, ගම්පල, කඩුගන්නාව හරහා කොළඹට පැමිණෙන විට එදින සවස් වී තිබිණි.

ගංවතුර ආපදා සහන ඉල්ලීම

1958 වර්ෂයේ අප රට තුළ යම් යම් වැදගත් සිදුවීම් ඇති වූ වසරකි. මගේ ජීවිකාව සම්බන්ධ කරුණු කීපයක් ද ඒ අතර ඇත. 1957 දෙසැම්බර් මාසයේ දී ඇති වූ ජලගැලීම් හා නායයෑම් නිසා අපට නිල නිවාසයෙන් ඉවත් වීමට සිදුවිය. මේ නිසා යම්කිසි සහනයක් ලබා ගත යුතු යැ'යි කල්පනා කොට, 1958 ජනවාරි 27 දින වාරිමාර්ග අධ්‍යක්ෂතුමා වෙත ලිපියක් යවමින් පහත සඳහන් පහසුකම් අනුමත කරන ලෙස ඉල්ලා සිටියෙමි.

අ. මාතර ගමනට භාවිතා කළ දුම්රිය ගමන් බලපත්‍ර රාජකාරී බලපත්‍ර ලෙස සැලකීම.

ආ. ඒ ගමනට ලබා ගත් නිවාඩු රාජකාරී නිවාඩු ලෙස සැළකීම සහ

ඇ. දෙසැම්බර් 20 දින සිට ජනවාරි 19 දින තෙක් මාසයකට යැපීම් දීමනා ලබා දීම.

මෙවැනි ඉල්ලීමක් රාජ්‍ය සේවයේ කිසිවකු මින් පෙර ඉදිරිපත් කර නැති බව දැනගන්නට ලැබිණි. ඒ නිසා, එය අනුමත කිරීම හෝ නොකිරීම මහභාණ්ඩාගරයෙන් කළ යුතු විය. මා ඉදිරිපත් කළ තොරතුරු නිවැරදි බව බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරුවරයා සහතික කළේය. මධ්‍යම කොට්ඨාසයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා එය නිර්දේශ කළේය. වෙන කාරණයකට බදුල්ලට පැමිණි පරිපාලනය භාර සහකාර වාරිමාර්ග අධ්‍යක්ෂ *නිශ්ශංක විජේවර්ධන මහතා* පුද්ගලික ව මගේ නිල නිවස ද පරීක්ෂා කර බලා, භාණ්ඩාගාරයට නිර්දේශයක් යවා ඇත. ඒ අනුව මගේ ඉල්ලීම භාණ්ඩාගාරයේ ආයතන පාලකවරයා විසින් අනුමත කළ බව 1958 මැයි 9වැනි දින වාරිමාර්ග අධ්‍යක්ෂකවරයා විසින් දන්වා එවා තිබිණි.

මෙම සිද්ධියට පසුව, 1958 ජාතිවාදී කෝළාහල නිසා විතැන් වූ නිලධාරීන් මේ පූර්වාදර්ශයක් කොට දක්වා ඉල්ලීම ඉදිරිපත් කළත් අනුමත නොවූ බව පුවත්පත්වල පළවී තිබුණ තොරතුරුවලින් දැන ගතිමි. මගේ ඉල්ලීම අනුමත කිරීම ගැන ද බලගතු විවේචන ඉදිරිපත් කර තිබිණි.

මහියංගණ උප කොට්ඨාශය

ඉහත සඳහන් ඉල්ලීම මා ඉදිරිපත් කරන විට අපගේ ප්‍රධානියා වූ වාරිමාර්ග ඉංජිනේරු *ඒ.ජේ.බී. පොන්රාජා* මහතාය. එතුමා බදුල්ලට මාරු වී පැමිණියේ 1958 මුල දී ය. එතෙක් බදුල්ල උප කොට්ඨාශය භාර ව සිටි *ජී.එම්. සිතම්පරපිල්ලේ* මහතා අලුතෙන් ඇරඹූ මහියංගණ උප කොට්ඨාසයට මාරු කරන ලදී. එහි සේවය කිරීමට ප්‍රධාන ලිපිකරු ලෙස *සී.ඒ. ද සිල්වා* මහතා ද තවත් කෙනෙක් ද (*හෂීම්* යයි සිතමි) ටික කලක් බදුල්ලේ සිට රාජකාරී ඉටු කළහ. ගබඩා නිළධාරී ගමගේ මහතා ද බදුල්ලේ සිට මහියංගණයට මාරු කරන ලදී. මහියංගණ උප කොට්ඨාස කාර්යාලය පිහිටා තිබුණේ මාපාකඩය. එය ආරම්භ කිරීමට දින කීපයකට පෙර ප්‍රේමා, දරුවා හා සමඟ මා ද මාපාකඩට ගොස් සංචාරක නිවාසයක රැයක් නැවතී සිට ආපසු පැමිණි බව මතකය. ඒ අවධියේ බදුල්ලේ සිට මාපාකඩට ගියේ පස්සර, බිබිල හරහා ය. ඒ ගමන සැතපුම් හැටක් පමණ විය. දැන් *මීගහකිවුල කරමැටිය* හරහා *මාපාකඩට* සැතපුම් විසිපහකින් පමණ ළඟාවිය හැකිය. බදුල්ලේ සේවය කළ පිරිස හා මහියංගනයට මාරු වී ගිය පිරිස් එකතුව ගන්නා ලද ඡායාරූපයක් තවමත් මා ළඟ තිබේ.



Front Row **:** C.A.de Silva, Fred Ratnasingham, A. Ekanayake, Mrs. Ekanayake, Mrs. Wimalasiri, P.M. Sithamparapillai, Mrs. Sithamparapillai, Wimalasiri's sister-in-law, Mrs. Jayathilake, Jayathilake, H.T.de S. Wimalasiri.

Second Row **:** Hasheem, Nanayakkara, J. Ratnappuli, Wickremasinghe, Kiri Banda, Kandasamy, Berty Jayasekera, W.M.J. de Silva, Sithamparanathan, Thillainathan, Albert, A.B.de Silva, W.B Ekanayake.

Third Row **:** Heen Banda, Seneviratne, D.A.Mahanama, Sneviratne, P.B.Rajasinghe, Ariyaratne, Gamage, Irton de Lima, B.A.Tissera, Jayasinghe, H.Wijesiriwardhane, Kalu Banda, Dias, Punchiappuhamy and A.V. Mahindapala.

1958 ජාතිවාදී කෝළාහල

1958 අප්‍රේල් මාසයේ දී රජයේ සේවක වැඩ වර්ජනයක් පැවතිණි. වාරිමාර්ග කාර්යාලයේ අප එයට සම්බන්ධ නොවූ නමුත් බදුල්ල කච්චේරියේ වර්ජනය පැවතිණි. ඒ අතරතුර ජාතිවාදී කෝලාහලයක් පැන නැගිණි. බදුල්ල නගරයේ දමිළ ජනකායක් පදිංචි ව උන්හ. අවට වතුකරයේ ද දමිළ සේවකයෝ සේවය කළහ. මේ කලබල උත්සන්න වී ගෙන එන විට, කැන්දකැටියේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කම්කරු පිරිසක් ලොරිවලට නැඟී

බදුල්ල නගරයට පැමිණියේ මුතියංගන රජ මහා විහාරයට හානි වන බවට කටකථා පැතිර ගිය නිසාය. මේ වන විට හදිසි නීතිය ප්‍රකාශ කර යුද්ධ හමුදාව ද, පොලීසියට සහායට යොදවා තිබිණි. ලොරිවලින් පැමිණි පිරිස් මුතියංගන පන්සල් භූමියට කොටු කර අත් අඩංගුවේ තබන ලදී. කලබල වැඩි වූ දිනක රාත්‍රියේ අප නිලනිවාසවල සිට බලන විට, බදුල්ල නගරයේ තැන් තැන්වල ගිනිදැල් මතුවන බව දුටුවෙමු. පොලීසිය හා හමුදාව ඒ තැන්වලට ගොස් ඒවා පාලනය කළහ. වතුකරයේ දමිළ කම්කරුවන් සිංහල ජනයාට පහර දීමට එන බවට කටකථා පැතිර ගියේය. නිල නිවාසවල සිටි අපි ඒ දවස්වල මහත් බියකින් කාලය ගත කළෙමු. එනමුත් ඇත්ත වශයෙන් ම මේවා කටකථා පමණක් විය. දෙමළ මිනිසුන් ද සිටියේ අප මෙන් ම බියකිනි.

මේ කලබල ගැන හෝඩුවාව වැටෙන විට, කාර්මික නිලධාරී *රත්නසිංගම්* මහතා හාල්, පොල්, දුරු මිරිස් ආදී බඩු ටිකක් ලබා දෙන ලෙස මගෙන් ඉල්ලීය. මා බඩුගත් කඩෙන් වෙනදාට වඩා බඩු ගන්නා විට ඒවා කාට දැ'යි මුදලාලි විමසූ නමුත් මගේ පිළිතුර වූයේ, කලබලකාරී තත්වය නිසා ටිකක් වැඩියෙන් බඩු ගන්නා බවයි. ඇත්ත වශයෙන් ම ඒ වැඩිපුර බඩු ගෙන ගොස් රත්නසිංහම් මහතාට දුනිමි. ටික දවසක් ගතවන තුරු ඒ අයට කඩවලට ගොස් අවශ්‍ය දේ මිල දී ගැනීමේ ගැටලුවක් පැවතිණි. ගෙවල් දොරවල් කීපයකට හානි සිදුකර තිබුණ නමුත් ජීවිත හානි කිසිවක් ගැන ඒ ප්‍රදේශයෙන් වාර්තා වූයේ නැත. පොලීසියේ මැදිහත් වීම පමණක් නොව දියතලාවෙන් යුද්ධ හමුදාව සංචාරයට යෙදවීම නිසා ද ඉක්මනින් ම කලබලකාරී තත්ත්වය නැති වී ගිය නමුත්, එයින් ආරම්භ වූ අවිශ්වාසය ලියලා යන්නට විය. වැලිමඩ ප්‍රදේශයේ දේශපාලකයෝ සිංහලයන් කුපිත කරවූහ. දමිළ දේශපාලකයෝ රටපුරා අවිශ්වාසය ගොඩනැඟුහ. තවමත් මේ රටේ "අළු යට පවතින්නේ" එසේ අවුලන ලද ගින්දරවල "පුපුරුය".

රේඩියෝවක් හා මහන මැෂිමක්

බදුල්ලේ සිටිය දී අපට ප්‍රයෝජනවත් භාණ්ඩ දෙකක් මිල දී ගතිමු. එකක් විදුලි බලයෙන් ක්‍රියා කරන ජී.ඊ.සී.ගුවන් විදුලි යන්ත්‍රයකි. ඒ සඳහා රුපියල් දෙසිය තිහක් ගෙවීමි. අනික සිංගර් මහන මැෂිමකි. මහන මැෂිමට රුපියල් 1800/-ක් විය. එනමුත්, ඒ මුදලින් ටිකක් ගෙවා ඉතිරිය මාසික වාරිකවලින් පියවන ලදී. ගුවන් විදුලි යන්ත්‍රය පසුකාලයේ දී බැටරිවලින් වැඩ කිරීමට ට්‍රාන්සිස්ටර් යොදා සකස් කර, අබලන් වී ඉවත දමන ලදී. මහන මැෂිම තවමත් අප නිවසේ තිබේ. පාවිච්චි කරන්නේ නැත.

නායයෑම නිසා, 1957 දෙසැම්බර් මාසයේ දී මගේ නිල නිවාසයට සිදු වූ හානිය අලුත්වැඩියා කිරීම ද මාස හතරක් පහකට පසුව ආරම්භ විය. මේ සඳහා ලොකු ගල් බැම්මක් බැඳීම අවශ්‍ය විය. ඒ කටයුත්ත සඳහා කොන්ත්‍රාත්තුව භාර ගෙන තිබුණේ පහළ ගෙය අයිති *ඇල්.ඇම්.පෙරේරා* මහතාය. ගල් බැම්ම බැඳ වැඩ අවසන් වූයේ, ස්ථාන මාරුවක් ලැබී අප ඒ නිවසින් ඉවත්වන සමයේ දී ය. එසේ ඉවත් ව ගියේ 1958 නොවැම්බර් මස 13වෙනි දා පමණය. නොවැම්බර් මස 15වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මා *තමන්කඩුව* වාරිමාර්ග කාර්යලයේ ප්‍රධාන ලිපිකරු ලෙස සේවය කිරීමට මාරු කරන ලදී. වසර මුල දී සහකාර අධක්ෂ *නිශ්ශංක විජේවර්ධන* මහතා බදුල්ලට පැමිණි අවස්ථාවේ, නාය යෑමෙන් හානි වූ මගේ නිල නිවාසය පරීක්ෂා කිරීමට ගිය ගමනේ දී, මගේ රාජකාරී පළපුරුද්ද ගැන තොරතුරු විමසුවේය. වාරිමාර්ග කාර්යාලයක කාර්ය මණ්ඩල කටයුතු, ඉදිකිරීම් වැඩ රාජකාරී, ගිණුම් කටයුතු යනාදිය පිළිබඳ සමස්ත දැනුමක් හා පළපුරුද්දක් මේ වන විට මා ලබා සිටි නිසා, වැඩ අවුල් වී තිබුණ තමන්කඩුව කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු ලෙස මා මාරු කිරීමට සහකාර අධ්‍යක්ෂවරයා තීරණය කළ බව පෙනේ.

ස්ථාන මාරුවක් ලැබුණායින් පසුව බදුල්ල උප කොට්ඨාශයට අයත් වූ *කන්දේ ඇල, මහඑළිය* වැනි තැන් බලා ගැනීමට කැමැත්ත පළ කළ විට, වාරිමාර්ග ඉංජිනේරු *පොන්රාජා* මහතා එතුමාගේ අලුත් ම කාර් එකෙන් ප්‍රේමා, දරුවා, සුමනාවතී යන තිදෙනා ද මා සමඟ ඒ තැන්වලට එක්කර ගෙන ගියේය. සුමනාවතී මහඑළිය ප්‍රදේශයෙන් ගෙදර උදව්වට සොයා ගත් දැරියකි. කන්දේ ඇල සංචාරක බංගලාව භාරකරු අපට දිවා ආහාරය සකසා දුන්නේය. කලින් නොදුටු මේ තැන් දැක බලා ගැනීමට සැලසීම ගැන ඉංජිනේරු මහතාට ස්තුති කළෙමි. ස්ථාන මාරුවීමක් ලත් කෙනෙකුට සාදයක් පවත්වා සුභ පැතීම සිරිතක් විය. ඒ අනුව බදුල්ල උප කොට්ඨාසයේ විසිරී සිටි හිතමිතුරන් විසින් අප වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

හිඟුරක්ගොඩට ස්ථාන මාරුව

නියමිත දිනට පෙර මගේ ගෘහ භාණ්ඩ ආදිය හිඟුරක්ගොඩට යැවීම සඳහා බදුල්ල දුම්රිය ස්ථානයෙන් බඩු මැඳිරියක් ලබා ගෙන එයට පටවා පිටත්කර යැවීමි. නොවැම්බර් 15වන දින *තමන්කඩුව* වාරිමාර්ග කාර්යාලයේ සේවයට වාර්තා කළ යුතු ව තිබුණ නිසා, ඊට පෙර එහි යෑමට පිටත් විය යුතු විය. මා සමඟ මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ සේවය කළ ලීලසෝම මහතා තමන්කඩුව කාර්යාලයේ සිට මට ලිපියක් එවා තිබිණි. එහි සඳහන් විස්තර අනුව දුම්රියෙන් හිඟුරක්ගොඩට යා යුතු විය. ඒ අනුව, නොවැම්බර්

මස 13වන දින රාත්‍රී තැපැල් දුම්රියෙන් පොල්ගහවෙල දක්වා ගියෙමු. ඒ කොටස ගමන් කළේ දෙවන පන්තියේ නිඳන මැදිරිවලය. සුමනාවතී ද අප සමඟ ගමන් ගත්තාය. පෙරවරු පහට පමණ පොල්ගහවෙලින් බැස මඩකලපුව දුම්රිය එහි ළඟාවන තුරු පැය තුන හතරක් ගත කිරීමට සිදුවිය. මඩකලපුව දුම්රියේ භෝජනාගාර මැදිරියක් ඇතැ'යි කල්පනා කළ අපි, පොල්ගහවෙල දී, ප්‍රමාණවත් පහසුකම් නොවූ නිසා, උදේ ආහාරය ගැන උනන්දු වූයේ නැත. එනමුත් මඩකලපුව දවල් දුම්රියේ එදින භෝජනාගාර පහසුකම් නොතිබුණ නිසා, දවල් දෙකට පමණ හිඟුරක්ගොඩට ළඟා වන විට, අප සියලු දෙනා ම බලවත් අහේනියකට පත් ව සිටියෙමු. ඒ නිසා හිඟුරක්ගොඩ නගරයේ දී කුසගිනි නිවාගෙන සැතපුම් දෙකක් පමණ දුරින් ගුවන් තොටුපල අසල පිහිටි වාරිමාර්ග කාර්යාලයට ගියෙමු.

ප්‍රධාන ලිපිකාර නිල නිවාසයේ එතෙක් එහි සේවය කළ ප්‍රධාන ලිපිකරු සිය පවුල සමඟ පදිංචි ව සිටි නිසා, අපට තාවකාලික නවාතැන්පලක් ලැබිණි. පළමුවෙන් වෙනත් නිලධාරීන් ද නිවැසි ව සිටි විශාල බංගලාවක ලොකු කාමරයක් ලැබිණි. ජල පහසුකම් හා විදුලි ආලෝකය තිබුණ මේ නිවසේ සිටි කීප දෙනාට ආහාරපාන සකසා දීමට සේවකයෙක් සිටියේය. අප පවුලේ ආහාරපාන ද එතැනින් ලැබිණි. ප්‍රේමාගේ අත් උදව්වට සුමනාවතී සිටි නිසා බිළිඳු දරුවාගේ වැඩපල කර ගැනීමට ද ගැටලුවක් නොවීය.

1958 නොවැම්බර් මස 15වැනි දින *නමන්කඩුව* වාරිමාර්ග කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු ලෙස වැඩ කටයුතු ආරම්භ කළෙමි. උප කොට්ඨාසයේ ප්‍රධානියා වූයේ වාරිමාර්ග ඉංජිනේරු *ජී.එස්.එම්.ඡොක්මන්* මහතාය. එතුමා ඉතා සුහද ව මා පිළිගෙන කාර්යාලයේ පැවැති තත්ත්වය පිළිබඳ විස්තර කළේය. මගේ සහායට *ලීලසෝම* හා *අබේවර්ධන* යනුවෙන් තවත් ලිපිකරු මහතුන් දෙදෙනෙක් වූහ. ලීලසෝම මහතා මීට කලින් මිණිපේ දී මා සමඟ සේවය කළ කෙනෙකි. අබේවර්ධන මහතා නවකයෙකු වූ අතර, ඔහු ඌරුගල පාසලේ මා උගන්වන කාලයේ දී මගේ ගෝලයෙකු විය. *එස්. ඇලෙක්සැන්ඩර්* නම් තාවකාලික ලිපිකරු මහතෙක් සිටියේය. *අමරසේකර,* ආරියසේන, දාබරේ යනුවෙන් ගබඩා නිළධාරීන් තිදෙනෙක් වූහ. *රාජවික්‍රම, පෙරේරා* හා සමරවීර නමින් සැලසුම්කරුවන් තිදෙනෙක් මෙහි සේවය කළහ. *ධර්මරත්න, එච්.ඒ.ඩී.එස්.වී.පෙරේරා, ජයසිංහ, හේරත්, මීඩින්* යනුවෙන් සහායක නිළධාරීන් කීප දෙනෙක් සිටියහ. ලොරි හා ජීප් රථ රියදුරන් හතර පස් දෙනෙක් වූහ. කවුඩුල්ල, ගල් අමුණ, ඇලහැර, ගිරිතලේ, මින්නේරිය ආදී වාරිමාර්ග යෝජනා ක්‍රම රාශියක් භාර ව කාර්මික නිලධාරීන් හා ඕවර්සීයර්වරු දහපහළොස් දෙනෙක් ද මේ කාර්යාලය යටතේ සේවය කළහ. *කැස්පර්ස්, කුලතුංග, නවරත්නරාජා, ජයතිස්ස, විල්සන්, නිකනැන්න, අයිවන් විජේසූරිය, රංජිත් බාලසූරිය, සිරිපාල* යන අය කාර්මික නිලධාරීහු වූහ. ඕවර්සීසර්වරුන් අතරින් දැනට මතකයේ

තිබෙන්නේ ප්‍රැන්සිස්, සිවලිංගම්, ප්‍රනාන්දු, එස්.ඒ.ගුණවර්ධන යන අයගේ නම් පමණයි. මෙම විවිධ ව්‍යාපාරවල සේවය කළ කම්කරු සංඛ්‍යාව හාරපන්සීයයක් වන්නට ඇත. කම්කරුවන්ගේ නිවාඩු ඉල්ලුම්පත් පමණක් දිනකට විසි පහක් පමණ අනුමත කිරීමට සිදුවිය. මේවායේ විවිධ අක්‍රමිකතා සිදුවීමට ඉඩ තිබුණ නිසා, ඉතා ප්‍රවේශමෙන් රාජකාරී කළ යුතු විය. එසේ නොවී නම්, දූෂණ චෝදනාවලට පවා භාජනය වීමට ඉඩ තිබිණි. ඒ අතරතුර, කොන්ත්‍රාත්තුකරුවන් කීප දෙනෙක් ඉදිකිරීම් කටයුතුවල නිරත වී සිටියහ. ඒ අය සම්බන්ධකර අල්ලස් චෝදනා පැන නැඟීමට ඉඩ තිබිණි. මේ රාජකාරිය දැලිපිහියෙන් කිරි කනවාටත් වඩා අමාරු බව නම් ඉක්මනින් ම අවබෝධ කර ගතිමි.

නිල නිවාසය ලැබීම

මට කලින් සිටි ප්‍රධාන ලිපිකරු මහතාට ස්ථාන මාරු වීමක් ලැබී තිබුණත්, ටික කලක් ගතවන තුරු නිලනිවාසය හැර ගියේ නැත. ස්ථාන මාරුවීමක් ලැබී තිබුණ නිසා, කාර්යාලයේ සේවයට පැමිණිය නොහැකි විය. ඔහු නිලනිවාසය හැර යන තුරු මට ප්‍රමාණවත් කුඩා නිලනිවාසයක් කාර්යාලයෙන් ටිකක් දුරින් ලැබිණි. ප්‍රධාන ලිපිකරු නිල නිවාසය පිහිටියේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිරියෙන් මහ පාර හරහා ගිය විට ළඟාවිය හැකි තැනකය. කලින් සේවයේ සිටි ප්‍රධාන ලිපිකරු වාරිමාර්ග ඉංජිනේරුවරයා සමඟ ආරවුල් ඇති කර ගෙන තම රාජකාරී පැහැර හරිමින් කලක් ගත කළ නිසා, මම බදුල්ලට මාරු වී ගිය විට අත්දුටු දෙයට සමාන තත්වයකට තමන්කඩුවේ දී ද මුහුණ දීමට සිදුවිය. බදුල්ලේ දී අතපසු වූ වැඩ කරන අතරතුර, වෙනත් එදිනෙදා රාජකාරී පැවරුණේ නැත. එනමුත්, තමන්කඩුවේ දී ප්‍රධාන ලිපිකරු ලෙස එදිනෙදා රාජකාරී කටයුතු ඉටු කළ යුතු විය. ඒ නිසා, සාමාන්‍ය රාජකාරී වේලාවට පෙර හා පසුව බොහෝ මහන්සි වී වැඩ කිරීමට සිදුවිය. විවේකයක් ගත්තේ දිවා ආහාරය ගැනීමට පමණය. මාසයකට හමාරකට පසුව මට හිමි නිල නිවාසය ලැබිණි. ඉන්පසුව රෑ බෝ වන තුරු කාර්යාලයේ ගත කිරීමට හැකි වූයේ මගේ බිරිඳ හා දරුවා සමීප තැනක සිටි නිසාය.

දිනක් රෑ බෝවී සෙල්ලම් දුම්රියක් ධාවනය කරමින් දරුවා සමඟ ගෙදර තුළ සිටින විට, ඒ අසලින් සර්පයෙක් ඇදී ගියේය. සැනෙකින් දරුවා ඩැහැ ගත් මම, මුළුතැන්ගෙයි සිටි ප්‍රේමාට කතා කොට, දරුවා ඈ අතට දී සර්පයා එළවා දැමීමි. අපට තිබුණ එක ආපදාවක් වූයේ මේ සර්පයින් සම්බන්ධ ගැටලුවයි. රාත්‍රියේ ඉතා පරීක්ෂාකාරී ව සිටිය යුතු විය. රාත්‍රි දහයෙන් පසුව විදුලි එළිය නැති විට මෙය වඩාත් ම අවදානම් සහිත විය. පසුකාලයේ දී ගිරිතලේ වැව් බැම්ම මත තිබුණ නිවසක සිටිය දී රෑ දහය හමාරට පමණ පසුව කුස්සිය පැත්තේ පොළඟෙක් ඇදී ගියේය. එවර අසල

සේවය කරමින් සිටි මුරකරුට කථා කොට විදුලි පන්දම් ගසා බලන විට, පොළඟා ඇදී යනු දුටිමි. මුරකරු ඒ සතා මරා දැමීය.

කවුඩුල්ල හා මින්නේරි උපකොට්ඨාශ

1959 ජනවාරි 1වැනි දින සිට තමන්කඩුව උප කොට්ඨාසය, කවුල්ල හා මින්නේරිය නමින් උප කොට්ඨාස දෙකකට වෙන් කර, කාර්ය මණ්ඩලය ඒ දෙකට වෙන් කරන ලදී. (බදුල්ල හා මහියංගණ මෙනි) කවුඩුල්ල කාර්යාලය තමන්කඩුව කාර්යාලය පිහිටි තැන ම තිබිය දී, මින්නේරිය කාර්යාලය ගිරිතලේ වැව් බැම්ම මත තිබුණ තාවකාලික ගොඩනැඟිලි සංකීර්ණයට ගෙන ගියේය. එතෙක් පැවැති තමන්කඩුව උප කොට්ඨාසයේ අනුයාතික කාර්යාලය වූයේ මින්නේරිය උප කොට්ඨාසයයි. ඒ නිසා, අතපසු කර තිබූ වැඩ සියල්ල ම එහි ගෙන යෑමට සිදුවිය. මම ගිරිතලේට ගියේ මේ බෙදීම අනුවයි.



නිවාසය



කාර්යාලය

මගේ නිල නිවාසය සාලයක්, කෑම කාමරයක්, ගබඩා කාමරයක් හා නිඳන කාමර දෙකක් වන සේ ඉදිකර තිබිණි. එම නිවසේ බිත්ති නිමවා තිබුණේ ලෑලිවලිනි. වහල සෙවිලි කර තිබුණේ ඇලුමිනියම් තහඩුවලිනි. මුළුතැන්ගෙය හා වැසිකිලිය වෙන ම පිටතින් ඉදිකර තිබුණි. ගහක් කොළක් අසල නොවූ වැව් බැම්මේ ග්‍රැවල් පොළොව දිවා කාලයට මිහිමත අපායක් බඳු විය. ඉර බැසීමෙන් පසුව වැවෙන් හමා එන සුළං රැල්ල "අපායේ අපට" සුරසැප මවා පෑවේය. මගේ නිවසට සමාන නිවසක් වම්පසින් විය. එහි සැලසුම්කරු *ගුණවර්ධන මහතා* සහ

අලුතෙන් පත්වී පැමිණි ලිපිකරු *ආර්.එන්.ජී. (ගාමිණී) රත්නායක* මහතා පදිංචි ව සිටියහ.

අපේ කාර්යාලය පිහිටියේ එතැනින් වම් පසට තවත් යාර දෙසීයක් පමණ ඈතින්ය. කාර්යාලයේ සිට බලන විට මේ ගෙවල් දෙක මෙන් ම වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ බංගලාව ද පෙනේ. ගිරිතලේ සේවය කළ අනික් සැලසුම්කරුවෝ හා ගබඩා නිළධාරීහු ද, සහායක නිලධාරීහු ද ගිරිතලේ-පොළොන්නරුව මහා මාර්ගයට සමීප වැව් කණ්ඩිය පාමුල ඉදිකර තිබූ තාවකාලික නිවාසවල නැවතී උන්හ. වැව් කණ්ඩිය ආරම්භ වන තැන මහපාරට එපිටින් වූ කණ්ඩියක් මත ඉදිකර තිබූ ස්ථීර ගොඩනැගිල්ලක *ජයතිස්ස, නිකතැන්න, විල්සන්* හා *සිරිපාල* යන කාර්මික නිලධාරීහු ලැගුම් ගෙන උන්හ. *ජින්තු* නමැති කාර්මික නිලධාරී මහතා වැව් කණ්ඩියේ පහළින් වූ තාවකාලික නිවසක පදිංචි ව සිටියේය. අලුතෙන් පිහිට වූ මින්නේරිය උප කොට්ඨාශ කාර්යාලය පිහිටා තිබුණේ පොළොන්නරුව දියබෙදුම පාරේ ගිරිතලේ වැව් බැම්ම මත ඉදිකර තිබූ තාවකාලික ගොඩනැඟිලි සංකීර්ණයකයි. වැව් කණ්ඩිය මත තිබුණ එක ම ස්ථීර ගොඩනැඟිල්ල වාරිමාර්ග ඉංජිනේරු නිල නිවාසය පමණකි.

1959 හා 1960 යන වසර දෙක තුළ මින්නේරිය වාරිමාර්ග උප කොට්ඨාස කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු ලෙස හිඟුරක්ගෙඩ කාර්යාලය, ගිරිතලේ තාවකාලික කාර්යාල හා නිවාස සංකීර්ණයේ හා මින්නේරිය වැව් බැම්මේ ස්ථීර ගොඩනැඟිලි සංකීර්ණයේ සේවය කළ සමය තුළ, මගේ රාජකාරියට සම්බන්ධ කරුණු අනුක්‍රමයෙන් මෙහි පහත විස්තර කරමි. ඉන්පසුව ඒ කාල පරිච්ඡේදය තුළ මගේ පෞද්ගලික ජීවිතයට සම්බන්ධ කරුණු රාශියක් ගෙනහැර දක්වමි.

මින්නේරිය උප කොට්ඨාසය

මින්නේරිය උප කොට්ඨාස කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වූහ :

1. වාරිමාර්ග ඉංජිනේරු *ජී.එස්.එම්. ෂොක්මන්* මහතා
2. සහකාර වාරිමාර්ග *ඉංජිනේරු සී.ජේ.ඒ. ගුණසේකර* මහතා
3. ප්‍රධාන ලිපිකරු *ඒ. ඒකනායක* මහතා
4. දෙවෙනි ලිපිකරු *ආර්.එන්.ජී. රත්නායක* මහතා
5. තාවකාලික ලිපිකරු *එස්. ඇලෙක්සැන්ඩර්* මහතා

6. සැලසුම්කරුවන් - රාජවික්‍රම මහතා, ගුණතිලක මහතා හා ගුණවර්ධන මහතා

7. ගබඩා නිලධාරී - ආරියසේන මහතා හා දාබරේ මහතා

8. සහකාර නිලධාරීන් - හේරත්, ජයසිංහ, ධර්මරත්න, මීඩින් හා එච්.ඒ.ඩී.එස්.වී.පෙරේරා මහතා

9. කාර්මික නිලධාරීන් - කැස්පර්ස්, කුලතුංග, විල්සන්, නිකතැන්න, පින්තු, සිරිපාල, එල්.ඒ.ඩී.ඒ. ජයතිස්ස යන මහත්වරු

10. නඩත්තු ඕවර්සීසර්වරුන් - ප්‍රැන්සිස්, ප්‍රනාන්දු, සිවලිංගම් හා එස්. ඒ. ගුණවර්ධන මහත්වරු, ඔවර්සිය ඇතිලිගොඩ මහතා කාර්යාලයේ සේවය කළේය.

මේ හැර ඉදිකිරීම් ඕවර්සියර්වරු කීප දෙනෙක් සිටි නමුත් ඒ අයගේ නම් මතක නැත. මෙම කාර්යාලය ගිරිතලේට ගෙනගියේ 1959 පෙබරවාරි මාසයේ දී පමණය. මෙම උප කොට්ඨාස කාර්යාලවල තිබෙන රාජකාරී ප්‍රමාණය, ප්‍රධාන කාර්යාලයෙන් මාරුකර සිටින ලිපිකාර මණ්ඩලයට පමණක් ඉටු කිරීමට නොහැකි නිසා, ඒ ඒ උප කොට්ඨාස තුළින් ම විවිධ තනතුර නාම යටතේ බඳවා ගත් නොයෙක් දෙනා කාර්යාල සේවයට යොදවා තිබේ. මින්නේරිය උප කොට්ඨාසයේ එසේ සේවයට යොදවන ලද සහායක නිලධාරීන් පස් දෙනෙක් වූහ. හේරත් මහතා ගිණුම් කටයුතුවලට සහාය විය. වවුචර පොත ලිවීම ඔහුගේ ප්‍රධාන කාර්යය විය. වැටුප් ලේඛන සකස් කිරීම වැනි රාජකාරිවලට සහාය වූයේ *ජයසිංහ* මහතාය. *ධර්මරත්න* මහතා කම්කරු නිවාඩු ලේඛන භාර ව සිටියේය. *මීඩින්* මහතා ඉංග්‍රීසි යතුරු ලේඛන කටයුතු කළේය. *එච්.ඒ.ඩී.එස්.වී.පෙරේරා* මහතා කම්කරු චර්යා සටහන් පවත්වා ගෙන ගියේය.

ප්‍රධාන ලිපිකරු වශයෙන් කාර්යාලයේ සාමාන්‍ය පරිපාලනයට අමතර ව, ගිණුම් විෂයය භාර ව කටයුතු කළෙමි. ඉදිකිරීම් වැඩ සම්බන්ධ ව රාජකාරී ඉටුකළේ *ඇලෙක්සැන්ඩර්* මහතාය. රජයේ සේවයට නවකයකු වූ *ගාමිණීට* (රත්නායක මහතා) ආයතන කටයුතු පිළිබඳ කාර්ය-මණ්ඩලයට රාජකාරී පවරා තිබිණි. එසේ වුවත්, ඔහුට නිසි පරිදි මඟ පෙන්වීම ආදි පුහුණු කිරීම් මවිසින් සිදුකළ යුතු ව තිබිණි. ඒ කාර්යය මගෙන් නිසි පරිදි ඉටුවූ බව මැතක දී ගාමිණී මුණගැසුන විට සඳහන් කළ කරුණකින් පැහැදිලි විය. ඒ කටයුතු ඉටුකරන අවධියේ දී ඒ දේ මගේ සාමාන්‍ය රාජකාරියේ කොටසක් ලෙස සැලකුවෙමි. නවකයෙකුට නිසි මඟපෙන්වීමේ වැදගත්කම මම හොඳින් ම තේරුම් ගෙන තිබුණේ එවැනි පුහුණුවක් හෝ මඟ පෙන්වීමක්

මට නොලැබුණු නිසාය. රත්නායක මහතා සම්බන්ධ මේ කාරණය ගැන තොරතුරු මෙතැනට සටහන් කිරීම වැදගත් යයි සිතමි.

2010 නත්තල් දිනයේ අපි රත්නායක මහතා පදිංචි කුරුණෑගල ඔහුගේ නිවසට ගියෙමු. මගේ ලොකු දුව, පොඩි දුව හා ලොකු දුවගේ දරු දෙදෙනා ද මේ ගමනට එක්වූහ. අප ගිරිතලේ සිටිය දී ලොකු දුව වයස අවුරුදු දෙකක පමණ බිළිඳියක වූවාය. රත්නායක මහතා විවාහ වූයේ ඔහු දැනට පදිංචි ව සිටින නිවස අසල වූ පවුලක තරුණියක සමගය. ඒ යුවලට දැන් පුතුන් දෙදෙනෙක් වෙති. කෙනෙක් වෛද්‍යවරයෙකි. විවාහ වී සිටින්නේ ද වෛද්‍යවරියක් සමඟය. අනික් පුතා උපාධිධාරියෙකි. උපාධිධාරිනියක හා විවාහ වී දැනට දෙදෙනා ම පරිසර අධිකාරියේ සේවය කරති. ගාමිණිගේ විවාහ මංගලයයට ද මම සහභාගි වූයෙමි. සතුටු සාමීචියේ යෙදී සිටිය දී මගේ මඟපෙන්වීම නිසා, ඔහුට මහත් ප්‍රයෝජනයක් වූ බව කීවේය. මා කළ දේ කුමක් දැ'යි විමසූ විට ඔහු කීවේ, ගිරිතලේ වාරිමාර්ග කාර්යාලයට ගිය මුල් දිනවල දී ම කාර්යාලයට ලැබෙන චක්‍ර ලේඛනවල පිටපත් ගෙන ගොනු කර තබා ගැනීමට මා උපදෙස් දුන් බවයි. ඒ නිසා, තම රාජකාරිවලට අදාල චක්‍රලේඛ, රෙගුලාසි ආදිය ගැන දැනුමක් ලබා ගත් බවය. රත්නායක මහතා සමඟ කුරුණෑගල පළාත් සභාවේ සේවය කළ ගණකාධිකාරිවරයෙකු වූ මගේ ඥාතියෙකු මට කීවේ, චක්‍රලේඛ හා රෙගුලාසි ගැන ඒ අය ද විමසුවේ රත්නායක මහතාගෙන් බවයි. රත්නායක මහතා රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන ඇත්තේ වයඹ පළාත් සභාවේ පරිපාලන නිලධාරි කෙනෙකු ලෙස සේවය කිරීමෙන් පසුවයි. **ගාමිණී රත්නායක** නම් වූ මේ තැනැත්තා කොපමණ දුරට කෙළෙහිගුණ දන්නා කෙනෙක් දැ'යි අවබෝධ වූ මට ඉමහත් සතුටක් ඇති විය.

අගය කිරීමක්

දැන් නැවතත් ආපසු ගිරිතලේට යමු. ඉහතින් සඳහන් පරිදි, තමන්කඩුව උපකොට්ඨාසයේ අතපසු කර ගොඩගැසී තිබුණ කටයුතු, මගේ සාමාන්‍ය රාජකාරි ඉටු කරන අතරතුර ම අවසන් කළ යුතු විය. සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැර ද වැඩ කරමින් ඒ සියල්ල අවසන් කළෙමි. 1959 අගෝස්තු මස 27 දින සහිත ලිපියක් වාරිමාර්ග ඉංජිනේරු ෂොක්මන් මහතා විසින් මාවෙත එවා තිබිණි. ඉංග්‍රීසි බසින් වූ එම ලිපිය මෙසේය :

"Appreciation of my work is entirely due to your efforts. Your intelligent and enthusiastic approach to this difficult subject, which would have baffled many officers is commended. D I's appreciation is just a proof that they are aware of the magnitude of the job which has been tackled successfully by you."

මෙවැනි අගය කිරීම් නිසා මගේ රාජකාරි අවංක ව හා කාර්යක්ෂම ව ඉටු කිරීමට තව තවත් උනන්දු වූයෙමි.

කම්කරුවන්ට මාසික වැටුප්

කම්කරුවන් සිය ගණනකට බලපාන ලද කටයුත්තක් අතපසු වී තිබිණි. දෛනික වේතනය මත ආණ්ඩුවේ විවිධ ආයතනවල දින 180ක සේවය සම්පූර්ණ කළ සේවකයන් මාසික වැටුපට පරිවර්තනය කිරීමට 1956 පිහිට වූ *අගමැති බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුව* විසින් තීරණයක් ගෙන තිබිණි. මින්නේරිය උප කොට්ඨාසයේ නොයෙක් වැඩබිම්වල සේවය කළ කම්කරුවන්ට 1959 වන විටත් මේ තීරණය ක්‍රියාත්මක කර තිබුණේ නැත. ඒ සඳහා වහා ම කළයුතු වූයේ ඔවුන්ගේ චර්යා සටහන් සකස් කිරීමයි. ඒ අනුව, ඒ ඒ කාලවල වේතන ගෙවීමට උපයෝගි කර ගත් චෙක්රෝල්වලින් අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි විය. මේ කාර්යය වේගවත් කර, ඇලහැර, ගිරිතලේ, මින්නේරිය ආදි පැරණි ගොවි ජනපදවල නඩත්තු කම්කරුවන් පළමුවෙන් මාසික වැටුපට පරිවර්තනය කළෙමු. දෙවන පියවර වූයේ එවකට ඉදිකිරීම් ව්‍යාපාරවල සේවය කරන සුදුසුකම් ඇති කම්කරුවන් මාසික වැටුපට පරිවර්තනය කිරීමයි. මේ කටයුත්ත 1959 වසර තුළ දී අවසන් කළෙමි. අක්‍රමිකතා වැළැක්වීම අත්‍යවශ්‍ය වූ නිසා, මේවා මගේ පෞද්ගලික සුපරීක්ෂණයට භාජනය කළ යුතුවිය. මේ දුෂ්කර කාර්යය 1959 වසර තුළදී අවසන් කළෙමු.

රියදුරාගේ භෝජනාගාරය

කාර්යාලයේ සේවය කරන කාර්ය මණ්ඩලයට මෙන් ම නොයෙක් අවශ්‍යතාවන් සඳහා කාර්යාලයට යන එන අයට ද අතුරු පසක්, ආහාර වේලක් හෝ තේ පැන් ආදිය පහසුවෙන් ලබා ගැනීමට තැනක් අහල පහළ තිබුණේ නැත. නගරබද කාර්යාලවල සුභසාධන වැඩ සටහන් යටතේ මෙවැනි පහසුකම් සලසා තිබුණත්, කැලැබද සේවයේ නිරත වූ අපට ඒ ගැන කිසිවක් දැන ගැනීමටවත් නොලැබිණි. ගිරිතලේ සේවය කළ අපට මේ අඩුපාඩුව පිරිමැසීමට පියවර ගත්තේ *ගුණරත්න* නම් ලොරි රියැදුරාය. කාර්යාලයට පහළින් දියබෙදුම පාර අසල ගිරිතලේ වැව පැත්තට වන සේ පොල්අතු සෙවිලි කොට අසුරා භෝජනාගාරයක් ආරම්භ කළේය. ගුණරත්න මහතාගේ බිරිඳ හා පුතුන් එකතුව මෙම ව්‍යාපාරය පවත්වා ගෙන ගියහ. මේ භෝජනාගාරය විවෘත කිරීමට මට ආරාධනා කර තිබිණි. ව්‍යාපාරය සාර්ථක වූ බවට සාක්ෂිය වූයේ කාර්යාලය මින්නේරිය වැව බැම්මට ගෙන ගිය පසු ද ඒ අසල ගුණරත්න මහතා විසින් අවන්හලක් විවෘත කිරීමයි. අප නිවෙස්වලට ද ආප්ප ඉඳිආප්ප වැනි යමක් ගෙන්වා ගැනීමට තිබුණේ මේ ස්ථානයයි.

ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීම

මෙවැනි දුෂ්කරතාවන් නිසා අවශ්‍ය ආහාරපාන, එළවළු, පළතුරු වැනි දේ මිල දී ගැනීමට හිඟුරක්ගොඩ කඩපලට ගමන් කිරීමට වාහන පහසුකම් ලැබිණි. තමන්කඩුව උප කොට්ඨාසය යටතේ හිඟුරක්ගොඩ පදිංචි ව සිටිය දී ද මගේ එවැනි අවශ්‍යතාවන් මිල දී ගත්තේ *"විල්මට් සහ විලියම්"* වෙළඳසැලෙනි. විල්මට් මහතා අහංගම ප්‍රදේශයෙන් ගොස් හිඟුරක්ගොඩ නොයෙක් ව්‍යාපාර පවත්වා ගෙන ගියේය. වී මෝල්, සිනෙමා ශාලාවක්, කුඹුරු යනාදිය ද තිබිණි. ඔහු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවෙකු ද විය. මා එම වෙළඳසලට ගියේ සාධාරණ මිල ගණන්වලට බඩු ගැනීමට හැකි වූ නිසාය. ධර්මරත්න හා සමරදිවාකර යන වෙළඳුන් දෙදෙනෙකුගේ කඩ තිබුණත්, ඒ අය ද දැන හැඳින ගෙන සිටි මුත්, ඒ තැන්වලින් යමක් මිලයට ගන්නේ විල්මට් කඩේ නොතිබුණහොත් පමණි. ගිරිතලේට හා මින්නේරියට ගිය පසු ද මේ සඳහා හිඟුරක්ගොඩ කඩපලට පැමිණියෙමු.

මේ වකවානුවේ ද හාල් කුළුබඩු පාලන මිලකට ලබා ගැනීමට සලාක පොත් ක්‍රමය ක්‍රියාත්මක විය. (මෙය දෙවෙනි ලෝක යුද්ධය සමයේ දී ආරම්භ වූවකි) හිඟුරක්ගොඩ මගේ සලාක පොත් ධර්මරත්න කඩේට සම්බන්ධ කර තිබිණි. පසුව මින්නේරිය සමුපකාර සමිතියට ඒවා මාරු කළෙමි. සලාකයට ලැබුණේ මෙරට තම්බපු හාල්ය. ඒවා ආහාරයට ගැනීම දුෂ්කර වූ නිසා, "මිල්චාට්" හෝ "කෝරා" වැනි හාලක් තිබුණ විට පමණක් මිලදී ගතිමි. සලාකයට රතු පරිප්පු ප්‍රමාණයක් පාලන මිලට ලැබිණි. එය නොවරදවා ම ගත්තේ මගේ දරුවාට හොඳ පෝෂණයක් වූ නිසාය. 1959 ජනවාරි මාසයේ මාගේ වැටුපෙන් අතට ලැබුණු මුදල රුපියල් දෙසිය දහතුනක් විය. 1960 ජනවාරි මාසයේ දී රුපියල් දෙසිය දහඅටක් ද, 1961 ජනවාරි මාසයේ එම මුදල රුපියල් දෙසිය තිස්තුනක් ද විය. දේශීය එළවළු ආදිය ලාභයට මිල දී ගත හැකි වූ නිසා ද, හාල්, තුනපහ සලාකයට ගත් නිසා ද වියදම් පාලනය කර ගැනීමට පුළුවන් විය. ණයවීමට අවශ්‍ය නොවීය. නිලනිවස අවට කැලෑවෙන් එළබටු වැනි දේ නොමිලේ ම ලබා ගත හැකි විය.

මින්නේරිය නිල නිවාස සංකීර්ණය

මින්නේරිය වැව් බැම්ම මත ඉදිවෙමින් තිබූ කාර්යාල හා නිවාස සංකීර්ණයේ වැඩ කටයුතු අවසන් වී, 1960 ජනවාරි ආරම්භයේ දී ගිරිතලේ සිට මින්නේරියට ගියෙමු. වාරිමාර්ග කාර්යාලය පිහිටියේ හබරණ-පොළොන්නරුව මහා මාර්ගය අසලය. ඒ පාරෙන් දකුණට හැරී වැව් බැම්ම දිගේ වැටී ඇති පාරේ වමට ඉහළට ඉදිකරන ලද ගුරු පාරක් දිගේ කාර්ය මණ්ඩලයට ස්ථිර නිවාස කීපයක් ඉදිකරන ලදී. වාරිමාර්ග කාර්යාල ගොඩනැගිල්ලට සමීප

ව එක සමාන නිවාස දෙකක් ඉදිවිය. පළමුවැන්න ප්‍රධාන ලිපිකරු නිල නිවසයි, දෙවැන්න සහකාර වාරිමාර්ග ඉංජිනේරුවරයාට වෙන්කර දෙන ලදී. ටික දුරක් ගිය විට, කඳුගැටයක් මත වූ ගොඩනැඟිල්ල වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ නිල නිවාසය විය. එය පසු කොට අලුතෙන් ඉදිකළ පාර දිගේ යන විට එක සමාන නිවාස තුනක් විය. ඒවා ලිපිකරු, සැලසුම්කරු හා ගබඩාකරු වැනි නිලධාරීන් සඳහාය. තවත් ටික දුරක් යන විට සුළු සේවකයන් සඳහා නිවාස ජෝඩු දෙකක් ඉදිකර තිබිණි. මට ලැබුණු නිවසේ මැද සාලයේ දෙපැත්තේ නිඳන කාමර විය. එක පැත්තකින් නිඳන කාමර දෙකක් ද ඒවාට යාබදව නාන කාමරය හා වැසිකිළිය ද විය. අනික් පසින් නිඳන කාමරයට පිටුපසින් නාන කාමරය හා වැසිකිළිය එකට තනා තිබිණි. ඒ පසින් කුඩා ගබඩා කාමරයක් ද විය. මැද සාලයේ පිටුපසින් වමට ගොස් කුඩා ඉස්තෝප්පුවට පිවිසි විට මුළුතැන්ගෙය, සේවක නිඳන කාමරය හා ඊටත් පිටුපසින් ඔවුන්ගේ නාන කාමරය ආදිය විය. අමුත්තන් කීපදෙනෙක් පැමිණියත් ගැටලුවක් මතු නොවීය. (වරක් අපේ අම්මා, හීංඅක්කා ආදීන් කණ්ඩායමක් මිනිපේ සිට එසේ පැමිණියහ.)

මින්නේරිය වැව් බැම්මේ නව කාර්යාල ගොඩනැඟිල්ලට ගෙවදීම ආගමික වතාවත් සහිත ව කළ යුතු යැ'යි සිතා, අදාළ කීප දෙනෙක් සමග කතිකා කළෙමි. වාරිමාර්ග ඉංජිනේරුතුමා කතෝලිකයෙකු විය. සහකාර වාරිමාර්ග ඉංජිනේරුවරයා ද ක්‍රිස්තු ලබ්ධිකයෙකු විය. ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරියා, තාවකාලික ලිපිකරු හා ගබඩා නිලධාරියා ද කතෝලිකයෝ වූහ. බෞද්ධාගමික වතාවත් කරන විට හැකි නම් ඒ අයගේ ද සහයෝගය ලබා ගත යුතු බව මගේ අදහස විය. එනමුත්, ඒ අය විරුද්ධ වුවත් අපට අවශ්‍ය දේ කළ යුතු බව ද සිතේ ධාරණය කර ගතිමි. අපගේ තීරණය වූයේ කාර්යාලයේ සර්ව රාත්‍රික පරිත්‍රාණ දේශනාවක් පවත්වා පසුදින දානයක් පුජා කිරීමයි. මේ කාරණය ඉංජිනේරුතුමාට දැන්වූ විට කිසිම විරුද්ධත්වයක් දැක්වූයේ නැත. ඒ නිසා මගේ පුරෝගාමීත්වයෙන් මේ කටයුතු කර ගෙන ගියෙමි. කම්කරුවන්ගේ පවා දායකත්වය ලබා ගත යුතු බව තීරණය කර සම්මාදම් පත්‍රිකා නොයෙක් වැඩපලවලට යැවිමි. නිලධාරීන්ගෙන් ද ආධාර ලබා ගතිමි. අසල සේවය කළ වඩුකාර්මිකයන් පිරිත් මණ්ඩපය ඉදිකිරීමට උපකාර කළහ. කාර්යාලයේ වෙනත් නොයෙක් සාමාජිකයෝ බෙහෙවින් ම උපකාර කළහ. හිඟුරක්ගොඩ ගුවන් තොටුපල ප්‍රදේශයේ පන්සලක භික්ෂූන් වහන්සේලාට පිරිතට ආරාධනා කළෙමි. පිරිතට සහභාගි වන ලෙස පොළොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු *එම්.ඒ.බිලෝක්* මහතාට ආරාධනා කළෙමි. එතුමා හොඳ බෞද්ධයෙකු වූ නිසාය. කවුඩුල්ල උප කොට්ඨාසයේ නිලධාරීන්ට ද ආරාධනා කළෙමු. ඒ සියලු දෙනා ම පිරිතට හා දානයට සහභාගි වුහ. මෙම පුණ්‍යෝත්සවය බෙහෙවින් ම සාර්ථක වූයේ යයි සිතමි.

මින් පසුව අසල පිහිටි නාගලකන්ද පන්සලේ පැවැති පින්කම් මාලාවකට අප බොහෝ දෙනෙක් සහභාගි වී පිරිත් පින්කමට එම පන්සල සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ අඩුපාඩුව වසා ගත්තෙමු.

1960 මාර්තු - ජූලි මහ මැතිවරණය

මින්නේරිය ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූයේ *සී.පී.ද සිල්වා මහතාය.* එතුමා බණ්ඩාරනායක ආණ්ඩුවල වාරිමාර්ග කටයුතු භාර අමාත්‍යවරයා ද විය. ඒ නිසා, දේශපාලන වශයෙන් ද යම් යම් පීඩන ඇති වූ අවස්ථා තිබිණි. 1960 වර්ෂයේ මාර්තු හා ජූලි මාසවල මහ මැතිවරණ දෙකක් ම පැවති නිසා ප්‍රධාන දේශපාලන පක්ෂවල ප්‍රචාරක රැස්වීම් ද වැඩි විය. කවුඩුල්ල වැව් බැම්ම ඉදිකිරීමේ කටයුතු වේගවත් කර ඇමතිතුමා ලවා විවෘත කිරීමේ උත්සවයක් කවුඩුල්ල වැව් බැම්ම මත දී පවත්වන ලදී. මේ උත්සවයට වාරිමාර්ග අධ්‍යක්ෂ *සිල්වා ගුණසේකර* මහතා ද ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු *එම්.ඒ බිලෝක්* මහතා ද සහභාගි වුහ. එදින සවස් භාගයේ අපගේ "සමාජ ශාලාවේ දී" සාදයක් හා රාත්‍රීභෝජන සංග්‍රහයක් ද පැවැත්විණි. ඇමතිවරයා හැර අනෙක් ප්‍රභූවරු මෙම සාදයට ද සහභාගි වූහ. වාරිමාර්ග අධ්‍යක්ෂකතුමා පැමිණ සිටි සැම දෙනා වෙත ම ගොස් පිළිසඳරේ නිරත විය. ඒ කාලයේ අපේ හැඟීම වූයේ එතුමා අපගේ සැප දුක සොයා බලන කෙනෙකු ලෙසය. ඇත්ත වශයෙන් ම සිල්වා ගුණසේකර මහතා වාරිමාර්ග අධ්‍යක්ෂවරයා වීමෙන් පසුව රටේ නොයෙක් ප්‍රදේශවල තාවකාලික නිවාස වෙනුවට ස්ථිර නිලනිවාස ඉදිකර විදුලි බලය හා ජලපහසුකම් ලබා දීමට ක්‍රියා කළේය. මේ නිසා දුෂ්කර ප්‍රදේශවල වුව ද සේවයට යන්නට නිලධාරීන් මැළි වූයේ නැත.

රාජ්‍ය භාෂාවෙන් රාජකාරී ඉටුකිරීම

1960 ජනවාරි මාසයේ සිට මින්නේරිය වාරිමාර්ග කාර්යාලයේ බොහෝ රාජකාරි කටයුතු රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් ඉටුකිරීමට පියවර ගතිමු. මාසික ගිණුම් පළමුවරට සිංහලයෙන් ඉදිරිපත් කළෙමු. ඒවාට අදාළ ලිපිලේඛන වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් ම අත්සන් තැබිය යුතු විය. එතුමා සිංහල නොදත් නමුත්, මවිසින් සකස් කර එතුමාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ පසු, කිසිම ප්‍රශ්නයක් නැති ව අත්සන් කළේය. මා ගැන මහත් විශ්වාසයක් තිබුණ බවක් පෙනී ගියේය. එවකට රජයේ නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්ෂණයක් පවත්වන ලදී. 1960 ජනවාරි 2 දින පැවැත් වූ එම ඉහළ ශ්‍රේණියේ පරීක්ෂණයට පෙනී සිටියෙමි. එයින් මා සමත් වූ බව දන්වා ලිපියක් ලැබුණේ 1960 අගෝස්තු 01වෙනි දා ය. ඉහළ ශ්‍රේණියේ

සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වූවන්ට රුපියල් පන්සීයක ප්‍රසාද දීමනාවක් ගෙවන ලදී. ඒ මුදල ද මගේ අඩුපාඩුකම් පියවා ගැනීමට උපකාර විය.

මෙම වසරේ මාර්තු හා ජූලි මාසවල පැවැත් වූ මහමැතිවරණ රාජකාරි සඳහා ද සහභාගි වීමට සිදු විය. එක මැතිවරණයකට ගියේ රොටවැව පාසලේ පැවැති ඡන්ද මධ්‍යස්ථානයටයි. එම ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ නිලධාරියා වූයේ පොළොන්නරුවේ ප්‍රාදේශීය වාර්මාර්ග ඉංජිනේරු කාර්‍යාලයේ සේවය කළ සහකාර වාරිමාර්ග ඉංජිනේරු *උපාලි වීරකෝන්* මහතාය. ඡන්දපොළ අප නිවාසවලට ඈත නොවූ නිසා, වීරකෝන් මහතා සමග උදෙන් ම රොටවැව පාසලට ගිය බව මතකය. හවස හතරට ඡන්දය අවසන් වූවායින් පසුව ද ඒ මහතා සමග ම මගේ නිලනිවාසයට පැමිණියෙමි. වීරකෝන් මහතා පොලිස් ආරක්ෂාව සහිත ව ඡන්ද පෙට්ටිය සමග පොළොන්නරුව කච්චේරියට ගියේය. 1960 ජූලි මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට ආණ්ඩුවක් පිහිටුවීමට බලය හිමි විය. බණ්ඩාරනායක මැතිණිය ලොව ප්‍රථම අගමැතිවරිය වූයේ ඒ නිසාය. සී.පී.ද සිල්වා මහතා මින්නේරිය ආසනය ජය ලබා බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවේ වාරිමාර්ග ඇමතිවරයා විය.

අප්පච්චීගේ අභාවය

1959 හා 1960 වසරවල දී මගේ ජීවිතයට සම්බන්ධ පෞද්ගලික කරුණු රාශියක් මෙහි පහත සඳහන් කරමි. තමන්කඩුවට මාරු වී ගිය නොබෝ දිනකින් 1959 ජනවාරි මාසයේ දී අපේ අප්පච්චීගේ අභාවය පිළිබඳ ආරංචිය මිණිපේ තැපැල් ස්ථානයේ සිට දුරකථනයෙන් හිඟුරක්ගොඩ අපේ කාර්යාලයට ලැබිණි. කාර්යාල මිතුරන්ගේ උපකාරය ඇති ව වහා ම කුලීරථයක් ගෙන්වා ගෙන ප්‍රේමා, දරුවා හා සුමනාවතී සමග මිණිපේ අප නිවසට ගියෙමි. එහි ළඟා වන විට රෑ බෝවී තිබිණි. නැදෑ පිරිස් පැමිණ සිටියහ. අපගේ විවාහයට පසුව ප්‍රේමා හා දරුවා සමග අපේ ගෙදර ගියේ පළමු වරටයි. අප්පච්චී ජීවත් ව සිටිය දී බදුල්ලේ සිට දෙවරක් මා මිණිපේ ගිය නමුත්, ප්‍රේමා හා දරුවා සමඟ එහි යෑමට මීට පෙර අවස්ථාවක් නොවීය. අප්පච්චීගේ මෘත ශරීරය ආදාහනය කළේ අපේ කුඹුරේ පසෙක තිබුණ ගොඩැල්ලකය. ගෙදර සිට සැතපුම් දෙකක් පමණ මඟක් දිගේ අවමඟුල් පෙරහැර ගමන් ගත්තේය. අපේ අයියා අස් වැසීමට නොහැකි ලෙස අඬා වැලපුණ නමුත්, මගේ දුක් වේදනාව ඉවසා ගෙන සිට වැළපෙන්නට වූයේ නිවසට පැමිණ රාත්‍රී නින්දට යන්ට සුදානම් වූ විටයි. කාර්යාලයේ මිතුරන් පිරිසක් ද හිඟුරක්ගොඩ සිට පැමිණ භූමදානයට පසුව ආපසු ගියහ. ප්‍රේමා, දරුවා, මා හා සුමනාවතී හත්දවසේ දානයට පසුව හිඟුරක්ගොඩ ගියෙමු.

තවත් දරු සම්පතක්

ප්‍රේමාට දෙවෙනි දරුගැබක් හටගෙන ඇති බව පෙබරවාරි මාසයේ දී පමණ දැනගන්නට ලැබිණි. කුළුඳුල් දරුවා පිළිසිඳ ගත්තේ නොයෙක් පහසුකම් ඇති කොළඹ ආශ්‍රිත පෙදෙසක දී ය. එම දරු උපත සිදුවූයේ යහපත් දේශගුණයක් ඇති බදුල්ලේ දී ය. එනමුත්, මෙවර අතිශයින් කර්කෂ පරිසරයක් වූ ගිරිතලේ වැව් බැම්ම මත පිහිටි ඇලුමිනියම් වහලයකින් ආවරණය වූ නිවසක කල්ගත කිරීමට ඇයට සිදුවිය. සිංහල අවුරුද්ද කිට්ටුවන තුරු උදව්වට සුමනාවතී සිටි නමුත් ඇගේ පියා මහඑළියේ සිට පැමිණ අවුරුද්දට පෙර ඈ එක්කර ගෙන යන ලදී.

වයස අවුරුදු දෙකකට ආසන්න ව සිටි මගේ කුඩා දියණියට මේ අතරතුර කක්කල් කැස්ස සෑදී මාස දෙකක් පමණ දුක්වින්දාය. සුමනාවතී ගියාට පසුව උදව්වට ගෙදර කිසිවෙකු නොවීය. ගැබ්ගත් කාන්තාවන් සමහර දෙනෙක් මුල් මාස දෙක තුන ගත කරන්නේ මහත් පීඩනයකින්ය. ඒ අතරට බිළිඳු දරුවෙකු රෝගාතුර වී සිටින විට ඉමහත් අසහනයට පත්වේ. සිංහල අවුරුදු කිට්ටු වන තුරු සුමනාවතී ගෙදර සිටි නිසා, යම් සහනයක් ලැබිණි. මේ නොයෙක් හේතු නිසා අප්පච්චීගේ අභාවයෙන් පසුව සිංහල අවුරුද්දට ගෙදර ගොස් අම්මා දැක බලා ගැනීමට අදහස් කළ නිසාත්, මිණිපේ යන්නට තීරණය කළෙමු.

සිංහල අවුරුද්දට මිණිපේ ගමන

ප්‍රේමාගේ තත්ත්වය අනුව බස්රථවල ගමන් කිරීම සුදුසු නොවේ යැ'යි සිතා ඇලහැර ව්‍යාපාරයේ නඩත්තු ඕවර්සියර් කෙනෙකු වූ සිවලිංගම් මහතාට අයිති කාර් එක ලබා දෙන ලෙස ඉල්ලා සිටියෙමි. පර්ජෝ 403 රථයක් වූ එය එවකට සැපපහසුව ඇති වාහනයක් විය. ගමන පිටත්වන දින පාන්දරින් ම අපේ නිවසට පැමිණි රථයෙන් ගමන ආරම්භ කර, මින්නේරිය අසල දී බස්රථයක ගැටිණි. අනතුර සිදුවූයේ බෝක්කුවක් උඩ දී ය. පාර පැත්තෙන් බස් රථය හිර වී තිබිණි. බෝක්කුව නිසා වම්පසින් රථයෙන් බැසීමට නොහැකි විය. අසල සිටි කෙනෙක් කුඩා ඉනිමඟක් ගෙනැවිත් තබා කාර් එකෙන් බැස ගැනීමට උදව් කළේය. හිඟුරක්ගොඩ පොලීසියෙන් එනතුරු පැයක් හමාරක් ගතකොට පොලීසියට ගොස්, එම රාජකාරී අවසන් කොට, මින්නේරියේ තිබුණ ගරාජයකින් කාර් එකේ තිරිංගවල තිබුණ දෝෂයක් අලුත්වැඩියා කරගෙන, පැය කීපයකට පසුව ගමනට පිටත් වූයෙමු. වත්තේගම දොරගමුවේ කෙනෙකු වූ අප කාර්යාලයේ සේවය කළ හේරත් මහතා ද අප සමග ඒ ගමනට එක්විය. මාතලේ, වත්තේගම, මඩවල, තෙල්දෙණිය, දහඅට වංගු ආදී තැන් පසුකර අපේ ගෙදර අසලට යන විට

සවස පහට පමණ වන්නට ඇත. හේරත් මහතා එම කාර් එකේ ම ආපසු වත්තේගමට ගියේය. රෑ බෝවන විට අපි අපගේ නිවසට ගියෙමු.

වසර හතරකට පසුව සිංහල අවුරුද්දට ගෙදර ගිය මට අපගේ නෑදෑයින් හමුවීමට ද ලැබිණි. ඒ අය ද මගේ පැමිණීම ගැන බෙහෙවින් ම සතුටු වූ බව පෙනිණි. ප්‍රේමාට ද තම නෑදෑයින් වඩා සමීප ව දැනහැඳින ගැනීමට ලැබිණි. මින්පසුව හැම වර්ෂයක ම පාහේ සිංහල අවුරුද්දට අපේ ගෙදර ගියේ අම්මාට ද එයින් මහත් සතුටක් ඇති වන බව දන්නා නිසාය. අවුරුදු දවස් ගත වූ පසුව, බසයකින් තෙල්දෙණියට පැමිණ එතැන සිට මාතලේට තවත් බසයකින් ද මාතලේ සිට පොළොන්නරුවට යන බසයක ගිරිතලේට ද ගියෙමි. මාතලේ බාබර් සාප්පුවකින් දියණියගේ කොණ්ඩේ කපා ගැනීමට ගිය විට, ඇගේ ඇඬීම නිසා කොණ්ඩේ කපා ගත්තේ මහත් ආයාසයකිනි. ගිරිතලේට පැමිණි පසුව ප්‍රේමාගේ සහයට කිසිවෙකු සිටියේ නැත. ඒ නිසා, සනීපාරක්ෂක කම්කරුවෙකු වූ ආරමුගම් ලවා ගුණරත්නගේ කඩෙන් යමක් ගෙන්වා ගැනීම වැනි දේ ඉටුකරවා ගත්තාය. වරක් දියණියට දීමට ගුණරත්නගේ කඩයෙන් ආප්ප වගයක් ගෙන්වා ගෙන ඇත. ඒවා ඇයට දුන් විට අරුමුගම්ගේ මූණට ඒවායින් දමා ගසා තිබේ. අම්මා සමඟ තිබුණ තරහක් නිසාය. සමහර දවස්වල ඈ තනියම ග්‍රැවල් පාර දිගේ කාර්යාලයට පැමිණ මා අසල වාඩි ගෙන උන්නාය. එසේ එන අවස්ථාවල කාර්යාල මිතුරන්ට හමුවූ විට ඒ අය වඩා ගෙනැවිත් මා ළඟ වාඩිකරවුහ. මේ නිසා කාර්යාලයේ හැම දෙනා ම පාහේ හැඳින ගෙන සිටියාය.

1959 වසරේ වෙසක් උත්සවයට මිහින්තලේ වැඳපුදා ගැනීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුවරයාගෙන් ප්‍රවාහන පහසුකම් ඉල්ලා සිටියෙමි. ඒ සඳහා එතුමාගේ ජීප් රථය අපට ලබා දුන්නේය. අප පවුලේ ප්‍රේමා, දියණිය හා මා ද, රත්නායක, දාබරේ යන මහත්වරු ද තවත් කෙනෙක් දෙන්නෙක් ද මෙයට එක්වූහ. පෙරවරුවේ ගමනට සුදානම් වී වාහනය එනතුරු සිටින විට, පොඩිසිඤ්ඤෝ නමැති කාර්මික සේවකයා ද සිය පවුල සමඟ වාහනයේ පැමිණියේය. ඒ අයට අවශ්‍ය වූයේ දඹුල්ලේ යෑමටය. වාහනයේ රියැදුරා වූයේ පෙරේරා නැමැත්තෙකි. කවුරුත් ඔහු හැඳින්වූයේ *"ගුස්තන්"* යනුවෙනි. ප්‍රේමා, දරුවා හා පොඩිසිඤ්ඤෝගේ බිරිඳ ඉදිරිපස අසුනේ වාඩි කරවා මම වාහනය පැදවීමට ගතිමි. එසේ වුවත්, එවකට මට රිය පැදවීමේ බලපත්‍රයක් තිබුණේ නැත. රත්නායක යනාදි අය සමඟ රියදුරු වාහනයේ පිටුපසින් වාඩි ගෙන ආහ. දඹුල්ලට ගොස් පොඩිඤ්ඤෝගේ පවුල එහි බස්සවා අපි මිහින්තලය බලා පිටත්වූයෙමු. එසේ යන අතරතුර මගේ කුඩා දියණිය අත්වැසිය නොහැකි අන්දමින් අඬන්නට පටන් ගත්තාය. ගාමිණී රත්නායක මහතා දියණිය වඩා ගෙන ටික දුරක් යන විට ඇඬීම නතර කොට නින්දට වැටුණාය. අප කණ්ඩායම මිහින්තලයට ගොස් වැඳපුදා ගෙන ආපසු

දඹුල්ලට පැමිණ, පොඩිසිඤ්ඤෝ පවුල ද සමඟ ආපසු ගිරිතලේට එන විට බෙහෙවින් ම හවස් වී තිබිණි. මේ වකවානුවේ දී සේවක සුභසාධනය සඳහා මෙවැනි පහසුකමක් ලබාගත හැකි වුව ද, ඒවා දෙපාර්තමේන්තුවෙන් නිල වශයෙන් අනුමත කර තිබුණේ නැත. ඒ ඒ ප්‍රදේශයේ ප්‍රධානියාගේ හොඳ හිත මත පදනම් වී ලබා ගත් පහසුකම්ය.

වරක් යම්කිසි භාණ්ඩ වගයක් ගෙන ඒම සඳහා ජීප්රථයක් කන්තලේ වාරිමාර්ග කාර්යාලයට ගිය ගමනක දී ද මම එය පදවා ගෙන ගියෙමි. ඒ ගමන පිටත් වූයේ රෑ වුණාට පසුවය. හදිසි අවශ්‍යතාව නිසාය. හබරණ පසුකර අලුත්ඔයට යනතුරු ඝන කැලෑවයි. එහි ටික දුරක් යන විට පාර අයිනේ වල් අලියෙකු සිටි නමුත්, මාර්ගය අවහිර වී නොතිබුණ නිසා ඉදිරියට ගියෙමු. ටික දුරක් ඉදිරියට ගොස් ස්වල්ප වේලාවකට වාහනය නවත්වා, අලියා ගැන ආපසු හැරී බලද්දී මගේ දනිස් වෙව්ලීමට පටන් ගත්තේය. ඒ ගැන කිසිවක් අන් අයට නොකියා අවශ්‍ය ගමන ගොස් ආපසු එන විට, ඒ ස්ථානයේ දැඩි පරීක්ෂාවෙන් පැමිණියෙමු. හෙඹරව ගිය ගමනක දී වල් අලියෙකු දැක්කාට පසුව නැවත වල් අලියකු හමුවූයේ මේ ගමනේ දී ය. එනමුත්, මින්නේරියේ නිලනිවාසවල පදිංචියට පැමිණි පසුව, වැවේ අනික් පැත්තේ කැලෑරොද තුළින් වතුරට බැස දියනෑමට හා බීමට පැමිණි වල් අලි රංචුවක් නිතර දක්නට ලැබිණි.

උණ වසංගතයක්

ගිරිතලේ සිටිය දී, වසර මැදහරියේ දී පැවති වියළි සමයේ දී, පවුලේ හැම දෙනාට ම තදබල උණ රෝගයක් වැළඳිණි. මේ උණ ගැනුණ විට සුවවීමට ටික දවසක් ගත වූ අතර, ඉන්පසුව මාසයක් හමාරක් ගතවන තුරු මහත් දුර්වලතාවක් දැනිණි. මේ නිසා හිඟුරක්ගොඩ නගරයෙන් මොරිස් මයිනර් කුලීරථයක් ගෙන්වා ගෙන මාතර ප්‍රේමාගේ ගෙදර ගියෙමු. එදින කුරුණෑගල පසු කරන විට මඟදිගට තද වැසි පැවතිණි. මාතර ගෙදරට යන විට මැදියම් රෑය පමණ විය. නිවසේ අප බස්සවා රියදුරු එවෙලේ ම ආපසු ගමනට පිටත්විය. ටික දිනකට පසුව ප්‍රේමා හා දරුවා එහි නවත්වා, මම ගිරිතලේට පැමිණියෙමි. සති දෙකකට පමණ පසුව, ඒ දෙදෙනා ද එක්කර ගෙන ආවේ ගෙදර වැඩට උදව්වට *එඩ්වින්* නමැති තරුණයෙකු ද කැටුවය. එඩ්වින්ගේ කථාවලට දරුවා බෙහෙවින් කුළුපග වූ බව පෙනිණි. මේ නිසා ප්‍රේමාට යම්කිසි සහනයක් ලැබිණි.

දෙවෙනි දරු උපතට මාතර ගමන

දරු ප්‍රසූතිය කිට්ටු වන විට නැවතත් ප්‍රේමා හා දරුවා සමඟ මම මාතර ගියෙමි. මෙවර ඒ ගමන ගියේ දුම්රියෙනි. එඩ්වින් තරුණයාට

තුන්වෙනි පන්තියේ ටිකට්පතක් ගෙන, අපට නිදහස් ගමන් බලපත්‍ර තිබුණ නිසා, හිඟුරක්ගොඩ සිට කොළඹට ගියේ දෙවෙනි පන්තියේ නිදන මැදිරියකය. නිදන මැදිරි නොලැබුණ වෙනත් ගමන්වල දී මා කළේ, ගල්ඔය හන්දියට ගිය වහා ම ගමන් බලපත්‍ර ගාස්තුවේ වෙනස මුදලින් ගෙවා පළමුවන පන්තියට උසස් කර ගැනීමයි. එවිට එම මැදිරිවල ඉඩකඩ තිබුණ නිසා, නිදාගෙන උණත් යෑමට පුළුවන. කොළඹින් පෙරවරු 7.30 ට පිටත්වන දුම්රියෙන් මාතරට යන විට, උදේ 11.30 පමණ වේ. එවකට මාතර "කිංග ්ස් කැබ්ස්" නමින් කුලීරථ සේවයක් තිබුණ නිසා එම රථයකින් තල්පාවිල අලහේන්පිට නිවසට ගියෙමු.



බිළිඳු පුතු සමග ප්‍රේමා සහ ලොකු දුව
ගිරිතලේදී, 1959

ප්‍රේමා හා දරුවා මාතර නවත්වා මා ගිරිතලේට පැමිණි නමුත්, අගෝස්තු මස අග දී ප්‍රේමා මාතර වල්පොල කරුණාරත්න වාට්ටුවට ඇතුළු කළ බව දන්වා පණිවිඩයක් ලැබුණ නිසා වහා ම එහි ගියෙමි. මට ද විවේක ගැනීමට කාමරයක් ලැබිණි. ප්‍රේමාගේ අම්මා සහ නංගී කෙනෙක් ද මා යන විටත් ඇය සමග සාත්තු නිවාසයේ සිටියාය. මා එහි ගිය දවසේ පාන්දරින් ම වාගේ දරුප්‍රසූතිය සිදු විය. මෙවර ඉපදුණේ කොලු පැටියෙකි. උපන් දිනය 1959 අගෝස්තු 31 වෙනි දා ය. ඔහුට නම් තැබුවේ "හේම කාන්ත යනුවෙනි. මෙම සිඟිති බිළිඳා සතියකට දෙකකට පසුව අප සමඟ ගිරිතලේට පැමිණියෙන් ඔහුට ද ඇලුමිනියම් වහල යට ටික කලක් ගත කිරීමට සිදුවිය. මෙවර ගිරිතලේ යන විට ප්‍රේමාගේ නංගී කෙනෙක් වූ *චන්ද්‍රා* අප සමඟ එහි ගිය බව මතකය. චන්ද්‍රා නංගී මින්නේරිය වැව් බැම්ම මත ඉදිකළ නව නිවාසවලට යන විට ද අප සමග සිටියා යැ'යි සිතමි. මින්නේරියේ සිටිය දී මේ බිළිඳු දරුවාට විටින් විට සෙම් අමාරුවක් ඇති විය. හිඟුරක්ගොඩ පෞද්ගලික වෛද්‍ය සේවයේ නිරත වූ *ප්‍රනාන්දු* නම් වූ දොස්තර මහතාගේ මතය වූයේ, දරුවාට වයස අවුරුදු හතරක් පමණ වනතුරු මේ රෝගය පැවතිය හැකි බවයි. එය එසේ වූ බව අත්දැකීමෙන් දනිමි. කොළඹට පැමිණි පසු නොයෙක් ප්‍රතිකාර ලබා දුන් නමුත්, අවසානයේ මෙය මුළුමනින් ම සුව වූයේ *ස්ටෙලා ද සිල්වා* නමැති ළමාරෝග විශේෂඥ වෛද්‍යවරියගේ ප්‍රතිකාර නිසාය.

බණ්ඩාරනායක ඝාතනය

1959 වසරේ දී අපට දක්නට අසන්නට ලැබුණු වැදගත් ම සිද්ධිය එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමාගේ ඝාතනයයි. කොළඹ රෝස්මීඩ් පෙදෙසේ එතුමාගේ නිවසේදී *'සෝමාරාම'* නම් භික්ෂුවක් විසින් එතුමාට වෙඩි තබන ලදී. නොයෙක් ප්‍රතිකාර ලබා දුන් නමුත් 1956 සැප්තැම්බර් මස 26 දින එතුමා අභාවප්‍රාප්ත විය. සැප්තැම්බර් මස අවසාන වන විට එතුමාගේ දේහය හොරගොල්ල වලව්වේ තැන්පත් කර තිබිණි. රටේ නොයෙක් පෙදෙස්වලින් එතුමාට ගෞරව දැක්වීමට විශාල ජනකායක් වැලනොකැඩී පැමිණියහ. සැප්තැම්බර් මස 30වෙනි දා මුදල් වසරේ ගිණුම්කටයුතු අවසන් කර ජයතිස්ස මහතාගේ කාර් එකෙන් එදින රාත්‍රියේ මාත් ගාමිණී රත්නායක මහතාත් හොරගොල්ලට ගියෙමු. වේයන්ගොඩ පාරෙන් හොරගොල්ල වත්තට ඇතුළුවීමට තිබුණ අතුරු මඟකින් ගොරගොල්ල වලව්ව අසලට ගිය අප දෙදෙනා පාන්දරින් ම දේහය බැලීමට එන සෙනඟ පෝලිමට එකතු වී ඉක්මනින් ම අපගේ ගෞරවය දක්වා පිටවීමු. නුවර පාරෙන් එන ප්‍රධාන පෝලිමට එකතු වුණා නම් පැය ගණනක් ගත කිරීමට සිදුවිය හැකි ව තිබිණි. රත්නායක මහතාත් මාත් කොළඹ පාරේ බොහෝ දුරක් පයින් ඇවිත් බස් රථයකින් කොළඹට පැමිණියෙමු. කොටුව දුම්රියපල ඉදිරියෙන් එවකට පිටත්වන අම්පාරේ වැන්රථයක මම ගිරිතලේට ගියෙමි. රත්නායක මහතා මාවනැල්ලේ ඔහුගේ ගමේ ගොස් පැමිණීමට පිටත් ව ගියේය.

බණ්ඩාරනායක අගමැතිතුමාගේ හදිසි අභාවය නිසා *ඩබ්ලිව්. දහනායක* මහතා අගමැති තනතුරට පත්විය. එනමුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරය එතුමාට සහයෝගය දැක්වූයේ නැත. ඔක්තොම්බර් මාසය අවසානයේ දී ඇමති මණ්ඩලය විසුරුවා හැර දහනායක මහතාට කැමති පරිදි ඇමති මණ්ඩලයක් පත්කරන ලදී. එවකට අග්‍රාණ්ඩුකාරවරයා වූයේ *ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක* මැතිතුමාය. **ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ** නමින් අලුත් දේශපාලන පක්ෂයක් පිහිටුවා ගත් දහනායක මහතා, 1960 මාර්තු මැතිවරණය තරග කළ නමුත් බොහෝ කාලයක් එතුමා නියෝජනය කළ ගාල්ල ආසනය පවා ජයගැනීමට නොහැකි විය. මාර්තු මැතිවරණයෙන් පසුව ඩඩ්ලි සේනානායක මැතිතුමා අගමැති ව ආණ්ඩුවක් පිහිටුවා ගත් නමුත්, රාජාසන කථාවේ ස්තුති යෝජනාව පරාජය වීම නිසා, ඒ ආණ්ඩුව බිඳවැටිණි. 1960 ජූලි මැතිවරණය පැවැත්වූයේ මේ නිසාය. ඒ වනවිට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය දුන්නාය. ඒ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව එතුමිය අගමැති තනතුරට පත් වී ආණ්ඩුවක් පිහිටුවන ලදී. එතුමිය අසුනක් දැරුවේ එවකට පැවති සෙනෙට් සභාවේය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නොවේ. සී.පී.ද සිල්වා, මෛත්‍රීපාල සේනානායක, ටී.බී. ඉලංගරත්න, පීලික්ස් ඩයස් බණ්ඩාරනායක යන මහත්වරු එතුමියගේ කැබිනට් මණ්ඩලයේ ප්‍රබල සාමාජිකයෝ වූහ.

චෙක්රෝල් පොරෝඩාව

1959 වසරේ දෛනික චේතන ලැබූ සේවකයින් රාශියක් මාසික වැටුප් ලබන්නන් බවට පරිවර්තනය කළ බව මෙහි ඉහතින් සඳහන් කළෙමි. එසේ පරිවර්තනය කළේ ඒ සඳහා රජයේ තීරණය ගෙන වසර දෙක තුනක් ගතවූවාට පසුවයි. මේ නිසා මාසික වැටුප් ලැබීමට සුදුසුකම් ලැබූ සේවකයනට හිඟ වැටුප් ලබා ගැනීමට හිමිකමක් තිබිණි. ඒ සඳහා වෙන ම වැටුප් ලේඛන සකස් කොට අදාළ සේවකයන්ට ගෙවීමට පියවර ගතිමු. මේ අතරතුර එම වැටුප් ලේඛන සකස් කරන මගේ සහායක නිලධාරියා හිඟ වැටුප් ලේඛන කිහිපයක් සමග මා වෙත පැමිණ, ඒවායේ සඳහන් මුදල් අපට ලබා ගත හැකි බව කීවේය. මේ ගැන ඔහුගෙන් ප්‍රශ්න කරන විට ඔහු කීවේ, මෙහි නම් සඳහන් සේවකයන් "සිරිසඟබෝලා" බවයි. එනම් හිස් නැති අය බවයි. චෙක් රෝල්වල හොර නම් ඇතුළත් කර මුදල් ලබා ගැනීම වැඩබිමිවල සාමාන්‍ය සිරිතක් ව පැවතිණි. මගේ සගයා මා වෙත ඉදිරිපත් කළ ලේඛනවල රුපියල් තුන්දහස් ගණනක් තිබිණි.

මාසික ව රුපියල් දෙසීයක් පමණ වැටුපක් ලබන කෙනෙකුට මෙවැනි "වාසියක්" ලැබෙනවා නම් කොපමණ හොඳ ද? එම ලේඛනය මා වෙත තබා යන ලෙස ඔහුට දැන්වූයෙමි. එදින සවස කාර්යාලයේ වැඩ නිම වී මගේ නිවසට යන විට මේ ලේඛනය ද රැගෙන ගොස් පරීක්ෂා කර බැලුවෙමි. ඒ මුදල නීත්‍යානුකූල ව ලබා ගැනීමට නොහැකිය. ඒ සඳහා මුදල් ගෙවීම් කරන සරප් වරයෙකුගේ සහයෝගය අවශ්‍ය වේ. එම ලේඛනයේ නම් ඇති අයට ගෙවන විට ඒ අය හඳුනා ගැනීමට කෙනෙකු අවශ්‍ය වේ. එනම් ඕවර්සියර් කෙනෙක් හෝ දෙන්නෙක් සම්බන්ධ විය යුතු වේ. එසේ "හොර වැඩකට" හතර පස්දෙනෙක් හවුල් වන විට යම් මුදලක් ඇත්නම් ඒ අය හැමදෙනා අතර බෙදී යා යුතු වේ. එවිට එක් කෙනෙකුට රුපියල් හයසීයක් පමණ ලැබෙනවා ඇත. රුපියල් හයසීයකට මෙතෙක් කල් අවංක නිලධාරියෙක් ලෙස මා රැක ගෙන ආ හොඳ නම පාවා දෙනවා ද? එය මගේ "මුළු ආත්මය ම පාවා දීමක්" නොවේ ද, යනාදි සිතිවිලි ගලා එන්නට විය. ඒ නිසා, අදාළ ලේඛන නිල නිවාසයේ නාන කාමරයට ගෙන ගොස් පුළුස්සා දමා, එහි ඉතිරි වූ අළු ටික ද "කොමෝඩ්" එකට දමා වතුර ගසා සෝදා හැරියෙමි. කලබල වී තිබුණ මගේ සිතට විශාල සහනයක් දැනිණි. පසු දින මගේ සගයාට මේ ගැන කීවෙමි. මා කළ දේ ගැන දැනුත් ඇතිවන්නේ මහත් තෘප්තියකි.

උසස් අධ්‍යාපන ප්‍රවේශය

1959 වසරේ දී ස්ථාපිත කරන ලද විද්‍යෝදය විශ්ව විද්‍යාලය විසින් රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා පාඨමාලා දෙකක් ආරම්භ කරන බව දන්වා පුවත්පත් නිවේදනයක් මා මින්නේරිය සේවය කරන කාලයේ දක්නට

ලැබිණි. එම පාඨමාලා සඳහා ඇතුළුවීමට ඉල්ලුම් පත් කැඳවා තිබිණි. අවශ්‍ය මූලික සුදුසුකම් ලෙස සඳහන් කර තිබුණේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී රජයේ හෝ පෞද්ගලික අංශයේ වසර තුනක සේවා පළපුරුද්දක්ය. ප්‍රවේශ පරීක්ෂණයක් පවත්වන බව ද සඳහන් වී තිබිණි. උසස් අධ්‍යාපනයක් පිළිබඳ යටපත් වී තිබුණ මගේ ආශාව ඉස්මතු විය. කුමන බාධක තිබුණත් මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට තීරණය කොට ඉල්ලුම් පතක් යැවිමි. ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට දැන්වීමක් ලැබිණි. කොළඹට පැමිණ ඒ සඳහා පෙනී සිටියෙමි. විභාගය පැවැත්වූයේ තර්ස්ටන් විද්‍යාලයේ ශාලාවකය. පසුව මා විභාගයෙන් සමත් වූ බවත් රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව හැදෑරීමට තෝරාගත් බවත් දැන්වූ ලිපියක් ලැබිණි. පාඨමාලාව ආරම්භ කිරීමට නියමිත දිනයේ, එනම් 1960 දෙසැම්බර් මස 20 දින, කොළඹ රේස්කෝස් ඇවිනිවු වෙත පැමිණෙන ලෙස දන්වා නිවේදනයක් ද ලැබිණි.

දැන් මා කළ යුතු වූයේ වහා ම කොළඹට ස්ථාන මාරුවක් ලබා ගැනීමයි. ඒ සඳහා ඉල්ලුම් කොට කරුණු පැහැදිලි කිරීමට පරිපාලනය භාර සහකාර වාරිමාර්ග අධ්‍යක්ෂවරයා මුණගැසීමට අවසර ඉල්ලා සිටියෙමි. එවකට මේ තනතුර දැරුවේ *ඒ.ජේ.එච්. ගුණසේකර* නම් සිවිල් නිලධාරියෙකි. එතුමා ස්වේච්ඡා හමුදාවේ මේජර්වරයෙකු විය. 1961 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවීමක් නියෝග කොට ලිපියක් ලැබිණි. එම ස්ථාන මාරුව ජනවාරි 2 දින සිට ලබා දෙන ලෙස ඉල්ලීමක් කළෙමි. එය ද අනුමත කර එවා තිබිණි. මින්නේරියේ සිටි මගේ මිතුරන් එකතු වී මට සුභපැතීමට සාදයක් පවත්වන ලදී. කම්කරු පිරිස් මා සමඟ ඡායාරූපයකට පෙනී සිටියෝය. මගේ ගෘහභාණ්ඩ ආදිය කොළඹට එවීමට හිඟුරක්ගොඩ දුම්රිය ස්ථානයට භාර දුනිමි. මඩකලපුවේ සිට කොළඹට එන රාත්‍රී තැපැල් දුම්රියෙන් කොළඹ පැමිණි නමුත් ඒ කවදා දැ'යි පැහැදිලි නැත. ප්‍රේමා, මම, දුව හා පුතා යනුවෙන් මේ වන විට අප පවුලේ හතර දෙනෙක් වූහ. මින්නේරියට ගොස් සිටි චන්ද්‍රා නංගී ද අප සමග කොළඹ එන්නට ඇත. **මෙම ස්ථාන මාරුවත් සමඟ මගේ ජීවිතයේ තවත් සන්ධිස්ථානයක් කරා පියනැඟුවෙමි.**

06 වැඩිහිටි සමය

මගේ පාසල් අධ්‍යාපනය ආරම්භ වූයේ වයස අවුරුදු හයයි මාස හයේ දී ය. අවුරුදු දහහත වන විට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වූයෙමි. පාසල් අධ්‍යාපනයට බාධාවක් නොවී නම්, 1952 වසරේ දී විශ්ව විද්‍යාලයට පිවිසිය යුතුව තිබිණි. වසර හතරක විශේෂ උපාධි පාඨමාලාවක් හැදෑරුවත් 1956 වන විට උපාධිධරයෙකු වන්නට තිබිණි. එනමුත්, එසේ සිදු නොවීය. පාසල් හැර ගොස් රැකියාවක නිරත වූ නමුත් උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමේ පිපාසය සංසිඳුනේ නැත. රැකියාවට ගිය පසු කොළඹ දී *ආචාර්ය තෙන්නකෝන් විමලානන්ද මැතිතුමා* හමු වූ විට ලැබුණු උපදෙස් නිසා එම ආශාව තවත් වැඩිවිය.

එසේ වුව ද, උචිත පරිසරයක් නොතිබුණ නිසා උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම වසර දහයකින් පමා විය. විද්‍යෝදය විශ්ව විද්‍යාලය විසින් රාජ්‍ය/ව්‍යාපාර පරිපාලන විද්‍යා උපාධි පාඨමාලාවක් ආරම්භ කරන බවට පුවත්පත් දැන්වීමක් පළකිරීම ගැන කලින් සඳහන් කළෙමි. ඒ අනුව ඉල්ලුම්කර ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිට 1960 අවසන් ව විට රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාවට ප්‍රවේශය ලබා ගතිමි.

මේ සමඟ මගේ වගකීම් අංශ කීපයකට ව්‍යාප්ත විය. සංකීර්ණ විය. උසස් අධ්‍යාපන පාඨමාලාව සාර්ථක ව හැදෑරීම, රැකියාවේ කටයුතු නොපිරිහෙළා ඉටුකිරීම, කුඩා දරුවන් දෙදෙනෙකුගෙන් යුක්ත වූ දරු පවුලක් නඩත්තු කිරීම, ඒ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාවන් සතුටුදායක අයුරින් සපුරාලීම, නෑදෑ හිතවතුන් සමඟ සුහද සම්බන්ධතාවක් පවත්වා ගෙන යෑම මේ අතර විය. මේවා සියල්ල තුලනය කරගෙන යෑමට දරණ ලද ප්‍රයත්නය ගැන පහතින් සඳහන් වේ.

උසස් අධ්‍යාපනය

1959 වසරේ දී ආරම්භ කළ විද්‍යෝදය විශ්ව විද්‍යාලය වසර දෙකක් පමණ ගතවන තුරු පවත්වා ගෙන ගියේ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන පරිශ්‍රයේය. ආර්ථික විද්‍යා, රාජ්‍ය පරිපාලන විද්‍යා හා ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය පිහිටුවා පවත්වා ගෙන යෑම සඳහා කොළඹ කුරුඳුවත්තේ රේස්කෝස් ඇවනිවුහි ලොකු නිවසක් කුළියට ගෙන තිබිණි. මේ කටයුතුවල පුරෝගාමී වූයේ *ආචාර්ය ලීනස් සිල්වා මැතිතුමාය.* රාජ්‍ය/ව්‍යාපාර පරිපාලන විද්‍යා පාඨමාලා දෙක උත්සවාකාරයෙන් ආරම්භ කළේ එවකට වෙළඳ ඇමතිවරයාව සිටි *ටී. බී. ඉලංගරත්න* මැතිතුමාගේ ප්‍රධානත්වයෙනි. ඒ 1960 දෙසැම්බර් මස 20වෙනි දා ය. විධිමත් ලෙස දේශන පටන් ගත්තේ දෙසැම්බර් 27වෙනි දා ය.

ආරම්භයේ දී මෙම පාඨමාලාවට ශිෂ්‍යයින් හාරසීයක් පමණ ඇතුළු කර ගෙන තිබිණි. කණ්ඩායම් කීපයකට බෙදා දේශන පවත්වන ලදී. ටික කලකට පසු දේශන පැවැත්වීම සඳහා කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ශාලා පහසුකම් ලබා ගත්තේය. මෙම පාඨමාලාවලට ඇතුළු කර ගත්තේ රැකියාවල නිරතවූවන් නිසා, පන්ති පැවැත්වූයේ පස්වරු පහේ සිට නවය දක්වාය.

ආචාර්ය ලීනස් සිල්වා මෙම අධ්‍යයනාංශයේ ප්‍රධානියා විය. *මහාචාර්ය කේ.පී. මුබර්ජි, ඩිංගි කරුණාතිලක, රොබර්ට් සිල්වා* හා *කේ.ඩී.පී.පෙරේරා* යන මහතුන් ස්ථීර කථිකාචාර්ය මණ්ඩලයට අයත් වූහ. මහ බැංකුවේ සේවය කළ ආචාර්ය ඩබ්ලිව්.එම්.තිලකරත්න, ආචාර්ය එම්.ආර්.පී. සල්ගාදු, ඒ.එස්.ජයවර්ධන, පාර්ලිමේන්තු මන්ත්‍රී ස්ටැන්ලි තිලකරත්න, සිවිල් සේවක සී.අරුල්ප්‍රගාසම් යන මහත්වරු බාහිර කථිකාචාර්යවරුන් වූහ. 1961 වසරේ මැද භාගයේ දී පමණ විද්‍යෝදය විශ්ව විද්‍යාලය ගංගොඩවිල පරිශ්‍රයට ගෙන ගියේය. එහි පැරණි ගුවන් හමුදා කඳවුරේ ගොඩනැඟිලිවලට විශ්ව විද්‍යාල කාර්යාලය ගෙන යන ලදී. එවකට ඉදිකොට අවසන් වී තිබුණ *ඥානිස්සර* ගොඩනැඟිල්ලේ පන්ති කාමරවල අප දේශන පවත්වන ලදී. ප්‍රධාන සුමංගල ගොඩනැඟිල්ල ඉදිවෙමින් පැවතිණි.

එවකට විශ්ව විද්‍යාලයේ ප්‍රධාන තනතුරු දරන ලද්දේ පහත සඳහන් ප්‍රභූන් විසිනි :

1. විශ්ව විද්‍යාලයාධිපති *වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි.*
2. ලේඛකාධිකාරී, *ඩී.ඒ.කුමාරගේ මහතා*, පසුව *හේමචන්ද්‍ර ගුණසේකර* මහතා.
3. පුස්තකාලාධිපති, *ගලපාත බේමානන්ද* ස්වාමීන් වහන්සේ, පසුව *ඩබ්ලිව්.බී. දොරකුඹුර* මහතා.

4. විභාගාධිකාරී ඒ.ඩබ්ලිව්. කළුආරච්චි මහතා.

5. පරිපාලන සහායක, ඒ.ඩබ්ලිව්.පී. ගුරුගේ මහතා (සිවිල් සේවකයෙකු වූ ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු විය)

ප්‍රථම පරීක්ෂණය 1961 වසර අවසානයේ දී පවත්වන ලදී. එයින් මා අසමත් විය. 1962 මාර්තු මාසයේ දී පැවැත්වූ විශේෂ පරීක්ෂණයේ දී ප්‍රථම පරීක්ෂණයේ සියලු විෂයයන්ගෙන් සමත් වීමි. ඒ සඳහා වූ ප්‍රශ්න පත්‍ර වූයේ රාජ්‍ය පරිපාලන විද්‍යාව, ආණ්ඩුක්‍රම, බැංකු ක්‍රම, ආර්ථික න්‍යාය, ආර්ථික ඉතිහාසය හා සරල සංඛ්‍යාන ක්‍රම යනාදියයි. ඉංග්‍රීසි හා බෞද්ධ සංස්කෘතිය යන අතිරේක විෂයන්ගෙන් ද සමත්විය යුතු විය.

ඉන්පසුව 1962 වර්ෂයේ සිට සාමාන්‍ය උපාධිය සඳහා පන්ති පැවැත්විණි. දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සහ රාජ්‍ය පරිපාලන විද්‍යාව යන ප්‍රධාන විෂයයන් තුනක් සාමාන්‍ය උපාධිය සඳහා හැදෑරුවෙමි. ඒ එකිනෙක විෂය සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් විය. *මහාචාර්ය කේ.ජී.මුකර්ජි මහතා* දේශපාලන විද්‍යාව ඉගැන්වීය. *ආචාර්ය වී.කනේෂලිංගම් මහතා* රාජ්‍ය පරිපාලන විද්‍යා ගුරුවරයා විය. *ආචාර්ය ඒ.එම්.ඒ.අසීස් මහතා* තවත් විෂයයක් ඉගැන්වීය. මේ අතර *ටී.ඒ.ඩී.සිරිසේන, එන්.ඒ.ගම්පොල, ධර්මසේන ද සිල්වා* යන මහත්වරු ස්ථිර කථිකාචාර්ය මණ්ඩලයට එක්වූහ.

පාඨමාලාව අවුරුදු දෙකක් හැදෑරීමෙන් පසුව ප්‍රශ්නපත්‍ර නවයකින් සාමාන්‍ය උපාධි පරීක්ෂණය පවත්වන ලදී. 1963 දෙසැම්බර් මාසයේ දී පැවැත්වුණු එම විභාගයේ ප්‍රතිඵල නිකුත් වූයේ 1964 වසරේ මැද භාගයේ දී පමණය. අපේක්ෂකයින් එකසිය විසිපහක් පමණ දෙනාගෙන් අසූපහක් පමණ සාමාර්ථය ලැබූහ. දෙදෙනෙක් දෙවන පෙළ අධස්ථන ශ්‍රේණියේ සාමාර්ථය ලබා තිබිණි. මම රාජ්‍ය පරිපාලන විද්‍යා අංශයෙන් පන්ති සාමාර්ථයක් ලබා ගත් එක ම අපේක්ෂකයා වීමි. මේ සඳහා උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වූයේ විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකර තිබූ බණ්ඩාරනායක ශාලාවේ දී ය. *අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා* කුලපති වශයෙන් උපාධි ප්‍රදානය කළේය. මෙම උත්සවයට මගේ මාමා කෙනෙකු වූ, *අස්ගිරි විහාර පාර්ශවයේ හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස නාහිමිපාණන්* ද වැඩම කර සිටියහ. මා උපාධියක් ලබා ගැනීම ගැන උන්වහන්සේ බෙහෙවින් ම සතුටු වූ බව පෙනෙන්නට තිබිණි.

මගේ බිරිඳ ප්‍රේමා සහ වැඩිමහල් දරු දෙදෙනා ද උත්සව ශාලාවේ අසුන් ගෙන සිටියහ. උපාධි ප්‍රධානෝත්සවය අවසන් වූවාට පසුව, මගේ මිත්‍ර *ජී.ඩබ්ලිව්.ජෝර්ජ්* මහතා සහ එම පවුලේ අය සමඟ අටේ කණුවේ ඡායාරූප ශාලාවකට ගොස් ඡායාරූප කීපයක් ගැනීමෙන් පසුව, කොළඹ නගර ශාලාව අසල වූ චීන අවන්හලට ගොස් රාත්‍රී භෝජනය ගැනීමෙන්

පසුව ගෙදර එනවිට රෑ බෝවී තිබිණි. ජෝර්ජ් වත්තේගෙදර මිතුරා ද එදින උපාධිය ලබා ගත් කෙනෙකු විය. මේ වසරේ උපාධිය සමත් වූ අප සියලු දෙනා එකතු වී අපගේ ගුරුවරුන් සඳහා මෙම චීන අවන්හලේ දී භෝජන සංග්‍රහයක් පැවැත්වූයෙමු.

කොළඹට මාරුවීම හා උඩහමුල්ලේ පදිංචිය

උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස මින්නේරියේ සිට කොළඹට ස්ථාන මාරුවක් ලබා ගත් පසු, පදිංචියට නිවසක් සොයා ගැනීම හදිසි අවශ්‍යතාවක් විය. විද්‍යෝදය විශ්ව විද්‍යාලය මාලිගාකන්දේ සිට ගංගොඩවිලට ගෙන යන බව දැනගත් නිසා, ගංගොඩවිල ප්‍රදේශයෙන් ගෙයක් සොයා ගැනීම උචිත බව තේරුම් ගතිමි. අප විවාහ වූ අවදියේ පදිංචි ව සිටි දෙල්කඳ ඉරිදා පොළ අසල නිවස හිමි වූ ආචිස් සිඤ්ඤෝ මුදලාලි මුණගැසුනෙමි. ඒ වන විට ඔහුගේ වත්තේ ඉදිකරමින් තිබූ නිවසක් කුළියට ලබා ගැනීමට හැකි විය. මාසික කුලිය රුපියල් අසූවක් විය. අවුරුද්දක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා ඒ නිවස කුළියට ලබා ගතිමි.

එහි නිදන කාමර දෙකක්, කෑම කාමරය හා විසිත්ත කාමරය, තවත් නිදන කාමරයකට ගත හැකි වෙනත් ශාලාවක්, මුළුතැන්ගෙය හා යාබඳ වැසිකිළියක් තිබිණි. වත්ත තුළ බීමට හා නෑමට ජලය ලබා ගත හැකි ලිං දෙකක් විය. විදුලි බලය නැත. මා ළඟ ලාම්පු තිබුණ නිසා ගැටලුව විසඳිණි. පසුව පෙට්‍රෝල් ලාම්පුවක් ද මිලයට ගතිමි. හිඟුරක්ගොඩින් එවන ලද මගේ ගෙවල් බඩු මරදානේ "ගුඩ්ෂෙඩ්" එකට ලැබුණු පසු ඒවා නව නිවසට ගෙනැවිත් එහි පදිංචියට ගියෙමු. දෙල්කඳ ඉරිදා පොළ අත දුරින් පිහිටියේය. සලාක කඩය ද අල්ලපු වැටෙය. නිවස පිහිටි වත්ත ඉඩකඩ තිබුණ නිසා, මගේ දරු දෙදෙනාට දුවපැන සෙල්ලම් කිරීමට පහසු විය. උඩහමුල්ල දුම්රිය ස්ථානයට විනාඩි පහකින් පමණ ළඟාවිය හැකි විය. වත්තේ ඉදිරියෙන් බස් පාරක් තිබිණි. ටික දුරක් ගිය විට හයිලෙවල් පාර හමුවේ. කොළඹ යන බස් ඒ පාරේ ගමන් කළේය.

මෙසේ කොළඹට මාරු වී යන විට මගේ වැටුපෙන් අතට ලැබුණු මුදල මසකට රුපියල් දෙසිය තිස් තුනක් විය. එයින් රුපියල් හතළිහක් ගෙවල් කුලී වශයෙන් ගෙවිය යුතු විය. රුපියල් අසූවක කුලියෙන් ඉතිරි රුපියල් හතළිහ අත්තිකාරම් මුදලෙන් අඩුකරන ලදී. උඩහමුල්ලේ සිට නාරාහේන්පිට දක්වා තුන්මාසයකට දුම්රිය වාර ප්‍රවේශපත්‍රයක් රුපියල් හයකට ලබා ගත හැකි විය. බස්වලින් කාර්යාලයට ගියත් දිනකට රුපියලක්වත් වියදම් වූයේ නැත. ගමනාගමනය සඳහා මා මින්නේරියේ දී මිලයට ගත් බයිසිකලය ද තිබිණි. මුදල් මෙන් ම කාලය ද ඉතිරි කර ගැනීමට බයිසිකලය බෙහෙවින් ම උපකාර විය.

සේවා ස්ථානය

කොළඹට මාරු වීමෙන් පසුව මගේ සේවා ස්ථානය වූයේ බෞද්ධාලෝක මාවතේ ගල්ඔය සංවර්ධන මණ්ඩල ගොඩනැඟිල්ලේ පිහිටා තිබූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ ශාඛාවයි. එම ගොඩනැඟිල්ලේ ඉහළ මාලය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශාඛා තුනක් ස්ථානගත කොට තිබිණි. කොන්ත්‍රාත් ශාඛාව හා ගබඩා ශාඛාව අනික් දෙකය. මේ ශාඛා තුන ම භාර ව නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂවරයෙක් සිටියේය. එතුමා මා මිණිපේ සිටිය දී දැන සිටි, එවකට බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තනතුර දැරූ, *බාරොන් සෙල්ලහේවා මහතාය.* රජයේ කාර්යාලවල වැඩි වැඩියෙන් රාජ්‍ය භාෂාවෙන් රාජකාරි ඉටුකිරීම ව්‍යාප්තවීමත් සමඟ, සිංහල භාෂා ප්‍රවීණතාව ලත් ලිපිකරුවන් අවශ්‍ය විය. මේ ශාඛාවේ මට පෙර සිටියේ දෙමළ ලිපිකරුවෙකි. ඔහු මා වෙනුවට මින්නේරියට මාරු වී ගිය තැනැත්තාය.

යන්ත්‍රෝපකරණ ශාඛාවේ අංශ ප්‍රධානියා වූයේ *සුබ්‍රමනියම්* නැමැති ජ්‍යෙෂ්ඨ ලිපිකරුවෙකි. වැඩිකල් නොගොස් ම ඔහු කෙරෙහි මා තුළ පැහැදීමක් ඇති විය. ඔහු ඉංග්‍රීසියෙන් කෙටුම්පත් කරන ලිපි සිංහලට පරිවර්තනය කළ යුතු විය. මේ සඳහා *ප්‍රඥාවර්ධන* නම් වූ තවත් ලිපිකරු මහතෙක් ද සිටියේය. මගේ විෂයට අදාළ ලිපිලේඛන සිංහලයට පරිවර්තනය කිරීමත් අවශ්‍ය විට සිංහල ලිපි ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමත් කළ යුතුවිය. පාරිභාෂිත ශබ්ද මාලා තිබුණ නිසා මෙය එතරම් ගැටලුවක් නොවීය.

මා මින්නේරිය උප කොට්ඨාසයේ සේවය කරන අවදියේ, පොළොන්නරුව උපකොට්ඨාසයේ සේවය කළ *බර්ටි ගලහිටියාව* මහතා කොන්ත්‍රාත් ශාඛාවේ සේවය කළේය. ඒ මහතා ද විද්‍යොදය පාඨමාලාව හැදෑරීමට ඇතුළු වූ කෙනෙකි. නියෝජ්‍ය අධ්‍යක්ෂ සෙල්ලහේවා මහතා ද මා ගැන දැන සිටි නිසා, යම්කිසි සතුටුදායක පරිසරයක් පැවතිණි. කොන්ත්‍රාත් ශාඛාවේ ප්‍රධාන ලිපිකරු වූයේ, 1952 තරම් ඈත කාලයක සිට දන්නා හඳුනන *ඇඩ්මන්ඩ් විතානගේ මහතාය.* එම ශාඛාවේ යතුරු ලේඛක *සතරසිංහ මහතා* ද කලින් දැන සිටි කෙනෙකි. යන්ත්‍රෝපකරණ ශාඛාවේ සේවය කළ තවත් කෙනෙකු වූයේ අර්ධ ලිපිකාර සේවයට අයත් වූ *ප්‍රනාන්දු* නම් වූ මහතෙකි. *තනබාලාසිංගම්* හා *පලනි* යනුවෙන් තරුණ දමිළ ලිපිකරුවන් දෙදෙනෙක් ද මේ ශාඛාවේ සේවය කළහ. කාර්යාලයේ දී පවා දමිළයන් අතර කුලභේදය තදින් පැවැති ලකුණු දක්නට තිබිණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය තවමත් පිහිටා තිබුණේ කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේය. *සිල්වා ගුණසේකර මහතා* අධ්‍යක්ෂවරයා විය. පරිපාලනය භාර ව සිටියේ සිවිල් සේවයට අයත් *මේජර් වී.ජේ.එච්. ගුණසේකර මහතාය.* (1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයට සම්බන්ධ වූ බවට සැක කොට ඔහු පසුව සිරභාරයට පත්විය.)

මේ අවදියේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා ජාවත්ත පාර, බෞද්ධාලෝක මාවත හන්දිය අසල මුලස්ථාන ගොඩනැඟිල්ලක් ඉදිකරමින් තිබිණි. 1961 වසර තුළ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව එම ගොඩනැඟිල්ලට ගෙනයන ලදී. අපගේ ශාඛාව ද මුල දී එම ගොඩනැඟිල්ලේ බිම් මහලේ කාමරයකට ගෙන ගොස්, පසුව දෙවෙනි මහලට ගෙන ගියේය. මේ වන විට අප ශාඛාවේ *සුබ්‍රමනියම්, ප්‍රනාන්දු, ප්‍රණාවර්ධන, තනබාලසිංහම්, පලනි හා මා* ලිපිකාර මණ්ඩලයට අයත් වූහ. අප්පුහාමි නමැත්තෙක් කාර්යාල කාර්ය සහායක විය.

කැළණිවැලි දුම්රිය මාර්ගය ආශ්‍රිත ප්‍රදේශවල පදිංචි ව සිටි සේවක පිරිස් නාරාහේන්පිට දුම්රියපොලෙන් බැස තිඹිරිගස්යාය පාරේ ටොරිංටන් පාරට ගොස් එහි වම් පසින් වූ මුස්ලිම් සුසාන භූමිය හරහා වැටී තිබුණ කෙටි පාරකින් ජාවත්ත පාරට ගියහ. උඩහමුල්ලේ පදිංචි ව සිටි මමත් බොහෝ විට එසේ කළෙමි. එනමුත් විටින් විට පාපැදියෙන් ද සේවයට ගියෙමි. තවත් විටක දෙල්කඳ හන්දියේ සිට තිඹිරිගස්යාය හරහා බස්වලින් ද සේවයට පැමිණියෙමි. සමහරවිට හැව්ලොක් පාරේ පොලිස් පාක් අසලින් කැප්පෙටිපොළ පාර දිගේ පයින් ම ජාවත්ත පාරට පැමිණියෙමි. විශාඛා විද්‍යාලයට ආ ගිය විට භාවිතා කළේ මේ මාර්ගයයි.

පුතා අසනීප වීම

මගේ පුතා (පසුව ලොකු පුතා යැයි හඳුන්වනවා ඇත) කුඩා කාලයේ මින්නේරියේ සිටිය දී නිතර නිතර සෙම් අමාරු නිසා අසනීප විය. හිගුරක්ගොඩ පෞද්ගලික බටහිර වෛද්‍යවරයෙකුගේ මතය වූයේ, පාසල් යන වයසට එළඹෙන තුරු මෙම අසනීප තත්වය පැවතිය හැකි බවයි. කොළඹට පැමිණි පසු ද මෙම රෝගී තත්වය පැවති නිසා, නොයෙක් දෙනාගෙන් ප්‍රතිකාර ලබා දුනිමි. වරක් *මාලේවන ඤාණිස්සර හිමියන්ගෙන්* ආයුර්වේද ප්‍රතිකාර ලබා දුනිමි. උන්වහන්සේගේ මතය වූයේ දරුවාට ඇදුම රෝගය සෑදී ඇති බවයි. ඊළඟට තිඹිරිගස්යායේ වජිර පාරේ හන්දියේ පදිංචි ව සිටි *ජේ.ආර්. විල්සන්* නමැති හදවත් පිළිබඳ වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබා දුනිමි. එතුමාගේ ප්‍රතිකාරයට දවසක් ඇර දවසක් උදෙන් එන්නත් දීම ඇතුළත් විය. මේ සඳහා දින දහයක් එතුමාගේ නිවසට දරුවා රැගෙන ඒමට සිදුවිය. උදේ හයට පමණ දරුවා සමග පැමිණ ප්‍රතිකාරයෙන් පසුව ඔහු ගෙදර ගොස් තබා නැවත කාර්යාලයට පැමිණීමට සිදුවිය. මෙයින් ද සුවයක් නොලැබුණි. මගේ පාසල් මිතුරෙකුගේ උපදෙස් මත ළමාරෝග විශේෂඥවරියක වූ *ස්ටෙලා ද සිල්වා* වෛද්‍යවරියගෙන් ප්‍රතිකාර ලබා ගතිමි. එතුමිය නියම කළ බෙහෙත් මිශ්‍රණය බෙහෙත් ශාලාවකින් රුපියලයි ශත

පනහකට ලබා ගත හැකි විය. එම ප්‍රතිකාරයෙන් පසුව වෛද්‍යවරිය හමුවූ විට කීවේ නැවත රොගාතුර වුවහොත් එම බෙහෙත් මිශ්‍රණය ලබා දෙන ලෙසයි. ක්‍රමයෙන් මාස දෙක තුනකින් දරුවාට සම්පූර්ණ සුවය ලැබිණි.



ලොකු පුතා (හේමකාන්ත ඒකනායක) පෙර පාසල් විය (උපන් දිනය 31.08.1959)

දියණිය පාසල් යැවීම

මගේ දියණිය (පසුව ලොකු දුව යයි හඳුන්වනවා ඇත) මේ වනවිට ළදරු පාසලකට ඇතුළු කළයුතු වියට පැමිණි සිටියාය. වජිර පාරේ විශාඛා විද්‍යාලයට සම්බන්ධ ළදරු පාසලක් එවකට තිබිණි. 1961 වසරේ දී මගේ දුව විශාඛා ළදරු පාසලට ඇතුළු කළෙමි. මෙම ළදරු පාසල පාලනය කළේ

ජයතිලක නම් තරුණ ගුරුවරියකි. මගේ දුව ඇගේ පන්තියට ඇතුළු කළෙමි. උඩහමුල්ලේ ගෙදර සිට ළඳරු පාසලට ගියේ ආවේ මැදිවියේ කාන්තාවක් සමඟය. දිනක් මා ගෙදර ගිය විට දියණියගේ හිස වෙලුම් පටියකින් ඔතා තිබෙනවා දැක විමසූ විට දැනගන්නට ලැබුණේ, ළඳරු පාසලේ දී පුටුව පෙරළී වැටී ඔළුව පිටුපස තුවාල වූ බවයි. පාසලේ දී පිළියම් කර ගෙදර එවා තිබේ. පසුදින පාසලට ගොස් *ජයතිලක මෙනෙවියගෙන්* විමසූ විට ඇගේ පිළිතුර වූයේ, වාඩි වී සිටි "පුටුව පදින විට" පිටිපස්සට වැටී තුවාල වූ බවයි. එනමුත් පසුව ආරංචි වූයේ වෙනත් දඟකාර ළමයෙක් මගේ දුව තල්ලු කිරීමෙන් වැටුණු බවයි. මේ නිසා සති දෙක තුනක් පාසල් ගමන නතර වී තිබිණි. එසේ වුවත්, මගේ දුව එම ළඳරු පාසලේ ම තබා ගත්තේ ඊළඟ වසරේ දී විශාඛා විද්‍යාලයට ඇතුළු කර ගැනීමේ අපේක්ෂාව නිසාය.

එවකට විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වූයේ *සූසන් ජුලිමුඩ් මහත්මියයි.* එතුමියගේ පාලනය යටතේ මෙම විදුහල විශාල දියුණුවක් ලබා තිබිණි. කොළඹ පමණක් නොව මුළු දිවයිනේ ම අග්‍රගණ්‍ය බෞද්ධ කාන්තා විදුහල ලෙස විශාඛා විද්‍යාලය ප්‍රසිද්ධියක් ඉසිලීය. ඊළඟ වසරේ මගේ දියණිය ද විශාඛා විද්‍යාලයට ඇතුළත් කරගනු ලැබීය. ඈ ඇතුළු කරන ලද්දේ *සෝමා කිරිඇල්ල* නම් වූ ගුරුතුමියගේ පන්තියටයි. ඒ පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නිසාත්, මගේ දියණිය ඇතුළු වූයේ මැයි මාසයේ දී පමණ නිසාත් ටික දවසකට පසුව ඉඩ තිබුණ වෙනත් පන්තියකට යවා ඇත. උදෙන් ම එසේ යවා ඇති නමුත්, දහවල් වන විට ආපසු *කිරිඇල්ල මහත්මියගේ* පන්තියට පැමිණ එතුමියගේ අතේ එල්ලී ඇත. මා එදින පාසලට ගිය විට කිරිඇල්ල මහත්මිය ඒ බව කීවාය. මේ නිසා එම වර්ෂයේ පහළ බාලාංශයේ ඉගෙන ගත්තේ කිරිඇල්ල මහත්මියගේ පන්තියේය.

ළඳරු පාසලේ අනතුරට පසුව දියණිය පාසල් ගියේ ආවේ මා සමඟය. බසයකින් ගොස් ඇය පාසලට ගෙන ගොස් ඇරලා, පොලිස් පාක් හරහා කැප්පෙටිපොල මාවතෙන් පාගමනින් කාර්යාලයට ගියෙමි. පෙරවරු එකොළහට පමණ කාර්යාලයෙන් පිට වී ඒ මාර්ගයේ ම ළඳරු පාසලට ගොස් දියණිය ගෙදර එක්කර ගෙන ගොස්, මගේ දිවා ආහාරය ද ගෙන කාර්යාලයට එනවිට දවල් දෙක පමණ විය. එසේ නමුත්, මගේ අංශ ප්‍රධාන සුබ්‍රමනියම් මහතා කිසි දිනක ප්‍රශ්න කළේ නැත. එයට හේතුව මගේ රාජකාරී කිසිවක් අතපසු නොකළ නිසා යයි සිතමි.

විශාඛා විද්‍යාලයට ලොකු දුව ඇතුළු කිරීමෙන් පසුව තත්ත්වයේ වෙනසක් සිදුවිය. උදේට මා සමඟ පාසලට ගියාය. දවාලට ප්‍රේමා සමඟ ආපසු ගියාය. එසේ කළ හැකි වූයේ, 1963 වසරේ දී ලොකු පුතා ද විශාඛා ළඳරු පාසලට ඇතුළු කළ නිසාය. උදේ දරු දෙදෙනා ම මා සමඟ පාසල් ගියහ. දවාලට ප්‍රේමා එහි ගොස් ළඳරු පාසල ඇරුණ පසු පුතා සමඟ

වජිරාරාමයට ගොස් දුවගේ පාසල ඇරෙන තුරු සිට, දෙදෙනා ම සමඟ ගෙදර ආවාය. විශාඛා විද්‍යාලයේ දරුවන්ගේ මව්වරුන්ගේ නැවතුම් පොළ වජිරාරාමයේ ධර්ම ශාලාව විය.

උඩහමුල්ලේ අප අසල්වැසියෙකු වූ ද, නාලන්දා විද්‍යාලයේ ගුරුවරයෙකු වූ ද, පෙරේරා මහතාගේ කුඩා දියණිය ද විශාඛා විද්‍යාලයට පැමිණියාය. ඈ එහි එක්කර ගෙන ආවේ වැඩිහිටි කාන්තාවක් විසිනි. දෙල්කඳ හන්දියට පැමිණ විශාඛා විද්‍යාලයට එන පාසල් බස්රථයෙන් පාසල වෙත පැමිණියහ. මගේ දියණිය ද සමහර දිනවල එම ආච්චී සමඟ පාසල් යැවීමු. මගේ සේවා ස්ථානය රත්මලානට වෙනස් වූ පසු ප්‍රේමාගේ මල්ලී කෙනෙක් වූ *හරිස්* පාසල ඇරුණු පසු ලොකු දුව ගෙදර එක්කර ගෙන ගියේය. ඔහු ඒ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළේය. මේ ආකාරයට අවශ්‍ය වූ විට කීප දෙනෙක් ම අපට උදව් කර තිබේ. ඒ අයට කෘතඥ විය යුතුය.

රත්මලානට මාරුවීම

මේජර් ගුණසේකරට පසුව පරිපාලනය භාර සහකාර වාරිමාර්ග අධ්‍යක්ෂවරයා ලෙස පත් වූයේ සිවිල් සේවයේ වර්නන් අබේසේකර මහතාය. මේ වන විට දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරු දැරුවන් සමහරක් මෙසේය: *එස්. ආරුමුගම් මහතා* නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විය. *ටී.බී.ඒ. සෙනෙවිරත්න, එස්.එම්. අරුමුගම්, වී.එන්. රාජරත්නම්* යනුවෙන් සහකාර අධ්‍යක්ෂවරු කීපදෙනෙක් වූහ. අප අංශය භාර වූයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ *සෙල්ලහේවා මහතාටය.* ප්‍රධාන ගණකාධිකාරි වූයේ *වීරසූරිය* නම් මහතෙකි. *ලීලාරත්න මහතා* කාර්යාල සහකාර (ඕ.ඒ.) විය. සහකාර ගණකාධිකාරිවරු කීපදෙනෙක් වූහ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යන්ත්‍රෝපකරණ අංශය පිහිටියේ රත්මලානේ ගොළුමඩම අසලය. මේ අංශය පිළිබඳ කාලයක් තුළ පුවත්පත්වල තිබූ විවේචනාත්මක ලිපි මාලාවක් නිසා එහි ප්‍රතිසංවිධානයක් ඇති කළේය. එම අංශයේ ප්‍රධාන ඉංජිනේරුවරයා වූ *ජොන්සන්* නැමැති ඉංග්‍රීසි ජාතික යාන්ත්‍රික ඉංජිනේරුවරයා උපදේශක තනතුරකට පත් කර, *එෆ්.එල්. තිරිමාන්න* මහතා ප්‍රධාන ඉංජිනේරු තනතුරට පත් කළේය. නියෝජ්‍ය අධ්‍යක්ෂ *සෙල්ලහේවා* මහතා මේ හැමදෙනාට ම ඉහළින් තබා රත්මලාන කාර්යාලයේ සිට සේවය කිරීමට මාරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන කාර්යාලයේ එතෙක් පැවැති යන්ත්‍රෝපකරණ ශාඛාව ද රත්මලානට මාරු කළ නිසා, 1962 ජුනි මස 5 දින සිට ක්‍රියාත්මක වන පරිදි මට ද ස්ථාන මාරුවක් ලැබිණි.

උඩහමුල්ලේ පදිංචි ව සිටි මම, ඉන්පසුව සේවයට පැමිණියේ ගම්සභා හන්දියෙන් පැපිලියාන පාරේ ගොස් අත්තිඩිය හරහා මැලිබන් හන්දියෙන් ගාලු පාරට වැටී, ගොළුමඩම හන්දියට ගමන් කිරීමෙනි. බස්රථ මාර්ගය වූයේ නුගේගොඩ සිට රත්මලාන දක්වා වූ 117 මාර්ගයයි. මේ වෙනස නිසා මගේ ලොකු දුව පාසලට එක්ක යෑමේ වෙනසක් සිදුවිය. උදේට බසයෙන් විශාඛා විද්‍යාලය වෙත ගොස් ලොකු දුව එහි බස්සවා බම්බලපිටියට පැමිණ ගාලුපාරේ එන බස්රථයකින් රත්මලානට පැමිණියෙමි. *හරිස්* දවාලට පාසලට ගොස් දියණිය ගෙදර එක්කර ගෙන ගියේය. ටික කලක් පාසල් වෑන්රථයකින් ද ඇය පාසලට ගියාය.

විධායක ශ්‍රේණියට උසස් වීම

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ශ්‍රේණියේ දෙවෙනි පන්තියට උසස් කිරීමේ විභාගයක් 1961 ඔක්තොම්බර් මස 14 දින පවත්වන ලදී. එම විභාගයෙන් මා සමත් වූ නිසා, අදාල ශ්‍රේණියට මා උසස් කළ බව දන්වා ලිපියක් 1962 ජූනි මස 21 දින භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් මා වෙත එවා තිබිණි. උසස්වීම් ක්‍රියාත්මක වූයේ 1961 ඔක්තොම්බර් 1වෙනි දා සිටය. සාමාන්‍ය ලිපිකාර ශ්‍රේණියේ වැටුප් වර්ධක නවයක් පමණ ලැබී තිබුණ නිසා, සුළු වැටුප් වැඩිවීමක් ලැබිණි. ඒ අනුව 1963 අප්‍රේල් 29 දින සිට රුපියල් 1860/- වාර්ෂික වැටුපක් ද, රුපියල් 155/- මාසික වැටුපක් ද හිමිවිය. සියලු දීමනා සහිත ව රුපියල් 260/- පමණ මුදලක් මාසික ව අතට ලැබුණේය.

පෝලියෝ භීතිය, පැපොල හා සරම්ප

1962 වසරේ දී බස්නාහිර පළාතේ කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පෝලියෝ "වසංගතයක්" පැතිර ගියේය. රෝගයට වඩා ඒ පිළිබඳ "භීතිය" ලැව්ගින්නක් මෙන් පැතිර ගියේ, තමන්ගේ කුඩා දරුවනට මෙවැනි රෝග යක් වැළඳුණහොත් ඒ අය සදකාලික අඛ්බගාත වන්නේය, යන භීතිය නිසාය. මගේ දියණිය මේ වන විට වයස අවුරුදු පහක් පමණ වූවාය. පුතාගේ වයස අවුරුදු තුනකට කිට්ටුය. ප්‍රේමා සමග මේ ගැන කතිකා කරගෙන, දරු දෙදෙනා රැගෙන මාතර ගියෙමු. ඒ තුන්දෙනා මහගෙදර නවත්වා මම ආපසු කොළඹ පැමිණ, සුපුරුදු රාජකාරියේ නිරත වූයෙමි. සිංහල අවුරුදු දිනවල මා මාතර ගියවිට දක්නට ලැබුණේ, පැපොල සෑදී පිඩා විඳින ප්‍රේමාය. දරු දෙදෙනාට පැපොල සෑදී සුව වී තිබිණි. මේ අතරතුර ලොකු දුවට විශාඛා විද්‍යාලයට ප්‍රවේශය ලැබුණ නමුත් එම පාසල් ගමන ආරම්භ කිරීමට හැකි වූයේ මැයි මාසයේ දී පමණය. *විදුහල්පතිනි පුලිමුඩි මහත්මියට* කාරණය පැහැදිලි කර අනුමැතිය ලබා ගෙන තිබිණි.

1963 වර්ෂයේ දී පමණ බඹරදෙණියේ නැන්දම්මාගේ දෙවෙනි දියණියගේ විවාහ මංගල්‍යයට සහභාගි වීමට මුළු පවුල ම බඹරදෙණියේ ගියෙමු. දුම්රියෙන් *පේරාදෙණියට* ගොස් අසල තිබූ කුලීරථයකින් *දඋලගල* හරහා නැන්දම්මලාගේ ගෙදරට ගියෙමු. ඒ මඟුලට අපේ ගමේ නෑදෑයෝ ද පැමිණ සිටියෝය. අපේ අම්මා, මට වැඩිමල් අක්කා යනාදි පිරිසක් මිණිපේ සිට මස්සිනාගේ කාර් එකේ මඟුල් ගෙදරට පැමිණ සිටියහ. මඟුල් උත්සවයට වඩා මේ අය මුණගැසීමට ලැබීම ගැන අප හැම දෙනා ම සතුටු වූයෙමු. මගේ ඥාති සොහොයුරු *ගුණතිලක මල්ලී* විවාහ වී සිටි *පද්මා* නංගිලාගේ කඩුගන්නාවේ ගෙදරට අපි ගියෙමු. නැන්දම්මාගේ දුව විවාහ කර දුන්නේ මාරස්සන ග්‍රාම නිලධාරි කෙනෙකුටය. මනමාලයාගේ නිවසට ද අපි ගියෙමු. ඉන් පසු දින අපි කොළඹ පැමිණියෙමු.

දින දෙක තුනකට පසුව අප දරු දෙදෙනාට ම උණ ගැනිණි. මරදානේ බෙහෙත් ශාලාවක් පවත්වා ගෙන ගිය *විජේගුණවර්ධන දොස්තර මහතාට* පෙන්වීමට බලාපොරොත්තුවෙන්, උදෑසනින් ම දරු දෙදෙනා සමග මැනිං ටවුමේ කුඩම්මලාගේ ගෙදර ගියෙමු. එනමුත් දරුදෙදෙනාගේ මුහුණුවල තිබුණ බිබිලි වගයක් දුටු කුඩම්මා කීවේ, සරම්ප හැදී ගෙන එන බවය. එයට බෙහෙත් කිරීම අනවශ්‍ය බව කී නිසා ආපසු ගෙදර පැමිණියෙමු. මේ දෙදෙනාට සරම්ප බෝවී ඇත්තේ නැන්දම්මලාගේ ගෙදර දී ය. නැන්දම්මාගේ ලොකු දුවගේ දරුවන්ට සරම්ප හැදී සිටි බව ප්‍රේමා මට කීවේ අප දරු දෙදෙනාට සරම්ප හැදුනාට පසුවයි. ඒ දරුවන් අසල සිටි නිසා අප දරු දෙදෙනාට ද එම රෝගය බෝවී තිබේ.

ඉගෙනීමට ලත් විශේෂ පහසුකම්



උපාධි සේයාරූව **(B.A. Vidyodaya, 1964)**

උපාධි පාඨමාලාවේ දේශන ආරම්භ වූයේ දිනපතා පස්වරු පහටයි. සවස හතරයි තිහට කාර්යාලයෙන් පිටත් වී නියමිත වේලාවට දේශනවලට පැමිණීම අපහසු විය. ඒ නිසා, **1957 ජූනි 13 දින නිකුත් කර තිබූ අංක 383 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ** විධිවිධාන යටතේ, පස්වරු 3.45 කාර්යාලයෙන් බැහැර යෑමට අවසර ලබා ගතිමි. ඒ වෙනුවට පෙරවරු 8.15 කාර්යාලයට පැමිණිය යුතු විය. පාපැදිය තිබුණ නිසා මෙය පහසු විය.

දිනපතා දේශන අවසන් වී ගෙදර එන විට රාත්‍රී නවය පමණ විය. ඇඟපත

සෝදා රාත්‍රී ආහාරයෙන් පසුව මැදියම් රෑය දක්වා පාඩම් කළෙමි. පෙරවරු පහට පමණ නැවත අවදිවිය යුතු විය. මේ කිසිවක් කරදරයක් ලෙස සැලකුවේ නැත. එක ම අරමුණ වූයේ උපාධිය ලබා ගැනීමටයි. දරුවන්ගේ හෝ නිවසේ අවශ්‍යතාවන් කිසිවක් අතපසු කළේ ද නැත. මේ සියල්ලේ දී ම ප්‍රේමා මට මහත් ශක්තියක් වූවාය. ඈ රැකියාවක නිරත නොවූ නිසා දරුවන්ට ද අඩුපාඩුවක් නොවීය. අගහිඟකම් ඉවසා දරා ගත්තෙමු.

උපාධි පරීක්ෂණය කිට්ටු වන විට මා නොගෙන තිබූ විවේක නිවාඩු හිලව්වට අධ්‍යයන නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා එය අනුමත කරවා ගතිමි. 1963 නොවැම්බර් මාසයේ දින භාග විස්සක් ද දෙසැම්බර් මාසයේ සම්පූර්ණ දින විස්සක් ද වශයෙන් දින තිහක අධ්‍යයන නිවාඩු ලබා ගතිමි. මෙම පහසුකම් නිසා මගේ ඉගෙනීමේ කටයුතුවලට පහසුවක් ඇතිවිය.



උපාධි ප්‍රදානෝත්සවයට පසුව 1964 දෙසැම්බර්

බාහිර කථිකාචාර්ය තනතුර

පන්ති සාමාර්ථයක් සහිත ව උපාධි පරීක්ෂණය සමත්වීම ගැන මගේ ගුරුවරයා වූ *ආචාර්ය කනේෂලිංගම් මහතා* අතිශයින් ම සතුටු විය. මා බාහිර කථිකාචාර්ය තනතුරකට පත් කරන ලෙස එතුමා අධ්‍යනාංශ ප්‍රධාන *මහාචාර්ය කේ.ජී.මුකර්ජි* මහතාට නිර්දේශ කළ බව දනිමි. ඒ අනුව 1964 ඔක්තොම්බර් මාසයේ සිට මට බාහිර කථිකාචාර්ය පදවියක් ලැබිණි. ඒ සඳහා ලිපිය අත්සන් කර තිබෙන්නේ එවකට විශ්ව විද්‍යාලයාධිපති වූ *පළන්නොරුවේ විමලධම්ම හිමිපාණන්* විසිනි. මේ වනවිට පළමුවන විශ්ව විද්‍යාලාධිපති *වැලිවිටියේ ශ්‍රී සෝරත හිමිපාණන්* අපවත් වී සිටියේය. උන්වහන්සේ අපවත් වූයේ 1962 වසරේ දී ය. ආදාහන උත්සවය පැවැත්වූයේ ගංගොඩවිල විශ්ව විද්‍යාල පරිශ්‍රයේ දී ය. අපි බොහෝ දෙනා මාලිගාකන්දේ සිට ගංගොඩවිලට පැමිණ අවමංගල්‍ය පෙරහැරට සහභාගි වූයෙමු.

සෝරත හිමිපාණෝ භාවිතා කළේ *විශ්ව විද්‍යාලයාධිපති* යන තනතුරු නාමයයි. උප කුලපති යන තනතුරු නාමය භාවිතාවට පැමිණියේ පසු කාලයේ දී ය. *මහාචාර්ය ටී.බී. කාන්ගහඅාරච්චි මහතා* අර්ථ නිරූපණය කළ අන්දමට, 'උපකුලපති' යනු පවුලේ දෙවෙනි ප්‍රධානියාය. සෝරත නාහිමිපාණෝ එම තනතුරු නාමය භාවිතා නොකළේ එහි ගැබ්වී තිබුණ සැඟවුණ අරුත නිසා යයි කාංගහඅාරච්චි මහතාගේ මතය විය. *පළන්නොරුවේ නාහිමියන්ට* පසුව *පරවාහැර වජිරඤාණ නාහිමිපාණෝ* විශ්ව විද්‍යාලයාධිපති තනතුරට පත්විය. *මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිඅාරච්චි මහතා* ඊළඟ විශ්ව විද්‍යාලයාධිපතිවරයා විය. *වල්පොල ශ්‍රී රාහුල හිමිපාණන්ට* පසුව *මහාචාර්ය හේම එල්ලාවල මහතා* විද්‍යෝදය විශ්ව විද්‍යාලාධිපතිවරයා විය. 1972 වර්ෂයේ දී මෙම විශ්ව විද්‍යාලය විද්‍යෝදය මණ්ඩපය විය. 1978 පසුව මෙම විශ්ව විද්‍යාලය *'ශ්‍රී ජයවර්ධනපුර'* නමින් නීතිගත කරන ලදී. 1970 වසර දක්වා ම විටින් විට මා බාහිර කථිකාචාර්ය තනතුරට පත්කරන ලදී.

වාරිමාර්ග ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුව

විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උපාධි පරීක්ෂණයට පසුව, 1964 ජනවාරි පළමුවෙනි දා සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවීමක් ලැබිණි. ප්‍රධාන කාර්යාලයේ ආයතන (කාර්ය මණ්ඩල) ශාඛාවේ රාජකාරි පැවරිණි. අංශ ප්‍රධානියා වූයේ *පර්ඩිනැන්ඩු මහතාය.* මෙම ශාඛාව කාර්යාල සහායක (ඕ.ඒ) *ඇඩිමන්ඩ් විතානගේ මහතාගේ* සහ සහකාර අධ්‍යක්ෂ *වර්නන් අබේසේකර මහතාගේ* මෙහෙයවීමට ද යටත් විය. මේ අංශයේ එක් විෂයභාර ලිපිකරුවෙකු වූ *කේ. ඩබ්ලිව්. පෙරේරා මහතා* ඉංජිනේරු කාර්ය මණ්ඩලය භාර ව කටයුතු කළ නිසා, දිනපතා ම පාහේ වාරිමාර්ග අධ්‍යක්ෂවරයාගේ නියෝගවලට භාජනය විය.

පෙරේරා මහතා ටික කලකට පසුව මහා භාණ්ඩාගාරයට මාරු වී ගිය පසු, එම විෂයේ රාජකාරි මට පැවරිණි. ඒ නිසා, දිනපතා ම පාහේ වාරිමාර්ග අධ්‍යක්ෂ *සිල්වා ගුණසේකර* මහතා හමුවීමට සිදුවිය. එතුමා ආඩම්බරකාර නිලධාරියෙකු වූ නිසා, එම සම්බන්ධතාවන් ඉතා සීරුවෙන් පවත්වා ගෙන යායුතු විය. එනමුත්, කෙනෙකු ගැන එතුමා පැහැදුණහොත්, ඉතා සාර්ථක නිල සම්බන්ධතාවක් ඇති කර ගත හැකිය. මා ගැන විශ්වාසය වැඩිවත් ම රාජකාරි කටයුතු ඉතා පහසු විය. පසු කාලයේ දී ලංකා ධීවර සංස්ථාවේ සේවය සඳහා රජයේ සේවයෙන් මුදා හැරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමේ දී අධ්‍යක්ෂතුමා මට බෙහෙවින් උපකාර කළේය.

උච්ච රැකියාවක් සොයා ගැනීම

1964 වසර තුළ උපාධි ප්‍රතිඵල නිකුත් කර උපාධි ප්‍රදානෝත්සවය ද පවත්වනු ලැබීය. එසේ වුවත්, බොහෝ කලක් ගතවන තුරු උපාධියට සරිලන පූර්ණ කාලීන තනතුරක් ලැබුණේ නැත. මෙයට කරුණු කීපයක් ද බලපෑවේය. අප උපාධිය ලබා ගත්තේ අලුතෙන් පිහිටුවන ලද විශ්ව විද්‍යාලයකිනි. එමෙන් ම, මෙම උපාධිය මීට පෙර මෙරටට හුරුපුරුදු එකක් ද නොවීය. එංගලන්තයේ සම්ප්‍රදායට පුරුදු ව සිටි මෙරට බොහෝ දෙනාට *"ඇමෙරිකන් මොඩලය"* බාල එකක් විය. පිරිවෙන් විශ්ව විද්‍යාලවලින් ලබා ගත්තේ *"ඇබින්න ඩිග්‍රී"* එකක් නොවේ ද යන්න ද සමහර කෙනෙකුට ගැටලුවක් විය.

මා උපාධි පාඨමාලාව හදාරන වකවානුවේ දී මුණ ගැසුණ ප්‍රේමාගේ ඥාතිවරයෙක් මට කීවේ මෙය, *"ඇබින්න ඩිග්‍රී"* එකක් යයි බොහෝ දෙනා කියන බවයි. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකයවත් ඔහුට තිබුණා දැ'යි සැක සහිතය. එසේ වුවත්, ඔහුට දුන් මගේ පිළිතුර වූයේ, "බළලා මීයන් අල්ලනවා නම්, ඉටියෙන් වුවත් මැටියෙන් වුවත් මට කම් නැති බවයි." කලක් ගතවන විට, හැම තැන ම දොර කවුළු විවර විය. මා සමඟ උපාධිය සමත් වූ බොහෝ දෙනා රජයේ ඉහළ තනතුරු දරා විශ්‍රාම ගත්හ. මම විශ්ව විද්‍යාල සේවයට ඇතුළුවීමි. එනමුත්, එයට ද කලක් ගත විය. උපාධි ප්‍රතිඵල නිකුත්වීමෙන් පසුව මහ බැංකුවේ මාණ්ඩලික තනතුරු සඳහා ඉල්ලුම් කළෙමි. සම්මුඛ පරීක්ෂණය සඳහා දිනක පස්වරු 1.30ට කැඳවා තිබිණි. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියට මා කැඳවූයේ පස්වරු 4.30ට පමණය. පැය කීපයක් වායු සමීකරණය කළ ශාලාවක ගත කළ නිසා, තදබල හිසරදයකින් පීඩා විඳිමින් සිටියෙමි. සම්මුඛ පරීක්ෂණයට සාර්ථක ව මුහුණ දීමට නොහැකි විය.

එම මණ්ඩලයේ මුලසුන දැරුවේ *ආචාර්ය ගාමිණි කොරෙයා* මහතාය. මෙම තනතුරට ඉල්ලුම් කිරීමට මට සුදුසුකම් තිබේ ද, යන්න ගැන ද ඒ

අය අතර කතිකාවක් ඇති විය. *කොරෙයා මහතා* කීවේ මා ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ තනතුරකට ඉදිරිපත් විය යුතු බවයි. පරිපාලන සේවයේ සිමිත තරග විභාගයට පෙනී සිටීමට ඉල්ලුවෙමි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබිණි. විවිධ සංස්ථා හා මණ්ඩල ආදියේ ද තනතුරු සඳහා ඉල්ලුම් කළෙමි. ඒ කිසිවක් ලැබුණේ නැත. ඒ තනතුරු සමහරකට අවශ්‍ය වූයේ උපාධි සුදුසුකමට වඩා පළපුරුද්දය. ඊටත් වඩා යම් අනුග්‍රහයෙකුගේ "තල්ලුවක්" අවශ්‍ය විය. මට එය තිබුණේ නැත. *බණ්ඩාරනායක අගමැතිනියගේ* රජය යටතේ *ජීලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමා* විසින් 1964 වසරේ දී ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කරන ලදී. එහි අධ්‍යක්ෂක මණ්ඩලයේ ආරම්භක සාමාජිකයන් වූයේ:

සභාපති	-	සිවිල් සේවයේ සෑම් සිල්වා මහතා
උප සභාපති	-	සිවිල් ඉංජිනේරු ගොඩවින් විතාන මහතා
ගණකාධිකාරි	-	ඊ.ද.එස්. වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ	-	ආර්ථික විද්‍යාඥ ජී.වී.එස්.ද සිල්වා මහතා
අධ්‍යක්ෂ	-	නාවික හමුදාපති රාජන් කදිරගාමර් මහතා

මෙම සංස්ථාවට අලුතෙන් කාර්යාල මණ්ඩලය බඳවා ගන්නා බවට දැන්වීමක් දැක, 1964-11-10 දින එහි V-ශ්‍රේණියේ තනතුර සඳහා ඉල්ලුම්පත් යැවීමි. එම තනතුරු සඳහා මාසික වැටුප රුපියල් 600/- ක් විය. මේ වනවිට රජයේ සේවයේ මට ලැබුණු මුදල මාසික ව රුපියල් 260/- ක් විය. පසුව VII ශ්‍රේණියේ තනතුරක් සඳහා මා තෝරා ගත් බව 1965.02.23 දින මට දන්වා තිබිණි. එම ශ්‍රේණියේ මාසික වැටුප රු. 500/=කි. මට එම තනතුර ලැබුණේ උපාධි සුදුසුකමට නොවේ. රජයේ සේවයේ වසර දහතුනක පළපුරුද්ද නිසාය. මේ තනතුර භාර ගැනීමට රජයේ සේවයෙන් මුදවා හැරිය යුතු විය. නැත්නම් මගේ රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ නැත. ඒ නිසා, 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 26 වැනි වගන්තිය යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට මාස හතරක් පමණ ගතවිය.

දේශපාලන හැලහැප්පීම්

1964 අග භාගය වන විට, මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ හැලහැප්පීම් ඇති විය. *සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ* රජය 1962 වසරේ සිට වැදගත් වෙනස්කම් කීපයක් ඇති කර තිබිණි. පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීම නිසා කතෝලික පල්ලිය දැඩි විරෝධතා ව්‍යාපාරයක් ගෙන ගියේය. එය සමනය කිරීමට ඉන්දියාවේ සිට කාදිනල්වරයෙක් මෙහි

පැමිණියේය. 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ සැකකරුවන් ද කතෝලික හෝ ක්‍රිස්තියානි ලබ්ධිකයෝ වූහ. 1962 වසරේ දී *රක්ෂණ* ව්‍යාපාරය ජනසතු කිරීම, බනිජ තෙල් ව්‍යාපාරය ජනසතු කිරීම, ලංකා බැංකුව රජයට පවරා ගැනීම, මහජන බැංකුව පිහිටුවීම වැනි කටයුතු රාශියක් ඉටු කරන ලදී. බනිජ තෙල් ව්‍යාපාරය ජනසතු කිරීම නිසා ඇමෙරිකා එක්සත් ජනපදය **පී.එල්. 480** නම් වැඩ සටහන යටතේ සපයන ලද තිරිඟු පිටි ආධාරය නතර කළේය.

එවකට පෞද්ගලික සමාගම් යටතේ පැවැති ප්‍රවෘත්ති පත්‍ර ව්‍යාපාරයෙන් ආණ්ඩුව දැඩි විවේචනයට ලක් කළේය. මේ නිසා ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමට යෝජනා කළ රාජාසන කථාව පරාජය කිරීමට ලේක්හවුස් අයිතිකරුවෝ විශාල ව්‍යාපාරයක් ගෙන ගියහ. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු හා මන්ත්‍රීවරු පිරිසක් රාජාසන කථා ස්තුති යෝජනාවට විරුද්ධ ව ඡන්දය දීමට පොළඹවා ගන්නා ලදී. එම රජයේ ඇමතිවරයෙකු වූ සී.පී.ද. සිල්වා මහතා ද ආණ්ඩුවට විරුද්ධ ව ඡන්දය දුන්නේය. ලංකා සමසමාජ පක්ෂය සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවට සහයෝගය දුන් නමුත්, පාර්ලිමේන්තුවේ දී ලැබූ පරාජය නිසා, එය විසුරුවා හැරීමට සිදුවිය. ආණ්ඩුවට සහයෝගය දැක්වීමට ගෝල්ෆේස් පිටියේ දී දැවැන්ත රැස්වීමක් පැවැත්විණි. කොමියුනිස්ට් පක්ෂයේ අනුග්‍රහයෙන් *"ඇන්න"* නම් අලුත් පත්‍රයක් ආරම්භ කරන ලදී. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව 1965 මාර්තු මාසයේ දී මහමැතිවරණයක් පවත්වන ලදී.

1965 මහ මැතිවරණය

රජයේ සේවයේ සිටිය දී මැතිවරණ රාජකාරී සඳහා අවසන් වරට ගියේ 1965 මාර්තු මැතිවරණයටයි. 1952 සිට සෑම මහමැතිවරණයක දී ම කුමන හෝ ප්‍රදේශයක මැතිවරණ රාජකාරී සඳහා සහභාගි වූයෙමි. 1965 මහ මැතිවරණයේ දී රාජකාරී සඳහා ගියේ මඩකලපුව දිස්ත්‍රික්කයේ *අඩ්ඩාලච්චේන* ඡන්ද මධ්‍යස්ථානයටයි. කොළඹ සිට මඩකලපුව රාත්‍රී දුම්රියෙන් ගොස්, මඩකලපුව දුම්රිය ස්ථානය අසල පාසලක දිනක විවේකයක් ගත කිරීමට තිබිණි.

මා සමඟ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ එකට සේවය කළ *මල්ලවරච්චි* සහ *ඇල්ලේපොල* යන දෙදෙනා ද මඩකලපුවට ගියහ. ඡන්දපොලට යා යුතු වූයේ පසුදින නිසා, *මල්ලවරච්චි* මහතා අඳුනන කෙනෙක් හමුවීමට අප තිදෙන බස්රියකින් කල්මුණේට ගියෙමු. එම තැනැත්තාගේ නිවස සොයා ගෙන ගොස් දිවා ආහාරයෙන් පසුව නැවත

මඩකලපුවට ඒමට පිටත් වූයෙමු. එවකට කල්මුණේ ප්‍රදේශය රෙදි විවීම සඳහා ප්‍රසිද්ධියක් ඉසුළුවේය. සරම්, සාරි වැනි රෙදිපිළි නිෂ්පාදනය කරන බව දැනගන්නට තිබිණි. මඩකලපුවට පැමිණි පසු එම නගරයේ ටිකක් ඇවිද්දෙමු. අප තිදෙනා ම මඩකලපුවට ගියේ පළමු වතාවටයි.

පසු දින විශේෂ බස් රියකින් *අඩ්ඩාලච්චේන විද්‍යාලයේ* පිහිටි ඡන්දපොලට ගියෙමු. නවාතැන් ගත්තේ ඒ අසල තිබුණ ගුරු විද්‍යාල පරිශ්‍රයේය. ඡන්දයට පෙර දින සවස *අඩ්ඩාලච්චේන* සිට සැතපුම් දෙකක් පමණ දුරින් පිහිටි *අක්කරෙයිපත්තුවට* ගියෙමු. ඡන්ද උණුසුම පැවැති නිසා, රෑබෝවීමට පෙර ආපසු නවාතැන්පලට පැමිණියෙමු. මැතිවරණ දිනයේ අප ඡන්දපොල භාර ප්‍රධාන නිළධාරියා වූයේ කොළඹ තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන දමිළ නිලධාරියෙකි. එනමුත් ඔහු අපටත් වඩා සිංහල උගතෙකු බව කථාබහෙන් තේරුම් ගියේය. ඡන්දපොල අසල විටින් විට නොයෙක් ආරාවුල් පැන නඟින විට, පොලීසිය ද සමඟ වහා ඒ තැන්වලට ගොස් කලහකරුවන් එළවා දැමීය.

අප සිටි ඡන්දපොල කාන්තාවන් සඳහා වූවකි. ඡන්දදායකයන් සියලු දෙනා ම මුස්ලිම් කාන්තාවෝ වූහ. ඒ අතර, *අත්තනගල්ලේ අලවල* කාන්තාවක් ද ඡන්දය දීමට පැමිණ සිටියාය. හොඳින් සිංහල කථා කළ ඇය විවාහය නිසා *අඩ්ඩාලච්චේනට* ගොස් සිටියාය.

ඡන්ද රාජකාරී අවසන් වී විශේෂ බස් රථයකින් නැවත මකඩලපුවට පැමිණ රාත්‍රී අටට පමණ කොළඹ බලා එන දුම්රියෙන් ආපසු පැමිණියෙමු. අතරමඟ දී දැනගන්නට ලැබුණු ඡන්ද ප්‍රතිඵල අනුව, එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණෙන බව දැනගතිමු. ඩඩ්ලි සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුව පිහිටුවන ලදී. *සී. පී. ද සිල්වා, පිලිප් ගුණවර්ධන, ඩබ්ලිව්. දහනායක, අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල* යන මහත්වරු ඇමති මණ්ඩලයට අයත් වූහ. *ජී.බී. වන්නිනායක* මහතා මුදල් ඇමතිවරයා වූ අතර, *ජේ.ආර්.ජයවර්ධන මහතා* රාජ්‍ය ඇමතිවරයා විය. *හොරොව්පතානේ මන්ත්‍රී ඊ.එල්.බී. හුරුල්ලේ* මහතා ප්‍රවාහන ඇමතිවරයා විය.

1965 වසරේ වැදගත් සිදුවීම්

මගේ ජීවිතය කෙරෙහි අඩුවැඩි වශයෙන් නොයෙක් බලපෑම් ඇති කළ අවුරුදු කීපයක් තිබිණි. 1965 අවුරුද්ද තුළ එවැනි වැදගත් සිදුවීම් කීපයක් ඇති විය. ඉහතින් සඳහන් කළ මහමැතිවරණය පැවති සමයේ **ප්‍රේමාට තවත් දරු උපතකට** හේතු වන ලකුණු පහළ විය. වැඩිමහල් දරු දෙදෙනා සම්බන්ධයෙන් ඇති වූ තත්වයට වඩා මේ අවස්ථාවේ මට කාර්ය බහුලත්වයක් ඇති කළේය. ගෘහණියක් වශයෙන් ප්‍රේමා මෙතෙක් අපට

ආහාරපාන සකසා දුන්නාය. එනමුත්, මෙවර මාස දෙක තුනක් ගතවන තුරු ඇයට මුළුතැන්ගෙයි කිසිවක් කළ නොහැකි විය. ආහාර අරුචියක් නොතිබුණත් කෑම උයන විට තදබල ඔක්කාර ගතියක් පැවතිණි. මේ වන විට වැඩිමහල් දරු දෙදෙනා ම පාසල් ගියහ. ලොකු දුව *විශාඛා විද්‍යාලයේ* තුන්වන පන්තියේ වූවාය. ලොකු පුතා *නුගේගොඩ ශාන්ත ජෝන් විදුහලට* ඇතුළු කළේ මේ වසරේ දී ය. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ නාවින්නේ පදිංචි ව සිටි ඒකනායක මහතා මට බෙහෙවින් ම උපකාර කළේය.

දරු දෙදෙනාට මෙන් ම ප්‍රේමාට හා මට ද ආහාර පිළියෙල කර තැබිය යුතු විය. ඒ නිසා, මා දිනපතා පාන්දර හතරට පමණ අවදි වී උදේ දවල් ආහාර උයා තැබුවෙමි. දරු දෙදෙනා පාසල් යැවීමට සූදානම් කළෙමි. ලොකු දුව දෙල්කඳ හන්දියේ සිට විශාඛා පාසල් බස් රථයේ පිටත් කළ හැකි විය. ලොකු පුතා පාසලට එක්කර ගෙන ගියේ මාය. දවල් වන විට ප්‍රේමා පාසලට ගොස් ලොකු පුතා ගෙදර එක්කර ගෙන ආවාය. ලොකු දුව ආපසු ගෙදර ආවේ පාසල් බස් රථයෙනි. අසල්වැසියෙකුගේ දරුවෙකු පාසලට එක්කර ගෙන ගිය ආච්චි සමඟ දෙල්කඳ හන්දියෙන් බැස ගෙදර ආවාය. ආච්චී නොසිටි දවසක වෙනදා බහින බස් නැවතුම පසුකර ගිය නිසා, අටේ කණුවේ නැවතුමෙන් බැස මහත් කම්පාවකින් ගෙදර පැමිණි බව එදින සවස ප්‍රේමා මට කීවාය. රාජකාරී නිමවා සවස ගෙදර පැමිණ අපගේ රාත්‍රී ආහාරය පිළියෙල කර ගතිමි. දෛනික කටයුතු බහුල වුවත් අවශ්‍ය සියලු දේ ම අතපසු නොවී සිදුවිණි.

1965 මහ මැතිවරණය පිළිබඳ උණුසුම අවට පරිසරයෙහි පැතිර ගියේය. මැතිවරණ රාජකාරී සඳහා මඩකලපුවට යෑමට සිදුවිය. ප්‍රේමාගේ මල්ලී *හරිස්* කොළඹ වැඩ කළ නිසා, ගෙදර නවත්වා යා හැකි විය. සිංහල අලුත් අවුරුද්ද සඳහා අපි හැම දෙනා ම මාතර මහ ගෙදරට ගියෙමු. පාසල් නිවාඩු කාලය නිසා *ප්‍රේමා* හා දරු දෙදෙනා එහි නවත්වා, මම රාජකාරී සඳහා කොළඹ පැමිණියෙමි. පාසල් නිවාඩුව අවසන් වූ පසු ඒ තුන්දෙනා නැවත කොළඹ එක්කර ගෙන ආවෙමි.

ලංකා ධීවර සංස්ථාවේ තනතුරු සඳහා අයදුම් කළේ ද මේ සමයේ දී ය. ඉහතින් සඳහන් පරිදි, 1965 ජූනි 15 දින සිට ක්‍රියාත්මක වන සේ, එම සංස්ථාවේ VII ශ්‍රේණියේ තනතුරක් ලැබී එය භාර ගෙන, එදිනට ගාලු මුවදොර පිහිටි ප්‍රධාන කාර්යාලයට සේවය සඳහා වාර්තා කළෙමි.

ලංකා ධීවර සංස්ථා සේවය

වසර දහතුන හමාරක් රජයේ ලිපිකාර සේවයේ නිරත ව සිට, චාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉවත් වී සංස්ථාවක සේවයට පිවිසීම ද නව මඟක් විවර කිරීමක් විය. විශ්‍රාම වැටුප් සහිත තනතුරකින් අර්ථ සාධක අරමුදල් හිමි තනතුරකට වෙනස් විය. සංස්ථාවල සංස්කෘතිය රජයේ සේවයට වඩා වෙනස් වේ. එනමුත්, ආරම්භක යුගයේ දී ලංකා ධීවර සංස්ථාවේ කටයුතු මෙහෙයවන ලද්දේ, රජයේ සේවයේ සිට සංස්ථාවට පැමිණි නිලධාරීන් පිරිසක් විසිනි. ඒ නිසා, වෙනස් වීම ප්‍රකට ව පෙනුණේ නැත. රජයේ සේවයට හුරුපුරුදු නීතිරීති රෙගුලාසි ව්‍යූහය තුළ කාලයක් සේවය කළ නිලධාරීන්ගේ සිතුම් පැතුම් ආකල්ප වෙනස් වූයේ, ඉතා සෙමිනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමහර සාමාජිකයන්ට ප්‍රබුද්ධ ආකල්ප තිබුණත් බහුතරයේ බලපෑම නිසා එතරම් නම්‍යතාවක් දක්නට ලැබුණේ නැත.

කාර්යාල පරිපාලනයේ ප්‍රධානියා වූයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුරු ඉසුළු, ලංකා සිවිල් සේවයේ නිලධාරියෙකු වූ, *ඊ.බී. තෙන්නකෝන් මහතාය.* එතුමා මහා භාණ්ඩාගාරයේ සේවය කළ කෙනෙකි. *ඉයුස්ටස් ජයසේකර* සහ *ඩී.ඩී.ජී. කරුණාරත්න* නම් වූ සහායක නිලධාරීන් දෙදෙනා ද *රාජපක්ෂ* නම් වූ ලිපිකාර මහතා ද මහාභාණ්ඩාගාරයේ සේවය කළ නිලධාරීහු වුහ. පුද්ගලයින් හැටියට මේ හැම දෙනා ම සුහදශීලී අය වූ නමුත්, ඒ අයට රාජකාරි ඉටුකිරීමට මඟ සලකුණු ලැබුණේ රජයේ නීති රීති රාමුවෙනි. ඒ අය එම රාමුව හොඳින් ම දැන සිටි නිසාය. මුදල් අංශයේ ප්‍රධානියා ලෙස වෘත්තීය ගණකාධිවරයෙකු සිටි නමුත්, ඒ අංශයේ කටයුතු ද රජයේ රාමුවෙන් පිටපැනිය නොහැකි විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වූ *වික්‍රමරත්න මහතා* අස්වී ගියාට පසුව, ගණකාධිවරයා වූයේ රජයේ රාමුව අනුගමනයට කැමති කෙනෙකි.

කෙසේ වෙතත්, අප කීප දෙනෙක් ජූනි මාසයේ සංස්ථා සේවයට බැඳුණු පසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් සංස්ථාවේ ඉදිරි දැක්ම ගැන කරුණු පැහැදිලි කිරීම සති දෙකක පමණ කාලයක් තුළ කරන ලදී. *ආර්ථික විද්‍යාඥ ජී.වී.එස්. ද සිල්වා මහතා, සභාපති සෑම් සිල්වා මහතා, උප සභාපති ගොඩිවින් විතාන මහතා* සහ *නාවික හමුදාපති කදිරගාමර් මහතා* වැනි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංස්ථාවේ නොයෙක් අංශ පිළිබඳ ව අපට දේශන පැවැත්වූහ. සංස්ථාව පිහිටුවීමේ අරමුණ ලෙස දැක්වූයේ, ධීවර කර්මාන්තය නඟා සිටුවන්නට නිෂ්පාදකයාටත් පාරිභෝගිකයන්ටත් සාධාරණයක් ඉටු කිරීමයි. සංස්ථාවේ ප්‍රාදේශීය ආයතන ජාලයේ සේවය කිරීමට බඳවා ගත් සහකාර කළමනාකරුවන්, ප්‍රධාන ලිපිකරුවන් ඇතුළු අනෙක් සහායක කාර්ය මණ්ඩලයට මෙසේ දැනුමක් ලබා දී, 1965 ජූනි මස අග දී පමණ රටේ නොයෙක් ප්‍රදේශවලට ඒ අය මාරු කර යවා, සති දෙක තුනක ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීමට පවරන ලදී.

ගාල්ලට මාරු කිරීම

මේ අතුව, 1965 ජූනි මස මස 28වැනි දින සිට මට ගාල්ලට මාරුවීමක් ලැබිණි. මාගාල්ලේ පිහිටි ධීවර දෙපාර්තමේන්තු කාර්යාලය සේවා ස්ථානය විය. *සඳනායක මහතා* සහකාර කළමනාකරු වශයෙන් පත්කර යවන ලදී. ගාල්ලේ ම කෙනෙකු වූ ලංසි මහතෙක් ද මෙතැනට අනුයුක්ත කරන ලදී. සඳනායක මහතාත් මාත් සති දෙකක් තුළ *අහංගම* සිට *බේරුවල* දක්වා වෙරළ තීරයේ පා ගමනින් ඇවිදිමින් ප්‍රදේශයේ පැවැති ධීවර කටයුතුවල ස්වභාවය සමීක්ෂණය කළෙමු. ධීවර කර්මාන්තයේ නිරතවූවන් මුණ ගැසුණෙමු. ඒ අයට සංස්ථාව ගැන කරුණු පැහැදිලි කළෙමු. මේ අතරතුර කොළඹ *සෙන්ට් ජෝන්* වෙළඳ *පොලේ* තොග වෙළෙඳුන් ගෙන ගිය බොරු ප්‍රචාර නිසා, සමහර තැන්වල දී අපට නොයෙක් අහිතකර ප්‍රතිචාර ලැබිණි. කෙසේ වෙතත්, පැය ගණන් ගත කර, සංස්ථාව නිසා ඒ අයට යහපතක් වීමට ඉඩ ඇති බව පහදා දුන් විට, තත්ත්වය සතුටුදායක විය. අප දෙදෙනාගේ මේ ව්‍යාපාරය අවසන් වූයේ *බේරුවල* වෙරළෙනි.

මාතරට මාරු කිරීම

මෙම අභ්‍යාසය අවසන් වූ විට, 1965 ජූලි 26වෙනි දා සිට මා තාවකාලික ව මාතරට මාරු කරන ලදී. මාතර පිහිටි අයිස් නිෂ්පාදනාගාර දෙකක් සංස්ථාවේ මෙහෙයවීම යටතට පත් කරගෙන, මාළු නිෂ්පාදන සංස්ථාවට යොමු කරවා ගැනීම මෙහි අරමුණ වූ බව පෙනේ. මාතර රාහුල පාරේ හරිශ්චන්ද්‍ර කර්මාන්ත ශාලාවට අයත් වූ අයිස් නිෂ්පාදනාගාරය හා මැද්දවත්තේ පිහිටි අයිස් නිෂ්පාදනාගාරය මේ ආකාරයට මෙහෙවන ලදී. ඒ සඳහා නිලධාරීන් කීප දෙනෙක් ඒ ස්ථානවල සේවයට යොදවන ලදී. අයිස් මිල දී ගැනීමට එන ධීවර වෙළඳුන්ට සංස්ථාවේ මැදිහත්වීමෙන් අයිස් සැපයීම අරඹන ලදී. ඒ ස්ථාන දෙකේ සේවයට යොදවන ලද ප්‍රනාන්දු, අමරසේකර, තෙන්නකෝන් හා ලංසි මහතා යන අයගේ කටයුතු මෙහෙයවීම හා ඒවාට සහභාගී වීම මගේ වගකීම විය. අයිස් මෝල් හිමිකරුවන් මේ සඳහා අවශ්‍ය පහසුකම් සැපයූහ. අප කීප දෙනා වැඩමුර ක්‍රමයට සේවයේ නිරත වූයෙමු. සමහර දවස්වල කෙනෙකුට සේවයට පැමිණීමට නොහැකි වුවහොත්, අන් අයට අතිකාල සේවයේ නිරත වීමට ද සිදුවිය. කෙසේ වෙතත්, ඊළඟ වැඩ මුරයට නියමිත තැනැත්තා පැමිණෙන තුරු කලින් වැඩ මුරයේ යෙදී සිටි අයට සේවා ස්ථානය හැර යෑමට නොහැකි විය. මෙම මැදිහත්වීම ගැන ද ධීවර වෙළඳුන් සමහර දෙනෙක් සැක පහළ කළ නමුත්, ඒ අයගේ ද හිත දිනා ගෙන කටයුතු කිරීම අපගේ වගකීම විය. අප සියලු දෙනා සංස්ථාවේ *"නානාපතිවරු"* ලෙස සලකන ලදී. අයිස් කම්හල් හිමියන් මෙම මැදිහත් වීමට කැමැති වූයේ, එතෙක් පැවැති යම් දූෂිත ගනුදෙනු මෙයින් වැළකී ගිය නිසාය.

1965 අගෝස්තු මස 16 දින නැවත මා ගාල්ලට මාරු කළ නමුත්, ඒ මාසයේ 21 දින සිට නැවත මාතරට මාරු කරන ලදී. ඒ වන විට මොහාන් එදිරිසූරිය නම් තරුණ නිලධාරියෙකු මාතර සහකාර කළමනාකරු ලෙස පත්කර එවන ලදී. එදිරිසූරිය මහතා විසින් මාතර කොටුවේ හෝටලයකට අයිති කාමරයක් අපගේ කාර්යාලය ලෙස යොදා ගැනීමට කුලියට ගන්නා ලදී. එතැන් සිට මාතර මැදවත්තේ පිහිටි මාළු පෙට්ටි කිරීමේ ස්ථානයට ගෙනෙන මාළු වෙළඳුන්ගෙන් ලබා ගෙන, කොළඹ ධීවර සංස්ථාවට යැවීමට වැඩපිළිවෙලක් යොදන ලදී. කොළඹ මෝදරට යවන ලද මාළුවලට ඉන්වොයිස් පත ධීවර සංස්ථාවෙන් මාතරට ලැබුණු විට, වෙළෙඳුන්ට ගෙවිය යුතු මිල ගණන් නිගමනය කොට ගැනීමේ බලය සහකාර කළමනාකරුට පවරා තිබිණි. ඒ නිසා, කොළඹ *සෙන්ට් ජෝන් වෙළඳපලේ* මිල ගණන් කුමක් වුවත් ඊට වැඩි මිලක් සංස්ථාවේ මාළු යවන වෙළඳුන්ට ගෙවීමට කටයුතු කළේය. ඒ නිසා වෙළඳුන් වැඩි වැඩියෙන් සංස්ථාවට මාළු දීමට කැමැත්ත දැක්වූහ. සංස්ථාවේ එසේ ඉහළ මිලක් ගෙවන්නේ කෙසේ ද, යන්න මෙම වෙළඳුන්ට ප්‍රශ්නයක් ව තිබිණි. සංස්ථාවට ඒවා ගබඩා කර තබා ගත හැකි වීම නිසා මාළු හිඟයක් පවතින විට, පාඩු නැති ව විකුණා ගැනීමට පුළුවන් බව අපේ තර්කය විය.

මාස කීපයකට පසුව *එදිරිසූරිය මහතා* හම්බන්තොටට මාරු කර, *නිස්ස ද සොයිසා* නම් වූ තරුණ මහතෙකු මාතර සහකාර කළමනාකරු වශයෙන් පත්කරන ලදී. ඔහුගේ කාලය තුළ අපගේ කාර්යාලය මාතර *බ්‍රෝඩ්වේ* පාරේ *කිංග්ස් හෝටලය* ඉදිරියේ *මොහොට්ටි දොස්තර මහතාට* අයිති ගොඩනැඟිල්ලකට ගෙන යන ලදී. එහි ඉහළ මහලේ ප්‍රමාණවත් ඉඩකඩ සහිත කොටසක් ලබා ගතිමු. ධීවර ආම්පන්න ගබඩා කර තබා ගෙන විකිණීම ආරම්භ කළෙමු. ඒ සඳහා කලින් ධීවර දෙපාර්තමේන්තුවේ සේවය කළ කෙනෙක් ගබඩා නිලධාරි වශයෙන් පැමිණියේය. ඔහු මාතර පොල්හේනේ පදිංචිකරුවෙකි. කොළඹ මාළු පෙට්ටි යැවීම ද තවදුරටත් කර ගෙන ගියෙමු.

මහනුවරට ස්ථාන මාරුව

1966 අප්‍රේල් මස 1වෙනි දා සිට මට මහනුවරට මාරුවීමක් ලැබිණි. සංස්ථාවේ අළෙවි ප්‍රවර්ධන කටයුතු ව්‍යාප්ත කිරීමට මහනුවර කාර්යාලය ආරම්භ කරන ලදී. *නිස්ස ද සොයිසා, ටී.එම්.ඩී.කේ.තෙන්නකෝන්* හා මා මාතර සිට මහනුවරට මාරු කරන ලදී. මහනුවර සහකාර කළමනාකරු වූයේ *එම්.එච්.ගුණවර්ධන* මහතාය. *ප්‍රනාන්දු* නමින් අළෙවි නිළධාරීවරයෙක් ද මහනුවරට යවන ලදී. ඒ වන විට මහනුවර නාගරික වෙලඳපොලේ

තිබුණ සමූපකාර මාලු වෙළඳ සැලක් ද සංස්ථාව යටතට ගෙන තිබිණි. ඒ වෙළඳසලේ *ඒ.එම්.එස්.බංඩාර* නම් වෙළඳ සහායකයෙක් සේවය කළේය.

ක්වීන්ස් හෝටලයේ පළමු වන මහලේ කාමර තුනක් කුලියට ගෙන මහනුවර දිස්ත්‍රික්කයේ කාර්යාලය එහි ආරම්භ කරන ලදී. මම ප්‍රධාන ලිපිකරු ලෙස කටයුතු කළෙමි. *වික්‍රමසිංහ* හා *නවරත්න* යනුවෙන් තවත් ලිපිකරුවන් දෙදෙනෙක් වූහ. *කැන්ඩි අයිස් කොම්පැණියට* අයත් අම්පිටියේ ගොඩනැගිල්ලක මාළු තොග ගබඩාවක් ආරම්භ කිරීමට ඉඩකඩ ලබාගන්නා ලදී. එහි ගබඩා නිලධාරී ලෙස පතිරණ මහතා කටයුතු කළේය. සේවකයින් කීප දෙනෙක් අලුතෙන් බඳවා ගන්නා ලදී. බෙදාහැරීමේ නිලධාරියා වශයෙන් සිල්වා මහතා කොළඹ සිට මාරුවී පැමිණියේය. ටික කලකට පසුව ගුණවර්ධන මහතා මාරු වී ගොස්, එදිරිසූරිය මහතා සහකාර කළමනාකරු වශයෙන් පත් වී ආවේය. ඔහු මාතර දී මා දැන හැඳින සිටි කෙනෙකි. එදිරිසූරිය මහතා මාරු වී ගොස් *ඩබ්ලිව්.පී.එස්. අබේදීර* මහතා මහනුවර දිස්ත්‍රික්කයේ සහකාර කළමනාකරු ලෙස පත්විය. මා මහනුවරින් මාරු වී යනතුරු ම සේවය කළේ අබේදීර මහතා සමඟයි. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීමට තේරුණු පසු, කොළඹට මාරුවීමක් ඉල්ලා සිටියෙමි. ඒ අනුව, 1968 මාර්තු 1වන දින සිට කෙළඹට ස්ථාන මාරුවීමක් ලැබිණි.

පදිංචිය වෙනස්වීම හා ආනුශංගික කරුණු

ලංකා ධීවර සංස්ථාවේ රැකියාව ලැබෙන විට අප පදිංචි ව සිටියේ උඩහමුල්ලේය. ඒ වන විට ප්‍රේමාගේ දරු ගැබට මාස හතරක් පමණ වීය. 1965 ජූනි මස අවසානයේ දී පිට පළාත්වල සේවය සඳහා යා යුතු විය. පළමුවෙන් ගාල්ලට ද ඉන් පසුව මාතරට ද මාරුවීම් ලැබිණි. ගාල්ලේ සේවය කළ කාලයේ දී ද එහි පැමිණියේ *මාතර නල්පාවිල* මහගෙදර සිටය. අගෝස්තු මාසයේ 21 දින සිට මාතරට මාරු කළ පසුව, තවදුරටත් ප්‍රේමාට තනිව ම දරු දෙදෙනාගේ වැඩ කටයුතු ඉටුකරමින් කොළඹට වී සිටීම අපහසු විය. දරු ගැබ මෝරන විට වැඩි වැඩියෙන් මගේ හෝ වැඩිහිටියන්ගේ උපකාරය අවශ්‍ය විය. ඒ නිසා අපගේ පදිංචිය වෙනස් කිරීමට තීරණය කළෙමු. ඒ අනුව, ගෙවල් බඩු ආදිය ද රැගෙන මාතර මහ ගෙදර පදිංචියට ගියෙමු.

ලොකු දුව පාසලෙන් අස් නොකර, ප්‍රේමාගේ ලොකු කුඩම්මලාගේ මැනිං ටවුමේ ගෙදර නැවැත්වූයෙමි. ලොකු කුඩම්මාගේ දියණිය ද විශාඛා විද්‍යාලයේ ඉගෙන ගත් නිසා, අපේ දුවට ද ඇය සමඟ පාසල් යා හැකි විය. ලොකු කුඩම්මා ද ප්‍රේමාට උදව් උපකාර කිරීමට කැමැති කෙනෙක් වූවාය. ඒ නිසා දරුවාට අසීරු තත්ත්වයක් ඇති නොවේය, යන විශ්වාසය අප තුළ

තිබිණි. ලොකු පුතා නුගේගොඩ සාන්ත ජෝන් විදුහලෙන් අස්කර ගෙන ගොස් මාතර රාහුල විද්‍යාලයට ඇතුළු කළෙමු. ඒ කාරණයේ දී ප්‍රේමාගේ හිංගි කුඩම්මාගේ පුතෙක් අපට උදව් කළේය. ලොකු පුතා තල්පාවිල සිට රාහුල විද්‍යාලයට පාසල් වෑන් රථයකින් ගියේ ආවේය. ප්‍රේමාට උදව් උපකාරයට ඇගේ මැණියන් ද නංගිලා දෙදෙනෙක් ද වූහ. *චන්ද්‍රා නංගී මාතර මොහොට්ටි දොස්තර මහතාගේ* වාට්ටුවේ හෙද සේවයේ නිරත ව සිටියාය. ප්‍රේමාගේ "පුංචි අයියා ද" ගෙදර සිට මාතරට රැකියාවට ගියේය. අපගේ කාර්යාලය ද මාතර නගරය තුළ පිහිටි නිසා දිනපතා මහගෙදර සිට සේවයට ගියෙමි.

පොඩිදුවගේ උපත

දරු උපත ළංවත් ම *ප්‍රේමා* මොහොට්ටි වාට්ටුවට ඇතුළු කළෙමු. 1965 නොවැම්බර් 25 දින පෙරවරුවේ මගේ පොඩිදුව උපත ලැබුවාය. මොහොට්ටි දොස්තර මහතාත්, චන්ද්‍රා නංගීත් දරු උපතට උපකාර කර තිබේ. මේ දරුවාට *"දයානි භද්‍රා නිල්මිණි"* යන නම තැබුවෙමි. මව සහ දරුවා සුවයෙන් සිටි නිසා දවස් දෙක තුනකට පසුව ගෙදර යන්නට හැකි විය.

මේ අතරතුර ප්‍රේමාගේ පවුලේ සහෝදරයන් දෙදෙනෙක් විවාහ පත්වූහ. පුංචි අයියා නාකියාදෙණිය ප්‍රදේශයේ තරුණියක හා විවාහ විය. ප්‍රේමාගේ බාල මල්ලී රාමා, තරුණ පාසල් ගුරුවරියක සමඟ විවාහ විය. රාමා තේ වත්තක රැකියාව කළ නිසා ගෙදර පදිංචි වූයේ නැත. පුංචි අයියා මහ ගෙදර ම පදිංචි විය.

ලොකු පුතාගේ පාසලට ගමන් පහසුව මෙන් ම මගේ ගමන් පහසුව ද මහ ගෙදර ඉඩකඩ ආදිය ද සලකා, මාතර නගරය ආශ්‍රිත ව පදිංචියට නිවසක් සෙවීමේ නිරත වීමි. මා සමඟ සේවය කළ ගබඩා නිළධාරී පීටර් සිල්වා මහතා පඹුරණ නිවසක් තිබෙන බව කී නිසා ඔහු සමඟ ගෙවල් හිමියා හමුවීමට කඹුරුගමුවට ගියෙමු. ගෙවල් අයිති තැනැත්තා මට තම නිවස කුලියට දීමට එකඟ විය. ඒ අනුව ගාලු පාරේ මාතර නගර සීමාව අසල පිහිටි නිවසේ පදිංචියට ගියෙමු. එම නිවස ඉඩකඩ තිබෙන වත්තක් තුළ පිහිටා තිබිණි. කාමර තුන හතරක් තිබිණි. මුළුතැන්ගෙය වෙන ම විය. නල ජලය හා විදුලි ආලෝකය ද තිබිණි. මාතර මහ ගෙදර මෙම පහසුකම් තිබුණේ නැත. මේ නිසා ප්‍රේමාටත්, මටත්, ලොකු පුතාටත් සියලු පහසුකම් ඇති නිවසක පදිංචි වීමට ලැබිණි. එනමුත්, මෙහි තිබුණ එක ම "භයානක" දේ වූයේ පඹුරණ ප්‍රදේශය බරවා මදුරු විමානයක් වීමයි. ඒ නිසා බිළිඳු දරුවා නිතර ම මදුරු දැලක් තුළ තැබීමට වග බලා ගත යුතු විය.

මහනුවර නාපාන හා ලේවැල්ලේ පදිංචිය

මාතර සිට මහනුවරට මාරුවීමෙන් පසුව පදිංචියට තැනක් සොයා ගැනීම පිණිස පළමුවෙන් කඩුගන්නාවට ගියෙමු. *ගුණතිලක මල්ලී* කඩුගන්නාවේ සෙනෙවිරත්න පවුලේ *පද්මා නංගී* සමඟ විවාහ වී එම මහ ගෙදර නැවතී සිටියේය. මගේ ස්ථාන මාරුව ගැන දැන්වූ විට ඒ මල්ලී ටික දවසකට එහි එන ලෙස මට කීවේය. ඒ අනුව මගේ ගෙවල් බඩු සියල්ල දුම්රියෙන් මහනුවරට යවා අපි ද දුම්රියෙන් කඩුගන්නාවට ගියෙමු. ගුණතිලක මල්ලීගේ මාමණ්ඩිය විශ්‍රාමික ගුරුවරයෙකු විය. එතුමා අප සුහදත්වයෙන් පිළිගත්තේය.

කඩුගන්නාවට ගිය වහා ම *නාපාන තෙන්නකෝන්* මහතා හමුවීමට ගියේ එතුමාගේ ගෙයක් තිබෙන බවට ලැබුණු හෝඩුවාවක් නිසාය. මහනුවරින් මඩවලට ගොස් එතැනින් සිරිමල්වත්ත පාරේ සැතපුම් භාගයක් පමණ ගිය විට, විශ්‍රාමික ගුරුවරයෙකු වූ තෙන්නකෝන් මහතාගේ නිවස හමුවේ. මෙතුමා මා කුඩා කාලයේ වලල මධ්‍යම පාසලේ හයේ පන්තියේ ගුරුවරිය වූ *ජී.එම්.තෙන්නකෝන් මැතිනියගේ සැමියාය.* මා කවුරුන් දැ'යි මතක් කර දුන් විට එතුමිය ද තම දරු කෙනෙක් ලෙස මා පිළිගත්තාය. මහපාර අයිනේ ම තෙන්නකෝන් මහතාගේ ඉඩමේ ගෙයක් ඉදිවෙමින් පැවතිණි. එහි වැඩ අවසන් වීගෙන එන නිසා, දින දෙක තුනකින් පදිංචියට සූදානම් කර දිය හැකි බව කීවේය. ඒ අනුව 1966 සිංහල අවුරුද්දට සතියක් හමාරක් තිබිය දී, නාපාන මෙම නිවසේ පදිංචියට ගියෙමු. මහනුවර දුම්රිය ස්ථානයට ළඟා වී තිබුණ මගේ ගෙවල් බඩු නාපානට ගෙන ගියෙමු. ලොකු දුව ද කොළඹ සිට අප සමඟ මහනුවරට එක්කර ගෙන ගියෙමු.

මහනුවරට මාරුවීමෙන් පසුව ලොකු පුතා ධර්මරාජ ප්‍රාථමික පාසලට ඇතුළු කළෙමි. ඒ සඳහා ධර්මරාජ විදුහලේ ගුරුවරයෙකු වූ ගුණතිලක මල්ලිගේ මස්සිනා කෙනෙක් අපට උපකාර කළේය. ලොකු දුව මේ වන විට මාස හයකට වැඩි කාලයක් මැනිං ටවුමේ ලොකු කුඩම්මලාගේ ගෙදර සිට පාසල් ගියාය. නිවාඩු කාලයක මාතරට එක්කර ගෙන යෑමට මා පැමිණි විට මේ දරුවා ඉතා අහිංසක පෙනුමකින් ඉන්නවා දුටිමි. නෑදෑයින් කොපමණ හොඳින් දරුවා රැකබලා ගත්තත් එය තම නිවස නොවන බවට හැඟීමක් ලොකු දුවට තිබෙන්නට ඇතැ'යි සිතුවෙමි. ඒ නිසා, මහනුවරට මාරු වී ගියාට පසුව ඒ දරුවා මහාමායා විද්‍යාලයට ඇතුළු කිරීමට පියවර ගතිමි.

මහනුවර අධ්‍යාපන කාර්යාලයට ගොස් ස්ථාන මාරුවීම මත පාසලට ඇතුළු කිරීමට තිබුණ විධිවිධාන යටතේ මහාමායා විදුහල්පතිනියට දීමට ලිපියක් ඉල්ලා ගතිමි. විදුහල්පතිනිය හමු වූ විට එතුමිය මට කීවේ, එම පාසලේ ඇත්තේ අදාළ ශ්‍රේණියට එක පන්තියක් පමණක් බවත් ඒ වන

විටත් එම පන්තියේ ශිෂ්‍යාවන් පනස් දෙනෙක් සිටින නිසා, තවත් කිසිවෙක් ඇතුළු කිරීමට නොහැකි බවත්ය. උසස් බාලිකා පාසල වැනි වෙනත් පාසලකට ඇතුළු නොකරන්නේ මන්දැ'යි මගෙන් විමසුවාය. මගේ දියණිය කොළඹ තිබෙන ඉහළ ම ගණයේ බෞද්ධ කාන්තා විදුහලේ ඉගෙන ගන්නා බවත්, මහනුවරදීත් එවැනි පාසලකට ඇතුළත් කිරීමට අවශ්‍ය බවත්, ඒ නිසා *මහාමායා විදුහලට* ප්‍රවේශය අපේක්ෂා කරන බවත් එතුමියට කීවෙමි. එතුමියගේ පිළිතුර වූයේ "දැන් බෞද්ධ පාසල් නැහැ, හැම පාසලක් ම රජයේ පාසල්" බවය. විශාඛා, මහාමායා වැනි පාසල් රජයට පවරා ගත්තත් මෙරට බෞද්ධ පරිසරයක් පවත්වා ගෙන යන්නේ යයි මා විශ්වාස කරන බව කීවෙමි. ඉඩ නැතැ'යි කොපමණ කීවත් මා වාඩි වී සිටි අසුනෙන් නැඟී සිටින්නේ නැති ව තව දුරටත් රැඳී සිටින විට, විදුහල්පතිනිය අවසාන වශයෙන් මගෙන් ප්‍රශ්න කළේ, අධ්‍යාපන කාර්යාලයෙන් ගෙනා ලිපිය ගත්තේ කාගෙන් ද යන්නයි. එය දුන් තැනැත්තා මා නොහඳුනන බවත් එම කාර්යාලයේ සිටි කෙනෙක් එය මට දුන් බවත්ය. අවසාන වශයෙන් මගේ දියණිය රැගෙන එන ලෙස එතුමිය කීවාය. ඒ අනුව කොළඹ ගොස් විශාඛා විදුහල්පතිනිය මුණගැසී මගේ අවශ්‍යතාව සඳහන් කළෙමි. දරුවා එම පාසලෙන් අස් කර ගන්නේ මන්දැ'යි එම විදුහල්පතිනිය *සූසන් පුලිවූඩ් මහත්මිය* මගෙන් විමසුවාය. කරුණු පැහැදිලි කළ පසු, අස්වීමේ ලියකියවිලි සකසා දුන්නාය. මගේ දියණියට ආශීර්වාද කළාය. පසුදින *මහාමායා විදුහලට* දරුවා සමඟ ගොස් ඇය එම පාසලට ඇතුළු කළෙමි.

ඉන්පසුව මහනුවරට එන සිරිමල්වත්ත බස්රියෙන් පැමිණ වැව රවුමේ දී අම්පිටියේ බසයට මාරු වී මහාමායා විද්‍යාලය වෙත යෑමට පුරුදු කළෙමි. ගුන්නෑපාන, නාපාන, ආදී ප්‍රදේශවලින් මහාමායා විද්‍යාලයට යන දරුවන් හා එකතුව පාසල් යෑමට පටන්ගත් නිසා, දිනපතා මට දරුවා සමඟ පාසල් යෑම අවශ්‍ය නොවීය. පාසල ඇරී ගෙදර එන ගමන ද අනෙක් දරුවන් සමඟ යන්නට පුරුදු විය. ලොකු පුතා උදේ මා සමඟ පාසලට පැමිණ ආපසු ගෙදර ගියේ අසල්වැසි සිසුවෙකු එක්ක යන ඔහුගේ පියා සමඟය. ලොකු දුව ද එම බස්රථයෙන් ගෙදර ගිය නිසා දෙදෙනාට ම එකට ගෙදර ළඟ දී බසයෙන් බැසීමට හැකි විය. මේ දෙදෙනා පාසල් ගිය විට ප්‍රේමා පොඩි දුවත් සමඟ ගෙදරට වී සිටියාය. මගේ කාර්යාලය ද මහනුවර පිහිටා තිබුණ නිසා වැඩ ඉවර වී ගෙදර එන විට රෑ බෝවී තිබිණි.

නාපාන නිවසේ විදුලි ආලෝකය තිබිණි. අසල ළිඳකින් පොම්ප කළ ජලය තෙන්නකෝන් මහතාගේ ගෙදර ජල ටැංකියකින් නල මාර්ග යෙන් ලැබුණි. එනමුත් ස්නානය කිරීම ආදියට ප්‍රමාණවත් නොවීය. ඒ නිසා, සමහර විට සති අන්තයේ බස් එකේ නවයාලතැන්නට ගොස් මහවැලි ගඟෙන් නාගෙන ආවෙමු. ගඟේ නෑමෙහි අවදානමක් ද තිබිණි. මේ අතරතුර

ලේවැල්ලේ පදිංචි ව සිටි මගේ පාසල් මිතුරෙක් ලේවැල්ලේ ඇති ගෙයක් ගැන පණිවිඩය මට දුන්නේය. ඒ ගැන සොයා බැලූ විට ඒ නිවසට විදුලි බලය තිබුණේ නැත. ගේ අසල මහපාරේ ජල කරාමයක් තිබිණි. එයින් පහසුවෙන් පානීය ජලය ලබා ගත හැකි විය. ටික දුරක් පයින් ගිය විට මහවැලි ගඟෙන් නෑමට හැකි විය. දරුවන්ගේ පාසල්වලට දුර ප්‍රමාණය බොහෝ අඩුවිය. ඒ නිසා, ලේවැල්ලේ එම නිවස කුලියට ගෙන එහි පදිංචියට ගියෙමු. මගේ කාර්යාල ගමන ද වඩා පහසු විය. අසල්වැසි නිවසක සිටි දරුවන් සමඟ මගේ දරු දෙදෙනා ද ලේවැල්ලේ බස්රියෙන් පාසල් ගියහ. ඒ සඳහා වියදම මෙන් ම කාලය ද ඉතුරු විය.

ලේවැල්ලේ ගෙදර සිටි කාලය තුළ අපගේ නෑදෑයින් කීප දෙනෙක් ම විටින් විට පැමිණියහ. අපේ අම්මා සති දෙක තුනක් අප නිවසේ ගත කළාය. පසුව බඹරදෙණියේ නැන්දම්මා තම බාල දියණියත් සමඟ වරක් එහි පැමිණියාය. ප්‍රේමාගේ අම්මා සහ චන්ද්‍රා නංගී නුවර ඇසල පෙරහැර සමයේ දී පැමිණ පෙරහැර බලා ආපසු ගියහ. ගුණතිලක මල්ලී සමඟ නිතර සම්බන්ධතාවක් පවත්වා ගෙන ගියෙමි. ඒ වන විට ඔහු උඩරිරියගම පද්මා නංගිලාගේ ඉඩමක කාමර දෙකක ගෙයක් ඉදිකර ගෙන එහි පදිංචියට පැමිණ සිටියේය. ඒ ඉඩමේ ලොකු නිවසක් ඉදිකර ගැනීමට සැලසුම්කර නිවාස දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් ඉල්ලා සිටියේය. එවකට නිවාස දෙපාර්තමේන්තුවේ මහනුවර සහකාර කොමසාරිස්වරයා වූයේ මා සමඟ වලල මධ්‍යම පාසලේ ඉගෙන ගත් *ඒ.ඩබ්ලිව්.ජයවර්ධන මහතාය.* ගුණතිලක මල්ලී ඒ මහතාට හඳුන්වා දී නිවාස ණය ලබා ගැනීම පහසු කළෙමි. ඒ කාලයේ ම අප සමඟ ඉගෙන ගත් *එච්.බී.රාජපක්ෂ මහතා* මහනුවර මර්කන්ටයිල් බැංකුවේ සේවය කරමින් ලේවැල්ලේ පදිංචි ව සිටියේය. ලේවැල්ල නිවස මට සොයා දුන්නේ රාජපක්ෂ මිතුරාය. මහනුවර කච්චේරියේ සේවය කළ අපේ අයියා ද එවකට පදිංචි වී සිටියේ *අරුප්පොල* රජයේ නිවාසයකයි. එය මගේ නිවසේ සිට පයින් යන දුරින් පිහිටා තිබිණි.

ලේවැල්ලේ ගෙදර දී වයස අවුරුදු එක හමාරක් පමණ වූ පොඩි දුව ලොකු දුවගේ ඔඩොක්කුවේ සිටිය දී හදිසියේ ම සිහි නැති වී කඩා වැටී ඇත. වහා ම අසල්වැසියෙකු සමඟ මහනුවර මහ රෝහලට ගිය ප්‍රේමා, පොඩි දුවට ප්‍රතිකාර ලබාගෙන මා සේවය කළ තැනට පැමිණියාය. ඉන් පසුව බොහෝ කාලයත් ගතවන තුරු එවැනි අසනීපයක් වැළඳුණේ නැත.

කොළඹට මාරුවීම - මිරිහානේ පදිංචිය

1968 වසරේ දී පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීමට කොළඹට මාරුවීමෙන් පසුව ද නැවත ගැටලු කීපයක් පැන නැඟිණි. පදිංචියට ගෙයක්

සොයා ගත යුතු විය. දරු දෙදෙනාට කොළඹ පාසල් දෙකක් සොයා ගත යුතු විය. මා මුලින් කොළඹට පැමිණ විමලවත්තේ ලොකු කුඩම්මලාගේ නිවසේ සිට දේශනවලට සහභාගී වූයෙමි. ලොකු පුතා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළු කර ගැනීමට හැකිවිය. ඒ සඳහා නැවත වරක් ගුණතිලක මල්ලීගේ මස්සිනා උපකාර කළේය. ඒ වන විට ආනන්ද විද්‍යාලයේ විදුහල්පති වූයේ *ඊ.ඒ.පෙරුසිංහ මැතිතුමාය.* එම පාසලට ප්‍රවේශය ලැබුණ පසු, මිරිහානේ ෂොක්මන් පෙදෙසේ විසූ ප්‍රේමාගේ "හින්නි මාමාගේ" නිවසේ ඉදිරිපස කාමරය මටත් ලොකු පුතාටත් නැවතීමට ලැබිණි. ඒ අසල පදිංචි ව සිටි *කහවත්ත* මහතාගේ පුතෙක් ද ආනන්ද විද්‍යාලයට ගියේය. ඔහු ආවේ ගියේ පාසලේ ආදී ශිෂ්‍ය සංගමයේ පාසල් වෑන් රථයකිනි. මගේ පුතා ද ඒ වාහනයෙන් යැවීමට කටයුතු සලසා ගත් නිසා, ඒ සම්බන්ධයෙන් කරදර වීමට සිදුවූයේ නැත.

ලොකු දුවට කොළඹින් පාසලක් නොලැබුණ නිසා, ප්‍රේමාට තව දුරටත් ලේවැල්ලේ නැවතී සිටීමට සිදුවිය. මේ වන විට කොළඹ විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වූයේ මහනුවර උසස් බාලිකා පාසලේ විදුහල්පතිනිය ව සිටි හේමා ජයසිංහ මහත්මියයි. එතුමිය මුණගැසී මේ ගැටලුව විසඳා ගැනීමට ප්‍රයත්න දැරුවේ නැත්තේ එතුමිය ඒ සඳහා සතුටුදායක ප්‍රතිචාරයක් නොදක්වනවා ඇත, යන අදහස නිසාය. මහ බැංකුවේ සේවය කළ මගේ මිත්‍ර **ඒ.එම්.එස්. රදලියගොඩ මහතා** මේ සඳහා ඉදිරිපත් විය. මගේ මිත්‍රයා මා සමඟ ගොස් ඉලංගරත්න මැතිනිය මුණගැසී මේ ගැන සඳහන් කළේය. එතුමියගේ මැදිහත්වීමෙන් දරුවා නැවතත් විශාඛා විද්‍යාලයට ඇතුළු කිරීමට හැකි විය. "හින්නි මාමා" ගේ මැදිහත්වීමෙන් මිරිහාන විජේසේකර මාවතේ එදිරිසිංහ මුදලාලිගේ ගෙයක් කුළියට ලබා ගතිමි. ඒ නිසා ලේවැල්ලේ තිබුණ ගෙවල් බඩු ගෙනැවිත් මුළු පවුල ම සමඟ මේ කුඩා නිවසේ පදිංචි වූයෙමු. මා වෙනුවට මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට මාරු වී ගිය පිරිස් මහතා ලේවැල්ලේ ගෙයි පදිංචියට ගියේය.

එදිරිසිංහ මුදලාලිගේ කඩේ පිටුපසින් පිහිටා තිබුණ මේ ගෙයි ඉඩකඩ සීමා සහිත වුවත් විදුලි ආලෝකය හා නල ජලය තිබිණි. එකිනෙකට සම්බන්ධ ඉස්තෝප්පුවත්, කාමර දෙකක් හා මුළුතැන්ගෙයක් තිබිණි. හදිසි අවශ්‍යතාව පිරිමසා ගැනීමට මෙය ප්‍රමාණවත් වුවත් එහි පැමිණි පසු ඉඩකඩ වැඩි නිවසක් සොයා ගැනීමට ප්‍රයත්න දැරුවෙමි. මේ නිවසේ පදිංචියට පැමිණි පසු, පොඩිදුව නැවත වරක් අසනීප වී උණ වැඩිවීම නිසා, වළිප්පුව ද හැදුණේය. *මහරගම දොස්තර සිල්වා මහතාගෙන්* ප්‍රතිකාර ලබා ගතිමු. නැවත වළිප්පුව හැදුණේ නැති නමුත් උණගැනුණු විට දරුවා ප්‍රවේශම් කර ගැනීමට මහත් වෙරදරුවෙමු.

විජේසේකර මාවතේ නිවසක පදිංචි වී සිටි *කොගින්ස් මහතා* ඔහුගේ නිවසට අල්ලපු වත්තේ පිහිටි නිවසක් හිස් ව තිබෙන බව දිනක් මට කීවේය. ගෙවල් හිමියා සේවය කළේ තැප්‍රොබේන් හෝටලයේය. *කොගින්ස්* මහතා සමඟ ගොස් ඔහු හමුවී, විජේසේකර මාවතේ අංක 30 දරණ නිවස කුළියට ලබා ගතිමි. ඒ ගෙයි අයිතිකරු *හෙක්ටර් ජයනෙත්ති* නම් හික්කඩුවේ පදිංචිකරුවෙකි. දින කීපයක් තුළ එදිරිසිංහ මුදලාලිගේ නිවස හිස්කොට, ජයනෙත්ති මහතාගේ නිවසට පැමිණියෙමු. එය ඉඩකඩ ඇති වත්තක් තුළ පිහිටා තිබිණි. නිදන කාමර තුනක්, කෑම කාමරයක් ලොකු සාලයක් යනාදියෙන් යුක්ත වූ ඒ නිවසේ මුළුතැන්ගෙය පහළ තලයක ඉදිකර තිබිණි. විදුලි ආලෝකය තිබුණේ නැත. බීමට නෑමට ජලය ගේ අසල වූ ළිඳකින් ලැබිණි. අල්ලපු වත්තේ *කොගින්ස්* පවුල පදිංචි ව උන්හ. අනික් පැත්තේ පෙරේරා නමැති පවුලක් වූහ. ලොකුවුව බස්රථවලින් පාසල් ගියාය. ලොකු පුතා තව ටික කලක් වෑන් රථයෙන් ගියේය.

1970 ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා ධීවර සංස්ථා සේවකයන් වැඩ වර්ජනයක නිරත ව සිටියහ. මාණ්ඩලික නිලධාරීන් ද මැයි මාසය වනතුරු වර්ජනයේ නිරත ව උන්හ. මේ නිසා, මාස හතරක කාලයක් කිසිම වැටුපක් සංස්ථාවෙන් ලැබුණේ නැත. ඉතා ම අසීරු කාල පරිච්ඡේදයක් විය. මගේ දරු පවුල නඩත්තු කරගත්තේ විද්‍යොදය විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්වරයෙකු වශයෙන් ලැබුණු සුළු මුදල හා පුෂ්පාරාමයේ පැවැති බාහිර උපාධි පන්තියක ඉගැන්වීමෙන් ලැබුණ සුළු මුදලෙන්ය. වැඩ වර්ජනයට පෙර මාසික ව රුපියල් හාරසිය තිහකට වැඩි මුදලක් අතට ලැබිණි. අතිරේක ඉගැන්වීම්වලින් රුපියල් දෙසිය පනහක් පමණ ලැබුණේය. දැන් මාසික වැටුප නැති නිසා, රුපියල් දෙසිය පනහකින් සියලු වියදම් පියවා ගත යුතු විය. මෙය ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් විය. මින් පෙර කිසිදාක මෙවැනි අත්දැකීමකට මුහුණ දී තිබුණේ නැත.

වැඩ වර්ජනයෙන් පසුව සංස්ථාවේ වැඩ කටයුතු යථා තත්ත්වයට පැමිණි පසු, ත්‍රිකුණාමලයේ චීන වරායේ ධීවර වරාය ඉදිකිරීම් කටයුතුවල නිරත වී සිටි සේවකයින් පිරිසකගේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් නිසා එම වැඩ කටයුතු අඩාල වී තිබිණි. එම සේවකයන් මෙහෙයවූයේ කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලට අයත් සේවකයෙකු විසින් යැයි කියන ලදී. වරාය ඉදිකිරීම් භාර ව සිටි ඉංජිනේරුවරයාගේ ඉල්ලීමක් පරිදි ඒ ගැන විමර්ශනයක් කරන ලෙස ප්‍රධාන කාර්යාලයෙන් මට පවරන ලදී. ඒ අනුව, දිනක් රාත්‍රී තැපැල් දුම්රියෙන් ත්‍රිකුණාමලයට ගොස් විමර්ශන කටයුතු ආරම්භ කළෙමි. දින කීපයක් එහි ගත කළ යුතු විය. මට නැවතීමේ පහසුකම් සලසා තිබුණේ ත්‍රිකුණාමල කොටුව තුළ වූ නාවික හමුදා පරිශ්‍රය තුළය.

විමර්ශන කටයුතු අවසන් වූවාට පසුව ආපසු ගමන දුම්රියෙන් එනවා වෙනුවට එම ගමන් බලපත්‍රවලට "එයාර් සිලෝන්" සමාගමේ ගුවන් යානයකින් රත්මලානට පැමිණීමට කටයුතු යොදා ගතිමි. එවකට දිනපතා කොළඹ - ත්‍රිකුණාමලය - යාපනය අතර ගුවන් ගමන් පැවතිණි. ආපසු එන ගමනේ දී ත්‍රිකුණාමලයට පැමිණෙන *"අව්රෝ"* යානයෙන් රත්මලානට පැමිණියෙමි. මෙය මගේ පළමුවන ගුවන් ගමන විය. මෙහි සඳහන් කරන්නේ ඒ නිසාය. පසු කාලයේ දී විදේශ ගමන්වල දී ගමනාගමනයේ නිරත වූයේ ගුවන් යානාවලින් ම ය. ඒ විස්තර පසුව සඳහන් වේ.

ලංකා ධීවර සංස්ථාවේ මෝදර මා සේවය කළ අවසාන දිනය 1970 සැප්තැම්බර් මස 30වෙනි දා ය. පසු දින විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුර භාර ගැනීමට ගංගොඩවිලට ගියෙමි. ධීවර සංස්ථාවෙන් සමුගැනීමට පෙර අළෙවි අංශයේ මා සමඟ සේවය කළ පිරිස් එකතු වී මට රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. ඒ කොළඹ නගර ශාලාව අසල පිහිටි චීන හෝටලයේ දී ය. භෝජන සංග්‍රහයෙන් පසුව ඒ අය මට වටිනා තෑග්ගක් දුන්හ. ඒ රත්තරන් පවුමකි. පසු කාලයේ ප්‍රේමා විසින් එය මගේ දරුවෙකුට හෝ මිණිබිරියකට දෙන්නට ඇතැ'යි සිතමි.

පිරිස් කළමනාකරණ අංශය

කොළඹ ස්ථාන මාරුවට අනතුරු ව මා අනුයුක්ත කරනු ලැබුවේ, ධීවර සංස්ථාවේ පිරිස් කළමනාකරණ අංශයටයි. එම අංශයේ සේවය කළ *ජීරිස් මහතා* මා වෙනුවට මහනුවරට මාරු කරන ලදී. එම අංශය කොළඹ ගාලුමුවදොර ධීවර දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ලේ පිහිටා තිබිණි. පිරිස් කළමනාකරණ අංශයේ කළමනාකරු වූයේ *ඒ.ජී.ජී.ජයසූරිය මහතාය.* ඒ මහතා ධීවර සංස්ථාව ආරම්භ කළ අවධියේ අළෙවි කළමනාකරු ලෙස සේවය කළේය. පිරිස් කළමනාකරණ අංශයේ සහකාර කළමනාකරුවෙකු වූ *ඩී.ඩී.ජී. කරුණාරත්න* මහතා මගේ සමීප ප්‍රධානියා විය. මම එක් ශාඛාවක ප්‍රධාන ලිපිකරු වීමි. තවත් ශාඛාවක් *රාජපක්ෂ* නම් ප්‍රධාන ලිපිකරු මහතා යටතේ විය. *කාලිංග ඒකනායක, රණසිංහ, අළුවිහාරේ* හා තවත් ලිපිකරුවෙක් මගේ ශාඛාවට අයත් වූහ. මෝදර ධීවර සංස්ථා පරිශ්‍රයේ නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමෙන් පසුව, ගාලු මුවදොර පිහිටා තිබුණ ධීවර සංස්ථාවේ සියලු අංශ මෝදරට ගෙන යන ලදී. ඒ නිසා, 1968 මැද භාගයේ දී පමණ සිට මගේ සේවා ස්ථානය පිහිටියේ මෝදරය.

මේ වන විට ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ද වෙනස් වී තිබිණි. සිවිල් සේවයේ *ඩී.සී.එල්.අමරසිංහ මහතා* සභාපතිවරයා විය. *ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා* අළෙවි අධ්‍යක්ෂ විය. ආරක්ෂක අංශය

භාර අධ්‍යක්ෂවරයා වූයේ *අබූබක්කර් මහතාය. ඩී.කේ. සුබ්‍රමනියම් මහතා* සාමාන්‍යාධිකාරීවරයා විය. නාවික හමුදාපති *රාජන් කදිරගාමර් මහතා* තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විය. සංස්ථා සේවයේ වසර කීපයක් සේවය කළ කීප දෙනෙක් 1968 වර්ෂයේ දී V ශ්‍රේණියට උසස් කරන ලද අතර, ඔව්හු මාණ්ඩලික ශ්‍රේණියේ සහකාර කළමනාකරුවන් වශයෙන් පත්කරනු ලැබූහ.

අළෙවි අංශය

මා පස්වෙනි ශ්‍රේණියට උසස් කරනු ලැබුවේ 1968 නොවැම්බර් මස 8වෙනි දා සිටය. එනමුත් එම උසස්වීම මාස තුනකට වැඩ බැලීමේ පත්වීමක් ලෙස සලකා, එය ස්ථීර කරන ලද්දේ 1969 මාර්තු මස 06වෙනි දා ය. ස්ථීර කළේ 1968 නොවැම්බර් මස 8වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදිය. උසස්වීමෙන් පසුව පිරිස් කළමනාකරණ අංශයේ සේවය කළ මා, දින දෙකකට පසුව අළෙවි කළමනාකරණ අංශයට මාරු කරන ලදී. ඒ අනුව මෝදර මසුන් තොග වෙළඳ අංශයේ සේවය සඳහා යොදවනු ලැබීය.

එවකට අළෙවි කළමනාකරු වූයේ අයිවර් ද මැල් මහතාය. අළෙවි අංශය අධ්‍යක්ෂ ස්ටැන්ලි ප්‍රනාන්දු මහතාගේ සෘජු අධීක්ෂණයට යටත් විය. මෝදර මෙම අංශයේ දිවා කාලයේ සේවය කළේ IV ශ්‍රේණියේ *එස්.ජී.සී. ද සිල්වා මහතාය.* ඔහු අම්බලන්ගොඩ සිට සේවයට පැමිණියේය. අලුතෙන් උසස් කරනු ලැබූ සහකාර කළමනාකරුවන් හතර දෙනෙක් වැඩ මුර ක්‍රමය යටතේ සේවයට යොදවන ලදී. ඒ ක්‍රමය යටතේ දවසේ පැය විසිහතර පුරා ම මෝදර මසුන් පිළිබඳ කටයුතු කරන අංශයේ සේවය පවත්වා ගෙන යන ලදී.

සංස්ථාවේ ට්‍රෝලර් යාත්‍රාවලින් ගෙනෙන මසුන් බෑම, ශීතකරණ කිරීම, බෙදාහැරීම, පිටපළාත්වලින් පාන්දරින් ගෙනෙන මසුන් පෙට්ටි ගැසීම, බෙදාහැරීම හා අවශ්‍ය නම් ශීතකරණය කිරීම, දිනපතා පෙරවරුවේ වෙළඳ නියෝජිතයින් වෙත මසුන් බෙදා හැරීම, ශීතකරණය කළ මසුන් පැකට් කිරීම හා ඒවා බෙදාහැරීම වැනි කටයුතු රාශියක් සහකාර කළමනාකරුගේ මෙම වැඩ මුරය තුළ සුපරීක්ෂණය කළ යුතු වේ. ඒ සඳහා ඔහුට සහායට තවත් නිලධාරීන් කීපදෙනෙක් හා කම්කරු පිරිසක් උන්හ. මගේ සේවා කාලය තුළ ප්‍රධාන සහායක නිළධාරීන් වූයේ, *ඩඩ්ලි ඇන්තනී, ටයිටස් ප්‍රනාන්දු* සහ තවත් කීප දෙනෙකි. ඒ අය නිතර ම මගේ වැඩ මුරයේ ම සේවය කළහ. ඒ නිසා ඇති වූ සුහද සම්බන්ධතාව නිසා වැඩකටයුතු කාර්යක්ෂම ව ඉටු කළ හැකි විය.

හදිසි අනතුර හා විභාගය

මෙම තොග වෙළඳ අංශයේ මසුන් පෙට්ටි ගැසීමාදිය කර ගෙන ගිය බිම නිතර ම වතුරෙන් සෝදාහරින්නා වූ ද මිදුණ අයිස් කැට හා කැලි විසිර පවත්නා වූ ද තැනක් නිසා, තෙතමනය ඇති සමහර විට, ලිස්සනසුළු වේ. එම ප්‍රදේශයේ වැඩ කරන හැම දෙනා ම "ගම් බූට්ස්" පැළඳගෙන සිටිත්. මා එකී සේවයට ගොස් නොබෝ දිනකින් ලිස්සා වැටී මගේ දකුණු අතේ වළලුකර බිඳීගියේය. මෙය සිදුවූයේ රාත්‍රී කාලයේ දී ය. හදිසි අනතුරක් සිදු වූ විට කෙනෙක් වහා ම රෝහලට ගෙන යෑම සිරිත වුවත්, මා එදින රාත්‍රියේ එහි සේවය කළ වගකිව යුතු නිලධාරියා නිසා, පසුදා පහන් වන තුරු සේවා ස්ථානයේ රැඳී සිටියෙමි. වළලුකර හන්දියේ මහත් වේදනාවක් දැනුණත් විවේක ගන්නා කාමරයේ රැඳී සිට පසුදා පෙරවරු අටට සේවයට එන නිලධාරියා පැමිණීමෙන් පසුව මහරෝහලට ගියෙමි.

වෛද්‍යවරු මා රෝහලට ඇතුළු කර, *විශේෂඥ වෛද්‍ය ඇන්තනීස් මහතාගේ* වාට්ටුවට යවන ලදී. පසුදින එතුමා වාට්ටුවට එනතුරු ඇතුළු කළ දවසේ රාත්‍රියේ වෙනත් කෙනෙකුගේ ඇඳ යට අතුරා දුන් පැඳුරක නිදා ගැනීමට සිදුවිය. ඉන්පසුව වෙනත් අංශයකට ගෙන ගොස් කැඩුණු අතට "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" වලින් පැලැස්තරයක් දමා, තවත් වාට්ටුවකට යවන ලදී. ඒ වාට්ටුවේ ඇඳක් ලැබිණි. දින දෙකක් ගෙදර නොගිය නිසා, එම වාට්ටුවේ හෙදියක් ලවා මගේ මස්සිනාට (හරිස්ට) දුරකථන පණිවිඩයක් දෙන ලදී. ඒ අනුව ඔහු එදින සවස රෝහලට පැමිණ අපේ ගෙදර ගොස් ප්‍රේමාට මේ ගැන දන්වන ලදී. දින දෙක තුනකට පසුව ටිකට් කපා ගෙන ගෙදර ගියෙමි. එනමුත් පැලැස්තරය සති හයක් තබා ගත යුතු විය. එම කාලපරිච්ඡේදය තුළ මට සේවයට යා නොහැකි නිසා අනතුරු නිවාඩු ලබා ගතිමි.

පශ්චාත් උපාධියේ පළමුවන කොටස සඳහා වූ විභාගය 1968 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී. මට එම විභාගයට ලිවීමට සිදුවූයේ මෙම අනතුර සිදුව තිබිය දී ය. මා වමත්කාරයෙකු නිසා විභාගයට ලිවීම ගැටලුවක් නොවීය. කැඩී තිබුණේ දකුණු අත නිසාය. එනමුත්, ඒ අත නිතර නිතර ඇදුන් දුන් නිසා, විභාගය ලිවීමට සිදුවූයේ එම වේදනාව ද විඳ දරා ගෙනය. සති හයකට පසුව පැලැස්තරය කපා දැමූ නමුත්, අත හැරවීමාදියට අපහසු විය. ඒ නිසා, මාස කීපයක් යනතුරු මහරගම, පිළියන්දල පාරේ යහම්පත් වෙදරාළහාමීගෙන් තෙල් බෙහෙත් කර ගැනීමට සිදුවිය. ක්‍රම ක්‍රමයෙන් අත නිසි පරිදි හැරවීමට හැකියාව ලැබිණි.

විභාගයෙන් පසුව නැවතත් මෝදර "වෙට් මාර්කට්" හි සේවයට ගියෙමි. මීට පෙර සඳහන් කළ සේවා මුරක්‍රමයට වැඩට ගියෙමි. රෑ මුරයෙන් පසුව දිනක් විවේක ලබා ඊළඟ දිනයේ සේවයට පැමිණියෙමි. 1969 මුළු

අවුරුද්ද ම ඒ ආකාරයට සේවය කළෙමි. 1968 දෙසැම්බර් පැවැත්වූ විභාග යෙන් සමත්වීමි. දෙවන කොටස විභාගය පැවැත්වූයේ 1969 දෙසැම්බර් මාසයේ දී ය. දෙසැම්බර් මාසයේ විභාගයෙන් පසුව 1970 ආරම්භයේ දී සේවයට යෑමට නියමිත ව තිබුණ දිනයේ සංස්ථාවේ සේවකයින් විසින් වැඩ වර්ජනයක් ආරම්භ කරන ලදී. මාණ්ඩලික නිළධාරීන් වූ අප සේවයට ගොස් අනියම් කම්කරුවන් සේවයට යොදවා යම් පමණකට වැඩ කර ගෙන යන්නට ප්‍රයත්න දැරුව ද, පළපුරුදු සේවකයින් නොමැති ව එය සාර්ථක නොවීය.

ඒ අතරතුර ආරක්ෂක කටයුතු භාර ව සිටි *අධ්‍යක්ෂ අබූබකර් මහතා* එක් දිනක් රාත්‍රියේ සංස්ථා භූමියේ දී අළෙවි අංශය භාරව සිටි ප්‍රාදේශීය කළමනාකරුවෙකුට බැණ වැදීම නිසා, මාණ්ඩලික නිළධාරීන්ගේ සංගමයේ නිළධාරීන් කීප දෙනෙක් ඒ වන විට සේවයේ නිරත ව සිටි එක ම මාණ්ඩලික නිළධාරියාවූ මා වහාම සේවයෙන් ඉවත්විය යුතුයයි තීරණය කළහ. ඒ තීරණයට අවනත වූ මා, එම ප්‍රදේශීය කළමනාකරු සමඟ එදින රාත්‍රියේ ඔහුගේ නිවසට ගොස් පසුදින ඔහු සමඟ ම මෝදරට පැමිණියෙමි. පෙරදින රාත්‍රියේ ගන්නා ලද තීරණය අනුව අන් මාණ්ඩලික නිලධාරීන් ද එදින සිට වැඩ වර්ජනයට සම්බන්ධ විය යුතුය. එනමුත්, ඒ අයට එවැනි තීරණයක් ගත් බවක් අමතක වී තිබුණ හැඩක් දක්නට ලැබිණි. ඒ නිසා, කම්කරු ව්‍යාත්තීය සමිතියක ලේකම් වූ මගේ මිත්‍ර *නන්දසිරි ගුණරත්න මහතාට* කථා කොට, වහා ම එම සමිතියේ සාමාජික ඉල්ලුම්පතක් පුරවා දී, එහි සාමාජිකයෙකු වී, වැඩ වර්ජනයට සම්බන්ධ වූයෙමි. මීට ටික දිනකට පසුව අනික් මාණ්ඩලික නිළධාරීහු ද වැඩ වර්ජනයට සම්බන්ධ වූහ. එම වර්ජකයන් ආපසු වැඩට ගියේ, 1970 මැයි මාසයේ දී ය. ඒ 1970 මහමැතිවරණයට මාසයකට පෙරය. මෙම වැඩ වර්ජන සමයේ දී, 1970 ජනවාරි 8 දින සිට ක්‍රියාත්මක වන පරිදි මා හම්බන්තොට දිස්ත්‍රික්කයට මාරු කරන ලදී. එනමුත් වර්ජනය නිසා එහි ගියේ නැත. මැයි මාසයේ ආපසු වැඩට යන අවදිය වන විට, පශ්චාත් උපාධියේ දෙවන කොටසේ ද ප්‍රතිඵල නිකුත් වී තිබිණි. ඒ වන විට මම රාජ්‍ය පරිපාලන විද්‍යාපති (ඇම්.පී.ඒ) උපාධිධරයෙකු වීමි. මැයි මාසයේ ආපසු සේවයට ගිය විට, මා පිරිස් කළමනාකරණ අංශයට අනුයුක්ත කරන ලදී. ඒ වන විට ඒ අංශයේ කළමනාකරු වූයේ *අර්වින් ජයසූරිය මහතාය.* ඔහු මගේ පශ්චාත් උපාධි සුදුසුකම් ගැන සැලකිල්ලක් දැක්වූ බව පෙන්වන ලදී.

එසේ වුව ද, මහමැතිවරණයෙන් පසුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය යටතේ *ජෝර්ජ් රාජපක්ෂ මහතා* ධීවර ඇමති විය. වැඩ වර්ජනය නිම කරන ලදී. මා කොළඹ ප්‍රදේශීය කළමනාකරුගේ කාර්යාලයට අනුයුක්ත කරනු ලැබීය. එහි කළමනාකරු වූයේ *ජයමාන්න*

මහතාය. ජනවාරි මාසයේ මා සේවාස්ථානයෙන් නික්ම ගියේ ඔහු සමඟය. මහමැතිවරණයෙන් පසුව සංස්ථාවේ ඉහළ තනතුරු දැරූ සමහර දෙනෙකු තුළ මා ඉහළ තනතුරක් සොයා යන බවට සැකයක් පැන නැඟී තිබිණි. 1970 සැප්තැම්බර් මාසයේ දී විද්‍යොදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරක් ලැබී එහි යෑමට පෙර මා දන්නා අයගෙන් සමුගැනීමට ගිය විට, එක් උසස් නිලධාරියෙක් මට කළ "විහිළුවක්" නිසා ඒ බව තේරුම් ගතිමි. මම විශ්ව විද්‍යාලයට ගියා ම සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වන්නේ කෙසේ දැ'යි ඔහු මගෙන් විමසීය. මගේ ක්ෂණික පිළිතුර වූයේ, විශ්ව විද්‍යාල සේවයට ගියාට පසුව, මට අවශ්‍ය වේ නම් උපකුලපති විය හැකි බවයි. (විශ්ව විද්‍යාල සේවයට යෑමෙන් පසුව කීප වරක් ම උප කුලපති තනතුරේ රාජකාරී ඉටු කිරීමට සිදුවිය.)



Master of Public Administration, 1969

07 විශ්ව විද්‍යාල සේවය
(පළමුවෙනි වසර අට)

හැඳින්වීම

සරසවි ගුරු සේවය සඳහා මා ප්‍රවේශ වූයේ මක්නිසා ද? මේ සඳහා කරණු කීපයක් ම හේතු විය. ප්‍රධානතම කරුණ වූයේ, අදාළ තනතුර සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් තිබීමයි. ඉල්ලුම්පත් යවා සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වන විට ඉල්ලුම්කරුවන් අතරින් වැඩි ම සුදුසුකම් තිබුණේ මටය. රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ පන්ති සාමාර්ථයක් සමග ප්‍රථම උපාධිය ද සම්මාන සාමාර්ථයක් සහිත පශ්චාත් උපාධියක් ද මට තිබිණි. රජයේ හා සංස්ථා සේවාවන්හි වසර දහනවයක පළපුරුද්දක් ද තිබුණේය. මෙම සුදුසුකම් තිබුණ නිසා කිසිවෙකුගේ අනුග්‍රහය නොමැති ව ලබා ගැනීමට තිබුණ එක ම තනතුර මෙය විය. ඉල්ලුම්කරුවන් අතරින් වැඩි ම සුදුසුකම් ඇති තැනැත්තා යටපත් කිරීමට තේරීම් මණ්ඩලයට නොහැකි විශ්ව විද්‍යාලයේ පමණක් යයි සිතමි.

විශ්ව විද්‍යාල කථිකාචාර්ය තනතුරට යම් තරමක සමාජ පිළිගැනීමක් ද තිබිණි. එය ධීවර සංස්ථාවේ කුමන තනතුරකටත් වඩා "නම්බුකාර" විය. ලිපිකාර සේවයට වඩා වැටුපක් ලැබුණ නිසා ධීවර සංස්ථාවට ගිය නමුත් මාතර මුදලාලි කෙනෙක් මට කීවේ, "මහත්තයාට මේ රස්සාව හරියන්නේ නැත" යන්නයි. ඒ නිසා ම නොවුණත් මටත් අවශ්‍ය ව තිබුණේ හැකි පමණ ඉක්මනින් වෙන රැකියාවක් සොයා ගැනීමටයි. මට තිබුණ ශාස්ත්‍රීය සුදුසුකම් අනුව විශ්ව විද්‍යාලයට වඩා වැඩි වැටුපක් ලැබෙන තනතුරකට යා හැකි වූ නමුත් එවැනි තනතුරුවලට බලගතු අනුග්‍රහයක් අවශ්‍ය විය. මට එවැන්නක් තිබුණේ නැත. එපමණක් නොවේ, ධීවර සංස්ථාවේ සේවය කළ අවසාන මාසයේ මගේ වැටුප රු. 640/=ක් විය. විවිධ අඩුකර ගැනීම්වලට පසුව අතට ලැබුණේ රු: 328.50ක මුදලකි. කථිකාචාර්ය තනතුරේ ආරම්භක මාසික වැටුප රු. 900/= ක් විය. අඩුකිරීම්වලට පසුව පළමුවන මාසයේ මගේ අතට ලැබුණ මුදල රු: 767.50 කි. එනම්. රු.439/= ක වැඩිවීමකි.

ඇත්ත වශයෙන් ම විශ්ව විද්‍යාල තනතුර භාර ගැනීමට එවකට මට තිබුණ ප්‍රධාන අභිප්‍රේරණය මුදලේ මෙම වැඩිවීමයි. අන් සියල්ල දෙවෙනි තැන ගත්තේය. මේ තනතුර ලැබුණු බව දැනගත් අස්ගිරි මහා විහාර විශ්ව විද්‍යාල පරිවෙණාධිපති *හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස නාහිමිපාණන්* වහන්සේ පහත සඳහන් පරිදි ලියා එවා තිබිණි:

"කලින් හිටිය රක්ෂාව එතරම් සතුටුවිය හැකි එකක් නොවේ. මෙය හැම අතින් ම හොඳයි. එහි අමාරුකම නම්, නොයෙක් කරදර ආරාවුල් වරින් වර ඇති වන එකයි. හැකිතාක් එවැනි අවස්ථාවලින් ආරක්ෂා වීම හොඳයි"

මෙම උපදේශය මට බෙහෙවින් ම උපකාර විය. අවුරුදු විසි අටක විශ්ව විද්‍යාල සේවා කාලය තුළ මුහුණ දුන් කරදර ආරාවුල් අනන්තය. ඒ සියල්ලෙන් ම උපක්‍රමශීලී ව ආරක්ෂා වීමට ලැබීම ගැන සතුටුවෙමි. මා විශ්ව විද්‍යාල සේවයට ප්‍රවේශ වූයේ 1970 ඔක්තෝම්බර් 1වැනි දිනය. එම සේවයෙන් විශ්‍රාම ගත්තේ 1998 අප්‍රේල් 20වැනි දිනය. මෙහි පහත සඳහන් කරන තොරතුරු අවුරුදු විසිහතයි මාස හතක එම කාල පරිච්ඡේදයට අයත් වේ. විශ්ව විද්‍යාලයට අදාළ පොදු කරුණු මෙන් ම එම කාලය තුළ පෞද්ගලික ව මගේ ජීවිතයට වැදගත් වූ කරුණු මෙහි ඇතුළත් වේ. ඒවා සමහරක් රට තුළ සිදු වූ දේ විය හැකිය. එනමුත්, ඒ සියල්ල මගේත් මගේ දරුවන්ගේත් ජීවිත කෙරෙහි යම් යම් බලපෑම් ඇති කර තිබේ. ඒ නිසා, මෙහි තැනින් තැන ඒ කරුණු ඇතුළත් කරමි.

විශ්ව විද්‍යාල ව්‍යුහය

1956 වර්ෂයේ දී බලයට පැමිණි *එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ* රජය විසින් දහනවවන සියවසේ සිට පැවැති අග්‍රගණ්‍ය විද්‍යා ස්ථාන දෙකක්, 1959 වර්ෂයේ දී විශ්ව විද්‍යාල බවට පත් කරන ලදී. ඇත්ත වශයෙන් ම සිදු වූයේ, ඒ විද්‍යායතන දෙකේ නම් නව විශ්ව විද්‍යාල දෙකට යොදා ගැනීමයි. ඒ අනුව, මාලිකන්දේ විද්‍යෝදය පිරිවෙන් පරිශ්‍රයේ **ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලය** පිහිටුවන ලදී. දෙවන ලෝක යුද්ධ කාලයේ දී ගංගොඩවිල පැවැති ගුවන් හමුදා කඳවුරු භූමිය විද්‍යෝදය විශ්ව විද්‍යාලයට පවරා දෙන ලදී. ඒ නිසා, විශ්ව විද්‍යාලයට උචිත පරිදි නව ගොඩනැඟිලි ඉදිකිරීම ආරම්භ කළ අතර, 1961 වර්ෂයේ දී පැරණි ගුවන් හමුදා කඳවුරේ තාවකාලික ගොඩනැගිලිවලට විශ්ව විද්‍යාල කාර්යාලය ගෙන යන ලදී. *සුමංගල, ඤාණීස්සර* යනාදී නම් යටතේ ස්ථිර ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකරන ලදී. විශ්ව විද්‍යාලයේ ප්‍රධාන තනතුරුධාරීන්ට නිල නිවාස කීපයක් ද ඉදිකරනු ලැබීය. විශාල ශාලා දෙකක් ද ඉදිකැරිණි. එකක් *'බණ්ඩාරනායක ශාලාව'* නමින් ද අනික් ශාලාව *'ලෙනින් ශාලාව'* නමින් ද ප්‍රසිද්ධියට පත්

විය. *'රාහුල ධම්මපාල'* යන නාමය යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ද ඉදිකරන ලදී.

මෙම කටයුතු සිදුවන අතරතුර විශ්ව විද්‍යාලයේ ප්‍රධාන බලධාරියා වූයේ විශ්වවිද්‍යාලයාධිපතිවරයාය. ආරම්භයේ සිට එම තනතුර දැරූ ප්‍රභූවරුන්ගේ නම් 1වැනි උප ලේඛනයේ සඳහන් වේ. එම තනතුරු නාමයෙන් හැඳින් වූ පළමුවැනියා වූයේ, *ගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත හිමිපාණන් වහන්සේය.* අන්තිමයා වූයේ *මහාචාර්ය හේම එල්ලාවල මහතාය.* එතුමා 1972 දක්වා එම තනතුර දැරීය.

1971 අප්‍රේල් කැරැල්ලට පසුව එවකට *අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ* රජය විසින් *මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න මහතාගේ* ප්‍රධානත්වයෙන් කොමිෂන් සභාවක් පත් කරන ලදී. එහි නිර්දේශ අනුව එවකට පැවැති විද්‍යෝදය, විද්‍යාලංකාර, පේරාදෙණිය, කොළඹ, කටුබැද්ද යනාදී විශ්ව විද්‍යාල, තනි විශ්ව විද්‍යාලයක මණ්ඩප බවට පරිවර්තනය කැරිණි. කටුබැද්ද විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපකුලපති ලෙස පත් කැරිණි. ඒ සඳහා කොළඹ වොර්ඩ් පෙදෙසේ "සනාතන මන්දිරය" නමින් විශ්ව විද්‍යාල කාර්යාලයක් අලුතෙන් ආරම්භ කළේය. දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පිහිටියේ එම ගොඩනැඟිල්ලේය. පසු කාලයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයක් ද එම පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදී.

විද්‍යෝදය විශ්ව විද්‍යාලය විද්‍යෝදය මණ්ඩපය බවට පත්විය. එහි ප්‍රධාන බලධාරියා වූයේ මණ්ඩාධිපතිවරයාය. 1972 වර්ෂයේ පළමුවෙන් ම එම තනතුරට පත්වූයේ *ආචාර්ය වී.කේ. සමරනායක මහතාය.* මණ්ඩාධිපතිවරුන්ගේ නම් ලැයිස්තුව ද Iවැනි උප ලේඛනයේ දක්නට ලැබේ.

1977 මහ මැතිවරණයට පසුව බලයට පැමිණි *ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාගේ* රජය විසින්, නව විශ්ව විද්‍යාල පනතක් මගින්, 1978 වසරේ දී *විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක්* ස්ථාපිත කර, මණ්ඩප සියල්ල "ස්වාධීන" විශ්ව විද්‍යාල බවට පරිවර්තනය කරන ලදී. ඒ අනුව විද්‍යෝදය මණ්ඩපය **ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය** විය. එතැන් සිට විශ්ව විද්‍යාලයේ ප්‍රධාන බලධාරියා උපකුලපති නමින් හඳුන්වන ලදී. විශ්ව විද්‍යාල සේවයෙන් ඉවත් වූ 1998 අප්‍රේල් මාසය දක්වා උපකුලපති තනතුර දරන ලද තැනැත්තන්ගේ නම් ලැයිස්තුවක් ද 1වැනි උපලේඛනයේ ඇතුළත් වේ.

පීඨ හා පීඨාධිපතිවරු

ආරම්භක යුගයේ දී විශ්ව විද්‍යාලයේ පීඨ හයක් හතක් තිබිණි. රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව පවත්වා ගෙන ගිය අධ්‍යයනාංශය *ශාස්ත්‍ර පීඨය* යටතේ විය. 1972 වර්ෂයේ දී *කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය* ආරම්භ කරන ලදී. 1998 දක්වා එම පීඨවල පීඨාධිපති තනතුරු දරන ලද විද්වතුන්ගේ නම් ලැයිස්තුව IIවැනි උප ලේඛනයේ දක්වා තිබේ.

අධ්‍යනාංශ හා ප්‍රධානීහු

ආරම්භයේ දී රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව පවත්වා ගෙන ගියේ ආර්ථික විද්‍යා, රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයෙනි. 1968 දී එය *කළමනාකරණ අධ්‍යයනාංශය* බවට පරිවර්තනය කරන ලදී. ඉන් පසුව 1980 මැයි මාසයේ 05වැනි දා සිට, වෙන ම රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශයක් ස්ථාපිත කරන ලදී. ආරම්භයේ සිට මා විශ්ව විද්‍යාල සේවයෙන් විශ්‍රාම ගත් 1998 වසර දක්වා අධ්‍යයනාංශ ප්‍රධාන තනතුරු දරන ලද විද්‍යාර්ථීන්ගේ නම් ලැයිස්තුවක් III වැනි උපලේඛනයේ දක්වා තිබේ.

දරණ ලද විවිධ තනතුරු

ශාස්ත්‍රීය අංශයේ ආරම්භක ශ්‍රේණිය සහකාර කථිකාචාර්ය තනතුරයි. මා 1970 ඔක්තෝම්බර් මාසයේ විශ්ව විද්‍යාල සේවයට ප්‍රවේශ වූයේ ඊට ඉහළ ශ්‍රේණියක් වන කථිකාචාර්ය තනතුරටයි. එම ශ්‍රේණියේ වසර හයක් සේවය කළ පසු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණියට උසස් වීමට පුළුවන. පසු කාලයේ දී සහකාර කථිකාචාර්ය ශ්‍රේණිය ඉවත් කොට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය යනුවෙන් ශ්‍රේණි දෙකක් ඇති කරන ලදී. I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරේ වසර දහයක සේවා කාලයකට පසුව සහාය මහාචාර්ය පදවියට උසස් වීමට සුදුසුකම් ලබන අතර, එසේ උසස් කිරීමට තවත් සුදුසුකම් කීපයක් සම්පූර්ණ කළ යුතු වේ. මේ අනුව 1986 ඔක්තෝම්බර් 1 දින සිට මා *සහාය මහාචාර්ය තනතුරට* උසස් කරන ලදී.

මෙසේ ශාස්ත්‍රීය තනතුරු දරන විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට විටින් විට නොයෙක් පරිපාලන තනතුරු දැරීමට සිදුවේ. ඒ ඒ යුගවල දී බලපවත්වන නීතිය අනුව, එවැනි සමහර තනතුරුවලට ඉහළ බලධාරීන් විසින් පත් කරනු ලබන අතර, සමහර තනතුරුවලට පත්වන්නේ ඡන්ද බලයෙනි. උදාහරණ වශයෙන් පීඨාධිපති වශයෙන්, පත්වන්නේ අදාළ පීඨයේ පීඨ මණ්ඩල සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙනි. අධ්‍යයනාංශ

ප්‍රධාන තනතුරට පත්කරන්නේ උපකුලපතිවරයා විසිනි. විශ්ව විද්‍යාලයේ වෙනත් තනතුරු සඳහා ද ඒ ඒ අවස්ථාවේ ප්‍රධාන විධායක තනතුර දරන බලධරයා විසින් පත්කරනු ලැබේ. අනුබද්ධ විශ්ව විද්‍යාලවල අධ්‍යක්ෂ තනතුරුවලට හා උපකුලපති තනතුරේ වැඩ බැලීමට පත් කරනු ලැබුවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසිනි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට විශ්ව විද්‍යාල පද්ධතියේ විවිධ මණ්ඩල හා ආයතනවල සාමාජික තනතුරවල ද සේවය කිරීමට සිදුවේ. මේ ආදී නොයෙක් තනතුරුවලට මා ලැබූ පත්වීම් දැක්වෙන ලැයිස්තුවක් IV උපලේඛනයේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රතිලාභ

විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරට පත්වූ විට, මට ලැබුණු මාසික වැටුප රු: 900/=ක් විය. කලින් කල ඉහළ ශ්‍රේණිවලට උසස්වීම නිසා මෙන් ම ඇති කරන ලද සංශෝධන නිසා, මා විශ්‍රාම ගන්නා විට මට ලැබුණු මාසික වැටුප රු: 34,427/=ක් විය. පළමුවන වසර හය තුළ ඇති වූයේ රු: 200/=ක වැඩිවීමකි. ඊළඟ වසර තුනකට පසුව තවත් රු: 450/=ක වැඩිවීමක් සිදු වී තිබිණි.

1980 හා 1987 අතර රු: 1,920/=න් වැඩිවුණ වැටුප තවත් රු: 3,630/= කින් වැඩි කරන ලදී. ඊළඟ වසරේ දී තවත් රු: 5,150/= කින් වැඩිවිය. 1989 සිට 1994 දක්වා කාලය පරිච්ඡේදය තුළ රු: 4,250/= කින් වැටුප වැඩි විය. බොහෝ කාලයක් තුළ කිසිම වැටුප් සංශෝධනයක් නොකර "තද කරගෙන සිට," 1988-1994 කාල පරිච්ඡේදය තුළ සැලකිය යුතු සංශෝධනයක් කරන ලද්දේ එවකට උසස් අධ්‍යාපන ආමාත්‍යවරයා වූ *ඒ.සී.එස්.හමීඩ් ඇමතිතුමා* සහ *විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ධූරය දරන ලද මහාචාර්ය අර්ජුන අලුවිහාරේ* මහතාගේ මැදිහත්වීම නිසාය.

1986 දී උසස්වීමක් ලැබූ නිසා වැටුප් වැඩිවීමක් සිදුවිය. 1994ට පසුව *අධ්‍යාපන ඇමති රිචඩ් පතිරණ මැතිතුමා* සහ ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති *මහාචාර්ය සිරිසේන තිලකරත්න මහතා* යන දෙදෙනාගේ මැදිහත්වීමෙන් නැවතත් වැටුප් සංශෝධනයක් කරන ලදී. මෙම සීඝ්‍ර වැඩිවීම් සමඟ ජීවන වියදම ද විශාල වශයෙන් වැඩිවීම නිසා, වැටුප් අරගලය ඉදිරියටත් පැවතිණි. මා විශ්‍රාම ගන්නා තුරු ඇති වූ වෙනස්කම් V උපලේඛනයේ දක්වා තිබේ.

උගන්වන ලද විෂයයන්

1970 ඔක්තෝම්බර් මාසයේ සිට 1998 අප්‍රේල් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය පරිපාලන විද්‍යා කේෂ්ත්‍රයට අන්තර්ගත වන විෂයයන් කීපයක් පළමුවන, තුන්වන හා හතරවන වසරවල උපාධි අපේක්ෂකයන්ට උගන්වන ලදී. සමහර වසරවල පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට උගන්වා ඇත. සප්ත වාර්ෂික නිවාඩු කාලයේ දී *බෞද්ධාලෝක විශ්ව විද්‍යාලයේ දී උපාධි* අපේක්ෂකයන්ට වසර එක හමාරක් තුළ දී ඒ සමහර විෂයයන් උගැන්වූයෙමි.

ප්‍රථම වර්ෂය සඳහා *'රාජ්‍ය පරිපාලන විද්‍යා මූලිකාංග'* නම් විෂයක් බොහෝ කලක් ම ඉගැන්වූයෙමි. මුල් කාලවල දී එය දේශපාලන විද්‍යා නැමියාවක් ගත් නමුත්, ක්‍රමයෙන් කළමනාකරණ නැඹුරුවක් ඇති වන සේ සංශෝධනය කරමින් ඉගැන්වූයෙමි. තුන්වන වසර සඳහා රාජ්‍ය පරිපාලන විද්‍යා න්‍යාය හා පරිචය යන පත්‍රයකට ඉගැන්වූයෙමි. එහි ද ක්‍රමයෙන් කළමනාකරණ නැඹුරුව වැඩි කරන ලදී. තෙවෙනි වසර සඳහා රාජ්‍ය මූල්‍ය විෂය ද ඉගැන්වූයෙමි. වසර කීපයකට පසුව අපේ ම උපාධිධාරිණියක් එම විෂය ඉගැන්වීමට යොමු කළෙමි.

එසේ ම, ප්‍රථම වර්ෂය සඳහා බොහෝ කාලයක් තුළ උගන්වන ලද දේශපාලන විද්‍යා විෂය ඒ සඳහා ම කථිකාචාර්යවරයෙකු බඳවා ගැනීමෙන් පසු ඔහුට පවරන ලදී. මගේ විශේෂ අවධානය යොමු කළ විෂයය වූයේ *රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණයයි.* 1972 සිට මෙම විෂයය ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට මෙන් ම පශ්චාත් උපාධියට ද ඉගැන්වූයෙමි. *බෞද්ධාලෝක විශ්ව විද්‍යාලයේ* දී ද එම විෂය ඉගැන්වීම සඳහා මවිසින් ම පොතක් සංස්කරණය කරන ලදී.

ඒ නිසා විවිධ මූලාශ්‍ර තුළින් ලබා ගත යුතු වූ දැනුම මගේ අත්පොතෙන් ලබා ගැනීමට හැකි විය. මෙම විෂය අපගේ ප්‍රථම උපාධියේ අවසන් වසර සඳහා උගැන්වූයෙමි. සප්ත වාර්ෂික නිවාඩුවෙන් පසුව, 1991 වසරේ සිට අපගේ ප්‍රථම උපාධියේ අවසන් වසර සඳහා සංවර්ධන පරිපාලන විෂය ද ඉගැන්වූයෙමි. 1989 හා 1991 වසරවල දී එය *බෞද්ධාලෝක විශ්ව විද්‍යාලයේ* දී ඉගැන්වූයෙමි. එහි දී මානව සම්පත් කළමනාකරණ විෂය යටතේ කළමනාකරණ අර්ධය මවිසින් උගන්වන ලදී. 1996 වසරේ ද බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන්ට ද කළමනාකරණ ප්‍රශ්න පත්‍රයක් සඳහා එම විෂය ඉගැන්වූයෙමි.

පාඨමාලා ව්‍යුහය හා ශිෂ්‍ය සංඛ්‍යාව, ආචාර්ය මණ්ඩලය

1960 දෙසැම්බර් මාසයේ දී ආරම්භ කරන ලද රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව බ්‍රිතාන්‍ය මාදිලියට සකස් කර තිබිණි. පළමුවන වර්ෂයේ දී විෂයයන් කීපයක් හදාරා ප්‍රථම පරීක්ෂණයෙන් සමත් වූ පසු, උපාධි පාඨමාලාවට ප්‍රවේශ විය. එහි ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය දෙවසරක් ද විශේෂ උපාධිය තෙවසරක් ද හැදෑරිය යුතු විය. උපාධි පරීක්ෂණය පවත්වන්නේ ඒ වසර දෙක හෝ තුන අවසානයේ දී ය. සාමාන්‍ය උපාධිය සඳහා ප්‍රධාන විෂය තුනක් යටතේ ප්‍රශ්න පත්‍ර තුන බැගින් ප්‍රශ්න පත්‍ර නවයකට විභාගයට පෙනී සිට සමත්විය යුතු විය.

1966 වර්ෂයේ දී මෙම ව්‍යුහය පළමුවන වසරේ ප්‍රථම පරීක්ෂණයට හා උපාධි පාඨමාලාවට වසර තුනකටත් වශයෙන් සංශෝධනය කරන ලදී. උපාධියේ i, ii හා iii යන කොටස් තුනක් විය. එක කොටසකට විභාග ප්‍රශ්න පත්‍ර හයක් පමණ විය. ඒ සඳහා අදාළ වසර අවසානයේ විභාගයට පෙනී සිටිය යුතුය. පසුව ප්‍රථම පරීක්ෂණය අහෝසි කොට, එය උපාධි I කොටස ලෙස ද, උපාධි කොටස් තුන II, III, IV යනුවෙන් ද සංශෝධනය කරන ලදී. මෙය මුළුමනින් ම ඇමරිකානු මාදිලියට පරිවර්තනය වීමකි. උපාධි අපේක්ෂකයෙක් වසර හතර තුළ දී ප්‍රශ්න පත්‍ර විසි හතරකින් සමත්විය යුතු විය. උපාධි නාමය *රාජ්‍ය පරිපාලන විද්‍යාවේදී* (බී.පී.ඒ.) (B.P.A.) නම් විය.

උපාධි පාඨමාලාවට ප්‍රවේශ වීමේ සුදුසුකම් ද ක්‍රමයෙන් වෙනස් විය. ආරම්භයේ දී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආයතනයක වසර තුනක සේවා කාලයක් තිබෙන කෙනෙකුට විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලද ප්‍රවේශ පරීක්ෂණයෙන් සමත් වී පාඨමාලාවට ප්‍රවේශ විය හැකි විය. දෙවන අවස්ථාවේ දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සාමාර්ථයක් ලබා ප්‍රථම වසරට ප්‍රවේශ විය හැකි විය. උසස් පෙළ විෂය ධාරාව කුමක් වුවත්, විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් තිබේ නම්, පාඨමාලාවට ඇතුළු වීමට පුළුවන්කම තිබිණි. විකල්ප ප්‍රවේශ මාර්ගය වූයේ, බාහිර අපේක්ෂකයෙකු ලෙස ප්‍රථම පරීක්ෂණයෙන් සමත් වී උපාධි පාඨමාලාවට (උපාධි I කොටසට) ප්‍රවේශය ලබා ගැනීමයි. වාණිජ විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ සමත්වූවන් පමණක් මෙම පාඨමාලාවට ඇතුළු කර ගන්නා අවදියට එන විට සහ උපාධි පාඨමාලාව කොටස් හතරකට සංශෝධනය කළ පසු, මෙම පාඨමාලාවට ප්‍රවේශය ලැබුණේ උසස් පෙළ සමත් වූවන්ට පමණය. බාහිර ප්‍රථම පරීක්ෂණය අහෝසි කරන ලදී.

රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව ආරම්භ කළ යුගයේ අවුරුදු පහා අපේක්ෂකයින් සියයකට අධික සංඛ්‍යාවක් ඇතුළු වූහ. එනමුත්, පාඨමාලා ව්‍යූහය වෙනස් කිරීම නිසා, මේ පාඨමාලාවට ප්‍රවේශය ඉල්ලන සංඛ්‍යාව

බෙහෙවින් ම අඩුවිය. වාණිජ විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ සමත්වූවන්ට මෙම පාඨමාලාවට ප්‍රවේශය සීමා කළ පසුව, සුදුසුකම් ලැබූ හැම දෙනාගේ ම ඉල්ලීම වූයේ ව්‍යාපාර පරිපාලන විද්‍යා පාඨමාලාවයි. රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාවට යම්කිසි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළු කළ නමුත්, ප්‍රශ්න පත්‍ර විසි හතරෙන් බහුතරයක් ව්‍යාපාර පරිපාලන විද්‍යා පාඨමාලාවට ද පොදු වූ විෂයන්ට සීමා කිරීමට සිදුවිය. මෙහි යම්කිසි වාසියක් ද තිබිණි. රැකියා ලබා ගැනීමේ දී ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය වැනි ක්ෂේත්‍රවල දැනුම ලැබෙන විෂයයන් හැදෑරූ නිසා, රාජ්‍ය පරිපාලන විද්‍යා උපාධිධාරීන් එම අංශවලට අදාල වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට ද පෙළඹුණාහ. ඒ නිසා, රැකියා ලබා ගැනීම රාජ්‍ය අංශයට පමණක් සීමා නොවීය. මෙම උපාධිධාරීන් බොහෝ දෙනෙක් ගණකාධිකාරී හා විගණන අංශයට යොමුවූහ.

වාණිජ විද්‍යා ධාරාවෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය විය. පිටිසර ප්‍රදේශයන්හි පාසල්වල විද්‍යා අංශ නොතිබුණ අතර, වාණිජ අංශය එයට විකල්පයක් විය. මේ නිසා ද වාණිජ විද්‍යා ධාරාවෙන් උසස් පෙළ සමත්වන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි විය. ආරම්භක යුගයේ දී මේ අයට විවෘත ව තිබුණේ *විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පාඨමාලාවට ප්‍රවේශය* ලබා ගැනීම පමණයි. ඒ නිසා, වාර්ෂික ව *රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා පාඨමාලාවලට* ඇතුළු කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට ද පියවර ගතිමු. උදාහරණ වශයෙන්, 1970 වසරේ රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාවට ඇතුළු කළේ සිසුන් හැට දෙනෙක් පමණයි. එනමුත්, ඊළඟ වසරේ සිට එය එකසිය විස්ස දක්වා වැඩි කරන ලදී.

1972 වසරෙන් පසුව කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ වාණිජ විද්‍යා අධ්‍යයනාංශයක් ස්ථාපිත කිරීම නිසා, තවත් සිසුන් සියයකට අධික සංඛ්‍යාවකට මෙම පාඨමාලාවලට ප්‍රවේශවීමට ඉඩ ප්‍රස්තාව ලැබිණි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට සිසුන් එවන ලද්දේ එක තොගේටයි. පීඨය විසින් එම සිසුන් පාඨමාලා අතර බෙදන ලදී. රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාවේ ස්වභාවය පැහැදිලි ව නොදත් නිසා, මේ අය එම පාඨමාලාවට ඇතුළු වූයේ ඉතා ම අකමැත්තෙනි. එසේ වුවත්, උපාධි පාඨමාලාව හදාරා පිටවී ගිය කිසිවෙක් රැකියා විරහිත ව නැත. දැනට ගණකාධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ ම නම් දරා සිටින ගුරුවරුන් කීප දෙනා රාජ්‍ය පරිපාලන විද්‍යා උපාධිධාරීන්ය. ඔව්හු, රාජ්‍ය පරිපාලන සේවයේ, විගණකාධිකාරී සේවයේ හා ගුරු සේවයේ යෙදී ඉමහත් සේවයක් කරති. වර්තමාන (2012) උසස් අධ්‍යාපන ඇමතිවරයා ද රාජ්‍ය පරිපාලන විද්‍යා උපාධිධාරියෙකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති තනතුර උසුලා විශ්‍රාම ලත් *ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතා* රාජ්‍ය පරිපාලන විද්‍යා අංශයෙන් 1972 වසරේ දී ප්‍රථම පන්තියේ සාමාර්ථයක් ලබා ගත් පළමුවැන්නාය. දෙවැන්නා වූයේ *රමණී සමරතුංග මහත්මියයි.* පසු කාලයේ දී විජේවර්ධන මහතාගේ දියණිය ද රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව හදාරා ප්‍රථම පන්තියේ සාමාර්ථයක් ලබා ගත්තාය. මා මෑතක දී කරන ලද විමසීමක දී දැනගන්නට ලැබුණේ, වසර හතළිස් දෙකක කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාවෙන් ප්‍රථම පන්තියේ සාමාර්ථය ලබා ගත් උපාධිධාරීන් සංඛ්‍යාව හතළිහක් පමණ බවයි. සියලු ම උපාධිධාරීන් හත්දහසකට වැඩි යැ'යි සිතමි.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පද්ධතියේ රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශයක් තිබෙන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පමණයි. එම පාඨමාලාව 1960 සිට එම නමින් ම තව ම පවතී. 1974 දී උපාධි නාමය 'ශාස්ත්‍රවේදී' යන්නේ සිට 'විද්‍යාවේදී' යන්නට පරිවර්තනය කරන ලදී. වර්තමානයේ එම උපාධිය 'විද්‍යාවේදී (රාජ්‍ය කළමනාකරණ)' යනුවෙන් හඳුන්වනු ලැබේ. ප්‍රවේශය පිළිබඳ ඇති වූ විවිධ ගැටලු නිසා දැනට මෙම පාඨමාලාවට වාර්ෂික ව සිසුන් පනස් දෙනෙක් පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ම තෝරා එවනු ලැබේ.

1980 මැයි මස 5වන දින රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය ආරම්භ කරන විට එහි ආචාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව පස් දෙනෙක් විය. එයින් කෙනෙක් ඒ අවදියේ ම අභාවප්‍රාප්ත විය. තව කෙනෙක් විදේශ ගත වී ආපසු පැමිණියේ නැත. තව කෙනෙක් පශ්චාත් උපාධි අංශය භාර ගෙන කටයුතු කළ නිසා, අධ්‍යයනාංශයට ලැබුණු දායකත්වය නැති ව ගියේය. මේ නිසා, මෙම අධ්‍යනාංශයට අවශ්‍ය වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ගොඩ නඟා ගැනීම බෙහෙවින් ම වැදගත් විය.

එසේ වුවත්, අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් ආචාර්යවරුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට තනතුරු සංඛ්‍යාවක් වෙන්කර තිබුණේ නැත. සිසුන් දහඅට දෙනෙකුට එක් ගුරුවරයෙකු බැගින් සිටිය යුතු යයි සඳහන් වුවත් එයට සරිලන අනුමත තනතුරු සංඛ්‍යාවක් නොවීය. වාර්ෂික ව ලැබුණේ තනතුරු එකක හෝ දෙකක වැඩිවීමකි. මගේ මිත්‍ර *ආර්.ඒ.ඒ පෙරේරා මහතා* 1983 දී පමණ පීඨාධිපති වූ පසු, පීඨයට සංයුක්ත සැලැස්මක් සකස් කොට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව, අවශ්‍ය තනතුරු සංඛ්‍යාවේ වැඩිවීමක් අනුමත කරණ ලදී. ඉන්පසුව වසරින් වසර සුදුසුකම් ලබන අපේ ම උපාධිධාරීන් මෙන් ම පිටින් ද බඳවා ගැනීමෙන් පසුව, 1998 වසරේ මා විශ්‍රාම යන අවධියේ දී, අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තිස් දෙනෙක් පමණ සිටි බව මතකය. එපමණක් නොව, එසේ අලුතෙන් සේවයට බඳවා ගත් බොහෝ දෙනාට පශ්චාත් උපාධි

සුදුසුකම් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා ද සලසා දෙන ලදී. එනමුත්, මේ වන විට මෙයින් කීප දෙනෙක් මෙම විශ්ව විද්‍යාල සේවයෙන් අස්වී, සමහර දෙනෙක් විදේශගත ව සිටිති. 1998 දක්වා බඳවාගෙන සිටි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ලැයිස්තුවක් VI උපලේඛනයේ දක්වා තිබේ.

මෙහි පහත සඳහන් කරුණු මා විශ්ව විද්‍යාල සේවයට බැඳුණු වසරේ සිට විශ්‍රාම ගන්නා තුරු සිදු වූ නොයෙක් දේ සම්බන්ධයෙනි. වසරින් වසර සිදු වූ දේ අනුක්‍රමයෙන් සටහන් කර තැබීමට සෑම ප්‍රයත්නයක් ම දරණ නමුත්, අතුරු තේමා ඔස්සේ මෙම කථාව නොයෙක් දිසාවලට ගමන් කිරීමට ඉඩ තිබේ. එයින් සමහරක් පොදු කරුණු විය හැකිය. තවත් සමහරක් මට හා මගේ පවුලේ අය ගැන විය හැකිය. කථාව බොහෝ සෙයින් දිග්ගැස්සීමට ඉඩ තිබෙන නිසා, හැම දෙයක් ම ඉතා ම සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්නෙමි. මේ අභ්‍යාසය හමාර වූ විට, මට ඉඩක් ලැබුණොත් සංක්ෂිප්ත එම තොරතුරු අවශ්‍ය යයි හැඟෙන තැන් විදහා දැක්වීමට බලාපොරොත්තු වෙමි.

විශ්ව විද්‍යාල සේවයට සම්බන්ධ වීමට පෙර මා සේවය කළ ලංකා ධීවර සංස්ථාවේ කටයුතු විමර්ශනය කිරීමට 1970 මහ මැතිවරණයෙන් පසු බලයට පැමිණි ආණ්ඩුව විසින් කොමිෂන් සභාවක් පත් කරන ලදී. නව ධීවර ඇමතිවරයා වූයේ මුල්කිරිගල මන්ත්‍රී ජෝර්ජ් රාජපක්ෂ මහතාය. කොමිෂන් සභාවේ එක ම සාමාජිකයා වූයේ එහි සභාපති නීතීඥ ජයරත්න මහතාය. ලේකම්වරයා වූයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අබේවික්‍රම නමැති නිලධාරිවරයෙකි. නීතීඥ ඩී.එස්. විජේසිංහ මහතා විසින් සාක්ෂි මෙහෙයවන ලදී. ශ්‍රී ලංකා නිදහස් සේවක සමිතිය කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කරන විට එයට සහභාගී වන ලෙස, සමිතියේ ලේකම් මා මිත්‍ර නන්දසිරි ගුණරත්න මහතා මට ආරාධනා කළ නිසා, විශ්ව විද්‍යාල සේවයට පැමිණි පසුව මේ සඳහා ඉදිරිපත් වූයෙමි. 1970 මුල දී ධීවර සංස්ථාවේ වැඩ වර්ජන සමයේ දී මට වෘත්තීය සමිති රැකවරණය ලබා දුන්නේ නන්දසිරි ගුණරත්න මහතාය. ඒ නිසා, එම සමිතිය වෙනුවෙන් සාක්ෂි දීම මගේ යුතුකමක් ලෙස සලකන ලදී. කොමිෂන් සභාවේ සභාපතිතුමා මෙන් ම ලේකම් හා නීතීඥ මහත්වරු ද මා ගැන පැහැදීමකින් සිටි බව සාක්ෂි අවසානයේ දී පැහැදිලි විය.

මීට පසුව 1971 හා 1972 වසරවල දී ධීවර ඇමති ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමාගේ සභාපතිත්වයෙන් පත් කරන ලද රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවක වැටුප් සංශෝධන කොමිෂන් සභාව ඇසුරෙන්, කළමනාකරණ අධ්‍යයනාංශයේ මහාචාර්යතුමා ඇතුළු අධ්‍යයන මණ්ඩලයේ කීප දෙනෙක් නොයෙක් කටයුතුවලට සම්බන්ධ වූහ. ඒ සියල්ල සිදුවූයේ 1971 අප්‍රේල් කැරැල්ලට පසුවයි. මෙම කොමිෂන් සභාවේ කාර්යාලය ආනන්ද කුමාරස්වාමි මාවතේ මල්පාර පැත්තට වන්නට පිහිටා තිබිණි.

ෆුල්බ්‍රයිට් පදනම යටතේ පැමිණි පාකිස්තානු සම්භවයක් තිබුණු ඇමරිකානු *මහාචාර්ය එම්. අලි රාසා මහතා* විසින් ඉදිරිපත් කරන ලද කරුණු පදනම් කර ගෙන, සම්මන්ත්‍රණයක් හා වැඩමුළුවක් අප අධ්‍යයනාංශයේ පුරෝගාමීත්වයෙන් පවත්වන ලදී. ඉන් පළමුවැන්න සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වැනි උසස් තනතුරු දරණ අය සඳහාය. එම සම්මන්ත්‍රණය මහ බැංකු ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සම්මන්ත්‍රණයේ කටයුතු ආරම්භ කළාය. ඉන්පසුව එම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල වෙනත් නිලධාරීන් හා වෘත්තීය සමිති නායකයින් සඳහා රැකියා ඇගැයීම (Job Evaluation) පිළිබඳ වැඩමුළුවක් බෞද්ධාලෝක මාවතේ *ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන ශ්‍රවණාගාරයේ දී* පවත්වන ලදී. මෙම වැඩමුළුව *මහාචාර්ය අලි රාසා* විසින් මෙහෙයවන ලද අතර, අප අධ්‍යයනාංශයේ කථිකාචාර්ය මණ්ඩලයේ *ආර්.ඒ.ඒ. පෙරේරා, සිරිසේන තිලකරත්න, කේ.ඒ. මුණසිංහ, ගාමිණී ගුණවර්ධන* හා මම ද දායක වූයෙමු මේ වැඩමුළුවේ ප්‍රධාන තේමාව වූයේ වැටුප් සංශෝධන කිරීමට ඒ ඒ ආයතනවල රැකියාවල නිරත අයගේ දායකත්වය අගය කිරීම පදනම් කර ගත යුතු බවයි.

මෙම අභ්‍යාසයට පසුව, එවකට ලංකා බැංකුව යටතේ පැවැති *නැප්‍රොබේන් හෝටලයේ* රැකියා ඇගැයීමක් පිළිබඳ අධ්‍යායනයක් කිරීමට අප අධ්‍යයනාංශයට ඉල්ලීමක් ලැබිණි. එම කටයුත්ත මා මිත්‍ර *ආර්.ඒ.ඒ. පෙරේරා මහතාට* පැවරිණි. ඔහුට එම කාර්යයේ දී සහාය වීම මට පවරන ලදී. මාස කීපයක් තුළ තැප්‍රොබේන් හෝටලයේ කාර්ය මණ්ඩලයේ රැකියා ඇගැයීමක් කොට වාර්තාවක් ඉදිරිපත් කළෙමු. අප විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ඉටු කරන ලද ප්‍රායෝගික අභ්‍යාසයක් ලෙස මෙය හැඳින්වීමට පුළුවන. එමඟින් එම අධ්‍යයනයේ නිරත වූ අප දෙදෙනාට වැදගත් කරුණු රාශියක් ගැන දැනුමක් ලබා ගැනීමට ඉඩ සැලසිණි.

1971 අප්‍රේල් කැරැල්ල

අධ්‍යයන වර්ෂයේ දෙවන වාරය අවසන් වූයේ 1971 අප්‍රේල් 5වෙනි දා ය. එදින දේශනවලින් පසුව මා පදිංචි ව සිටි මිරිහානේ විජේසේකර මාවතේ නිවසට යෑමට බසයක් එන තුරු විශ්ව විද්‍යාල ප්‍රධාන දොරටුව අසල මහපාරට වී සිටියෙමි. මා දිනපතා නිවසේ සිට විශ්ව විද්‍යාලයට ගියේ ආවේ බසයෙනි. මිරිහානේ සිට උඩහමුල්ලට බස් ගාස්තුව ශත දහයක් විය. උඩහමුල්ලේ සිට විශ්ව විද්‍යාලය අසලට තවත් ශත දහයක් විය.

මගේ අසල්වැසියෙකු වූ *කරුණාතිලක මහතා* ද මා සමඟ බසය එන තුරු රැඳී සිටියේය. ඉතිහාස අධ්‍යයනාංශයේ උපාධිධරයෙකු වූ කරුණාතිලක මහතා, පසු කාලයේ දී නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විය.

අප දෙදෙනා සිටි තැනින් ගමන් මළු අතැති ව ගිය ශිෂ්‍යාවන් කීප දෙනෙක් "හා මේ අපේ සර් නේ ද?" යනුවෙන් පවසමින් හනි හනික විජේරාම හන්දිය පැත්තට ගියහ. විශ්ව විද්‍යාල භූමිය තුළ යම්කිසි අසාමාන්‍ය කලබලකාරී ගතියක් තිබුණ නිසා, ඒ ගැන ද කථා කරමින් බසයක් එන හැඩක් නොවූයෙන් පයින් ම නිවෙස් කරා ගමනට පිටත් වූයෙමු.

පසුදින උදෑසන පාසල් යන්නට පිටත් වී ගිය මගේ දරුවන් ටික දුරක් ගොස් ආපසු ගෙදර පැමිණ ඇදිරි නීතිය ප්‍රකාශකර ඇති බව කීහ. එහෙන් මෙහෙන් කරුණු විමසා බලන විට දැනගන්නට ලැබුණේ, පෙර දින රාත්‍රියේ ජනතා විමුක්ති පෙරමුණ විසින් පොලිස් ස්ථාන කීපයකට පහර දී සන්නද්ධ කැරැල්ලක් ඇති කළ බවය. දින කීපයක් නොයෙක් පෙදෙස්වල මෙම අරගලය පැවතුණ අතර, සමහර ප්‍රදේශ ඒ අයගේ පාලනයට නතුකර ගත් බව ද දැනගන්නට ලැබිණි.

මෙම අරගලය පටන් ගන්නා විට මෙරට පොලිස් ස්ථාන දැඩි ලෙස සන්නද්ධ වී සිටියේ නැත. නාමික වශයෙන් මහජන ප්‍රදර්ශනයට තුවක්කු කීපයක් තිබුණ නමුත් ඒවාට ජීව උණ්ඩ තිබුණා දැ'යි සැක සහිතය. එවකට පොලීසියේ ලොකු ම ආයුධය වූයේ බැටන් පොල්ලයි. ඉතා අසීරු තත්වයකට පත් වූ ආණ්ඩුව, නොයෙක් රටවලින් අවි ආයුධ ලබා ගැනීමට ක්‍රියා කළේය. මෙරට පොලීසිය අවි ආයුධවලින් සන්නද්ධ කරන ලද්දේ මේ කැරැල්ලට පසුව යයි සිතමි. තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වූ බව නම් ප්‍රසිද්ධියට පත්විය.

දින කීපයකට පසුව, අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ජාතිය ඇමතුවායඃ "නොමඟ ගිය" තරුණ තරුණියන් රැසක් අත් අඩංගුවට ගන්නා ලදී. මේ අය රඳවා තබා ගැනීමට විශ්ව විද්‍යාල හා පාසල් ගොඩනැඟිලි කීපයක් යොදා ගන්නා ලදී. ගංගොඩවිල විද්‍යෝදය විශ්ව විද්‍යාල භූමිය හා ගොඩනැඟිලි එසේ යොදා ගත් එක් ස්ථානයක් විය. මේ නිසා, රට යථා තත්ත්වයට පත් වූව ද, විශ්ව විද්‍යාලය පවත්වා ගෙන යෑමට තැනක් නැති විය.

විශ්ව විද්‍යාල බලධාරීන්ට විකල්ප තැන් සොයා ගැනීමට සිදුවිය. විශ්ව විද්‍යාල කාර්යාලය සඳහා තර්ස්ටන් විද්‍යාල විදුහල්පති නිල නිවස ලබා ගන්නා ලදී. දේශන පැවැත්වීමට ලුම්බිණි මහා විද්‍යාලයේ ගොඩනැගිලිවල ඉඩ ලබා ගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ, පෙරවරුවේ පාසල් පැවැත්වීමෙන් පසුව විශ්ව විද්‍යාලයේ දේශන පැවැත්වීමට පස්වරුව යොදා ගත යුතු වීමයි. කළමනාකරණ අධ්‍යයනාංශයේ කාර්යාලය හා දේශන ශාලා සඳහා බෞද්ධාලෝක මාවත ලොන්ග්ඩන් පෙදෙස හන්දියේ රජයේ නිල නිවාසයක් ලබා ගත්තේය. පසුව සමහර දේශන පැවැත්වීමට තර්ස්ටන් විද්‍යාලයේ

පන්ති කාමර ලබා ගන්නා ලදී. මේ ආකාරයට 1972 ඔක්තෝම්බර් මාසය පමණ වනතුරු විශ්ව විද්‍යාලය ගංගොඩවිල පරිශ්‍රයෙන් පිටත පවත්වා ගෙන යෑමට සිදුවිය.

විශ්ව විද්‍යාල භූමියේ පවත්වා ගෙන ගිය පුනරුත්ථාපන කඳවුරු ක්‍රමයෙන් වෙනත් තැන්වලට මාරු කිරීමට පටන් ගන්නා ලදී. තමන්ට සරසවි භූමිය ආපසු ලබා දෙන ලෙස ශිෂ්‍ය ඉල්ලීම් ද වැඩි වන්නට විය. මේ නිසා 1972 ඔක්තෝම්බර් මාසය පමණ විට ගංගොඩවිල විශ්ව විද්‍යාල භූමිය නැවත විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ප්‍රයෝජනයට ලබා දෙන ලදී.

මේ අතර අපරාධ යුක්ති විනිශ්චය සහා නීතිය යටතේ 1971 කැරැල්ලට සම්බන්ධ ප්‍රධාන සැකකරුවන් විසි ගණනකට නඩු පවරන ලදී. සතියේ නඩු දිනවල මෙම පිරිස්, ආවරණය කළ බන්ධනාගාර රථවල අපගේ කාර්යාලය ඉදිරිපිටින් එහා මෙහා ගෙන යනවා දැකීම එවකට සුලභ දර්ශනයක් විය.

මෙම නඩුවේ නොයෙක් සාක්ෂිකරුවන්ගේ තොරතුරු අනුව විද්‍යෝදය විශ්ව විද්‍යාල භූමියේ දී ජනතා විමුක්ති පෙරමුණේ *"පන්ති පහ"* පවත්වා ඇත. ඒ සඳහා යොදා ගෙන ඇත්තේ එහි කස ගස් පිහිටි විවෘත භූමියයි. ඒ කාලයේ තැන් තැන්වල සිසුන් කණ්ඩායම් රැස්වී සිටිනු දැක ඇතත්, ඒ මෙවැනි දේශපාලන ව්‍යාපාරයක දේශන සඳහා බවට කිසිවෙකු සැක කළේ නැත. ප්‍රධාන දොරටුව ඉදිරිපසින් පිහිටි සංඝාවාසය ද මෙම දේශපාලන ව්‍යාපාරය සඳහා සාකච්ඡා පැවැත්වීමට යොදා ගෙන ඇත. එහි සිටි *"මොරවක හද්දිය"* නමින් සිවුරු දැරූ තැනැත්තා, කැරැල්ලට පෙර සුප්‍රසිද්ධ මැරයෙකු වූ බව අප බොහෝ දෙනෙක් දැක ඇත. එනමුත්, ඒ මැරකම්වල අරමුණ දැන සිටියේ නැත. කැරැල්ලට පෙර විද්‍යෝදය ශිෂ්‍ය ව්‍යාපාරයේ නායකයෙකු වූ මහින්ද විජේසේකර මහතා පසු කාලයේ නිදහස් වී, විවෘත දේශපාලනයට පිවිස ඇමතිවරයෙකු වූ කෙනෙකි. 1977 එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි පසු මහ නඩුවේ විත්තිකරුවන් නිදහස් කරන ලදී. එහි නායක *රෝහණ විජේවීර මහතා* 1982 ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී, *කොල්වින් ආර්. ද සිල්වා* වැනි කෘතහස්ත වාමාංශික නායකයින්ට වඩා ජන්ද ලබා ගත්තේය.

1971 දී එම දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධ ව සිටි බොහෝ දෙනෙක් දැනට සමාජයේ උසස් ස්ථානවල සිටිත්. ඒ අය සමහර දෙනාගේ ප්‍රකාශ අනුව පෙනී යන්නේ, සිරගත වීමට පෙර ඒ කිසිවෙක් නායකයින්ගේ ප්‍රකාශ කිසිවක් ප්‍රශ්න නොකළ බවයි. එනමුත්, බන්ධනාගාරයේ දී *"දේශන පහ"* පමණක් නොව වෙනත් බොහෝ කරුණු විවේචනයට භාජනය කළ බවයි. ඉන්පසුව ජනතා විමුක්ති පෙරමුණේ "වැරදි ගමන් මඟ නිසා" ඒ අය වෙනස් වී, සමහරු යහපත් පුරවැසියන් වී දියුණු වූ බව පිළිගනිති. මේ

සමහර දෙනෙක් එසේ වුවත්, **ජනතා විමුක්ති පෙරමුණ** එක් දහස් නවසිය අසූ ගණන්වල අග භාගයේ දී නැවතත් විනාශකාරී මඟක් ගෙන තිබිණි. ඒ ගැන මගේ අදහස් කීපයක් පසුව සඳහන් කරමි.

ගංගොඩවිල විශ්ව විද්‍යාල පරිශ්‍රයට ආපසු පැමිණීම

විශ්ව විද්‍යාල පරිශ්‍රය නැවත ආපසු ලබා ගැනීම සඳහා ශිෂ්‍ය සංවිධාන විසින් මහත් වෙහෙසක් දරන ලදී. එසේ වුවත්, එම භූමියේ සිටි රැඳැවියන් අඩුවන තුරු රජය විසින් එම ඉල්ලීම්වලට සතුටුදායක ප්‍රතිචාර දැක්වූයේ නැත. 1972 ඔක්තෝම්බර් මාසය පමණ වන විට ආරක්ෂක හමුදා විසින් විශ්ව විද්‍යාල භූමිය නිදහස් කළ නිසා, කොළඹ නොයෙක් ස්ථානවල විසිර තිබුණ අංශ ගංගොඩවිලට නැවත ගෙන එන ලදී. ශිෂ්‍ය සංවිධාන හා වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයන් එකතුව මහා ශ්‍රමදානයක් මගින් විශ්ව විද්‍යාල පරිශ්‍රය මුළුමනින් ම ශුද්ධ පවිත්‍ර කරන ලදී. ඉන් පසුව, 1972 අවසන් වන විට ක්‍රමයෙන් විශ්ව විද්‍යාලයේ කටයුතු යථා තත්වයට පත්වීමට පටන් ගත්තේය.

විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වන විට, සෑම වසරක ම මුල් මාස දෙක තුනේ ජල ප්‍රශ්නයකට මුහුණ දෙන ලදී. ඒ අවදියේ බවුසරවලින් වතුර ගෙනැවිත් සීමිත ටැන්කි ටික පුරවා ගත්හ. පසුව ලොකු ජල ටැංකියක් ඉදිකර මේ ගැටලුව නිරාකරණය කරගත් බව පෙනේ.

ඉඩම් ප්‍රතිසංස්කරණය

1972 මෙරට ආර්ථික හා දේශපාලන වශයෙන් වැදගත් කරුණු දෙකක් සිදුවූ වසරකි. ජනරජ ව්‍යවස්ථාව සම්මත කිරීම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සම්මත කිරීම මේ වැදගත් කරුණු දෙකයි. 1971 අප්‍රේල් කැරැල්ලට පසුව එවකට පැවති රජයේ සමහර ප්‍රතිපත්ති වෙනස් කිරීමට පියවර ගන්නා ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ද එවැන්නකි. පළමුවැනි පියවරක් වශයෙන්, අක්කර පනහකට වැඩියෙන් ශ්‍රී ලාංකිකයන්ට අයිතිය තිබූ ඉඩම් රජයට පවරා ගෙන, ඒවා පාලනය කිරීමට **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව** නමින් ආයතනයක් ස්ථාපිත කරන ලදී. දෙවනුව, විදේශීය සමාගම්වලට අයිති ව තිබූ ඉඩම් පවරා ගන්නා ලදී. මෙම පියවර ගැනීම කුමන ඇමතිවරයාට පැවරිය යුතු ද යන්න ගැන මතභේදයක් පැවති බවට රාවයක් එවකට පැවතිණි. ඉඩම් ඇමතිවරයාට මේ කාර්යය පැවරුණ නමුත්, වැවිලි කර්මාන්ත ඇමතිවරයා ඒ ගැන විරෝධය දැක්වූ බවට ආරංචියක් පැතිර ගියේය. ඒ, වතු ජනසතු කිරීමට නිසි බලධරයා වැවිලි කර්මාන්ත ඇමතිවරයා විය යුතුය, යන අදහස මතය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගත් වතු සමහරක් දේශපාලන හිතවතුන්ගේ ග්‍රහණයට අයත් වී පාළුවී ගියේය. *නාවනගල හා ගලේකැලේ* තේ වතු එසේ පාළු වී ගිය වතු දෙකකි. සමහර සරුසාර ඉඩම් දේශපාලකයින්ගේ නිසරු ඉඩම්වලට මාරු කරගත් අවස්ථා ද තිබිණි. 1977න් පසුව බලයට පැමිණි ආණ්ඩුව යටතේ මේ හුවමාරුව පමණක් නොව, ඉතා අඩු මුදලට සමහර ඉඩම් පවරා දුන් අවස්ථා ද බොහෝ වී යයි කියනු ලැබේ.

1972 ජනරජ ව්‍යවස්ථාව

1972 මැයි මස 22වැනි දින සිට ක්‍රියාත්මක කරන ලද **ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව**, මෙරට දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කේෂ්ත්‍රයන්හි ඉතා වැදගත් තැනක් ගත්තේය. 1947 දී අරඹන ලද **සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය** හා **සෙනෙට් සභාව** යනුවෙන් පාර්ලිමේන්තුවේ සභා දෙකක් විය. ආණ්ඩුකාරවරයා මහා බ්‍රිතාන්‍යයේ කිරීටය (රජු හෝ රැජිණ) නියෝජනය කළේය. මේ සම්බන්ධය නිසා, ශ්‍රී ලංකාව පූර්ණ ස්වාධීන රාජ්‍යයක් වූයේ නැතැ'යි තර්කයක් විය. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළ ම උසාවිය වූයේ **බ්‍රිතාන්‍යයේ ප්‍රීවි කවුන්සිලයයි.**

මේ නිසා, 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණකරුවන්ට පවා ප්‍රිවි කවුන්සිලයට අභියාචනා කර නිදහස් වීමට හැකියාව ලැබිණි. මේ ආදී නොයෙක් දුර්වලකම් නිසා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන සමඟි පෙරමුණ 1970 මැතිවරණයේ දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට වරම පැතුවේය. එසේ පත් වූ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින්, එතෙක් පැවැති සෙනෙට් සභාව අහෝසි කිරීමට නීති අනුමත කරගන්නා ලදී. එසේ ම, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමට ජනවරම ලබා ගත්තේය. *ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා* ව්‍යවස්ථා සම්පාදක ඇමතිවරයා ලෙස කටයුතු කළේය. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ ආරම්භක රැස්වීම කොළඹ රාජකීය ප්‍රාථමික පාසල් පරිශ්‍රයේ පිහිටි **'නවරඟහලේ දී'** පවත්වා, සංකේතාත්මක ව පාර්ලිමේන්තුවෙන් නිදහස් බව ප්‍රදර්ශනය කළේය. ඉන් පසුව ව්‍යවස්ථා සම්පාදක සභාවේ රැස්වීම් පාර්ලිමේන්තු පරිශ්‍රයේ දී පැවැත්වූ නමුත්, අවසානයේ දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමට ද රැස්වූයේ **"නව රඟහලේ දී ය."** එතෙක් ආණ්ඩුකාරවරයා ලෙස තනතුර දරන ලද **විලියම් ගොපල්ලව මැතිතුමා**, 1972 මැයි මස 22 දින නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේය. **අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය** නව අගමැතිවරිය ලෙස ජනාධිපතිතුමා ඉදිරියේ

දිවුරුම් දී වැඩ භාර ගත්තාය. කැබිනට් මණ්ඩලය ද එසේ දිවුරුම් දෙන ලදී. මේ නිසා, 1802 සිට බ්‍රිතාන්‍ය කිරීටයට තිබුණ සම්බන්ධතාව අවසන් විය. ශ්‍රී ලංකාව ස්වාධීන ස්වෛරී රාජ්‍යයක් විය.

පොඩිදුව පාසල් යාම

1971 වර්ෂය මට කරුණු කීපයක් නිසා වැදගත් විය. ඉන් පළමුවැන්න වූයේ, මගේ පොඩි දුව දයානී හද්‍රා නිල්මිණි ඒකනායක, සුජාතා බාලිකා විදුහලට ඇතුළත් කිරීමයි. ලොකු දුව විශාඛා විද්‍යාලයට ගිය නමුත් පොඩි දුව එයට ඇතුළත් කිරීමට නොහැකි වූයේ අපේ ගෙදර සිට දුර ප්‍රමාණය "සැතපුම් දෙකකට" වැඩි වූ නිසාය. නුගේගොඩ අනුලා විද්‍යාලයට ප්‍රවේශය ලබා ගැනීමට ද නොහැකි විය. ඒ නිසා, පෞද්ගලික පාසලක් වූ සුජාතා විද්‍යාලයට පොඩි දුව භාර දුනිමි. එවකට එහි විදුහල්පතිනිය වූයේ *ක්ලේරා මොට්වානි* නැමැති ප්‍රසිද්ධ ගුරුවරියයි. මෙම පාසලේ ප්‍රාථමික අංශය තිබුණේ තුන්මුල්ල හන්දියේ නිවසකය. පොඩි දුවගේ මුල් ම ගුරුවරිය වූයේ *මල්කාන්ති රත්නායක* නම් වූ තරුණ ගුරුවරියයි.

දිනපතා පෙරවරුවේ මිරිහාන විජේසේකර මාවතේ පිහිටි නිවසේ සිට ජුබිලි කණුවට පැමිණ "මාර්ග අංක 113'' බස් රථයේ තුන්මුල්ල හන්දියට පැමිණ පොඩි දුව පාසලට හැර ගොස්, මම ගංගොඩවිල විජේරාම හන්දිය දක්වා යන බසයකින් විශ්ව විද්‍යාලයට ගියෙමි. දවල් පාසල ඇරෙන විට නැවත එහි ගොස් දරුවා සමඟ ගෙදර පැමිණ හවස් වරුවේ දේශන සඳහා විශ්ව විද්‍යාලයට ගියෙමි. 1971 අප්‍රේල් කැරැල්ලට පසුව ගංගොඩවිල යනවා වෙනුවට *ලොංග්ඩන්* පෙදෙසට ගියෙමි. දවල්ට පාසලට ගොස් දරුවා සමග ගෙදර ගියෙමි. දිවා ආහාරය ගෙන නැවත දේශන සඳහා ලොංග්ඩන් පෙදෙසට ගියෙමි. 1972 ඔක්තෝම්බර් මාසය දක්වා මේ ආකාරයට පාසල් යෑමට සිදුවිය.

සිව්වන දරු උපත

1971 වසර අග දී ප්‍රේමා නැවත වරක් ගැබ් ගත් බව දැනගන්නට ලැබිණි. එසේ වුවත්, මෙවර 1965 වසරේ දී මෙන් ගෙදර දොර වැඩ කටයුතුවලින් වැළැකී සිටීමට අවශ්‍ය නොවීය. 1972 අගෝස්තු මස 31 දින දරු ප්‍රසූතිය සිදුවිය. මෙයට ශල්‍ය කර්මයක් අවශ්‍ය විය. එයට හේතුව වූ කරුණු මෙසේය: දරු ප්‍රසූතිය ලංවන විට ගෙදර වැඩට සේවිකාවක ලබා දීමට මා මිත්‍ර නන්දසිරි ගුණරත්න මහතා කටයුතු කළේය. එම සේවිකාව මිරිහාන අපේ ගෙදරට කැඳවා ගෙන ඒමට ප්‍රේමාත් මාත් නන්දසිරි මිතුරාගේ ගල්කිස්සේ නිවසට ගියෙමු. බස් රථයෙන් ගමන ගොස් ආපසු එන විට,

අත්තිඩියේ සිට නුගේගොඩ දක්වා ම ප්‍රේමාට අසුනක් දීමට කෙනෙක් බසයේ සිටියේ නැත. එදින රාත්‍රියේ ප්‍රේමාට විළිරුදාව සෑදී නතර නොවීම දියර ගලන්නට වූ නිසා, කාසල් වීදියේ මාතෘ නිවාසයට ඇතුළු කළෙමි. පසුදින තත්ත්වය බරපතල වූයෙන් ශල්‍ය කර්මයක් කර දරුවා බිහිකර ගැනීමට වෛද්‍යවරු තීරණය කළහ. එය සාර්ථක විය. මෙවර ඉපදුණේ පිරිමි දරුවෙකි. ඒ ***වරුණ කෝසල ඒකනායක*** නම් වූ මගේ පොඩි පුතාය. ශල්‍ය කර්මයක් කළයුතු වුව ද ඔහු ඉපදුනේ ද ලොකු පුතා උපන් දිනයේ දී ම ය. ඉන් පසුව අයියාගේත් මල්ලිගේත් උපන් දින සැමරුම එක දිනකට යෙදුණේය.

ලොකු දුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියේ, මේ වසරේ දෙසැම්බර් මාසයේ දී ය. එයින් හොඳින් සමත් වී උසස් පෙළට ඉගෙන ගැනීම 1973 වසරේ දී ආරම්භ කරන ලදී. බඹරදෙණියේ නැන්දම්මාගේ ලොකු දුවගේ දුව ද ආනන්ද බාලිකා විද්‍යාලයේ උසස් පෙළ ඉගෙන ගැනීමට අපේ ගෙදර නවත්වන ලදී. දරුවා බෙහෙවින් ම නිහඬ වූවාය. ඉඩ පාඩු තිබෙන හැම වේලාවක ම පාහේ පොඩි පුතා වඩා ගෙන සිටීමට කැමැත්තක් දැක්වූවාය. ඒ දරුවාට පිරිමි සහෝදරයින් නොසිටි නිසා, පොඩි පුතාට වැඩි ඇල්මක් දැක්වූවා වන්නට ඇත. මෙම වර්ෂය අවසාන භාගය වන විට ඇති වූ ආහාරපාන දුෂ්කරතා නිසා, ඒ දරුවා පාසල අසල ගෙදරක නැවැත්වූ බව ආරංචි විය. මේ කාරණය නිසා, බඹරදෙණියේ නැන්දම්මා ටික කලක් යනතුරු මා සමඟ අමනාපයෙන් සිටි බව පසුව අත්දුටු සිද්ධියක් නිසා වැටහිණි. උදව්වක් කරනවා නම් කුමන කරදර හිරිහැර මැද වුව ද එය අවසන් වන තුරු ඉවසා දරා ගෙන සිටිය යුතු යැ'යි තේරුම් ගතිමි. වසර කීපයකට පසුව නැන්දම්මා නැවතත් පෙර පරිදි ම මට දයාව කරුණාව දැක්වීමට පටන් ගත්තාය. නැන්දම්මාගේ හැටි එහෙමයි.

1973 ආහාර අභේනිය

1973 සැප්තැම්බර් මාසයේ දී ලෝක බනිජ තෙල් මිල ඉහළ දැමීමක් *"ඔපෙක්"* සංවිධානය විසින් සිදුකරන ලදී. ඒ වකවානුවේ දී ම ලෝක ආහාර හිඟයක් ද ඇති විය. ඒ නිසා, අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින් *"වගා සංග්‍රාමයක්"* ප්‍රකාශයට පත් කරන ලදී. හැකි සෑම බිම්කඩක ම යම්කිසි ආහාර බෝගයක් වගා කිරීමට උනන්දු කරවන ලදී. ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය පාලනය කිරීමට දැඩි පියවර කීපයක් ගන්නා ලදී. වී හාල් එහා මෙහා ප්‍රවාහනය කිරීම් සීමා කළේය. සමහර තැන්වල මාර්ග බාධක පිහිටුවන ලදී. *"හාල්පොලු"* යයි කීවේ මේවාටයි. කෙනෙකුට හාල් සේරු දෙකකට වැඩිය ගෙන යෑම තහනම් කරන ලදී. ඊට වැඩිය ගෙන යන්නට අවශ්‍ය නම්,

ප්‍රාදේශීය සහකාර ඒජන්තවරයාගෙන් (ඩියාරෝ) බලපත්‍රයක් ලබා ගත යුතු විය. සතියේ දින දෙකක් භෝජනාගාරවල බත් විකිණීම තහනම් කරන ලදී.

මෙය දැඩි සීමාකාරී වැඩ පිළිවෙලක් වුවත්, කෙටි කාලයක් තුළ අල බතල, මඤ්ඤොක්කා, අතුරු ආහාර භෝග දිවයින පුරා වගා කිරීමට පටන් ගන්නා ලදී. සමහර භෝගවල මිල වැඩිවීම නිසා ද ගොවීන්ට වැඩි ආදායමක් ලැබෙන්නට පටන් ගත්තේය. බඩඉරිඟු විශාල වශයෙන් ආහාරයට ගන්නා බදුල්ල දිස්ත්‍රික්කයේ *මීගහකිවුල* ප්‍රදේශයේ රුපියල් පහළොවක් පමණ වූ ඉරිඟු බුසල, රුපියල් පනහ හැට දක්වා වැඩිවිය. එනමුත්, වැඩි කල් නොගොස් මෙම ප්‍රයත්නය කඩාකප්පල් කිරීමට බලවේග කීපයක් ම ක්‍රියාත්මක විය.

ජේ.ආර්. ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් වූ එක්සත් ජාතික පක්ෂය මහ ජනතාව හාමතේ තබන බවට චෝදනා කරමින්, *"හාල් පොල්ල" "මිරිස් පොල්ල"* යනාදිය දැඩි විචේචනයට ලක් කළේය. 1962 ඛනිජ තෙල් ව්‍යාපාරය ජනසතු කළ අවස්ථාවේ දී, අත්හිටවූ *ජී.ඇල්. 480 වැඩ සටහන* යටතේ ඇමරිකන් පිටි සැපයීම නැවත ආරම්භ කරන ලදී. ඒ නිසා, බඩඉරිඟු මිල ගණන් නැවතත් පහළ වැටී වගාවට ඇති වූ උනන්දුව නැති වී ගියේය. මේ අතරතුර, ආණ්ඩුව තුළ ද අර්බුදයක් ඇති කොට, *ලංකා සම සමාජ පක්ෂයේ* සාමාජිකයන් වූ මුදල් ඇමති ආචාර්ය *එන්.එම්. පෙරේරා මහතා,* වැවිලි කර්මාන්ත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඇමති *කොල්වින් ආර්. ද සිල්වා මහතා* සහ ප්‍රවාහන ඇමති *ලෙස්ලි ගුණවර්ධන මහතා* එම රජයෙන් ඉවත් වූහ. 1975 වන විට, විරුද්ධ පක්ෂයේ උද්ඝෝෂණ ව්‍යාපාරය දැඩි විය. එක්සත් ජාතික පක්ෂය ධාන්‍ය රාත්තල් අටක් දෙන බවටත් ධර්මිෂ්ට සමාජයක් බිහිකරන බවටත් පොරොන්දු විය. මේ ආදී නොයෙක් හේතු නිසා, බණ්ඩාරනායක මැතිනියගේ රජය ජනතා අප්‍රසාදයට පත්වුවත්, 1973 ආරම්භ කළ වැඩ පිළිවෙල ඉදිරියට ගෙන ගියා නම්, ස්වයංපෝෂිත ආර්ථිකයකට මඟ සැලසීමට තිබිණි.

වගා ව්‍යාපාරය

රජයේ මෙම වැඩ පිළිවෙලට සමගාමී ව මහජනයාගේ ද වගා ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් පැන නැඟිණි. මා පෞද්ගලික ව එයට දායක වූ ආකාරය ද මෙහි දී විස්තර කළ යුතු ව තිබේ. මේ අවදියේ *මුතියංගන රජමහා විහාරයේ විහාරාධිපති පදවිය දැරුවේ සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ අනුනායක හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස නාහිමිපාණෝය.*

මුතියංගන විහාරයට අයත් ඉඩම් වගයක් මීගහකිවුලේ කෝමාරික ඇල ව්‍යාපාරය යටතේ තිබිණි. මම උනන්දු වන්නේ නම්, එයින් ඉඩම් කට්ටියක් ලබා ගැනීමට හැකි බව අපේ අයියා මට දන්වා තිබිණි. ඒ අනුව, නායක හාමුදුරුවෝ එහි වඩින දිනක අයියාත්, මාත්, අයියාගේ පුතුන් දෙදෙනෙකුත් කෝමාරිකයට ගියෙමු. මට ඉඩම් කට්ටියක් වෙන් කර දෙන ලෙස එම ඉඩම් මනින මිනින්දෝරුවරයාට නියම කරන ලදී. ඉන් පසුව විටින් විට එහි ගොස් ඉඩමේ වගාවක් කිරීමට පියවර ගතිමි. මේ 1973 ඔක්තෝම්බර් මාසයේ දී පමණය. කෝමාරික ඉඩම් වගා කිරීමට ජලය ලැබුණේ *ලොග්ගල්ඔය* හරහා ඉදිකර තිබූ අමුණකිනි. මෙය පැරණි වාරිමාර්ග ව්‍යාපාරයක් විය. මුතියංගන පන්සලේ ඉඩම් එහි දෙවෙනි අදියර යටතට වැටිණි. පැරණි මහ ඇල අවසන් වූ තැන සිට මහ ඇලක් කපා තිබිණි. එනමුත්, කොන්ක්‍රීට් බැමි ආදිය ඉදිකර ජලය ලබා දීමට කටයුතු කීපයක් අවශ්‍ය විය. මට ලැබුණ ඉඩමට ජලය ලබා ගත හැකි වූයේ පරණ වෙලෙන් පහළට ඉදි කර තිබුණ *"රජ ඇල"* නම් ජල මාර්ගයෙනි.

1973 මාස් කන්න ආරම්භයට පෙර ඉඩම එළිකර වගාවට සූදානම් කළ යුතු ව තිබිණි. පළමුවෙන් ම එම ඉඩමේ සුදුසු තැනක වාඩියක් තනා ගත්තෙමි. අවට කැලෑවෙන් අවශ්‍ය ලී දඬු කපා ගෙන පොල් අතු සෙවිලි කළ පැලක් ඉදිකර ගතිමි. පොල් අතුවලින් ම "බිත්ති" වටකරන ලදී. ගලහ ප්‍රදේශයෙන් වැඩට සේවකයන් දෙදෙනෙක් සොයා ගෙන වගා කටයුතු ආරම්භ කළෙමි. මුල් වතාවේ *සෝයා බෝංචි, ලංකා පරිප්පු, රට කජු, වට්ටක්කා, වම්බටු* වැනි දේ වගා කළෙමු.

මෙම කටයුතු සාර්ථක ව ඉටුකර ගැනීමට නිතිපතා එහි යා යුතු විය. විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු පැහැර නොහැර ඉටු කළ යුතු විය. ඒ නිසා, එක් සතියක ඉදිරි සතිය සඳහා ද දේශන ආදිය පවත්වා ඊළඟ සතියේ කෝමාරිකයට ගොස් එහි ගත කළෙමි. විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකුට ශිෂ්‍යයින් සමඟ මනා අවබෝධයක් ඇති කර ගත් විට මෙවැනි නම්‍යතාවකින් කටයුතු කිරීමට "නිදහසක්" ලැබේ.

කොළඹ සිට කෝමාරිකයට මාර්ග කීපයකින් යන්නට පුළුවන. කොළඹ-බදුල්ල රාත්‍රී දුම්රියෙන් බදුල්ලට ගොස් එතැනින් මීගහකිවුලට බස් එකකින් යා හැකිය. මීගහකිවුලේ සිට සැතපුම් දෙකක් පමණ පයින් ගොස් කෝමාරික ඉඩමට ළඟාවීමට පුළුවන. මේ සඳහා ද *අකුරුකඩුව* පාර, *කෙසෙල්වත්ත* පාර, *කෝන්ගහමුල* පාර, *කෝමාරික පරණ පාර* ආදී වශයෙන් පිවිසුම් මාර්ග කීපයක් විය. බදුල්ලේ සිට කැටවත්ත බස් එකින් ගිය විට කෝන්ගහමුල දී බැස කන්දේ පහළට ගොස් ඉඩමට යා හැකි විය.

මේ වකවානුවේ දී ආහාර හිඟයක් පැවති නිසා, *කැටවත්ත සමූපකාර සමිතියේ* කළමනාකාර මහතා දැන හැඳිනගෙන, මේ සඳහා පිළියම් යොදා ගතිමි. සලාකයට දෙන හාල්, පිටි ආදිය එම ප්‍රදේශයේ පාරිභෝගිකයින් ලබා ගත්තේ අඩුවෙනි. ඒ නිසා ඉතිරියක් තිබේ. මේ කාලයේ කිරිපිටි ආදිය නාගරික ප්‍රදේශවලින් සොයා ගැනීම අතිශයින් ම දුෂ්කර විය. *නෙස්ප්‍රේ* වැනි කිරිපිටි වර්ග පහසුවෙන් ම මෙම සමූපකාර කඩෙන් මිල දී ගැනීමට තිබිණි. සලාකයට දෙන සීනි රාත්තලක් ශත 72ක් වුවත්, වැඩිපුර අවශ්‍ය සීනි සඳහා රාත්තලකට රු: 7.50ක් ගෙවිය යුතු විය. සලාකයට ගන්නා සීනි සමහර දෙනෙක් රු: 5.00ට විකුණති. ඒ ක්‍රමයෙන් වැඩිපුර සීනි ලබා ගැනීමට හැකි විය. එමෙන් ම, කෝමාරික අසල ගමක *(කළුගහකඳුර)* කිතුල් හකුරු හා පැණි නිපද වූ නිසා ඒවායින් ද අඩුවක් නොවීය. වගා ව්‍යාපාරය ගැන සොයා බැලීමට යන මේ ගමන්වල දී, මගේ ගෙදරට (දරුවන්ට) අවශ්‍ය කිරිපිටි හා සීනි වැනි දේ ගෙන ඒමට ද අවස්ථාවක් ලැබිණි. මේ ගමන් බිමන් කොපමණ දුෂ්කර වුවත්, මගේ දරුවන්ට හිඟයකින් තොරව කිරි ලබා දීමට පුළුවන් වූ නිසා, මෙය කළයුතු දෙයක් විය. මා මේ ගමන් ගිය විට *"ප්‍රේමා"* දරුවන් රැක බලා ගැනීමට කරදර වින්ද බව දනිමි.

1974 අප්‍රේල් නිවාඩුවට මුළු පවුල ම සමඟ කෝමාරික ගියෙමි. ඒ අය එහි දී නිදාගත්තේ කැලෑ කෝටුවලින් ඉදිකළ මැස්සකය. මුං ඇට අස්වැන්න එකතු කිරීමට ඒ අය හවුල් වූහ. දිනපතා දිය නෑමට හැතැප්ම කාලක පමණ දුරින් වූ *ලොග්ගල් ඔයට* ගියෙමු. අව් කාෂ්ටකයේ ඇවිද ගොස් සීතල ජල ධාරාවෙන් නාගන්නට හැකි විය. මෙය දරුවන්ට නව අත්දැකීම් වුවත් දුක් කරදර ගැන ද හැඟීමක් ඇති වන්නට ඇත. එහි දී ලොකු පුතාට උණ සෑදී මීගහකිවුල රෝහලෙන් ප්‍රතිකාර ලබා ගතිමු. ඒ සඳහා සැතපුම් දෙක තුනක් පයින් ම යෑමට සිදුවිය. ඉඩමේ වැඩ කරන විට විෂ සහිත පස් වගයක් පැගීම නිසා මගේ කකුල්වල තුවාල හට ගැනී අමාරු විය. ආපසු කොළඹට විත් ප්‍රතිකාරයක් ලෙස "ජෙන්සන් වයලට්" (Jensen Violet) ගල්වා ඒවා සුව කර ගතිමි. වසර දෙකකට පමණ පසුව මේ ඉඩම, අනුනායක හිමිපාණන්ගේ උපදෙස් අනුව, මගේ හීන්මාමාගේ පුතා *ගුණරත්න මල්ලීට* පැවරුවෙමි.

දරුවන්ගේ ප්‍රගතිය

මෙම කාල පරිච්ඡේදය තුළ මටත් මගේ දරුවන්ටත් වැදගත් කරුණු කීපයක් සිදුවිය. ලොකු දුව අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගය සමත් වී 1976 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වූවාය. එම වසරේ දී විශාඛා විද්‍යාලයේ ශිෂ්‍යාවන් තිස් දෙනෙක් පමණ මෙම වෛද්‍ය පීඨයට ඇතුළත් වූ බව කියනු ලැබේ.

ලොකු පුතා සාමාන්‍ය පෙළ විභාගය සමත් වූයේ 1975 වසරේ දී ය. උසස් පෙළ සඳහා ඉගෙන ගෙන විභාගය සමත්වූයේ 1979 වසරේ දී ය. ඔහු තම විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමට සම්බන්ධ වී ක්‍රීඩාවට වැඩි අවධානයක් යොමු කළ නිසා, විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට තරම් ප්‍රතිඵල ලැබුණේ නැත. පොඩි දුව 1975 වර්ෂයේ දී පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වුවත්, එවර ද විශාඛා විද්‍යාලයට ප්‍රවේශය ලැබීමේ බලාපොරොත්තුව අහෝසි විය. 1976 ඔක්තෝම්බර් 01 සිට මට I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට උසස්වීමක් ලැබිණි.

ශිෂ්‍ය ව්‍යාපාරය

1976 වර්ෂයේ දී විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ ප්‍රබල වෙනස්වීමක් සිදුවිය. වසර ගණනාවක් *ලංකා ජාතික ශිෂ්‍ය සංගමය* මහා ශිෂ්‍ය සංගමයේ බලය තහවුරු කර ගෙන සිටියේය. එනමුත්, ඒ අය සමඟ ම සිටි කණ්ඩායමක් 1976 දී නිලවරණයට නාමයෝජනා භාර දෙන විට, වෙන ම කණ්ඩායමක් සේ තරගයට ඉදිරිපත් විය. ඒ විකල්ප කණ්ඩායම ජයග්‍රහණය කළේය. ඒ අයට ජනතා විමුක්ති පෙරමුණේ අනුග්‍රහය ලැබුණු බවට ආරංචියක් පැතිර ගියේය. 1998 දී විශ්‍රාම යන තුරුත් ලංකා ජාතික ශිෂ්‍ය සංගමයට මහා ශිෂ්‍ය සංගමයේ බලය ලබා ගැනීමට බැරි විය. විකල්ප කණ්ඩායම 1976 දී තරගයට ඉදිරිපත් වූයේ මැර බලය අහෝසි කිරීමටය. එනමුත්, ඉන් පසුව ක්‍රමයෙන් මැර බලය තව තවත් වර්ධනය විය. නවසිය අසූගණන්වල දෙවෙනි භාගයේ දී මැර බලය අතිශයින් ම උග්‍ර විය. ඒ ගැන යථා කාලයේ දී විස්තර කරන්නෙමි.

සමීප නෑදෑයින්ගේ වියෝව

මෙම කාල පරිච්ඡේදය තුළ මාගේ සමීප ඥාතීන් කීප දෙනෙකුගේ අභාවයන් සිදුවිය. ***නවරත්න මල්ලී, පල්ලේවෙල නැන්දම්මා, සිරිනාම අයියා*** මේ අතර වූහ.

නවරත්න මල්ලී, *පල්ලේවෙල නැන්දම්මාගේ* බාල පුතාය. *සිරිනාම* අයියාගේ මල්ලීය. අපේ අයියා විවාහ කර ගෙන සිටි *නන්දා* අක්කාගේ ද මල්ලීය. ඔහු මට අවුරුද්දකට පමණ බාලය. අප දෙදෙනා සමීප ඥාතීන් පමණක් නොව කුළුපග මිතුරෝ ද වූහ. *නවරත්න මල්ලී* හුන්නස්ගිරියේ තැපැල් මහතාය. පදිංචි වී සිටියේ අපේ ගමේ *එක්කස්සේ* නිවසක් තනා ගෙනය. හේ අතිශයින් කැප වූ දේශපාලන චරිතයක් විය. 1972 මැයි දින උත්සවය සඳහා කොළඹ පැමිණ ආපසු ගිය විට අසනීප වී මරණයට

පත්විය. ප්‍රදේශයේ සමාජ සේවකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි ඔහුගේ අවමංගල්‍යයට විශාල පිරිසක් සහභාගී වූහ. මාත් එහි ගොස් දින දෙක තුනක් ම ගත කළෙමි. ඔහුගේ අභාවය සිදුවන විට වයස අවුරුදු හතළිහක් වත් නැත. මින් පසුව මම *කෝමාරික* ඉඩමට ගොස් සිටින දවසක *පල්ලේවෙල* නැන්නදම්මාගේ අභාවය පිළිබඳ ආරංචිය ලැබිණි. අයියාගේ පුතෙකු වූ "රාජා" ද *කෝමාරික* සිටි නිසා, අපි දෙදෙනා ම *පල්ලේවෙල* යෑමට පිටත් වූයෙමු. *මීගකිවුලේ* සිට මහියංගනයට ගොස් එතැනින් මහනුවර යන බසයකින් *මාඩුගොඩට* යන විට රෑ හතහමාරට පමණ ඇත. සැතපුම් දෙක හමාරක් පමණ දුර පයින් ම ගොස් *පල්ලෙවෙලට* ගියේ තද වැස්සේය. නැන්දම්මාගේ අවමඟුල් කටයුතුවලින් පසුව *සිරිනාම* අයියාත්, මාත් පාගමනින් ම *මාඩුගොඩට* ආවෙමු. ඒ වන විට *සිරිනාම* අයියා පපුවේ අමාරුකාරයෙක් ව සිටි බව දැනගතිමි. *සිරිනාම* අයියා මහනුවර බසයකින් පේරාදෙණියට යන්ට ගියේය. මම මීගහකිවුලට ගියෙමි. දින දෙක තුනකට පසුව කොළඹ ගිය විට **සිරිනාම අයියාගේ** අභාවය ගැන ආරංචිය ලැබිණි. ඒ අයියා සේවය කළේ පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේය. අවමංගල උත්සවයට සහභාගී වීමට එහි ගියෙමි.

1975 වසරේ දී **මගේ නැන්දම්මා** (ප්‍රේමාගේ අම්මා) අභාවප්‍රාප්ත වූවාය. එවකට පරිපාලන සේවයේ සීමිත තරග විභාග සඳහා පෙනී සිටී අපේක්ෂකයින්ට විෂයානුබද්ධ අධ්‍යයනය සම්බන්ධ දේශන මාලාවක් පවත්වමින් සිටියෙමි. ඒ නිසා, පණිවිඩය ලැබුණු විගස ප්‍රේමා සහ දරුවන් තල්පාවිලට පිටත්කර හැරියෙමි. දේශනය අවසන් වූ පසු එදින රාත්‍රියේ මගේ අසල්වැසි *වීරරත්න* මහතා සමඟ මාතරට ගියෙමි. මාතර බස් නැවතුමට ළඟාවන විට රාත්‍රී දොළහට පමණ වන්නට ඇත. ඒ වේලාවේ *තල්පාවිලට* යන්නට වාහන කිසිවක් නොවූයෙන් අපි දෙදෙනා සැතපුම් තුනක් පමණ පයින් ම ගියෙමු. පසුදා භූමදාන කටයුතු සිදුකෙරිණි.

1977 වසරේ මැයි මාසයේ දී මගේ එක කුස උපන් **අක්කා** අභාවප්‍රාප්ත වූවාය. අවමංගල උත්සවය සඳහා *මිණිපේ හඳගනාවේ* අක්කලාගේ ගෙදර යන විටත් බොහෝ නෑදෑ පිරිස් පැමිණ සිටියහ. අක්කාගේ මරණය සිදුවන විට වයස අවුරුදු තුනක පමණ දුවක් ද උන්නාය. ඊට වැඩිමහල් ගැහැණු දරුවන් හතර දෙනෙක් හා පිරිමි දරුවන් දෙදෙනෙක් වූහ. ඒ කිසිවෙක් විවාහපත් වී සිටියේ නැත. මෙම අවමඟුලට අපේ අයියාගේ වැඩිමහල් දරුවන් ද පැමිණ සිටි බව මතකය. ක්‍රියාශීලී තරුණ තරුණියන් වූ ඒ අය, එවකට පැවැති දේශපාලන වාතාවරණය ගැන ද කතාබහ කළහ. ඒ හැම දෙනා ම පාහේ එක්සත් ජාතික පක්ෂයට හිතවත් ව සිටි බව පෙනිණි. මහ මැතිවරණයට කිට්ටුව රටේ පැවැති දේශපාලන ප්‍රචාරය නිසා එවැනි තත්ත්වයක් ඇති වී යයි සිතමි. එවකට පැවති ආණ්ඩුව අවුරුදු හතක් බලයේ

සිටි නිසාත්, "හාල් පොලු" වැනි ප්‍රචාර නිසා මහජනයා අතර කළකිරීමක් පැවැති නිසාත් මෙම තත්වය ඇති වූවා විය හැකිය. මේ කතාබහ අනාගත පෙර ළකුණක් පෙන්නුම් කළ බව අවබෝධ විය.

අපේ අම්මා



නංගී, අම්මා (වාඩිවී) අක්කා, පිටුපසින් පොද්දල්ගොඩ මස්සිනා 1953)

අපේ අම්මා අභාවප්‍රාප්ත වූයේ 1977 ජූනි මාසයේ දී ය. අම්මා ජීවත් ව සිටිය දී අවසන් වරට දකින්නට ලැබුණේ අක්කාගේ අවමංගලයට මිණිපේ හඳගනාවේ අක්කලාගේ ගෙදර ගිය විටය. අම්මා මට කීවේ "දරුවෝ අපිට ඉස්සර වෙලා යනවා" වැනි දෙයකි. අක්කාගේ අභාවය ගැන මහත් ශෝකයෙන් සිටි බව පැහැදිලි විය. ඊට මාසයකට පමණ පසුව අම්මාගේ අභාවය ගැන ආරංචිය ලැබිණි. ඒ වන විට මා පදිංචි ව සිටියේ විද්‍යෝදය විශ්ව විද්‍යාලය අසල රත්තනපිටියේ ගෙදරය. ප්‍රේමාත්, මාත් (නංගීගේ දුව) අනුලා දුවත් රාත්‍රියේ ම ගමනට පිටත්වූයෙමු. මහනුවර බසයකින් පොල්-ගහ මුල හන්දියට පැමිණ, *ගුණතිලක* මල්ලීලාගේ ගෙදර ගියෙමු. ඒ වන විට වෙලාව පාන්දර දෙකට පමණ වන්නට ඇත. මහනුවරට ගියත් ඒ වේලාවේ මිණිපේ බස් නැති නිසාය. පාන්දර පහට පමණ ගුණතිලක මල්ලී ද සමඟ මහනුවරට ගොස් මිණිපේ ගෙදරට යන විට උදේ 9.30 පමණ වන්නට ඇත.

ඒ වන විටත් එදින පස්වරුවේ අම්මාගේ භූමදානය කටයුතු සූදානම් කර තිබිණි. අම්මාගේ බාල සහෝදරයෙකු වූ අස්ගිරි මහා විහාරයේ පරිවේණාධිපති *හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස අනුනායක හිමිපාණන්* ද වැඩම කළහ. ඉතා චාම් ලෙස භූමදාන කටයුතු අවසන් විය. දානමය පිංකමට පසුව දිනක මිණිපේ ගියෙමු. එසේ වුවත්, අපේ අම්මා පිළිබඳ මතක සටහන් වළලා දැමීමට නොහැකියි. විටින් විට නැවත නැවතත් මා කුඩා කාලයේ සිට අම්මාගෙන් ලැබූ දයාව කරුණාව සිතට නැඟේ.

අපේ අම්මා අභාවප්‍රාප්ත වන විට වයස අවුරුදු අසූ තුනක් විය. මළපොතේ අකුරක් නොදත් නමුත් ජීවිතයේ අත්දැකීම් නිසා අපට දුන් උපදෙස්, අවවාද අපට මහත් සේ උපකාර විය. අම්මා ගැන මගේ මුල් ම මතකය *ඇල්දම්පෝරුවේ* සිට ගමට පැමිණීම සම්බන්ධයෙනි. ගම අසල

පතනක කොටා තිබූ හේනක සිට අම්මා සමඟ ගෙදර එනවිට පය ලිස්සා වැටී කණුවක ඇනීමෙන් මගේ දකුණු ඉලයේ තුවාලයක් ගැන මතකය දෙවැන්නයි. අම්මා මා වඩා ගෙන *මාඩුගොඩ* රෝහලට ගෙන ගොස් තුවාලයට ප්‍රතිකාර ලබා ගත්තේය. ගමේ කොල්ලන් සමඟ රෑ වනතුරු සෙල්ලම් කර අඳුරේ ගෙදර එන විට, ගිනි පෙනෙල්ලක් අතේ තියාගෙන හිටි අම්මා මං පිච්චීමට තරවටු කිරීම ද මතකය. මේ තරවටුවට පසුව නැවත රෑ වී ගෙදර ආවේ නැත.

මගේ වයස අවුරුදු දොළහ පමණ වනතුරු මා හැදී වැඩුණේ අම්මා ඇසුරේය. අකුරු කියවීමට පුළුවන් වූ විට *යශෝධරාවන, ධාතු විස්තරය* වැනි පොත් මා ළඟා කියවා ගත්තාය. ඒවායේ කවි අම්මාට කට පාඩමෙන් ගැයීමට පුලුවන්කම තිබිණි. ගොයම් නෙලන විට නෙළුම් කවි කීමට ද අම්මාට හැකියාවක් තිබිණි.

මිණිපේ ඉඩම් ලැබුණ පසු අප්පච්චී එහි ගිය නමුත්, 1949 පමණ වනතුරු අම්මා ගමට වී සිටියේ කරුණු කීපයක් නිසාය. රජය විසින් ගමේ ළමුන්ට කිරි සැපයීම සඳහා පිහිටුවන ලද "කිරිදෙන මධ්‍යස්ථානය" අම්මා විසින් පවත්වා ගෙන ගියාය. එයට ප්‍රධාන හේතුව (අභාවප්‍රාප්ත වූ) කලාවැවේ අක්කාගේ දරුවා පෝෂණය කිරීමය. මගේ පාසල් නිවාඩුවට නේවාසිකාගාරයේ සිට ගමේ පැමිණීම තවත් හේතුවක් විය. ගමේ තිබුණ කුඹුරු වැඩකරවා ගැනීම ද එහි තිබූ ගේදොර අභාවයට යා නොදී පවත්වා ගෙන යෑම ද තවත් අරමුණු වන්නට ඇත. එනමුත්, අම්මාට කුඩා ගැහැණු දරුවෙකු සමඟ තනියම ගමට වී සිටීම තවදුරටත් කළ නොහැකි වන විට මෙන් ම කොළඹ ගේ ලැබීම ආදිය නිසා, මිණිපේ පදිංචියට ගියාය. ඉන් පසුව මගෙ නිවාඩු කාලයේ දී මා ගියේ මිණිපේටයි.

අප්පච්චීගේ අභාවයට පසුව මිණිපේ කුඹුර හා ගොඩ ඉඩම බෙදා වෙන්කර දී, අම්මා තම මිණිපිරිය සමඟ කුඩා නිවසක් ඉදිකර ගෙන එහි පදිංචි වී සිටියාය. මා විටින් විට මිණිපේ ගිය අවස්ථාවන්හි අපේ ගෙදරට විත් ඉන්නට කී නමුත්, මිණිබිරියගෙන් නිදහස් වන තුරු එයට කැමති වූයේ නැත. වරක් මා උඩහමුල්ලේ පදිංචි ව සිටින විට ඇස් පරීක්ෂා කරවා ගැනීමට පැමිණ සති දෙක තුනක් අප නිවසේ නැවතී සිටියාය. නැවත වරක් අප ලේවැල්ලේ පදිංචි වී සිටි සමයේ දී සති කීපයක් අප සමඟ ගත කළාය. අප විජේසේකර මාවතේ සිටිය දී මාස තුනක් පමණ අප සමඟ ගත කළාය. එවර අම්මා ආවේ අප සමඟ ජීවත්වීමට කැමැත්තෙනි. එනමුත්, මාස තුනකට පසුව සුපුරුදු පරිසරයට යා යුතු බව ඈ කීවාය. අපේ ගෙදර සිටින විට තම කාමරයට හා මිදුලට පමණක් කොටු වී සිටිය යුතු විය. අප හැර වෙන දන්නා හඳුනන කෙනෙක් නොවීය. නිදහසේ වතුර ටිකක් නා ගැනීමට බැරි විය. මිණිපේ ඉන්නා විට මේ කිසිවකට බාධාවක් නැත. නැවතත් සුපුරුදු

පරිසරයේ මිණිබිරිය සමඟ ජීවත්වීම අම්මාගේ අවශ්‍යතාව බව පැහැදිලි විය. අම්මා අභාවප්‍රාප්ත වනතුරු ජීවත්ව සිටියේ එම පරිසරයේය. මිණිබිරිය සමඟ හිටියත් අම්මා තනිය ම තමාගේ ආහාරපාන සකසා ගත්තාය. අප මිණිපේ ගිය අවස්ථාවල අපට ද කෑම බීම උයා දුන්නාය. අම්මා අවසාන මාසය හමාර අනුන්ගෙන් යැපෙන්නට ඇත. එතෙක් ස්වාධීන ව ජීවත්වීම අම්මාගේ කැමැත්ත වූ බව තේරුම් ගතිමි. එසේ ද වුවත්, මගෙන් අම්මාට යුතුකම් ඉටුවූවා දැ'යි සැකයක් පවතින නමුත් දැන් කුමක් කරන්න ද?

1977න් පසු දේශපාලන වාතාවරණය

දේශපාලන ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් 1977 වසරේ දී ඇති විය. එතෙක් බලයේ සිටි බණ්ඩාරනායක මැතිනියගේ රජය පරාජයට පත්විය. මහ මැතිවරණයේ දී *ජේ.ආර්. ජයවර්ධන* මැතිතුමාගේ නායකත්වයෙන් වූ එක්සත් ජාතික පක්ෂය, පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලයක් ලබා ගත්තේය. *ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ* මන්ත්‍රීන් සංඛ්‍යාව අට දෙනෙක් පමණ විය. 1947 සිට අඛණ්ඩ ව පාර්ලිමේන්තුවේ සිටි *ලංකා සමසමාජ පක්ෂයේ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා* සහ *ලංකා කොමියුනිස්ට් පක්ෂයේ පීටර් කේනමන් මහතා* වැනි මන්ත්‍රීවරු (බණ්ඩාරනායක රජයේ ඇමතිවරු) පවා පරාජයට පත්වූහ.

ධර්මිෂ්ට සමාජයක් බිහිකිරීමට බලයට පැමිණි ජයවර්ධන රජය, මැතිවරණය අවසන් වූ වහා ම රටේ පැතිර ගිය ප්‍රචණ්ඩ ක්‍රියා නවත්වනවා වෙනුවට, "පොලීසියට සතියක් නිවාඩු" දෙන ලදී. පාර්ලිමේන්තුවේ ප්‍රධාන විරුද්ධ පක්ෂය වූයේ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණයි. එම පක්ෂයේ ප්‍රකාශිත අරමුණ වූයේ, රට තුළ වෙන ම *"ඊලාම් රාජ්‍යයක්"* පිහිටුවීමයි. පසු කාලයේ දී ත්‍රස්තවාදී මහා අරගලයට පදනම වැටුණේ මේ ආකාරයෙනි. එක්සත් ජාතික පක්ෂයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය දෙමළ ජාතිවාදී දේශපාලනය ශක්තිමත් කළේය. 1982 ජනාධිපතිවරණයේ දී මේ බව හොඳින් පැහැදිලි විය.

ජේ.ආර්. ජයවර්ධන රජය, 1972 ජනරජ ව්‍යවස්ථාව සංශෝධනය කර, *විධායක ජනාධිපති තනතුර* ස්ථාපිත කළේය. ඒ යටතේ, 1977 මහජන ඡන්දයෙන් තේරී පත්වූ අගමැතිවරයා විධායක ජනාධිපතිවරයා විය. ඉන්පසුව, 1982 වසරේ දී ජනාධිපතිවරණයක් පවත්වන ලදී. එම තරගයට ඉදිරිපත් වූ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා *ජේ.ආර්.ජයවර්ධන* මහතා සහ *හෙක්ටර් කොබ්බෑකඩුව* මහතාය. කොබ්බෑකඩුව මහතා 1970 සිරිමාවෝ බණ්ඩාරනායක රජයේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිවරයා විය. එතුමාගේ යුගයේ දියත් කළ වගා ව්‍යාපාරයෙන් විශාල වශයෙන් ප්‍රයෝජන ලැබුවේ උතුරු

පළාතේ ගොවි ජනතාවයි. ඒ නිසා, ඒ අය බොහෝ දෙනෙක් කොබ්බෑකඩුව මහතාට ඡන්දය දුන්හ. දෙමළ ජාතිකයෙකු වූ *කුමාර් පොන්නම්බලම් මහතාට* එතරම් සහයෝගයක් යාපනේ ජනතාවගෙන් ලැබුණේ නැත.

1982 ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ ජේ.ආර්. ජයවර්ධන මහතා, 1977 මහ මැතිවරණයෙන් තේරී පත්වූ පාර්ලිමේන්තුවේ නිල කාලය වසර හයකින් දීර්ඝ කිරීමට ජනමත විචාරණයක් පැවැත්වීය. මේ නිසා, 1983 ජූලි මාසයේ පැවැත්විය යුතු ව තිබූ මහමැතිවරණය නොපැවැත්විණි. මහ මැතිවරණයක් පවත්වන තුරු බලා ගෙන සිටි දකුණේ මෙන් ම උතුරේ තරුණ තරුණියන්ට එය කල්දැමීම තම දේශපාලන අපේක්ෂාවන්ට බාධා කිරීමක් වැනි විය. මේ නිසා, තරුණ ජන කොටස් නොයෙක් ආකාරයේ අරගලවලට පෙළඹිණි. 1983 කළු ජූලිය ද එම අරගලයේ ම එක් අවස්ථාවක් වූවා විය හැකි නමුත් එය එළිදැක්කේ වෙනත් ආකාරයකටය. එම සිද්ධිය අපට බලපෑ අයුරු වෙන ම විස්තර කිරීමට බලාපොරොත්තු වේ. ඊට පෙර නැවත 1977 වසරට ආපසු යා යුතු ව තිබේ.

පළමුවන සප්ත වාර්ෂික නිවාඩුව

විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ, වසර හතක් අඛණ්ඩ ව සේවය කළ විට, එක් වසරක (වැටුප් සහිතව) නිවාඩුවක් ගැනීමට හිමිකම ලබති. ඒ අනුව, 1977 සැප්තැම්බර් 30වෙනි දා වන විට, මට වසරක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් ලබා ගත හැකි විය. මෙම නිවාඩුව ඵලදායක ව ගත කිරීමට නම්, යම්කිසි විදේශ ආයතනයක පර්යේෂණයක හෝ ඉගෙනීමක නිරත විය යුතු වේ. (දැනට දේශීය වශයෙන් වුව ද එම නිවාඩුව ගතකළ හැකි වේ) මගේ සප්ත වාර්ෂික නිවාඩුව ගත කිරීමට සුදුසු ආයතනයක් ගැන සොයා බලන විට, එවකට විදේශ ආධාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූ, මහ බැංකුවේ මාණ්ඩලික නිලධාරියෙකු වූ, පී. ඒ.එස්. දහනායක මහතා මට හෝඩුවාවක් ලබා දුන්නේය.

දහනායක මහතා අප විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු විය. හෙතෙම 1964 වසරේ උපාධි ප්‍රදානෝත්සවයට අප සමඟ ඉදිරිපත් ව මහ බැංකුවේ සේවයට බැඳුණු කෙනෙකි. 1969 වසරේ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන සමයේ අපි එකට පාඩම් කළෙමු. මේ නිසා, යම්කිසි දැන ඇඳුනුම්කමක් ද තිබිණි. එතුමා මට කීවේ, නෙදර්ලන්ත රජය විසින් ප්‍රදානය කරන ශිෂ්‍යත්ව ක්‍රමයක් තිබෙන බවයි. ඒ වකවානුවේ නෙදර්ලන්තයේ සමාජ අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (Institute of Social Studies) මාස පහළොවක ශාස්ත්‍රපති පාඨමාලාවක් අලුතෙන් ආරම්භ කරන බව දැනගන්නට ලැබිණි. ඒ සඳහා නියමානුකූල මාර්ග ඔස්සේ ඉල්ලුම්පතක් ඉදිරිපත් කළෙමි.

මෙවැනි ආයතනයක පාඨමාලාවක් සඳහා තෝරා ගත් විට, සුදුසුකම් තිබෙන අයට නෙදර්ලන්ත රජයේ විදේශ ආධාර දෙපාර්තමේන්තුව විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාවට මා තෝරා ගත් බවත් ඒ සඳහා ශිෂ්‍යත්වයක් ලැබෙන බවත් දන්වා එවා තිබිණි. මේ වන විට අප පීඨයේ පීඨාධිපති වූයේ, 1976 වසරේ නෙදර්ලන්තයේ එම ආයතනයට ගොස් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ආපසු පැමිණ සිටි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය *කේ.ඒ. මුණසිංහ මහතාය.* පාඨමාලාවට මා තෝරා ගත් පසු, මුණසිංහ මහතා ලවා නෙදර්ලන්තයේ දෙදෙනෙකුට ලිපි දෙකක් යවන ලදී. එකක් ISS ආයතනයේ කථිකාචාර්යවරයෙකු වූ *වසන්ත් මොහාරීර්* මහතාටය. ඉන්දියානු සම්භවයක් ඇති එතුමා ලාංකිකයන්ට ද උදව් උපකාර කරන කෙනෙකු විය. මට අවශ්‍ය පාඨමාලාවක් ගැන උපදෙස් ලබා ගැනීම එතුමාට ලිපියක් යැවීමේ අරමුණ විය. ඉක්මනින් ම එතුමා පිළිතුරක් එවා තිබිණි. අනෙක් ලිපිය යැව්වේ මුණසිංහ මහතා හේග් නුවර සිටිය දී නවාතැන් ගෙන සිටි නිවසේ අයිතිකාර *ඒ.එච්.බෙස්ට් මහත්මියටයි.* මා නෙදර්ලන්තයට ගිය විට නේවාසික පහසුකම් ලබා ගැනීම එහි අරමුණ විය. එතුමියට අයිති නිවසේ උඩ තට්ටුවේ එක කාමරයක ලාංකිකයන් දෙදෙනෙකු සිටින බවත්, ඊට ඉහළ මාලයේ කාමරයක් තිබෙන බවත්, ඒ නිසා මට නැවතීමේ පහසුකම් සැපයිය හැකි බවත් *බෙස්ට් මහත්මිය* දන්වා එවා තිබිණි.

විදේශගත වීම සඳහා මෙරට බලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය විය. විශ්ව විද්‍යාල බලධාරීන්ගෙන් සප්ත වාර්ෂික නිවාඩුව අනුමත කරවා ගතිමි. විදේශගත වීමට පෙර අග්‍රාමාත්‍යතුමාගේ අවසරය ලබා ගත යුතු ව තිබිණි. මැතිවරණයකින් පසුව නව අගමැතිවරයෙකු පත්ව සිටි නිසා, එහි යම්කිසි ප්‍රමාදයක් තිබිණි. අග්‍රාමාත්‍ය කාර්යාලයට ගොස් ඒ ගැන සොයා බැලුවෙමි. එවකට අගමැති වූයේ ජේ.ආර්.ජයවර්ධන මහතාය. එතුමාගේ ලේකම්වරයා මැණික්දිවෙල මහතාය. කටුබැද්ද විශ්ව විද්‍යාලයේ විජේසේකර නම් මහතෙක් ද අග්‍රාමාත්‍ය අනුමැතිය අපේක්ෂා කරන බව දැනගන්නට ලැබිණි. ටික දිනකින් අවශ්‍ය අනුමැතිය ලැබිණි.

ඊළඟ පියවර වූයේ, නෙදර්ලන්තයට ඇතුළුවීමට විසා බලපත්‍ර හා ගුවන් ගමන් බලපත්‍ර ලබා ගැනීමයි. වීසා ලබා ගැනීමට නෙදර්ලන්තයේ කොන්සල් ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළෙමි. මාගේ විදේශ ගමන් පොතේ විසා බලපත්‍රය සටහන් කර තිබේ. කොළඹ පිහිටි නෙදර්ලන්තයට අයත් සමාගමක් වූ කේ.එල්.එම්. ආයතනයෙන් ගුවන් ගමන් බලපත්‍රය ලබා ගතිමි. එම බලපත්‍රය *කොළඹ* සිට *කරච්චිය* දක්වා පාකිස්තාන් ජාත්‍යන්තර ගුවන් සේවයේ (P.I.A) යානයකින් ගොස්, එතැන් සිට *ඇම්ස්ටර්ඩෑම්* නුවරට *නෙදර්ලන්ත ගුවන් සේවයේ* (K.L.M.) යානයකින් ගමන් කිරීමටත් විය.

මේ සියල්ලට පෙර විදේශගත වීමට අවශ්‍ය ඇඳුම් පැළඳුම් හා උපකරණ සොයා ගත යුතු විය. ඇඳුම් බෑගයක් හා සීතලට ඇඳීමට සුදුසු කලිසමක් මුණසිංහ මහතාගෙන් ඉල්ලා ගතිමි. තවත් කලිසමක් හා කමිස දෙකක් ගම්සභා හන්දියේ හේවාවිතාරණ ටේලර් සාප්පුවෙන් මස්සවා ගතිමි. 1964 දී පමණ එතැනින් ම මසා ගත් කලිසම් කෝට් කට්ටලයක් මා සතු ව තිබිණි. කොළඹ ජාවත්ත පාරේ සළුසල ආයතනයෙන් (ඕවර් කෝට්) දිග උණුසුම් කබායක් මිල දී ගතිමි. එය රු: 150/=ක් වී යයි මතකය. එවකට පිටරටින් "බේල්" ඇඳුම් ගෙන්වා විකිණීම ප්‍රචලිත ව පැවතිණි. ඒවා ඒ රටවල අය පාවිච්චි කර ඉවතලන ඇඳුම් නිසා, එතරම් මිලක් නොවීය. කලිසම් කෝට් රෙදි හිඟයක් පැවති නිසා සළුසල මගින් ද "බේල්" ඇඳුම් ගෙන්වන ලදී.

දැන් විදේශගත වීමට අවශ්‍ය සියලු දේ සම්පූර්ණය. කටුනායක ගුවන් තොටුපල අසල නිවසක පදිංචි ව සිටි, අප ආචාර්ය මණ්ඩලයේ සාමාජික මා මිත්‍ර *ඩබ්ලිව්.එම්. ජයරත්න මහතා*, විදේශ ගතවන ගමනේ දී එතුමාගේ නිවසට පැමිණ රාත්‍රී භෝජනයට සහභාගි වන ලෙස මට ආරාධනා කර තිබිණි. ඒ අනුව, ප්‍රේමා හා දරුවන් ද තවත් මිතුරන් කීප දෙනෙක් ද එහි ගියෙමු. මට ප්‍රවාහන පහසුකම් සැපයුවේ මා මිත්‍ර *ඩබ්ලිව්.එම්. අබේරත්න බණ්ඩාර මහතාය. මුණසිංහ, ආර්.ඒ.ඒ. පෙරේරා* යන මිතරෝ ද පැමිණ සිටියහ. රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු අපි සියලු දෙනා ම ගුවන් තොටුපලට ගියෙමු. එතැනින් හැම දෙනාගෙන් ම සමුගෙන, ඉතිරි කටයුතු තනියම කර ගැනීමට සිදුවිය.

රේගු නිලධාරීන්ට පරීක්ෂා කිරීමට ගමන් මල්ල විවෘත කර පෙන්වීමි. ඉන්පසුව ගුවන් ගමන් බලපත්‍රය සමඟ අදාළ කවුන්ටරයට ගොස් බඩුමල්ල හා ගුවන් ගමන් බලපත්‍රය භාර දී "ගුවන් යානා පිවිසුම් පත්‍රය" (Boarding Pass) ලබා ගත යුතු විය. ඒවා අවසන් කර, ආගමන විගමන නිලධාරීන් සිටින කවුන්ටරයට ගොස් විදේශ ගමන් බලපත්‍රය භාර දිය යුතුය. විදේශගත වීමට අවශ්‍ය නිසි අවසරය තිබේ ද, යනාදිය පරීක්ෂා කර බලා, විදේශගත වූ බවට මුද්‍රාවක් තබා, විදේශ ගමන් බලපත්‍රය (පොත) (Passport) ආපසු ලැබේ. මේ සියල්ලට ආකෘති පත්‍ර කීපයක් පිරවිය යුතු වේ. පුරුදුකාරයින්ට ඒවා සරල දේ වුවත් පළමුවරට විදේශගත වන්නකුට සුළු ප්‍රශ්නයකට උත්තර ලිවීම පවා ගැටලුවක් වේ. මේ සියල්ල අවසන් වූවාට පසුව ගුවන් යානයට යන ප්‍රදේශයට පැමිණේ. ගුවන් යානාවට යෑමට වේලාව පැමිණි විට අදාළ දොරටුවේ දී ගුවන් සේවිකාවන් විසින් යාන පත්‍රයේ කොටසක් කඩා ගෙන ඉතුරු කොටස මගියා අතට දෙනු ලැබේ. ඒ අවධියේ ගුවන් යානයට ගියේ *"ටාමැක්"* එක දිගේ පයින් ම ය. (දැන් නම් ඒ සඳහා වූ බස්රථ තිබේ) ඈතින් නවත්වා තිබෙන ගුවන් යානයට තරප්පු

පෙළක් නැඟ ප්‍රවේශ විය යුතු වේ. තමාට අදාළ ආසනය සොයා ගෙන, අතේ ගෙන යන බඩුමල්ල ආසනවලට ඉහළින් ඇති රාක්කය තුළ තැන්පත් කරනු ලැබේ. අවශ්‍ය නම්, ගුවන් සේවිකාවන්ගේ සහාය ලැබේ.

පාකිස්ථානයේ කරච්චි ගුවන් තොටුපල දක්වා මා ගියේ P.I.A. යානයකින් නිසා, එහි වූ සේවිකාවෝ පාකිස්ථාන ජාතිකයින් වූහ. විදේශ ගතවන සියලු දෙනා ම දන්නා දේවල් මට අලුත් ම අත්දැකීම් විය. ගුවන් යානයේ දොර වසා ගමනට සූදානම් වන විට, හැම දෙනාගෙන් ම වෙන්වී යන මහා පාලු ගතියක් දැනිණි. කඳුලක් දෙකක් වැටෙන්නට විය. මා මේ ගමන පිටත් ව ගියේ 1977 සැප්තැම්බර් මස 16වෙනි දා රාත්‍රියේය. පැය හතරකින් පමණ කරච්චි ගුවන් තොටුපලට ළඟා වීමෙන් පසුව, පැය දාහතරක් පමණ කරච්චියේ නතර වී සිටීමට සිදුවිය. කවුදෝ කෙනෙක් කුලී රථයකින් මා ඇතුළු කීප දෙනෙක් කරච්චි නගරයේ පිහිටි MEHRAN නම් හෝටලයට කැඳවා ගෙන ගියේය. මට විවේක ගැනීමට එහි කාමරයක් ලැබිණි. පැය කීපයක් නිදාගෙන සිට පෙරවරු නවයට පමණ නගරයේ ඇවිදීමට පිටත්වූයෙමි. එදින මුස්ලිම් උත්සව දිනයක් වූ හෙයින්, කඩ සාප්පු බොහෝමයක් වසා තිබිණි. මඟදී මුණ ගැහෙන එහි වැසියන් එකිනෙකා *"මුබරක් ඊඩ්"* යන්න ප්‍රකාශ කරමින් සුභ පතා ගන්නවා දක්නට ලැබිණි. දිවා ආහාරය සඳහා හෝටලයට පැමිණ භෝජන ශාලාවේ දී ආහාරය ගන්නා අතර, ලංකාවේ කෙනෙක් ලෙස පෙනුණු තරුණයෙකුට කථාබහ කිරීමට ප්‍රයත්න දැරුවෙමි. එනමුත් ඔහු එයට මැළිකමක් දැක්වීය. ඔහු ලෙබනනය බලා යන ලාංකික දමිළ තරුණයෙකු බව පමණක් සඳහන් කළේය. සමහර විට ඔහු අවි පුහුණුව සඳහා එහි ගිය කෙනෙකු වන්නට ද ඉඩ තිබේ.

17වෙනි දා රාත්‍රියේ කරච්චියෙන් පිටත් වන කේ.එල්.එම් ගුවන් යානයකට යෑමට *මේහ්රාන්* හෝටලයෙන් පිටත් වී ගියෙමි. ගුවන් තොටුපලේ දී KLM නියෝජිතයෙක් මගේ ගමන් මල්ල (Bag එක) කොහේ දැ'යි විමසූ විට මා කියා සිටියේ, මම එය ගුවන් තොටුපලේ දමා ගිය බවයි. එවිට ඔහු මා සමඟ, දමා ගිය ගුවන් බඩු තිබෙන කාමරයකට ගොස් මගේ බඩුමල්ල සොයා ගතිමු. එය සොයා ගත් පසුව ඔහු කීවේ, එය මා ඉවත් කර ගෙන නැති නිසා නැතිවීමට වුව ද ඉඩ තිබුණ බවයි. ඉන්පසුව මගේ බඩුමල්ල සමඟ ගුවන් ගමන් කවුන්ටරයට ගොස් ඇම්ස්ටර්ඩෑම් ගුවන් තොටුපලට එය යැවීමට භාර දී යාන පත්‍රය (Boarding Pass) ලබා ගෙන, නියමිත වේලාවට ගුවන් යානයට ගියෙමි. එම යානය ඩී.සී. 10 දරන පුළුල් බඳ (Wide Bodied) සහිත නෙදර්ලන්ත (KLM) ගුවන් සමාගමේ යානයක් විය. එහි තුළ හරස් අතට ආසන අටක් පමණ තිබිණි. ඇම්ස්ටර්ඩෑම් ගුවන් තොටුපලට පසුදා ළඟා වන විට පෙරවරු හතට පමණ වන්නට ඇත.


2
දරන්නාගේ නම / Name of Bearer: Mr Ariyapala Ekanayake
(විවාහක නම) විවාහයට පෙර තිබූ නම / Maiden Name (if married): —
වෘත්තිය / Profession: University Lecturer
උපන් ස්ථානය සහ දිනය / Place and Date of Birth: Halyala 26-03-1933
පදිංචිය / Residence: Sri Lanka
හඳුනා ගැනීමේ ලකුණු / Distinguishing Marks: —
උස / Height: 5' 4" කේශ වර්ණය / Colour of hair: Black ඇස්වල වර්ණය / Colour of eyes: Black
ජාතිකත්වය / National Status: ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි / Citizen of Sri Lanka by descent
Please See Page Number Fourteen
අවලංගුවන දිනය / Date of Expiry: 1980-07-08
නිකුත් කළ ස්ථානය / Issued at: Colombo
දිනය / Date: 1977-07-09
Competent Authority under the Immigrants and Emigrants Act
හැඳුනුම් පත්‍රය අංකය / Identity Card Number: 330860219 V
E 137936

පළමුවන විදේශ ගමන් බලපත්‍රය (1977)

නෙදර්ලන්තය

මෙම ගුවන් තොටුපලේ දී බඩුමල්ල ලබා ගෙන, ආගමන විගමන පාලන අංශයට ගොස් එම කටයුතු අවසන් කර, පිටතින් පිහිටි බැංකුවකින් මා ලංකාවෙන් ගෙනගිය පවුම් තිහක මුදල ලන්දේසි මුදල්වලට මාරු කරගෙන, *හේග් නුවරට* යන බසය වෙත ගියෙමි. *ඇම්ස්ටර්ඩෑම්* ගුවන් තොටුපලේ සිට නිතිපතා *හේග්* ආදී නගරවලට බස් සේවයක් තිබේ. හේග් නෙදර්ලන්තයේ අගනුවරයි. මා යුතු වූයේ එහි මධ්‍යම දුම්රිය ස්ථානය වෙතය. එතැනින් කුලී රථයකින් *වයිසන්-බෲක් ස්ට්‍රාට්* අංක 109 දරණ ස්ථානයේ පිහිටි *බෙස්ට් මහත්මියගේ* නිවසට ගියෙමි.

බෙස්ට් මහත්මිය මා පිළිගෙන, නිවසේ ඉහළ ම මාලයේ පිහිටි කුඩා කාමරයකට එක්කර ගෙන ගියාය. එම කාමරයේ ඇඳක්, කුඩා මේසයක්, පුටුවක් හා ඇඳුම් දමා ගැනීමට අල්මාරියක් ආදිය තිබිණි. සීතල සමයේ දී ක්‍රියාත්මක කළ හැකි ගෑස් උණුසුම්කරණයක් ජනේලයක් අසල තිබිණි. කාමරයට ඇතුළුවීමට පෙර පිටතින් මුහුණ සෝදා ගැනීමට ජල කරාමයක් හා බේසමක් විය. මගේ ඇඳුම් බෑගය ආදිය කාමරයේ නිසි පරිදි තැන්පත් කර මුහුණ කට සෝදා ගැනීමෙන් පසුව පහළට බැස්සෙමි.

එම නිවසේ පළමුවන මහලේ තිබුණ කාමරයක තවත් ලාංකිකයින් දෙදෙනෙක් පදිංචි ව සිටින බව කීවේය. ඒ වේලාවේ ඒ දෙදෙනා බැහැර ගොස් උන්හ. අනිත් දෙදෙනා සිටි කාමරයට යාබද ව අපගේ මුළුතැන්ගෙය, නාන කුටිය හා වැසිකිලිය පිහිටා තිබිණි. ඒවා පෙන්නා දුන් පසුව, අයි.එස්.එස්. (ISS) ආයතනයට හා නගරයේ කඩ සාප්පු පිහිටි ප්‍රදේශයට යන අයුරු බෙස්ට් මහත්මියගෙන් අසා දැනගතිමි. මා එහි ගියේ ඉරිදා දිනක නිසා, සමහර කඩ සාප්පු වසා තිබිණි. එනමුද්‍ර, නිවස ඉදිරිපසින්වූ කුඩා ප්‍රමාණයේ කඩයකින් පාන් ගෙඩියක්, මාජරින් බඳුනක් වැනි දේ කීපයක් මිලයට ගත හැකි විය.

ඉන් පසුව සැතපුම් එකහමාරක් පමණ දුරින් පිහිටි *විටබෘග්* (Wittebrug) නමැති ගොඩනැඟිල්ල වෙත පාගමනින් ම ගියෙමි. අයි.එස්.එස්. ආයතනය පිහිටා තිබුණේ එම ගොඩනැඟිල්ලේය. මේ දිනවල විදේශකයින් පැමිණෙන නිසා, ආයතනයේ නේවාසිකාගාර පහසුකම් සලසා දෙන නිලධාරියා සේවයේ යෙදී සිටියේය. ඔහු ලංකාවට පැමිණ ඒ ගැන දන්නා කෙනෙකු විය. මම නේවාසිකාගාර පහසුකම් ඇති බව කී විට, බෙස්ට් මහත්මියගේ නිවස ගැන තොරතුරු ඔහු දන්නා බව කීවේය.

මගේ නවාතැනේ සිට අයි.එස්.එස්. ආයතනයට බසයෙන් හා ට්‍රෑම් කාර් එකෙන් ද පැමිණිය හැකිය. නවාතැන අසල ඇති මහා මාර්ගයට ගිය විට *හේග් නගර* මැදට යන බසයක් පැමිණේ. එයින් ගොස් නගර මධ්‍යයේ සිට *විටබෘග්* දක්වා යන ට්‍රෑම් කාර් එකකින් යන ගමන එක ක්‍රමයකි. නගර මධ්‍යයේ සිට බස් එකකින් ගොස් අයි.එස්.එස්. ආයතනය අසලට ම ළඟාවීම දෙවෙනි ක්‍රමයයි. වියදමක් නැති පහසු ම ක්‍රමය පයින් ගමනයි. මා මුලින් ගියේ ඒ ආකාරයටයි. ඉන් පසුව ද නිතර අනුගමනය කළේ ඒ ක්‍රමයයි.

පළමුවන දිනයේ බැහැර ගොස් ආපසු පැමිණෙන විට, අනෙක් ලාංකික නේවාසිකයෙකු වූ *කීර්ති සේනාරත්න* මහතා පැමිණ සිටියේය. ඔහු කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරියෙකි. ඩෙල්ෆ්ට් (Delft) හි පිහිටි R.V.B. ආයතනයේ ඩිප්ලෝමාවක් හැදෑරීමට පැමිණ සිටියේය. ඔහු මාතර ප්‍රදේශයේ කෙනෙකු බව කතාබහෙන් දැනගතිමි. හේග් නගරයෙන් බැහැර ගොස් සිටි රත්නායක මහතා ද දින දෙක තුනකට පසුව ආපසු පැමිණියේය. ඒ මහතා ද ඩිප්ලෝමාවක් හැදෑරීමට පැමිණ සිටි කර්මාන්ත සංවර්ධන මංඩලයේ නිලධාරියෙකු විය. ඔහු මහනුවර ප්‍රදේශයේ කෙනෙකු බව දැනගතිමි.

අප තිදෙනා රාත්‍රී ආහාරය හවුලේ සලසා ගතිමු. ඒ සඳහා අවශ්‍ය සහල්, පරිප්පු, අල, ලොකු ලූණු, කුඩා සැමන් ටින්, එළවළු ආදිය *කොන්මාර්* (Conmar) නම් වූ වෙළඳසැලෙන් හා *හොබ්බේමාප්ලේන්* Hobbemaplein) නම් වූ තැන පිහිටි විවෘත සති අන්ත පොළෙන් මිල දී ගතිමු. උදාහරණයක් වශයෙන්, නොකැඩුණු හොඳ හාල් කිලෝවක් ගිල්ඩර් නවයක් පමණ වුවත් අප මිල දී ගත්තේ කොන්මාර්හි තිබූ කැඩුණු හාල්ය. ඒ සඳහා ගෙවිය යුතු වූයේ කිලෝවකට ගිල්ඩරයකට අඩු මුදලකි. එකල ලංකාවේ හිඟ ආහාරයක් වූ රතු පරිප්පු කිලෝවක් ගිල්ඩර් තුනකට පමණ ගත හැකි විය. කිලෝ පහේ අල මල්ලක් ගිල්ඩරයක් පමණ විය. ලොකු ලූණු කිලෝවක් ශත පනහක් පමණ විය. විවෘත පොළේ ගෝවා මලක් ගිල්ඩරයක් පමණ විය. අප තිදෙනා පොළේ ගියේ පයින් ම ය. එක ගමනක් සැතපුම් දෙක තුනක් වන්නට ඇත. *කොන්මාර්* ගියේ ද ඒ පරිදිමය.

අපගේ රාත්‍රී ආහාරය සඳහා මාසික වියදම එක් අයෙකුට ගිල්ඩර් හැත්තෑපහක් පමණ විය. උදේ හා දිවා ආහාරය වෙන වෙන ම සලසා ගතිමු. එය බොහෝ විට පාන් හා මාජරීන්වලින් යුක්ත විය. උදේට දියර කිරි වීදුරුවක් පානය කළෙමු. අප හැම දෙනා ම ලංකාවෙන් යන විට දුරු මිරිස් කුඩු ගෙන ගොස් තිබුණ නිසා, ඒ සඳහා වියදමක් නොවීය. තේ කොළ ද එසේ ම ය. මාසයකට වරක් ගෑස් සඳහා සුළු මුදලක් ගෙවීමට සිදුවිය. මගේ කාමර කුලිය මාසයකට ගිල්ඩර් 190ක් විය. මේ ආදී සියලු වියදම් සඳහා මාසයකට ගිල්ඩර් හාරසීයක්වත් වියදම් කළේ නැත. අප නේවාසිකාගාරයේ ජීවිතය මේ ආකාරයට ගෙවී ගියේය. එවකට ගිල්ඩරයක් රුපියල් 4.90ක් විය.

පසුදින සඳුදා අයි.එස්.එස්. ආයතනයට ගිය පසු, අලුතෙන් පැමිණ සිටි නොයෙක් රටවල අප විදේශාධාර දෙපාර්තමේන්තුවට එක්කර ගෙන යන ලදී. එහි දී ඉදිරි කාලය තුළ අප අනුගමනය කළ යුතු දේ ගැන පැහැදිලි කිරීමක් යම් යම් නිලධාරීන් විසින් කරන ලදී. අපගේ පළමුවන මාසික දීමනාව ද එදින ලබා දෙන ලදී. එය ගිල්ඩර් 1,200ක් විය. ඉන්පසුව මාසික ව තැපෑලෙන් එම මුදල ලබා ගැනීමට වවුචරයක් එවන ලදී. අසල පිහිටි තැපැල් කන්තෝරුවෙන් ඒ මුදල ලබා ගත හැකි විය. අප නවාතැනේ සිටි ලාංකිකයින්ගේ උපදෙස් අනුව, *"පරිබස්" බැංකුවේ* ඉතිරි කිරීම් ගිණුමක් අරඹා, මාස්පතා දීමනාවෙන් ගිල්ඩර් 800ක් වත් එහි තැන්පත් කළෙමි. හැකි තරම් ලොකු මුදලක් ඉතිරි කර ගැනීම එක ම අරමුණ විය. ඒ නිසා, සති අන්ත හා නිවාඩු දිනයන්හි යුරෝපයේ නොයෙක් රටවල ඇවිදීමට ඉඩ ප්‍රස්ථාව තිබුණ නමුත්, ඒ වෙනුවෙන් මුදල් වියදම් කළේ නැත. ආයතනය මගින් වියදම් කර සංවිධානය කර තිබූ ගමන් පමණක් ගියෙමි.

අයි.එස්.එස්. ආයතනය

නෙදර්ලන්තයේ විශ්ව විද්‍යාල පදනම (Netherlands Universities Fundatiosion for International Coopertation - NUFFIC) *නම්ක්* අරමුදල් සපයන ආයතන රාශියක් තිබේ. Institute of Social Studies - ISS සමාජ අධ්‍යයන ආයතනය මේවායින් එකකි. මා ප්‍රවේශය ලැබුවේ එම ආයතනයටයි. එහි ප්‍රධානියා වූයේ මණ්ඩපාධිපතිවරයාය (Rector) අධ්‍යාපන කටයුතු භාර ව පීඨාධිපතිවරයෙක් විය. ශිෂ්‍ය කටයුතු භාර අංශයක් තිබිණි.

මෙම ආයතනයේ 1952 පමණ සිට කෙටිකාලීන (මාස හයකට අඩු) ඩිප්ලෝමා පාඨමාලා සහ දහ මාසයේ ශාස්ත්‍රපති පාඨමාලා කීපයක් පවත්වා ගෙන ගියේය. ඒවාට ලෝකයේ නොයක් රටවලින් අපේක්ෂකයන් ඇතුළත් කර ගත්හ. මෙම අය බෙහෙවින් ම සංවර්ධනය වන රටවලිනි. 1977 වසරේ මාස පහළොවක ශාස්ත්‍රපති පාඨමාලාවක් ආරම්භ කළේය.



1978 අප්‍රේල් අයි එස් එස් ආයතනය ඉදිරිපිට හිමවැටීම. මෙහි සිවානන්දන්, ලලිතා දිසානායක, වික්‍රමනායක, ඒකනායක හා මෙතර් ආදී ලාංකිකයින් ද සිටී

මා ඇතුළත් කර තිබුණේ එම පාඨමාලාවටයි. ආරම්භක අවදිය අත්හදා බැලීම්වලින් ගහණ විය. අපේක්ෂකයන්ගේ විවිධ අවශ්‍යතාවන් අනුව විශේෂ විෂය ක්ෂේත්‍රය තෝරා ගැනීමට නිදහසක් තිබිණි. මට අවශ්‍ය වූයේ රාජ්‍ය පරිපාලන විද්‍යාව / සංවර්ධන පරිපාලනය පදනම් වූ පාඨමාලාවකි. *ලයිබීරියාව, සැම්බියාව, උගන්ඩාව* යන රටවලින් පැමිණ සිටි තරුණ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් තිදෙනෙකුට ද එවැනි පාඨමාලාවක් අවශ්‍ය විය. ඒ නිසා, අපි හතර දෙනා නොයෙක් විෂයයන් එකට හැදෑරුවෙමු. මගේ කුළුපග ම මිතුරා වූයේ ලයිබීරියාවේ *මැක්ස්වෙල් පෝ* නැමැත්තාය. වෙනත් අය සමඟ ද විවිධ විෂයයන් හැදෑරීම සිදුවිය.

මාගේ ගුරුවරුන් වූයේ *මයිකල් ෆෝල්ටාස්, ෆන් නිව්වන්හුවුස, රේමන් ඇප්තෝර්ප්, කෙන් පෝස්ට්, ෆර්ක්‍රයිසර්, කෙස්ටර්, ක්‍රාක්* යන අයයි. මේ අතරින්, *මයිකල් ෆෝල්ටාස්* (Micheal Faltas) මහතා මගේ නිබන්ධන සුපරීක්ෂකවරයා ද විය. ඒ නිසා එතුමා සමඟ ඉතා කිට්ටුවෙන් ඇසුරු කිරීමට ලැබිණි. ඔස්ට්‍රියානු ජාතිකයෙකු වූ ෆෝල්ටාස් මහතා, විවිධ රටවල නොයෙක් අත්දැකීම් තිබුණු පියෙකු වැනි ගුරුවරයෙකි. *වසන්ත් මොහාරීර් මහතා* මට නිශ්චිත විෂයයක් ඉගැන්නුවේ නැති නමුත්, අධ්‍යාපන චාරිකා ආදියට මා සහභාගී කරවා ගත් ගුරුවරයෙකි. සංවර්ධන පරිපාලන ඩිප්ලෝමාධාරීන්ගේ

අධ්‍යාපන චාරිකාවට සහභාගී වීමට ඉඩදීම නිසා, නෙදර්ලන්තයේ දකුණු *ලිම්බර්ග්* (South Limburg) ප්‍රදේශයේ අත්හැරදැමූ ගල්අඟුරු ආකර තිබූ ප්‍රදේශයක දින දෙක තුනක් සංචාරයක යා හැකි විය. වරක *මොහාරීර්* මහතාගේ ඉතියෝපියානු මිතුරෙක් *ඇම්ස්ටර්ඩෑම්* විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කළ පී.එච්.ඩී. නිබන්ධනයක් පරීක්ෂක මඩුල්ලක් ඉදිරියේ විස්තර කරන අයුරු (Defending Ph. D. Thesis) දැක ගැනීමට මා එක්කර ගෙන ගියේය. එය නව අත්දැකීමක් විය. *මොහාරීර් හා ෆෝල්ටාස්* යන ගුරුවරු දෙදෙනා ම මා ඇතුළු දෙතුන් දෙනෙක් ඒ මහතුන්ගේ නිවෙස්වලට කැඳවා රාත්‍රී භෝජන සංග්‍රහ පවත්වන ලදී.

පාඨමාලාවේ මුල් අවදියේ ම, එහි ගැටලු කීපයක් නිරාකරණය කර ගැනීමට, විසිතිස් ගණනක් වූ අපේක්ෂකයින් සමඟ ආයතනයේ ගුරු මඩුල්ලක් *ආන්හෙම්* (Arnheim) නම් ප්‍රදේශයේ විවේක ස්ථානයට ගොස් දින දෙක තුනක් තුළ සාකච්ඡා කර, යම් යම් වෙනස්කම් ඇති කරන ලදී. *ආන්හෙම්* නම් ස්ථානය දෙවෙනි ලෝක යුද සමයේ නාසි හමුදාව සමඟ ඕලන්ද භටයින් විශාල සංග්‍රාමයක් කළ තැනකි. ගුරුවරුන්ගෙන්, විවිධ විෂයන්ගෙන් හා අධ්‍යාපන චාරිකාවලින් ලද අත්දැකීම් හා දැනුමට අමතර ව, විවිධ රටවලින් පැමිණි අය සමඟ ඇසුරින් ද මගේ දැනුම හා අත්දැකීම් පුළුල් වූ බවට කිසිම සැකයක් නැත.

මෙම කාලපරිච්ඡේදය තුළ දී *ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා* ආදී රටවල් රාශියක අය මෙම පාඨමාලාවේ දී මට මුණගැසිණි. *කොලොම්බියා, පේරු, ආර්ජන්ටිනා, බ්‍රසීලය, ගයානා* යන දකුණු ඇමරිකානු රටවලද *පිලිපීනය, ඉන්දුනීසියාව, පකිස්තානය* යන ආසියාතික රටවල ද *සූඩානය, සැම්බියාව, උතුරු රොඩේසියාව (පසුව සිම්බාබ්වේ), ටැන්සානියාව, උගන්ඩාව, දකුණු අප්‍රිකාව, ඝානාව, නයිජීරියාව, ලයිබීරියාව, සියෙරා ලියොන්, මුරුසිය* යන අප්‍රිකානු රටවල ද පුද්ගලයින් රාශියක් මුණ ගැසී ඇසුරු කිරීමට ලැබිණි. ජීවිත කාලයක් තුළ කොපමණ පොත්පත් කියෙව්වත් මෙවැනි දැනුමක් අත්දැකීමක් ලබාගැනීමට නොහැකි වේ.

අප්‍රිකානු රටවල බොහෝ ජන කොටස් ක්‍රිස්තියානිකරණයට ලක් වී බටහිර අනුකරණයට ද නතු වී ඇති බව පෙනී ගියේය. ඒ සමඟ ම එම බලපෑම නිසා යම්කිසි ප්‍රතිවිරුද්ධ ප්‍රවණතාවක් එනම්, බටහිර රටවල දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රවාදී බලවේග අප්‍රිකානු රටවල් බොහොමයක පැන නැගිණි. *දකුණු අප්‍රිකාවේ* හා *දකුණු රොඩේසියාවේ* නිදහස් අරගලවලට නායකත්වය දෙන ලද්දේ ක්‍රිස්තියානි හා බටහිරකණයට පාත්‍ර වූ දේශීය නායකයින් විසිනි. දකුණු රොඩේසියාවේ නිදහස් අරගලයෙන් පසුව එය *සිම්බාබ්වේ* නමින් හැඳින්විණි. එයට නායකත්වය දුන් *රොබට්*

මුගාබේ ජාත්‍යන්තර වශයෙන් කොපමණ පිරිහීමකට ලක්වූවත්, ඒ රට තුළ ඔහුට තවමත් පිළිගැනීමක් ඇති බව පෙනේ. මැතිවරණ දූෂිත යයි කියන නමුත්, ජනතා පිළිගැනීමක් නොමැති ව බලයේ සිටීමට කුමන නායකයකුට වුව ද අපහසු වේ. *ටැන්සානියාව* වැනි රටවල දේශීය සමාජවාදයක් ගොඩනැඟීමට ප්‍රයත්න දරන ලදී. එහි බටහිර බලපෑම එතරම් නොවී යයි සිතමි. එසේ වුවත්, එම රටවල් විරුද්ධ කර ගැනීමෙන් වැළකී සිටිය බව ද පෙනී යයි.

ලතින් ඇමරිකානු රටවල මුළුමනින් ම ස්පාඤ්ඤ බලපෑම පවතී. *බ්‍රසීලය පෘතුගීසි යටත් විජිතයක් ව* තිබිණි. එම රටවල ද විවිධ තරාතිරමේ ජනතා අරගල පැවතිණි. ආසියානු රටවල තත්ත්වය වුව ද වඩා හොඳින් තේරුම් ගැනීමට මෙම ඇසුර උපකාර විය. දිනක් මා සිංහල කෙනෙක් සමග කථා කරමින් සිටිය දී, ඒ අසල සිටි බංගලාදේශයේ කෙනෙකුගෙන් අප කථා කරන දේ ඔහුට තේරුම් ගැනීමට හැකි දැ'යි "විහිළුවට" මෙන් විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ, බොහෝ සිංහල වචන තේරුම් ගත හැකි බවයි.

ලතින් ඇමරිකානු රටවල් සමහරක ප්‍රධාන ආහාර භෝගය බඩඉරිඟු හෝ කෙසෙල්ගෙඩි (බනානා-Banana) ය. සමහර රටවල උක් වගාව විශාල වශයෙන් සිදුකෙරේ. බ්‍රසීලයේ රබර් වගාව පවතී. අප්‍රිකානු රටවල ප්‍රචලිත ආහාරය *මඤ්ඤොක්කා* (පිටි) හා *බඩඉරිඟු ය.* නයිල් ගඟ ආශ්‍රිත ප්‍රදේශවල *වී සහ තිරිඟු* වගා කෙරේ. යුරෝපා ජාතීන් අප්‍රිකානු රටවල් ආක්‍රමණය කළේ එම රටවල *බනිජ ද්‍රව්‍ය* නිසා බව පෙනේ. *දියමන්ති, රත්රන්, කොන්ගෝ හා දකුණු අප්‍රිකාවේ* විශාල වශයෙන් දක්නට ලැබේ. බටහිර අප්‍රිකානු රටවල් ගොවිබිම් සඳහා යටත් කරගෙන ඇත. *බ්‍රිතාන්‍යය, ප්‍රංශය, බෙල්ජියම හා ජර්මනිය* විසින් අප්‍රිකානු රටවල් යටත් කර ගනු ලැබීය.

නෙදර්ලන්තයේ අධිපත්‍යය දකුණු අප්‍රිකාවේ පැවතිණි. *බ්‍රිතාන්‍යය* ද එහි යම් යම් ප්‍රදේශ යටපත් කර ගෙන සිටි නිසා, විසිවන සියවස ආරම්භයේ *බ්‍රිතාන්‍ය හා ඕලන්ද සම්භවයක් ඇති ජන කොටස්* අතර යුද ගැටුම් පැවතිණි. Boer War, නමින් හැඳින්වුණු යුද්ධය එයයි. *බ්‍රිතාන්‍යය* වෙනුවෙන් එකල *වින්ස්ටන් චර්චිල්* දකුණු අප්‍රිකාවේ සටන් කර ඇත. කළු ජාතීන් දැඩි ලෙස මර්දනය කර ගෙන (APARTHEID) සිටියේ ඕලන්ද සම්භවයක් ඇති *"බුවර්" වරුන්* විසිනි. *නෙල්සන් මැන්ඩෙලා* සටන් කළේ එයට විරුද්ධවයි.





නෙදර්ලන්තයේ දකුණු ලිම්බර්ග් චාරිකාවේ දී බෙල්ජියමේ පැරණි මාළිගාවක් අසල
(මම, තුර්කියේ එමෙල්, ලංකාවේ ලලිතා සහ පිලිපීනයේ මරිකොන්)



දකුණු *ලිම්බර්ග්* චාරිකාවේ දී - ලයිබීරියානු ජාතික *මැක්ස්වෙල් පෝ* පිටිපසින් සිටි අනික් දෙදෙනා *සැම්බියානු* හා *නයිජීරියානු* ජාතිකයන්ය. මැද කවුද?



දකුණු *ලිම්බර්ග්* කර්ක්‍රාඩ හි පල්ලියක පුස්තකාලයක් තුළ



පකිස්තානු ජාතික *අවාන්* මිතුරා සමග *ආන්හයිම්* ගමනේ දී -1978

නෙදර්ලන්තය විසින් නැගෙහිර ඉන්දියානු දූපත් හා දකුණු ඇමරිකාවේ ඕලන්ද ගයනාව යටත් කර ගෙන සිටින ලදී. දෙවෙනි ලෝක මහා යුද්ධය අවසන් වනවාත් සමඟ නැගෙනහිර ඉන්දියානු දූපත් *ඉකර්නෝ ජනාධිපතිවරයා* යටතේ නිදහස් වී *ඉන්දුනීසියාව* නමින් හැඳින්විණි. *ඕලන්ද ගයානාව* (Dutch Guyana) *සුරිනාම්* යන නමින් නිදහස් විය. ඉන්දුනීසියාවේ ප්‍රධාන වශයෙන් ම කුළුබඩු වතු වගා කළ අතර, සුරිනාමයේ උක්වගාව පැවතිණි. ඒවායේ සේවය සඳහා ඉන්දියාවෙන් ගෙන ගිය කම්කරුවන් *සුරිනාම් වැසියෝ* වූහ. ඔවුන්ගේ භාෂාව ද හින්දි භාෂාවයි. ඉන්දුනීසියාවේ හා සුරිනාමයේ ජන කොටස් නෙදර්ලන්තයේ පදිංචි වී සිටිති. ඒ අය තම තමන්ගේ ආහාරපාන ආදිය ද නෙදර්ලන්තයට ගෙන ගොස් තිබේ. නෙදර්ලන්තයේ ඉන්දුනීසියානු අවන්හල් දක්නට ලැබේ. ඒවායේ ඇති ආහාර වර්ග ඉන්දුනීසියානු නම්වලින් ම හඳුන්වනු ලැබේ. සුරිනාමයෙන් නිතිපතා අලබතල, කොස් පොළොස් වැනි දේවල් ගෙන ගොස් සති අන්ත පොලවල විකිණීමට තිබේ. හේග් නගරයේ පිහිටි *හොබ්බෙමාජ්ලේන්* විවෘත පොලේ දී කිරි අල, බතල, මඤ්ඤොක්කා, පොළොස්, වම්බටු, වට්ටක්කා දළු වැනි දේ ලබා ගත හැකිය. *සුරිනාම් කඩවල* හින්දි චිත්‍රපට ගීත කැසට් මිල දී ගැනීමට තිබේ. මා එහි දී *ලතා මංගේෂ්කාර්* ගායිකාවගේ කැසට් මිල දී ගෙන තිබේ.

නෙදර්ලන්තයේ සිටිය දී ලාංකිකයන් රාශියක් පළමුවරට එහිදී මුණගැසිණි. අයි.එස්.එස්. හි දී *සීවානන්දන්, ලලිතා දිසානායක, සුනිල් ආදිහෙට්ටි* හා *සරොජා ආදිහෙට්ටි* යන ලාංකිකයින් මුණගැසිණි. ඒ අය ද එහි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට පැමිණ සිටියහ. මහ බැංකුවේ *වික්‍රමසිංහ* හා *ජයමහ* යන දෙදෙනා කලින් අප විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂයින් ලෙස හැඳින ගෙන සිටියෙමි. කෙටි කාලීන සම්මන්ත්‍රණය සඳහා පැමිණි *නෙවිල් කරුණාතිලක, බැටී වීරකෝන්, සුසන්ත ගුණතිලක* යන මහත්වරුන් ද හේග්වල දී මුණගැසිණි. අප අතර අනෙ‍්‍යෝන්‍ය සුහදතාව ගොඩනැඟීමට වරින් වර අපගේ නවාතැන්වල දී රාත්‍රී භෝජන සංග්‍රහ පැවැත්වූයෙමු. කෙටි කාලයකට පැමිණි අයට වුව ද බත් වේලකින් සංග්‍රහ කිරීම අපගේ සිරිත විය.

නෆික් (Nuffic) ආයතනයේ අධ්‍යක්ෂ *එවර්ට් යොන්ගන්ස්* (Evert Jongens) මහතා ලාංකිකයන් කෙරෙහි විශේෂ බැඳීමක් තිබුණේ, ඔහු නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා ආදී ශිෂ්‍ය සංගමයේ අනුශාසක වීම නිසාය. ඔහු වසරකට වරක්වත් ලංකාවට පැමිණියේය. නෙදර්ලන්තයේ නගරයක් වූ *ෆෙල්සන්* (Velsen) හා *ගාලු ප්‍රදේශය* අතර සම්බන්ධතාවක් ද ගොඩනඟා තිබිණි. ගාල්ලේ ඕලන්ද බලකොටුව නිසා එම සම්බන්ධතාව ගොඩනඟන ලද බව පෙනේ. ඉන්පසුව *ෆෙල්සන්* නගරයෙන් ගාලු ප්‍රදේශයට නොයෙක් ආධාර ලබා දීමට ද කටයුතු කරනු ලැබේ.

වරක් *ෆෙල්සන්* නගරයේ ලංකාව පිළිබඳ ව පැවැති ප්‍රදර්ශනයක් බැලීමට ගියෙමි. එය *නෆීක්* ආයතනයේ අනුග්‍රහය යටතේ පැවතිණි. එහි දී ලංකාවේ සිතියමක් පෙන්වා *නෆීක්* ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මගෙන් ඇසුවේ දෙමළ ජනයා වාසය කරන ප්‍රදේශ කවරේ ද යන්නයි. එවිට ඔහුගෙන් මා ඇසුවේ, ඔහු අදහස් කරන්නේ කුමන දෙමළ ජනයා ද කියායි. එයට පිළිතුරක් නොවූයෙන්, මා ඔහුට පැහැදිලි කළේ, ලංකාවේ ප්‍රධාන වශයෙන් දෙමළ ජන කොටස් තුනක් සිටින බවයි. යාපනේ, මඩකලපුව, හා වතුකරය යන දෙමළ ජන කොටස් තුනය. සිංහල ප්‍රදේශවල ජීවත්වන දෙමළ ජනයා ගැන නොකීවෙමි. මෙතුමාගේ ප්‍රකාශයෙන් මට අවබෝධ වූයේ, 1978 වැනි කාලය වන විට යුරෝපීය රටවල දමිළ දේශපාලනය විසින් ප්‍රචාරක වැඩ සටහනක් ගෙන ගොස් තිබුණ බවයි.

බටහිර යුරෝපීයයෝ විවිධ රටවල 'සුළු ජන කොටස්' යයි සඳහන් අය ගෙන ගිය අරගලවලට උදව් උපකාර කළහ. නෙදර්ලන්තයේ සම්බන්ධයක් ඇති දකුණු අප්‍රිකානු පාලකයින් ගෙන ගිය මර්ධනකාරී වැඩ පිළිවෙලට විරුද්ධ ව අප්‍රිකානු ජාතික කොන්ග්‍රසය ගෙන ගිය ව්‍යාපාරය ද එවැනි විමුක්ති අරගලයක් සේ සලකා නෙදර්ලන්තයේ වැසියෝ හා රජය පවා නෙල්සන් මැන්ඩලාගේ ව්‍යාපාරයට උපකාර කළහ. විමුක්තිකාමීන්ට රැකවරණ සැලසූහ. අපේ රටේ දමිළ ත්‍රස්තවාදීන්ට ද බටහිර යුරෝපයේ රැකවරණය ලැබුණේ *විමුක්ති කාමීන්* ලෙස සලකාය. සුළුජන කොටස් විසින් ගෙන ගිය අරගලයට උපකාර කිරීම ඔවුන්ගේ යුතුකම ලෙස සැලකූහ.

ඩෙල්ෆ්ට් නගරයේ පිහිටි ජාත්‍යන්තර වාරි ඉංජිනේරු ආයතනයේ (I.H.E.) සහ ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ (R.V.B.) පුහුණුව සඳහා ගිය ලාංකිකයින් ද අපට මුණගැසිණි. *දයන්ත විජේසේකර, දයාරත්න, ෆොන්සේකා, රෝයි ජයසිංහ, රණසිංහ* යන අය ඉන් සමහරෙකි. වරක් ඩෙල්ෆ්ට් නුවර ශ්‍රී ලංකා රාත්‍රියක් (Sri Lanka Night) පවත්වා ලංකාවේ ආහාරපාන හා සංගීතයෙන් පැමිණි පිරිසට සංග්‍රහ කළෙමු. මම ද එයට දායකවීමි.

රත්නායක හා *සේනාරත්න* යන දෙදෙනා ලංකාවට ගිය පසු *රණසිංහ* හා *දයාරත්න* අපගේ නවාතැනට පැමිණියහ. ඉන්පසුව *රෝයි ජයසිංහ* මහතා පැමිණියේය. අවසානයේ මා මිත්‍ර *ආර්.ඒ.ඒ පෙරේරා* මහතා පැමිණ, *රෝයි ජයසිංහ* මහතා සමඟ ලොකු කාමරයක නේවාසික ව උන්හ. රෝයි ජයසිංහ ගියාට පසුව ආර්.ඒ.ඒ පෙරේරා මහතාට මගේ කාමරය දී, මම පහළ ලොකු කාමරයට පැමිණියෙමි. ඒ 1978 දෙසැම්බර් මාසයේ දී ය. ඒ මාසයේ දී මගේ බිරිඳ ප්‍රේමා නෙදර්ලන්තයට පැමිණි නිසාය.



එකනායක රෝයි ජයසිංහ හා පරණවිතාරන
මේ දරුවන්ගේ වයසට තව අවුරුදු 34ක් එකතුවී ඇත (1978)

නෙදර්ලන්තයේ දී මට මුණැසුණු ලාංකික ජෝඩුවක් හා තවත් පුද්ගලයෙකු ගැන සඳහන් නොකළොත් අඩුපාඩුවක් වේ. *රොටර්ඩෑම්* නගරය අසල පදිංචි ව සිටි *පෙරේරා යුවල* ඉතා ගුණයහපත් අය වූහ. ඒ දෙදෙනාගේ මුල් නම් දැන් මට මතක නැත. මහත්තයාට *'එඩ්වඩ්'* යයි කියමු. පෙරේරා මහත්මිය හේග් නුවර පෞද්ගලික ආයතනයත සේවය කළාය. දිනපතා තම සැමියා සමඟ රොටර්ඩෑම් සිට තමන්ගේ කාර් එකෙන් හේග් නුවරට පැමිණියහ. එඩ්වඩ් පෙරේරා මහතා ද හේග් නුවර ආයතනයක සේවය කළේය. වරක් *ලලිතා දිසානායක, සිවානන්දන්, මේතර්* ජෝඩුවට හා මට ද දිවා භෝජනයකට ආරාධනා කරන ලදුව අපි රොටර්ඩෑම් ගියෙමු. එදින *සුසන්ත ගුණතිලක* මහතා ද පැමිණ සිටි නිසා, ඒ මහතා ද කැටුව ගියෙමු. අපට ඉතා ප්‍රණීත ආහාර වේලකින් සංග්‍රහ කරනු ලැබිණි. මෙම ජෝඩුව ශ්‍රී ලාංකිකයන් මුණ ගැසුණු කීප වතාවක දී මට හමු වී ඇත.

මෙයට ඉඳුරා ම වෙනස් ලාංකිකයෙකු ද හේග් නුවර දී මට මුණගැසිණි. ඔහු නෙදර්ලන්තයට ගොස් වැඳගැම්මකට ඇති කිසිවක් නොකර ජීවත්වන "පිළිලයකි". අපගේ අයි.එස්.එස්. ආයතනයේ දී ලාංකිකයින් රැස් වූ අවස්ථාවක අපට මුණ ගැසුණ කෙනෙකි. ඔහු ඉතා ඉහළ සමාජය ඇසුරු කරන කෙනෙකු ලෙස පෙන්වා, මා පදිංචි තැන ලිපිනය ද ඉල්ලා ගෙන දිනක් අප නවාතැන්පොලට පැමිණියේය. බොහෝ කාලයකින් ලංකාවේ කෑමක් රස බැලීමට නොහැකි වූ බව සඳහන් කර, අපගෙන් ආහාර වේලක් ද භුක්ති විඳදේය. සතියකට පමණ පසුව නැවත වරක් පැමිණියේය. මේ වන විට ඔහු ගැන නොයෙක් මාර්ගවලින් ලැබුණු තොරතුරු අනුව ඔහු "රස්තියාදුකාර නිකමෙකු" බව දැන ගෙන සිටියෙමු. මින් පසු අප හමුවීමට නොඑන ලෙස දන්වා පිටත් කර හැරියෙමි. නැවත කවදාවත් මුණ ගැසුණේ නැත.

අයි.එස්.එස්. ආයතනයට ගිය 1977 සැප්තැම්බර් මාසයේ සිට 1978 ජූනි මාසය අග වනතුරු පමණ, විවිධ විෂයයන් ඉගෙනීමෙහි නිරත වී සිටියෙමි. අතරින් පතර නත්තල් සමයේ දී හා පාස්කු සමයේ දී කෙටි නිවාඩු ලැබිණි. නිවාඩු කාලවල දී බොහෝ දෙනෙක් යුරෝපයේ නොයෙක් රටවල සංචාරයට ගිය නමුත් ලාංකික අප ඒ සඳහා මුදල් වියදම් කළේ නැත.

වරක් දෙකක් මා අසනීප වූ අවස්ථා ද තිබිණි. එක සතියක බ්‍රහස්පතින්දා දිනක තදබල පපුවෙ අමාරුවක් දැනුණු නමුත්, ප්‍රතිකාරයක් සඳහා නොගොස් කාමරයට වී දින තුන හතරක් විවේක ගතිමි. පසුව නවාතැන අසල සිටි වෛද්‍යවරයෙකු හමුවීමට *බෙස්ට් මහත්මිය* විසින් වේලාවක් වෙන් කරගෙන ඔහු හමුවන ලෙස මට දැන්වීය. ඉන්දුනීසියානු සම්භවයක් ඇති ඒ දොස්තර මහතා මට සුළු ප්‍රතිකාරයක් කළේය. බියවීමට හේතුවක් නැතැ'යි මට දැන්වීය. තවත් වරක් දින දෙකක් තදබල හිසරුදාව පැවතිණි. ඒ අතර දිනක් මුහුණ කට සෝදා ගැනීමට බේසම වෙත ගිය විට මගේ නාසයෙන් දරුණු ලේ ගැලීමක් සිදුවිය. එය අවසන් වූ පසු හිසරදය ද සුව විය. මෙය සීතල ප්‍රදේශවල දී සමහර දෙනෙකුට විඳින්නට සිදුවන ගැහැටක් බව දැන ගත්තේ වරක් මගේ ගුරුවරයෙකු වූ *මහාචාර්ය රේමන්ඩ් ඇප්ලෙප්* මහතා හමුවීමට ඔහුගේ කාමරයට ගිය විට, ඔහුගේ නාසයෙන් ලේ නැවැත්වීමට ටිෂූ කොළ ගොඩක් තද කරගෙන සිටි නිසාය. ඒ ගැන බිය වන්නට එපා යැ'යි එතුමා මට කීවේය.

පාඨමාලාවේ දේශනවලට සහභාගී වූ සමය අවසන් වූ පසු, නිබන්ධනයක් (Dissertation) ලිවීමට තිබිණි. මේ සඳහා මගේ සුපරීක්ෂකවරයා වූයේ *මයිකල් ෆෝල්ටාස් මහතායි.* මට අවශ්‍ය වූයේ අප විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන විද්‍යා පාඨමාලාව සම්බන්ධයෙන් ශාස්ත්‍රීය විමර්ශනයක් කර, එය වැඩිදියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මේ සම්බන්ධයෙන් නොයෙක් පොත්පත් කියවා තොරතුරු ඒකරාශී කොට න්‍යායික පදනමක් ගොඩනඟා ගැනීමට කල්ගත විය. *ෆෝල්ටාස්* මහතා මට දුන් උපදේශය වූයේ, කියවීමට කොපමණ දේ ඇති නමුත්, යම් අවස්ථාවක එය නවත්වා එතෙක් රැස් කර ගත් තොරතුරු උපයෝගී කර ගෙන නිබන්ධය ලිවීමට ප්‍රවේශ වෙන ලෙසයි. ඒ අනුව නිබන්ධනයේ කෙටුම්පත් විටින් විට එතුමාට භාර දී උපදෙස් ලබා ගතිමි. ප්‍රේමා නෙලදර්ලන්තයට පැමිණෙන විට නිබන්ධනයේ කටයුතු අවසන් කිරීම මගේ ඉලක්කය විය. නිබන්ධනයේ අත් පිටපත වෙන කෙනෙකුට දී යතුරු ලියනය කරගන්නවා වෙනුවට, මා විසින් ම එය කිරීමට අනුමැතිය ලබා ගතිමි. ඒ සඳහා කුඩා යතුරු ලියනයක් ද මිල දී ගතිමි. ටයිප් කිරීමට ගාස්තුවක් ලැබුණ නිසා ටයිප්රයිටරය මට ඉතිරි විය. එයට මගේ අතින් වියදමක් නොවීය.

උපාධි පාඨමාලාව හා නිබන්ධනය සම්පූර්ණ කිරීමෙන් පසුව ඒවායින් මා සමත් වූ බව ඒ වකවානුවේ දී දැනගත් නමුත්, අදාළ නිල ප්‍රතිඵලය මට ලැබුණේ 1979 මැයි මාසයේ දී ය. එනම්, ලංකාවට ආපසු පැමිණ මාස පහකට පසුවයි. එම නිල සහතික පත්‍රයේ සඳහන් කර තිබෙන්නේ මට *'සංවර්ධන අධ්‍යාපනපති'* (Master of Developmet Studies) උපාධිය ප්‍රදානය කළ බවයි.

හේග් නුවර (The Hague)

අප කුඩා කාලයේ දී පස් බැම්ම කැඩීයෑම වැළැක්වීමට ක්‍රියා කළ ඕලන්ද ළමයෙකුගේ කථාවක් අසා ඇත. ඒ කථාව හේග් නුවරට අදාළ යයි සිතමි. හේග් නුවර නෙදර්ලන්තයේ අගනුවරයි. එහි බොහෝ තැන් මුහුදු මට්ටමට වඩා පහතින් පිහිටා තිබේ. අප අධ්‍යාපනය ලැබූ අයි.එස්.එස්. ආයතනය පිහිටි ප්‍රදේශයේ සිට මුහුදු වෙරළ දිසාවට යන විට කඳු බෑවුමක ඉහළට යනවා මෙනි. *ෂේවිනින්ගන්* (SCHEVININGEN) වෙරළ නිම කර තිබෙන්නේ මුහුද ගොඩ කිරීමෙනි. මුහුදු වෙරළින් අඩි පනහක් හැටක් පමණ ඉහළට ගොඩ කර නගරය දෙසට මුහුද ගැලීම නතර කර තිබේ. යම් තැනකින් එම ගොඩ කළ වේල්ල කඩා දැමුවහොත් මුළු අගනුවර ම යටවීමට ඉඩ තිබේ. ඒ නිසා, අප කුඩා කාලයේ අසා තිබුණ කථාව සුරංග නා කථාවක් වැනි ප්‍රබන්ධයක් නොවේ.

හේග් නාගරයේ පැරණි මාර්ග තවමත් ගඩොල් වැනි ගල් අතුරා නිම කර තිබෙනු දක්නට ඇත. අලුත් මාර්ගවල පවා මේ ක්‍රමය අනුගමනය කළ තැන් දක්නට තිබේ. මේ ක්‍රමය වැලිපොළොවට හොඳින් ඔරොත්තු දෙන බව පෙනේ. මගී ගමන් තීරුවල ද මෙවැනි ගල් අතුරා තිබේ. ඒ නිසා යම් පළුද්දක් වූ විට පහසුවෙන් ම අලුත්වැඩියා කළ හැකිය. සිමෙන්ති අතුරා ඇති විට කඩන ආකාරයට ලොකු ප්‍රදේශයක් කැඩිය යුතු නොවේ. කුඩා ප්‍රදේශයක් ඉතා හොඳින් අලුත්වැඩියා කිරීමට පුළුවන.

හේග් නගරයේ *විටබෑග්* නම් ස්ථානය අසල ඉතා කුඩා ගොඩනැඟිලිවලින් සමන්විත **MADURODAM** නම් විශ්මිත නගරයක් නිර්මාණය කර තිබේ. අක්කර පහක පමණ භූමි ප්‍රදේශයක කඳුගැට ආදිය නිර්මාණය කර, අඩිපාරවල් අසල පැරණි රජමාලිගා, මහ පල්ලිවලට සමාන ඉතා කුඩා පරිමාණයේ ගොඩනැඟිලි සංකීර්ණයක් එහි දක්නට තිබේ. විවේකයක් ගත කිරීමට ඉතා මනහර ස්ථානයකි. වේලාව ඇත්නම් දින ගණනක් වුවත් ඒ තුළ එහා මෙහා ඇවිදිමින් අධ්‍යයනය කිරීමට දේවල් (ගොඩනැඟිලි) නිර්මාණය කර තිබේ.

1977 සැප්තැම්බර් 16වෙනි දා මා නෙදර්ලන්තයට පිටත් ව ගිය පසු, මාස දාහතරක් තනියම මගේ බිරිඳ ප්‍රේමා, දරුවන් රැක බලා ගෙන ගෙදර සියලු කටයුතු ඉටු කළාය. මීට පෙර කිසිදාක එතරම් වෙහෙසක් දැරුවේ නැත. 1973 වසර අග දී විටින් විට සතියක් පමණ තනියම ගෙදර කටයුතු බලා කියා ගැනීමට සිදු වූ නමුත්, අවශ්‍ය දේ සපයා දීමාදියට මා සිටියේය. මා නෙදර්ලන්තයට යන විට පොඩි පුතා වයස අවුරුදු පහක් සම්පූර්ණ වී පාසල් යැවීමේ අවධියට පැමිණ සිටියේය. ඒ සඳහා ද මහන්සි වූයේ ප්‍රේමා ය. මාස තුන හතරක දුෂ්කර ක්‍රියාවෙන් පසුව පොඩිපුතා නාලන්ද විද්‍යාලයට ඇතුළත් කළේ *ධර්ම ගුණසිංහ විදුහල්පතිතුමාගේ* උපකාරයෙනි. ඒ සඳහා මා මිත්‍ර *කේ.ඒ. මුණසිංහ මහතා* ද මැදිහත් විය. පොඩි පුතා උදේට පාසල් ගොස් තිබෙන්නේ ලොකු පුතා සමගය. ආපසු ගෙන ඒමට ප්‍රේමා පාසලට ගියාය. ඒ යන විට වෛද්‍ය පීඨයේ නේවාසිකාගාරයක නැවතී සිටි ලොකු දුවට දිවා ආහාරය ද රැගෙන ගිය බව කියති.

ප්‍රේමා නෙදර්ලන්තයට පැමිණීම

සප්ත වාර්ෂික නිවාඩු ලබා විදේශගත වන සැමියා සමඟ බිරිඳට ද විදේශ ගත වීමට යාන පත්‍ර ආදිය ලැබේ. එසේ වුවත් දරුවන්ගේ කටයුතු බලා ගැනීමට තිබුණ නිසා, මගේ බිරිඳට මා සමඟ එසේ යෑමට නොහැකි විය. ඒ නිසා, 1978 දෙසැම්බර් පාසල් නිවාඩු සමයේ දී ප්‍රේමා නෙදර්ලන්තයට ගෙන්වා ගැනීමට කටයුතු කළෙමි. ඈ කොළඹ සිට *ඇම්ස්ටර්ඩෑම්* දක්වා හුදකලා ව පැමිණියාය. ඇය *ඇම්ස්ටර්ඩෑම්* ගුවන් තොටුපලට පැමිණෙන දිනයේ මම එහි ගොස් සිටියෙමි. ගුවන් යානය පැමිණ බොහෝ වේලාවක් ගත වන තුරුත් ප්‍රේමා මඟී අංගනයෙන් එළියට නොපැමිණි නිසා, ඇය ඒ යානයෙන් ආවේ නැද්දැ'යි සිතන විට, නිලධාරියෙකු මා වෙත පැමිණ, ප්‍රේමාගේ ගමන් බලපත්‍රය මට පෙන්වා මා ඉන්නේ ඇය හමුවීමට දැ'යි විමසා, මා එක්කර ගෙන ආගමන විගමන නිලධාරීන් සිටි කාමරයකට ගියේය. ප්‍රේමා එහි වාඩි ගෙන සිටියාය. විදේශ භාෂාවෙන් කතා බහ කිරීමට එතරම් නිපුණත්වයක් නොවූ නිසාත්, එම නිලධාරීන්ගේ සමහර ප්‍රශ්නවලට පිළිතුරු දීමට අපොහොසත් වූ නිසාත් මෙසේ රඳවා ගෙන ඇත. එනමුත්, ඈ මෙහි පැමිණියේ, Husband (සැමියා) මුණගැසීමට කී නිසා, මා සොයා ගෙන නිලධාරියෙක් පැමිණියේය. මේ කිසිවකට ප්‍රේමා කලබල වූ බවක් පෙනෙන්නට තිබුණේ නැත. මේ සිද්ධිවලට පසුව අපි දෙදෙනා, මා හේග් නුවරට ගිය ආකාරයට ම එහි ගොස්, නවාතැන්පලට ගියෙමු. *බෙස්ට් මහත්මිය* විසින් ඉතා සුහද ව ප්‍රේමා පිළිගත්තාය.

මගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ වනතුරු දෙසැම්බර් මාසය හේග් නුවර ගත කළෙමු. එහි යා යුතු තැන් කීපයකට ප්‍රේමා සමඟ ගියේ බොහෝ විට පාගමනින්මයි. ආපසු ලංකාවට එන්නට පෙර ලන්ඩන් නුවර දැක බලා ගැනීමට සිතිණි. ඒ නිසා, එහි රැකියාවක නිරත ව සිටි *රන්ජින් සමරකෝන් මල්ලීට* ලිපියක් යවා අපට නැවතීමේ පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලීමි. (රංජිත් මල්ලී ප්‍රේමාගේ මාමා කෙනෙකුගේ පුතෙකි). හේග් නුවරින් පිටත්වීමට පෙර කටයුතු කීපයක් සිදුවිය.

මා නෙදර්ලන්තයට යන විට එහි දී පාවිච්චියට ගෙන ගියේ සීමිත ඇඳුම් ප්‍රමාණයකි. ලංකාවෙන් පිටත්වන විට ඇඳගෙන ගිය කලිසම් කෝට් ඉතා ම යල් පැන තිබුණ බව එහි ගිය දවසේ ම දැනිණි. ඒ නිසා, එහි දී ඇඳීමට කෝට් එකක් දෙකක් ගත යුතු විය. අලුතෙන් ම ඒ ඇඳුම් මිල දී ගැනීමට වත්කමක් තිබුණේ නැත. හේග් නුවර වෙස්ට්එන්ඩ් (Westeinde) නම් ස්ථානයේ පරණ ඇඳුම් විකුණන ක්‍රිස්තියානු සංවිධායක කුඩා වෙළඳසලක් ගැන එහි සිටි ලාංකික මිතුරන් කී නිසා, එහි ගොස් අවශ්‍ය දේ සමහරක් මිලයට ගතිමි. පාවිච්චි කළ ඇඳුම් වුවත් එම වෙළඳසල පවත්වා ගෙන ගිය කාන්තාවන් ඒවා පිරිසිදු කර, ඇඳුම් දමන කොකුවල එල්ලා ක්‍රමවත් ව තබා තිබිණි. ඒවා සුළු මුදලකට ලබා ගත හැකි විය. ලංකාවට එන්නට කිට්ටුව ද එහි ගොස් ඇඳුම් සූට් දෙකක් හා කෝට් එකක් මිලයට ගතිමි.

මා එහි යන සමයේ ලංකාවේ ඇඳුම් පැළඳුම් හිඟයක් තිබුණ නිසා, ප්‍රේමාට හා දරුවන්ට ප්‍රයෝජනයට ගත හැකි ඇඳුම් පැළඳුම් ක්‍රමයෙන් ඒකරාශී කිරීමට පියවර ගතිමි. Vand D, Hemas නම් වූ රෙදි සාප්පුවලින් අඩු මිලට විකුණන අවස්ථාවල දී මට මෙන් ම පවුලේ අයට ද ගැලපෙන ඇඳුම් මිලට ගෙන රැස්කර තබා ගතිමි. *හොබ්බෙමාප්ලේන්* පොලේ දී සාප්පුවලින් ඉවතලන ඇඳුම් මිලට ගත හැකි විය. ඒවා අලුත් නමුත් මිලෙන් අඩුවිය. ඇඳුම් පැළඳුම් පමණක් නොව ගුවන් විදුලි යන්ත්‍රයක් ද රයිස් කුකර් එකක් ද මිල දී ගෙන තිබිණි. බෙස්ට් මහත්මිය සමඟ ගොස් මිල අඩුකර විකුණන සාප්පුවකින් Tokyo Beaver වර්ගයේ අලුතෙන් වෙළඳපලට හඳුන්වා දුන් රේඩියෝ කැසට් යන්ත්‍රයක් මිල දී ගෙන තිබිණි. මේවා සියල්ල අප සමඟ ගුවන් යානයේ ගෙන ඒමට බර වැඩි නිසා, ඒවා සමහරක් පාර්සල් කර තැපෑලෙන් එවීමට භාර දුනිමි. කිලෝ විස්ස දක්වා බර පාර්සල් එසේ එවීමට හැකි විය. එය ඉතා ම ලාබදායක විය. එවැනි පාර්සල් දෙක තුනක් ම එවීමි. මා නෙදර්ලන්තයේ යන විට ගෙන ගිය ඇඳුම් බෑගය ද තැපෑලෙන් ආපසු එවීමි. ඒ නිසා, අලුතෙන් සූට් කේස් දෙකක් ද මිලයට ගතිමි. ඒවා සාධාරණ මිල ගණන්වලට ලබා ගත හැකි විය. ඒවා එතරම් ශක්ති සම්පන්න නොවීය.

ලන්ඩන් ගමන

මේ සියලු කටයුතු අවසන් වූ පසු, 1978 දෙසැම්බර් 28වන දින ප්‍රේමාත් මාත් ලන්ඩන් ගමන සඳහා හේග් නුවරින් පිටත්වූයෙමු. ලන්ඩන් ගමන යා යුතු වූයේ *රොටර්ඩෑම්* ගුවන් තොටුපලින් පිටත්වන NLM ගුවන් යානයකිනි. හේග් නුවර සිට දුම්රියෙන් රොටර්ඩෑම් වෙත ගියෙමු. කලින් කතාබහ කර ගෙන තිබූ පරිදි, *ලන්ඩන් හීත්‍රෝ* ගුවන් තොටුපලට ගිය විට *රංජිත් මල්ලී* මුණගැසිණි. ඔහු සමඟ උමං දුම්රියෙන් *හවුන්ස්ලෝ* (Hounslow) දක්වා ගොස්, එතැන් සිට ටික දුරක් පා ගමනින් අපගේ නවාතැන්පොළට ගියෙමු. එම නිවස ඉන්දියානු සම්භවයක් ඇති කෙනෙකුට අයිතිය. රංජිත්ගේ මල්ලී ලාල් සමරකෝන් මල්ලී ද ඔහුගේ බිරිඳ සමඟ එම නිවසේ එක් කාමරයක ලැඟුම් ගෙන සිටියෝය. ප්‍රේමාටත් මටත් එයට අල්ලපු කාමරයක් ලැබිණි. කාමර උණුසුම් කිරීමේ පහසුකම් ආදිය නොවීය. සීත සෘතුව වූ මේ කාලයේ අප දෙදෙනා එහි ගත කළේ මහත් දුෂ්කරතාවයෙනි. සතියට පවුම් දහ හතරක් ගෙවිය යුතු විය.

ලොකුදුව මහනුවර මහාමායා විදුහලේ ඉගෙන ගන්නා කාලයේ දී එකට පන්තියේ සිටි *ශ්‍රීයාමාලා* නම් යෙහෙළියකගේ මාමා කෙනෙකු වූ *පර්සි අබේසේකර* මහතා පදිංචි ව සිටියේ අප නවාතැන් ගත් ස්ථානයට කිට්ටුවයි. ඒ නිසා, දිනක් එහි පැමිණෙන ලෙස ලැබුණු ආරාධනයකට ගොස් රාත්‍රී ආහාරයෙන් පසුව ආපසු එන විට, හිම වැටී අයිස් බවට පත්වී තිබිණි. එවිට ඒ මත ගමන් කිරීම ලිස්සනසුළුය. දෙවරක් පමණ ප්‍රේමා ලිස්සා වැටිණි. වාසනාවකට මෙන් කිසිදු හානියක් වූයේ නැත. එයින් පසුව එළියට බැස ගමන් යෑමට ඈ අතිශයින් මැළිවූවාය. තවත් දිනක ප්‍රේමාගේ ලොකු මාමාගේ පුතෙකු වූ *පියසේන සමරකෝන්* මහතා රාත්‍රී භෝජනය සඳහා අප දෙදෙනා ඔහුගේ නිවසට කැඳවා ගෙන ගියේය. පියසේන බ්‍රිතාන්‍ය ගුවන් සේවයේ "ග්‍රවුන්ඩ් එංජිනියර්" (Ground Engineer) කෙනෙකු ලෙස සේවය කළේය. ඒ ගමන ගියේ පියසේනගේ කාර් එකෙන් නිසා, ප්‍රේමාට උපද්‍රවයක් වූයේ නැත. මේ හැර සාප්පු යෑමටවත් ප්‍රේමා පැමිණියේ නැත. මා තනියම ගොස් එනතුරු ඇය කාමරයට වී සිටියාය.

ලන්ඩන්හි දී ඉන්දියානු සාප්පු තිබෙන "සවුත්හෝල්" නම් වීදියට ගොස් සාරි කීපයක් මිලයට ගතිමි. ලාල්ගේ බිරිඳ සේවය කළ සාප්පුවකින් සිංගර් විදුලි මහන මැෂිමක් (Portable) මිලයට ගතිමි. එය සූට්කේස් එකක් මෙන් අතේ ගෙන යා හැකි වුවත් ලොකු බරක් තිබිණි. Oxford St., තිබෙන සාප්පු කීපයකට ගියේ බඩු මිල දී ගැනීමට වඩා ඒවා දැක බලා ගැනීමටයි.. ඒ ගමනේ දී නම් ප්‍රේමා ද පැමිණියාය. අප දෙදෙනා එක සාප්පුවක් තුළ කතාබහ කරමින් ඇඳුම් පැළඳුම් බලන විට, වෙනත් දෙදෙනෙක් මහත්

උනන්දුවෙන් අප දිහා බලා සිටි නමුත් කතාබහ කළේ නැත. ඒ ලන්ඩනයේ සිටින සිංහලයින්ගේ හැටිය. වෙන කෙනෙක් දැන හැඳින ගෙන කතාබහ කිරීමට කැමති නැතිලු. පරපෝෂකයින්ගෙන් බේරීමටය.

1979 ජනවාරි මස 4 දින ලංකාවට ආපසු පැමිණීමට හීත්‍රෝ ගුවන් තොටපලට උදෙන් ම ගොස් ගමන් මලු භාරදුන් විට, ඒවා නියමිත ප්‍රමාණයට වඩා බර නිසා, පවුම් 103ක් ගෙවන ලෙස දැන්වීය. එතරම් මුදල් ගෙවීමට මා ළඟ තිබුණේ නැත. ඒ නිසා, ගමන් මලු එතැනින් ඉවත් කරගෙන පර්සි අබේසේකර මහතාට දුරකථනයෙන් කථා කර අපගේ ගැටලුව ගැන කීවෙමි. ඔහු ද බ්‍රිතාන්‍ය ගුවන් සේවයේ සේවය කළ කෙනෙකි. පණිවිඩය ලැබුණු විගස ගුවන් තොටුපලට එන බව කී නිසා, ඔහු එනතුරු සිටින අතරතුර ගමන් මලු බාර ගන්නා කවුන්ටරයේ සේවය කළ සේවිකාවන් ඉවත් වී ගිය පසු, KLM නියෝජිතයා මා වෙත පැමිණ මුදල් කිසිවක් ම නැද්දැ'යි විමසා, නැතැ'යි කී විට, මගේ ගමන් මලු දෙක ම Conveyer Belt එකට දමා පිටත් කළේය. යාන පත්‍ර දෙකක් මා අතට දී ඉක්මනින් ගුවන් යානය වෙත යන ලෙස දැන්වීය. මේ වන විට පර්සි අබේසේකර මහතා පැමිණියේය. දැන් ප්‍රශ්නය නිරාකරණය වී ඇති බව ඒ මහතාට කියා එතුමාට ස්තුති කර, ඉක්මනින් ඉහළ මාලයට ගොස් යානයට යන්නට පිටත් වුණෙමු. මගීන් නැවතී සිටි ශාලාවකට ගොස් එහි සේවිකාවකගෙන් විමසූ විට, ඉක්මනින් ගුවන් යානාව වෙත යන ලෙස කීවාය. මේ වන විටත් පිටත්වීමට නියමිත වේලාව පසු වී තිබිණි. එදින ගුවන් පථයේ හිම වැඩි නිසා ගුවන් ගමන් ප්‍රමාද වී සිදුවිය. පර්යන්ත ගොඩනැගිල්ලේ බොහෝ දුරක් පා ගමනින් ගොස් යානයට පිවිසෙන දොරටුව අසලට යන විට, එහි සිටි සේවිකාවන් අපගේ යාන පත්‍ර බලා යානයේ සිටින සේවිකාවට කතා කර, අප දෙදෙනා එනතුරු යානයේ දොර විවෘත කර තබන ලෙස දැන්වූවාය. ඉමහත් වෙහෙසකින් පසු ගුවන් යානයට පිවිසුණු වහා ම දොර වසා දැමුවේය. අන්තිමට යානයට පිවිසුණේ අප දෙදෙනාය. පැයක් ප්‍රමාද වූ නිසා එම යානයේ ම ඇම්ස්ටර්ඩෑම් ගුවන් තොටුපලට පැමිණිය හැකි විය. ඒ වන විට ඇම්ස්ටර්ඩෑම් වේලාව පෙරවරු 11.00ට පමණ ඇත. කොළඹ එන KLM ගුවන් යානය පිටත් වන්නේ පස්වරු 1.00ටයි. ඒ නිසා ප්‍රමාණවත් කාලයක් තිබිණි.

හීත්‍රෝ ගුවන් තොටුපලින් පිටත් වී ටික දුරක් එන විට අහස ඉතා පැහැදිලි වී තිබිණි. යුරෝපයේ රටවල් හරහා එන විට යුගෝස්ලාවියාව වැනි රටවල් උඩින් ආ බව දැනගන්නට ලැබිණි. *ග්‍රීසියේ ඇතැන්ස්* ගුවන් තොටුපලේ දී යානය බොහෝ වේලාවක් නතර කර තිබිණි. ඇදීරි වැටී ගෙන එන යාමයේ එම ගුවන් තොටුපලට බස්සන හා එයින් පිටත්වන යානා මනරම් දසුනක් විය. *ඇතැන්ස්* ගුවන් තොටුපලේ එක් පසක මහ

මුහුදය අනිත් පස කඳුවැටියකි. යානා ඇතුළු වන්නේ හා පිටත් වන්නේ අනිත් දෙපැත්තෙනි. අපගේ යානය *ඇතැන්ස්* ගුවන් තොටුපලින් පිටත්වන විට රෑ වී තිබිණි. පැය ගණනක ගමනින් පසුව කරච්චියේ දී නැවතත් නතර කර, කොළඹ කටුනායක ගුවන් තොටුපලට බස්සන විට 1979 ජනවාරි මස 5 දින පෙරවරු හතට පමණ වන්නට ඇතැ'යි සිතමි.

ලංකාවට පැමිණීම

ගමන් මලු ආදිය එකතු කර ගෙන ආගමන විගමන අංශය පසුකර රේගු නිලධාරීන් ඉදිරියේ ගමන් මලු විවෘත කර පෙන්වා එළියට එන විට, ලොකු පුතා, පොඩි පුතා ආදීන් අප එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටි බව පෙනිණි. ලන්ඩන් ගුවන් තොටුපලේ හිම පතනය ගැනත් ආරංචිය පැතිර තිබිණි. ඒ නිසා අප එම යානයෙන් නොපැමිණෙතැ'යි යන සැකයක් අප දකිනා තුරු තිබී ඇත. මාස පහළොවකට පසු මා දුටු පොඩි පුතාට මෙන් ම මට ද ඉමහත් සතුටක් දැනිණි. මා ලංකාවෙන් පිට වී ගිය දවස්වල සිට පොඩි පුතාගේ උගුරේ සෙම හිරවීමක් වැනි දෙයක් තිබුණ බවත් මා ආපසු පැමිණි විට එය ඉබේ ම නැති වී ගිය බවත් ප්‍රේමා මට කීවාය.

මා *මිත්‍ර අබේරත්න බණ්ඩාර* මහතාගේ වාහනයෙන් අපි රත්තනපිටියේ ගෙදර ගියෙමු. ප්‍රේමා නැති කාලයේ ගෙදර නතර කර ගියේ මර්ලින් අක්කාය. එතුමිය දරුවන් හොඳින් බලා ගත් බව පැහැදිලි විය. *මුණසිංහ, ආර්.ඒ. පෙරේරා, ආරියරත්න* මෙන් ම අලුත් කෙනෙකු වූ *හෙක්ටර් පෙරේරා* මහතා ද අප නිවසට පැමිණ සිටියහ. අප හැම දෙනාට ම අන්‍යෝන්‍ය වශයෙන් මෙය ප්‍රීතිමත් දිනයක් විය.

1978 දෙසැම්බර් මාසයේ දී ප්‍රේමා නෙදර්ලන්තයට පැමිණි පසු අපගේ දරු හතර දෙනා විසින් එම මස 09වන දින ලියා එවන ලද ලිපියක් තවමත් මා ළඟ තිබේ. අපගේ දරුවන් අපට ලියන ලද පළමුවන ලිපිය ද මෙය වන්නට ඉඩ තිබේ. ඊට පෙර අප එකිනෙකාගෙන් වෙන් වී නොසිටි නිසාය. පොඩි දුව අම්මාට උපන් දින සුභ පැතුම් සහිත චිත්‍රයක් එවා තිබිණි. සිතන පතන සියලු ම දේ එලෙසින් ම ඉටුවූ බවට සන්තෝෂයට පත් වේවා'යි ද ප්‍රාර්ථනාවක් එහි ලියා තිබිණි. පොඩි පුතා උපන් දින සුභ පැතුම් සමඟ චිත්‍රයක් ද පැන්සලෙන් වගන්ති කීපයක් ලියන ලද ලිපියක් ද එවා තිබිණි. ඒ ලිපියේ අනිත් පිටුවේ අම්මා ගිය ගුවන් යානය ඇඳ තිබිණි. සෙල්ලම් බඩු ගොඩක් ගේන්න කියා ද වගන්තියක් විය. ලොකු පුතාගේ ලිපි විස්තර සහිත විය. ගුවන් තොටුපලේ දී කළ දේවල් හා ආපසු ගෙදර ගිය ආකාරය ද මල්ලී ගැන ලිපියේ ඉතා කෙටියෙන් සඳහන් කර තිබිණි. "මල්ලී කරදර කරන්නේ නැතුව ඉන්න බව ලොකු පුතාගේ ලිපියේ සඳහන් නමුත්, ලොකු දුවගේ

ලිපියේ සඳහන් වන්නේ "තවමත් මුරණ්ඩු ගතිය තියෙනවා. හිටපු ගමන් එක එක ඒවා පොළොවේ ගහනවා. ගල් ඇහිඳන් අපිටත් ගහනවා" වැනි දේවල්ය. ඒ දෙන්නා ම කියන්නේ පොඩිපුතා මර්ලින් නැන්දාගෙන් කතන්දර අහගන්නා බවයි. සාරි හැට්ට රෙදි යනාදිය ගැන ලොකු දුව කරුණු රාශියක් ලියා තිබිණි. වයස විසිඑකක් වූ තරුණියකගේ අවශ්‍යතාවන් එහි සඳහන් වී යයි සිතමි. අපි ආපසු එනවිට ලන්ඩන් නුවරින් ගත් කොන්කෝඩ් ගුවන් යානයක ආකෘතියක් හා කුඩා ප්‍රමාණයේ (match box) කාර් කීපයක් පොඩිපුතාට ගෙනාවෙමු. අන් අයට රෙදිපිළි හා තවත් දේවල් ගෙනාවෙමු. ඒ දරුවන්ගේ අවශ්‍යතා සියල්ල සිත්සේ ඉටුවුණා දැ'යි නොදනිමි.

08 විශ්ව විද්‍යාල සේවය
(දෙවෙනි දෙළොස් වසර)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සේවය ආරම්භ කිරීම

මා සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත්තේ, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපයෙනි. එහි මණ්ඩපාධිපතිවරයා වූයේ මහාචාර්ය ටියුලි ද සිල්වා මහතාය. නිවාඩුවෙන් පසුව 1979 ජනවාරි 6 දින නැවත සේවය සඳහා වාර්තා කළේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයටයි. එහි උපකුලපතිවරයා වූයේ මහාචාර්ය කේ.ඒ. ජිනදාස පෙරේරා මහතාය. කළමනාකරණ අධ්‍යයනාංශයේ ප්‍රධාන තනතුර දැරුවේ කේ.ඒ. මුණසිංහ මහතාය. හේමා විජේවර්ධන මහතා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති විය.

මා විසින් නෙදර්ලන්තයේ හේග් නුවර අයි.එස්.එස්. (ISS) ආයතනයේ දී කරන ලද අධ්‍යයනය පදනම් කර ගෙන රාජ්‍ය පරිපාලනය සඳහා වෙන ම අධ්‍යයනාංශයක් පිහිටුවන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කළෙමි. ඒ අනුව, 1980 මැයි මස 5වැනි දින සිට කළමනාකරණ අධ්‍යනාංශය බෙදා වෙන් කර, රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශය ආරම්භ කරන ලදී. එම අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙස මා පත් කරන ලදී. ඉන්පසුව මගේ ජීවිතයේ ඇති වූ විවිධ වෙනස්කම් පහත දැක්වේ.

නෙදර්ලන්තයේ දී ඉතිරි කරගත් මුදලින් පවුම් දෙදාහක බැංකු අණකරයක් රැගෙන ආවෙමි. ඒ මුදලින් හිඩෙකි (HIDEKI) සමාගම මගින් ජපානයේ පාවිච්චි කළ කාර් දෙකක් ගෙන්වා ගතිමි. එකක් ටොයෝටා කොරෝල්ලා ටී - 20 රථයකි. අනික (ඩැට්සන්) නිසාන් සනී (බටු සනී) රථයකි. ටොයෝටා රථය විකිණීමෙන් ලැබුණු රු 65,000/- මුදලින් රුපියල් පන් දහසක් තැරැව්කරුට ගෙවන්නට සිදුවිය. තවත් රුපියල් දසදහසක් ණය ගෙවීමට වියදම් විය. ඉතිරි පනස් දහස නිවසක් ඉදිකර ගැනීමට යෙදෙව්වෙමි.

ඉඩමක් මිලයට ගැනීම හා නිවසක් ඉදිකිරීම

මිරිහානේ විජේසේකර මාවතේ පදිංචි ව සිටිය දී, 1971 ඔක්තෝම්බර් මාසයේ දී පමණ තලපත්පිටියේ පැවැති ඉඩම් වෙන්දේසියකට ගියෙමි. ලංකා ලැන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (Lanka Land Investment) සමාගම විසින් වෙන්දේසිය පවත්වන ලදී. තලපත්පිටිය කනත්ත පාරට බස් එකක් තිබිණි. වෙන්දේසි දිනයේ ගෙදර සිට පයින් ම ගිය නමුත්, කනත්ත හන්දියට යන තුරු ම බසය ආවේ නැත. වෙන්දේසි ඉඩම පිහිටියේ කනත්ත හංදිය කිට්ටුවයි. ඉඩම් කැබලි හැට පහක් වෙන්දේසියට තිබිණි. එහි බිම් සැලැස්ම සහිත පත්‍රිකා බෙදා හැර තිබිණි. මහ පාරට මායිම් වූ ඉඩම් කට්ටි කැබලි කනත්ත හන්දිය අසලින් අංක එකේ සිට ආරම්භ විය. ඊට පිටු පසින් කට්ටි 17 සිට ඇරඹිණි. අංක 18 ඉඩම් කට්ටිය වෙන්දේසියට ඉදිරිපත් කළ විට ඉල්ලුම් කළෙමි. වැඩි තරගයක් නොවීය. පර්චස් 17.2 එම ඉඩම් කට්ටිය රු.4,400/- කට මට තීන්දු විය. මුළු මුදල ම මා ළඟ තිබුණේ නැත. ඒ නිසා, ඒ අවස්ථාවේ රු. 1,000/-ක චෙක්පතක් දී ඉතිරි මුදල පසුව ගෙවීමට තීන්දු කර ගතිමි. වෙන්දේසිය හමාර වී ගෙදර ගොස් ඉඩම් කට්ටියක් ගත් බව ප්‍රේමාට කීවෙමි. "මිනී මරුවන්" ඉන්න ඒ ප්‍රදේශයෙන් ඉඩමක් ගත්තේ මක්නිසා දැ'යි ඈ ප්‍රශ්න කළාය. ඉඩමක අවශ්‍යතාව තිබිණි. පරිසරය කුමක් වුවත් දැන් කළ හැකි දෙයක් නොවීය. ඉතිරි මුදල් සොයා ගෙන ඉඩම සන්තක කර ගැනීමට පියවර ගත යුතු විය. විශ්ව විද්‍යාලයේ ණය දෙන සමිතියේ සාමාජිකයෙකු වූ නිසා එයින් යම් මුදලක් ලබා ගත හැකි විය. තවත් ගෙවීමට ඉතිරි වූ මුදලක් වසරක් තුළ මාසික වාරිකවලින් ගෙවීමට යොදා ගතිමි. මේ අනුව, 1972 වසර අවසන් වන විට ඉඩම් ඔප්පුව ලබාගත හැකි විය. ඔප්පු ගාස්තු ඇතුළු ඉඩමට වියදම රු: 5,500/-ක් විය. වාරිමාර්ග දෙපාරතමේන්තුවේ දී දැන හැඳිනගෙන සිටි සැලසුම්කරුවෙකු වූ *ගුණතිලක* මිතුරා ලවා 1976 දී පමණ නිවාස සැලැස්මක් නිර්මාණය කර ගෙන තිබිණි. එය ඉතා සරල සැලැස්මක් විය. එනමුත් අවශ්‍ය මූලිකාංග තිබිණි. එයට අනුව එහි ඇස්තමේන්තු වියදම රු: 35,000/- කි.

නෙදර්ලන්තයට ගොස් ආපසු පැමිණ කාර් එක විකුණා ඉතිරි වූ රු:50,000/- මුදල නිවසක් ඉදිකර ගැනීමට ප්‍රමාණවත් නොවීය. ඒ නිසා, උගස් බැංකුවෙන් රු: 50,000/- ණය මුදලක් ඉල්ලා සිටියෙමි. ඒ මුදල ලැබෙන ලකුණු ඇති වූ පසු, තලපත්පිටිය ඉඩමේ නිවස ඉදිකිරීම මූලික කටයුතු ආරම්භ කළෙමි. 1980 අප්‍රේල් මාසයේ දී පමණ එම ඉඩමේ ළිඳක් හාරා ගැනීම ආරම්භ කළෙමි. විශ්ව විද්‍යාලයේ සේවය කළ *ගුණවර්ධන* නම් වූ අපගේ කාර්යාල සේවක මහතා මේසන් කෙනෙකු නිසා, මගේ නිවස ඉදිකිරීම ඔහු බාර ගත්තේය. ඒ සමඟ ඔහු විශ්ව විද්‍යාල සේවයෙන් ඉවත් වී පූර්ණකාලීන ව මේසන් වැඩේ නිරත විය. ඒ නිසා, සමහර වැඩ කටයුතු

ඉටුකරවා ගැනීම පහසු විය. මේ අතරතුර, ළිඳ කැපූ දවසෙන් පසුව මගේ තුනටියේ අමාරුවක් සෑදීම නිසා රෝහල් ගතවීමි. එම රෝගය කොඳු ඇට පේලියේ තුනටිය අසළ හිරවීමෙන් ඇතිවන්නකි. (SCIATICA) මේ නිසා සති දෙක තුනක් රෝහලේ දී හා නිවසේ දී බෙහෙත් ගැනීමට සිදුවිය. ගෙදරට අවශ්‍ය දැව සොයා ගැනීමට ගුණවර්ධන සමග රුවන්වැල්ල ප්‍රදේශයට ගොස් අවශ්‍ය පියවර ගතිමි. වහලට පොල් පරාල තොගයක් මාතර මහ ගෙදරින් පුංචි අයියා ගෙනවිත් දුන්නේය. ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් තිබිය දී ම, 1980 ඔක්තොබර් මස 20 දින තලපත්පිටිය නිවසේ පදිංචියට ගියෙමු. දින දෙකක් තුනක් ඇතුළත විදුලි බලය ද ලබා ගතිමි. එනමුත්, 1997 මැයි මාසය පමණ වන තුරු නල ජලය ලැබුණේ නැත. ළිඳ අඩි හතළිස් පහක් වුවත් වියලි සමයේ දී ළිඳේ ජලය පහළට ගොස් ඉතිරි වූයේ අඩියක හමාරක ජල ප්‍රමාණයකි. මේ නිසා නල ජලය තිබුණ අඹුල්දෙණිය වැනි තැන්වලට පාන්දරින් ම කාර් එකෙන් ගොස් ගමන් දෙක තුනකින් වතුර ගෙනැවිත් පුරවා ගතිමි. කුමන කරදර මධ්‍යයේ වුව ද, අපේ ම නිවසක පදිංචි ව සිටීම මටත් ප්‍රේමාටත් සැනසිල්ලක් වූ බව නිසැකය. උගස් බැංකුවේ ණය මුදල ලැබුණේ නිවසේ වැඩ හමාර වූවාට පසුවය. මේ සියලු මුදල් යොදවා වුව ද නිවසට අවශ්‍ය සියලු පහසුකම් සලසා ගැනීමට නොහැකි විය. සිවිලින් ගැසීම ජනෙල්වලට ග්‍රිල් දමා ගැනීම, නිවස අවට බැම්මක් දමා ගැනීම වැනි දේ අවසන් කර ගැනීමට හැකි වූයේ තවත් වසර නවයකින් පමණය. 1979 හා 1980 වසරවල දී කාර් එකක් සහ නිවසක් ලැබීම ද අපගේ සුවපහසුවට හේතු විය. කෙසේ වෙතත්, දරුවන් පාසල් යාම තවමත් බස් රථවලින්ය. පොඩි පුතා පමණක් නාලන්දා විද්‍යාලයට කාර් එකේ ටික කලක් ගියේය. පසුව ජුබිලි කණුවේ සිට පාසල් බස් රථයෙන් ගමනට පුරුදු විය.

සංචාරක ව්‍යාපාරය

නිවසේ ඉදිකිරීම් කටයුතුවලට සියලු මුදල් වියදම් වූ නිසාත් දරුවන්ගේ වියපැහැදම් වැඩි වූ නිසාත් නැවතත් අගහිඟකම්වලට මුහුණ දීමට සිදුවිය. මෙ ගැන ළතැවෙමින් සිටිය දී, ප්‍රේමාගේ ඥාතියෙකු වූ *මහින්ද සමරකෝන්* මිතුරා විසඳුමක් ගැන හෝඩුවාවක් දුන්නේය. මට දැන් කාර් එකක් තිබුණ නිසා, අතරින් පතර සංචාරකයින් ප්‍රවාහණයට නිරත විය හැකි නම්, අමතර ආදායමක් උපයා ගත හැකිය, යන්නයි. ඒ අනුව, මහින්ද සමග ගෝල්ෆේස් හෝටලයේ ට්‍රැවල් කවුන්ටර (Galle Face Hotel Travel Counter) භාර ව කටයුතු කළ දීපාල් ජයසිංහ මහතා මුණගැසුණි. විටින් විට සංචාරකයින් ප්‍රවාහණයට මා කැඳවිය හැකි බව *දීපාල්* කීවේය.

මට ලැබුණු පළමුවන ගමන් වාරය ගෝල්ෆේස් හෝටලයේ සිට කටුනායක ගුවන් තොටුපලට මඟියෙකු හැරලීමටයි. ඒ සඳහා රුපියල් හැත්තෑපහක් (රු. 75/-) ලැබිණි. ගුවන් තොටුපළට යන මඟීන් සමහරවිට රු 100/-ක් දුන්හ. ක්‍රමයෙන් අත්දැකීම් වැඩි වන විට, වෙනත් ගමන් බිමන් සඳහා ද අවස්ථාව ලැබිණි. වරක් ඕස්ට්‍රෙලියානු තලතුනා යුවලක් සමග මහනුවර, නුවරඑළිය හා හික්කඩුව යන තැන්වල දින කිහිපයක සංචාරයක ගියෙමි. ඒ මහතා දෙවැනි ලෝක මහා යුද සමයේ දී සොල්දාදුවෙකු ලෙස ලංකාවට පැමිණ තිබිණි. මෙවර ඔහු ලංකාවට පැමිණ තිබෙන්නේ පැරණි මතක සටහන් අලුත් කර ගැනීමටය. එමෙන් ම, තම බිරිඳට ලංකාව පෙන්වා දීමටය. ත්‍රිකුණාමලයේ නිලාවැලි, දකුණේ යාල අභය භූමි, අනුරාධපුරය, සීගිරිය, ගාල්ල, තංගල්ල වැනි ප්‍රදේශවලට ද ගමන් වාර විටින් විට ලැබුණේය. ඒවාට මුදල් ලැබුණේ ධාවනය වූ දුර ප්‍රමාණය අනුවය. මෙසේ ලැබුණු මුදලින්, 1982 ජනවාරි මාසයේ දී ගෑස් උදුනක් හා සිලිණ්ඩරයක් මිල දී ගතිමි. එනමුත්, මේ ව්‍යාපාරය වැඩි කල් කර ගෙන යන්නට ඉඩ ලැබුණේ නැත. 1982 ජනවාරි මස 20වැනි දින හෘද රෝගයක් වැළඳුණ නිසාය. ඒ පිළිබඳ විස්තර පසුව ගෙන හැර දක්වමි.

ජනාධිපතිවරණය හා ජනමත විචාරණය

1982 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ පවත්වන ලද ජනාධිපතිවරණය හා ජනමත විචාරණය ගැන, *"1977න් පසු දේශපාලන වාතාවරණය"* යන ශීර්ෂය යටතේ ඉහතින් විස්තර කර තිබේ. ජනාධිපතිවරණය සමයේ දී අප කිහිප දෙනෙකුගේ ක්‍රියාකාරකම් ගැන සංක්ෂිප්ත ව සඳහන් කළ යුතු ව තිබේ. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා සමග තරගයට ඉදිරිපත් වී සිටි අපේක්ෂකයා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාය. එතුමා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ රජයේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා විය. බණ්ඩාරනායක මැතිණියගේ සිවිල් නිදහස අහෝසි කර තිබූ නිසා, තරග කිරීමට නොහැකි විය. කොබ්බෑකඩුව මහතා වෙනුවෙන් ඡන්ද ව්‍යාපාරය මෙහෙයවන ලද්දේ විජය කුමාරතුංග කලාකරුවා විසිනි. වරක් මහනුවර දී දැවැන්ත රැස්වීමක් පැවැත්විණි. එයට සහභාගී වීමට අප කිහිප දෙනෙක් එහි ගියෙමු. පුස්තකාලයාධිපති *ඩබ්ලිව්.බී.දොරකුඹුර මහතා, මහාචාර්ය මැන්දිස් රෝහණදීර මැතිතුමා, ආචාර්‍ය ජගත් වික්‍රමසිංහ මහතා* හා මම මේ ගමනට සහභාගී වී, එම රැස්වීමෙන් පසු අනුරාධපුරයට ගියෙමු. හිටපු අමාත්‍ය *කේ.බී.රත්නායක මහතා* විසින් සංවිධානය කරන ලද රැස්වීම් කිහිපයකට සහභාගී වීම සඳහාය. අනුරාධපුරයට ගොස් නවාතැන් ගත්තේ අපගේ ශිෂ්‍යාවක වූ, එවකට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනුරාධපුර ශාඛාවේ කළමනාකාරිනිය වූ *බස්නායක මහත්මියගේ* සංචාරක නිවාසයකය. බස්නායක මහත්මිය *කේ.බී. රත්නායක මහතාගේ* ඥාතිවරියක වුවාය.

පසු දින උදෑසන ආහාරය රත්නායක මහතාගේ නිවසේ සූදානම් කර තිබිණි. ඉන්පසුව රැස්වීම් පැවති තැන් දෙක තුනකට ම ගියෙමු. සවස් වරුවේ රැස්වීම් පැවැත්වුණේ *තඹුත්තේගම* නගරය අසලය. එය සංවිධානය කර තිබුණේ *සුනිල් ජයවීර* නම් වූ අපගේ ගෝලයෙකුගේ ප්‍රධානත්වයෙනි. එම රැස්වීමේ දී කළ කථාවේ දී මා කීවේ, *කොබ්බෑකඩුව* මහතා ඡන්ද තිස්හතර ලක්ෂයක් පමණ ද ජයවර්ධන මහතා ඡන්ද විසිහය ලක්ෂයක් පමණ ද ලබන බවයි. ඇත්ත වශයෙන් ම ප්‍රතිඵලය වූයේ අනෙක් පැත්තටය. ජේ.ආර්.ජයවර්ධන මහතා ජයග්‍රහණය කොට දෙවෙනි වරටත් ජනාධිපතිවරයා විය. ඉන්පසුව විජය කුමාරතුංග මහතාට *නැක්ස්ලයිට්* (Naxalite) චෝදනාවක් පටලවා ඔහු සිරභාරයේ තබන ලදී. ජනමත විචාරණය පැවැත් වූ පසු මහ මැතිවරණය ද කල්දැමීය.



ඩෙවන් දිය ඇල්ල

විශ්ව විද්‍යාලයේ වෙනස්වීම්

මහාචාර්ය ජිනදාස පෙරේරා මහතාගේ නිලකාලය අවසන් වූවාට පසුව උපකුලපතිවරයෙකු පත් කර ගැනීමට ඡන්දයක් පවත්වන ලදී. 1978 විශ්ව විද්‍යාල පනත අනුව ඡන්ද බලය හිමි වූයේ කෝට් (COURT) සභාවටයි. එහි සමාජිකයන් හතළිස් ගණනක් වූහ. උපකුලපති තනතුර සඳහා රජයෙන් *අලහකෝන් මහතා* ඉදිරිපත් කරන ලදී. එනමුත්, කලින් රජයේ ආධාරකරුවකු වූ මහාචාර්ය ටී.බී. කාන්ගහආරච්චි මහතා ද තරගයට

ඉදිරිපත් විය. ඒ මහතාට උදව් උපකාර කළේ එවකට ව්‍යාපාරිකයෙකු වූ *මහාචාර්ය ලීනස් සිල්වා මහතාය.* කාන්ගහඅාරච්චි මහතා දිනුවේය. එනමුත් රජය ඒ ගැන පැහැදීමක් නොවීය. සාම්ප්‍රදායානුකූල ව උපකුලපතිවරයෙකු පත්වූ පසු අධ්‍යාපන ඇමතිවරයා ද ජනාධිපතිවරයා ද හමුවීම කළ යුතු වුවත්, කාන්ගහඅාරච්චි මහතා එය පැහැර හැරියේය. තමාට සහයෝගය නුදුන් අය බැහැදැකීමට අවශ්‍ය නැතැ'යි ඔහුගේ තර්කය විය. කෙසේ වෙතත්, වැඩි කාලයක් කාන්ගහඅාරච්චි මහතාට උප කුලපති තනතුර දැරීමට ඉඩ තැබුවේ නැත. විශ්ව විද්‍යාලයේ කලබලකාරී තත්ත්වයක් ඇතිවීය, යන පදනම මත නිසි බලධාරියෙකු පත් කර, උපකුලපතිවරයා ඉවත් කරන ලදී. විශ්ව විද්‍යාල පනත ද සංශෝධනය කර, ජනාධිපතිවරයා විසින් උපකුලපතිවරයා පත්කිරීමට කටයුතු කරන ලදී. නිසිබලධාරියා ලෙස මෙන් ම ඊට පසුව උපකුලපතිවරයා වශයෙන් ද පත් කරනු ලැබුවේ *කරුණාසේන කොඩිතුවක්කු* මහතාය.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ උපධාරියෙකු වූ කොඩිතුවක්කු මහතා, සමවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රබලයෙකු ව සිටි බවත් එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධානයේ සාමාජිකයෙකු වූ බවත් කියනු ලැබේ. මා විශ්ව විද්‍යාලයට බැඳුණු දිනවල වාගේ කොඩිතුවක්කු මහතා විද්‍යෝදය මණ්ඩපයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාර්යවරයෙකු වශයෙන් සේවය කළේය. පසුව ඔස්ට්‍රේලියාවට ගොස් පස්චාත් උපාධි සුදුසුකම් ලබා පැමිණ, කථිකාචාර්ය ශ්‍රේණියට උසස් විය. 1977 මහ මැතිවරණයෙන් පසුව බලයට පැමිණි රජය යටතේ ජාතික තරුණ සේවා සභාවට සම්බන්ධ ව කටයුතු කර ඇත. ඔහු විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ නිසි බලධාරියා ලෙස පත් කරනු ලැබුවේ මේ අවදියේ දී ය. 1988 පමණ දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් පත්ව යන තුරු හෙතෙම උපකුලපති තනතුර දැරුවේය.

1983 ජූලි කලබලය

යාපනය ප්‍රදේශයේ දී එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් බිම් බෝම්බයකින් ඝාතනය කළ හමුදා භටයන්ගේ අවසන් කටයුතු කොළඹ කනත්තේ දී සිදුකිරීමට ගෙන ආ විට, රටේ කලබල තත්වයක් ඇති විය. 1983 ජූලි මාසයේ 25වැනි දින මගේ පොඩි පුතා පාසල් ගියේය. එනමුත්, එදින දවල් වන විට කොළඹ ප්‍රදේශයේ විවිධ තැන්වලින් දුම්රොටු පැන නගිනවා විශ්ව විද්‍යාලයේ සුමංගල ගොඩනැඟිල්ලේ ඉහළ මාලයක සිටි අපට පෙනිණි. එවකට කළමනාකරණ අධ්‍යයනාංශයේ ප්‍රධාන මුණසිංහ මහතාත් මාත් මාගේ කාර් එකෙන් අපේ දරුවන් ගැන සොයා බැලීමට කොළඹ පැත්තට ගියෙමු. පළමුවෙන් ම අප ගියේ නාලන්දා විද්‍යාලයටය. එහි සිටි පොඩි පුතා එක්කර ගෙන මුණසිංහ

මහතාගේ දුව ඉගෙන ගත් ශාන්ත බ්‍රිජට් විදුහලට ගියෙමු. ඒ දියණිය ද කැටුව ඊළඟට අප ගියේ ඩික්මන් පාරේ ශාන්ත පාවුළු විදුහලටය. කොට කලිසම් ඇඳි කණ්ඩායමක් පිහියා ආදිය අතැති ව ඩික්මන් පාර දිගේ ගොස් ගාලු පාර දෙසට යනවා මුණගැසිණි. ඉක්මනින් පාසලට ගොස් පොඩි දුව සමග කාර් එකට විත් අපි පස් දෙනා හැව්ලොක් පාර දිගේ ගමන් කළෙමු.

රෙදි මෝල අසල පොලිසියෙන් කීප දෙනෙක් තැනින් තැන සිටි නමුත් කලබලෙන් එහා මෙහා යන ජනතාව මෙහෙයවීමට කිසිවක් නොකළ බව පෙනිණි. කිරුළපන හංදිය අසළ පල්ලිය ළඟට එන විට මහපාර මැද කාර් එකක් ගිනි ගෙන දැවෙනවා දුටිමු. එහි තුළ යමෙක් සිටිනවා ද නැද්ද පැහැදිලි නොවීය. කොට කලිසම් ඇඳගත් මැරයෝ වාහන මෙහෙයවූහ. ඔව්හු අපගේ රථය තුළට එබී බැලූහ. මුණසිංහ මහතා ඔවුනට තේරෙන භාෂාවෙන් ශබ්ද නඟා යමක් කීවේය. එවිට අපට ඉක්මනට යන්නට සංඥා කළේය. නුගේගොඩ හන්දියේ හමුදා භටයන් කිහිප දෙනෙක් ද වූහ. එතැනින් දෙල්කඳ හන්දියට ගොස් මුණසිංහ මහතාත් දුවත් ඔහුගේ නිවසේ බස්වා පොඩිදුවත් පොඩි පුතාත් මාත් තලපත්පිටියේ අපේ ගෙදරට ගියෙමු.

මේ වන විට කලබලය හැම තැන ම පැතිරී තිබුණු බවට සාධක තිබිණි. පාසල් යන විට පොඩි පුතු අත්දුටු දේ ඔහුගෙන් අසා දැන ගතිමි. ජුබිලි කණුවේ සිට පාසල් බස්රියෙන් ගිය ළමයි සේනානායක හන්දියේ දී බස්සවා බසයේ ගමන නතර කර ඇත. ඉන් පසු බොරැල්ල හන්දිය ආදිය පසු කර පාසල දක්වා පයින් ගොස් ඇත. පාසලට ගිය පසු එයින් පිටතට නොයන ලෙස උපදෙස් ලැබී තිබේ. ඒ නිසා, මා එනතුරු ප්‍රධාන ගේට්ටුව අසළට වී සිටියේය. පොඩි දුව පාසලට යන තුරු කලබල කිසිවක් දැක නැත.

ගෙදර සිටිය දී මැර කණ්ඩායමක් කට මැත දොඩවමින් කනත්ත හන්දිය පැත්තේ සිට මහපාර දිගේ පහළට යනවා දුටිමු. ෆාම් එක නම් වූ ස්ථානය පසු කළා ම තිබුණු දම්ළ පොලිස් නිලධාරියෙකුගේ නිවසට හානි කරනවා දුටිමු. එම පොලිස් නිලධාරියා මිරිහාන පොලිසියේ සේවය කළ කෙනෙකි. ඔහු රාජකාරි සඳහා ගොස් සිටියේය. ඔහුගේ මව ගෙදර සිට කලබල ගැන හෝඩුවාව ලැබුණු වහා ම අල්ලපු වත්තේ සිංහල මිනිසුන්ගේ ගෙදරට ගොස් රැකවරණය ලබා ගත්තාය. එනමුත්, මැරයින්ගේ දාමරිකකම් වැළැක්වීමට කිසිවෙකුට නොහැකි විය.

සඳුදා දිනක ආරම්භ වූ මෙම කලකෝලාහල නැවැත්වීමට රජය විසින් යම්කිසි පියවරක් ගත්තා දැ'යි දැනගන්නට තිබුණේ නැත. එම සතියේ බ්‍රහස්පතින්දා ජනාධිපතිවරයා විසින් ජාතිය අමතා කතාවක් පවත්වන ලදී. පොලීසිය හා හමුදාව මැදිහත් වූයේ ඊට පසුවයි. අපි සියැසින් දුටු දේ ඉතා

අල්ප වුවත් මැර කණ්ඩායම් විසින් මිනීමැරීම්, ගෙවල් ගිනි තැබීම් ආදිය විශාල වශයෙන් සිදුකළ බවට ආරංචි පැතිර ගියේය.

ගැටලු නිරාකරණය කිරීමේ මුවාවෙන් රජය කළේ ජනතා විමුක්ති පෙරමුණ, කොමියුනිස්ට් පක්ෂය යනාදිය තහනම් කිරීමත් එහි නායකයන් සමහර දෙනෙකු සිරගත කිරීමත්ය. නැක්සලයිට් චෝදනා යටතේ ද සමහර දේශපාලන නායකයන් සිරගත කළහ. පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවෙනි සංශෝධනය සම්මත කර ගෙන බෙදුම්වාදය ප්‍රතික්ෂේප කර දිවුරුම් දීමට නියම වූ නිසා, ද්‍රවිඩ විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ අසුන් ගැනීම නතර විය. ඒ නිසා, ප්‍රජාතන්ත්‍රවාදී ව සාකච්ඡා කිරීමට තිබුණු ඉඩකඩ ද ඇහිරී ගියේය. දමිළ ජන කොටස් විශාල වශයෙන් විදේශගත වූහ. මෙය බෙදුම්වාදය ශක්තිමත් කිරීමට හේතු විය. විදේශගතවූවන්ගෙන් මෙන් ම විදේශ සංවිධානවලින් ද අවිගත් කණ්ඩායම්වලට ආධාර ලැබිණි. අවසානයේ එල්.ටී.ටී.ඊය අවිගත් ප්‍රබල ත්‍රස්තවාදී කණ්ඩායමක් බවට පරිවර්තනය වූයේ මේ නිසාය. ඒ පිළිබඳ ඉතිහාසය වෙන ම කතාවකි. මෙහි සඳහන් කර ඇත්තේ සියැසින් දුටු දේ හා ඇසූ ආරංචි මත පදනම් වූ මතයක් ප්‍රකාශ කිරීම පමණය.

පවුලේ ප්‍රගතිය

1980 ඔක්තෝම්බර් මාසයේ තලපත්පිටියේ නිවසෙහි පදිංචිය සහ ඊට ආසන්න වසර දෙකේ ක්‍රියාකාරකම් දෙක තුනක් ඉහතින් විස්තර කර තිබේ. ඉන්පසුව 1989 මැද භාගය වනතුරු ඇති වූ වැදගත් සිදුවීම් මෙහි ඇතුළත් කර තිබේ.



1983 දී, ශ්‍රී පාද වන්දනා කර පැමිණෙන අතර, හග්ගල මල් වත්තේ දී, ලොකු දුව, ලොකු පුතා, ප්‍රේමා, පොඩි පුතා සහ පොඩි දුව

1982 වසර අවසාන වේගෙන එන විට, ලොකු දුව සීමාවාසික කාලය අවසන් කර, කොළඹ ජාතික රෝහලේ නිර්විින්දන අංශයේ රැකියාව ආරම්භ කළාය. නිර්විින්දන අංශයේ වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබුණ නිසා, කොළඹින් බැහැර නොගොස් සේවය කිරීමට ලැබෙන්නේ ඒ අංශයට ඇතුළු වූ විටය. ඒ නිසා, එම ක්ෂේත්‍රය තොරා ගත් බව පෙනේ. එසේ වුවත්, උතුරේ සටන් වැඩි වන විට කෙටි කාල සේවාවක් සඳහා අනුරාධපුර රෝහලේ සේවයට යන්නට සිදුවිය. මහ රෝහලේ සේවය කරන සමයේ කොළඹ බාර්න්ස් පෙදෙසේ නිල නිවාසයක නේවාසික ව සිටියේය. ඒ නිසා ප්‍රවාහන පහසුකම් ද ලැබිණි. වයසින් මුහුකුරා යන නිසා විවාහයක් ගැන සොයා බැලීමට සිදුවිය. අවසානයේ, 1987 දෙසැම්බර් මාසයේ දී *වසන්ත ලියනගම* යන තරුණයා සමග විවාහ වූවාය. විවාහ උත්සවය පැවැත්වූයේ එවකට *රාමඩා* නම් වූ හෝටලේය. නෑදෑයන් හිතමිතුරන් පිරිසක් එයට සහභාගි වූහ. විවාහයෙන් පසුව නාවල සේනානායක මාවතේ පිහිටි වසන්තගේ නිවසේ පදිංචියට ගියාය. මහරෝහලේ සේවයට ගියේ එහි සිටය. 1989 අගෝස්තු මාසයේ දී සප්ත වාර්ෂික නිවාඩුවට මා විදේශගත වන විට පැවති තත්ත්වය එසේ විය.



ලොකදුවගේ විවාහ මංගල්‍යය 17.12.1987

ලොකුපුතා අසූගණන්වල ආරම්භයේ දී ටික කලක් කොළඹ පිටකොටුවේ මොරිස් රෝච් (Mourice Roche) සමාගමේ වෙළඳ සේවකයෙකු /ගබඩා නිලධාරියෙකු ලෙස සේවය කළේය. මේ සඳහා උපකාර කළේ නෙදර්ලන්තයේ දී මා හැඳින ගෙන සිටි, කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරියෙකු වූ, *කීර්ති සේනාරත්න* මහතාය. පසුව ලොකුපුතා තමා විසින් ම ඉල්ලුම් කර හැටන් නැෂනල් බැංකුවේ සේවයට බැඳුණේය. කලක් කොළඹ ඩාර්ලි පාරේ ශාඛාවේ සේවය කර පසුව නුගේගොඩ ශාඛාවට මාරු විය. 1991 වසරේ දී පමණ ඔහු විදේශගත වනතුරු එහි සේවය කළේ යැයි සිතමි. මාත් ඒ වකවානුවේ විදේශගත ව සිටි නිසා නිශ්චිත නැත.

පොඩි දුව සුජාතා විද්‍යාලයේ දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට සමත් වූවාය. උසස් පෙළ සඳහා වෙනත් පාසලකට යා යුතු විය. *විදුහල්පතිනිය ක්ලේරා මොට්වානි මහත්මිය* දරුවා පාසලෙන් අස්කර නොගන්නා ලෙස සඳහන් කළමුත්, විද්‍යා අංශයෙන් උසස් පෙළ හැදෑරීමට අවශ්‍ය බව සඳහන් කොට, මිලාගිරියේ ශාන්ත පාවුළු විදුහලට (St. Pauls Milagiriya) ඇතුළත් කළෙමි. 1983 ජූලි කලබල සමයේ පොඩි දුව ඉගෙන ගත්තේ එම පාසලේය. උසස් පෙළ සමත්වුවත් විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් නොතිබුණ නිසා, පොඩි දුවත් හැටන් නැෂනල් බැංකුවේ රැකියාවක් ලබා ගත්තාය. ඈ අලුත්කඩේ ශාඛාවේ සේවය කළාය. මේ වනවිට අප පදිංචි ව සිටියේ තලපත්පිටියේ නිසා, දිනපතා ගමනාගමනය කරදර විය. එසේ වුවත්, 1989 සැප්තැම්බර් මස අවසානය දක්වා ම එහි සේවය කළාය.

පොඩිපුතා 1978 වසරේ දී, ප්‍රේමාගේ ඉමහත් උත්සාහයෙන් නාලන්දා විද්‍යාලයට ඇතුළත් කර ගෙන තිබුණේ, මා නෙදර්ලන්තයේ සිටි අවදියේය. ඒ කාරණයේ දී එම විදුහලේ ගුරුවරියක වූ *මැන්දිස් මහත්මිය* බෙහෙවින් උපකාර වූවාය. විශ්ව විද්‍යාලයේ අප ගෝලයෙකු වූ *කුවේජූ* මහතා නාලන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු විය. මැන්දිස් මහත්මිය අපට හඳුන්වා දුන්නේ කුවේජූ මහතාය. එම පාසලේ පීරිස් නම් වූ ගුරුවරයෙක් ද අප ගෝලයෙකු විය. මේ ආදී නොයෙක් දෙනෙකුගේ සහයෝගයෙන් පොඩි පුතා නාලන්දා විද්‍යාලයේ ශිෂ්‍යයෙකු විය. 1983 ජූලි කලබල පටන්ගත් දිනයේ මහත් පීඩාවකට පත් ව පාසල් ගිය බව ඉහතින් විස්තර කළෙමි. අසූ ගණන්වල අගභාගයේ දී "දේශප්‍රේමීන්ගේ" නොයෙක් මැදිහත්වීම් නිසා, පාසල් අධ්‍යාපනයට අවහිරතා ඇති ඇති විය. සාමාන්‍ය වශයෙන්, 1987 අග දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිය යුතු වුවත්, මේ අයට විභාගය පවත්වන්නට හැකි වූයේ 1988 පෙබරවාරි මාසයේ දී ය. ඉන් පසුව උසස් පෙළ පන්ති පටන් ගැනීමට නොහැකි ව තිබිණි. ඒ නිසා, 1988 වර්ෂය මුළුමනින් ම ගත කළේ පාසල් යාමට නොහැකිවය.

විදේශ චාරිකා (1) - බෙල්ජියම

1983 ඔක්තෝම්බර් හා 1988 අගෝස්තු යන කාලපරිච්ඡේදය තුළ විටින් විට විදේශ චාරිකාවල නිරත වීමට අවස්ථාව ලැබිණි. *බෙල්ජියමේ ලර්වන්* නුවර කතෝලික විශ්ව විද්‍යාලය (Katholik Univesity, Lurven) (KUL) සමග පැවති සම්බන්ධතාවක් මත කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ කථිකාචාර්යවරුන්ට කේ.යූ.එල්. විශ්ව විද්‍යාලයේ දී පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට පහසුකම් තිබිණි. ඒ යටතේ සහකාර කථිකාචාර්යවරු තිදෙනෙක් ලර්වන් නුවරට ගොස් සිටියහ. මෙම වැඩ සටහන යටතේ ආචාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන්ට කෙටිකාලීන චාරිකාවල නිරතවීමට පහසුකම් තිබිණි. ඒ අනුව, 1983 ඔක්තෝම්බර් මාසය අග දී ආචාර්ය හෙක්ටර් පෙරේරා මහතාත් මාත් බෙල්ජියමට ගියෙමු. අප දෙදෙනාගේ පරිහරණයට එම විශ්ව විද්‍යාල පරිශ්‍රයේ කාමරයක් වෙන් කර දුන්හ. ශිෂ්‍ය නේවාසිකාගාරයෙන් (Home Vesalius) කාමර දෙකක් ලැබිණි. එම නේවාසිකාගාරයේ විවිධ රටවලින් පැමිණි පශ්චාත් උපාධි අපේක්ෂකයෝ උන්හ. අප්‍රිකානු රටවලින් මෙන් ම ඉන්දියාවේ හයිද්‍රාබාද්, බංගලි දේශය යනාදි රටවල අය ද අපට මුණගැසිණි. මේ සමහර දෙනෙක් පාදිලිවරුන් වූහ. නේවාසිකාගාරයේ සිටි හැම දෙනාට ම පොදු මුළුතැන්ගෙයක් හා කෑම ශාලාවක් පාවිච්චි කිරීමට සිදුවිය. ආහාරපාන තබා ගැනීමට කුඩා පෙට්ටියක් හා ශීතකරණයක් ද විදුලි උදුනක් ද වෙන්කර දී තිබුණි. අපට අවශ්‍ය පරිදි බත් එළවළු උයාගැනීමට ඉඩ තිබිණි. අප්‍රිකානුවන් බොහෝ දෙනෙකුගේ ආහාරය වූයේ මඤ්ඤොක්කා පිටි තලප ය. යම් ව්‍යංජනයක් සමග තලප ආහාරයට ගත්හ.

විශ්ව විද්‍යාලයේ පුස්තකාලයේ තිබූ පොත් දාහතරක ඡායා පිටපත් ලබා ගතිමි. ඒ සියල්ල ම විවිධ රටවල රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධ පොත් විය. මෙසේ ගන්නා ලද ඡායා පිටපත් පිටකවර යොදා බැඳ ගැනීමට, පිටපත් යන්ත්‍ර තිබුණු වෙළඳසලේ පහසුකම් තිබිණි. එම පොත් සියල්ල ම වෙන ම පාර්සලයක් වශයෙන් ගුවන් මගින් ලංකාවට එවීමි. හෙක්ටර් පෙරේරා මිතුරාගේ භාණ්ඩ තොගයක් නැව් මගින් එවීය. අප දෙදෙනා ම දිනක් ඇන්ට්වර්ප් (ANTWERP) නගරයේ නැව් භාණ්ඩ ගැන කටයුතු කරන සමාගමක් වෙත ගියෙමු.

මේ කාල පරිච්ඡේදය තුළ එම විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරු දෙදෙනෙක් තම නිවෙස්වල දී අප දෙදෙනාට රාත්‍රී භෝජන සංග්‍රහ පැවැත්වූහ. එක් කෙනෙක් පදිංචි ව සිටියේ *ඇන්ට්වර්ප්* නගරයේය. ඒ මහාචාර්යවරයා *එම්බ්‍රේච්ට්* (Embrecht) මහතා අප දෙදෙනාත් *තන්නිරිගම* යුවලත් ලර්වන් නගරයේ සිට එක්කර ගෙන ගොස් ආපසු හැරලවීය. රෑ කෑමෙන් පසුව ආපසු එන ගමනේ දී, පොලිස් මාර්ග බාධකයක දී පරීක්ෂණයට ලක්වීමු. මේ

වන විට අපගේ කනිෂ්ට කථිකාචාර්යවරුන් තවත් දෙදෙනෙක් එහි පැමිණ සිටියහ. ඒ නිසා, යාපා, ගුණවරධන, ධර්මදාස, තන්තිරිගම, කරුණාරත්න යනුවෙන් සහකාර කථිකාචාර්යවරු පස් දෙනෙක් ද වෙන ම බෙල්ජියමට ගොස් සිටි චාර්ලිස් ප්‍රනාන්දු මහතා ද වශයෙන් ලාංකිකයින් හත් අට දෙනෙක් ලර්වන් නුවර දී මුණගැසිණි. විටින් විට ඒ අය එක් වී භෝජන සංග්‍රහ පැවැත්වූහ.

බෙල්ජියමේ සිටින විට සති අන්තවල දී වෙනත් යුරෝපයේ නගරවලට යන චාරිකා බස් රථවලින් (IDEAL CAR) නෙදර්ලන්තයේ මාස්ට්‍රිච්ට් (MAASTRICHT), ඇම්ස්ටර්ඩෑම් හා බටහිර ජර්මනියේ බොන්, කොලෝන් නගරවලට ගියෙමු. ඇම්ස්ටර්ඩෑම් ගමනට අමුතුවෙන් වීසා අවශ්‍ය නොවූවත් බටහිර ජර්මනියට ඇතුළුවීම සඳහා වීසා අවශ්‍ය ව තිබිණි. මේ බස් රථය ජර්මනියට ඇතුළු වූයේ ආකෙන් (Achen) නම් ස්ථානයෙන්ය. මේ ස්ථානය බෙල්ජියම, නෙදර්ලන්තය හා ජර්මනිය යන රටවල් තුනේ ම සීමාවේ තැනකි. බස් රථය එතනට ගිය විට මගීන් එයින් බැස, ආගමන හා විගමන බාධකය හරහා අනෙක් පැත්තට ගොස් බසයට ගොඩවිය යුතුය. අප දෙදෙනාට වීසා නොතිබුණු නිසා, ආගමන විගමන කවුන්ටරයට නොගොස් දේශසීමාව හරහා පයින් ගොස් බසයට ගොඩවීමු. අප දෙදෙනා ඒ වෙලාවේ ගත්තේ ලොකු අවදානමකි. එනමුත් අපගේ අරමුණ ඉටුවිය. බස් රථය පළමුවෙන් කොලෝන් නගරයට ගොස් ඊළඟට බොන් නගරයට ගියේය. ඒ වන විට දවල් දොළහ පමණ වන්නට ඇත. ඒ නිසා අප දෙදෙනා කොලෝන් නගරයේ දී බසය මුණ ගැසෙන බව රියදුරුට පවසා බැහැර ගියෙමු. බොන් නගරයේ සිරි නරඹා රයින් නදිය අසල වූ එළිමහන් භූමියක වූ බංකුවක් මත වාඩි වී, දිවා ආහාරයට ගෙනගිය පාන් ඇපල් ආදිය භුක්ති විඳ, ටික වෙලාවක් එහි ගත කළෙමු. පසුව බොන් දුම්රිය ස්ථානයට පැමිණ කොලෝන් නුවරට යා හැකි දුම්රියකින් එහි ගියෙමු. පැය භාගයකින් පමණ කොලෝන් නගරයට පැමිණ බස් රිය පැමිණෙන තුරු පැරණි පල්ලියක් ඇති පෙදෙසට ගියෙමු. තවත් වේලාව තිබුණු නිසා එහි වීදියක තිබුණ කඩ සාප්පු නැරඹීමට ගියෙමු. සුළු තෑගි බෝග මිලට ගෙන පස්වරු හය වන විට බස් නැවතුම්පළට ගියෙමු. පැයකින් පමණ බස් එක පැමිණියේය. පැය කිහිපයකින් ලර්වන් නුවර අප නවාතැනට පැමිණියෙමු.

තවත් වරක් මම තනියම *ලක්සම්බර්ග්* නුවරට (රටට) ගියෙමි. එවර මගේ මිතුරු *හෙක්ටර් පෙරේරා මහතා* එංගලන්තයට ගොස් සිටියේය. සති අන්තයේ ලක්සම්බර්ග් යන ඉඩියාල් බසයකින් ඒ ගමන ගියෙමි. ලක්සම්බර්ග් රටත් නගරයත් එකකි. බස් රථය නතර කළ තැන සිට බලන විට කන්දේ තද බෑවුමක් විය. අඩි හත් අට සීයයක් පමණ පහළින් දිය පහරක් පෙනේ. බස් නැවතුම තිබුණු උසේ සිට එහා පැත්තේ තිබුණ කන්දට දෙපොලකින්



බෙල්ජියමේ ලර්වන් නගරය

පාලම් දෙකක් විය. එක පාලමක් දිගේ ගොස් එගොඩහ නගරයේ වීදි දිගේ ඇවිද සිහිවටන (Souvnir) විකිණීමට තිබෙන කඩයකින් තැගි දීමට තබා ඇති දේ මිලට ගෙන, අනිත් පාලම දිගේ බස් නැවතුම් පොළ තිබුණු පැත්තට පයින් ගොස්, පාලම මැද හරියට විත් පහළ බලන විට කැරකැවිල්ල හැදෙන තරම්ය. බස් රථය ආපසු ගමනට පිටත් වන්නේ රෑ බෝවී එන විටය. ඒ මාර්ගයේ එක් තැනක කඳු දෙකක් සම්බන්ධ කළ ඉතා ම දිග පාලමකින් ගමන් කළ යුතු විය. රාත්‍රී නමය පමණ වන විට නවාතැනට පැමිණියෙමි.

බෙල්ජියමේ සිට ලන්ඩන් නුවරට ද ගියෙමි. ඒ සඳහා *බ්‍රසල්ස්* නුවර තැනකින් ටිකට්පතක් ලබා ගෙන දුම්රියෙන් හා නැවෙන් යා යුතුය. 1983 දෙසැම්බර් 12 දින පාන්දරින් ම *බ්‍රසල්ස්* නුවරට ගොස් එතැන් සිට *ඔස්ටෙන්ඩ්* (Ostende) දක්වා දුම්රියෙන් ගියෙමි. එතැනින් එංගලන්තයේ *ඩෝවර්* දක්වා නැවකින් ද ඩෝවර් (Dover) සිට *ලන්ඩන් (වික්ටෝරියා)* දුම්රියපොළ දක්වා නැවතත් දුම්රියෙන් ද ගියෙමි.

දුරකථනය මගින් කලින් කථිකා කරගෙන සිටි පරිදි විශ්ව විද්‍යාලයේ මගේ ශිෂ්‍යයකු වූ *කුලතුංග පෙරේරා මහතා* උමං දුම්රිය මාර්ගයේ යම් ස්ථානයක දී මුණගැසිණි. පෙරේරා මහතා එවකට බ්‍රිතාන්‍ය ලංකා මහකොමසාරිස් කාර්යාලයේ වාණිජ අංශ භාර සහකාර කොමසාරිස්වරයා විය. උක්ස්බ්‍රිජ් (Uxbridge) ප්‍රදේශයේ තිබෙන ඔහුගේ නිවසට ගියෙමු. රාත්‍රී

ආහාරයෙන් පසුව කතා බහ කරමින් සිටිය දී, ඔහු කී කරුණක් නිසා මා ඉතා සංවේදී විය. තමා එම තත්ත්වයේ සිටින්නේ මා නිසා බව ඔහු කීවේය. පුදුමයට පත් මම එසේ කීවේ මක්නිසා දැ'යි ඇසුවෙමි. උපාධි පාඨමාලාවේ තුන්වෙනි වසරේ තමා ඉගෙන ගන්නා විට, පාඨමාලාවෙන් ඉවත් වී යන තරමට කළකිරීමකින් සිටි බවත්, මා නියම කළ මාතෘකාවකට නිබන්ධනයක් ලියා දුන් පසු එහි මා ලියා තිබුණු උපදේශයක් නිසා, මහත් ධෛර්යයක් ලැබූ බවත් ඔහු කීවේය. ඔහුගේ නිබන්ධනය සතුටුදායක බවත් තව ටිකක් උනන්දු වුවහොත් උසස් ප්‍රතිඵල ලැබිය හැකි බවත් මා විසින් එහි සටහන් කර තිබුණාලු. ඔහු ඒ ගැන මතක් කළ විට මට මැවී පෙනුණේ, මුතුඇට වන් අත් අකුරින් ලියා තිබුණු රචනාවයි. එහි මා කුමක් ලියා තිබුණා දැ'යි මතක නැත. ගුරුවරයෙකුගේ සරල උපදේශයක් කෙනෙකුගේ ජීවිතේ මෙතරම් වෙනසක් සිදු කළා නම්, එය නිහතමානී ව සතුටු විය යුතු දෙයක් නොවන්නේ ද? (පෙරේරා මහතා මැතක දී විශ්‍රාම ගිය බව මට දුරකථනයෙන් කථා කොට කීවේය). පසුදින පෙරේරා මහතා සමඟ ම මහකොමසාරිස් කාර්යාලයට ගොස් එදින රෑ වනතුරු ලන්ඩන් නගරයේ සිරි නැරඹුවෙමි. 9 වෙනි දා සවස හවුංස්ලෝ ප්‍රදේශයේ පදිංචි සිටි පර්සි අබේසේකර මහතා හමුවීමට කතිකා කරගෙන සිටියෙමි. මීට පෙර ලන්ඩන් ගිය විට මෙතුමා හමුවූ බව සඳහන් කර තිබේ. මෙවර ඔහු මුණගැසීමට අවශ්‍ය වූයේ මගේ ලොකු දුව පශ්චාත් උපාධි පුහුණුව සඳහා එංගලන්තයට ගියහොත් අවශ්‍ය නවාතැන් පහසුකම් සලසා ගැනීමටය. එදින එතුමාගේ නිවසේ දී රාත්‍රී ආහාරය මට සලසා දුන්නේය. අවශ්‍ය හැම උදව්වක් ම කිරීමට එතුමාත් එතුමාගේ බිරිඳත් පොරොන්දු වූහ.

පෙරේරා මහතාගේ නිවසට ළඟාවිය හැකි උමං දුම්රිය ස්ථානයට පැමිණ, රෑ බෝවී තිබුණ නිසා කුලී රියකින් එහි ගියෙමි. එදින රාත්‍රිය ද එහි ගත කළෙමි. පසු දින නැවතත් පෙරේරා මහතා සමග නගරයට පැමිණ, රාත්‍රී එකොළහ වන තුරු ලන්ඩන් නගරයේ බකිම් හැම් මාලිගාව ''වෙස්ට් මිනිස්ටර් දේවස්ථානය" පාර්ලිමේන්තුව ආදී ස්ථානවල පයින් ම ඇවිද හෙම්බත් වූ විට, වික්ටෝරියා දුම්රියපලට ගොස් බොහෝ වේලාවක් විවේක ගතිමි. ආපසු ගමනට ඩෝවර් දක්වා යන දුම්රිය රාත්‍රී එකොළහට පමණ පිටත් විය. එතැනින් නැවට නැඟී 11වෙනි දා හිමිදිරියේ බෙල්ජියමේ ඔස්ටෙන්ඩ් දුම්රියපොලට පැමිණියෙමි. එතැන් සිට පැයකින් හමාරකින් බ්‍රසල්ස් හරහා ලර්වන් හි නවාතැනට පැමිණියෙමි.

අප දෙදෙනාට (හෙක්ටර්ට හා මට) ආපසු පැමිණීමට තිබුණේ වසර අවසානයේ දී ය. ඇත්ත වශයෙන් ම ඊළඟ වසරේ ආරම්භයේ දී ය. ඒ අතරතුර ලංකාවේ මිතුරන්ගේ නිවෙස්වල නොයෙක් අවස්ථාවල භෝජන සංග්‍රහ ආදිය පැවැත්විණි. බෙල්ජියමේ සිටිය දී අලුතෙන් මුණ ගැසුණු කෙනෙකි, චාර්ල්ස් ප්‍රනාන්දු මහතා. එතුමා පසුකාලයේ දී අපගේ ආචාර්ය

මණ්ඩලයේ සමාජිකයෙකු විය. 1984 ජනවාරි 1වෙනි දා හිමිදිරි පාන්දරින් ම විශ්ව විද්‍යාලයේ මහාචාර්ය හෙරූලන් (Heroulen) මහතාගේ කාර් එකෙන් බ්‍රසල්ස් ජාත්‍යන්තර ගුවන් තොටුපලට පැමිණියෙමු. කොළඹට පැමිණීමට තිබුණේ ඇම්ස්ටර්ඩෑම් හරහාය. බ්‍රසල්ස් ගුවන් තොටුපලේ දී ම අපගේ ගමන්මලු කොළඹට එවීමට භාර දී මුළු ගමනට ම, බ්‍රසල්ස් - ඇම්ස්ටර්ඩෑම් - කොළඹ බලා පිටත් වන යානා පිවිසුම්පත් ද (Boarding Pass) ලබා ගතිමු. ඒ වන විට ගුවන් සේවාවන් බොහොමයක් පරිගණක භාවිතයට පිවිස තිබිණි. බ්‍රසල්ස් සිට ඇම්ස්ටර්ඩෑම් දක්වා (NLM) එන්.එල්.එම්. යානයකින් ද ඇම්ස්ටර්ඩෑම් සිට කොළඹ දක්වා කේ.එල්.එම්. (KLM) යානයකින් ද ගමන් කළෙමු. කේ.එල්.එම්. යානය ජකර්තා දක්වා යන්නකි.

ඇම්ස්ටර්ඩෑම් ගුවන් තොටුපලේ පැය කිහිපයක් ගත කිරීමට සිදුවිය. පස්වරු එකට පමණ කොළඹ දක්වා එන යානය පිටත්විය. එහි එන අතරමඟ දී ගුවන් නියමුවන් සිටින කුටිය (Cockpit) බැලීමට ද අවසර ලබා ගෙන එයට ගියෙමු. ඒ යානයේ නිලධාරීන් පස් දෙනෙක් සේවයේ නිරත ව උන්හ. ප්‍රධාන ගුවන් නියමුවා (Captain) සහායක ගුවන් නියමුවා (Co-pilot), ඉංජිනේරුවා, ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා කරවන්නා හා මඟ සලකුණු පෙන්වන්නා (Navigator) යන පස් දෙදෙනාය. දැන් බොහෝ ගුවන් යානාවල සේවය කරන්නේ දෙදෙනෙකු පමණි. එයට හේතුව පරිගණක භාවිතය අතිශයින් වැඩි වී ඇති නිසාය. එතැනින් ආපසු අපගේ අසුන් පෙදෙසට පැමිණෙන විට *ඇල්ලේ ගුණවංශ හිමියන්* මුණ ගැසුණි. *හෙක්ටර් පෙරේරා මහතා* උන්වහන්සේ සමඟ බොහෝ වේලා කතා කරමින් සිටියේය. 1983 ජූලි කලබලය නිසා යුරෝපා රටවල ඇති වී තිබෙන තත්ත්වය ගැන උන්වහන්සේ මහත් වේදනාවෙන් කථා කළ සේක. උන්වහන්සේ ගැන පසු කාලයේ දී නොයෙක් මාර්ගවලින් තොරතුරු දැනගන්නට ලැබිණි. ඒ සියල්ලෙන් ම මට හැඟී ගියේ උන්වහන්සේ දේශමාමක මානවහිතවාදී හිමිනමක් බවයි.

අප දෙදෙනා බෙල්ජියමේ සිටි අවසන් දිනවල, එහි දී අප නිරත වූ කටයුතු පිළිබඳ වාර්තාවක් අපගේ සමායෝජන මහතාටත්, බෙල්ජියම් විදේශාධාර කාර්යාලයේ නිලධාරිනියකටත් භාර දුනිමු. ලංකාවට පැමිණීමෙන් පසුව අපගේ පීඨාධිපතිවරයාට ද එවැනි වාර්තාවක් භාර දුනිමු.

විදේශ චාරිකා (2) - හයිද්‍රාබාද්

විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් *'ඇමරිකානු අධ්‍යයන සංගමය'* නමින් සංවිධානයක් පිහිටුවා ගත්හ. මෙහි පුරෝගාමී ව කටුයුතු කළේ අප විශ්ව විද්‍යාලයේ *ප්‍රස්තකාලයාධිපති ඩබ්ලිව්.බී.දොරකුඹුර මහතාය.* සංගමයේ ව්‍යවස්ථාවට අත්සන් කළ ආරම්භකයින් හත් දෙනා අතරට මා ද



With Dr. Hurd , Director, American Studies Research Centre, Hyderabad September, 1986

ඇතුළත් විය. මෙම සංගමය ක්‍රියාත්මක වූයේ එක්සත් ජනපදයේ අධ්‍යාපන පදනමේ අනුග්‍රහයෙනි. වසර කිහිපයක් ම රටේ නොයෙක් ස්ථානවල දී සංගමයේ වාර්ෂික සම්මේලන පැවැත්විණි. නිතිපතා සාමාජික සාමාජිකාවන් පනහකට වැඩියෙන් සහභාගි වූහ.

ඉන්දියාවේ *හයිද්‍රාභාද්හි* පිහිටි *ඔස්මේනියා විශ්ව විද්‍යාල පරිශ්‍රයේ* පිහිටි ඇමරිකානු අධ්‍යයන පර්යේෂණ මධ්‍යස්ථානයේ සති දෙකක් පමණ ගත කිරීමට ශිෂ්‍යත්ව ක්‍රමයක් ද ක්‍රියාත්මක විය. ඒ යටතේ 1986 සැප්තැම්බර් 16 -30 කාල පරිච්ඡේදය තුළ අප හතර දෙනෙක් එහි ගියෙමු. අප විශ්ව විද්‍යාලයේ *ආචාර්ය ජී. විල්සන් මහතාන්* මාත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය *ජී.බී. මීගස්කුඹුර මහතාන් ආචාර්ය වේරකේ මහතාන්* යන හතර දෙනාය. කොළඹ සිට බොම්බායට ද එතැනින් හයිද්‍රභාද් දක්වා ද ඉන්දියානු ගුවන් සේවයේ (Indian Airline) යානාවලින් ගමන් කළෙමු. එහි දී පළමුවන දින තුන හතරක් නවාතැන් පහසුකම් සලසා තිබුණේ පැරණි රජ මාලිගාවක පිහිටි හෝටලයකයි. ඉන්පසුව මධ්‍යස්ථානය අසල එයට සම්බන්ධ නේවාසිකාගාරයේ කාමර හතරක් ලැබිණි. ඉතා ම වියලි කාලගුණයක් පැවති මේ සමයේ විදුලි පංකා ක්‍රියා කළත් සිසිලසක් නොලැබිණි. ඒ මදිවට මදුරුවන්ගෙන් ද ගැහැට වූ නිසා, මදුරු දැල් දමා ගෙන නිදාගත යුතු විය. එයින් තවත් රස්නය වැඩි විය.

දිවා කාලයේ දී අසල පිහිටි පුස්තකාලයට ගොස් පරයේෂණවල නිරත වීමි. දින දෙක තුනක සම්මන්ත්‍රණයක් ද පැවතුණි. ඒ සඳහා ඉන්දියාවේ

නොයෙක් ප්‍රදේශවලින් පැමිණි අය සහභාගී වූහ. **ඒ අය අප රටේ දමිළ දේශපාලනඥයින් තදබල ලෙස විවේචනය කළහ. එහි සිටි සරණාගතයන් ද මහත් හිසරදයක් ලෙස සැලකූ බව පෙනිණි.**

දකුණු ඉන්දියානු ක්‍රමයට සැකසූ ආහාරපාන ලැබුණු නිසා ගැටලුවක් නොවීය. රාත්‍රී හා උදේ ආහාරය නෙවාසිකාගාරයෙන් ද දිවා ආහාරය පර්යේෂණ මධ්‍යස්ථානයේ භෝජනාගාරයෙන් ද ලැබිණි. වරක් අප කීප දෙනෙක් එහි විශ්ව විද්‍යාලයක උපකුලපතිවරයෙකු හා කථිකාචාර්යවරුන් කිප දෙනෙකු සහභාගි වූ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වීමු. එය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ *ආචාර්ය හර්ඩි* (HURD) මහතා විසින් ජලාශයක් අසල පිහිටි සමාජ ශාලාවක පැවැත්විණි. මේ ආදී නොයෙක් අවස්ථාවල ඉන්දියානු විද්වතුන් මුණ ගැසීමට ලැබීමෙන් පුළුල් අවබෝධයක් ලබා ගැනීමට උපකාර විය.

හයිද්‍රාබාද් නගර මධ්‍යයේ පිහිටි වෙළඳසල්වලින් නොයෙක් රෙදිපිළි හා ස්වර්ණාභරණ ලබා ගත හැකි විය. මා මිල දී ගත්තේ සාරි හා ගවුම් රෙදි පමණයි. එවා බොහෝමයක් ලොකු දුව සඳහාය. ඉතා හොඳ වොයිල් සාරි එරටින් ලබා ගත හැකි විය. කාශ්මීර, බෙනාරිස් යනාදී වර්ගවල වටිනා සාරී කිහිපයක් ද ගෙනාවෙමි. ඉන්දියාවේ යන බොහෝ දෙනා කරන්නේ එරටින් රෙදිපිළි ගෙන ඒමයි. එතරම් පුළුල් තේරීමක් සඳහා ඉඩ තිබේ. මිල ගණන් ද සාධාරණ බව පෙනිණි.

1986 සැප්තැම්බර් මස 30වැනි දින අප සිවුදෙනා ම බොම්බාය හරහා කොළඹට පැමිණියෙමු. හයිද්‍රාබාද් ගුවන් තොටුපලින් පිටත් වූයේ පැහැදිළි අහසක් තිබුණ දිනක පෙරවරුවේ නිසා, මුළු ගමන තුළ ම ඉන්දියාවේ භූමි ප්‍රදේශයේ ශුෂ්කභාවය ගුවනේ සිට දැක ගැනීමට ලැබිණි. *ආන්ද්‍රා ප්‍රදේශය* හා *කේරළ ප්‍රදේශය* එළිපෙහෙළි කර වගාවට යොදා තිබුණ බව දක්නට ලැබිණි. ලංකා වෙරළ තීරයට පිවිසෙන විට අමුතු ම ප්‍රියමනාප දසුනක් ඇස ගැටේ. මවු බිම කෙතරම් සුන්දර දැ'යි හිතෙන්නේ එවිටයි.

විදේශ චාරිකා (3) - භූතානය

එක් දහස් නමසිය අසූගණන්වල මැද භාගයේ දී ජ්‍යාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ දේශන පැවැත්වීමට සහභාගී වූයෙමි. එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ව සිටි *ෆෝබ්ස් මහතා දොරකුඹුර මහතාගෙන්* කළ ඉල්ලීමක් අනුව, මා එයට යොමු කරන ලදී. මා දේශන පැවැත්වූයේ 1931 සිට ලංකාවේ දේශපාලන විකාශනය පිළිබඳවයි. මෙය ඩිප්ලෝමා අපේක්ෂකයින්ට මෙන් ම වෙනත් අයටත් විවෘත ව තිබුණ නිසා, සමහර ප්‍රභූ ගණයේ අය ද කීප දෙනෙක් විටින් විට එයට සහභාගී වූහ.

මේ වකවානුවේ දකුණු ආසියානු සහයෝගිතාව පිළිබඳ කතිකාවක් පැන නැඟී තිබිණි. *සාර්ක් (SAARC) සංවිධානය* බිහිවූයේ ඊට වසර කිහිපයකට පසුවය. මූලික සාකච්ඡාවලට පුරෝගාමී වූයේ නේපාලයේ *ත්‍රිභුවන් විශ්ව විද්‍යාලයට* සම්බන්ධ වී සිටි නේපාල රජතුමාගේ මස්සිනා කෙනෙකු වූ *වික්‍රම් ෂා නැමති කුමාරයාය.* එතුමා ෆෝබ්ස් මහතාට එවා තිබූ ආරාධනාවක් මත මගේ නම යෝජනා කර තිබුණ නිසා, සම්මන්ත්‍රණ තුනකට සහභාගී වීමට ඉඩ ලැබිණි. මේවා පැවැත්වූයේ *තිම්පු, කත්මණ්ඩු* හා *කොළඹ* නගරවලය. මෙහි පළමුවෙන් තිම්පු ගමන ගැන විස්තර කරමි.

කොළඹ සිට මදුරාසිය හා කල්කටාව හරහා භූතානයේ පාරෝ දක්වා ගමන් කිරීමට ගුවන් ගමන් අවසරපත් ලැබිණි. ඉන්දියාවට දෙවරක් ඇතුළු වීමට වීසා ලබා ගත යුතු විය. මූලික කටයුතු සම්පූර්ණ කර ගෙන, 1988 ජුනි මස 5වැනි දින කොළඹින් පිටත් වී, ඉන්දියානු ගුවන් සේවයේ (Indian Airline) යානයකින් මදුරාසියට ගියෙමි. එම සමාගමේ ම ගුවන් යානයකින් කල්කටාවට ගියෙමි. කොළඹ සිට මදුරාසියට පැයකින් පමණ ගිය නමුත් මදුරාසියේ සිට කල්කටාවට ගමන් කිරීමට පැය හතරක් පමණ ගත විය. පස්වෙනිදා රෑ කල්කටාවේ හෝටලයක ලැගුම් ගෙන හයවෙනිදා භූතාන ගමනට පිටත්වීමි. කල්කටා ගුවන් තොටුපලේ සිට භූතානයේ *පාරෝ* (PARO) ගුවන් තොටුපල දක්වා ගමන් කළේ *ඩෘක්එයාර්* (DRUKAIR) නම් වූ භූතානයට අයත් ගුවන් යානයකිනි. එය මගීන් දහසය දෙනෙක් ගෙන යා හැකි යානයකි. නියමු කුටියේ සේවය කළ නියමුවන් දෙදෙනා හැර වෙන ගුවන් සේවක සේවිකාවන් කිසිවෙක් නොවීය. ගමන අතරතුර අතුරුපස සඳහා පාර්සලයක් ඉදිරිපස අසුනේ පිටුපස මල්ලක බහා තිබිණි. මේ ගුවන් යානය අහසේ බොහෝ ඉහළට ගියේ නැත. කඳු ශිඛර අතරින් පහළින් ගමන් කර, පැය එක හමාරක් දෙකක් අතර කාලයේ දී *පාරෝ* ගුවන් තොටුපලට පැමිණියේය. මෙහි ධාවන පථය පිහිටා තිබුණේ ගංගාවක් අසල, එහි දිග අතටය. වෙන සමතලා බිමක් නොවීය. පර්යන්ත ගොඩනැගිල්ලට ගිය පසු ආගමන විගමන නිලධාරීන්ට වීසා නිකුත් කිරීමට බොහෝ වේලාවක් ගත විය. එවකට භූතානයට සංචාරකයින් වැද්ද ගන්නේ නැත. ඒ නිසා, වීසා නිකුත් කිරීම පවා ඉතා ප්‍රවේශමෙන් කළ බව පෙනිණි.

ගුවන් තොටුපළ අසල එක් පසකින් හිමාලය කඳු වැටිය විය. ඒ ගිරිශිඛර මුදුන් නිතර ම හිමෙන් වැසී පැවතිණි. ගුවන් තොටුපල අසළ නදියේ දිය පහර එම කඳු ශිඛරවලින් ගලා බැසිණි. *පාරෝ* ගුවන් තොටුපලේ සිට *භූතානයේ* අගනුවර වූ තිම්පු නගරයට සැතපුම් විසිපහක් පමණ විය. අපි නවීන බසයකින් ගමන් කළෙමු. ලංකාවෙන් ගිය *මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා* සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ *ආචාර්ය සමරසිංහ මහතා* ද මෙසේ ගිය පිරිසට අයත් වූහ.

බස් රථ මාර්ගය කඳුබෑවුමක විය. ලංකාවේ උඩරට ප්‍රදේශයටත් වඩා බෑවුම් සහිත විය. මහපාර අසල නිවෙස්වල මා දුටු දෙයක් නම්, ඒවා බොහෝමයක් මහල් තුනක් වන සේ ඉදිකර තිබීමයි. බිම් මාලය ඒ අය ඇති කළ හරක්, එළුවන් වැනි සතුන් ගාල් කිරීමටය. නිවැසියන්ගේ මුළුතැන්ගෙය ආදිය පළමුවන මහලේ ද නිදන ඉඩකඩ පහසුකම් ඉහළ මහලේ ද තිබුණු බව පෙනිණි. බොහෝ නිවාස කඳුබෑවුම් අසල පිහිටි නිසා අඩිපාරවල් දිගේ යා යුතු විය. භූතාන් වැසියන්ගේ ඇඳුම් ද සකස් කර ගෙන තිබුණේ දණහිසෙන් ඉහළට තිබෙන ආකාරයටයි. ශීතල දේශගුණය නිසා පාවහන් සහ දිගමේස් වැනි යමක් භාවිත කළහ. එරට භික්ෂූන් වහන්සේලා පවා සිවුරු ඒ ආකාරයට ඇඳි බව දක්නට තිබිණි. තිම්පු නුවර දී අපට නවාතැන් ලැබුණේ *මොටිතං* (MOTITHAN) හෝටලයේය. එය එහි වූ එක ම හෝටලය විය. රජයේ ගොඩනැඟිලි හා කඩ සාප්පු පවා නගර ප්‍රදේශයේ විය. එම නගරයේ පිහිටි විශාල ම නිවස ඉන්දියානු තානාපතිවරයාගේ නිල නිවාසය යැ'යි සිතමි. හත්වෙනිදා සහ අටවෙනිදා සාකච්ඡා සභාව පැවතිණි. ඒ රජයේ දේපාරතමේන්තුවේ ම රැස්වීම් ශාලවකය. හත්වෙනි දා රාත්‍රී භෝජන සංග්‍රහය ඉන්දියානු තානාපතිවරයාගෙන් ලැබිණි. අටවෙනිදා සන්ධ්‍යාවේ *මොටිතං* හොටලයේ දී සංස්කෘතික සංදර්ශනයක් විය.

මේ අවධියේ භූතානයේ තනි පාලකයා වූයේ එහි රජතුමාය. පාර්ලිමේන්තුවක් වැනි ආයතනයක් නොවීය. එනමුත් රජතුමා පවා එරට සංඝරාජතුමාගේ උපදෙස්වලට යටත් විය යුතුව තිබිණි. සම්මන්ත්‍රණය අතරතුර කතාබහේ දී තේරුම් ගියේ, රජයේ නිලධාරීන් අතර කළකිරීමක් තිබූ බවය. විදේශගත වී අධ්‍යාපනය ලැබූ අය තම රට තුළ පැවති පාලන තන්ත්‍රය ගැන පැහැදීමක් නොවුණු බව දිස්විය. එනමුත්, ඒ රටේ හොඳ ඔත්තු සේවාවක් තිබුණු බව සමහර දෙනෙකුගේ මතය විය. ඔත්තු සේවාවේ ප්‍රධානියා වූයේ ඉන්දියානු නිලධාරියෙකි. රටේ ගොඩනැඟෙන අසහනය තේරුම් ගෙන රජතුමා විසින් ම යම් සංශෝධන කළ බව පසුව ආරංචි විය. දැනට එහි පාර්ලිමේන්තුවක් ඇති බව දැනගන්නට ඇත. රජතුමා තම පුත්‍රයා අගමැති තනතුරට පත්කර තිබේ. අගමැතිවරයා ඕක්ස්ෆර්ඩ් උපාධිධාරියෙකු යැ'යි කියනු ලැබේ.

තිම්පු කඩපලේ දී සුළු ත්‍යාග භාණ්ඩ (SOUVNIRS) කිහිපයක් මිලයට ගතිමි. *නගුල්තරං* (NAGULTARAN) නම් වූ භූතාන මුදල් නොතිබුණ නමුත්, ඒ රටේ ඉන්දියානු මුදල් බෙහෙවින් ම පරිහරණය වේ. ඒ නිසා ගැටලුවක් පැන නැඟුණේ නැත. නවවෙනිදා පෙරවරුවේ ආපසු ගමනට පිටත් වී *පාරෝ-කල්කටා* හරහා *මදුරාසියට* පැමිණ, එදින රාත්‍රියේ එහි හෝටලයක ලැගුම් ගතිමි. පසු දින පෙරවරුවේ මදුරාසියේ රෙදි සාප්පු කිහිපයකට ගොස් ඇඳුම් පැළඳුම් ටිකක් මිල දී ගතිමි. එම කඩවල සිංහල කතා කරන

වෙළඳ සේවකයෝ උන්හ. ඒ අය සමහර දෙනෙක් ලංකාවේ ද සිටි අයයි. දහවෙනි දා හවස් වරුවේ මදුරාසි ගුවන් තොටුපලින් පිටත් වී පැයකින් පමණ කටුනායකට පැමිණියෙමි.

විදේශ චාරිකා (4) - නේපාලය

දකුණු ආසියානු සහයෝගිතාව ගැන තිම්පු නගරයේ පැවති සම්මන්ත්‍රණයට පසුව *කත්මණ්ඩු නුවර* දී ද සම්මන්ත්‍රණයක් 1988 අගෝස්තු මස 16-17 යන දින දෙකේ දී පවත්වන ලදී. මේ සඳහා කොළඹින් පිටත් ව ගියේ අගෝස්තු 13වෙනි දා ය. එදින රාත්‍රියේ මදුරාසියේ හෝටලයක නවාතැන් ගතිමි. එවර ද මට *මහාචාර්ය ලක්ෂ්මන්* මහතා මුණගැසිණි. තවත් ලාංකිකයන් දෙදෙනෙක් ගිය නමුත්, ඒ කවුදැ'යි දැන් මතක නැත. මෙවර මදුරසියේ දී හා කල්කටාවේ දී වැඩි කාලයක් ගත කිරීමට තිබුණ නිසා, වෙනත් කටයුතුවල නිරත වීමට ද අවස්ථාව ලැබිණි.

මදුරාසියේ දී අප නැවතී සිටි හෝටලයේ සිට පා ගමනින් යා හැකි තැනක මහා රෙදිපිළි සල්පිලක් විය. ඉන්දියාවේ නොයෙක් ප්‍රාන්තවල නිපදවන විවිධ මාදිලියේ රෙදිපිළි එම ප්‍රදර්ශනයේ දී දක්නට ලැබිණි. ආපසු ලංකාවට එන විට ද එය තිබුණ නිසා, එහි ගොස් අවශ්‍ය යැ'යි සිතූ සාරි, ඇඳ ඇතිරිලි ආදිය කිහිපයක් මිලයට ගතිමි. ඉන්දියාවේ විවිධත්වය හා පුරාණය මේ දේවලින් අවබෝධ කර ගැනීමට හැකි විය. කල්කටාවේ පොත් සාප්පුවකින් ඉන්දියානු නිදහස ගැන ලියා තිබූ FREEDOM AT MIDNIGHT නම් පොත මිල දී ගතිමි. එරට නිදහස් සටහනේ නායකයන්ගේ කාර්යභාරය එයින් ඉගෙන ගතිමි.

මදුරාසියේ සිට කල්කටාවට යන ගමනේ දී අනිත් ලාංකිකයන් ගිය යානයේ මට අසුනක් වෙන් කර තිබුණේ නැති නිසා, පැය පහක් හයක් ගුවන් තොටුපලේ ගත කිරීමට සිදුවිය. රෑ ගමන් කළ යානයකින් කල්කටාවට යන විට පසුදා පාන්දර එකට දෙකට වන්නට ඇත. කෙසේ වෙතත් අනික් අය නැවතී සිටි හෝටලයට ගොස් නවාතැන් ගෙන, පසු දින ඒ අය සමග නේපාල ගුවන් යානයකින් *කල්කටාවේ* සිට *කත්මණ්ඩු* දක්වා ගියෙමි. *කත්මණ්ඩු* ඉතා කාර්යබහුල ගුවන් තොටුපලක් විය. එමෙන් ම අවට *සිංගප්පූරුව, බැංකොක්, ඩකා, ක්වාලාලම්පූර්,* වැනි තැන්වලින් ද *දිල්ලියෙන්* හා *කරච්චියෙන්* ද යනාදී වශයෙන් බොහෝ යානා පැමිණේ.

නේපාලයේ අගනුවර වූ *කත්මණ්ඩු නුවර* නොයෙක් තරාතිරමේ වීදි හා ගොඩනැඟිලි දක්නට ලැබේ. රජ මාලිගා, හෝටල්, පන්සල්, කෝවිල් ආදිය තැනින් තැන දක්නට ලැබේ. අපට නවාතැන් ලැබුණේ නවීන නමුත් තරමක කුඩා හෝටලයකය. සම්මන්ත්‍රණය පැවැත්වූයේ ද එහි ශාලාවකය.

විවේක වෙලාවන්හි දී රජ මාලිගය තිබුණු පෙදෙසේ ඇවිදීමට ගියෙමි. හින්දු කෝවිලක් බැලීමට ගියෙමි. විශාල දාගැබක් හා විහාර ගෙයක් තිබිණි. එතැන සිට බලන විට *කත්මණ්ඩු* අවට බොහෝ ප්‍රදේශයක් දැක බලා ගැනීමට පුළුවන. *චික්‍රම් හා කුමාරයා* සේවය කළ විශ්ව විද්‍යාල පරිශ්‍රයට ද අප කැඳවා ගෙන ගියේය.

සම්මන්ත්‍රණය අවසන් වූවාට පසුව අගෝස්තු මස 18වෙනි දා කත්මණ්ඩු නුවරින් පිටත් වී, එදින ම හවස් වන විට මදුරාසියට පැමිණ, 19වෙනි දින කොළඹට පැමිණියෙමි. එන ගමනේ මදුරාසියේ දී ඉහත සඳහන් පරිදි රෙදිපිළි තොගයක් මිලයට ගත් නිසා ගමන් මල්ල බර වැඩිවිය. ඉන්දියානු ගුවන් සේවයෙකුට සැලකිල්ලක් කළ විට බර ගැන නොසලකා ගමන් මල්ල යානාවට යැවීමට පිටත් කර හැරියේය. ලංකාවේ ගුවන් තොටුපල සෙවකයින්ගෙන් මට කිසිම බාධාවක් සිදුවී නැත.

විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම්, 1986- 89

1980 මැයි මාසයේ සිට 1986 ජූලි මාසය දක්වා රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධාන තනතුරේ කටයුතු කරමින්, එහි අධ්‍යයන කාර්ය මණ්ඩලය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළෙමි. එම කටයුත්තේ දී සමහරවිට පීඨාධිපති මෙන් ම උපකුලපති යන උසස් නිළධාරීන්ගේ බාධාවලට මුහුණ දීමට ද සිදුවිය. එසේ වුවත්, මගේ අත්දැකීම වූයේ, තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කළ විට තේරීම් මණ්ඩලය මගේ නිර්දේශය අනුමත කළ බවය. වරක් පීඨපතිවරයා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අපේක්ෂිකාවකගේ පවුලේ වැදගත්කම ගැන සඳහන් කළේය. එනමුත් මට අවශ්‍ය වූ අපේක්ෂකයා එවකට රජයේ සේවයේ නිරත ව සිටි යම් අත්දැකීම් ලබා සිටි නිසා, එවැන්නෙක් අප අධ්‍යයනාංශයට ප්‍රයෝජනවත් බව පෙන්වා ඔහු තෝරා ගත්තෙමි. තවත් වරක් උපකුලපතිවරයාට යම් කිසි අපේක්ෂකයකු පත් කිරීමට අවශ්‍ය තිබුණ බව පෙනිණි. එනමුත්, ඉදිරිපත් වූ අපේක්ෂකයන් අතර පී.එච්.ඩී සුදුසුකම් තිබූ කෙනෙකු ද වූයෙන්, එවැනි අයෙකු වඩා සුදුසු බව මගේ මතය විය. එවැනි කෙනෙක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට යැවිය යුතු නොවේ. එනමුත්, ඒ අපේක්ෂකයා රුසියානු උපාධිධාරියෙක්ය, යන තර්කය මත උපකුලපතිවරයා විරෝධතා පළකර වෙනත් කටයුත්තක් ඇති බව කියා පරීක්ෂණ මණ්ඩලයෙන් නැඟිට ගියේය. එම මණ්ඩලයේ සිටි බාහිර සාමාජිකයින් දෙදෙනා ම මගේ නිර්දේශය අනුමත කළහ. ඒ නිසා, පී.එච්.ඩී. උපාධිධාරියා තෝරා ගතිමු. උපකුලපතිවරයා කළේ අපේක්ෂකයාට පළා බෙදීමයි. ස්ථිර තනතුරක පුරප්පාඩුව තිබියදීත් වසරකට තාවකාලික පදනමකින් පත් කළේය. එනමුත්, පසුව ස්ථිර පදනමකට පත් කළෙමු. මේ ආදී සමහර කරුණු නිසා උපකුලපතිවරයා තුළ මා ගැන එතරම් පැහැදීමක්

තිබුණේ නැත. වරින් වර සනාතන සභා රැස්වීම් යනාදියේ දී තර්ක විතර්ක ද ඇති විය.

පීඨාධිපති තනතුරට පත්වීම

මේ අතර, 1986 ජූලි මස මුල දී එවකට තනතුර දැරූ පීඨාධිපතිවරයා හිටිවන ම ඉල්ලා අස්විය. එසේ අස්වීමට හේතු කවරේ දැ'යි පැහැදිලි නොවීය. මසකට පමණ පසුව ඔහු විදේශගත වූ බව දැනගන්නට ලැබිණි. මේ අවධියේ ඔහුට යම් යම් තර්ජන ආදිය තිබුණ බවට ද කතාවක් පැතිර ගියේය. එහි සත්‍යතාව ගැන නොදනිමි. හදිසියේ ම පීඨාධිපති තනතුර හිස්වීම නිසා, එයට යම් කෙනෙක් තෝරා පත් කරගත යුතු විය. 1978 විශ්ව විද්‍යාල පනත අනුව පීඨාධිපති පත් කර ගත්තේ පීඨ මණ්ඩලයේ සාමාජිකයින්ගේ ඡන්දයෙනි. ඒ සඳහා ඉදිරිපත් විය හැකිවූයේ අධ්‍යයනාංශ ප්‍රධානවරුන්ටයි. අධ්‍යයනාංශ ප්‍රධානීන් පත් කළේ උපකුලපතිවරයා විසිනි. එනමුත්, අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ පිළිගැනීමක් තිබිය යුතු විය.

පීඨාධිපති තනතුර භාර ගැනීමට මා කැමති දැ'යි විමසන ලෙස උපකුලපතිවරයා විසින් *දොරකුඹුර* මහතාගෙන් ඉල්ලා ඇත. ඒ ගැන මගෙන් විමසූ විට *දොරකුඹුර* මහතාට මා කීවේ, අනවශ්‍ය ඇඟිලි ගැසීම් නැති ව කටයුතු කර ගෙන යෑමට ඉඩ තබනවා නම්, මා එම තනතුර භාරගන්න බවයි. ඒ පණිවිඩයට පසුව පීඨ මණ්ඩල රැස්වීමක් කැඳවා 1986 ජූලි මස 4 වෙනි දා මා පීඨාධිපති වශයෙන් තෝරා ගන්නා ලදී. උපකුලපතිවරයා විසින් පත්වීම් ලිපිය නිකුත් කරන ලදී.

පීඨාධිපති තනතුරේ සේවය කරද්දී උපකුලපතිතුමා සමග හොඳ හිත ගොඩනැඟුණු අතර, එතුමා එයින් ඉවත් ව යන විට අප දෙදෙනා මනා සම්බන්ධතාවක් ඇති ව සිටියේ යයි සිතමි.

පීඨාධිපති තනතුරේ කටයුතු ඉටුකිරීමට එම කාර්යාලයට ගිය විට, මේසය මත විවෘත නොකළ ලියුම් ගොඩක් තිබෙනවා දැක, එයට හේතුව පීඨයේ සහකාර ලේඛකාධිකාරී *සිවලිංගම්* මහතාගෙන් විමසුවෙමි. හිටපු පීඨාධිපතිගේ නියමය එය බව ඔහු කීවේය. මින් පසු පීඨයට ලැබෙන සියලු ලිපි විවෘත කර අවශ්‍ය කටයුතු කරන ලෙස ඔහුට උපදෙස් දුනිමි. මගේ අවධානයට යොමුවිය යුතු ලිපි පමණක් මා වෙත යොමු කරන ලෙස උපදෙස් දුනිමි. ලිපි ද්‍රව්‍යයක් අවශ්‍ය වී ඒ ගැන කාර්යාලයේ සේවක තැනට කී විට, පීඨාධිපතිගේ ලාච්චුවේ ඇති යතුරු කැරැල්ලක් ඉල්ලුවේය. ඒ ලිපිද්‍රව්‍ය තිබුණ කබඩ් එක විවෘත කිරීමටයි. ඒ යතුරු කැරැල්ල ගෙන එහි තිබූ යතුර අදාළ ලාච්චුවලට හා කබඩ්වලට දමන ලෙස ඔහුට කීවෙමි. ඉන්පසුව පීඨාධිපති මේස ලාච්චුවේ යතුරු කැරලි තිබුණේ නැත.

පීඨාධිපති තනතුරට පත්වීමෙන් පසුව පැවැති පළමුවන පීඨ මණ්ඩල රැස්වීමේ දී කණ්ඩායම් දෙකක් අතර මහත් ආන්දෝලනයක් ඇති විය. හිටපු පීඨාධිපති හා සමඟ මගේ මිත්‍රයෙක් වාදයකට පැටලිණි. හිටපු පීඨාධිපතිට සහායට තවත් කීප දෙනෙක් ද මගේ මිතුරාගේ සහයට දෙතුන් දෙනෙක් ද වාදයට පිවිසි කල්හි මහත් ගාලගෝට්ටියක් ඇති විය. මගේ අසුනේ සිට ම මේසයට තදින් මිටෙන් පහරක් ගසා, වහා ම දබරය නතර කරන ලෙස වේගයෙන් නියෝග කළෙමි. හැම දෙනා ම නිශ්ශබ්ද වූහ. මගේ මිතුරා තම අසුනෙන් නැඟිට රැස්වීම් ශාලාවෙන් පිට වී ගියේය. රැස්වීමේ වැඩ කටයුතු සතුටුදායක ලෙස අවසන් විය. දවසකට දෙකකට පසුව මගේ මිතුරා හමු වූ විට කිසිවක් සිදුනොවූ ලෙසින් ඔහුට කතාබහ කළෙමි. ගැටලු නිරාකරණය විය. පසු දිනක මේ සිද්ධිය ගැන කතාබහ මතු වූ විට ඔහු මට කීවේ, රැස්වීම් ශාලාවෙන් පිට වී ගිය ඔහු කාර් එකේ නැඟී නුගේගොඩ දක්වා ගිය බවයි. ආවේගය අවසන් වූ පසු ආපසු පැමිණි බවයි.

පීඨ මණ්ඩල රැස්වීම් පෙරවරු නවයට ආරම්භ කිරීමට මා මුලසුනට ගොස් සිටියේ අනෙක් හැම සාමාජිකයෙකු ම පැමිණීමට පෙරය. වේලාවට වැඩ කිරීම ගැන බොහෝ දෙනා තුළ දක්නට ලැබුණේ නොසැලකිල්ලකි. සමහර අවස්ථාවල පීඨ මණ්ඩල සාමාජිකයන් පමණක් නොව පීඨයේ සියලු ම සාමාජිකයන්ගේ විශේෂ රැස්වීම් පැවැත්විය යුතු අවස්ථා ඇති වේ. වරක් එවැනි රැස්වීමකට කීප දෙනක් නොපැමිණීම නිසා එයට හේතු විමසූවෙමි. මෙය ද අලුත් දෙයක් විය. බොහෝ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සාධාරණ හේතු දක්වා තිබිණි. එක කථිකාචාර්යවරයෙක් ඒ ගැන විරෝධය දක්වා පිළිතුරු නොඑවීමට සිටි බව ආරංචි විය. පිළිතුරු ඉල්ලා සිටි දිනය වන විට ඔහුගෙන් ද හේතු දක්වා ලිපියක් ලැබිණි. ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ඔහුට මුරණ්ඩු නොවන ලෙස උපදෙස් දීම නිසාය.

පීඨාධිපතිවරයෙක් තම පීඨයේ යහපත සඳහා නොයෙක් අයුරු ක්‍රියා කළ යුතු වේ. පාලක සභාවේ දී පීඨය වෙනුවෙන් පෙනී සිටිය යුතු වේ. සනාතන සභාවේ දී ද අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් පීඨය නියෝජනය කළයුතු වේ. අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීම, උපකරණ ආදිය සපයා දීම, මුදල් වෙන් කරවා ගැනීමට කටයුතු කිරීම මෙයින් සමහරකි. අලුතෙන් එන යම් යම් උපකරණ ලබාගැනීමේ දී නිතර ම බාධා ඇති වේ. එක්වරක් කළු ලෑලි වෙනුවට මැගිබෝඩ් හා චෝක් බෝඩ් ඉල්ලා සිටි විට දී, අනිත් පීඨවල පීඨාධිපතිවරු පවා සැපයීම් කමිටුවේ දී එකඟ කරවා ගත්තේ ඉතා අමාරුවෙනි. මුදල් ඉතිරි කර ගැනීම අවශ්‍ය උපකරණ ලබා ගන්නවාට වඩා වැදගත් යයි සැලකූ බවක් පෙනිණි. එහෙත්, වරක් බාධකය කඩා දැමූ පසු කාගේත් සහයෝගය ලැබිණි.

අධ්‍යයනාංශවල පවතින පුරප්පාඩු පිරවීමට මූලික වශයෙන් කටයුතු ආරම්භ කළ යුතු වන්නේ අධ්‍යයනාංශ ප්‍රධානියා විසිනි. එනමුත්, ඊළඟ වසරේ ප්‍රතිපාදන ඉල්ලා සිටින විට පුරප්පාඩු පුරවා තිබීම වැදගත් වේ. වරක් එක් අධ්‍යයනාංශ ප්‍රධානියෙක් සම්මුඛ පරීක්ෂණයට අපේක්ෂකයින් පහළොස් දෙනෙක් කැඳවීම නිර්දේශ කර, එය අවසන් වූ විට එක් කෙනෙකුට වඩා සුදුස්සන් නැති බව කීවේය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපකුලපතිතුමා හා පාලක සභාවේ සාමාජිකයන් කීප දෙනෙක් වූහ. ඒ අයගේ අදහස් විමසා හය දෙනෙක් සුදුස්සන් ලෙස තේරුවෙමු. එයට දැඩි විරෝධය පෑ අධ්‍යයනාංශ ප්‍රධානියා, පසු දින තනතුරෙන් ඉල්ලා අස්විය. වෙන කෙනෙක් ඒ වෙනුවට පත් කිරීමට නිර්දේශ කළෙමි. පුරප්පාඩු හය පිරවීමට ක්‍රියා කළෙමි. පසු කාලයේ ආපසු හැරී බලන විට, අලුතෙන් එසේ පත් කළ හය දෙනා ම පී.එච්.ඩී.උපාධි පවා ලබා ගත්හ. ඒ අය බඳවා ගැනීමට විරෝධය පෑ තැනැත්තා මේ දක්වා පී.එච්.ඩී. උපාධියක් ලබා ගෙන නැත.

ශිෂ්‍ය ක්‍රියාකාරකම්

ශිෂ්‍ය ක්‍රියාකාරකම් නිසා නොයෙක් ගැටලුවලට මුහුණ දීමට සිදුවිය. පීඨාධිපති තනතුරට පත් වී මාසයක් ගතවන විට, උපකුලපතිවරයා විදේශ ගතවීම නිසා, එම තනතුරේ කටයුතු ඉටු කිරීමට පත් කරනු ලැබීමි. ඒ 1986 අගෝස්තු 16වන දින සිට 26වන දින දක්වා කාල පරිච්ඡේදය සඳහාය. විවිධ ශිෂ්‍ය කණ්ඩායම් අතර මතභේද ගැටුම් පැවතිණි. අගෝස්තු මාසයේ 20 දින රාත්‍රියේ එක් ශිෂ්‍ය කණ්ඩායමක් සමුගැනීමේ උත්සවයක් පැවැත් වූ අතර, තවත් කණ්ඩායමක් වෙනත් ශාලාවක චිත්‍රපටි දර්ශනයක් පැවැත්වූහ. පොලු මුගුරු සහිත රැස් වූ කණ්ඩායමක් තම ආත්මාරක්ෂාව සඳහා එසේ කරන බව කීහ. ඒ බාහිර පුද්ගලයින් පිරිසක් තමන්ට පහර දීමට සිටිනවාය, යන අනුමානය මතය. කෙසේ වෙතත්, කළමනාකරණ පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිතවතුන් දහ දොළොස් දෙනෙක් මගේ සහයට එදින මා සමඟ සිටියහ. ගැටුමක් ඇති නොවීමට පියවර ගෙන අප විසිර ගියේ පසුදින පාන්දර දෙකට පමණය. පෙරදින රාත්‍රියේ සිදුවූ දේ ගැන පසුදින පෙරවරුවේ සුමංගල ගොඩනැඟිල්ල ඉදිරිපිට විවෘත සංවාදයක් පැවැත්වූහ. පැය දෙක තුනක වාද විවාදවලට පසුව ඒ අය විසිර ගියහ.

උපකුලපතිතුමා නැවත රාජකාරියට පැමිණි පසු, 1986 අගෝස්තු මස 27වැනි දින මවිසින් පිටු පහක වාර්තාවක් එතුමාට භාර දුනිමි. එහි අවසාන ඡේදය පහත දැක්වෙන අයුරු විය :

"23 - There is an extremely undesirable tedency that is now developing among a small clique of students to resort to thuggery and cause physical harm of a most vicious and painful kind to suppress the majority who do not tow the line. In the eyes of the majority of students administration may appear ineffective if these things continue unabated. There may come a day when there would be no active student life in the campus. What is left may be a humourless unthinking uncritical horde of followers of a band of thugs in the guise of student leaders"

මෙම පුරෝකථනය ක්‍රම ක්‍රමයෙන් යථාර්ථයක් වූ බව පසු කාලයේ දී පැහැදිලි විය. විශ්ව විද්‍යාලයෙන් බැහැර බලවේග ශිෂ්‍යයින්ගේ ක්‍රියාකාරකම්වලට බලපෑම නිසා මේ තත්ත්වය උදා විය.

ප්‍රාණ ඇපකරුවන් පිරිසක්

1987 මැයි මස 6වෙනි දින පීඨ මණ්ඩල රැස්වීම පැවැත්වීම පිණිස විශ්ව විද්‍යාල භූමියට ගියෙමි. ප්‍රධාන ගේට්ටුව සාමාන්‍යයෙන් පාලනය කරන්නේ විශ්ව විද්‍යාලයේ ආරක්ෂක සේවකයින් විසිනි. එනමුත් එදින එය සිසුන්ගේ පාලනයේ වූ බව පෙනිණි. එසේ වුව ද ඇතුළුවීමට ඉඩ ලැබිණි. පෙරවරු 10.15ට පමණ පීඨ මණ්ඩල රැස්වීම ආරම්භ කර ඉක්මනින් අවසන් කළෙමු. එයට හේතු වූයේ මුල්‍යාධිකාරි මගින් උපකුලපතිවරයාගෙන් පණිවිඩයක් ලැබුණ නිසාය. මටත්, මුණසිංහ මහතාටත් උපකුලපතිවරයාට කථා කරන ලෙස එමගින් දන්වා තිබිණි.

පුස්තකාලයාධිපති දෙකුඹුර මහතාගේ කාමරයට ගොස් මුණසිංහ මහතා උපකුලපතිවරයාට කථා කළේය. දෙරකුඹුර මහතා ද එසේ කළේය. පොලිස් අත් අඩංගුවේ සිටින සිසුන් මුදා ගැනීමට කටයුතු කරන බව දැනගන්නට ලැබිණි. මේ තත්වයට හේතු වූ කරුණු මෙසේය:

1987 මැයි 1වෙනි දා නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානයේ දී මව්බිම සුරැකීමේ සංවිධානයේ මෙහෙයවීමෙන් පැවැති මැයි දින රැස්වීමෙන් පසුව පොලීසිය විසින් කරන ලද වෙඩිතැබීමක් නිසා, *කිත්සිරි මෙවන් රණවක* නමැති ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ අවසාන වසරේ ශිෂ්‍යයා මිය ගියේය. ඔහු මෙම රැස්වීමට පැමිණ ඇත්තේ මහජන එක්සත් පෙරමුණේ උප සභාපතිවරයෙකු වූ තම පියා වන පානදුරේ නීතිඥ රණවක මහතා සමඟය. මේ කරුණ නිමිති කර ගෙන විශ්ව විද්‍යාලයේ සිසුන් කුපිත වී, මැයි මස 3වෙනි දා පමණ ගොඩනැඟිලි බිත්තිවල නොයෙක් සටන් පාඨ හා චෝදනා පාඨ ලියා තිබිණි.

විශ්ව විද්‍යාලයේ දෙවෙනි අධ්‍යයන වාරය 4වෙනි දා ආරම්භ වීමට නියමිත ව තිබිණි. එදින රණවක ශිෂ්‍යාගේ අවමංගල්‍යට සහභාගි වීමට

සිසුහු බස්රථවලින් පානදුරයට ගියහ. ආචාර්ය මණ්ඩලයේ විසි පස් දෙනෙක් පමණ ද, විශ්ව විද්‍යාලයේ බස් රථයකින් එහි ගියහ. මැයි මස 5වෙනි දා දේශන පැවතුණේ නැත.

ඉහත සඳහන් පීඨ රැස්වීමෙන් පසුව සුමංගල ගොඩනැඟිල්ල ඉදිරිපිටට යනවිට ශිෂ්‍යන්ගේ රැස්වීමක් පැවැත්වෙන බව දුටිමි. ශිෂ්‍ය භික්ෂුනමක් කථා කරමින්, සිසුන් සමග රැඳී සිට සහයෝගය දක්වන ලෙස ආචාර්යවරුන්ගෙන් ඉල්ලා සිටියේය. වචනයෙන් හෝ හැසිරීමෙන් ගුරුවරුන්ට සිත් රිදෙන කිසිවක් නොකරන ලෙස ශිෂ්‍යයින්ගෙන් ඉල්ලීය. නන්දසිරි සිසුවා කථා කරමින් ඔවුන් රඳවා ගැනීමට හේතු විස්තර කළේය. සිසුන් පිරිසක් පොලිසිය විසින් අත් අඩංගුවට ගත් බවත්, දවල් දොළහ වන විට ඒ අය නිදහස් කරදීමට ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක මහතා පොරොන්දු වූ බවත්, එය ඉටුවන බවක් පෙනෙන්නට නැති බවත් ඔහු සඳහන් කළේය. මේ අතරතුර ශිෂ්‍ය නායකයන් විසින් පුවත්පත් වාර්තාකරුවන් ගෙන්වා ගැනීමට ක්‍රියා කරන බව දැනගන්නට ලැබිණි.

දිවා ආහාරය සඳහාවත් පිටවීමට ඉඩ නොලැබෙන බව පෙනී ගිය නිසා, විශ්ව විද්‍යාල සේවකයෙකු ලවා කෑම පාර්සල් කිපයක් ගෙන්වා ගෙන, දොරකුඹුර මහතාගේ කාමරයට ගොස් එහි වූ මේසයක් අසල ආහාර ගන්නා අතරතුර, පුවත්පත් වාර්තාකරුවන් පැමිණ ඡායාරූප කීපයක් ද ලබා ගත්හ. කෑමෙන් පසු ඒ කාමරයේ ම රැඳී සිටි අතර, සිසුන් විශාල කණ්ඩායමක් කාමරය ඉදිරියට පැමිණ මඟ අවුරාගත්හ. සටන් පාඨ කියන්නට වූහ.

මේ අතර පොලීසිය ප්‍රධාන ගේට්ටුව ළඟට පැමිණ ඇති බවත්, මහා විනාශයක් වීමට පෙර ඒ අය පිටත් කර යවන ලෙසත් අපට කීහ. ආචාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙක් පොලිස් නිලධාරීන් වෙත ගොස් කරුණු පැහැදිලි කර, ඒ අය ගේට්ටුව අසලින් ඉවත් කර ගත්හ. මේ නිසා, දොරකුඹුර මහතාගේ කාමරය අවහිර කරගෙන සිටි ශිෂ්‍ය පිරිස විසිර ගියහ. පස්වරු 5.30ට පමණ පසුව අප සියලු දෙනා ම සන්ථාගාරයට ගොස් තේ පානය කර එහි රැඳී සිටියෙමු. රාත්‍රී 7.00ට පමණ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක මහතා පොලිසිය විසින් නිදහස් කළ සිසුන් පස් දෙනා සමඟ විශ්ව විද්‍යාල භූමියට පැමිණියේය. ඔහු සමඟ සන්ථාගාරයට පැමිණි ශිෂ්‍ය නායකයින් කියා සිටියේ, නිදහස් නොකළ ශිෂ්‍යයා නිදහස් කරන තුරු අපට පිටවී යෑමට ඉඩදිය නොහැකි බවය.

ශිෂ්‍යයින් පස්දෙනෙක් සමඟ සාකච්ඡා කිරීමට කැමති බව දන්වා රාත්‍රී 8.30ට පමණ උපකුලපතිවරයාගෙන් පණිවිඩයක් ලැබිණි. ශිෂ්‍ය නායකයින්ට මේ බව දැන්වූ විට, ඒ අය අතර සාකච්ඡා කොට බොහෝ වේලාවකට පසුව, ඒ සඳහා සුදානම් බව දන්වා සිටියහ. එම සාකච්ඡාව දොරකුඹුර මහතාගේ නිවසේ දී පැවැත්වීමට තීරණය කරන ලදී. නුගේගොඩ - කොහුවල මල්පාරේ

එම නිවස පිහිටියේය. රාත්‍රී 10.30ට සාකච්ඡාව පැවැත්වීමට එකඟ වුවත්, විවිධ පුද්ගලයින් විටින් විට පැමිණීම නිසා, සාකච්ඡාව ආරම්භ වූයේ රාත්‍රි 11.15 ට පමණය.

සාකච්ඡාව අතර සිසුන් කියා සිටියේ, ආචාර්යවරු රැඳී සිටියේ කැමැත්තෙන්ය, යන්නය. එසේ නම්, දැන් අපට යන්නට පුළුවන් දැ'යි විමසූ විට ඒ අයගේ පිළිතුර වූයේ, ඉතිරි සිසුවිය ද නිදහස් කළාට පසුව යා හැකි බවයි. මේ වන විට අදාළ ශිෂ්‍යාව ද නිදහස් කර ඇති බව සනාථ විය. ඉන්පසුව ශිෂ්‍ය නියෝජිතයන් ඉල්ලා සිටියේ මේ කටයුතුවලට සම්බන්ධ අයට දඬුවම් නොකරන ලෙසය. විශ්ව විද්‍යාලය විවෘත කර තැබුවත් සිසුන් දේශනවලට පැමිණියත් මා දේශනවලට නොඑන බවත්, මගේ දේශන නොපැවැත්වෙන බවත්, මා දේශනවලට එන්නේ එයට සුදුසු තත්ත්වයක් ඇතැ'යි මට දැනුණ විට බවත් ඒ හැම දෙනා ඉදිරියේ සඳහන් කළෙමි.

දොරකුඹුර මහතාගේ නිවසේ සිට උපකුලපතිතුමාගේ වාහනයෙන් මා ගෙදර හැරළීමට කථා කළ නමුත්, කාර්ය මණ්ඩලයේ සගයන් විශ්ව විද්‍යාල භූමියේ සිටින නිසා, මා එහි යායුතු බව කියා එහි ගියෙමි. සිදුවූ දේ සන්ථාගාරයේ සිටි අන් අයට පැහැදිලි කර දී, රාත්‍රී (පාන්දර) එකට පමණ තදබල මහන්සියත් නිදිමතත් නිසා ගෙදර ගියෙමි. ප්‍රේමා හෝ ළමයි මේ කිසිවක් ගැන දැන සිටියේ නැත. ගෙදර පැමිණීම ප්‍රමාද වන බව සවස දුරකථනයෙන් දැන්වූයෙමි. ඒ නිසා මා එනතුරු ප්‍රේමා රෑ කෑම සුදානම් කර ගෙන බලා සිටියාය.

පසුදින පුවත්පත්වල මේ සියලු දේ ඡායාරූප සහිත ව පළ වී තිබිණි. ඉන්පසුව දින ගණනක් නොයෙක් දෙනා නොයෙක් අදහස් පළකර තිබිණි. එනමුත්, ශිෂ්‍ය සංවිධානවල ක්‍රියාකාරිත්වයේ වෙනසක් සිදුවූයේ නැත. ගුරුවරුන් වූ අපට ද කළහැකි කිසිවක් නොවීය. හිතුවක්කාර තරුණ දරුවන් කරන කියන දේ ඉවසා දරා ගෙන සිටින දෙමව්පියන් මෙන් අපිත් නිහඬ විමු.

මෙම සිද්ධි සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කිරීමට ඒක පුද්ගල කමිටුවක් පත් කළේය. කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට මා පළමුවෙන් ම කැඳවා තිබිණි. මා දන්නා තොරතුරු විස්තර කරන අතරතුර, යම් යම් නම් සඳහන් කරමින් ඒ අය අප රඳවා ගත් අය අතර සිටියේ දැ'යි මගෙන් විමසීය. භික්ෂූන් වහන්සේ නමක් ගැන ද විමසීය. ඒ අය කිසිවෙක් මා නොදන්නා බව ඔහුට දැක්වූයෙමි. මෙම පරීක්ෂණයෙන් කිරීමට සූදානම් වන්නේ තෝරා ගත් කීප දෙනෙකුට විරුද්ධ ව සාක්ෂි ලබා ගෙන දඬුවම් කිරීම බව පෙනී ගියේය. ඒ කාරණයේ දී මා ප්‍රයෝජනවත් සාක්ෂිකරුවෙකු නොවන්නට ඇත. මගෙන් කරුණු විමසීම පැයකින් හමාරකින් අවසන් විය. එතැනින් එළියට පැමිණි

විට උපකුලපතිවරයා කාර්යාලයට පැමිණ සිටින බව දැනගත් නිසා, එතුමා මුණගැසීමට ගියෙමි. අදාළ සිද්ධියෙන් අපට පීඩනයක් වූ නමුත් පළිගැනීමට අවශ්‍ය නැති බව එතුමාට කීවෙමි. මානවහිතවාදී පුද්ගලයෙකු වශයෙන් මේ "දඬයම" අත්හැර දමන ලෙස සඳහන් කර නිවසට ගියෙමි. එදින නිවාඩු දිනයක් විය. පරීක්ෂණ කමිටුව මින් පසු ක්‍රියාත්මක වූයේ නැත.

ටික දිනකට පසුව මා පීඨාධිපති කාර්යාලයේ සිටින විට, කාර්යාල සේවකයා මා වෙත පැමිණ සිසුන් කණ්ඩායමක් මා හමුවීමට ඇවිත් සිටින බව කීවේය. පීඨ රැස්වීම් ශාලාවේ ඒ අයට අසුන් ගන්නා ලෙස දන්වා පසුව එහි ගියෙමි. කුමක් සඳහා පැමිණියේ දැ'යි මම ඔවුන්ගෙන් විමසුවෙමි. කිසිවෙකුට සෘජු ව යමක් කීමට නොහැකි බවක් පෙනිණි. "ප්‍රාණ ඇපකරු" සිද්ධිය ගැන කථා කිරීමට දැ'යි විමසූ විට ඒ ගැන බව පිළිගත්හ. වරදක් කළේ වුව ද එය කෙළින් ම පිළිගැනීමට මේ අය සූදානම් නැත. ඒ නිසා සමාව ගැනීමට ද සූදානම් නැත. ඒ විශ්ව විද්‍යාල සිසුන්ගේ ස්වභාවයයි. ඒ නිසා මගේ මතය ඔවුන්ට ප්‍රකාශ කළෙමි. ශිෂ්‍යයින්ගේ හොඳ ම මිතුරන් ගුරුවරුන් බවත්, මේ සිද්ධිය නිසා තම ගුරුවරු පීඩනයට පත් වූ බවත් ශිෂ්‍යයන් සමඟ මට තිබෙන්නේ කෝන්තරයක් නොව කණගාටුවක් බවත් කීවෙමි. අප අතර පැන නැඟී තිබුණ "තාප්පය" ඉවත් වූ බව පෙනිණි. සිසු කැල සිනාමුසු මුහුණින් විසිර ගියහ.

1987 ඉන්දියානු මැදිහත්වීම

ලංකාවේ පැවැති අභ්‍යන්තර ගැටලුවලට ඉන්දියාව සෘජුව ම මැදිහත් වූයේය. 1987 වසරේ දී *ඩෙන්සිල් කොබ්බෑකඩුව* හා *විජය විමලරත්න* වැනි හමුදා නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් ත්‍රස්තවාදය පරාජය කිරීමට දියත් කරන ලද හමුදා මෙහෙයුම වූ *'වඩමරච්චි'* සටන නතර කිරීමට ඉන්දියාව මැදිහත් විය. ඉන්දියාවෙන් උතුරේ ජනතාවට ආහාර සපයන මුවාවෙන් "පරිප්පු දැමීම' ලෙස හැඳින් වූ මැදිහත් වීම පළමුවැන්නයි. බොහෝ දෙනාගේ මතය අනුව ප්‍රභාකරන් ඉන්දියාවට පැන ගියේ මෙම මැදිහත්වීම නිසාය.

ඉන්පසුව ඉන්දියානු අගමැති *රජීව් ගාන්ධි* ලංකාවේ *ජනාධිපති ජයවර්ධන මහතා* සමඟ අත්සන් කළ ඉන්දු-ලංකා ගිවිසුමත් සමඟ ම ඉන්දියානු හමුදාව ද මෙරටට ගොඩබටහ. රටේ නොයෙක් ප්‍රදේශවල පැතිර ගිය විරෝධතා මධ්‍යයේ මෙම ගිවිසුම අත්සන් කළහ. ඉන්පසුව නාවික හමුදා උත්තමාචාරය නිරීක්ෂණය කළ *ගාන්ධි මහතාට* නාවික හමුදා භටයෙක් ප්‍රහාරයක් එල්ල කළේය. එය මුළු රට ම රූපවාහිනිය මගින් දැකගත්හ. විරෝධතා මැඬලීමේ පියවරක් ලෙස විශාල වශයෙන් ඉන්දියානු හමුදාවක් ලංකාවට එවන ලදී. අපගේ නිවෙස්වලට වී සිටි අපට, එක දවසක් තුළ රත්මලාන ගුවන් තොටුපලට ගොඩබට වැඩි ම ගුවන් යානා සංඛ්‍යාවක්

දක්නට ලැබිණි. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ඉන්දියානු හමුදා යොදවා අපගේ හමුදා ඒ ප්‍රදේශවලින් ඉවත් කළහ. නැත්නම් කඳවුරුවලට සීමා කළහ. ත්‍රස්තවාදී කණ්ඩායම් බොහොමයක් තමන්ගේ ක්‍රියාකාරකම් නතර කළ නමුත්, ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් වූ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් යටත් වූයේ නැත.

මේ අතර දකුණේ "දේශප්‍රේමී" ව්‍යාපාරය ද ප්‍රසාරණය විය. එක් පැත්තකින් ඉන්දියානු "වඳුරු හමුදාව" ඉවත් කිරීමට උද්ඝෝෂණ කළ අතර, ජයවර්ධන රජයට විරුද්ධ ව අරගලයක් ද දියත් කරන ලදී. මෙය විශ්ව විද්‍යාලවලට මෙන් ම පාසල් පද්ධතියට ද ක්‍රමයෙන් ව්‍යාප්ත වී, 1988 පමණ වන විට උග්‍ර තත්වයට පත්ව තිබිණි.

රජීව් ගාන්ධි-ජයවර්ධන (ඉන්දු-ලංකා) ගිවිසුමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ද විරෝධතා ව්‍යාපාරයක් දියත් කරන ලදී. ඉන්දියානු බලපෑම යටතේ "එම මාදිලියට" පළාත් සභා පිහිටුවීම රට බෙදීමට ගන්නා පියවරක් ලෙස හඳුන්වන ලදී. රටේ විවිධ ප්‍රදේශවල රැස්වීම් පවත්වා විවිධ කථිකයින් ලවා එයට විරෝධය පෑමට පියවර ගන්නා ලදී. මේ රැස්වීම් කීපයකට මම ද සහභාගී වීමි.

එක් දිනක උදෑසනින් ම *ධර්මසිරි සේනානායක මහතා* තලපත්පිටියේ නිවසට පැමිණ, රත්නපුර හා බලන්ගොඩ ප්‍රදේශවල පැවැත්වෙන රැස්වීම්වලට සහභාගී වන ලෙස ආරාධනා කළේය.

රැස්වීමට යෑමට නියමිත දින උදෙන් ම ඒ මහතා මගේ නිවසට පැමිණියේය. *ජේ.ආර්.ජී. සූරියප්පෙරුම මහතා* ද වාහනයේ සිටියේය. *ආචාර්ය දිනරත්න ගමගේ* මහතාගේ නිවසට ගොස් ඒ මහතා ද කැටුව අපි හතර දෙනා රත්නපුරේ *නන්ද එල්ලාවල මහතාගේ* නිවසට ගියෙමු. (එල්ලාවල මහතා ඒ වන විට අභාවප්‍රාප්ත වී සිටියේය) එහි දී උදේට තේ පානය කර, එතැනට පැමිණ සිටි දෙදෙනෙකු සමඟ වෑන් රථයකින් ගමගේ මහතා සමඟ බලංගොඩ ගියෙමි. එහි ගොස් *ක්ලිෆර්ඩ් රත්වත්තේ මහතා* මුණ ගැසිණි. එහි දී සිල්වා නම් ව්‍යාපාරිකයෙකුගේ නිවසින් ආහාර පාන ගැනීමට සූදානම් කර තිබිණි. හෝටලයක නැවතීමට පහසුකම් ලැබිණි. පසු දින රැස්වීම් දෙකක් තිබුණ තැන්වලට රත්වත්ත මහතාගේ වාහනයෙන් අප දෙදෙනා කැඳවා ගෙන ගියහ.

රැස්වීම් අවසාන වී සවස හයට පමණ බලංගොඩ බස් නැවතුම්පළෙන් කොළඹ බලා එන බස් රථයක නැඟී ආපසු පැමිණියෙමු. නාවින්නේ දේවානන්ද පාර අසල මා බසයෙන් බැස, අසල පිහිටි සෝමසුන්දර මහතාගේ නිවසට ගොස් ඔහුගේ වාහනයෙන් ගෙදර යන විට රාත්‍රී එකොළහට පමණ ඇත. ගමගේ මහතාගේ නිවස අටේ කණුව අසල නිසා ඔහු එතැන දී බසයෙන්

බැස ගන්නට ඇත. තවත් වරක් මෙවැනි රැස්වීමකට වැලිමඩ ගියෙමි. ඒ ගමන ගියේ මගේ කාරයෙනි. අපගේ ගුරු මණ්ඩලයේ *සුනිල් ගුණතුංග මහතා* හා මගේ පොඩි පුතා ද මේ ගමනට එක් වූහ. *ගුණතුංග මහතා බණ්ඩාරවෙල* ඇල්ල ප්‍රදේශයේ *නාවෙලගම* කෙනෙකි. පළමු දින රෑ ඒ මහතාගේ නිවසේ ගතකොට, පසුදා උදෑසන බණ්ඩාරවෙල හරහා වැලිමඩට ගොස්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක *රත්නායක මහතා* මුණ ගැසුණෙමි. ඒ මහතා එදින උමාඇල ප්‍රදේශයේ රැස්වීමක් සංවිධානය කර තිබිණි. එම රැස්වීමට පසුව වැලිමඩ තානායමට පැමිණ දිවා ආහාරයෙන් පසුව ආපසු ගමනට පිටත්වූයෙමු. පැය පහක පමණ ගමනින් පසුව ගෙදර එන විට රෑ නවයට පමණ ඇත. ආපසු ගමනේ දී මා සමඟ සිටියේ පොඩිපුතා පමණි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පමණක් නොව ජනතා විමුක්ති පෙරමුණ ද පළාත් සභා ක්‍රමයට විරුද්ධ වූ නමුත්, පාර්ලිමේන්තුවේ "හයෙන් පහක" බලයක් තිබුණ නිසා, අදාළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමට හැකි විය. එසේ වුව ද, මන්ත්‍රීවරුන් සියලු දෙනා ම කොළඹ හෝටලයක නවත්වා ගෙන සිට පාර්ලිමේන්තුවට එක්කර ගෙන ගිය බවට ආරංචියක් පැතිර ගියේය. *රජීව්-ජේ.ආර්. ගිවිසුමට* සෘජුව ම සහයෝගය දක්වන බවක් පෙන්වූයේ *ගාමිණී දිසානායක මහතා* වැනි කීප දෙනෙකි. *අගමැති ප්‍රේමදාස මහතා* පවා එයට විරුද්ධ වූ බවක් සඳහන් කළත්, පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ඒ මහතා විසිනි. එක්සත් ජාතික පක්ෂයෙන් එයට විරෝධය දක්වා අස්වූයේ *ගාමිණී ජයසූරිය මහතා* පමණයි.

සහාය මහාචාර්ය තනතුර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1 ශ්‍රේණියේ) තනතුරේ වසර දහයක් සම්පූර්ණ කළ විට සහාය මහාචාර්ය තනතුරට උසස් කිරීමට සුදුසුකම් ලැබේ. 1986 ඔක්තෝම්බර් 01වැනි දිනට මා එම ශ්‍රේණියේ වසර දහයක් සම්පූර්ණ කිරීමට නියමිත ව තිබිණි. කවර දිනක සිට සුදුසුකම් ලැබුවත්, ඉල්ලන්නේ ඒ දිනට පසුව නම්, උසස්වීම් ප්‍රදානය කරන්නේ ඒ සඳහා ඉල්ලුම් කරන දින සිටය. ඒ නිසා මම ඊට කලින් 1986 සැප්තැම්බර් 8 දින උසස්වීම ඉල්ලුම් කළෙමි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියමයන් අනුව මෙම උසස් කිරීම පිණිස ලකුණු ක්‍රමයක් ද සපුරාලිය යුතු විය. ඒ අනුව ලබා ගත හැකි ලකුණු 67කි. අවශ්‍ය අවම ලකුණු 40කි. ස්වයං-ඇගයීම අනුව මට ලකුණු 50ක් තිබිණි. පර්යේෂණ ලිපි ලේඛන විශේෂඥයින් දෙදෙනෙකු විසින් අගය කළ යුතු විය.

මේ සඳහා සෑහෙන කාලයක් ගත වේ. විශේෂඥයින්ට මේවා ලැබුණු වහා ම ඒවා ලකුණු කර ආපසු එවන්නේ නැත. කීප වරක් ම මතක් කළ යුතු වේ. මගේ වාර්තා ඇගැයීමට දුන් විශේෂඥයින් දෙදෙනා මා දන්නා හඳුනන අය වුව ද වෙනසක් නොවීය. මේ ගැන ඒ අයට කථා කිරීම ද නුසුදුසුය. ඒ

අයගේ වාර්තා ලැබුණේ 1988 මාර්තු මාසයේ දී පමණය. ඉන්පසුව පරීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වේ. එයට ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් දෙදෙනෙකු නම් කළ යුතු වේ. මා පීඨාධිපති වූ නිසා, තවත් කෙනෙක් කොමිෂන් සභාවෙන් නම් කළ යුතු විය. මේ සඳහා මාස පහක් පමණ ගත විය. 1988 සැප්තැම්බර් 8වැනි දින රැස් වූ තේරීම් මණ්ඩලය, මා උසස් කිරීමට නිර්දේශ කළේය. ඒ තේරීම් මණ්ඩලයේ ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ම සාමාජිකයෙක් ද සිටියේය. තේරීම් මණ්ඩලය රැස් වූ දිනයේ ම පාලක සභාවේ ද රැස්වීමක් පැවැත්විණි. තේරීම් මණ්ඩලයේ නිර්දේශය එදින පාලක සභාව විසින් අනුමත කරන ලදී.

මෙම උසස් කිරීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් සවිස්තරාත්මක ව උපදෙස් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර, එහි සාමාජිකයෙකු ද තේරීම් මණ්ඩලයට සහභාගි වුවත්, විශ්ව විද්‍යාලයේ පාලක සභාවට ස්වාධීන ව තීරණ ගැනීමට අධිකාරී බලයක් ඇතැ'යි කියන නමුත්, මෙම උසස්වීම් සඳහා කොමිෂන් සභාවේ එකඟතාව අවශ්‍යය, යන කාරණය මත සැප්තැම්බර් මස මැද භාගයේ දී උපකුලපතිතුමා විසින් ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලිපියක් යවන ලදී. කොමිෂන් සභාවේ රැස්වීමක් පැවැත්වූයේ නොවැම්බර් මස 26 වැනි දිනය. ඉන්පසුව එහි තීරණය විශ්ව විද්‍යාලයට දන්වා එවීම ප්‍රමාද වූ නිසා, දෙසැම්බර් 13වැනි දින මම කොමිෂන් සභා කාර්යාලයට ගොස් එම ලිපිය ගෙනැවිත් විෂය භාර නියෝජ්‍ය ලේඛකාධිකාරීට භාර දුනිමි.

උසස්වීම් අනුමත කර තිබුණ නමුත් මට ගෙවිය යුතු වැටුප් තලය පිළිබඳ ගැටලුවක් පැන නැඟී තිබිණි. මේ ආදී නොයෙක් කරුණු ගැන සඳහන් කරමින් දෙසැම්බර් 14වැනි දින මවිසින් දීර්ඝ ලිපියක් උපකුලපතිතුමාට යවන ලදී. එම ලිපියේ එක් ඡේදයක් පහත දැක්වේ :

"8 – The net result of all this seems to be that I have to wait indefinitely to benefit by the rewards of promotion which now seems to be my due. One wonders whether this is the reward one gets for carrying on the burden of helping to administer a faculty with the largest student population who find it convenient to hold us hostage because of our regular presence in the campus"

1988 දෙසැම්බර් 15වැනි වන දින උසස්වීම් ලිපිය ලැබිණි. වැටුප් විෂමතාව ඉවත් කර තිබිණි. මේ සඳහා උසස්වීම් ඉල්ලූ දින සිට අවුරුදු දෙකයි මාස තුනයි දින අටක් ගත විය. මේ කාරණය මෙතරම් විස්තර කළේ විශ්ව විද්‍යාල පද්ධතියේ ක්‍රියාකාරිත්වය බිඳක් පෙන්වීමටත් මා ලබා ගත් කිසිම දෙයක් කරදර බාධකවලින් තොර ව නොලැබුණු බවත් ගෙනහැර දැක්වීමටය.



මහනුවර මහාවිහාර පරිවේණාධිපති විද්‍යාවිශාරද පණ්ඩිත අතිපූජ්‍ය හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



නා හිමි පුදට

ගෞරවාර්හ හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස අනුනායක හිමිපාණෝ

මගේ ජීවිතය කෙරෙහි ඉමහත් බලපෑමක් ඇති කළ මෙම හිමිපාණෝ අම්මාගේ මලනු කෙනෙකු ලෙස හාල්යාලේ අබේසිංහ මුදියන්සේලාගේ අප්පුහාමි සහ පිටවල හේරත් මුදියන්සේලාගේ පළිගුමැණිකා යන දෙමව්පියන්ට දාව 1908 මාර්තු 10 වැනි දින ජන්ම ලාභය ලැබූහ. නාරම්පනාවේ ගංගාතිලක විහාරාධිපති *ගෞරවාර්හ වේරගොඩතැන්නේ ශ්‍රී ධර්මදර්ශී සරණපාලාභිධාන නායක හිමියන්* සහ මහනුවර අස්ගිරි මහා විහාරයෙහි ආදාහන මළු ගෙඩිගේ විහාරාධිපති මහියංගන රජමහ විහාරාධිපති ව වැඩ විසූ *උඩුවාවල ශ්‍රී රේවතාභිධාන නායක හිමිපාණන්ගේ* සමානාචර්යත්වයෙන්, 1925 දී *හාල්යාලේ සුමනතිස්ස* නමින් උන්වහන්සේ ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වූහ.

විද්‍යා විශාරද පණ්ඩිත උපාධි ලත් උන්වහන්සේ, වත්තේගම ධර්මද්වීප පිරිවෙන ආරම්භ කොට, පසුව අස්ගිරි මහා විහාර පරිවෙනාධිපති ධූරය ද හෙබ වූ සේක. කෙටි කලක් රෝගාතුර ව සිටි උන් වහන්සේ 1988 පෙබරවාරි 17 දින අපවත් වූ සේක. එම මස 21වැනි දින අස්ගිරිය පොලිස් ක්‍රීඩාංගනයේ දී ආදාහනෝත්සවය පවත්වන ලදී. උන්වහන්සේගේ බෑනාවරුන් ලෙස *ගුණතිලක මල්ලීන්* මාත් චිතකයට ගිනි ඇවිළුවෙමු. ප්‍රේමා, ලොකුදුව, වසන්ත බෑනා, පොඩිපුතා, පොඩි දුව ඇතුළු අප පවුලේ කීප දෙනෙකු ද මෙම ආදාහනෝත්සවයට සහභාගී වූහ.

දෙවන සප්ත වාර්ෂික නිවාඩුව

ප්‍රවේශය

පළමුවන සප්ත වාර්ෂික නිවාඩුව අවසන් වී මා නැවත සේවයට පැමිණියේ 1979 ජනවාරි 6වෙනි දා ය. ඒ අනුව, 1985 අවසන් වන විට, එක් වසරක සප්ත වාර්ෂික නිවාඩුවක් ලබා ගැනීමට හිමිකමක් තිබිණි. එනමුත්, ඒ සඳහා විදේශීය විශ්ව විද්‍යාලයක් වැනි ආයතනයකින් ආරාධනාවක් ලබා ගත යුතු වේ. දැන්නම් රට තුළ වුව ද මෙම නිවාඩුව ගත කළ හැකිය. එනමුත්, එය එතරම් පලදායක නොවේ. මේ නිසා නොයෙක් විකල්ප අවස්ථා ගැන අවධානය යොමු කරමින් සිට, පීඨාධිපති තනතුරේ වසර දෙක හමාරක් කටයුතු කිරීමෙන් පසුව, විදේශ ආයතන කීපයකට ලිපි යැවීමි. මගේ සුදුසුකම් පළපුරුද්ද ආදිය එහි දැක්වීමි. එයින් එක් ලිපියක් *බෘනායි විශ්ව විද්‍යාලයේ* සමාජ ප්‍රතිපත්ති හා පරිපාලන අධ්‍යයනාංශයේ *ප්‍රධාන ආචාර්ය ජී.ජේ. නට්මන් මහතාට* යැවීමි.

එම ලිපියට පිළිතුරක් ලැබුණේ *ආචාර්ය පීටර් ඊටන්* මහතාගෙනි. ඒ වන විට *නට්මන්* මහතා කළමනාකරණ හා පරිපාලන අධ්‍යයන පීඨයේ

පීඨාධිපති ව සිට මගේ ලිපිය *ඊටන්* මහතාට භාර දී තිබේ. රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති හෝ සංවර්ධන පරිපාලනය යන විෂයයන්, 1989 අගෝස්තු සිට 1990 මැයි දක්වා වූ අධ්‍යයන වර්ෂයේ දී ඉගැන්වීමට ඉඩ ප්‍රස්ථාව තිබෙන බව සඳහන් කොට දුරකථනයෙන් සාකච්ඡා කිරීමට යෝජනා කර තිබිණි. ඒ 1989 පෙබරවාරි 4වෙනි දා එවන ලද ලිපියක් මඟිනි. මා ගැන විමසිය හැකි දෙදෙනෙකුගේ නම් එවන ලෙස ද ඉල්ලා තිබිණි. උපකුලපති *මහාචාර්ය එල්.ජී.එන්. පෙරේරා මහතාගේ* හා ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ *මහාචාර්ය සිරිසේන තිලකරත්න මහතාගේ* නම් පෙබරවාරි 21වැනි දින ලිපියක් මඟින් දන්වා යැවීමි. පෙබරවාරි 23වැනි දින *සලාකා සංනිවේදන* මධ්‍යස්ථානයට ගොස් පස්වරු 3.50 සිට දුරකථනයෙන් සාකච්ඡා කළෙමු.

මින් පසුව, මට උචිත පත්වීමක් ප්‍රදානය කිරීමට *බෘනායි විශ්ව විද්‍යාල* බලධාරීන් එකඟ වූ බව මැයි මස 3වන දින ලිපියක් මඟින් *පීටර් ඊටන් මහතා* විසින් දන්වා එවා තිබිණි. මෙම විශ්ව විද්‍යාලය අලුතින් ආරම්භ කළ නිසා, බොහෝ දේ තවමත් විකාශනය වෙමින් තිබිණි.

1989 මැයි මස 11වැනි දින *බෘනායි විශ්ව විද්‍යාලයේ* මූල්‍යාධිකාරී *ජෙනින් එරී* (Janin Erih) මහතා මට ලිපියක් එවා තිබිණි. වර්ෂාර්ධ දෙකක් (Semester) සඳහා බාහිර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරකට මා පත් කිරීමට උපකුලපතිවරයා එකඟ වූ බව සහ පහත සඳහන් පහසුකම් මට ලබා දෙන බවත් එම ලිපියේ සඳහන් විය.

(අ). වැටුප මාසයකට ඩොලර් 4,600 බැගිනි. (පසුව එවන ලද ලිපියකින් මෙය සංශෝධනය කර තිබිණි. ඒ ලිපිය අනුව අප විශ්ව විද්‍යාලය විසින් මට ගෙවන වැටුප් පදනම් කර ගෙන දීමනාවක් ගෙවන බව සඳහන් විය)

(ආ). ගුවන් ගමන් යාන පත්‍ර ලබාදීම (Economy class)

(ඉ). බෘනායි රටේ ගත කරන දිනකට ඩොලර් 80 බැගින් දීමනාවක්

(ඊ). බඩුබාහිරාදිය සහිත ව විශ්ව විද්‍යාලයේ නිවාසයක් නොමිලේ සැපයීම

(උ). තමන් ම පදවන වාහනයක් (මෙහි බස් ගමනාගමනයක් නොවීය)

මෙතරම් ත්‍යාගශීලී ව මට පත්වීමක් ප්‍රදානය කරන රට ගැන කරුණු බිඳක් මෙහි සඳහන් කළ යුතු යැ'යි සිතමි. මෙය වඩාත් වැදගත් වන්නේ, එය නමින් සඳහන් කළත් අපේ රට බොහෝ දෙනා ඒ ගැන එතරම් නොදන්නා නිසාය.

බෘනායි දරුසලම් **BRUNEI DARUSSALAM**

අතීතයේ නැගෙනහිර ඉන්දියානු දූපත් වශයෙන් හැඳින්වුණු ප්‍රදේශයේ විශාලතම දූපත වූයේ බෝර්නියෝවයි. (BORNEO). එම දූපත පසු කාලයේ දී කොටස් 4කට බෙදී තිබේ. දකුණට වූ විශාල ම කොටස කලිමන්තාන් (KALIMANTAN) නමින් දැනට ඉන්දුනීසියාවට අයත් වේ. උතුරු දිග තීරුව කොටස් තුනකට බෙදී තිබේ. *සරවක් හා සබා* නම් වූ ප්‍රදේශ දෙක *මැලේසියාවට* අයත්ය. *බෘනායි* නම් වූ කොටස සරවක්හි ඊශාන දිගින් පිහිටා තිබේ. (314 පිටුවේ සිතියම බලන්න). එම රට දිස්ත්‍රික්ක හතරකින් සමන්විත වේ. *තෙම්බුරොන්ග්* (TEMBURONG), *බෘනායි මුවාරා* (BRUNEI MUARA), *ටුටොන්ග්* (TUTONG) සහ *බෙලයිට්* (BELAIT) යනුවෙනි. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 5,765 කි. අගනුවර *බංඩාර් ශ්‍රී භගවාන්* නම් වේ. එය බෘනායි මුවාරා දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ. (1982 මැද) ජනගහනය 198,930 ක් වූ බවත් ඔවුන් බොහෝ සෙයින් ම දේශීය මැලේ ජාතිකයන් වූ බවත් සඳහන් වේ. චීනුන් හා ඉන්දියානුවන් ටික දෙනෙක් ද වූහ. නිල ආගම ඉස්ලාම්ය. වෙනත් ආගම් අදහන ජන කොටස් ද වෙති. මේ ජනතාව කතා කරන්නේ මැලේ භාෂාව වුවත් ඉංග්‍රීසි භාෂාව ද බෙහෙවින් ම භාවිතා කෙරේ. එරට පිරිමි එදිනෙදා ඇඳුම වශයෙන් කලිසම් කමිස අඳිති. උත්සව හා නිල අවස්ථාවල දී මැලේ ජාතිකයන්ට විශේෂ වූ ඇඳුමක් අඳිති. කුමන අවස්ථාවන්හි දී වුවත් කාන්තාවන්ගේ ඇඳුම වෙනසක් නොවේ. බොහෝ දෙනා මුස්ලිම් කාන්තාවන් පළඳින හිස්වැසුම් භාවිතා කරති. මේ සමඟ ඇති බෘනායි හා මැලේසියානු රජ පවුල්වල සාමාජිකයින් පෙනී සිටින චිත්‍රයෙන් මෙය පැහැදිලි වේ. (315 පිටුව)

බෘනායි රටේ ව්‍යාපාරික නටයුතුවල නිරත වී සිටින්නේ චීන හා ඉන්දියානු ජාතිකයන්ය. චීන ව්‍යාපාරික නායකයන් හා රටේ රජතුමා අතර මනා සුහද සම්බන්දතාවක් තිබෙන බව කියනු ලැබේ. *බණ්ඩාර් ශ්‍රී භගවාන්* නගරයේ චීන බෞද්ධ පන්සලක් තිබේ. එහි ප්‍රසිද්ධියේ කිසිම අවහිරයක් බාධාවක් නොමැති ව චීන බෞද්ධයෝ වතාවත් පවත්වති. (වෙනත් තැනක් නොතිබූ නිසා මාත් එහි සිටි අවධියේ මල් පහන් පූජා කළේ එහිය). රටේ නොයෙක් තැන්වල ක්‍රිස්තියානි පල්ලි දක්නට ලැබේ. මේ රට බොහෝ කාලයක් බ්‍රිතාන්‍ය කිරීටයේ රැකවරණය යටතේ පැවතිණි. පූර්ණ නිදහස ලැබුණේ 1983 වසරේ දී ය.

1973 දක්වා ම බෘනායි බෙහෙවින් ම දුප්පත් රටක් ව පැවතිණි. එහි ආදායම් මාර්ගය වී ඇත්තේ රබර් වගාවයි. එනමුත්, ඛනිජ තෙල් ලැබීමත් ඒවායේ මිල ඉහළ යෑමත් නිසා, *සුල්තාන්වරයා* ලෝකයේ ධනවත් ම පුද්ගලයෙකු විය. ආණ්ඩුවේ අයවැය ලේඛනයට මුදල් ලැබෙන්නේ සුල්තාන්වරයාගේ



බෘනායි සිතියම

භාණ්ඩාගාරයෙන් බව කියනු ලැබේ. රජයේ ආයතන මෙහෙයවීමට ඇමති මණ්ඩලයක් සිටින නමුත් ව්‍යවස්ථාදායක සභාවක් හෝ පාර්ලිමේන්තුවක් නැත. රාජ්‍ය බලය මුළුමනින් ම සුල්තාන්වරයා වෙත කේන්ද්‍රගත වී ඇත. රටවැසියන් ද පාලන තන්ත්‍රයේ නිරත අය ද සුල්තාන්වරයාටත් රජ පවුලේ අයටත් මහත් ගෞරව සම්ප්‍රයුක්ත ව කතා කරන, හැසිරෙන බව පෙනේ. සුල්තාන්වරයා *හජි හසනල් බෝල්කියා* නම් වේ. එතුමාගේ නිල නාමය His Majesty Paduka Seri Baginda Sultan **Haji Hasanal Bolkiah** Muizzaddin Waddaulah Sultan Dan Yang Di.Pertun, Negara Brunei Darussalam යන්නයි. එරට රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රකාශවල දී මේ නිලනාමය මුළුමනින් ම ප්‍රකාශ කරනු ලැබේ. රජ බිසව හඳුන්වනුයේ Her Majesty Paduka Seri Baginda **Raja Isteri Pengiran Anak Saleha** යනුවෙනි. දෙවෙනි බිසව හඳුන්වන්නේ Her Royal Highness **Pengiran Isterri Hajjah Mariam** නමින්ය. කිරුළ හිමි කුමරා හඳුන්වන්නේ මෙසේය: His Royal Highness Paduka Seri Duli Pengiran Muda Al-Muthadee Billah බෘනායි රාජ්‍යයේ විදේශ ඇමතිවරයා හා මුදල් ඇමතිවරයා සුල්තාන්වරයාගේ සහෝදරයන් දෙදෙනෙකි. ඒ දෙදෙනා හඳුන්වන්නේ මෙසේය: විදේශ ඇමතිවරයා His Royal Highness Paduka

Seri Pengiran Perdana Wazir Sahibul Himmah Wal Waqar Pengiran **Muda Haji Mohamed Bolkiah** මුදල් ඇමතිවරයා (His Royal Highness Paduka Seri Pengiran Digadong Shaibul Mal Pengriran Muda **Haji Jefri Bolkiah** සුල්තාන්වරයාගේ සහෝදරිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවක් ද වූවාය. එම සහෝදරිය හැඳින්වූයේ මෙසේය: (Yang Ternamat Mulia Paduka Seri Pengiran Anak Puteri **Hajjah Masna**) මෙම තොරතුරු යම් පමණකට විස්තර වශයෙන් සඳහන් කළේ බෘනායි රටේ සංස්කෘතිය පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමට උපකාර වන ලෙසය.



Members of two Royal households in Brunei and Malaysia pose for a group photograph at Istana Nural Iman

බෘනායි විශ්ව විද්‍යාලය – Universiti Brunei Darussalam (U.B.D.)

මෙම විශ්ව විද්‍යාලය ආරම්භ කරන ලද්දේ 1985 වර්ෂයේ දී ය. එහි කුලපති වූයේ බෘනායි සුල්තාන්වරයාය. අධ්‍යාපන ඇමතිවරයා උපකුලපතිවරයා විය. විශ්ව විද්‍යාලයේ දෛනික වැඩ කටයුතු මෙහෙයවීමට උපකුලපතිවරයාගේ උපදේශක හා නියෝජ්‍ය උපකුලපති කෙනෙක් සිටියහ. ලේඛකාධිකාරී හා මූල්‍යාධිකාරී යන තනතුරු දෙකක් විය. වඩා ක්‍රියාකාරී ව කටයුතු කළේ මූල්‍යාධිකාරීවරයාය. පීඨ තුනක් තිබිණි. ශාස්ත්‍ර, විද්‍යා හා කළමනාකරණ යනුවෙනි. කළමනාකරණ හා පරිපාලන අධ්‍යයන (Managment and Administrative Studies) පීඨය යටතේ අධ්‍යනාංශ දෙකක් විය. කළමනාකරණ අධ්‍යයනාංශය හා රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයයි. මා *බෘනායි* ගිය අවදියේ දී පීඨාධිපති තනතුර දැරුයේ *ආචාර්ය ක්‍රීස් නට්මන්* (Dr. Chris Nuttman) මහතාය.

කළමනාකරණ අධ්‍යයනාංශයේ ප්‍රධානියා වූයේ *ජිම් විල්සන්* (Jim Wilson) මහතාය. *ආචාර්ය පීටර් ඊටන්* (Dr. Peter Eaton) මහතා රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයේ ප්‍රධානියා විය.

බෘහනායි ගමනට සූදානම හා පිටත් වීම

මගේ සප්ත වාර්ෂික නිවාඩුව ගත කිරීමට තැනක් ලැබුණ නිසා, 1989 මැයි 11වැනි දින එක් වසරක නිවාඩු ඉල්ලා සිටියෙමි. උපකුලපතිතුමා විසින් එය ජූලි 19වැනි දින අනුමත කර තිබිණි. 1989 ජූලි 23 සිට ඔක්තෝම්බර් 1 දින දක්වා විවේක නිවාඩු සහ ඔක්තෝම්බර් 2 දින සිට 1990 ඔක්තෝම්බර් 1 දක්වා සප්ත වාර්ෂික නිවාඩු වශයෙනි. 1989 ජූනි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි පීඨාධිපති තනතුරෙන් ඉල්ලා අස්වුණෙමි. එම පුරප්පාඩුවට පීඨය විසින් *ජගත් බණ්ඩාරනායක මහතා* පත්කර ගැනිණි.

අප විශ්ව විද්‍යාලයේ කලක් සේවය කොට අස්වී ගිය *ඩබ්.ඒ. විමලතිස්ස මහතා* 1989 ජූනි 5 දින බෘහනායි සිට ලිපියක් එවා තිබිණි. මගේ පැමිණීම ගැන ආරංචිය ලැබුණ බවත් අවශ්‍ය විස්තරයක් තිබේ නම් විමසන ලෙසත් ඒ මහතා සඳහන් කර තිබිණි. ජූනි මස 12වන දින විමලතිස්ස මහතාට පිළිතුරක් යැවීමි. වීසා ලබා ගැනීම ගැන බෘහනායි විශ්ව විද්‍යාල බලධාරීන්ගෙන් විමසා යැවීමි. ඒ සඳහා ඉල්ලා සිටි ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල ඡායා පිටපත් හා මගේ ඡායාරූප දෙකක් ජූලි 17 දින *ඩී එච් එල්* (DHL) පණිවිඩ සේවාව මඟින් යවන ලදී. මේ කාල පරිච්ඡේදයේ දී රට තුළ කලබලකාරී තත්ත්වයක් පැවති නිසා තොරතුරු හුවමාරුව සතුටුදායක ව සිදු වූයේ නැත. "දේශප්‍රේමීන්" පාසල්වලත්, විශ්ව විද්‍යාලවලත් පොදුවේ රට තුළත් නොයෙක් අවුල් වියවුල් ඇති කළේ මේ වකවානුවේ දී ය.

1989 අගෝස්තු මස 6වැනි දින රාත්‍රියේ උපකුලපති නිල රථයෙන් කටුනායක ගුවන් තොටුපලට ගියෙමි. එහි යන අතරතුර රජය විසින් ඇඳිරි නීතිය පනවා තිබුණ බව දැනගතිමි. මා සමඟ ගුවන් තොටුපලට ගිය රියැදුරා සහ ආරක්ෂක නිලධාරියා ගුවන් තොටුපල පොලීසියෙන් බලපත්‍රයක් ලබා ගෙන ආපසු යෑමට පිටත්වූහ. මා එදින මැදියම් රෑ (පාන්දර) එකට පමණ සිංගප්පූරුවට යන සිංගප්පූරු ගුවන් සමාගමේ යානයකින් විදේශ ගතවීමි. පසුදා, එනම් 7වෙනි දා, සිංගප්පූරුවේ වේලාවෙන් පාන්දර පහට පමණ එම ගුවන් තොටුපලට ළඟාවුණෙමි.

සිංගප්පූරුවේ සිට බෘහනායි දරුසලාම් බණ්ඩාර ශ්‍රී භගවාන් ගුවන් තොටුපලට යෑමට සිංගප්පූරු ගුවන් සේවයේ යානයක් පෙරවරු නවයට පිටත් ව ගිය නමුත්, මා ඒ ගැන නොදැන යාන පත්‍රයේ තිබුණ පරිදි පෙරවරු 11.00 වන තුරු ගුවන් තොටුපලේ රෑඳී සිට, රාජකීය බෘහනායි ගුවන් සේවයේ යානාවකින් සිංගප්පූරුවෙන් පිටත් වී ගියෙමි. ඒ ගුවන් ගමනට පැය දෙකක් පමණ ගත වේ. *බණ්ඩාර ශ්‍රී භගවාන්* ගුවන් තොටුපලෙන් එළියට එන විට *විමලතිස්ස මහතා* මා මුණගැසී, එහි පැමිණ සිටි පීඨාධිපති *ක්‍රීස් නට්මන් මහතා* හඳුන්වා දුන්නේය. *නට්මන් මහතා* මා නගර මධ්‍යයේ පිහිටි

ඇන්ග්ස් හෝටලයට (ANG'S HOTEL) එක් කරගෙන ගොස් එහි ලැගුම් ගැනීමට සැලැස්වීය.

බෘහනායි විශ්ව විද්‍යාල සේවයට පිවිසීම

ෂෙරටන් උතමා හෝටල් පරිශ්‍රයේ තිබුණ *ආවිස්* (AVIS) කුළී රථ සමාගමේ කාර්යාලයෙන් මගේ පාවිච්චියට අවශ්‍ය වාහනය ලබා ගත හැකි බවට පණිවිඩයක් ලැබුණ නිසා, මා සිටි හෝටලයට නුදුරින් වූ එම ස්ථානයට ගොස් ටොයෝටා කොරොල්ලා (Toyota Corolla) රථයක් තෝරා ගතිමි. ඊට වඩා ලොකු සැප පහසුකම් වැඩි රථයක් තිබුණ නමුත්, එයට ධාවන වියදම් ආදිය වැඩිවිය හැකි නිසා, ටොයෝටා රථය වඩා හොඳ බව තීරණය කළෙමි. පසුදින උදැසන විශ්ව විද්‍යාලයේ නිලධරයෙකු පැමිණ තිබිණි. මගේ කාර් එකෙන් ඒ අය පිටුපස විශ්ව විද්‍යාලයට ගියෙමි. ඒ ගමන සැතපුම් තුනක් පමණ වන්නට ඇත.

විශ්ව විද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයට ගොස් එහි ප්‍රධාන *ආචාර්ය පීටර් ඊටන්* මහතා මුණගැසුණෙමි. ඒ මහතා සමඟ දුරකථනයෙන් කථාකර තිබුණ නමුත් එදින පෞද්ගලික ව මුණගැසුණ පසු අවශ්‍ය තොරතුරු සාකච්ඡා කළේය. එදින මා ඇඳගෙන ගියේ අප විශ්ව විද්‍යාලයේ දී පුරුදු ව සිටි ටියුනික් කොලරය සහිත සුදු කමිසයකි. ඒ ගැන ද විමසූ විට *ඊටන් මහතා* කීවේ, එම විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කමිසයක් ඇඳ ටයි පටියක් ද බඳින බවයි. ඒ නිසා විශ්ව විද්‍යාලයට එන විට එවැනි ඇඳුමකින් සැරසී එන ලෙස සඳහන් කළේය. ඉන්පසුව විශ්ව විද්‍යාලයේ බලධාරීන් කීප දෙනෙක් මුණ ගැසීමට පරිපාලන ගොඩනැඟිල්ලට මා එක්කර ගෙන ගියේය. එහි දී නියෝජ්‍ය උපකුලපතිතුමා, හා මූල්‍යාධිකාරීවරයා හඳුන්වා දුන්නේය. එහි ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති *මහාචාර්ය සිරිනන්ද මහතා* ද මුණ ගැසිණි. පසුව විද්‍යා පීඨයේ කථිකාචාර්යවරයෙකු වූ *රොඩ්නි ප්‍රනාන්දු මහතා* සහ කළමනාකරණ අධ්‍යයනාංශයේ *විමලනිස්ස මහතා* ද හමුවීමි. පුස්තකාලය හා පොත් සාප්පුව තිබෙන තැන් ද ඊටන් මහතා විසින් මට පෙන්වා දෙන ලදී.

කළමනාකරණ පීඨය පිහිටි ගොඩනැඟිල්ලේ පසකින් තිබූ කාමර කට්ටලයක් මගේ කාර්යාලය සඳහා තිබිණි. එහි පිටුපසින් නාන කාමරයක් හා වැසිකිලියක් ද කුඩා මුළුතැන්ගෙයක් ද (Pantry) තිබිණි. කාර්යාල කාමරයේ මගේ භාවිතයට තිබුණු මේසය හා පුටුවට අමතර ව, ශිෂ්‍ය පුටු හත අටක් ද මැගි බෝර්ඩ් එකක් ද තිබිණි. බෘහනායි රට අධික රස්නය නිසා කාමරය වායු සමීකරණය කර තිබිණි. පළමුවන දවසේ වැඩ අවසන් වූවාට පසුව මා හෝටලය වෙත එක්කර ගෙන යෑමට ද විශ්ව විද්‍යාලයේ වාහනයක් පැමිණියේය. ඒ වාහනය පිටුපසින් මගේ වාහනයේ ගමන් කරන

විට, අතරමඟ දී මා පොලීසියෙන් නවත්වන ලදී. ඉදිරියෙන් ගිය වාහනය ද නවත්වා එහි සිටි නිලධාරියෙක් අප සිටි තැනට පැමිණ මැලේ භාෂාවෙන් කාරණය විමසූ විට කියා ඇත්තේ, මා ආසන පටිය පැළඳ නොසිටි නිසා නැවැත්වූ බවයි. මා මෙහි පැමිණි පළමු දිනය බව පොලිස් නිලධාරියාට පැවසූ විට ආසන පටිය පළඳින ලෙස මට උපදෙස් ලැබිණි. එම පටිය පැළඳ නොගෙන වාහනයේ ධාවන කිරීමට දඩය බෘනායි ඩෝලර් දාහක් බව ද දැනගතිමි. මින් පසු ලංකාවේදීත් ආසන පටිය පැළඳීම මට පුරුද්දක් ව තිබේ. වයස අවුරුදු පනස් පහේ දී ඉගෙන ගැනීමට ලැබුණේ කොපමණ හොඳ පාඩමක් ද?

1989 අගෝස්තු 06වෙනි දා සිට ඔක්තෝම්බර් 2වැනි දින දක්වා ඇන්ග්ස් (ANG'S) හෝටලයේ ලැඟුම් ගෙන සිටියෙමි. ඇඳුම් පැළඳුම් සේදීම ආදිය නොමිලේ සිදුකෙරිණි. වියදම් කළයුතු වූයේ ආහාරයට හා වාහනයට පැට්‍රල් සඳහා පමණි. ටික දිනකට පසුව හෝටලයේ ලැඟුම් ගෙන සිටි ලංකාවේ කෙනෙක් භෝජනාගාරයේ දී හමුවිය. ඔහු නමින් *තිස්ස වික්‍රමසිංහය.* කතාබහ කරන විට දැනගන්නට ලැබුණේ, තිස්ස වික්‍රමසිංහ මහතා ක්‍රිකට් ක්‍රීඩක රන්ජන් මඩුගල්ල මහතාගේ වැඩිමහල් සොයුරිය "නිම්මි" විවාහ කර ගෙන සිටි තරුණයෙකු බවයි. ඔහු මුවාරා වරායේ කළමනාකාර තනතුරක් භාර ගැනීමට බෘනායි රටට පැමිණ තිබේ. එම වරාය බෘනායි හි ප්‍රධාන නැව් තොටුපලය. ටික දිනකට පසුව තිස්ස අලුත් ම ටොයෝටා කොරොල්ලා රථයක් මිල දී ගත්තේය. (ඒ සඳහා ණය මුදලක් ලැබී තිබිණි). *මුවාරා* නගරයේ නිවසක් කුලියට ගෙන එහි පදිංචියට ගියේය. ඒ වන විට තිස්සගේ බිරිය "නිම්මි" එහි පැමිණ සිටියාය.

ඉගැන්වූ විෂයයන්

සතියේ දිනවල දිනපතා විශ්ව විද්‍යාලයට ගොස් ඉගැන්වීමේ හා පාඩම්වලට සූදානම් වීමේ කටයුතුවල නිරත වීමි. සිකුරාදා දින එහි නිවාඩු දිනයක් නිසා ඒ වෙනුවට සෙනසුරාදා දිනවල සේවයේ නිතර විය යුතු විය. නැවත ඉරිදා දිනය ද විවේක දිනයකි. පළමුවන වර්ෂාර්ධයේ (Semester) ඉගැන්වීමට මට පැවරුණේ සංවර්ධන පරිපාලන විෂයයි. මේ සඳහා පාඨ ග්‍රන්ථ දෙකක් විය. *ඩෙනිස් රොන්ඩිනෙලි* (Dennis Rendinelli) සංවර්ධන පරිපාලනය නම් වූ පොත සහ *රොබර්ට් චේම්බර්ස්ගේ* (Robert Chambers) ග්‍රාමීය සංවර්ධනය නම් වූ පොත්ය. මේ පොත් මීට කලින් පරිහරණය කර නොතිබුණ නිසා, ඒ දෙක පොත් සාප්පුවෙන් මිළයට ගෙන කියවා සාරාංශ කර ගැනීමට සිදුවිය. එම සාරාංශ ඡායා පිටපත් කර සිසුන් අතර බෙදා දී, දේශන පැවැත්වීමේ දී උපයෝගී කර ගතිමි. දෙවන වර්ෂාර්ධය වන විට මානව සම්පත් කළමනාකරණ විෂයයේ කොටසක් ඉගැන්වීමට

පැවරිණි. අනිත් කොටස ඉගැන්වූයේ *ඒබ්‍රහම් ඩී කෲස්* (Abraham De Cruz) නම් කථිකාචාර්යවරයාය. මේ යටතේ පරිහරණයට කළමනාකරණ මූලධර්ම පොතක් විය. එය ද සාරාංශ කර ගතිමි. රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය යන විෂය ද ඉගැන්වීමට භාරගතිමි. ඒ සඳහා මා විසින් ලංකාවේ දී ලියා තිබූ ග්‍රන්ථයක කොටුම්පතක් උපයෝගී කර ගතිමි. සංවර්ධන පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණ විෂයයන් ඉගැන්වූ පන්තිවල සිටි ගැහැණු පිරිමි සිසුන් අතර බෲනායි සුල්තාන් වරයාගේ සොහොයුරිය හා දියණියක් ද සිටීම විශේෂ දෙයක් විය. එය වඩාත් විශේෂ වූයේ ඒ දෙදෙනා කිසි විටක අනෙක් සිසුන්ගෙන් වෙන්ව කැපී පෙනීමට කටයුතු නොකිරීම නිසාය.

1990/91 අධ්‍යයන වර්ෂයේ පළමුවන වර්ෂාර්ධයේ දී ද රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණය යන විෂයයන් දෙක ඉගැන්වූයෙමි. දෙවන වාරයේ සංවර්ධන පරිපාලනය ඉගැන්වීම *ආචාර්ය බී.එස්. විජේවීර මහතාට* පැවරිණි. එතුමා කලක් ලංකා සිවිල් සේවා නිළධාරීයෙක් ව සිටි අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා ද විය. පසුව *පැප්‍රුවා නිව්ගිනි* විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කර බෲනායි විශ්ව විද්‍යාලයට පැමිණියේය. මා බෲනායි රටින් පිටව එනතුරුත් විජේවීර මහතා එහි සේවය කළේය.



රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලන අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරු කීප දෙනෙකු සමග (1990)

පවුලේ සමාජිකයන් බෘහනායි පැමිණීම

මා බෘහනායි ගිය දවස්වල ලංකාවේ අතිශය කලබලකාරී තත්ත්වයක් පැවතිණි. එහි ගිය පසු ඒ රට කොපමණ සාමකාමී දැ'යි හොඳින් දැනිණි. මුල් සතියේ දෙකේ රෑ නින්දේ දී පවා ලංකාවේ පැවති තත්ත්වය ගැන කලබල වී අවදිවූ අවස්ථා තිබිණි. අපේ රටේ පැවති කලබලකාරී තත්ත්වය නිසා ප්‍රේමා හැකි ඉක්මනින් බෘහනායි පැමිණීමට යුහුසුලු වූවාය. ඒ සඳහා වීසා ලබා ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍ර ලංකාවට එවා ආපසු ගෙන්වා ගෙන විශ්ව විද්‍යාලයට භාර දුනිමි.

ප්‍රේමා හා *දරු දෙදෙනා* බෘහනායි එන නිසා නිල නිවාසයක් ඉල්ලුවෙමි. ටික දිනකින් *අංගරෙක්* දෙස නිවාස සංකීර්ණයක පළමුවන මහලේ නිවසක් මට ලැබිණි. නිවසට අවශ්‍ය ලී බඩු ආදිය මෙන් ම මුළුතැන්ගෙට අවශ්‍ය උපකරණ ද ඇඳ ඇතිරිලි පොරෝණ ආදිය ද විශ්ව විද්‍යාලය විසින් සපයන ලදී. රූපවාහිනී යන්ත්‍රයක් හා වීඩියෝ යන්ත්‍රයක් ද සපයා තිබිණි.

ප්‍රේමා හා දරු දෙදෙනා ඔක්තෝම්බර් 1වෙනි දා සිංගප්පූරු ගුවන් සේවයේ යානයකින් *බණ්ඩාර් ශ්‍රී භගවාන්* ගුවන් තොටුපලට පැමිණෙන බව දන්වා තිබුණ නිසා, මා එහි ගොස් ඒ අය පිට වී එනතුරු බොහෝ වේලාවක් බලා සිටි නමුත් කිසිවෙක් නොපැමිණි නිසා, එහි තුළ සිටි නිලධාරියෙකුගෙන් විමසූ විට කීවේ, ඒ නම් ඇති තිදෙනෙක් ආගමන විගමන කාර්යාලයේ සිටින බවයි. ඒ අයට අනුමත වූ වීසා ගමන් බලපත්‍රවල සළකුණු කර නොතිබුණ නිසා රඳවා ගෙන ඇත. මා එහි ගියේ මට ලැබී තිබුණ අවසරයත් සමඟය. ඒ නිසා, ඒ අය සමඟ පිට වී යෑමට හැකි විය. සිරිතක් වශයෙන් ගමන් බලපත්‍ර (Passport) රඳවා ගනිති. විශ්ව විද්‍යාලයේ නියෝජිතයෙක් ආගමන පාලන දෙපාර්තමේන්තුවට ගොස් අදාළ වීසා අනුමත කර ගෙන ගමන් බලපත්‍ර ගෙනැවිත් දෙති. ඒවා එසේ ආපසු ලැබී තිබෙන්නේ ඔක්තෝම්බර් මස 9වැනි දිනට පසුවයි. 1990 අගෝස්තු 10වෙනි දා තෙක් (Dependent Pass) යැපෙන්නන්ගේ අවසර පත්‍ර සටහන් කර තිබේ.

පොඩිපුතා, පොඩිදුව හා ප්‍රේමා සමඟ මට දී තිබුණ කාර් එකෙන් *ඇන්ග්ස්* හෝටලයට ගියෙමි. එම හෝටලයේ යාබද කාමර දෙකක් ලබා ගතිමු. එහි වැඩිකල් නැවතී සිටියේ නැත. ඔක්තෝම්බර් 3වැනි දින *අංගරෙක්* දෙස නිල නිවාසයේ පදිංචියට ගියෙමු. ඒ නිසා, අපට අවශ්‍ය පරිදි ආහාරපාන සකසා ගැනීමාදිය කළ හැකි විය.

ලංකාවේ දී පවුලේ අය මුහුණ දුන් ප්‍රශ්න

ප්‍රේමා හා දරු දෙදෙනා බෘතායි පැමිණි පසු, මා ලංකාවෙන් පිට වී පැමිණි වේලේ සිට ඒ අය මුහුණ දුන් සිද්ධි කීපයක් ගැන විස්තර දැනගතිමි. මා ගෙදරින් පිට වී සතියකට පමණ පසු, එක් දිනක රාත්‍රී කාලයේ දී, ආයුධ සන්නද්ධ පිරිසක් නිවසට කඩා වැදී ඇත. ඒ වේලාවේ ගෙදර සිටියේ ප්‍රේමාත්, පොඩිපුතාත්, පොඩි දුවත් යන තිදෙනා පමණි. ලොකු පුතා වැඩට ගොස් ආපසු පැමිණ සිටියේ නැත. නිවසට කඩා වැදුණ අය මා ගැන විමසා තිබේ. ගෙදර අස්සක් මුල්ලක් නෑර පොත් පත් ලිපි ලේඛන පරීක්ෂා කර ඇත. අල්මාරි කබඩ් ආදිය විවෘත කර මා ගැන පරීක්ෂා කර ඇත. අවි ආයුධ තිබේ දැ'යි විමසා තිබේ. මේ තොරතුරු බොහොමයක් විමසා තිබෙන්නේ පොඩි පුතාගෙනි. පැයකට හමාරකට පසුව සොයා ගැනීමට කිසිවක් නොවූයෙන්, ඒ අය ජේ.වී.ජී.එකෙන් කියා යන්ට ගොස් ඇත. තවත් අය ජේ.වී.පී. කියා පැමිණීමට ඉඩ ඇති බවත් ප්‍රවේශම් වී ඉන්න ලෙසත් කියා තිබේ.

ලොකු පුතා ගෙදර පැමිණ තිබෙන්නේ මේ සියලු දේ අවසන් වූවාට පසුවයි. බෙහෙවින් ම බියට පත් ප්‍රේමා හා දරු දෙදෙනා, පසුදින උදෑසනින් ම ලොකු දුව එවකට පදිංචි ව සිටි නාවල සේනානායක මාවතේ ගෙදරට ගොස් තිබේ. එදින සිට බෘතායි එනතුරු ඒ තිදෙනා ම ලොකු දුව සමඟ ගත කර තිබේ. පොඩි දුව දවල් කාලයේ බැංකුවේ රැකියාවට ගොස් ආපසු සවසට එහි පැමිණ ඇත. ඒ අය බෘතායි පැමිණීමට ඉක්මන් කළ නමුත් එහි පැමිණෙන තුරු මේ කිසිවක් දන්වා එව්වේ නැත. ඒ නිසා, ඉක්මනින් ඒ අය බෘතායිවලට ගෙන්වා ගැනීම වේගවත් කිරීමක් සිදු නොවීය. සාමාන්‍ය පරිදි සිදුවීමට ඉඩ හැරියෙමි. මා මීට පෙර වතාවේ නෙදර්ලන්තයේ ගියේ මේ හැම දෙනා ම ඉතා ලාබාල වියේ දී ය. එසේ වුවත්, ප්‍රේමා අවශ්‍ය සියලු කටයුතු ඉටු කළාය. දැන් මේ අය වයසින් මුහුකුරා ගිය අය වුවත්, රටේ තිබුණ කලබලකාරී තත්ත්වය නිසා, ප්‍රේමාට පවුලේ කටයුතු හසුරුවා ගෙන අප නිවසට වී ගත කිරීමට නොහැකි විය.

බෘතායිහි දී පවුලේ ක්‍රියාකාරකම්

ලංකාවේ දී මහත් අසහනයකින් සිටි ප්‍රේමා හා දරු දෙදෙනා, බෘතායි පැමිණි පසු අස්වැසිල්ලක් ලැබූ බවට කිසිම සැකයක් නැත. හුදකලාව සිටි මට ද එය සහනයක් විය. ආහාරපාන සකසා ගැනීමට හැකි වූ නිසා, හෝටලයෙන් හෝ ආපන ශාලාවලින් ආහාර ගැනීම අවශ්‍ය නොවීය. මට හදවත් රෝගී තත්ත්වයක් තිබුණ නිසා, මෙය වඩාත් ම අත්‍යවශ්‍ය දෙයක් විය.

බෘහනායි රටේ කාලයක් ගත කිරීමට යන අය අවශ්‍යයෙන් ම කළ යුතු කරුණු දෙකක් විය. තමන්ගේ ම රථයක් පදවනවා නම් රියදුරු බලපත්‍රයක් ලබා ගත යුතු වේ. තම රටේ දී එවැනි බලපත්‍රයක් තිබුණත් බෘහනායි ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන බලපත්‍රයක් ලබා ගත යුතු වේ. නොවරදවා ම කළයුතු අනිත් කටයුත්ත නම්, හැඳුනුම්පතක් ලබා ගැනීමයි. ඒ සඳහා වූ කාර්යාලයට ගොස් ඇඟිලි සළකුණු තබා අත්සන් කළයුතු ආකෘති පත්‍රයක් සමඟ ඡායාරූප පිටපත් දෙකක් භාර දිය යුතුය. මාසයකින් පමණ පසුව හැඳුනුම්පතක් ලැබේ. රට තුළ ගමන් යන විට තමන්ළඟ මෙම කාඩ්පත තබා ගත යුතු වේ. මා බෘහනායි ගිය සැනින් ම මේවා ලබා ගෙන තිබිණි. ප්‍රේමා හා දරු දෙදෙන පැමිණි පසු ඒ අයට ද හැඳුනුම්පත් ලබා ගතිමු.

පවුලේ අය ලංකාවෙන් එන විට ඉඳිආප්ප තැම්බීමට උපකරණ ගෙනෙන ලෙස දන්වා යැවීමි. එහි පැමිණි පසු ස්ටීමරයක් මිලයට ගතිමු. පවුලේ, කීප දෙනෙකුට පාවිච්චි කිරීමට පිඟන් කෝප්ප ටිකක් තිබුණ නමුත් අවශ්‍යතාවක් ඇති වුවහොත් ගැනීමට මෙලමයින් පිඟන්, තඹිම් හා කෝප්ප ටිකක් ද රෙදි මැද ගැනීමට විදුලි ඉස්ත්‍රික්කයක් ද මිලයට ගතිමු. පොඩිපුතා ප්‍රිය කළ ගුවන් විදුලි කැසට් (two-in-one) යන්ත්‍රයක් ද මිලයට ගතිමු. එදිනෙදාට අවශ්‍ය ආහාරපානාදිය කීප තැනකින් මිලයට ගතිමු. ඒ සඳහා දින තුන හතරකට වරක් කඩපොළට යා යුතුය. මාළු වෙළඳපොළට ගොස් වැඩි වශයෙන් මිලට ගන්නේ තෝර මාළුය. තෝර කුරියකුගේ හිස පැත්තෙන් හෝ වලිගය පැත්තෙන් කැපීම එහි දක්නට ලැබිණි. මාළු ඔළුව කපා වෙන ම විකුණති. එය එහි ආපන ශාලාවල රසවත් ව්‍යංජනයකි. අප මිලයට ගත්තේ වලිගය පැත්තේ කැල්ලය. කිලෝ එකහමාරක් පමණ කැල්ලක් ඩොලර් හයක් පමණ විය. මාළු වෙළඳපොලේ ඉහළ මාලයේ පොල් විකුණන තැනක් තිබේ. පොල් ගෙඩියක් මිලයට ගෙන කට්ට කඩා දමා පොල් ගෙඩිය යන්ත්‍රයකට දැමූ විට මිරිකීමට සුදුසු ප්‍රමාණයට කුඩා කැලිවලට (හිරමනයට දමා ගෑවා මෙන්) කැඩී යයි. එය ගෙදර ගෙනැවිත් ශීතකරණයේ තබා ගත හැකි විය. පොල්තෙල් මෙන් ම සූරිය කාන්ත හා සෝයා වැනි තෙල් ද මිලයට ගත හැකි විය. එළවළු වර්ග ද එම වෙළඳපොලෙන් මිල දී ගැනීමට තිබිණි. ඉරිදා දිනවල පොලට ගොස් ගමේ එළවළු කොළ ජාති මිලයට ගතිමු. ඈත ගම්වලින් වී කොටා ගෙනැවිත් තිබූ රතු හාල් වර්ගයක් ද පොලෙන් ගත හැකි විය. වෙනත් ආහාරපාන අවශ්‍ය දේ යොහාන් වැනි වෙළඳ සංකීර්ණවලින් මිල දී ගත හැකි විය. ඉන්දියානු දමිළ වෙළඳුන්ගේ කඩවලින් කරවල, හාල් මැස්සන් වැනි දේ මෙන් ම කුළුබඩු ද මිල දී ගැනීමට පුළුවන්කම තිබිණි.

පැරණි රජ මාළිගාව අසල තිබුණු කඩයකින් වීඩියෝ සහ ඕඩියෝ කැසට් ලබා ගැනීමට තිබිණි. පැරණි හින්දි සින්දු කැසට් හා සීඩී තැටි කීපයක් මිලයට ගනිමු. හින්දි චිත්‍රපට වීඩියෝ කැසට් පටි සුළු මුදලක් ගෙවා ටික දිනකට පාවිච්චියට ලබා ගත හැකි විය. ඒවා ළඟ තබා ගැනීමට අවශ්‍ය නම් මිල දී ගැනීමට ද හැකියාව තිබිණි. රූපවාහිනිය, වීඩියෝ යන්ත්‍රය හා කැසට් යන්ත්‍රය ආදිය ගෙදර තිබුණ නිසා, විනෝද අංශය ද යම් තරමකට සම්පූර්ණ විය.

අප නිවසේ ආහාර වේලකට පළමුවෙන් ම ආරාධනා කළේ අප අධ්‍යයනාංශයේ *පීටර් ඊටන්* *ජෝඩුවට*, චීන ජාතික කථිකාචාර්යවරයෙකුට හා අප පදිංචි ව සිටි ගොඩනැගිල්ලේ ම ඉහළ මාලයක පදිංචි ව සිටි *පුෂ්පා තම්බිපිල්ලේ* මෙනෙවියටත්ය. *පීටර් ඊටන්* මහතා ලංකාවට පැමිණි ගමනක දී ආප්ප, ඉදිආප්ප ආහාරයට ගත් බව වරක් මට කියා තිබුණි. ඒ නිසා, අධ්‍යයනාංශයේ එකට වැඩ කරන මේ දෙතුන් දෙනාට ඉඳිආප්ප සංග්‍රහයක් සඳහා ආරාධනා කළෙමු. මා එහි සිටි අවදියේ දී, *බංඩාර් ශ්‍රී භගවාන්* කඩවීදියේ චීන කඩයකින් මත්පැන් මිලයට ගැනීමට තිබිණි. ජොනී වෝකර් රතු ලේබල් බෝතලයක් බෲනායි ඩොලර් විසිතුනක් විය. කළු ලේබල් බෝතලයක් ඩොලර් තිහක් විය.

මෙම සාදයෙන් පසුව විටින් විට සති අන්තවල, ලංකාවේ අයට ද ආරාධනා කර රාත්‍රී හෝ දිවා භෝජන සංග්‍රහ පැවැත්වූයෙමු. මෙය බෲනාහි ලාංකිකයන් අතර සුහදතාව රැක ගැනීමට යොදා ගත් ක්‍රමයක් විය. වෙනත් අය ද අපට ඒ අයගේ සාදවලට ආරාධනා කළහ. මහාමාර්ග, විදුලි සන්දේශ වැනි දෙපාර්තමේන්තුවල මෙන් ම ඉදිකිරීම් ව්‍යාපෘතිවල සේවයේ නිරත ව සිටි ලාංකික ඉංජිනේරුවරු ද, ලංකාවෙන් ගිය පාසල් ගුරුවරු හා විශ්ව විද්‍යාල ගුරුවරු ද එහි සේවයේ නිරත ව උන්හ. අගමැති කාර්යාලයේ (සුල්තාන්වරයාගේ කාර්යාලයේ) සේවයේ නිරත ව සිටි ඉංජිනේරුවරයෙක් ද විය. මේ අය සමහර දෙනෙක් එම රටට ගොස් ඇත්තේ නැව් මගිනි. නැත්නම් පැරණි ගුවන් තොටුපල මගිනි. දැනට එහි නවීන පන්නයේ ගුවන් තොටුපලක් හා ගුවන් සේවයක් තිබේ. සිංගප්පුරුව, බැංකොක්, ඩුබායි, ඩාර්වින් හා තවත් අවට රටවලට *බෲනායි* ගුවන් සේවයේ යානා ගමන් කරති. ඒ රටවලින් ද *බංඩාර් ශ්‍රී භගවාන්* නුවරට යානා පැමිණෙති.

ලාංකිකයන් අන්‍යොන්‍ය සුහදතාව රදවා ගත් තවත් ක්‍රමයක් වූයේ, කවුරුන් හෝ රටින් පිටත් ව යන විටත් ආපසු පැමිණෙන විටත් ගුවන් තොටුපලට ගොස් මුණ ගැසීමෙනි. මේ අවස්ථාවල දී, වෙනත් අය ද ගුවන් තොටුපලේ දී නිතර නිතර මුණ ගැසෙත්. අගනුවර අවට පදිංචි කෙනෙකුට ගුවන් තොටුපලට යන එන එක එතරම් දුර ගමනක් නොවීය. *කුවාලා බෙලයිට්* වැනි තැනක සිට වුවත් පැය දෙක තුනකින් පැමිණීමට පුළුවන. වරක් අගනුවර අවට පදිංචි කණ්ඩායමක් සති අන්තයක දී *කුවාලා බෙලයිට්*

නගරයට ගොස් ක්‍රිකට් ක්‍රීඩාවකට හා භෝජන සංග්‍රහයට සහභාගී වූයෙමු. *කුවාලා බෙලයිට්* හා *සෙරියා* යන නගරවල සිටින්නේ බනිජ තෙල් සමාගම් සේවකයෝය. ලංකාවෙන් එහි ගොස් සේවය කරන බොහෝ දෙනෙක් සිටිති. මේ ආදී කරුණු නිසා සති අන්තවල දී පවා පාළුවකින් තොර ව කාලය ගත කිරීමට ලැබිණි.

එනමුත්, සතියේ දිනවල මා විශ්ව විද්‍යාලයට ගිය විට ප්‍රේමාට හා දරු දෙදෙනාට තට්ටු නිවාසයට කොටු වී ඉන්නට සිදුවිය. දිවා රාත්‍රී ආහාරපාන සැකසීම හැර වෙන කළ යුතු යමක් නොවීය. රූපවාහිනී යන්ත්‍රය තිබුණ නිසා එය නැරඹීමට හැකි විය. කැසට් යන්ත්‍රය තිබුණ නිසා සින්දු ඇසීමට ද ලැබිණි. මේ කාලය තුළ දී දරු දෙදෙනා පරිගණක පන්තියකට සම්බන්ධ කළෙමි. නගරයේ තිබුණ *චුන් හුවා* (CHUN HWA) නම් චීන පාසලේ එම පන්ති පැවැත්වූයේ සවස හතරෙන් පමණ පසුවය. ඒ නිසා, විශ්ව විද්‍යාලයෙන් පසුව ගෙදර පැමිණ දරුවන් සමඟ එහි ගියෙමි. මෙය දිනපතා ම සිදු නොවූ නමුත් ප්‍රයෝජනවත් ලෙස කාලය ගත කිරීමට මඟක් විය.

පොඩි දුව

පොඩිදුව බැංකුවෙන් ලබා ගත් නිවාඩුව දීර්ඝ කර ගැනීමට ඉල්ලූ නමුත් එය ප්‍රතික්ෂේප විය. ඉන් පසුව තවදුරටත් අධ්‍යාපනයක් ලබා ගැනීම ගැන අවධානය යොමු කළාය. *බෘනායිහි* සේවය කරන ලාංකිකයන් බොහෝ දෙනෙකුගේ දරුවන් ඉගෙන ගත්තේ එංගලන්තය, ඕස්ට්‍රේලියාව වැනි පිට රටවලය. සමහරෙක් විශ්ව විද්‍යාලවල ඉගෙන ගනිති. පොඩි දුවට ද ඕස්ට්‍රේලියාවට ගොස් උසස් අධ්‍යාපනයක් ලැබීමේ කැමැත්ත තිබුණ නමුත්, මට බෘනායි විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු අවුරුදු හතරක් පහක්වත් තිබුණා නම් මිස, ඒ කටයුත්තට අත ගැසීමට හැකියාවක් නොවීය. ඒ වන විට ලංකාවේ අයි.ටී.එස්. (ITS) නමින් උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවා තිබිණි. එහි යම්කිසි කාලයක් ඉගෙන ගෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාලයකට ගොස් අවුරුද්දකින් උපාධියක් ලබා ගැනීමේ ක්‍රමයක් තිබිණි. ඒ නිසා, පොඩිදුවට ඒ මඟ ගැනීමට කටයුතු කළෙමි. ලොකු පුතා හා ලොකු දුව ලංකාවේ සිටි නිසා, අවශ්‍ය මූලික කටයුතු යෙදිය හැකිවිය. අයි.ටී.එස්. ආයතනයේ නේවාසික පහසුකම් ද තිබිණි.

මේ නිසා, දෙසැම්බර් මාසයේ අග දී පොඩිදුව ලංකාවට පැමිණියාය. ආපසු එන ගමනේ දී එක් රැයක් සිංගප්පූරුවේ හෝටලයක නවාතැන් ගෙන, යම් යම් දේ මිලයට ගෙන, පසුදා ලංකාවට පැමිණියාය. බෘනායි සිට ලංකාවට එන ජෝඩුවක් ද එදින රෑ එම හෝටලයේ නවතින බව කලින් අපට දන්වා තිබිණි. පොඩිදුව සිංගප්පූරුවට ගොස් අප නිවසට දුරකථන

පණිවිඩයක් දුන් නමුත්, ටැලිෆෝනය නිසි පරිදි තබා නොතිබුණ නිසා, පණිවිඩය ලබා ගැනීමට බැරි විය. එහෙයින්, බෘනායි හි සිටි *පෙරේරා* නමැති ගුරු නිවසට කථා කොට පණිවිඩයක් දී තිබිණි.

පොඩි දුව ලංකාවට පැමිණ *ඉන්ස්ටිට්යුට් ඔෆ් ටෙක්නොලොජිකල් ස්ටඩීස්* (Institute of Technological Studies - ITS) ආයතනයට ඇතුළු වී උසස් අධ්‍යාපනය ලැබීම ආරම්භ කළාය. නේවාසිකාගාරයේ නැවතීමේ පහසුකම් ලබා ගත්තාය. ලොකු පුතා සහ ලොකු දුව විටින් විට පොඩිදුව ගැන සොයා බලා තිබේ.

පොඩි පුතා

ලංකාවේ පාසල්වල පැවැති අවුල් වියවුල් තත්ත්වය නිසා, පොඩිපුතා තව දුරටත් *බෘනායි* හි රඳවා ගෙන සිටීමට සිදුවිය. සාමාන්‍ය පෙළ විභාගය සමත්වුවත්, ලංකාවට ආපසු පැමිණ අධ්‍යාපනයක් ලබා දීමට සුදුසු වාතාවරණයක් නොවීය. ඒ නිසා පොඩි දුව ලංකාවට පැමිණි පසු පොඩි පුතාට හුදකලාව බෘනායි තට්ටු නිවාසයේ ගත කිරීමට සිදුවිය. අප තිදෙනාට අවශ්‍ය ආහාරපාන ප්‍රේමා සකස් කළාය. බැල්කනියේ පුටුවක් තබා ගෙන ඉදිරිපස පාරේ අඛණ්ඩ ව එහා මෙහා යන රථවාහන දෙස බලා සිටීම පොඩි පුතාගේ එක් විනෝදාංශයක් විය. මේ නිසා, ටික දිනකින් බෘනායි හි එවකට භාවිතාවේ තිබූ රථවාහන (කාර්) ගැන මනා අවබෝධයක් ලබා ගත්තේය.

දැනටත් පොඩිපුතාට කාර් ගැන හොඳ දැනුමක් තිබේ. තම යාළුමිත්‍රයින් බොහෝ දෙනෙක් කාර් පිළිබඳ ව උපදෙස් ලබා ගන්නේ පොඩි පුතාගෙනි.

අප පදිංචි ව සිටි තට්ටු නිවාසය පිහිටා තිබුණේ *බණ්ඩාර ශ්‍රී භගවාන්* (B.S.B) ගුවන් තොටුපල අසලය. මේ නිසා, බැල්කනියේ වාඩි වී සිටින විට නිවසට ඉහළින් එහා මෙහා පියාසර කරන ගුවන් යානා ද නිතර දකින්ට ලැබේ. මෙම යානා රාජකීය බෘනායි ගුවන් සමාගමට (R.B.A), සිංගප්පූරු ගුවන් සේවයට හා තායි ගුවන් සේවයට අයත් විය. මෙසේ කලක් ගත වන විට නිකරුණේ කාලය ගත කිරීම සුදුසු නොවන නිසා, කුමක් කිරීමට බලාපොරොත්තු වන්නේ දැ'යි පොඩි පුතාගෙන් විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ, ගුවන් නියමුවකු වීමට කැමැති බවයි. කුඩා කාලයේ තට්ටු ගොඩනැඟිල්ලක පඩි පෙලක්වත් නැඟීමට බයේ සිටි මේ දරුවා, දැන් ගුවන් නියමුවකු වීමට කැමති බව කීම මට අදහාගත නොහැකි තරම් විය.

කෙසේ වෙතත්, මේ සඳහා තිබෙන ඉඩ ප්‍රස්ථා ගැන සොයා බැලීමට පටන් ගතිමු. බෘනායි අගනුවර පිහිටි ඇමෙරිකන් තානාපති කාර්යාලයට සම්බන්ධ පුස්තකාලයට ගොස්, ඇමෙරිකාවේ ගුවන් නියමු පුහුණු මධ්‍යස්ථාන

ගැන සොයා බැලුවෙමු. ඇමෙරිකාවේ ෆ්ලොරිඩාහි ඩේටෝනා (Daytona) වෙරළාසන්න ප්‍රදේශයේ මෙවැනි මධ්‍යස්ථාන කීපයක් තිබෙන බව දැනගන්නට ලැබිණි. ඕස්ට්‍රේලියාවේ මෙවැනි මධ්‍යස්ථාන ගැන තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. මේ අතර, ලංකාවේ රත්මලාන ගුවන් තොටුපල තුළ ඒෂියන් ඒවියේෂන් සෙන්ටර් (Asian Avation Center) නම් තැනක් තිබෙන බව ආර්.බී.ඒ. ගුවන් සේවයේ නිරත ව සිටි ලාංකිකයෙක්ගෙන් දැනගතිමි. 'වික්‍රමසිංහ' නමින් ඔහුගේ සහෝදරයා එම මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරයා ලෙස සේවය කරන බව ද කීවේය. මේ මධ්‍යස්ථානයේ අයිතිකරු වූයේ *හෙක්ටර් අබේවර්ධන* මහතාගේ පුත්‍ර *සුනිල් අබේවර්ධන* මහතාය. ඔහු අපේ ලොකු පුතා සමඟ ඒ කාලයේ ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත් බවක් දැන ගත් නිසා, ඒ ආයතනයට ලිපියක් යවා තොරතුරු ගෙන්වා ගතිමි. වාණිජ නියමු බලපත්‍රය ලබා ගැනීම දක්වා පුහුණු කිරීමට ලංකා රුපියල් ලක්ෂ පහක් පමණ අය කරන බවත් වසරකින් පමණ පුහුණුව අවසන් කර සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගයට පෙනී සිටිය හැකි බවත් දැන ගතිමු. එම විභාගය සමත් වූ පසු වාණිජ ගුවන් නියමු බලපත්‍රය (Commercial Pilot's Licence) ලැබේ. එවිට ගුවන් සේවා සමාගමක රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබේ.

ලංකාවට ආපසු පැමිණ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා ඉගෙන ගැනීමට වසර දෙකක්වත් ගත කළ යුතුවේ. එය හොඳින් සමත් වුවහොත් විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට තවත් වසරක්වත් ගත වේ. ඉන්පසුව විශ්ව විද්‍යාලයේ කලබල ආදිය නොමැති ව තිබුණොත් උපාධියක් ලබා ගැනීමට වසර හතරක්වත් ගත කළ යුතුය. මේ අනුව අවුරුදු හතක් අටක් ගතකර උපාධිධාරියෙකු වුවත් රැකියාවක් ලැබෙන්නේ කවද ද'යි නියම නැත. ගුවන් නියමු බලපත්‍රය ලබා ගැනීමට අවුරුදු දෙකක් ගත කළත්, එය තාක්ෂණික පුහුණුවක් නිසා, වැඩිකල් නොගොස් රැකියාවක් ලබා ගැනීමට ඉඩ තිබේ. මේ ආදී කරුණු නිසා, ගුවන් නියමු පුහුණුව ලබා දීමට තීරණය කළෙමි. මේ වන විට මාස දෙක තුනක් ගත වී තිබිණි. 1990 මැයි මාසේ අග දී අප ලංකාවට පැමිණීමට නියමිත ව තිබූ නිසා, එතෙක් පොඩි පුතා ද බෘනායිහි රැඳී සිටියේය.

බෘනායි ගත කරන ඉතිරි කාලයේ ප්‍රයෝජනවත් යමක නිරත විය යුතු නිසා, පොඩි පුතා එහි පාසලක පැවැත්වුණු සන්ධ්‍යා ඉංග්‍රීසි පන්තියකට ඇතුළු කළෙමු. අපි නිවස අසල ම පිහිටි *හසනල් බෝල්කියා* ක්‍රීඩා මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකයක් විය. ලංකාවේ තවත් ළමයෙක් එහි පුහුණුවට ගිය නිසා, පොඩි පුතා ද එයට සම්බන්ධ කළෙමි. බෘනායි පාසලක ගුරුවරයෙකු වූ ඒ දරුවාගේ පියා පොඩි පුතා ද පිහිනුම් පන්තියට එක්කර ගෙන යෑමට කැමති විය. පිහිනීමට හැකියාවක් ලැබුණා ද'යි නොදනිමි. එනමුත්, හුදකලා

ව ගෙදරට වී සිටිනවාට වඩා තම වයසේ කෙනෙකු සමඟ ඇසුර වුව ද ප්‍රයෝජනවත් යැ'යි සැලකුවෙමි.

වෙනත් සිදුවීම්

1990 ජනවාරි මාසයේ සිට අප නිවසේ සිටියේ ප්‍රේමාත් මාත් පොඩි පුතාත්ය. සමහර දවස්වල පොඩි පුතා සමඟ ඉංග්‍රීසි පන්තියට ගිය විට ගෙදර ඉතිරි වූයේ ප්‍රේමා පමණයි. දිනක් පොඩි පුතාත් මාත් බැහැර ගොස් ආපසු එනවිට ප්‍රේමා විසිත්ත කාමරයේ පුටුවක් මත එක් කකුලක් තබා ගෙන වාඩි වී සිටියාය. පුටුව උඩ තිබුණ කකුලේ ඇඟිලි පෙදෙස රෙදි පටකින් වෙලා තිබිණි. සිදුවූයේ කුමක් දැ'යි විමසූ විට, නාන කාමරයට ගොස් ආපසු ගෙට ගොඩවන විට එහි තිබුණ ගැටිටේ පය වැදී මාපට ඇඟිල්ල තුවාල වී ලේ ගලන්නට වූ බව කීවාය. ගෙදර ඉස්සරහා දොරටුව අසලට පැමිණ කෑගසන විට, ඉහළ මාළයේ පදිංචි ව සිටි ඇමෙරිකානු ජාතික තරුණ මහතෙක් පැමිණ, ප්‍රථමාධාරයක් දී ගොස් තිබේ. එම ඇමෙරිකන් යුවල ද විශ්ව විද්‍යාලයේ සේවයට පැමිණ සිටි අයයි.

රෙදිකඩ ඉවත් කර බලන විට, මාපට ඇඟිල්ලේ නියපොත්ත මුල තුවාල වී ඇති බව දුටිමි. *ගඩොන්ග්* (GADONG) කඩපලේ ගොඩනැඟිල්ලක උඩුමහලේ බෙහෙත් ශාලාවක් පවත්වා ගෙන ගිය චීන සම්භවයක් ඇති වෛද්‍යවරයෙකු වෙත ප්‍රේමා එක්කර ගෙන ගොස් ප්‍රතිකාර ලබා දුනිමි. ප්‍රේමාට පඩිපෙළ නැඟීමට අපහසු වූ නිසා, ඈ උස්සා ගෙන ඉහළ මාලයට යෑමට සිදුවිය. පොඩි පුතාටත් මටත්, දෙපැත්තෙන් අල්ලා ගෙන පඩි පෙළ නැඟීමට තරම් එය පළල් නොවීය. දියවැඩියාකාරියක් වූ නිසා, තුවාලය වේලෙන තුරු නියපොත්ත ගැලවීමට සුදුසු නැතැ'යි වෛද්‍යවරයා පැවසීය. බෙහෙත් දමා ගැනීමට කීපවිටක් ම ඒ ආකාරයට ප්‍රේමා වෛද්‍යවරයා වෙත එක්කර ගෙන යෑමට සිදුවිය. තුවාල වෙළීමට සති දෙකක් පමණ ගත විය. ඉන් පසුව නියපොත්ත ඉබේ ම ගැලවී වැටිණ.

මෙම අනතුර නිසා, ගෙදර ඉවුම් පිහුම් කිරීමට බැරිවූ බැවින්, ඒ කාලය තුළ පොඩිපුතාට ඒ වැඩ ඉගෙන ගැනීමට සිදුවිය. අම්මාගේ උපදෙස් ලබා ගෙන බත් වැංජන පිසීම පුරුදු විය. තෝර මාළු පෙති බදින ආකාරය මා කියා දී තිබුණ නිසා, දිවා රෑ ආහාරය සතුටුදායක තත්ත්වයකින් සකස් කර ගත හැකි විය. මා කුඩා කාලයේ අපේ අම්මා අසනීප වූ විට බතක් වැංජනයක් උයන්නට පුරුදු වූ අන්දමට පොඩි පුතාට ද අම්මාගේ ආපදාව නිසා සුළු වශයෙන් හෝ ඉවුම් පිහුම් ගැන දැනුමක් ලබා ගැනීමට අවස්ථාවක් ලැබිණි.

බෲනායිහිදී හමු වූ ලාංකිකයෝ

ප්‍රේමාගේ කකුල තුවාල වී සිටි වකවානුවේ දිනක අපේ ගෙදරට අමුත්තෙක් පැමිණියේය. උඩරට සාරියක් ඇඳ සිටි ඇය සමඟ කතා බහ කරන විට දැනගත් තොරතුරු මෙසේය. මේ කාන්තාව *අරඹේපොල* නම් වූවාය. බෲනායි හි ටුටොන්ග් (TUTONG) නරගයේ පාසල් ගුරුවරියක ලෙස ඈ සේවය කළාය. අප ගැන ආරංචි වී අගනුවරට පැමිණි අවස්ථාවේ හමු වී යන අදහසින් පැමිණි බව කීවාය. අරඹේපොල මහත්මිය නිතර අගනුවරට නොපැමිණීම නිසා, එහි සිටින ලාංකිකයින් හමුවන්නේ කලාතුරකිනි. ඒ මහත්මිය උගන්වන පාසලේ ම කාමරයක නේවාසික ව සිටියේ හුදකලාව ම ය. තම සැමියා මියගොස් දියණියන් දෙදෙනෙකුගේ ඉගෙනීම් ආදිය ගැන කටයුතු කිරීමට අවශ්‍ය හෙයින්, වැඩි ආදායමක් ලැබෙන නිසා බෲනායි ගොස් ඇත. අරඹේපොල මහත්මිය ඉගැන්වූයේ *ටුටොන්ග්හි සූෆ්‍රි බෝල්කියා* ඉංග්‍රීසි පාසැලේය. (SUFRI BOLKIAH ENGLISH SCHOOL)

අප හමුවීමට පැමිණි අරඹේපොල මහත්මියට එදින දිවා ආහාරය සලසා දුන් බව මතකය. හවස්වරුවේ ආපසු ගමනට සූදානම් වී අපට එතුමියගේ නවාතැනට එන ලෙස ආරාධනා කළාය. එම ආරාධනය අනුව පසුව දිනක අප තිදෙනා (ප්‍රේමා, පොඩිපුතා හා මම) එහි ගියෙමු. හුදකලාව දිවි ගෙවන එතුමිය, අපගේ පැමිණීම ගැන බෙහෙවින් ම සතුටු වූ බව පෙනිණි. එහි දී අපට දිවා ආහාරය ලැබිණි. ඉන්පසු හැකි පමණ වේලාවක් එහි ගත කොට, රෑ බෝවීමට පෙර ආපසු පැමිණියෙමු. අරඹේපොල මහත්මියගේ දරු දෙදෙනා ලංකාවේ පදිංචි ව සිටියේ නාරාහේන්පිට හන්දිය අසල තමන්ගේ ම නිවාසයකයි. ඒ මහත්මිය ලංකාවට පැමිණි අවස්ථාවක අයි.ටී.එස්. නේවාසිකාගාරයට ගොස් පොඩි දුව හමු වූ බව දැනගන්නට ලැබිණි.

මා බෲනායි ගිය දවස්වල ම එහි ගිය තිස්ස වික්‍රමසිංහ මහතා, මුවාරාහි නිවාසයක පදිංචි ව එම වරායේ සේවය කළේය. එම යුවල ද වරක් අපට දිවා ආහාරයට එන ලෙස ආරාධනා කළහ. අප තිදෙනා එහි ගොස් එක් දිනක් ඒ අය සමඟ ගත කොට පැමිණියෙමු. මේ යුවල ද අගනුවරින් බැහැර ව පදිංචි ව සිටි නිසා අනිත් ලාංකිකයින් සමඟ නිතර දෙවෙලේ මුණගැසීමක් නොවීය. *බණ්ඩාර් ශ්‍රී භගවාන්* නම් වූ බෲනායි අගනුවර හා ඒ අසල නොයෙක් ආයතනවල සේවයේ නිරත ව සිටි ලාංකික පවුල් හා පුද්ගලයින් විසි ගණනක් (සියලු දෙනා ම පනහකට වැඩිය) පමණ අපට එහි දී මුණගැසී ඇත. එහි විශ්ව විද්‍යාලයේ සේවයේ නිරත වූ *විමලතිස්ස* මහතා, විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ දී ද අප සමඟ සේවය කළ කථිකාචාර්යවරයෙකු විය. ඔහු තම බිරිඳ හා දරුවා සමඟ එහි පදිංචි ව සිටියේය. *ආචාර්ය රොඩ්නි ප්‍රනාන්දු* මහතා එම විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයේ කථිකාචාර්යවරයෙකු

විය. ඔහු පදිංචි ව සිටියේ ද *විමලනිස්ස* මහතා සිටි තට්ටු නිවාස සංකීර්ණයේ පහළ මාලයේ නිවසකය. එහිම *බෙනරගම* නම් පවුලක් පදිංචි ව සිටියහ. බෙනරගම මහතා එහි විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවය කළේය. බෲනායි විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති තනතුර දැරූ *මහාචාර්ය සිරිනන්ද* මහතා සිය බිරිඳ සමඟ එහි පදිංචි වී උන්හ. ඒ දෙදෙනාගේ දරු දෙදෙනෙක් උන්හ. ඔව්හු ලන්ඩනයේ පාසල් අධ්‍යාපනය ලැබූහ. මා එහි ගොස් මාස හතරකට පමණ පසුව ආචාර්ය *වීජේවීර* මහතා එම විශ්ව විද්‍යාලයේ සේවය සඳහා පැමිණියේය. එම යුවලගේ පුතා ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයකට ප්‍රවේශය ලබා එහි ගියේය.

ආචාර්ය *රංජිත් සිල්වා* මහතා තම බිරිඳ සමඟ අප පදිංචි ව සිටි තැනට සමීප නිවසක පදිංචි ව සිටියේය. ජීව විද්‍යාඥයෙකු හා පුහුණු කිමිඳුම්කරුවකු වූ රංජිත්, ධීවර දෙපාර්තමේන්තුවට සම්බන්ධ ව සේවය කළේය. ඒ යුවලගේ දරු දෙදෙනා ඕස්ට්‍රේලියොවේ ඉගෙනීමේ නිරත ව උන්හ. ධීවර දෙපාර්තමේන්තුවේ මිරිදිය ධීවර විශේෂඥයෙකු ලෙස සේවය කළ ලාංකික තරුණයෙක් ද බිරිඳ සමඟ නගරයෙන් බැහැර ගමක පදිංචි ව සිටියේය. ඔහුගේ නම මගේ මතකයට නැඟෙන්නේ නැත. එනමුත් ඒ ජෝඩුව අපට රාත්‍රී භෝජන සංග්‍රහයකට ද ආරාධනා කර ඇත. ඒ දෙදෙනා අපේ නිවසට ද පැමිණ තිබේ.

ලාංකික ඉංජිනේරුවරු කීප දෙනෙක් ම *බෲනායිහි* දී මුණගැසී, සුහද සම්බන්ධතාවක් ගොඩ නඟා ගෙන සිටියෙමු. එහි අගමැති කාර්යාලයේ ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කළ *සිල්වා* මහතා, බෲනායි හි දී මට හමු වූ වැඩිමහල් ම තැනැත්තා යයි සිතමි. එතුමා මුලින් එහි යන විට නැව් මගින් ගිය බව සඳහන් කළේය. පැරණි ගුවන් තොටුපලක් තිබුණ නමුත් නිතිපතා ගුවන් සේවයක් තිබී නැත. බෲනායි ගුවන් තොටුපල ඉදිකර ඇත්තේ පසු කාලයේ දී ය. ඒ කාලයේ බෲනායි ගිය පාසල් ගුරුවරු සමහර දෙනෙක් එහි ගොස් ඇත්තේ නැව් මගින් බව කීහ. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රීරිස් නම් වූ ඉංජනේරුවරයෙක් එහි සේවය කළේය. ඔහු තම පුතා *මයියා* සමඟ එහි විසීය.

මයියා ඉගෙන ගත්තේ බෲනායි පාසලකය. පෞද්ගලික ආයතවල සේවය කළ සිවිල් ඉංජිනේරුවරුන් දෙතුන් දෙනෙක් ද මුණගැසිණි. *බංඩාර* නම් වූ ඉංජිනේරු මහතාගේ නම පමණක් මතකය. ඒ අය සේවය කළේ චීන ජාතිකයිනට අයත් ඉදිකිරීම් සමාගම්වලය.

බෙනරගම මහතා හැර තවත් කීප දෙනෙක් විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සේවය කළහ. *දිසානායක* නම් වූ තරුණ ඉංජිනේරුවරයෙක් තම බිරිඳ හා දරු දෙදෙනාත් සමඟ එහි ටික කලක් ගත කොට, ඕස්ට්‍රේලියාවට

සංක්‍රමණය විය. ඉන්පසුව *සොයිසා* නම් වූ ඉංජිනේරුවරයෙක් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයට පැමිණියේය. *සෝමසිරි* නම් වූ තාක්ෂණික නිළධාරියෙක් ද බෘනායි ටෙලිකොම් (BRUNEI TELECOM) දෙපාර්තමේන්තුවේ සේවය කළේය. අප රත්තනපිටියේ පදිංචි ව සිටි යුගයේ සෝමසිරි මහතා ද ඒ අසල පදිංචි ව සිටි බව දැනගන්නට ලැබිණි. ඔහුගේ පුතුන් දෙදෙනෙක් ඕස්ට්‍රේලියාවේ *ඩාවින්* නුවර පදිංචි ව සිටිත්. වරක් මා එහි ගිය විට ඒ අය මුණගැසිණි. බෘනායි ගුවන් සේවයේ රැකියාවක නිරත වූ කෙනෙක් ද මුණගැසිණි. ඒ මහතාගේ සහෝදර වික්‍රමසිංහ මහතා *ඒෂියන් ඒවියේෂන් සෙන්ටර්* නම් වූ ලංකාවේ ගුවන් නියමු පුහුණු ආයතනයේ සේවය කළේය.

පාසල් ගුරුවරු කීප දෙනෙක් ද බෘනායිහි දී මුණ ගැසිණි. පෙරේරා යුවල එවැනි දෙදෙනෙකි. *පෙරේරා* මහතා චිත්‍රකර්ම ගුරුවරයෙකි. ඒ දෙදෙනාට දියණියක් විය. ඒ දියණිය එහි පාසලක ඉගෙන ගත්තේය. අපේ පොඩි දුව එහි සිටිය දී ඒ අයගේ නිවසේ රාත්‍රී භෝජන සංග්‍රහයකට අප හතර දෙනා ම ගිය බව මතකය. ඉහතින් සඳහන් කළ ඉංජිනේරු සිල්වා මහතා ද පදිංචි ව සිටියේ එම නිවාස සංකීර්ණයේ නිවාසයකය. මට දැනට නම මතක නැති තවත් ගුරුවරයෙක් තම බිරිඳ හා පුතා සමඟ එහි පදිංචි ව සිටියේය. අපේ පොඩි පුතා සමඟ පිහිනීම් පුහුණුවට ගියේ ඒ දරුවාය.

ඉහත සඳහන් සියලු දෙනා ම භෝජන සංග්‍රහ අවස්ථාවල දී නිතර හමු වූ අයයි. බෘනායි පදිංචි ව සිටි ලාංකිකයින් ටික දෙනා සුහද සබඳතා ගොඩ නඟා ගෙන සිටියේ රාත්‍රී හෝ දිවා භෝජන සඳහා එකිනෙකාගේ නිවෙස්වලට ආරාධනා කිරීමෙනි. මේ නිසා, සෑම සති අන්තයක ම පාහේ කාගේ හෝ නිවසක භෝජන සංග්‍රහයක් තිබිණි. කාන්තාවන්ට "ඕපාදූප" හුවමාරු කර ගැනීමටත්, පිරිමින්ට "අඩියක්" ගසා කයිවාරු කෙළීමටත් මෙය හොඳ අවස්ථාවක් විය. මේ කිසිවකට සම්බන්ධ නොවූ ලාංකික පවුල් දෙකක් ද එහි වූහ. ඒ අය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ පවුල්ය. එක කථිකාචාර්යවරයෙක් ලාංකික මැලේ ජාතිකයෙකි. අනිත් කෙනා ලාංකික මුස්ලිම් ජාතිකයෙකි. ඒ රටේ පැවැති සංස්කෘතිය අනුව ඒ අය හුදකලා නොවන්නට ඇත.

ලංකාවට පැමිණීම

1989/1990 අධ්‍යයන වර්ෂය අවසන් වූයේ 1990 මැයි මාසයේ දී ය. පළමුවන වර්ෂාර්ධය අවසානයේ මෙන් ම දෙවන වර්ෂාර්ධය අවසානයේ දී පවත්වන විභාගවල දී, තම තමන් උගන්වන විෂයයන් සම්බන්ධ ව විභාගයේ දී විභාග ශාලාවේ සුපරීක්ෂණය හා උත්තර පත්‍ර එකතු කර ගැනීම

අදාළ ගුරුවරයා විසින් ම කළ යුතු වේ. ඉන් පසු දින දෙක තුනක් ඇතුළත උත්තර පත්‍ර පරීක්ෂා කර ලකුණු ලැයිස්තු හා උත්තර පත්‍ර අධ්‍යයනාංශ ප්‍රධාන වෙත භාරදිය යුතුය. දෙවන වර්ෂාර්ධය සඳහා වූ උත්තර පත්‍ර හා ලකුණු ලැයිස්තු භාර දීමෙන් පසුව මගේ වගකීම් අවසන් විය. ඒ නිසා මැයි මාසයේ අග දී ලංකාවට පැමිණීමට විධිවිධාන යොදා ගතිමි. එතෙක් මා කළ සේවය සඳහා ලැබිය යුතු ගෙවීම් සියල්ල ලබා ගැනීමට පියවර ගතිමි.

ලංකාවට එන ගමනේ දී සිංගප්පූරුවේ දී යම් යම් දේ මිලයට ගත යුතු වූ නිසා, දින දෙක තුනක් එහි නතර වීමට සිංගප්පූරු තරුණ ක්‍රිස්තියානි සංගමයේ (Y.M.C.A.) නේවාසිකාගාරයේ අප තිදෙනාට ගැලපෙන කාමරයක් ගතිමි. ඒ සඳහා කල්තියා *බෘනායි* සිට ම මුදල් එවීමට සිදුවිය. ලංකාවට පැමිණ ආපසු *බෘනායි* යන දිනය දක්වා දින විසිනවයක් සඳහා විවේක නිවාඩු හිමිකම තිබුණ බව දැන ගත් නිසා, එම නිවාඩුව අනුමත කරවා ගතිමි. මෙය ඇත්ත වශයෙන් ම නිවාඩුවක් තුළ නිවාඩුවක් වූයේ මා ලංකාවෙන් සප්ත වාර්ෂික නිවාඩු ලබා ගෙන සිටි කාලයේ බෘනායි විශ්ව විද්‍යාලයට කළ සේවය සඳහා හිමි වූ නිවාඩුවක් නිසාය. එවැනි නිවාඩුවක් නොලැබුණා නම්, ඒ රටින් පිට වී ආපසු එහි යනතුරු වූ කාලපරිච්ඡේදයට දීමනාවක් නොලැබේ.

1990 මැයි මස 31වැනි දින පෙරවරුවේ අප නිවසේ සිට මගේ භාවිතයට දී තිබූ රථයෙන් ම බණ්ඩාර් ශ්‍රී භගවාන් ගුවන් තොටුපලට පැමිණ, ඒවිස් (AVIS) කාර් සමාගමේ නියෝජිතයාට එය භාර දුනිමි. මම ආපසු එන විට මට නැවත කාර් එක ගුවන් තොටුපලේ දී භාර ගැනීමට විධිවිධාන යෙදුවෙමි. මගේ මතකයේ හැටියට, රාජකීය බෘනායි ගුවන් සේවයේ යානයෙන් පෙරවරු නවයට පමණ බෘනායි රටෙන් පිටත් වී පෙරවරු එකොළහට පමණ සිංගප්පූරුවට පැමිණියෙමු. සිංගප්පූරු ගුවන් තොටුපලේ දී අපේ එක ඇඳුම් බෑගයක් භාණ්ඩ රඳවා ගන්නා තැනට භාර දී එහි තිබෙන කුලී රියකින් නගර මධ්‍යයේ පිහිටි තරුණ ක්‍රිස්තියානි සංගමයේ නේවාසිකාගාරයට ගියෙමු.

අප තිදෙනාට ඉහළ මාලයක ඇඳන් තුනක් තිබෙන කාමරයක් වෙන් කර දෙන ලදී. මුහුණ කට සෝදා ටික වේලාවක් විවේක ගෙන, නේවාසිකාගාරය අවට පෙදෙසේ ඇති කඩ සාප්පුවල ඇති දේ ගැන විපරම් කර බැලුවෙමු. එදින රාත්‍රියේ අසල භෝජනාගාරයකින් රෑ කෑම ගැනීමෙන් පසු නේවාසිකාගාරයට ගොස් රෑය ගත කළෙමු.

පසු දින කඩ සාප්පු විවෘත කරන වේලාවට *සෙරංගුන් වීදියේ* ඇවිදීමට ගියෙමු. එම වීදිය සාරි ආදි ලංකාවේ අයට අවශ්‍ය දේ මිලයට ගැනීමට සුදුසු තැනක් බව අසා තිබිණි. එනමුත්, ප්‍රේමාට හිතට අල්ලන අයුරු රෙදිපිළි එහි

නොවූයෙන්, නැවත නේවාසිකාගාරය වෙත පැමිණ, අනික් පසට ගිය විට හමුවන උතුරු ඉන්දියානු රෙදිපිළි සාප්පු කීපයක් වෙත ගියෙමු. එහි තිබුණ කඩ දෙක තුනකින් අවශ්‍ය කරන රෙදිපිළි සහ අත් ඔරලෝසුවක් ද මිලට ගෙන දිවා ආහාරය ද ඒ වෙළඳ සංකීර්ණයේ තිබුණ ආපන ශාලාවකින් ගෙන නේවාසිකාගාරයට පැමිණියෙමු. ඉන් පසුව ප්‍රේමා නේවාසිකාගාරයේ විවේක ගනිද්දී පොඩි පුතාත් මාත් රූපවාහිනී යන්ත්‍රයක් මිල දී ගැනීමට *"සිම්ලින්"* ටවර් පිහිටි ප්‍රදේශයට ගියෙමු. එහි ඉලෙක්ට්‍රොනික හා වෙනත් එවැනි භාණ්ඩ තිබෙන සාප්පු කීපයකට ගොස් එක තැනකින් නවීන පන්නයේ අඟල් දහනවයේ රූපවාහිනී යන්ත්‍රයක් මිලයට ගතිමු. අපගේ නේවාසිකාගාරය වෙත ගෙන ඒමට කුලී රථයක් අවශ්‍ය විය.

පසු දින මුළු දවස ම කඩ සාප්පුවල ඇවිදීමට ගත කළෙමු. එදින රාත්‍රී අටට පමණ සිංගප්පූරු ගුවන් තොටුපලට ගියෙමු. අප ළඟ තිබුණ සූට් කේස් හා රූපවාහිනී යන්ත්‍රය ආදිය නිසා, ගුවන් තොටුපල ගමනට කුලී රථ දෙකක් අවශ්‍ය විය. ප්‍රේමා හා පොඩි පුතා එක රථයක පිටත් කර යවා, රූපවාහිනී යන්ත්‍රය සමඟ මම තවත් රථයක ගුවන් තොටුපලට ගියෙමි. ගුවන් තොටුපලේ දමා ගිය බඩු මල්ල ද ලබා ගෙන, ගුවන් යානයට පිවිසෙන යාන පත්‍ර ආදිය සමඟ අදාල ගේට්ටුව වෙත ගියෙමි. සිංගප්පූරු වේලාවෙන් රාත්‍රී 10.30ට පමණ ගුවන් ගමන ආරම්භ කළ අපි, ලංකාවේ වේලාවෙන් රාත්‍රී 11.45ට පමණ කටුනායකට ළඟා වූයෙමු.

අපේ ලොකුදුවගේ මහත්තයා *වසන්ත* වාහනයක් රැගෙන ගුවන් තොටුපලට පැමිණ සිටි අතර, පාන්දර දෙක පමණ වන විට තලපත්පිටියේ අපේ නිවසට පැමිණියෙමු. 1989 අගෝස්තු මැද හරියේ දී පමණ අතහැර ගිය එම නිවස අතුපතු ගා පිරිසිදු කර තිබුණ බව දක්නට ලැබිණි. අප ඒ නිවසට නැවත පැමිණියේ 1990 ජූනි මස 03වෙනි දා පාන්දර දෙකට පමණය. ලොකුදුව හා පොඩිදුව ගෙදර සිටියහ. ඒ නිසා, මා නැවත පැමිණියේ හිස් ගෙයකට යන අදහසක් ඇති වූයේ නැත.

නිවාඩු කාලයේ දී ඉටු කළ දේ

මා බෲනායි යන විට ගෙදර දමා ගිය මගේ පරණ *"බුටු සනී"* කාර් එක එහෙ මෙහෙ තිබී නැවත කවුරුන් විසින් හෝ අපේ ගෙදරට ගෙනැවිත් තිබිණි. මා නැති අවදියේ එය ලොකු දුවලාගේ ගෙදර තිබුණේ යයි සිතමි. කෙසේ වෙතත්, දැන් අවශ්‍ය ගමන් බිමන් යෑමට වාහනය තිබුණ නිසා, බොහෝ දේ කර ගැනීමට පහසු විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ගොස් කළ යුතු වූ කරුණු කීපයක් ඉටු කළෙමි. මේ වන විට *මහාචාර්ය*

එල්.ජී.එන්. පෙරේරා මහතා උපකුලපති ධූරයෙන් ඉවත් වූ පසු, *මහාචාර්ය එස්.බී. හෙට්ටිආරච්චි මහතා* උපකුලපති වශයෙන් පත් වී සිටියේය.

පොඩිදුව නේවාසිකාගාරයෙන් ඉවත් වී ගෙදර සිට, අයි.ටී.එස්. (I.T.S.) යන්නට පටන් ගත්තේය. පොඩි පුතා ගුවන් නියමු පුහුණුවට යෙදවිය යුතු විය. ඒ සඳහා දිනක් පොඩි පුතා සමඟ රත්මලාන ගුවන් තොටුපලේ පසෙක තිබූ *ඒසියන් ඒවියේෂන් සෙන්ටර්* (Asian Aviation Center) වෙත ගියෙමි. එහි දී එහි කළමනාකරු වූ *කැප්ටන් මනම්පේරි* (ගුවන් නියමුවෙකි) හමු වී විස්තර කථා කර ගතිමු. *ඉංජිනේරු වික්‍රමසිංහ* මහතා ද හමු වී යයි සිතමි. අවශ්‍ය මුදල් ගෙවා හැකි ඉක්මනින් ම පුහුණුව ආරම්භ කිරීමට පියවර ගතිමි. ලොකු පුතා ඔහුගේ මිතුරෙකු වූ *සුනිල් අබේවර්ධන මහතාට* කථා කර තිබුණේ යයි සිතමි. සුනිල් මේ ආයතනයේ අයිතිකරුය. ඔහු ලොකු පුතා සමඟ එකට පාසල් ගිය කෙනෙකි. පොඩි පුතා ප්‍රයෝජනවත් කටයුත්තක නිරත වූයේ යයි සිතුවෙමි. මේ වන විට රටේ පැවැති අවදානම් තත්ත්වය ද පහ වී ගොස් තිබුණ නිසා, බියවීමට දෙයක් නොවීය. ගුවන් නියමුවෙකු වීමේ බලාපොරොත්තුව ඉටු කර ගැනීමෙහි පොඩි පුතා නිරත විය.

මා *බෘහනායි* ගිය පසු ලොකු පුතාගේ විවාහ මංගල්‍යය සිදුවිය. ඒ නිසා, ඒ වෙනුවෙන් යමක් කළ යුතු වූ නිසා, අපි ලංකාවට පැමිණි පසු, 1990 ජූනි මාසයේ දිනක කොල්ලුපිටියේ ඩුප්ලිකේෂන් පාරේ පිහිටි අවන්හලකට ගොස් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වූයෙමු. එයට සහභාගී වූයේ ප්‍රේමා, ලොකු දුව, වසන්ත (බෑනා), ලොකු පුතා, නිර්මලා (ලේලිය), පොඩි දුව, පොඩි පුතා හා මාත් යනුවෙන් පවුලේ කීප දෙනා පමණයි. සුළු වශයෙන් හෝ ඒ යුතුකම ද ඉටු කිරීමෙන් පසුව මට යම්කිසි සැනසිල්ලක් ඇති විය. දින කීපයකට පසුව ලොකු පුතා අප කීප දෙනාට රාත්‍රී භෝජන සංග්‍රහයක් ඔහුගේ නිවසේ දී පැවැත්වීය. එදින *රෙන්ටන් අල්විස් මහතා* ද එයට සහභාගී වී සිටියේය.



ලොකුපුතාගේ විවාහ මංගල්‍යය- 16.09.1989

නැවත බෘහනායි යෑම

ලංකාවට පැමිණ ආපසු බෘහනායි යන ගමන තායිලන්තයේ බැංකොක් නුවර හරහා යෑමට සැලසුම් කර ගතිමි. බැංකොක් නුවර *තමසත් විශ්ව විද්‍යාලයේ පශ්චාත්* උපාධියකට ඉගෙන ගනිමින් සිටි *ඒ.දයාරත්න මහතා* ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යා අධ්‍යනාංශයේ සහකාර කථිකාචාර්යවරයෙකු විය. මා බැංකොක් නුවරට පැමිණි විට නැවතීමේ තැනක් සූදානම් කර දෙන ලෙස ඉල්ලා ඒ මහතාට ලිපියක් යැවීමි. එයට සතුටුදායක පිළිතුරක් ලැබිණි. ලංකාවට පැමිණි පසු උපාලි ට්‍රැවල්ස් සමාගම මඟින් බැංකොක් හරහා බෘහනායි යෑමටත් ඒ මාර්ගයේ ම ආපසු කොළඹට ඒමටත් තායි ගුවන් සේවයෙන් ටිකට් පත් ලබා ගතිමි. තායිලන්තයට ඇතුළුවීමට අවශ්‍ය වීසා බලපත්‍ර ද උපාලි ට්‍රැවල්ස් සමාගම විසින් ම ලබා දෙන ලදී.

මේ අනුව, 1990 ජූනි මස 27වැනි දින දවල් කටුනායකින් පිටත්වන තායි ගුවන් සේවයේ යානයකින් බැංකොක් බලා ගියෙමි. එහි ළඟාවන විට රෑ බෝ වෙමින් තිබිණි. ආගමන විගමන වතාවත් හමාර වී, ගමන් මල්ල ද එකතු කර ගෙන ගුවන් තොටුපල ඉදිරිපසට එන විට, දයාරත්න මහතා පැමිණ සිටියේය. ඔහු සමඟ භික්ෂූන් වහන්සේ නමක් ද සිටියේය. උන්වහන්සේ ලංකාවේ කළුතර නාගොඩ ප්‍රදේශයේ *'සිරිරතන'* නම් වූ හිමිනමකි. බොහෝ කාලයක් බැංකොක් නුවර පදිංචි ව සිටි නිසා උන්වහන්සේ හොඳ මාර්ගෝපදේශකවරයෙකු විය. *තමසන් විශ්ව විද්‍යාලය* අසල වූ නවාතැන් පලකට මා එක්කර ගෙන ගොස් එහි නවත්වා, ඒ අය පසුදින මුණගැසෙන බව සඳහන් කර පිටත් වී ගියහ.

පසු දින පෙරවරුවේ දයාරත්න මහතා මා සිටි නවාතැනට පැමිණ, කිලෝමීටරයක් පමණ දුරින් පිහිටි *තමසන් විශ්ව විද්‍යාලයට* මා එක්කර ගෙන ගියේය. එම විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට සලසා තිබෙන පහසුකම් ගැන අවබෝධයක් ලැබිණි. අසල තිබූ පොත්හලට ගොස් එහි තිබෙන නවීන පොත්පත් දැක බලා ගත්තෙමි. කළමනාකරණය පිළිබඳ මූලික පොතක් මිලයට ගතිමි. මහපාරේ අනික් පසින් පිහිටා තිබූ පැරණි බෞද්ධ විහාරයක් වෙත ගොස් වැඳ පුදාගතිමි. දයාරත්න මහතා බැංකොක් නුවර ගඟෙන් එගොඩ නිවසක තම බිරිඳ සමඟ පදිංචි ව සිටියේය. ගඟ හරහා ගමන් කිරීමට තැන් රාශියක යාත්‍රා සේවයක් තිබිණි. ඒ නිසා එගොඩ මෙගොඩ ගමන් කිරීම බැංකොක් වැසියන්ගේ සාමාන්‍ය සිරිත විය. මා නවාතැන් ගෙන සිටි ස්ථානයට සමීප නේවාසිකාගාරයක උඩු මහලේ කාමරයක පදංචි ව සිටි *ආචාර්ය උපාලි නානායක්කාර* නම් ලාංකිකයෙකු ද හමුවිය. ඒ මහතා එෆ්.ඒ.ඕ. (F.A.O.) නම් වූ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ කාර්යයක නිරත වීමට එහි පැමිණ සිටියේය.

දින දෙකක් ම බැංකොක් නගරයේ ගත කිරීමට විවේක තිබුණ නිසා, නවාතැන අවට ප්‍රදේශයේ නොයෙක් තැන්වල පා ගමනින් ඇවිද්දෙමි. රෙදි සාප්පු හා වෙළඳ සංකීර්ණ මෙන් ම බැංකොක් නුවර විශේෂයෙන් දක්නට ලැබෙන දිනෙන් දෙකෙන් ඇදුම් මසා ගැනීමට පුළුවන් ටේලර් සාප්පු සහිත කුඩා ප්‍රමාණයේ රෙදිපිළි කඩ සංකීර්ණවල ද ඇවිද බැලීමි. මා නැවතී සිටි නවාතැනේ ලිපිනය තායි භාෂාවෙන් ලියා දුන් සිරිරතන හාමුදුරුවෝ, උන්වහන්සේ සිටි පන්සලේ දුකරථන අංකය ද එහි ලියා දුන්හ. එහේ මෙහේ ඇවිද මඟ වැරදුණොත් මෙය පෙන්වා බස්රියක හෝ කුලී රියක මා සිටි තැනට පැමිණිය හැකි බව උන්වහන්සේ කියා දුන්හ. බෲනායි ගොස් ආපසු ලංකාවට යන ගමනේ දී ද බැංකොක් හරහා යන අදහස තිබුණ නිසා, රෙදිපිලි ඇදුම් ආදිය එක්රැස් කර ගැනීමට අවශ්‍ය නොවීය. එක් දිනක් බස් රථයකට නැඟී ලොකු වීදියක් තිබෙන පෙදෙසකට ගොස් ඇවිද බැලුවෙමි. එම වීදියේ කඩවල් ඉදිරිපිට පදික වේදිකාවේ කුඩා ප්‍රමාණයේ යන්ත්‍ර සූත්‍ර

තබා ගෙන යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කරන සුළු කර්මාන්තකරුවන් රාශියක් සිටින බව දුටිමි. ඒ අයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගත්තේ එහි තිබුණු ලෙකු කඩවලිනි. පදික වේදිකාවේ මේ අය එහි එහා මෙහා යන මහජනතාවට බාධාවක් වූයේ නැත.

1990 ජූනි මස 30වෙනි දා පෙරවරුවේ බැංකොක් ගුවන් තොටුපලින් පිටත් ව බෘනායි යන තායි ගුවන් සේවයේ යානයකින් *බණ්ඩාර් ශ්‍රී භගවාන්* වෙත ගියෙමි. ආගමන විගමන වතාවත් අවසන් කර ගමන් මලු එකතු කර ගෙන, පර්යන්ත ගොඩනැගිල්ලේ බිම් මහලේ තිබූ ඒවිස් (AVIS) කාර් සමාගමේ කවුන්ටරය වෙත ගොස් මගේ කාර් එක ලබා ගෙන, මා පදිංචි ව සිටි *අංගරෙක්* දෙස නිල නිවාස සංකීර්ණයේ අංක 1 දරන මහල් නිවාසයට ගියෙමි. ජූලි මස 1වැනි දින සිට නැවත *බෘනායි විශ්ව විද්‍යාලයේ* සේවය ඇරඹුවෙමි.

දෙවෙනි වර මා *බෘනායි* ගිය පසු මගේ වැඩිමහල් දරු දෙදෙනා විදේශගත වූහ. වෛද්‍යවරියකු වූ ලොකු දුව ලංකාවේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ එම්.ඩී. (M.D) උපාධිය සමත් ව සිටි අතර, වැඩිදුර පුහුණුව ලැබීමට 1990 ජූලි මාසයේ දී එංගලන්තයට ගියාය. එහි ගොස්, කලින් සකස් කර ගත් වැඩ පිළිවෙලක් අනුව, ලන්ඩන් නුවර රෝහලක පුහුණුවීම් ආරම්භ කළාය. ඇගේ සැමියා *වසන්ත* ද (මගේ බෑනා) මාස කීපයකට පසුව තම සේවා ස්ථානයෙන් නිවාඩු ලබා ගෙන එහි ගියේය. එංගලන්තයේ පුහුණුව ලබා, අයර්ලන්තයේ ඩබ්ලින් නුවර පැවැත්වූ විභාග යට පෙනී සිටි ඇය එයින් සමත් වූවාය. ලංකාවට ආපසු පැමිණියේ 1993 ජූනි මාසයේ දී ය.

හැටන් නැෂනල් බැංකුවේ සේවය කරමින් සිටි ලොකු පුතා බැංකුකරුවන්ගේ ආයතනය විසින් පවත්වන අවසාන විභාගය ද සමත් වී සිටි අතර, පරිගණක වැඩ සටහන් සම්පාදනය පිළිබඳ පරීක්ෂණයකින් ද හොඳින් සමත් වී සිටියේය. ඔහුට ඒ අංශයේ උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති වූ කැමැත්ත ඉටු කර ගැනීම පිණිස, එංගලන්තයේ *බෘනෙල් විශ්ව විද්‍යාලයට* ප්‍රවේශය ලබා ගෙන, 1990 අගෝස්තු මාසයේ දී තම බිරිඳ සමඟ එංගලන්තයට ගොස් උසස් අධ්‍යාපනය ලැබීම ආරම්භ කළේය. වසර හතරකට පසුව උපාධිය සමත් වී ලංකාවට පැමිණ, සිංගප්පූරුවේ රැකියාවක් ලබා ගෙන 1996 ජනවාරි මාසයේ සිට එහි පදිංචියට ගියේය. ඉන්පසු, 2002 දී පමණ ඕස්ට්‍රේලියාවේ *ක්වීන්ස්ලන්ත* ප්‍රාන්ත ආණ්ඩුවේ භාණ්ඩාගාරයේ රැකියාවක් ලබා ගෙන එහි පදිංචියට ගියේය.

හුදකලාව ගත කළ කාලය

බෲනායි විශ්ව විද්‍යාලයේ සේවය සඳහා දෙවන වර එහි ගිය පසු නිල නිවාසයේ මාස හයක් පමණ ගත කරන්නට සිදු වූයේ හුදකලා ව ම ය. ඊළඟ අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට පෙර විශ්ව විද්‍යාලයේ පළමුවන උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විණි. එය පැවැත්වූයේ *හසනල් බෝල්කියා* ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ දී ය. මා පදිංචි ව සිටි නිවසේ සිට එතැන ඉතා සමීප ස්ථානයක් වුවත්, නිදහසේ ගත කිරීමට අපහසු වීමට ඉඩ තිබුණ නිසා, මා එම උත්සවයට සහභාගි වූයේ නැත. එනමුත් ගෙදර සිට රූපවාහිනියෙන් ඒ සියල්ල බලා සිටියෙමි. එය වඩා සතුටුදායක විකල්පයක් වූ බව එහි ගිය සමහර දෙනා සමඟ කථාබස් කිරීමෙන් තේරුම් ගතිමි. එසේ වුවත්, එදින රාත්‍රියේ එම ස්ථානයේ පැවැති භෝජන සංග්‍රහයට සහභාගි වූයෙමි. පීටර් ඊටන් යුවල මා එහි එක්කර ගෙන ගියහ. ආහාර පාන සපයා තිබුණේ බෲනායි හෝටල් පාසල විසිනි. එහි සේවය කළ ලංකාවේ තරුණයන් ද හමු විය.

මා බෲනායි සිටිය දී දෙවරක් ම මහම්මත්තුමාගේ උපන් දින උත්සව නැරඹූවෙමි. එදින විශේෂ සිද්ධියක් වූයේ, *හසනල් බෝල්කියා සුල්තාන්වරයා* අගනුවර එක් වැදගත් ස්ථානයකින් ආරම්භ කර, නියමිත මාර්ගයක් දිගේ කිලෝමීටර් තුන හතරක් පයින් ගමන් කර, නැවත ගමන ආරම්භ කළ තැනට වෙනත් මාර්ගයකින් පැමිණීමයි. රජ පවුලේ සාමාජිකයින් ඇමතිවරුන් මෙන් ම උසස් නිලධාරීන් ද සාමාන්‍ය මහජනතාව ද සුල්තාන්වරයා සමඟ ඒ පා ගමනේ නිරත වූහ. ඒ හැම දෙනා ම ඇඳගෙන සිටියේ උත්සව අවස්ථාවල දී බෲනායි වැසියන් අඳින ජාතික ඇදුමයි. මෙම උත්සවයට සමගාමී ව සුල්තාන්වරයා දින තුනක් පමණ තම රජ මාලිගාව මහජනයා සඳහා විවෘත කරයි. ඒ දිනවල එහි පැමිණෙන සියලු දෙනාට ම ආහාරයෙන් සංග්‍රහ කරයි. පිරිමින් යන පැත්තේ රජ පවුලේ පිරිමින් ද ගැහැණුන් යන පැත්තේ රජ පවුලේ කාන්තාවන් ද එහි පැමිණෙන අය පිළිගැනීමට සිටිති. මෙය වාර්ෂික උත්සවයකි. රටේ කුමන ප්‍රදේශයක කෙනෙකුට වුව ද, අවශ්‍ය නම් කිසිම අවහිරයකින් තොර ව රජ මාලිගාවට ගොස් දැක බලා ගෙන ආහාර වේලක් භුක්ති විඳීමට අවකාශ සැලසේ.

අධ්‍යයන වර්ෂය ආරම්භ වූවාට පසුව පළමුවන වර්ෂාර්ධයේ දී, පෙර වර්ෂයේ දෙවන වර්ෂාර්ධයේ ඉගැන්වූ විෂයයන් දෙක ඉගැන්වූවෙමි. ඉන් පෙර වර්ෂයේ පාඩම් සූදානම් කර ගෙන තිබුණ නිසා දෙවෙනි වර ඉගැන්වීම වඩා පහසු විය. සුළු එකතු කිරීම් පමණක් අතරින් පතර අවශ්‍ය විය. මෙවර විකල්ප විෂයයක් වූ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ පන්තියට එක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව පෙරට වඩා වැඩි විය. ඒ ගැන අන් කථිකාචාර්යවරුන් තුළ යම් අසතුටක් ඇති වූ බව ද පෙනෙන්නට තිබිණි. සුල්තාන් වරයාගේ සොහොයුරිය

ද එම විෂයට ප්‍රවේශ වීමට මා සමඟ කථාබහ කළ නමුත්, වෙනත් විෂයයක් තෝරා ගන්නා ලෙස ඇය උනන්දු කළෙමි. සුල්තාන්වරයාගේ නැඟණිය මගේ විෂයට ඇතුළු කර ගැනීම ප්‍රතික්ෂේප කළ ආරංචිය පැතිර ගිය විට, අනික් ගුරුවරුන්ගේ "ඊර්ෂ්‍යාව" ටිකක් සමනය වනවා ඇතැ'යි කල්පනා කළ නිසාය. කුමන විශ්ව විද්‍යාලයක වුවත් ජනප්‍රිය ගුරුවරයෙක් වීම එතරම් ගුණදායක දෙයක් නොවේ. විදේශ විශ්ව විද්‍යාලයක එය භයානක වීමට ඉඩ තිබේ. එහි ගත කරන සුළු කාලය තුළ සහෝදර කථිකාචාර්යවරුන් අමනාප කර නොගෙන සිටීම වඩා යහපත් දෙයකි.

හුදකලාව කාලය ගත කිරීමට සිදු වූ නිසා, විශ්ව විද්‍යාලයේ ගත කළ කාලයෙන් බැහැර වූ අනිත් ලාංකිකයින් සමඟ ඇසුරු කිරීම වැඩි විය. ඒ අය සමහර දෙනෙක් මා මෙන් ම හුදකලාව සිටි අයයි. විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු වූ *රොඩ්නි ප්‍රනාන්දු මහතා* හා බෘනායි ගුවන් සේවයේ නිරත ව සිටි ලාංකිකයෙක් යනාදී වශයෙන් හතර පස් දෙනෙක් සති අන්තවල දී එකිනෙකාගේ නිවෙස්වල දී මුණ ගැසුණහ. බොහෝ විට මුහුදේ නෑම පිණිස *මුවාරා* (MUARA BEACH) වෙරළට ගියෙමු. ඒ අවස්ථාවල *"ජොනී වෝකර්"* ද අපේ මිතුරකු විය. ඉන්පසුව පරණ සින්දු කීපයක් ගැයීම ද විනෝදාංශයක් විය. වරක් අගනුවර පදිංචි ව සිටි ලාංකිකයින් පිරිසක් එකතු වී, *කුවාලා බෙලයිට්* ඛනිජතෙල් සමාගමේ සේවයේ නියුතු ලාංකිකයින් කණ්ඩායමක් සමඟ සති අන්තයක් ගත කිරීමට එහි ගියෙමු. ක්‍රිකට් තරගයක් ද පවත්වා, ආහාරපාන ගෙන හවස් වන විට ආපසු පැමිණියෙමු. මෙය පැය දෙක තුනක ගමනක් විය. බෘනායි රටේ ඛනිජ තෙල් කර්මාන්තය පිහිටා තිබුණේ *බෙලයිට් දිස්ත්‍රික්කයේ සෙරියා* ප්‍රදේශයේය. ඒ අසල වූ නගරය *කුවාලා බෙලයිටිය*. එහි අසල වූ ගඟ හරහා ගිය විට නැගෙනහිර මැලේසියාවේ සරවක් ප්‍රාන්තයට යා හැකිය. එනමුත් එය වෙන ම රටකි.

1982 ජනවාරි මාසයේ සිට ම මා හදවත් රෝගියෙකු වූ නිසා, *බෘනායි* ගිය පසු ද නිතිපතා ප්‍රතිකාර ලබාගත යුතු විය. ඒ නිසා, *බණ්ඩාර් ශ්‍රී භගවාන්* (බී.එස්.බී. -BSB) අගනුවර පිහිටි නවීන පන්නයේ මහ රෝහලට ගොස් ප්‍රතිකාර ලබා ගැනීමට ලියා පදිංචි වූයෙමි. මෙම රෝහල සුල්තාන්වරයාගේ අග රැජිණ නමින් ඉදිකර තිබිණි. එය RAJA ISTERI PENGIRAN ANAK SALEHA HOSPITAL නම් විය. එම රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් ද සාමාන්‍ය වෛද්‍යවරුන් ද රාශියක් සේවය කළහ. ඒ බොහෝ දෙනෙක් විදේශිකයන් වූහ. ලංකාවේ කෙනෙක් ද එහි පැමිණියේය. මාසික ව එහි සායනවලට ගියෙමි. ඒ අතරතුර දියවැඩියා රෝග යට ද ප්‍රතිකාර ලැබිණි. ඒ සියලු ප්‍රතිකාර ලැබුණේ නොමිලේය. වරක් ඇස් පරීක්ෂා කිරීමට අවශ්‍ය බව කියා එදිනට වෙනත් කෙනෙකුගේ වාහනයක

එන ලෙස දැන්වූ නිසා, මගේ මිත්‍ර *රොඩ්නි ප්‍රනාන්දු* මහතා සමඟ ගියෙමි. ඇස්වලට බෙහෙත් දමා පරීක්ෂා කළ විට, ඉර අව්වේ වාහනයක් පැදවීම ඉතා ම අසීරුය. එවැනි අවස්ථාවක උපකාරයක් ලබා ගැනීමට මව්බිමේ කෙනෙක් සිටීම කොපමණ සහනයක් ද?

දිනක් මා කාර්යාල කාමරයේ සිටින විට තදබල පපුවේ අමාරුවක් දැනිණි. සෑහෙන වේලාවක් ගත වන තුරු එය අඩු නොවූ නිසා, මගේ මේසය මත දිග ඇදී හාන්සි වූයෙමි. එදින දේශන නොතිබූ නිසා සෑහෙන වේලාවක් එසේ ගත කිරීමට හැකි විය. ක්‍රමයෙන් වේදනාව පහ වී ගියේය. මහත් සහනයක් දැනිණි. ඉන්පසු එවැනි අමාරුවක් බෲනායි සිටිය දී හැදුණේ නැත.

ආපසු ලංකාවට යෑමට කාලය එළඹෙන විට අවශ්‍ය කරන බඩුමුට්ටු කීපයක් මිලයට ගතිමි. පොඩි පුතාට කුඩා කැමරාවක් උවමනා බව දන්වා එවා තිබිණි. එහි හැඩ රුව හා විස්තර ද ලියා තිබිණි. ගඩොන් හි පිහිටි සාප්පුවකින් එය මිල දී ගතිමි. නගරයේ පිහිටි යොහාන් (YEOHAN) වෙළඳ සංකීර්ණයෙන් ලොකු සූට්කේස් එකක් හා සාමාන්‍ය තරමේ බඩු මල්ලක් ද කරේ එල්ලා ගෙන යා හැකි ප්‍රමාණයේ කුඩා බෑග් එකක් ද මිල දී ගෙන ටිකෙන් ටික ආපසු ගමනට සූදානම් වූයෙමි.



ආයුබෝවන් **UBD** 1990 දෙසැම්බර්

වර්ෂාර්ධ අවසානයේ විභාග පවත්වා උත්තර පත්‍ර ලකුණු කර භාර දුනිමි. ඒ අතරතුර විශ්ව විද්‍යාලයේ බලධාරීන් විසින් විසින් භෝජන සංග්‍රහවලට ද ආරාධනා කළහ. නියෝජ්‍ය උපකුලපතිතුමා මටත් මැලේසියාවෙන් පැමිණ සිටි කථිකාචාර්යවරයෙකුටත් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. මූල්‍යාධිකාරී *ජැනින් එරී මහතාත්* තවත් කීප දෙනෙකුත් එයට සහභාගී වූහ. අප පීඨයේ පීඨාධිපති *ආචාර්ය ක්‍රීස් නට්මන් මහතා* ද ''ඉංග්‍රීසි'' සමාජ ශාලාවක රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීය. එයට පීඨයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ සහභාගී වූහ. මේ අවස්ථා දෙකේ දී ම එම විශ්ව විද්‍යාලයේ දී මට සැලකූ ආකාරය ගැන එම බලධාරීන්ට මගේ ප්‍රණාමය පුද කළෙමි. ඉන්පසුව විශ්ව විද්‍යාලයේ සේවය නිමවා සමුගැනීමට දින දෙකතුනකට පෙර, *ආචාර්ය ක්‍රීස් නට්මන්, ආචාර්ය පීටර් ඊටන් හා ආර්. නෝල්ඩ් දෙපිකරේ* මහත්වරුන්ට ලිපි මගින් ස්තුති කළෙමි.

ලාංකික මගේ හිතවතුන් ද අවසන් කාලය තුළ භෝජන සංග්‍රහ ආදිය පැවැත්වීමෙන් මට ඔවුන්ගේ හොඳ හිත පෙන්වූහ. මේ අතරතුර, තායි ගුවන් සේවයේ බෘහස්පතින්දා ශාඛාවට ගොස් මගේ ගමනට අවශ්‍ය ආසන වෙන්කර ගැනීමාදිය කළෙමි. චාර්ටර්ඩ් බැංකුවේ තිබූ තැන්පත් මුදල් සඳහා ට්‍රැවලර් චෙක්පත් ලබා ගතිමි.

ආපසු ලංකාවට පැමිණීම

1991 ජනවාරි මස දෙවෙනි දින පස්වරු දෙකට පමණ *බණ්ඩාර ශ්‍රී භගවාන්* ගුවන් තොටුපලෙන් *බැංකොක්* බලා එන තායි ගුවන් සේවයේ යානයෙන් පිට වී එන සූදානමින් එම ගුවන් තොටුපලට පැමිණියෙමි. මා භාවිතා කළ කාර් එක ඒවීස් (AVIS) කාර් සමාගමේ නියෝජිතයාට භාර දුනිමි. ගුවන් තොටුපලට පැමිණ සිටි ලාංකික හිතමිතුරන්ගෙන් සමුගතිමි. කෙනෙක් විදේශගත වන විට ගුවන් තොටුපලට පැමිණීම එහි සිටි බොහෝ ලාංකිකයන්ගේ සිරිතක් විය. ගුවන් යානයට පිවිස ටික වේලාවකට පසුව එය ගුවන්ගත විය. අවසාන වශයෙන් බෘහස්පතින්දා රජයට ආයුබෝවන් කීවෙමි. අහස් යානයේ සිට ගන්නා ලද ඡායාරූප කීපයක් තිබුණ නමුත් දැන් ඒවා සොයා ගැනීමට නැත. ඉතිරි ව ඇත්තේ සිතේ සටහන් වූ සටහන් පමණි. ඒවා මා ජීවත්වනතුරු නොමැකී පවතිනවා ඇත.

එදින බැංකොක් ගුවන් තොටුපලින් එළියට එන විට, *දයාරත්න මහතාන්* එම මහත්මියත්, *සිරිරතන හාමුදුරුවොන්* එහි සිටියහ. ඒ අය මා කැටුව ගොස් සාමාන්‍ය ප්‍රමාණයේ හෝටලයක නවාතැන් ගැනීමට සැලසූහ. සිරිරතන හාමුදුරුවෝ ඒ අසල පන්සලක නැවතී සිටින බව කී සේක. පසුදින උන්වහන්සේ පැමිණ, මා ඇදුම් මසා ගැනීමාදිය කළ හැකි ප්‍රදේශයකට

එක්කර ගෙන ගියේය. කලිසම් කෝට් සූට් එකක් ද බුෂ් කෝට් දෙකක් හා කලිසම් ද වශයෙන් දිනකින් මසා දීමට කටයුතු කරන තැනකට භාර දුනිමි.

ඉන්පසුව දිවා ආහාරය සඳහා මහපාර අයිනේ පිහිටි නේපාල ජාතිකයෙකුගේ ආපන ශාලාවට ගියෙමු. හාමුදරුවන්ටත් මටත් ආහාර සැපයූ එම වෙළඳ මහතා, අපෙන් මුදල් අය කළේ නැත. බැංකොක් නුවර බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකට සලකන්නේ ඒ ආකාරයෙන් බව දැනගතිමි. බස්වල ගමනට උන්වහන්සේලාගෙන් මුදල් අය කරන්නේ නැත. පිණ්ඩපාතේ වඩින භික්ෂූන් වහන්සේලාට ආහාර බෙදන්නේ වෙන වෙන ම ''සිලි'' බෑග්වල අසුරාය. මුදල් ද පරිත්‍යාග කරති. ඒ නිසා, ලංකාවේ භික්ෂූන් වහන්සේ නමකට වුව ද බැංකොක් නුවර අවශ්‍ය වන්නේ නතර වීමට තැනක් පමණය. සිරිරතන හාමුදුරුවන් නතර වී සිටියේ එහි විශාල පන්සල් පරිශ්‍රයක කොනක පිහිටි කුඩා කුටියකය. තවත් ලංකාවේ හාමුදුරුවරු දෙනමක් ද තාවකාලික ව එහි වාසය කළහ. උන්වහන්සේලා ද මා ලංකාවට එන දවසේ ම එම ගුවන් යානයෙන් ලංකාවට පැමිණියහ. සිරිරතන හාමුදුරුවෝ ලංකාවේ අපට බෙහෙවින් ම උපකාර කරන බව දයාරත්න මහතාගෙන් දැනගන්නට ලැබිණි.

දින දෙක තුනක් බැංකොක් නුවර ගතකර ඇදුම් පැළඳුම් එකතු කරගෙන, 1991 ජනවාරි 6වන දින තායි ගුවන් සේවයේ යානයකින් කොළඹට පැමිණීමට ගුවන් තොටුපලට ඇවිත් බලන විට, මගේ මුදල්, චෙක්පත් හා කැමරාව තිබුණ කුඩා ගමන් මල්ල හෝටලයේ දමා ආ බව පෙනිණ. මා සමඟ සිටි හිමිනමක් වහා ම ගොස් සිරිරතන හාමුදුරුවන්ට දුරකතන පණිවිඩයක් දී බෑග් එක ගුවන් තොටුපලට ගෙන්වා ගතිමු. එහි තිබූ කිසිවක් අඩුපාඩු නැති ව තිබිණි. හෝටල් සේවකයින් එය සුරක්ෂිත ව තබා ගෙන ඇත. සිරිරතන හිමියන් හෝටලයට ගිය විගස ම උන්වහන්සේට එය දී තිබේ. උන්වහන්සේට කුලී රථයේ ගාස්තුව පමණක් මා විසින් ගෙවන ලදී. එම බෑග් එකේ රුපියල් ලක්ෂ දෙකක් පමණ වටිනා චෙක්පත් ආදිය තිබිණි. ටික දවසකට දැන හැඳිනගත් ඒ ස්වාමීන් වහන්සේ ඒ අවස්ථාවේ මා සිටි දැඩි පීඩණයෙන් මුදවා ලූ සේක. උන්වහන්සේට පිංසිදු වේවා. එදින දහවල් දොළහට පමණ කටුනායක ගුවන් තොටුපලට ළඟාවූයෙමි. පැයකින් හමාරකින් ගෙදර ගියෙමි. නැවතත් ප්‍රේමා හා දරුවන් සමග විසීමට ඉඩ ලැබිණි.

09 විශ්ව විද්‍යාල සේවය
(තුන්වන වසර අට)

ලංකාවේ දී ඉදිරි කටයුතු

බෘනායි විශ්ව විද්‍යාලයේ සේවයෙන් පසු, 1991 ජනවාරි 6වන දින ලංකාවට පැමිණි නමුත්, මගේ නිවාඩුව අවසන් වූයේ පෙබරවාරි 1වෙනි දා ය. ඒ අතරතුර කාලයේ දී කළයුතු දේ කීපයක් ම කෙරෙහි අවධානය යොමු කළෙමි. නෙදර්ලන්තයේ සිට පැමිණ මිලයට ගෙන තිබුණ ''බටු සනී'' කාර් එක දැන් බෙහෙවින් ම අබලන් වී තිබුණ නිසා, වඩා නවීන වාහනයක් සොයා ගත යුතු වී තිබිණි. ඒ සඳහා නොයෙක් ''කාර් සේල්'' තැන්වල විපරම් කර බලා, දිනක් යක්කල, ගම්පහ පාරේ පිහිටි තැනකට ගියෙමු. එහි යන විට අපගේ ඥාතියෙකු වූ *නිස්ස ජයවර්ධන මහතා* ද කැටුව යා හැකි විය. ඒ වාහන නියෝජිත ආයතනයේ ප්‍රේමාගේ ගමේ කෙනෙක් ද සේවය කළේය. එතැන තිබුණ වාහන අතරින් *''ට්‍රැඩ් සනී''* කාර් එකක් තෝරා ගෙන එය මිලට ගතිමු. පොඩි පුතා ද මේ ගමනට පැමිණියේය. අලුත් වාහනය වායු සමීකරණය ආදිය තිබුණ ''ෆුල් ඔප්ෂන්'' රථයක් විය. ඒ නිසා, ඉඩකඩ හා සැප පහසුකම් වැඩියෙන් තිබිණි. වාහනය මිලදී ගැනීමෙන් පසුව 1991 පෙබරවාරි 2-4 අතර දිනවල මහියංගණ හා මිණිපේ පෙදෙස්වල චාරිකාවක නිරත වූයෙමු.





1991 පෙබරවාරි 4 රංටැඹේ හා මිණිපේ ජලාශ අසල පොඩි පුතා, ප්‍රේමා හා මම

පොඩිපුතා 1990 ජූනි මාසයේ සිට ගුවන් නියමු පුහුණු කටයුතුවල නිරත වී සිටියේය. මා බෲනායි සිටි සමයේ රාත්‍රී කාලයේ පුහුණුව තිබුණු දිනවල, ප්‍රේමා හා පොඩි දුව රත්මලානට ගොස් ඔහු කැඳවා ගෙන පැමිණ තිබේ. සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාග සමත්වීම මේ ක්‍රියාවලියේ අවශ්‍යතම අංගයක් විය. පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රය (PRIVATE PILOTS LICENCE) ලබා ගැනීමට අදළ විභාගය සමත් ව පැය පනහක පියාසර පුහුණුව අවශ්‍ය වේ. එය සම්පූර්ණ කර වාණිජ ගුවන් නියමු බලපත්‍රය සඳහා අවශ්‍ය විභාගයට පෙනී සිටීමට 1991

නොවැම්බර් 21 දින එංගලන්තයට ගියේය. එහි ගොස් නැවතී සිටියේ ලොකු දුවගේ නිවසේය. එංගලන්තයේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පවත්වන විභාගයට පෙනී සිට එයින් සමත් වී, 1992 මැයි 10වැනි දින ආපසු ලංකාවට පැමිණියේය. සී.පී.එල් (CPL) බලපත්‍රය ලබා ගැනීමට පියාසර පැය දෙසීයක් සම්පූර්ණ කළයුතු නිසා, නැවතත් ලංකාවේ දී පුහුණුවේ නිරත විය. වසරක් පමණ ගත කිරීමෙන් පසුව, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කොට වාණිජ ගුවන් නියමු (COMMERCIAL PILOTS LICENCE) CPL) බලපත්‍රය ලබාගත්තේය.

පොඩි දුව ගෙදර සිට අයි.ටී.එස්. ආයතනයේ ඉගෙනීමට ගියාය. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව, ඇමෙරිකා එක්සත් ජනපදයේ *නැගෙනහිර කනෙක්ටිකට් විශ්ව විද්‍යාලයේ*(EASTERN CONNCETICUT STATE UNIVERSITY) උපාධි පාඨමාලාවක් හැදෑරීමට ප්‍රවේශය ලබා ගත්තාය. ඒ අනුව, 1992 සැප්තැම්බර් මාසයේ දී තවත් සිසුන් කීප දෙනෙක් සමඟ එහි ගියාය. උපාධිය සමත් වී වසරක් පමණ රැකියාවක ද නිරත ව සිට, 1995 වසරේ දී ලංකාවට පැමිණියාය.





පොඩිපුතා පියසර පුහුණු වේ

1991 පෙබරවාරි 1වෙනි දා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නැවත සේවය සඳහා වාර්තා කළෙමි. මේ වන විට රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානියා වූයේ *ආචාර්‍ය යූ.බී. රාමනායක මහතාය.* පසුව විශ්ව විද්‍යාලයේ විවිධ මණ්ඩලවල සාමාජිකත්වයට පත්වීම් ක්‍රමයෙන් ලැබිණි. පීඨයේ ස්ථිර කථිකාචාර්යවරු පීඨ මණ්ඩලයේ සාමාජිකයන් වෙති. පීඨ මණ්ඩලය විසින් මා එහි නියෝජිතයෙකු ලෙස සනාතන සභාවේ සාමාජිකත්වයට 1991 ජනවාරි 23 දින සිට අවුරුදු තුනකට වළංගු වන ලෙස තෝරා ගත්තේය. ඉන් පසුව, උපකුලපතිවරයා විසින් 1991 මාර්තු 10වන දින සිට වසර තුනකට වළංගු වන ලෙස සනාතන සභාව වෙනුවෙන් පාලක සභාවේ සාමාජිකත්වයට පත්කරන ලදී. විශ්ව විද්‍යාලයේ පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ පීඨ මණ්ඩල නියෝජිතයා ලෙස 1991 දෙසැම්බර් 17වන දින පත් කරනු ලැබීය.

අනුබද්ධ විශ්ව විද්‍යාල

මේ වන විට රජය විසින් අනුබද්ධ විශ්ව විද්‍යාල පිහිටුවීමට තීරණයක් ගෙන තිබිණි. එක්සත් ජාතික පක්ෂ රජයේ උසස් අධ්‍යාපන ඇමතිවරයා වූයේ *ඒ.සී.එස්. හමීඩ් මහතායි. මහාචාර්ය අර්පුන අළුවිහාරේ මහතා* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විය. අනුබද්ධ විශ්ව විද්‍යාල පිළිබඳ වගකීම එහි උපසභාපතිවරයා වූ *මහාචාර්ය බාලසූරිය මහතාට* පැවරී තිබිණි. අන් විශ්ව විද්‍යාල අනුබද්ධ විශ්ව විද්‍යාල (Affiliated University Colleges) ඇති කිරීමට උනන්දු නොවූ නමුත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය උද්යෝගිමත් ව එයට දායක විය. ඒ අනුව, සබරගමුව, බුත්තල, රහංගල, අනුරාධපුරය යන තැන්වල අනුබද්ධ විශ්ව විද්‍යාල ඇති කරන ලදී. ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ ආයතන සඳහා අධ්‍යක්ෂවරු පත් කරන ලදී. ඒ අනුව, උතුරු මැද අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ ලෙස *ඩබ්ලිව්.බී.දෙදාරකුඹුර මහතා* ද, සබරගමුව අනුබද්ධ විශ්ව විද්‍යාලය සඳහා *දයානන්ද සෝමසුන්දර මහතා* ද, බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලයට *මහාචාර්ය බමුණුආරච්චි මහතා* ද, රහංගල ඌව අනුබද්ධ විශ්ව විද්‍යාලය සඳහා *සුමනතිස්ස නම් වූ හිමිනමක්* ද පත් කරන ලදී. මෙම අනුබද්ධ විශ්ව විද්‍යාල සියල්ල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට සම්බන්ධ කර තිබිණි. පසු කාලයේ දී වෙනත් විශ්ව විද්‍යාලවලට අනුබද්ධ ව බස්නාහිර, අම්පාර, ත්‍රිකුණාමලය, වව්නියාව යන තැන්වල ද එවැනි ආයතන පිහිටුවන ලදී.

මෙම අනුබද්ධ විශ්ව විද්‍යාලවල වසර දෙකක ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කරන ලදී. ඒ ඒ ස්ථානවල විවිධ පාඨමාලා ඇරඹුහ. බුත්තල ආරම්භ කළේ ආහාර විද්‍යා පාඨමාලාවකි. රහංගල කෘෂි විද්‍යා පාඨමාලාවක් ද, සබරගමුවේ සංචාරක ව්‍යාපාරය සහ ගණකාධිකරණ පාඨමාලා දෙකක් ද, අනුරාධපුර රජරට අනුබද්ධ විශ්ව විද්‍යාලයේ කෘෂිවිද්‍යා පාඨමාලාවක් සහ හෝටල් කළමනාකරණ පාඨමාලාවක් ද ආරම්භ කරන ලදී. මේ එකිනෙක පාඨමාලාව සඳහා විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් අධ්‍යයන සමායෝජකවරයෙකු (Academic Coordinator) බැගින් පත් කරන ලදී. ඒ අනුව, 1991 ඔක්තෝම්බර් 1වෙනි දා සිට සබරගමුව අනුබද්ධ විශ්ව විද්‍යාලයේ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන සමායෝජක ලෙස, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් මා පත් කරන ලදී. එම පත්වීම් 1996 අප්‍රේල් 1වැනි දින දක්වා වළංගු ව පැවතිණි.

අධ්‍යයන සමායෝජක - (ACADAMIC COORDINATOR)

මෙම තනතුරට අයත් වූ කාර්ය භාරය වූයේ, අදාළ පාඨමාලාව සඳහා විෂය නිර්දේශ මාලාවක් සකස් කර, පීඨ මණ්ඩලයෙන් අනුමත කරවා ගෙන ක්‍රියාත්මක කිරීමට අනුබද්ධ විශ්ව විද්‍යාලයට පැවරීමත් ඒ පිළිබඳ ව පසු විපරම් කිරීමත් අවශ්‍ය විටක සංශෝධනාදිය කරදීමත් අවශ්‍ය කථිකාචාර්ය මණ්ඩලය බදවා ගැනීමේ දී අධ්‍යක්ෂවරයාට සහයෝගය ලබාදීමත්ය. මෙම විෂය සම්බන්ධයෙන් මට තිබුණ දැනුම අල්ප වූ නමුත්, අලුත් දෙයකට දායක වීමට ඉඩ ලැබීම නිසා එය භාර ගතිමි. මෙම පාඨමාලාව කළමනාකරණ පීඨයට පැවරුණ නිසා, මෙම පීඨයේ ම කෙනෙක් සමායෝජක තනතුරට පත්කළ යුතු විය. පීඨයේ අනික් ආචාර්යවරුන්ට ද මේ ගැන විශේෂ දැනුමක් නොවීය. මේ සඳහා සුදුස්සා මා යයි එවකට පීඨයේ බලධාරීන් නිගමනය කළ බව පෙනේ. අප විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ක්‍රිෂාන් *දෙහෙරගොඩ මහතාට* මේ පිළිබඳ ව විශේෂඥ දැනුමක් තිබුණ නිසා, මෙයට සහයෝගය දක්වන ලෙස ආරාධනා කළෙමි. ඒ මහතා ඉතා සතුටින් එය භාර ගෙන, අඛණ්ඩ ව මා සමඟ සහයෝග යෙන් කටයුතු කළේය. විෂය නිර්දේශ මාලාව මුළුමනින් ම සකස් කළේ ඒ මහතාය. *ආචාර්ය දෙහෙරගොඩ* බල්ගේරියාවේ සොෆියා විශ්ව විද්‍යාලයේ පී.එච්.ඩී. (Ph.D.) උපාධිධාරියෙකු විය. ඒ මහතාගේ විෂය ක්ෂේත්‍රය භූගෝල විද්‍යාව හා සංචාරක කර්මාන්තයයි. පසු කාලයේ දී ඩිප්ලෝමා පාඨමාලාවට සම්බන්ධ වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් එයාර් ලංකා සමාගමේ සති දෙකක පමණ පුහුණුවකට යොමු කිරීමට කටයුතු කළෙමු. එම පුහුණුව සඳහා සබරගමුව අනුබද්ධ විශ්ව විද්‍යාලය විසින් සිසුන් වෙනුවෙන් මුදල් ගෙවන ලදී. ඊළඟ වර්ෂවල සිසුන්ට ද මෙම පුහුණුව ලබා දෙන ලෙස ඉල්ලූ නමුත්, විවිධ හේතු නිසා එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි විය.

1992 ජනවාරි 3වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වයට පාලක සභාව විසින් මා පත්කරන ලදී. එය වසර තුනක කාලයක් සඳහා විය. එම වසරේ නොවැම්බර් මාසයේ දී රාමනායක මහතාගේ නිල කාලය අවසන් වූ පසු, රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධාන තනතුරට මා පත් කරනු ලැබීය. එය 1992 නොවැම්බර් 12 සිට වසර තුනක කාලයක් සඳහා විය. එනමුත්, 1994 පෙබරවාරි 16වන දින සිට එම තනතුරෙන් ඉල්ලා අස්වූයෙමි. ඒ සමඟ ම ශිෂ්‍ය උපදේශක තනතුරට පත් කරනු ලැබීය. ඒ 1994 දෙසැම්බර් 31 දින දක්වාය.

සප්ත වාර්ෂික නිවාඩුවට පසුව රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයේ සිසුන් සඳහා විෂයයන් දෙකක් ඉගැන්වූයෙමි. ප්‍රථම වර්ෂයේ සිසුන් සඳහා රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය, සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද හතරවන

වර්ෂයේ සිසුන් සඳහා සංවර්ධන පරිපාලන විෂය ද ඉගැන්වූයෙමි. මේ විෂයයන් දෙක ම අනිවාර්ය විය. රාජ්‍ය පරිපාලන විද්‍යාව විශ්ව විද්‍යාල සේවයේ ආරම්භයේ සිට ම මා ඉගැන්වූ විෂය විය. සංවර්ධන පරිපාලනය ඉගැන්වීමට භාරගත්තේ බෲනායි සිට ආපසු පැමිණි පසුය. බෲනායි විශ්ව විද්‍යාලයේ දී එම විෂය උගන්වා තිබිණි. එයට අවශ්‍ය පොත්පත් ද ගෙනවිත් තිබිණි.

උතුරු මැද පළාත් අනුබද්ධ විශ්ව විද්‍යාලය

උතුරු මැද පළාත් අනුබද්ධ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වයට, 1993 නොවැම්බර් 11 දින සිට 1995 ජනවාරි 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා *උපකුලපති ඩබ්ලිව්.බී.දෙරකුඹුර මහතා* විසින් අත්සන් තබා ඇති ලිපියක් මගින් පත් කර ඇති බව පෙනේ. මේ වකවානුවේ දී එම අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා වූයේ *මහාචාර්ය ඩබ්ලිව්.එම්.ජයරත්න මහතාය.* ඒ මහතාගේ එහි සේවය අවසන් වූ පසු, මාස තුනක කාලයක එහි වැඩ බැලීමට මා පත් කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු කර ගෙන යන අතරතුර, අනුබද්ධ විශ්ව විද්‍යාලයේ කටයුතු ද කර ගෙන ගියෙමි. බදාදා දිනවල පාන්දරින් ම නිවසෙන් පිටත් වී පෙරවරු 9.00 වන විට අනුරාධපුර යාපනය පාරේ පිහිටි අනුබද්ධ විශ්ව විද්‍යාල කාර්යාලයට ගියෙමි. එම කාර්යාලයේ සහකාර ලේඛකාධිකාරීවරයෙක් සහ ගණකාධිකාරීවරියක් මගේ සහායට සිටියහ. ලේඛකාධිකාරීවරයා *ගාමිණී ඒකනායක* නම් වූ නිකවැරටිය ප්‍රදේශයේ කෙනෙකි. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ගණකාධිකාරිනිය අනුරාධපුර ප්‍රදේශයේ ම කෙනෙකු වූවාය. අනුරාධපුරයේ සිටින විට නවාතැන් ගැනීමට ගුවන් තොටුපල පාරේ නිවාසයක් කුලියට ගෙන තිබිණි. එය සංචාරක බංගලාවක් ලෙස ද යොදා ගත්තේය. ගාමිණී නැවතී සිටියේ ද මේ නිවසේ ම ය.

මෙම අනුබද්ධ විශ්ව විද්‍යාලයේ හෝටල් කළමනාකරණය, ගණකාධිකරණය සහ කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යන ලදී. මා එහි යන විට, විභාග පැවැත්වීම පිළිබඳ ශිෂ්‍ය උද්ඝෝෂණයක් දියත් කර තිබිණි. දිනපතා ම පෙරවරු නවයේ සිට දහය දක්වා කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂකවරයාගේ කාර්යාල කාමරය ඉදිරිපිට කොරිඩෝවේ වාඩි වී, ඔවුහු සටන් පාඨ ලියූ පුවරු අතැති ව උන්හ. කෑකෝ ගැසීමක් නොවීය. ශිෂ්‍ය නායකයකු ගෙන්වා කරුණු විමසූ විට ඔහු කියා සිටියේ, වර්ෂාර්ධ විභාග අසමත් වූ අයට විශේෂ විභාගයක් පවත්වන ලෙසය. අනුබද්ධ විශ්ව විද්‍යාල අධ්‍යක්ෂකවරුන්ගේ රැස්වීමක දී ගන්නා ලද තීරණයක් නිසා එසේ විශේෂ විභාග පැවැත්වීමට නොහැකි වී

තිබිණි. කෙසේ වෙතත්, ස්ථානගත ගැටලු විසඳා ගැනීමට අදාළ අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂවරයාටත් කළමනාකරණ මණ්ඩලයටත් බලය තිබිය යුතු බව මගේ මතය විය. ඒ අනුව, කළමනාකරණ මණ්ඩලයේ මාසික රැස්වීමට මේ කාරණය ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගෙන, අදාළ විභාග පැවැත්වීමට තීරණය කළෙමි. ශිෂ්‍ය උද්ඝෝෂණය අවසන් විය. එනමුත් අනික් අනුබද්ධ විශ්ව විද්‍යාලවල අධ්‍යක්ෂවරු මේ ගැන එතරම් සතුටුවූයේ නැත.

මාස තුනක කාලයක් සතිපතා අනුරාධපුරයට ගමන් කිරීමට සිදුවිය. එහි අධ්‍යක්ෂකවරයාට වෙන්කර තිබූ වාහනයේ රියදුරු අනතුරකට භාජනය වී රිය පැදවීමට නොහැකි තත්වයක සිටියේය. ඒ නිසා, වරක් එම වාහනය රැගෙන කොළඹ පැමිණියෙමි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පැවැත්වීමට නියමිත රැස්වීමකට සහභාගී වීම සඳහා දිවා ආහාරයෙන් පසුව තලපත්පිටියේ නිවසින් පිටත්වූයෙමි. ගෙදර ඉදිරිපස ගේට්ටුවට එළියෙන් වාහනය නවතා තබා ගේට්ටුව වැසීමට පැමිණි විට, වාහනය ඉදිරියට ඇදී පාර හරහා ගොස් අනිත් පැත්තේ වත්ත ඇතුළේ ගහක හැපී නතර විය. මේ ආපදාව මිරිහානේ පොලීසියට දන්වා, පසු ව වාහනය අලුත්වැඩියා කිරීමට භාර දුනිමි. ඒ පිළිබඳ ව ක්‍රියා කළේ *ගාමිණී ඒකනායක* මහතාය.

ඉන්පසු අනුරාධපුර ගමන යන්නට සිදුවූයේ මගේ වාහනයෙන්ය. ඒ වන විට වාහනයක් ගෙන්වීමට ලැබුණු බලපත්‍රයක් මත ටොයෝටා කොරෝනා (TOYOTA CORONA) රථයක් මිළ දී ගෙන තිබිණි. ඒ සඳහා මා වෙත තිබුණ "ට්‍රැඩ් සනි" සහ "බටු සනි" යන වාහන දෙක ම විකිණීමට සිදුවිය. ට්‍රැඩ් සනියට රු: 4,10,000/= සහ බටු සනියට රු: 75,000/= ක් ලැබිණි. අලුතින් මිලයට ගත්තේ ඩීසල් වාහනයකි. මාස තුනකට පසුව අනුරාධපුර අනුබද්ධ විශ්ව විද්‍යාලයේ සේවය අවසන් කළෙමි. ඉන්පසුව, එහි අධ්‍යක්ෂ ධූරයට පත්වී ගියේ *මහාචාර්ය මැන්දිස් රෝහණාධීර මහතාය.*

බඹරදෙණියේ නැන්දම්මාගේ අභාවය

අනුරාධපුර සේවය කළ කාලය තුළ දී, බඹරදෙණියේ නැන්දම්මාගේ අභාවය සිදුවිය. ඒ නිසා, අනුරාධපුරයේ සිට මහනුවර හරහා බඹරදෙණියට ගොස් එම අවමංගල උත්සවයට සහභාගි වූයෙමි. මගේ ඥාති සහෝදරයින් වන *ධර්මසේන අයියා* සහ *ගුණතිලක මල්ලී* ද එහි පැමිණ සිටියහ. නැන්දම්මාගේ දෙවෙනි පුතා මහගෙදර පදිංචි ව සිටි නමුත්, තම මෑණියන්ගේ අවමංගලයට සහභාගී වූයේ නැත. මාත් *ධර්මසේන අයියාත්* ඔහු මුණගැසී කථා කළ නමුත්, තම මතය වෙනස් කළේ නැත. ඊට බාල පුතෙක් ද අසල නිවසක පදිංචි වී සිටි නමුත් පැමිණියේ නැත. මේ අයට තම මෑණියන්

සමඟ තිබුණ වෛරය කුමක් දැ'යි මට තේරුම් ගැනීමට බැරි විය. මෙවැනි දෙයක් මා අත්දුටුවේ මගේ ජීවිතයේ පළමුවරටයි.

කෙසේ වෙතත්, ඊට පසුව දානමය පිංකමට ද ප්‍රේමා සමඟ මම ද එහි ගියෙමි. මගේ ගැටවර වියේ දී නැන්දම්මා මට දැක්වූ දයාව, කරුණාව නිසා එතුමියගේ අවමංගල්‍යයට මෙන් ම දානයට ද සහභාගී වීමට මගේ බැඳීමක් තිබිණි'යි අදහස් කළෙමි. තව ටික කලකට පසුව බඹරදෙණියේ මාමාගේ අභාවය සිදු වී එයට ද සහභාගි වූයෙමි. බඹරදෙණියේ සම්බන්ධතාව එයින් අවසන් විය. දැනට විටින් විට හමුවන්නේ හා කථාබස් කරන්නේ කඩුගන්නාවේ පදිංචි නන්දා අක්කා සමඟ පමණි. ඇය නැන්දම්මාගේ ලොකු දුවයි. ඒ අක්කා විවාහ වී සිටියේ පොලීසියේ සේවය කළ දසනායක නම් වූ සාජන්වරයෙකු සමඟය. ඒ අයියා අභාවප්‍රාප්ත වී ඇත. නන්දා අක්කා විවාහක තම දියණිය සමඟ කඩුගන්නාවේ පදිංචි ව සිටිති. ඒ අක්කාගේ වැඩිමහල් දියණිය උසස් පෙළ විභාගයට ඉගෙන ගන්නා සමයේ දී කෙටි කාලයක් මිරිහානේ විජේසේකර මාවතේ අප නිවසේ නතර වී සිටියාය. ඇය දැන් පාසල් ගුරුවරියෙකි. දරු දෙදෙනෙක් සිටී. වැඩිමලා පුතෙකි. ඔහු දැනට දෙවෙනි වසරේ වෛද්‍ය ශිෂ්‍යයෙකු බව දැනගන්නට ලැබිණි. දුව උසස් පෙළ ඉගෙන ගනී. මෙවැනි නොයෙක් නෑදෑයින් සිටින නමුත් මුණගැසෙන්නේ ඉතා ම කලාතුරකිනි. සමහර දෙනෙක් හඳුනන්නේත් නැත.

සප්ත වාර්ෂික නිවාඩු යාන පත්‍ර

දෙවෙනි සප්ත වාර්ෂික නිවාඩුව සමඟ මට හා බිරියට ලැබිය යුතු යාන පත්‍ර කැනඩාවට ගොස් ආපසු පැමිණීමට ඉල්ලුම් කළෙමි. බෘහනායි සිට ආපසු පැමිණ කැනඩාවට යෑමට යාන පත්‍ර ලබා ගැනීමට විශ්ව විද්‍යාලයෙන් දුන් චෙක්පතක් ද රැගෙන විනිමය පාලක අනුමැතිය ලබා ගැනීමට ගිය විට, විදේශ ගතවීම සඳහා අගමැතිතුමාගේ අනුමැතිය අවශ්‍ය බව සඳහන් කළ නිසා, ඒ ගැන සොයා බැලීමි. බෘහනායි යන විට අගමැති අනුමැතිය ලබා ගැනීමට ආකෘති පත්‍ර සම්පූර්ණ කර දුන් නමුත් ඒවා අගමැති කාර්යාලයට ලැබී නැත. හේතුව විමසන විට පෙනී ගියේ, එවකට සිටි අපේ උපකුලපතිතුමා විශ්ව විද්‍යාල කාර්යාලයෙන් එය රැගෙන ගොස් ඇති නමුත් ඉන් එහාට ඒ ලිපිලේඛන ගමන් කර නැති බවය. හිත හොඳ මිනිසෙකු වූ උපකුලපතිතුමා, ඒ ලිපිලේඛන රැගෙන ගොස් තිබෙන්නේ ඉහළ ආයතනවලට ඒවා ගෙන ගොස් දී වැඩ කටයුතු ඉක්මන් කරවා ගැනීමටයි. එසේ ගෙන යන ලිපි එතුමාගේ දින පොතේ බහා ගනී. වැඩ රාජකාරී බහුල නිසා ඉන්පසුව ඒවා ගැන අමතක වේ. මගේ ලිපිවලට ද ඒ ඉරණම අත් වූ බවට අනුමාන කෙරේ. එසේ අමතක වී ප්‍රමාද වන ලිපිලේඛන කල්ගත වූ විට, ඩබ්ලිව්.පී.බී. (Waste

Paper Basket) එකට යනවා විය හැකිය. එතුමා දැනට ජීවතුන් අතර නැත. ඒ නිසා ඒවාට අත් වූ ඉරණම ගැන දැන ගැනීමට ක්‍රමයක් නැත.

කෙසේ වෙතත් යාන පත්‍ර ලබා ගැනීමට ඇති වූ බාධකය නිසා ඒ සඳහා ලැබුණු චෙක්පත ආපසු විශ්ව විද්‍යාලයට භාර දුනිමි. පසුව මම වෙනත් ගමනකට මුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටියෙමි. විශ්ව විද්‍යාලය මගේ ඉල්ලීම ප්‍රතිපාදන කොමිෂන් සභාවට යවා උපදෙස් ඉල්ලන ලදී. අවසානයේ 1995 ඔක්තෝම්බර් මස 11වෙනි දින උපකුලපති *දොරකුඹුර මහතා* විසින් මා වෙත එවන ලද ලිපියකින් දන්වා තිබුණේ, ඊළඟ සප්ත වාර්ෂික නිවාඩුවේ දී සම්පූර්ණ යාන පත්‍ර ගාස්තු ගෙවීමට පාලක සභාව තීරණය කළ බවයි. ඊට හේතුව, මට නැවත ලැබීමට නියමිත ව තිබුණ වසරකට අඩු සප්ත වාර්ෂික නිවාඩුවක් නිසා, ලැබෙන යාන පත්‍ර ගාස්තුව අඩු මුදලක් වීමයි.

බාල දරුවන්ට රැකියා සෙවීම

පොඩිපුතා - 1993 අවසානය වන විට වානිජ ගුවන් නියමු සුදුසුකම් ලබා තිබිණි. ඒ නිසා, එයට උචිත රැකියාවක් සෙවීමේ නිරත වීමු. එවකට විටින් විට *එයාර්ලංකා සමාගමේ* ගුවන් නියමු පුරප්පාඩු සඳහා සුදුසුකම් ඇති අය බඳවා ගත්හ. බඳවා ගත්තේ සීමිත සංඛ්‍යාවකි. ඉල්ලුම්කරුවන් බොහෝ දෙනෙක් වූහ. ඒ අය තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මෙන් ම පියාසර පරීක්ෂණ ද පැවැත් වේ. බොහෝ දෙනෙකුට සමාන සුදුසුකම් ඇති විට තෝරා ගැනීමේ ක්‍රියාවලියට බාහිර සාධක ද බලපෑම් ඇති කරයි. මා දන්නා හඳුනන කිසිවෙකු ගුවන් සමාගමේ හෝ ආණ්ඩුවේ ඉහළ තැන්වල නොසිටි නිසා, එම සාධක පොඩි පුතා වෙනුවෙන් ක්‍රියාත්මක නොවීය. ඒ නිසා, 1994 වසරේ දී පත්වීමක් ලබා ගැනීමට බැරි විය.

ඉන්පසුව ඉල්ලුම්පත් කැඳවූ අවස්ථාවක, ඉල්ලුම්කරුවන් හතළිස් ගණනකින් දහ අට දෙනෙක් පොරොත්තු ලැයිස්තුවකට ඇතුළත් කර, පළමුවෙන් අට දෙනෙකුට පත්වීම් ප්‍රදානය කරන ලදී. ඒ අට දෙනාගේ ලැයිස්තුවට ද පොඩි පුතා අයත් වූයේ නැත. මේ වන විට ආණ්ඩු වෙනස්වීමක් ද සිදුවී තිබිණි. 1994 එක්සත් ජාතික පක්ෂ රජය බලයෙන් පහ වී, චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මිය ජනාධිපති තරගයෙන් ජයගෙන තිබිණි. ඉන්පසුව පැවැති මහ මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන පෙරමුණ පාර්ලිමේන්තු බලය ලබා ගත්තේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගුවන් සේවා ඇමති වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් *ධර්මසිරි සේනානායක මහතා* පත්විය. එයාර් ලංකා සමාගමට ගුවන් නියමුවන් බඳවා ගැනීමේ දී ඇති වී තිබුණ අවධිමත් තත්වය නිසා, ඉල්ලුම්කරුවන් සමහර දෙනෙකුට අසාධාරණයක් සිදු වූ බව දන්වා සවිස්තරාත්මක ලිපියක් මවිසින්

ඇමතිතුමාට යවන ලදී. ඒ අතරතුර සමහර පුවත්පත් මගින් ද ඇති වූ විෂමතාවන් ගැන එළිදරව් කර තිබිණි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, කරුණු සොයා බලා, පොරොත්තු ලේඛනයේ ඇතුළත් කර සිටි අපේක්ෂකයින් වෙන ම පියාසර පරීක්ෂණයට භාජනය කරන ලදී. ඒ සඳහා එංගලන්තයෙන් ජ්‍යෙෂ්ඨ ගුවන් නියමුවෙකු ගෙන්වා ගෙන ඔහුට පරීක්ෂණය භාර දුන්නේය. එයින් පසුව තවත් කීප දෙනෙකු සමඟ පොඩි පුතාට ද 1996 ජනවාරි මාසයේ දී ආධුනික ගුවන් නියමු පත්වීමක් ලැබිණි. ඒ කාලයේ *එයාර් ලංකා සමාගමේ* තිබුණේ (LOCKHEED TRI STAR) *ලොක්හීඩ් යානාය.* එහි දෙවෙනි නිලධාරීන් (Second Officer) ලෙස අලුතෙන් බඳවා ගන්නා අය පුහුණු කළහ. ඒ පුහුණුව සාර්ථක ව සම්පූර්ණ කරන අයට දෙවෙනි නිලධාරී පත්වීමක් ලැබිණි. 1996 වර්ෂයේ සැප්තැම්බර් 4වෙනි දා පොඩි පුතාට ද එවැනි පත්වීමක් ලැබිණි. කලකට පසුව ඔහු, පළමුවැනි නිලධාරී (First Officer) තනතුරට උසස් විය.

මේ අතරතුර *ට්‍රයිස්ටාර්* යානා වෙනුවට *එයාර් බස්* 320, 330 හා 340 යානා ශ්‍රීලන්කන් ගුවන් සමාගමට මිලයට ගෙන, ට්‍රයිස්ටාර් යානා විකුණා දමන ලදී. ඒ යානා සඳහා පුහුණු වී, 320 යානාවල ටික කලක් සේවය කොට, 330 හා 340 යානාවල සේවයට උසස්වීම් ලබා ගත්තේය. දැනට වසර කීපයක සිට ඒ යානාවල (Captain) කපිතාන්වරයෙකු ලෙස සේවය කරයි. පොඩි පුතා බලාපොරොත්තු වූ ආකාරයේ රැකියාවක් ලැබීම ගැන අපි කවුරුත් සතුටු වෙමු. ආරම්භයේ දී පියාසර පුහුණුවට යොදවන සමයේ දී ප්‍රේමා එතරම් සතුටක් දැක්වූයේ නැති නමුත්, පසු කාලයේ දී ඇය ද පොඩි පුතා ගැන තිබූ බිය ඉවත් කර ගත්තාය. ඒ ඔහු දක්ෂ ගුවන් නියමුවකු බව ආරංචි වීම නිසාය.

පොඩි දුව - ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉගෙනීමෙන් පසුව, 1995 වසරේ දී ආපසු ලංකාවට පැමිණියාය. ටික දිනක් රැකියාවක් නැති ව සිටි නිසා, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ගුණපාල නානායක්කාර මහතා මගින් එහි රැකියාවකට සම්බන්ධ කළෙමි. කලක් එහි සේවය කරන අතරතුර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මාණ්ඩලික තනතුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කර, එහි පත්වීමක් ලබා ගත්තාය. එහි විදේශ සම්බන්ධතා ඇති ශාඛාවක සේවයට සම්බන්ධ වී (Re- Insurance) ප්‍රතිරක්ෂණය ගැන විශේෂ දැනුමක් ලබා ගත්තාය. ඒ දැනුම මත පසු කාලයේ දී *යූනියන් ඇෂුවරන්ස් සමාගමේ* සේවයට බැඳුණාය. දැනට එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක් දරන්නීය.

ලොකු දුව සහ ලොකු පුතා

ලොකු දුව - පශ්චාත් උපාධි පුහුණුව සඳහා එංගලන්තයට ගිය ලොකු දුව, අදාළ විභාග ආදිය සමත් වී වසරක් පමණ එහි රෝහලක සේවයේ නිරත ව සිටියාය. 1987 දෙසැම්බර් මාසයේ දී විවාපත් වූයේ නමුත්, දරු සම්පතක් ලැබුණේ එංගලන්තයේ සිටිය දී ය. 1993 අප්‍රේල් මස 14වැනි දින උපන් කුළුඳුල් දරුවා ද සමඟ ජූනි මාසයේ මුල දී ලංකාවට පැමිණියාය. සේවා ස්ථානය ලෙස ලැබුණේ *පානදුර* රෝහලය. ඒ නිසා දිනපතා තලපත්පිටියේ අප නිවසේ සිට පානදුරේ රෝහලේ සේවයට ගියාය. බිළිඳු දරුවා බලාකියා ගැනීමට කෙනෙකු සොයා ගන්නා තුරු අපේ ගෙදර නැවතී සිටියේ දිවා කාලයේ දී ප්‍රේමා ගෙදර සිටි නිසාය. පළමු මුණුබුරා රැක බලා ගැනීම ඇයට ද සතුටට කරුණක් විය. ටික කලකට පසුව සේවිකාවක් සොයා ගත් පසු, නාවල සේනානායක මාවතේ වසන්තගේ (බෑණාගේ) නිවසේ පදිංචි වූහ. අවුරුද්දක් පමණ පානදුරේ සේවය කළ පසුව රාගම රෝහලට මාරුවීමක් ලැබිණි.

1994 නොවැම්බර් 14වන දින දෙවෙනි දරු උපතත් සිදුවිය. ඒ කුඩා දියණියකි. ඇය රැක බලා ගැනීමේ දී ද ප්‍රේමාගේ සහාය අවශ්‍ය විය. පුතාගේ වැඩ කටයුතු සේවිකාව ඉටුකළ නමුත්, බිළිඳු දියණිය ප්‍රේමාට භාර දී ලොකු දුව රැකියාවට ගියාය. මේ අවධියේ දී අප පදිංචි ව සිටියේ 1992 වසරේ දී මිලයට ගත් මැනිං ටවුන් නිවාස සංකීර්ණයේ නිවසකය. ඒ නිසා, ලොකුදුවට වැඩට යන ගමන් බිළිඳු දියණිය එහි ගෙනැවිත් තම මැණියන්ට භාර දී යා හැකි විය. නිවාස සංවර්ධන අධිකාරිය විසින් මැනිං ටවුමේ ඉදිකරන ලද නිවාස විකිණීමට කටයුතු කරන බව පුවත්පත් මගින් දැන ගෙන, බෘහස්පතින් ගොස් උපයා ගත් මුදලින් මේ නිවස මිලට ගතිමු. දැනට එම නිවසේ පොඩි දුව පදිංචි වී සිටී.

1996 අග දී ලොකු දුව ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූවාය. වසන්ත හා දරු දෙදෙනා ද සමඟ එහි ගොස් මෙල්බර්න් නුවර අසල බොක්ස්හිල් නම් වූ ප්‍රදේශයේ රෝහලක රැකියාවක් ලබා ගත්තාය. වසර දෙකක් පමණ ඒ අසල නිවසක් කුලියට ගෙන පදිංචි ව සිට, පසුව *මවුන්ට් වෙවර්ලි* නම් පෙදෙසේ නිවසක් මිලයට ගෙන එහි පදිංචියට ගියහ. ඒ රටේ කුලී ගෙයක පදිංචි ව සිටිනවාට වඩා බැංකු ණයක් ලබා ගෙන නිවසක් මිල දී ගැනීම වඩා යහපත් වන්නේ, මාසික ව ගෙවිය යුතු බැංකු ණය මුදලත් ගෙවල් කුලියත් අතර ලොකු වෙනසක් නැති නිසාය. බැංකු ණය ගෙවා අවසන් වූ විට තමන්ට නිවස ද ඉතිරි ව තිබේ.



පරම්පරා තුනක් - චන්ද්‍රා, නිර්මලා, දිනීත්, ප්‍රේමා, සචිනි, ලොකු දුව, මම සහ පොඩිපුතා තලපත්පිටියේ දී

ඕස්ට්‍රේලියාවේ විශේෂඥ තනතුරක් ලැබීමට එහි විභාග සමත් විය යුතුවේ. එම විභාග සමත්වීමෙන් පසුව, 2000 අගෝස්තු මාසයේ *ක්වීන්ස්ලන්ත ප්‍රාන්තයේ බ්‍රිස්බේන්* නුවර අසල රෝහලක තනතුරක් ලැබී එහි ගියහ. මේ වන විට දරු දෙදෙනා පාසල් යමින් සිටි අතර, *බ්‍රිස්බේන්* ගොස් *ස්ප්‍රින්ග්වුඩ්* නම් ප්‍රදේශයේ නිවසක් කුලියට ගෙන පදිංචි වූහ. එයට තුදුරින් පිහිටි *ජෝන් පෝල්* නම් වූ විද්‍යාලයට දරු දෙදෙනා ඇතුළු කළහ. එම ක්‍රියාවලියේ දී ඒ දෙදෙනා *මවුන්ට් වෙවර්ලි* පාසලේ සිටි පන්තියට වඩා ඉහළ පන්තියට ඇතුළු කළ නිසා, දෙදෙනාට ම වසර බැගින් වාසියක් ලැබිණි. මාස කීපයකට පසුව *එයිට් මයිල් ප්ලේන්ස්* නම් වූ පෙදෙසින් නිවසක් මිලයට ගෙන එහි පදිංචියට ගියහ. ඉන්පසුව දරු දෙදෙනාගේ පාසල් ද මාරු කළහ. දැනට දරු දෙදෙනා විශ්ව විද්‍යාලවල සිසුන්ය. පුතා තුන්වෙනි වසරේය. දියණිය ප්‍රථම වසරේය. ලොකු දුව ද තම සේවා ස්ථානය මාරු කර දැන් දෙවෙනි *එලිසබෙත් රැජින* නමින් වූ රෝහලක සේවය කරන්නීය.

ඉහතින් සඳහන් කර ඇති පරිදි ලොකු පුතා ද දැනට *බ්‍රිස්බේන් නුවර* පදිංචි ව සිටී. කලින් කුලී නිවසක පදිංචි ව සිටි නමුත් පසුව නිවසක් මිලයට ගෙන තිබේ. එම නිවසට 2011 දෙසැම්බර් මාසයේ පැවැති ගංවතුරෙන් හානි

වූ නිසා, මේ වන විට එය මුළුමනින් ම අලුත්වැඩියා කර ගෙන නැවත එහි පදිංචියට ගොස් ඇත. වැඩිමහල් දරු දෙදෙනාගේ තොරතුරු සඳහන් කිරීමේ දී වසර ගණනක් ඉදිරියට ගිය නමුත් නැවතත් 1995ට ආපසු යා යුතුව ඇත.





1995 සිංහල අවුරුද්ද තලපත්පිටියේ දී



සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

1994 වර්ෂයේ දේශපාලන වෙනස්වීම් නිසා, සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා ලෙස *සාලිය මැතිව් මහතා* පත්කර සිටියේය. එම වර්ෂයේ ජනාධිපතිවරණය හා මහමැතිවරණය පැවැති සමයේ දී, *සාලිය මැතිව් මහතා* හමු වී දැන හැඳින ගෙන සිටියෙමි. එවකට සාමාජිකයින් හත් දෙනෙකුගෙන් පමණ සමන්විත වූ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කර, සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් නව කොමිෂන් සභාවක් පත් කළේය. මා එහි සභාපතිවරයා ලෙස පත් කරන ලදී. *මානවඩු* නම් වූ නීතීඥ මහතා හා විශ්‍රාමික නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරයෙකු වූ *වික්ටර් පෙරේරා* නම් මහතෙක් අනික් සාමාජිකයින් දෙදෙනා වූහ. ආණ්ඩුකාරවරයා ඉදිරියේ විධිමත් ව දිවුරුම් දී අපි රාජකාරී ආරම්භ කළෙමු. කොමිෂන් සභාවේ කටයුතු මෙහෙය වූ නිලධාරීන් වූයේ, එහි ලේකම් *ඇන්ඩෘ ජයමාන්න* සහ සහකාර ලේකම් *ප්‍රංචිනිලමේ* යන මහතුන් දෙදෙනායි. ඒ අයගෙන් අපට සහයෝගය ලැබිණි. සතිපතා රැස්වීම් පවත්වා කොමිෂන් සභාවට ඉදිරිපත් වූ කරුණු සම්බන්ධ ව ක්‍රියා කළෙමු.

මේ අතරතුර සේවයෙන් ඉවත් කරන ලද කොමිෂන් සභා සාමාජිකයින් නඩු මඟට ගොස් මූලික අයිතිවාසිකම් පෙත්සමක් අභියාචනාධිකරණයට ඉදිරිපත් කළහ. එවකට අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුතුමා වූයේ සරත් නන්ද සිල්වා මහතාය. තවත් සාමාජිකයින් දෙදෙනෙකුගෙන් යුත් විනිසුරු මඬුල්ලක් ඉදිරියේ මේ කාරණය විභාගයට ගෙන, දින කීපයක් ම උසාවියට යෑමට සිදුවිය. නීතීඥ *මානවඩු* මහතා හඳුනන *සෙනෙවිරත්න* නම් ජනාධිපති නීතීඥයෙකු අප වෙනුවෙන් පෙනී සිටි අතර, ජනාධිපති නීතීඥ *ආර්.කේ.ඩබ්ලිව්. ගුණසේකර මහතා* පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියේය. සේවයෙන් ඉවත් කර තිබූ *ගුණසේකර* නම් වූ සභාපතිවරයා මෙම නීතීඥවරයාගේ සහෝදරයෙක් යැ'යි කියනු ලැබීය. 1996 මැද භාගය වන විට පෙත්සම්කරුවන්ගේ වාසියට තීන්දුව ලැබිණි. ඉන්පසුව, අප එහි සේවයට ගියේ නැත. නව කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට කැමැති දැ'යි ආණ්ඩුකාරතුමා මගෙන් විමසූ නමුත් මා එයට කැමති වූයේ නැත. එයින් ඒ අත්දැකීම අවසන් විය. එනමුත්, ජීවිතයේ පළමුවරට ඉහළ උසාවියකට ගොස් විනිසුරුතුමන්ලාගේත් නීතීඥයින්ගේත් කටයුතු ගැන සුළු වශයෙන් හෝ දැනගන්නට ලැබීම මෙයින් ඇති වූ වාසියක් විය.



සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දිවිරුම් දීම





නීතීඥ මානවඩු මහතා,මම, ආන්ඩුකාර සාලිය මැතිව් මහතා සහ වික්ටර් පෙරේරා මහතා. (1995 ජූනි 2)

හදවත් සැත්කම

1982 ජනවාරි මාසයේ දී මට හෘදරෝගයක් වැළඳී කොළඹ ජාතික රෝහලේ හෘද රෝග අංශයෙන් ප්‍රතිකාර ලබා ගතිමි. රෝහලින් පිටවන විට නිකුත්කර තිබෙන රෝග නිගමන පතේ සඳහන් වී ඇති පරිදි මා රෝහලට ඇතුළු කර තිබෙන්නේ ජනවාරි මස 23වැනි දා ය. පිට කළ දිනය 1982 ජනවාරි 30දා ය. එක් සෙනසුරාදා දිනක දිවා ආහාරයට පසුව බලවත් ලෙස දාඩිය වැටීමට පටන් ගෙන, පපුව කැක්කුමක් ද ඇති විය. ඒ නිසා, අසල නිවසක තිබූ වාහනයකින් කොළඹ මහ රෝහලට රැගෙන ආවේ ප්‍රේමා විසිනි. ලොකු දුව මේ අවදියේ සේවය කරමින් සිටියේ කොළඹ ජාතික රෝහලේ සීමාවාසික සේවයේය. පළමුවෙන් ම දැඩි සත්කාර ඒකකයට ඇතුළු කර, ඉන්පසු පියවරෙන් පියවර රෝගය සුව අතට හැරෙන විට සාමාන්‍ය වාට්ටුවට මාරු කරන ලදී. එහි රාත්‍රී කාලයේ දී මා සමඟ නැවතී සිටියේ ලොකු පුතාය.

මට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා වූයේ හෘද රෝග විශේෂඥ *වාලුපිල්ලේ දොස්තර මහතාය. උපුල් විජේවර්ධන* සහ *අතුකෝරාළ* යන විශේෂඥ වෛද්‍යවරු දෙදෙනා එවකට සේවය කළේ වාලුපිල්ලේ දොස්තර මහතාගේ සහායකයින් ලෙසය. එනමුත් අතුකෝරාළ දොස්තර මහතා අන් වෛද්‍යවරුන් සමඟ වාට්ටු සවාරියට පැමිණියේ නැත. *රෝහිණී කරුණානායක මෙනෙවිය* දැඩි සත්කාර ඒකකයේ සේවය කළ වෛද්‍යවරියයි. එතුමිය දැනට මහනුවර මහ රෝහලේ හෘද රෝග අංශය භාර ප්‍රධාන වෛද්‍යවරිය වන අතර, ඒ ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් ඇත්තේ *රෝහිණී නෙන්නකෝන්* නමිනි. ලොකුදුව හොඳින් දන්නා හඳුනන කෙනෙකි, *වෛද්‍ය රුවන් ඒකනායක* මහතා එවකට *වාලුපිල්ලේ* දොස්තර මහතාගේ රෙජිස්ට්‍රාර්වරයා ලෙස සේවය කළේය. ඒ මහතා ද මා සායනවලට ගිය විට ප්‍රතිකාර ලබා දුන්නේ ය.

මෙම හදවත් රෝගය නිසා මාස තුනක් පමණ විවේකයක් ගත කිරීමට සිදුවිය. මේ කාලය තුළ දී පොඩි දුව අප ළිඳෙන් වතුර ඇද මා නෑවූ බව මතකය. අප ළිදේ වතුර හිඟවන විට අසල නිවාසයක ලිඳකින් දියනෑමට ප්‍රේමා මා එක්කර ගෙන ගියාය. එම නිවසේ පදිංචි ව සිටියේ මිරිහාන පොලීසියේ සේවය කළ නිලධාරියෙකු හා ඔහුගේ මැණියන්ය. 1983 ජූලි කලබල සමයේ ඒ අයට කරදර විඳීමට සිදුවිය. ඉන්පසුව එම නිවස ක්‍රිස්තියානි පල්ලියක් සේ යොදා ගැනීමට දී තිබේ. ඒ යහපත් මිනිස්සු නැවත මුණගැසුණේ නැත.

රෝහල් ගතවීමට තරම් හදවත් රෝගය දැඩි වූයේ 1982 වසරේ දී වුවත්, එහි ඉතිහාසය ඊට එහා යන බව දැන් මට කල්පනා වේ. 1978 වර්ෂයේ මා *නෙදර්ලන්තයේ* සිටිය දී දැඩි ලෙස පපුවේ අමාරුවක් සෑදී දින තුන

හතරක් නවාතැනේ මගේ කාමරයේ විවේක ගත් බව මතක් වේ. ඒ අසල සිටි වෛද්‍යවරයෙකුගෙන් සුළු ප්‍රතිකාරයක් ලබා ගත් නමුත්, රෝහල්ගත විය යුතු හදවත් රෝගයක් ලෙස එවකට සැලකුවේ නැත. එසේ, පසු කාලයේ දී දැනගන්නට ලැබුණු අන්දමට, එවර මට තිබුණු රෝග ලක්ෂණ අනුව එය ද සුළු ප්‍රමාණයේ හදවත් රෝගයක් වී යයි සිතමි. එය යටපත් වී තිබී වසර හතරකට පසුව බලවත් ලෙස මතු වන්නට ඇත. ඒ කාලයේ මම නිතර දුම්පානය කරන්නෙකු ද වීමි. ඒ විෂමාචාරය මෙයට බෙහෙවින් ම බලපාන්නට ඇත. ඉන්පසුව දුම්පානය කරන කෙනෙක් අසලවත් ඉන්නවාට මා කැමති නැත. එහෙත්, හදවත් රෝගයක් සමඟ ජීවත්වීමට සිදුවිය. නිතර සායනවලට ගොස් ප්‍රතිකාර ලබා ගතිමි. 1984 නොවැම්බර් 9වැනි දින නැවත වරක් මෙම රෝගය නිසා රෝහල්ගත වීමි. එවර රෝහලෙන් පිට වී ඇත්තේ නොවැම්බර් 21වෙනි දා ය. රෝග නිශ්චය පතේ සඳහන් කර තිබෙන්නේ, "Ischeamic Heart Disease" නිසා රෝහල්ගත කළ බවයි.

මගේ සාමාන්‍ය රාජකාරී ඉටු කළ නමුත්, ක්‍රමයෙන් හදවත් රෝගය නරක අතට හැරෙන නිසා, 1995 අගෝස්තු මාසයේ දී පමණ නවලෝක රෝහලේ හදවත් සැත්කම් සඳහා එංගලන්තයේ සිට පැමිණ සිටි *කුලතිලක* නම් වූ ලාංකික ශල්‍ය වෛද්‍යවරයා වෙත ලොකුදුව විසින් මා එක්කර ගෙන යන ලදී. ඒ වන විට ජාතික රෝහලේ හෘද රෝග අංශයේ වෛද්‍ය ශාන්තරාජ් විසින් ගන්නා ලද ඇන්ජියෝග්‍රම් (Angiogram) රූප පටියක් ද රැගෙන ගියෙමු. මෙය කුඩා ප්‍රමාණයේ සිනමා පටයක් වැනි දෙයකි. මගේ ඉකිලියේ නහරයක් තුළට කම්බියක් වැනි දෙයක් ඇතුළු කර එය හදවත දක්වා යවා හෘදය වස්තුවේ අවහිර වී ඇති තැන් යන්ත්‍රයක උපකාරයෙන් සිනමා පටයක් වැනි දෙයක සටහන් කර ගන්නා ලදී. කුලතිලක දොස්තර මහතාට මෙය පෙන්වා සාකච්ඡා කරන විට, වසර දහතුනක් පමණ බෙහෙත්වලින් මෙම රෝගය පාලනය කර ගෙන සිටි නිසා, ශල්‍ය කර්මයක් අවශ්‍ය මක්නිසා දැ'යි විමසූ විට එතුමාගේ පිළිතුර වූයේ, සැත්කමක් නොකළොත් මට ජීවත්විය හැකි ව තිබුණේ තවත් එක් වසරක් පමණක් බවයි. සැත්කමක් කළොත් වසර දහයක්වත් ජීවත් වීමට පුළුවන. මේ නිසා, හදවත් සැත්කමක් කිරීමට තීරණය කළෙමු. එහෙත්, *කුලතිලක මහතා* ආපසු එංගලන්තයට යන නිසා එතුමාට එය කළ නොහැකි නමුත්, එතුමාගේ ද ගුරුවරයා වූ *හෙඩ්ලි බ්‍රවුන්* නම් දොස්තර කෙනෙක් ලංකාවට එන බව කීවේය. එම වෛද්‍යවරයා ලවා සැත්කම කරවා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කළෙමු.

එවකට නවලෝක රෝහලේ හදවත් සැත්කමක් සඳහා රුපියල් 299,000/= අය කළේය. මෙයට රෝහලේ දින දාහතරක නැවතීමේ හා වෛද්‍යවරුන්ගේ ගාස්තු අයත් විය. ලොකු දුව මේ වියදම දැරීමට සූදානම් ව සිටි නමුත්, ජනාධිපති අරමුදලෙන් ආධාරයක් ලබා ගැනීමට ඉල්ලීමක්

කළෙමි. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙන් රුපියල් ලක්ෂයක් ලබා ගත හැකි විය. ඒ නිසා, ජනාධිපති අරමුදලෙන් ලබාගත යුතු වූයේ රු: 1,75,000/= ක් පමණකි. රු: 25,000/= ක් මා විසින් දැරීමට පුළුවන් බව සඳහන් කළෙමි. ජනාධිපති අරමුදලින් ගෙවීම අනුමත කිරීමට පෙර කොළඹ ජාතික රෝහලෙන් මෙම සැත්කම කර ගැනීමට ඇති හැකියාව ගැන ජනාධිපති කාර්යාලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විමසන ලදී. එවකට ජාතික රෝහලේ ද හදවත් සැත්කම් අරඹා තිබුණ නිසා, මෙය උභතෝකෝටික ප්‍රශ්නයක් විය. මගේ මිත්‍ර *සවිමන් උරුගොඩවත්ත මහතා* මා සමඟ එවකට නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිණිය වූ *පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය* වෙත ගොස් කාරණය පැහැදිලි කළ විට, අමාත්‍යාංශයේ ලේකම්වරයා ව සිටි ඩඩ්ලි දිසානායක මහතා හමුවන ලෙස කීවාය. නවලෝක රෝහලේ දී මෙම සැත්කම සිදුකිරීම ගැන සෞඛ්‍ය අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නැති බව සඳහන් කොට එතුමා ජනාධිපති කාර්යාලයට ලිපියක් සකසා මා අතට දුන්නේය. ජනාධිපති කාර්යාලයේ ගණකාධිකාරීවරයෙක් ද උරුගොඩවත්ත මහතාගේ අසල්වැසියෙකි. ආධාර මුදල ජනාධිපති අරමුදලෙන් ගෙවීමට ජනාධිපතිවරිය විසින් ම අනුමත කළ යුතු වේ. මූලික අවශ්‍යතාවන් සම්පූර්ණ ව තිබුණ නිසා, ජනාධිපති අනුමැතිය ද ලැබිණි. ඉන්පසුව මා ඉල්ලන ලද මුදල නවලෝක රෝහලට ගෙවීමට සූදානම් බව දන්වන ලිපියක් එම රෝහල වෙත යවන ලදී. ඊ.ටී.එෆ්. අරමුදලින් ලැබෙන මුදල සම්බන්ධ ව ද එවැනි ලිපියක් රෝහල වෙත යවා තිබිණි. ඉතිරි මුදල මවිසින් ගෙවා ශල්‍යකර්මයට අවශ්‍ය වියදම පියවීමි.

ශල්‍ය වෛද්‍ය *හෙඩ්ලි බ්‍රවුන්* (Dr. Headley Brown) *මහතා* ලංකාවට පැමිණි පසු, එතුමා හමු වී සැත්කම ගැන කථා කළෙමු. සැත්කමට මාසයකට පෙර මා විසින් අනුගමනය කළ යුතු වැඩපිලිවෙල වෛද්‍යවරයා විසින් නියම කරන ලදී. සීනි, ලුණු, පිටි ආහාර වර්ග (බත් ඇතුළුව) වැළැකී සිටිය යුතු විය. ඒ නිසා ඒ මාසය තුළ මගේ ආහාරය වූයේ, තම්බන ලද එළවළු හා මාළු පමණයි. තේ පානයෙන් වැළැකී සිටියෙමි. තැම්බූ එළවළු හා මාළුවලට ලුණු දැම්මේ නැත. දින දෙක තුනක් ගත වන විට මේ ආහාරයට පුරුදු වූයෙමි. ඒ නිසා, ලේවල සීනි ප්‍රමාණය පහළ වැටිණි. රුධිර පීඩනය පාලනය විය.

ශල්‍ය කර්මය සඳහා 1995 නොවැම්බර් මස 8වන දින රෝහල් ගතවීමි. එදින සවස්වන විට නිර්විඳ්දන වෛද්‍ය *අනිල් පෙරේරා මහතා* මා වෙත පැමිණ, සියලු තොරතුරු විමසීය. පසුදින පාන්දරින් ම රෝහල් සේවකයෙකු විසින් මා සැත්කමට සූදානම් කරන ලදී. 1995 නොවැම්බර් 9වැනි දා, බ්‍රහස්පතින්දා, පෙරවරුවේ මා ශල්‍යාගාරයට ගෙන යන ලදී. එහි දී *නිර්විඳ්දන වෛද්‍ය අනිල් පෙරේරා* මහතා මා සමඟ කථා කරමින් ම බෙහෙත් එන්නත් කළේය. තත්පර කීපයකින් නින්ද ගියේය. නැවත මා

අවදි වන විට සිටියේ දැඩි සත්කාර ඒකකයේ ඇඳක් මතය. පපු පෙදෙසට පැලැස්තර දමා තිබිණි. හදවතට මහත් සැහැල්ලු බවක් දැනිණි. අසල සිටි හෙදි නිලධාරිනියක් පැවසූ අන්දමට, මගේ සැත්කමට පැය හතරක් පහක් ගත වන්නට ඇත. ඒ නිසා, මා අවදි වන්නට ඇත්තේ පැය හතක්වත් ගතවීමෙන් පසුව විය හැකිය. අවදි වී පැය කීපයක් ගතවන තුරු තුවාල ගැන දැනීමක් නොවීය. දින දෙක තුනකට පසු දැඩි සත්කාර ඒකකයේ සිට සාමාන්‍ය කාමරයකට මාරු කරන ලදී. රෝහලෙන් පිටත් කර තිබෙන්නේ නොවැම්බර් 19වැනි දා ය. ඒ යන විට නිකුත් කරන ලද රෝග නිශ්චය පතේ සඳහන් වන්නේ මෙසේය:

"Coronary Artery Bypass Grafting x 6 done on 09/11/95

LMA LAD x D1 (Sequential Grafts)

RIMA Distal ® Coronary

Vein OM1 Om2, Om3 (Sequential Grafts)

Dr. H. Brown FRCS, MS

Dr. A. Perera FFARCS

මාසයකට පසුව සායනයට පැමිණියෙමි. ඒ වන විට හදවත් රෝග යට අදාළ ලෙඩුක් සුවයට පත්වී තිබිණි. ගමන් බිමන් යන විට දැනුණ පපුවේ කැක්කුම් කිසිවක් ඉන් පසුව දැනුණේ නැත. මේ ලියන විට (2012 මැයි මාසයේ) සැත්කමෙන් පසුව වසර දහසයක් ගත වී තිබේ. ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ යම් අපහසුවක් ඇතත්, පපුවේ කැක්කුම් වේදනා ආදියක් මේ වනතුරු දැනුණේ නැත. මෙම සැත්කමට භාජනය වන විට විශ්ව විද්‍යාල සේවයේ වසර විසිපහක් සම්පූර්ණ කර තිබිණි. රජයේ සේවයේ වසර දහහතරක් සහ සංස්ථාවක වසර පහක් ද වශයෙන් මේ සියල්ල එකතු කළ විට වසර හතළිස් හතර හමාරක මහජන සේවයේ නිරත වී සිට ඇත. ඒ වන විට මගේ වයස අවුරුදු හැට දෙක හමාරක් විය.



හදවත් සැත්කමෙන් පසුව සවිනි හා දිනීත් සමග මැනිං ටවුමේදී



නිර්මලා සහ ලොකුපුතා සමග මැනිං ටවුමේදී 1995

සරත් ගාමිණී ඒකනායක

අයියාගේ පුතෙකු වූ *සරත් ගාමිණී ඒකනායක* පුතාගේ විවාහ මංගල්‍යයට ප්‍රේමාත්, මාත්, පොඩි පුතාත්, සහභාගි වූයෙමු. එම උත්සවය පැවැත්වූයේ මහනුවර රතුකුරුස සංගම් ශාලාවේ දී ය. පොඩි පුතා දෙවන මනමාලයා විය. සරත්ගේ මනමාලිය වූයේ උපාධාරී පාසල් ගුරුවරියක වූ *නෙරංජලාය*. සරත් පුතා ද උපාධාරී ගුරුවරයෙකු විය. සේවය කළේ තෙල්දෙණිය ගම්ඉම බණ්ඩාරනායක මහා විද්‍යාලයේය. *නෙරංජලා දුව* තෙල්දෙණියේ වෙනත් පාසලක සේවය කර, දැනට දෙදෙනා ම ගම්ඉම පාසලේ සේවය කරති. සරත් එහි විදුහල්පතිය. පාසල් ගුරු නිවාසයේ පදිංචි ව සිටිති. මේ දෙදෙනා අපට කළ උදව් උපකාර ගැන ඊළඟ පරිච්ඡේදයේ සඳහන් ව තිබේ.

මේ දෙදෙනාගේ දියණිය, *ශෂී ප්‍රභා මිණිබිරිය* දැන් උසස් පෙළ විභාගයට සූදානම් වන්නීය. කාලය කොපමණ ඉක්මණින් ගෙවී යනවා ද?



පොඩිපුතා සරත්ගේ දෙවෙනි මනමාලයා ලෙසට

තුන්වෙනි සප්ත වාර්ෂික නිවාඩුව

හදවත් සැත්කමෙන් පසුව කොළඹ මැනිං ටවුමේ මංගල පාත්හි පිහිටි 'එස්' (S) තට්ටු නිවාස සංකීර්ණයේ බිම් මහලේ පිහිටි අංක 6 දරන (B/S/G.6) නිවසේ පදිංචි ව සිටියෙමු. මෙම නිවස 1992 වසරේ දී නිවාස සංවර්ධන අධිකාරියෙන් මවිසින් මිල දී ගෙන තිබිණි. ප්‍රේමාත්, මාත්, පොඩිදුවත්, පොඩි පුතාත් මෙහි නිවැසියන් වූයෙමු. පොඩි දුවට මේ වන විට පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ තාවකාලික තනතුරක් ලැබී තිබිණි. පොඩි පුතා එයාර්ලංකා සමාගමේ ආධුනික ගුවන් නියමු පුහුණුවට සම්බන්ධ වී සිටියේය.

මේ වන විට *සබරගමුව විශ්ව විද්‍යාලය* ස්ථාපිත කර තිබිණි. එහි උපකුලපති මා මිත්‍ර *දයානන්ද සෝමසුන්දර මහතා* දිනක් මගේ නිවසට පැමිණ, එම විශ්ව විද්‍යාලයේ කටයුතුවලට සම්බන්ධ වන ලෙස ඉල්ලා සිටියේය. ඌව පළාත් අනුබද්ධ විශ්ව විද්‍යාලය හා බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාල පිළිවෙලින් කෘෂි විද්‍යා පීඨයක් හා ව්‍යවහාරික විද්‍යා පීඨයක් වශයෙන් පිහිටුවා ඌව මණ්ඩපය යටතේ ඒකාබද්ධ කිරීමට යෝජිත බවත් එහි මණ්ඩපාධිපති වශයෙන් මා පත් කළ හැකි බවත් කීවේය. සැත්කම සිදුකර එතරම් කලක් ගත වී නොතිබුණ නමුත්, මෙය අලුත් අත්දැකීමක් විය හැකි නිසාත් නොබෝ දිනකින් තුන්වෙනි වරට සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමට සුදුසුකම් ලබන නිසාත් මේ යෝජනාව එම නිවාඩුව ඵලදායක ව යොදා ගැනීමට අවස්ථාවක් විය හැකි නිසාත් *සෝමසුන්දර මහතාගේ* ඉල්ලීමට එකඟ වුණෙමි.

ඌව මණ්ඩපාධිපති තනතුර

1996 ජනවාරි 1වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මා ඌව මණ්ඩපයේ මණ්ඩාධිපති ලෙස පත්කරන ලදී. ඌව අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂකවරයාගේ නිලරථය මගේ පරිහරණයට ලැබිණි. බොරලන්දේ *(රහංගල)* පිහිටි නිල නිවාසය මගේ පදිංචියට ලැබිණි. නිල රථයට රියැදුරෙක් සිටි නිසා, එතරම් වෙහෙසක් නොමැති ව ගමන් බිමන්වල නිරත වීමට හැකි විය. මා එහි යන විට කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් අතර, සහකාර මූල්‍යාධිකාරී *නාගහපිටිය මහතා*, ප්‍රධාන ලිපිකරු *මැන්දිස් මහතා*, ගබඩා *නිලධාරී ජයසුන්දර මහතා*, යතුරු ලේඛිකා *නන්දනී මෙනෙවිය*, ඉංග්‍රීසි යතුරු ලේඛිකා *පද්මා මෙනෙවිය*, කථිකාචාර්යවරුන් වූ *අමරසිංහ යුවල*, *අනිල් අබේරත්න මහතා*, *ප්‍රබෝද් ඉලුක්පිටිය මහතා*, *සමරජීව මහතා*, ඉංග්‍රීසි උපදේශක *ධර්මසේන මහතා* හා *පණ්ඩිතරත්න මහතා* ද වූහ. *දඹවින්න මහතා* කෘෂි ඕවර්සියර්වරයා විය. ඔහු යටතේ කම්කරු කාන්තාවන් හත් අට

දෙනෙක් සේවය කළහ. නිල රථයේ රියැදුරු වූයේ *කුලසිරි* නම් අයෙකි. කාර්යාල සේවකයාගේ නම මට දැන් මතක නැත. එනමුත්, ඔහු ඉතා ම කීකරු නිහඬ කෙනෙකු විය. නිල නිවසේ සේවකයෙක් මා යන විට සිටි නමුත්, ඔහු මා යටතේ සේවය කිරීමට කැමැත්තක් නොදැක්වූ බව පෙනිණි. ටික දිනකින් ඔහු සේවයෙන් ඉවත් විය. ඉන්පසුව බෙලිහුල්ඔය ප්‍රදේශයේ කෙනෙකු වූ *කිරිමුදියන්සේ* නිල නිවාසයේ සේවය සඳහා ගෙන්වා ගතිමි. ඔහු මගේ ආහාර පානාදිය සැලකිලිමත් ව සකස් කර දී, නිවසේ කටයුතු හොඳින් කර ගෙන ගියේය. ඌව අනුබද්ධ විශ්ව විද්‍යාලය යටතේ සංචාරක නිවාසයක් ද විය. එහි සේවකයා වූයේ *බණ්ඩාර* නම් කෙනෙකි.

පුස්තකාලයේ කටයුතු භාර ව සිටියේ *පෙරේරා* නම් වූ අයෙකි. ඔහුගේ ප්‍රධාන කාර්යය ලෙස ඔහු සැලකුවේ වෘත්තීය සමිති කටයුතු කිරීම බව පෙනී ගියේය. කෘෂි විද්‍යා අංශයේ සහායකයෙක් සිටියේය. ඔහු සේවකයින් අතර මෙන් ම ගමේ අය අතර ද හොඳ හිතක් ගොඩ නඟා ගෙන සිටි බව පෙනිණි. ගමේ පන්සලේ පිංකම්වල දී ද ඒවාට සහභාගී විය.

මණ්ඩපාධිපති වශයෙන් පත්වීම ලැබුණ පසුව, එහි සේවය සඳහා නිවාඩු ලබා ගත යුතු ව තිබිණි දෙවන සප්ත වාර්ෂික නිවාඩුවෙන් පසුව සේවයට පැමිණි වසර පහක් සම්පූර්ණ වන්නේ 1996 පෙබරවාරි මාසයේ දී ය. ඉන් පසුව අනුපාතික ව මාස අටක නිවාඩු ගැනීමට හිමිකම ලැබේ. විශ්ව විද්‍යාලයේ නිවාඩු කාලවල දී විවේක නිවාඩු ලබා ගත හැකි වේ. ඒ නිසා, මා පළමුවෙන් ම කළේ විවේක නිවාඩු ඉල්ලීමයි. මෙය 1996 පෙබරවාරි 22 දින ලිපියක් මගින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා විසින් අනුමත කර තිබිණි. එම විවේක නිවාඩුව 1996 මැයි දක්වා වළංගු විය. විටින් විට විශ්ව විද්‍යාලයේ නිවාඩු කාලය දීර්ඝ වූ අතර, 1996 අගෝස්තු 1වැනි දින සිට මාස අටක සප්ත වාර්ෂික නිවාඩුව අනුමත කරන ලදී. ඒ නිසා, 1997 මාර්තු අවසානය දක්වා මණ්ඩාධිපති තනතුර දැරීමට හැකි විය. 1996 අගෝස්තු 1 සිට මණ්ඩාධිපති තනතුරේ වසර තුනක් සඳහා පත් කළ අතර, එතෙක් එම පත්වීම වැඩ බැලීම සඳහා විය. මේ අතරතුර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් බුත්තල හා ඌව අනුබද්ධ විශ්ව විද්‍යාලවල අධ්‍යක්ෂ තනතුරේ කටයුතු ඉටුකිරීමට ද පත් කරන ලදී. නීතිමය අවශ්‍යතාවක් සඳහා එසේ පත් කිරීමට සිදුවිය. ඒ අතරතුර, එම අනුබද්ධ විශ්ව විද්‍යාලවල කටයුතු ඇවර කර, ඒවා සබරගමුව විශ්ව විද්‍යාලයේ ඌව මණ්ඩපයේ පීඨ බවට පරිවර්තනය කිරීමට ක්‍රියා කළ යුතුවිය.

මා බොරලන්දට යන විට එම අනුබද්ධ විශ්ව විද්‍යාලයේ කටයුතු ආවරණය කළේ සබරගමුව විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා විසිනි. ඒ නිසා, ඒ කටයුතු මට භාර දීමේ දී ගැටලුවක් පැණ නැඟුණේ නැත. එනමුත්,

බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලයේ වෙන ම අධ්‍යක්ෂවරයෙක් හා කාර්ය මණ්ඩලයක් සිටි නිසා, වෙනස්වීම් සිදු කිරීමේ දී දුෂ්කර තත්වයක් පැන නැඟිණි.

බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ මහාචාර්යවරයෙකු වූ *ආතර් බමුණුආරච්චි මහතා* බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂකවරයා විය. එතුමාගේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වරයෙක් හා සහකාරී මූල්‍යාධිකාරීවරයෙක් ද සහිත අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් ද වූහ. මෙම අනුබද්ධ විශ්ව විද්‍යාලයේ *ආහාර විද්‍යාව* හා *ඉංග්‍රීසි* යන පාඨමාලා දෙකක් විය. ආහාර විද්‍යා පාඨමාලාව ඉතා උසස් අන්දමින් පැවැති බව පෙනිණි. එයට හේතුව, *බමුණු ආරච්චි මහාචාර්යවරයා* එම විෂය පිළිබඳ විශේෂඥයෙකු වූ නිසාය. එසේ වුවත්, පරිපාලනය සාර්ථක ව සිදුවූ බවක් පෙනෙන්නට තිබුණේ නැත. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා තම සිතැඟි පරිදි දෛනික කටයුතු කර ගෙන ගිය බව පෙනිණි. මේ අය සිකුරාදා දිනයේ සති අන්තයට පිටත් ව ගොස් ආපසු පැමිණියේ සඳුදා හෝ අඟහරුවාදාය. කාර්ය මණ්ඩලයට නිසි මඟ පෙන්වීමක් නොවීය. ඒ නිසා, පළමුවෙන් ම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා සහ සහකාර මූල්‍යාධිකාරිවරයා මාරු කර යවා, ඒ කටයුතු රහංගල කාර්යාලයේ අදාල නිලධාරීන්ට පැවරිය යුතු විය. බුත්තල සිටි කථිකාචාර්යවරයෙකුට එදිනෙදා පාලනය පවරා, නිතර බුත්තලට ගොස් කටයුතු මෙහෙයවීමට පියවර ගතිමි.

ඉන් පසුව ව්‍යවහාරික විද්‍යා පීඨයට අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගතිමු. ඒ අනුව, ඒ ඒ විෂයයන්ට මහාචාර්යවරුන් හා කථිකාචාර්යවරුන් බඳවා ගෙන පීඨාධිපතිවරයෙකු තෝරා ගතිමු. ව්‍යවහාරික විද්‍යා පීඨයේ ප්‍රථම පීඨාධිපතිවරයා ලෙස *මහින්ද රූපසිංහ මහතා* පත් කළෙමු. ඒ මහතා මහනුවර මූලික පර්යේෂණ ආයතනයේ සේවය කළ කෙනෙකි. ඉන්පසුව බුත්තල වැඩ කටයුතු ගැන එතරම් සොයා බැලීමක් අවශ්‍ය නොවීය. එනමුත් මේ කටයුතු සපුරා ගැනීමට මාස හත අටක් ගත කිරීමට සිදුවිය. කෘෂිකර්ම විද්‍යා පීඨය සඳහා අවශ්‍ය මහාචාර්යවරයෙක් සහ කථිකාචාර්ය මණ්ඩලයක් තෝරා පත් කර ගතිමු. මේ සඳහා ද මාස කීපයක් ගත විය. *මහාචාර්ය ජයසේකර* මහතා කෘෂිකර්ම විද්‍යා පීඨයේ පීඨාධිපති වශයෙන් පත් කොට, එහි කටයුතු ඒ පීඨාධිපතිවරයාට පැවරීමෙන් පසු මට මණ්ඩාධිපති තනතුරේ කටයුතු කර ගෙන යෑමට ඉඩ ලැබිණි. එම පීඨාධිපතිවරයා පත් කරන තුරු එහි කටයුතු ආවරණය කිරීම ද මට පැවරිණි.

විවිධ දුෂ්කරතා

අනුබද්ධ විශ්ව විද්‍යාල යටතේ මෙම පාඨමාලාවල ඉගෙන ගනිමින් සිටි සිසුහු, නොයෙක් අඩුපාඩුකම් නිසා නිතර උද්ඝෝෂණවල නිරත වූහ. රහංගල සිසුන් හැම ගොඩනැඟිල්ලක ම පෝස්ටර් අලවා නොයෙක් ඉල්ලීම් ඉදිරිපත් කළහ. මෙම පෝස්ටර් ව්‍යාපාරය නිසා, ඒ අයට පෝස්ටර් ගැසීමට පුවරු කීපයක් ඉදිකර දී, තම ව්‍යාපාරය එයට සීමා කරන ලෙස උපදෙස් දුනිමි. සියලු ගොඩනැඟිලිවල බිත්තිවල පෝස්ටර් ඇලවීමෙන් සිසුන්ට මහජන අප්‍රසාදය එල්ල වන බව ද ඒ අයට කීවෙමි. අබලන් වී තිබුණ බිත්ති සියල්ල අලුතෙන් පින්තාරු කරවීමි. මේ පියවර නිසා, පෝස්ටර් ගැසීම ඉදිකර දුන් පුවරුවලට සීමාවිය. වරක් ඒ අයට කීවේ මා පෝස්ටර් කැලෑවක සිට පැමිණි කෙනෙක් නිසා, ඒවායින් බියපත් නොවන බවයි. ක්‍රමයෙන් අන්‍යෝන්‍ය අවබෝධය ගොඩනැඟුණි. පසුව සිසුන් සමඟ ගනුදෙනු කිරීම අපහසු නොවීය. බුත්තල සිසුහු ද නොයෙක් ආකාරයේ ඉල්ලීම් ඉදිරිපත් කළහ. ඒවාට සතුටුදායක විසඳුම් ලබා දුන් පසු සතුටුදායක වාතාවරණයක් පවත්වා ගෙන යා හැකි විය.

නේවාසිකාගාර පහසුකම් කිසිවක් සලසන්නේ නැති ව පවත්වා ගෙන ගිය අනුබද්ධ විශ්ව විද්‍යාල පීඨ බවට පරිවර්තනය කරන විට, වෙනත් සාම්ප්‍රදායික විශ්ව විද්‍යාලවල පවතින පහසුකම් සියල්ල තමන්ටත් ලබා දෙන ලෙස සිසුහු උද්ඝෝෂණය කරති. මෙම උද්ඝෝෂණ පැන නැඟීමට පෙර හැකි තරම් දුරට විසඳුම් ලබා දීම පාලනය භාර අපගේ වගකීම වන්නේය. මෙම මතය පසු බිමේ තබා ගෙන, රහංගල හා බුත්තල පීඨවලට අලුතෙන් ප්‍රවේශ වන සිසුන්ට හැකි තරම් දුරට නේවාසිකාගාර පහසුකම් ලබා දීමට පියවර ගතිමි. මේ ප්‍රදේශවල විකල්ප පහසුකම් දුර්ලභවීම නිසා මෙය අත්‍යවශ්‍ය දෙයක් විය. මේ සඳහා වූ මගේ යෝජනා සබරගමුව විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා හා පාලක සභාව විසින් නිරන්තරයෙන් ම අනුමත කළහ.

භෞතික සම්පත් වර්ධනය කිරීම මෙන් ම මානව සම්පත් වර්ධනය ද බෙහෙවින් ම වැදගත් විය. විවිධ අංශවලට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මෙන් ම සේවයේ නිරත ව සිටි අයගේ අවශ්‍යතා ද සපුරාලිය යුතු විය. රහංගල අනුබද්ධ විශ්ව විද්‍යාල ගොවිපලේ බොහෝ කලක් සේවය කළ කාන්තාවන් දහ දොළොස් දෙනෙක් වූහ. ඒ අය සමහර දෙනෙක් විශ්‍රාම යන කාලයට සමීප වී උන්හ. එනමුත්, ඔව්හු තවමත් දෛනික වැටුප් මත සේවයේ යෙදී සිටියහ. එහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ සේවයට පැමිණි දිනවලට පමණක් වේතන ලැබීමත් නිවාඩු හිමිකම් ආදිය නොලැබීමත්ය. ඒ නිසා, 1996 නොවැම්බර් මාසයේ දී මා විසින් පාලක සභාවට ඉදිරිපත්

කළ නිර්දේශයක් මඟින් මේ කම්කරුවන් මාසික වැටුපට පරිවර්තනය කිරීම අනුමත විය. මින් පෙර නිසි කෙනෙක් මෙම අසරණ සේවිකාවන් ගැන අවධානය යොමු කර තිබුණේ නැත.

අනුබද්ධ විශ්ව විද්‍යාලයේ තාවකාලික පදනම යටතේ සේවය කළ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ සේවය නතර වන තැනට කරුණු යෙදී තිබිණි. විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්ය සේවයට බඳවා ගැනීමේ දී ඒ අයට ද ඉල්ලුම් කරන ලෙස උපදෙස් දී, තේරීම් මණ්ඩලවල දී කරුණු ඉදිරිපත් කර එම අසහනය ඉවත් කළෙමි. යම් යම් පුරප්පාඩුවලට සේවකයින් බඳවා ගැනීමේ දී සේවයේ සිටි අයගේ ඉල්ලීම් අනුව යම් යම් අය සේවයට බඳවා ගැනීමට නිර්දේශ කර අනුමත කරවා ගතිමි. මෙසේ පුස්තකාලයේ සේවයට බඳවා ගත් තරුණියක්, පසු කාලයේ දී කථිකාචාර්යවරයෙකු සමඟ විවාහ පත්විය. දැන් ඒ අය විදේශගත වී සිටිති. තවත් කෙනෙකුගේ ඥාතියෙක් බුත්තල සංචාරක නිවාස භාරකරු ලෙස බඳවා ගෙන ඇත. ඔහු ඉවුම් පිහුම් හොඳින් දන්නා බව කී නිසාත්, විශ්ව විද්‍යාලය මඟින් ඒ ගැන පරීක්ෂණයකට භාජනය කර පත්වීමක් දෙන ලදී. කාර්යාල සේවකයෙකුගේ බිරිඳක් කාර්යාල සේවිකාවක් ලෙස යොදවා සිටී. මේ අය හැම දෙනා ම මූලික අවශ්‍යතාවලටත් වඩා සුදුසුකම් තිබූ අයවෙති. ඔවුන් දැනටත් හොඳින් සේවයේ නිරත වී සිටින බව දැනගන්නට ඇත.

1996 ජනවාරි 1 සිට 1997 මාර්තු 25 දින දක්වා *උඟව මණ්ඩපයේ මණ්ඩාධිපති* ලෙස කටයුතු කළෙමි. මේ අතරතුර 1996 මාර්තු 8වන දින සිට 21වන දින දක්වා සබරගමුව විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ රාජකාරී ආවරණය කිරීමට පත් කරන ලදී. මාසික ව පාලක සභාවේ රැස්වීම්වලට බෙලිහුල්ඔයට හෝ රැස්වීම් පවත්වන වෙනත් තැනකට ගමන් කිරීමට සිදුවිය. වරක් කොළඹ කොල්ලුපිටියේ රේණුකා හෝටලයේ දී පාලක සභා රැස්වීමක් පවත්වන ලදී. තවත් වරක හෝර්ටන් තැන්නේ *"ෆාර්ඉන්"* (FAR INN) හෝටලයේ දී රැස්වීමක් පැවැත්විණි. පාලක සභාවේ සාමාජිකයින්ට රහංගල දැක බලාගැනීමට සැලැස්වීම පිණිස හෝර්ටන් තැන්නේ රැස්වීම් යෝජනා කළේ මා විසිනි. මෙය රහංගල පැවැති දුෂ්කරතාව පාලක සභා සාමාජිකයන්ට පෙන්වීමේ උපක්‍රමයක් විය. රහංගල මා සේවය කළ කාලය තුළ සති අන්තයට සතිපතා ම කොළඹ ගෙදර පැමිණියෙමි. ආපසු යන අතරතුර සමහර විට උඩවලව පාරේ බුත්තලට ගියෙමි. බුත්තල වැඩ කටයුතු පීඨාධිපතිවරයාට පවරන තුරු සතියකට වරක්වත් එහි ගියෙමි.

වරක් කොළඹ සිට රහංගල යන ගමන ගියේ ගිනිගත්හේන, හැටන්, නුවරඑළිය, හරහාය. හැටන් පසුකර කොටගල සමීපයට එන විට පෙරවරු අටට පමණ වන්නට ඇත. ඒ වකවානුවේ මාසයක පමණ කාලයක් තුළ වල්ගා තරුවක් ලංකාවට ඉහළින් දිනපතා ගමන් කළේය. කොටගලින් යන

විට ඉතා පැහැදිලි ව වල්ගා තරුව දිස්විය. විනාඩි පහක් හයක් පමණ එය ඉහළ අහසේ ගමන් කරනවා දුටිමි. එය විශේෂ අත්දැකීමක් විය.

අයියාගේ ලොකු පුතා, *ජී.බී. ඒකනායක* හදිසි අනතුරක් නිසා අභාවප්‍රාප්ත වූයේ මේ අවදියේය. අවමඟුලට සහභාගි වීමට ප්‍රේමාත් මාත් පල්ලේවෙලට ගොස් දින දෙකතුනක් ගතකළෙමු. මේ පුතාට ඒ වනවිට වයස අවුරුදු 47ක් පමණ විය. දරු තිදෙනෙකුගේ පියෙකු විය. *පෝටාලේ* දී 1950 නිව්මෝනියාව හැදී සිටියේ මේ දරුවාය.

මේ යුගයේ බලය බෙදීම පිළිබඳ ව එවකට පැවැති රජයේ යෝජනා ගැන දේශන පැවැත්වීම සඳහා හැටන්, නුවරඑළිය, බදුල්ල, හම්බන්තොට, කෑගල්ල, කුරුවිට යන ස්ථානවල පාසල්වලට සහ රජයේ නිලධාරීන්ගේ රැස්වීම්වලට විටින් විට ගියෙමි.

උඟව මණ්ඩපාධිපති තනතුරේ රාජකාරී අවසන් කොට, 1997 මාර්තු 26 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ සේවය සඳහා වාර්තා කර තිබේ. එම මාර්තු 26වෙනි දා මගේ හැට හතරවෙනි උපන් දිනය විය. තවත් වසරක් විශ්ව විද්‍යාල සේවයේ නිරත ව සිටිය හැකි විය. රහංගලින් ආපසු පැමිණියේ එම අවශ්‍යතාව ඉටු කිරීමටයි. නැත්නම් විශ්‍රාම යනතුරු ම රහංගල සේවය කළ හැකි ව තිබිණි.

මා රහංගල සේවය කරන අවධියේ පවුලේ සාමාජිකයන් විටින් විට එහි පැමිණියහ. විටින් විට ප්‍රේමා මා සමඟ එහි ගොස් නැවතී සිටියාය. මා කොළඹ පැමිණ රහංගල යන විට ලොකු දුව තම දරු දෙදෙනාත් සමඟ රහංගල ගොස් ටික දිනක් ගත කළාය. ඒ අතරතුර වසන්ත ද එහි පැමිණියේය. වසන්ත පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිටිය දී දන්නා හඳුනන කථිකාචාර්යවරයෙක් ද දේශන සඳහා එහි පැමිණ සිට මුණගැසුණි. පොඩි දුවගේ විවාහයට පෙර ප්‍රේමා සහ චන්ද්‍රා නංගී හා තිස්ස ජයවර්ධන සහෝදරයාත් වරක් රහංගලට පැමිණ දින කීපයත් ගත කළහ. ආපසු යන ගමනේ දී මාත් සමඟ ගොස් අතරමඟ දී බඹරකන්ද ඇල්ල දැක බලා ගැනීමට ගියෙමු. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති තනතුර දැරූ, මගේ ගුරුවරයෙකු වූ, *මහාචාර්ය සිරිසේන නිලකරත්න මහතා* සිය පවුල (බිරිඳ හා දරු දෙදෙනා) සමඟ පැමිණ සංචාරක නිවාසයේ නතර වී හෝර්ටන් තැන්න බැලීමට ද ගියහ.



ප්‍රේමාත් මාත්
හෝර්ටන් තැන්න
මුදුනේ



රහංගල නිල
නිවස ඉදිරි පිට



හපුතලේ එඩිසන්
බංගලාව ඉදිරි පිට

මා හුදකලාව සිටින දිනවල සමහර විට හෝර්ටන් තැන්නේ *ෆාර් ඉන්* දක්වා ගොස් ආපසු පැමිණියෙමි. මගේ නිල නිවසේ සිට වාහනයකින් හෝර්ටන් තැන්නට යෑමට ගතවූයේ විනාඩි හතළිස් පහක් පමණය. එහි සිටිය දී දිනපතා ම පාහේ *ඔහිය* පාරේ කිලෝමීටර් දෙක තුනක් කන්දේ ඉහළට ඇවිද ගියෙමි. හදවත් සැත්කමක් කළ කෙනෙකුට එය ඉතා හොඳ ව්‍යායාමයක් විය. රහංගල සිට නුවරඑළියට යෑමට ගතවූයේ පැයක පමණ කාලයකි. ඒ නිසා, අප්‍රේල් සමයේ දී අතරින් පතර එහි ද ගියෙමි. හෝර්ටන් තැන්නේ පාලක සභා රැස්වීම් පැවැත්වුණු දින, එය අවසන් වී අප කීප දෙනෙක් නුවරඑළියට ගොස්, සබරගමුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු වූ *අයගම විජිත හිමියන්ගේ නිවසේ* දී රාත්‍රී භෝජන සංග්‍රහයක් ද භුක්ති විඳ ආපසු පැමිණියෙමු. මේ හිමියෝ ජපන් නිකායක පැවිදි වූ කෙනෙකි.

උෆව මංඩපයේ මෙහෙය නිමවා ආපසු එන්නට සූදානම් වන විට රහංගල හා බුත්තල කර්ය මණ්ඩල සමුදීමේ සංග්‍රහ පැවැත්වූහ. රහංගල කාර්ය මණ්ඩලය විශාල පිත්තල පහනක් තෑගි දුන්හ. ගොවිපලේ සේවිකාවන් පිත්තල මල් බදුන් දෙකක් තෑගි කළහ. බුත්තල කාර්ය මණ්ඩලයේ තෑග්ග වූයේ විශාල පිත්තල බිත්ති සැරසිල්ලකි. දැඩි පාලකයෙකු ලෙස හඳුන්වනු ලැබ සිටි මට මේවා බෙහෙවින් ම අගය කළ හැකි දේවල් විය.

පොඩිදුවගේ විවාහ මංගල්‍යය



පොඩි දුවගේ විවාහ මංගල්‍යය - 23.05.1997

මගේ පොඩිදුවගේ විවාහ මංගල්‍යයය 1997 මැයි මාසයේ 23 දින කොළඹ කොල්ලුපිටියේ *ශෂකාවා ශාලාවේ දී* සිදු කරන ලදී. පොඩිදුව විවාහ වූයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ සේවය කළ *ප්‍රියන්ත ප්‍රේමකුමාර* නම් තරුණයෙකු සමගය. මේ කටයුත්ත යෝජනා වූවාට පසුව, ප්‍රියන්තගේ දෙමව්පියන් මැනින් ටවුමේ අප නිවසට පැමිණ අවසන් තීරණයකට එළඹෙන ලදී. ඒ වනවිට ඕස්ට්‍රේලියාවට ගොස් සිටි ලොකුදුව සහ සිංගප්පූරුවට ගොස් සිටි ලොකුපුතා මෙම උත්සවයට සහභාගි වීමට පැමිණියහ. කුඩා *සවිනි* මල් කුමාරිය වූවාය. *දිනිත්* Page Boy විය. *නෙලා* නංගිගේ දියණිය දෙවෙනි මනමාලිය වූවාය. මගේ නෑදෑයින් අතර, ගුණතිලක මල්ලී, පද්මා නංගී, ඒ අයගේ පුතුන් දෙදෙනා, දියනිය හා ලේලියක් ද අනුලා දුව හා අබේරත්න පුතා ද වූහ. ප්‍රේමාගේ නෑදෑයින් අතර අක්කා නංගිලා දෙන්නා කුඩම්මලාගේ දරුවන් වන මේජර් ජනරාල් ගැමුණු කුලතුංග, පාලිත කුලතුංග, බ්‍රිගේඩියර් ලක්ෂමන් රාසපුත්‍ර, කීර්ති රාසපුත්‍ර ඇතුළු බොහෝ දෙනෙක් මෙම උත්සවයට සහභාගි වූහ. සරත් පුතා සහ නෙරංජලා දුවත් පැමිණි බව මතකය.

පොඩි දුවලා විවාහ වීමෙන් පසුව මැනින් ටවුමේ අප නිවසේ පදිංචි වීමට හැකි වුවද, මත්තේගොඩ නිවසක් කුලියට ගෙන එහි පදිංචියට ගියහ. විවාහයෙන් පසුව ස්වාධීන ව පවුලක් ගොඩනැඟීමට ඒ දෙදෙනා පියවර ගත යුතු බව අත්දැකීමෙන් ම දැන සිටි නිසා, ඒ අය වැළැක්වූයේ නැත.

ප්‍රියන්ත බෑනා පසු කාලයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහකාර ලේකම් තනතුරකට පත්ව, චීන රජයේ ශිෂ්‍යත්වයක් මත *වුහාන් විශ්ව විද්‍යාලයෙන්* ආචාර්ය උපාධියක් ලබා, දැනට එම කොමිෂන් සභාවේ අතිරේක ලෙකම්වරයෙකු මෙන් සේවයේ නිරත ව සිටී.

විශ්‍රාම පූර්ව සේවය හා විශ්‍රාම ගැනීම

තුන්වන සප්ත වාර්ෂික නිවාඩුව අවසන් කර නැවත රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයේ සේවයට පැමිණි පසු, තවත් එක් අධ්‍යයන වර්ෂයක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වූයෙමි. ඒ වසරේ ප්‍රථම වර්ෂයේ සිසුන් සඳහා ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් රාජ්‍ය පරිපාලන විද්‍යා මූලිකාංග විෂය ඉගැන්වූයෙමි. හතරවන වසරේ සිසුන් සඳහා සංවර්ධන පරිපාලන විෂය ඉගැන්වූයෙමි. මෙම අධ්‍යයන වර්ෂය අවසන් වූයේ 1998 අප්‍රේල් මස 20වන දින දී ය. 1998 මාර්තු මස 26 දිනට මා වයස හැටපහ සම්පූර්ණ වුණ නිසා, එදින විශ්‍රාම ගැනීමට අදහස් කරන බව සඳහන් කරමින්, 1998 ජනවාරි මස 13වන දින මවිසින් උපකුලපතිතුමාට දන්වා යවන ලදී. අධ්‍යයන වර්ෂය අවසන් වූයේ 1998 අප්‍රේල් 20වන දින නිසා, එතෙක් මගේ සේවය දීර්ඝ

කරන බව සඳහන් ලිපියක් උපකුලපති *මහාචාර්ය ජී.විල්සන් මහතා* විසින් පෙබරවාරි 23 දින මා වෙත එවා තිබිණි.

මේ අතරතුර විශ්‍රාම ගැනීමට සූදානම් වී සිටි මට, මගේ අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් 1998 මාර්තු 25 දින සමුගැනීමේ උත්සවයක් පවත්වන ලදී. මා ළඟ තිබෙන මයික්‍රෝ කැසට් පටියක සඳහන් වන අන්දමට, පැය තුන හතරක් පුරා පැවති මෙම උත්සව සභාවේ කටයුතු මෙහෙයවන ලද්දේ ශිෂ්‍යයෙකු වශයෙන් පවා මෙවැනි කාරණාවල දී දස්කම් දැක්වූ තරුණ කථිකාචාර්යවරයෙකු වූ *හරේන්ද්‍ර කාරියවසම් මහතා* විසිනි. රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධාන *චන්ද්‍රා වීරසිංහ මහත්මිය* පිළිගැනීමේ කථාව පැවැත්වූවාය. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති *ආචාර්ය එච්.එම්.ඒ. හේරත්* වසර තිහකට වැඩි කාලයක් තුළ මා ගැන දන්නා දේ විස්තර කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය ණය අංශයේ අධ්‍යක්ෂ (පසුව නියෝජ්‍ය අධිපති) ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතා රාජ්‍ය පරිපාලන විද්‍යා ආදි ශිෂ්‍යයින් වෙනුවෙන් කථාවක් පවත්වමින්, 1969 සිට මා ගැන දැන සිටි දේ විස්තර කළේය. මෙහි සඳහන් හතර දෙනා ම මගේ ගෝලයන් වූහ. විෂය දැනුමට වඩා යමක් මගෙන් ඉගෙනගත් බව කීහ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් අවසන් වසරේ ශිෂ්‍යයෙක් කථා කළේය. සිසුන් කණ්ඩායමක් උපහාර ගීතයක් ගායනා කළහ. පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වූ *රනුක්ගේ මහතා* විසින් විශේෂ දේශනයක් පවත්වන ලදී.

මෙම උත්සවයට මගේ බිරිඳ, පොඩිදුව සහ ප්‍රියන්ත බෑනා ද පැමිණ සිටියහ. මෙම උත්සවය ගැන ස්තුති කළ මා කියා සිටියේ, මගෙන් යම් කිසි සේවයක් ඉටුවී ඇත්නම්, එයට කාලය යෙදවීමට හැකිවූයේ මගේ බිරිඳ දුන් නොමඳ සහයෝගය නිසා බවයි.



Ad Multos Annos ඵලකය මට ප්‍රදානය කළේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසිනි



හරේන්ද්‍ර කාරියවසම් මහතා, ආචාර්ය හේරත් මහතා, චන්ද්‍රා වීරසිංහ මහත්මිය සහ ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතා කථා කරනවා ප්‍රේමා අසා සිටී



සිසු උපහාර





ඉහල පිංතූරයේ පොඩිදුව හා ප්‍රියන්ත බෑනාත් මැද පිංතූරයේ ඉදිරි පෙළ ආචාර්ය එච්. ඒ. පී. අබේවර්ධන මහතාත්, ජානකී එදිරිසිංහ මහත්මිය, ලලිනා ප්‍රනානදු මහත්මිය සහ හද්‍රා ආරච්චිගේ මහත්මිය සිටිති.



ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල සේවයෙන් 1998 අප්‍රේල් මස 21වන දින විශ්‍රාම ගත් පසුව ලැබිය යුතු අර්ථ සාධක අරමුදල්, පාරිතෝෂික දීමනා සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දීමනා ආදිය මාසයක් දෙකක් තුළ ලබා ගැනීමට හැකි විය. එම විශ්ව විද්‍යාලයේ මරණාධාර සමිතියේ සාමාජිකයෙකු ද වූ නිසා, මෙම සමිතිය විසින් රුපියල් දහ අටදාහක දීමනාවක් ද මට ගෙවන ලදී. 1951 නොවැම්බර් 15වෙනි දා සිට 1965 ජූනි 15 දින දක්වා රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප ලබා ගැනීමට පියවර ගතිමි. මේ වන විට මට ඉතිරි ව ඇති මාසික ආදායම එම විශ්‍රාම වැටුප පමණයි. මාසික ආදායමක් ලබා ගැනීමට තැන්පත් කළ අර්ථ සාධක අරමුදල් ආදිය 2011 පෙබරවාරි මාසයේ පමණ සිට මූල්‍ය ආයතනයක හිර වී ඇත.

I-උපලේඛනය

විශ්ව විද්‍යාලයාධිපතිවරු, මණ්ඩපාධිපතිවරු හා උපකුලපතිවරු

❖ **විශ්ව විද්‍යාලයාධිපතිවරු**

1. වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි
2. පලන්නොරුවේ විමලධම්ම නාහිමි
3. පරවාහැර වජිරඤාන නාහිමි
4. මහාචාර්ය ඩී.ඒ. හෙට්ටිආරච්චි මහතා
5. වල්පොල ශ්‍රී රාහුල නාහිමි
6. මහාචාර්ය හේම එල්ලාවල මහතා

❖ **මණ්ඩපාධිපතිවරු**

1. ආචාර්ය වී.කේ. සමරනායක මහතා
2. ආචාර්ය චන්ද්‍රා ධර්මවර්ධන මහතා
3. ආචාර්ය ඩබ්ලිව්.ඇම්.කේ. විජේතුංග මහතා
4. මහාචාර්ය ටියුලි ද සිල්වා මහතා
5. මහාචාර්ය ජිනදාස පෙරේරා මහතා

❖ උපකුලපතිවරු

1. මහාචාර්ය ජිනදාස පෙරේරා මහතා
2. මහාචාර්ය ටී.බී. කන්ගහ ආරච්චි මහතා
3. නිසි බලධාරී කරුණාසේන කොඩිතුවක්කු මහතා
4. උපකුලපති කරුණාසේන කොඩිතුවක්කු මහතා
5. මහචාර්ය එල්.පී.එන්. පෙරේරා මහතා
6. මහචාර්ය එස්.බී.හෙට්ටිආරච්චි මහතා
7. ඩබ්ලිව්.බී. දොරකුඹුර මහතා
8. මහාචාර්ය පී. විල්සන් මහතා

II - උපලේඛනය

පීඨාධිපතිවරු

❖ ශාස්ත්‍ර පීඨය

1. මහාචාර්ය කේ.පී. මුඛර්ජි මහතා
2. මහාචාර්ය එල්.ජී.හේවගේ මහතා

❖ කළමනාකරණ, අධ්‍යාපන හා වාණිජ විද්‍යා පීඨය

1. මහාචාර්ය ධර්මසේන ද සිල්වා මහතා
2. මහාචාර්ය සිරිසේන තිලකරත්න මහතා
3. කේ.ඒ. මුණසිංහ මහතා
4. ආර්.ඒ.ඒ. පෙරේරා මහතා
5. හේම විජේවර්ධන මහතා
6. ආරියපාල ඒකනායක මහතා
7. ජගත් බණ්ඩාරනායක මහතා
8. කේ.ආර්.එම්.ටී. කරුණාරත්න මහතා
9. ආචාර්ය එච්.එම්.ඒ.හේරත් මහතා

III - උපලේඛනය

අධ්‍යයනාංශ ප්‍රධානීහු

❖ අර්ථික විද්‍යා, රාජ්‍ය හා ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යනාංශය

1. ආචාර්ය ලීනස් සිල්වා මහතා
2. මහාචාර්ය කේ.පී. මුඛර්ජී මහතා
3. ආචාර්ය ධර්මසේන ද සිල්වා මහතා

❖ පරිපාලන විද්‍යා අධ්‍යනාංශය

1. මහාචාර්ය ධර්මසේන ද සිල්වා මහතා
2. කේ.ඒ. මුණසිංහ මහතා
3. ආර්.ඒ.ඒ. පෙරේරා මහතා
4. කේ.ඒ. මුණසිංහ මහතා

❖ රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යානාංශය

1. ආරියපාල ඒකනායක මහතා
2. එච්.ඒ. චාර්ල්ස් ප්‍රනාන්දු මහතා
3. ආචාර්ය යූ.බී.රාමනායක මහතා
4. චන්ද්‍රා වීරසිංහ මහත්මිය
5. ආචාර්ය එච්.එම්.ඒ. හේරත් මහතා
6. ලලිතා ප්‍රනාන්දු මහත්මිය

IV - උපලේඛනය

උසුලන ලද තනතුරු

❖ ශාස්ත්‍රීය තනතුරු

1. කථිකාචාර්ය - 1.10.1970 - 30.09.1976
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 1.10.1976 - 30.09.1986
3. සහාය මහාචාර්ය - 1.10.1986 - 20.04.1998

❖ පරිපාලන තනතුරු

1. අධ්‍යනාශය ප්‍රධාන - 2.5.1980 - 3.7.1986
2. පීඨාධිපති - 4.7.1986 - 13.6.1989
3. උප කුලපති තනතුරේ රාජකාරී ආවරණය කිරීම :
   (1) ශ්‍රී ජයවර්ධනපුර වි.වි. 16.8.1996 - 26.8.1996 සහ 1.2.1988 - 16-2-1988
   (2) සබරගමුව වි.වි. - 8.3.1996 - 12.3.1996
4. වැඩ බලන අධ්‍යක්ෂ, උතුරුමැද අනුබද්ධ වි.වි.- 1994 (මාස තුනක්)
5. වැඩ බලන අධ්‍යක්ෂ, බුත්තල, අනුබද්ධ වි.වි. - 1996
   (මාස දෙකක් පමණ)
6. වැඩ බලන අධ්‍යක්ෂ, ඌව පළාත අනුබද්ධ වි.වි.- 1996
   (මාස දෙකක් පමණ)
7. මණ්ඩපාධිපති, ඌව මණ්ඩපය, සබරගමුව වි.වි. 1.1.1996 - 25.3.1997

❖ වෙනත් තනතුරු

1. ආරක්ෂක කටයුතු උපදේශක
2. ශිෂ්‍ය උපදේශක - 5.6.1975 - 30.6.1977
3. නේවාසිකාගාර පාලක
4. අධ්‍යයන සමායෝජක - 8.10.1991 - 31.12.1995
5. බාහිර කථිකාචාර්ය, විදේශ කටයුතු පිළිබඳ බණ්ඩාරනායක අධ්‍යයන මධ්‍යස්ථානය - 1985 - 1988
6. ආගන්තුක කථිකාචාර්ය (බෲනායි වි.වි.) - 6.8.1989 - 1.1.1991

❖ සාමාජික තනතුරු (විවිධ කාල පරිච්ඡේද තුළ)

1. පීඨ මණ්ඩල සාමාජික
2. සනාතන සභා සාමාජික
3. පාලක සභා සාමාජික

4. පශ්චාත් උපාධි කළමනාකරණ ආයතන - කළමනාකරණ මණ්ඩල සාමාජික
5. පර්යේෂණ හා ප්‍රකාශන කමිටු සාමාජික

V - උපලේඛනය

වැටුප් හා වැටුප් සංශෝධන

1.	1.10.1970	-	රු. 900/=
2.	1.10.1976	-	රු. 1,100/=
3.	1.1.1980	-	රු. 1,550=
4.	1.1.1982	-	රු. 2,775/=
5.	1.1.1987	-	රු. 3,470/=
6.	1.1.1988	-	රු. 6,400/= , රු. 7,100/=
7.	1.1.1989	-	රු. 12,250/= (සහාය මහාචාර්ය තනතුරට)
8.	1.1.1996	-	රු. 14,375/= , රු.14,500/=
9.	1.1.1996	-	රු. 16,500/=
10.	1.1.1996	-	රු. 21,725/= (උෆව මණ්ඩාධිපති)
11.	1.1.1997	-	රු. 32,095.75 (උෆව මණ්ඩාධිපති) (සංශෝධනය-1997)
12.	20.4.1998	-	රු. 34,427/=

VI - උපලේඛනය

රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයන කාර්ය මණ්ඩලය

1.	ආරියපාල ඒකනායක මහතා	-	A
2.	ගුණපාල නානායක්කාර මහතා	-	*#
3.	ගුණසිරි මහතා (අභාවප්‍රාප්ත විය)		
4.	සිරිනිමල් විතාන මහතා	-	*# R
5.	එස්.එල්.ආර්. සමරතුංග මහත්මිය	-	* R

6. එච්.එම්.ඒ.හේරත් මහතා	-	*
7. ජගත් විජේනායක මහතා	-	R
8. යූ.බී. රාමනායක මහතා	-	*
9. එච්.ඒ.සී. ප්‍රනාන්දු මහතා		
10. භද්‍රා හේවාපත්තුආරච්චි මහත්මිය	-	*
11. චන්ද්‍රිකා ජයවීර මහත්මිය	-	R
12. අතුල මානවඩුගේ මහතා		
13. ඩබ්ලිව්.එම්.එන්. වීරතුංග මහතා		
14. රංජිත් ඉහළනායක මහතා	-	* R
15. එම්.නියාස් මහතා	-	R
16. එස්.එල්. සීලනාථ මහතා	-	* R
17. ඊ.ඒ. වීරසිංහ මහතා	-	*
18. බී.වයි.ජී රත්නසේකර මහතා		
19. චන්ද්‍රා වීරසිංහ මහත්මිය	-	R
20. ලලිතා ප්‍රනාන්දු මහත්මිය	-	* #
21. වසන්තා රාජපක්ෂ මහත්මිය		
22. එම්.එල්. රූපසිංහ මහතා	-	* R
23. එම්.ඩී. පුෂ්ප කුමාරි මහත්මිය		
24. ගීතා තරංගනී මහත්මිය		
25. හේමමාලී ගුණතිලක මහත්මිය		
26. හරේන්ද්‍ර කාරියවසම් මහතා		
27. දිසා බංඩාර මහතා	-	* #
28. සුනේත්‍රානි අමරතුංග මහත්මිය		
29. සුදත් මංජුල අමරසේන මහතා		
30. නිල්මිණි සේනානායක මහත්මිය	-	R

* - පී.එච්.ඩී. # - මහාචාර්ය A - සහාය මහාචාර්ය R- අස්වී ඇත.

10 විශ්‍රාමික යුගය
(1998 ට පසුව)

අප බොහෝ දෙනාට ළමා වියේ සිට විශ්‍රාමික අවදිය වන තෙක් අනුන්ගේ කාල සටහන් අනුව කටයුතු කිරීමට සිදුවේ. එයින් මිදෙන්නේ විශ්‍රාම ගත් විටය. විශ්‍රාම ගත් පසුව ද විශ්ව විද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතු කරගෙන යන ලෙස මට ඉල්ලීම් ලැබුණත්, මගේ කාල සටහන අනුව කටයුතු කිරීමට ලැබුණ ඉඩ ප්‍රස්ථාව නැති කර ගැනීමට අකැමැති වූයෙමි. දෙවනුව, මා විශ්‍රාම ගත් පසුවත් මා ඉගැන්වූ විෂයයන් ඉගැන්වීමට භාර ගත්තා නම්, අධ්‍යයනාංශයේ තරුණ කථිකාචාර්යවරයෙක් ඒ සඳහා යෙදවීමට ඇති ඉඩ ප්‍රස්ථාව නැති වීමට ඉඩ තිබිණි. එය අධ්‍යයනාංශයේ යහපතට හිතකර නොවේ. මේ හැම දෙයකට ම වඩා මෙතෙක් මා වෙනුවෙන් හා මගේ දරුවන් වෙනුවෙන් කැප වී සිටි ප්‍රේමා තව දුරටත් හුදකලා ව තැබීම සුදුසු නොවීය. මේ ආදී නොයෙක් කරුණු නිසා, විශ්‍රාම ගැනීමෙන් පසුව ප්‍රේමා ගෙදර තනිකර දමා අනුන්ගේ කාල සටහන් අනුව කටයුතු කිරීමට සිදුවන කිසිම දෙයක් භාර ගත්තේ නැත. මේ වන විට අපේ දරුවන් ද අපෙන් වෙන් වී ගොස්ය. පොඩි පුතා තවමත් විවාහ වී නොසිටි නමුත් වෙන ම නිවසක් ඉදිකර ගෙන එහි පදිංචියට ගොස් සිටියේය. ඒ නිසා ප්‍රේමාටත් මටත් දරුවන්ගේ වගකීම්වලින් තොරව අපට කැමති පරිදි ගමන් බිමන් වැඩ කටයුතු කිරීමට නිදහස තිබිණි.

තලපත්පිටිය අප නිවසේ තනි වූ අප දෙදෙනා, එකිනෙකාගේ සැපදුක් ගැන වඩාත් සමීප ව සොයා බැලුවෙමු. වයස්ගත වන විට ස්වභාවයෙන් ම ඇතිවන ලෙඩදුක්වලින් ප්‍රවේශම් වී, අවශ්‍ය ප්‍රතිකාර ලබා ගනිමින් කාලය ගත කළෙමු. ඒ අතර තුර, දිනක් අපේ පැරණි මිතුරෙකු වූ *පියදාස* මහතා ගැන සොයා බැලීමට ඔහුගේ උපන් ගම වූ අත්තනගල්ලේ *අලවලට* ගියෙමු. වසර හතළිහකට පමණ පෙර පියදාස මිතුරාගේ මඟුල් ගෙදර ගියාට පසුව අප එහි ගොස් නැත. ඒ ඉසව්වට ගොස් විමසා බැලූ විට පියදාස මහතාගේ වැඩිමහල් සොහොයුරා එම නිවසේ දී අපට හමුවිය. ඔහුගෙන් දැන ගන්නට ලැබුණේ, අප මිතුරා කුරුණෑගල පදිංචි ව සිටින බවයි. ඔහුගේ දුරකථන

අංකය ලබා ගෙන ගෙදර පැමිණි වහා ම දුරකථනයෙන් කථා කළෙමි. පුදුමයට පත් මගේ මිතුරා, තමන් පදිංචි තැන ලිපිනය දන්නේය. ටික දිනකින් අපි එහි ගියෙමු. මගේ මිතුරාත් ඔහුගේ බිරිඳත් අප ඉතා සුහද ලෙසින් පිළිගෙන දිවා ආහාරය ද සලසා දුන්හ. මිණිපේ සිටිය දී දැන හැඳින සිටි, එවකට ආධුනික කාර්මික නිලධාරියෙකු වූ *ජී.සමරසිංහ මහතා* ද හමු විය. පියදාස මහතාගේ නිවස ඉදිරිපිට නිවසක සමරසිංහ මහතා පදිංචි ව සිටියේය. ඔහුගේ දියනියක් පියදාස මහතාගේ ලොකු පුතා විවාහ කර ගෙන සිටියේය. ඒ අය ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පදිංචි බව කීහ. අපේ ලොකු දුවලා ද එවකට පදිංචි වී සිටියේ මෙල්බර්න් නුවර අසල පෙදෙසකය. බොහෝ කාලයකට පසුව මුණගැසුණ අප හැමට මෙය බෙහෙවින් ම සතුටුදායක අවස්ථාවක් විය. සවස හතරට පමණ ආපසු ගමනට පිටත් වූයේ නැවතත් හමුවන ප්‍රතිඥාව ඇතිවයි.

විදෙස් ගමන්

පළමුවැනි ඕස්ට්‍රේලියා ගමන

මා විශ්ව විද්‍යාල සේවයෙන් විශ්‍රාම ගැනීමට මාස පහක් පමණ තිබිය දී සප්ත වාර්ෂික නිවාඩුවට ලැබිය යුතු යාන පත්‍රය උපයෝගී කරගෙන ප්‍රේමාත් මාත් වරක් ඕස්ට්‍රේලියාවට ගියෙමු. මේ වන විට අපේ ලොකු දුවලා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර ආශ්‍රිත *බොක්ස්හිල්* නම් ස්ථානයේ පදිංචි ව උන්හ. ලොකු දුව එහි රෝහලක සේවය කළාය. බෑණා (වසන්ත) දේපල වෙළඳාමේ නිරත ආයතනයක සේවය කළේය. ඒ අයගේ දරු දෙදෙනාගෙන් වැඩිමලා *දිනීත්* පාසල් යෑම අරඹා තිබිණි. එනමුත්, දියණිය (සවිනි) තවම වයස අවුරුදු තුනක දරුවෙකු වූවාය. දෙමව්පියන් සේවයට යන විට ඇය ළමා සුරැකුම් මධ්‍යස්ථානයක තබා ගියහ.

1997 නොවැම්බර් 29 දින, කොළඹ කටුනායකින් පිටත් වී එයාර් ලංකා සමාගමේ යානයකින් සිංගප්පූරුවට ගියෙමු. අපේ ලොකු පුතා මේ වන විට සිංගප්පූරුවේ පදිංචි ව සිටි නිසා එහි දින දෙක තුනක් ගත කොට, දෙසැම්බර් 2වෙනි දා රාත්‍රී 8.00ට සිංගප්පූරුවෙන් පිටත්වන *ක්වන්ටාස්* (Quantas) ගුවන් සමාගමේ යානයකින් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නගරයට ගියෙමු. ගුවන් ගමනට පැය හතක් පමණ ගත වේ. ඒ අනුව අප මෙල්බර්න් ගුවන් තොටුපලට පැමිණෙන විට දෙසැම්බර් 3වෙනිදා දා එහි වේලාවෙන් පාන්දර පහට පමණ වන්නට ඇත. සිංගප්පූරුව හා මෙල්බර්න් වේලාවේ අතර පැය දෙකක වෙනසක් තිබිණි. ආගමන විගමන වතාවත්වලින් පසුව ගමන් මලු ලබා ගෙන, රේගු පරීක්ෂණ නිම වී පර්යන්තයෙන් එළියට එන විට, *වසන්ත* එහි පැමිණ සිටියේය.

පැය භාගයක පමණ ගමනකින් පසුව නිවසට ළඟා වූයෙමු. අපගේ එක ම මුණුබුරා *දිනීත්* හා එක ම මිණිබිරිය *සවිනි* අපගේ පැමිණීම ගැන බෙහෙවින් ම සතුටු වූ බව පෙනිණි. පාසල් යෑමට සූදානම් වූ දිනිත්ට මා තම පාසලට එක්කර ගෙන යෑමට අවශ්‍ය විය. ඒ නිසා, ඔහු සමඟ මාත් වසන්ත පදවා ගෙන ගිය කාර් එකට ගොඩවූයෙමි. විනාඩි පහළොවක පමණ ගමනකට පසුව *බ්ලැක්බර්න්* ප්‍රාථමික පාසලට (Blackburn Primary) පැමිණියෙමු. මා කැටුව පන්තියට ගිය දිනීත් ඔහුගේ පන්තිය භාර ගුරුතුමියට මා හඳුන්වා දුන්නේය. එතුමිය ආගිය තොරතුරු විමසා පන්තියේ සිටි අනික් ළමුන්ට ද මා දිනීත්ගේ සීයා ලෙස හඳුන්වා දුන්නාය. මගේ කුඩා මුණුබුරාට තම සතුට තවත් වැඩි වූ බවක් පෙනිණි.

ආපසු නිවසට පැමිණ මූණ කට සෝදා ගෙන, උදේ ආහාරයකින් පසුව අපට වෙන් කර තිබූ කාමරයට වී විවේක ගතිමු. ලොකු දුවත් වසන්තත් එදින නිවාඩු ලබා ගෙන සිටි බව මතකය. සිංගප්පූරුවෙන් කුඩා වීඩියෝ කැමරාවක් මීලට ගන්නා ලෙස වසන්ත මට දන්වා තිබුණ නිසා, මෙල්බර්න් යන විට එය ද රැගෙන ගියෙමි. එය උපයෝගී කරගෙන අපේ බෑණා කුඩා මිණිබිරියගේ නැටුම් ගැයුම් රූපගත කළේය. ඒවා නැවත පෙන්වන විට සවිනිට ඉමහත් සතුටක් ඇති වූ බව පෙනිණි.

ලොකු දුවට හා බෑණාට ඉඩකඩ තිබෙන අන්දමට අප මෙල්බර්න් නගරය හා අවට ප්‍රදේශය නැරඹීමට එක්කර ගෙන ගියහ. එක් දිනක මෙල්බර්න් නගර මධ්‍යයේ ඇති උස ම ගොඩනැඟිල්ලට එක්කර ගෙන ගියහ. එහි ඉහළ තිබෙන නැරඹුම් මැදිරියට ගිය විට නගරය වටා බොහෝ ඈත ක්ෂිතිජය දක්වා මනරම් දසුනක් ලැබේ. වසර සීයයක පමණ පැරණි ඕස්ට්‍රේලියාවේ තොරතුරු අඩංගු චිත්‍රපට දර්ශනයක් ද දක්නට ලැබිණි. තවත් වරක් *හීල්ස්විල්* (Healsville) නම් පෙදෙසේ පිහිටි සත්ව උද්‍යානයකට ගියෙමු. එහි දී ඕස්ට්‍රේලියාවේ විශේෂ වූ සතුන් දැකගත හැකි විය. කැන්ගරු, *කුවාලා* (Koala), *ප්ලැටිපස්* යනාදී සතුන් හා කුරුලු ආදීන් දක්නට ලැබිණි. *කොවාලා* නම් වූ වලසෙකු වැනි කුඩා සතා *ඉයුකැලිප්ටස්* (Eucaliptus) ගස්වල ලැග සිටී. ඒ සතුන්ගේ ආහාරය එම ගසේ කොළය. නිතර ම නිදිමත ගතියෙන් මෙන් සිටින ඒ සතුන් චලනය වන්නේ ඉතා හෙමින්ය. කැන්ගරු ඕස්ට්‍රේලියාවට විශේෂ වූ, එහි නොයෙක් ප්‍රදේශවල වාසය කරන සතෙකි. *ප්ලැටිපස්* නම් වූ ඉතා කුඩා සතා ජලය ඇසුරෙත් දක්නට ලැබේ. ඉතා කුඩා ඉබ්බෙක් පමණ වන නමුත් එමෙන් කටුවක් නැත. ඕස්ට්‍රේලියාවට විශේෂිත වූ *නරියෙක්* වැනි කුඩා දඩ බල්ලෙක් ද දක්නට ලැබිණි.



කටුනායක ගුවන් තොටු පලේ දී



සිංගප්පූරු ගුවන් තොටු පලේ දී



හිල්ස්විල් සත්ව උද්‍යානයේ දී 1997 දෙසැම්බර්



සිඩ්නි උද්හිද උද්‍යානයේ දී 18.12.1997

මේ ගමනේ දී අපගේ ගුවන් ටිකට්පතින් මෙල්බර්න් සිට සිඩ්නි දක්වා ගොස් ඒමට පහසුකම ලැබිණි. එය දැනට ගුවන් සමාගම්වලින් සලසන අතිරේක සේවයකි. ඒ නිසා, ප්‍රේමාත් මාත් 18.12.1997 දින සිඩ්නි නුවරට ගියෙමු. එහි ගුවන් තොටුපලේ සිට බස් රියෙන් සිඩ්නි නගර මධ්‍යයට ගොස් එහි විසිතුරු නැරඹුවෙමු. සිඩ්නි වරාය, ඔපෙරා හවුස් (Opera House) පාර්ලිමේන්තුව, නගරයට උඩින් ඉදිකර ඇති තනි පිල්ලේ දුම්රිය (Monorail)යනාදිය දැක බලා ගතිමු. ආපසු ගමන රාත්‍රී නවයට යෙදී තිබුණ නමුත්, ගමන් විඩාව වැඩි වූ නිසා, ගුවන් සමාගමේ කාර්යාලයකට ගොස් සවස හයට තිබූ යානයකින් මෙල්බර්න් ගමන යොදා ගෙන, සිඩ්නි ගුවන් තොටුපලට ගියෙමු. පැයකින් පමණ *මෙල්බර්න්* ගුවන් තොටුපලට පැමිණ දුම්රියෙන් *බොක්ස්හිල්* වෙත ගියෙමු. වසන්ත දුම්රියපලට පැමිණ අපව නිවසට එක්කර ගෙන ගියේය.

ඩාර්වින් නගරය

නැවතත් විශ්ව විද්‍යාල සේවයට පැමිණිය යුතු ව තිබුණ නිසා, 1997 දෙසැම්බර් 24 දින ආපසු ගමනට පිටත් වූයෙමු. මේ අවදියේ අප අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයෙකු වූ *එම්.එල්.රූපසිංහ* මහතා පී.එච්.ඩී. (Ph.D) උපාධිය සඳහා ඕස්ට්‍රේලියාවේ ඩාර්වින් නගරයේ පිහිටි *නොදර්න් ටෙරිටරි යුනිවර්සිටි* (Northern Territory University) වෙත ගොස් සිටියේය. ඔහු තම බිරිඳ හා ගැහැණු දරුවන් දෙදෙනා සමඟ එහි පදිංචි වී සිටියේය. ඒ නිසා, ආපසු ගමන ඩාර්වින් හරහා පැමිණියෙමු. දෙසැම්බර් 24 දින මෙල්බර්න් ගුවන් තොටුපලෙන් පිටත් වී ඇඩිලේඩ් ගුවන් තොටුපල හරහා (ඕස්ට්‍රේලියාවේ දකුණු කොන) උතුරු කොනේ පිහිටි ඩාර්වින් නගරයට පැමිණියෙමු. ඒ ගුවන් ගමන දිවා කාලයේ වූ නිසා, ඕස්ට්‍රේලියාවේ භූ විෂමතා ස්වල්පයක් හෝ දැක ගැනීමට ලැබිණි. *ඇඩිලේඩ්* නුවරින් පිටත් වී ටික වේලාවකට පසුව *ඩාර්වින්* අඩවියට එනතුරු පැය හතරක පමණ ගමන කාන්තාර හා ශුෂ්ක කැලෑ ප්‍රදේශ උඩින් විය. *ඩාර්වින්* ගුවන් තොටුපලට ළඟාවන විට තද වැස්සක් පැවතිණි. එමෙන් ම, තද රස්නයක් ද පැවතිණි. නිතර ම දාඩිය ගතිය පැවතිණි.

රූපසිංහ මහතා තවත් මිතුරකුගේ වාහනයකින් ගුවන් තොටුපලට පැමිණ සිටියේය. ප්‍රේමාත් මාත් තම නිවාසයට එක්කර ගෙන ගොස්, අපට වෙන් කර තිබූ කාමරයේ ස්වල්ප වේලාවක් විඩා හැරීමෙන් පසුව, දිවා ආහාරය සඳහා තවත් නිවසකට එක්කර ගෙන ගියේය. ඒ නිවස දාස මුදලාලිගේ බෑණා (දියණිය විවාහ කරගෙන සිටි) කෙනෙකුගේ බව දැනගන්නට ලැබිණි. ලාංකික වූ තවත් පිරිසක් එහි රැස් වී සිටියහ. ගෙහිමි තරුණ මහතා හා ඔහුගේ තරුණ බිරිඳ අප දෙදෙනාට ඉතා සුහද ව

සංග්‍රහ කළහ. බෲනායි හි සිටිය දී මුණගැසුණු විදුලි සංදේශ නිලධාරී *සෝමසිරි* මහතාගේ පුතෙක් ද මුණගැසිණි. ඒ හැම දෙනා ම බොහෝ උනන්දුවෙන් අපට සංග්‍රහ කළහ. මේ අයට එකතු වීමට මෙය අවස්ථාවක් වන්නට ඇත. ඊට පසු දින නත්තල් දිනය විය. *ඩාර්වින්* නගරයේ බැලිය යුතු තැන් වෙත ගියෙමු. ඒ නගරයේ විශේෂයෙන් දක්නට තිබෙන දෙයක් නම්, එළිමහන් ප්‍රදේශවල ගැවසෙන කැන්ගරු සතුනුත් විදිවල හා කඩපිල්වල ගැවසෙන ඕස්ට්‍රේලියානු ආදිවාසීනුත්ය. මේ ආදිවාසීන්ගේ හැඩරුව පැරණි මානවයාගේ හැඩරුවට සමානය. ලංකාවේ ආදිවාසීන් මෙන් නොවේ.

දෙසැම්බර් 24, 25 දින රෑ දෙකේ *රූපසිංහ මහතාගේ* නිවසේ ගත කළෙමු. ඒ අතරතුර දිවා කාලයේ දී රූපසිංහ මහතාගේ විශ්ව විද්‍යාලය බැලීමට ද ගියෙමු. එහි දී රූපසිංහ මහතාගේ සුපරීක්ෂක පාකිස්තානු ජාතික තරුණ මහාචාර්යවරයෙක් ද මුණගැසිණ. දෙසැම්බර් 26වෙනි දින පස්වරුවේ ඩාර්වින් ගුවන් තොටුපලට විත්, *කෑන්ස්* (Cairns) නුවර සිට පැමිණෙන *ක්වන්ටාස්* යානයකින් සිංගප්පූරුවට පැමිණියෙමු. ඒ ගමනට ද පැය පහක් පමණ ගත වන්නට ඇතැ'යි සිතමි. සිංගප්පූරුවේ සිට එයාර්ලංකා ගුවන් යානයකින් කොළඹට පැමිණියේ 27වෙනි දා පාන්දරය. ඩාර්වින් නුවර ගැන සඳහන් කළයුතු කරුණක් නම්, එය *බෲනායි සුල්තාන්වරයාගේ* ගව පට්ටිය පිහිටි ප්‍රදේශය බවත් බෲනායි සිටින ලාංකිකයින් සේවය අවසන් කර ඩාර්වින් නුවරට පැමිණ පදිංචි වන බවත්ය.

දෙවැනිවර ඕස්ට්‍රේලියා ගමන

දෙවෙනි වරට අප ඕස්ට්‍රේලියා ගියේ මා විශ්‍රාම ගැනීමෙන් පසුවයි. මේ වන විට පොඩි පුතා *එයාර්ලංකා* සමාගමේ ගුවන් නියමුවෙක් වශයෙන් සේවය කළ නිසා, ඔහුගේ දෙමාපියන් වශයෙන් ප්‍රේමාටත්, මටත්, එයාර් ලංකා ගුවන් සේවා පවතින ගමනාන්තවලට නොමිලේ ගමන් කිරීමට පහසුකම් ලැබිණි. මෙවර ඕස්ට්‍රේලියා ගමනේ දී අපට එම පහසුකම් ලැබුණේ සිංගප්පූරුව දක්වා පමණි. 1998 ඔක්තෝබර් 23 දින සිංගප්පූරුවට යෑමට කටුනායක ගුවන් තොටුපලට ගිය නමුත්, එම යානයේ ආසන නොතිබුණ නිසා, ආපසු ගෙදර ගොස් පසු දින කටුනායකට යෑමට සිදුවිය. නොමිලේ ගමන් කරන අයට ආසන ලැබෙන්නේ මුදල් ගෙවා යන අය නැති වුවහොත් පමණි. ඔක්තෝම්බර් 24 දින සිංගප්පූරුවට ගොස් එදින රාත්‍රී ලොකු පුතාගේ නිවසේ නතර වී සිට, පසුදින රාත්‍රී 8.00ට සිංගප්පූරුවෙන් පිටත්වන ක්වාන්ටාස් (Quantas) යානයෙන් මෙල්බර්න් නුවරට ගියෙමු. එහි යන විට 26 දින හිමිදිරි පාන්දරය. වසන්ත ගුවන් තොටුපලට පැමිණ සිටියේය. තවමත් ලොකු දුවලා පදිංචි ව සිටියේ *බොක්ස්හිල්* (Box Hill) නිවසේමයි. මෙවර අපි ඕස්ට්‍රේලියාවේ මාස තුනක් ගත කළෙමු.



1997 දෙසැම්බර් 26 වෙනි ද ලංකාවට ආපසු එද්දී

ඒ අතරතුර පදිංචියේ වෙනස්කමක් සිදුවිය. මවුන්ට් වෙවර්ලි (Mount Waverly) නම් ප්‍රදේශයේ නිවාසයක් මිලයට ගත් ලොකු දුවලා එහි පදිංචියට ගියහ. බැංකුවකින් ණය මුදලක් ලබා ගෙන නිවසක් මිලයට ගත්තත් මාස්පතා බැංකුවට ගෙවීමට සිදුවන්නේ මාසික ගෙවල් කුලියට සමාන මුදලකි. ණය මුදල ගෙවා අවසන් වූ විට වත්කමක් ද ඉතිරි ව තිබේ. අවශ්‍ය නම් පසුව විකුණා දැමීමට පුළුවන. මේ නිසා එහි බොහෝ දෙනා තමන්ගේ ම ගෙවල්වල පදිංචි ව සිටිති. කුලී ගෙවල්වල පදිංචි ව ඉන්නේ කෙටි කාලවලට එහි සිටින අය පමණයි. *මවුන්ට් වෙවර්ලි* වෙත පදිංචියට ගිය නමුත් ලොකුදුව සේවය කළේ *බොක්ස් හිල්* රෝහලේයි. එනමුත්, දිනිත්ගේ පාසල මාරු කළේය. නිවසේ සිට පා ගමනින් යා හැකි *මවුන්ට් වෙවර්ලි* ප්‍රාථමික පාසලට ඔහු ඇතුළු කළේය. *සචිනි* මිණිබිරිය ළදරු පාසලකට ඇතුළු කළහ. නිවසේ කාර් දෙකක් තිබුණ නිසා, ගමන් බිමන්වලට පහසු විය.





බොක්ස් හිල්



පෙන්ගුවින් එනතුරු

මේ වාරයේ දී වසන්තට හා ලොකු දුවට නිවාඩු ලබා ගැනීමට ලැබුණ පරිදි දුර බැහැර තැන් කීපයකට ද ගමන් බිමන් ගියෙමු. වරක් *ෆිලිප් අයිලන්ඩ්* (Philipe Island) නම් වූ පෙදෙසකට ගොස් සංචාරක නිවාසයක දින කීපයක් ගත කළෙමු. එම දූපතේ *පෙන්ගුවින්* (Penguine) සතුන් ලගින

තැනක් බැලීමට ගියෙමු. දිවා කාලයේ ආහාර සොයා මුහුදේ සැරිසරණ මේ සතුන්, රෑ බෝ වන විට ගොඩබිමට පැමිණ මුහුදු වෙරළ අයිනේ තිබෙන ඔවුන්ගේ ලැගුම් ස්ථාන වෙත දිනපතා පැමිණෙති. මේ ආශ්චර්යය දැක බලා ගැනීමට සංචාරකයෝ මේ ප්‍රදේශයට පැමිණෙති. මෙම සතුන් ගොඩබිමට පැමිණෙන තුරු සංචාරකයින්ට රෑඳී සිටීමට බැමි බැඳ සකස් කර තිබේ. රාත්‍රී අට හමාර නවය පමණ වන විට මේ සිද්ධිය අවසන් වේ.

පිලිප් දූපතේ සිට ඕස්ට්‍රේලියාවේ දකුණු කොනේ පිහිටි *විල්සන්ගේ* තුඩුව (Wilson's Promontory) නම් වූ ප්‍රදේශයට දිනක් ගියෙමු. ඒ ගමනට පැය හතරක් පහක් ගත වේ. ශුෂ්ක කැලෑ ප්‍රදේශයක් හරහා වැටී ඇති පාරක් දිගේ එහි යා යුතු වේ. *පිලිප් අයිලන්ඩ්* සිට ආපසු එන ගමනේ දී පාරු පාලමකින් ගොඩ වී ශාන්තුවරයින් දෙළොස් දෙනා (Twelve Apostles) නමින් හඳුන්වන මුහුදු බාදනයට ලක්වී තිබුණ ප්‍රදේශයකට ද ගියෙමු. මුහුදු වතුර වැදී සෝදා ගොස් ඉතිරි ව තිබෙන, මිනිසුන් සමාන පර්වත කොටස්, *ඇපොසල්ස්* ලෙස හඳුන්වනු ලැබේ. එතැන පසුකර මෙල්බර්න් නගරයට පැමිණීමට පැය පහක් හයක් ගතවිය.

ක්ලේටන් ප්‍රදේශයේ පදිංචි *රමණිලා* රෑ කෑමට ආරාධනා කර තිබුණ නිසා එහි යන විට රාත්‍රී නවයට පමණ වන්නට ඇත. තවත් කීප වතාවක් *රමණී* සහ *නිස්ස* අපට භෝජන සංග්‍රහවලට ආරාධනා කළහ. *චන්ද්‍රිකා* ද කීප වතාවක් අපට එසේ සංග්‍රහ කළාය.

තවත් වරක පැරණි රං ආකර තිබුණ *බැලරැට්* (Balarrat) නම් වූ ස්ථානයට ගියෙමු. දැනට එම ආකරවල රත්තරන් නොමැති අතර, දහනවවන සියවසේ පැවැති නගරය සංරක්ෂණය කර තිබේ. අශ්ව කරත්තයක් ඒ මාර්ග දිගේ එහා මෙහා ගමන් කරයි. ඒවා පදවන්නන් පැරණි ඇඳුම් පැළඳුම් ඇඳගෙන සිටිති. එකල පැවැති ආකාරයේ භෝජනාගාරයක් ද තිබේ. රත්තරන් හාරන ලද බිං ගෙවල් සංචාරකයින්ට දැක බලා ගැනීමට පවත්වා ගෙන යති. *වෙරිබී* (Weribee) නම් වූ ප්‍රදේශයක පිහිටි විවෘත සත්ව උද්‍යානයක් බැලීමට ද ගියෙමු. විශාල භූමි ප්‍රදේශයක පැතිර තිබුණ මෙහි සතුන්ට නිදහසේ හැසිරීමට තරම් ඉඩකඩ ඇති පරිදි එම උද්‍යානය සකස් කර තිබිණි. *සිංහයින්, ව්‍යාඝ්‍රයින්, කඟවේනන්, ඔටුවන්, ජිරාෆ්, සීබ්‍රා, මී හරකුන්* යනාදි ලොකු ප්‍රමාණයේ සතුන් මේ උද්‍යානයේ දී දැකගත හැකි විය. එහි සංචාරකයින් එහා මෙහා ගෙන ගියේ බස්වලිනි. පාගමනින් නොවේ.

ලොකු දුවලා මෙන් ම අප දන්නා හඳුනන බොහෝ දෙනා ගියේ *ඩැන්ඩිනොන්ග්* (Dandinong) පන්සලටයි. එය *මවුන්ට් වෙවර්ලි* සිට පැය භාගයක් පමණ ගිය තැන ඇති නගරයකි. අපගේ අධ්‍යනාංශයේ කලක් සේවය කළ *චන්ද්‍රිකා ජයවීර* (ද අල්විස්) මහත්මිය හා ඒ මහතා මේ පන්සලේ දායකයෝ වූහ. *කාන්ති සමරසිංහ* නම් වූ කථිකාචාර්යවරියගේ සැමියා ද නිතර මෙම පන්සලේ දී මුණගැසිණි.

වසන්තගේ මිත්‍රයෙකු වූ *පුෂ්පසිරි මහතා* තම බිරිඳගේ දෙමාපියන් ද සමඟ පදිංචි ව සිටියේ ද *ඩැන්ඩිනොන්ග් නගරය* අසල නිවසකය. *පුෂ්පසිරි* මහතාගේ මාමණ්ඩිය *'මහවල'* නම් වූ කෙනෙකි. ඒ මහතා ලංකාවේ සමූපකාර දෙපාර්තමේන්තුවේ සේවය කළ කෙනෙකි. *ඩැන්ඩිනොන්ග්* අවට පදිංචි ව සිටි වැඩිහිටි ලාංකිකයින් සතියකට වරක් නගර සභාවේ ප්‍රජාසලක දී මුණගැසී, දිවා ආහාරය භුක්ති විඳ විනෝද වූහ. ප්‍රේමාට හා මටත් එයට සහභාගී වන ලෙස ආරාධනාවක් ලැබුණ නිසා, අදාළ දිනයට *මවුන්ට් වෙවර්ලි* සිට බස් රථයෙන් එහි ගොස් දවස ගත කළෙමු. එහි දී *ඒකනායක* නම් වූ වැඩිහිටියෙකු ද මුණගැසිණි. එම යුවල ලංකාවේ පාසල් ගුරුවරු වූහ. තම දරුවන් සමඟ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී තිබේ. මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැස්වීම් දවසක ලංකාවෙන් *ලූෂන් බුලත්සිංහල, අනුලා බුලන්සිංහල* යුවල හා ඒ දෙදෙනාගේ පුතාත්, ලේලියත්, *රොඩිනි වර්ණකුල* ආදී කලාකරුවන් එහි පැමිණ ගායනා ආදියෙන් අපට සංග්‍රහ කළහ. ඒ අය මෙල්බර්න් පැමිණ සිටියේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීමටය. එය වෙනත් තැනක පාසල් ශාලාවක දී පැවැත්විණි.

මෙවර අපි ලංකාවට ආපසු එන ගමන පිටත්වූයේ 1999 ජනවාරි 29වෙනි දා ය. එදින සිංගප්පූරුවේ ලොකු පුතාගේ නිවසේ සිට 30වෙනි දා රාත්‍රියේ ලංකාවට එන යානයකින් පිටත් වී කටුනායකට පැමිණ ඇත්තේ 31වැනි දින පාන්දරය. අප දෙදෙනා තවමත් තලපත්පිටිය නිවසේ පදිංචි වී සිටි නිසා, එහි යන්නට ඇත්තේ පොඩි දුවලා සමඟය. මාස තුනක් පමණ එම නිවසත් කාර් එකත් බලාගත්තේ පොඩි දුවත්, ප්‍රියන්ත බෑණාත්ය.



මෙල්බර්න් නගරයේ දී රමණී සහ චන්ද්‍රිකා සමඟ

තුන්වෙනි වර ඕස්ට්‍රේලියා ගමන

තුන්වෙනි වරට අප ඕස්ට්‍රේලියාවට යන අවදිය වන විට, *එයාර්ලංකා සමාගමේ* ගුවන් යානා *සිඩ්නි* *නුවරට* යාත්‍රා කිරීමට පටන්ගෙන තිබිණි. එම සමාගමේ ගුවන් නියමුවකු ලෙස සේවය කළ පොඩි පුතාට, තම දෙමව්පියන් සඳහා අයකිරීමකින් තොර ව යාන පත්‍ර ලබා ගැනීමට හැකි විය. ඒ නිසා, අතරමඟ නතර නොවී *කොළඹ* සිට *සිඩ්නි* දක්වා ගමන් කිරීමට ලැබිණි. අපට ලැබුණ තවත් පහසුවක් නම්, ආසන හිස් ව තිබේ නම්, ව්‍යාපාරික පන්තියේ (Business Class) ගමන් කිරීමට තිබූ අවසරයයි. අතපය දිගහැර ගැනීමාදියට තිබෙන ඉඩකඩ වැඩිය. හිරවීම අඩුය. ආහාරපාන සැපයීමේ දී වෙනසක් දක්නට ලැබේ. ප්‍රේමාත් මාත් ගුවන් ගමන් යන විට නිතර ම ඉල්ලා සිටින්නේ නිර්මාංශ ආහාරය. දැනට සෑම ගුවන් සේවයක ම පාහේ ආහාර වේලට පෙර මත්පැන් අවශ්‍ය නම් නොමිලේ සපයනු ලැබේ. මා පළමුවරට 1977 නෙදර්ලන්තයට ගිය අවදියේ මත්පැන් සඳහා මුදල් අය කළේය. එනමුත්, තරගකාරිත්වය වැඩිවීම නිසා, ඒ සඳහා අයකිරීම් ඉවත් කරන ලදී. බොහෝ දෙනාගේ පිළිගැනීම අනුව, *එයාර්ලංකා ගුවන් සේවයේ* ආහාරපාන සේවය උසස් මට්ටමක පවතී.

මෙවර අපි ඕස්ට්‍රේලියාවට ගියේ 1999 දෙසැම්බර් මස 5වෙනි දා ය. මෙම යානය පාන්දර 5.00ට කටුනායකින් පිටත් වේ. පැයකට හමාරකට පසුව උදේ ආහාරය ලැබේ. එය අවසන් වන විට ලංකාවේ වේලාවෙන් පෙරවරු හතහමාර අට පමණ වේ. ඉන්පසුව මැදිරි තුළ ආලෝකය අවම කර, අවශ්‍ය කෙනෙකුට නිදා ගැනීමට ඉඩ හරිති. පැය හතරක් පමණ ගතවන තුරු ගුවන් සේවිකාවන් පවා විවේක ගන්නා බව පෙනිණි. ලංකා වේලාවෙන් දවල් දොළහමාර පමණ වන විට දිවා ආහාරය ලබා දීමට පටන් ගනී. මේ වන විට යානය ඕස්ට්‍රේලියාවේ වයඹ කොණේ *බෲම්* (Broom) නම් පෙදෙසින් රට තුළට පිවිසී තිබේ. දැන් යානය ගමන් කරන්නේ ඕස්ට්‍රේලියාවේ දකුණු දිගින් පිහිටි මුහුදු තීරය දෙසටයි. බටහිර ඕස්ට්‍රේලියාවේ දකුණු දිගින් පිහිටි ශුෂ්ක ප්‍රදේශයක් පසු කරනවා දක්නට ලැබේ. මේ ප්‍රදේශය බෙහෙවින් ම ඛනිජ ද්‍රව්‍යවලින් සමන්විත බව කියනු ලැබේ. යකඩ ගල් අඟුරු මෙන් ම ඛනිජ තෙල් පවා මේ ප්‍රදේශයේ ඇත. මූකලන් කැලෑ දක්නට ලැබෙන්නේ දකුණු වෙරළ තීරයට ලංවන විටයි. බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් (Perth) නගරය නැව් ගමන් යුගයේ දී භාවිතා කළ *ෆ්‍රීමැන්ටල්* (Freemantle) වරාය ආශ්‍රිත ව පිහිටා තිබේ.

දකුණු වෙරළ තීරය දක්වා පියාසර කරන ගුවන් යානය, ඊට පසුව නැගෙනහිර දෙසට හැරී ඉද්ද ගැසුවාක් මෙන් *සිඩ්නි* නුවර බලා පියාසර කරයි. මේ වන විට ඕස්ට්‍රේලියාවේ (මෙම ප්‍රදේශයේ) වේලාව පස්වරු තුන පමණ වේ. ඕස්ට්‍රේලියා මහද්වීපයේ වේලාව සම්බන්ධ කලාප කීපයක් තිබේ.

බටහිර (කලාප) ඕස්ට්‍රේලියාවේ වේලාව ලංකාවේ වේලාවට පැය දෙක හමාරකට ඉදිරියෙන් ඇත. එනම්, *පර්ත්* නගරයට ඉර උදාවන්නේ කොළඹට වඩා පැය දෙක හමාරකට පෙරය. *මෙල්බර්න්* නගරය පිහිටි ප්‍රදේශයේ වේලාව ලංකාවෙන් වෙනස් වන්නේ පැය හතර හමාරකිනි. සිඩ්නි නගරයට යන විට එය පැය හතර හමාරක් වේ. එනමුත්, ශ්‍රීෂ්ම කාලයට මේ ප්‍රදේශවල වේලාව පැයකින් ඉදිරියට ගෙනේ. එවිට *සිඩ්නි හා මෙල්බර්න්* නුවර වේලාවන් ලංකාවේ වේලාවට වඩා පැය පහ හමාරකට පෙරය. මේ නිසා, අපගේ ගුවන් යානය *සිඩ්නි* නුවරට ළඟාවන්නේ එහි වේලාවෙන් රාත්‍රී හත හමාරට පමණය. ලංකාවේ වේලාවෙන් පස්වරු දෙක (හෝ තුන) පමණ වේ. *කොළඹ* සිට *සිඩ්නි* දක්වා ගමන් කිරීමට ගතවන ගුවන් කාලය පැය දහයක් පමණ වේ. යානාවේ ගමන් කරන අපට දිවා ආහාරය අවසන් වන්නේ ඕස්ට්‍රේලියාවේ වේලාවෙන් පස්වරු හයට පමණය. (ලංකාවේ වේලාවෙන් දවල් එක හමාරට පමණය.)

තවත් පැයකින් හමාරකින් *සිඩ්නි* නුවර ගුවන් තොටුපලට යානය ළඟා වේ. අතිශයින් කාර්ය බහුල මෙම ගුවන් තොටුපලවල එහා මෙහා යන ගුවන් යානා රාශියක් තිබේ. සමහරක් ජාත්‍යන්තර ගමන්වල යෙදෙන යානාය. සමහරක් රට තුළ විවිධ තැන්වලට පියාසර කරන තරමක කුඩා යානාය. *සිඩ්නි* ගුවන් තොටුපලේ දී ආගමන විගමන වතාවත් සපුරාලීමෙන් පසු ගමන් මලු එකතු කර ගත යුතු වේ. **ඕස්ට්‍රේලියාවට විදේශ රටවලින් කිසිම පැල ජාතියක් හෝ නොපිසූ ආහාරයක් ගෙන ඒමට ඉඩ දෙන්නේ නැත.** ඒ නිසා, රේගු පරීක්ෂණය ඉතා සූක්ෂම ව සිදු කෙරේ. හැම ගමන් මල්ලක් ම විවෘත කර පෙන්විය යුතු වේ. රේගු ප්‍රකාශන නිවැරදි ව තිබිය යුතු වේ. මේ කටයුතු හමාර වූ පසු අභ්‍යන්තර ගුවන් ගමන් කවුන්ටරය වෙත යා යුතුය. ප්‍රේමාට හා මට *මෙල්බර්න්* නුවරට ගමන් කිරීමට *ක්වාන්ටාස්* (Quantas) යානයකින් යා යුතු විය. බඩු මලු අදාල ස්ථානයට භාර දී යාන පත්‍රය (Boarding Pass) ලබා ගෙන වෙන ම අංගනයක් වෙත ගියෙමු. ටික වේලාවකට පසුව යානයට පිවිසීමට දොරටු විවෘත කෙරේ. පැයක පමණ ගුවන් ගමනකින් පසුව *මෙල්බර්න්* ගුවන් තොටුපලට පැමිණෙන විට රාත්‍රී නවය හමාරට පමණ ඇත. *වසන්තගේ* කාර් එකෙන් *මවුන්ට් වෙවර්ලි* පිහිටි නිවසට යන විට රාත්‍රී දහය හමාර එකොළහ පමණ වන්නට ඇත. පෙරදින මුළු රැය ම නිදිවරා සිටි අප දෙදෙනාට අවශ්‍ය වූයේ, හැකි පමණ ඉක්මනින් මූණ කට සෝදා ගෙන කුමක් හෝ ආහාරයක් ගෙන නින්දට වැටීමටයි.

මෙවර ඕස්ට්‍රේලියාවට ගොස් එහි මාස පහක පමණ කාලයක් ගත කළෙමු. ඒ නිසා, මින් පෙර අවස්ථාවලට වඩා ක්‍රියාකාරකම් රාශියක නිරත වීමට ඉඩ ප්‍රස්ථාව ලැබිණි. එයින් වැදගත් කරුණු ගැන පහතින් විස්තර කරන්නෙමි. ඒ විස්තර කාල අනුක්‍රමයකට නොව මාගේ මනසේ සටහන් වී තිබෙන අන්දමට එකින් එක ගෙන හැර දැක්වීමයි. **විසිවන සියවස ගෙවී**

විසි එක් වන සියවස උදා වූයේ මෙහි සිටිය දී ය.

ලොකු දුවලා *මවුන්ට් වෙවර්ලි* පෙදෙසේ පදිංචියට ගොස් දෙවෙනි වසරට එළඹ සිටියේය. මුණුබුරා *(දිනීත්) මවුන්ට් වෙවර්ලි* පාසලට යන දෙවන වසර විය. මිණිබිරිය *(සවිනි)* එම ප්‍රාථමික පාසලට ඇතුළත් කළ පළමුවන වසරයි. ඇය පාසල් ඇරී ගෙදර පැමිණි විගස ම, පසු දිනට නියම කර තිබූ ගෙදර වැඩ අවසන් කිරීමට යුහුසුළු වූවාය. බරපතල වගකීමක් හිසමත තබා ගත් කෙනෙකුගේ ස්වරූපය පෙන්නුම් කළාය. ඒ වැඩ අවසන් වූවාට පසුව අස්වැසිල්ලක් ලබන බව පෙනිණි. පාසල ගැන විමසූ විට කියා සිටියේ, පන්තියේ සිටින සිසුන් පන්ති කාමරයෙන් පිටවන විටත්, එයට ඇතුළු වන විටත් තමාට ප්‍රමුඛත්වය ලැබෙන බවයි. පන්තියේ ගුරුවරිය අන් සිසුන්ට කියා ඇත්තේ *සවිනි* වී.අයි.පී. (VIP), එනම් ඉතා වැදගත් කෙනෙකු බවයි. ඒ නිසා, නිතර ම ඇයට පන්තියේ සිසුන් අතර ප්‍රමුඛත්වය ලැබිණි. (එයට හේතුව කුඩා කළ සාප්පු සංකීර්ණයක දී ට්‍රොලියකින් වැටී ආබාධයක් වී සිටීමයි) මේ කාරණය මේ කුඩා දරුවාගේ ආත්ම ශක්තිය ගොඩනැඟීමට උපකාර විය. ශාරීරික ආබාධයක් තිබුණ නමුත් ඉගෙනීමේ දී අතිශයින් දක්ෂ බව පෙන්වා ඇත.

මුණුබුරා ඒ අවදියේ කිසිම දෙයක් බරපතල ලෙස සැලකුවේ නැත. කුඩා කාලයේ දී අතිශයින් ක්‍රියාශීලී විය. අනුන්ගේ නිවසකට ගියත් අසුනක වාඩිවී සිටිනවාට වඩා ඒවායේ ඇඳි දිගේ ගමන් කිරීමට ප්‍රිය කළේය. මවුන්ට් *වෙවර්ලි* නිවසට ගිය පසු, ඉඩකඩ හා ගෘහ භාණ්ඩ ආදිය වැඩිවීම නිසා, *බොක්ස් හීල්* නිවසේ දී හැසිරීමට වඩා ප්‍රවේගකාරී විය. දුව පැන ඇවිදීමට ගෙය තුළ මෙන් ම මිදුල්වල ද ඉඩකඩ තිබිණි. නිවසේ සිට පාසලට පා ගමනින් ගියත් විනාඩි පහකින් පමණ යා හැකි විය. සාමාන්‍යයෙන් දිනපතා ම පාහේ *වසන්ත* දරු දෙදෙනා පාසල් ගෙන ගියේය. එක් දිනක් මා සමඟ පයින් පාසල් යෑමට ගොස් *සවිනි* බිම වැටී දනිස් තුවාල විය. පාසලට ගිය පසු පන්තියේ ගුරුතුමිය ප්‍රථමාධාර ලබා දුන් බව දැනගන්නට ලැබිණි. මින්පසු *සවිනි* පයින් ගමනට එතරම් කැමැත්තක් දැක්වූයේ නැත.

මීට පෙර අවස්ථාවල ඕස්ට්‍රේලියාවට ගිය විට ගමන් බිමන් ගියේ ලොකු දුවගේ මිට්සුබිෂී ගැලන්ට් (Mitsubishi Gallant) කාර් එකෙනි. *එරට නීතිය අනුව එවැනි රථයක ගමන් කළ හැකි වන්නේ රියදුරා ද සමඟ මඟීන් පස් දෙනෙකුට පමණයි.* ලොකුදුවගේ පවුලේ හතර දෙනාත් ප්‍රේමා හා මාත් එක් වූ විට හය දෙනෙකි. ඒ නිසා මෙවර එහි ගිය පසු වසන්තගේ කුඩා කාර් එක විකුණා ආසන හතක් තිබෙන රථයක් මිලට ගත්තේය. මෙම රථයෙන් ඇඩිලේඩ් වැනි දුර බැහැර ගමන් ද ගියෙමු. ඒ විස්තර පසුවටයි.

මගේ මිත්‍ර *එම්.කේ.පියදාස* මහතා එම මහත්මියත් සමඟ ඕස්ට්‍රේලියාවේ දී හමුවීම මෙවර ගමනේ දී වැදගත් සිද්ධියක් විය. *පියදාස මහතාන්* මාත් *මීණිපේ* වාරිමාර්ග කාර්යාලයේ එක කාලයක සේවය කර තිබිණි. ඔහු මගේ

විවාහයේ දී දෙවෙනි මනමාලයා ලෙසත් එක් සාක්ෂිකරුවෙකු ලෙසත් කටයුතු කළේය. විශ්‍රාම ගැනීමෙන් පසුව ඔහු පදිංචි ව සිටි කුරුණෑගල ප්‍රදේශයට ගිය ගමන ගැන කලින් සඳහන් කළෙමි. පියදාස මිතුරාගේ ලොකු පුතා ඕස්ට්‍රේලියාවේ *මෙල්බර්න්* ප්‍රදේශයේ තැනක පදිංචි ව සිටියේය. මගේ මිතුරා එහි පැමිණි බව දුරකථනයෙන් මට දැන්වීය. පසුව දින දෙක තුනක් ඇතුළත ප්‍රේමාත් මාත් *මවුන්ට් වෙවර්ලි* සිට *මෙල්බර්න්* නගරය හරහා තවත් කිලෝමීටර් දහයක් පමණ යා යුතු දුම්රිය ස්ථානයට ගමන් කොට, *පියදාස* මහතාගේ ලොකු පුතාගේ නිවසට ගියෙමු. මේ ගමනට පැයක් පමණ ගතවිය. ලංකාවෙන් ගෙනා කැවිලි ආදිය සහිත ව ප්‍රණීත තේ පැන් සංග්‍රයක් ලැබිණි. මින් පසුව *පියදාස මහතා* ද තම පුතා සමඟ *මවුන්ට් වෙවර්ල්හි* අප නිවසට පැමිණියේය. ඒ අවස්ථාවේ මා මිතුරා යම්කිසි වේදනාවකින් සිටින බව පෙනී කරුණු විමසූ විට, උදර පෙදෙසේ යම් රෝගාබාධයක් කලක් සිට පවතින බව කීවේය. දින කීපයකට පසුව ඒ අය ලංකාවට පැමිණි බව දැනගන්නට ලැබිණි.

මෙල්බර්න් නුවර අවට නොයෙක් තැන්වල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සේවය කළ කථිකාචාර්යවරුන්/වරියන් කීප දෙනෙක් පදිංචි ව සිටියහ. *කාන්ති සමරසිංහ මහත්මිය* දේපළ කළමනාකරණ අධ්‍යයනාංශයේ සේවය කළ කථිකාචාර්යවරියකි. ඇය පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා *මෙල්බර්න් විශ්ව විද්‍යාලයට* ගොස් සිටියාය. පදිංචි ව සිටියේ නගරයෙන් නැගෙනහිර දෙසට වූ තැනකය. රාජ්‍ය පරිපාලන විද්‍යා ආයතනයේ කථිකාචාරිනී *රමණී සමරතුංග මහත්මිය මොනෑෂ් විශ්ව විද්‍යාලයේ* පී.එච්.ඩී. උපාධිය සඳහා පර්යේෂණවල නිතර වී සිටියාය. ඒ මහත්මිය ද *මොනෑෂ්* විශ්ව විද්‍යාලය අසල *ක්ලේටන්* හි (Clayton) තම සැමියා වූ *නිස්ස රාජපක්ෂ* මහතා හා දරු දෙදෙනා සමඟ පදිංචි ව සිටියාය. අප අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරියක් වූ *චන්ද්‍රිකා ජයවීර මහත්මිය* තම සැමියා *(අල්විස් මහතා)* හා දරු දෙදෙනා සමඟ පදිංචි ව සිටියේ ද ඒ අසල ම නිවසකය. *රමණී* සහ *චන්ද්‍රිකා* යන දෙදෙනා ම මගේ ගෝලයින් ද වූහ. *රමණී සමරතුංග* මහත්මිය මේ වනවිට: (2012 අගෝස්තු) *මොනෑෂ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය* තනතුරකට උසස් වී ඇති බව දැන ගන්නට ඇත.

මේ හැම දෙනාට ම පෙර පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ගිය ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යානාංශයේ කථිකාචාර්ය *නවරත්න මහතා,* අනතුරකින් පසුව, තම බිරිය හා ඇගේ සොහොයුරෙක් සමඟ එහි පදිංචි ව සිටී. නවරත්න මහතාට එහි සමාජ සේවා අංශයෙන් ආධාර ලැබෙන බව දැනගන්නට ලැබිණි. ඔහුගේ බිරිය රැකියාවක නිරත වී ඇත. මීට පෙර වතාවක අප *බොක්ස්හිල්* ගිය විටක රෑ කෑමක් සඳහා අපට ආරාධනාවක් ලැබිණි. *නවරත්න මහතාගේ* මස්සිනා අප එක්කර ගෙන ගොස් ආපසු එක්ක

ආවේය. තමාගේ ම නිවසක් ද ඉදිකර ගෙන සිටින *නවරත්න මහතාට* බිළිඳු දරුවෙකු ද සිටියේය. මේ අය අප රටේ සිටියා නම් අත්විය හැකි ඉරණම කුමක් ද? අනුන්ගෙන් යැපෙමින් ජීවත්වන්නට සිදුවිය හැකි ව තිබිණි.

කාන්ති සමරසිංහ මහත්මිය පදිංචි ව සිටි ප්‍රදේශයේ ජීවත් වූ ලාංකිකයින් පිරිසක් *ග්‍රේට් ඕෂන් ඩ්‍රයිව්* (Great Ocean Drive) නම් වූ ප්‍රදේශයේ එක් දිනක විනෝද චාරිකාවක් යන බව කියා අප දෙදෙනාට ද (ප්‍රේමාට හා මට) එයට සහභාගී වන ලෙස දැන්වීය. *වසන්තගේ* කාර් එකෙන් අප දෙදෙනා කාන්තිගේ නිවසට ඇරලන ලදී. එතැන් සිට බස් රථයකින් පහළොවක් විස්සක් පමණ පිරිසක් *මෙල්බර්න්* සිට මුහුදු තීරය අයිනේ මාර්ගයක ගමන් කොට විවේක ස්ථානයට පැමිණ දිවා ආහාරය ගතිමු. ඉන්පසුව තවත් දුරක් ගමන් කොට මුහුදු වෙරළ අයිනේ තැනක නැවතී විවේකයෙන් සිටියෙමු. ආපසු පැමිණි විට *වසන්ත* පැමිණ අප දෙදෙනා *මවුන්ට් වෙවර්ලි* නිවසට කැඳවා ගෙන ගියේය.

ඇඩිලේඩ් නගරයේ පැවැති ක්‍රිකට් තරගයක් බැලීමට ගියේ ද මේ ගමනෙ දී ය. වසන්ත මිල දී ගෙන තිබුණ ආසන හතේ වැගන් රථයෙන් *මෙල්බර්න්* සිට *ඇඩිලේඩ්* නුවරට ගියෙමු. මේ ගමන කිලෝමීටර් හයසීයක් පමණ විය. පෙරවරු නවයට පමණ නිවසින් පිටත් වී, අතරමඟ දී දිවා ආහාරය ගෙන, *ඇඩිලේඩ්* නගරයේ නවාතැන්පලට පැමිණෙන විට රාත්‍රී අටට පමණ වන්නට ඇත. ප්‍රේමාටත් මටත් එක් කාමරයක් ද ලොකු දුවලාගේ පවුලේ හතර දෙනාට වඩා ලොකු කාමරයක් ද නිවාඩු නිකේතනය වෙන් කර තිබිණි.

ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම ඕස්ට්‍රේලියාවට පැමිණි ගමනේ දී *ඇඩිලේඩ් ඕවල් පිටියේ* දී තුන්කොන් සීමිත ඕවර් තරගයට සහභාගී වූහ. ඕස්ට්‍රේලියාව සමඟ පැවැති තරගයේ දී *ඩැරල් හෙයාර්* නම් විනිශ්චයකරු අපගේ ක්‍රීඩක *මුත්තයියා මුරලිදරන්ට* පිට පිට ම නිපන්දු තීරණ දීමට කටයුතු කළ නිසා, ශ්‍රී ලංකා ක්‍රිකට් නායක *අර්ජුන රණතුංග* මහතා දැඩි විරෝධය පා, ලංකාවේ කණ්ඩායම ක්‍රීඩා පිටියෙන් බැහැර ගෙන යෑමට තරවටු කර, මහත් ආන්දෝලනයක් ඇති කළේ මේ තරග වාරයේ දී ය. එදින තරගය නැරඹීමට ගොස් සිටියේ *වසන්ත* (බෑණා) පමණය. මා මේ ආන්දෝලනය දැක්කේ රූපවාහිනිය තුළිනි.

දින දෙකකට පසුව තවත් තරගයක් එංගලන්තයත් සමඟ එම ක්‍රීඩා පිටියේ දී ම පැවැත්වීමට නියමිත ව තිබිණි. ඒ තරගය බැලීමට අපි සියලු දෙනා ම ගියෙමු. තරගය ආරම්භ කළේ සවස් වරුවේය. *වසන්තගේ* මිතුරකුගේ ගෙදර දී ලාංකිකයන් කීප දෙනෙක් මුණගැසී, දිවා ආහාරයෙන් පසුව ක්‍රීඩා තරගය නැරඹීමට ගියෙමු. එදින ද පෙර දින මෙන් *ඩැරල්*

හෙයාර් නම් විනිසුරු හැසුරුණ විට, එයට ද විරෝධයක් දැක්වීය. ඒ සඳහා එංගලන්ත නායක *මයිකල් ඇතර්ටන්* කැමැත්තක් දැක්වූයේ නැත. මගේ මතකයේ හැටියට, ඒ තරගයේ දී *මහේල ජයවර්ධන* ක්‍රීඩකයා ශතකයක් ලබා ගත්තේය. එය ජාත්‍යන්තර තරගයක දී ඔහු ලබා ගත් පළමුවන ශතකය යැයි සිතමි. ඊට දින කීපයකට පෙර *මෙල්බර්න්* ක්‍රීඩා පිටියේ දී පාදයේ ආබාධයක් ඇති වූ *අරවින්ද සිල්වා* ක්‍රීඩකයා *ඇඩිලේඩ්* තරගයට ක්‍රීඩා කළේ නැත.

එදින රාත්‍රිය නිවාඩු නිකේතනයේ ගත කොට, පසු දින පෙරවරු නවයට පමණ ආපසු ගමනට පිටත් වූයෙමු. ඒ අතර, *ඇඩිලේඩ්* නගරයේ බැලිය යුතු තැන්වලට ද ගියෙමු. *ඇඩිලේඩ්* නාගරික ප්‍රදේශය පසු කළ විට මහා මාර්ගය වැටී තිබුණේ ශුෂ්ක ප්‍රදේශයක් හරහාය. අතරමඟ දී හමුවන කන්ටේනර් ප්‍රවාහන රථ මහත් වේගයකින් ගමන් කළ අතර, ඒවා පසුකර යෑම අතිශයින් දුෂ්කර විය. එම මහා මාර්ගයේ වාහන ඉස්සර කිරීමට නියමිත කොටස් වෙන් කර තිබිණි. **එක පැත්තකට යන වාහන ඉස්සර කිරීමට ඇති ප්‍රදේශවල අනිත් පැත්තට යන වාහන පැදවිය යුත්තේ එක මං තීරුවක පමණි.** කිලෝමීටර් පහක් පමණ ගිය පසු අනික් පසට යන වාහන ඉස්සර කරන ප්‍රදේශය හමුවේ. මේ නිසා අධික වේගයෙන් වාහන ගමන් කළත් අනතුරු සිදුවන්නේ ඉතා ම කලාතුරකිනි. නාගරික ප්‍රදේශවලට පිවිසෙන විට වේගසීමාව කිලෝ මීටර් හැටකට හෝ පනහකට හෝ අඩු කිරීමට සිදුවේ. විවෘත මහා මාර්ගයේ කිලෝමීටර් සියය දක්වා වේගයකින් ධාවනය කළ හැකි වේ. ඉතා දීර්ඝ ගමනකින් පසුව රාත්‍රී නවය පමණ වන විට *මවුන්ට් වෙවර්ලි* නිවසට පැමිණියෙමු.

ප්‍රේමාත් මාත් ගෙදර සිටිය දී, ලොකු දුවලා *නිව් සවුත් වෙල්ස්* (New South Wales) ප්‍රාන්තයේ *ග්‍රිෆිත්* (Griffith) නම් වූ ඈත ස්ථානයක දින කීපයක සංචාරයක යෙදුණාහ. වසන්තගේ අක්කා කෙනෙක් විවාහ කර ගෙන සිටි *විජේරත්න* නම් වෛද්‍යවරයා ඒ නගරයේ රෝහලක සේවය කළේය. වසන්තගේ වැඩිමහල් සොහොයුරු *ලාල් ලියනගම* හා පවුල (කුමුදු හා දරු දෙදෙනා) එහි පැමිණ, පසුව *මෙල්බර්න්* පැමිණියහ. ඒ දරු දෙදෙනා *වසන්තගේ* වෑන් රථයෙන් පැමිණි අතර, *ලාල්* හා *කුමුදු* දුම්රියෙන් පැමිණියහ. *මවුන්ට් වෙවර්ලි* නිවස ඒ හතර දෙනාට ද පහසුවෙන් නැවතී සිටීමට ඉඩකඩ තිබිණි. ඒ පවුලේ අය සමඟ නැවත වරක් අපි *පිලිප් අයිලන්ඩ්* (Philip Island) වෙත ගොස් කලින් ගමනේ දී නැවතී සිටි නිවාඩු නිකේතනයේ ම ලැගුම් ගත්තෙමු. ඒ ගමනට වාහන දෙකක් අවශ්‍ය විය. වසන්තගේ වෑන් රථයත්, ලොකු දුවගේ කාර් එකත් ඒ සඳහා යොදා ගන්නා ලදී.

පිලිප් අයිලන්ඩ් ගිය *ලාල් පවුල* පෙන්ගුවින් දර්ශනය නැරඹීමට ගියහ. පසු දින දිවා කාලයේ දී කුඩා යාත්‍රාවකින් අසල මුහුදේ *'සී ලයන්"* (Sea Lion) නම් වූ ලොකු මසුන් වර්ගය නැරඹීමට ගියෙමු. එහි වරාය ප්‍රදේශයේ මනරම් වෙරළ තීරයක් තිබේ. දරුවන් සමඟ එක් දිනක් එහි විනෝදයෙන් ගත කළෙමු. ආපසු එන ගමනේ දී අතරමඟ තිබුණු අවන්හලකින් දිවා ආහාරය ගෙන, හවස් වන විට *මවුන්ට් වෙවර්ලි* නිවසට පැමිණියෙමු. *ලාල් පවුල* සමඟ තවත් දිනක *ඩැන්ඩිනොන්ග්* කඳු මුදුනට ගියෙමු. අවට ප්‍රදේශයේ හතර වටින් මනරම් දසුනක් කඳු මුදුනේ සිට දැකිය හැකි වේ. දින කීපයකට පසුව *ලාල් පවුල* ලංකාවට ගියහ.

කැන්බරා චාරිකාව

මෙවර ද ප්‍රේමාත් මාත් *ඩැන්ඩිනොන්ග්* නගරයේ නාගරික ප්‍රජා ශාලාවේ සභිපතා රැස්වන ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ වැසියන්ගේ හමුවට සහභාගී වූයෙමු. එමඟින් නිවසට වී සිටීමේ ඒකාකාරී භාවය අඩු වේ. වරක් මේ අය දින තුනක විනෝද ගමනක් සංවිධානය කළහ. ඒ ගමනේ පුරෝගාමීත්වය ගෙන ක්‍රියා කළේ *විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ* මා සමඟ එකට උපාධිය හැදෑරූ *අමරසේකර මහතාය.* ඔහු ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගොස් සිටී කෙනෙකි. ලංකාවේ තරුණයෙකුට හිමි බස් රථයකින් ලාංකිකයන් විසි තිස් ගණනක් මේ ගමනට එකතු වූහ. *මහවෙල, ඒකනායක* යන මහතුන් ද ඒ අයගේ බිරින්දෑවරුන් ද අපට හමු වූ සමහර දෙනෙකි.

මෙල්බර්න් නගරයෙන් පිටත් වන විට දවල් දෙදාළහත් පසු වී තිබිණි. අතරමඟ වෙළඳ සංකීර්ණයකින් අවශ්‍ය කරන ආහාර පාන එකතු කර ගෙන, තවත් ටික දුරක් ගොස් හමුවන සංචාරක විවේක ස්ථානයක දී දිවා ආහාරය ගත්තෙමු. ඒ අවස්ථාවේ ගන්නා ලද ඡායාරූපයක් ද මා ළඟ තිබී හමු විය. දිවා ආහාරයෙන් පසුව ගමන අරඹා, රෑ බෝවන විට කැන්බරා නගරයේ සංචාරක නිකේතනයක් වෙත පැමිණියෙමු. මේ මාර්ගය කඳු පල්ලම් සහිත වුවත් ගමනට දුෂ්කර නොවීය. නිවාඩු නිකේතනයේ ආහාර පාන සකසා ගැනීමටත්, නිඳ ගැනීමටත්, පහසුකම් තිබිණි. ගමනට සම්බන්ධ වූ අය ම රාත්‍රී ආහාරය පිළියෙල කළහ.

පසු දින උදේ ආහාරයෙන් පසුව ඕස්ට්‍රේලියාවේ අගනුවර වූ *කැන්බරා* නගරයේ සිරි නැරඹුවෙමු. එහි පාර්ලිමේන්තු රැස්වීම් බැලීමට ද ඉඩ ප්‍රස්ථාව ලැබිණි. මන්ත්‍රී මණ්ඩල දෙක ම එක ගොඩනැගිල්ලේ දෙපසක පිහිටා තිබිණි. එහි ගෘහ නිර්මාණය සුවිශේෂ ලක්ෂණයක් ගනී. පිටතින් සිට බලන කෙනෙකුට තණ කොළ පිට්ටනියක් මෙන් වූ කඳු ගැටයක් දිස්වේ. පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඒ කඳුවැටිය තුළ ඉදි කර තිබෙන අයුරක් ගනී.

මෙදින රෑ ගත කිරීමට අප නඩය ගියේ *වොලොන්ගොන්ග්* (Wollongong) නම් වූ ප්‍රදේශයටයි. එහි කඳු ගැටයක *තායිවාන් බෞද්ධ මධ්‍යස්ථානයක්* වේ. කඳු ගැටය මුදුනේ *බෞද්ධ විහාරය* ද ඒ අසල ම පහළ තලයක භෝජනාගාරයක් ද වේ. මීටර් සියක් පමණ දුරින් කන්දේ පහළට වන්නට හෝටලයක් ඉදිකර තිබේ. එහි යන සංචාරකයන්ට (වන්දනාකරුවන්ට) ලැගුම් ගැනීමට මෙහි කාමර ලබා ගත හැකිය. ඉතා පිරිසිදු ව හා ක්‍රමානුකූල ව මේ ස්ථානය පවත්වා ගෙන යන බව දක්නට තිබිණි. අප එහි ගිය දවසේ රාත්‍රී ආහාරය, පසුදින උදේ ආහාරය භෝජනාගාරයෙන් ලැබිණි. උදේ ආහාරයට පෙර විහාරයේ පවත්වන වතාවත්වලට ද සහභාගී වූයෙමු.

ආපසු ගමන *සිඩ්නි මෙල්බර්න්* මහා මාර්ගය ඔස්සේ විය. එය වරක් මුහුදු තීරයෙන් ද, වරක් ගොඩබිම වනාන්තර තුළින් ද, වැටී තිබිණි. එදින දිවා ආහාරය ගත්තේ කොතැන දී දැ'යි දැන් මතක නැත. මඟ දී දෙතුන් වරක් *ජංගල් ටොයිලට්* (Jungle Toilet) පාවිච්චි කිරීමට සිදුවිය. (ඉන්දියාවේ දඹදිව ගමන් යන අයට ද මෙය සාමාන්‍ය දෙයකි) රාත්‍රී අට පමණ වන විට *ඩැන්ඩිනොන්ග්* නගරයට පැමිණියෙමු. *මහවෙල මහතාගේ* බෑණා වන *පුෂ්පසිරි මහතා* (*වසන්තගේ* මිතුරෙකි) තම කාර් එකෙන් ප්‍රේමාත් මාත් *මවුන්ට් වෙවර්ලි* වෙත රැගෙන ආවේය. *මහවෙල මහතා* ද අප සමඟ පැමිණ ආපසු ගියේය. *මහවෙල මහතාගේ* අභාවය සිදුවූයේ ඕස්ට්‍රේලියාවේ දී ය. ඒ වන විට අපි දෙදෙනා ලංකාවට පැමිණ සිටියෙමු. එතුමාගේ මෘත ශරීරය ලංකාවට ගෙනැවිත් මහනුවර *අනිවත්ත* ප්‍රදේශයේ භූමදාන කරන ලදී. ඒ අවමංගල්‍යයට අප දෙදෙනාත් එහි ගියෙමු. මහවෙල මහතා ජීවත් ව සිටිය දී අවසන් වරට අපට මුණගැසුණේ මේ ගමනේ දී ජ්‍යෙෂ්ඨ පුරවැසි සාදවල දී ය.

එක් දිනක පස්වරුවේ *ප්‍රේමා* ව්‍යායාමයට ඇවිදීමට යන්නට මට කථා කළාය. මා එයට කැමැති වූයේ නැති නිසා, ඇය තනියම එළියට බැස ඇවිදීමට ගියාය. පැයක් පමණ ගතවන තුරු ආපසු නොපැමිණි නිසා, *වසන්තන්* මාත් කාර් එකෙන් නිවස අසල ඇති නොයෙක් පාරවල් දිගේ ගොස් සොයා බැලුවෙමු. කීපවරක් ම ඒ ඒ පාරවල් දිගේ ගොස් පොලීසියටවත් දැන්වීමට කතිකා කර ගෙන ආපසු එනවිට, වෙනත් පාරක දී *ප්‍රේමා* අපට හමු විය. සිදුවූයේ කුමක් දැ'යි විමසූ විට ඇගේ පිළිතුර වූයේ, ගෙදර යන පාර සොයා ගැනීමට නොහැකි වූ බවයි. එය සත්‍යයකි. සුපුරුදු කෙනෙකුට වුව ද එම නිවෙස්වලට යන පාරවල් සොයා ගැනීමට අපහසු වේ. ඇය නිතර ගමන් බිමන් ගියේ මා සමඟ නිසා පාරවල් මතක තබා ගැනීමට අවශ්‍ය නොවීය. *මවුන්ට් වෙවර්ලි* පෙදෙසට ගිය මුල් දිනවල දී මටත් පාර වැරදී තිබේ. මින් පසුව ප්‍රේමා තනියම ඇවිදින්නට ගියේ නැත.



කැන්බරා යන අතර තුර

මේ කාලය තුළ දී සති අන්ත ආදියේ දී ලොකු දුවලා අප දෙදෙනා සමඟ නොයෙක් තැන් බැලීමට එක්ක යන ලදී. වරක් තවත් කඳුකර පෙදෙසකට ගියෙමු. එය එක් දින චාරිකාවක් විය. මේ කඳු ප්‍රදේශය ඉතා සීතල දේශගුණයක් ඇති, සමහර විට හිම වැටෙන, පෙදෙසක් යයි කියනු ලැබේ.

ලොකු දුව ඕස්ට්‍රේලියානු වෛද්‍ය සේවයේ නිරත වීමට සමත් විය යුතු විභාගය නිම කළේ ද මේ යුගයේ දී ය. *එංගලන්තයේ* හා *අයර්ලන්තයේ* විභාග සමත් වී ලංකාවේ වෛද්‍ය විශේෂඥයෙකු ලෙස සේවය කළත්, *ඕස්ට්‍රේලියාවේ* දී එම තත්වය ලබා ගැනීමට එහි විභාග සමත් විය යුතුය. නැත්නම්, ආධුනික තත්වයෙන් (ඉතා ම අඩු වැටුපකට) සේවය කිරීමට සිදුවේ. ඕස්ට්‍රේලියාවේ විභාගය සමත් වීමෙන් පසුව පවත්වන උපාධි ප්‍රදානෝත්සවය නියම ව තිබුණේ 2000 මැයි මාසේ මුලටය. අප දෙදෙනා අප්‍රේල් 22 දින ආපසු ලංකාවට පැමිණීමට නියම ව තිබුණ නිසා, ඒ උත්සවයට සහභාගී වීමට ලැබුණේ නැත. එම උත්සවයේ වීඩියෝ පටයක් *වසන්න* විසින් මා වෙත එවා තිබිණි.

2000 අප්‍රේල් 22 දින සවස *ක්වාන්ටාස්* ගුවන් යානයකින් *මෙල්බර්න්* සිට *සිඩ්නි* ගුවන් තොටුපලට පැමිණියෙමු. *ශ්‍රී ලන්කන්* ගුවන් යානය *සිඩ්නි* සිට පිටත් වන්නේ රෑ 8.30 ට පමණය. නොනවත්වා ගමන් කළ මෙය, පසුදා පාන්දර 3.30 ට පමණ කටුනායකට ළඟා විය. ආපසු එන මේ ගමන රාත්‍රී කාලයේ දී නිසා, කොළඹ සිට සිඩ්නි ගිය ගමන තරම් වෙහෙසකර නොවීය.

පොඩි දුවට දරු උපතක්

පොඩි දුව විවාහ පත්වීමෙන් පසුව මත්තේගොඩ නිවාස සංකීර්ණයේ නිවසක් කුලියට ගෙන එහි පදිංචියට ගොස් සිටියාය. පොඩි දුවගේ පුංචි අම්මා *(චන්ද්‍රා නංගී)* ඇගේ සැමියා වූ *නිස්ස ජයවර්ධන* මහතා සමඟ පදිංචි ව සිටියේ පොඩි දුවලාගේ නිවස ඉදිරියෙන් වූ ඒ අය මිලයට ගෙන තිබූ නිවසකය. පොඩි දුවට ගෙය සොයා දුන්නේ *නිස්ස* විසිනි. පොඩිදුව සේවය කළේ රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේය. *ප්‍රියන්ත* (බෑණා) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සේවය කළේය. ඒ දෙදෙනා දිනපතා සේවයට ගියේ යතුරු පැදියකය.

ප්‍රේමාන් මාත් තුන්වෙනි වරට ඕස්ට්‍රේලියාවට ගොස් සිටිය දී පොඩි දුවට දරු ගැබක් ඇති වූ බව දැනගන්නට ලැබිණි. විවාහ වී වසර දෙක හමාරකට පමණ පසුව දැන ගන්නට ලැබුණ මේ ආරංචිය අප කාගේත් සතුටට හේතු විය. *මත්තේගොඩ* සිට ගමන් බිමන් කිරීම සුදුසු නොවූ නිසා, *මැනිං ටවුමේ* පිහිටි මගේ නිවස තම පදිංචිය සඳහා ඉල්ලා සිටියාය. මා එයට එකඟ විය. *මත්තේගොඩ* කුලී නිවස අතහැර තම බඩුමුට්ටු සමඟ *මැනිං ටවුමේ* නිවසට විත් පදිංචි වූහ. එම නිවසේ ද අවශ්‍ය ලී බඩු ආදිය තිබිණි. මින්පසුව පොඩි දුවට තම ගමන් බිමන්වලට මෙන් ම අවශ්‍ය ඕනෑම වේලාවක වෛද්‍යවරුන් හමුවීමාදියට පහසු විය.

අප්‍රේල් මාසයේ අවසන් සතියේ අප ලංකාවට පැමිණෙන විට දරුගැබට මාස පහක් පමණ ගත වී තිබිණි. දරු ප්‍රසූතිය ආසන්න වන විට පොඩි දුවට නිතර ම උණ ගතියක් පැවතිණ. රැකියාවට ද ගියාය. අවසානයේ 2000 අගෝස්තු මාසයේ දී කාසල් වීදියේ කාන්තා රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබා ගත් අතර, අගෝස්තු මාසයේ 22 දින දරු උපත සිදුවිය. එසේ වුවත්, බිළිඳු දරුවා දැඩි සත්කාර කුටියක තැබීමට සිදුවිය. පොඩි දුවට උණ ගතිය අඩු වූයේ ද නැත. බිළිඳු දරුවා ජීවත් කරවීම දුෂ්කර බව ඒ පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියගේ මතය විය. සතියක් පමණ ගත වන විට අපූර්වා නම් වූ ඒ දරුවා අභාවප්‍රාප්ත විය. කොළඹ කනත්ත සුසාන භූමියේ දේහය මිහිදන් කරන ලදී. පොඩි දුව කොළඹ ජාතික රෝහලට ඇතුළු කර ප්‍රතිකාර කරන ලදී. දින කීපයකට පසු උණ බැසීමෙන් අනතුරු ව ඈ රෝහලින් පිටව ගියාය.

මේ ගැන මහත් සේ දුක්වූ ලොකු දුව, සැප්තැම්බර් මාසයේ අග දී ඕස්ට්‍රේලියාවට යන්නට පොඩි දුවට හා ප්‍රියන්තට ගුවන් ගමන් යාන පත්‍ර දෙකක් එව්වාය. සිඩ්නි නුවර ඔලිම්පික් තරග පැවැත්වෙන සමය නිසා, ලොකු දුවලා එහි ගොස් සිටිය දී පොඩි දුවලා එහි ගොස් පසුව බ්‍රිස්බේන් ගියහ. මේ වන විට ලොකු දුවලා පදිංචි ව සිටියේ ස්ප්‍රින්වූඩ්හි නිවසේය.

ටූවුම්බා වැනි තැන්වල සංචාරයට ගිය බව දැනගන්නට ලැබිණි. සති දෙක තුනකට පසුව ආපසු ලංකාවට පැමිණ සාමාන්‍ය වැඩ කටයුතුවල නිරත වූහ. වාර්ෂික ව ළමා නිවාස ආදියට ආධාර උපකාර කර පිං පමුණුවති.

වෙනත් සිදුවීම්

ප්‍රේමාගේ අයියා කෙනෙකු වූ පුංචි අයියාගේ පුතා පොලිස් සේවයේ නිරත වූවෙකි. ඔහුගේ විවාහ මංගල්‍යයට ආරාධනා කර තිබිණි. එම උත්සවය පැවැත්වූයේ මාතර නුපේ හන්දියට සමීප තැනක පිහිටි උත්සව ශාලාවක දී ය. ප්‍රේමාත් මාත් එහි ගොස් මංගල උත්සවයට සහභාගී වීමු. එවකට මගේ කාර් එකේ යම් යම් ආබාධ පැවැති නිසා, ප්‍රේමාගේ මල්ලී කෙනෙකු වූ හරිස් සමඟ ගොස් මාතර නුපේ හා පඹුරණ ප්‍රදේශයේ ගරාජවලින් පිළියම් යොදා ගතිමි. මංගල උත්සවය පැවැති දින රාත්‍රියේ නෑදෑයින් බොහෝ දෙනෙක් හරිස්ගේ නිවසේ දී රාත්‍රී ආහාරපාන ගත් බව මතකය. මධ්‍යම රාත්‍රියෙන් පසුව අප කීප දෙනෙක් මාතර බ්‍රෝඩ්වේ පෙදෙසේ රෑ කඩයකට ගොස් ආවෙමු. රොටී වැනි දේවල් ආහාරයට ගෙන තේ පානය කර පැමිණියෙමු.

පසුදින ප්‍රේමාත් මාත් පෙරවරු එකොළහට පමණ මාතරින් පිටත් වී දින තුන හතරක සංචාරයක් ඇරඹුවෙමු. දිවා භෝජනය සඳහා හම්බන්තොට තානායමට ගියෙමු. හම්බන්තොට ධීවර වරායේ හා මුහුදේ මනරම් දසුනක් ඇති උස්බිමක තානායම පිහිටා තිබේ. පැයක් දෙකක් ගතකර ගමනට පිටත්වූයෙමු. අපගේ මීළඟ නවාතැන්පල වූයේ බණ්ඩාරවෙලයි. වැල්ලවාය, කොස්ලන්ද, බෙරගල, හපුතලේ හරහා ගොස් බණ්ඩාරවෙලට ළඟාවන විට සවස පහට පමණ ඇත. කොස්ලන්ද පසු වූ විට මහපාර නාය ගොස් ඇති තැනක් පසු කිරීමට සිදුවිය. බණ්ඩාරවෙල තානායමේ කාමර ඉඩකඩ නොතිබුණ නිසා තානායමිකරුට අයිති නිවසක ලැගුම් ගතිමු. ඒ නිවස නිවාඩු නිකේතනයක් ලෙස යොදා ගෙන තිබිණි. එදින රාත්‍රිය බණ්ඩාරවෙල එම නිවසේ ගත කළෙමු.

ඊළඟ දිනයේ අපගේ ඉලක්කය වූයේ බදුල්ලයි. වසර හතළිහට පමණ පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරද්දී අවුරුදු දෙකක් බදුල්ලේ ගත කර තිබේ. බදුල්ල නගරයේ තානායම වෙත ගිය අපට එහි කාමරයක් ලබා ගත හැකි විය. දින දෙකක් ම එහි ගතකළෙමු. අපට පුරුදු තැන් බැලීමට වාහනයේ එහා මෙහා ගියෙමු.

වඩාත් ම වැදගත් වූයේ මුතියංගන විහාරස්ථානය වැඳපුදා ගැනීමයි. එයට ද සිත් සේ ඉඩ ලැබිණි. රෑ දෙකක් බදුල්ලේ තානායමේ ගත කර අපේ ගමනට පිටත්වීමු. එදින අප ගමන් ගත්තේ දුන්හිඳ ඇල්ල තිබෙන පෙදෙස, මීගහකිවුල, කරමැටිය, මාපාකඩ හා මහියංගණ මාර්ගයේය. 1973/74 වසරවල

දී මා නිතර දෙවේලේ මීගහකිවුල කොමාරිකට ගොස් තිබේ. වාහනයෙන් කැටවත්ත මහ පාර දිගේ ගොස් ඒ තැන් බලා ආපසු ගියෙමු.

මහියංගණ චෛත්‍යයට වැඳපුදා ගෙන එදින දිවා ආහාරයට නව නගරයේ තානායමට ගියෙමු. ඉන් පසුව පැයක පමණ විවේකයකට අනතුරු ව මහනුවර දෙසට ගමන ඇරඹුවෙමු. පල්ලේවත්ත, හස්සලක, ගුරුළුපොත, දහඅට වංගුව, තිස්පහ, පණාවැල්උල්ල, තැම්මිටියාන, තවලංතැන්න, කෝවිල්මඩ, උඩදුම්බර (මාඩුගොඩ), හුන්නස්ගිරිය, මැදමහනුවර (උඟරුගල), මොරගහමුල, රඹුක්වැල්ල පසුකර තෙල්දෙණියට (පැරණි කරල්ලියද්ද) පැමිණි පසු එහි නව තානායමට ගොස් කාමරයක් වෙන් කරවා ගත්තෙමි. එදින රෑ ගත කළේ එම තානායමේය. මෙතැන සිට කිලෝමීටරයක් හමාරක් ගියා නම් සරත් පුතාලාගේ ගුරු නිවාසයට යන්නට තිබිණි. එනමුත් මේ ගමනේ දී නෑදෑයින්ට වදයක් වීමට අපට අවශ්‍ය වූයේ නැත. මුදල් ඉතිරි කර ගැනීමට හැකි වුවත් අප දෙදෙනාට අවශ්‍ය වූයේ මින් පෙර නොසිටි තැන්වල නැවතී විවේක ගැනීමයි.

අපගේ අවසාන නවාතැන වූයේ *කඩුගන්නාව* පැරණි තානායමයි. එය හැම අතින් ම පැරණි ස්වභාවයක් ඉසිලිය. එය පිහිටා තිබුණේ කඩුගන්නාවේ කුළුණ *(කැප්ටන් ඩෝසන් අනුස්මරණ කුළුණ)* සමීපයේය. කඩුගන්නාව කන්ද බැසීමට පටන් ගන්නා ස්ථානය අසලය. ඒ නිසා පහසුකම් අඩුවුවත් එය ද ලැබිය යුතු අත්දැකීමක් විය. පසුදින කොළඹ එන අතරමඟ දී දිවා ආහාරය ගෙන *තලපන්පිටියේ* නිවසට යන විට සවස් වී තිබිණි. මාතරින් ගමන පිටත්වීමට පෙර තිබුණ දෝෂ කිසිවක් නැති ව වාහනයට ආපදාවක් නැති ව ගමන අවසන් කිරීමට ලැබිණි.

හරිස්ගේ අභාවය

ඉහත සඳහන් මංගල උත්සවයට ගිය අවස්ථාවේ හමු වූ ප්‍රේමාගේ බාල සහෝදරයා වූ *හරිස්චන්ද්‍ර විජේසිරිවර්ධන* (හරිස්), කොළඹ රක්ෂණ සංස්ථාවේ යම් කටයුත්තකට පැමිණ ආපසු යන විට, පිටකොටුව බස් නැවතුම්පලේ දී බස් රියකට යට වී ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයට රැගෙන ගොස් ඇති නමුත් අභාවප්‍රාප්ත විය. මේ ආරංචිය ලැබුණු විගස හදිසි අනතුරු අංශයට ගොස් බලන විට, හරිස්ගේ මළසිරුර දක්නට ලැබිණි. වැවිලිකරුවෙකු වූ හරිස්ගේ පුත් *රවී* දේහය කොළඹ මල් ශාලාවට දී සූදානම් කර ගෙන මාතර නිවසට ගෙන ගියේය. ප්‍රේමාත් මාත් පසුදින *මාතර තල්පාවිලට* ගොස් අවමඟුල් කටයුතුවලට සහභාගී වූයෙමු. සියලු ම සහෝදර සහෝදරියන් පැමිණ සිටියහ. මෙම මරණය සිදුවූයේ 2000 ජූලි 7වෙනි දා ය.

හරිස්ගේ බිරිඳ රූපා අභාවප්‍රාප්ත වූයේ 2006 දෙසැම්බර් 13වෙනි දා ය. ඊට පෙර ඈ තම දියණිය සමඟ කොළඹ පැමිණි අවස්ථාවක, තලපත්පිටියේ අප නිවසට ද පැමිණියාය. ඒ දෙදෙනා පැමිණියේ *ප්‍රේමා* රෝගාතුර වී සිටි නිසා ඈ බැලීමටය. *රූපා* ද අසනීප වී ඉතා දුර්වල තත්වයකින් පසු වූ බව පෙනිණි. එසේ අප නිවාසයට පැමිණ මාතර ගොස් වැඩි කලක් ගතවන්නට පෙර රූපාගේ අභාවය ගැන ද දැනගන්නට ලැබිණි. එනමුත්, ප්‍රේමා අසාධ්‍ය තත්වයෙන් සිටි නිසා, මට ඒ අවමංගල්‍යයට සහභාගී වීමට නොහැකි විය.

2006 වර්ෂයේ ජූලි මාසයේ දී පමණ ප්‍රේමාගේ වැඩිමහල් සොහොයුරු *එඩිමන්ඩ් විජේසිරිවර්ධන* (පුංචි අයියා) අභවප්‍රාප්ත විය. මගේ විවාහක දිවිය ආරම්භයේ සිට නන් අයුරින් අපට උපකාර කළ කෙනෙකු වූයෙන්, පුංචි අයියාට අවසන් ගෞරව දැක්වීමට යා යුතු විය. ඒ නිසා, පොඩිදුව හා ප්‍රියන්ත බෑණා සමඟ උදෙන් ම තලපත්පිටියෙන් පිටත් වී තල්පාවිලට ගොස් එදින ම ආපසු පැමිණියෙමු. ප්‍රේමාගේ රෝගී තත්වය නිසා රැයක්වත් පිට ගත කිරීමට නොහැකි වූ නිසාය.



ලියනගම පවුල

පුංචි අයියාගේ අභාවයට පෙර, 2002 වසරේ දී පමණ *ප්‍රේමා* ද ගමන් බිමන් යෑමට තරම් සුවයෙන් සිටි අවදියේ පුංචි අයියාගේ දෙවෙනි දුවගේ විවාහ මංගල්‍යයට අප පවුලේ කීප දෙනෙක් සමඟ මාතර ගියෙමු. මංගල උත්සවය පැවතියේ මාතර පඹුරණ උත්සව ශාලාවකය. එවර මංගල උත්සවය හමාර වූවාට පසුව රුහුණු විශ්ව විද්‍යාලයේ සංචාරක නිවාසයකට ගොස් එදින රාත්‍රිය එහි ගත කළෙමු. මේ ස්ථානය වෙන් කරවා ගෙන තිබුණේ ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවය කරන *ප්‍රියන්ත* බෑණාය. පොඩිදුවත්, පොඩිපුතාත්, ප්‍රේමාත්, මාත් ඒ ගමනට සහභාගී වීමු. පසුදින ආපසු ගමනේ දී *බෙන්තර* අසල පිහිටි හෝටල් සංස්ථාවේ භෝජනාගාරයෙන් දිවා ආහාරය ගතිමු. ගෙදර එන විට සවස් වී තිබිණි.

හතරවෙනි ඕස්ට්‍රේලියා ගමන

ලොකු දුව ඕස්ට්‍රේලියානු වෛද්‍ය සභාවේ විභාගයෙන් සමත් වූ පසු විශේෂඥ වෛද්‍ය පුරප්පාඩු ඇති රෝහල්වලට ඉල්ලුම් පත් යවන ලදී. සිඩ්නි, මෙල්බර්න් වැනි ප්‍රධාන නගරවල පුරප්පාඩු ඇති විට ඕස්ට්‍රේලියානුවන්ගෙන් ද ඉල්ලීම් ලැබෙන නිසා ඒවාට තරඟය වැඩිය. වෙනත් ප්‍රාන්තවල රෝහල්වලට එවැනි ඉල්ලුමක් නැත. මේ අතරතුර ක්වීන්ස්ලන්ත ප්‍රාන්තයේ ලෝගන් නම් රෝහලක සම්මුඛ පරීක්ෂණයකට ද පෙනී සිටි පසු ඒ සඳහා තෝරා ගෙන තිබිණි. වසර හතරක් පමණ වික්ටෝරියා ප්‍රාන්තයේ මෙල්බර්න් අසල රෝහලක සේවය කර ඒ ප්‍රදේශයට හුරු වී සිටි නිසාත්, වසන්තගේ මිතුරන් බොහෝ දෙනෙක් මෙල්බර්න් නුවර අවට වාසය කළ නිසාත්, කිලෝමීටර් දෙදාහක් ඈත ප්‍රදේශයකට සංක්‍රමණය වීම යම් තරමක අපහසුවක් විය. එසේ වුවත්, ක්වීන්ස්ලන්ඩ් ප්‍රාන්තයේ දේශගුණය වඩා හිතකර නිසාත් වැඩි වැටුපක් ලැබෙන තනතුරක් ඉක්මනින් ලැබෙන නිසාත් එම තනතුර භාර ගෙන බ්‍රිස්බේන් ප්‍රදේශයට පැමිණීම හැම අතින් ම වාසිදායක විය.

2000 අගෝස්තු මාසයේ දී ලොකු දුවලා ලෝගන් රෝහලේ පත්වීම භාර ගෙන ඒ අසල ස්ප්‍රින්වුඩ් (Springwood) නම් ස්ථානයක මැලේසියානු ජාතිකයෙකුට අයිති නිවසක් කුලියට ගෙන පදිංචියට ගියහ.

ඒ නිසා අපගේ හතරවෙනි ඕස්ට්‍රේලියානු ගමන බ්‍රිස්බේන් නුවරට විය. පෙර පරිදි ශ්‍රීලංකන් ගුවන් යානයකින් 2001 ජූනි 23 දින පාන්දර සිඩ්නි බලා පිටත් වී, සවස 7.30 පමණ වන විට එහි ළඟා වුනෙමු. එවර ද අපට ව්‍යාපාරික පන්තියේ (Business Class) ආසන ලැබිණි. සිඩ්නි ගුවන් තොටුපලේ දී වර්ජින් බ්ලූ (Virgin Blue) ගුවන් සමාගමේ යානයකින් බ්‍රිස්බේන් දක්වා ගියෙමු.

මෙම ගුවන් සමාගම රිචඩ් බ්‍රැන්සන් (Richard Branson) නම් වූ කෝටිපති ව්‍යාපාරිකයාට අයිති වර්ජින් එයාර්වේස් සමාගමේ අතුරු

සමාගමකි. සාමාන්‍ය ගුවන් යානවල මෙන් එහි නොමිලේ ආහාරපාන සැපයීමක් නැත. අවශ්‍ය කෙනෙකුට මිල දී ගැනීමට පුළුවන් සේවයක් යානාව තුළ පවත්වා ගෙන යයි. එනමුත් මේ ගමනට ගතවන්නේ පැයක් පමණ නිසා, එහි මඟීන් බොහෝ දෙනා වතුර බෝතලයක් හා කෙටි ආහාරයක් පිටතින් රැගෙන එති. එය වඩා ලාභදායක නිසාය. බ්‍රිස්බේන් ගුවන් තොටුපලට ළඟා වන විට රාත්‍රී දහය පමණ වන්නට ඇත. වසන්ත එතැනට පැමිණි සිටි නිසා ඉක්මනින් ස්ප්‍රින්වුඩ් හි (Springwood) නිවාසයට පැමිණීමට හැකි විය.

අපගේ මුණුබුරා (දිනීත්) සහ මිණිබිරිය (සවිනි) අසල තිබූ ආගමික නිකායික පුද්ගලික පාසලක් වූ ජෝන් පෝල් (John Paul) පාසලට ඇතුළු කර තිබිණි. ඒ දෙදෙනාට මෙහි පැමිණි පසු මවුන්ට් වෙවර්ලි පාසැලේ දී ඉගෙන ගත් පන්තියට වඩා ඉහළ පන්තියකට ඇතුළු කර ගෙන තිබිණි. ඒ නිසා, එක වසරක වාසියක් ලැබිණි. ලොකු දුව ලෝගන් රෝහලේ සේවයට ගියාය. එය විනාඩි විස්සක පමණ ගමනක් විය. වසන්ත (බෑණා) බ්‍රිස්බේන් නගරය අසල දේපල වෙළඳ සමාගමක රැකියාවක සම්බන්ධ වී සිටියේය. දරු දෙදෙනාට පාසල් අරුණේ සවස තුන හමාරට පමණය. ඒ නිසා ඒ වේලාව වන විට පාසලට ගොස් ගෙදර එන්නට පහසුකම් තිබුණ බව පෙනිණි.

ලොකු දුවලා එයිට් මයිල් ප්ලේන්ස් (Eight Mile Plains) ප්‍රදේශයේ මේසී පෙදෙස (Maisie Place) නිවසක් මිලයට ගෙන එහි පදිංචියට ගියහ. මෙය ස්ප්‍රින්වුඩ්හි නිවසට වඩා ඉඩකඩ තිබිණි. තමාගේ නිවසක් වීම තවත් වැදගත් වෙනසකි. එම නිවසේ සිට කිලෝමීටර් එක හමාරක් දෙකක් දුරින් 'ගාඩ්න් සිටි' (Garden City) නම් වෙළඳ සංකීර්ණයක්, බස් නැවතුම්පලක් පිහිටා තිබිණි. මේසි වීදිය අසල සිට ගාඩ්න් සිටි වෙත පැයකට වරක් පමණ යන එන බස් රථයක් විය. පයින් ගියොත් පැය බාගයක් පමණ ගතවේ. ප්‍රේමා සමඟ පයින් ගමන පහසු නොවීය. ඒ නිසා අප දෙදෙනාට අවශ්‍ය වූ විටක බස් රථයෙන් ම මේ ගමන ආවේ ගියේය. වෙනත් ගමන් බිමන් ලොකු දුවලා සමඟ ගියෙමු.

අප දෙදෙනා මෙවර ඕස්ට්‍රේලියාවට ගියේ එහි වැඩි කල් ගත කිරීමට නොවේ. එහෙත් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් කටුනායක ගුවන් තොටුපලට එල්ල කළ ප්‍රහාරය නිසා, ශ්‍රීලංකන් ගුවන් යානා රාශියක් විනාශවීමත් සමඟ ඕස්ට්‍රේලියාවට තිබුණ ගුවන් සේවය නතර විය. ඒ නිසා, විකල්පයක් සොයන විට එහි අතරමං වූ මඟීන්ට එමිරේට්ස් (Emirates) ගුවන් සේවයේ යානාවලින් ආපසු පැමිණිය හැකි බව ආරංචි විය. ඒ නිසා, බ්‍රිස්බේන් නගරයේ පිහිටි ශ්‍රීලංකන් ගුවන් සේවයේ නියෝජිත කාර්යාලයට ගොස් ඒ සඳහා වැඩ පිළිවෙල යොදා ගත යුතු විය. මේ නිසා අතිරේක වියදමක් නැතිව ආපසු ලංකාවට පැමිණීමට ඉඩ ලැබිණි.

වරක් බයිරන් බේ (Byran Bay) නම් වූ මුහුදු තීරයකට ගියෙමු. ඒ සඳහා බ්‍රිස්බේන් නුවර සිට කිලෝමීටර් තුන්සීයයක් පමණ නිව් සවුත් වෙල්ස් මාර්ගය දිගේ ගමන් කොට, මුහුදු තීරයට වැටී තිබුණ කුඩා මාර්ග යක් දිගේ ටික දුරක් යා යුතු විය. මෙම ස්ථානයේ විශේෂත්වය නම්, තල් මසුන් රංචු පිටින් දැක ගැනීමට ලැබීමයි. ඕස්ට්‍රේලියාවේ මැද හරියෙන් නැගෙනහිරට ම පිහිටි ස්ථානය බයිරන් බේ ප්‍රදේශය බව කියනු ලැබේ. එක කාලයකට ඒ අවට මුහුදේ තල් මසුන් දක්නට ලැබේ. මෙහි යන මහා මාර්ගය දෙපස මූකලාන් කැලෑ මෙන් ම උක් වගාවන් ද දක්නට ලැබේ. උක් වගාව කිලෝමීටර් සිය ගණනක් පමණ එක දිගට පැතිර ඇත. සිඩ්නි නගරයේ සිට බ්‍රිස්බේන් දෙසට වැටී ඇති දුම්රිය මාර්ගය ද තැනින් තැන දී හමුවේ.

බ්‍රිස්බේන් නගරයේ සිට කිලෝමීටර් අසූවක් පමණ ගමන් කළ විට *ගෝල්ඩ් කෝස්ට්* (Gold Coast) නම් මුහුදු තීරයක් හමුවේ. ඒ ප්‍රදේශය සංචාරකයින් සඳහා දියුණු කර තිබේ. *ගෝල්ඩ් කෝස්ට්* නගරය ද විශාල ප්‍රදේශයක් තුළ පැතිර තිබේ. වරක් මෙහි නිවාඩු නිකේතනයක් වෙන් කරවා ගෙන අප දෙදෙනා සමඟ ලොකු දුවලා එහි ගොස් දින දෙකතුනක විවේකයක් ගත කළහ.

විදේශගත වී සිටින ශ්‍රී ලාංකික බෞද්ධයින් ඒ රටවල දී නිතර දෙවේලේ ආගමික කටයුතුවල නිරත වන බව පෙනේ. අපේ ලොකු දුවලා ද මේ සිරිත අනුගමනය කළහ. මෙල්බර්න් නගරය ආශ්‍රිත ව වාසය කරද්දී *ඩැන්ඩිනොන්ග්* පන්සලට ගියහ. *බ්‍රිස්බේන්* පැමිණි පසු වරක් *ස්ප්‍රින්ග්වුඩ්* අසල නිවසක් ආවාසයක් ලෙස යොදා ගෙන සිටි ලංකාවේ භික්ෂූන් වහන්සේ කෙනෙකුට දන්දීම කළේය. පසුව *ෆොරස්ට් ලේක්* (Forest Lake) නම් ස්ථානයේ පිහිටි පන්සලකට සම්බන්ධ වූහ. එහි භූමි භාගයක බෝධියක්, දාගැබක්, ධර්ම ශාලාවක් හා ආවාසයක් සහිත පන්සලක් තිබේ. ලංකාවේ භික්ෂූන් වහන්සේ එහි වැඩ වසති.

මෙම පන්සල්වලට සිංහල බෞද්ධ ජනයා රැස්වන්නේ සෙනසුරාදා දිනවල දී ය. දහම් පාසල පවත්වන්නේ ද එදින සවස් වරුවේ ය. සිංහල බෞද්ධ ළමයින්ට ආගම ඉගැන්වීම පමණක් නොව සිංහල ඉගැන්වීම ද (ලිවීම, කියවීම) සිදුවේ. සෙනසුරාදා දිනවල අවශ්‍ය කෙනෙකුට පන්සලේ දී ම රෑ කෑම ගැනීමට කුඩා භෝජනාගාරයක් සංවිධානය කරති. ඉඳිආප්ප වැනි දේ පිටතින් රැගෙන එති. මේ භෝජනාගාරයේ දී ම ආප්ප උයනු ලැබේ. පන්සලට රැස්වන කාන්තාවන් මේ කටයුතු කරන්නේ ස්වේච්ඡා වෙනි. ඒවායින් ලැබෙන ආදායම පන්සලේ නඩත්තුවට යොදනු ලැබේ.

ෆොරස්ට් ලේක් පන්සලේ දී බොහෝ කලකට පෙර බදුල්ලේ දී දැන හැඳිනගෙන සිටි *ගල්කැටිය* නම් මහතෙක් මුණගැසිණි. බදුල්ල ප්‍රදේශයේ

ව්‍යාපාරික සහෝදරයින් ද සිටින *ගල්කැටිය* මහතා, එවකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරියෙකු විය. පසු කලෙක විදේශගත ව ඕස්ට්‍රේලියාවට පැමිණ *බ්‍රිස්බේන්* හි පදිංචි ව සිටී. *ෆොරස්ට් ලේක් පන්සලේ* දාගැබ ඉදිකිරීමේ දී බොහෝ වෙහෙස මහන්සි වූ බව *ගල්කැටිය* මහතා කීවේය.

'අබේදීර' නම් මහතෙක් මේ පන්සලේ දායකයින් අතර පෙරමුණ ගෙන කටයුතු කරයි. ඔහු මා ලංකාවේ දී දැන හැඳින සිටි අබේදීර මහතුන් තිදෙනෙකුගේ බාල ම සහෝදරයාය. ඒ පවුලේ වැඩිමහල් සහෝදරයා ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහකාර ලේකම්වරයෙකු ලෙස සේවය කොට, පසුව *ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී* තනතුර දැරීය. ඊට පසුව ඕස්ට්‍රේලියාවට ගොස් පදිංචි ව ඇත. ඒ *අබේදීර මහතා* බ්‍රිස්බේන් අවට ඇති වෙනත් පන්සලක දායකයෙකි. මා බ්‍රිස්බේන් පැමිණි බව ආරංචි වී දිනක් ලොකු දුවගේ ගෙදර පැමිණ මා මුණගැසී ගියේය. අනෙක් අබේදීර සහෝදරවරුන් දෙදෙනා ම මා ධීවර සංස්ථාවේ සේවය කරද්දී හමු වූ අය වෙති. ඒ අය තව ම ලංකාවේ පදිංචි ව සිටිති.

ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයේ පී.එච්.ඩී. (Ph.D) උපාධියට ඉගෙන ගනිමින් සිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යා අධ්‍යයාංශයේ කථිකාචාර්ය *යාපා බණ්ඩාර මහතා* ද මට බ්‍රිස්බේන් නුවර දී හමුවිය. ඔහු තම බිරිඳ හා පුතා සමඟ එහි පදිංචි ව සිටියේය. වරක් දිවා ආහාරය සඳහා අපට ආරාධනා කර එහි ගියෙමු. ලොකු දුවලා ඒ අයට ද වරක් දිවා ආහාරයක් සඳහා ආරාධනා කළහ. අපගේ මුණුබුරාත් යාපා බණ්ඩාර මහතාගේ පොඩි පුතාත් කුළුපග මිතුරන් බවට පත්වූහ. යාපා බණ්ඩාර මහතා තම අධ්‍යාපන කටයුතු අවසන් කළ පසුව, නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ *වගවග* (Waga Waga) *විශ්ව විද්‍යාලයක* සේවය සඳහා එහි ගොස් පදිංචි වූ බව පසුව මට දන්වා තිබිණි. යාපා බණ්ඩාර මහතා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්ව සිටි *ගනේගල* මහතාගේ සහෝදරයෙක් යයි කියනු ලැබේ.

ඕස්ට්‍රේලියාවේ ඊසාන දෙසට වන්නට පිහිටි ක්වීන්ස්ලන්ත ප්‍රාන්තය උක් වගාව මෙන් ම වෙනත් පළතුරු එළවළු වගාවන් සඳහා ද යොදා ගෙන ඇත. එහි දේශගුණය නිසා ලංකාවේ වැවෙන එළවළු පළතුරු එහි වගා කෙරේ. කෙසෙල්, කොස්, පොළොස් වැනි දේ පවා එහි වෙළඳ සැල්වලින් මිල දී ගැනීමට තිබේ. ලංකාවෙන් ගොස් සිටින අයගේ වෙළඳසැල් ද එහි තිබේ. ඒවායින් රතු කැකුළු හාල් වැනි ලංකාවේ සමහර ආහාර වර්ග මිල දී ගැනීමට තිබේ. සමහර කෙනෙක් ආප්ප, ඉඳිආප්ප වැනි ආහාර වර්ග සාදා විකිණීමේ නිරත ව සිටිත්. මේ නිසා ලංකාවේ අයට තමන්ට සුපුරුදු ආහාරපාන ලබා ගැනීමට දුෂ්කර නොවේ.

බ්‍රිස්බේන් නගරයේ පිහිටි *ගබා* (Gabba) නමින් හඳුන්වන ක්‍රිකට් ක්‍රීඩා පිටියේ පැවැත්වූ තරග දෙක තුනක් නැරඹීමට යෑමේ අවස්ථාව ලැබිණි. ඒ තරග ලංකාවේ හා ඕස්ට්‍රේලියාවේ ක්‍රීඩා කණ්ඩායම් දෙක අතර පැවැත්වූ ඒවාය. මෙවැනි අවස්ථාවල ඕස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රී ලාංකිකයෝ තරග නැරඹීමට පැමිණ ලංකාවේ ක්‍රීඩකයින්ට සහයෝගය දක්වති. මැල්බන් නුවර එම්.සී.ජී. (MCG) පිටියේ තරග පවත්වන විට, ශ්‍රී ලාංකිකයින් විශාල සංඛ්‍යාවක් එය නැරඹීමට පැමිණ, ලංකාවේ ක්‍රීඩකයින් උද්යෝගීමත් කරති. ඕස්ට්‍රේලියාවේ පදිංචි ලංකාවේ අය වෙනත් නගරවල පැවැත්වෙන තරග නැරඹීමට ද යති. එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය පවතිද්දී ඕස්ට්‍රේලියාවේ සිටි ඔවුන්ගේ හිතවාදීන් අතළොස්සක් යම් යම් විරෝධතාවන් පැවැත්වූවත් ක්‍රීඩා තරග පැවැත්වෙන ස්ථානවල උද්ඝෝෂණ කිසිවක් ඇති වූ බවක් දැනගන්නට තිබුණේ නැත.

ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර ලෝක වෙළඳ මධ්‍යස්ථානයට ප්‍රහාර එල්ල කරන විට අප සිටියේ *බ්‍රිස්බේන් නුවර එයිට් මයිල් ප්ලේන්* හි ලොකු දුවලාගේ ගෙදරය. සිරිතක් වශයෙන් රාත්‍රී නිදා ගැනීමට ගොස් බොහෝ වේලා ගතවන තුරු කුඩා ගුවන් විදුලි යන්ත්‍රයකින් බී බී සී, ඒ බී සී හා සී එන් එන් වැනි ගුවන් විදුලි සේවාවලට කන්දීම මගේ සිරිත විය. සැප්තැම්බර් 11 දින රාත්‍රියේ එසේ ගුවන් විදුලිය ශ්‍රවණය කරන විට, නිව්යෝර්ක් නුවර ප්‍රහාරය ගැන ආරංචිය ලැබිණි. මේ සිද්ධිය සජීවී විකාශනයක් ලෙස ශ්‍රවණය කිරීමට ලැබුණ අතර, පසුදින උදෑසන රූපවාහිනියෙන් සියලු දර්ශන දැක ගැනීමට ලැබිණි. මේ සිද්ධිය වූයේ එල්ටීටීඊ ත්‍රස්තයින් අපේ ගුවන් යානාවලට පහර දී මාස එක හමාරකට පමණ පසුවයි.

ඉහතින් සඳහන් කළ පරිදි ලංකාවට ආපසු පැමිණීමට *ශ්‍රී ලංකන්* ගුවන් යානා නොවූයෙන්, සිඩ්නි නුවරට ගොස් *එමිරේට්ස්* යානාවකින් සිංගප්පූරුව බලා ගියේ 2001 සැප්තැම්බර් 16වෙනි දා ය. 17වෙනි දා පාන්දර සිංගප්පූරු ගුවන් තොටුපලේ සිට ලොකු පුතා සමඟ ඔහුගේ නිවසට ගියෙමු. මේ වන විට ලොකු පුතා පදිංචි ස්ථානය වෙනස් කර තිබිණි. සිංගප්පූරුවේ සතියක පමණ කාලයක් ගත කළෙමු.

ඒ නිසා, සිංගප්පූරුවේ නැරඹිය යුතු තැන් කීපයක් බැලීමට ඉඩ ලැබිණි. වරක් එහි සත්ව උද්‍යානයක් බැලීමට ගියෙමු. මෙය සත්ව උද්‍යානයකට වඩා හරිත උද්‍යානයක් ලෙස සංවර්ධනය කර තිබේ. ඉතා ක්‍රමානුකූල ව ගස් කොළන් වවා ඇති මෙහි, විවිධ පක්ෂීන්ට නිදහසේ පියාසර කිරීමට හැකිවන සේ, දැලින් රැකවරණය කර ඇති පෙදෙස් තිබේ. හිම වලසෙක් සිටින ගුහාවක් නියමිත සීතල ඇති වන සේ ඉදිකර තිබේ. මෙම හරිත වනය හා

පක්ෂි/සත්ව උද්‍යානය සැලසුම් කර ආරම්භ කරන ලද්දේ දෙහිවල සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂවරයා ව සිටි *ලින් ද අල්විස්* (Lyn de Alwis) මහතා විසින් යයි කියනු ලැබේ.

තවත් දිනක සන්තොස (Sentosa) දූපත නැරඹීමට ගියෙමු. සිංගප්පූරුවේ වරාය අසල ගොඩනැගිල්ලක ඉහළ මාලයේ සිට ඈතින් පිහිටි බිම්කඩක් දක්වා ඇද තිබෙන කම්බි දිගේ ගමන් කරන පුටුවලට සමාන යානාවලින් එම දූපතට පිවිසීමට පුළුවන. ඉන්පසුව පා ගමනින් ඇවිදිමින් නැරඹීමට ඇති දේ බොහෝය. බ්‍රිතාන්‍ය පාලකයින් දෙවෙනි ලෝක යුද සමයේ සිංගප්පූරුවේ යම් යම් ගිවිසුම් අත්සන් කිරීම දක්වන ආකෘති ඉදිකර තිබෙන ශාලාවක් ඇත. තවත් තැනක පොළොව යට මසුන් තටාක සංකීර්ණයක් දක්නට ලැබේ. කඳුගැටයේ ඉහළ ම තලයේ දුම්රිය මාර්ගයක් තිබේ. එතැන පසුකර පහළට යන විට, චතුර මල්වලින් ගහන ජලාශ සංකීර්ණයකි. ආහාරපාන ලබා ගැනීමට තැන් ද තිබේ. මේ නිසා කිසිම පාළුවක් නොදැනී පැය හත අටක් විවේකයෙන් ගත කිරීමට හැකි තැනකි, මෙම දූපත.

මේ ආකාරයට ලොකු පුතාලා සමඟත් අප දෙදෙනා වෙනමත් සිංගප්පූරුවේ නොයෙක් තැන් දැක බලා ගෙන, සතියකට පසුව 2001 සැප්තැම්බර් 22 දින *ශ්‍රීලංකන්* ගුවන් සමාගමේ යානයකින් ලංකාවට පැමිණියෙමු. කටුනායක ගුවන් තොටුපලේ සිට පොඩි දුවලා අප එක්කර ගෙන ගියේ *නලපන්පිටිය* අපේ නිවසටයි.

පස්වෙනි ඕස්ට්‍රේලියා ගමන

මෙවර ප්‍රේමාත් මාත් ඕස්ට්‍රේලියාවේ ගියේ *බ්‍රිස්බේන්* නගරයටය. 2002 නොවැම්බර් 8වන දින කටුනායකින් පිටත් වී සිංගප්පූරුවට ගොස් *බ්‍රිස්බේන්* නුවරට පැමිණ ඇත්තේ 9වන දින පෙරවරුවේය. මේ වන විට ලොකු පුතා ද ඕස්ට්‍රේලියාවේ *ක්වීන්ස්ලන්ත ප්‍රාන්තයේ* භාණ්ඩාගාරයේ රැකියාවක් ලබා ගෙන *බ්‍රිස්බේන්* නුවර පදිංචියට ගොස් සිටියේය. ගුවන් තොටුපලට පැමිණි අප දෙදෙනා ලොකු දුවලාගේ නිවසට එක්කර ගෙන ගියේ ලොකු පුතාය. මෙවර ගමනේ දී අප දෙදෙනා ඕස්ට්‍රේලියාවේ මාස තුනක් ගත කර තිබේ. ඒ කාලය තුළ සිදුවූ වැදගත් කරුණු කීපයක් මෙහි විස්තර කරනු ලැබේ.

2002 වසර අවසානයේ දී දින කීපයක් ගත කිරීමට *බනියා කඳුකරයේ* (Bunya Mountains) නිවාඩු නිකේතන දෙකක් වෙන් කරවා ගෙන, ලොකු පුතාලා හා ලොකු දුවලා සමඟ එහි ගියෙමු. අප දෙදෙනා ගියේ ලොකු පුතාගේ වාහනයේය. බ්‍රිස්බේන් ප්‍රදේශයේ සිට මේ ගමනට පැය පහක් හයක් ගතවේ. ටික දුරක් ගමන් කළ විට කඳුකර මාර්ගයක් හමුවේ. අතරමඟ *ටූවූම්බා* (Toowoomba) නමැති නගරයක් හමුවේ. එහි දී දිවා ආහාරයෙන්

පසුව ගමනේ ඉතිරි කොටසට පිවිසියෙමු. නිවාඩු නිකේතනවලට ළඟා වන විට සවස පහට පමණ ඇතැ'යි සිතමි. ලොකු දුවලාට වෙන ම නිවසක් තිබිණි. ලොකු පුතා, නිර්මලා (ලේලි) හා අපි දෙදෙනා කඳුබෑවුමේ තවත් පැත්තක තිබුණ නිවසකට ගියෙමු. එතැන සිට මනරම් දසුනක් දැකීමට හැකි විය.

පොළොවෙන් අඩි දෙක තුනක් ඉහළට ඇති කණු මත නිවස ඉදිකර තිබේ. බිත්ති ලෑලිවලින් නිමකර තිබූ අතර, වහල වානේ තහඩුවලින් සෙවිලි කර තිබිණි. මෙම නිවසට ජලය ලබා ගන්නේ ඒ ඒ නිවසට වෙන වෙන ම ඉදිකර තිබූ වැසි වතුර එකතු කරන ජල ටැංකිවලිනි. නිවාසවල වැහි පිහිලිවලින් වැසි සමයේ ගලා යන ජලය මෙම ජල ටැංකිවලට හරවා තිබේ. නිවස තුළ තිබෙන ජල කරාම විවෘත කරන විට පොම්පයක් ක්‍රියාත්මක වී ජලය ගලා ගෙන එයි. මේ කඳු මුදුනේ දිය උල්පත් කිසිවක් නැත. අප හැම දෙනාට ම ආහාරපාන සකස් කළේ ලොකු දුවලාගේ නිවසේ දී ය. ජනවාරි 1වෙනි දා උදේ ආහාරයට කිරිබත් උයා තිබිණි. දුරු මිරිස් ගෙන ගොස් තිබුණ නිසා, කිරිබත් කෑමට හොඳ ලුණු මිරිසක් ද තිබිණි.

මේ කඳුගැටය ආශ්‍රිත ව ඇවිදීමට අඩි පාරවල් තිබුණ නමුත්, ප්‍රේමාටත් මටත් කන්දේ පහළට ගොස් ආපසු පැමිණීමට දුෂ්කර වූ නිසා, සමතලා බිමේ ටික දුරක් ඇවිද විවේක සුවයෙන් ගත කළෙමු. මේ හැම තැනක ම නොවරදවා ම දක්නට ලැබෙන්නේ *කැනගරුලාය.* ගෙවල් අසල තණබිම්වලත් මේ සත්තු සැරිසරති. ආපසු *බ්‍රිස්බේන්* එන ගමනේදීත් අප දෙදෙනා ආවේ ලොකු පුතාගේ රථයෙනි. ඒ එන අතරමඟ කුඩා නගරයක තිබුණ ඉතා පැරණි හෙල්ලෙන පාලමක් ද දැක ගත හැකි විය. සවස තුන හතර පමණ වන විට ලොකු දුවලාගේ නිවසට පැමිණියෙමු. ඒ අය වෙන ම වාහනයකින් අපට පෙර නිවසට පැමිණ උන්හ.

ප්‍රේමා කලක් සිට විටින් විට ප්‍රදර්ශනය කළ රෝගී තත්ත්වයක් මෙවර *බ්‍රිස්බේන්* ගිය විට රාත්‍රී කාලයේ දී නිතර නිතර පැන නැඟිණි. රෑ නිදා සිටින විට අවදි වී, ජනෙල් වීදුරුවලින් පෙනෙන විවිධ ඡායා පෙන්වා, එහි සිටින්නේ කවුදැ'යි මගෙන් ප්‍රශ්න කළාය. රාත්‍රී කාලයේ කාමරය තුළ තිබෙන විදුලි ආලෝකය නිසා වීදුරු ජනෙල්වලින් දිස්වන්නේ වෙනත් කෙනෙක් කාමරයෙන් පිටත සිටින අයුරකි. ඇත්ත වශයෙන් එය තමාගේ ම රුවේ ඡායාවකි. එනමුත් යම්කිසි දුර්වල මානසික තත්වයක් ඇති විට මෙය වෙන කෙනෙක් සේ පෙනෙන්ට ඉඩ තිබේ. මේ පිළිබඳ ව ලොකු දුව හඳුනන සිඩ්නි නුවර පදිංචි ව සිටි ලාංකික මනෝ වෛද්‍යවරියකගෙන් විමසූ විට කියා ඇත්තේ, *ඩිමෙන්ෂියා* (Dementia) නම් වූ රෝගය *ඇල්ස්හයිමර්* (Alzheimer's disease) රෝගයේ ප්‍රතිඵලයක් බවයි. දැඩි ලෙස අමතක වීම ද මෙහි ලක්ෂණයකි. කුඩා කල බොහෝ දේ මතක නමුත් මෑතක කරුණු මතක නැත.

මේ දිනවල ලොකු දුවලා *සිඩ්නි* නුවරට යෑමට සැලසුම් කර තිබිණි. එහි *වසන්තගේ* සහෝදරයෙකු වන *බන්දුල ලියනගම* පුතා සිය පවුල සමඟ පදිංචි ව සිටියේය. ඒ නිසා අප දෙදෙනාට ද *සිඩ්නි* ගමනට *වර්ජින් බ්ලූ* ගුවන් සේවයෙන් ආසන දෙකක් වෙන් කරවා ගෙන එහි ගියෙමු. ලොකු දුවලා එහි ගියේ ඒ අයගේ වාහනයෙනි. *සිඩ්නි* නුවර දී ලොකු දුව හඳුනන වෛද්‍යවරිය මුණ ගැසී ප්‍රේමා පරීක්ෂා කර බැලුවාය. එයින් ද තහවුරු වූයේ *ඇල්ස්හයිමර්* රෝගය උග්‍ර වන බවය.

ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම මේ දිනවල ඕස්ට්‍රේලියාවේ සංචාරයක නිරත ව සිටියේය. සිඩ්නි ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පැවැත් වූ සීමිත ඕවර් තරගයක් බැලීමට අවස්ථාව ලැබිණි. එදින තරගයෙන් ලංකා කණ්ඩායම ජයග්‍රහණය කළේය. මගේ මතකයේ හැටියට *සනත් ජයසූරිය* හා *මාවන් අතපත්තු* යන ක්‍රීඩකයන් දෙදෙනා මෙම ජයග්‍රහණයට මඟ පෑදූහ.

2003 පෙබරවාරි 7වන දින *බ්‍රිස්බේන්* ගුවන් තොටුපලින් පිටත් වී සිංගප්පූරුව හරහා එදින රාත්‍රියේ කටුනායකට පැමිණියෙමු. මේ ගමනේ දී අප ගමන් කළේ *එමිරේට්ස්* සමාගමේ යානයකිනි. මෙය අප දෙදෙනාගේ අවසන් විදේශ සංචාරය විය. අප දෙදෙනාට ම ගමන් බිමන් අප්‍රිය වී තිබිණි. අසනීප ද වැඩි විය. විදේශවල දී යම් කරදරයක් වුවහොත් එයින් ද පීඩා විඳින්නේ දරුවන් නිසා, උපන් රටට වී ජීවත්වීම හැම අතින් ම උචිත බව තේරුම් ගතිමු.

1998 අප්‍රේල් මාසයේ විශ්‍රාම ගැනීමෙන් පසුව, 2003 පෙබරවාරි මාසය වන තුරු මෙතෙක් විස්තර කළේ විදේශ ගමන් ගැන පමණයි. ඒ අතරතුර ලංකාවේ දී අප දෙදෙනා නිරත වූ ගමන් බිමන් හා වෙනත් කටයුතු ගැන විස්තර කළ යුතු ව තිබේ.

විදේශ ගමන්වලට පසුව

ප්‍රේමාත් මාත් අවසන් වරට ඕස්ට්‍රේලියාවට ගොස් ආපසු පැමිණ පදිංචි වූයේ *තලපත්පිටිය* කනත්ත පාරේ පිහිටි අප නිවසේය. ඒ වන විට අපේ පරිහරණයට තිබුණේ 2002 අගෝස්තු මාසයේ දී පොඩි පුතා මට මිලයට ගෙන තිබුණ *නිසාන් "වින්ග්රෝඩ්"* රථයයි. 1994 වසරේ දී බදු සහන සහිත ව වාහනයක් ගෙන්වා ගැනීමට බලපත්‍රයක් මට ලැබිණි. ඒ සඳහා නුගේගොඩ "හොන්ඩා" ඒජන්සිය මඟින් *ටොයෝටා කොරෝනා* ඩීසල් කාරයක් ගෙන්වා ගෙන තිබිණි. ඒ රථය මිල දී ගැනීමට මගේ *ට්‍රැඩ් සනී* හා *බට්ට සනී* යන කාර් දෙක ම විකිණීමට සිදුවිය. *බට්ට සනී* කාර් එක *නෙදර්ලන්තයේ* ගොස් ආපසු පැමිණි විට මිල දී ගත් කාර් එකයි. *ට්‍රැඩ් සනී* කාර් එක *බෘනායි* ගොස් ආපසු පැමිණි විට මිල දී ගත් මගේ

දෙවෙනි කාර් එකයි. තුන්වෙනි කාර් එක මිල දී ගැනීමට පළමු කාර් දෙක ම විකුණුවෙමි. *ටොයෝටා කොරෝනා ඩීසල් කාර්* එක නිසා, නොයෙක් වර කරදර විඳීමට සිදුවිය. වරක් මහනුවර ගමනක් ගොස් ආපසු එන විට වරකාපොල දී ඇන්ජිම නතර වී පණගැන්වීමට නොහැකි වූ නිසා, *ප්‍රියන්ත බැණා* කාර්මිකයෙකු සමඟ කොළඹ සිට වෙනත් වාහනයකින් පැමිණ, අප දෙදෙනා (ප්‍රේමාත් මාත්) එක්කර ගෙන යන තුරු පැය හතරක් පහක් අඹේපුස්ස හෝටල් සංස්ථාවේ අවන්හලේ ගත කිරීමට සිදුවිය. එදින අප එහි සිටින විට මා මිත්‍ර *අබේරත්න බණ්ඩාර* මහතා තමාගේ ජංගම දුරකථනය මට දී නුවර ගියේය. ඒ දුරකථනය තිබුණු නිසා ප්‍රියන්තට පණිවිඩයක් දීමට හැකි විය.

මේ ආදී අතවර නිසා, ඩීසල් රථය විකුණා ඒ මුදල පොඩි පුතාට දුනිමි. *විනිස්රොඩ් රථයට* තවත් ලොකු මුදලක් යෙදවීමට පොඩි පුතාට සිදුවිය. එනමුත් මෙය පැට්‍රල් වාහනයක් නිසාත්, බොහෝ සෙයින් අලුත් නිසාත් වසර නවයක් ගත වන තුරු කිසිම කරදරයක් නැති ව ගමන් බිමන් යෑමට හැකි විය. ප්‍රේමාත් මාත් 2002න් පසු එම වාහනයෙන් නොයෙක් ගමන් බිමන් ගිය නමුත් අතරමඟ හිරවීමක් නොවීය.

පොඩි පුතා මේ අවදිය වන විට *මිරිහානේ එදිරිසිංහ පාරේ* අලුතෙන් ඉදිකෙරුණු නිවසක් මිලයට ගෙන තිබිණි. ප්‍රේමාත් මාත් වැඩි වැඩියෙන් ලෙඩ දුක්වලට භාජනය වන නිසාත්, පොඩි පුතා තම නිවසේ ගත කළේ හුදකලා ජීවිතයක් නිසාත්, අප දරුවන්ගේ අදහස වූයේ අප දෙදෙනා පොඩි පුතාගේ නිවසේ පදිංචියට යා යුතු බවයි. මේ නිසා, 2003 වසරේ දී *නලපන්පිටියේ* නිවස විකිණීමට හෝ බදුදීමට පුවත්පත් දැන්වීමක් පළ කළෙමි. එයට ප්‍රතිචාරයක් ලෙස දිනක් *කුලරත්න* නම් වූ කෙනෙක් පැමිණ අපගේ නිවස බදුගැනීමට කැමැත්ත පළ කළේය. එයට මා එකඟ වූ පසු, තමාගේ බිරිඳ සමඟ පැමිණ නිවස බැලිය යුතු බව කියා, සවස පහට පමණ කුඩා දරුවෙකු හා කාන්තාවක සමඟ පැමිණියේය. ඒ තැනැත්තිය මගේ ගෝලයෙකු බව ඈ කීවාය. ඇය ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක් වූ *නිලකා ජයසුන්දර* නම් වූවාය. ගනුදෙනුව තීන්දු කර ඒ අයට නිවස බදු දුන්නෙමි.

ප්‍රේමාත් මාත් පොඩි පුතාගේ නිවසේ පදිංචියට පැමිණියෙමු. ඉන් පසුව ප්‍රේමාගේ රෝගී තත්වයට ප්‍රතිකාර ලබා ගැනීමට පියවර ගතිමු. ඒ නිසා, *ඔඇසිස්* (OASIS) රෝහලේ සේවයේ නිරත මනෝවෛද්‍යවරයෙකු වූ *ජී.ජී.එස්. ප්‍රනාන්දු* මහතා වෙත ගියෙමු. ප්‍රතිකාර කිරීමට එතුමා භාර ගත්තේය. මාසයකට වරක් පමණ එතුමා වෙත ගොස් ප්‍රගතිය සමාලෝචනය කළෙමු. මෙම රෝගය මුළුමනින් ම සුවකළ හැකි තත්ත්වයක නොවීය. කළහැකි වූයේ තාවකාලික පිළියම් පමණයි. එසේ වුවත්, වෛද්‍ය වරයෙකුගේ සහාය

අවශ්‍ය බව තේරුම් ගතිමි. මේ ගැටලුව තිබුණත් ප්‍රේමාට තවමත් තමන්ගේ වැඩ කටයුතු තනියම කර ගැනීමට හැකියාව තිබිණි. ඈ නිතර ම පිරිසිදුවෙන් සිටීමට උත්සාහ ගත්තාය. පොඩි පුතාගේ නිවසේ සේවකයෙකු සිටි නිසා ආහාරපාන සලසා ගැනීම පහසු විය.

මේ වන විට වයස අවුරුදු තිහ පසුකර සිටි පොඩි පුතා, *මෙලානි හලංගොඩ* නම් තරුණියක් ඇසුරු කරන බව දැනගන්නට ලැබිණි. දිනක් ඈ අප සිටි නිවසට ද පැමිණියාය. ප්‍රේමා ඇය ගැන පැහැදුණු බව පෙනෙන්නට තිබිණි. විවාපත්වීම ගැන පොඩි පුතාගෙන් විමසූ විට දැනගන්නට ලැබුණේ, 2004 ජනවාරි මාසයේ දී පමණ යුග දිවයට එළඹීමට බලාපොරොත්තු වන බවයි. හුදකලාව සිටිනවාට වඩා හැකි ඉක්මනින් විවාපත්වීම සුදුසු යයි මමත් කල්පනා කළෙමි.

උඩදුම්බර පදිංචිය

උඩදුම්බර මා උපන් ගම් ප්‍රදේශයයි. විශ්‍රාමික ජීවිතය ඇරඹීමෙන් පසු නිතර දෙවේලේ ගම් ප්‍රදේශයට යෑමට අවස්ථාව ලැබිණි. අපේ අයියාගේ දරු පවුල එහි පදිංචි ව සිටියේය. අයියාගේ එක් පුතෙක් තෙල්දෙණියේ ගම්ඉම මහා විද්‍යාලයේ ගුරු සේවයේ නිරත වී පාසලේ ගුරු නිවාසයේ පදිංචි ව සිටියේය. ගමට යන එන අවස්ථාවල *සරන්* පුතාලාගේ ගෙදර දවසක් දෙකක් නැවතී සිටියෙමු. ගම් ප්‍රදේශයේ නිවසක් හා ඉඩමක් මිලයට ගෙන පදිංචි වීමට අදහසක් ද පැන නැඟිණි. ඒ ගැන ගමේ සිටි අයියාගේ පුතෙකු වූ *රංජිත්ට* හා *සරන්* පුතාට කී විට, ඒ අය ද තැනක් ගැන විපරම් කළහ.

අපේ ගමට අල්ලපු ගමේ *කණහම්පිටිය* නම් තැනක *මඩුගල්ලේ* නම් වූ තරුණ යුවලකට අයිති ගෙයක් හා ඉඩමක් විකිණීමට ඇති බව ආරංචි විය. එහි ගිය විටක සරත් පුතා සමඟ ගොස් එම ඉඩම හා නිවස බැලීමට ගියෙමි. ඉඩම අක්කර කාලක් පමණ ඇත. අලුතෙන් ඉදිකර තිබුණ නිවසේ පවුලක් පදිංචි වී සිටියේය. ඒ අය ඉක්මනින් වෙනත් නිවසකට යන බව කීහ. මේ ප්‍රදේශයේ ප්‍රධානතම ගැටලුව වියළි කාලයේ දී ජලය හිඟවීමයි. එනමුත්, මේ ඉඩමේ එක් කොනක ජලයෙන් පිරුණු ලිඳක් තිබිණි. එය බැඳගැනීමට අවශ්‍ය විය. ජල පොම්පයක් ද ස්ථානගත කර තිබිණි. නිවස අසල තිබූ ටැංකියකට පොම්ප කිරීමටය. නිවසේ පිහිටීම ද සිත් ගත්තේය. තාර දමා ඉදිකර තිබූ පාරක් අයිනේ වූ නිසා, ගෙදර මිදුලට ම වාහනයකින් යා හැකි විය. නිවස අයිතිකරුවන් එවකට පදිංචි ව සිටියේ තෙල්දෙණිය රඹුක්වැල්ලේය. සරත් පුතා සමඟ එහි ගොස් ගණුදෙනුව ගැන කථා කර ගතිමු.

2003 ජූලි මස 04වෙනි දා *වත්තේගම නීතීඥ හා නොතාරිස් රත්නායක මහතා* ලවා ඔප්පුව ලියවා ගෙන ගනුදෙනුව අවසන් කළෙමු. පසුදින *මඩුගල්ලේ යුවල කණගම්පිටියට* පැමිණ ඉඩමේ හා නිවසේ භුක්තිය මා වෙත පවරා දුන්හ. ඒ වන විට එම නිවසේ පදිංචි ව සිටි පවුල එයින් ඉවත් වී ගොස් සිටියහ.

එදින ම රංජිත් පුතා සමඟ මහියංගණයට ගොස් හියුම් පයිප්ප විකුණන තැනකින් ළිඳට දැමිය හැකි විශාල අඩි අටක පයිප්පයක් මිලයට ගෙන, ඒ අයගේ ම ලොරියකින් කණගම්පිටියට ගෙන්වා ගෙන ලොරියේ තිබුණ ක්‍රේන් එකෙන් ළිඳට බස්සවා ගත්හ. පසුව අවශ්‍ය පරිදි ළිඳ බැඳ නිවසට වතුර පොම්ප කිරීමට පයිප්ප දමා ගතිමි. මා ළඟ තිබුණ "ජිනසේන" පොම්පයක් සවිකර ගතිමි. ජලය පිරවීමට ප්ලාස්ටික් ටැංකියක් ද ස්ථානගත කළේය. ජල සැපයීම එසේ විසඳා ගතිමි.

නිවසේ වැඩ රාශියක් කිරීමට තිබිණි. ස්ථීර වයරින් කිරීම, බිත්ති පාට කිරීම, නාන කාමරයක් ඉදිකර ගැනීම, සීලින් ෆෑන් සවිකර ගැනීම, ගේ පිටුපස වේල්ලේ පස් හාරා මිදුලේ ඉඩ වැඩිකර ගැනීම, ගේ වටා කාණු බැඳීම, මහපාරෙන් ඉඩමට ඇතුළු වීමට ගේට්ටුවක් ඉදිකිරීම, ගල් බැම්මක් බැඳීම යනාදි වැඩ රාශියක් කළ යුතු ව තිබිණි. ඒ සඳහා සති හයක් හතක් ගත විය. මේ සඳහා *සරත් පුතා* බෙහෙවින් ම මට උපකාර කළේය. ඉදිකිරීම් වැඩවලට අවශ්‍ය යකඩ, සිමෙන්ති, ගේට්ටුව, ලී ආදිය *තෙල්දෙණියේ* සිට *කණගම්පිටියට* ප්‍රවාහනය කිරීමට සරත් පුතා හඳුනන රියැදුරෙකුට පවරන ලදී. ඒ බඩු තෙල්දෙණියෙන් මිලයට ගැනීම වඩා ලාබදායක විය. අයියාගේ පුතුන් වන *රාජා, ආනන්ද, රංජිත්, එම්.බී.* යන අය නොයෙක් ආකාරයෙන් මට උදව් කළහ. මේ සමයේ දී ප්‍රේමාටත් මටත් යන එන ගමන්වල දී නවාතැන් දීමෙන් හා ආහාරපාන සැපයීමෙන් *සරත් පුතාත්*, ඒ පුතාගේ බිරිඳ *නෙරංජලා දුවත්* දැක්වූ සහයෝගය මිල කළ නොහැකිය

මේ ගමන් බිමන් යන විටත් නව නිවස බැලීමට ගිය විටත් ප්‍රේමාට නොයෙක් දුක් ගැහැට විඳීමට සිදුවිය. ඈ දියවැඩියාකාරියක වූ නිසා, කොළඹ සිට යන විට අතරමඟ දී නිතර නිතර ටොයිලට් යෑම අවශ්‍ය විය. වරක් ගමනට පිටත්වන විට බඩේ අමාරුවක් සෑදී පීඩා විඳ්දාය. *කණගම්පිටියේ* නිවස මිදුලේ බැම්මකින් වැටී උරහිස උළුක් විය. ඒ සඳහා එහි දී දේශීය වෙදකම් කර, පසුව කොළඹ පැමිණ ආසිරි රෝහලින් ප්‍රතිකාර ලබා දුනිමි. අභ්‍යන්තරයේ ප්‍රශ්නයක් නැති බව එක්ස්රේ ඡායාරූපයකින් පෙන්නුම් කළේය.

තලපත්පිටිය අප නිවසේ තිබුණ සමහර බඩුමුට්ටු මා යන විට මගේ වාහනයෙන් ද ගෙන ගියෙමි. ලොකු ගෘහ භාණ්ඩ ආදිය ලොරියකින් ගෙන

ගියෙමි. නිවස තුළ වැඩ කටයුතු අවසන් වූවාට පසුව, 2003 අගෝස්තු 27 දින *කණගම්පිටියේ* නිවසේ පදිංචියට ගියෙමු. එදින පොඩි පුතා, පොඩිදුව හා ප්‍රියන්ත බෑණා කොළඹ සිට එහි පැමිණියහ. ගෙවදින දිනයේ *පල්ලේවෙල පන්සලේ සුමංගල හාමුදුරුවන්* සහ *කිරිපට්ටිය පන්සලේ සාරානන්ද හාමුදුරුවන්* වැඩම කර සෙත් පිරිත් දෙසූහ. නන්දා අක්කා, කල්‍යාණි දුව, රාජා, පොඩිමැණිකේ, ආනන්ද, රංජිත්, සරත්, නෙරංජලා දුව, ශෂී ප්‍රභා මිණිබිරිය යනාදි අය සෙත් පිරිත් අවස්ථාවට පැමිණ සිටියහ. මගේ දරුවන් එහි දින දෙකක් පමණ ගතකර ආපසු කොළඹ ගියහ. කොළඹ සිට මහනුවර හරහා අප නිවසට ළඟාවිය හැකි මාර්ග දෙකක් විය. උඩදුම්බර (මාඩුගොඩ) නගරයට ගොස් දකුණට හැරී කණගම්පිටිය හන්දියට එන පාරත්, මහනුවර, මහියංගන පාරේ කි.මී.41 කණුව පසු කළ විට *එළමල්පොනේ දී කිරිපට්ටියට* හැරී එන පාරත්ය. ඒවා උඩදුම්බර සිතියමේ දක්නට ඇත.

ඉන් පසුව ප්‍රේමාත් මාත් ගෙදර දොරේ හා ගෙවත්තේ වැඩ කටයුතුවල නිරත වූයෙමු. මෙහි පදිංචියට යෑමට පෙර *මනෝ වෛද්‍ය ප්‍රනාන්දු* මහතාට කාරණය විස්තර කර, අප පදිංචියේ මෙවැනි වෙනස්කමක් කරන බව කී විට, සමහර විට එය ප්‍රේමාගේ රෝගී තත්වය සුවකර ගැනීමට උපකාර වීමට ඉඩ තිබෙන බව කීවේය. අප උඩදුම්බර පදිංචියට ගියේ වියළි කාලයේ වුව ද, කොළඹ සිට එහි ගිය අප දෙදෙනාට ම එය සිසිල් දේශගුණයක් විය. එහි ජලය සීතල නිසා උණුදිය ලබා ගත හැකි විදුලි උපකරණයක් ද සවිකර ගෙන තිබිණි. එනමුත්, ප්‍රේමා දිනපතා ම නෑවේ ඇල් වතුරය. තමාගේ ම ඇඳුම් ද එකිනෙක සෝදා ගත්තාය. වැඩිපුර සේදීමට ඇති විට රෙදි සෝදන යන්ත්‍රය ද භාවිතා කළෙමු. විදුලිය විසන්ධි වීම් නිතර නිතර සිදුවිය. ඒ නිසා, ලාම්පු දෙක තුනක් තබා ගැනීමට ද අවශ්‍ය විය. මුළුතැන්ගේ කටයුතුවලට කෙනෙකු සොයා ගත්තෙමු. ඒ නිසා ඉවුම් පිහුම් වැඩ කර ගැනීම ගැටලුවක් නොවීය.

ගෙවත්ත එළිපෙහෙළි කර එළවළු වවා ගැනීමට සූදානම් කර ගතිමි. ඒ සඳහා අවට ගමෙන් මිනිසුන් දෙදෙනෙකු යෙදවූයෙමි. ගෙවත්තේ සෝදාපාළුව නැති වීමට අවශ්‍ය ගල් වැටි බැඳ උචිත ස්ථානවල සැවැන්දරා පඳුරු හිටෙව්වෙමු. අමු මිරිස්, මාළු මිරිස්, කැරට්, මෑකරල්, බණ්ඩක්කා, කරවිල වැනි එළවළු වර්ග තැනින් තැන සිටවා ගත්තෙමු. දීර්ඝකාලීන වගාවන් වශයෙන් ගම්මිරිස් කරටි එකසිය පනහක් හා තේක්ක පැල හැත්තෑපහක් සිටුවූයෙමු. එක තැනක ඉඟුරු ටිකක් ද වවා ගතිමු. ඉඟුරු අල හොඳට එරීමට අවුරුදු දෙකක් පමණ ගත වේ. සමහර එළවළු බෝග රිළවුන්ගෙන් පාළුවීම වළක්වා ගැනීමට මහත් වෑයමක් දැරීමට සිදුවිය. අවට කැලෑවේ රිලා රංචු දෙක තුනක් ම සැරි සැරූහ. මේ වගාවන් කළේ 2003

සැප්තැම්බර් හා 2004 අප්‍රේල් අතර කාල පරිච්ඡේදය තුළය. මුලින් ම එළවළු වවාගත් නිසා ගෙදර අවශ්‍යතා සපුරාගත හැකි විය. වැඩිපුර තිබුණ ටිකක් විකුණා ගත්තෙමි.

ප්‍රේමාත් මාත් මාසයකට වරක් බැඟින් කොළඹ පැමිණියෙමු. ඒ ආවේ අප දෙදෙනාට ම අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමටයි. මටත් වඩා මසකට වරක් ප්‍රේමා දොස්තර ප්‍රනාන්දු මහතාට පෙන්විය යුතු විය. ඇයට අවශ්‍ය බෙහෙත් මිල දී ගත හැකි වූයේ බවර් සමාගමේ ග්‍රෑන්ඩ්පාස් පිහිටි බෙහෙත් ගබඩාවකිනි. එසේ පැමිණි විට අප දෙදෙනා ලැගුම් ගත්තේ පොඩි පුතාගේ නිවසේය. උඩදුම්බර යෑමට පෙර අපට වෙන්කර තිබූ නිඳන කාමරය අප දෙදෙනා සඳහා තවදුරටත් වෙන් වී තිබණි. 2003 නොවැම්බර් මාසයේ එහි පැමිණි විටක, රාත්‍රී කාලයේ දී ප්‍රේමා බිම වැටී ඔළුව බිත්තියක ගැටී තුවාල විය. වහා ම කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයට ගොස් ප්‍රතිකාර ලබා ගතිමු. දින කීපයක් සෝදිසියෙන් සිටීමට උපදෙස් ලැබිණි. හිස තුළ ලේ ගැලීමක් වැනි දෙයක් සිදුවීමට ඇති ඉඩකඩ නිසාය. දින කීපයකට පසුව ආපසු උඩදුම්බර ගියෙමු.

2003 දෙසැම්බර් මාසයේ දී කොළඹ සිට නෑදෑ පිරිසක් උඩදුම්බර අප නිවසට පැමිණ දින දෙක තුනක් ගත කළහ. වසන්තගේ සහෝදරයින් දෙදෙනෙකු වූ *ලාල්* හා *දයා ලියනගම* හා ඒ අයගේ බිරියන් ද නංගීගේ පුතාද ඒ අය අතර වූහ. ලොකුදුවලා ද එහි පැමිණ සිටියහ. 2004 අලුත් අවුරුදු උදාවට ඒ අය සිටියේ අප නිවසේය. දිනිත් මුණුබුරාත්, වසන්තගේ නංගීගේ පුතාත් සිත් සේ රතිඤ්ඤා, අහස් කුරු ආදිය පත්තු කළහ. ඒ ළමයින් සිටින විදේශවල දී මෙයට ඉඩ නොලැබෙන නිසා මෙය ඔවුන්ට අලුත් අත්දැකීමක් විය.

පොඩිපුතාගේ විවාහ මංගල්‍යය

පොඩි පුතාගේ විවාහ මංගල්‍යය සිදුකළේ **2004 ජනවාරි 9වෙනි** දා ය. එම උත්සවය ගල්කිස්ස හෝටලයේ දී පවත්වන ලදී. ඒ සඳහා ඕස්ට්‍රේලියාවේ පදිංචි ලොකු පුතාලාත්, ලොකු දුවලාත් පැමිණියහ. එම උත්සවයෙන් පසුව ලොකු දුවලා අප සමඟ උඩදුම්බර නැවත වරක් ගොස් දින දෙක තුනක් ගත කළහ. එවර මගේ වාහනයෙන් මහියංගන ආදී තැන්වලට ගියහ. ආපසු කොළඹ යන ගමනේ දී මා සමඟ මගේ වාහනයෙන් මහනුවරට ගොස් එතැන් සිට කොළඹට පෞද්ගලික බස් රථයකින් ගියහ. පැය තුනකින් පමණ කොළඹ ගිය බව දැනගන්නට ලැබිණි.

සිරිතක් වශයෙන් අවුරුද්ද අවසානයේ ලංකාවට එන ලොකු පුතා හා නිර්මලා (ලේලිය) පොඩි පුතාගේ විවාහ මංගල්‍යය නිසා, 2004 ජනවාරි

මාසයේ සති දෙක තුනක් ලංකාවේ ගත කළහ. ඒ අතරතුර ඒ දෙදෙනා ද උඩදුම්බර අපේ නිවසට පැමිණ දින දෙක තුනක් ගත කළහ. එතැන සිට එක දවසක *වස්ගමුව වනෝද්‍යානය* නැරඹීමට ගොස් එක දිනක් තුළ ආපසු ආවේය. අප උඩදුම්බර නිවසට ගෙවදින විට පැමිණි පොඩි දුව, ඊට පසු තුන්වරක් විටින් විට එහි පැමිණියහ. වරක් සති අන්තයක කොළඹ සිට උඩදුම්බර දක්වා බසයෙන් පැමිණියාය. මම කඩපොළට පැමිණ පොඩි දුව සමඟ අපේ ගෙදර ගියෙමි. පොඩි දුව ආපසු ගියේ ද බසයෙනි. තවත් වරක් එසේ බසයෙන් පැමිණ දින දෙක තුනක් ගතකර ප්‍රේමාත් මාත් සමඟ මගේ රථයෙන් මහනුවර ලේවැල්ලට ගොස් පොඩි පුතාලා සමඟ කොළඹ ගියාය. 2004 සිංහල අවුරුදු දිනවල පොඩි දුව හා ප්‍රියන්ත ඒ දෙදෙනාගේ මිතුරු යුවලක් සමඟ අප නිවසට පැමිණියහ. මේ ආකාරයට විටින් විට දරුවන්ගේ පැමිණීම නිසා මටත් වඩා සතුටු වූයේ ප්‍රේමාය.



වසන්ත, ලොකුදුව, දිනීත්, ප්‍රියන්ත, පොඩිදුව, ප්‍රේමා, සවිනි, මම, ලොකුපුතා සහ නිර්මලා සමඟ

අසල්වාසීන්ගේ සංග්‍රහ

උඩදුම්බර පදිංචියට ගිය නොබෝ දිනකින් අසල්වැසි කීප දෙනෙක් අපට භෝජන සංග්‍රහවලට ආරාධනා කළහ. ඒ අය මා ළමා කාලයේ සිට දැන හැඳිනගෙන සිටි අයයි. එගොඩවෙලේ ලේකම් මහත්තයා කණගම්පිටිය හන්දියේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය කෙනෙකි. මැදිවක පාසලේ මා ඉගෙන ගන්නා කාලයේ ඉහළ පන්තියක ඉගෙන ගත් කෙනෙකි. පහේ පන්තියේ දී මා සමඟ ඉගෙන ගත් පොඩි මැණිකේ විවාහ කර ගෙන සිටියේය. *එගොඩෙවෙලේ ලේකම් මහත්තයා* අප කුඩා කාලයේ එම ප්‍රදේශයේ උප්පැන්න විවාහ මරණ රෙජිස්ට්‍රාර්වරයා වූ *එල්.බී. අබේසේකර* මහතාගේ වැඩිමහල් පුතාය. ඒ අයගේ අසල්වැසි ප්‍රධානාචාර්ය මැදිවක මහතාගේ දියණියකි, පොඩි මැණිකේ. මේජර් ජනරාල් එගොඩවෙලේ මේ දෙදෙනාගේ පුතෙකි. ප්‍රේමාටත් මටත් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වූ එක් කෙනෙක් මේ ලේකම් මහත්තයාය. මේ වන විට එතුමාගේ බිරිඳ, පොඩි මැණිකේ අභාවප්‍රාප්ත වී සිටියාය.

මා මැදිවක පාසලේ පහේ පන්තියේ ඉගෙන ගනිද්දී ඒ පන්තියේ ඉගෙන ගත් තවත් ගැහැණු ළමයෙකු වූයේ ඒ ප්‍රදේශයේ කෝරළේ මහත්තයෙකුගේ දියණිය *පුංචි කුමාරිහාමිය.* වැඩිහිටි වූ පසු පල්ලේවෙල *ටිකිරි බණ්ඩා* නමින් අප දැන සිටි පාසල් ගුරුතුමා *පුංචි කුමාරිහාමි* විවාහ කර ගෙන කණගම්පිටියේ පදිංචි ව සිටියේය. අප උඩදුම්බර පදිංචියට යන අවදියේ මේ ගුරුතුමා ද අභාවප්‍රාප්ත වී සිටියේය. පුංචි කුමාරිහාමි අක්කා ද ප්‍රේමාටත් මටත් රාත්‍රී භෝජන සංග්‍රයක් පැවැත්වූවාය. මගේ සමීප අසල්වැසියෙකු වූයේ *ඒ.බී.ඒ. මැදිවක මහතාය.* එතුමා මැදිවක විශ්‍රාමලත් ග්‍රාම නිලධාරි විය.

මා එහි පාසල් යන අවදියේ මැදිවක මහතා මට වඩා පහළ පන්තියක ඉගෙන ගත්තේය. පසුව ඔහු මහනුවර *විද්‍යාර්ථ විද්‍යාලයේ* ඉගෙන ගත් බව දැන ගතිමි. ඔහු විවාහ කර ගෙන සිටියේ පිටවල ගමේ පිටවල පවුලේ දියණියකි. මෙම ග්‍රාම නිලධාරි / ගුරු යුවල ද භෝජන සංග්‍රහයක් පැවැත්වූහ. අප නිවස ඉදිරියෙන් ම පාරේ අනිත් පැත්තේ නව නිවසක් ඉදිකර ගෙන පදිංචි ව සිටියේ මරක්කල පවුලකි. කණගම්පිටියේ සාම්ප්‍රදායික ව මරක්කල පවුල් කීපයක් පදිංචි වී සිටිති. අප පාසල් යන අවදියේ මේ ගමේ මරක්කල පවුල් කීපයක් ම විය. අපගේ වර්තමාන අසල්වැසියෝ එළහරකුන් ඇති කළහ. දිනපතා කිරි ලබා ගෙන උඩදුම්බර තේ කඩවලට විකුණූහ. ඒ පමණක් නොව, විටින් විට හරක් එකතු කර ලොරියකින් මස් කඩයට යැවූහ. ඒ අයගේ උත්සව දිනක අපට බෙසමක කෑම තොගයක් එවා තිබිණි. ඒ සියල්ල අපේ අයියාගේ පුතෙකු වූ රංජිත්ට දුන්නෙමු. මස් ජාති තිබුණ නිසාය.

පල්ලේවෙල

උඩදුම්බර පදිංචි ව සිටිය දී අප වැඳුම් පිදුම් සඳහා ගියේ පල්ලේවෙල පන්සලටයි. අපේ අයියාගේ බිරිඳ *නන්දා අක්කා* සහ දරුවන් කෙනෙක් දෙන්නෙක් පදිංචි ව සිටියේ ද පල්ලේවෙල නිවසකයි. එම නිවස ඒ අයගේ පාරම්පරික උරුමය විය. අප කුඩා කාලයේ දී ආවේ ගියේ ද ඒ ගෙදරටයි. ඒ නිසා, පල්ලේවෙල මට අමුතු තැනක් නොවීය. පල්ලේවෙල පන්සලේ 2003 වසරේ කඨින පිංකමට ද අපි සහභාගී වූයෙමු. මීට පෙර නොයෙක් අවස්ථාවල පල්ලේවෙල මාමාගේ නැන්දම්මාගේ අපේ අයියාගේ සහ අයියාගේ ලොකු පුතාගේ (ජී.බී.) මතක දානමය පිංකම් පැවැත්වූයේ පල්ලේවෙල පන්සලේ දීය. මා ඒවාට ද සහභාගී වී ඇත. 2003 වර්ෂයේ උඩදුම්බර ගිය පසු, පල්ලේවෙල කුඹුරක් මිලට ගෙන එම මාස් කන්නයට වැඩ කර ගතිමු. කුඹුර වී දෙපෑල පල්ලහක් පමණය. එය අදේට වැඩ කළේ අයියාගේ පුතෙකු වූ ආනන්ද විසිනි. ආනන්ද හොඳ ගොවියෙකු විය. ඒ කන්නයේ මගේ කොටස වශයෙන් 2004 අප්‍රේල් මාසයේ දී වී බුසල් තිහක් ලැබිණි. ඒවා කණගම්පිටියේ නිවසේ කාමරයක කොනේ ගබඩා කළෙමි. ටිකෙන් ටික මෝලට දී කොටවා ගෙන ආහාරයට ගතිමු. මෙම අස්වැන්න ලැබීමට පෙර අසල වී මෝලෙන් රතු කැකුළු හාල් මිලයට ගත්තේ කිලෝව රුපියල් විසිතුන බැගිනි. අස්වැන්න ලැබුණායින් පසුව ඒ වියදම ඉතුරු විය.

උඩදුම්බර සුළං සමය

උඩදුම්බර ප්‍රදේශයට අප්‍රේල් මාසයෙන් පසුව මාස හයක් පමණ ගතවන තුරු තද හුළඟක් අල්ලයි. ඒ කාලයට ගස් කොළන් වියළී යයි. දිය උල්පත් සිඳේ. ජල හිඟයක් ඇති වේ. දිය නෑමට කදුරු- ඔය වලට යා යුතුය. විදුලි සම්බන්ධතා බිඳ වැටේ. දින දෙක තුනේ විදුලි ආලෝකය නැති ව ඉන්නට සිදුවේ. විදුලිය බිඳවැටීම අලුත්වැඩියා කිරීමට හසලක පෙදෙසේ විදුලිබල මණ්ඩලයෙන් පැමිණිය යුතු වේ. ඒ අය එන්නේ දුරකථන පණිවිඩ කීපයක් දුන් පසුවයි. දුරකථන පහසුකම් ද ඇත්තේ උඩදුම්බර නගරයේය. එ සමයේ ජංගම දුරකථන ක්‍රමය ප්‍රචලිත ව තිබුණේ නැත. වරක් ජංගම දුරකථන සමාගමක නියෝජිතවරයෙක් අප නිවසට දුරකථනයක් සවිකර ගිය නමුත්, විටින් විට සංඥා දුර්වලවීම නිසා, එම සේවය සතුටුදායක නොවීය. එසේ වුව ද, පණිවිඩ හුවමාරුවට කිසිම පහසුකමක් නැති ව සිටිනවාට වඩා මෙය විටින් විට ප්‍රයෝජනයට ගත හැකි විය. ඒ නිසා, කොළඹ ජීවත් වූ පොඩි දුව හා පොඩි පුතා සමඟ රාත්‍රියේ කථා බහ කළ හැකි විය. වරක් ඕස්ට්‍රේලියාවේ පදිංචි ලොකු දුවට ද එම දුරකථනයෙන් කථා කළෙමි. එනමුත් ඉක්මනින් විසන්ධි වේ.

පාසල් මිතුරන්

මගේ මිත්‍රයෙකු වූ ලේවැල්ලේ පදිංචි එච්.බී. රාජපක්ෂ මහතාගේ බිරිඳ අභාවප්‍රාප්ත වූයේ මේ අවදියේය. ගුවන් විදුලියෙන් ආරංචිය දැන ගත් පසු, ප්‍රේමාත් මාත් අපේ වාහනයෙන් ලේවැල්ලට පැමිණ අවමංගල්‍යයට සහභාගි වූයෙමු. මගේ පාසල් මිතුරෙකු වූ *ඒ්ජේසිංහ අයියා* පදිංචි ව සිටියේ තෙල්දෙණියේ සෙනරත්වෙලය. වරක් එම නිවසට ගොස් එක් රැයක් ගත කළෙමු. විජේසිංහ අයියාත් අක්කාත් අප දෙදෙනාට හොඳින් සැලකුහ. අප මිලට ගත් නිවසේ අලුත්වැඩියා කරන අවධියේ උඩදුම්බර නගරයේ ගොඩනැඟිලි ද්‍රව්‍ය වෙළඳසැල්වලින් ද යම් යම් දේ මිලයට ගතිමු. අපේ ගමේ කෙනෙකු වූ බිළිඳා මුදලාලිගෙන් ද සිමෙන්ති, කොන්ක්‍රීට් ගල් ආදිය මිලට ගතිමි. එහි ගිය අවස්ථාවල මුණගැසුණ ඔහුගේ මතය වූයේ, උඩදුම්බර ප්‍රදේශයේ වාත අමාරු වැඩිවන බවයි. සීතල දේශගුණය නිසාය. එහි ඇත්තක් ඇති බව මටත් අත්දැකීමෙන් ම දැනිණ.

මැදිවක පාසල

2003 වසර අවසානයේ දී මැදිවක පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස මම සහභාගි වුණෙමි. මගේ ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ එම පාසලේ දී ය. එහි ගොඩනැඟිලි වෙනස් කර තිබේ. විදුහල්පති වූයේ *ටී.ඒ්. මැදිවක මහතාය.* එතුමාගේ පියා ද කලකට පෙර එම පාසලේ ප්‍රධානාචාර්යවරයා විය. ටී.ඒ්. මැදිවක මහතාගේ වැඩිමහල් සහෝදරයෙකු මා සමඟ ඉගෙන ගෙන ඇත. ඔහු පොලිස් සේවයේ සිට විශ්‍රාම ගෙන ගමට වී සිටී. ඔහු මට එහි දී මුණගැසිණි. 2004 පෙබරවාරි 4වෙනිදාට යෙදුණු නිදහස් අනුස්මණ උත්සවයට දේශනයක් පැවැත්වීමට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මට ආරාධනා කරන ලදී. අවට ගම්වලින් පැමිණ සිටි විශාල පිරිසකට නිදහසේ වැදගත්කම අලලා කථා කළෙමි. මේ දේ සිදුවූයේ ඒ ප්‍රදේශයේ බොහෝ දෙනා මා ගැන පැහැදීමක් තිබුණ නිසා යයි සිතමි. ඒ ගම්වල උසස් රජයේ නිලතලවලට පත්වූ කීප දෙනෙක් ඇතත් විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකු වූ කෙනෙක් නොවීය. තවමත් නැතැ'යි සිතමි. මෙය ද මා පිළිගනු ලැබීමට හේතු වූවා විය හැකිය.



මැදිවක පාසලේ දී 2003 දෙසැම්බර්

ප්‍රේමා අසනීප වීම

විශ්‍රාමික දිවිය ඇරඹූ දින සිට ප්‍රේමාගේත් මගේත් දින චර්යාවේ එක් අංගයක් වූයේ පස්වරු පහට ඇඟපත හා මූණකට සෝදා ගෙන, රාත්‍රී ආහාරයට පෙර *පන්සිල්* සමාදම් වී, *තුන් සූත්‍රය* සජ්ජායනා කිරීමයි. බොහෝ දිනවල ධජග්ග සූත්‍රය ද එකතු කළෙමු. උඩුදුම්බර පදිංචියට ගිය පසු ඒ නිවසේ සාලයේ එකිනෙකට සමීප ව පුටු දෙකක් තබා මේ සත්කාරයේ නිරත වූයෙමි. මෙයින් ප්‍රේමාට යම් සැනසිල්ලක් ඇති වූ බව දක්නට තිබිණි.

සමහර දවස්වල තම පියා තමා මෙහි එක්කර ගෙනැවිත් තනිකර දමා ගිය බවක් ඈ පැවසුවාය. මෙය මට පමණක් නොව අපේ නෑදෑ කාන්තාවන් කීප දෙනෙක් සමග ද ප්‍රකාශ කර ඇත. ප්‍රේමාගේ පියා අභාවප්‍රාප්ත වූයේ 1950 වසරේ දී ය. එනමුත්, යම් මානසික දුර්වලතාවක් නිසා මෙම මානසික තත්ත්වයට පිවිසෙන බව දක්නට තිබිණි. ප්‍රේමාට තනිකමක් වැනි දෙයක් දැනෙනවා නම් ආපසු කොළඹට යමුදැ'යි විමසූ විට වරක් කීවේ, මට කැමැත්තක් කරන ලෙසය. ගෙවත්තේ වැඩකට ගිය විට නිතර ම විපරම් කර බැලුවේය. ඈ තනිකර දමා මාත් කොහේ හෝ යාවිය, යන බිය නිසාය. මා ඇගේ සැමියා බව අමතක වන සැටියක් ද දක්නට තිබිණි. මේ නිසා ඇය අස්වැසීමට වැඩියෙන් ඇයට සමීපවීමට සිදු විය.

2004 මැයි මාසයේ 18 දින මැදියම් රෑයේ පමණ ප්‍රේමා මා අවදි කර, මගෙන් විදුලි පන්දම ඉල්ලීය. නිවසේ විදුලිය විසන්ධි වී ඇති බව පෙනිණි. මා ළඟ තිබුණ විදුලි පන්දම දුන් විට, එය ද රැගෙන නිදන කාමරයට යාබද නාන කාමරයට ගිය සැණින් ම ප්‍රේමා කෑගහන ශබ්දය ඇසී එහි ගොස් බලන විට, ඈ බිම වැටී හිසෙන් ලේ ගලනවා දුටිමි. ඈ නැඟිට්ටවා, අසළ තිබූ තුවායක් ගෙන හිස වටා ඔතා ලේ ගැලීම නැවැත්වූයෙමි. වහා ම ඇය රෝහලට ගෙන යා යුතු යැ'යි තීරණය කර, කළුවරේ ම ඇඳුමක් අන්දවා මගේ වාහනේට නංවාගෙන, රංජිත් පුතාලගේ නිවස වෙත ගියෙමි. රංජිත් අපේ අයියාගේ පුතෙකි. ඒ අසල ගමක ග්‍රාම නිලධාරියාය. අප නිවසේ සිට වාහනයෙන් විනාඩි තුන හතරකින් යා හැකි දුරක ඔහුගේ ම නිවසේ සිය පවුල සමග පදිංචි ව සිටියේය. රංජිත් පුතාත් අවදි කර ගෙන උඩුම්බර රෝහලට ගියෙමි. රෝහලේ ද විදුලිය බිඳ වැටී තිබිණි. රාත්‍රී සේවයේ සිටි වෛද්‍යවරියගේ නිවසේ දී ලෙඩා පෙන්වා, වාට්ටුවට ඇතුළත් කිරීමට තුණ්ඩුවක් ද රැගෙන වාට්ටුවට ගියෙමු. එහි සේවයේ සිටි හෙද නිලධාරිනිය ප්‍රේමාගේ තුවාලයට පිළියම් කළාය. ඒත් ලාම්පු එළියෙනි. විදුලි එළිය නොවීය. රංජිත් පුතා අසල නිල නිවාසයට ගොස් එම රෝහලේ සේවය කරන හෙද නිලධාරියෙකු වූ *තෙන්නකෝන් පුතා* (මගේ නංගිගේ ලොකු පුතා) අවදි කර ගෙන වාට්ටුවට පැමිණියේය. තුවාල වූ හිසට පිළියම් කිරීමෙන් පසුව, උදේ ඩී.එම්.ඕ. මහතා එන තුරු වාට්ටුවේ නවත්වා ගත්තේය. තෙන්නකෝන් පුතාත් වාට්ටුවේ සිටි නිසා, *රංජිත් පුතාත්* මාත් ආපසු ගෙදර ගියෙමු.

පසුදා පෙරවරු නවයට පමණ වාට්ටුවට යන විට, ඩී.එම්.ඕ. මහතා පැමිණ ලෙඩා බලා ටිකට් කපා තිබිණි. ගෙදර ගොස් දින දෙකකට පසුව බෙහෙත් දමා ගැනීමට නැවත වාට්ටුවට පැමිණෙන ලෙස දැන්වීය. මැයි මාසේ 21වැනි දින අප කොළඹ එන්නට සැලසුම් කර තිබිණි. ඒ නිසා, එදින පෙරවරුවේ රෝහලට ගොස් තුවාලයට බෙහෙත් දමා බැඳගෙන කොළඹ ගමනට පිටත්වූයෙමු. ප්‍රේමාත් මාත් උඩුම්බර අපේ ගෙදර සිටි **අවසාන රාත්‍රිය මැයි විසිවෙනි දා ය.** පසුදින කොළඹ එන අතරතුර පල්ලේකැලේ නව නිවසකට ගෙවදීමකට සහභාගීවීමට ද ගියෙමු. අයියාගේ ලොකු පුතා, *ජී. බී. ගේ බිරිඳ අයිරා* හා පුතුන් දෙදෙනා ඉදිකර ගත් නිවස පිහිටියේ පල්ලකැලේ ගම් උදාව පැවති ස්ථානය අසළින් ටික දුරක් ඇතුළට ගිය තැනකය. *නන්දා අක්කාත්* ඒ අක්කාගේ ලොකු දුව *කල්‍යාණිත්, තෙන්නකෝන්* පුතාගේ බිරිඳත් අප සමග පල්ලෙකැලේට පැමිණියහ. තෙන්නකෝන් පුතාගේ බිරිඳ අතරමඟ නෑදෑ ගෙදරකට ගියාය. අනික් අය ගෙවදින නිවසට ගියහ. දිවා ආහාරයෙන් පසුව ගමනට පිටත් වී මහනුවර හරහා කොළඹට පැමිණ පොඩි පුතාගේ නිවසට එන විට රෑ බෝවී තිබිණි.



යන තැනකට මාත් එනවා



උතුරා යන සෙනෙහස

පසු දින උදෑසන ප්‍රේමා සමග ඔඇසීස් (OASIS) රෝහලට ගොස් ඇගේ හිසේ තුවාලයට ප්‍රතිකාර ලබා ගැනීමට කටයුතු කළෙමි. *ඩී. ඩබ්ලිව්. වීරසූරිය* නම් වූ ශල්‍ය වෛද්‍යවරයෙක් පැමිණ තුවාලය පරීක්ෂා කර නැවත බෙහෙත් දමා වෙළුම් පටි බඳින ලෙස උපදෙස් දෙන ලදී. අපගේ තොරතුරු විමසූ දොස්තර මහතා කීවේ, එතුමා නවක වෛද්‍යවරයෙක් ලෙස පළමුවෙන් ම සේවය කළේ උඩදුම්බර (මාඩුගොඩ) රෝහලේ බවයි. සඳුදා දිනයේ දී රෝහලට පැමිණ තුවාලය නැවත පිරිසිදු කර බෙහෙත් දැමිය යුතු යැ'යි කී නිසා එසේ කළෙමු. තුවාලය හොඳට ම සුව වන තුරු කොළඹ නැවතී සිටීමට තීරණය කළෙමු.

ඒ සතියේ සිකුරාදා, එනම් 28වෙනි දා, අපගේ ලේලිය වන *මෙලාණිත්*, ප්‍රේමාත්, මාත් කෑම මේසය වටා වාඩි වී රෑ කෑම ගන්නා විට, ප්‍රේමා නිදිමත ගතියක් පෙන්වූ නිසා, අපගේ නිදන කාමරයට ගොස් ඇයට නිඳා ගැනීමට සලසා දුනිමු. මම අවදිව විපරමෙන් සිටියෙමි. රාත්‍රී දහයට පමණ බලන විට ප්‍රේමා ඇගේ ඇඳේ වාඩි වී තම කට ළඟට අතක් ලංකර ගෙන ඉන්නා බව දුටිමි. ඇයට වමනය කිරීමට උවමනා වී තිබිණි. වහා ම අසල නාන කාමරයට එක්කර ගෙන ගොස් එහි බොහෝ වෙලා වමනය දැමීමෙන් පසුව අත කට සෝදා ගෙනැවිත් නැවත ඇඳේ හාන්සි කරවීමි. ඒ සමග ම ඉහළ මාලයේ තම කාමරයේ සිටි *මෙලාණි* දුවට කතා කළෙමි. අප දෙදෙනා කතිකා කර තීරණය කළේ ප්‍රේමා වහා ම රෝහලකට රැගෙන යා යුතු බවයි. මැනිං ටවුමේ පදිංචි පොඩි දුවට ද පණිවිඩයක් දුන්නාය.

අප පළමුවෙන් ම ගියේ ඔඇසීස් රෝහලටයි. එහි යන විට පොඩිදුව හා ප්‍රියන්ත බෑණා ද පැමිණ සිටියහ. මේ වේලාවේ එම රෝහලේ පිළියමක් කළ හැකි වෛද්‍යවරයෙක් නොසිටි නිසා, ආසිරි රෝහලට ගියෙමු. එහි බාහිර රෝගී අංශයේ වෛද්‍යවරිය කීවේ රෝහලේ ඉඩ නැති බවයි. ඇය ඉදිරියේ දී ම නවලෝක රෝහලටවත් යමු දැ'යි කියන විට එම වෛද්‍යවරිය කීවේ, නවලෝක රෝහලෙත් ඉඩ නැති බවයි. ඒ දවස්වල ඩෙංගු රෝගීන් නිසා එම රෝහල් කාමර පිරී ගොස් තිබිණි. අපගේ ඊළඟ ඉලක්කය වූයේ ආසිරි රෝහල අසල ම පිහිටි ඇපලෝ රෝහලයි.

ඇපලෝ රෝහලට ගිය වහා ම රෝගියා පරීක්ෂා කර අදාල වෛද්‍ය විශේෂඥයින්ගේ උපදෙස් මත ස්කෑන් ඡායාරූප ද ගෙන රෝහලට ඇතුළත් කරන ලදී. පසු දින පාන්දරින් ම හමුවූ *කුමාරවේල්* නම් වූ ස්නායු වෛද්‍යවරයාගේ උපදෙස වූයේ, ස්නායු ශල්‍ය වෛද්‍යවරයා හමුවන ලෙසය. ඉන්දියානු ජාතික ස්නායු ශල්‍ය වෛද්‍යවරයා *රවී පලූර්* (Ravi Palur) නම් විය. පෙරවරු නවයට පමණ ඒ වෛද්‍යවරයා හමු වූ විට ඔහු කියා සිටියේ, මොලයට ලේ ගලන නිසා වහා ම සැත්කමක් කළ යුතු බවයි. එයට එකඟ වූවාට පසුව, අවශ්‍ය මුදල් තැන්පත් කිරීම් ආදිය පොඩිදුව විසින් කරන

ලදී. මේ වන විට පොඩි පුතා පැමිණ සිටියේ යැ'යි සිතමි. ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නුවර පදිංචි ව සිටි ලොකු දුවට හා ලොකු පුතාටත් පොඩි දුව පණිවිඩය දී තිබිණි.

2004 මැයි මාසේ 29වෙනි සෙනසුරාදා පස්වරුවේ ප්‍රේමාගේ ශල්‍යකර්මය සිදු කරන ලදී. එය සාර්ථක වූ බව ශල්‍යාගාරයෙන් එළියට පැමිණි වෛද්‍යවරයා මට කීවේය. ප්‍රේමා දැඩිසත්කාර ඒකකයට යවා සිටියාය. මා එහි ගොස් බලන විට දක්නට ලැබුණේ, හිසේ දෙපොළකින් කුහර දෙකක් විද ඇති බවයි. *නේවාසික වෛද්‍ය රත්වන්නේ මහතා* ලෙඩාගේ තත්ත්වය මට විස්තර කර දුන්නේය. ස්කෑන් ඡායා පිටපත් ද පෙන්වමින් ඔහු කීවේ, එහි දක්නට ලැබෙන පැල්ලම්වල වඩා කළුපාටට හා තද ගතිය අඩු ඡායා පැරණි හා අලුත් ලේ ගැලීම් පෙන්නුම් කරන බවයි. සිදුරු කළ කුහර මගින් එම ලේ උරවා ඉවත් කළ බව ද රත්වත්ත දොස්තර මහතා මට කීවේය. මා එහි සිටිය දී ම ප්‍රේමා නිර්විත්දනයෙන් අවදි වූ බව පෙනිණි.

ලෙඩා බැලීමට නෑදෑයින් බොහෝ දෙනෙක් පැමිණ සිටියහ. ඒ අතර වැඩියෙන් ම පැමිණ සිටියේ වසන්ත බෑණාගේ හා ප්‍රියන්ත බෑණාගේ ඥාතීන්ය. 30වෙනි ඉරිදා ඔස්ට්‍රේලියාවේ සිටි ලොකු දුව හා ලොකු පුතාත් පැමිණ සිටියහ. වෛද්‍යවරියක් වූ ලොකු දුව ලෙඩා ගැන සොයා බැලීමට පටන් ගත්තාය. එය අපට මහත් සැනසීමක් විය. වෛද්‍යවරුන් මුණගැසී තොරතුරු විමසුවාය. ටික දවසකට පසු දැඩි සත්කාර ඒකකයේ සිට වෙනත් කාමරයකට ප්‍රේමා මාරු කළහ. ඒ කාමරයේ වෙනත් කෙනෙකුට නැවතී සිටීමට පහසුකම් තිබිණි. දිනපතා ම රාත්‍රී කාලයේ මම එම කාමරයේ නැවතී සිටියෙමි. දුවලා දෙදෙනාත් අම්මා ළඟ ගත කළ බවට මතකයක් තිබේ. 2004 ජූනි 7 දින ප්‍රේමා ඇපලෝ රෝහලෙන් ගෙදර එක්කර ගෙන ගියෙමු. ලෙඩා නිදහස් කිරීමේ සටහනේ ඇති අන්දමට ශල්‍ය කර්මය මෙසේ සිදු කර තිබේ :

"Left Frontal and Parietal Emergency Burr Holes and evacuation of Chronic SDH was done on 29 May 2004 " - RAVIKANT PALUR, NEURO SURGEON.

ප්‍රේමාට මෙම ආපදාව සිදුවන විට අප දෙදෙනා පදිංචි ව සිටි උඩුදුම්බර නිවසට නැවත යාමට නොහැකිය. නිතර නිතර ශල්‍ය වෛද්‍යවරයාගේ නිරීක්ෂණයේ සිටිය යුතු නිසාය. කොළඹ මැනිං ටවුමේ මංගල පාත්හි අප නිවසේ පදිංචි ව සිටි පොඩිදුව හා ප්‍රියන්ත, ප්‍රේමාටත් මටත් එහි පදිංචියට ඉඩ සැලසූහ. ප්‍රේමාට දිවා රෑ උපස්ථාන කිරීමට සෙලින්කෝ නිවාස සාත්තු සේවයෙන් (Home Nursing Service) හෙදියන් දෙදෙනෙක් ගෙන්වා

ගැනීමට ලොකු දුව කටයුතු කළාය. හත්වෙනි දා ම රාත්‍රී සේවය සඳහා *ජී.කේ. ශ්‍රියාණී* නැමති හෙදිය පැමිණියාය. පසු දින පෙරවරු හතේ සිට දිවා කාලයේ සේවයට *චන්ද්‍රා ලෝරන්ස්* නම් හෙදිය පැමිණියාය. එක් කෙනෙක් පැය දොළහක් සේවයේ නිරත විය. මේ අයට අවශ්‍ය ආහාර පාන සැපයීමට ද සිදුවිය. දින දෙක තුනකට පසුව *චන්ද්‍රා* වෙනුවට *මේනකා* නැමති ගැහැණු ළමයෙක් සේවයට පැමිණියාය. 2006 සැප්තැම්බර් මාසය වනතුරු මේනකා ප්‍රේමාට උපස්ථාන කිරීමේ නිරත වී සිටියාය. ටික දිනකට පසුව ශ්‍රියාණි වෙනුවට වෙනත් කෙනෙක් රාත්‍රී සේවය සඳහා පැමිණියාය.

මුල් දිනවල අපගේ ආහාර පිළියෙල කර ගැනීමට කෙනෙක් නොසිටි නිසා, ඒ වගකීම මම භාර ගත්තෙමි. උදේ වරුවේ කුඩා මුළුතැන්ගේ (PANTRY) තුළ මා උයන විට ප්‍රේමා පැමිණ බලා ගෙන උන්නාය. ඒ අවදියේ සාමාන්‍ය කතාබහටත් ගේ තුළත් මිදුලෙත් ඇවිදීමටත් පුළුවන්කම තිබිණි. ඉවුම් පිහුම්වල මා නිරත ව සිටීම ගැන ප්‍රේමාට දුකක් කණගාටුවක් ඇති වූ බවක් පෙනෙන්නට තිබිණි. විටින් විට මුළුතැන්ගෙට පැමිණියේද ඒ නිසා වන්නට ඇත. එනමුත්, මා ඒවා කළේ විනෝදයෙන් බව හැඟවීමට ප්‍රයත්න දැරුවෙමි.

ඇපලෝ රෝහලේ දී ප්‍රේමාගේ මොළේ එකතු වන රුධිරය ඉවත් කළ නමුත් තවත් යම් ප්‍රමාණයක් ශේෂ ව තිබූ බව පසුව කළ ස්කෑන්වලින් පෙනෙන්නට තිබිණි. අතරින් පතර නිදිකිරා වැටෙන ගතියක් ද තිබිණි. ලොකුපුතා හා ලොකු දුව සති දෙකක් පමණ ගතවන තුරු නැවත ඕස්ට්‍රේලියාවට ගියේ නැත. ඒ නිසා ඒ දෙදෙනා යම් තරමකට දන්නා හඳුනන ජාතික රෝහලේ ස්නායූ වෛද්‍ය අංශයේ විශේෂඥයෙකුගේ මතය විමසා, ඒ වෛද්‍යවරයාගේ උපදෙස් මත ස්නායු ශල්‍ය වෛද්‍ය වාට්ටුවට ප්‍රේමා ඇතුළු කර, තවත් ලේ ටිකක් ඉවත් කරන ලදී. ඉන්පසුව ඇපලෝ රෝහලේ සායනයට ගොස් *රවී පලූර් දොස්තර මහතාට* මේ ගැන කී විට, තමා වෙත නොපැමිණීම ගැන සතුටු වූයේ නැත. තවත් ස්කෑන් පරීක්ෂාවක් කර එය නිරීක්ෂණයෙන් පසුව කීවේ, තවත් ලොකු සැත්කමක් කළයුතු බවයි. එනමුත් එය ඉක්මන් කළේ නැත. සති දෙකකට පසුව ලොකු දුව හා ලොකු පුතා ආපසු ඕස්ට්‍රේලියාවට ගියහ. නිතිපතා සායනයට ගොස් *රවී පලූර් දොස්තර* මහතාගෙන් උපදෙස් හා ප්‍රතිකාර ලබා ගතිමු. ජූනි මාසයේ අවසානයේ දී පමණ තවත් සැත්කමක් කළ යුතු බව කීවේය. ලොකු දුවට ඒ ගැන දැන්වූ පසු දුරකථනයෙන් සාකච්ඡා කර පෙර පරිදි ම රුධිරය ඉවත් කිරීමට සීමිත සැත්කමක් කිරීමට එකඟ විය.

ඒ නිසා, නැවතත් ප්‍රේමා 2004 ජූලි මස 21වෙනි දා ඇපලෝ රොහලට ඇතුළු කළෙමි. මෙවර රෝහල් කාඩ්පතේ සඳහන් කර තිබුණේ මෙසේය :

"RE – ACCUMULATION OF CHRONIC SUB – DURAL HEMATOMA LEFT FRONTO – PARIETAL

Chronic sub-dural haematoma was done on 22-july-2004 "

ශල්‍යාගාරයට ගෙන යෑමට පෙර ලෙඩාගේ කාමරයේ දී හිස මුඩු කිරීම් ආදිය කරන විට ප්‍රේමා ඒවාට දැඩි විරෝධතාව දැක්වූවාය. රෝගීන් ගෙන යන ට්‍රොලියේ ඇය ගෙන යන විට නොනවත්වා ම ඇඬුවාය. ඒ නිසා මාත් ඈ සමඟ ශල්‍යාගාරය වෙත එන බවට පෙන්වා ට්‍රොලිය අසලින් හෙමින් ඉවත්වූයෙමි. ශල්‍ය කර්මයට පසුව පෙර පරිදි දැඩිසත්කාර ඒකකයට ගෙන ගියහ. මා එහි යන විටත් ප්‍රේමා තද නින්දේ සිටියාය. ප්‍රේමා අවදිවූවාට පසුව ගොස් බලා සිට, ඈට මා හඳුනා ගැනීමට නොහැකි බවක් දැනිණි. විටින් විට කීප වතාවක් ලෙඩා ළඟට ගියත් ඈ කිසිවක් කීවේ නැත. බොහෝ වේලාවකට පසුව වෛද්‍යවරයාගෙන් විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ, තාවකාලික ව මතකයට බාධාවක් වී ඇති බවය. ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වනවා ඇතැ'යි කීවේය. එනමුත්, මින් පසු ප්‍රේමාට කථා කළ නොහැකි විය. එපමණක් නොව, දකුණු අත සහ කකුල දුර්වල වී තිබිණි. හොඳින් එහා මෙහා ඇවිදිමින් සිටි ප්‍රේමාට කෙනෙකුගේ උදව් නැති ව ඇවිදීමට නොහැකි වී තිබිණි. දෙවන වර මෙම සැත්කමේ දී මොළයේ ශෛලවලට හානියක් සිදුවී ඇති නිසා, මෙම ආබාධ පැන නැඟිණි. සැත්කමට ප්‍රේමා දැක්වූ විරෝධය මේ ආපදාවේ පෙර ලකුණු වූයේ යැයි සිතමි. එනමුත් දැන් ප්‍රමාද වැඩිය. සැත්කම නොකර සිටියා නම් දොස්තර මහතාගේ අදහස අනුව ප්‍රේමා ජීවත් කරවීමට නොහැකි වන්නට තිබිණි. ඒ නිසා මට තිබුණු විකල්පය කුමක් ද? සැත්කමට පෙර මෙවැනි දෙයක් සිදුවේ යැයි කිසිසේත් සිතන්නට හේතු නොවීය. දැඩි සත්කාර ඒකකයෙන් සාමාන්‍ය කාමරයට පිටත් කළ පසු, නැවතත් සෙලින්කෝ සාත්තු සේවා ආයතනයෙන් සේවිකාවන්ගේ සහය ලබා ගතිමු. මේනකා තව දුරටත් ඒ සඳහා පැමිණියාය.

මෙවර ටිකට් කැපුවේ අගෝස්තු මාසේ 2වෙනි දා ය. මේ වන විට *ප්‍රියන්න බැණා* දැන සිටි කුරුණෑගල රැකියා ඒජන්සියකින් මුළුතැන්ගෙයි සේවයට කෙනෙක් ගෙන්වා තිබිණි. ඒ කාන්තාවගේ නම *මධුරිය*. ඇය ද 2005 දෙසැම්බර් මාසය දක්වා අපට උදව් කළහ. නිතිපතා සායනයට ගොස් *රවී පල්ලර් දොස්තර මහතාගේ* උපදෙස් ලබා ගතිමු.

නැවත තලපත්පිටිය නිවසට

අප දෙදෙනා උඩදුම්බර පදිංචි ව සිටි අවදියේ තලපත්පිටියේ මාගේ නිවස බදු දී තිබුණු බව ඉහත සඳහන් කළෙමි. ප්‍රේමාගේ රෝගී තත්ත්වය නිසා එම නිවස ආපසු ලබා ගැනීමට අවශ්‍ය විය. ඒ ගැන බදුකරුවන්ට දැන්වීමටත් පෙර මට ගේ අවශ්‍ය දැ'යි ඒ අය ම විමසූහ. ඉන් පසු මාස දෙක තුනකින් වෙන තැනක පදිංචියට ගියහ. ප්‍රියන්තගේ මස්සිනා කෙනෙක් දන්නා හඳුනන ගෙවල් අලුත්වැඩියා කරන කොන්ත්‍රාත්කරුවෙකු ලවා අප නිවස මුළුමනින් ම ශුද්ධ පවිත්‍ර කරවා ගතිමි.

ප්‍රේමාගේ පළමුවන සැත්කම අවදියේ ලංකාවට පැමිණ සිටි ලොකු පුතා සමඟ ජුනි මාසේ මුල් දවස්වල උඩදුම්බරට ගොස්, එහි තිබුණු ගෙවල් බඩු ප්‍රවාහනයට ගැලපෙන පරිදි සකස් කර තැබුවෙමු. මගේ වාහනයෙන් රැගෙන ආ හැකි අපගේ රෙදිපිළි බෑග් ආදිය ඒ ගමනේ දී ම ගෙන ආවෙමු. තලපත්පිටියේ නිවස අලුත්වැඩියා කෙරෙද් දී ම ඉතිරි බඩු ටික සරත් පුතා විසින් තෙල්දෙණියේ සමූපාකාර සමිතියේ ලොරියකින් ගෙනැවිත් දුන්නේය. මාස කිහිපයකට පසුව උඩදුම්බර නිවාසය කොළඹ හුළුගල්ල නම් මහත්මියකට විකුණුවෙමි. ඒ අය එම නිවස මිලට ගෙන ආබාධිත දරුවන් රැක බලා ගන්නා තැනක් බවට පත් කර තිබේ. ඒ ගැන මම සතුටු වෙමි.

2004 නොවැම්බර් 4වෙනි දා ප්‍රේමාත් සමඟ තලපත්පිටියේ නිවසේ පදිංචියට ගියෙමි. ප්‍රේමා බලා ගැනීමට මේනකා එහි පැමිණියාය. තවත් කෙනෙක් රාත්‍රියේ සේවය සඳහා පැමිණියාය. ගේ දොර වැඩ කටයුතු කිරීමට මධුරි පැමිණියාය. මෙහි ගිය පසු ප්‍රේමාට සාත්තු කරන අයටත් වැඩිපුර ඉඩකඩ ඇති තැනක් ලැබිණි. මාගේ පාවිච්චියටත් වෙන ම කාමරයක් තිබිණි. සේවිකාවන්ට විවේකයෙන් සිටීමට වෙන ම කාමරයක් තිබුණු අතර, ප්‍රේමාට සුපුරුදු ඇගේ කාමරය නැවත ලැබිණි. උඩදුම්බර නිවසේ සවිකර තිබූ උණුවතුර යන්ත්‍රය ගෙනවිත් සවිකර ගත් නිසා, ප්‍රේමාට අවශ්‍ය උණුවතුර ලබා ගත හැකි විය. උදේ හවස ඇඟ සේදීමත්, පෙරවරු එකොළහට පමණ දිනපතා නෑවීමත් නිසා ප්‍රේමා පිරිසිදුවෙන් සිටියාය. මේනකා මේ ගැන විශේෂයෙන් උනන්දු වූවාය. පස්වරු පහට පමණ දිනපතා මා ළඟ වාඩි කරවා ගෙන සිරිත් පරිදි පන්සිල් සමාදන් වීමත් තුන් සූත්‍රය සජ්ඣායනාවත් කළෙමි. එය අවසන් වීගෙන එන විට, ප්‍රේමා ඉබේට ම නින්දට වැටී සිටියාය. ඉන්පසු රාත්‍රී සේවය භාර ගන්නා හේදිය විසින් ප්‍රේමා භාර ගෙන බලා ගත්තාය. අතරින් පතර අවදි වූවත් පහන් වනතුරු නිදි ඇඳේ ම ගත කළාය. උදේ දවල් රාත්‍රී ආහාර නිසි වේලාවට කැවීම මේ අය විසින් ම කරන ලදී. දිවා කාලයේ දී එළිමහනට ගෙන ගොස් නිවස ඉදිරි පස ඉස්තෝප්පුවේ වාඩි කරවා ගෙන දවස ගත කළේය.

මේ අතරතුර ඇති වූ වෙනත් ලෙඩදුක්වලට ඔඇැසීස් රෝහලෙන් ප්‍රතිකාර ලබා දුන්නෙමි. සැත්කම්වලින් පසුව *රවී පල්ලූර් දොස්තර* මහතා මනෝ වෛද්‍ය *ජී.ජී.එස්.ප්‍රනාන්දු* මහතා වෙත ලිපියක් යවා, කලින් කර ගෙන ගිය ප්‍රතිකාර අඛණ්ඩ ව කර ගෙන යන ලෙස දන්වා තිබේ. ප්‍රතිකාර ලබා දීම නිසා එවර මැයි මාසය පමණ වන තුරු වෙනත් කිවයුතු රෝගාබාධයක් නොවීය. එහෙත් 2007 මැයි මාසයේ 28 දින සිට දින පහක් ඔඇැසීස් රෝහලේ නේවාසික *වෛද්‍ය කුමාර් ප්‍රනාන්දු මහතාගෙන්* ප්‍රතිකාර ලබා ගෙන තිබේ. *ඒ.ටී.අලිබෝයි* නැමති වෛද්‍යවරයා ද රෝග පරීක්ෂණයක් කළේ ය.

මේ වන විට රාත්‍රී කාලයේ දී ප්‍රේමාට සාත්තු කිරීමට කුරුණෑගල රැකියා ඒජන්සියකින් *පද්මිණි* නැමති කුරුණෑගල කාන්තාවක් පැමිණ සිටියාය. *මේනකා* දවල් කාලයට සේවය කළාය. ප්‍රේමා මේනකාට ඉතා ම කුළුපග වූ බව පෙනිණි. අවාසනාවකට මෙන් සැප්තැම්බර් මාසය අවසානය වන විට මේනකාගේ පැමිණීම නතර විය. ඈ සෙලින්කෝ සාත්තු සේවා ආයතනයෙන් ඉවත් වී ගිය බවත් ඊට ටික කලකට පසුව විවාපත් වූ බවත් ආරංචි විය. මේනකා අස්වී ගිය පසු සේවයට පැමිණි තරුණියන් තම වගකීම් නිසි ආකාරයට සිදුකළ බවක් දක්නට තිබුණේ නැත. පද්මිණී සිටි නිසා සහනයක් තිබිණි. විටින් විට දිවා සේවයට එන සේවිකාවන් මාරු වන විට ප්‍රේමාට කළ යුතු සාත්තුව පිළිබඳ ඒ අයට උපදෙස් දුන්නේ පද්මිණී විසිනි. *මේනකා* අස්වී යාමට මාස කිහිපයකට පෙර *මධුරිගේ* සේවය අවසන් කර, *වසන්ති* නම් තරුණ කාන්තාවක් මුළුතැන්ගෙයි සේවයට පැමිණ සිටියාය. ප්‍රියන්ත බෑණාගේ මිත්‍රයෙකු වූ නානුඔයේ වෙළඳ ව්‍යාපාරිකයෙකු වූ *රත්නායක මහතා* විසින් වසන්ති අප නිවසේ සේවයට එවන ලදී. වසන්ති මුළුතැන්ගේ හා ගෙදර දොර පිරිසිදු කිරීම් ආදී වැඩ කටයුතු සඳහා පැමිණි නමුත්, අවශ්‍ය වූ විටක ලෙඩාගේ කටයුතුවල දී ද උපකාර කළාය. මධුරි සිටිය දී ඒ කිසිවකට උදව් කළේ නැත.

2006 සැප්තැම්බර් මාසයේ 20වෙනි දා මට සැත්කමක් කිරීමට සිදුවිය. ඒ මගේ *පිලිහාව* (Spleen) ඉදිමී තිබුණු නිසාය. සැප්තැම්බර් 18 දින ශ්‍රී ජයවර්ධනපුර රෝහලට ඇතුළත් වී 20 දින පිට වී ගියෙමි. ශල්‍ය කර්මය සිදු කළේ *ශල්‍ය වෛද්‍ය ලලින පියරිසි මහතා* විසිනි. රෝහලේ නේවාසික ව සිටි කාලය ගත කළේ 15වෙනි වාට්ටුවේය. මෙම ශ්‍යාල්‍ය කර්මය කරන අවදියේ ද ලොකු දුව ලංකාවට පැමිණියාය. මේ දින කිපය හැර ප්‍රේමා රෝගතුර වීමෙන් පසුව ඈ තනි කර දමා එක රැයක්වත් පිට ගත කිරීමට ගියේ නැත. වරක් පුංචි අයියාගේ අවමංගල්‍යයට සහභාගී වීමට මාතර තල්පාවිල ගිය නමුත් එදින ම ආපසු පැමිණියෙමි.

මගේ ශල්‍ය කර්මය අවසන් වී වැඩි දවසක් ගත කිරීමට පෙර වසන්ති ද ඇගේ පවුලේ යම් යම් ගැටලු නිසා සේවයෙන් ඉවත් වී ගියාය. ඉන්පසුව සේවයට පැමිණි කාන්තාව පද්මිණී සමඟ ගැටලුවක් ඇතිකර ගත් නිසා පිටත් කර හැරියේය. නැවත මුළුතැන්ගෙට සේවිකාවක් ලබා ගැනීම නතර කර, පන්නිපිටියේ මොරකැටිය හන්දියේ කෙයා සර්විස් ලංකා නම් ආයතනයක් පවත්වා ගෙන ගිය අපගේ ගෝලයකු වූ *අබේගුණරත්න* මහතාගේ ඒජන්සියෙන් සේවිකාවක් ගෙන්වා ගතිමි. ඒ අය දවසේ පැය විසි හතර ම සේවය කරති. ලෙඩා සමග ම ජීවත් වෙති. එහි යම් පහසුවක් තිබුණේ නමුත්, පළපුරුද්ද අඩු අය ද සිටි නිසා, දින කිහිපයක් ගතවන තුරු පුහුණුවක් දිය යුතු විය. ඒ ආයතනයේ මුලින් ම සේවයට පැමිණියේ *මල්කාන්ති* නම් හෙදියකි.

2007 මැයි මාසය වන විට ප්‍රේමා අසනීප වීම නිසා ඔඇසීස් රෝහලට ඇතුළත් කළෙමි. මැයි 30 සිට ජුනි 13 දක්වා එහි නේවාසික ව කුමාර් ප්‍රනාන්දු මහතාගෙන් ප්‍රතිකාර ලබා ගතිමු. දින කිහිපයක් දැඩි සත්කාර ඒකකයේ ද ගත කිරීමට සිදුවිය. මෙවර ප්‍රේමාට වැළඳුණේ නිව්මෝනියා රෝගය බව සඳහන් වේ. ජුනි 13වෙනි දා ඔඇසීස් රෝහලෙන් පිට වී පැමිණි නමුත්, නැවතත් 14 දින ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට ඇතුළත් කළෙමි. එහි දී *විශේෂඥ වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මියගෙන්* ප්‍රතිකාර ලබා ගතිමු. 14වෙනිදා සාමාන්‍ය වාට්ටුවේ දී ප්‍රතිකාර කර, ඊළඟ දවසේ දෙවෙනි පන්තියේ කාමරයකට ද පසුව පළමුවන පන්තියේ කාමරයකට ද මාරු කළේය. මල්කාන්තිට පසුව වෙනත් කාන්තාවක් සේවයට පැමිණියාය. ඈ ජූලි 18 දක්වා සේවයේ නිරත ව සිටියේය. ලෙඩාට යම් සුවයක් ලැබී ගෙන එන විට, පොඩි දුව රෝහලට ගිය අවස්ථාවක විශේෂඥ වෛද්‍ය *අනුලා විජේසුන්දර මහත්මිය* කියා ඇත්තේ, ප්‍රේමා ගෙදර එක්කර ගෙන ගොස් විවේකයෙන් ගත කිරීමට සලස්වන ලෙසයි. රෝග විනිශ්චය පත්‍රිකාවේ සඳහන් අන්දමට මෙවර ප්‍රේමාට වැළදී ඇත්තේ ASPIRATION PNEUMONIA නැමති රෝගයයි. ඔඇසීස් රෝහලේ දී ප්‍රතිකාර කළේ ද එම රෝගයටයි. දොස්තර මහත්මියගේ උපදෙස් අනුව, 2007 ජුනි 20 දින ටිකට් කපා ගෙන ප්‍රේමා ගෙදර එක්කර ගෙන ගියෙමු. තලපත්පිටියේ අප නිවස පිහිටියේ ද රෝහල අසලයි.

මේ වන විට ද ලෙඩා බලා ගැනීමට ගෙදර සිටියේ *කෙයා සර්විස් ලංකා ආයතනයේ* සේවිකාවකි. ඈ පැය විසි හතරේ ම ලෙඩා ළඟ සිටියාය. සිංහල අවුරුදු දිනවලට කලින් පද්මිණි ආපසු ගියාය. නැවත නොඑන බව කීවාය. ඒ නිසා මුළුතැන්ගේ වැඩට කෙනෙක් සොයා ගැනීමට උඩදුම්බර පදිංචි අපේ අයියාගේ පුතා වූ රංජිත් පුතාට දී තිබූ පණිවිඩයක් අනුව, 2007 මැයි මාසයේ මුල දී එම ප්‍රදේශයේ *වදවලකන්ද* නම් ගමේ *සිරියලතා* නම්

කාන්තාවක් එක්කර ගෙන ආවේය. ඒ නිසා, ගෙදර වැඩට යම් උපකාරයක් ලැබිණි. නැත්නම් ආහාරපාන උයාපිහා ගැනීම පවා මවිසින් සිදුකළ යුතු ව තිබිණි.

ප්‍රේමා නිතර නිතර රෝගාතුර වන නිසා, MEDI-CALLS නම් ආයතනයකින් හදිසි සේවා ලබා ගැනීමට පොඩි දුව වැඩ පිළිවෙලක් යොදා තිබිණි. 2007 ජුනි මාසයේ 30 දින වරක් එම ආයතනයෙන් සේවය ලබා ගතිමි. හදිසි අසනීපයක් ගැන දුරකථනයෙන් දැන්වූ විට වෛද්‍යවරයෙක්, හෙද නිලධාරියෙක් සමග ඇම්බියුලන්ස් රථයක් නිවසට පැමිණෙයි. අවශ්‍ය නම් ගැනීමට ඔක්සිජන් සිලිණ්ඩරයක් ද රැගෙන එති. ඊළඟට එම ආයතනයේ සේවය ලබා ගෙන ඇත්තේ 2007 ජුලි මස 10වෙනි දා ය. එදින රාත්‍රියේ **ප්‍රේමා අභාවප්‍රාප්ත වූවාය.**



නැතිවුණ පුණ්ඩරිකය

ප්‍රේමාගේ අභාවය

ජූලි 10වෙනි දා පස්වරු හයට පමණ ප්‍රේමාගේ රාත්‍රී ආහාරයට පසුව වෙන දා මෙන් ම අප නිවස සාලයේ මා ළඟ වාඩිකරවා ගෙන, පන්සිල් සමාදන් වී තුන් සූත්‍රය සජ්ජායනය කිරීමට පටන් ගතිමි. එනමුත්, ප්‍රේමාගේ පපුවේ සෙම හිරවීමක් මතු වන්නට පටන් ගත්තේය. උගුර හිරවෙන බවක් ද දක්නට තිබිණි. ඒ නිසා, පිරිත් කීම නවත්වා ප්‍රේමා නිදන කාමරයට ගෙන ගොස් ඇඳේ හාන්සි වීමට සැලස්වූයෙමි. ඒ අතරතුර, මෙඩිකෝල් ආයතනයට දුරකථන පණිවිඩයක් ද දුනිමි. පොඩි දුවට ද දුරකතනයෙන් කථා කර අප නිවසට එන ලෙස දැන්වූයෙමි. පැය භාගයකින් පමණ මෙඩිකෝල් වෛද්‍යවරයෙක් හා හෙද නිළධාරියෙක් ද පැමිණියහ. ලෙඩාට ඔක්සිජන් දෙන ලදී. වෛද්‍යවරයාගේ උපදෙස වූයේ, වහා ම රෝහලකට යැයුතු බවයි. පොඩි දුව පැමිණි පසු රෝහලකට යන අදහසින් තව ටික වේලාවක් ඉන්නා අතරතුර, වෛද්‍යවරයා විසින් ලෙඩා පරීක්ෂා කරන ලදී. ටික වෙලාවකට පසුව, පොඩිදුව පැමිණි නමුත්, ඒ වන විට රෝහලකට ගෙන යාමෙන් පලක් නොවන බව කීවේය. මේ වන විට ප්‍රේමාගේ ඉහ ඉද්දර කැසටි යන්ත්‍රයේ පිරිත් සජ්ජායනාවක් ආරම්භ කර තිබිණි. මා ඇගේ නළල පිරිමදිමින් ඇඳේ පසෙක වාඩි වී සිටියෙමි. අසළට පැමිණි පොඩි දුව අම්මාගේ අත අල්ලා ගෙන සිටියාය. නැවත වරක් ලෙඩා පරීක්ෂා කළ වෛද්‍යවරයා කීවේ නාඩි වැටීම දුර්වල වන බවය. තවත් ස්වල්ප වෙලාවකට පසුව නලාව පපුවට තබා පරීක්ෂා කර බැලූ වෛද්‍යවරයා නිහඬ ව ම කාමරයෙන් බැහැර යන විට Has She Gone? (ඇය ගියා ද?) යයි මා ඔහුගෙන් ඇසුවේය. වෛද්‍යවරයාගේ පිළිතුර වූයේ 'ඔව්' යන්නයි. ඒ අනුව ප්‍රේමාගේ අභාවය සිදුවූයේ 2007 ජූලි මස 10 අඟහරුවාදා රාත්‍රී 9.15 ට ය.

අම්මාගේ අභාවය ගැන ලොකු දුවටත් ලොකු පුතාටත් දැන්වීමු. පොඩිපුතා මේ වන විට *'සිම්ෆ්‍යුලේටර්'* පුහුණුවකට බැංකොක් නුවරට ගොස් සිටි නිසා, *මෙලානි* අම්මාගේ අභාවය ගැන දැන්වූවාය. ඉන් පසුව, ජයරත්න මල්ශාලාවට දුරකථනයෙන් කථාකර මෘත ශරීරය පිළිබඳ කටයුතු කිරීමට දැන්වීය. පැයකට පමණ පසුව ඒ අය පැමිණ මෘත ශරීරය රැගෙන ගියහ. පොඩි දුව හා ප්‍රියන්ත ද (බෑණා) ජයරත්න මල් ශාලාවට ගියහ. පසු දින පෙරවරුවේ පොඩි දුවත් මෙලානිත් මල් ශාලාවට ගොස් මෘත දේහයට ඇන්දවීමට අවශ්‍ය රෙදිපිළි ආදිය ලබා දී ඒ ගැන උපදෙස් දී පැමිණියහ. තලපත්පිටිය ප්‍රදේශයේ මරණ ලියාපදිංචි කරණ රෙජිස්ට්‍රාර්වරයාගේ නිවසට ගොස් මරණය ගැන දැනුම් දී, ඔහු නිකුත් කළ සහතිකය ජයරත්න මල් ශාලාවට යැවීමි.

සමුගැනීම

ප්‍රියන්ත බෑණාගේ මස්සිනාවරුන් වන *අනූෂ* හා *සරත්* 11වෙනි දා උදෙන් ම පැමිණ, අප නිවස හා අවට අවමඟුලට සුදානම් කළහ. තාවකාලික ආවරණ, පුටු ආදිය ගෙන්වා ගැනීමට පියවර ගෙන තිබිණි. ප්‍රේමාගේ මෘත දේහය නිවසට ගෙනෙන විට 11වැනි බදාදා පස්වරු දෙකට පමණ ඇත. ඕස්ට්‍රේලියාවේ සිටි වැඩිමහල් දරු දෙදෙනාගෙන් ද විමසා, අවසාන කටයුතු 14වැනි සෙනසුරාදා පස්වරු හයට බොරැල්ල කනත්තේ ආදාහනාගාරයේ දී සිදු කිරීමට තීරණය කර ගත්හ. ඒ අනුව ජයරත්න මල් ශාලාව විසින් මරණ දැන්වීම් ගුවන් විදුලියෙන් හා පුවත්පත් මගින් ප්‍රචාරණය කිරීමට සලස්වන ලදී. උඩදුම්බර හා වෙනත් ප්‍රදේශවල පදිංචි මගේ නෑදෑයින්ටත් මාතර පදිංචි ප්‍රේමාගේ නෑදෑයින්ටත් දුරකථන මගින් දැන්වූයෙමු. ප්‍රේමාගේ නෑදෑයින් කිහිප දෙනෙක් කොළඹ අවට පදිංචි ව උන්හ. ඒ අයට ආරංචිය ලැබුණේ පුවත්පත් හා ගුවන්විදුලිය මගිනි.

ලොකු දුවත්, ලොකු පුතාත්, නිර්මලා (ලේලිය) සහ පොඩිපුතා 12 වෙනි දා, බ්‍රහස්පතින්දා ලංකාවට පැමිණියහ. වසන්ත බෑණා හා ලොකු දුවගේ දරු දෙදෙනා, *දිනීත් හා සවිනි*, සෙනසුරාදා වන විට ලංකාවට පැමිණීමට නියමිත ව තිබිණි. ප්‍රේමාගේ සහෝදර සහෝදරියන්ගෙන් ජීවතුන් අතර සිටියේ රාමචන්ද්‍ර මල්ලී හා චන්ද්‍රා නංගීත්, නෙලා නංගීත් පමණය. මේ දිනවල නෙලා තම දියණිය සමග මැද පෙරදිග රටක සිටියාය. ප්‍රේමාගේ අයියාලාගේ දුවලා පුතාලා ද අක්කාගේ දියණියන් ද පැමිණ සිටියහ.

අවසාන දිනයේ ආගමික වතාවත් ආදිය සිදුකරන විට එය මෙහෙය වූයේ, අයියාගේ පුතා වූ තෙල්දෙණියේ ගම්ඉම මහා විද්‍යාලයේ විදුහල්පති *සරත් ඒකනායක* පුතා විසිනි. බදාදා සිට සෙනසුරාදා හවස් වන තුරු මගේත් දරුවන්ගේත් හිත මිතුරන් රාශියක් නිවසටත්, සුසාන භූමියටත් පැමිණ ඒ අයගේ ශෝකය පළ කළහ. නිර්මලාගේ නිවසින් ද අසල්වාසීන් විසින් ද ආහාර පානාදියෙන් උපකාර කළහ. මෙම දින කිහිපය තුළ ම ප්‍රියන්තගේ මෑණියන් නිවසේ කටයුතු මෙහෙයවීමේ දී මහත් සේ වෙහෙස දැරුවාය. ලොකු දුව, පොඩිදුව, මෙලානී යන දියණියන්ද නන් අයුරින් තම යුතුකම් ඉටුකළහ. ලොකු පුතා, පොඩිපුතා, ප්‍රියන්ත බෑණාත්, අනූෂ, සරත් යන දෙදෙනාත් නොයෙක් වැඩ කටයුතු ඉටු කළහ. වසන්ත බෑණා ඔස්ට්‍රේලියාවේ සිට පැමිණියේ 14වෙනි දා ය. ඉන් පසුව ඔහු අවශ්‍ය සහාය දැක්වීය. වසන්තගේ සහෝදර සහෝදරියන් ද විටින් විට පැමිණියහ. වසන්තගේ පියාණන් වූ විශ්‍රාමික විදුහල්පති *ඩී.ඒ.ලියනගම මහතා* රෝගී තත්වයෙන් වුව ද දෙවරක් ම පැමිණ අවසන් කටයුතුවලට ද සහභාගී විය.

අප නිවසේ සිට සුසාන භූමිය දක්වා රිය පෙරහැර යන විට පොලීසියේ සහාය ලබා ගැනීමට නිර්මලා ලේලිගේ සහෝදර මේජර් ජනරාල් නිමල් ජයසූරිය මහතා විසින් පියවර ගෙන තිබිණි. එදින පෙරවරුවේ අප නිවසට පැමිණි මේජර්වරයෙක් මගෙන් තොරතුරු විමසා, මිරිහාන පොලීසියේ සහාය ලබා දෙන බව මට දැන්වීය. ආගමික වතාවත් ඉටුකළේ තලපත්පිටියේ ධම්මනිකේතනාධිපති ස්වාමීන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහනසේලා විසිනි. නිවසේ දී ආගමික වතාවත් අවසන් කර, 2007 ජූලි 14වෙනි දා, සෙනසුරාදා පස්වරු හතරට පමණ ප්‍රේමාගේ දේහය රැගත් රිය පෙරහැර නිවසින් පිටත්විය. තලපත්පිටිය කනත්ත පාර දිගේ ඇතුළු කොට්ටේ හන්දියට ගොස් බොරුල්ල කනත්ත ආදාහනාගාරය වෙත පැමිණෙන විට පස්වරු පහට පමණ වන්නට ඇත.

ආදාහනාගාරය අසල ශාලාවේ දී පැමිණෙන්නන්ට දේහය බලා ගැනීමට සලස්වා, පස්වරු හයට පමණ එය ආදාහනාගාරයට ඇතුළු කළහ. බෑණාවරුන් දෙදෙනෙක් ලෙස වතාවත් කළේ රාමාගේ පුතා සහ ප්‍රියන්ත බෑණාත්ය. ටික වෙලාවකින් ආදාහනාගාරයේ චිමිනියෙන් කළු දුම් රොටු අහසට නගිනු දැකගත හැකිවිය. වසර පනස් එකක් මා සමග වාසය කළ ප්‍රේමා දැන් අළුගොඩකි. දින දෙක තුනකට පසුව එම අළු අඩංගු මුට්ටියක් මල් ශාලාවෙන් අපට ලැබිණි. පවුලේ සැම දෙනා (දරුවන් හා මම) කැළණියට ගොස් ඔරුවකින් ගඟ මැදට පිවිස, අළු බඳුන බිඳ දමා ගඟේ පාකර හැරියෙමු.

හත්වෙනි දින මතක බණ දේශණා කළේ කෝට්ටේ නාග විහාරාධිපති *පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමියන් වහන්සේ* විසිනි. පසු දින සංඝගත දක්ෂිණාවට වැඩම කළේ ධම්මනිකේතකනාරාමයේ භික්ෂූන් වහන්සේලාය. තුන් මාසේ දානය දෙන ලද්දේ 2007 ඔක්තෝම්බර් 10වෙනි දා ය. පෙර දින රාත්‍රියේ ධර්ම දේශනය පැවැත්වූයේ බොරැල්ල ජයවර්ධනාරාමාධිපති *පූජ්‍යපාද දේවහන්දියේ පඤ්ඤාසේකර නිමිපාණන් වහන්සේ* විසිනි. දානය සඳහා වැඩම කළේ තලපත්පිටියේ ධම්මනිකේතනාරාමයේ භික්ෂූන් වහන්සේලාය. මින් පසුව අවුරුදු පතා නොයෙක් ආකාරයේ පිංදහම් කර පිං අනුමෝදන් කරන්නේ දරුවන්ගේ මැදිහත්වීමෙනි.

හුදකලාව

මගේ බිරිඳ ප්‍රේමා ඔත්පල වූ නමුත් ජීවත් ව සිටීම ගැන බෙහෙවින් ම සතුටු වූයෙමි. ඈ රැක බලා ගැනීම මගේ වගකීමකට වඩා යුතුකමක් සේ සැලකුවෙමි. ඒ යුතුකම් ඉටුකළේ කිසිම පැකිලීමකින් නොවෙයි. මට ආශාව තිබුණේ ඈ ජීවත්වන තුරු මමත් ජීවත් වීමයි. ඇයගේ අභාවයට පෙර මට '' යන්ට '' සිදුවූවා නම්, ඔත්පල ව සිටි ඇය මගේ දරුවන්ට බරක් වීමට ඉඩ තිබිණි. ඒ අය තම මෑණියන් හොඳින් රැක බලාගන්නා බවට කිසිම සැකයක් නොවූ නමුත්, මා විසින් ඒ කටයුතු කිරීම මාගේ කැමැත්ත විය.

වසර තුනක් පමණ ඔත්පළ ව සිටි ප්‍රේමා අභාවයට පත්වූ පසු මට හැඟී ගියේ, ඈ යුතුකම් දෙකක් ඉටුකළ බවකි. පළමුවැන්න ඈ සම්බන්ධයෙන් ම ය. තාවකාලික ව හෝ ඈ ඇගේ දුකින් මිදුණාය. සංසාර චක්‍රයේ තව කී වරක් උපදී ද මැරේ ද නොදන්න නමුත්, දැනට විඳි දුකෙන්වත් මිදීම සැනසුමකි. මගේ වගකීමෙන් මා නිදහස් කිරීම දෙවැන්නයි. මේ ගැන මා සතුටු වූවා නොවේ. එහෙත් සිදුවූයේ එයයි.

එසේ වුවත්, 2007 ජූලි මාසේ 18වැනි දින සිට මා හුදකලා වූ බව වැඩි වැඩියෙන් දැනෙන්නට විය. අවමංගල කටයුතු අවසන් වී හත්දවසේ දානයෙන් පසුව නෑදෑ පිරිස් විසිර ගියහ. මගේ දරු දෙදෙනෙක් ලංකාවේ සිටි නමුත් මට හැකිතාක් මගේ ම නිවසට වී කාලය ගත කිරීම මගේ කැමැත්ත විය. මේ ගැන හොඳින් දන්නා පොඩි දුව සහ ප්‍රියන්ත බෑණා, තලපත්පිටිය නිවසේ සිට කොළඹ රැකියාවට ගියහ. තුන් මාසේ දානයට උදව් කිරීමට පද්මිණි ගෙන්වා ගත්තාය. දානය අවසන් වූ පසු මහනුවර ලේවැල්ලේ පදිංචි ව සිටි මගේ පාසල් මිතුරෙකුගේ ආරාධනය පරිදි එහි ගියෙමි. ඒ ගැන එතරම් සතුටක් නොදැක්වූ පොඩි දූලා ද නැවත මැනිං ටවුමේ නිවසේ පදිංචියට යන ලදී. මහනුවර ගොස් රාජපක්ෂ මිතුරාගේ පිලවල වත්තේ දින දෙක තුනක් විවේකයෙන් ගත කර ආපසු තලපත්පිටියට පැමිණ හුදකලාව ජීවත්වීමට පටන්ගතිමි.



හුදකලාවිය

ප්‍රේමාගේ වියෝවෙන් ඇති වූ පාළුව විටින් විට දැනෙන්නට පටන් ගත් නමුත්, මගේ දෛනික වැඩ කටයුතු තනියම කර ගැනීමට සිදුවූ නිසා, ඒවා යටපත් විය. උදේ දවල් රාත්‍රී ආහාරපාන සකස් කර ගැනීම, ඒ සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය කඩවලින් ගෙන ඒම, නිවස මිදුල කුඩා ගෙවත්ත දිනපතා අතුපතු ගා පිරිසිදු කරගැනීම යනාදියට සෑහෙන වෙලාවක් ගතවිය. දැන් බණ දහම් ශ්‍රවණය කිරීමටත් වෙනත් පොත් පත් කියවීමටත් වැඩියෙන් කාලය ගත කිරීමට ද අවස්ථාව ලැබිණි. වසරක් පාසා ලොකු දුවලා ලංකාවට පැමිණෙන නිසා දෙසැම්බර් මාසය තුළ අපගේ නිවස තුළ පාළුවක් නැත. ලොකු දුව, වසන්ත (බෑණා), දිනීත් (මුණුපුරා) හා සවිනි (මිණිබිරිය) යන හතර දෙනා පමණක් නොව ඒ අය පැමිණි විට යන එන්නන් ද නිවසේ ගැවසේ. මෙවර ලොකු දුව මා සමග දඹදිව වන්දනාවේ යෑමට ද කටයුතු සුදානම් කළහ. ලංකා බැංකුවේ දඹදිව චාරිකා වැඩ සටහන යටතේ 2007 දෙසැම්බර් දෙවන තුන්වන සතිවල දී දින දොහළක චාරිකාවක නිරත වීමු.

දඹදිව වන්දනා ගමන

සිරිතක් වශයෙන් මෙම චාරිකාව ආරම්භ කරන්නේ ලංකාවේ කටුනායක සිට චෙන්නායි දක්වා ද එතැන් සිට නව දිල්ලිය දක්වා ගුවන් මගින් ගොසිනි. ලොකු දුවලා ඕස්ට්‍රේලියාවේ සිට ලංකාවට ගමන් කරන යාන පත්‍රිකා උපයෝගී කර ගෙන කොළඹ සිට නවදිල්ලියට ශ්‍රීලංකන් යානයකින් ගමන් කළහ. පොඩිපුතාගේ වරප්‍රසාද යටතේ මට කොළඹ සිට නවදිල්ලියට ශ්‍රීලංකන් ගුවන් සේවයේ යානයකින් ගමන් කළ හැකි විය. අප ගමන් කළ ගුවන් යානය පියාසර කළේ පොඩි පුතාය. කටුනායක ගුවන් තොටුපලට මා ගියේත් පොඩි පුතා සමගය. නව දිල්ලි ගුවන් තොටුපලට ගිය පසු දිල්ලි නගරයේ හෝටලයකට අප එක්කර ගෙන යෑමට එහි සංචාරක ව්‍යාපාරයක වාහනයක් සමග මඟ පෙන්වන්නෙක් පැමිණ සිටියේය. රාත්‍රිය ගත කරන හෝටලයට ගොස් ආහාර පානයෙන් පසුව විවේක ගතිමු.

පසු දින පෙරවරුවේ දී වන්දනා කණ්ඩායමේ අනෙක් පිරිස අපට මුණගැසිණි. ඒ අය හෝටලයට පැමිණ තිබෙන්නේ පාන්දර දෙකට තුනට පමණය. පාමන්කඩ පන්සලක හිමිනමක් ද ඒ කණ්ඩායමට අයත් විය. අසල ඇති මුදල් මාරු කරන තැනකට ගොස් ලංකාවේ මුදල් ඉන්දියානු මුදල්-වලට මාරුකර ගතිමි. ලංකාවේ මුදල් ටිකක් ඉතිරි කර ගතිමි. පෙරවරු දහයට පමණ අපගේ ගමන ආරම්භ කිරීමට ලොකු බස් රථයක් පැමිණ තිබිණි. වන්දනා කණ්ඩායමේ පිරිස විසි පහක් තිහක් පමණ වන්නට ඇත. සමහර දෙනෙක් තනිවමත් තවත් අය පවුලේ දෙතුන් දෙනෙක් වශයෙනුත් උන්හ. ක්‍රම ක්‍රමයෙන් ඔවුනොවුන් දැනහැඳින ගැනීමට පටන් ගත්හ. දින දහයක් එකොළහක් පමණ වූ මේ සංචාරයේ දී දැක බලා ගත් හා වැඳපුදා ගත් ස්ථාන මගේ මතකයට නැඟෙන ආකාරයට පහතින් විස්තර කරමි.

නව දිල්ලි - අග්‍රා

දිල්ලි නගරයේ සිට කිලෝමීටර් 203ක දුරක් පැය පහක් පමණ ගමන් කළ අපට පළමුවෙන් ම හමුවූයේ අග්‍රා නගරයයි. එහි යමුනා නදී තීරය අසළ *සාජ් ජහාන් රජතුමා* විසින් ඉදිකරන ලද *ටාජ් මහල්* නම් වූ අති සුන්දර නිර්මාණය බැලීමට ගියෙමු. මෙහි ඉතිහාසය, ගෘහ නිර්මාණ ශිල්පය, විස්තර කිරීමට ප්‍රයත්න දරන්නේ නැත. එදින රැය ගත කළේ අග්‍රා නගරයේ හෝටලයකයි.

මෙම සංචාරයේ දී අපට ගමන් විස්තර කියා දීමටත් නවතින තැන්වල දී පහසුකම් සකසා දීමටත් ඉන්දියානු ජාතික මඟපෙන්වන්නෙක් අප සමග ගමන් ගත්තේය. පහසුකම්වල අඩුපාඩු ඇති විට දොස් අහන්නේ මොහුය. ඔහු නිතර ම සංචාරක සංවිධානයේ දුක්ගන්නාරාළය. *සී බෑන්ක් ට්‍රැවල්ස් ආයතනය* දෙන ලද ගමන් මාර්ගය වෙනස් කිරීමට ප්‍රයත්න දැරූ අවස්ථාවක, අප විරුද්ධ වීම නිසා, නව දිල්ලියේ සිටි ඉන්දියානු නියෝජිතයාට දුරකතනයෙන් කතාකොට ගැටලුව නිරාකරණය කර ගත්තේ අපගේ මඟ පෙන්වන්නා විසිනි.

අග්‍රා - ලක්නව්

දෙවෙනි දින පාන්දරින් ම ගමනට පිටත් වූ අප වන්දනා පිරිස, ඊළඟට ගියේ *සංකස්ස පුරයටයි* (SANKESIA). පිටිසර ගම් ප්‍රදේශයක පිහිටි එම ගම්මානය ගෞතම බුදුරජාණන් වහනසේ දෙව් ලොවට වැඩම කර තම මෑණියන්ට අභිධර්මය දෙසා ආපසු වැඩිය ස්ථානය බව කියනු ලැබේ. කුඩා කඳු ගැටයක් මත පිහිටි සිහිවටනයක් ද කඳුපාමුල එක් පසකින් කුඩා හින්දු කෝවිලක් ද බෝධි වෘක්ෂයක් ද දක්නට ලැබේ. ටිකක් දුරින් පන්සලක් ඇත. මෙහි ලාංකික භික්ෂූන් වහන්සේ නමක් වැඩ සිටිනවා දුටිමි. උන්වහන්සේලාගේ සිවුපසය ලැබෙන්නේ ලංකාවෙන් යන වන්දනා කරුවන්ගේ ආධාරවලින් බව දැනගන්නට ලැබිණි. *සංකේසියාවේ* දී දිවා ආහාරයෙන් පසුව *ලක්නව්* නගරය දක්වා ගමන් කළෙමු. *අග්‍රා* සිට *ලක්නව්* දක්වා ගමනට පැය දහයක් එකොළහක් පමණ ගතවේ. එහි හෝටලයක රාත්‍රියට ලැගුම් ගත්තෙමු.

ලක්නව් - බරණැස

පසුදින උදේ පාන්දරින් ම පිටත් වී පැය හතක ගමනකට පසුව බරණැසට ළඟාවීමු. අතරමඟ දී දිවා ආහාරය පිණිස කෑම පාර්සලයක් ලැබිණි. බරණැස් නුවර නවාතැන් ගත් හෝටලයේ දී රාත්‍රී ආහාරය ලැබිණි. ඊට පෙර සවස් වරුවේ කාලය ඉතිරි ව තිබුණ නිසා, *සාරානාත් විහාරයේ* දී ලාංකික භික්ෂූන් වහන්සේලා පිරිසක් *ධම්මචක්ක පවත්තන සූත්‍රය* දේශනාව

ශ්‍රවණය කිරීමට ගියෙමු. ඊළඟ දිනයේ හිමිදිරි පාන්දර ගංගා නදියේ දිය නාන තැන් බැලීමට සමහර දෙනෙක් ගියහ.

උදේ ආහාරයට පසුව බරණැස් නුවර බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන ලද *මිගදාය* (මුවන්ගේ උයන) නැරඹීමට ගියෙමු. පස්වග මහණුන් වහන්සේලාට ධර්මදේශනා කිරීම නිරූපණය කරන තැන බෝ මුලක් අසල එය ඉදිකර තිබේ. *මූලගන්ධකුටි විහාරය* ද ඒ අසල ම ය. අනගාරික ධර්මපාලතුමා (සිරිදේවමිත්ත ධර්මපාල හිමි) කරන ලද අනුපමේය කාර්යභාරයේ අගය තේරුම් යන්නේ මේතැන් බලන විටය. නටබුන් ගැන විස්තර කර දීමට ඉන්දියානු ජාතිකයෙක් පැමිණියේය. ලාංකික සිල් මෑණී කෙනෙකු විසින් සිංහලෙන් තොරතුරු පැහැදිලි කර දෙන ලදී. එම සිල් මෑණියන් ද යැපෙන්නේ වන්දනාකරුවන්ගේ ආධාරයෙන් බව පෙනී ගියේය. වන්දනාකරුවන් බොහෝ දෙනෙකුගේ චාරිකාවේ වැදගත් අංගයක් වන්නේ ඇඳුම් පැළඳුම් මිලයට ගැනීමයි. මාර්ගෝපදේශකයන්ට ද එය වාසිදායක වනවා විය හැකිය. ඒ නිසා, අසල පිහිටි රෙදි කඩවලට මඟ පෙන්වීම ද සිදුවේ. එදින රාත්‍රිය ද ගත කළේ *වරනාසි හෝටලේය.*

බරනැස - බුද්ධගයාව

පැය අටක පමණ ගමනකින් පසුව බුද්ධගයාවට පැමිණ හෝටලයක ලැගුම් ගතිමු.

පසුදින පාන්දරින් ම ජයශ්‍රී බෝධින් වහන්සේ වෙත ගොස් කිරි ආහාර පූජා කළෙමු. ඉන් අනතුරු ව බෝසමිඳු පාමුලට වී අටසිල් සමාදන් වීමු. අප සිල් සමාදන් කරවූයේ *පාමන්කඩ බෝධිරාජ විහාරයේ හිමිනමක්* විසිනි. උන්වහන්සේ අප සමග වන්දනාවේ වැඩම කළහ. බෝ මැඩ පරිශ්‍රයේ තිබෙන විහාර මන්දිරය තුළ අති විශාල බුදු පිළිමයක් තිබේ. නොයෙක් රටවල සැදැහැතියන් එම පිළිමය සිවුරෙන් පුදති. පැය භාගයකට හමාරකට වරක් සිවුරු මාරු කෙරේ. බෝ සමිඳු අවට උස් තාප්පයකින් වට කළ පරිශ්‍රයකි. ඉන් පිටත නොයෙක් රටවල භික්ෂූන් වහන්සේලා ද ගිහි බෞද්ධයන් ද නොයෙක් ශබ්ද පූජා කරති. සමහර විට එය මහත් ගාලගෝට්ටියක් බවට පත්වේ. එය සීමාවෙන් පිටත එක් පසක පැවැත්වෙන නිසා අනෙක් පසට සෝෂාවක් ඇති නොවීය.

බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කළ තැන් ඒ අසල ම දක්නට ලැබේ. *රුවන් සක්මන, අජපාල නුගරුක* ආදී තැන් බෝමැඩට සමීපයේ පිහිටා තිබේ. මුචලින්ද නා රජු ආවරණය ලබා දුන් තැන පොකුණක් තුළ නිර්මාණය කර තිබේ. බෝ සමිඳු පරිශ්‍රයෙන් පිටත *බුද්ධගයා ලංකාරාමය* දක්නට ලැබේ. මෙතැනින් ටික දුරක් බස් රථයෙන් ගොස් *නේරංජනා ගංගාව* පසු කළෙමු. විශාල විවෘත ඉඩක විසිර තිබුණ මෙම නදිය, අප එහි



බුද්ධගයාවේදී කිරිපිඬු පූජාව අතැතිව

ගිය අවදියේ වියලී ගොස් තිබිණි. තද වැසි කාලය නොවූ නිසා වන්නට ඇත. ටිකක් දුරක් ගිය විට, *සොත්තිය බමුණා කුසතණ අටමිටක් පූජා කළ තැන* ද පසු කළ විට, *සුජාත විහාරය* වෙත ළඟාවේ. සිදුහත් බෝසතාණන්ට *සුජාතා කුමරිය කිරිපිඬු පූජා කළේ* එම ස්ථානයේ දී යැයි කියනු ලැබේ.

දිවා ආහාරයට හෝටලයට ගොස් සුළු විවේකයට පසු නැවතත් බස්රියෙන් ම *දුර්ගේෂ්වරී* ගුහා බැලීමට ගියෙමු. සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ දුෂ්කර ක්‍රියාවන්හි නිරත වූයේ එම ගුහාව තුළ යැ'යි කියනු ලැබේ. ආපසු බෝ සමිඳු පාමුලට ගොස් සිල් පවාරණය කොට, හෝටලයට ගියෙමු. රාත්‍රී භෝජනයෙන් පසුව එහි ගත කළෙමු.

බුද්ධගයාව - රජගහනුවර - නාලන්දාව - පාඨලීපුත්‍ර (Patna)

පසුදින පාන්දරින් ම උදේ ආහාරය ගෙන අප පිටත් ව ගියේ *රජගහ* (RAJGHIR) *නුවර* ගමනටයි. මෙහි *වේළුවනය* (උණගස් පිරුණු උයන) ඉතා මනරම් උයනක් ලෙස පවත්වා ගෙන යන බව පෙනේ. සිත්කළු ජලාශයක් එහි දක්නට ලැබේ. බොහෝ දෙනෙක් ගිජ්ඣකූට පර්වතය මුදුනට

පා ගමනින් ම ගිය නමුත්, මා එහි ගියේ "කේබල් කාර්" (Cable Car) එකකිනි. පහළ සිට කඳු මුදුනේ තැනකට ඇද තිබෙන කේබල් දිගේ ඉහළ පහළ යන රථ වර්ගයකි. එක රථයක ගමන් කළ හැක්කේ එක්කෙනෙකුට පමණි. ගිරි මුදුනේ *ජපන් ජාතිකයින් ඉදිකළ සාම චෛත්‍යය සහ විහාරය* දක්නට ලැබේ. ගිරි මුදුනේ සිට බලන විට *දෙව්දත් තෙරුන්* බුදුන් වහන්සේට ගල් පෙරළූ තැන දිස්වේ. පාගමනින් යන අයට ඒ අසලට ම යා හැකිය. කන්ද පාමුල සමතලා භූමියේ රජ මාලිගාවක නටබුන් දක්නට ලැබේ. අජාසත් රජු තම පියා බිම්බිසාර රජතුමා සිරකර තැබුවේ එම මාලිගාව තුළ යැ'යි කියනු ලැබේ. එතැන් සිට බලන විට බුදුරදුන් වැඩසිටි ගිරිකුල පෙනේ.

එතැනින් පිටත් වී එන අතරතුර, කරත්ත රෝද ගිලී ගියේ යැ'යි කියන ගල්තලාවක් හමු වේ. *'රථ රෝද පාරවල්'* යයි කියන සැලකුණු ගල්තලාව මත දැනටත් දක්නට තිබේ. මෙතැනින් පසුව නාලන්දාවට ගියෙමු. ලෝකයේ පැරණිතම විශ්ව විද්‍යාලය පිහිටා තිබුණේ නාලන්දාවේය. විශාල භූමි ප්‍රදේශයක පැතිරී තිබුණ ගොඩනැගිලි සංකීරණයන්හි නටබුන් දක්නට තිබේ. නාලන්දා විශ්ව විද්‍යාලයේ පුස්තකාලය *මෝගල්* (මුස්ලිම්) රජවරුන් විසින් ගිනිබත් කළ බව කියනු ලැබේ. එම ගින්න හය මාසයක් පමණ ඇවිලී ගිය බව සමහර දෙනෙකුගේ මතය වී තිබේ. නාලන්දාවට පසුව *පාටලිපුත්‍ර නගරයට* ගොස් රාත්‍රියට එහි ලැගුම් ගතිමු.

පාටලිපුත්‍ර - වෛශාලී - කුසිනාරා

හිමිදිරි පාන්දර ආහාර ගෙන වෛශාලී නගරයට ගමන පිටත් වූයෙමු. පාර්සල් ලෙස ගෙන ගිය දිවා ආහාරයෙන් පසුව කුසිනාරා නුවරට ගොස් එහි හෝටලයක නවාතැන් ගතිමු. *වෛශාලීහි* දී දැක බලා ගත් දේ හෝ කරන ලද කිසිවක් දැනට මතක නැත. සවස් වරුවේ *කුසිනාරා නුවර* ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානයේ ඉදිකර තිබෙන මහා පරිනිර්වාණ විහාරයට ගොස් වැඳ පුදා ගත්තෙමු. පිරිනිවන් මංචකයේ වැඩ සිටින බුදුරජාණන් වහන්සේ නෙතට ගැටුණ විට බුදුන් දැකීමෙන් ලද සතුට මොහොතකින් නැති වී යන්නේ උන්වහන්සේ මේ වැඩ සිටින්නේ පිරිනිවන් මංචකයේ ය, යන සිතුවිල්ල පැන නැඟීමත් සමගය. ඒ ගැන මෙනෙහි කරන කෙනෙකුට නෙතට කඳුලක් ගැලීම නිතැතින් ම සිදු වේ. සැදැහැවත් බෞද්ධයන් විසින් බුදුරුව රන් ආලේප කර තිබෙනු පෙනේ. මනා අයුරු සිවුරු පොරවා තිබේ. එතැනින් පිට වී සංඝාවාස තිබෙන පෙදෙසට ගිය විට, ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා එහි වාසය කරන බව පෙනිණි. වන්දනාවේ යන කෙනෙකුට නවාතැන් ගැනීමට කාමර පහසුකම් ද ඇත. රෑ බෝවන විට අපි නවාතැන් ගත් හෝටලයට ගියෙමු.

කුසිනාරා - ලුම්බිණි

පසුදින පාන්දරින් පිටත් වී නේපාලයේ පිහිටි ලුම්බිණියට ගමන් ආරම්භ කළෙමු. පැය කීපයක් ගමන් කොට ඉන්දීය නේපාල දේශ සීමාවේ දී නේපාලයට ඇතුළු වීමට පෙර ගමන් බලපත්‍ර පෙන්වා වීසා ලබා ගත යුතු වේ. එම වතාවත්වලින් පසුව, ටික වේලාවකින් ලුම්බිණිය දක්වා පැමිණ බස් නැවතුම්පලකින් බැස පා ගමනින් ගොස් සිද්ධාර්ථ කුමාරයා උපන් ස්ථානයට ළඟා වූයෙමු. *සිදුහත් කුමරෝත්පත්තිය* සිදු වූ තැන ගොඩනැගිල්ලක් ඉදිකර ආවරණය කර තිබේ. *සත් පියුම් මත ගමන් කළ තැන* ඒ තුළ දක්නට ලැබේ. එම ගොඩනැගිල්ලෙන් පිටත ජලය රැඳි පොකුණක් දක්නට ඇත. සිදුහත් උපත සිදුවූ පසු දෝවනය කළේ ඒ පොකුණේ බව කියනු ලැබේ. ඒ අසල කීප තැනක ම ජපන් බුරුම ආදී බෞද්ධයින් ඉදි කළ විශාල චෛත්‍ය කිහිපයක් දක්නට ඇත. බසය වෙත එන අතරමඟ තිබෙන සංඝාවාසයක ලංකාවේ දී අධ්‍යාපනය ලැබූ නේපාල භික්ෂූන් වහන්සේ නමක් මුණගැසිණි. රාත්‍රිය ගත කිරීමට ආපසු ඉන්දියාවේ තිබුණු හෝටලයකට පැමිණියෙමු. නේපාලයේ සිට ඉන්දියාවට ඇතුළු වීමට වීසා තිබේ දැ'යි නැවත පරීක්ෂා කර බලන විට ද්විත්ව වීසා ("මල්ටිපල් වීසා") නැත්නම්, ආපසු ඉන්දියාවට ඇතුළුවීම ගැටලුවක් වේ. අප ගමනේ කෙනෙකුට එවැනි ප්‍රශ්නයක් මතු වූ නමුත් අපගේ මාර්ගෝපදේශක ඉන්දියානුවා එය නිරාකරණය කර ගත්තේය. මුදල් හුවමාරුවක් වූයේ දැ'යි නොදනිමි.

ලුම්බිණි - කපිලවස්තු - සැවැත් නුවර

ඊළඟ දිනයේ ගමන ආරම්භ කළේ හිමිදිරි පාන්දරින් ම ය. ගමන් මඟ බොහෝ දුරක් යන තුරු තද මීදුම් ගලා තිබිණි. අතරමඟ කුඩා කඩපලක බස්රථය නවත්වා, රියදුරු ආදීන් උදේ ආහාරය ගෙන, තේ පානය කළහ. පෙට්ටි කඩයකින් මාත් තේ වීදුරුවක් පානය කළෙමි. මීදුම තිබිය දී ම නැවත ගමනට පිටත් වී මීළඟට අප ගියේ *කපිලවස්තු පුරයටයි.* සිද්ධාර්ථ කුමාරයා ගිහි ජීවිතය ගත කළ කපිලවස්තු පුරයේ නටබුන් දක්නට ලැබිණි.

එදින ම අප ඊළඟට ගියේ *සැවැත් නුවරටයි.* රාත්‍රිය ගත කළේ එහි හොටලයකයි. වන්දනා කණ්ඩායමේ කීප දෙනෙක් *ලංකාරාමයේ* විශ්‍රාම ශාලාවක ලැගුම් ගත්හ. ඒ අය ද ආහාර ගැනීමට හෝටලයට පැමිණියහ. පසුදින සැවැත් නුවර දැක බලා ගත යුතු තැන් නැරඹීමට ගියෙමු. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි *ගන්ධකුටිය, දම් සභා මණ්ඩපය, ආනන්ද බෝධීන් වහන්සේ* ආදිය එකිනෙකට සමීප ව පිහිටි පූජනීය ස්ථාන වෙයි. බුදු හිමියන් පැන් පානය කළ ළිඳ ද ටිකක් දුරින් මනරම් ජලාශයක් ද දක්නට ලැබේ. යම් තරමක් දුරකින් *සාරිපුත්‍ර චෛත්‍යය* පිහිටා තිබේ. එම පරිශ්‍රයේ ම වාගේ *ආනාථපිණ්ඩික සිටුතුමාගේ මාලිගාවේ නටබුන්* දක්නට ලැබේ. මේ සියල්ල පිහිටා තිබෙන්නේ ඉතා අලංකාර උද්‍යානයකය. මේ *ජේතවනයයි.* මෙම



කපිලවස්තු නටඹුන් අතර

ශුද්ධ භූමියෙන් මඳක් දුරින් අංගුලිමාල මහ රහතන් වහන්සේ වැඩ වාසය කළ ආරාමය පිහිටා තිබේ. ඒ අසළ සාමාන්‍ය තරමේ චෛත්‍යයක් ද දක්නට ලැබේ. *චිංචි මානවිකාව* අපාගත වූ තැන ද මේ පරිශ්‍රයේ දක්නට ඇත.

සැවැත්නුවර - ලක්නව් - නවදිල්ලිය

මින් පසුව අපට තිබුණේ ආපසු ගමනයි. උදෙන් ම පිටත් වී *ලක්නව්* දක්වා බස් රථයෙන් ගමන් කළෙමු. දිවා ආහාරයෙන් පසුව ලක්නව් දුම්රියපළට ගියෙමු. පස්වරු 3.35ට **සතාබ්දි (Sathabdi Express)** සුඛෝපබෝගී දුම්රියෙන් නව දිල්ලිය බලා ගියෙමු. ඒ ගමනේ දී කීපවරක් ම ආහාරපානයෙන් සංග්‍රහ කරනු ලැබේ. රාත්‍රී භොජනය ද ලැබෙන්නේ දුම්රියේ දී ය. මෙම සේවය අතිශයින් ම කාර්යක්ෂම විය. එය ගුවන් යානාවල සේවයටත් වඩා උසස් තලයක පවතී. සේවකයින් බෙහෙවින් ම ක්‍රියාශීලීය. රාත්‍රී 10.00ට පමණ නවදිල්ලි දුම්රියපළට ළඟා වූයෙමු. මැදිරිවලට දුවගෙන එන කුලීකරුවන් ගමන් මලු ඔසවා ගන්නේ බලහත්කාරයෙන් මෙනි. ඒ කුලියක් උපයා ගැනීමේ උද්යෝගය නිසාය. එනමුත් බෙහෙවින් ම අහිංසක පිරිසක් බව පෙනිණි. දුම්රියපළට පැමිණ නැවත බස් රථයෙන් වන්දනා ගමන් ආරම්භ කළ හෝටලය වෙත ගියෙමු.

වන්දනා කණ්ඩායමේ අනික් අය පසු දින උදෑසනින් ම ලංකාවට ආපසු එන ගමනට පිටත් වී ගියහ. අපි පස් දෙනා *(වසන්ත, ලොකුදුව, දිනීත්, සවිනි හා මම)* කුලී රථයක් ලබා ගෙන නව දිල්ලියේ සංචාරයක නිරත වූයෙමු. එහි බෞද්ධ විහාරයකට ගොස් ඒ අසල වූ *බිර්ලා මන්දීර්*

නම් වූ හින්දු කෝවිල ද නැරඹුවෙමු. බෞද්ධ විහාරයේ ලාංකික භික්ෂූන් වහන්සේලා වැඩ සිටිති. උන්වහන්සේලාගේ සංඝාවාසයට වන්දනාකරුවෝ උපකාර කරති.

මහත්මා ගාන්ධි අනුස්මරණ ස්මාරකය සහ කෞතුකාගාරය නරඹා ඉන්දියා ගේට්, පාර්ලිමේන්තු සංකීරණය ආදී වැදගත් තැන් පසුකර, දිවා ආහාරය සඳහා හෝටලයට ගියෙමු.

එදින පස්වරුවේ නවදිල්ලියේ සිට කොළඹට එන ශ්‍රීලංකන් ගුවන් යානයෙන් ලංකාවට ඒමට ඉන්දිරා ගාන්ධි ජාත්‍යන්තර ගුවන්තොටුපලට ගියෙමු. ගුවන් තොටුපල අසල පොත් සාප්පුවකින් **භගවත් ගීතාව** නැමති පොත මිලයට ගතිමි. ගුවන් යානයට යාන පත්‍ර (Boarding Pass) දෙන වෙලාවට ගොස් ප්‍රවේශ ශාලාවට ගියෙමු. එදින මට බිස්නස් ක්ලාස් (Bussiness Class) අසුනක් ලැබිණි. යානාව පැදවූයේ පොඩි පුතාය. ගමන අතරමඟ දී ගුවන් නියමු කුටියට ගොස්, එහි තිබෙන අතිරේක අසුනක වාඩි වී, කටුනායක බස්වන තුරු ගමන් මඟ අවට ද කුටිය තුළ ඇති යන්ත්‍ර සූත්‍ර ද නිරීක්ෂණය කරමින් පැමිණියෙමි. මෙය අලුත් අත්දැකීමක් විය. මීට පෙර කේ.එල්.එම් යානයකින් *ඇම්ස්ටර්ඩෑම් සිට කොළඹට* එන ගමනේ දී නියමු කුටිය නැරඹීමේ අවස්ථාව ලැබිණි. ඒ යානය බොයින් 747 වර්ගයේ එකක් විය. මෙදින අප ගමන් කළේ එයාර් බස් 320 යානයකිනි.

රෑ බෝවන විට තලපත්පිටිය නිවසට පැමිණියෙමු. ටික දිනකට පසුව ලොකුදුවලා ඕස්ට්‍රේලියාවට ගිය නිසා මා නැවතත් තනිවිය. දඹදිව ගමන ගැන මෙනෙහි කිරීමට ඉඩ ලැබිණි. මේ ගමනට පෙර දඹදිව වන්දනා ගමන් ගැන එතරම් උනන්දුවක් නොතිබුණ නමුත්, ඉන් පසුව එහි අගය කොතරම් දැ'යි තේරුම් ගියේය. *සිදුහත් කුමාරෝත්පත්තිය, බුද්ධත්වයට පත්වීම, දහම් දෙසීම හා පිරිනිවන* ආදි ශුද්ධ වූ තැන් දැක බලා ගැනීම බෞද්ධයෙකුට අවශ්‍ය දෙයක් යයි කියනු ලැබේ. ඒ වාසනාව මට ලැබීම ගැන සතුටු වෙමි. එයට උපකාර කළ මගේ දරුවන්ට හද පිරි සෙනෙහසින් පිං අනුමෝදන් කරමි. "මේ ගමනට ප්‍රේමාත් සිටියා නම්" යයි සිතුන වාර අනන්තය. ඇයට ද පුණ්‍යානුමෝදනා කරමි.

දඹදිව ගමනට පසුව (2008 ජනවාරි සිට ඉදිරියට)

දඹදිව චාරිකාවට අනතුරු ව ලොකු දුවලා ඕස්ට්‍රේලියාවට ගියාහ. ඉන් පසුව නැවතත් මා තලපත්පිටිය නිවසේ හුදකලා විය. එසේ වුව ද මට උවමනා දෙයක් කිරීමට නිදහස ලැබිණි. උදෑසනින් ම අවදිව තේ පානයෙන් පසුව ආහාරයට යමක් සකස් කර ගෙන, පෙරවරු හයත් හතත් අතර ප්‍රවෘත්ති දැන ගැනීමට ගුවන් විදුලියට, රූපවාහිනියට කන්දෙමින් / නරඹමින් උදේ ආහාරය ගත්තෙමි. ඉන් පසුව ගෙවල් දොරවල් අතපතු

ගා හමාර වන විට පෙරවරු නවය පමණ වේ. පෙරවරු එකොළහ පමණ වන තෙක් පොතක් පතක් කියවීමට මෙන් ම, කඩයකට ගොස් අවශ්‍ය දේ ගෙන ඒමට වේලාව තිබිණි. මගේ *ව්නිග්ෆෝඩ් රථය* තිබුණ නිසා ගමන් බිමන් පහසු විය. දිවා ආහාරය සකස් කිරීමට පැයක් පමණ ගතවේ. රාත්‍රී ආහාරය ද එකට ම උයා ගන්නා නිසා ඉන් පසුව මුළුතැන්ගේ වැඩක් නැත. දිවා ආහාරයට පසුව පැයක් හමාරක් විවේක ගැනීමට හැකි විය. ඉන් පසුව ගමනක් බිමනක් නැත්නම් බණ දහම් ඇසීමට හා ඒ සම්බන්ධ පොත්පත් කියවීමට ඉඩ ලැබිණි.

මින් පසු කාල පරිච්ඡේදයේ දී, විටින් විට සමීප ඥාතීන්ගේ ලෙඩ දුක් හා අභාවයන් ද මගේ රෝගාබාධ නිසා රෝහල්ගතවීම් ආදිය ද වැඩි විය. 2008 වසරේ මුල දී ම *නන්දා අක්කා* (අපේ අයියාගේ බිරිඳ) රෝගාතුර වීම ගැන දැන ගන්නට ලැබිණි. වරක් උඩදුම්බර ගොස් බලන විට අක්කාගේ ලොකු දුව කල්‍යාණි උඩදුම්බර මහපාර අසල නිවසක් කුලියට ගෙන අම්මා සමඟ එහි පදිංචි ව සිටින බව දැනගන්නට ලැබිණි. පල්ලේවෙල සිට රෝහලට රැගෙන ඒමට ගමන් පහසුව අඩු නිසාත්, වැඩි වේලාවක් ගතවන නිසාත්ය. ඉන් පසුව එහි යන විට අපේ ගෙදර තිබුණ රෝද පුටුවක් සහ කොමෝඩ් පුටුවක් ගෙන ගොස් දුනිමි. දුරකථනයෙන් තොරතුරු ලබා ගැනීමට පහසුකම් තිබිණි.

ධර්මසේන අයියා

2008 මාර්තු මාසයේ අග දී *ධර්මසේන අයියාගේ අභාවය* ගැන දැන ගන්නට ලැබිණි. පොඩිපුතා සමඟ එම අවමංගල්‍යයට සහභාගී වූයෙමි. අප දෙදෙනා එහි ගොස් ටික වේලාවකින් මහනුවර රෝහලට ද ගියෙමු. ඒ වන විට *නන්දා අක්කා* මහනුවර මහ රෝහලේ හෘද රෝග වාට්ටුවට ඇතුළු කර සිටි බව දැන ගත් නිසාය. ආපසු මරණ ගෙදරට එන විට බොහෝ නැදෑ පිරිස් පැමිණ සිටියහ. *බඹරදෙණියේ නන්දා අක්කා* ද ඒ අතර සිටියේය. *ධර්මසේන අයියාගේ* ලොකු පුතා එවකට සේවය කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පිරිසක් ද පැමිණ සිටියහ. ඒ අතර, මගේ ගෝලයෙක් යයි කියන කෙනෙකු මුණගැසිණි. දේහය ආදහනයට පිළිමතලාවේ ආදහනාගාරයට ගෙන යන ලදී. අපි (පොඩිපුතාත් මාත්) දෙදෙනාත් එහි ගොස් ඒ කටයුතු අවසන් වූ විට එතැනින් ම පිටත් වී කොළඹ පැමිණියෙමු. එසේ එන විට මා සිතට නැඟුනේ, ඊට ටික කලකට පෙර ධර්මසේන අයියාගේ වැඩිමහල් පුත් සමන්ගේ විවාහ මංගල්‍යයටත් නිවසට පැමිණීමටත් (Home Coming) යන උත්සව දෙකකට ම ප්‍රේමාත් මාත් සහභාගී වූ බවයි. විවාහ මංගල අවස්ථාවක දී මා මිත්‍ර *සවිමන් උරුගොඩවත්ත මහතා* ද හමු විය. මනමාලියගේ පාර්ශවය දැන හැඳින ගෙන සිටි නිසා එයට සහභාගී වී ඇත.

ධර්මසේන අයියා අපේ බාල හීං අප්පච්චීගේ සහ හීං අම්මාගේ දෙවෙනි පුතාය. ළමාවියේ දී කොළඹ පුංචි බෝරැල්ලේ සුමංගලාරාමයට පැමිණ පැවිදි ව අධ්‍යාපනය ලබා, කන්තලේ ප්‍රදේශයේ පාසලකින් ගුරු සේවය ආරම්භ කර ඇත. එහි දී මුහුණ දුන් නොයෙක් දුෂ්කරතා නිසා උපැවිදි වූ බව මිණිපේ දී මා මුණගැසුණ විටක දැනගන්නට ලැබිණි. මිණිපේ මොරයායේ පාසලේ සේවය කරන අවදියේ (පතිරාජ ගුරුතුමිය ගෙනා යෝජනාවක් අනුව එතුමියගේ ඥාති දියණියක් සමඟ) විවාහ පත් වී දරු තිදෙනෙකුගේ පියෙකු විය. ලොකු දුවත් දෙවෙනි පුතාත් ගුරුවරුය. වැඩිමල් පුතා *සමන්* උපාධිධාරී ගණකාධිකාරීවරයෙකි. ළමා කාලයේ අප දෙදෙනා කෙළිදෙළෙන් ගත කිරීම ගැන ද මතක් විය. මහණ වීමට පෙර සිංහල අවුරුද්දට ගමට පැමිණි විටක ධර්මසේන අයියාත් මාත් අපේ අයියා ඉදිරියේ කවි ගායනා කර තෑගි වශයෙන් ලස්සන චීන රතිඤ්ඤු පෙට්ටි ලබා ගත් බව මතකය. ධර්මසේන අයියා පූජ සිල්ක් රෙද්දෙන් මැසූ ජාතික ඇඳුමක් ඇඳ සිටියේය. මනා පෙනුමක් ඇති හුරු බුහුටි ළමයෙකු විය.

නන්දා අක්කා

2008 අප්‍රේල් මස 5වැනි දින පෙරවරුවේ නන්දා අක්කාගේ අභාවය ගැන දැනගන්නට ලැබිණි. දිවා ආහාරයෙන් පසුව මාගේ වාහනයෙන් ගමනට පිටත් වී සවස් වන විට තෙල්දෙණියට ගොස්, සරත් පුතා ගනුදෙනු කරන කඩයකින් මරණ ගෙදරට අවශ්‍ය බඩු ටිකක් දමා ගෙන, උඩදුම්බර පල්ලේවෙල බලා ගමන් කළෙමි. මැද මහනුවර (උඟරුගල) පසුකර යන විට හමුවන 'රොටී කඩේ' ළඟ නවතා තේ පානය කොට නැවත ගමනට පිටත් වීමට සූදානම් වන විට, කෑගල්ලේ සරත් රණසිංහ පුතා හා දරු දෙදෙනා බසයකින් පැමිණ මගේ වාහනය දැක එයින් බැස ආවෝය. රෑ බෝ වී තිබුණ මේ වේලාවේ මරණ ගෙදරක යන මට දැන් තනියට පිරිසක් සිටිති. පල්ලේවෙල නිවසට යන විට රාත්‍රී නවයට පමණ වන්නට ඇතැ'යි සිතමි.

නන්දා අක්කාගේ මෘත දේහය මිහිදන් කළේ අප්‍රේල් 7වෙනදා ය. ඊට පසු දින මැදිවක සහ කරඳගොල්ලේ මරණ ගෙවල් දෙකකටත් සරත් හා රංජිත් පුතාලා සමඟ ගොස් සහභාගී වූයෙමි. *අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා* ඝාතනයට ලක්වූයේ මේ දිනවල වැලිවේරියේ දී ය. නන්දා අක්කාගේ හත් දවසේ දානය 11වෙනිදා ට යෙදී තිබිය දී වුව ද, ප්‍රේමාගේ අභාවයට පසු එළඹුණ පළමුවැනි සිංහල අවුරුද්දට පොඩි දුව හා පොඩි පුතා සමඟ ගත කිරීමට අවශ්‍ය නිසා, අප්‍රේල් 9වන දින මම ආපසු වැලිවේරිය හරහා තලපත්පිටියට පැමිණියෙමි.

අපේ අයියා සමඟ නන්දා අක්කා විවාහ වූයේ 1945 වසරේ දී ය. ඒ මම වලල මධ්‍ය විද්‍යාලයට ප්‍රවේශය ලැබූ වර්ෂයයි. නන්දා අක්කලාගේ පවුල සමඟ අපේ සම්බන්ධය පාරම්පරිකයි. ඒ අක්කාගේ පියා (පල්ලේවෙල

මාමා) අපේ අප්පච්චීගේ මස්සිනා කෙනෙකු විය. මා පාසල් යන වියටත් පෙර අපේ අම්මා සමඟ කීපවරක් ම පල්ලේවෙල මාමලාගේ ගෙදර ගොස් තිබේ. අපේ අම්මා *කරල්ලියද්දේ නැන්දම්මා* (නන්දා අක්කාගේ මව) සමඟ ඉතා කුළුපග වූ බව පෙනිණි. එහි ගිය අවස්ථාවල නවරත්න මල්ලී (නන්දා අක්කාගේ මල්ලී) සමඟ කෙළිදෙළෙන් ගත කළ බව මතකය. එම නිවසේ ගැහැණු ළමුන් දෙදෙනෙක් වූහ. කෙනෙක් නන්දා අක්කාය. අනික් කෙනා ඒ අක්කාගේ නැන්දම්මාය. නැකමින් මට කුඩම්මාය. එසේ වුවත්, මේ දෙදෙනා ම පාසල් යන වියේ දැරියෝ වූහ.

නන්දා අක්කා ගැන පැහැදිලි මතකයක් ඇත්තේ මා හෝඩියේ පන්තියේ ඉගෙන ගත් සමයේ දී ය. එවකට පාසල් දිවා ආහාරයට බත් සමඟ මයිසූර් පරිප්පු හොද්දක් දෙන ලදී. එම කෑම බෙදුවේ පාසලේ ඉහළ පන්තිවල ගැහැණු ළමුන්ය. නන්දා අක්කා පරිප්පු බෙදනවා හොඳින් මතකය. පසු වසරක දී මෙම ගැහැණු දැරියන් දෙදෙනා මා පාසලට පැමිණි දිනක පල්ලේවෙලට එක්කර ගෙන ගියහ. පසුදින ඒ අය සමඟ පාසලට එන ගමනේ දී ඇල වේල්ලක් දිගේ ගමන් කිරීම ද මතකය.

අයියා විවාහ වූ අවදියේ බිංතැන්නේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී (ඩීයාරෝ) කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු විය. මට මතක කාලයේ එම කාර්යාලය පිහිටා තිබුණේ බිබිල අසල *පෝටාව* නම් ගමේය. මගේ ගැටවර වියේ පාසල් නිවාඩු කාලවල දී මාත් කීපවරක් ම පෝටාවට ගොස් ඇත. ඒ හැම අවස්ථාවක දී ම *නන්දා අක්කා* කටට රසට ආහාර වේලක් උයා දුන් බව ද මතකය. අපේ අම්මා උයා දුන් කෑම තරමට ම නන්දා අක්කාගේ කෑමත් රසවත් විය. මා එහි ගිය විට තමාගේ ම මළුනු කෙනෙක් ලෙස මට සැලකුවාය. නන්දා අක්කා වැඩිහිටි කාන්තාවක් වූ නිසා යම්කිසි ගෞරව සම්ප්‍රයුක්ත බියක් ද මා තුළ තිබිණි. ඒ නිසා අක්කා තරහ වන කිසිවක් නොකළෙමි. බක්කි කරත්තයක නැඟී පාසල් ගිය දැරියක් කෙරෙහි මා සිත ඇදී ගිය නමුත්, එවැනි දෙයක්වත් නන්දා අක්කාට දැනෙන්නට හැසුරුණේ නැත.

පසු කාලයේ දී මම උඟරුගල කනිෂ්ඨ පාසලේ ගුරුවරයෙකු ව සිටි අවදියේ අයියලා අපේ ගමේ පදිංචියට ගියහ. පාසල අසල නිවාසයක නවාතැන් ගෙන සිටි මම සති අන්තවල ගමට ගොස් ප්‍රණීත ආහාරපානයෙන් අහේනිය නැති කර ගත්තෙමි. නවාතැනේ කෝකියාගේ ආහාරය පිටුරු මෙන් විය. නන්දා අක්කාගේ කෑම වේල නිල් තණකොළ වැන්න. මා කොළඹ රැකියාවට ගිය පසු අයියාත් අක්කාත් ඒ අයගේ දරුවනුත් දැක ගන්නට ලැබුණේ කලාතුරකිනි. මගේ විවාහයෙන් පසුව ඈත ප්‍රදේශවලට මාරු වී යෑම නිසාත් මේ සම්බන්ධතාව තවත් දුරස්ථ විය.

විශ්‍රාම ගැනීමෙන් පසුව ප්‍රේමාත් මාත් උඩදුම්බර පදිංචියට ගොස් සිටි අවදියේ අප දෙදෙනා නිතර පල්ලේවෙල නිවසට ගිය අතර, ඒ වන විට

අපට ඇප උපස්ථාන කළේ නන්දා අක්කාගේ (ලොකුදුව) කල්‍යාණි දුවයි. නන්දා අක්කා ඒ වන විට රෝග පීඩාවට පත් වී සිටි නිසාය. එසේ වුවත්, කථා බහෙන් පෙර පරිදි ම වූවාය. නන්දා අක්කාගේ අභාවය තවත් යුගයක අවසානයක් විය.

මගේ රෝගාබාධ

තලපත්පිටිය නිවසේ හුදකලාව ජීවත් වූ මා, මාසයක් පතා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ *වෛද්‍ය චූලා හේරත් මහතාගේ* සායනයට ගොස් ප්‍රතිකාර ලබා ගතිමි. මේ වන විට වගුගඩු දුර්වලතාව, දියවැඩියාව, අධික රුධිර පීඩනය මෙන් ම කොලෙස්ටරෝල් අවතුලනය යන විවිධ රෝගවලින් පීඩා විඳීමට පටන් ගත්තේය. බෙහෙත් වර්ග කීපයක් අවශ්‍ය වූ නමුත් ඒවා නිසා ද ශරීර දුර්වලතාවන් පැන නැඟිණි. මෙවැනි දුර්වලතාවන් පැන නැඟුණ දවසක හේරත් දොස්තර මහතා මුණ ගැසුණ විට, වහා ම රෝහල්ගත වීමට උපදෙස් ලැබිණි. ඒ නිසා 2008 මැයි මාසේ 9 දින සිට 18 දින දක්වා 7වෙනි වාට්ටුවේ නැවතී ප්‍රතිකාර ලබා ගතිමි.

මෙවැනි අවස්ථාවල ටිකට් කැපූ විට පොඩි පුතාගේ ගෙදර ගොස් ටික දිනකින් නැවතත් සුපුරුදු පරිදි තලපත්පිටියේ නිවසට ගියෙමි. එනමුත් ලොකු දුවත්, පොඩි දුවත්, පොඩි පුතාත්, නිතර දෙවේලේ දුරකථනයෙන් තොරතුරු විමසූහ. 2008 ජූලි මාසයේ දී ගෙදර දොර වැඩවල උදව්වට හොරණ ප්‍රදේශයේ *රත්නසිරි* නම් කෙනෙක් වසන්තගේ මිතුරෙකු වූ නිමල් විසින් සොයා දෙන ලදී. උසාවියේ ඇති ඉඩම් නඩුවක් සඳහා යයි කියමින් රත්නසිරි මසකට වරක් ගෙදර ගියේය. ආපසු පැමිණෙන දින නිශ්චිත නැත. උසාවියට ගිය විට වෙනත් නඩුවලට අත් අඩංගුවට ගෙන හිර අඩස්සියේ තබන බව ඔහු කියයි. මා සමඟ සිටිය දී ඉතා කීකරු ව ගෙදර වැඩ කටයුතු කළේය. එසේ වුවත් ගෙදර ගිය විට ආපසු පැමිණීම අවිනිශ්චිත වූ නිසා, මාස කීපයකට පසු නැවත නොඑන ලෙස දැන්වීය.

ප්‍රේමාගේ වර්ෂ පූර්ණ දානමය පිංකම 2008 ජූලි මස 10වෙනි දාට යෙදී තිබිණි. පොඩි දුවලා එකතු වී ධම්මනිකේතනාරාමයේ භික්ෂූන් වහන්සේලාට දානය හා පිරිකර පූජා කර අම්මාට පිං පැමිණුවූහ. අම්මාට පිං පිණිස කරන කටයුත්තකට ගැනීමට ලොකුපුතා මා වෙත යම් මුදලක් එවා තිබිණි. මා උපන් ගම වූ *හාල්යාලේ* පන්සලේ ලිඳක් බැඳ ගැනීමට ඒ මුදල යෙදවීමි. පසුව පන්සලට ගිය අවස්ථාවක එය දැක බලා ගැනීමට ලැබිණි.

සම්මාන උපාධි

2008 වසරේ ඔක්තෝබර් මාසය පමණ වන විට, *ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය* සහ *ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය* මට සම්මාන උපාධි ප්‍රදානය කිරීමට යෝජනා කරන බව දැන ගන්නට ලැබිණි. විශ්ව විද්‍යාල සේවයෙන් විශ්‍රාම ගෙන වසර දහයක් ගත වන විට, සම්මාන උපාධියක් ප්‍රදානය කිරීමට යෝජනා කරන්නේ එම විශ්ව විද්‍යාලවලට මා ප්‍රයෝජනවත් සේවයක් කළා යයි වර්තමාන බලධාරීන් නිගමනය කර ඇති නිසා වන්නට පුළුවන. මා විශ්‍රාම ගිය සැනින් ම මෙය සිදුවූවා නම් ඒ මගෙන් යම් පල ප්‍රයෝජනයක් ලබා ගත් අයගේ ක්‍රියාවක් නිසා වන්නට ඉඩ තිබිණි. වසර දහයකට පසුව මෙවැනි තීරණයකට එළඹෙන්නේ මා නිසැකයෙන් ම යම් ප්‍රයෝජනවත් කාර්යභාරයක් ඉටු කළ නිසා විය හැකිය. ඒ ගැන සලකා බලා සම්මානයක් දෙනවා නම් එහි වටිනාකමක් ඇතැ'යි යන හැඟීම නිසා එම සම්මාන උපාධි භාර ගැනීමට තීරණය කළෙමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මට ප්‍රදානය කළේ *''විද්‍යාශූරී''* (D.Sc.) සම්මාන උපාධියයි. උපාධි ප්‍රදානෝත්වසය පවත්වන ලද්දේ 2008 දෙසැම්බර් මස 02වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ය. මේ සඳහා හේතු පාඨය ඉදිරිපත් කළේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති *ආචාර්ය සම්පත් අමරතුංග මහතා* විසිනි. එම විස්තරය මෙහි පහත දක්නට ඇත. සම්මාන උපාධිය ප්‍රදානය කරන ලද්දේ *ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කුලපති මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමිපාණන් වහන්සේ* විසිනි. උපකුලපතිවරයා වූයේ *ආචාර්ය එන්.එල්.ඒ.කරුණාරත්න* මහතාය. මගේ අති දක්ෂ ශිෂ්‍යාවක වූ *ආචාර්ය රමණි සමරතුංග* සහ *තිස්ස රාජපක්ෂ* යුවල, බෑණා වන *ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර*, පොඩි දුව සහ පොඩි පුතා උපාධි ප්‍රදානෝත්ව ශාලාවේ අසුන් ගෙන උන්හ.

මහාචාර්ය ආරියපාල ඒකනායක මහතාට විද්‍යාශූරී සම්මාන උපාධිය පිරිනැමීම වෙනුවෙන් කරන හඳුන්වාදීමේ දෙසුම කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති *ආචාර්ය සම්පත් අමරතුංග මහතා* ඉදිරිපත් කරයි.

ගරු කුලපති ස්වාමීන් වහන්ස,
ගරුතර මහා සංඝයා වහන්ස, පූජක තුමනි,
උපකුලපති තුමනි,
පීඨාධිපතිවරුනි,
විශ්වවිද්‍යාල සනාතන සභාවේ හා පාලක සභාවේ සාමාජික භවතුනි,
විශ්වවිද්‍යාල අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ සාමාජික භවතුනි,

නවක උපාධිලාභීනී,
සම්භාවනීය අමුත්තනි,
නෝනාවරුනි, මහත්වරුනි,

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර, *හාල්යාල* නම් වූ පිටිසර ග්‍රාමයේ ගොවි පවුලක, ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා සහ අබේසිංහ මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ යුවළට කනිටු පුත්‍රයකුව 1933 වසරේ මාර්තු 26වන දින දරුවෙක් උපන්නේය. හේ නමින් *ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ආරියපාල ඒකනායක* නම් විය. ආරියපාල ඒකනායක සිසුවා සිය ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ මහනුවර මැදිවක රජයේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාවෙනි. පසුව සිය කුසලතා මත ශිෂ්‍යත්වයක් ලබා, ද්විතීය අධ්‍යාපනය සඳහා *මහනුවර වලල මධ්‍ය විද්‍යාලයට* ඇතුළත් වන්නට ඔහු භාග්‍යවන්ත විය. සිංහල බස පිළිබඳ ව ප්‍රවීණතාවක් තිබුණ ද ඔහුට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශිල්ප හදාරා 1949 දී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය ඉහළින් සමත් වන්නට හැකි විය. ඉන් අනතුරුව, ස්වකීය වෘත්තිය ජීවිතය අරඹන එතුමා, ඉංග්‍රීසි බස ඉගැන්වීමේ උපගුරුවරයෙකු වශයෙන් පත්වීම් ලැබීය. 1951 වසරේ නොවැම්බරයේ දී රජයේ ලිපිකාර සේවා විභාග යෙන් සමත් ව රාජ්‍ය සේවයට එක්වූ ඒකනායක තරුණයා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත වෙමින්, මිනිපේ, බදුල්ල, හිගුරක්ගොඩ, ගිරිතලේ, මින්නේරිය වැනි ප්‍රදේශවල ප්‍රජාවට සිය සේවය ලබා දුන්නේය.

ආරියපාල ඒකනායකයන්ගේ දිවිය නව මඟකට යොමු කරනු ලැබුයේ 1960 දී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය ප්‍රථම වරට හඳුන්වා දෙන ලද උපාධි පාඨමාලාවක් පිළිබඳ පුවත්පත් දැන්වීමකි. එමගින් සන්ධ්‍යාකාලීන උපාධි පාඨමාලාවක් සඳහා රැකියාවන්හි නියුතු අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවා තිබිණි. ඒ වන විටත් විවාහපත්ව දරුවන් දෙදෙනකුගේ පියෙකු සිටි අපගේ කතානායක විසින්, සිය ජීවිත අභියෝගයන්ට ද මුහුණ දෙමින් උසස් අධ්‍යාපනයට ඇතුළු වන්නට පසුබිම සකස් කර ගනු ලැබීය. අනතුරුව 1963 දී හෙතෙම රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් ශාස්ත්‍රවේදී උපාධිය පංති සාමාර්ථයක් ද සහිත ව දිනා ගනුයේ එම උපාධි පාඨමාලාවට පෙනී සිටි ශිෂ්‍ය කණ්ඩායමට එක් වෙමිනි. උසස් අධ්‍යාපනයෙන් පසුව ද ඔහු ලංකා ධීවර සංස්ථාවේ සහකාර කළමනාකරුවකු ලෙස පත් වීමක් ලැබීය. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයෙහි ආර්ථික විද්‍යා, ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයෙහි බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් පත් වන්නට ද නොබෝ දිනකින් ඔහුට හැකියාව ලැබුණි. සරසවි සිසුනට දැනුම බෙදා දෙන්නටත් වැඩිදුර අධ්‍යාපනයටත් නිරතුරු ව ම නොපසුබස්නා උත්සාහයෙන් කටයුතු කළ ආරියපාල ඒකනායකයන්, සිය වෘත්තීය ජීවිතය ගෙන යන අතර ම ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලය හඳුන්වා

දුන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MPA) හිමිකරගනුයේ සම්මාන සාමාර්ථයක් ද සමඟිනි. පසුව 1970 වසරේ දී විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ නිත්‍ය කථිකාචාර්යවරයෙකු වශයෙන් පත් වූ ඒකනායකයෝ, සිය වෘත්තීය ජීවිතය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙත ම කැප කරමින් සරසවි සිසුනට ඥානය බෙදාදීම ඇරඹූහ.

නෙදර්ලන්තයේ හේග් නුවර සමාජීය අධ්‍යයන ආයතනය (Institute of Social Studies) මඟින් සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධිය 1978 වසරේදී දිනා ගත් ඔහු, පෙරලා මව් රටට පැමිණ සිය නවමු අත්දැකීම් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සමඟ බෙදා හදා ගනිමින්, රාජ්‍ය පරිපාලන විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව ගොඩනැගීම හා දියුණු කිරීමට කටයුතු කළේය. 1986 වසරේ දී රාජ්‍ය පරිපාලන විද්‍යා පිළිබඳ සභාය මහාචාර්ය තනතුරට පත්වූ මෙතුමා, දේශීය සරසවි සිසු පරපුර වෙත රාජ්‍ය පරිපාලන විද්‍යා පිළිබඳ දැනුම බෙදා හරින්නට අප්‍රතිහත ධෛර්යෙන් යුතු ව කටයුතු කළේය. දිවයිනේ ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ රාජ්‍ය පරිපාලන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ප්‍රදානය කරන එක ම අධ්‍යයනාංශය වන රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය, 1980 වසරේ දී ස්ථාපනය කිරීමට පුරෝගාමී ව කටයුතු කරනු ලැබුයේ *මහාචාර්ය ආරියපාල ඒකනායකයන්* විසිනි. එහි පුරෝගාමී අධ්‍යයනාංශ ප්‍රධානවරයා වශයෙන් ද කටයුතු කරමින්, එතුමා විසින් සපයන ලද පදනම මත, දේශීය වශයෙන් රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයත් අධ්‍යයනාංශයත් ශක්තිමත් ලෙස වර්ධනය විය. ඔහුගෙන් රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයට ඉටුවූ මෙම මහඟු මෙහෙවර නිසා ම ක්ෂේත්‍රයේ බොහෝ දෙනාගේ ගෞරවාදයට පාත්‍ර වූ මෙතුමා, රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ නිර්මාතෘවරයා වශයෙන් ද සැලකේ.

වාර කිහිපයක දී ම අධ්‍යයනාංශ ප්‍රධාන වශයෙන් කටයුතු කරමින්, තවදුරටත් කැප වී අධ්‍යයනාංශයේ දියුණුව හා ප්‍රගමනය උදෙසා කටයුතු කළ මහාචාර්ය ආරියපාල ඒකනායකයෝ, 1986 වසරේ දී කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති තනතුර සහ වැඩ බලන උපතුලපති තනතුර හොබවමින්, උසස් නායකත්ව කුසලතා පිළිබිඹු කළහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පාලක සභා සාමාජික, සනාතන සභා සාමාජික, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන කළමනාකරණ මණ්ඩලයේත්, අධ්‍යයන මණ්ඩලයේත් සාමාජික සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා සහ සමාජීය විද්‍යා ස්ථාවර අනුකමිටුව ආදියේ ක්‍රියාකාරී සාමාජික තනතුරු හොබවමින්, ඔහු විසින් සිදු කර ඇති සේවය අනභිවනීය වේ. ඔහු දක්ෂ ගුරුවරයකු පමණක් ම නොව දක්ෂ නායකයෙකු මෙන් ම පරිපාලකයෙකු ද විය. ඔහුගේ නායකත්වය කිසි විටෙක අභියෝගයට ලක් නොවීය. ඉවසීමේ ගුණයෙන්

යුක්ත ව මැදිහත් සිතින් කටයුතු කළ කෙනෙකු ලෙස හෙතෙම බොහෝ දෙනාගේ පැසසුමට ලක් විය. ඔහුගේ සේවය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පමණක් සීමා නොවූ අතර, 1996 වසරේ දී සබරගමුව විශ්ව විද්‍යාලයේ උඟව මණ්ඩපයෙහි මණ්ඩපාධිපති තනතුර ද, 1996 දී බුත්තල අනුබද්ධ විශ්ව විද්‍යාලයෙහි වැඩ බලන අධ්‍යක්ෂ තනතුර ද, සබරගමුව අනුබද්ධ විශ්ව විද්‍යාලය, ජාත්‍යන්තර අධ්‍යයනයන් පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ අධ්‍යාපනික ආයතනවල බාහිර කථිකාචාර්‍ය තනතුරු ද, හොබවමින්, වෙනත් ජාතික මට්ටමේ අධ්‍යාපනික ආයතනවලට ද සේවය ලබා දෙමින්, එම ආයතනවල අධ්‍යාපනික උන්නතිය සඳහා ද ක්‍රියා කළේය. විවිධ පර්යේෂණ පත්‍රිකා සහ ශාස්ත්‍රීය ලිපි සම්පාදනය කරමින් රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඉදිරියට ගෙන යාමට එතුමා දක්වන ලද දායකත්වය පැසසුම් කටයුතුය.

දශක තුනක පමණ දිගු සේවා කාලයකින් පසුව, 1998 වසරේ දී මහාචාර්ය ආරියපාල ඒකනායකයන් විශ්‍රාම දිවියට එළඹුණ ද, තවදුරටත් රාජ්‍ය පරිපාලන විද්‍යා ආදි ශිෂ්‍ය සංගමයෙහි නිත්‍ය සාමාජිකත්වය සහ අනුශාසක ධූරය දරමින්, අධ්‍යනාංශයේ ප්‍රගතිය සඳහා උපදේශකත්වයෙහි එතුමා නියැලෙමින් සිටී.

ගරු කුලපති ස්වාමීන් වහන්ස,

මහාචාර්ය ආරියපාල ඒකනායකයන් රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි සිදු කරන ලද ශාස්ත්‍රීය සේවාව, රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය ගොඩනඟා පෝෂණය කිරීමෙහි ලා දක්වන ලද පුරෝගාමී සේවාව සහ ක්ෂේත්‍රයෙහි විවිධ තනතුරු හොබවමින් සමාජ ජීවිතයේ දී පිළිබිඹු කරන ලද පරිචය අරභයා කෘතවේදීත්වය පළ කරනු වස්, *විද්‍යාශූරී සම්මාන උපාධිය* ප්‍රදානය කරනු සඳහා මහත් ගෞරවයෙන් යුතු ව සභාභිමුඛ කරමි.





සම්මාන උපාධි 2008 දෙසැම්බර් 02

UNIVERSITY OF SRI JAYEWARDENEPURA
SRI LANKA

This is to certify that

Ariyapala Ekanayake

was conferred the

Degree of Doctor of Science
(honoris causa)

at the Convocation held
on
02nd December 2008

Witness our hands this Second day of December
Two Thousand Eight

Vice-Chancellor

Registrar

D.Sc. සම්මාන උපාධි සහතිකය

සබරගමුව විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වූයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ය. ඒ 2009 ජනවාරි 15 වැනි දින දී ය. එම විශ්ව විද්‍යාලය මට ශාස්ත්‍රශූරී (D.Lett) සම්මාන උපාධිය පිරිනමන ලදී. හේතු පාඨය ඉදිරිපත් කරන ලද්දේ කළමනාකරණ පීඨයේ පීඨාධිපති ඩී.ඒ.අයි. දයාරත්න මහතාය. එම පාඨය මෙහි පහත දැක්වේ. සම්මාන උපාධිය ප්‍රදානය කරන ලද්දේ සබරගමුව විශ්ව විද්‍යාලයේ කුලපති මහාචාර්ය කුඹුරුගමුවේ වජිර නාහිමිපාණන් වහන්සේ විසිනි. උපකුලපති වූයේ මහාචාර්ය මහින්ද රූපසිංහ මහතාය. මහාචාර්ය ඒ.ඩී.වී.ද එස්. ඉන්ද්‍රරත්න සහ මහාචාර්ය බී.එල්. පණ්ඩිතරත්න මහතාට ද එදින සම්මාන උපාධි පිරිනමනු ලැබූහ. මගේ බෑණා වසන්ත ලියනගම, ලොකු දුව, මුණුබුරා දිනිත් තරුෂ ලියනගම, මිණිබිරිය සවිනි දුලංගා ලියනගම යන පිරිස ද උත්සව ශාලාවේ අසුන් ගෙන උන්හ. එදින රාත්‍රී භෝජන සංග්‍රහයට ද සහභාගී වූයෙමි.

PROFESSOR ARIYAPALA EKANAYAKE

Introduction and Presentation by Mr.D.A.I Dayaratne

Dean,Faculty of Management Studies

Venerable Chancellor,

Ariyapala Ekanayake, the youngest son of Ekanayake Rajapaksha Mudiyanselage Tikiri Banda and Abeysinghe Mudiyanselage Bandara Manike was born on 26th March 1933, in the village of Halyala,Udadumbara in the Kandy District. He received his primary education at the Rural Vernacular Mixed School in Mediwaka, Kandy. Due to his brilliant performance in the 5th standard at school, he was awarded a government scholarship and held it throughout his secondary education. That won him the opportunity to enter the *Walala Central College* for his secondary education. There he studied in the English medium, even though he was perfectly proficient in sinhala. After the completion of his Senior School Certificate (SSC) in December 1949, he started a career in 1951 as a Teacher Assistant in English. In the month of November of the same year, he passed the Government Clerical Examination and received his first appointment in the Department of Irrigation which eventually led him to serve in different parts of the country (Minipe,Badulla,Hingurakgoda, Girithale,Minneriya etc).

As a result of young Ekanayaka's enthusiasm to continue his higher studies, in 1960 he entered the Vidyodaya University of Ceylon

as a student of the first batch taken for the Bachelor of Arts (General) Degree. He pursued his studies in the Public Administration stream and graduated in 1963 achieving a Second Lower, being the only person in that first batch to obtain a class. With many years of devoted service in the public sector and numerous achievements, he was appointed to the position of Assistant Manager at the Ceylon Fisheries Corporation. Given the excellent performance at the University, he becomes a Visiting Lecturer at the Department of Economics, Business and Public Administration which was within the Faculty of Art in the Vidyodaya University of Ceylon.

Mr. Ekanayake continued to demonstrate his sincerity of purpose for advancing intellectually by gaining admission to the first batch of the Masters in Public Administration (MPA) offered by the Vidyodaya University of Ceylon, and completed it obtaining a merit pass in 1969.

In 1970, Mr. Ekanayake joined the Academic Staff of Vidyodaya University of Ceylon and served for 6 years as a lecturer until he was promoted to the post of Senior Lecturer in 1976. In recognition of his valuable services to the University and of his academic achievements" he was promoted in 1986 as Associate Professor in the Department of Public Administration, University of Sri Jayawardanepura.

In 1978, Professor Ekanayake was selected from the University to pursue a Masters Degree in Development Studies offered by the Institute of Social Studies (ISS) at Hague in Netherlands. The training that he received has been beneficial, not only to the University but to the entire country, since it enabled the Faculty of Management Studies and Commerce to commerce and develop postgraduate courses in Public Administration. Professor Ekanayake's contribution to the Department of Public Administration took the from of pioneering the establishment of the first and only academic department to offer an undergraduate Degree in Public Administration in 1980. He became its first Head and the course leader for the subjects of Public Administration, Public Enterprises, Public Finance and Political Science. Based on his contribution to the Department, he is also still identified as the Founder of the Department of Public Administration. Until his appointment as Dean of the Faculty

of Management Studies and Commerce at Vidyodaya University of Ceylon in 1986, he functioned as the Head of the Department of Public Administration and contributed immensely to its development. Professor Ekanayake's involvement in various other organizations, Universities and schools include his service as the Rector to the Uva Campus, Sabaragamuwa University of Sri Lanka (1996 to 1997);Bandaranaike Center for International studies, Sri Lanka Institute of Development Administration, Sri Lanka Library Association and Federation of Thrift and Credit Co-orporative Societies Ltd. of Sri Lanka. He also contributed to the field of social sciences through his extensive research work and articles which have been published in prestigious academic journals both local and international.

Prof. Ekanayake immensely contributed for the Development Sabaragamuwa University of Sri Lanka from its inception as an Affiliated University College. He was the first Academic Co-ordinator of the Travel and Tourism Management Programme of the Sabaragamuwa Affiliated University College. As the co-ordinator, he gave the leadership for the formulation of curricula of the above academic programme.

He played an important role as the Rector of Uva Campus in the development of Uva Affiliated University College and subsequently, for the formation of the Faculty of Agricultural Sciences in Sabaragamuwa University of Sri Lanka. Likewise, he contributed immensely to the development of Buttala Affiliated University College and to the establishment of the Faculty of Applied Sciences of the Sabaragamuwa University of Sri Lanka.

During the inception stages of Uva Campus of the Sabaragamuwa University, Prof. Ekanayake extended his valuable services as the Rector Uva Campus, fulfilling the requirements of physical and human resources of the Faculty.

Prof. Ekanayake served as a Council Member of the Sabaragamuwa University and chaired various key decision making committees of the Sabaragamuwa University of Sri Lanka. His experience, knowledge and expertise were very much useful in enhancing the quality of academic and administrative perfomance of the University.

Venerable Chancellor,

For the invaluable service rendered for the fostering and development of the discipline of Management and Public Administration in Sri Lanka, it is my privilege to present to you Professor Ariyapala Ekanayake for the conferment of the Degree of Doctor of Letters, Honoris Causa, of the Sabaragamuwa University of Sri Lanka.



රමණී, පොඩිපුතා, පොඩිදුව, ප්‍රියන්ත සමග



පවුලේ ප්‍රීතිය

SABARAGAMUWA UNIVERSITY OF SRI LANKA

This is to certify that
as approved by the Council
on the recommendation of the Senate of
The Sabaragamuwa University of Sri Lanka

Professor Ariyapala Ekanayake

was conferred the degree of

Doctor of Letters
(honoris causa)

at the convocation held in Colombo on
15th January 2009

Witness our hands this
Fifteenth day of January Two Thousand and Nine

Professor Mahinda S. Rupasinghe
Vice Chancellor

T K W T Thalagune
Registrar

D.Lett: සහතිකය 2009 ජනවාරි 15 සබරගමු විශ්ව විද්‍යාලය

චමිල මුණුබුරාගේ විවාහ මංගල්‍යය

චමිල මගේ මුණුබුරෙකි. අයියාගේ ලොකු පුතා වූ ජී.බී. ඒකනායකගේ වැඩිමහල් පුතාය. **2009 ජූනි මස 9වැනි** ද චමිල පුතාගේ විවාහ මංගල්‍යය සිදුකරන විට, එයට නොවරදවා ම සහභාගී වන ලෙස චමිලගේ මව අයිරා දුව මට දැන්වූවාය. මේ වන විට මා නිරන්තරයෙන් රෝගාබාධවලට පත්වන නිසා, මේ උත්සවයට සහභාගී වීමට ලැබේ ද, යන්න සැක සහිත විය. එසේ වුවත්, මඟුල් දිනයේ දී කොළඹ-මහනුවර නගරාන්තර දුම්රියේ ගොස් ආපසු පැමිණීමට ටිකට්පත් මිල දී ගතිමි. එය නැරඹුම් මැදිරියේ ගමන් කිරීමටයි. මංගල දිනයේ දී පෙරවරු 7.00 කොළඹ කොටුවෙන් පිටත් වන දුම්රියට මා ගෙන ගොස් බැස්ස වූයේ ප්‍රියන්ත බෑණා යයි සිතමි.

පෙරවරු 9.45 වන විට මහනුවර දුම්රියපලට ළඟාවූ පසු, මඟුල් ගෙදර යන්නට සුදුසු ඇඳුම්වලට මාරුවීමට දුම්රියපලේ විවේකාගාරයට ගියෙමි. කලකට පෙර මනා ලෙස මේස පුටු ඇති ව තිබුණ විවේකාගාරය දැන් හිස් කාමරයක් පමණක් විය. ඇඳුමක් ගලවා එල්ලීමට බෝල කුඩුවක් වැනි දෙයක් හෝ කණ්ණාඩියක් නොතිබිණි. ඇඳුම් මාරු කරගැනීමෙන් පසුව දුම්රිය ස්ථානාධිපති කාමරයට ගිය විට, එහි සේවය කරන අපගේ ඥාති පුත්‍රයෙකු වූ කරුණාතිලක පුතා ද සේවයේ සිටියේය. ඒ පුතාත් මඟුල් ගෙදර යන බව කී නිසා, මගේ ඇඳුම් බෑගය සුරැකි ව තැබීමට ඔහුට භාර දී, ත්‍රිරෝද රථයකින් අම්පිටිය පාරේ *ඩෙවෝන් හෝටලය* වෙත ගියෙමු. විශාල නෑදෑ පිරිසක් පැමිණ සිටියහ.

විවාහය ලියාපදිංචියට සාක්ෂිකරුවන් වශයෙන් අත්සන් කිරීමට පැමිණ සිටියේ මධ්‍යම පළාතේ *ප්‍රධාන අමාත්‍ය සරත් ඒකනායක මහතාන්* තවත් නිලධාරී මහතෙකුත්ය. ඒ කටයුතු අවසන් වූ පසු, දිවා ආහාරයට නොසිට ප්‍රධාන අමාත්‍යතුමා පිටත් වී ගියේය. එතුමා වාඩි ගෙන සිටි අසුනේ වාඩි ගත් මම, සාක්ෂියට අත්සන් කළ අනෙක් මහතා සමඟ කතාවට වැටුණෙමි. **ඩබ්ලිව්.එම්.වික්‍රමරත්න** නම් වූ ඒ මහතා, පිළිමතලාවේ යටිනුවර ප්‍රාදේශීය ලේකම්වරයා බවත් මනමාලියගේ පියා සේවය කරන්නේ එම කාර්යාලයේ බවත් කීවේය. මා කවුද'යි විමසූ විට, අසල වාඩි ගෙන සිටි කල්‍යාණී දුව (අයියාගේ ලොකු දුව) මා කවුද'යි විස්තර කරත් ම, අර නිලධාරීතුමා අසුනෙන් නැඟිට මා වෙත පැමිණ දණගසා ආචාර කළේය. එතුමා මගේ විශ්ව විද්‍යාල ගෝලයෙකු වූ බව කියා හැඳින ගැනීමට බැරි වීම ගැන සමාවන ලෙස ඉල්ලීය. මෙතරම් පිරිසක් මැද මා ඉදිරියේ දණ ගසා ආචාර කිරීමට තරම් නිහතමානී මේ ගෝලයා ගැන සංවේදී නොවන්නේ කුමන ගුරුවරයා ද? මෙවැනි අත්දැකීම් කීපයක් නිසා ගුරුවරයෙක් වීම කොපමණ භාග්‍යයක් දැ'යි සිතුන වාර අනන්තය.

දිවා භෝජනයෙන් පසුව කරුණාතිලක පුතා සමඟ දුම්රියපලට ගොස් මගේ බෑගය ගෙන ඇඳුම් මාරු කර ගෙන, කොළඹ එන දුම්රියට ගොඩවූයෙමි. එම දුම්රිය පස්වරු 3.00ට මහනුවරින් පිටත් වී පස්වරු 5.45 ට පමණ කොළඹ කොටුවට ළඟා විය. ප්‍රියන්ත බෑණා පැමිණ සිටි නිසා තවත් පැය භාගයකින් හමාරකින් තලපත්පිටියට ගියෙමි.

කෝසල මුණුබුරාගේ විවාහ මංගල්‍යය

මගේ නංගීගේ වැඩිමහල් දියණිය වූ අනුලා දුවගේ පුතා විවාහ පත්වීම සිදුවූයේ **2009 ජූනි මාසයේ 25වැනි දින** දීය. එම උත්සවය පැවැත්වූයේ *ගල්කිස්සේ බර්ජයා මවුන්ට් රෝයල් හෝටලයේ* ශාලාවකයි. ලංකාවේ සිටි අප පවුලේ සියලු දෙනා ම, එනම්, පොඩි දුව හා ප්‍රියන්ත බෑණා, පොඩි පුතා හා මෙලානි ලේලිය යනාදින් සමඟ මම එම උත්සවයට සහභාගී වූයෙමි. මෙහි දී සිදු වූ විශේෂ සිද්ධිය නම්, *පොද්දල්ගොඩ නංගී* හමුවීමයි. ඒ අවුරුදු පනස් පහකට පමණ පසුවයි. අනුලා දුවගේ නැන්දම්මා වූ මේ නංගී, පොද්දල්ගොඩ මස්සිනාගේ (මගේ නංගීගේ සැමියා) එක ම නැගණියයි. මා මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ සේවය කරන සමයේ දී අපේ ගෙදර දී කුඩා දැරියක් වශයෙන් **පොද්දල්ගොඩ නංගී** හමු වී තිබේ. ඉන්පසුව ඇය විවාහ වී දරු මුණුබුරන් ද ලැබූ පසු හමු වූ විට, හැඳිනගත හැකි වූයේ ඒ නංගී මා වෙත පැමිණ කථා කළ නිසයි. හෝම්කම්ං (Home Coming) දවසේ ද අපේ නංගී හා වෙනත් නෑදෑයින් සමඟ පොද්දල්ගොඩ නංගී ද හමුවිය. ඇගේ එක් පුතෙක් අප විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යා උපාධිධාරියෙකු බව දැනගන්නට ලැබිණි. ඔහු දෝහා-කටාර් දේශයේ ගණකාධිකාරීවරයෙකු වශයෙන් සේවය කරන්නේ යයි කීය. ඔහු මට මුණ ගැසී නැත. පොද්දල්ගොඩ නංගී විවාහ වී ඇත්තේ මාරස්සන ප්‍රදේශයේ වික්‍රමසිංහ නම් වූ තැපැල් ස්ථානාධිපතිවරයෙකු සමඟය. මාරස්සනට දීග ගොස් සිටින බඹරදෙණිය නැන්දම්මලාගේ බාල දුව පොද්දල්ගොඩ නංගී හඳුනන බව කීවාය. නෑදෑයින් ලංකාවේත් විදේශවලත් නොයෙක් දෙස විසිර සිටිති. මේ නයින් බලන විට අප හැම දෙනා ම හැම දෙනාගේ ම නෑදෑයින් නොවේ ද?

සිරිතක් වශයෙන් වසර අවසානයේ දී මාසයක පමණ කාලයකට ලොකු දුවලා ලංකාවට විත් තලපත්පිටිය නිවසේ පදිංචි වී සිටිති. එවිට ගෙදර දොරේ පාළුව මුළුමනින් ම පහව යයි. යන එන්නන් බොහෝය. ඒ අය සමඟ ගමන් බිමන් යෑමට ලැබේ. මගේ වාහනය ලොකු දුවලාගේ පාවිච්චියට වෙන් කෙරේ. ඒ අය ආපසු ගිය විට නැවතත් තනිවීම නිසා ක්‍රමයෙන් එයට ද පුරුදු වූයෙමි.

ප්‍රේමා අභාවයට පත් වී දෙවන වර්ෂය පිරෙන 2009 ජූලි 10වෙනි දා ට නාග විහාරයට පෙරවරු දානය පූජා කළෙමු. මේ හැර ප්‍රේමාට පිං පැමිණවීම පිණිස උඩදුම්බර රෝහලේ වාට්ටු අලුත්වැඩියා කිරීමට මුදලින් උපකාර කළෙමි. මේ සඳහා කල්‍යාණි දුව ද මැදිහත් වූවාය. ඒ අවදියේ ගෙදර වැඩවලට උදව්වට *කිඩිනසාමි* නමැති බගවන්තලාවේ කෙනෙක් පැමිණ සිටියේය. පවුලේ පටලැවිල්ලක් නිසා දින කීපයකට පසුව ඔහු ගියේය. ඉන් පසුව *කිඩිනසාමි* විසින් ම *රාජු* නමැති වැඩිහිටියෙකු එක්කර ගෙන ආවේය. රාජුගේ ගැටලුව වූයේ නිවාඩුවකට ගෙදර ගිය විට ආපසු පැමිණීමට නොදත්කමයි. ඔහු එක්කර ගෙන ඒමට කිඩිනසාමි වැනි කෙනෙකුවත් පැමිණිය යුතු විය. එනමුත්, වරක් දෙවරක් එසේ ගොස් නැවතත් පැමිණ, 2010 අප්‍රේල් මාසය පමණ වනතුරු මා සමඟ සිටියේය.

වෙනත් වැදගත් සිද්ධි

2010 ජනාධිපති මැතිවරණය පැවැත් වූ අවදියේ ජනවාරි 17-21 අතර මා රෝහල්ගත වී සිට ඇත. රෝහල් සේවයකයන් කීප දෙනෙක් සරත් ෆොන්සේකා අපේක්ෂකයාගේ ආධාරකරුවන් බව පෙනී ගියේය. වාට්ටුවේ සිටි භික්ෂූන් වහන්සේ නමක් ඔහුට පක්ෂව කතාබහ කළේය. ඒ අනුව නම් සරත් ෆොන්සේකා මහතාගේ ජයග්‍රහණය ගැන කිසිම සැකයක් නොවීය. එනමුත්, මහජන මතය එය නොවීය. තර්කානුකූල ව සිතා බැලිය හැකි කෙනෙකුට, මහජන මතය නිවැරදි ව දැක හැකි ව තිබිණි. එසේ වුවත්, මෝහයෙන් මුළා වූ විට තිමිර පටලයෙන් වැසී යයි. අප්‍රේල් මාසයේ දී මහ මැතිවරණය පවත්වන ලදී. එයින් එක්සත් ජනතා නිදහස් සන්ධානය විශිෂ්ට ජයක් ලබා ගත්තේය.

2010 වසර තවත් කරුණු රාශියක් නිසා මට වැදගත් විය. පළමුවෙන් ම මගේ ලේලිය වූ *මෙලානිගේ* පියා අභාවප්‍රාප්ත වූයේ **අප්‍රේල් මාසයේ 17වෙනි දිනය.** ලේවැල්ල තම නිවසේ පදිංචි ව සිටි **නිහාල් හලංගොඩ මහතා** හෘද රෝගයක් වැළඳී අභාවප්‍රාප්ත විය. මහනුවර මහ රෝහල අසල මල් ශාලාවක මෘත දේශය තබා තිබිණි. පොඩි දුවත් මාත්, චන්ද්‍රා නංගී හා තිස්ස ජයවර්ධන සොහොයුරාත් එකතුව මහනුවර ගොස් දේහයට බුහුමන් දැක්වූයෙමු. එහි පැමිණ සිටි පානබොක්කේ හා නුගවෙල යන මහතුන් දෙදෙනෙක් දැනහැඳින ගැනීමට ලැබිණි. ආපසු එන ගමනේ දී දිවා ආහාරය සඳහා පේරාදෙණියේ තානායමට ගියෙමු. ඉන් පසුව පොල්ගහමුල පසුකර කොළඹ එද්දී, අසල පිහිටි ගුණතිලක මල්ලිලාගේ නිවසටත් ගොඩවී යමු දැ'යි පොඩි දුව විමසූ නමුත්, එවැනි අවශ්‍යතාවක් නොවූ නිසා, කල්වේලා ගතවන හෙයින් කොළඹ පැමිණියෙමු.

එනමුත්, අවාසනාවකට මෙන් **අප්‍රේල් මස 22 දින පද්මා නංගී අභාවප්‍රාප්ත** වූ බව ඇගේ සැමියා වූ ගුණතිලක මල්ලී මට දැන්වූවේය. පසුදින පාන්දරින් ම පොඩි දුවත්, මාත් උඩරියගම යන අතරතුර, අනුලා දුව ද එක්කර ගෙන ගියෙමු. උදේ අට පමණ වන විට ගුණතිලක මල්ලිලාගේ නිවසට ගියෙමු. එහි ගිය පසු මරණය ගැන දන්වා යසවතී (අපේ අක්කාගේ ලොකුදුව) දුවට ද පණිවිඩයක් දුන්නෙමි. නෑදෑයින් බොහෝ දෙනෙක් මුණගැසීමට ලැබිණි. ඒ අතර, බඹරදෙණියේ නන්දා අක්කා, ඒ අක්කාගේ ලොකු දුව, ඒ දුවගේ දුව, ගුණතිලක මල්ලීගේ බෑණාවරු දෙතුන් දෙනෙක්, ලේලිවරුන් කීප දෙනෙක්, ඥාති දියණියන් හා පුතුන් කීප දෙනෙක් ද වූහ. මේ අය මුණ ගැසෙන්නේ ඉතා ම කලාතුරකිනි. සමහර නෑදෑයින් අඳුනන්නේ නැත. පද්මා නංගීගේ ඥාතීන් ද හමු වී දැන හැඳින ගැනීම් අලුත් කර ගැනීමට ලැබිණි. එදින පස්වරුවේ භූමදානය මහයියාව සුසාන භූමියේ දී සිදුකිරීමට නියමිත ව තිබිණි. නිවසේ දී, ආගමික වතාවත් නිමකර අවමඟුල් රථ පෙරහැර පිටත් වූ පසු අපි ආපසු ගමනට පිටත් වූයෙමු. තද වැස්ස නිසා ගමන් මඟ දුෂ්කර විය. හවස් වන විට තලපත්පිටියේ නිවසට පැමිණියෙමු.

ඉන්පසුව දානමය පිංකමට ද උඩරියගමට ගියෙමි. එවර මා ගියේ කොළඹ පිටකොටුවේ සිට මහනුවර බලා යන බස් රථයකිනි. පොල්ගහමුල බහින විට ගුණතිලක මල්ලීගේ පුතා ඉඳුනිල් සිය වාහනයෙන් පැමිණ මා නිවසට එක්කර ගෙන ගියේය. දානයට පෙර දින සවස ධර්ම දේශනාව පවත්වන ලද්දේ අස්ගිරි මහාවිහාර පරිවේනාධිපති නාරම්පනාවේ ආනන්ද ස්වාමීන් වහන්සේ විසිනි. පසුදින දවල් දානය අසල පිහිටි පොල්ගහමුල පන්සලේ හාමුදුරුවන්ට පූජා කරන ලදී. එදින ද නෑදෑයින් බොහෝ දෙනෙක් හමුවීමට ලැබිණි. පසු දින පෙරවරු දහයට පමණ මහනුවරට ගොස් එතැනින් පානදුරට යන පෞද්ගලික බස් රථයකින් නුගේගොඩට ගියෙමි. එවර මා සමඟ රාජා නමැති තරුණයෙක් ද ගෙදර වැඩපල සඳහා එක්කර ගෙන ආවේය. ඔහු ගෙනවිත් දුන්නේ අයියාගේ පුත් රංජිත් විසිනි.

රාජා වකුගඩු රෝගියෙකු බව පසුව දැනගතිමි. එනමුත්, නොවැම්බර් මාසයේ දීපවාලි උත්සවයට යන තුරු මා නිවසේ වැඩ කටයුතු කර දුන්නේය. ආපසු යද්දී රෝගාතුර වීම නිසා මහනුවර මහ රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබා ගෙන ඇත. ඊට පසු මාත් බලවත් ව රෝගාතුර වීම නිසා ඔහු නැවත ගෙන්වා ගැනීමට උනන්දු වූයේ නැත. ඔහු මගේ නිවසේ අවසාන සේවකයා විය.



හුදකළා වූ දෙදෙනෙක්

නැටුම් පන්ති කාමරය

ප්‍රේමාගේ තෙවස් පූර්ණ දානමය පිංකම යෙදී තිබුණේ 2010 ජූලි 10 වෙනි දිනටය. මෙවර ප්‍රේමාට පිං පිණිස තෙල්දෙණිය ගම්ඉම බණ්ඩාරනායක මහා විද්‍යාලයේ නැටුම් කාමරය ඉදිකිරීමට මුදලින් ආධාර කළෙමි. එම ශාලාව විවෘත කළ දිනයේ සවි කළ සිහිවටන ඵලකයේ පහත දැක්වෙන විස්තරය දක්නට තිබේ :

> **මහ/තෙල්/ගම්ඉම බණ්ඩාරනායක මහා විද්‍යාලයේ විදුහල්පති සරත් ගාමිණී ඒකනායක මහතාගේ ඉල්ලීම පරිදි, සිය සුළු පියාණන් වන මහාචාර්ය ආරියපාල ඒකනායක මැතිඳුන්, නැසීගිය සිය භාර්යාව වූ ප්‍රඥාවතී විජේසිරිවර්ධන ඒකනායක මහත්මිය සිහිවීම පිණිස පරිත්‍යාග කරන ලද මූලික ධනයෙන් හා ගම්වාසීන්ගෙන් සුභ පතන්නන්ගෙන් ආධාර උපකාර සහිත ව ඉදිකරන ලද මෙම මනරම් නර්තන ශාලාව, 2011ක් වූ පෙබරවාරි මස 16වන දින සිසු අයිතියට පවරන ලදී.**





නැටුම් පන්ති කාමර ඇය වෙනුවෙන් ස්මාරකයක්


ows
he
If you stop every
time a dog barks
your road will
never end.



තලපත්පිටිය ධර්ම නිකේතනාරාමයට හීල් දානය පූජා කළෙමු. රංගල රාජා ඒ දානය හොඳින් සූදානම් කර දුන්නේය. විවිධ කොළවර්ග යොදා කොළකැඳක් මවිසින් පිළියෙල කරන ලදී. දං පිං කිරීම ගැන රාජා දැනගත්තේ කෙසේ ද'යි විමසූ විට ඔහු කීවේ, තම මෑණියන් සිංහල බෞද්ධ කාන්තාවක් බවයි. පියා දමිළයෙකි. ඉහතින් සඳහන් කළ පරිදි රංගල රාජා දීපවාලි උත්සවයට ගෙදර ගිය නිසා මම පොඩිපුතාගේ ගෙදරට ගියෙමි. ශාරීරික දුර්වලතාවන් වැඩිවීම නිසා තනි ව ම ජීවත්වීමට නුසුදුසු නිසාය. කෙසේ වෙතත් එයින් සිදුවූයේ හොඳක්මය.

රෝහල්ගත වීම

2010 නොවැම්බර් මස 17වන දින රාත්‍රියේ ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ තදබල බාධාවක් දැනිණි. ඒ නිසා, පසුදින පාන්දරින් ම ගොස් රෝහල්ගත වීමට අවශ්‍ය දේ රාත්‍රියේ ම සූදානම් කර තැබීමි. පසු දින පහන් වූ විගස ම පොඩි පුතාට මගේ රෝගය ගැන දන්වා, මා රෝහලට එක්කර ගෙන යන ලෙස ඉල්ලූවෙමි. මෙය අසා සිටි මෙලානී ලේලිය සැනෙකින් සූදානම් වී මාත් වාහනයට නංවා ගෙන එය පදවා ගෙන ජයවර්ධනපුර රෝහලට ගියාය. ඒ අතරතුර පොඩි පුතා දුරකථනයෙන් පොඩි දුවට පණිවිඩයක් දී තිබිණි.

ජයවර්ධනපුර රෝහලේ හදිසි රෝග අංශයට මා ඇතුළු කරන විට ම තවත් රෝගියෙක් මටත් වඩා අසාධ්‍ය තත්ත්වයෙන් රෝහලට ඇතුළු කර දැඩි සත්කාර ඒකකයට යැවීය. එම රෝගියා පිටත් කළ පසු මට අවධානය යොමු විය. සිරිත් පරිදි මා *චූලා හේරත් දෙස්තර මහතාගේ* වාට්ටුවට යවන ලදී. උදෙන් වාට්ටුවට පැමිණි හේරත් මහතා, ඉකෝ (ECHO) පරීක්ෂණයට මා හෘදරෝග අංශයට යවා එතැනින් දැඩි සත්කාර ඒකකයට යවන ලදී. මට හුස්ම ගැනීමේ බලගතු දුෂ්කරතාවක් පටන් ගත්තේය. ඒ නිසා ඔක්සිජන් දීමට පියවර ගන්නා ලදී. 18වැනි දින රාත්‍රියේ දැඩි සත්කාර ඒකකයේ දී මගේ ප්‍රාණය නිරුද්ධ වේද'යි සැකයක් මට ම දැනිණ. ඔක්සිජන් දීම අත්‍යවශ්‍ය වුවත්, ඒ සඳහා දමා තිබූ මුහුණ ආවරණය මට දැඩි පීඩනයක් වන බව දැනිණි. මාස්ක් (MASK) එක ඇද දැමීමට වීරිය කළෙමි. මගේ කලබලකාරී තත්ත්වයට පිළියමක් යොදන්නට ඇත.

මෙම පීඩනය අත්විඳි මට අමුතු ම සිතුවිල්ලක් ඇති විය. එය සැරියුත් මහ රහතන් වහන්සේ සම්බන්ධයෙනි. උන්වහන්සේ බලවත් සේ රෝගාතුර ව පීඩා වින්ද බව මා අසා තිබිණි. එවැනි උතුමන්ටත් රෝග පීඩා ඇති වෙනවා නම්, මා වැනි පුද්ගලයකු පීඩාවට පත්වීම පුදුමයට කරුණක්

නොවිය යුතුය යන්නයි. ඒත් සමඟ ම මට මහත් සැනසිල්ලක් දැනිණි. ටික වේලාවකින් නින්දට වැටුණෙමි. අවදි වූයේ පසු දින පහන් වූවාට පසුවය. නිසි පරිදි පිළියම් යෙදීම නිසා මා එදින ගොඩ වූ බව පැහැදිලි විය. තවත් දින කීපයක් දැඩි සත්කාර ඒකකයේ ගත කළෙමි. දිනපතා ම උදේ සවස චූලා හේරත් දොස්තර මහතා පැමිණ මගේ තත්වය විමසා බැලීය. එතුමාගේ සහායක වෛද්‍යවරයෙක් ද පාන්දරින් ම පැමිණ මා ගැන කරුණු සොයා බැලුවේය. මේ අතරතුර ලොකු දුව ද ඕස්ට්‍රේලියාවේ සිට පැමිණ නිතර මා ගැන විපරමින් සිටියාය.

දැඩි සත්කාර ඒකකයේ දින පහක් ගත කර 7වෙනි වාට්ටුවට මාරු කරන ලදී. දෙසැම්බර් 7වෙනි දා තෙක් එහි සිට ප්‍රතිකාර ලැබීමි. එහි දී ද ඔක්සිජන් දීම නතර කළේ නැත. උදේ දවල් සවස පුරා ම ලොකු දුව වෛද්‍යවරුන්ට කතාබහ කරමින් ද වාට්ටුවට ආහාර පාන ගෙනවිත් දීමෙන් ද මට කළහැකි හැම සත්කාරයක් ම කළාය. ලෙඩෙකුට රෝහල් කාර්ය මණ්ඩලයේ සැලකිල්ල වැඩි වන්නේ ද නිතර සෙවිල්ලෙන් සිටින දැනුමැති කෙනෙක් සිටින විටයි. හෙදි සොහොයුරියන්, හෙද නිලධාරීන් හා වෙනත් සේවකයන් මා ගැන විශේෂ උනන්දුවක් දැක්වූහ. මට සාත්තු කිරීමට වෙන ම සේවකයෙකු ද රඳවා තිබිණි. (එම සේවකයන්ට අප විසින් වෙන ම මුදල් ගෙවිය යුතු විය)

ටිකට් කපා මා ගියේ පොඩි පුතාගේ ගෙදරටයි. සුපුරුදු කාමරය මට වෙන්කර තිබිණි. ලොකු දුවගේ දරුවන් හා වසන්ත ලංකාවට පැමිණි පසු, ඒ අය තලපත්පිටිය නිවසේ නවාතැන් ගත්හ. මගේ වාහනය පාවිච්චි කරන ලදී. මින් පසුව මා තලපත්පිටිය නිවසේ වාසයට ගියේ නැත. තවමත් මගේ නිවස පොඩි පුතාගේ නිවසයි. තලපත්පිටියේ සවිකර තිබූ ඩයලොග් සැටලයිට් ඇන්ටෙනාව පොඩිපුතාගේ ගෙදරට ගෙනැවිත් සවිකර දුන්හ. තලපත්පිටිය නිවසට තිබුණ ඉන්ටර්නෙට් සම්බන්ධතාව මෙතනට මාරු කරන ලදී. ඒ නිසා, මගේ කාමරය ස්වයං-පෝෂිත තැනකි. වෙන ම ජංගම දුරකථනයක් ද මට තිබේ. ගුවන් විදුලියේ හා රූපවාහිනියේ බණ දහම් ඇසීමට පුළුවන. දිනපතා ලොකු දුව සමඟ කතාබහ කර මගේ සෞඛ්‍ය තත්වය වාර්තා කළ හැකි විය. ජංගම දුරකථනයෙන් අවශ්‍ය කෙනෙකුට කතාබහ කිරීමට ද පුළුවන.

කුරුණෑගල ගමන

එංගලන්තයේ දැනට ජීවත්වන මගේ පැරණි මිත්‍රයෙකු වන *ආනන්ද ජයතිස්ස මහතා* (එල්.ඒ.ඩී.ඒ. ජයතිස්ස) වරක් ගාමිණී රත්නායක මහතාගේ දුකරථන අංකය දුන්නේය. ආර්.එන්.ජී. රත්නායක නම් තරුණ නිලධාරියෙක් ගැන මේ කථාවේ පස්වෙනි පරිච්ඡේදයේ සඳහන් කර තිබේ. ජයතිස්ස

මහතා විසින් මගේ දුරකථන අංකය ගාමිණී රත්නායක මහතාට දී ඇත. ඒ නිසා ගාමිණී හා මා අතර යලි සම්බන්ධතාවක් ඇති විය. 2010 දෙසැම්බර් 25වෙනි දා නත්තල් දිනයේ අපි පස් දෙනෙක් ගාමිණිගේ නිවසට ගියෙමු. ලොකු දුව, පොඩි දුව, දිනිත්, සවිනි හා මා ඒ පස් දෙනාය.

පැය තුනක ගමනකින් පසුව පෙරවරු 11.00 ට පමණ කුරුණෑගල වටරවුම් පාරේ පිහිටි ගාමිණිගේ නිවසට ගියෙමු. මගේ ලොකු දුව වයස අවුරුදු දෙකක් තුනක් ව සිටි අවදියේ දැක ඇති නමුත්, ඉන්පසුව ගාමිණී මුණගැසුනේ මේ ගමනේ දී ය. ගාමිණී විවාහ වී සිටින්නේ කතෝලික කාන්තාවක් සමඟ නිසා, නත්තල් දිනයේ අපට සාරවත් තේ පැන් සංග්‍රහයක් ලැබිණි. දිවා ආහාරයට ආරාධනා කළ නමුත් අපේ අක්කාගේ ලොකු දුව යසවතී කුරුණෑගල මල්ලවපිටිය ප්‍රදේශයේ පදිංචි ව සිටින නිසා ඒ නිවසට යා යුතු බව පවසා එහි ගියෙමු. මා ධීවර සංස්ථාවේ සේවය කරන කාලයේ දැන හැඳින ගෙන සිටි *කුලසිරි* (ටී.එම්.ඩී.කේ) *තෙන්නකෝන් මහතා* ද ගාමිණිගේ නිවසේ දී අපට හමුවිය. ඔහු විවාහ වී සිටින්නේ ගාමිණිගේ බිරිඳගේ සොහොයුරියක් සමඟය.

දිවා ආහාරය සඳහා යසවතී දුවලාගේ නිවසට ගියෙමු. මගේ ලේලිය හීන් මාමාටත් දරු මුණුබුරන්ටත් මඟුල් මේසයක් බඳු කෑම වේලක් සූදානම් කර තිබිණි. මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක මුණුබුරෙක් ද අබේසිංහ පුතා ද ගොදර සිටියහ. අබේසිංහ පුතා ගාමිණී සමඟ පළාත් සභා කාර්යාලයේ එකට සේවය කර ඇත. ඒ නිසා ගාමිණිගේ ගුණ යහපත්කම ගැන සඳහන් කළේය. දිවා ආහාරයෙන් පසුව ආපසු ගමනට පිටත් වී ගම්පහ දී ලොකු දුව සමඟ වෛද්‍ය පීඨයේ එකට ඉගෙන ගත් *සුමේධා* නම් වෛද්‍යවරියගේ නිවසට ද ගොඩ වී රාත්‍රී අටට පමණ තලපත්පිටිය නිවසට පැමිණියෙන් පැරණි මිතුරන් හා නෑදෑයින් හමුවීමේ සතුට කලක් පැවතිණි.

නැවත රෝගාතුරවීම

2010 නොවැම්බර් මාසයේ දී බලවත් ලෙස රෝගාතුර වූ බව ඉහතින් සඳහන් කළෙමි. ඉන්පසුව වැඩි වැඩියෙන් ශාරීරික දුර්වලතාවන් දැනෙන්නට විය. 2011 ජනවාරි මාසයේ දී නාසයෙන් රුධිර වහනයක් නිසා 23වැනි දින සිට 25වැනි දින දක්වා ජයවර්ධනපුර රෝහලේ අංක 11 දරණ වාට්ටුවේ නැවතී ප්‍රතිකාර ලබා ගතිමි. ප්‍රධාන වෛද්‍යවරයා *අශෝක ජයසේන මහතාය.* එහෙත් මට ප්‍රතිකාර කළේ වාට්ටුවේ ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයෙකි. පසු අවස්ථාවක ප්‍රතිකාර සඳහා ඒ දොස්තර මහතාගේ නිවසට ගිය විට මට දුන් උපදේශය වූයේ, නාසය ශුද්ධ පවිත්‍ර කිරීමෙන් වැළකී සිටින ලෙසයි. නාස් පුඩුව ඇතුළට ඇඟිලි දමා ශුද්ධ කරන විට එහි තුළ ඇති සියුම් ස්නායු තුවාල වී ලේ ගැලීමට ඉඩ තිබෙන නිසාය. මෙය සාර්ථක පිළියමක් විය.

එවර වාට්ටුවේ නේවාසික ව සිටි අවස්ථාවේ පැරණි ගායකයෙකු වූ *හරූන් ලන්ත්‍රා* මහතා රෝහල්ගත වී සිටියේය. එකල මා ප්‍රිය කළ ගායකයකු නිසා ඔහුගේ ආබාධය ගැන විමසූ විට ඔහු කීවේ, උගුරේ ආබාධයක් නිසා කටහඬ දුර්වල වී ඇති බවය. ගායකයෙකුට එවැනි ආබාධයක් වූ විට ඔහුගේ මුළු පැවැත්මට ම තදබල හානියක් වේ. *සනත් ගුණතිලක* කලාකරුවා ද රෝහලට පැමිණ ලන්ත්‍රා මහතාට උදව් උපකාර කිරීමට ඉදිරිපත් වූ බව පෙනිණි. මා රෝහලෙන් පිටවී ගිය නිසා ඉන් පසු කුමක් වී දැ'යි නොදනිමි.

ජනවාරි මස 27 සිට 29 දින දක්වා *චූලා හේරත් දොස්තර මහතාගේ* වාට්ටුවේ නේවාසික ව ප්‍රතිකාර ලබා ගතිමි. ඉන්පසු නිතිපතා එතුමාගේ සායනයට ගිය විටක දිනක් මා හෘද රෝග අංශයට යොමු කළේය. *හෘද රෝග විශේෂඥ ජගත් හේරත් මහතා* සමඟ සහායක වෛද්‍යවරයෙක් තීරණය කළේ පැය විසි හතරක කාලයක් රෝහල්ගත ව නාඩි වැටීම වාර්තාගත වන හෝල්ටර් මොනිටර (Holter Monitor) නම් කුඩා යන්ත්‍රයකින් වාර්තා කර ගෙන පරීක්ෂා කළ යුතු බවයි. 2011 ජූලි මස 21වෙනි දින රෝහල්ගත වී කුඩා ජංගම දුරකථනයක් පමණ වූ පරිගණකයක් පපු පෙදෙසට සවි කර ගෙන පසුදින පැය විසිහතරක් පමණ ගත කළෙමි. එහි වාර්තාගත වූ තොරතුරු මුද්‍රණය කළ පසු, *"ඉලෙක්ට්‍රෝ ෆිසියෝලොජිස්ට්"* විශේෂඥයෙක් විසින් මා පරීක්ෂා කළයුතු බවට නිගමනය කරන ලදී.

හදවත් රෝගයට ප්‍රතිකාර ලබා ගැනීමට මා නිතර හමුවූයේ හෘද රෝග *විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.එස්. ශාන්තරාජ් මහතාය.* 2011 අගෝස්තු 8 වෙනි දින ඒ මහතාට මෙම වාර්තා පෙන්වූ විට මට උපදෙස් දුන්නේ, විශේෂඥ වෛද්‍ය *අසංග දුනුවිල මහතා* හමුවන ලෙසයි. දුනුවිල මහතාට දීමට ලිපියක් ද ශාන්තරාජ් මහතා විසින් මට දෙන ලදී. අගෝස්තු මස 11වැනි දින දුනුවිල මහතා හමු වූ විට " පේස් මේකර්'' (PACE MAKER) නමින් හඳුන්වන හෘද ස්පන්දය විධිමත් කරන කුඩා යන්ත්‍රයක් සවිකළ යුතු බවත්, ඒ සඳහා ආසිරි රෝහලට ඇතුළු වන ලෙසත් දැන්වීය. මේ සඳහා අගෝස්තු මස 18වැනි දින ආසිරි රෝහලට ඇතුළු වූයෙමි. පසුදින පෙරවරුවේ ශල්‍යාගාරයක් තුළ දී පපුවේ චම්පසින් මස් පිඬුව තුළට පේස් මේකර් උපකරණය සවිකරන ලදී. දින දෙක තුනක් දැඩි සත්කාර ඒකකයේ නැවතී සිට සාමාන්‍ය කාමරයකට ගොස් දවසකට පසුව රෝහලෙන් පිටවූයෙමි.

මෙම සැත්කමට පෙර හෘද ස්පන්දන වේගය විනාඩියකට 66ක් පමණ තිබිණි. එනමුත්, ඉන් පසුව එය 80-90 ත් අතර ප්‍රමාණයකට වැඩිවිය. සායනයකට ගිය විට මේ ගැන සඳහන් කළ කල්හි, දුනුවිල දොස්තර මහතා කීවේ, අපහසුවක් නොදැනේ නම් එම පීඩන වේගය වැඩි නැති බවයි. කෙසේ වුව ද, 2012 ජනවාරි මාසය වන විට හුස්ම ගැනීමේ යම් අපහසුකම් දැනෙන්නට විය.

2011 වසර අවසානයේ ලංකාවට පැමිණි ලොකු දුවලා සමඟ වරක් හික්කඩුව හෝටලයකට ගොස් දින කීපයක් ගත කළෙමි. පොඩි දුව හා ප්‍රියන්තත් මේ ගමනට එක්වූහ. ඉන්පසුව ලොකු පුතා හා පොඩිපුතාත්, පොඩි දුවත්, ලේලිවරුන් හා බෑණා ද සමගින් බෙන්තොට හෝටලයකට ගොස් දින දෙක තුනක් ගත කළෙමි. මේ ගමන් දෙකේ දී ම මගේ ආහාර පානවල විශාල වෙනසක් විය. 2012 ජනවාරි මාසයේ 8වෙනිදා රෝහල් ගතවීමට සිදුවිය. පළමුවෙන් *චූලා හේරත්* මහතාගේ වාට්ටුවට ඇතුළු කළ පසු හෘද රෝග වාට්ටුවට මාරු කළේය. හුස්ම ගැනීමේ දුෂ්කරතාව තදින් ම දැනිණි. රෝග විනිශ්චය පතේ සඳහන් අන්දමට හදවතේ වම් පස දුර්වලතාවක් තිබේ. හෘද ස්පන්දන වේගය 84ක් යයි සඳහන් වේ. ජනවාරි 13 දින රෝහලෙන් පිට වී පැමිණියෙමි.

එසේ වුවත්, වෛද්‍ය ශාන්තරාජ් මහතා මුණගැසී උපදෙස් ලබා ගතිමි. ඇඳේ ඇලවී නිඳා සිටින විට ක්ෂණික ව නැඟිටීමට සිදුවිය. හුස්ම ගැනීම අපහසු වන නිසාය. මේ පීඩනය උග්‍ර වූයෙන්, ජනවාරි මස 24 දින කොළඹ ඩර්ඩන්ස් (DURDANS) රෝහලට ඇතුළු වී ශාන්තරාජ් දොස්තර මහතාගෙන් ප්‍රතිකාර ලබා ගතිමි. දැඩි සත්කාර ඒකකයේ ගත කිරීමට සිදුවිය. දුනුවිල දොස්තර මහතා පැමිණ පරිගණකයක් උපයෝගී කර ගෙන පේස් මේකර් යන්ත්‍රයේ යම් වෙනස්කම් කළේය. ජනවාරි 27 දින ගෙදර ගිය නමුත්, පෙබරවාරි 5 වෙනි දා නැවත රෝහල්ගත වීමට සිදුවිය. Admitted with Clinical Heart Failure (LVE – 30%) යනුවෙන් රෝග විනිශ්චය පත්‍රිකාවේ සඳහන් කර තිබේ. පේස් මේකර් යන්ත්‍රය නැවත සකස් කරන ලදී. ඉන්පසුව හෘද ස්පන්දන වේගය 60 දක්වා අඩු කරන ලදී. රාත්‍රී කාලයේ දී (රෑ 9.00 සිට උදේ 5.30 දක්වා) අඩු වන ලෙස වෙනස් කර ඇත. 2012 පෙබරවාරි 9වෙනි දින ටිකට් කපා ගෙදර ගියෙමි. මින් පසුව ක්‍රමයෙන් තිබූ දුෂ්කරතා ඉවත් වී ගියේය. මේ වන විට තිබුණ අමාරුකම් සියල්ල ඉවත් වී ගොස් ඇති බව දැනේ. එනමුත්, මේ තුලනය පවත්වා ගෙන යෑමට බෙහෙත් වර්ග හත අටක් ශරීරගත කළ යුතු ව ඇත. මේ සඳහා මාසයකට රුපියල් පන්දහසකට වඩා වැය වේ. බොහෝ විට දරුවෝ ඒ වැය දරති.

අනාගතය

අතීතය එසේ වුවත්, අනාගතය ගැන මහත් බලාපොරොත්තු ඇති ව ජීවත් වෙමි. එයට ප්‍රධානතම හේතුව තවත් මුණුබුරෙකු බිහිවීමයි. මෙලානි ලේලිය මාස කීපයකට පෙර ගැබ්ගත් බව පොඩි පුතා මට කීවේය. විවාහ වී වසර අටකට ආසන්න ව දරු සම්පතක් නොමැති ව සිටි ඒ දෙදෙනාටත් උරුමක්කාරයෙකු ලැබෙන්නට යන බව දැනගත් විට බෙහෙවින් ම සතුටු වූයෙමි. ඒකනායක රාජපක්ෂ මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා නම් වූ

ගොවියාගේ පුත් ආරියපාලට ඒ පරම්පාරාව ඉදිරියට ගෙන යෑමට කෙනෙක් සිටින බව දැන ගත් විට සතුටු නොවන්නේ කුමන සීයා ද? මට මුණුබුරෙක් හා මිණිබිරියක් සිටින නමුත් ඒ දෙදෙනා ලොකු දුවගේ දරුවෝය. ඒ නිසා **2012 ජූනි 3වෙනි දින සිදු** වූ මේ දරු උපත අතිශයින් වැදගත් වේ. මාගේ ආදරණීය බිරිඳ, ප්‍රේමා, දියණියන් දෙදෙනෙක් හා පුතුන් දෙදෙනෙක් වශයෙන් දරු හතර දෙනෙක් මට දායාද කොට දී ඇත. ඒ හතර දෙනා නිසා බෑණාවරු දෙදෙනෙක් හා ලේලිවරු දෙදෙනෙක් වශයෙන් තවත් දරු හතර දෙනෙක් ලැබිණි. ඒ නිසා මා දැන් දරු අට දෙනෙකුගේ පියෙකි. ඒ හැම දෙනා ම සමෘධිමත් දිවිපැවැත්මත් ගත කිරීමට ශක්තියක් ලබා ඇත. 2011 ජනවාරි මාසයේ දී මගේ දරු මුණුබුරන් එකතු වී දෙන ලද පත්‍රිකාවක් මා ලග ඇත. ඒ අයටත් මා යමක් කර ඇතැ'යි එයින් දැන ගතිමි.



Thatha

You never look for praises
You are never one to boast
You just go on quietly working
For those you love the most
Your dreams are seldom spoken
Your wants are very few
And most of the time your worries
Will go unspoken too
You're there.... A firm foundation
Through all our storms of life
A sturdy hand to hold to
In times of stress and strife
A true friend we can turn to
When times are good or bad
One of our greatest blessings,
The man that we call Thatha

Thank you for all you have done for us

එය මට ප්‍රමාණවත්ය



අලුත් මුණුබුරා මියුර කවින්



පරම්පරා තුනක්



අලුත් නැයෙක්



අම්මා, තාත්තා සමග **With proud parents**

දැනට මට වෙනත් බලාපොරොත්තු කිසිවක් නැත. විටින් විට මතුවන අපේක්ෂාවන් යටපත් කර ගැනීමට ප්‍රයත්න දැරීමට මගේ කාලය ගත කරමි. පාන නිවී යන විට යම් පමණක හෝ සුවඳවත් දුමක් වායු තලයට මුසු කිරීමට ඇත්නම් හොඳය. සතර මහා භූතයන්ගෙන් සෑදුණු මේ මිනිසා විසිරී ගොස් එම භූතයන්ට එකතු වනවා ඇත. මේ මගේ අවසාන වාක්‍යය නොවේ. මගේ සිතට බෙහෙවින් ම සමීප කාරණයක් ගැන යමක් ලියා තැබීමට ඉතිරි ව ඇත. ඒ මා අධ්‍යාපනය ලැබූ *වලල මධ්‍ය විද්‍යාලය* සහ *සමස්ත මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය* ගැනයි. දැන් එයට ප්‍රවේශ වෙමු.

වලල ඒ. රත්නායක මධ්‍ය විද්‍යාලය

මධ්‍ය විද්‍යාල පද්ධතිය තුළින් හැදුණු වැඩුණු මගේ මේ කථාවට මගේ පාසල් මෑණියන් සමඟ සම්බන්ධතාව කෙටියෙන් හෝ සඳහන් කළ යුතුවේ. 1950 සැප්තැම්බර් මස 12වන දින පාසල හැර යෑමෙන් පසුව, විටින් විට පාසලට ගොස් පැරණි ගුරුවරුන් මුණ ගැසිණි. ඒ ගුරුවරු මාරු වී ගිය පසු මගේ ගමන අඩුවිය. තරුණ වියේ දී පාසල් ශාලාවක නාට්‍යයක් පුහුණුවීමට ගියෙමි.

මංතිලක මැතිතුමා විදුහල්පති ව සිටි අවදියේ 1966-1967 අතරතුර ආදි ශිෂ්‍ය සංගමය පිහිටුවීමට රාජපක්ෂ, ගුණසේන, හේරත් යනාදි මිතුරන් සමඟ පාසලට ගොස් සාකච්ඡා කිරීමෙන් පසුව, පුවත්පත් දැන්වීමක් ද පළ කළ නමුත් මා කොළඹට මාරුවීමෙන් පසුව ඒ කටයුතුවලට සහභාගී වීමට නොහැකි විය. 1990 ගණන්වල මුල දී මිගෙල්රත්න විදුහල්පතිතුමාගේ සමයේදී ආදි ශිෂ්‍ය සංගමයේ රැස්වීම්වලට නිතර සහභාගී වූයෙමි. මේ වන විට මට වාහනයක් ද තිබුණ නිසා ගමන් බිමන් පහසු විය.

මිගෙල්රත්න මහතාගේ ආරාධනයෙන් 1992 මාර්තු 30 දින පෙරවරු පාසල් රැස්වීමේ දී පැයක පමණ දේශනයක් පැවැත්වීමට ගියෙමි. මගේ එම කථාවට අන්තර්ගත වූයේ ශිෂ්‍යත්ව විභාගය සමත්වීමෙන් පසු මා වලල මධ්‍යම පාසලට පැමිණි ආකාරය හා එහි ගත කළ ආකාරයත්, නිදහස් අධ්‍යාපනයට ඒ. රත්නායක මහතාත්, කන්නන්ගර මහතාත් ඉටු කළ කාර්යභාරය ගැනත් සංක්ෂිප්ත කරුණු ස්වල්පයකි. මේ අවදියේ පාසලේ නියෝජ්‍ය විදුහල්පති තනතුර දැරුවේ *හේමන්ත ප්‍රේමතිලක මහතා* සහ *රංමැණිකේ විජේසිංහ මහත්මිය* යන දෙදෙනාය.

පාසලේ වෙනත් වැදගත් අවස්ථාවලට සහභාගී වූයෙමි. 1994 වසරේ හේමන්ත ප්‍රේමතිලක මහතා විදුහල්පති ව සිටි සමයේ දී පාසල් ස්වර්ණ ජයන්ති උත්සවයට සහභාගී වූයෙමි. එහි ප්‍රධාන ආරාධිතයා වූයේ ජනාධිපති ඩී.බී. විජේතුංග මැතිතුමාය. 1995 පෙබරවාරි මස 23වන දින පැවැත්වූ ක්‍රීඩා උත්සවයේ ප්‍රධාන අමුත්තෙකු වශයෙන් සහභාගී වූයෙමි. පසු කාලයේ දී අප

විදුහලේ ආදි ශිෂ්‍යයෙක් වූ *මහින්ද කල්පගේ* මහතා සමඟ කීප වතාවක්ම කොළඹ සිට ගොස් නොයෙක් උත්සවවලට සහභාගී වූයෙමි. අන්තිමට එසේ සහභාගී වූ උත්සව දෙකක් විය. *පාර්ලිමේන්තු මන්ත්‍රී අර්ල් ගුණසේකර මහතා* බස් රථයක් පාසලට පරිත්‍යාග කිරීමේ උත්සවය පළමුවැන්නයි. වර්තමාන *අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ* ප්‍රධානත්වයෙන් පැවැති වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය දෙවැන්නයි. *වලල ඒ. රත්නායක මධ්‍ය විද්‍යාලයේ* වර්තමාන සිසුන් ජාතික ක්‍රීඩා උත්සව ආදියේ දී දක්වන දස්කම් දැක නැවත නැවතත් ගැටවර වියට යන්නෙමි. ඒ කොපමණ සුන්දර යුගයක් ද ?





විදුහල්පති හේමන්ත ප්‍රේමතිලක මහතා සහ නියෝජ්‍ය විදුහල්පතිනි රංමැණිකා විජේසිංහ මහත්මිය විසින් පිළිගැනීම. 1995 පෙබරවාරි 23







සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය



පෙති රැසක් ගොණුවී

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටිය දී, 1943-47 කාල පරිච්ඡේදය තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවල මධ්‍යම පාසල් පනස් හතරක් පිහිටුවන ලදී. (VII වැනි උප ලේඛනය බලන්න) මේ මඟින් අපේක්ෂා කළේ දුප්පත් දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දීමයි. යටත් විජිත සමයේ උසස් අධ්‍යාපනය ලැබීමටත් රජයේ රැකියාවක් ලබා ගැනීමටත් ඉංග්‍රීසි අධ්‍යාපනය අනිවාර්ය විය. මේ සඳහා පහසුකම් පැවතියේ නාගරික මධ්‍යස්ථානවල ආගමික සංවිධාන විසින් පිහිටුවා තිබුණ විද්‍යාල කීපයක පමණි. එම විද්‍යාලවලින් අධ්‍යාපනය ලැබීමට ගාස්තු ගෙවිය යුතු විය. නාගරික ප්‍රදේශවල දරුවන් මෙන් ම පිටිසර ප්‍රදේශවල වත්පොහොසත්කම් ඇති පවුල්වල දරුවන් ද (එම පාසල්වල නේවාසිකාගාරවල හෝ වෙනත් නවාතැන්වල නැවතී) මුදල් වියදම් කර ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයක් ලැබූහ. මේ නිසා, ඉංග්‍රීසි අධ්‍යානය ඇති හැකි අයගේ වරප්‍රසාදයක් විය. මෙය දක්ෂකම් ඇති සෑම දරුවන්ගේ ම අයිතිවාසිකම් බවට පත් කිරීමට නම් ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය නොමිලේ සැපයීමත්, ඒ සඳහා උචිත පාසල් පද්ධතියක් පිහිටුවීමත් අනිවාර්ය විය.

ආණ්ඩුව මඟින් නිදහස් අධ්‍යාපනය සැලසීමට *ආචාර්ය කන්නන්ගර ඇමතිතුමා* රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ආඥා පනතක් සම්මත කරවා ගෙන මැතිවරණ කොට්ඨාශයට එක බැගින් වන සේ මධ්‍යම පාසල් පනස් හතරක් පිහිටුවන ලදී. එවකට පැවතියේ මැතිවරණ කොට්ඨාශ පනහක් වුවද, සමහර කොට්ඨාශ සඳහා පාසල් එකකට වැඩිය පිහිටුවීම නිසා, ආරම්භක මධ්‍ය විද්‍යාල පනස් හතරක් (54) විය. 1943 වසරේ පාසල් 9ක් ද, 1944 වසරේ පාසල් 14ක් ද , 1945 වසරේ 13ක් ද, 1946 වසරේ 14ක් ද, 1947 වසරේ පාසල් 04ක් ද වශයෙනි. දුප්පත් දරුවන්ට නේවාසිකාගාර පහසුකම් ඇති ව අධ්‍යාපනය ලබා දීමට ශිෂ්‍යත්ව ක්‍රමයක් ද ආරම්භ කළේය. ඒ අනුව, පස්වැනි පන්තියේ ඉගෙන ගත් සිසුන් සඳහා දීප ව්‍යාප්ත විභාගයක් පවත්වා ඉහළ ලකුණු ලබා ගන්නා දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. මේ නිසා දුර බැහැර ප්‍රදේශවල සිසුන් නේවාසිකාගාර පහසුකම් සහිත ව ද්විතීය අධ්‍යාපනය ලැබූහ.

හයවෙනි පන්තියේ සිට ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව විය. එසේ වුවත්, 1946 වසරේ සිට මව් බසින් ඉගැන්වීම ආරම්භ කර, අනුක්‍රමයෙන් වසරින් වසර ඉහළ පන්තිවලට ද මව් බසින් ඉගැන්වීම් ව්‍යාප්ත කරන ලදී. මේ නිසා, 1956 පමණ වන විට, ද්විතීය පාසල්වල ඉගැන්වීමේ මාධ්‍යය මව්බස විය. ඉංග්‍රීසි එක් විෂයයක් පමණක් විය. එය අනිවාර්ය දෙවැනි භාෂාවක් විය.

මේ ආකාරයට පිහිටුවන ලද මධ්‍යම පාසල් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයටත්, විශ්ව විද්‍යාල ප්‍රවේශයටත් සිසුන් ඉදිරිපත් කළ පසු, 'විද්‍යාල' නමින් හැඳින්වීමට සුදුසුකම් ලැබීය. මෙම පාසල්වල ඉගෙන ගත් සිසුන් කීප දෙනෙක්, 1961 වසරේ දී **සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදී ශිෂ්‍ය සංගමය** නමින් සංවිධානයක් පිහිටුවා ගත්හ. මෙහි පුරෝගාමී වූයේ තලාතුඔය සහ නුගවෙල මධ්‍ය විද්‍යාලවල ආදි ශිෂ්‍ය *බර්ටි ගලහිටියාව* මහතාය. එවකට ලංකා සිවිල් සේවයේ *සෝමපාල ගුණධීර මහතා* සභාපති තනතුරට පත්කර ගත්හ. බර්ටි ගලහිටියාව මහතා ලේකම් විය. කෙළෙහි ගුණ දන්නා මේ ටික දෙනෙක් එකතු වී **ආචාර්ය කන්නන්ගර මැතිතුමා** අසරණ ව සිටි, එතුමාගේ ජීවිතයේ අවසාන අවධියේ එතුමා මුණ ගැසී උදව් උපකාර කළ බව ගලහිටියාව මහතා සඳහන් කරයි.

මෙම සංගමය 1971 පමණ වනතුරු පැවැති නමුත්, ඒ වර්ෂයේ ඇති වූ අප්‍රේල් කැරැල්ල හේතුවෙන් ගලහිටියාව මහතා ඇතුළු සංගමයේ කීප දෙනෙක් රහස් පොලීසියේ සැකයට පාත්‍රවීම හේතු කොට ගෙන අක්‍රීය විය. 1991 මැද භාගයේ දී පමණ *සුප්‍රසිද්ධ බනික් ශිල්පී හා ව්‍යාපාරික විපුල ධර්මවර්ධන මහතා* මෙම සංගමයට පුනර්ජීවයක් ලබා දීමට මහත් වෙහෙසක් දැරීය. විපුල ධර්මවර්ධන මහතා නුගවෙල මධ්‍ය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. එම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාවක් පිහිටුවා ගැනීමට ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ ශාලාවේ පැවැත් වූ රැස්වීම සඳහා වෙනත් මධ්‍ය විද්‍යාල ආදි සිසුන් අතළොස්සකට ද ආරාධනා කර තිබිණි. එයට සහභාගී වූවන්ට විපුල ධර්මවර්ධන මහතා සිංහල ක්‍රීඩා සංගම් (SSC) ශාලාවේ දී දිවා භෝජන සංග්‍රහයක් පවත්වා **සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය** නැවත පණගැන්වීමට පළමුවන පියවර තැබීය. පසුව මෙම පිරිස එතුමාගේ නිවසට කැඳවා රැස්වීම් කීපයකට පසුව ආරම්භක මහා සභා රැස්වීම 1992 වසර මුල දී *සවිසිරිපාය රැස්වීම් ශාලාවේ* දී පවත්වන ලදී.

මෙම රැස්වීමට දිවයිනේ නොයෙක් ප්‍රදේශවලින් මධ්‍ය විද්‍යාල ආදි සිසුන් රාශියක් සහභාගී වූහ. ඒ අතර රංබණ්ඩා සෙනෙවිරත්න, තිලක් ඉද්දමල්ගොඩ, අලවත්තාගොඩ ප්‍රේමදාස, සවිමන් උරුගොඩවත්ත, බර්ටි ගලහිටියාව, පී.බී.වන්නිනායක, එම්.සී.මාතුපාල වැන්නවුන් වූහ. පණ්ඩිත් අමරදේව, පණිභාරත, ගුණදාස ලියනගේ වැනි විශේෂ ආරාධිතයින් කීප දෙනෙක් ද රැස්වීමට පැමිණියහ. *සවිමන් උරුගොඩවත්ත මහතා* විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත සභා සම්මත කර ගෙන නිලධාරී මණ්ඩලයක් ද තෝරාපත් කර ගන්නා ලදී. ප්‍රධාන තනතුරු සඳහා පත්කර ගත් අය මෙසේය :

සභාපති	-	මහාචාර්ය ආරියපාල ඒකනායක මහතා (වලල මධ්‍ය විද්‍යාලය)
ලේකම්	-	ලංකා පරිපාලන සේවයේ පී.බී. වන්නිනායක මහතා (අනුරාධපුර ම.විද්‍යාලය)
භාණ්ඩාගාරික	-	එන්.අයි.බී.එම්ආයතනයේඅධ්‍යක්ෂ ජෙනරාල්එම්.සී. මාතුපාල මහතා (ගලහිටියාව මධ්‍ය විද්‍යාලය)
ජාතික සංවිධායක	-	කලාශූරී විපුල ධර්මවර්ධන මහතා (නුගවෙල මධ්‍ය විද්‍යාලය)
සංස්කාරක	-	ලේඛක සවිමන් උරුගොඩවත්ත මහතා (පැල්මඩුල්ල මධ්‍ය විද්‍යාලය)

ඉන්පසුව තෝරාපත් කර ගන්නා ලද ප්‍රධාන තනතුර දැරුවන්ගේ ලැයිස්තුවක් VIII උපලේඛනයේ දක්නට ලැබේ. සවිසිරිපායේ පැවැත් වූ මහා රැස්වීමට හා භෝජන සංග්‍රහයට මෙන් ම එතුමාගේ නිවසේ පැවැත් වූ රැස්වීම් සියල්ලට ම වියදම දැරුවේ *විපුල ධර්මවර්ධන මහතා* විසිනි.

මුල් වසරවල දී නොයෙක් ආකාරයේ සීමාවන් නිසා පුළුල් වැඩ සටහනකට පිවිසීමට නොහැකි විය. එනමුත්, ක්‍රම ක්‍රමයෙන් නව සාමාජිකයන් ඒකරාශී වීමෙන් හා අරමුදල් වර්ධනය කර ගැනීමෙන් පසුව, ක්‍රියාකාරකම් ව්‍යාප්ත වීමට පටන් ගැනිණි. ආරම්භයේ සිට ම ආචාර්ය කන්නන්ගර මැතිතුමා අනුස්මරණය කිරීම සඳහා වාර්ෂික දේශන පවත්වන ලදී. ක්‍රමයෙන් ගද්‍ය පද්‍ය රචනා තරග, ක්‍රිකට් හා වෝලිබෝල් තරග පවත්වනු ලැබීය. මේ ක්‍රියාකාරකම් සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන නමුත් උද්යෝගීමත් සාමාජිකයන් කීප දෙනෙකුගේ අනුග්‍රහය නිසා මෙම වියදම් පියවා ගෙන වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට හැකියාව ලැබී තිබේ. 2012 වසරේ දී දොළොස්වන වරටත් ක්‍රිකට් තරග පැවැත්වීමට නියමිතය.

මේ වන විට පාර්ලිමේන්තු පනතක් සම්මත වීමෙන් සංගමය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිළිගෙන තිබේ. සංගමයට මූලස්ථානයක් ඉදිකර ගැනීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. ආචාර්ය කන්නන්ගර මැතිතුමාගේ පිළිරුවක් පාර්ලිමේන්තු පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට යම් යම් පියවර ගෙන ඇත. සංගමය විසින් ඒ සඳහා විශාල මුදලක් පරිත්‍යාග කර තිබේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සංගමයේ අනුකාරක සභාවක් විසින් පියවර කීපයක් ගෙන ඇත. සංගමයේ ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවේ යයි සමහර සාමාජිකයන්ගෙන් මැසිවිලි නැගෙන නමුත්, කිසිම ප්‍රතිලාභයක් නොමැති ව තමන් උගත් පාසල් පද්ධතියට සේවයක් කිරීමට කැප වූ සංවිධානයක්

අභාවයට යා නොදී පවත්වා ගෙන යෑමත් ඉතා හෙමින් වුවත් දැනට ලබා ඇති ප්‍රගතිය ගැන පැරණි සාමාජිකයෙකු වශයෙන් සතුටු වෙමි. සංගමයේ ක්‍රියාකාරකම් රාශියකට සම්බන්ධ වීමට ලැබීම නිසා මගේ හුදකලා ජීවිතයේ ඒකාකාරී බව බිඳීමට ඉඩ ප්‍රස්ථාව ලැබිණි. අවුරුදු කීපයක දී නුගවෙල, තෝලන්ගමුව, ඉබ්බාගමුව, ගලහිටියාව, රුවන්වැල්ල යනාදී මධ්‍ය විද්‍යාල හා අවට පාසල්වල කන්නන්ගර අනුස්මරණ දේශන පැවැත්වීමට ලැබීම මට මහත් ආශ්වාදයක් ගෙන දෙන්නක් විය. සංගමය විසින් සංවිධාන කළ වාර්ෂික චාරිකා කීපයකට සහභාගී වී ඇත. රංටැඹේ චාරිකාව මගේ බිරිඳ ජීවත් වී සිටිය දී එසේ සම්බන්ධ වූ අවසාන සචාරිය විය. සංගමයේ රැස්වීම් ආදියට හැකිතාක් කල් සහභාගී වීමට බලාපොරොත්තු වෙමි. උද්යෝගීමත් සාමාජිකයන්ගේ නොඉවසිලිමත් භාවය ගැන සතුටු වෙමි. සංගමයේ ප්‍රගතියට එය ද උපකාර විය හැකිය. මධ්‍ය විද්‍යාල පද්ධතිය නිසා ජීවිතයේ දුර ගමනක් ගිය මහලු මිනිසෙකුගේ ප්‍රාර්ථනය ''මෙම සංගමය චිරාත් කාලයක් යෙහෙන් වැජඹේවා!'' යන්නය.

(VII) උප ලේඛනය

ආරම්භක මධ්‍ය විද්‍යාල (අකාරාදි පිළිවෙලට)

	ආරම්භක වර්ෂය		ආරම්භක වර්ෂය
01. අකුරම්බොඩ	1943	28. පොරමඩුල්ල	1945
02. අනුරාධපුරය	1947	29. බිබිල	1946
03. අලුත්ගම මුස්ලිම් බාලිකා	1947	30. මතුගම	1943
04. ඉබ්බාගමුව	1943	31. මරදාන	1945
05. ඉරුතිලංපිඩි	1944	32. මහව	1945
06. කරන්දෙණිය	1944	33. මාදම්පේ	1946
07. කරවිට	1947	34. මාවතගම	1943
08. කළුතර තිස්ස	1945	35. මිනුවන්ගොඩ	1943
09. කැකිරාව	1945	36. යාපනය-ස්ටැන්ලි	1944
10. කුලියාපිටිය	1947	37. රත්නපුර සීවලී	1944
11. කාත්තන්කුඩි	1943	38. රුවන්වැල්ල	1945
12. කොටහේන	1946	39. වඳුරඹ	1944

13. ගම්පොල	1946	40. වලල	1944
14. ගලහිටියාව	1944	41. වන්නාරමුලෙයි	1945
15. ගිනිගත්හේන	1946	42. වාසවිලාන්	1946
16. තලාතුඔය	1945	43. වාද්දූව	1945
17. තෙලිජ්ජවිල	1946	44. වැලිමඩ	1945
18. තෝලංගමුව	1945	45. වීරකැටිය	1943
19. දෙනියාය	1944	46. වේයන්ගොඩ	1943
20. දෙහිවල	1946	47. වේලනෙයි	1945
21. දික්වැල්ල	1943	48. සඳලංකාව	1945
22. නාරම්මල	1944	49. හංවැල්ල	1944
23. නුගවෙල	1944	50. හික්කඩුව	1944
24. නෙල්ලියඩි	1946	51. හුණුමුල්ල	1945
25. පස්සර	1946	52. හැදුනාව	1946
26. පැල්මඩුල්ල	1946	53. හේනේගම	1944
27. පිළියන්දල	1944	54. හොරණ තක්ෂිලා	1946

(VIII) උප ලේඛනය

සමස්ත ලංකා මධ්‍ය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් (1960-2013)

සභාපතිවරු

01.	සෝමපාල ගුණධීර මහතා	1960-1962	ගලහිටියාව
02.	මහාචාර්ය ආරියපාල ඒකනායක මහතා	1992-1993, 1994-1995	වලල
03.	විපුල ධර්මවර්ධන මහතා	1993-1994	නුගවෙල
04.	ඩී.එම්. ජයතිලක දිසානායක මහතා	1995-1997	වැලිමඩ
05.	බ්‍රිගේඩියර් ප්‍රියන්ත සමරතුංග මහතා	1997-1999	නුගවෙල

06.	එස්.එම්.එස්.බී. නියන්ගෙඩ මහතා	1999-2001	නුගවෙල
07.	ජනත් ගුණරත්න මහතා	2001-2003	කළුතර, තිස්ස
08.	ආචාර්ය ඒ.ඩබ්. මොහොට්ටාල මහතා	2003-2005	පිළියන්දල
09.	එම්.බී.වර්ෂකෝන් මහතා	2005-2007	මාවතගොඩ
10.	වෝල්ටර් මාරසිංහ මහතා	2007-2009	මාදම්පේ
11.	පණ්ඩුල ඇඳගම මහතා	2009-2010	රත්නපුර, සීවලි
12.	මහින්ද කල්පගේ මහතා	2010-2013	වලල

ලේකම්වරු

01.	බර්ටි ගලහිටියාව මහතා	1960-1971	නුගවෙල
02.	පී.බී. වන්නිනායක මහතා	1992-1993	අනුරාධපුර
03.	සවිමන් උරුගොඩවත්ත මහතා	1993-1994	පැල්මඩුල්ල
04.	විපුල ධර්මවර්ධන මහතා	1994-1995	නුගවෙල
05.	වෝල්ටර් මාරසිංහ මහතා	1995-1996,2001-02	මාදම්පේ
06.	ඩබ්.එච්.එම්. උඳුගොඩ මහතා	1996-1997	තෝලංගමුව
07.	ජනත් ගුණරත්න මහතා	1997-1999	කළුතර,තිස්ස
08.	ජී.ජී.රූපසිංහ මහතා	1999-2001	පැල්මඩුල්ල
09.	එස්. වන්නි ආරච්චි මහතා	2002-2004, 2011-12	අනුරාධපුර
10.	ජේ.එම්.කේ.බී. ජයසේකර මහතා	2004-2006, 2012-13	හැදුනාව
11.	හියුබට් ද අල්විස් මහතා	2006-2009	පිළියන්දල
12.	ශ්‍රීපාලි ගුණරත්න මහත්මිය	2009-2011	කළුතර තිස්ස
13.	ධම්මික සොයිසා මහතා	2010-2011	මාදම්පේ
14.	ජේ.එම්.කේ.බී. ජයසේකර මහතා	2011	හැදුනාව

භාණ්ඩාගාරිකවරු

01.	එම්. බෝකොලමුල්ල මහතා	1960-1962	තෝලංගමුව
02.	එම්.සී. මාතුපාල මහතා	1992-1993	ගලහිටියාව
03.	ජයතිස්ස සමරනායක මහතා	1993-1994	ගම්පොල

04.	පියදස රත්නායක මහතා	1994-1999	නුගවෙල
05.	විමලා එදිරිසිංහ මෙනෙවිය	1995-1997	ඉබ්බාගමුව
06.	පී.ජී.පී. පොරොවේගම මහතා	1977-1999	අනුරාධපුර
07.	එම්.ඊ. සිරිල් ප්‍රනාන්දු මහතා	1999-2000	කළුතර තිස්ස
08.	පණ්ඩුල ඇඳගම මහතා	2000-2001	රත්නපුර සීවලී
09.	ජේ.එම්.ඩ්‍ලූ.බී. ජයසේකර මහතා	2001-2003	හැදුනාව
10	එන්.ජී.කේ.කේ. සෙනෙවිරත්න මහතා	2003-2005	තෙලිජ්ජවිල
11.	එල්.බී. වත්තේගෙදර මහතා	2005-2009	අකුරම්බොඩ
12.	ආර්.බී.. අබේසේකර මහතා	2009-2011	තලාතුඔය
13.	සෝමසිරි ද සිල්වා මහතා	2011-2013	හොරණ තක්ෂිලා

(IX) උප ලේඛනය

සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදී ශිෂ්‍ය සංගමයේ ගීතය

විද්‍යා දීපය දල්වා දුරු කළ
මිථ්‍යා තිමිරය දෙරණේ
වැඩුමල් දූ දරුවෝ අපි ඔබගේ
මැදි විදුහල් මවුනේ . . . .
නෙත් ලද ඔබෙ පා සෙවනේ .....

සකල විභවතා සමසේ විකසිත
විපුල දිරිය දී සරසා හදවත
නිබඳ සැදූ නිදහස් නැණ මාවත
මවුනි ඔබේ ගුණ යාපත පැපත .....

බැතින පුදා නැණ ගුණ රට දැය වෙත
රකින සදා නිදහස් නැණ මාවත
කන්නන්ගර නම් ඉසිවර නුවණැස
එළිය කරයි අප යන මඟ දස දෙස .....

ගේය පද	:-	රත්න ශ්‍රී විජේසිංහ
සත්සර මුසුව	:-	රෝහණ වීරසිංහ
ගායනය	:-	රෝහණ වීරසිංහ



අවසාන විදේශ ගමන් බල පත්‍රය

පසුවදන

අපේ අප්පච්චී සාම්ප්‍රදායික සිරිත් විරිත්වලින් මෙහෙය වුණ කෙනෙක් විය. ගොවිතැන් බත් කිරීමේ දී සතාසිව්පාවනට හානියක් නොකර පාළු වළක්වා ගැනීමට මෙන් ම වෙනත් සියලු කටයුතුවල දීත් ආගමික සිරිත් විරිත් සහ නක්ෂත්‍රය පදනම් කරගෙන ක්‍රියා කළේය.

හේන් කුඹුරු වැඩ අරඹන හැම විට ම නැකත් හෝ සුභ දවස් යොදා ගත්තේය. සතාසිව්පාවුන්ගෙන් ගොවිතැන් රැක ගැනීමට පිරිත් සන්නයේ තිබෙන සමහර ගාථා ප්‍රයෝජනයට ගත්තේය. ඒ යුගයේ කෘමිනාශක ආදී රසායනික ක්‍රම තිබුණේ නැත. ඒ නිසා, සාම්ප්‍රදායානුකූල ක්‍රම උපයෝගී කර ගැනීමට සිදු විය. ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබුණ නිසා, නවීන ක්‍රම සෙවීමේ අවශ්‍යතාවන් ද නොවීය.

තම දරුවන්ගේ කටයුතු සම්බන්ධවයෙන් ද නක්ෂත්‍රය කෙරෙහි විශ්වාසයක් තැබූ බව මා සම්බන්ධයෙන් අප්පච්චී අනුගමනය කළ පිළිවෙත අනුව පැහැදිලි වේ. ගොවි පවුලකට පිරිමි දරුවෙක් ඉපදුන විට බාල වයසේ දී පවා ගොවි කටයුතුවලට සම්බන්ධකර ගැනීම සාමාන්‍ය සිරිතය. ඒ නමුත්, මා එසේ යොදවා ගැනීමට උත්සුක වූයේ නැත. මා තරුණ වියට පත්වූ විට ද කුඹුරු වැඩ ආදියට කැඳවා ගෙන ගියේ නැත. විටින් විට ඒ වැඩට සහභාගි වූයේ මගේ කැමැත්තෙනි.

පාසල්වලට ළමුන් ඇතුළු කළේ ලිත් වර්ෂයේ මුල දීය. මා පාසලට භාර දුන්නේ සැප්තැම්බර් මස පළමුවැනිදාය. ඒ වන විට මගේ වයස අවුරුදු හයයි මාස පහක් ගත වී තිබිණි. සමහර විට එතෙක් මට "අපල" තිබුණා වන්නට ඇත. පාසල් අධ්‍යාපනය ඇරඹීමෙන් පසුව කුමන පන්තියක දී වත් මා අසමත් වූයේ නැත. බොහෝ විට පන්තියේ පළමුවැනියා හෝ දෙවෙනියා විය. අධ්‍යාපනය කඩා කප්පල් වූයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වූවාට පසුවයි.

කේන්දර පලාඵල ගැන මා තුළ ද යම් විශ්වාසයක් තිබුණ නමුත් බොහෝ කල් ගතවන තුරු නිවැරදි පලාඵල විස්තරයක් ලියවා ගැනීමට කෙනෙක් මුණ ගැසුණේ නැත. නමසිය හැත්තෑ ගණන්වල මුල දී මගේ මිතුරෙක් වූ තන්තිරිගේ මහතා රජයේ මුද්‍රණාලයෙන් විශ්‍රාමලත් ධර්මදස නම් කෙනෙක් හඳුන්වා දුන්නේය.

ධර්මදස මහතා මගේත් දරුවන්ගේත් පලාඵල විස්තර ලියා දුන්නේය. ඒවායේ සඳහන් සමහර පුරෝකථන ඒ අවදියේ අප විශ්වාස නොකළ නමුත් ඒවා බොහොමයක් සිදු විය. කෙනෙක් විදේශගත වනවා යයි කී විට

එය කෙසේ සිදුවිය හැකිදැයි පවා එවකට සිතිය නොහැකිවිය. ධම්දස මහතා කියා තිබුණේ අප පවුලේ හැම දෙනාම විදේශගත වන බවය.

2003 වසරේ මා උඩදුම්බර පදිංචියට ගියාට පසුව අපේ ගමේ ප්‍රසිද්ධ දෛවඥ පවුලක කෙනෙකුට මගේ උපන් වේලාව දුන් විට පරිගණක මගින් පලාඵල විස්තරයක් ලබා දුන්නේය. එහි සඳහන් සමහර කරුණු මෙසේය.

අපල:

කටයුතු වරින් වර වෙනස් කරයි. එකම කටයුත්ත එක දිගටම කරගෙන යෑමට උනන්දුවක් නැත. ජීවිතය කම් කටොළු සහිත වේ. වැඩිපුර අසනීප සිදු වේ. ශරීරය දුර්වල අයෙකි. නිකරුනේ වියදම් කරයි. වියදම් අධික වේ. නඩුහබ වලට පටලවයි. වස්තු හානි කරයි. හිතට කරදර උපදින දේ වලට මුහුණ පාන්නට සිදුවේ. දේශාන්තරවල ඇවිද්දවයි. ඇවිදිලි අධික වේ. මදුපානයට ප්‍රිය වූ කෙනෙක් වීමට ඉඩ තිබේ. ආත්ම ශක්තිය අඩුය. දුක් සහිත වැඩවල යෙදෙන්නට සිදුවේ.

කෞශල්‍යයට ප්‍රීති සහගත දේට වැඩි වියදම් කර මුදල් නාස්ති කරයි. නිකරුනේ ලස්සනට වියදම් කරයි. ඉගෙනීම අතර මඟ කඩාකප්පල් කරන්නට ඉඩ තිබේ. හොරෙන් අකටයුතු දේ කිරීමට පොළඹවයි. තද ආත්මාර්ථකාමී පිහිටීමක් ඇත. සියළුදේම ලෞකිකවූත් තමන්ගේම වාසිය පිණිසවූත් දේවල් විය යුතු වේ. ආශ්‍රය පහත් අය සමග වෙයි. ගුණ ධර්ම හීන කෙනෙකි. අනුන්ගේ දේපල කඩා වඩා ගැනීමට මාන බලන්නා වගේම සමතෙකි. හතුරෝ බොහෝ වෙති. විශ්වාසවන්ත මිත්‍රයෙක් නැත්තෙක් වෙති.

ශුභඵල:

මෙලොව දියුණුව පිණිස දිවාරාත්‍රයෙහි වෙහෙසෙන්නෙකි. කරුණාවන්ත විශ්වාසවන්ත කෙනෙක් වේ. අනුන්ගේ දුක් වෙනුවෙන් කම්පා වෙයි. මානසික ධර්ම දන්නෙක් හා තේරෙන කෙනෙක් වේ. යමක් කිරීමට පෙර වඩා හිතන්නෙකි. උවමනා තැනේදී උවමනා අන්දමට සිත යොදා කටයුතු කිරීමේ ශක්තිය ඇත්තෙකි. කලබල රහිත ඕනෑ වැඩකට යෙදිය හැකි හිතක් ඇත්තෙකි.

යමක් අනුන්ට වටහා දිය හැකි කෙනෙකි. තමන්ගේ නෑදෑයින්ට වඩා පිට අයට ලාභ ප්‍රයෝජන ලැබේ. උසස් අදහස් ඇති නීති ගරුක කෙනෙකි. රාජ්‍ය තන්ත්‍රවලින් අනුන් නොදන්නා වැඩ වලින් ආදායම් ලබයි. යුක්තිය විසඳීමේ හා අපරාධ පරීක්ෂණයේ තියුණු නුවණක් තිබේ. යහපත් ඉගෙනීම

ලබාදී පණ්ඩිත ගුණ ඇති අයෙකු කරයි. අමුතු අමුතු දේ නිපදවීමට ආශා ඇති කරයි. පොත්පත් කියවීම සංගීතයට සෞන්දර්යට සහ සැපසේ වාසයට ප්‍රිය කරන කෙනෙක් වේ. පර හිත් දක්නා නුවණ වේ.

ගෘහ ජීවිතය ගෞරවයෙන් ගත කරයි. බලවත් කෙනෙකු හා ආලය නිසාම විවාහ වෙයි. ගෞරවය රැකගන්න කෙනෙකි. දරුවෝ උසස් වේ. ආගමික භක්තිය ඇත. කලත්‍රයාට හා දරුවන්ව ඉතා හිතවත් කෙනෙක් වේ. තම පවුලේ ගෞරවය රැකගන්නට දැඩි වෙහෙසක් දරණ කෙනෙක් වේ. නිර්භීත සෘජු උද්යෝගිමත් වේගවත් ගති වලින් යුත් කෙනෙක් වේ. මිල මුදල් හම්බ කිරීමේ සමතෙකි. ජීවිතයේ, පසු කාලයේ ධනයෙන් සපිරි කාලයක් වේ. ආශ්‍රය කරන අයට හා කලත්‍රයාට බොහෝ හිතවත් වේ. ආගම සම්බන්ධ විශේෂ ඥානයක් තිබේ. නෑදෑයින්ගෙන් ගෞරවය ලබයි. දීර්ඝායු ලබයි.

මෙම පලාඵල ඇති කේන්දරය පහතින් දැක්වේ.





මගේ ජීවිතයේ ගමන් බිමන්, ස්ථාන මාරුවීම් බොහෝ විය. උපන් බිමෙන් වෙන් විය. සමහර සිද්ධි දෙවරක් බැගින් සිදු වී තිබේ. 1947 සහ 1957 ගං වතුර ආපද, බදුල්ල හා හිඟුරක්ගොඩ සේවා කාලවල දී (අ) නිල නිවාස ගැටලු (ආ) පූර්වයාතිකයන් අතපසු කළ රාජකාරි (ඉ) උප කොට්ඨාශ දෙකට බෙදීම, පශ්චාත් උපාධි දෙක, සම්මාන උපාධි දෙක යනාදිය උදාහරණ වේ. මගේ ජීවිතයේ දී අහිතකර බලපෑම් ඇති කළ අය ගැන සඳහන් කර ඇත්තේ ප්‍රධාන තේමාවට අදාල නම් පමණි. මා උදව් උපකාර කළ අය බොහෝ දෙනෙක් ඇතත් මෙහි මා ඉස්මතු කිරීමට ප්‍රයත්න දරුවේ මට උදව් උපකාර කළ අය ගැනයි.

මේ කථාවේ ඇති තොරතුරුවලින් ඉහත සඳහන් පලාඵල කොපමණ දුරට තහවුරු වේ ද'යි කියවන්නා විසින් නිගමනය කළ යුතු වේ.

සිතියම් සහ ඡායාරූප

අනු අංක	පිටු අංක	
01	004	උඩදුම්බර සිතියම
02	007	හාල්යාල ඉහළවෙල සහ ගම්මැද්ද අමුතුකොළහින්න පස සිට
03	008	හාල්යාල සිතියම
04	010	-එම- කහටගොල්ල ඇල්ල පස සිට
05	035	මියුගුණ වෙහෙර
06	051	විසිපහේ කණුවේ සිට දේවාලේවත්තට යන පාර
07	054	අද දේවාලේවත්ත (අලුතෙන් නිවසක් ඉදිවෙමින් පවතී)
08	062	දෝතලුගල (නකල්ස් කඳුවැටියේ දකුණ කොණ)
09	062	නිදිගත ලංදේසියා නකල්ස් කඳුවැටියේ උතුරු කොණේ ඈතින් මීමුරේ පිහිටා ඇත
10	093	සැතපුම් විස්සේ පා ගමන වලල සිට මාඩුගොඩ දක්වා
11	100	හුන්නස්ගිරි කන්ද තරණය-වලල සිට හුන්නස්ගිරි කඳු මුදුනට
12	112	අපේ අයියා
13	137	අපේ අප්පච්චී
14	144	1954 දී මගේ සේයාරුව
15	147	ප්‍රේමාට පෙම් බැඳීම
16	148	1950 දී ප්‍රේමා සහ කපුගෙවත්තේ කළු අක්කා
17	160	මංගල සේයා රුව
18	177	බදුල්ල වාරිමාර්ග කාර්යය මණ්ඩල ඡායාරූපය
19	182	නිවාසය සහ කාර්යාලය
20	194	ප්‍රේමා, බිළිඳු පුතා සහ ලොකු දුව සමග ගිරිතලේ දී
21	204	ලොකු පුතා පෙර පාසල් අවදිය
22	208	උපාධි සේයාරුව (B.A.Vidyodaya,1964)
23	209	උපාධි ප්‍රදානෝත්සවය දා සිය පවුල සමග

24	230	පශ්චාත් උපාධිය (Master of Public Administration.1969)
25	253	අපේ අම්මා, නංගී, ලොකු අක්කා සහ පොද්දල්ගොඩ මස්සිනා සමග (1953)
26	260	පළමුවන විදේශ ගමන් බලපත්‍රය (1977)
27	263	අයි එස් එස් ඉදිරිපිට හිමවැටීම 1978 අප්‍රේල්
28	266	නෙදර්ලන්තයේ දකුණු ලිම්බර්ග් චාරිකාව
29	267	අප්‍රිකානු මිතුරන් සමග (මාස්ට්‍රිච්ට් හි දී 1978)
30	267	කර්ක්‍රාඩ පල්ලියේ පුස්තකාලයක් තුළ
31	267	පකිස්තානු මිත්‍ර අවාන් සමග ආර්න්හයිම් යද්දී
32	270	රෝයි ජයසිංහ හා පරණවිතාන පවුල සමග නෙදර්ලන්තයේදී (1978)
33	283	ඩෙවන් දිය ඇල්ල
34	286	1983 හග්ගල මල් වත්තේ දී
35	287	ලොකු දුවගේ විවාහ මංගල්‍යය 1987 දෙසැම්බර් 17 දා
36	291	බෙල්ජියමේ ලර්වන් නගරය
37	294	ආචාර්ය හර්ඩ් සමග හයිදෘාබාද් හි දී 1986 සැප්තැම්බර්
38	310	අස්ගිරි අනුනායක ගෞරවාර්හ හාල්යාලේ ශ්‍රී සුමනතිස්ස හිමිපාණෝ
39	310	නා හිමි පුදට මල්
40	314	බෲනායි සිතියම
41	315	බෲනායි සහ මැලේසියානු රාජකීයයන් 1990
42	319	UBD ගුරුවරු ටික දෙනෙක් සමග 1990
43	334	ලොකු පුතාගේ විවාහ මංගල්‍යය 1989 සැප්තැම්බර් 16
44	339	ආයුබෝවන් UBD 1990 දෙසැම්බර්
45	343	1991 පෙබරවාරි 4 රංටැඹේ දී
46	343	ප්‍රේමා හා පොඩිපුතා රංටැඹේ අසළ දී
47	344-345	පොඩිපුතා ගුවන් නියමු පුහුණුව
48	354	පරම්පරා තුනක් තලපත්පිටියේ දී

49	355	1995 සිංහල අලුත් අවුරුද්ද
50	357	සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දිව්රුම් දීම 1995 ජූනි 02
51	362	සවිනි හා දිනීත් සමග
52	362	නිර්මලා හා ලොකුපුතා සමග
53	263	පොඩිපුතා දෙවෙනි මනමාලයා සේ 1995 දෙසැම්බර්
54	370	හෝර්ටන් තැන්න මුදුනේ, රහංගල නිල නිවසෙ සහ හපුතලේ අඩිසන් බංගලාව අසළ 1996
55	371	පොඩිදුවගේ විවාහ මංගල්‍යය 1997 මැයි 23
56	374	Ad Multos Annos අධ්‍යයන කාර්‍ය මංඩලයේ උපහාරය
57	375	විශ්‍රාම ගැනීම 1998 මාර්තු 25 හරේන්ද්‍ර කාරියවසම්, චන්ද්‍රා වීරසිංහ, ආචාර්‍ය හේරත්, ඩබ්ලිව් ඒ විජේවර්ධන ආදීන් කථා පවත්වනවා ප්‍රේමා අසා සිටී.
58	375	සිසු උපහාර
59	376	සමු ගැනීමේ මගේ කථාව
60	386	විදේශ ගත වීමට කටුනායක දී
61	386	සිංගප්පූරුවේ දී
62	387	ඕස්ට්‍රේලියාවේ හීල්ස්විල් උයනේ දී
63	387	සිඩ්නි උද්භිද උද්‍යාණයේ දී
64	390	1997 දෙසැම්බර් 26 වෙනි දා ලංකාවට ආපසු එද්දී
65	391	බොක්ස් හිල්
66	391	පෙන්ගුවින් එනතුරු
67	393	රමණී හා චන්ද්‍රිකා සමග මෙල්බර්න් නගරයේ දී
68	402	කැන්බරා යද්දී
69	406	ලියනගම පවුල
70	420	පොඩිපුතාගේ විවාහ මංගල්‍යය 2004 ජනවාරි 04
71	424	මැදිවක පාසලේ දී
72	426	යන තැනකට මාත් එනවා
73	426	උතුරායන සෙනෙහස
74	434	නැතිවුණ මල

75	438	හුදකලාවිය
76	442	බුද්ධගයාවේ දී
77	445	කපිලවස්තු නටඹුන් අතර
78	455	සම්මාන උපාධි 2008 දෙසැම්බර් 02
79	456	D.Sc. සම්මාන උපාධි සහතිකය
80	460	සම්මාන උපාධි ප්‍රදානෝත්සවය දා රමණීය සහ දරුවන්
81	460	සම්මාන උපාධි ගැන පවුලේ ප්‍රීතිය
82	461	D.Lett: සහතිකය 2009 ජනවාරි 15 සබරගමුව විශ්ව විද්‍යාලය
83	466	හුදකලාවූ දෙදෙනෙක්
84	467-468	නැටුම් පන්ති කාමර ඇය වෙනුවෙන් ස්මාරකයක්
85	474	දරුවනගේ උපහාරය 2011 ජනවාරි
86	475	මියුර කවීන් ඒකනායක 2012 ජූනි 03
87	475	පරම්පරා තුනක්
88	476	අළුත් නෑයෙක්
89	476	දෙමව්පියන් සමග
90	478-480	වලල ඒ රත්නායක මධ්‍ය විද්‍යාල ක්‍රීඩා උත්සවය 1955 පෙබරවාරි 23
91	480	පෙති රැසක් ගොණුවී
92	488	අවසාන ගමන් බල පත්‍රය

නිමි...